සද්ධම්ම සාරාවී සංග්‍රහය



සද්ධර්ම

සාරාර්ථ සඞ්ග්‍රහය

සද්ධම්

සාරාර්ථ සඞ්ග්‍රහය

වැලිවිට ශ්‍රී ශරණඞ්කර සඞ්ඝරාජ

මාහිමියන් වහන්සේ විසින්

ප්‍රණීත යි.

රත්නපුර - මාරපණ

ශාසනෝදය පරිවෙණාධිපති රාජකීය පණ්ඩිත

කිරිඇල්ලේ ඤාණවිමල

ස්වාමිපාදයන් වහන්සේ විසින්

සංශෝධිත යි.

කොළඹ

සීමා සහිත

ඇම්. ඩී. ගුණසේන සහ සමාගම

2500

ප්‍රස්තාවනා

සිංහල භාෂාව පමණක් දත් ධම්කාමීන්ගේ සද්ධාභාජනය හා ධම්ඤ්ඤනය දියුණුවීමට ඉවහල් වන පරිදි පෙර විසූ ගිහි-පැවිදි පණ්ඩිතවරයෝ ග්‍රන්ථ සම්පාදනය කළහ. මේ පොත් ගද්‍ය-පද්‍ය වශයෙන් කොටස් දෙකකට බෙදිය හැක. එයින් අප අතර බෙහෙවින් සුලභ ව ඇත්තේ ගද්‍යයෙන් රචනා කරණ ලද පොත් ය. මේවා ප්‍රමාණයෙන් හා සඞ්ඛ්‍යා වශයෙන් ද පද්‍ය ග්‍රන්ථ වලට වඩා විශාල බැව් කිව හැක.

සදුකල්හි ම සාමාන්‍ය ජනතාව නිතර දෙවේලේ ධම්කථා ශ්‍රවණය ප්‍රිය කළ නිසා ධම්ය ඇතුළත් ගද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ආරක්ෂා වූ බැව් සිතිය හැක. පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ වලට පැරණි පාඨක සමාජයෙන් එබඳු තැනක් ලැබී ඇති බවක් නොපෙනේ. අනිත් පද්‍ය ග්‍රන්ථ තබා ජාතක කථාවක් ඉ පද්‍යයට නැගූ මහා කාව්‍ය යක් වූ **කව් සිළුමිණ** පවා මුල් පත්ඉරුව වත් නැති දුර්ලභ පොතක් ලෙස අසින් ව තිබී ම එයට සාධකයකි. ශතවර්ෂ එකොළහ ඉක්ම වූ සිංහල ග්‍රන්ථ අප අතර ශෙෂ ව නැත ත් සම්බුද්ධාගම තයේ සිට ම අපට සරල සිංහල සාහිත්‍යයක් තිබුන බැව් වංශ කථා වල එන ග්‍රන්ථ පිළිබඳ විස්තර හා ශිලාලිපි වල සඳහන් භාෂා විලාශය ත් අනුව සැළකීමට ඉඩ තිබේ.

ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 14 වැනි ශතවර්ෂයේ මධ්‍යභාගයේ සිට 23 වැනි ශතවර්ෂයේ අවසාන භාගය දක්වා ගතවී ගිය අවුරුදු 900 ක් පමණ වූ මේ කාලය තුළ විසූ ගිහි-පැවිදි පණ්ඩිතයන් විසින් ලියන ලද සිංහල ගද්‍ය සාහිත්‍ය ධම් ග්‍රන්ථ 26 ක් දැනට අප අතර ශෙෂ ව ඇත.

1. අභාසළමෙවන් කසුප් (v. කාශ්‍යප) රජ - **ධම්පියා අටුවා ගැටපදය**
2. ගුරුළුගෝමී - i **අමාවතුර** ii **ධම්ප්‍රදීපිකාව**
3. විදාගම්බාහු - i **බුද්ධසරණ** ii **දහම්සරණ** iii **සඟසරණ**
4. මයූරපාද හිමි - **පූජාවලිය**
5. ධම්සේන හිමි - **සද්ධම්රත්නාවලිය**
6. කලිකාල සාහිත්‍ය සම්භාවිත පණ්ඩිත පරාක්‍රමබාහු රජ - **විසුද්ධි මාර්ග මහා සන්නය**

7. දෙව්රද දම් පසහිනාවන් – **දළඳ සිරිත**

8. දෙවරසෙක්ත ජයබාහු නාමාපරධෙය් දුතිය ධම්කිර්ති සඞ්ඝරාජ මාහිමි – **සද්ධම්මාලඞ්කාර ය**

9. දුතිය (iv) පණ්ඩිත පරාක්‍රම්බාහු රජ – **පන්සිය පණස් ජාතක පොත**

10. වීරසිංහ ප්‍රතිරාජ – **පන්සිය පණස් ජාතක පොතේ ඇතැම් කොටස්**

11. සාහිත්‍ය විල්ගම්මුල සඞ්ඝරාජ මාහිමි - **සිංහල බොධිවංශ ය**

12. ධම්මදින්නාචරිය විමලකිත්ති හිමි – **සද්ධම්රත්නාකර ය**

13. සකල විද්‍යාවක්‍රවර්ති පරාක්‍රම පණ්ඩිත – **සිංහල ස්තූපවංශ ය**

14. ලඞ්කා සෙනෙවිරත් පරිවෙණාධිපති හිමි – **විමුක්ති සංග්‍රහ ය**

15. වැලිවිට ශ්‍රී ශරණඞ්කර සඞ්ඝරාජ මාහිමි–

i **සද්ධම් සාරාර්ථ සඞ්ග්‍රහ ය**

ii **සාරත්ථ දීපනී (පිරිත් සන්න ය)**

iii **මධුරත්ථප්පකාසිනී (මහා බොධිවංශ සන්න ය)**

iv **මුණිගුණාලඞ්කාර ය**

v **අභිසමෙධාඩි අලඞ්කාර ය**

16. හීතට්කුඹුරේ සුමඞ්ගල හිමි – **මිලිඳුප්‍රශ්න ය**

17. නිබ්බට්ටවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත මහා නායක හිමි – **ශ්‍රීසද්ධම්මාවවාද සංග්‍රහ ය**

18. මොරතොට රාජගුරු ශ්‍රී ධම්මක්ඛන්ධ මහානායක හිමි – **උපාසක ජනාලඞ්කාර ය**

19. ගම්මුල්ලේ ශ්‍රී රතනපාල හිමි – **විමානවත්ථු ප්‍රකරණ ය**

ධම්කාමීන්ගේ විපුල ප්‍රයෝජන ය තකා සවභාෂාවෙන් ලියන ලද මෙම ධම් ග්‍රන්ථ සමූහ ය නිසා ධම්ඥන ය දියුණුවීම ත් හැර තත් කාලීන භාෂා විලාශ ය–ජාතික පැරණි සිරිත්–විරිත්–දුර්ලභ ඓතිහාසික තොරතුරු හා ලඞ්කා ශාසන වංශ ය පිළිබඳ අප්‍රකට කරුණු රැසක් ද ප්‍රකට වන අතර සිංහල සාහිත්‍ය ය පෝෂණ ය පිණිස සිදුවූයේ ද ඉමහත් සේවයකි.

සඞ්ඝරාජ චරිත ය හා ශාසනීය කෘති

බෝධිසත්ව ගුණොපෙත වැලිවිට පිණ්ඩපාතික අසරණ ශරණ ශරණඞ්කරාභිධාන සඞ්ඝරාජ මාහිමියන් වහන්සේ ගේ

උත්පත්ති ය-	ශ්‍රී: බු: ව:	2241	- ශ: ව:	1619	- ක්‍රි: ව:	1697.
උපසම්පදා ව ලැබීම-	,,	2296	- ,,	1675	- ,,	1753.
අපවත්වීම-	,,	2322	- ,,	1700	- ,,	1778.
සද්ධම්ම සාරාථී සංග්‍රහ ය ලිවීම	,,	2269	- ,,	1647	- ,,	1725.
නෙසජ්ජමඤ්ඤසා සන්න ය ලිවීම	,,	2278	- ,,	1656	- ,,	1734.

දෙවෙනි විමලධම්ම සූරිය රජු කල රකඛඩඟ දේශයෙන් උපසම්පන්න භික්ෂූන් ගෙන්වා මහවැලි ගඟේ ගැටඹේතොට උදකුක්ඛේප සීමාවෙහි දී උපසම්පත්නී ය ලැබූ **සූරියගොඩ කිත්සිරි මෙවන් රාජසුන්දර** තෙරුන් වහන්සේ වෙත පැවිදි වූ වැලිවිට ශරණඞ්කර සාමණේර තම වයස 56 දී උපසම්පදා ව ලැබ එ තැන් සිට 25 වසක් ලඞ්කා සම්බුද්ධශාසනයේ දියුණු ව තකා අනලෝත්සාහ යෙන් ක්‍රියා කොට ජන්මලාභයෙන් 81 වැන්නෙහි ඇසළ පුර පසළොස්වක් පොහෝ දින මල්වත්තේ **පෝයමළු විහාරයේ** දී අපවත් වූ හ.

උන්වහන්සේ විසින් ලියන ලද පොත් අතුරෙන් **සද්ධම්ම සාරාථී සංග්‍රහ ය** ලියන ලද්දේ උත්පත්තියෙන් 28 වැන්නෙහි ය. **නෙසජ්ජමඤ්ඤසා** සන්න ය ඊට නව වසකට පසු ව ලියන ලද් දකි. මේ පොත් දෙක ම රචනා කරණ ලද්දේ ශ්‍රීවීර පරාක්‍රම නරෙන්ද්‍රසිංහ රජුගේ ආරාධන ය ලෙස ය.

ශාසනික සත්ක්‍රියා

දඹදෙණි සමයෙහි පඤ්චමූල පරිවෙණාධිපතීන් වහන්සේ විසින් ii පැරකුම්බා රාජ්‍යාදයෙන් 25 වැන්නෙහි (ශකවර්ෂ 1183- ක්‍රි: ව: 1261) විශෙෂයෙන් භික්ෂූන්ගේ ප්‍රයෝජන ය පිණිස ගර් භිණී-කුමාර විකිත්සා ඇතුළත් තොකොට සම සැටක් පද්ධ තීන්ගෙන් පරිපූර්ණ වන පරිදි ලියන ලද මේ ග්‍රන්ථයට ව්‍යාඛ්‍යා තයක් කරණ සේ නරෙන්ද්‍රසිංහ රජතුමා විසින් කරණ ලද ආරා ධන ය පිළිගෙණ සවකීය ධර්මාචාර්ය්‍ය **පල්කුඹුරේ අත්ථදස්සි** සමා ණේරයන් හා ආදි ශිෂ්‍ය පිරිසක් ද සහාය කොට ගෙණ එ ම කර්තව්‍ය ය යථා ශක්ති ප්‍රමාණයෙන් සම්පූර්ණ කොට මහවාසලට

ඔප්පුකළ තැනේ දී "වැලිවිට ගණ්ඩන් ලොවට වැඩ දැයක මහත් කටයුත්තක් කෙළේ ය. මිට අප විසින් කුමක් කටයුතු දැ"සි විවාල කල පෞද්ගලික ලාභ-කීර්ති-ප්‍රසංශාදියක් අපෙක්ෂා නොකළ උන්වහන්සේ මේ රටේ නැතිවී තිබෙන උපසම්පදාව නැවත ත් පිහිටුවා නටබුන් ව තිබෙන පූජණීයස්ථාන ප්‍රතිසංස්කරණය කොට සම්බුද්ධ ශාසනය දියුණු කරන්නැ සි රජතුමාට කිහ.

එහෙත් එවකට රෝගාතුර ව සිටි රජතුමාගේ බලාපොරොත්තු රහිත හදිසි මරණය නිසා එම ශාසනික මහා පුණ්‍ය කර්මය ඉටුකරලීමට අවස්ථාවක් ලැබුනේ නැත.

ඉන් පසු රජපැමිණී ශ්‍රී විජයරාජසිංහ රජතුමා ද අට වසක් පමණ වූ සවකිය කෙටි රාජ්‍යකාලය තුළ දෙවරක් ම මේ ගැන උත්සාහ ගත් නමුත් සඵල වූයේ නැත. ඒ රජුගේ අභාවයෙන් පසු ශකවර්ෂ 1669 දී රජපැමිණී කීර්ති-ශ්‍රී රාජසිංහ නරෙන්ද්‍රතෙමේ සවකීය රාජ්‍යෝදයෙන් සවැන්නෙහි වැලිවිට ශරණඞ්කර සාමණේරයන් වහන්සේගේ අදහස් ලෙස උපාලිවංශික උපසම්පදාව පිහිටුවීමෙන් ලඞ්කා සම්බුද්ධ ශාසනය ප්‍රකෘති මත් කොට සඞ්ඝරාජ පදවිය ද උන්වහන්සේට ම පැවරුහ.

ශාසන භාරය ඉසිලීමී වස් මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ප්‍රථමයෙන් ම ආරණ්‍යක මහා කාශ්‍යප නිමියන්ට පැවරීමෙන් ප්‍රාරබ්ධ මේ සම්භාවනීය පදවිය කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් පත්කරණ ලද වැලිවිට ශ්‍රී ශරණඞ්කර සඞ්ඝරාජයන්ගෙන් පසු නිස්ව තිබේ.

(අද ලක් රජය විසින් ද කළ යුතු ව තිබෙන්නේ මේ තාක් නිස්ව තිබෙන මේ පදවිය සුදුසු මහතෙර නමකට පත් කොට බුද්ධශාසනයේ විරසථිති ය පිළිබඳ අවශ්‍ය දේ උන්වහන්සේගේ අනුශාසනා පරිදි කිරීම ය.

තම සතු දේත් සහ සතු දේත් එකට පටලවාගෙණ කරන්ට යාම නිසා අපකීර්තියට හා විපතට හාජන නොවී බුදුසසුන දියුණු කිරීමට මේ ම රජය විසිනු ත් කළ යුතු එක ම ඥානාන්විත ක්‍රියාව නම් මහපැරකුම්බා රජු පටන් කීර්ති ශ්‍රී රාජසිංහ රජු තෙක් විසූ ලක්රජුන් අනුව යාම ය.

සද්ධම්ම සාරාර්ථ සංග්‍රහය

මයූරපාද පරිවෙණාධිපති බුද්ධපුත්‍රයන් වහන්සේ විසින් **ඉතිපි සෝ භගවා අරහං** යනාදී නවගුණපාඨයට අයත් **"අරහං"** යන පදය මාතෘකා කොට පරිච්ඡේද 34 ක ග්‍රන්ථ සූචිසිද්ධසක්-අක්ෂර සත්ලක්ෂ සැට අට දහසක් හා ඛණ්ඩවර 96 ක් සිටින සේ පිටු 808 කින් යුත් පූජාවලී නම් ධර්ම ග්‍රන්ථයක් රචනා කළා සේ ම ජන්මලාභයෙන් 28 වියෙහි සිටි ශරණඞ්කර සාමණේර යන් වහන්සේ විසින් ද එ ම බුදුගුණ පාඨයට අයත් **"බුදෙඩා"** යන පදය මාතෘකා පාඨය වශයෙන් ගෙණ එකොළොස් දහසක් ග්‍රන්ථයන්ගෙන් යුත් අධිකයක් සහිත නවමහා පරිච්ඡේදයකින් (පිටු 559) පරිපූර්ණ වූ **සද්ධම්ම සාරාර්ථ සංග්‍රහ** නම් වූ මේ මා හැඟි ධර්ම ග්‍රන්ථය ශ්‍රී ලඞ්කාධිපති ව ශ්‍රී ශෛඛණ්ඩ ශෛලාභිධාන ශ්‍රීවර්ධන පුරප්‍රවරයෙහි රාජ්‍ය ශ්‍රී පදප්‍රාප්ත ශ්‍රී වීරපරාක්‍රම නරෙන්ද්‍රසිංහ පෘථ්වීපාලයන්ගේ ආරාධනය ලෙස එතුමාගේ රාජ්‍යෝදයෙන් 18 වැන්නෙහි හෙවත් ශ්‍රී බුද්ධ වර්ෂ 2269 වැන්නෙහි එ ම නගරයෙහි ම පිහිටි **පෝයමළු විහාරයෙහි** දී රචනා කරණ ලද්දකි.

මෙය කලින් මුද්‍රණය කර තිබෙන්නේ **සාරාර්ථ සංග්‍රහ** ව නමිනි. එය අපරීක්ෂාකාරිත්ව ය නිසා ඇති වූ වරදකි. මේ පොත සාරාර්ථ සංග්‍රහ ව නමින් බොහෝ දෙනා අතර ප්‍රචලිත වූයේ මේ වැරදීම නිසා හෝ හෙසජ්ජ මඤ්ජුස්සර හැඳින්වීමේ දී **මඤ්ජුසේ** ය යි සංක්ෂිප්ත වශයෙන් ව්‍යවහාර කරන්නාක් මෙන් හෝ විය හැකි යි.

ඖෂධ සාරාර්ථයන් සඞ්ග්‍රහ කළ **සාරාර්ථ සංග්‍රහ** නමින් මීට වඩා පැරණි (බුද්ධදත්ත රජතුමා ලියූ) වෙද පොත් තිබෙන නිසා සද්ධර්මයෙහි සාරාර්ථයන් සංග්‍රහ කොට ලියන ලද මේ ග්‍රන්ථයට **සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහ** යන නම තැබූ සේ පෙනේ.

අඞ්ගුත්තරනිකාය-දීඝනිකාය-විශුද්ධිමාර්ගය-එ ම ටීකාව-මහාබෝධිවංශය-සමන්තපාසාදිකා විනෝදනී-ධම්මපදට්ඨකථා ආදී පාලි හා අර්ථ ග්‍රන්ථවලින් උපුටා ගත් චතුස්සත්‍ය ය - ආර්ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග ය හා තෙලෝස් බුත්ඝාදී ය සඳහන් පාලිපාඨ සාධක වශයෙන් දක්වමින් ඒ ඒ ධර්මකොට්ඨාස සවිභාග වෙන් විස්තර කර තිබේ.

මෙම ග්‍රන්ථයෙහි නාම ය **සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහ ය** ම බව කර්තෘ සන්දර්ශන ය පිණිස මේ පොතේ (553-566) වැනි පිටුවල උන්වහන්සේ විසින් ම ලියන ලද ගද්‍ය-පද්‍ය රචනාවන්හි ද, හෙසජ්ජ

මිඤ්ජසා පූර්විකාවෙනි ද, කිර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ඇමතියකු විසින් ලියන ලද **සඞ්ඝරාජ සාධු චරියාවෙහි** 10 පිටේ හා 29 වැනි පිටේ ද සඳහන් වී නිබේ. මේ කරුණු අනුව සලකන කල මෙහි සම්පූර්ණ නාම ය **සද්ධම්ම සාරාඵුල සඞ්ගහ ය** බවට කිසි ම සැක යක් නැත.

ප්‍රාචීන භාෂා ශාස්ත්‍ර පිරිහී ගිය සමයක විසූ වර්තමාන ශාස්ත්‍රාත්‍යානියේ ආදි පුරුෂයාණන්ගේ භාෂා විලාශ ය දැන ගැණීමට ත්, සවභාෂාව පමණක් දන් ධම්කාමීන්ගේ ප්‍රයෝජන ය පිණිස හා සවභාෂාභිවෘද්ධි වඩින ය පිණිස ත් මේ ග්‍රන්ථයෙන් සිදුවනුයේ ඉමහත් සේවයකි.

මේ සංස්කරණ ය **සිමා සහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම** සතු ය.

මෙය ට:

පණ්ඩිත කිරිඇල්ලේ
ඤාණවිමල ස්ථවිර.

2500
1957 මාර්තු මස 15 දින
මාරපණ ශාස්ත්‍රෝදය පිරුවන්හි දී ය.

පටුන

	පිටු
1. පරිච්ඡේදය	
ප්‍රාරම්භ ය	1 - 16
1. ප්‍රකරණාරම්භ කථා	16 - 47
2. පරිච්ඡේදය	
2. ප්‍රථමාභිනීහාර කථා	48 -102
3. පරිච්ඡේදය	
3. සාමාන්‍යාභිනීහාර කථා	103-151
4. පරිච්ඡේදය	
4. අභිසම්බෝධි කථා	152-229
5. පරිච්ඡේදය	
5. දම්සක් පැවතුම් සූත්‍රදේශනාව	230-299
6. පරිච්ඡේදය	
6. ආර්‍යසත්‍ය කථා	300-345
7. පරිච්ඡේදය	
7. මහාකාශ්‍යප සථවිරාවබෝධ කථා	346-430
8. පරිච්ඡේදය	
8. මහාකප්පින සථවිරාවබෝධ කථා	431-469
9. පරිච්ඡේදය	
9. මහාමඞ්ගල සූත්‍රදේශනා කථා	470-552
10. කනීෂ සන්දර්ශනාදි කථා	553-559

සද්ධම්ම
සාරාර්ථ සඞ්ග්‍රහය

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මා සම්බුද්ධස්ස.

1. පරිවේදය

ප්‍රාරම්භය

ඉතිපි සෝ භගවා අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණ සම්පන්නෝ සුගතෝ ලෝකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරථි සත්ථා දෙවමනුස්සානං බුද්ධෝ භගවා-ති

ශ්‍රී සද්ධර්මාමෘතදයක විමෝක්ෂාත්මික ඥානෝපලබ්ධ බුද්ධ නාමෝපලක්ෂිත ප්‍රවර සුරාසුර ගරුඩ මනුජ භුජග ගන්ධර්ව මකුට[1] කූට සංචුම්බිත ශෛලසංඝට්ටිත චරණයුගලෝපශෝභිත ත්‍රෛලෝක්‍යෛකතිලක විවිධ විමල විපුලාඛිල චූල මධ්‍යම මහා ශීල ධෘත ව්‍රතාදී ගුණගණාභරණ සමලඞ්කෘත බ්‍රහ්මාමර නර නාග ශ්‍රමණ බ්‍රාහ්මණාදී සසරාමර සකල ලෝකාභිමතාර්ථප්‍රදානක්ෂම සුරපාදප සුරමණී සඞ්කාශානන්න සුබදයකවූ සර්ව්වඥයන් වහන්සේ විසින්:

ඔවිත්‍රිංශත් ශතසහස්‍ර නහුත ත්‍රිශත පඤ්චාශත් යොජනා වෘත ඇති චක්‍රවාටපර්‍යන්ත ශතසහස්‍රයකින් හෙරි ශතසහස්‍රයක් සෘද්ධ සුමේරගිරි ශතසහස්‍රයකින් එකවිට ආකොටනය කොට ශබ්ද පැවැත්වූවා සේ, අවීචියෙහි පටන් භවාග්‍රය දක්වා භවාග්‍රයෙහි පටන් අවීචිය දක්වා වරින් අතෙක ශතසහස්‍ර ලෝකධාතුවෙහි ඉතා උස්ව පැතෙන ඝෝෂයෙන් පරිද්දෙන් විද්‍යමානවූ ශ්‍රාවක ප්‍රත්‍යේකබුද්ධ යන් හා අසාධාරණවූ තමන්වහන්සේගේ අර්හත්වාදී ගුණය ප්‍රකාශ කොට දක්වා වදාරණ පිණිස:

---

1. මකුටමණි – ඇතැම්

උක්කාත්‍යුක්කතා තථා මධ්‍යා ප්‍රතිෂ්ඨාත්‍යා සුපූර්විකා,
ගායත්‍ර්‍යුෂ්ණි ගනුෂ්ටුප් ච බෘහතී පඞ්ක්තිරෙව ච

ත්‍රිෂ්ටුප් ච ජගතී චෛව තථාතිජගතී මිතා,
ශක්වරී සාති ප්‍රකෘත්‍යා දෂ්ට්‍යත්‍යෂ්ටී තතඃ පරම්.

ධෘතිශ්චාති ධාතිශ්චෛව කෘතිඃ ප්‍රකෘතිරාකෘතිඃ,
විකෘතිස්සඞ්කෘතිශ්චෛව තථාත්‍ය කෘතිරුත්කෘතිඃ-යි

නිර්දිෂ්ට වූ එකෙකාක්ෂරයෙන් වර්ධිත වූ පාදයන් කරණ කොට ගෙණ පාඨක් පෘථක් භාවයට පැමිණ ඡන්දස් නාමයෙන් ප්‍රවෘත වූ සවිසි ඡන්දස් අතුරෙන්:

සඛ්‍යෙය'ව විගුණෙකුණා විත්‍ථාරායාම සණ්ඨාවෝ,
වුත්තසසඳ්ධනතරානඤ්ච ගරුලාතඤ්ච අඞ්ගුලං-යි

නිර්දිෂ්ට ක්‍රමයෙන් විනතා කටයුතු වූ තවලක්ෂ පණස්දහස් දෙයිය සැත්තෑ දෙකක් පමණ අතුල් ඇති භූමි ප්‍රදෙශයෙක්හි:

පත්‍ථාරෙ සබ්බගෙ පාදෙ පුබ්බගාධොලපරෙ සමා,
ප්‍රබෙඛ ගුරුතෙවමිමෙ කත්තබබා යාව සබ්බලෝ-යි

දක්වන ලද ක්‍රමයෙන් සවීගුරුපාදයෙහි පටන් යම්තාක් සවීලඝුපාදය ද, ඒ තාක් ප්‍රසථාර කටයුතු වූ දෙතිස් දහස් සත්සිය අට සැටක් පමණ වෘත්ත හා එහි සත්ලක්ෂ සත් තිස්දහස් දෙයිය අසූ වක් පමණ මාත්‍රා ඇති අතිශක්වරී නම් ඡන්දසෙහි:

එකාදිනුක්කමෙනඛෙක ප්‍රබ්බාධෝ දිගුණෙ ලිඛෙ,
මිසසිතෙහි ලහුථෙහි සෙකෙහුදදිථකම්භවෙ-යි

නිර්දිෂ්ටවූ උද්දිෂ්ටවිධියෙන් විඛ්‍යජනයන් විසින් විනතා කටයුතුවූ, සාරසිය සතළිස් වන තැනින් පළමුවෙනි විෂම පාදය හා එසේ ම මෙම ඡන්දසෙහි දසතුන්දහස් පසාසූ වන තැනින් දෙවෙනි සම්පාදය හා-එසේ ම අනුසාරදහස් දෙසිය අටක් පමණ අතුල් ඇති භූමිප්‍රදෙශයෙක්හි සවීගුරුපාදයෙහි පටන් සවීලඝුපාදය දක්වා ප්‍රසථාර කටයුතුවූ සාරදහස් සයානුවක් පමණ වෘත්ත හා, එහි සැත්තෑ තුන්දහස් සත්සිය විසිඅටක් පමණ මාත්‍රා ඇති ජගතී නම් ඡන්දසෙහි තුන්දහස් සාරසිය සතළිස්සවෙනි තැනින් තුන් වෙනි විෂම පාදය හා-එසේ ම දෙලක්ෂ සාරදහස් අටසියයක් පමණ අතුල් ඇති භූමිප්‍රදෙශයෙක්හි සවීගුරුපාදයෙහි පටන් සවීලඝු පාදය දක්වා ප්‍රසථාර කටයුතුවූ අටදස් එක්සිය අනුදෙකක් පමණ

වෘත්ත හා, එහි එක්ලක්ෂ පණස්නවදස් සත්සිය සතළිස් සතරක් පමණ මාත්‍රා ඇති අති ජගති නම් ඡන්දසෙහි තුන්දහස්දසකාභූවන තැනින් සතරවෙනි සම්පාදය හා - මෙසේ ඡන්දඃකුයෙහි සතර සථානයකින් පාද සතර ගෙණ එක්තරා වෘත්තයකට නම් ලද්දාවූ මේ ගාථාවගේ නවපදයෙහි ම අර්ථ වර්ණනාකරන්නා තබා එක්පදයෙක අර්ථ විශෙෂයෙන් වර්ණනා කරතහොත් බඹලොව උසට ශාරීපුත්‍රාදි කිසිකෙණෙකුන් විසින් පොත් ලියා රැස්කළ ත් නොපිළිවන. එතකුදුවුව ත් බඹලොව විවාළවුන්ට ඔස්තාසංඥවෙන් මේ දිසාවෙහි ය සි දක්වන්නා සේ, චූල ධම්කරකයෙන් ගත්නා මුනුදු පැත් සේ, සූචිකාඡ්‍රයෙන් අවලෝකනය කරණ අනිලපථය සේ තමන්ගේ ප්‍රඥාශක්‍තිවූ පරිද්දෙන් ඒ නවපදය අතුරෙන් "බුඛො" යන මේ අක්ෂර දෙකකින් උපලක්ෂිතවූ පදය ගෙණ:-

සබෙබ සඞ්ඛතාසඞ්ඛතෙ ධම්මෙ අබුජ්ඣි බුජ්ඣති බුජ්ඣිස්ස තීති, වා-බුඛො.

සබෙබ, සියලු; සඞ්ඛතෙ, ප්‍රත්‍යයොත්පන්න ධර්මයන්; අසඞ්ඛතෙ, අප්‍රත්‍යයොත්පන්න (නිවන් පරායණ) ධර්මයන්; අබුජ්ඣි, (භූත කාලාඛ්‍ය අතීතකාල වශයෙන්) දනී නුසි හෝ; බුජ්ඣති, (වර්තමාන කාලාඛ්‍ය ඒතරහිකාල වශයෙන්) දනීනුසි හෝ; බුජ්ඣිස්සතීති, (අනාගත කාලාඛ්‍ය සාම්පරායික) කාලවශයෙන් දනීනුසි හෝ; බුඛො, බුඛ නම්. යන වාක්‍යයෙහි - බුධඤ්ඤණෙ - ධාතු බුධ, සි තබා, "භුවාදයො ධාතවො" සි ධාතුසංඥකොට, "ධාතුස්සනෙතා ලොපො නෙකසරස්ස" සි ධාත්වන්ත ලොප් කොට, "බුධගමාදිභ්‍යො කත්තරි" සි ත ප්‍රත්‍යය කොට, "ධසහෙහි ධසා ච" සි ධා දෙඛකොට, "හව තුත්‍ථාතමන්නානං දෙ ධෙ" සි දකාර කොට, "පච්චයාදනිච්ඨා නිපාතනා සිජ්ඣන්ති" සි පස සබඳ කොට, පසසබඳ නිමිතින් කින් සංඥකොට, කින් සංඥනිමිතින් නම්වත් කොට,

"ජිනවචන යුත්තං හි" යනු කෙවල මාගධයෙහි ප්‍රපතිත වන්නෙහි "ලිඟව නිපච්චතෙ" සි ජිනවචනානුකූල කොට, ව්‍යඤ්ජන සංඥසුතුරෙන් ව්‍යඤ්ජන සංඥකරණ ලද ස්‍යාදීන් කෙරෙන් අර්ථාත්‍රය "වත්තිච්ඡානු ප්‍රබ්බිකා සඳපපවත්තී" සි යුක්තීන් ගන්නේනුදු "ඉච්ඡා ව යථා තන්ති" සි ප්‍රඥාවාරිහු වක්තෘ විවක්ෂාව ද පාලිවූ පරිද්දෙන් මිස තමන් කැමැත්තෙන් ශාස්ත්‍රයට විරොධ කොට නොගන්නේයි කි පරිද්දෙන් අවලොකනය කොට, අර්ථමාත්‍රෙක වචන සිව්හකනි කොට, ප්‍රථීසවර ලොප් කොට, පරසවරයහට

අසමාන වර්ණ මත්තෙහි ප්‍රතිෂේධ කොට, සවර රහිත ගතකුරු විබත්පර පණතුරු කරා පමුණුවා, විබත් අන්තගෙයින් පදසංඥ කොට, "බුදධා" යි පදය සිඩකොට ගෙණ, ඒ පදය ද:

පදං චතුබ්බිධං වුත්තං නාමාඛ්‍යාතොප සඟ්ගහං,
නිපාතජඤ්ච තඤ්ඤැහි අසෙසා බලවනිධාවති-යි

දක්වන ලද නාමාඛ්‍යාතොපසර්ග නිපාත සඞ්ඛ්‍යාත චතුර්විධ පදයන් අතුරෙන්:

අත්ථං තමනන්'ති නාමානි, —අථ වා—අත්තති අත්ථානි තම යන්'ති නාමානි' ඇදි විභත්‍යන්තානි—යි ඉති උක්තප්‍රකාර අර්ථ ඇති නාම-නාමපදය යි කියා ද.

නාම නාමං සබ්බනාමං සමාසං තද්ධිතං තථා,
කිතනාමඤ්ච නාමඤ්ඤ නාමං පඤ්ච විනිද්දිසෙ-යි.

දක්වන ලද නාම නාමය, සබ්බ නාමය, සමාසානන්ත නාමය, තද්ධිතානන්ත නාමය, කිතකානන්ත නාමය, යන පඤ්චවිධ නාමයන් අතුරෙන් කිතකානන්ත නාමය යි කියා ද:

පුල්ලිඞ්ගං ඉත්ථිලිඞ්ගං ච නපුංසකමථාපරං,
තිලිඞ්ගඤ්ච අලිඞ්ගඤ්ච නාම්කං පංචධා මතා-යි.

දක්වන ලද පුල්ලිඞ්ගනාමය, ස්ත්‍රීලිඞ්ග නාමය, නපුංසකලිඞ්ග නාමය, තිලිඞ්ගනාමය, අලිඞ්ගනාමය, යන පඤ්චප්‍රකාර නාමයන් අතුරෙන් පුල්ලිඞ්ගනාම ය යි කියා ද.

පඨමා දුතියා තතියා චතුත්ථී පඤ්චමී තථා,
ඡට්ඨී ච සත්තමී වෙති විභත්ති සත්තධා මතා-යි.

දක්වන ලද ප්‍රථමා විභක්තිය, ද්විතීයා විභක්තිය, තෘතීයා විභක්තිය, චතුර්ථී විභක්තිය, පඤ්චමී විභක්තිය, ෂෂ්ඨී විභක්තිය, සප්තමී විභක්තිය, යන සප්තවිභක්තීන් අතුරෙන් ප්‍රථමෛකවචන නාමික පදයැ යි කියා ද, ශබ්දශාස්ත්‍රානුකූල කොට දක්වා පුනරපි තදාදී වර්ණනාවාරයෙන් ප්‍රකරණය මහත්කරණු පිණිස:

බුඩොති කෙනටෙඨන බුදධා - බුධ ඉති, බුදුනැ යි යන මේ නාමය (නොහොත්) බුදුනැ යි කියා - කෙනටෙඨන, කවර අර්ථය කින්; බුඩො, බුඩ නම් වනසේක් ද? කවරකෙණෙකුත් විසින් බුඩ යන මේ නාමය කරණලද දැ යි චෝදනා කළෝ:

බුඩොති නෙතං නාමං න මාතරා කතං, න පිතරා කතං, න භාතරා කතං, න භගිනියා කතං, න මිත්තාමච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතා, න සමණ බ්‍රාහ්මණෙහි කතං, න දෙව තාහි කතං-සි යනු දම්සෙතෙව් සැරියුත් මහතෙරුන්මහන්සේගේ නිදේශපාඨයෙහි ආ නෙයිත් ලොකයෙහි මාතා පිතා ජ්‍යෙෂ්ඨ භ්‍රාතා භගිනි මිත්‍රාමාත්‍ය ඥාති සාලොහිත ශ්‍රමණ බ්‍රාහ්මණාදි යම්කිසිවක්හු විසිනුත් තබන ලද නම් ඇත ත් සදෘස ව මේ බුදුහැ සි යන නාමය මහාමායාදේවීන් විසින් හෝ සුඩොදන තරජතීහු විසින් හෝ, ජ්‍යෙෂ්ඨ භ්‍රාතා භගිනි කෙණෙකු විසින් හෝ, මිත්‍රයකු විසින් හෝ අමාත්‍යයකු විසින් හෝ, ඥති සාලොහිත ය සි කිහන ලද ඥතීන් සම්බන්ධවූ අශීතිසහස්‍ර බන්ධුත් අතුරෙත් යම්කිසි කෙණෙකුන් විසින් හෝ, ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙකුන් විසින් හෝ, ශක්‍රාදි දෙවියෙකු විසින් හෝ, කරණ ලද නාමයක් නොවෙයි කියා විසර්ජනය කළෝ.

එසින් කිහ - විශුද්ධිමාර්ගයෙහි.

න මහාමායාය න සුඩොදන මහාරාජෙන න අසීතියා ඤති සහසෙසහි කතං න සක්‍ක සනඤුසිතාදීහි දෙවතා විසෙසෙහි-සි'

යම්කිසි ඥෙය ධර්මයෙක් ඇද්ද ඒ සියළු ඥෙයධර්මය දන් නෙයින් විමොක්ෂඥානික ඥත්වශයෙන් බුඩ නම් වනසේක.

හෙද කිහ - බුඩඝොෂ මහතෙරහු.

යං කිඤ්චි අත්ථි ඤෙය්‍යං නාම සබ්බස්ස බුද්ධතනා විමොක්ඛ නානික ඤාණවසෙන බුඩො-සි.

විමොක්ෂඥානික ඥතය නම් කවර යත්? සියලු කෙලෙසුන් කෙරෙන් මුක්තවන බැවින් රහත්මග විමොක්ෂ නම් වෙයි. ඒ විමොක්ෂයාගේ අවසානයෙහි උපදනා බැවින් රහත්ඵලය විමෝ ක්ෂඥාන නම් වෙයි. රහත්ඵලය ලද කල ලැබියයුතු බැවින් සවිනේ දන්නා නුවන විමොක්ෂඥානිකඥන් නම් වෙයි.

මෙම කිහ - විශුද්ධිමාර්ග පිකාවෙහි.

සබ්බසො පටිපක්ඛෙහි විමුච්චතී'ති විමොක්ඛා-අග්ගමග්ගො තස්ස අනෙතා අග්ගඵලං, තත්ථ භවං, තසමිං ලද්ධෙ ලද්ධබ්බතො විමොක්ඛ නානිකඤාණං සබ්බඤ්ඤුතඤාණෙන සද්ධිං විමොක්ඛ නානි ක ඤාණං-සි:

සක්ඛාශ්‍රවයන් වහන්සේ ද රහත් ඵලයට පැමිණෙනසේක. බුදුන්ගේ වෙනස කිම යත්? ශ්‍රාවකයන් වහන්සේගේ වනාහි ප්‍රාදෙශික ඥාන ය. බුදුන්ගේ ඥාන ය සර්ව්වඥතාඥාන ය. ශ්‍රාවකයන් වහන්සේලා දඹදිවැ නොයෙක් සථානයෙහි රහත්වනසේක. අග්‍රශ්‍රාවක-මහා ශ්‍රාවකයන් ප්‍රත්‍යන්තදෙශාදියෙහි කොං උපදනා බව මුත් දඹදිව්හි අසවල් සථානයෙහිදී ම රහත්වනසේකැ යි යනු, නියමයෙක් දක්නට නැත. සර්ව්වඥයන්වහන්සේ වනාහි දඹදිවට නාභිමඩලාකාරවූ සර්ව්ව මුනිවරාවිජහිතසථානයවූ බොධිද්‍රැමමූලයෙහි දී ම දසපෙරුම් බෙලෙන් පස්මරුන් බිඳ බුදුවනසේක. එහෙයින් භගවත් බුඩයන්ට බොධි මූලයෙහි සර්ව්වඥතාඥාන ප්‍රතිලාභය හා සමග අර්හත්ඵලය උපදනේ ම සර්ව්වඥතාඥානාදී සියලු බුදුගුණ හා සමග උපදී. සර්ව්වධර්මයන්ගේ සාක්ෂාත්ක්‍රියාව නිමිත්තකොට ඇති ප්‍රඥප්තියක නොවත් ප්‍රත්‍යක්ෂ සිඛ ප්‍රඥප්තියක යන අර්ථ යි-ඒ ප්‍රඥප්තිතොමෝ යම් ගුණයක් නිමිත්තකොටගෙණ ඇත්තී ද, ඒ ගුණයෝ තථාගතයන්ට ප්‍රත්‍යක්ෂ යෝ නු යි ඒ ගුණයන් මෙන් ප්‍රඥප්තිය ද සාක්ෂාත්කෘත නම් වෙයි. අනුන්ගේ ව්‍යවහාරයකින් ලද නාමයෙක් නොවෙයි. බොධිද්‍රැමමූලයෙහිදී සිඛ වූ සර්ව්වඥතාඥානය කාරණකොටගෙණ උපන් නමෙකි

එහෙයින් වදාළහ: දම්සෙනෙවි සැරියුත් මහතෙරහු එම් නිදේශයෙහි-

විමොක්ඛන්තිකමෙතං බුඩ්ඛානං භගවන්තානං බොධිමූලෙ සහ සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුඩ්ධො-ති

තව ද ලොකයෙහි ආවසථිකය, ලෛඛ්‍යිකය, නෛමිත්තිකය, අධිත්‍යසමුත්පන්නය යි කියා නාමය චතුර්ව්විධ හෝ වේ.

කියේ මැනෝ - විශුඛිමාර්ගයෙහි

චතුබ්බිධං වා කාමං ආවත්ථිකං ලිඞ්ගිකං නෙමිත්තිකං අධිච්ච සමුප්පන්නං-ති.

එහි කොලුය, කෙළිය, වසුය, වැසිය, ලදරුය, ලදුරිය, මිහලුය, මැහැලිය යනාදී වශයෙන් සත්වයන්ගේ ඒ ඒ අවස්ථා බලා කියනලද නාමය **ආවසථික** නම් වෙයි—කලුය, හෙලලුය, කුරුය, කුදුය, කෘශය, සථූලය, සිඛණ්ඩිය, කුන්තයාය, පලඟයාය, ඡත්ත පාණිය, දණ්ඩපාණිය, යනාදී වශයෙන් සත්වයන්ගේ සංඥව නිසා කියන නම් **ලෛඞ්ගික** නම් වෙයි—ධර්ම්මධරය, පණ්ඩිතය, බහුශ්‍රැතය, සථවිරය, ශ්‍රොතාපන්නය, ආර්ය්‍යය, සර්ව්වඥය, දශබලධරය යනාදී

වශයෙන් සත්වයන්ට පැමිණියාවූ ගුණධර්මයන් ගෙණ කියන නම් **නෛමිත්තික** නම් වෙයි — සිරිවඩ්ඩය, ධනවඩ්ඩය, අජිතය, සිබාළිය, ගෞතමය, ශාක්‍යසිංහය, ආදිත්‍යබන්ධුය, පරාක්‍රම්බාහුය, වික්‍රමබාහුය, වීරබාහුය, විජයබාහුය, ජයබාහුය, නිශ්ශඞ්කමල්ලය, ත්‍රිභුවනමල්ලය, සාහසමල්ලය, භුවනෛකබාහුය, ගජබාහුය, යනාදි වශයෙන් සත්වයන්ගේ ඉච්ඡානුරූපවූ පරිද්දෙන් තබාතලද නාමය **අභිත්‍යසමුත්‍යන්න** නම් වෙයි. මේ චතුර්විධනාමයන් අතුරෙහි බුඩ යන නාමය බොධිද්‍රැම මූලයෙහි දී ලත් ගුණ ධර්මය හෙයින් ද, නෙවත් චතුඃසත්‍යය දත් හෙයින් ද, ඒ චතුඃසත්‍යය අසඳෘකෝණඩසඳෘදීන්ට දැන්වූහෙයින් ද, මේ ආදී ගුණය ගෙණ ප්‍රසිඩවූ හෙයින් **නෛමිත්තික** නාම නම් වෙයි.

එහෙයින් වදළහ. 'බුඩොති කෙනටේඨන' යනුවෙන් තමන් විසින් කළ වොදනාවට පරිහාර දක්වන දම්සෙනෙවි සැරියුත් මහ තෙරහු විසින්:

බුජ්ඣිතා සච්චානී'ති බුඩෝ, බොධෙතා පජායාති බුඩෝ, සබ්බඤඤුතාය බුඩෝ, සබ්බදස්සාවිතාය බුඩෝ, අනඤඤ ඤෙය්‍යතාය බුඩෝ, විසවිතාය බුඩෝ, ඛීණාසව සංඛාතෙන බුඩෝ--යනාදී:

බුජ්ඣිතා සච්චානීති බුඩෝ – සච්චානි, භවස්‍රඛාසඛාද ග්‍රථිත සත්වයන්ට සංවෙග ජනනය වන පිණිස දෙසූ ජාති ජරා ව්‍යාධී මරණාදිවූ සංසාරව්‍යසනය දුක්ඛඃනත්‍යෂයි කියා ද, දුක්ඛඃට භව හෙතු දක් වනු පිණිස තදනන්තර කොට දෙසූ කාම භව විභව වශයෙන් ත්‍රිධානිත්‍යාවූ ආධ්‍යාත්මික බාහිර වශයෙන් ෂඩාලම්බනයෙහි අතීතානාගත වර්තමාන කාලභෙදයෙන් අෂ්ටොත්තරශත ප්‍රභෙදවූ තෘෂ්ණාව සමුදය සත්‍යය යි කියා ද, ශීලවිශුඩි චිත්තවිශුඩි දෘෂ්ටිවිශුඩි කාඞ්ඛාවිතරණවිශුඩි මාර්ගාමාර්ගඥාන දර්ශනවිශුඩි ප්‍රතිපදඥානදර්ශනවිශුඩි ඥානදර්ශනවිශුඩි ආදීවූ සප්තවිශුඩි පරම්පරාවෙන් ප්‍රත්‍යක්ෂ කටයුතුවූ යථොක්ත දුඃඛයෙන් අභිභූත වන බැවින් කළකිරුනු සිත් ඇති සත්වයන්ට ප්‍රතිඡ්ඡා දක්වා ආසවාද උපදවන පිණිස දෙසූ ඡාත්‍යාජරා මරාමෘතමහානිර්ඛාණය නිරෝධසත්‍යය යි කියා ද, ඊට ඉක්බිති ව නිරෝධාධිගමය පිණිස දෙසූ සම්‍යක්දෘෂ්ටි ආදිවූ මඞ්ගම ප්‍රතිපදව මාර්ගසත්‍යය යි කියා ද, මෙසේ සත්‍යඥාන කෘතඥාන කෘත්‍යඥාන සංඛ්‍යාත ත්‍රිපරිවෘත්තයක් හා එකෙකි සත්‍යය තුන් තුන් ආකාරයන්ගේ වශයෙන් ද්වාදශාකාරයක් ඇත්තාවූ දුඃඛසත්‍යයෙහි පීළනටඨය, සංඛතටඨය, සන්තාපටඨය, විපරිනාමටඨය යන සතර

ධර්මයන්ගේ වශයෙන් ද, සමුදය සත්‍යයෙහි ආයූහනට්ඨය, සංයෝග ට්ඨය, නිදානට්ඨය, පළිබෝධට්ඨය යන සතරධර්මයන්ගේ වශයෙන් ද, නිරෝධ සත්‍යයෙහි නිස්සරණට්ඨය, විවෙකට්ඨය, අසඞ්ඛතට්ඨය, අමතට්ඨය යන සතර ධර්මයන්ගේ වශයෙන් ද, මාර්ගසත්‍යයෙහි නියාානට්ඨය, හෙතුට්ඨය, දස්සනට්ඨය, ආධිපතෙය්‍යට්ඨය යන සතරධර්මයන්ගේ වශයෙන් ද, මෙසේ එකෙකි සත්‍යය සතර සතර ධර්මයන්ගේ වශයෙන් ෂොඩශාකාරයක් ඇති පූරිත පාරමීධර්මයන්ගේ හෙතුයෙන්:

බොධිද්‍රැමමූලයෙහි කෙලාශක්ෂය කළ සර්ඥවරයන් විසින් ප්‍රශසාකොට වර්ණනාකර වදාරණ ලද්දවූ චතුරාය්‍යීසත්‍යධර්මයන්-දූරෙ නිදානය, අවිදූරෙ නිදානය, සන්තිකෙ නිදානය යන මේ ත්‍රිවිධනිදාන යන් අතුරෙන් අවිදූරෙනිදානාවසාතයෙහි යථාක්‍රමයෙන් ප්‍රවෘත්ති හෙතු නිවෘත්තිහෙතු ආදි වශයෙන් තත්ථ්‍යාවිපරිතභාවයෙන්, ආයා ඥානයෙන්, පරොපදෙශ රහිත ව දන්නෙයින් බුඩ නම් වන සේකැයි නියා ද විස්සර්ජනය කළෝ.

තව ද මෙහි දැක්වූ ත්‍රිවිධ නිදානය නම් කවරහ ගත්? දීපඞ්කර පාදමූලයෙහි කෘතාභිනීහාර ඇති මහසත්ත්‍වයාගේ යාවත් විඥානාන්මභාවයෙන් සැව තුසීපුරයෙහි උත්පත්තියෙක් ඇද්ද, තාවත් ප්‍රවෘත්තිවූ කථාමාර්ගය වනාහි **දූරනිදාන** නම් වේ.

එයින් කීහ.

දීපඞ්කර පාදමූලසමීං හි කතාභිනීහාරස්ස මහාසත්තස්ස යාව වෙස්සන්තරත්තභාවා චවිත්වා තුසිතපුරෙ නිබ්බත්ති තාව පවත්තෙතා කථාමග්ගො දූරෙනිදානං නාම—යි.

තුෂිතභවනයෙන් සැව යථාක්‍රමයෙන් ගොස් යාවත් විජයපාදප මූලයෙහි වූ විදුරුමුවා මඞ්ගල පය්‍යඞ්කාරූඪ ව සසෙන මාරසෙනාරි ජය ගෙණ සර්ඥතාඥානප්‍රාප්තිය ද තාවත් ප්‍රවෘත්ති කථාමාර්ගය වනාහි **අවිදූරෙ නිදාන** නම් වේ.

එයින් කීහ.

තුසිතභවනතො පන චවිත්වා යාව බොධිමණ්ඩෙ සබ්බඤ්ඤුතං පපත්ති තාව පවත්තෙතා කථාමග්ගො අවිදූරෙ නිදානං නාම—යි

සන්තිකෙ නිදානය වනාහි තත් තත් ස්ථානයෙහි විහරණය කිරීමෙන් ඒ ඒ ස්ථානයෙහි මි දක්නා ලැබේ.

එයින් කීහ.

සන්තිකෙ නිදානං පන තෙසු තෙසු ඨානෙසු විහරතො තසමිං තසමිං යෙව ඨානෙ ලබ්භති—යි.

මෙසේ සංක්ෂේපයෙන් ශාස්ත්‍ර ධර්ම දෙකට අනුකූලකොට විභාග කළෝ.

එසේ විභාග කළ බුඩඝඛදය ගෙණ ශ්‍රී ලංකෙශ්වර වූ නුපාලො ත්‍තාමයානන්ගේ ආරාධනාවෙන් ධර්ම ප්‍රකරණයක් කරණු ලැබෙයි· නෙවත්:

ශ්‍රී ලඞ්කාඞ්ගණා භරණ ප්‍රතිනාගානිධවල පුලිනතල උභයතීරා ලංකාභ නෙක ජලවර කදම්බ ලුලිත ශිශිර නිකුඤ්ජ ගම්භිරෝ ත්තුඛඝ භරඞඝ භාඞඝාකුල මහාවාලුකාඛඝනා නමැති ජලපරිඛායෙ න් පරික්ෂේපවූ නෙක සුරපති මෞලි මණිකිරණ රඤ්ජිත පාදත්ත ඇති අනාථ නාථ නාථානිධාන දිව්‍යරාජයාගේ ලඞ්කාඞ්ගනෙ ත්තමාඞඝධර රජතකිරීටයක් සේ සොභමාන වූ දෙවමන්දිරයෙන් ද,

එසේ ම සකල ලඞ්කා ශාසන පරිපාලන සුරෙන්ද්‍ර ප්‍රයෝජිත ක්‍රූරතර යක්ෂ රාක්ෂසාදී භයංකර වක්‍රායුධ ධර හස්ත ඇති විෂ්ණුදිව්‍යරාජයාගේ වෛජයන්ත ප්‍රාශාද නිර්විශෙෂ දෙවමන්දිර යෙන් ද, එසේ ම අනෙක ශත දෙවගණ රාජහංස නිසෙවිත සරොරුහ කානනාකාර පාදයුගලොප ශොභිත සකඞ්කුමාරානිධාන දිව්‍යරාජයාගේ දෙවමන්දිරයෙන් ද, සුරාඞ්ගනා ලඞ්කෘත වූ නගර මධ්‍යයෙහි සුප්‍රතිෂ්ඨිත මූලසකඞ්ඛ විටප ශාඛාදීන් සමලඞ්කෘත වූ කල්පද්‍රුම සඞ්කාශ විජය පාදප සාඛ්‍යාත බොධිද්‍රුමයුග්මයකින් ද, ශීලවෘත ධුතගුණෛක භාජන සංඝගණ නිසෙවිත **උපොසථා රාමය** යන මහාවිහාරයකින් ද, එසේ ම සුඛාවබොධ කරණලද බෞඛාගම ඇති ශීලාචාරාදී ගුණසමපන්න සංඝගණ නිසෙවිත මනොරම්‍යවූ **අස්ගිරිවිහාරය** යන පූජිතාම ප්‍රකාශිත මහාවිහාරය කින් ද ශොභමානවූ:

ශිශිරකර කර නිකරොවරණාකාර සුධාපණ්ඩරොත්තුඛ ඝනාගරවරණොපකාරිකාලඞ්කෘත විවිධ රත්නකම්මනෙත්‍රාඤ්ච ලිත දොර කෝෂ්ඨකොපශොභිත ක්ෂීරොදධි ශිඛරාකාර අනිඛවල සකිගඛ ශුඛ්ඛ මෘදු පුලිඛඝ විප්‍රකිණ්ණාඞඝ විවිත්‍ර චිත්‍රකම්මනා-ලඞ්කෘත නිත්තනිසනමඝ සොපාන මාලකොපශොභිත ගිත්තාල සාරපට්ටිකා බද්ධ ඉෂ්ටිකා ඡදනාග්‍රාවලම්බමාන ප්‍රවාලදාම මුක්තාජාල චාමීකර රජත බොධිපත්‍රාලඞ්කෘත නෙමසජ්ඣු මණිදන්තකම්මාදි භාසුර දොර යොජිත උපරි ප්‍රාශාදතලගත සුවර්ණ රජත මණිතාර කාගෙන් විරචිතොජ්වලිත උඩ්ඩව විතාන ඇති පූජොත්සවයට දිව්‍ය

ලොකාගත දිව්‍යනාටක ප්‍රතිභාග මඤ්ජුනිල කම්පිත රජත සුවර්ණමය ධවජ පතාකා ලොකයෙන් හා සුභාසුරමාන මණිමුක්තාදි රත්නා ලොකයෙන් හා සතතොජ්වලිත සුරභි සුගන්ධ තෛල ප්‍රදීපාලෝ කයෙන් විගතාන්ධකාර ඇති—

විවිධ ද්‍යුති නිකර විභිද්‍රනා කාශි කොශලාදි අනර්ඝවස්ත්‍රයෙන් බදනාලද වටතිර ඇති කනක රජත මෞක්තික වජ්‍රේන්ද්‍රනීල පද්මරාග වෛඩූර්‍යය ශංඛ ශිලා ප්‍රවාලාදී අනෙක සහශ්‍රානර්ඝ රත්නයෙන් සුවර්ණකම් රජතකම් අයස්කම් දන්තකම් මාලාකම්දි යෙහි දක්ෂ විවක්ෂණ ශිල්පාචාරීන් ලවා සහස්‍රාක්ෂ වජ්‍රපාණ්‍යාසනා නිනවනියාකාර ව කරවණ ලද වජ්‍රාසන මඤ්චකයෙහි සමාසන සඩාධිපති හිරණ්‍යගර්භොත්තමාඞ්ගධර විචිත්‍ර රත්න කිරීටානිභ වනීය වූ විසිතුරු රුවන්කරඬුවෙහි වඩනලද බ්‍රහ්මාමර නරනාගාදී මෞලිමණි ත්‍රිමර පරිවුම්බිත පාදපංකජොපෙත ජීනවර **ශ්‍රී දන්ත ධාතූන්වහන්සේගේ** රත්නාවල සහස්‍රපරිවෘත හිමවත් පර්වතානි භවනීය ත්‍රෛභූමික ප්‍රවර ප්‍රාසාදමණ්ඩපයෙහි ශිශිර මරීචීන් දශදික් බබුලුවා උදයගිරි පර්වතොජ්වලිත ශරච්චන්ද්‍රානි භාවනීය අනගි මණි බැඳි රුවන්කොතෙහි ආලොකයෙන් විගතාන්ධකාර ව බබලන්නාවූ—

ජනපද නිගම ග්‍රාමාරණ්‍ය පර්වතශිත ශිඛර නිර්ඣර කන්දර නන්තරාදීන් සහිත වූ තාල හින්තාල නාග පුන්නාග ජම්බු ජම්භීර නින්ත්‍රිණී ශ්‍රී ඵල කපිත්ථ මාතුලුඞ්ග බීජපූරක නාලිකෙර පනස චම්පක ශාල කෙතක මන්දාරික නිකරාදී නිත්‍ය ඵල කුසුම භර සණ්ඩ මණ්ඩිත ආරාමෝද්‍යානොපවනයෙන් හා සුප්‍රසන්න ශිශි රොදක සම්පූර්ණ විකශිත නීරජ කානන සඤ්චාරිත මධුකරයන්ගේ මධුරනාදයෙන් හා ජලචර පක්ෂීන්ගේ රාවප්‍රතිරාවයෙන් යුක්ත වාපි ප්‍රෂ්කරණීන්ගෙන් සකලජන මනොනන්දනීය වූ—

ධරණීතල සජනාඞ්ඝ ප්‍රතිෂ්ඨිත අඤ්ජනගිරි ප්‍රතිභාග සුන්දර ශරීරොපලක්ෂිත ප්‍රබල දුනී ප්‍රාකාර ගොපුරද්වාර හෙදන සුශික්ෂිත නීල මේඝ ගහී විනිගීත විද්‍යුල්ලතායුගල සශ්‍රීක දන්තයුගලොප ශොභිත සංග්‍රාමාඞ්ගසම්පන්න නිඛිල මඞ්ගල්‍ය ලක්ෂණාන්විත අඛිල හස්ත්‍යලංකාරයෙන් සරහනලද හස්තිසෙනාවගෙන් ද, අනෙක දෙශොත්පන්න ප්‍රසිද්ධානිල සංඝාශ ජවබල සම්පන්න විෂ්ඵුලිංග විනිගීත ඛුරසංඝට්ටන අවිර ප්‍රභාකර සෘජු ධාවන අලාතචක්‍රාකාර

වෘත්තධාවනාදී යුද්ධාඞ්ග සුශික්ෂිත ක්ෂීරෝදධි තරඞ්ග නිර්විශෙෂාති ධවල සර්ව මඞ්ගල්‍ය ලක්ෂණාන්විත ප්‍රවර තුරඟසෙනාවගෙන් ද, සෙනෙවිඡිත්‍ර ධාරිත රාජපයඞ්කො ඊවලිත නෙක කම්මන්තා ලංකෘත භූජඞ්ගරිපුවෙට සාඞ්ගෘශ ජවබල සම්පන්න වර තුරඞ්ග යොජිත ප්‍රවර රථසෙනාවගෙන් ද, ධනුශ්ශිල්ප ඛඩ්ගශිල්පාදියෙහි කෘතාභ්‍යාස ඇති ආරොහ පරිනාහසම්පන්න ප්‍රාංශවික්‍රමාන්විත ශක්ති තොමරාදි විවිධායුධ සන්නද්ධානෙක පාබලසෙනාවගෙන් ද, යන චතුර චතුරඞ්ගිනී සෙනාවගෙන් සංකීර්ණ වූ—

නෙක දෙශාගත ශෘඞ්ගාරි වාණිජ ජනයාගේ දශවිංශත් ත්‍රිංශත් චත්වාරිංශත් පඤ්චාශත් දශදශකාදී අගය ඇති හිරිණ්‍ය සුවර්ණාදී භාණ්ඩපුටයන් තබා භෙදනය කරණහෙයින් **පුට භෙදන** නම් වූ ක්ෂීරාර්ණව ශිඛරාකාර සුවිශුද්ධ වාලුකා විප්‍රකීර්ණ ශ්‍රෙතවර්ත්ත සුවිභක්ත භූමිභාග හා පීති මණ්ඩප චතුෂ්ක සිංඝාට ඇති අමරගන සදෘශානිරාම රූපශොභාග්‍රප්‍රාප්ත විශිෂ්ඨ නර නාරි සම්මර්දයාගෙන් හා, අක්ෂර ලිඛිත ගණිත ගන්ධර්ව ඡන්දස් නිඝණ්ඩු වෛය්‍යාකරණාදී ශාස්ත්‍රයෙහි දක්ෂ අනෙවිධ පණ්ඩිතජනයන්ගෙන් සමාකීර්ණ වූ—

නීල පීත රක්ත පණ්ඩරාදී ප්‍රභෙද වර්ණ ඇති නෙක දෙශොත්පන්න විචිත්‍රානඞ් වස්ත්‍රාපණ පඞ්ක්තීන් හා ආශිංසනීය කනක රජත ප්‍රවාළ මෞක්තිකාදි රත්න ඝජිත රත්නාපණ පඞ්ක්තියෙන් ද, සුප්‍රසාරිතානෙක චම්පක වකුල සුමන කෙතකාදි කුසුම පණ පඞ්කතීන් හා රුචිර සුරභී කර්පූරාගරු වන්දන කුංකුම නක්තකාල ජාතිඵලෛලාදි සුගන්ධ ද්‍රව්‍ය පරිපූරිතානෙක ගන්ධාපණ යෙන් හා ප්‍රදීප්තමාන නිධි නිකෙතපඞ්කතීන් ශොභමාන වූ—

සකල ජන තුෂ්ටි ජනනීය කොෂ්ඨාගාර පඞ්කතීන් හා ශ්‍රමණ බ්‍රාහ්මණාදීන්ට තබා දෙන ලද ඛාද්‍ය භොජ්‍ය ලෙය්‍ය පෙය්‍ය ශායනීය සංඛ්‍යාත පඤ්චවිධ ආහාර සඤ්ජීන විශාල දානශාලායෙන් ප්‍රතිමණ්ඩිත වූ—

විවිධ චිත්‍ර දෘඤ්චාල කොෂ්ඨ කවර ප්‍රවර ගොපුර තොරණොපශොභිත පරශස්‍යා අනිනන්දනීය වූ සුධාකම් නිර්මිත ඝනතර පණ්ඩර ප්‍රාකාර පරික්ෂිප්ත හිමගිරි සංඝාශානෙක වර භවන පරිවාරිත ඒකභූමික ද්විභූමික ත්‍රෛභූමික රාජභවනශ්‍රීන් සමලංකෘත වූ—

පූර්වාරම් වශයෙන් **සෙඛණ්ඩ ශෛලාභිධාන** වූ ක්ෂත්‍රිය කුල සම්භූත ජාවිඝ්‍රාහ්‍රයන්ගේ ජයවර්ධන බලවර්ධන ගුණවර්ධන යශෝවර්ධන ධනවර්ධන සුඛවර්ධන කරන්නාවූ **ශ්‍රීඛඩීන** නම් පුර ප්‍රවරයෙහි—

සමිසා ත්‍රිසිංහලයට එකච්ඡත්‍ර නංවා රාජ්‍යශ්‍රී ප්‍රදප්‍රාප්ත ව රාජ තේජස් නමැති ආලෝකයෙන් ශත්‍රුජන නමැති තිමිර නිකර විධ්වංසනය කොට, රාජානුභාව නමැති දිව්‍යෞෂධයෙන් ප්‍රතිපක්ෂ ජන නමැති භුජඟයන්ගේ ක්‍රොධ නමැති විෂ මැඩ, ප්‍රඥ නමැති වජ්‍රාඞ්කුශයෙන් ප්‍රවණ්ඩ ජන නමැති මත්තහස්තීන් සුශික්ෂිත කොට, රාජබල නමැති වජ්‍රායුධයෙන් අමිත පර නරපති නමැති ව්‍යාඝ්‍ර යන්ගේ බල නමැති නඛ සහිත දළ සිද, රාජානුභාව නමැති අයොමුඛරයෙන් සානඛ අභිමානජන නමැති වෘෂභරාජයන්ගේ මාන නමැති ශාඛය බිඳ, දශදිශ් නමැති යෂ්ටිකොටියෙහි විශුද්ධ කීර්ති නමැති දදපෙළ බැන්දවූ ත්‍රිභුවන ජන වන්දනීයවූ සම්භූයන් වහන්සේ මාගේ සූර්‍යගොත්‍රයෙහි ප්‍රාදුර්භූත වූ සේක.

එසේ හෙයින් බුද්ධරතනය ත් මාගේ ම ය. තන්මූඛ සඤ්ජා ත ව ආ හෙයින් ද, තත් ප්‍රතිවෙධ කළ හෙයින් ද, ධම්මරතනය ත් මාගේ ම ය. තදනුරූප ප්‍රතිපත්තියෙහි ප්‍රතිෂ්ඨිත හෙයින් ද, සඞ්ඝ රතනය ත් මාගේ ම ය. මෙබඳු රතනත්‍රය කොශල-බිම්බිසාර අජාතශත්‍රු-ධම්මාශොක-දෙවනපෑතිස්-දුට්ඨගාමුණු-පරාක්‍රමබාහු ආදි මාගේ වංශයෙහි වූ නරදෙවයෝ ම දිවි සේ රක්‍ෂාකළාහු ය. මා විසි නුදු අප්‍රමාද ව ශාසන පරිපාලනය කටයුතු ය සි යන උදුරාද්‍ධ්‍යා සයක් ඇති ව පශ්‍යාප්ති - ප්‍රතිපත්ති - ප්‍රතිවෙධ සංඛ්‍යාත ත්‍රිවිධ ශාසනය පවත්නා ශ්‍රී ලඞ්කාද්වීපයෙහි දික්විජයකොට දශදිශාඛ්‍ය න්තරයෙහි යසොතෙජස් පතුරුවා අසදෘශාඥාචක්‍රයෙන් ශ්‍රෙෂ්ඨ ධම්ම චක්‍රය අභිවර්ධිය කෙරෙමින් ජිනවර ශ්‍රී දන්තධාතූන්වහන්සේට නිරන්තරයෙන් ආනත චිත්තාදී පඤ්චවිධ තූර්‍යනාදයෙන් හා ආහාර දීප ධූප සුගන්ධ පුෂ්පාදී අනෙකවිධ පූජාසත්කාර පැවැත් වීමෙන් ද,

උභය විහාරවාසී මහාසඞ්ඝයාට චීවර-පිණ්ඩපාත-සයනාසන-ගිලාන ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත චතුර්විධ ප්‍රත්‍යයෙන් සඞ්ග්‍රහකිරීමෙන් ද, ප්‍රව්‍රජ්‍යා ලිඟී ශ්‍රද්ධාවන්ත කුලපුත්‍රයන් ශාසනයෙහි පැවිදිකරවා තදනුකූල ප්‍රතිපත්තියෙහි පිහිටුවා ප්‍රත්‍යය ඵලවීමෙන් ද, සකලජනාභිමතාර්‍ථ සිද්ධිය පිණිස පෘථිවි සමුද්භේදකොට පැනනැඟී සුරපාදප සඞ්ඛ්‍යාත මහාකල්පද්‍රුමයන් සෙයින් ලොක ශාසනොපකාරී ව සම්පවිත කුසල

සම්භාරයන් ඇති ව, රතනත්‍රයෙහි ගුණ ප්‍රකාශ කිරීම් වශයෙන් අනිතව ධම්ප්‍රකරණයකුත් කරවා මත්තෙහි පවත්නා ලොකශාසනයට ද, උපකාරී ව එයින් ජනිතවූ කුශල බලයෙන් දිව්‍යබ්‍රහ්ම සම්පත් හා මනුෂ්‍යලොකයෙහි චක්‍රවාළ චක්‍රවර්තිසම්පත් ආදිය විඳ කෙළවර සංසාර කාන්තාරයෙන් එතර ව නිම්ණ්ණපුර ප්‍රවිෂ්ටවූව මැනවැ සි යන කරුණාධ්‍යාසයක් ඇත්තාවූ—

දිවසකර සුනු මනුවංශ මහාසම්මතාභිසම්මත රොජ වර රොජ කල්‍යාණ වරකල්‍යාණ උපොසථ මහාමන්ධාතු වර උපවර පරම්පරාගත සගර සාගර භරත භගීරථාඤ්ජස මහාසුදර්ශන නිර් දිශ්‍ය මඛාදෙව පුත්‍ර නප්පාසනන්තාන නිමි කුස පරිපාලිත රඝු අජ දශරථ රාමාභිරාම ඉක්ෂ්වාකු ප්‍රභව සකල කුලතාර තාරාපතීභූත ධෙෞතසඛප්‍රක්ෂිප්ත ක්ෂීර සලිල නිම්ල අනෙක භූමිපාල මෞලි ලාලිත චරණ යුගලොපශොභිත ධෘති සමෘති ව්‍යවසාදි ගුණ ගණාධි වාස විමල ශීලාලඞ්කාර සතත සමලඞ්කෘත විවිධාමිත ගුණාකර ශ්‍රී නිවාස වාස සදෘනින සකල සද්ගුණ නිර්මිත රූපනිර්දෙශෙ අඛිල ලොක දෘඛ විනොදනය කළ සුඛොදන නරපති ප්‍රභෘති සූයස්‍ය වංශයෙන් තාම්පර්ණිදීපාඛ්‍යාත ශ්‍රී ලඞ්කාද්වීප ප්‍රවිෂ්ට ව–

යථාක්‍රමානිශෙක ප්‍රාප්ත වූ අනෙක නරපති තමැනි තාරහාර ලතායෙහි දීප්තිමත් ව බබලන මධ්‍යමාණික්‍යයක් වැනි වූ, ජිනවර වරණාරවින්ද මෞලිනිජ මස්තකාලඞ්කෘත විවිධ ගුණගණා භරණ විභූසිත සකල ජන පතල කරුණා නිධාත යාචකජන වාතක[1] අනවරත දාන ධාරා ප්‍රවාහ සද්ධම්රාජ ශාසනාභිවර්ධි කර සකල පාපිවිප්පති මධ්‍යකර නිසෙවිත පාදපඞ්කජොපශොභිත අනන්තභොගීන්ද්‍ර භොගාවලී නිර්විශෙෂ රුචිරායත පීණබාහු යුග ලොපශොභිත අනිඳිතාඞ්ග ප්‍රත්‍යඞ්ග සම්පන්න ප්‍රවර කෙසරසිංහ රාජ ප්‍රතිභාන අලීනාශංකුචිත ශ්‍රෙෂ්ඨතර සවීවික්‍රමයෙන් සමන් විතවූ **ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ** නම් මහාරාජොත්තමයානන්ගේ ආරාධනායෙන්–

විමල විපුල විශුද්ධ බුදුසින් ප්‍රසිද්ධ ශ්‍රද්ධාවන්ත රාජ රාජ මහාමාත්‍යාදි විබුධජන සාධුසම්මතාමිත ගුණගණාභරණාලඞ්කෘත නෛකාශත පමිත් මධ්‍යගත ප්‍රඥප්තාසනාරූඪ ව ධම්කථනය කොට සභාරඤ්ජනය කිරීමෙහි සමර්ථ වූ, නොයෙක් භික්ෂූන් ඇති නිඛිලජන රම්‍යවූ ප්‍රවර ගුණාභිරාම වූ **උපොසථාරාමවාසි** මහාසඞ්ඝයා

1. යාචක ජන පාරිජාතක—මුද්‍රිත.

වහන්සේ අතුරෙන් ලාභසත්කාරාදිය ප්‍රතික්ෂේපකොට අසඞ්ඛ තාර්ය පිණිස පැවිදි ව ධර්මානුකූල ප්‍රතිපත්තියෙහි පිහිටා වාසය කරණ **සරණඞ්කර පිණ්ඩපාතික සාමණේරයන්වහන්සේ** සූත්‍ර භිධම් විනය සඞ්ඛ්‍යාත පිටකත්‍රයෙන් චතුරාර්යසත්‍යාදී සාරාර්ථයන් ගෙණ දෘෂ්ටධාර්මික සාම්පරායිකාර්ථයෙන් සත්සත්වානුග්‍රහකරණ බුද්ධියෙන්, ඒ බුද්ධ **ශබ්දයෙහි** සඞ්ග්‍රහකොට දැක්වීම් වශයෙන් ව්‍යුත්පත්ති නිමිත්තාර්ථ පරිත්‍යාගකොට වක්තව්‍ය වූ අත්‍යර්ථ සංඥා වශයෙන් ගත් **සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහය** නම් වූ ධර්මප්‍රකරණයක් ගෙණහැර දක්වනසේක.

එහි ප්‍රකාශවන්නේ නම්: ශුද්ධ වූ බුද්ධාදි රත්නත්‍රයෙහි ගුණ හා සකලාර්තානර්ථයට මූලකාරණා වූ කුශලා - කුශල දෙදෙනාගේ විභාග ම ය.

හෙ ද වනාහි නිලෝගුරු බුදුන් විසින් **භාෂයෙ ජෝතයෙ ධම්මං** යනාදීන් වදාළ බුද්ධානුශාසනාව පිළිගෙණ, මාගධී භාෂාව පරිවර්තනයකොට සවදෙස වාසීන්ට වැඩ පිණිස සටකීය සිංහල භාෂාවෙන් අර්ථසඞ්ග්‍රහකොට දක්වන බව මුත් ඒ ඒ තැන පහළ කරන්නේ පාත්‍රිමාශ්‍රානුකූල ව ප්‍රඥාවට විෂය වූ පරිද්දෙන් දුටු අර්ථ යෙක් ම ය. එසේ හෙයින් තිරශ්චීන යෝනියෙහි ද සිටියවුන් විසින් අවවාදානුශාසනා වශයෙන් කිකල රජ -යුවරජ-දෙවි-මුනි ආදීන් විසිනු දු ආදර සත්කාර කොට ඇසූ ධර්මයෙක.

ලොකාග්‍රවූ බුදුන්හෙරෙහි ම උගත් ශ්‍රාවකයන් දෙසන කල යාමිත්‍රයෙහි ම සිටි පිය නොසොල්වා වැඩ සිට ඇසීම් වශයෙන් බුදුන් විසිනුදු ගරු නැන්හි තුබූ ධර්මයෙකැ සි යනාදීන් ධර්මයෙහි මහනතබය ද සමුපචිත කුසලබල ඇති ව ක්ෂත්‍රියකුල සඤ්ජාත වූ චක්‍රවාලචක්‍රවර්ති රජදරු කෙණෙකුන් ඇතිකලක මුත් අන් කිසි කලෙක නොලැබිය හැකි චක්‍රරත්නය සේ හෙට්ඨිම පරිවෙජදයෙන් සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් හෝ, මද්ධ්‍යම පරිවෙජදයෙන් අර්ථසංඛ්‍ය කල්පලක්ෂයක් හෝ, උත්තම පරිවෙජදයෙන් ඔඩ්ඩාසංඛ්‍ය කල්ප ලක්ෂයක් හෝ, පූරිත පාරමීධර්මයන් ඇති ව, බොධිද්‍රුම මූලයෙහි මාරපරාජය කොට බුදුවූ සර්ඥකෙණෙකුන් වහන්සේ ඇති කාල යෙහි ම මුත් ප්‍රමාණාතික්‍රාන්ත කල්පකොටි සහශ්‍රයක් අතික්‍රාන්ත වුවත් ශ්‍රමණ - බ්‍රාහ්මණ - දෙව - මාර - බ්‍රහ්මාදී යම් කිසිවක්හු විසින් පහළකරගත නොහැකි ධර්මයෙකැ සි යනාදීන් ධර්මය දුර්ලභ පරිදි ද:

ශබ්ද මාත්‍රයක් නිමිත්තග්‍රහණය කළ බිරවඟුලිකාදීන් ශාන්තවූ නිවන්පුර පැමිණ වූ හෙයින් ද, ආලවක - අඞ්ගුලිමාල බරරෝම - ශූචිරෝමාදි කකීශ සභාව ඇති තදයන් පවා විඥාණය සුන් වෘෂභයන් සේ, පියා වගුල විහඟයන් සේ, නිය දළ සුන් ව්‍යාඝ්‍රයන් සේ, දිවගදින් විෂඝෝර සපුන් සේ, දමනය කිරීමෙහි සමර්ථවූ ධර්මය හෙයින් ද, පසඟතුරු රවින් උපදනා සෞමනස් සතතයෙන් ධර්මචින්තා කරනුවහට උපදනා සෞමනස් හා තුල්‍ය නොවන බැවින් ද, සතතයෙන් ධර්මසම්මර්ශනය කරනුවහු සඳහා යෙන් නොපිරිහෙන බැවින් ද, සංසාර මහා කාන්තාරයට නව ගැලක් මෙන් ද, සසර සයුරට මහ නැවක් සෙයින් ද, චතුරාශ්‍රවා දීන්ට නව හෙයක් සෙයින් ද, සංසාර රෝගයට දිවබෙහෙදක් සෙයින් ද, ත්‍රිවිධාග්නියට අහස්ගඟ සෙයින් ද, කෙලෙස් වනයට තෙජොග්නිස්ඛන්ධයක් සෙයින් ද, ශ්‍රාමාණ්‍යබීජ රොපණයට සරු කෙතක් සෙයින් ද, ප්‍රාර්ථිතෙර්ෂිතාර්ථදනයෙහි සිතුමිණි රුවණක් සෙයින් ද, ජරා මරණ භීතයන්ට භීරුත්‍රාණ සෙයින් ද, කෙලඟ දුඃඛ පරිදීඞ්තයන්ට අනුග්‍රහ කිරීමෙහි ප්‍රේමභරිත මාතෘවක සෙයින් ද, සර්ශ්‍රාමාණ්‍ය ගුණජනකාර්‍යයෙන් පිතෘන් සෙයින් ද:

ශ්‍රාමාණ්‍ය ගුණ පර්‍යේෂණයට මිත්‍රයන් සෙයින් ද, කෙලඟ මූලානුපලිප්තාර්‍ථයෙන් පදුම්ණ්පත් සෙයින් ද, කෙලඟ දුගඳප්‍රති විනොදනාර්‍ථයෙන් සිවුදැගඳ සෙයින් ද, අෂ්ටලෝක ධර්මයට අක මප්‍යාර්‍ථයෙන් හිරිරාජ සෙයින් ද, කෙලඟමල පවාහනාර්‍ථයෙන් මහානදී සෙයින් ද, ජාතිකාන්තාර කෙලඟවත ග්‍රහණ නිසතරණා ර්‍ථයෙන් සුදෙශික සෙයින් ද, සර්‍වනය සූන්‍යඛෙම අභයපුර ප්‍රවර නිර්‍වාණ නගර ප්‍රවෙශන කරණාර්‍ථයෙන් මහාසාර්‍ථවාහක සෙයින්ද, සංස්කාරයන්ගේ සභාවදර්‍ශිනාර්‍ථයෙන් සුසජ්ජිත විමලාදර්‍ශ සෙ සින් ද, කෙලඟ සර ශකති ප්‍රතිඛාහනාර්‍ථයෙන් වජ්‍රඵලකසෙයින් ද, කෙලඟවෘෂ්ටි ත්‍රිවිධාග්නි සන්තාප ප්‍රතිඛාහණයෙන් සෙතවර්‍ෂිත්‍ර සෙයින් ද, මොහ තිමිර නිකර විධ්වංඝනය කරණයෙන් අර්‍ශිශිර කිරණ සෙයින් ද, අනෙකවිධ ශ්‍රාමාණ්‍ය ගුණ වර රතනසථානා ර්‍ථයෙන් හා අපරිමිත අසංඛෙය අප්‍රමෙයාර්‍ථයෙන් මහොදධි සෙයින් දැයි එවමාදී ගුණයෙන් යුකත බැවින් ද-

සර්‍ව දරථ පරිළාහ භව නිඛිල ශොක දුඃඛ රාග චෙෂ මොහ මාන දෘෂ්ටි ඍණාකුසල ධර්‍ම නසා යශොඝිත සුඛ ඵාසු ප්‍රීති යොග ඛෙම අනවද්‍ය ඉෂ්ටසුඛ විපාකාදිය ඵලවත බැවින් ද, භිතවශයෙන්

සෙවියයුතු භෙෂජ්‍යයක් සේ, උපකාර පිණිස සෙවියයුතු මිත්‍ර යන් සේ, තාරණය පිණිස සෙවියයුතු නෞකා සේ, සුගන්ධය පිණිස සෙවියයුතු මාලාගන්ධාදිය සේ, අභය පිණිස සෙවියයුතු නිරුත්තානයක් සේ, ප්‍රතිෂ්ඨාපිණිස සෙවියයුතු පෘථිවිය සේ, ශිල්ප පිණිස සෙවියයුතු ආචාරීන් සේ, යශස් පිණිස සෙවියයුතු රජදරු වන් සේ, අනිමිතාර්ථසිද්ධිය පිණිස සෙවියයුතු ඕණිරුවණක් සේ, බලවඩිනය පිණිස සෙවියයුතු ආහාරය සේ, පිපාස විනොදනය පිණිස සෙවියයුතු සිසිල් පැන් සේ, අලඞ්කාර පිණිස සෙවියයුතු ආභරණ සේ, අඞ්කාරවිඛ්ඨංශනය පිණිස සෙවියයුතු ප්‍රදීපාදිය සේ, දානම්සොඬාදී ප්‍රඥවන්තයන් විසින් එෂණය ගවෙෂණය පර්‍යේෂණය කටයුතු වූ, දිවිපුදා ඇසියයුතු වූ, ධම්යෙකා සි සිතා නොනිදා-නොනතනා – නොකොදුරා–අවික්ඛිපතා චිත්තසන්තාන ඇති ව ඇසිය යුතු— කෙසේද යත්?

---

1. පරිච්ඡේදය

ප්‍රකරණාරම්භ කථා

සච්ලොකවාසීන්ට අග්‍රවූ සම්බුදයන් වහන්සේ දවාත්‍රිංශත් වර මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්තවූ සේක. ඒ පුරුෂ ලක්ෂණ යෙන් සමන්විත ව ඉදින් ගෘහවාසයෙහි විසූසේක් වී නම්: සතිස් ලක්ෂ දසදහස් තුන්සිය පණස් යොදුන් ඇති චක්‍රවාටයෙහි ක්ෂුද්‍ර ද්වීප දෙදහසකින් පිරිවරණ ලද සතරමහත් දිවුතෙලෙහි පවත් වන ලද ආඥාචක්‍ර ඇති සප්තරතන සමන්විත තරශ්‍රේෂ්ඨයක් ව සක්විති රජසිරි විඳිනා සේක ගෘහනිෂ්ක්‍රමණයකොට පැවිදිවූ නොයින් අතීත් සම්‍යක්සම්බුද්ධත්වයට ප්‍රාප්තවූ සේක.

එහෙයින් වදුළහ.

ඉමානිංඝිමානි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණානි: යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස දෙ ගතියො භවන්ති අනඤ්ඤා. සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවි ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන සමන්නාගතො – තස්සිමානි සත්තරතනානි භවන්ති. සෙය්‍යථිදං? චක්කරතනං, හත්ථිරතනං, අස්සරතනං, මණිරතනං, ඉත්ථිරතනං, ගහපතිරතනං, පරිණායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සොඉමං සාගරන්තං මහාපඨවිං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛො පන අගාරා අනගාරියං පබ්බජති අරහති සම්මාසම්බුද්ධොලොකෙ විවට්ටච්ඡදො.

ඒදෘනා සෝ ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛෝ පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධෝ ලොකෙ විවත්තච්ඡදෝ-ති.

යම් මහාපුරුෂ ලක්ෂණයකින් සමන්විත වූ මහාපුරුෂ තෙමේ ගෘහවාසයෙහි විසුවහොත් සක්විනිරජ වන්නා වූ ගෘහාභි නිෂ්ක්‍රමණ ය කළ හොත් අනිත් සම්‍යක් සම්බුද්ධත්වයට ප්‍රාප්තවන්නා වූ ඒ ලක්ෂණයෝ නම් කවුරු ද යත්?

එම දක්වන්නට වදාළේ මැනෝ

කතමානි ච තානි භික්ඛවෙ මහාපුරිසස්ස දවත්තිංස මහාපුරිස ලක්ඛණානි? යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස දෙවගතියෝ හොන්ති අනඤ්ඤ. සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති -පෙ- සචෙ ඛෝ පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධෝ ලොකෙ විවත්තච්ඡදෝ. ඉධ භික්ඛවෙ මහාපුරිසෝ සුපතිට්ඨිතපාදෝ හොති. යම්පි භික්ඛවෙ මහාපුරිසෝ සුපතිට්ඨිතපාදෝ හොති. ඉදම්පි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිස ලක්ඛණං හවති.

පුන ච පරං භික්ඛවෙ මහා පුරිසස්ස හෙට්ඨා පාදතලෙසු චක්කානි ජාතානි හොන්ති සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි සුවිභත්තන්තරානි. යම්පි භික්ඛවෙ මහාපුරිසස්ස හෙට්ඨා පාදතලෙසු චක්කානි ජාතානි හොන්ති සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි සුවිභත්තන්තරානි. ඉදම්පි භික්ඛවෙ මහා පුරිසස්ස ආයතපණ්හි හොති -පෙ- දීඝඞ්ගුලී හොති-මුදුතලුන හත්ථපාදෙ හොති. ජාලහත්ථපාදෙ හොති. උස්සංඛ පාදෙ හොති. එණිජඞ්ඝා හොති. ඨිතකොව අනොණමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණුකානි පරිමසති. පරිමජ්ජති. කොසොහිත වත්ථගුයෙහා හොති. සුවණ්ණ වණ්ණා හොති. කඤ්චන සන්නි භත්තවෝ. සුඛුමච්ඡවි හොති. සුඛුමත්තා ඡවියා රජොජල්ලං කායෙ න උප ලිපති

එකෙක ලොමෝ හොති. එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි උද්ධග්ගලොමෝ හොති. උද්ධග්ගානි ලොමානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි පදක්ඛිණාවත්තක

ජාතානි බ්‍රහ්මුජ්ජුගතත්තා හොති. සත්තුස්සදෝ හොති. සීහපුබ්බද්ධකායෝ හොති. විතනන්තරංසෝ හොති. නිග්‍රෝධපරිමණ්ඩලෝ හොති. යාවතකඞ්වස්ස කායෝ තාවතකඞ්වස්ස ව්‍යාමෝ, යාවතකඞ්වස්ස ව්‍යාමෝ තාවතකඞ්වස්ස කායෝ. සමවට්ටක්ඛන්ධෝ හොති. රසග්ගසග්ගී හොති. සිහහනු හොති. චත්තාරීස දන්තා හොති. සමදන්තා හොති. අවිවරදන්තා හොති. සුසුක්කදාඨෝ හොති. පහූතජිව්හෝ හොති. බ්‍රහ්මස්සරෝ හොති. කරවීකභාණී හොති. අභිනීලනෙත්තෝ හොති. ගොපඛුමෝ හොති. උණණා භමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතූල සන්නිභා හොති. යම්පි භික්ඛවෙ මහා පුරිසස්ස උණණා භමුකන්තරෙ ජාතා හොති. ඔදාතා මුදුතූල සන්නිභා- ඉදම්පි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිස ලක්ඛණං භවති.

පුන ච පරං භික්ඛවෙ මහාපුරිසෝ උණ්හීස සීසෝ හොති. ඉදම්පි භික්ඛවෙ මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණං භවති. ඉමානි ඛෝ තානි දවත්තිංස මහාපුරිසලක්ඛණානි යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස දෙව වා ගතියෝ භවන්ති අනඤඤ. සචේ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මිකෝ ධම්මරාජා චාතුරන්තෝ විජිතාවි ජනපදත්ථාවරියප්පත්තෝ සත්තරතන සමන්නාගතෝ- තස්සිමානි සත්තරතනානි භවන්ති. සෙය්‍යථිදං? චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායකරතනමෙව සත්තමං. පරොසහස්සං ඛෝ පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සෝ ඉමං පඨවිං සාගරපරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛෝ පනාගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මාසම්බුද්ධෝ ලොකෙ විවත්තච්ඡදෝ - ඉමානි ඛෝ තානි භික්ඛවෙ මහාපුරිසස්ස දවත්තිංස මහා පුරිස ලක්ඛණානි-යි.

ඒ එසේ ම ය. මේ දෙතිස් මහාපුරුෂ ලක්ෂණය වර්ණනාකරණුවන් විසින් කථිය - කථිසාදෘශ්‍යය - ලක්ෂණය-ලක්ෂණානිසංසය යන මේ සතර කොට්ඨාශය එකි එකී ලක්ෂණයක දක්ව දක්වා වර්ණනාකළ කල්හි විස්තර වශයෙන් වර්ණනා කළා නම් වෙයි. එහෙයින් කථිය - කථිසාදෘශ්‍යය - ලක්ෂණය - ලක්ෂණානිසංසය යන මොවුන්ගේ වශයෙන් වර්ණනා කරණු ලැබේ.

කෙසේ ද යත්?

1. සද්ධම් කුසුම ඵල පත්‍රාලඞ්කෘත කල්පද්‍රැම වූ ඒ සම්බුදුරජාණන් වහන්සේ පුරිම ජාති පුරිම භව පුරිම නිකෙත සඞ්ඛ්‍යාත සසරෙහි මේ

පළමු සැරිසරණ සේත් ප්‍රතිඛණාතික්‍රාන්ත ජාතිකෝටි ශතසහස්‍ර යෙහි වජ්‍රප්‍රාමුඛයක් සේ කුශලධර්මයෙහි දෘඪ වූ සමාදානය ඇති වූ සේක.

එසේ ම අවසිත සමාදානයෙහි කායසුචරිතයෙහි වචීසුචරිත යෙහි මනොසුචරිතයෙහි දානසංවිභාගයෙහි ශීලසමාදානයෙහි උපවසථොපවාසයෙහි[1] මෛත්‍රෙයය්‍යතායෙහි පෙත්තෙයය්‍යතායෙහි සාමඤඤතායෙහි බ්‍රහ්මඤඤතායෙහි කුලජ්‍යෙෂ්ඨාපචායිතායෙහි ද, අන්‍යතර අධිකුශලධර්මයෙහි ද, සතරාමර ලොකයා විසින් නොසෙල් විය හැකි පරිද්දෙන් දෘඪ වූ සමාදාන ය ඇතිවූ සේක. ඒ කුශල කර්මය හේතුකොටගෙණ කාබුන් මරණින් මත්තෙහි සවර්ගයෙහි ඉපද එහි දිව්‍ය වූ ආයුෂයෙන් දිව්‍ය වූ වර්ණයෙන් දිව්‍ය වූ සැප යෙන් දිව්‍ය වූ යසසින් දිව්‍ය වූ ආධිපත්‍යයෙන් දිව්‍ය වූ රූපයෙන් දිව්‍ය වූ ශබ්දයෙන් දිව්‍ය වූ ගන්ධයෙන් දිව්‍ය වූ රසයෙන් දිව්‍ය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් සුඛෝදයෙහි බද්ධෙනකාමීන් සෙසින් සෙසු දෙව් යන් මැඩපවත්වමින් සවර්ගී සම්පත් විඳ එයින් චුත ව වැඩිසේක් මෙ සමයෙහි සුප්‍රතිට්ඨිත පාදතලද්වය ඇති වූ සේක.

—හෙවත්—

අග්‍රපාදතල ය හෝ පාර්ෂ්ණි ය හෝ පාර්ශ්ව ය හෝ පෙරටුව බිම සම්පීඩකරණ පාදතල මධ්‍යයෙන් ඡිද්‍ර හෝ පැණෙන පත්ල නගනකල පාදග්‍රාදීන්. කෙරෙන් එන්තරා ස්ථානයක් පෙරටුව නැගෙණ සෙස්සන්ගේ පතුල් සේ නොව සවර්ණපාදුකා සෙයින් එක පැහැර භූමි සම්පීඩය කරණ, එක පැහැර නැගෙණ **සුප්‍රතිෂ්ඨිත පාදතල ය සි** කියන ලද මේ මහාපුරුෂ ලක්ෂණය ලත් සේක.

ඉදින් මේ ලක්ෂණයෙන් සමන්විත ව ගෘහවාසයෙහි විසූ සේක් වී නම් මනුෂ්‍ය වූ කිසි පසමිතුරන්හු විසින් මැඩපැවැත් විය නොහැකි වූ චක්‍රවර්ති රාජ්‍යශ්‍රීපදප්‍රාප්ත වනසේක. ගෘහාන්නිෂ්ක්‍රමණයකොට පැවිදි වූ හෙයින් අතීත් සම්‍යක් සම්බුද්ධත්වයට පැමිණ අභ්‍යන්තරගත රාගයෙන් හෝ වෙෂයෙන් හෝ මොහයෙන් හෝ බාහිර වූ ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්මයෙකු විසින් හෝ අලලා මැඩපැවැත්විය නොහැකි වූ සේක.

---

1. උපොසථ වාසයෙහි-ඇතැම්.

එසින් වදළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො දළහසමාදානො අහොසි කුසලෙසු ධම්මෙසු අවත්ථිත සමාදානෙ කායසුචරිතෙ වචීසුචරිතෙ මනොසුචරිතෙ දානසංවිභාගෙ සීලසමාදානෙ උපොසථූපවාසෙ ම තෙනය්‍යතාය පෙත්තෙය්‍යතාය සාමඤ්ඤතාය බ්‍රහමඤ්ඤතාය කුලෙ ජෙට්ඨාපචායිතාය අඤ්ඤතරඤ්ඤතරෙසු ච අධිකුසලෙසු ධම්මෙසු. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. සො තත්ථ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හාති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපත්තෙය්‍යෙන දිබ්බෙහි රූපෙහි දිබ්බෙහි සද්දෙහි දිබ්බෙහි ගන්ධෙහි දිබ්බෙහි රසෙහි දිබ්බෙහි ඵොට්ඨබ්බෙහි. සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති.

සුප්පතිට්ඨිත පාදො හොති. සම්ං පාදං භූමියං නික්ඛිපති සම්ං උද්ධරති සම්ං සබ්බාවන්තෙහි පාදතලෙහි භූමිං ඵුසති. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මික්ඛො ධම්මරාජා චාතුරන්තො විජිතාවි ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන සමන්නාගතෙ: තස්සිමානි සත්තරතනානි භවන්ති. සෙය්‍යථිදං? චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායක රතනමෙව සත්තමං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ග රූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගර පරියන්තං අඛිලමනිම්මිත්තමක්ඛණ්ඩකං ඉද්ධං ඵීතං ඛෙමං සිවං නිරබ්බුදං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන සමෙන අභිවිජිය අජ්ඣා වසති. රාජා සමානො කිං ලභති? අවික්ඛම්භියො හොති කෙනචි මනුස්සභූතෙන පචවත්තිකෙන පචවාමිතෙනන. රාජා සම්ානො ඉදං ලභති.

සචෙ ඛො පනාගාරස්මා අනගාරියං පබ්බජති. අරහං හොති සම්මා සම්බුද්ධො ලොකෙ විවත්තචක්ඛු, බුද්ධො සම්ානො කිං ලභති? අවික්ඛම්භියො හොති අබ්භන්තරෙහි වා බාහිරෙහි වා පචවත්තිකෙහි පචවාමිතෙනහි රාගෙන වා දොසෙන වා මොහෙන වා සමණෙන වා බ්‍රාහමණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහමුනා වා කෙනචි වා ලොකස්මිං. බුද්ධො සම්ානො ඉදං ලභති-සි.

මේ පමණකින් කම් ය කම්සාදෘශ්‍ය ය ලක්ෂණ ය ලක්ෂණානිසංස ය යන මේ සතර සංක්ෂේපයෙන් දක්වන ලදී ය.

තව ද කම් ය නම් ඒ ත්‍රෛලෝක්‍යාවායී වූ භාග්‍යවතුන් වහන්සේ සාරාසංඛ්‍ය කල්පලක්ෂයක් මුලුල්ලෙහි දැසතර ව කළා වූ දැනදී කුශලකම් ය වන්නේ ය. කම්සාදෘශ්‍ය ය නම් දැසතර ව කළ බව සතරාමර ලෝකයෝ දනිත්ව යි හඟවන්නාක් මෙන් උපන්නා වූ සුප්‍රතිෂ්ඨිත[1] මහා පුරුෂ ලක්ෂණ ය වන්නේ ය. ලක්ෂණ ය නම් සුප්‍රතිෂ්ඨිත පාදතලයන් ඇති බව වන්නේ ය. ලක්ෂණානිසංස ය නම් පසමිතුරන් විසින් මැඩපැවැත් වි ය නො හැකි බව වන්නේ ය. මේ සතර කොටස්‌ස ය සියලු මහාපුරුෂ ලක්ෂණයට ම යොදුගත යුත්තේ ය.

---

2. සම්‌පූර්ණරත්න නිධිනිකෙන වූ ඒ සම්‌බුදුරජාණන්‌වහන්සේ පූර්‌වජන්‌මයෙහි සියලු ජනයාට සැප ඵලවූසේක. උදෙවග භය සන්‌ත්‍රාස නූපදවා ධාර්‌මික වූ රක්ෂාවරණ ගුප්‌ති ය කොට සියලු සත්‌වයන්‌ට අභයදාන ය දී පිරිවර සහිත වූ මහදන්‌දුන් සේක. එසේ මනාකොට කරණ ලද සුචරිතයෙන් සවර්‌ගයෙහි ඉපිද අනන්‌තාපර්‌යන්‌ත කාලයක් මුලුල්ලෙහි දිවඟසුරු විද මෙසමයෙහි එකෙකි චක්‍රයෙහි දහස් දහස් දූවි ඇති, නිම්නැබ සහිත දෙසියසොළසක් මහුල් ලකුණෙන් පිරිවරණ ලද **දව්වක්‌කලක්ෂණයෙන් විභූතුරු** වූ **හෙඬියාපාදතලදවය** ඇති වූ සේක් ගෘහවාසයෙහි විසුවහොත් අපමණ වූ බ්‍රාහ්‌මණ ගෘහපතිකාදී පරිවාර ජනයන් විසින් පිරිවරණලදුව සක්‌විතිරජ වන සේක.

ගෘහාන්‌නිෂ්‌ක්‍රමණය කොට පැවිදි වූ හෙයින් අපමණ වූ භික්‌ෂු-භික්‌ෂුණී – උපාසක – උපාසිකා – දිව්‍ය – මනුෂ්‍ය – අසුර – නාග-ගන්‌ධර්‌වයන් විසින් පිරිවරණ ලදුව සම්‌බුදු පදප්‍රාප්‍ත වූ සේක.

එහෙයින් වදළහ

යම්‌පෙ භික්‌ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං සබෙඛ මනුස්‌සභූතො සමානො බහුජන සුඛාය අහොසි උබෙඛගං උත්‌තාසං භයං අපනුදිතා. ධම්‌මිකඤ්‌ච රක්‌ඛාවරණ ගුත්‌තිං සංවිධාතා සපරිවාරඤ්‌ච දානං අදාසි. සො තස්‌ස

---

1. සුප්‍රතිට්‌ඨිත (පාදතා) මුද්‍රිත.

කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති —පෙ— සෝ තතෝ චුතෝ ඉත්ථත්තං ආගතෝ සමානෝ ඉමං මහාපුරිස ලක්ඛණං පටිලභති නෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි හොන්ති සාසාසරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාර පරිපූරානි සුවි භත්තන්තරානි. සෝ තෙන ලක්ඛණෙන සමන්නාගතෝ සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්තති —පෙ—

රාජා සමානෝ කිං ලභති? මහාපරිවාරෝ හොති. මහා යසෝ හොති. පරිවාරා බ්‍රාහ්මණ ගහපතිකා නෙගම ජානපද ගණක මහාමත්තා අණිකට්ඨා දෙවාරිකා අම්චචා පාරිසජ්ජා රාජානෝ හොතියා කුමාරා. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? මහා පරිවාරෝ හොති. මහා යසෝ හොති. මහා පරිවාරා භික්ඛූ භික්ඛුණියෝ උපාසකා උපාසිකායෝ දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධෝ සමානෝ ඉදං ලභති-සි.

---

3. සනරුමර ලොක සම්සඳ හුමර නිහෙවිත ශ්‍රී පාදාරවින්ද ධාතෙපලක්ෂිත වූ ඒ සම්බුරාජෝත්තමයානන් වහන්සේ පූර්ව ජන්ම නන්තරයෙහි ප්‍රාණාතිපාතයෙන් වැලක පරුපඝාතය පිණිස ගන්නා ලද දණ්ඩශස්ත්‍රයන් නැති ව සකල ප්‍රාණීන් විෂයෙහි හිතානුකම්පාවෙන් යුක්ත ව විසූසේක.

ඒ කුශල බලයෙන් කාබුන් මරණින් මත්තෙහි සවර්ගලොකයෙහි ඉපැද අපමණ වූ දිවඉසුරු විඳ එයින් චුත ව වැඩිසේක් දික්වූ අත් පතුල් ඇති, විලුම් මුදුනෙහි සිහින් කකුල් ඇති, සෑස පිවාක් වැනි විලුම් ඇති, සෙසු ජනයන් සේ නොව ශ්‍රීපාදතලය සතරහාගයෙන් දෙහාගයෙක් අක්පතුල් ව තුන්වන භාගයෙහි ජඞ්ඝා ප්‍රතිෂ්ඨිත ව සතරවන භාගයෙහි ගිදිඅඟින් වටා තුබූවක් වැනි වූ රක්තකම්බල ගෙණ්ඩුකයක්[1] සේ සම්පූර්ණ වූ **දික් විලුම් ඇති** මේ මහාපුරුෂ ලක්ෂණය ද-

---

4 ඇතැම් ඇඟිලි දික් ව ඇතැම් ඇඟිලි ලුහුඬු වන සෙස්සන් සේ නොව මකුළුවන් ඇඟිලි සේ දික් ව මුලින් දළ ව ක්‍රමයෙන් ගොස් අගින් සිහින් ව නියඬ්ගතෙලයෙන් ගණ වැටූ සිරියෙල් වැටි සෙසින් සොඳාමත් ව බබලන **දීඝාඞ්ගුලි** නම් වූ මේ මහා පුරුෂ ලක්ෂණය ද-

---

1. හෙණ්ඩුකයක්-මුද්‍රිත.

5. සකඹයෙන් හෝ නැමෙන කටිප්‍රදෙශයෙන් හෝ නැමෙන දනමඬලින් හෝ නැමෙන දිඝශරීර ඇතිවන බැවින් පාර්ශවයෙන් වක්වෙන උඩු බලා නසත්තරු ගණන්‍රුවන් සෙයින් ඇවිදින් අල්ප මාංශ රුධිර වන බැවින් ශුලසදෘස ව වෙවුලමින් ඇවිදින සෙස්සන් සේ නොව දෙවුන්‍රුවර නැගූ රුවින් තොරණක් සෙයින් ශොභිත වූ සෘද්ධ වූ දීඝප්‍රමාණ වූ **බ්‍රහ්මර්ෂභගාත්‍ර** නම් මේ මහා පුරුෂලක්ෂණය ද, යන මේ ලක්ෂණත්‍රයෙන් සමන්විත වූ සේක් ගෘහවාසයෙහි විසුවහොත් දීඝායුෂ්ක ව මනුෂ්‍ය වූ කිසි පසම්බුරු කෙණෙකුන් විසින් ප්‍රකෘති ආයුෂ්ආවසානය දක්වා ජීවිතනතරායක් කොට ගත නොහැකි සක්විති රජසිරි විඳිනා සේක.

ගෘහනිෂ්ක්‍රමණය කොට පැවිදිවූ හෙයින් දීඝායුෂ්ක ව උපන් තැන් පටන් පරිනිර්වාණය දක්වා ශ්‍රමණයෙකු විසින් වේව සි, බ්‍රාහ්මණයෙකු විසින් වේව සි, දෙවියෙකු විසින් වේව සි, මාරයෙකු විසින් වේව සි, බ්‍රහ්මයෙකු විසින් වේව සි, ලොකයෙහි කිසි කෙණෙකුන් විසින් වේව සි ජීවිතනතරායක් කොටගත නො හැකි සම්‍යක්සම්බුද්ධත්වඥන පදප්‍රාප්ත වූසේක

එසින් වදළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතො අහොසි. නිහිතදණ්ඩො නිහිතසත්ථො ලජ්ජී දයාපන්නො සබ්බපාණභූත හිතානුකම්පී විහාසි. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති —පෙ—. සො තතො චුතො ඉත්තභාවං ආගතො සමානො ඉමානි තීණි මහා පුරිසලක්ඛණානි පටිලභති. ආයතපණ්හි ච හොති දීඝඞ්ගුලි ච බ්‍රහ්මුජුගත්තා ච. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ—

රාජා සමානො කිං ලභති? දීඝායුකො හොති චිරට්ඨිතිකො. දීඝමායුං පාලෙති. න සක්කා හොති අනතරා ජීවිතා වොරොපෙතුං කෙනචි මනුස්සභූතෙන පච්චත්තිකෙන පච්චාමිත්තෙන. රාජා සමානො ඉදං ලභති. බුද්ධො සමානො කිං ලභති? දීඝායුකො හොති චිරට්ඨිතිකො. දීඝමායුං පාලෙති. න සක්කා හොති අනතරා ජීවිතා වොරොපෙතුං පච්චත්තිකෙහි පච්චාමිත්තානහි සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසමිං. බුද්ධො සමානො ඉදං ලභති–සි.

6. සතරාමර සකලලොක විනතාමාණික්‍ය වූ ඒ සම්බුදුරාජොත්තමයානන්වහන්සේ පූර්ජන්මානන්තරයෙහි ප්‍රණීත වූ රස ඇති ඛාදනීයොජ්‍යාදිය දන්දුන් සේක. ඒ කුශල බලයෙන් කාබුන් මරණින් මත්තෙහි සවගීයෙහි ඉපිද අපමණ වූ දිවසැපත් විඳ එයින් චුත ව වැඩි සේක් දෙ අත් දෙපා පිට ශිරිජාල පැණෙන අංසකූටයෙහි දු සකඛයෙහි දු අස්ථිකොටි පැණෙන මනුෂ්‍ය ප්‍රෙත යන් වැනි සෙසු ජනයන් සේ නොව දෙ අත් පිට ය, දෙපා පිට ය, දෙ අංසකූට ය, සකඛ ය, යන සජනසථානයෙන් පරිපූර්ණ වූ **මාංසොනසද** ඇති මේ මහාපුරුෂලක්ෂණ ය ලත් සේක. ඉදින් මේ මහා පුරුෂලක්ෂණයෙන් සමන්විත ව ගෘහවාසයෙහි විසූ සේක් වී නම් අපමණ වූ ප්‍රණීතාහාරයන් ලැබ සක්විති රජ ඉසුරු විඳිනා සේක.

ගෘහනිනිෂ්ක්‍රමණය කොට පැවිදි වූ හෙයින් සතරාමර ලොකයා විසින් එලවන ලද ප්‍රණීතාහාරයන් ලබන සුලු ව සම්බුදු කාඥන පද ප්‍රාප්ත වූ සේක.

එයින් වදාළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබෙබ මනුස්සභූතො සමානො දතා අහොසි පණීතානං රසිතානං ඛාදනීයානං හොජනීයානං සායනීයානං ලෙහනීයානං පානානං. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති —පෙ— සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති. සන්තුස්සදෙ හොති. උභොසු හත්ථෙසු උස්සදෙ හොනති. උභොසු පාදෙසු උස්සදෙ හොනති. උභොසු අංසකූටෙසු උස්සදෙ හොනති. ඛණ්ඩෙ උස්සදෙ හොති. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ—

රාජා සමානො කිං ලභති? ලාභී හොති පණීතානං රසිතානං ඛාදනීයානං හොජනීයානං සායනීයානං ලෙහනීයානං පානානං. රාජා සමානො ඉදං ලභති. බුද්ධො සමානො කිං ලභති? ලාභී හොති රසිතානං පණීතානං ඛාදනීයානං හොජනීයානං සායනී යානං ලෙහනීයානං පානානං. බුද්ධො සමානො ඉදං ලභති-සි.

---

7. ඝන තර මොහ තිමිර නිකර අශිශිර කිරණායමාන වූ ඒ සම්බුරාජොත්තමයානන් වහන්සේ පූර්ජන්මානන්තරයෙහි දුන ප්‍රියවචනාජීවය්‍ය සමානාත්මතා ය යන චතුස්සඞ්ග්‍රහවස්තුවෙන්

ජනයන්ට සඞ්ග්‍රහ කළ සේක. ඒ කුශල බලයෙන් සවිඟියෙහි ඉපිද අපමණ වූ දිවඉසුරෙන් සතුටු ව එයින් සැව මෙහි පැමිණ සේක් ශ්‍රීනසභාපාදතලයන් ප්‍රසන්න වූ ගිතෙල ගලා තුබූ සියක් වට පෙලූ පුලුන් පෙදෙ සෙයින් මොලොක් වූ ජාතමාත්‍ර කුමාරයක් හුගේ හසභාපාදතලයන් සෙයින් හැමකල්හි ම **මෘදු** වූ **තරුණ** වූ **අතුල් පතුල් ඇති** මේ මහාපුරුෂ ලක්ෂණය ද-

8. පැණ අත් පැණ පා ඇති සෙසු ජනයන් සේ නොව දක්ෂ වූ වඩුවකු විසින් යොදන ලද ජාලකවුළුවක් වැනි ව අත සතර ඇඟිල්ලෝ ද පය පස්ඇඟිල්ලෝ ද, එකප්‍රමාණ ව ඔවුනොවුන් විනිවිද සිටිනා **ජාලහත්ථපාද** නම් වූ මේ මහා පුරුෂලක්ෂණය ද යන පුරුෂ ලක්ෂණද්වය ලත් සේක.

ඉදින් මේ මහාපුරුෂ ලක්ෂණද්වයෙන් සමන්විත ව ගාහ වාසයෙහි විසුවහොත් සුවිනීත වූ බ්‍රාහමණ ගෘහපතිකාදීන් විසින් පිරිවරණ ලදු ව සක්විති රජසිරි විඳිනා සේක. ගෘහානිනිෂ්ක්‍රමණය කොට පැවිදි වූ හෙයින් සුවිනීත වූ භික්ෂු-භික්ෂුණී-උපාසක-උපාසිකා දිව්‍ය-මනුෂ්‍ය-අසුර-නාග-ගන්ධර්‍වයන් විසින් පිරිවරණ ලදු ව සම්බුදපදප්‍රාප්ත වූ සේක.

එයින් වදාළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො වතූහි සඞ්ගහවත්ථූහි ජනං සඞ්ගණ්හිතා අහොසි දානෙන පෙය්‍යවජ්ජෙන අත්ථචරියාය සමානත්තතාය. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උපසන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති-පෙ-සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි දෙව මහාපුරිසලක්ඛණානි පටිලභති. මුදුතලුණ හත්ථපාදෙ ච හොති. ජාලහත්ථ පාදෙ ච, සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සමෙ අඟාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති-පෙ-

රාජා සමානො කිං ලභති? සුසඞ්ගහිත පරිජනො හොති. සුසඞ්ගහිතස්ස හොන්ති බ්‍රාහමණගහපතිකා නෙගම ජානපද, ගණකමහාමත්තා අණීකට්ඨා දෙවාරිකා අමච්චා පාරිසජ්ජා රාජා නො හොගියා කුමාරා. රාජා සමානො ඉදං ලභති. බුද්ධො සමානො කිං ලභති? සුසඞ්ගහිත පරිජනො හොති. සුසඞ්ගහිතස්ස හොන්ති භික්ඛු භික්ඛුනියො උපාසක උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධො සමානො ඉදං ලභති—යි.

9. අතිපරිශුද්ධ ප්‍රවර ගුණගණාහරණ සමලංකෘත වූ ඒ සම්බුදු රාජොත්තමයානන් වහන්සේ පූර්ව්‍යජන්මාන්තරයෙහි බොහෝ ජනයන්ට අර්ථාන්විත වූ ධර්මාන්විත වූ බස් බිණූසේක. සියලු සත්වයන්ට හිතසැප ඵලවූසේක. ධර්මයාග කළසේක. ඒ කුශල බලයෙන් සුවගීයෙහි ඉපිද අපමණ වූ දිව්‍යසුරා විඳ එයින් සැව මෙහි උපන්සේක් පිටිපසයෙහි බොලට ඇතිවන බැවින් ඇණ පට සේ තද පා ඇති කැමැති සේ තොප පිරිවැටෙන යහුවන් පතුල් නොපැණෙන සෙසු ජනයන් සේ නොව නැඟි මත්තෙහි ගුල්ඵයෝ පිහිටා වඩාත් කල නානිය පටන් ගෙණ උර්ධ්වකාය තැව සිටි රන් පිළිමයක් සෙයින් නිශ්චල ව අධඃකාය ම චලිතවන සුවයෙන් පාදයෝ පරිවර්තිත වන පෙරටු දු පිටිපසු දු දෙපාර්ශ්වයෙහි දු සිට බලහුවන්ට පාදතලයන් පැණෙන **උන්ණතපාදතා** නම් වූ මේ මහා පුරුෂ ලක්ෂණය ද—

---

10. නීල වූ අඤ්ජනවර්ණ වූ ලෝමයෝ දක්ෂිණාවර්තත ව ආවර්තිත ව පර්‍යන්තයෙහි සදමඬලක් වැනි ශ්‍රී මුඛයෙහි ශොභා බලහුවන් සෙයින් සිටිනා **උර්ණාග්‍ර ලෝමතා** නම් මේ මහා පුරුෂලක්ෂණ ය ද යන මේ මහාපුරුෂ ලක්ෂණද්වයෙන් යුක්ත වූ සේක. ඉදින් මේ මහා පුරුෂලක්ෂණද්වයෙන් සමන්විත ව ගෘහ වාසයෙහි විසුවහොත් කාමභෝගීන්ට අග්‍ර ව සක්විති රජසිරි විඳිනා සේක. ගෘහානිනිෂ්ක්‍රමණය කොට පැවිජ් වූ හෙයින් සම්බුදුවයන්ට අග්‍ර ව ශ්‍රේෂ්ඨ ව සම්බුදුපදප්‍රාප්ත වූ සේක.

එයින් වදාළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො බහුනො ජනස්ස අත්ථූ පසංහිතං ධම්මූපසංහිතං වාචං භාසිතා අහොසි. බහුජනං හිදං සෙසි පාණිනං හිතසුඛාවහො අහු ධම්මයාගී. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සඟඟං ලොකං උපපජ්ජති—පෙ—

සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි දෙව මහාපුරිසලක්ඛණානි පටිලභති. උස්සඞ්ඛපාදෙ ච හොති. එඪගඟලොමෝ ච. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සවෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති-පෙ-. රාජා සමා නො කිං ලභති? අඟෙහා ච හොති සෙට්ඨා ච ඔකෙඨා ච

උත්තමෝ ච පවරෝ ච කාමනොහීනං. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? අනෙහා ච හොති සෙට්ඨෝ ච මොක්ඛෝ ච උත්තමෝ ච පවරෝ ච සබ්බසත්තානං: බුද්ධෝ සමානෝ ඉදං ලභති—සි.

---

11. සකී සුරාසුර මුනි මනුජ වන්දනීය වූ ඒ සම්බුදුරජාණන් වහන්සේ පූර්වජන්මානන්තරයෙහි සියලු සත්වයෝ සිද්ධිසැටකලා ශිල්ප ය හා අෂ්ටාදශ විද්‍යාස්ථානය ද කර්මාන්තාදි ය ද කෙසේ නම් වහා දැන ගණිද්ද? කෙසේ නම් වහා ඉගෙණ ගණිද්ද? කෙසේ නම් වහා ඔවුන්ට මම උගන්වම් ද? යනාදීන් ශිල්පශාස්ත්‍රාදි ය සකස්කොට ඉගැන්වීමෙහි යෙදුන සේක.

ඒ කුශලබලයෙන් දෙවුලොව ඉපිද දිව ඉසුරෙන් පිනා පුන මෙහි උපන්සේක් හාත්පසින් පරික්ෂිප්ත ව සිටි මහාකොට වඩනාලද හැල්ගබක් සෙයින් පරිපූර්ණ වූ **එණිජඞ්ඝ** නම් වූ මේ මහා පුරුෂ ලක්ෂණය ලත් සේක. ඉදින් මේ මහා පුරුෂ ලක්ෂණයෙන් යුකත ව ගෘහවාසයෙහි විසූසේක් වී නම් දැවිසහස්ස පරිත්තදීප පරිවාරිත සතර මහත් දිවයින රජ ඉසුරට පැමිණ රජදරුවන්ට සුදුසු වූ රාජාඞ්ග වූ රාජූපභොග වූ රාජානුවර්ත්තික වූ යම් කිසි දෙයක් ඇද්ද ඒ සියල්ල වහා ලබමින් සක්විති රජ ඉසුරු විඳිනා සේක. ගෘහාන්නිෂ්ක්‍රමණය කොට පැවිදි වූ හෙයින් ශ්‍රමණාර්ය වූ ශ්‍රමණාඞ්ග වූ ශ්‍රමණොපභොග වූ ශ්‍රමණානුවර්ත්තික වූ යම් කිසි දෙයක් ඇද්ද ඒ සියල්ල වහා ලබමින් බුදු රාජ්‍යයට පැමිණි සේක.

එසින් වදාළහ

යම්පි භික්ඛවෙ තථාගතෝ පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතෝ සමානෝ සක්කච්චං වාචෙතා අහොසි සිප්පං වා විජ්ජං වා වරණං වා කම්මං වා කින්ති මෙ ඛිප්පං ආජානෙය්‍යං ඛිප්පං විජානෙය්‍යං ඛිප්පං සම්පාපුණෙය්‍යං න චිරං කිලිසෙය්‍යුන්ති. සෝ තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සහා ලොකං උපපජ්ජති —පෙ—.

සෝ තතෝ චුතෝ ඉත්ථත්තං ආගතෝ සමානෝ ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති. එණි ජඞ්ඝා හොති. සෝ තෙන ලක්ඛණෙන සමන්නාගතෝ සවෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ—. රාජා සමානෝ කිං ලභති? යානි එතානි

රාජාරහානි රාජඞ්ගානි රාජූපභොගානි රාජානුච්ඡවිකානි තානි ඛිප්පං පටිලභති. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? යානි ච තානි සමණාරහානි සමණඞ්ගානි සමණූපභොගානි සමණානුච්ඡවිකානි තානි ඛිප්පං පටිලභති බුද්ධෝ සමානෝ ඉදං ලභති—සි.

12. සතරාමර සකලලොකෙක සරණ වූ සම්බුදුරජාණන්වහන්සේ අතීතභවයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා එළඹ: වහන්ස, කුසල් නම් කවරේද? අකුසල් නම් කවරේද? සාවද්‍ය කවරේද? අනවද්‍ය කවරේද? කුමක් සෙවනය කටයුතුද? කුමක් සේවනය නොකට යුතුද? කුමක් කරණු ලබන්නේ මට බොහෝ කලකට අවැඩ හා දුක් වේද? කුමක් කරණු ලබන්නේ බොහෝ කලකට වැඩ සැප සිද්ධ වේද? යනාදීන් විචාරීමෙහි යෙදුන සේක.

ඒ කුශලබලයෙන් සවඟීයෙහි ඉපද දිව ඉසුරෙන් පිනා පුන මෙහි උපන් සේක් දූලි හෝ දූලි හෝ ශරීරයෙහි නො ඇලෙන පද්ම පත්‍රයෙහි ජලබින්දු සෙසින් රජස් ආදිය විවර්ජන සිද්ධ ඔවි ඇති **සුඛුමච්ඡවි** නම් වූ මේ මහා පුරිෂ ලක්ෂණ ය ලත් සේක.

ඉදින් මේ මහාපුරුෂ ලක්ෂණයෙන් සමන්විත ව ගෘහවාස යෙහි විසූසේක් වී නම් ප්‍රඥාවෙන් අග්‍ර ව කාමභොගීන් කෙරෙහි සදෘශ වූ හෝ විශිෂ්ඨ වූ හෝ කිසිවෙක් නැති ව සප්විති රජ ඉසුරු විඳිනා සේක. මහාභිනිෂ්ක්‍රමණ් නික්ම පැවිදිවූ හෙයින් මහත් වූ අභිධර්මාදිය දන්නා මහාප්‍රඥාවෙන් ද ආකාශ ය සේ පෘථුල වූ ප්‍රඥාවෙන් ද, හංස බහුල තුණ්ඩි බහුල ප්‍රඥාවෙන් ද, ජවන හංස ගති බඳු ශීඝ්‍ර ප්‍රඥාවෙන් ද, තීක්ෂණප්‍රඥාවෙන් ද, විනිවිද පවත්නා ප්‍රඥාවෙන් ද, යුක්ත ව සියලු සතුන් කෙරෙහි ප්‍රඥාවෙන් අග්‍ර ව සම්බුදු ඥානයට ප්‍රාප්තවූ සේක.

එසින් වදළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො සමණං වා බ්‍රාහ්මණං වා උපසඞ්කමිත්වා පරිපුච්ඡිතා අහොසි. කිං භන්තෙ කුසලං? කිං අකුසලං? කිං සාවජ්ජං? කිං අනවජ්ජං? කිං සෙවිතබ්බං? කිං නසෙවිතබ්බං? කිං මෙ කතිරමානං දීඝරත්තං අහිතාය දුක්ඛාය අස්ස? කිං වා පන මෙ කතිරමානං දීඝරත්තං හිතාය සුඛාය අස්සාති? සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්න තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති —පෙ—.

සෝ තතෝ චුතෝ ඉත්ථත්තං ආගතෝ සමානෝ ඉදං මහාපුරිසලක්ඛණං පටිලභති. සුඛුමවඡවී හොති. සුඛුමත්තා ඡවියා රජෝ ජල්ලං කායෙ න උපලිම්පති. සෝ තෙන ලක්ඛණෙන සමන්නාගතෝ — සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ— රාජා සමානෝ කිං ලභති? මහාපඤ්ඤෝ හොති. නාඤ්ඤ හොති කොචි පඤ්ඤාය සදිසෝ වා විසිට්ඨෝ වා කාමෙ නොභිනං. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? මහාපඤ්ඤෝ හොති පුථුපඤ්ඤෝ හාසුපඤ්ඤෝ ජවනපඤ්ඤෝ නිබ්බෙධිකපඤ්ඤෝ. නාඤ්ඤ හොති කොචි පඤ්ඤාය සදිසෝ වා විසිට්ඨෝ වා. සබ්බඤ්ඤුතානං බුද්ධෝ සමානෝ ඉදං ලභති—යි.

13. ප්‍රසිද්ධ ශුද්ධ බුද්ධ ගුණාලඞ්කෘත වූ ඒ සම්භූරාජෝ තතමයානන්වහන්සේ පූර්ණවයෙහි සියලු සත්වයන් කෙරෙහි ක්‍රොධ නො කොට උපායාස බහුල නොවී අනෙකප්‍රකාරයෙන් බණ මින් සිවිසිදී ත් කොපයෙන් සිත් නොගටා ක්ෂමාව ම බහුල වූ සේක.

සිතින් මොලොක් ආසනාරණ පාපුරණාදි ය ද දන් දුන් සේක. ඒ කුසල බලයෙන් දෙවුලොව ඉපිද දිවඉසුරෙන් පිනා එයින් සැව මෙහි උපන් සේක් දැහැතුලෙන් මැද දිවිදළින් ගටා ගෙරිසක කමී කොට නිම් වූ එක ඝන රත් පිළිමයක් සේ සුවර්ණ වර්ණ වූ ඝන සිනිදු මට. රත්කඳක් සෙයින් **ප්‍රභාන බු ඡවි ඇති** මේ මහාපුරුෂ ලක්ෂණයෙන් සමන්විත වූ සේක. ඉදින් මේ මහා පුරුෂලක්ෂණ යෙන් සමන්විත ව ගෘහවාසයෙහි වියසේක් හි නම් සෙසුම කොශෙය්‍ය ආසනාරණ පාපුරණාදිය ලබමින් සතර මහත් දිවයින සක්විති රජ ඉසුරු විඳිනා සේක. ගෘහාභිනිෂ්ක්‍රමනය කොට පැවිදි වූ හෙයින් බුදු ව සෙසුම කොශෙය්‍ය ආසනාරණ පාපුරණාදි ය ලබමින් ලෝ මුදුන් පත් වූ සේක.

එයින් වදාළහ

යමපි භික්ඛවෙ තථාගතෝ පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතෝ සමානෝ අක්කොධනෝ අහොසි. අනුපායාස බහුලෝ. බහුම්පි වුත්තෝ සමානෝ නාභිසජ්ජි න කුප්පි. න ව්‍යාපජ්ජි. න පතිත්ථීසි න කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතුකාසි. දානං ච අහොසි සුඛුමානං මුදුකානං අත්ථරණානං පාපුරණානං ඛොමසුඛුමානං කප්පාසික සුඛුමානං කොසෙය්‍ය සුඛු

මානං කම්බලසුඛුමානං සෝ තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති.—පෙ—.

සෝ තතෝ චුතෝ ඉත්ථත්තං ආගතෝ සමානෝ ඉමං මහාපුරිස ලක්ඛණං පටිලභති. සුවණ්ණවණ්ණෝ හොති කඤ්චන සන්නිභත්තචෝ. සෝ තෙන ලක්ඛණෙන සමන්නාගතෝ සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්ක වත්ති —පෙ—. රාජා සමානෝ කිං ලභති? ලාභී හොති සුඛුමානං මුදුකානං අත්ථරණානං පාපුරණානං ඛොමසුඛුමානං කප්පාසික සුඛුමානං කොසෙය්‍යසුඛුමානං කම්බල සුඛුමානං. බුද්ධෝ සමානෝ ඉදං ලභති-යි.

14. මාගේ සවාමි වූ ඒ සම්මාසම්බුදුරාජෝත්තමයාණන්වහන්සේ පූර්වජන්මාන්තරයෙහි ඔවුනොවුන් කෙරෙහි බිඳී බොහෝ කලක් නොරට ගොස් වැදහුන්, බොහෝ කලක් ගම්න් බැහැර ගොස් වැදහුන්, නැයන් මිත්‍රයන් විශ්වාසින් ඒ ඒ තැනින් ගෙණ හැර තමතමන්ගේ ඥති ආදීන් හා සමග එක්කොට ඔවුනොවුන් කෙරෙහි මෙත්සින් උපදවන සේ අවවාද අනුශාසනාකොට, නැවත නොබිඳෙන ලෙසට සමගි සහවට්ට කර වූ සේක.

ඒ කුශල බලයෙන් දෙවුලොව ඉපිද දිවඉසුරෙන් පිණා එසින් සැව මෙහි උපන් සේක්, වෘෂභ වර වාරණාදීන්ගේ අඩහ ජාත සෙසින් පුරුෂ ව්‍යඤ්ජනය සවර්ණපදමකර්ණිකාවක් බදු කොශගහියෙහි අවනිත ව ප්‍රච්ඡන්න ව හෙමවසන්‍රයෙන් ගුහ්‍යකට යුතු බැවින් **කොශාවගූහිත වස්ත්‍ර ගුහ්‍ය** නම් වූ මේ මහාපුරුෂ ලක්ෂණයෙන් සමන්විත වූ සේක. ඉදින් මේ මහා පුරුෂ ලක්ෂණ යෙන් සමන්විත ව ගෘහවාසයෙහි විසූ සේක් වී නම්: බොහෝ දාසදාසීන් පුත්‍රයන් ඇති ව සත්තිනි රජඉසුරු විඳිනා සේක. අභිනිෂ්ක්‍රමණය කොට පැවිදි වූ හෙයින් ශාරිපුත්‍රාදී අනෙක මහාශ්‍රාවකයන් ශාක්‍ය පුත්‍රයන් විසින් පිරිවරණ ලදුව බුද්ධරාජ්‍ය යට පැමිණියහ සේක.

එසින් වදලහ

යම්හි කිඤ්චිවෙ තථාගතෝ පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිවාසං අනුස්සරති අනුස්සහුතෝ සමානෝ විරපපතථෙ විරපප තාස්නෝ අසඤ්ඤතිත්තෙන සුඛජෙජ සඛිනෝ සමානෙතා අහොසි.

මාතරමපි පුත්තෙන සමානෙතා අහොසි. පුත්තොපි මාතරා සමානෙතා අහොසි. පිතරමපි පුත්තෙන සමානෙතා අහොසි. පුත්තොපි පිතරා සමානෙතා අහොසි. භාතරමපි භාතරා සමානෙතා අහොසි. භාතරමපි භගිනියා සමානෙතා අහොසි. භගිනිමපි භාතරා සමානෙතා අහොසි. සම්ඛී කඤ්ඤා ච අබ්භනුමොදිතා අහොසි. සෝ තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජි-පෙ-.

සෝ තතෝ චුතෝ ඉත්ථත්තං ආගතෝ සමානෝ ඉමං මහාපුරිසලක්ඛණං පටිලභති. කොසොහිත වත්ථගුයෝ හොති. සෝ තෙන ලක්ඛණෙන සමන්නාගතෝ සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති—පෙ—. රාජා සමානෝ කිං ලභති? පභූත දූතෙනා හොති. පරොසහස්සං ඛෝ පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? පභූතපුත්තෝ හොති නෙකසහස්සා සබ්බා පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. බුද්ධෝ සමානෝ ඉදං ලභති—සි.

15. නිඛුවත නිම්මලජන රාජහංස නිසෙවිත පඞ්කජ කාණනා කාර ශ්‍රීපාද යුගලොපශොභිත වූ ඒ සර්ව්වඥරාජොත්තමයාණන්ව හන්සේ අතීත භවයෙහි මහාජන සඞ්ග්‍රහ ය පරිඝ්‍රාකරණ සේක් මේ පුරුෂතෙම මෙ තම් මෙ තම් සත්කාරයන් විඳගන්නට සුදුසු වන්නේ ය සි දැන පුරුෂ විශෙෂානුරූප සත්කාර කළ සේක.

ඒ කුශල බලයෙන් සවර්ගයෙහි ඉපිද දිව ඉසුරෙන් පිනා පුන මෙහි උපන් සේක්, කාය නෝ දීඝී වන, ව්‍යාම හෝ දිඝී වන, සෙසු ජනයන් සේ නොව පණස් හත් වත බැවින් හෝ සියක් හත් වත බැවින් හෝ සම වූ සඤ්ඤය හා සම වූ ශාඛා ඇති න්‍යග්‍රොධය දිගිනු දු විඤ්ඤාරයෙනු දු සම්පමණ වේ ද, එසෙසින් ම කයිනු දු ව්‍යාම යෙනු දු සම්පමණ වූ යම් පමණ කාය වි නම් එ පමණ ව්‍යාම ඇති යම් පමණ ව්‍යාම වී නම් එපමණ කාය ඇති **න්‍යග්‍රොධපරිමණ්ඩල** නම් වූ මේ මහාපුරුෂ ලක්ෂණය ද-

16. කඩිජ වත බැවින් උඬ්ඩ කාය අපරිපූර්ණ ව, වාමන නෙසින් අධඃකාය අපරිපූර්ණ ව සිට නොනැමී දෙ දන පිරිමදනට අසමර්ථ වූ උභය කාය ඇති වන බැවින් **ඔට නොනැමී දෙ අන්ලෙන් දෙ දන පිරිමදිනා** මේ මහා පුරුෂ ලක්ෂණ ය ද යන මේ පුරුෂ ලක්ෂණඩයෙන් යුක්ත වූ සේක.

ඉදින් මේ මහාපුරුෂ ලක්ෂණද්වයෙන් සමන්විත ව ගෘහවාසයෙහි විසූසේක් වී නම් ආඪ්‍ය ව මහත් ධනී ව මහත් වූ උපභොග පරිභොග ඇති ව, බොහෝ රන් රිදී මසු කහවනු ඇති ව, බොහෝ උපකරණ වස්තු ඇති ව, බොහෝ ධන ධාන්‍ය පරිපූර්ණ කොෂ කොෂ්ඨාගාර ඇති ව, සත්වැනි රජ ඉසුරු විඳිනා සේක. ගෘහනිෂ්ක්‍රමණය කොට පැවිජ් වූ නෙයින් ශ්‍රද්ධා ධනාදීන් ආඪ්‍ය ව මහද්ධනී ව මහත් වූ උපභොග පරිභොග ඇති ව බුද්ධරාජ්‍යයට පැමිණි සේක

එසින් වදළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං ප්‍රඛෙ ඉත්‍රස්සභූතො සමානො මහාජන සඞ්ගහං සමේ කඞ්ඛමානො සඤ්ජානාති. සාමං ජානාති. පුරිසං ජානාති. පුරිස විසෙසං ජානාති. අයමිද මරහති අයම්දමරහතී'ති තත්‍ර තත්‍ර පුරිස විසෙසකරෝ අහොසි. සෝ තස්ස කම්මස්ස කතත්තා උපචිනත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස හෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති-පෙ-.

සෝ තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි දෙව මහාපුරිස ලක්ඛණානි පටිලභති න්‍යග්‍රොධ පරිමණ්ඩලෝ ච හොති. සීතිකොව අනොනමනෙනා උභොහි පාණිතලෙහි ජනුකානි පරිමසති. පරිමජ්ජති සෝ තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සවෙ අගාරං අජ්ඣාවසති රාජා හොති. චක්කවත්ති-පෙ-. රාජා සමානො කිං ලභති? අඩ්ඪා හොති මහද්ධනො මහාභොගො පභූතජාතරූප රජතො පභූත විත්තූප කරණෙ පභූත ධනධඤ්ඤෙසු පරිපුණ්ණ කොසකොට්ඨාගාරෝ. රාජා සමානො ඉදං ලභති. බුද්ධෝ සමානො කිං ලභති? අඩ්ඪා හොති මහද්ධනො මහාභොගො – තස්සිමානි ධනානි හොන්ති: සෙය්‍යථිදං? සද්ධාධනං සීලධනං හිරිධනං ඔත්තප්ප ධනං සුතධනං චාගධනං පඤ්ඤාධනං. බුද්ධෝ සමානො ඉදං ලභති-සි

17. විශුද්ධ ගුණරත්න ප්‍රවරාකර වූ ඒ සර්ව්ඥ රාජොත්තම යානන් වහන්සේ පූර්ව්ජන්මානන්තරයෙහි සියලු සත්ත්වයන්ට වැඩ කැමති ව හිත කැමති ව ඵාසු කැමති ව යොගක්ෂෙම කැමති ව කිමෙක් ද මේ සියළු සත්ත්වයෝ කෙසේ නම් ශ්‍රද්ධාවෙන් ශීලයෙන් ශ්‍රුතයෙන් ත්‍යාගයෙන් ප්‍රඥාවෙන් ධනධාන්‍යයෙන් ක්ෂෙත්‍ර වස්තු වෙන් ද්විපද චතුෂ්පද ජාතීන්ගෙන් දාසකර්මකාරයන් ගෙන් ඥාති මිත්‍ර ජනයන් ගෙන් බන්ධූන්ගෙන් වැඩෙද්දේ හෝ සි සිතා සියලු

සතුන්ට වැඩකිරීමෙහි නිරත වූ සිත් ඇති ව උපකාර කළ සේක. ඒ කුශල බලයෙන් දෙව්ලොව ඉපිද දිව ඉසුරෙන් පිනා ද්‍රුන මෙහි උපන් සේක් **සිංහයාගේ ප්‍රථිවීසීඝාය** බඳු ශරීර ඇති බව ය.

18. නිමිනා ව පෙනෙන පිට දෙභාග ඇති සෙසු ජනයන් සේ නොව කටිය පටන් ගෙණ මාංස පටලයෙක් සකාඛය දක්වා උඩුත ව නැඟී රන් පෝරුවක් සෙයින් පිට වසා පිහිටි සෙයින් **චිතඝනරංඝ** ය සි කියන ලද මේ මහා පුරුෂලක්ඛණය ඇති බව ය.

19. කොකුන් සෙයින් දිස් වූ පළල් වූ ග්‍රීවා ඇති බණන කල ගිරාජාලා පැණෙන මද ව සවර නිගීත වෙන සෙසු ජනයන් සේ නොව සුවෘත්තා වූ රන්කලස කරක් බඳු කදට ඇති බණන කල ගිරාජාලා නොපැණෙන මෙඝයක්හුගේ ගර්ජන සෙයින් ගර්ජනා කරණ කල සවර මහත් වන **සම්මෘත්තා ස්ඝණ්ඨ** නම් වූ මේ මහා පුරුෂ ලක්ඛණය ද යන මේ පුරුෂ ලක්ඛණ තුන්හී යුකත වූ සේක.

ඉදින් මේ මහාපුරුෂ ලක්ඛණ තුන්හී යුකත ව ගෘහවාස යෙහි විසූසේක් වී නම්: නොපිරිහෙන ධන ධාන්‍ය ක්ෂෙත්‍ර වසතු වෙන් දවිපද චතුෂ්පද ඥාතීන් ගෙන් පුත්‍රදාරාවන් ගෙන් දස කම්කාරාදීන් ගෙන්, ඥතීන්ගෙන්, මිත්‍රයන්ගෙන්, බන්ධූන්ගෙන් යුකත ව නොපිරිහෙන සියලු සම්පත්තීන් යුකත ව සක්විති රජසිරි විඳිනා සේක. ගෘහාභිනිෂ්ක්‍රමණ ය කොට පැවිජී වූ හෙයින් ශ්‍රද්ධාවෙන් ශීල යෙන් ශ්‍රැතයෙන් ත්‍යාගයෙන් ප්‍රඥාවෙන් සප්ත සම්පත්තීන් නොපිරි හෙන සවභාව ඇති වූ බුද්ධ රාජ්‍යයට පැමිණි සේක.

එසින් වදාළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො බහුනො ජනස්ස අත්ථ කාමො අහොසි හිතකාමො ඵාසු කාමො යොගක්ඛෙම කාමො. කිනති මෙ සද්ධාය වඩ්ඪිතබ්බං සීලෙන වඩ්ඪිතබ්බං සුතෙන වඩ්ඪිතබ්බං චාගෙන වඩ්ඪිතබ්බං පඤ්ඤාය වඩ්ඪිතබ්බං ධනධඤ්ඤෙන වඩ්ඪිතබ්බං ඛෙත්තවත්ථුනා වඩ්ඪිතබ්බං දිපද චතුප්පදෙහි වඩ්ඪිතබ්බං පුත්තදාරෙහි වඩ්ඪිතබ්බං දාස කම්මකර පොරිසෙහි වඤ්ඤිතබ්බං ඤාතීහි වඩ්ඪිතබ්බං මිත්තෙහි වඩ්ඪිතබ්බං බන්ධවෙහි වඩ්ඪිතබ්බන්ති–

සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපප ජ්ජති —පෙ—. සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානෙ

ඉමානි තීණි මහා පුරිසලක්ඛණානි පටිලභති? සිහපුබ්බද්ධකායෝ ච හොති. චිතන්තරංසෝ ච සම්වත්තක්ඛන්ධෝ ච, සෝ තෙහි ලක්ඛණෙහි සමන්නාගතෝ - සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ—.

රාජා සමානෝ කිං ලභති? අපරිහානි ධම්මෝ හොති. න පරිහායති ධනධඤ්ඤන ඛෙත්තවත්ථූනා දිපද චතුප්පදෙහි පුත්ත දාරෙහි දාස කම්මකර පොරිසෙහි ඤාතිහි මිත්තෙහි බන්ධවෙහි. න පරිහායති සබ්බසම්පත්තියා. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? අපරිහාන ධම්මෝ හොති. න පරිහායති සද්ධාය සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය. න පරිහායති සබ්බසම්පත්තිහි. බුද්ධෝ සමානෝ ඉදං ලභති-යි.

20. ප්‍රවර සුවිසුද්ධ සඞ් ගුණගණානුරණ විභූසිත වූ ඒ සඞ්ඝ යන් වහන්සේ පූජ්‍යජනමානනාරයෙහි අතින් පයින් කැවින් මුඛ රෙන් ශස්ත්‍රයෙන් සත්‍රියන්ට මැරීම් තැළීම් වශයෙන් වෙහෙස නුදුන් සේක. ඒ කුශල බලයෙන් සවගීයෙහි ඉපිද දිව ඉසුරු විඳ එයින් සැව මෙහි උපන් සේක් සත්ත්‍රියයක් රසහරණීනු ඊර්ඛවා ග්‍ර ව ත්‍රිවයෙහි ම ප්‍රතිමුක්ත ය ත නිලබීජයක් පමණ ආහාරයෙ කුදු ජිහ්වාග්‍රයෙහි තබන ලද්දේ සඞ් ශරීරයෙහි ඕජස් අනුස්ම රණ ය කරණ හෙයින් රසයන්ගේ ග්‍රාශ ය, අදන ය, කරවන් නෙන් **රසග්‍රාසාග්‍ර** නම් මේ මහා පුරුෂ ලක්ෂණයෙන් සමන්විත වූ සේක.

ඉදින් මේ මහා පුරුෂ ලක්ෂණයෙන් සමන්විත ව අගාර මද්ධ්‍යයෙහි විසූ සේක් වී නම්: අල්පාබාධ ව සන්විති රජසිරි විඳිනා සේක. ගෘහානිනිෂ්ක්‍රමණ ය කොට පැවිජී වූ හෙයින් අල්පාබාධ ව බුද්ධ්‍රාජ්‍යයට ප්‍රාප්ත වූ සේක.

එයින් වදලහ

යම්පි භික්ඛවෙ තථාගතෝ පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතෝ සමානෝ සත්තානං අවිහෙඨක ජාතිකෝ අහොසි පාණිනා වා ලෙඩ්ඩුනා වා දණ්ඩෙන වා සත්ථෙන වා. සෝ තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපප ජ්ජති —පෙ—. සෝ තතෝ චුතෝ ඉත්ථත්තං ආගතෝ සමානෝ

ඉමං මහාපුරිස ලක්ඛණං පටිලභති – රසග්ගසග්ගී හොති උද්ධග්ගස්ස රාජකරණියෝ ජීවාය ජාතා හොන්ති සම්පිවාභිතියෝ. සෝ තෙන ලක්ඛණෙන සමන්නාගතෝ සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ—.

රාජා සමානෝ කිං ලභති? අපපාබාධෝ හොති අපපාතඞ්කෝ සම්වෙපාකිණියා ගහණියා සමන්නාගතෝ නාති සීතාය නාවුණ්හතාය. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? අපපාබාධෝ හොති අපපාතඞ්කෝ සම්වෙ පාකිණියා ගහණියා සමන්නාගතෝ නාති සීතාය නාවුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය. බුද්ධෝ සමානෝ ඉදං ලභති–සි.

---

21. වෛනෙය ජනොත්පල කුසුම වනසණ්ඩ ප්‍රබෝධන ප්‍රවර දශශත කිරණායමාන වූ ඒ සම්බුදු රාජෝත්තමයාණන් වහන්සේ අතීත භවයෙහි ප්‍රිය නෙත්‍රයෙන් සියලු ජනයා බැලූ සේක. ඒ කුශල බලයෙන් දෙවුලොව ඉපිද දිව ඉසුරෙන් පිනා පුන මෙහි උපන් සේක්– අභිනීල නෙත්‍ර ඇති වූ සේක නෙවත් සියලු නුවණ ම නිල්නොවතුදු නිල් වුවමනා තන්හි – දියඹෙරලිය මල් වැනි ඉතා පිරිසුදු නිල්පැහැය රන්වන් වුවමනා තන්හි කිණිහිරි මල් වැනි ඉහා පිරිසුදු රන්වන් පැහැය රත් වුවමනා තන්හි බඳුවදමල් පැහැ වැනි රත් පැහැය සුදු වුවමනා තන්හි දවහන් තරු වැනි සුදුපැහැය කළු වුවමනා තන්හි රෑක් පෙණෙන ඇට වැනි ඉතා පිරිසුදු කළු පැහැ ඇති ව නෙත්‍ර යුගලයෝ රන්වීම නෙක්හි මිණි සිවි මැදුරු සෙසින් වැටෙන **අගිනිල වූ නෙත්‍රයන්** ඇති මේ මහා පුරුෂ ලක්ෂණයෙන් සමන්විත වූ බව ය.

---

22. අක්ඛිගුලයෝ අපරිපූණ්ණ ව විනිග්ගත ව ගම්භීර ව නිබ්බෙන අක්ඛියුගළයන් ඇති සෙසු ජනයන් සේ නො ව එ විගස උපන් රතු වස්සක්හුගේ අක්ඛිගුල සදෘශ වූ අක්ඛියුගළ ඇති **ගොපක්ඛම** නම් වූ මේ මහා පුරුෂ ලක්ෂණය ඇති බව ය – යන මේ පුරුෂ ලක්ෂණ ද්වයෙන් සමන්විත වූ සේක. ඉදින් මේ මහාපුරුෂ ලක්ෂණද්වයෙන් සමන්විත ව ගෘහවාසයෙහි විසූසේක් නම්: බ්‍රාහ්මණ ගෘහපතිකාදීන්ට ප්‍රිය දර්ශනීය ව සක්විති රජ ඉසුරු විඳිනා සේක. ගෘහාභිනිෂ්ක්‍රමණය කළ හෙයින් භික්ෂු – භික්ෂුණී – උපාසක – උපාසිකාදී සියලු සත්වයන් ප්‍රිය දර්ශනීය ව සම්බුදු පදප්‍රාප්ත වූ සේක.

එසින් වදුළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං ප්‍රබෙඛ මනුස්සභූතො සමානො න ච විසටං න ච විසා චිතං න පන විවෙය්‍ය පෙක්ඛිතා උජු තථා පඤව මුදුමනො පිය වක්ඛුනා ඛහුජනං උදික්ඛිනා අහොසි. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති —පෙ—.

සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි දෙ මිහාපුරිස ලක්ඛණානි පටිලහති අනිනිල නෙත්තො ච හොති හොපම්ඛො ච.

සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සවෙ අගාරං අජ්ඣා වසති රාජා හොති චක්කවත්තී —පෙ—. රාජා සමානො කිං ලහති? පියදස්සනො හොති. ඛහුනො ජනස්ස පියො හොති මනාපො ඛ්‍රාහ්මණ ගහපතිකානං නෙගම ජානපදානං ගණක මහාමත්තානං අණිකට්ඨ දෙවාරිකානං අමච්චානං පාරිසජ්ජානං රාජූනං හොගියානං කුමා රානං. රාජා සමානො ඉදං ලහති.

බුද්ධො සමානො කිං ලහති? පියදස්සනො හොති ඛහුනො ජනස්ස පියො හොති මනාපො භික්ඛුනං භික්ඛුණීනා උපාසකානං උපාසිකානං දෙවානං මනුස්සානං අසුරානං නාගානං ගන්ඛබ්බානං. බුද්ධො සමානො ඉදං ලහති-සි.

23. ලොකොත්තර ගුණ කුසුම ඵල පල්ලවාලඞ්කෘත සුර පාදප වූ ඒ සම්බුදුයන් වහන්සේ අතීත ජන්මාන්තරයෙහි බො- හෝ සඵුයන් කායසුචරිතයෙහි- වචීසුචරිතයෙහි- මනොසුචරිත යෙහි- දානසංවිභාගයෙහි- ශීලසමාදානයෙහි- උපොසථූපවාසයෙහි- මෙත්තෙය්‍යතායෙහි - පෙත්තෙය්‍යතායෙහි- සාමඤඤතායෙහි- ඛ්‍රහම ඤඤතායෙහි – කුලජ්‍යෙෂ්ඨාපචායිතායෙහි – අන්‍යතරත්‍යතර අභි කුශලධර්මයෙහි - පෙරදුරිකොට හැසිර වූ සේක. ඒ කුශල බලයෙන් දෙව්ලොව ඉපිද දිවඉසුරු විඳ පුන මෙහි උපන් සේක් **උෂ්ණීෂ ශීර්ෂ** නම් මේ මහාපුරුෂ ලක්ෂණයෙන් යුක්ත වූ සේක.

—හෙවත්—

හේ පරිපූර්ණ ලළාට ද පරිපූර්ණ ශිඛිතා ද් ගෙන කියන ලද්දේ ය. බුදුන් දකුණු කන් සිළ පටන් ගෙණ මාංශ පටලයෙක් සමුත්ථිත ව සියලු නළල වසා පුරා ගොස් වම් කන් සිළ සිටියේ ය

රජෙකු නළල බඳ රන්පටක් සෙයින් දිලිසෙයි පශ්චිම භවික බොධිසත්වයන්ගේ මේ ලක්ෂණය දැක රජනට උෂ්ණීෂ පට කළහ මේ එක් අවිසෙක. සෙසු ජනයෝ අපරිපූර්ණ සිරස් ඇති වෙති. ඇතම් කෙණෙක් කල්ප ශිඛී වෙති. ඇතම් කෙණෙක් අසිපි ශිඛී වෙති. ඇතම් කෙණෙක් කුච්ඡ ශිඛී වෙති. ඇතම් කෙණෙක් ප්‍රාග්භාර ශිඛී වෙති. බුදුනට වූ කලි හිදිඅයින් වටා තුබුවාක් සෙයින් පරිපූර්ණ වූ උදක බුබ්බුදයක් බඳ සිරස් වෙයි

එහි ප්‍රථම පක්ෂයෙහි උෂ්ණීෂයෙන් වෙළන ලද හිස් වැන්නෙන් උෂ්ණීෂ විය. දවිතීය පක්ෂයෙහි උෂ්ණීෂයක් සෙයින් හැම තැන්හි පරිමණ්ඩලශිඛී-උෂ්ණීෂශිඛී නම් වෙති සි ගුරුළුගෝමීන් විසින් බොධිවංශ පරිකථාවෙහි ලා විනිශ්චය කරණ ලද උෂ්ණීෂශිඛී නම් මේ මහාපුරුෂලක්ෂණයෙන් යුක්ත වූ සේක. ඉදින් මේ මහාපුරුෂ ලක්ෂණයෙන් සමන්විත ව ගෘහවාසයෙහි විසූ සේක් නම් බ්‍රාහ්මණ ගෘහපතිකාදීන් විසින් අනුව පවත්නා ලබ මින් සක්විති රජසිරි විඳිනා සේක ගෘහානිනිෂ්ක්‍රමණය කළ නෙසින් සදෙවාමර මානුජයන් විසින් අනුව පවත්නා ලදු ව බුද්ධ පූජ්‍යයට ප්‍රාප්ත වූ සේක

එසින් වදලහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං නවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො බහුජන පුබ්බඞ්ගමො අහොසි: කුසලෙසු ධම්මෙසු බහුජන පාමොක්ඛො කායසුචරිතෙ වචීසුචරිතෙ මනොසුචරිතෙ දානසංවිභාගෙ සීලසමාදානෙ උපොසථූපවාසෙ මාතෙය්‍යතාය පෙත්තෙය්‍යතාය සාමඤ්ඤතාය බ්‍රහ්මඤ්ඤතාය කුලෙජෙට්ඨාපචායිතාය අඤ්ඤතරඤ්ඤතරෙසු අධිකුසලෙසු ධම්මෙසු. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා අසස්සත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සහං ලොකං උපපජ්ජති—පෙ—.

සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමං මහා පුරිසලක්ඛණං පටිලභති. උණ්හීසසීසො හොති. සො තෙන ලක්ඛණෙන සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති—පෙ—. රාජා සමානො කිං ලභති? මහාසස ජනො අඞ්ගසිකො හොති බ්‍රාහ්මණ ගහපතිකා නෙගම ජානපද ගණක මහාමත්තා අණ්ඩකට්ඨා දෙවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානෙ

හොඟියා කුමාරා රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමාහෝ කිං ලභති? මහාජන ජනෝ අඞ්ගාසිකෝ හොති භික්ඛු භික්ඛුණියෝ උපාසකා උපාසිකායෝ දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධෝ සමානෝ ඉදං ලභති-සි.

---

24 සුපරි සුද්ධ ප්‍රවර නිඛිල ගුණරත්න නිධිනිකෙත නිර්මි ඝෙෂ වූ ඒ සම්බුරුජෝත්තමයානන් වහන්සේ පූර්විජන්මාන්තර යෙහි මුසාවාදයෙන් දුරු ව සත්‍යවාදී ව සත්‍යයෙන් සත්‍යය අතු රෙහි බොරුවක් නො කියා ගළපමින් සිර ව පිහිටි වචන බෙණෙ මින් ඇදහිලි කටයුතු වචන බෙණෙමින් ලෝකයා. සම්බන්ධ ව විසංවාද නොකොට සත්‍යවාදී වූ සේක. ඒ කුශල බලයෙන් දෙව්ලොව ඉපිද දිවඉසුරෙන් පිනා පුන මෙහි උපන්සේක් එක කූප යෙක් හි දෙකක් නුණෙකු දු ලොම් ඇති සෙසු ජනයන් සේ නො ව එකෙකි කූපයෙහි **එකෙක ලොම් ඇති** මේ මහාපුරුෂ ලක්ෂණය ද—

---

25. ඌර්ණරෝමධාතුව ඇති බව ද හෙවත් ඒ ලොම් තළල් මැද වූ යේ ය. ඉතා පිරිසිදු දවහන් තරු වැන්න. පහන් ගිතෙල ගලා තුබූ සියක් වට පෙළ. පුලුන්පෙදක් සෙසින් මෙලෙක. හිඹුල් පුලුන් ලියපුලුන් හා සමාන ම ය. ඒ රෝමයෝ කෙළවර ගෙන අදනා ලද්දාහු අඞ්ගුලිප්‍රමාණ වෙති. විහිදුනා ලද්දාහු දක්ෂිණා වර්තිත ව ඌර්ධ්වාග්‍ර ව සිටිති.

සවණි ඵලක මධ්‍යයෙහි තුබූ රජත බුද්බුදයක් සෙසින් සවණ්කලසයෙන් නික්මෙන ක්ෂීරධාරා සෙසින් අරුණප්‍රභා රහිත ගගනතලයෙහි ඔසධිතාරකා සෙසින් අතිමනොහර ව දිස්නි. මෙය **ඌර්ණරෝම** නමැ සි කියා බොධිවංස පරිකථාවෙහි වර්ණනාකරණ ලද දෙබැම් අතුරෙහි හටගත් **ඌර්ණරෝම** නම් මේ මහාපුරුෂ ලක්ෂණය ද යන මහාපුරුෂ ලක්ෂණඥයෙන් යුක්ත වූ සේක. ඉදින් මේ මහාපුරුෂ ලක්ෂණඥයෙන් සමන්විත ව ගෘහවාසයෙහි විසූ සේක් නම් බ්‍රාහ්මණ ගෘහපතිකාදීන් විසින් සමීප වර්තිත ව සත් විනි රජසිරි විඳිනා සේක. ගෘහාභිනිෂ්ක්‍රමණ ය කළ හෙයින් සතරාමර ලෝකයා විසින් සම්පවර්ති ව සම්බුදපදප්‍රාප්ත වූ සේක

එසින් වදාළහ

යම්පි. භික්ඛවෙ තථාගතෝ පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතෝ සමානෝ මුසාවාදං පහාය මුසාවාදා පටිවිරතෝ අහොසි. සච්චවාදී සච්චසන්ධෝ ථෙතෝ පච්චයිකෝ

අවිසංවාදකො ලොකස්ස. සො තස්ස කම්මස්ස කතත්තා උප චිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති —පෙ— සො තතො චුතො ඉධෙත්තං ආගතො සමානො ඉමානි දෙ මහාපුරිස ලක්ඛණානි පටිලභති එකෙක ලොමෝ ච හොති. උණ්ණා භමුකන්තරෙ ජාතා හොති ඔදාතා මුදු තූල සන්නිභා

සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ—. රාජා සමානො කිං ලභති? මහාස්ස ජනො උපවත්තති බ්‍රාහ්මණ ගහපතිකා නෙගම ජානපදා ගණක මහාමත්තා අණ්ඩකට්ඨා දෙවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො භොගියා කුමාරා රාජා සමානො ඉදං ලභති. බුද්ධො සමානො කිං ලභති? මහාස්ස ජනො උපවත්තති භික්ඛු භික්ඛුණියො උපාසකා උපාසිකායෝ දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධා සමානො ඉදං ලභති—යි.

26. සකී පරවාදීහ කුවිහ විදූරණ ප්‍රවර සිංහරාජ වූ ඒ සකීඳු රාජෝත්තමයානන් වහන්සේ දැකී ජන්මාන්තරයෙහි පෙශුන්‍ය වචන ය හැර කේලම්න් ඔහුනොවුන් හා බිඳුවන වචනයෙන් දුරු ව මෙතනින් යම්ක් මොවුන්ගේ නෙදය පිණ්ස එ තැන්හි නොකියන සුලු ව එතනින් යමක් අසා ඔවුන්ගේ නෙද ය පිණ්ස මොවුන්ට නොකියන සුලු ව භින්න වූ සඞ්ඝයන් ගළපන සුලු ව සමගි වූවන්ට අනුබල දෙන සුලු ව සමගි තන්හි වාසය ඇති ව සමගි වූවන් කෙරෙහි ඇලුම් ඇති ව සමගි වූවන් දැක ත් අසා ත් සතුටු ව යම් වචනයක් කිකල සඞ්ඝයන් සමගි කෙරේ ද ඒ සාමග්‍රීගුණ ය ප්‍රකාශකරණ වචන ය ම කියන සුලු වූ සේක. ඒ කුසල බලයෙන් දෙව්ලොව ඉපිද දිවඉසුරෙන් පිනා පුන මෙහි උපන්සේක් උපරිඤාන් හනුයෙහි පිහිටි දනතයෝ විස්සෙක. අධස්තාත් හනුයෙහි පිහිටි දනතයෝ විස්සෙකැ යි කියා **චත්තාරිංශත් දන්තයන් ඇති** මේ මහා පුරුෂලක්ෂණ ය ද—

27. කුමිරීලයන් දත් සෙයින් විරළ ව නිබෙන මතස්‍ය මාංසා දිය කන කල දත් අතුරුතුරු පිරෙණ සෙසු ජනයන් සේ නොව පබළු පත්හි බඳ විදුරු පෙළක් සෙයින් අවිවර ව තෙලිහුඩින් දක්වන පරිවෙජදයක් බඳු **අවිවර දන්තයන්** ඇති මේ මහා පුරුෂ ලක්ෂණ ය ද යන මේ මහාපුරුෂ ලක්ෂණ දෙකින් යුක්ත වූ සේක.

ඉදින් මේ මහා පුරුෂ ලක්ෂණ දෙකින් සමන්විත ව ගෘහවාසයෙහි විසූ සේක් නම් කිසි කෙණෙකුත් විසින් නොබිඳිය හැකි වූ බ්‍රාහ්මණ ගෘහපතිකාදී අනෙදෑ පිරිවර ඇති ව සක්විති රජ ඉසුරු විඳිනා සේක් ගෘහනිෂ්ක්‍රමණ ය කළ හෙයින් අනෙදෑ වූ භික්ෂු - භික්ෂුණී උපාසක – උපාසිකා – දිව්‍ය-මනුෂ්‍ය – අසුර-නාග-ගන්ධර්‍වයන් විසින් පිරිවරණ ලදු ව බුද්ධත්වයට ප්‍රාප්ත වූ සේක.

එසින් වදළහ

යම්පි භික්ඛවේ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො පිසුණං වාචං පහාය පිසුණාය වාචාය පටිවිරතො අහොසි. ඉතො සුත්වාන අමුත්‍ර අක්ඛාතා ඉමෙසඤ්ඤාදය, අමුත්‍ර වා සුත්වා න ඉමෙසං අක්ඛාතා අමූසං භෙදාය. ඉති භින්නානං වා සන්ධාතා සහිතානං වා අනුප්පදාතා සමග්ගාරාමෙ සමග්ගරතො සමග්ග නන්දි සමග්ගකරණිං වාචං භාසිතා අහොසි. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පජ්ජති —පෙ—.

සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහාපුරිස ලක්ඛණානි පටිලභති. චත්තාරිස. දන්තා හොති අච්චර දන්තා ච. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති -පෙ-. රාජා සමානො කිං ලභති? අභෙජ්ජ පරිසො හොති. අභෙජ්ජාසස හොන්ති බ්‍රාහ්මණ ගහපතිකා නෙගම ජානපද ගණක මහාමත්තා අණීකට්ඨා දෙවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානො හොහියා කුමාරා. රාජා සමානො ඉදං ලභති. බුද්ධා සමානො කිං ලභති? අභෙජ්ජ පරිසො හොති. අභෙජ්ජාසස හොන්ති භික්ඛු භික්ඛුණියො උපාසක උපාසිකායො දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධා සමානො ඉදං ලභති-සි.

---

28. මනුජ සුරාසුර රාජහංස නිසෙවිත නීරජ කානනා කාර පාද යුගලොප සොභිත වූ ඒ සම්බුදුරජාණන් වහන්සේ පූර්‍වජන්ම යෙහි කණ්ණියට කකීශ වූ. එරූඪ වචනයෙන් දුරු ව යම් වචනයක් තොමෝ නිර්දෝෂ ද ව්‍යංජන මධුරත්වයෙන් කණ්ණියට සැප ද අති මධුරත්වයෙන් සකල ශරීරයෙහි කෝප නුපදවා ප්‍රේම උපදවන

හෙයින් ප්‍රේම කටයුතු ද අස්ඛලිත ව සැප සේ සිතට වදන හෙයින් සිත්කලු ද ගුණ සම්පූර්ණ බැවින් සිවුමැලි ද බොහෝ ජනයාට ප්‍රිය වේ ද බොහෝ ජනයාට සිතට අනිවාඩිකර ද එබඳු වූ වචනයක් ම කියන සුලු වූ සේක.

ඒ කුශල බලයෙන් දෙවිලොව ඉපිද දිව ඉසුරෙන් පිනා පුන මෙහි උපන් සේක් සතුල වූ දිවු ඇති කාශ වූ දිවු ඇති ලුහුබු දිවු ඇති බද දිවු ඇති හිඟම දිවු ඇති සෙසු ජනයන් සේ නො ව මේලෙක් වන බැවින් දිව කෙළින් හිදක් සේ වටා ගෙණ දෙ නාසිකාවිශිද්‍ර පිරිමදිනි. දික්වන බැවින් දෙ කර්ණවිශිද්‍ර පිරිමදිනි. පළල් වන බැවින් කෙශාන්තාපර්‍යන්තවසාන කොට ඇති සියලු ලලාට ය ප්‍රච්ඡාදනා කරණ මෙලෙක් වූ දික් වූ පලල් වූ වර්ණසම්පන්න වූ **ප්‍රභූත ජිව්හා** නම් මේ මහා පුරුෂ ලක්ෂණ ය ද-

29. ඡින්නාස්වර ඇති භින්නාස්වර ඇති කාකස්වර ඇති සෙසු ජනයන් සේ නො ව මහා බ්‍රහ්මයාගේ සවර බදු වූ කුරුවි කෙවිල්ලන් හඬ සෙයින් **මධුර වූ සවර ඇති** මේ මහා පුරුෂ ලක්ෂණ ය ද යන මේ මහා පුරුෂ ලක්ෂණ දෙකින් යුක්ත වූ සේක. ඉදින් මේ මහා පුරුෂ ලක්ෂණ දෙකින් යුක්ත ව ගෘහවාසයෙහි විසූ සේක් වි නම් බ්‍රාහ්මණ ගෘහපතිකාදීන් විසින් අදහාගත හැකි බස් ඇති ව සක්විති රජසිරි විඳිනා සේක. ගෘහාභිනිෂ්ක්‍රමණ ය කළ හෙයින් සනරාමර ලෝකයා විසින් අදහා ගත හැකි බස් ඇති ව බුද්ධ රාජ්‍යයට ප්‍රාප්ත වූ සේක.

එසින් වදළහ

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො ඵරුසං වාචං පහාය ඵරුසාය වාචාය පටිවිරතො අහොසි. යා සා වාචා නෙලා කණ්ණසුඛා පෙමණීයා හදයඞ්ගමා පොරී බහුජනකන්තා බහුජන මනාපා තථා රූපිං වාචං භාසිතා අහොසි. සො තස්ස කම්මස්ස කන්තත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති —පෙ—. සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි ද්වෙ මහා පුරිසලක්ඛණානි පටිලභති. පභූතජිව්හො ච හොති බ්‍රහ්මස්සරො ච කරවීකභාණී. සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සබෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ—.

රාජා සමානෝ කිං ලභති? ආදෙය්‍යවචෝ හොති ආදිය නතිස්ස වචනං බ්‍රාහ්මණ ගහපතිකා නෙගම ජානපදා ගණක මහා මත්තා අණිකට්ඨා දෙවාරිකා අමච්චා පාරිසජ්ජා රාජානෝ භොගියා කුමාරා. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? ආදෙය්‍යවචෝ හොති ආදිය නතිස්ස වචනං භික්ඛූ භික්ඛුණියෝ උපාසකා උපාසිකායෝ දෙවා මනුස්සා අසුරා නාගා ගන්ධබ්බා. බුද්ධෝ සමානෝ ඉදං ලභති-සි.

---

30. ක්‍රෑර තිර්‍යක මානඛග ප්‍රවර මෘගෙන්ද්‍ර වූ ඒ සම්බුදුයන් වහන්සේ සංසාරයෙහි සැරිසරණ සේක් සම්ඵප්‍රලාප ය සි කියන ලද වැඩ නැති බසින් දුරු ව කිය යුතු කල් සලකා කී සේක. සත්‍ය ය කී සේක. දෘෂ්ටධාර්මික සාම්පරායික අර්ථ නිශ්‍රිත ව ම කී සේක. නව ලොකොත්තර ධර්‍මය නිශ්‍රිත ව ම කී සේක. සංවර විනය පහාන විනය යන දෙවිප්‍රකාර විනය නිශ්‍රිත ව ම කී සේක. යුක්ත ප්‍රාප්ත කාලයෙහි උපමා හා කාරණා සහිත වූ පර්‍යාප්තවත් වූ අනිවර්ධි යෙන් යුක්ත වූ සිත්හි නිධානයක් මෙන් තිබිය යුතු බස් ම කියන සුලු වූ සේක. ඒ කුශල බලයෙන් දෙව්ලොව ඉපිද දිව ඉසුරෙන් පිනා පුන මෙහි උපන් සේක් සිංහයාගේ අධිස්ථානත් හනුව සෙයින් දෙ හනුව ම පරිපූර්ණ ව පුර දෙළොස්වක සඳ වැනි වූ **සිහහනු** නම් මේ මහා පුරුෂ ලක්ෂණයෙන් සමන්විත වූ සේක.

ඉදින් මේ මහා පුරුෂ ලක්ෂණයෙන් යුක්ත ව අගාර මධ්‍ය යෙහි විසූ සේක් කිසි පසමිතුරෙකු විසින් නසාලිය නො හැකි ව සත්විනි රජ ඉසුරු විඳිනා සේක. මහබිනික්මන් කළ හෙයින් අභ්‍යන්තරයෙහි වූ රාගයෙන් වේව සි වෙෂයෙන් වේව සි මොහ යෙන් වේව සි බාහ්‍ය වූ ශ්‍රමණයෙකු විසින් වේව සි බ්‍රාහ්මණ යෙකු විසින් වේව සි දෙවියෙකු විසින් වේව සි මාරයෙකු විසින් වේව සි බ්‍රහ්මයෙකු විසින් වේව සි ලොකයෙහි කිසි කෙණෙකුන් විසින් වේව සි නසාලිය නොහැකි ව සම්බුදභාවයට ප්‍රාප්ත වූ සේක.

එයින් වදාළහ

යම්පෙ භික්ඛවෙ තථාගතෝ පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතෝ සමානෝ සම්ඵප්පලාපං පහාය සම්ඵප්පලාපා පටිවිරතෝ වාචං භාසිතා අහොසි. කාලෙන සාපදෙසං පරියන්තවති අහොසි. කාලවාදී භූතවාදී අත්ථවාදී ධම්ම වාදී විනයවාදී නිධානවතිං අත්ථසංහිතං. සෝ තස්ස කම්මස්ස

කතත්තා උපචිතත්තා උසන්නත්තා පිපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සහගං ලොකං උපපජ්ජති —පෙ—. සෝ තතෝ චුතෝ ඉත්ථත්තං ආගතෝ සමානෝ ඉමිං මහාපුරිසලක්ඛණං පටිලභති. සීහහනු හොති. සෝ තෙන ලක්ඛණෙන සමන්නාගතෝ සචෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති —පෙ—.

රාජා සමානෝ කිං ලභති? අපපඨංසිකෝ හොති කෙනචි මනුස්සභූතෙන පච්චත්තිකෙන පච්චාමිත්තෙන. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? අපපඨංසිකෝ හොති කෙනචි මනුස්සභූතෙන පච්චත්තිකෙන පච්චාමිත්තෙන. රාජා සමානෝ ඉදං ලභති. බුද්ධෝ සමානෝ කිං ලභති? අපපඨංසිකෝ හොති අබ්භන්තරෙහි වා බාහිරෙහි වා පච්චත්තිකෙහි පච්චාමිත්තෙහි රාගෙන වා දෙසෙන වා මොහෙන වා සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං. බුද්ධෝ සමානෝ ඉදං ලභති-සි.

31. ප්‍රචණ්ඩ මොහාන්ධකාර ප්‍රබන්ධ විධ්වංසන ප්‍රවරාදිත්‍ය වූ ඒ සම්බුදුරජාණන් වහන්සේ අතීත භවයෙහි මිථ්‍යාජීවයෙන් දුරු වූ සේක. තරාදිය පලම් දඬු ආදියෙන් වඤ්චාකොට ගන්නා තුලා කූට ය, රත්තලි හා රන් ගෑ තලි මිශ්‍රකොට වඤ්චාකරන්නා වූ කංස කූට ය, වී සාල් තෙල් ආදිය වඤ්චාකොට මැනගන්නා මානකූට ය නිමියන් අනිමිකොට අනිමියන් නිමිකොට අන්ලස් ගන්නා උකෙකා ටන ය, ඒ ඒ උපායෙන් මෙරමා වඤ්චාකිරීම ය යෙදීම් වශයෙන් හෝ මායම් වශයෙන් හෝ මැණික් රත්රන් නොවන දෙය මැණික් රත්රනැ සි කියා වඤ්චාකිරීම ය යන මොවුන්ගේ කුටිල ප්‍රයෝග යෙන් දුරු වූ සේක. මිථ්‍යාජීවයෙන් දුරු ව සම්‍යග් ආජීවයෙන් ජීවිකාව කළ සේක.

ඒ කුශල බලයෙන් දෙවිලොව ඉපද දිව්‍ය වූ ආයුෂයෙන් දිව්‍ය වූ වර්ණයෙන් දිව්‍ය වූ සැපයෙන් දිව්‍ය වූ යශසින් දිව්‍ය වූ අධිපති භාවයෙන් දිව්‍ය වූ රූපයෙන් දිව්‍ය වූ ශබ්දයෙන් දිව්‍ය වූ ගන්ධයෙන් දිව්‍ය වූ රසයෙන් දිව්‍ය වූ ස්ප්‍රෂ්ටව්‍යයෙන් හිරු උදයෙහි බබ්බෙහකාමීන් සෙයින් සෙසු දෙවියන් මැඩ පැවත ප්‍රමාණාති ක්‍රාන්ත කාලයක් මුලුල්ලෙහි දිව ඉසුරු විඳ පුන මෙහි උපන් සේක්-ඇතම් දන් උස් ව ඇතම් දන් මිටි ව දනතයන් විෂම ව නිබෙන සෙසු ජනයන් සේ නො ව යපනින් සිදුනා ලද සඤ්පතක් සෙයින් **සම වූ දනතයන්** ඇති මේ මහා පුරුෂ ලක්ෂණ ය ද-

32. පූතිදන්තයන් නැගෙණ බැවින් ඇතැම් දංෂ්ට්‍රා කාෂ්ණ ව විවණ් ව තිබෙන සෙසු ජනයන් සේ නො ව දවහන්හරු අති භවා දිලිසෙන ප්‍රභාවයෙන් සමන්වාගත වූ **අතිධවල** වූ **සුශුක්ල දංෂ්ට්‍රා** නම් මේ මහාපුරුෂ ලක්ෂණය ද යන මේ මහාපුරුෂ ලක්ෂණ දෙකින් යුකත වූ සේක.

ඉදින් මේ මහා පුරුෂ ලක්ෂණ දෙකින් සමන්විත ව අගාර මධ්‍යයෙහි විසූ සේක් නම් බ්‍රාහ්මණ ගෘහපතිකාදි සුවි පරිවාර ජනයන් විසින් පිරිවරණ ලදු ව සතිස්ලක්ෂ දස දහස් තුන්සිය පණස් යොදුන් වට චක්‍රවාටාභ්‍යන්තරයෙහි වූ පන්සියයක් පන් සියයක් ක්ෂුද්‍ර දවීප පරිවාරිත උතුරුකුරු දිවයින ය, අපර ගෝයාන ය, පූර්වවිදෙහ ය, ජම්බුද්වීප ය, යන සතර මහාද්වීපයෙහි එකච්ඡත්‍ර නංවා සප්තරතන චක්‍රවර්ති ව සක්විති රජ ඉසුරු විඳිනා සේක. ගෘහනිෂ්ක්‍රමණය කොට පැවිදි වූ හෙයින් සුවි වූ භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා දිව්‍ය මනුෂ්‍ය අසුර නාග ගන්ධර්වයන් විසින් පිරිවරණ ලදු ව තුන් ලොවට මුදුන් මල් කඩක් වැනි ව සම්බුදුඤාණයට ප්‍රාප්ත වූ සේක.

එසින් වදුලහ-දීඝනිකාය—ලක්ඛණ සූත්‍රයෙහි

යම්පි භික්ඛවෙ තථාගතො පුරිමං ජාතිං පුරිමං භවං පුරිමං නිකෙතං පුබ්බෙ මනුස්සභූතො සමානො ඉච්ඡා ආජීවමප හාය සම්මා ආජීවෙන ජීවිකං කප්පෙසි. තුලාකූට කංසකූට මාන කූට උක්කොටන වඤ්චන නිකති සාවියොගා ඡෙදන වධබන්ධන විපරාමොස ආලොප සහසාකාරා පටිවිරතො අහොසි. සො තස්ස කම්මස්ස කතත්තා උපචිතත්තා උස්සන්නත්තා විපුලත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති—පෙ—.

සො තතො චුතො ඉත්ථත්තං ආගතො සමානො ඉමානි දෙ මහාපුරිස ලක්ඛණානි පටිලභති. සම්දන්තා ව හොති සුසුක්කදාඨො ච; සො තෙහි ලක්ඛණෙහි සමන්නාගතො සවෙ අගාරං අජ්ඣාවසති රාජා හොති චක්කවත්ති ධම්මිකො ධම්ම රාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන සමන්නාගතො. තස්සිමානි සත්තරතනානි භවන්ති—සෙය්‍යථිදං? චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායක රතනමෙව සත්තමං. පරොසහස්සං ඛො

පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසේනප්පමද්දනා. සෝ ඉමං පඨවිං සාගරපරියන්තං අඛිල මනිමිත්තමකණ්ටකං ඉද්ධං ඵීතං ඛෙමං සිවං නිරබ්බුදං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභි විජිය අජ්ඣාවසති.

රාජා සමානෝ කිං ලභති? සුචි පරිවාරෝ හොති. සුචිස්ස හොත්ති බ්‍රාහ්මණගහපතිකා නෙගම ජානපද ගණක මහාමත්තා අණීකට්ඨා දෙවාරිකා අමච්චා පාරිසජ්ජා රාජාණෙ හොගියා කුමාරා. රාජා සමානෝ ඉදං ලභති. සචෙ ඛෝ පන අගාරස්මා අනගාරියං පබ්බජති. අරහං හොති සම්මාසම්බුද්ධෝ ලොකෙ විවත්තවජ්ජෙ. බුද්ධෝ සමානෝ කිං ලභති? සුචිපරිවාරෝ හොති සුචිස්ස හොන්ති භික්ඛූ භික්ඛුණියෝ උපාසකා උපාසිකායෝ දෙවා මනුස්සා නාගා ගන්ධබ්බා. බුද්ධෝ සමානෝ ඉදං ලභති—සි.

මෙසෙකින් කාමි ය කම්සාදෘශ්‍ය ය ලක්ෂණ ය ලක්ෂණානි ශංස ය යන සතර කොට්ඨාස ය දෙනිස් මහා පුරුෂලක්ෂණයෙන් එකෙකි පුරුෂ ලක්ෂණයෙක්හි ලා විශෙෂයෙන් විනිශ්චය කරණ ලදැ යි දත යුතු.

මෙසේ දක්වන ලද දෙනිස්මහාපුරුෂ ලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් බබලන රූපකාය සම්පත්තියක් ඇති සේක-නොහොත්- සම්මුහ්‍යුත්පත්ති විශුද්ධිසඞ්ඛ්‍යාත සමීදෙව්යන් විසින් පූජනීය බැවිනු දු අහීන්ද්‍රාදි සමීගුණනණාහරණයෙන් විභූෂිත වූ විශුද්ධිදෙව හාවයට ප්‍රාප්ත බැවිනු දු දෙවාතිදෙව වූ සාශ්‍රාෂ්ඨි සංඛ්‍යාත ප්‍රමාණාතික්‍රාන්ත ලොකධාතුයෙහි අපරිමාණ ශක්‍රයන් ගේ ගුණාභිනවන ය කොට ඔවුන් මුදුනෙහි කෙළනා ලද පාපි යුම් ඇති වන බැවින් ශක්‍රාතිශක්‍ර වූ කෙවල ලොකධාතුයෙහි වසි ප්‍රාප්තාදි නිඛිල ගුණගණෝපචිත අමිත මහා බ්‍රහ්මයන් ගේ ශරීරාලොකය හා ගුණාලොකය ශරත් සූයෙස්‍රාදයෙහි බලෙන කැමින් සේ අභිභවනය කොට දිලිහෙන බැවිනු දු ඔවුන් කිරුළු මිණි රැසින් සුප්‍රශොධිත පාදපඞ්කජ ඇති බැවිනු දු ශ්‍රෙෂ්ඨාඥාසෙයින් බ්‍රහ්ම නම් වූ බුද්ධගුණයෙන් සමන්විත බැවිනු දු බ්‍රහ්මාති බ්‍රහ්ම වූ.

"භාග්‍යවානීති භගවාන්—භග්ගවාතීති භගවාන්—භගෙ රිත්‍යුක්ත ඉති භගවාන්—විභක්තවානීති භගවාන්—භක්තවානීති භගවාන්-භගෙෂු වානන්තගමන ඉති භගවාන්" යන මේ ස අර්ථ යෙන් යුක්ත බැවින් භාග්‍යවත් වූ-"ආරාද් හතත්ත්වාදර්හන්-අරීණාං

භගවත්වාදර්හත්-අරණාසඳ භගවත්වාදර්හත්-ප්‍රත්‍යයාදීනාමර්හත්වාදර්හත්-පාපකරණෙ රහොභාවාදර්හත්" යන මේ පස් අර්ථයෙන් සම්පූර්ණ බැවින් අර්හත් වූ-"සොභන ගමනත්තා සුගතො-සුන්දර ගමනත්තා සුගතො - සම්මා ගදත්තා සුගතො-සම්මා ච ගතත්තා සුගතො" යන මේ සතර අර්ථයෙන් සමන්විත බැවින් සුගත වූ-අගාරික මුනි අනගාරික මුනි සෙඛ මුනි අසෙඛ මුනි අරහන්ත මුනි පච්චෙක මුනි ය යි යන ෂඩ්විධ මුනීන්ද්‍රයන්ට අග්‍ර වෙයින් මුනීන්ද්‍රාග්‍ර වූ—

ඒ සම්බුදුරජාණන් වහන්සේ මෘදු කොමල පාදතලයෙහි පටන් සුනීල කෙශාන්ත ය දක්වා සඤ්ඣාඝන ප්‍රභාවයෙන් හා ඉන්ද්‍රවාප විද්‍යුල්ලතා ශතසහස්‍රයෙන් වලඳනාලද රූවන් මෙරක් සේ සුප්‍රතිෂ්ඨිතපාදාදී වූ ද්වාත්‍රිංශත්වර මහාපුරුෂ ලක්ෂණයෙන් හා අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් ප්‍රතිමණ්ඩිත වූ ශ්‍රී ශරීරයෙහි තත් තත් ප්‍රදෙශයෙන් ඉන්ද්‍රනීල මාණික්‍ය රසධාරා සෙයින් ජාම්බොනද සුවර්ණ රසධාරා සෙයින් රජත රසධාරා සෙයින් නන් රූවන් රස ධාරා සෙයින් නික්ම අනෙක සහස්‍ර අශිශිර කිරණ ශිශිරකරොද් ගත ව සරදමේඝාදරයෙහි ඔබිනොබ ධාවන ය කරන්නා සේ අනෙක ලොකධාතුව එකාලොකකොට දීප්තිමත් ව බබලන්නා වූ නීලපීත ලොහිතාවදාත මඤ්ජෙෂ්ඨ ප්‍රභාසවර ය යන ෂට්වර්ණ ඝන බුද්ධරශ්මි මාලායෙන් නෙකජන චිත්තනයනානන්දන ය කරන්නා වූ අසදෘශ වූ අනොපම වූ අචින්ත්‍ය වූ අවාච්‍ය වූ රූපකාය සම්පත්තිය සක් ඇති සේක.

මෙසේ ප්‍රකරණාරම්භයෙහි ලා යම් බුදුගුණයක් වර්ණනාකරණ ලද ද ඒ සියලු ගුණය බුදුවීම ප්‍රමුඛකොට ඇත්තේ වේ ද, බුදු වීම චතුස්සත්‍යාවබොධ ය වීම මුල්කොට ඇත්තේ වේ ද, එසේ හෙයින් අභිඤ්ඤෙය්‍ය ධර්ම යැ යි කියන ලද විශිෂ්ටඥානයෙන් දත යුතු චතුස්සත්‍ය ධර්මයන් පූර්වභාගයෙහි විදර්ශනාප්‍රඥාවෙන් අධි ගතඤාණයෙහි මාර්ගප්‍රඥාවෙන් මතුයෙහි සම්බුදුඤාණයෙන් දත යුතු හෙයින් ද පරිඤ්ඤෙය්‍ය ධර්ම යැ යි කියන ලද දුඃඛසත්‍ය ධර්මයන් එසේ ම දතයුතු හෙයින් ද ප්‍රහාතව්‍ය ධර්ම යැ යි කියන

ලද සමුදය පාඨික ධර්මයන් එසේ ම දතයුතු හෙයින් ද සච්ඡි කාතබ්බ ධර්ම ය යි කියන ලද නිර්‍වාණධර්මයන් එසේ ම දතයුතු හෙයින් ද භාවිතව්‍යධර්ම යැ යි කියන ලද මාර්ගසත්‍යධර්මයන් එසේ ම දතයුතු හෙයින් ද දත් හෙයින් ද බුද්ධ නම් වන සේක.

එයින් වදාළහ

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං
පහාතබ්බං පහීණමෙම තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණ-සි

මෙතෙකින් මේ සද්ධර්ම සාරාර්ථ සංග්‍රහ නම් වූ

ධර්ම්ප්‍රකරණයෙහි

ප්‍රකරණාරම්භ කථා නම් වූ

පළමුවන පරිච්ඡේදය

— නිමි —

2. පරිච්ඡේදය

2. ප්‍රථමාභිනිහාර කථා

තව ද මේ සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහ නම් වූ ධර්ම්ප්‍රකරණයෙහි

ප්‍රථමාභිනිහාර කථා නම් කවරහ යත්?

මේ මෙසේ දතයුතු - කෙසේ ද යත්?

අසරණ සරණ වූ සරණගත වප්‍රපක්ෂර වූ කරුණා නිධාන වූ **සංකුසඳ-කොණාගමන-කාශ්‍යප-ගෞතම-මෛත්‍රෙය** යන බුද්ධ දිවාකරයන් පස්දෙණෙකුන් වහන්සේගෙන් ප්‍රතිමණ්ඩිත නොයින් **භද්‍රකල්ප** ය සි ලද නම් ඇති මේ කල්පයට සාරාසඞ්ඛ්‍යය කල්ප ලක්ෂයකින් මත්තෙහි සාරමණ්ඩ නම් කල්පයෙහි සතරවන අතුරා කප සවිඤ්ඤක-අවිඤ්ඤක රත්නයට හා ලෞකික ලොකොත්තර සම්පත්තියට උත්පත්තිස්ථාන වූ බුඩ ප්‍රත්‍යේකබුඩ අග්‍ර ශ්‍රාවක මහා ශ්‍රාවක චක්‍රවාලචක්‍රවර්ති නරොත්තමයන්ට ප්‍රතිෂ්ඨාධාර වූ ගඟා ගිරි තටාකාරණ්‍ය ග්‍රාම නිගම රාජධාන්‍යාදියෙන් සම්ලඞ්කෘත වූ ජම්බුද්වීපයෙහි-

හත්ථිසද්දං අස්සසද්දං භෙරි සංඛ රථානි ච,
බාදථ පිවථාවෙව අන්නපානෙන භොසිතං-සි.

දක්වන ලද හස්තිශබ්ද ය අශ්වශබ්ද ය භෙරිශබ්ද ය ශංඛ ශබ්ද ය රථශබ්ද ය යනා දි දශවිධ ශබ්දයෙන් නිර්ඝෝෂ වූ සුවර්ණ රජතාදි උත්තුඞ්ග යෂ්ටිකොටියෙහි බඳනා ලද ධ්වජ පතාකාවලම්බිත සූක්ෂ්ම ඝණඝිකා නාදයෙන් අභිරම්‍ය වූ ඇත්මුළු අස්මුළු රිය පෙළ යොධමුළු ය සි කියන ලද චතුරඞ්ගිනී සෙනායෙන් හා එලු පලෙලු ගව මහිෂාදීන් හා වස්ත්‍රාභරණ ධනධාන්‍ය ඛාද්‍ය භොජ්‍යා දීන් සමෘර්ධ වූ උභය වීථියෙහි සඳුන් කපුරු කොට්ටම් කළුවැල් දෙවුදුරු තකුල් ආදි වූ සුගන්ධාපණයෙන් හා දූසමින් සපු දුනුක්මුහුළු සාලාදි පුෂ්පාභත පඞ්ක්තියෙහි සෞරභ්‍යයෙන් එකසුගන්ධ වූ සෞම්‍ය දෙශයෙහි පත්තුණ්ණදෙශයෙහි චීනදෙශයෙහි උපන් පිළි හා අනෙක වණ් ඇති නෙකවිධ වස්ත්‍රාපණ පඞ්ක්තියෙන් ද මුකුතා මාණික්‍යාදි රත්නාපණ පඞ්ක්තියෙන් ද සශ්‍රීක වූ-

සුපරිශුද්ධ වාලුකාතල ඇති වඳුවඩක තිකොණාදී රම්‍ය ලිපියෙන් ශොභමාන වූ තර්‍කීව්‍යාකරණාදි සමීක්ෂාසත්‍රයෙහි දක්ෂයෙක පණ්ඩිත ජනයන්ගෙන් හා යුක්ති විනිශ්චයෙහි තුලා ප්‍රතිභාග සෙනානායකාදීන් විසින් නිත්‍යසෙවිත ඉයිගිලි සඬ්කාශයෙක විචිත්‍ර චිත්‍ර කම්මනාදීන් සකලජන චිත්තානන්දනිය වූ නෙකවිධ ශාලා යෙන් ද පඬ්කනීර ශුඝකාඛ්‍ය දීර්ඝිකා ත්‍රයකින් හා ඉෂ්ටිකා ශෛලාදියෙන් නිර්මිත වූ සුණ්ණවමින් සුදු වූ වක්‍රවාට පර්වතාකාර ප්‍රාකාර වලයාලඬ්කෘත අත්‍යුත්තුඞ්ග ගොපුර තොරණයෙන් සම්ල ඬ්කෘත වූ දෙවියන්ගේ ආලකමන්දු නම් රාජධානි ය සේ සදෘ රම්‍ය වූ ක්ෂණික මරණ නැති හෙයින් අමර ය යි කියන ලද දෙවියන් වැනි නර නාරි සමූහයාගෙන් සමාකීර්ණ හෙයින් **අමරවති** නුවර ය යි ලද නම් ඇති පුටභෙදනාඛ්‍ය රාජධානියෙහි—

උභතො සුජාතො මාතිතො ච පිතිතො ච සංසුද්ධගහණිකො යාව සත්තමා කුලපරිවට්ටා අක්ඛිත්තෝ අනුපක්කුට්ඨෝ ජාතිවාදෙන අභිරූපෝ දස්සනීයෝ පාසාදිකෝ පරමාය වණ්ණ පොක්ඛරතාය සමන්නාගතෝ—යි.

යනාදීන් වර්ණනීය වූ කමලාසන සඬ්ඛ්‍යාත මහාබ්‍රහ්මයා විසින් ලොකයාහට ප්‍රකාශකළ චතුර්වේද ය හියේ‍යාහාවයෙන් බ්‍රාහ්මණ යන් වෙතින් නික්මෙන හෙයින් බ්‍රහ්මශිෂ්‍ය වූ ශිෂ්‍යයන් චතුර්විධ පුත්‍රයන් කෙරෙහි ඇතුළත් හෙයින් බ්‍රහ්මපුත්‍ර ය හ යි කියන ලද සන්වන කුල පරම්පරාව දක්වා කිසිවක් හට තෙපි මෙබඳු ජාතියක් ඇත්තාහ යි කි කල්හි තෙපි ත් මේ බඳු ජාතියක් ඇත්තාහු නොවේ දැ සි නැවත පෙරළා ජාතියෙන් ඝටා බැණ පසුබාලි ය නො හැකි වූ හෙවත් කුල ගණනා තන්හි මෙසේ හින වූ කුල ඇත්තේ ය. ඇයි කුමට ගණ වූ දැ යි කියා කුල පිළිබඳ තෙපුලෙන් නො දූෂිය හැකි වූ අනින්දිත වූ උභයකුල පරිශුද්ධ වූ.

කොරීනං හෙට්ඨිමන්නෙන සතං යෙසං නිධානගං,
කහාපණානං දිවස වළඤ්ඡෝ වීසතිමමණං.
තෙ ඛත්තිය මහාසාලා සීතිකොට්ඨානි තු,

නිධානගානි දිවස වළඤ්ඡෝ ච දසමමණං.
යෙසං විජමහාසාලා තදුපඩ්ඩෙ නිධානගෙ,
වළඤ්ඡෝ ච ගහපති මහාසාලා ධනෙ සියුං-යි.

මෙසේ දක්වන ලද ත්‍රිවිධ මහාසාර කුලයන් අතුරෙන් බ්‍රාහ්මණ මහාසාරකුලයෙහි ජලපොළොව සේ ගැඹුරු වූ පස් පොළොව සේ විපුල වූ මහාමේරු සේ සිරි වූ තද ගල් වූව ත් උණකිළිල සේ සිදී මෙහි සම්පිඬු වූ විදුරුවියක් සේ තීක්ෂණ ප්‍රඥා ඇති හෙයින් යථා ප්‍රවෘත්ත අර්ථාන්විත අන්වර්ථ නමින් යුක්ත ව ත්‍රිවේදීය යොජිත ඉක්ෂුචාප කුසුමශර ධාරිත මකරධ්වජාඛ්‍යාත රූප මදදීන් මත් වූ අනඥයා පරයන රූප සම්භාවෙන් අග්‍රප්‍රාප්ත ව අඩුතුන්කෙළක් පුරහනන්ගේ නෘත්‍ය ගීතාදී දර්ශනයෙන් ප්‍රමාද ව සිහිමුලා වූ සක් දෙව් රජහු ඇකයෙන් බැස උදුන ක්‍රීඩාදී ය කොට නැවත තවු නිසා දෙවුන්වරු යි සිතා අමරවති නම් රාජධානියට සම්ප්‍රාප්ත වූ දිව්‍ය කුමාරයන්හු මෙන් සුමේධ නම් සිවිමැලි කුමරක් ව ඉපිද කෘෂි වණිජ්‍යාදී අන්නසි ක්‍රියාවකට ව්‍යාවෘත නොවී.

ඉරු නාරී යජුස්සාම මිතිවෙදූ තයෝ සියුං,
එතෙ එව තයි නාරී වෙදූ මනෙතා සුතිත්තියා-සි.

දක්වන ලද ත්‍රිවේද ය හා අථර්වවේද ය සහිත වූ චාතුර්වේද ය ය

කපෙපා ව්‍යාකරණං ජෝති සත්ථං සික්ඛා නිරුත්තී ච
ඡන්දෝ විචිති වෙතානි වෙදඞ්ගානි වදන්ති ඡ-සි.

දක්වන ලද කල්ප ය ව්‍යාකරණ ය ජ්‍යොතිශ්ශාස්ත්‍ර ය ශික්ෂා ය නිරුක්ති ය ඡන්දෝවිචිති ය යන ෂඩඞ්ග ය හා ලොකයෙහි පැවති යම් යම් ශාස්ත්‍රයක් ඇද්ද ඒ ශාස්ත්‍ර ය නමැති සාගරයෙහි පරතෙර දැක සකල කෘත්‍යාවාර් භාවයට ප්‍රාප්ත වූ සේක.

එසින් කිහ - මහා බොධිවංශයෙහි

ඉතොනිතානං කප්ප සත සහස්සාධිකානං වතුන්නං අසඞ්ඛ්‍යානං මත්ථකෙ ලොකිය ලොකුත්තර සම්පදාකර බුඩ පවෙචක බුඩ අග්ගසාවක මහාසාවක චක්කවත්තී නරාසභාධාර වර ජම්බුදීපෙ අමරගණ සදිස ජනාකිණ්ණතාය අමරවතී'ති ලඞ්කාභිධානාය අමර වනියා රාජධානියා සකල ලොක පූජිතෙ කමලාසන සුනුකුලෙ පරම සුබුම් ලෙධො සුලෙධො නාම සුඛුමිාරෝ හුත්වා වසන්ත කත්තී මදදින විලාසෙ වෙදසාගර පාරගො සකල කලාවරියභාවමුප ගතො-සි.

බුඩ වංශයෙහි දු වදුලේ මෑ නෝ

කපෙප ච සතසහසෙස චතුරෝ ච අසංඛියෙ,
අමරං නාම නගරං දස්සනෙය්‍යං මනොරමං,
දසහි සද්දෙහි අවිවිත්තං අන්නපාන සමායුතා—යනාදී

ඒ සුමෙධ නම් බොධිසත්වයන් ගේ දෙමව්පියන් කම් වූ පරිද්දෙන් පරලොකප්‍රාප්ත වූ කල්හි වසතු රක්ෂා කිරීමෙහි නියුක්ත වූ අමාත්‍යයෝ අවුත් සවාමීනි! ඔබවහන්සේගේ උභය කුල පරම්පරාවෙහි පැවත ආ මේ ධන රාසි ය බලා වදාළ මැනවැ සි අනෙක රහසාගත් සහස්‍රයන් දෙර හරවා දැක් වූ කල්හි මාගේ මාතා පිතා ආදීහු මේ ධනරාස්කොට තබා යන්නාහු මෙයින් කිසිවක් නො ගෙණ ම ගියාහු ය. මා විසින් වනාහි මේ ධන සම්පත් දන්දීම් වශයෙන් මා කැටුව ගෙණ යන්නට වටනේය සි සිතා රජහට එ පවත් දන්වා ධන ධාන්‍යයෙන් ප්‍රයෝජන කැමති කෙණෙක් සුමෙධ බ්‍රාහ්මණයන්ගේ ගෙදොරට එන්නේ ය සි සියලු නුවර බෙර හසුරුවා භෙරි නාද නමැති සුගන්ධාඝ්‍රාණ ය කළ යාවක ජන නැමති භෘඞ්ග යන් අවුත් රැස්වූ කල්හි රුවන් නැමති මුවරද වතුරෙන් ඔවුන් සන්තර්පණ ය කොට හෙවත් යාචකයන්ට සිත්ලෙස සත් දවසක් රුවන් පිරූ ගබඩාවල හැරි දොර නො වසා දන්දුන් සේක. ඉක් බිත්තෙන් මාගේ සවාමිදරු වූ ඒ සුමෙධ බොධිසත්වයෝ එක්දව සෙක දිව්‍ය විමානයක් සෙසින් උතුම් වූ මතුමහල් තලයෙහි රඟා ගත ව පලක් බැඳ හුන් සේක. මෙසේ සිතූ සේක.

කෙසේ ද යත්?

සුමෙධ පණ්ඩිතයෙනි! නැවත නැවත භවයෙහි ප්‍රතිසන්ධි ග්‍රහණ ය කිරීම නම් මහත් දුක් වන්නේ ය. එසේ ම උපන් උපන් සථානයෙහි ශරීරයාගේ විනාශවීම ද දුක් වන්නේ ය. මම ද ජාති ස්වභාවකොට ඇත්තෙමි. ජරාව ත් ස්වභාවකොට ඇත්තෙමි. ව්‍යාධි ය ත් ස්වභාවකොට ඇත්තෙමි. මරණ ය ත් ස්වභාවකොට ඇත්තෙමි. මෙසේ ජාති ජරා ව්‍යාධි මරණ ඇති සසරෙහි දුක් විඳිනා මා විසින් ජාති නැත්තා වූ ජරා නැත්තා වූ ව්‍යාධි නැත්තා වූ මරණ නැත්තා වූ එකාන්ත සැප ඇති රාගාදීන් තැවීමක් නැති හෙයින් සිහිල් වූ අමෘත මහා නිර්වාණ ය සොයන්ට වටනේ ය. භවයෙන් මිදී නිර්වාණගාමී වූ එක් මාර්ගයක් විය යුතු ය සි සිතූ සේක.

මෙම දක්වන්නට බුඩවංශයෙහි වදාළේ මැ නෝ.

> රහොගතො නිසීදිත්වා එවං චින්තෙසහං තදා,
> දුක්ඛා පුනබ්භවෝ නාම සරීසස්ස ච භෙදනං.
>
> ජාති ධම්මෝ ජරා ධම්මෝ ව්‍යාධි ධම්මෝ වහං තදා,
> අජරං අමරං ඛෙමං පරියෙසිස්සාමි නිබ්බුතිං.

යාවනූනිමං පූතිකායං නානා කුණප පූරිතං
ඡඩ්ඩසිච්චාන ගවේජ්‍යං අතපෙඛෝ අනත්තිකෝ,

අත්ථි හෙහිති සෝ මඤ්ඤා න සෝ සක්කා න හෙතවෙ.
පරියෙසිස්සාමි තං මඟ්ගං භවතෝ පරිමුත්තියා-සි.

එයින් මත්තෙහි දු සිතන සේක් යම් සේ ලොකයෙහි කාය චිත්තාපීඩා කරන්නා වූ දුඃඛ ය නසන සැප නම් දෙයක් ඇද්ද එප රිද්දෙන් භව ය ඇති කල්හි ඒ භව ය විනාශයට සුදුසු වූ විභවය කුත් ඇති විය යුතු ය. යම් සේ ලොකයෙහි නො ඉවසිය හැකි උෂ්ණයක් ඇති කල්හි ඒ නැසිය යුතු ජල පවන් ආදී සිහිලස දෙයකුත් ඇද්ද එ පරිද්දෙන් රාග අග්නි චෙෂ අග්නි මොහ අග්නි සංඛ්‍යාත ත්‍රිවිධාග්නි ව්‍යපශමණ ය කරණ නිර්‍වාණයකු දු ඇති විය යුතු ය. යම් සේ ලොකයෙහි ලාමක වූ පවිටු ධර්‍මයක් ඇතිකල්හි ඒ නැසිය යුතු කල්‍යාණ වූ අනවද්‍ය වූ ධර්‍මයකුත් ඇද්ද-හෙවත් අකුසල් නසන කුසල් නම් දෙයකුත් ඇත්තේ ම වේ ද එපරිද් දෙන් ඒ ඒ තන්හි උපදවන පවිටු ජාති ය ඇති කල්හි ඒ ජාති ය නසන්නා වූ නිර්‍වාණයකුත් ඇත්තේ ම ය යි නිවන් ඇති බැව් නිශ්චය කොට සිතූ සේක.

මෙ ද දක්වන්නට කිහ-දුරෙනිදානයෙහි

තතෝ උත්තරිම්පි එවං විත්තෙසි: යථා හි ලොකෙ දුක්ඛස්ස පටිපක්ඛභූතං සුඛං නාම අත්ථි. එවං භවෙ සති තපපටිපක්ඛෙන විභවෙනාපි භවිතබ්බං. යථා ච උණ්හෙ සති තස්ස වූපසමභූතං සීතමපි අත්ථි. එවං රාගාදීනං අග්ගීනං වූපසමෙන නිබ්බාණෙනාපි භවිතබ්බං. යථා ච පාපකස්ස ලාමකස්ස ධම්මස්ස පටිපක්ඛ භූතෝ කල්‍යාණෝ අනවජ්ජධම්මොපි අත්ථියෙව. එවමෙව පාපි කාය ජාතියා සති සබ්බා ජාතිඛෙපනතෝ අජාති සංඛාතෙන නිබ්බාණෙනාපි භවිතබ්බමෙව—සි.

එම ගාථායෙන් දක්වන්නට වදාළහ බුදුහු.

යථාපි දුක්ඛෙ විජ්ජන්තෙ සුඛන්නාම පි විජ්ජති,
එවං භවෙ විජ්ජමානෙ විභවොපි ඉච්ඡිතබ්බකෝ.

යථාපි උණ්හෙ විජ්ජන්තෙ අපරං විජ්ජති සීතලං,
එවං තිවිධග්ගි විජ්ජන්තෙ නිබ්බාණං ඉච්ඡිතබ්බකං

යථාපි පාපෙ විජ්ජන්තෙ කල්‍යාණම්පි විජ්ජති,
එව මෙව ජාති විජ්ජන්තෙ අජාති ඉච්ඡිතබ්බකං—සි.

බුදුන් පසේ බුදුන් හැර සෙස්සන් විසින් නො සෙවිය හැකි නිර්‍වාණ ය ඇති බව මෙසේ අනෙකොපමායෙන් නිශ්චය කොට සොයා තබා කාමයෙන් නික්ම ගොස් ඒ නිර්‍වාණ ය සෙවිය යුතු ලෙසට නො යෙක් උපමා නැවත සිතූ සේක.

කෙසේ ද යත්:

එමබා ෟමෙධ පණ්ඩිතයෙනි! යම් සේ පුරුෂයෙක් මහත් අසුචි වලෙක් හි ගැලී කිලිටු වූ ගාත්‍ර ඇති ව පස් පියුමෙන් ගැවසී සිහිල් පැනින් පිරී නිබෙන විලක් දැක ඒ විලට බස්නට මග නො සොයා නම් මේ විලට බැස මාගේ ශරීරයෙහි අසුචි මල සෝදා ශුද්ධි වෙමි යි සිතා විලට බස්නට උත්සාහ නො කෙරේ නම් ඒ අඥාන පුරුෂයා ගේ දෙෂයෙක් මිස විලෙහි දෙෂයෙක් නො වේ ද—

එසෙයින් ම ගඞ්ගා-යමුනා-අචිරවතී ආදී වූ එකොළොස් දහස් පන්සිය පන් සැත්තැවක් පමණ ගඞ්ගොදකයෙනු දු සුවාසූ දහසක් යොදුන් ගැඹුර ඇති සමුද්‍ර ජලයෙනු දු සෝදා ශුද්ධි කොට ගත නො හැකි කෙලෙස් නැමැති මළ පිරිසිදු කිරීමට සමර්ථ වූ නිර්‍වාණ නැමැති විලට බැස කෙලෙස් නැමැති මළ සේදීමට උත්සාහ නො කෙරෙත් නම් තොපගේ ම දෙෂ මිස නිර්‍වාණ නමැති විලෙහි දෙස නො වන්නේ ය. යම් සේ සොරුන් විසින් පිරිවරන ලද පුරුෂයෙක් ගැලවී යන්නට සුදුසු මාර්‍ගයක් ඇති ව තිබියදී ත් ඉදින් (පළා) නො යේ නම් මාර්‍ගයෙහි දෙෂ යෙක් නො වෙයි. ඒ පුරුෂයා ගේ ම දෙෂයෙක.

එපරිද්දෙන් කෙලෙස් නමැති සොරුන් විසින් පිරිවරණ ලදුයේ වටකොට සිසාරා ගන්නා ලදුයේ ඉදිත් නිර්‍වාණ නමැති මාර්‍ග ය ඇති ව තිබියදී ත් එහි නො යේ නම් ඒ නිවන්/මග නො සොයා නම් ඒ පුද්ගලයාගේ ම දෙෂ ය මිස නිවන් නමැති මාර්‍ගයෙහි දෙෂ ය නො වන්නේ ය. යම් සේ ව්‍යාධියෙන් අභිපීඩිත පුරුෂයෙක් සර්‍ව ව්‍යාධි ව්‍යුපශමන ය කිරීමෙහි දක්ෂ වෛද්‍යාචාර්‍ය්‍ය යෙකු සමීපයෙහි ඇති ව සිටියදීත් ඒ වෛද්‍යාචාර්‍ය්‍ය යා කරා පැමිණ ව්‍යාධියට නිසි පිළියම් නො කරවා නම් ඔහුගේ දෙෂ ය මිස වෛද්‍යාචාර්‍ය්‍යයා ගේ දෙෂයෙක් නො වේ ද එ සෙයින් ම ධන්වන්තරී ආදීන් විසින් අනෙක ශත සහස්‍ර ග්‍රන්ථයෙන් රචනා කරණ ලද සර්‍ව වෛද්‍යශාස්ත්‍රයෙහි දක්ෂ ජීවකාදීන් විසිනු දු ව්‍යුපසමන ය කොට ගත නො හැකි කෙලෙස් නමැති ව්‍යාධියෙන් අභිපීඩිත වූයේ

කෙලෙසුන් ව්‍යපශමනයට සමර්ථ වූ නිවන් නැමති ආචාරීන් නො සෙවීම පුද්ගලයාගේ දෙෂය මිස නිවන් නැමති ආචාරීන් ගේ දෙෂය නො වන්නේ ය සි ද සිතූ සේක.

මෙ ම කිහ-එම නිදානයෙහි.

යථා නාම ගුථරාසිම්හි නිමුග්ගෙන පුරිසෙන දූරතො පඤ්ච වණ්ණ පදුම සඤ්ඡන්නං මහාතළාකං දිස්වා කතරෙන නු ඛො මග්ගෙන එත්ථ ගන්තබ්බන්ති තං තළාකං ගවෙසිතුං යුත්තං-යං තස්ස අගවෙසනං න සො තළාකස්ස දොසො. එවං කිලෙස මල ඛොවනෙ අමතමහා නිබ්බාණතලාකෙ විජ්ජමානෙ තස්ස අග වෙසනං න අමත මහානිබ්බාණ තළාකස්ස දොසො.

යථා ච වොරෙහි සමපරිවාරිතො පුරිසෝ පලාන්නමගෙ විජ්ජමානෙපි සවෙ න පලායති-න සො මිගස්ස දොසො පුරි සස්සෙව දොසො. එවමෙව කිලසෙහි පරිවාරෙත්වා ගහිතස්ස පුරි සස්ස විජ්ජමානෙ යෙව නිබ්බාණගාමිමග්ගි. සවෙ මග්ගො මගස්ස අගවෙසනං නාම න මිගස්ස දොසො පුග්ගලස්සෙව දොසො. යථා ච ව්‍යාධි පිළිතො පුරිසෝ විජ්ජමානෙ ව්‍යාධි තිකිච්ඡකෙ වෙජ්ජෙ සවෙතං වෙජ්ජං ගවෙසිත්වා ව්‍යාධිං න තිකිච්ඡාපෙති න සො වෙජ්ජස්ස දොසො. එවමෙවං යො කිලෙසව්‍යාධි පිළිතො කිලෙස වූපසම මග්ගකොවිදං විජ්ජමානමෙව ආචරියං න-ගවෙසති නසස්සෙව දොසො—න කිලෙස චිකිච්ඡකස්ස ආචරියස්ස—සි.

බුදුන් විසිනුදු වදලේ මැ නෝ

යථා ගුථගතො පුරිසො තළාකං දිස්වාන පූරිතං,
න ගවෙසති තං තළාකං න දොසො තළාකස්ස සො.
එවං කිලෙසමලධොවෙ විජ්ජමනෙ අමතන්තළෙ,
න ගවෙසති තං තළාකං න දොසො අමතන්තළෙ
යථා අරීහි පරිරුද්ධො විජ්ජමනෙ ගමනෙ පථෙ,
න පලායති සො පුරිසො න දොසො අස්සාසස්ස සො.
එවං කිලෙස පරිරුද්ධො විජ්ජමානෙ සිවෙ පථෙ,
න ගවෙසති තං මග්ගං න දොසො සිවමස්සාසෙ.
යථාහි ව්‍යාධිතො පුරිසො විජ්ජමානෙ තිකිච්ඡකෙ,
න තිකිච්ඡාපෙති තං ව්‍යාධිං න සො දොසො තිකිච්ඡකෙ.
එවං කිලෙසව්‍යාධීහි දුක්ඛිතො පතිපීළිතො,
න ගවෙසති තං ආචරියං න සො දොසො විනායකෙ—සි.

අනිකෙකු දු සිතූ සේක—කෙසේ ද යත්?

යම් සේ සැරහීම් කැමති පුරුෂයෙක් කණ්ඨයෙහි බඳනා ලද කුණපයක් වහා දමා සැපසේ යේ ද එපරිද්දෙන් ම මා විසින් තේ කුණු ශරීර ය හැර දමා අනපේක්ෂ ව ඇලුම් නැති ව නිර්‍වාණ නමැති නුවරට පැමිණිය යුතු ය. තව ද උක්කාර භූමියෙහි කරණ ලද මල මූත්‍රයෙහි කිසි ඇලයක් නො කොට නිසුකොට සත්‍රී පුරුෂයෝ අනපේක්ෂ ව හිනිත් හෝ දශානන යෙන් හෝ නො ගෙණ යෙද්ද එසෙයින් ම මා විසින් තේ කුණු ශරීරයෙහි ඇලයක් මැදහත් කමක් නො කොට දමා නිවන්පුර යා යුතු ය.

තව ද යම් සේ නාවිකයෝ දිරා දුදුරු ව උදකොද්ගත වන ජරා නැව හැර දමා යද්ද එ සෙසින් ම මා විසින් තේ නව නව දෙරකින් වැහෙන කුණු ඇති මේ ශරීර ය හැර නිවන් පුර යා යුතු ය. තව ද යම් සේ පුරුෂයෙක් නො යෙක් රත්න යන් ගෙණ සොරුන් හා සමග යන්නේ තමාගේ රතනයන් සොරුන් කෙරෙන් නසී යේ යන භයින් ඔවුන් හා නො ගොස් නිරුපද්‍ර ව මිංගීයකින් යේ ද එ සෙසින් ම මා විසින් දු සොරුන් වැනි මේ ශරීරය හැර යා යුතු ය. ඉදින් මේ ශරීරයෙහි තෘෂ්ණාව කෙලෙම් නම් කුසල් නමැති රුවන් නස්නේ ය. එසේ නෙයින් මා විසින් දු කුසල් නැමැති රුවන් නැසීමට භයින් මේ ශරීර ය හැර යා යුතුම ය යි ද සිතූ සේක.

මෙ ද කිහ එම නිදානයෙහි.

අපරම්පි විනෙතාසි: යථා මණ්ඩූකා ජානිකෝ පුරිසෝ කණ්ඨේ ආසත්තං කුණපං ඡඩ්ඩෙත්වා සුඛී භවෙය්‍ය. එවං මයාපි ඉමං පූතිකායං ඡඩ්ඩෙත්වා අනපෙක්ඛෙන නිබ්බාණ නගරං පවිසිතබ්බං. යථා ච නරනාරියෝ උක්කාර භූමියං උච්චාර පස්සාවං කත්වා න තං උච්චඩ්ඩෙහන වා ආදාය දසනෙතන වා වෙය්‍යෙත්වා ගච්ඡන්ති. ජිගුච්ඡමානා පන අනපෙක්ඛාව ඡඩ්ඩෙත්වා ගච්ඡන්ති. එවං මයාපි ඉමං පූතිකායං අනපෙක්ඛෙන ඡඩ්ඩෙත්වා අමතං නිබ්බාණ නගරං පවිසිතුං වට්ටති.

යථා ච නාවිකා නාම ජජ්ජරං නාවං අනපෙක්ඛා ඡඩ්ඩෙත්වා ගච්ඡන්ති. එවං අහම්පි ඉමං නවනි වනමුඛෙහි පග්ඝරන්තා කායං ඡඩ්ඩෙත්වා අනපෙක්ඛා නිබ්බාණ නගරං පවිසිස්සාමි. යථා ච පුරිසෝ නානා රතනානි ආදාය වොරෙහි සද්ධිං මග්ගං ගච්ඡන්තෝ අත්තනෝ

රතන නාසනයෙන තෙ ඡඩ්ඩිත්වා බෙමං මිගහං ගණ්හාති. එවං අයම්පි කරජ කායෝ රතනවිලොපක චොරසදිසෝ. සවාහං එතං තණ්හං කරිස්සාමි අරියමග්ග කුසලධම්මරතනං මෙ නාසිස්සති. තස්මා මයා ඉමං චොරසදිසං කායං ඡඩ්ඩෙත්වා නිබ්බාණ නගරං පවිසිතුං වට්ටති-සි.

බුදුන් විසිනුදු වදාළේ මැ නෝ.

යථාපි කුණපං පුරිසෝ කණ්ඨෙ බද්ධං ජිගුච්ඡිය,
මොචයිත්වාන ගච්ඡෙය්‍ය සුඛී සෙරි සයං වසී.

තථෙවිමං පූතිකායං නානාකුණප සඤ්චයං,
ඡඩ්ඩයිත්වාන ගච්ඡෙය්‍යං අනපෙක්ඛා අනත්ථිකෝ.

යථා උච්චාරට්ඨානම්හි කරිසං නරනාරියෝ,
ඡඩ්ඩයිත්වාන ගච්ඡන්ති අනපෙක්ඛා අනත්ථිකා.

එවමේවාහං ඉමං කායං නානාකුණප පූරිතං,
ඡඩ්ඩයිත්වාන ගච්ඡිස්සං වච්චං කත්වා යථා කුටිං.

යථාපි ජජ්ජරං නාවං පලුග්ගා උදකගාහිණී,
සා මී ඡඩ්ඩෙත්වා ගච්ඡන්ති අනපෙක්ඛා අනත්ථිකා.

එවමේව ඉමං කායං නාවච්ඡිද්දං ධුවස්සවං,
ඡඩ්ඩයිත්වාන ගච්ඡිස්සං ජිණ්ණං නාවංව සාමිකා.

යථාපි පුරිසෝ චොරෙහි ගච්ඡන්තෝ භණ්ඩමාදිය,
භණ්ඩවෙච්ඡදභයං දිස්වා ඡඩ්ඩයිත්වාන ගච්ඡති.

එවමේව අයං කායෝ මහාචොරසමෝ විය,
පහායිමං ගමිස්සාමි කුසලවෙච්ඡදතා භයා-සි.

මෙසේ සුමේධ පණ්ඩිතයෝ අනෙකවිධ උපමායෙන් ගිහි ගෙන් නික්මෙන්නට සුදුසු මේ අර්ථ ය සිතින් සලකා තමන්ගේ ප්‍රමාණානික්‍රාන්ත වූ හොගසඤ්ඤා ය යටකි ක්‍රමයෙන් කෘපණ සංඛ්‍යාත දුනි දිළිඳුන් හා, අඩික සංඛ්‍යාත මහින් හා, යාවකාදීන්ට දන්දී වසනුකාම කෙලෙශකාම ය හැර අමර තම් නුවරින් නික්ම හුදකලාව හිමවත ධම්මික තම් පර්වත ය නිසා ආශ්‍රමයක් කොට එහි පන්සලක් හා පඤ්චදෝෂ විනිර්මුක්ත සඤ්ඤක් මවා කාමච්ඡන්දී පඤ්චනීවරණ දෝෂයන් කෙරෙන් බෙන් වූ "එවං සමාහිතෙ චිත්තෙ පරිසුද්ධෙ පරියොදාතෙ අනඞ්ගණෙ විගතූපක්කිලෙසෙ මුදුභූතෙ කම්මනියෙ ඨිතෙ ආනෙඤ්ජප්පත්තෙ"සි කියන ලද අටකාරණ ගුණයෙන් සම්පන්න වූ—

ඉද්ධි පරිත්ත ඤාණඤ්ච පුරිමං ජාතී අනුස්සති,
දිබ්බඤ්ච චක්ඛු සොතඤ්ච පඤ්චාභිඤ්ඤා ඉමා මතා—සි.

යනු හෙයින් දක්වන ලද සාඩිය පරසින් දන්නා ඤාණ ය පෙර උපන් කඳපිළිවෙළ දක්නා පුබ්බේනිවාසානුස්සතීනි ය, දිවඇස ය දිවකණ ය යන මේ පඤ්චාභිඥා හා රූපාරූප අෂ්ටසමාපත්ති උපද වනු පිණිස ඒ ආශ්‍රමපදයෙහි නවදොෂ සම්භාගත වූ සාටක යුගල ය හැර චාදශගුණ සම්භාගත වූ වල්කචීර ය හැඳ සෘෂිප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වූ සේක.

මෙසේ පැවිදි වූ තැනැත්තේ අෂ්ටදොෂයකින් සමන්විත වූ ඒ පත්සැල හැර දශගුණ සම්භාගත වූ වෘක්ෂමූලයට එලඹ ධ්‍යාන යෙන් සියලු හොජන ය හැර ප්‍රවෘත්තඵල හොජන ය කොට ඇති ව නිසද්‍යසථාන චංක්‍රමණ වශයෙන් වීර්‍ය කිරීමෙහි යෙදී සත්දවස ඇතුලෙහි ම අෂ්ටසමාපත්ති පඤ්ච අභිඥාලාභී වූ සේක. මෙසේ තමන්වහන්සේගේ යථාප්‍රාර්ථිත අභිඥාබලයට පැමිණුනු සේක.

මේ ද කිහ – එම නිදානයෙහි

එවං සුමේධපණ්ඩිතෝ නානාවිධාහි උපමාහි ඉමං නෙක්ඛම්ම පාරිපූරිං අත්ථං විනෙත්වා සකනිවෙසනෙ අපරිමිතං හොගක්ඛන්ධං හෙට්ඨාවුත්තනයෙන කපණද්ධික්‍කාදීනං විස්සජ්ජෙත්වා මහාදානං දත්වා වත්ථුකාමෙ ච කිලෙසකාමෙ ච පහාය අමරතගරතෝ නික්ඛමිත්වා එකකොව හිමවන්තෙ ධම්මිකං නාම පබ්බතං නිස්සාය අස්සමං කත්වා තත්ථ පණ්ණසාලඤ්ච මිඛකමඤ්ච මාපෙත්වා පඤ්චහි නීවරණදොසෙහි විවජ්ජිතං "එවං සමාහිතෙ චිත්තෙති" ආදිනා නයෙන වුත්තෙහි අට්ඨහි කාරණගුණෙහි සමුපෙතං අභිඤ්ඤා සඞ්ඛාතං බලං ආහරිතුං තස්මිං අස්සමපදෙ නව දොස සමන්නාගතං සාටකං පජහිත්වා දවාදස ගුණ සමන්නාගතං වාකචීරං නිවාසෙත්වා ඉසිපබ්බජ්ජං පබ්බජී.

එවං පබ්බජිතෝ අට්ඨදොස සමඞ්ගිණණං තං පණ්ණසාලං පහාය දසගුණ සමන්නාගතං රුක්ඛමූලං උනගන්ත්වා සබ්බං ධඤ්ඤ විකතිං පහාය පවත්තඵල හොජිනෝ හුත්වා නිසජ්ජට්ඨාන වඞ්කම වසෙනෙව පධානං පදහනෙනා සත්තාහබ්භන්තරෙයෙව අට්ඨන්නං සමාපත්තීනං පඤ්චන්නඤ්ච අභිඤ්ඤානං ලාභී අහොසි එවං තං යථා පත්ථිතං අභිඤ්ඤාබලං පාපුණී—සි.

බුදුන් විසිනු දු වදලේ මැ නෝ

එවාහං විත්තයිත්වාන නෙකකොටිසහං ධනං,
නාථානාථානං දත්වාන හිමවන්තමුපාගමිං.
හිමවන්තස්ස අවිදූරෙ ධම්මිකෝ නාම පබ්බතෝ,
අස්සමෝ සුකතෝ මය්හං පණ්ණසාලා සුමාපිතා.
වඩ්ඪකිං තත්ථ මාපෙසිං පඤ්චදෝස විවජ්ජිතං,
අට්ඨගුණසමූපෙතං අභිඤ්ඤාබලමාහරිං.
සාටකා පජහිං තත්ථ නවදෝසමුපාගතා,
වාකචීරං නිවාසෙසිං ද්වාදසගුණමුපාගතං.
අට්ඨදෝස සමාකිණ්ණං පජහිං පණ්ණසාලකං,
උපාගමිං රුක්ඛමූලං ගුණෙ දසහුපාගතං.
වාපිතං රොපිතං ධඤ්ඤං පජහිං නිරවසෙසතෝ,
අනෙක ගුණසම්පන්නං පවත්තඵල මාදිසිං.
තත්ථපධානං පදහිං නිසජ්ජට්ඨාන චඞ්කමෙ.
අභිඤ්ඤාබලෙහි සත්තාහෙ අභිඤ්ඤාබල පාපුණිං—යි.

මේ පාළියෙහි වනාහි ආශ්‍රමයක් පන්සැලක් සඞ්ඝිණක් මවා එහි විසිවී සි යනාදි විසින් වදාළ හෙයින් සුමෙධ පණ්ඩිතයන් විසින් සවහස්නායෙන් ම පන්සල් ආදිය කළාහ් මෙන් හැඟෙයි. එසේ නොගණු ව. ඒ දවස් බොධිසත්වයන් වහන්සේ හිමවත පෙදෙස ධම්මික නම් පර්‍වත සමීපයට එළඹෙනි සි දුටු ශක්‍රදෙවෙන්ද්‍රයන් විසින් මෙහෙයන ලදු ව විශ්වකර්ම දිව්‍යපුත්‍ර අවුත් පබලුවන් සෙවෙනි ඇනි, රිදී පට පැහැ වැනි සුදු වූ භිත්ති ඇනි, ඉන්ද්‍රනීලමාණික්‍ය යෙහි රශ්මියෙන් කරණ ලද්දක් වැනි වූ සිත්කලු බිම් ඇති පන් සැලක් මවා එහි තාපස ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි වන තාපසවරුන්ට ප්‍රයෝජන වූ ත්‍රිදණ්ඩ කුණ්ඩිකාදී තවුස් පිරිකර ද නිර්මිතකොට තබා පන්සැල භිත්තියෙහි පැවිදිවනු කැමති යම්කිසිකෙණෙක් මේ තවුස් පිරිකර ගෙණ පැවිදිවෙත්ව සි අකුරු හැඳ ඔහු ගිය කල්හි.

සුමෙධපණ්ඩිතයෝ හිමවත වනභූමියෙහි තමන්ට නිවා සානුරූප වූ ස්ථානයක් බලන්නාහු විශ්වකර්මයා විසින් මවා ගිය ආශ්‍රම ප්‍රදෙශ ය දැක සක් මන් කෙළවරට ගොස් බලා පදලඤ්ඡ නඟක් නො දැක විමසු ව මැණවැ සි පන්සලෙහි දොර හැර ඇතුළට ප්‍රවිෂ්ට ව ඒ ඒ තැන්හි බලන සේක් භිත්තියෙහි තුබූ අකුරු කියවා මට කැපවූ පිරිකර වන්නේ ය.

මේ ගෙන පැවිදිවෙමි සි තමන් වහන්සේගේ හැඳ පෙරව තුබූ සාටක යුගල ය ගලවා තබා බඳුවද මල්පෙත්ෂතන් කරණ ලද මල්දමක් බඳු වූ ඵන් වූ වැහැරි ම ය හඳන ය හැඳ අනොජා මල්දමක් බඳුවූ වැහැරි සිවුරු පෙරව දෙඔමල් ඇතිරියක් හා සමාන වූ අඳුන් දිවිසමක් එකාංශකොට බහා දළමඬුලු බැඳ තුන් වකක් ඇති තවුස් පිරිකර කද කර තබා කොමළ වූ ඇඟිලි නැමති පෙතිපතර ඇති රත්මහනෙල් කලඹක් බඳු ශ්‍රී හස්තාතල යෙන් කන්තාරයෂ්ටි සඞ්ඛ්‍යාත සැරයවියක් ගෙණ බඹවිමනක් වැනි වූ පන්සලින් නික්ම මෘදු සිනිඳු මට සමතල සෙවත පුලිණ විප්‍රකීර්ණ සැටහත් මහ සක්මනට නැඟී කිපවාරයක් සක්මන් කොට තමන්වහන්සේගේ තාපස ලීලාව බලා සතුටු ව ශ්‍රමණ ධර්‍ම පූරණයෙහි උපන් උත්සාහ ඇති සේක් තවුස් පිරිකර කද එක්ප්‍රදෙශයෙක තබා සක්මන් මලුවෙහි කෙළවර මුදුහවර්ණ ශිලාතල මස්තකයෙහි සුවර්ණ ප්‍රතිමාවක් මෙන් වැඩ හිඳ දිවසා තික්‍රාන්තකොට සවස්වේලෙහි පන්සැලට වැද නිද්‍රොපගත ව ශරීර දරථ ය විනොදන ය කොට ප්‍රත්‍යූෂකාලයෙහි පිබිද තමන් වහන්සේගේ ආගමන පරීක්ෂා කරණ සේක් මෙසේ සිතූ සේක.

"මම වනාහි ඝරාවාසයෙහි ආදීනව දැක අමිතභොග අනන්ත යස ගැර ආරණ්‍ය ප්‍රවිෂ්ට ව නෛෂ්ක්‍රම්‍ය ය සොයා පැවිදි වීමි. එසේ වූ මට මේබදු පන්සැලෙහි විහිමි දෙවෙනි ගිහිගෙයක විසිමක් වැන්නේ ය. එබැවින් මේ පන්සල හැර වෘක්ෂමූලයට එලඹ ධාන්‍ය චිකාතීන් උපන් සියලු හොජනයන් හැර නටුවෙන් ගිළිහි වගුළ ඵල පත්‍ර අනුභවකෙරෙමින් සැතපෙන ඉරියවුව හැර ඉදිමී සිටීම් සක්මන් කිරීම් වශයෙන් වීර්‍ය්‍ය කටයුතු ය සි" සිතා යථොක්ත ක්‍රම යෙන් පන්සල හැර ගොස් සතර සම්‍යක් ප්‍රධානවීර්‍ය්‍ය වශයෙන් සත්දවස ඇතුළත ම පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති ඉපද වූ සේක. මේ කාරණ ය ප්‍රකාශකොට දක්වා වදාරන්නා වූ සඞ්ඝයන් වහන්සේ කිඹුල්වත් නුවර න්‍යග්‍රොධාරාමයෙහි වූ රුවන් සක්මනෙහි දී ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේට ආමන්ත්‍රණය කොට එදු තමන් වහන්සේගේ පුණ්‍ය තෙජසින් දෙවියන් මවා දුන් ආශ්‍රම ය සඳහා—

අසසමෝ සුකතෝ මය්‍හං පණ්ණසාලා සුමාපිතා,
වඩ්ඪකීං තත්‍ථ මාපෙසිං පඤ්ච වෙස විවජ්ජිතං.

යනාදී පාළිය වදාළ සේක. මෙසේ සුමේධ නම් තාපසයන් වහන්සේ අභිඥාලාභී ව ධ්‍යාන ක්‍රීඩාවෙන් හිමාල වනයෙහි වාසය කරණ සේක.

එ සමයෙහි අවිද්‍යා නමැති අන්ධකාරය නසන්නා වූ සද්ධර්ම නමැති ප්‍රදීපාලෝකය කරන්නා වූ සර්ව ලෝකයාහට ශාස්තෘකාර වූ නිරුත්තර වූ **දීපංකර** නම් සම්‍යක් සම්බුද්ධරජාණන් වහන්සේ ඊට පූර්වභාගයෙහි ම අතලප කල්පකොටි ශතසහස්‍රයෙක්හි ධනාදී සම්භාරයන් පාරමී ධර්මයන් පුරා **රම්‍යවතී** නම් රාජධානියෙහි **සුදේව** නම් නරපතින් නිසා **සුමේධා** නම් බිසවුන් කුස ප්‍රතිසන්ධිග්‍රහණයකොට වලාපටලයකින් නික්මුනු පූර්ණ චන්ද්‍රමණ්ඩලයක් සෙයින් මව් කුසින් ප්‍රසූත වදාදික් විලෝකනය කොට උත්තර දිශානිමුඛ ව සිංහනාද කොට ක්‍රමයෙන් වැඩී **හංසාය කොඤ්චාය මයූරාය** යන නම් ඇති තුන්ප්‍රාසාදයෙහි ලක්ෂ්‍යාංගනාන් නාටක සත්‍රීන් හා සමග රාජ්‍ය ශ්‍රී සම්පත් අනුභව කෙරෙමින් දසලක්ෂයක් අවුරුද්දට ආයුෂ ඇති කාලය වන බැවින් දසදහසක් හවුරුදු මුලුල්ලෙහි ගිහි නෙයි වැස **පදුමා** නම් දේවීන් කුසින් **වාසභඛත්තිය** නම් පුත් රුවණක් උපන් කල්හි-

ජරා ජීර්ණ ව්‍යාධි මෘත සංඛ්‍යාත දෙවදූතයන් තුන්දෙනා දැක සසර කලකිරී නැවත ප්‍රව්‍රජිත රූපය දැක. මේ ලෙස කරමි සිතා අලඬකාත හත්ථිඛන්ධාරූඪ ව එසෙයින් ම සුවාසූ දහසක් හත්ථිඛන්ධාරූඪ වූ රාජදරුවන් විසින් පිරිවරණ ලදුව මහත් වූ රාජර්ධීන් මහාභිනිෂ්ක්‍රමන් නික්ම පැවිදි ව අනූව පැවිදි වූ කෙළක් පමණ භික්ෂූන් විසින් පිරිවරණ ලදු ව දසමසක් මුලුල්ලෙහි දුෂ්කර ක්‍රියා කොට අන්‍යතර පුරාඛ්‍යානාවක විසින් ප්‍රේරිතත්වත ලද දිව්‍යඔජස් ප්‍රක්ෂිප්ත කළ ක්ෂීරපායාසය වලඳා, සල් වෙතෙහි දිවා විහාර කොට-

සුනන්දාදේවකොපනීත කුශමුෂ්ටි ප්‍රතිග්‍රහණය කොට **පුලින** නම් බොධිවෘක්ෂ මූලයෙහි දී සම්‍යක් සම්බෝධිඥාන ය සමධිගම්කොට බොධිද්‍රැම සමීපයෙහි ම යථා ක්‍රමයෙන් සප්ත සප්තාහානික්‍රාන්ත කොට **සුනන්දාරාමයෙහි** දී ධර්මචක්‍ර ය පවත්වා **සුමංගල** ය **තිස්ස** ය යන නමින් ප්‍රසිද්ධ අග්‍ර ශ්‍රාවක දෙදෙණෙකුන් වහන්සේ හා සමග හැම කල්හි ම චතුරාශ්‍රවයන් ක්ෂය කළ සාරලක්ෂයක් පමණ ක්ෂීණාශ්‍රවයන් විසින් පිරිවරණ ලදු ව,

සාගත නම් මහතෙර කෙණෙකුන් විසින් උපස්ථාන කරණු ලබමින් **නන්දා** ය **සුනන්දා** ය යන අග්‍රශ්‍රාවිකා දෙදෙණෙකු විසින් සම්ධිගත ශාසන ය ඇති ව යථා ක්‍රමයෙන් සැරිසරණ

සේක් රම්‍ය නම් පුරයට ප්‍රවිෂ්ට ව කෙලසාග්නීන් තැවුනා වූ ජනයන්ගේ සිත් ධර්ම කථා නමැති අමෘත රසධාරායෙන් සිහිල් කරවට පමුණුවමින් සුදර්ශන මහා විහාරයෙහි වැඩ වැස වදාරණ සේක.

මෙ ම කිහ මහාබොධි වංශයෙහි

තදා මොහන්ධකාර නිද්දරෝ ධම්මදීපඞ්කරෝ දීපඞ්කරෝ නාම සකල ලොක කරෝ අනුත්තරෝ සම්මාසම්බුද්ධෝ ප්‍රබ්භාගෙයෙව අනපප කපපකොටි සතසහසෙසසු පාරමියෝ පූරෙත්වා රම්මවතී නගරෙ සුදෙව රාජකුලෙ සුමෙධාය දෙවියා කුච්ඡියං පටිසන්ධිං ගහෙත්වා ඝනරාජීතෝ පුණ්ණවල්ලි විය මාතුකුච්ඡිතෝ නික්ඛමිත්වා සීහනාදං නදිත්වා හංසා කොඤ්චා මයූරානිධාකෙසු තිසු පාසාදෙසු නාටකිත්ති සතසහසෙසන පරිවරියමාහෝ දසවස්ස සහස්සානි අගාරමජ්ඣෙ වසිත්වා පදුමාදිධානාය අග්ගමහෙසියා කුච්ඡිතෝ උසභක්ඛන්ධාභිධානෙ පුත්තෙන ජාතෙ-

ජරා ජිණ්ණ ව්‍යාධි මත පබ්බජිතෙ දිස්වා අලඞ්කත හත්ථික්ඛන්ධවරගතෝ චතුරාසීතිසහස්ස කරිවරරොහකෙන රාජා ලොකෙන මහතා ව බලකායෙන පරිවුතෝ මහානිනික්ඛමණං නික්ඛම්ම පබ්බජිත්වා අනුපබ්බජිතාය පුරිසකොටියා පරිවුතෝ දසමාසෙ පධාන චරියං චරිත්වා අඤ්ඤතර ප්‍රාවාසියා දින්නං දිබ්බොජක පක්ඛිත්තං පායාසං පරිභුඤ්ජිත්වා සාලවනෙ දිවාවිහාරං කත්වා-

සුනඤ්ජීවකොපනීත කුසමුට්ඨියෝ ගහෙත්වා පිප්පලි රුක්ඛමූලෙ අභිසම්බුජ්ඣිත්වා සුනඤ්ජරාමේ ධම්මචක්කං පවත්තෙත්වා සුම්ඞ්ගලෝ - නිස්සෝති ච්ඡි අග්ගසාවකෙහි සද්ධිං නිච්චකාලං චතුහි ඛීණාසව සතසහසෙසහි පරිවුතෝ-

සාගතෙන යතිනා උපට්ඨහියමානෝ නඤ්ඤ සුනඤ්ඤති ච්ඡි අග්ගසාවිකාහි සමධිගත සාසනෝ අනුප්‍රබ්බෙන චාරිකං චරමානෝ රම්මනගරං පත්වා කිලෙසගහිසන්තතතං සබ්බජන මානසං ධම්ම කථාමත රසධාරාය සීතිභාවං ජනෙත්වා සුදස්සන මහා විහාරෙ විහරති-සි.

මෙසේ සම්බුදයන් වහන්සේ සුදර්ශන මහාවිහාරයෙහි වැඩ වසන සේකැ සි යනු ඇසූ රඹගම් නුවරවාසි ශ්‍රද්ධාවන්ත ජනයෝ ගඳ දුම් මල් පහන් ගත් අත් ඇති ව බුදුන් කරා එළඹ පසඟ පිහිටුවා වැඳ සුවඳ මල් ආදියෙන් පුද ඛණ අසා ගැත්තවුන් කෙරෙහි අනුකම්පාවෙන් සෙට දවසට ඉවසා වදාරන්නේ ය සි

ආරාධනා කොට නුවරට ගොස් දෙවෙනි දවස් මහදන් සරහා නුවර අලංකෘත කොට නැවත බුදුන් වඩනා මාර්ගය සරහන්නාහු උදක යෙන් භින්නසථානයෙහි පස් පුරවා සමතළ කෙරෙමින් රිදීපට සේ වැලි අතුට, ලද පස්මල් ඉසිමින් නානාවිධ ධ්වනි මිහිදුනා වසනුයෙන් ධජ පතාක තංවමින් කදලි තොරණ පුන්කලස පඬුකාති ආදිය සදමින් සිටියාහු ය.

එ සමයෙහි සුමේධ තාපසයන් වහන්සේ තමන් වහන්ගේ ආශ්‍රමපදයෙන් උද්ගත ව මාර්ගය සරහමින් සිටි ඒ මනුෂ්‍යයන් ගේ උපරිභාගයෙන් ආකාශචාරි ව යන සේක්. තුටු පහටු සිත් ඇති ඒ මිනිසුන් දැක කාරණ කිම් දෙහෝ සි විමසන පිණිස ආකාශ යෙන් බැස එකන්පසෙක්හි සිටි සේක් එබඳු උපාසකවරුනි! මේ මාර්ගය තෙපි කවරක්හට අලඞ්කෘත කොට සරහව් දැ සි ඒ මනුෂ්‍යයන් ගෙන් විමාළ සේක.

ඒ ඇසූ ජනයෝ කියන්නාහු ස්වාමි වූ සුමේධ තාපසයන් වහන්ස! තව නොදත් සේක් ද? දීපංකර නම් දශබලධාරී වූ සම්බුදු යන් වහන්සේ සම්බුදු ඥාණ පදප්‍රාප්ත ව පවත්වන ලද උතුම් වූ ධර්ම චක්‍රය ඇති ව ලොකාභිවෘඩි ය පිණිස ග්‍රාම නිගමාදියෙහි සැරිසරණ සේක්, අපගේ නුවරට පැමිණ සුදර්ශන මහා විහාරයෙහි වැඩ වස වදාරණ සේක.

අපි ඒ සම්බුදුයන් වහන්සේ ඇතුළු වූ මහා සඞ්ඝයා වහන් සේට දන්දෙනු පිණිස ආරාධනා කොට වඩනා මාර්ගය සරහම්හ සි කිහ. ඒ ඇසූ සුමේධ තාපසයන් වහන්සේ සිතන සේක් කල්ප ශතසහස්‍රයකි නු දු බුදුනැ සි යන ශබ්ද මාත්‍රයක් ඇසීම දුර්ලභ ය. එ බදු සම්බුදු කෙණෙකුන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේකැ සි ඇසීමි. නොබෝ වේලාවකින් දක්නට ද ලබමි සි ප්‍රීතින් පිනා ගිය සිත් ඇති ව මේ මාර්ගයෙන් එක් ප්‍රදේශයක් මාවිසිනු න් සැරහිය යුතු යැ සි සිතා එසේ වී නම් උපාසක වරුනි! මට ත් මින් ප්‍රදේශයක් දෙව සි ඉල්වූ සේක.

උපාසකවරු ත් සුමේධ තාපසයන් වහන්සේ ඍද්ධි ඇති සේකැ සි දැන තමන් විසින් මහා සරහාගත නොහැකි වූ සිහිල් දියෙන් පිරූ ගැඹුරු කඳුරැලියක් මේ ඔබවහන්සේ සැර හු ව මැනවැ සි දුන්නාහු ය.

එ කල්හි සුමේධ තාපසයන් වහන්සේ බුද්ධාලම්බන ප්‍රීති උපදවා සිතන සේක් මම මේ සථාන ය ඍද්ධියෙන් සරහන්නට සමර්ථ යෙමි. හෙවත් අමරපුරෙශ්වර වූ ශක්‍ර දිව්‍යරාජයාගේ පරසතු

රැක සොල්වා මල් ගෙණවුත් සරහන්නට ද සමර්ථ යෙමි. උරග පුරෙශ්වර වූ නාගරාජයන්ගේ චිත්තානන්දන ය කරවන කඳුපුල් මල් ගෙණවුත් සරහන්නට ද සමර්ථ යෙමි. සුවර්ණමේරු පර්වත රාජයාගේ අධොභාගයෙන් සත් රුවන් ගෙණවුත් මේ ගැඹුරු කඳුරැලි ය පුරවන්නට ද සමර්ථ යෙමි.

තව ද අඟස බලා රුවන් වර්ෂා වස්වා මේ කඳුරැලි ය පුර වන්නට ද සමර්ථ යෙමි. මෙසේ සෘද්ධ්‍යානුභාවයෙන් සැරසීම් වතාහි මාගේ සිත සතුටු වන්නේ නොවෙයි. අද මා විසින් ඒ නිලොඟුරු සම්බුදුයන් වහන්සේ උදෙසා කායවාග්චිත්ත ය කටයුතු ය යි සිතා එබඳු මහානුභාව සම්පන්න තාපසයන් වහන්සේ බුදුන් කෙරෙහි ගත් ගෞරවයෙන් මෘදු කොමල හස්තයෙන් පස් ගෙණවුත් ඒ කඳුරැලි ය පුරවමින් නොනිමි කල්හි ම ත්‍රෛලෝක්‍ය ප්‍රදීපාය මාන වූ දශබලධාරී වූ **දීපඞ්කර** නම් සම්බුදුයන් වහන්සේ මහානුභාව සම්පන්න වූ ෂට්අභිඥ ධර වූ ක්ෂීණාශ්‍රව වූ සඞ්ඝපොහන වූ සාරලක්ෂයක් පමණ භික්ෂූන් විසින් පිරිවරණ ලද්දු ව අසදෘස වූ බුද්ධලීලාවෙන් වැඩි සේක.

කෙබඳු සංඝපොහන වූ භික්ෂූන් විසින් ද යි යත හොත්? යම් සේ ඒ සම්බුදුයන් වහන්සේ ඡඤ්ඩිදී සතර අගනියට නොපැමිණෙන සේක් ද එබඳු ඡඤ්ඩිදී සතර අගනියට නොපැමිණෙන භික්ෂූන් විසින් ද, යම් සේ තමන් වහන්සේ ඉෂ්ටානිෂ්ටාදියෙහි අකම්පය සවභාව ඇති සේක් ද, එසේ ම ඉෂ්ටානිෂ්ටයෙහි අකම්පය සවභාව ඇති භික්ෂූන් වහන්සේ විසින් ද – යම් සේ ඒ සම්බුදුයන් වහන්සේ චක්ෂුරාදී ෂඩින්ද්‍රියයන් දමන ය කළ සේක් ද එබඳු චක්ෂුරාදී ෂඩින්ද්‍රියයන් දමන ය කළ භික්ෂූන් වහන්සේ විසින් ද—

යම් සේ ඒ සම්බුදුයන් වහන්සේ සකල ක්ලේශයන් සත් හිඳු වූ බැවින් ශාන්ත වූ සේක් ද එබඳු ශාන්ත භික්ෂූන් වහන්සේ විසින් ද, යම් සේ ඒ සම්බුදුයන් වහන්සේ ක්ලේශාග්නීන් නිවියා වූ සිත් ඇති සේක් ද, එබඳු ක්ලේශාග්නීන් නිවියා වූ සිත් ඇති භික්ෂූන් වහන්සේ විසින් ද — මේ ආදී නොයෙක් ගුණයෙන් යුක්ත වූ නොයෙක් භික්ෂූන් වහන්සේ විසින් ද ජවාලා නොපමයන් කුහකයන් පාප පුද්ගලයන් යම් කලෙක සමූහ වූ ව ද මහමුහුදු කුණු සෙයින් සුස්නෙහි නො සිටිය දෙන හෙයින් ඒ සියලු භික්ෂූන් වහන්සේ සඞ්ඝපොහන වන සේක.

මේ බදු වූ උතුම් ගුණයෙන් යුක්ත සාරලක්ෂණයක් පමණ ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේ විසින් පිරිවරණ ලද සේක් දෙවියන් විසින් දිව්‍ය ගන්ධ මාලාදීන් පූජාකරණ ලදු ව දිව්‍ය සංගීති පවත් වන ලදු ව මනුෂ්‍යයන් විසින් මානුෂ්‍යක ගන්ධ මාලාදීන් පූදන ලදු ව අනන්ත වූ බුඩි ලීලායෙන් සප්තකුල පර්වතයන් විසින් පිරි වරණ ලද සුවර්ණමෙරු පර්වත ය මෙන් ද,

තාරකා සමූහයා විසින් පිරිවරණ ලද පූර්ණ චන්ද්‍රමණ්ඩල ය මෙන් ද, සහස්‍රරශ්මීන් පිරිවරණ ලද ශරත් සූර්‍යමණ්ඩල ය මෙන් ද මනොසිලා තලයෙහි විජෘම්භමාන සිංහරාජයක්හු මෙන් ද අලඞ්කාත කොට පිළියෙළ කරණ ලද මාඝීයට පිළිපන් සේක.

සුමේධ තාපසයන් වහන්සේ අඤ්ඤි උන්මීලන ය කොට අලඞ්කාත මාඝීයෙන් වඩනා වූ දශබලධාරී වූ සම්බුදුයන් වහන් සේගේ සුප්‍රතිෂ්ඨිත පාදද්වි දෙතිස් මහා පුරුෂලක්ෂණ යෙන් ප්‍රති මණ්ඩිත වූ අසිති අනුව්‍යඤ්ජනයෙන් අනුව්‍යඤ්ජිත වූ ව්‍යාමප්‍රභා මණ්ඩලයෙන් සම්පරිවාරිත වූ මණිවර්ණ ගගනතලයෙහි දශදික් දිවන අනෙක ශතසහස්‍ර විද්‍යුල්ලතා සෙසින් ආවෙළාවෙළහුත වූ යුවල යුවල වූ නිල පීත ලොහිතාවදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වර ය යන ෂට්වර්ණ ඝන බුද්ධරශ්මි මාලාවන් විහිදුවන්නා වූ ඛද්‍යොත ප්‍රභා නිශ්ප්‍රභා කොට දිලිහෙන බාලාර්කී මණ්ඩල ය සෙසින් දිව්‍ය බ්‍රහ්මාදීන් ගේ ශරීර ප්‍රභා අභිභවා දිලිහෙන රූපාග්‍රප්‍රාප්ත වූ ආත්මභාවයෙන් උපලක්ෂිත වූ ඒ ලොකස්වාමි වූ සම්බුදුයන් වහන්සේ දැක—

අද මා විසින් දශබලධාරී වූ මේ උතුමාණන් වහන්සේට ජීවිත පරිත්‍යාග කරන්නට වටනේ ය යි සිතා භාග්‍යවත් වූ සම්බුදුයන් වහන්සේ **දෙයිය අසාලසක්** මඞ්ගල්‍ය ලක්ෂණයෙන් විසිතුරු වූ ශ්‍රීපාදයුග්ම ය **කළල්** මතුයෙහි **නො තබා මිණි පෝරු** යෙන් කළ නෙයක් මැඩ වඩනා කලක් මෙන් සාරලක්ෂණයක් පමණ ක්ෂීණාශ්‍රව භික්ෂූන් හා සමග මාගේ පිට මැඩගෙණ වඩනා සේක් ව යි එසේ වැඩීම මට දීර්ඝකාලයකට හිත සැප පිණිස වන්නේ ය යි දළමඬුලු මුදා දළමඬුලු හා අදුන් දිවසම් වැහැරි සිඳුරු කාළවණ් වූ **කළල්** මතුයෙහි අතුට මිණිඵලක නෙයක් මේන් **කළල්** මතුයෙහි වැදහොත් සේක.

මෙ ද කිඤ්චාපි දූරෙනිදානයෙහි

සුමේධෝ බුද්ධාරම්මණං පීතිං ගහෙත්වා විනෙසි. අහං ඉමං ඔකාසං ඉද්ධියා අලඞ්කරිතුං පහොමි. එවං අලංකතෝ පන මං න පරිතොසෙස්සන්ති. අජ්ජ මයා කාය වෙය්‍යාවච්චං කාතුං වට්ටතීති පංසුං ආහරිත්වා තස්මිං පදෙසෙ පක්ඛිපි. තස්ස තස්මිං පදෙසෙ අතලඞ්කතෙ යෙව දීපඞ්කර දසබලෝ මහානුභාවතං ඤත්වා ඛීණාසවානං චතූහි සතසහස්සෙහි පරිවුතෝ දෙවතාසු දිබ්බගන්ධමාලාදීහි පූජයන්තෙසු දිබ්බ සංගීතෙසු පවත්තමානෙසු මනුස්සෙහි මානුසක ගන්ධෙහි චෙව මාලාදීහි ච පූජ යන්තෙසු අනන්තාය බුද්ධලීළාය මනොසිලාතලෙ විජම්භමානෝ සීහෝ විය තං අලඞ්කත පටියත්තා මග්ගං පටිපජ්ජි.

සුමේධ තාපසෝ අක්ඛීනි උම්මීලෙත්වා අලඞ්කත මහොන්න ආගච්ඡන්තස්ස දසබලස්ස ද්වත්තිංස මහාපුරිසලක්ඛණ පතිමණ්ඩිතං අසීතියා අනුබ්‍යඤ්ජනෙහි අනුබ්‍යඤ්ජිතං බ්‍යාමප්පභාය සමපරිවා රිතං මණිවණ්ණ ගගනතලෙ නානප්පකාරා විජ්ජුල්ලතා විය ආවෙළා වෙළාභූතාවෙව යුගල යුගල භූතා ව ඡබ්බණ්ණ ඝන බුද්ධරස්මියෝ විස්සජ්ජෙන්තා රූපග්ගප්පත්තං අත්තභාවං ඔලොකෙත්වා අජ්ජ මයා දසබලස්ස ජීවිතපරිච්චාගං කාතුං වට්ටති. මා භගවා කළලෙ අක්කමී. මණිඵලකසෙතුං අක්කමන්තා විය සද්ධිං චතූහි ඛීනාසව සතසහස්සෙහි මම පිට්ඨිං මද්දමානෝ ගච්ඡතු. තා මෙ භවිස්සති දීඝරත්තං හිතාය සුඛාය'ති කෙසෙ මොචෙත්වා අජින ජටා වාක චීරානි කාළවණ්ණ කළලෙ පත්ථරිත්වා මණිඵලකසෙතුං විය කළල පිට්ඨෙ නිපජ්ජි.

එසින් වදළහ - බුදුහු

තෙ මෙ පුට්ඨා ව්‍යාකරිංසු බුද්ධෝ ලොකෙ අනුත්තරෝ,
දීපංකරෝ නාම ජිනෝ උපජ්ජි ලොකනායකෝ.
තස්ස සොධියති මිගෙහා අඤ්ජසං වට්ටමායනං
කෙසෙ මුඤ්චිත්වහං තත්ථ වාකචීරඤ්ච චම්මකං,
කළලෙ පත්ථරිත්වාන අවකුජ්ජෝ නිපජ්ජහං.
අක්කමිත්වාන මං බුද්ධෝ සහ සිස්සෙහි ගච්ඡතු,
මා නං කළලෙ අක්කමිත්වෝ හිතාය මෙ භවිස්සති-ති.

මෙසේ කළල් මතුයෙහි වැදහොත්තා වූ සුමෙධ තාපස යන් වහන්සේ නිලුපුල්පෙති බඳු නෙත්‍ර යුග්ම ය දල්වා ත්‍රෙලෝ ක්‍යෙකදිවාකර වූ දීපඞ්කර සම්‍යක් සම්බුද්ධ සර්ව්ඥරාජෝත්තමයා

නන් වහන්සේ අසදෘශ වූ අචින්ත්‍ය වූ අනොපමේය වූ බුද්ධශ්‍රිය බලන සේක් සතුටු ව මෙසේ සිතූ සේක-කෙසේ ද යත්? ඉදින් මට අනිප්‍රාය ඒ නම් මේ බුදුන් කෙරෙහි පැවිදි ව ලොභ දොෂ මොහ මද මාන මාත්සර්‍යාදි සකල ක්ලේශයන් නසා අග්‍රදක්ෂිණෙය්‍ය බවට පැමිණ සාරලක්ෂයක් ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේට සඞ්ඝනවක ව බුදුන් පිරිවරා රම්‍ය නම් නුවරට වදනට සමර්ථයෙමි.

එසේ කිරීම අති මධුර රස ඔජනයක් ලැබ බොහෝ කාලයක් ශ්‍රද්ධායෙන් පිඹින සත්ත්වසමූහයා බලා සිටිය දී අඳුරු ගැබකට වැද අනුභව කිරීමක් වැන්න. සා පිපාසායෙන් පෙළෙන ලදරුවන් බලා හිඳිද්දි අමාරස අනුභව කරණ මවක් වැන්න. ගිනි ගෙණ දිලිසෙන ගෙයි දරුවන් හඬ හඬා සිටිය දී තනි ව ගැලවී දිවන මවුපියන් වැන්න. එසේ හෙයින් හුදකලාව අප්‍ර සිද්ධ ව නිවන්පුර යාමෙන් ප්‍රයෝජන නැත. මම ද මේ **දීපඞ්කර** දශබලධාරී සම්බුදුන් වහන්සේ මෙන් සම්‍යක්සම්බොධියට පැමිණ සද්ධර්ම නැමැති නැවෙකි ලා සංසාර නැමැති සාගරයෙන් සත්ත්ව වගීයා එතර කොට නිවන් නැමැති අමාරසයෙන් සන්තර්පණය කොට නැවත පරිනිර්වාණ ය කිරීම මට සුදුසු ය යි සිතා **අඤ්ඤා ධර්ම සමොධාන** යෙන් යුක්ත ව බුද්ධත්වයට අනිනිහාර කොට වැදහොත් සේක.

මෙම දක්වන්නට කිහ - දුරෙනිදානයෙහි

සෝ සාලලපිටෙ නිපන්නකෝ ව පුන අකඞ්ඛී උම්මිලෙත්වා දීපඞ්කර දසබලස්ස බුද්ධසිරිං සවපස්සමානෝ එවං චින්තෙසි. සවෙ අහං ඉමෙජ්ඣ්‍යං සබ්බකිලෙසෙ ඛෙපෙත්වා සංඝනවකෝ හුත්වා රම්මනගරං පවිසෙය්‍යං අඤ්ඤතකවෙසෙන පන මෙ කිලෙසෙ ඛෙපෙත්වා නිබ්බාණපපත්තියා නත්ථි. යන්නූනාහං දීපඞ්කර දස බලෝ විය පරමාභිසම්බොධිං පත්වා ධම්මනාවං ආරොපෙත්වා මහා ජනං සංසාරසාගරා උත්තාරෙත්වා පච්ඡා පරිනිබ්බායෙය්‍යං. ඉදං මියහං පනිරූපත්ති නතෝ අට්ඨමෙම සමොධානෙත්වා බුද්ධ භාවාය අනිනිහාරං කත්වා නිපජ්ජි.

සිහු මැ සි මහාබොධි වංශයෙහි ත්

නිපන්නෝ පන සෝ මහාපුරිසෝ විබුද්ධපුණ්ඩරික ලොච නානි උම්මිලෙත්වා ඔලොකෙන්නෝ තස්ස විජිත කුසුමායුධ සංගා ඒසාය බුද්ධසිරිං දිසවා පඤ්ඤා සඤ්ඤය වොදිතෝ යන්නූනාහං

අනෙකාදීනවං සංසාරං පහාය පරමසුඛං නිබ්බානං ගණ්හායන්ති. විනෙත්වා තතෝ කරුණා තරුණියා ආයාචිත හදයෝ එවං පණීතාමත පටිවෙධෝ අතිමධුරවර නොජනං ලභිත්වා ඝනතර තිමිර ගබභං පවිසිත්වා පරිභුඤ්ජත සදිසෝ මාදිසෙ සති මති සුති ධිති සමාධි සමපත්තෙන වීරපුරිසෙ එකාකිනි සංසාර ජලනිධි නිමුග්ග සත්තකායං පහාය නිබ්බාණථලමභිරුළෙහ කොහි නාම අඤ්ඤ භවාභවෙසු විපරිවත්තමානස්ස අසරණීභූතස්ස ලොකස්ස පතිට්ඨං කාතුං සමත්ථෝ භවිස්සති?

සබ්බඤ්ඤුතං පන පත්වා සදෙවකං ලොකං සංසාර කන්තාරා තාරෙත්වා නිබ්බාණ නගරං පවිසිස්සාමී'ති සාවකඤාණාභිමුඛ මානසං සබ්බඤ්ඤුත ඤාණාභිමුඛං අකාසි.

එසේ වැදහොත් සුමෙධ තාපසයන් වහන්සේ යම් හෙයකින් නියත විවරණ ලබන බොධිසත්ව වරයන්ට—

මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති හෙතු සත්ථාර දස්සනං,
පබ්බජ්ජා ගුණසම්පත්ති අධිකාරෝ ච ඡන්දතා;
අට්ඨධම්මසමොධානා අභිනීහාරෝ සම්ජායති-සි.

දක්වන ලද අෂ්ටධර්මයෙන් සමන්විත ව ම නියත විවරණ ලැබිය යුතු ද? ඒ අෂ්ටධර්මයෙන් සමන්විත ව ම වැදහොත් සේක. ඒ එසේ ම ය. බුද්ධත්වයට ප්‍රාර්ථනා කරණකල **මනුෂ්‍යත්වාභාව** යෙහි ම සිට බුද්ධත්ව ය ප්‍රාර්ථනා කළහොත් එසේ වුවහුට ප්‍රාර්ථනාව සමෘඩ වෙයි. නාගයොනියෙහි හෝ අවශෙෂ ජාති හැර ශක්‍රාදි දෙවයොනියෙහි හෝ සිටියහුට ප්‍රාර්ථනාව සමෘඩ නොවේ. මනුෂ්‍යත්වභාවයෙහි වූ පුරුෂත්වයෙහි ම සිටියහුට ප්‍රාර්ථනාව සමෘඩ වේ. සන්ත්‍රීත්වයෙහි සිටියනට හෝ.

පකතිඋ පකතිමිකාසිත්තා උභුයෝ පත පණ්ඩකෝ,
නපුංසකෙන පඤ්ඤත්තෙ පණ්ඩකා පරිදීපිතා-සි.

දක්වන ලද අකුසල විපාකානුභාවය කරණකොට ගෙණ කාළපක්ෂයෙහි පණ්ඩක ව ශුක්ලපක්ෂයෙහි කාමපරිළාහ සත්හිදුවන පකති පණ්ඩක ව ද-උපක්‍රමයෙන් බිජුහරණ ලද ඔපක්කමික පණ්ඩකයොනියෙහි ද-අනුන්ගේ නිමිත්ත මුඛයෙන් ගෙණ උන්ගේ අසුචියෙන් මුඛ ය තෙමුනුකල කාමරාග ය සන්හිදෙන ආසිත්ත පණ්ඩකයොනියෙහි ද – එසේ ම අනුන් ව්‍යතික්‍රම කරන්නා බලා

කාමරාග ය සන්හිදෙන්නා වූ උසූයපණ්ඩක යොනියෙහි ද-ස්ත්‍රී ත් නොවන පුරුෂ ත් නොවන නපුංසක පණ්ඩක යොනියෙහි ද මෙවුන්දමෙහි හැසිරෙණ කල ස්ත්‍රීනිමිත්ත ප්‍රතිච්ඡන්න ව පුරුෂ නිමිත්ත ප්‍රකටවන්නා වූ උභතොබ්‍යඤ්ජනක යොනියෙහි ද- එසේ ම පුරුෂනිමිත්ත ප්‍රතිච්ඡන්න ව ස්ත්‍රීනිමිත්ත ප්‍රකටවන්නා වූ උභතොබ්‍යඤ්ජනක යොනියෙහි ද – සිටියානට හෝ ප්‍රාණීනාව සමෘඩ නොවෙයි පුරුෂත්වයෙහි සිටියන්ට ද එම ආත්මභාවයෙහි රාගදෙවෂාදී සකල කෙලෙශයන් නසා අර්හත්ඵල ප්‍රාප්තියට පැමිණෙන තරම් **හෙතුසම්පන්න් ඇත්ත්‍රුව** ම ප්‍රාණීනාව සමෘඩ වෙයි.

එබඳු හෙතුසම්පන් නැත්තහුට ප්‍රාණීනාව සමෘඩ නොවෙයි. හෙතුසම්පන්නයා ගට ද ඉදින් **ජීවමාන බුදුන්ගේ සම්පයෙහි** ම ප්‍රාණීනා කළහොත් ඒ ඔහුට ප්‍රාණීනාව සමෘඩ වෙයි. බුදුන් පිරිනිවි කල්හි චෛත්‍ය සඞ්ඛ්‍යාත දැගැබක් සම්පයෙහි හෝ බොධිමූලයෙහි හෝ ප්‍රාණීනා කරන්නහුට සමෘඩ නොවෙයි. බුදුවරයන්ගේ සමීප යෙහි ප්‍රාණීනා කරන්නහුට ද ශාසනප්‍රව්‍රජ්‍යාවෙන් හෝ ඍෂිප්‍රව්‍රජ්‍යා වෙන් හෝ **පැවිදිවූවහුට** ම ප්‍රාණීනාව සමෘඩ වෙයි. කාමපරිභොග වූ ගෘහස්ථයාහට සමෘඩ නොවෙයි.

ප්‍රව්‍රජිතය, හට ද පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති සඞ්ඛ්‍යාත ගුණ ප්‍රතිලාභී වූවාහට ම සමෘද්ධ වෙයි මෙකී ගුණ සමපත්තියෙන් විරහිත වූවාහට සමෘද්ධ නොවෙයි. ගුණසම්පන්නයා විසිනු දු යමෙකු විසින් තමා ජීවිත ය බුදුන්ට පරිත්‍යාග කෙරේ ද මෙ බඳු අධික ක්‍රියාවෙන් **අධිකාර සම්පන්නවූවාහට** ම සමෘද්ධ වෙයි. යථොක්ත අධිකාර සම්පත් නැත්තා වූ අන්‍යතරයාහට සමෘඩ නො වෙයි. අධිකාර සම්පන්නයාහට ද යමෙක් බුද්ධකාරක ධර්මයන් පිණිස **මහන්** වූ **ඡන්ද ය ද** මහත් වූ උත්සාහ ය ද මහත් වූ ව්‍යායාම ය ද ඇති ව බුද්ධ කාරක ධර්මයන් පර්යේෂණ කරන්නේ වී නම් ඕ හට ම සමෘද්ධ වෙයි බුද්ධකාරක ධර්මයන් පිණිස මහත් වූ ඡන්ද ය ද මහත් වූ උත්සාහ ය ද මහත් වූ ව්‍යායාම ය ද ඇති ව බුද්ධකාරක ධර්මයන් පර්යේෂණ ය නො කරන්නාහට සමෘද්ධ නො වේ.

එසින් කිහ-දූරෙනිදානයෙහි

මනුස්සත්තභාවසමිං යෙව හි ඨත්වා බුද්ධත්තං පත්ථෙන්නස්ස පත්ථනා සම්ජ්ඣති. නාගස්ස වා සුපණ්ණස්ස වා දෙවතාය වා පත්ථනා නො සම්ජ්ඣති. මනුස්සත්තභාවෙපි පුරිසලිඞ්ගෙහි ඨිත-සෙව පත්ථනා සම්ජ්ඣති. ඉත්ථියා වා. පණ්ඩක නපුංසක උභ

තොබ්‍යඤ්ඣතකානං වා නො සම්ජඤ්ඤති. පුරිසස්සපි තසම්ං අත්ත භාවෙ අරහත්තපපත්තියා හෙතුසම්පන්නස්සෙව පඨනා සම්ජඤ්ඤති නො ඉතරස්ස.

හෙතුසම්පන්නෙනාපි සවෙ ජීවමානකබුද්ධස්සෙව සන්තිකෙ පඨෙන්නස්ස පඨනා සම්ජඤ්ඤති. පරිනිබ්බුතෙ බුද්ධෙ වෙතිය සන්තිකෙ වා බොධිමූලෙ වා පඨෙන්නස්ස න සම්ජඤ්ඤති. බුද්ධානං සන්තිකෙ පඨෙන්නස්සාපි පබ්බජ්ජා ලිඞ්ග සිතස්සෙව සම්ජඤ්ඤති. නො ගිහිලිඞ්ග සිතස්ස. පබ්බජිතස්සාපි පඤ්චාභිඤ්ඤා අට්ඨසමා පත්ති ලාභිනො යෙව සම්ජඤ්ඤති. න ඉමාය ගුණසම්පත්තියා විරහිතස්ස. ගුණසම්පන්නෙනාපි යෙන අත්තනො ජීවිතං බුද්ධානං පරිච්චත්තං හොති. තස්ස ඉමිනා අධිකාරෙන අධිකාරසම්පන්න සොව සම්ජඤ්ඤති. න ඉතරස්ස:

අධිකාරසම්පන්නස්සාපි යස්ස බුඩකාරක ධම්මානං අත්ථාය මහන්තා ඡන්දෙ ව මහන්තා උස්සාහොවායාමෝ ච පරියෙට්ඨි තස්සෙව සම්ජඤ්ඤති න ඉතරස්ස—සි.

ඔවුන් අතුරෙහි ඡන්දමහන්තභාවයට උපමා දක්වනු ලැබේ.

කෙසේ ද යත්?

යමෙක් තෙමේ එකොදකිභූත වූ සකල චක්‍රවාල ගර්භ ය තමා ගේ බාහුබලයෙන් පිහිනා පරතෙරට යන්නට සමර්ථ වේ ද ඔහු බුඩත්වයට පැමිණෙයි-හෙවත් සතිස්ලක්ෂ දසදහක් තුන්සිය පණස් යොදුනක් වට ඇති චක්‍රවාටාබ්‍යන්තරයෙහි හැම තන්හි ම කිඹුල් දැනි මොහොරු ආදීන් විසින් ගැවසී තිබෙන සමුද්‍ර යෙහි ඔරු-පස්රු ආදි කිසිවක් නො ගෙණ හස්තබලයෙන් ම පිහිනා එතර ව ගියක්හට බුඩත්ව ය සිඩවන්නේ ස යි යමෙක් කියේ වී නම් එයට නො පසු බැස මම එබඳු සමුද්‍ර ය පිහිනා එතර ගොස් බුඩත්වයට පැමිණෙමි සි කියා සමුද්‍රයට බස්නට සමර්ථ යෙක් ඇත්නම් ඔහු බුඩත්වයට පැමිණෙයි.

තව ද යමෙක් එ බඳු චක්‍රවාල ගර්භ ය කටු සහිත හුණ පදුරෙන් ගැවසී තිබෙන්නේ ය. ඒ හුණවන ය වහන් ආදී කිසි වක් පය නො ලා දඹිමුගුරු ශස්ත්‍රාදියක් අතින් නො ගෙණ විසූ ගනය කොට හෙවත් දෙකක් කොට පිරා පදසා ගමනින් ම එතර ගියක් හට බුඩත්වයට පැමිණි ය හැක්කේ ය සි කියේ වී නම් යමෙක් ඒ අසා මට බුඩත්ව ය මිස ඒ හුණවන ස විසූහන ය කොට යාම දුෂ්කර දෙයක් නො වෙයි. සසර දුක් ගන්නා සත්ව

වඥියාහට නිවත් සාදා දෙනු පිණිස පයට සුඛස්පර්ශ දෙන නිතණ වතයක් මෙන් සරු නොකොට සක්වළ ගැබ පුරා තුබූ ඒ හුණ වන ය විසුහත ය කොට ගෙණ එතර ගොස් බුඩත්වයට පැමිණෙමි සි කියා පටන්ගන්නට සමර්ථයෙක් ඇත් නම් ඔහු බුඩත්වයට පැමිණෙ සි.

තව ද යමෙක් සකලචක්‍රවාල ගර්භ ය ඝන හිළුක් වනයක් මෙන් අතුරු නැති ව කඩු තෙප් ආදී තියුණු මුවහත් ඇති ශස්ත්‍ර උඩුකුරු කොට හිඳුවා තිබෙන්නේ ය. ඒ චක්‍රවාලගර්භ ය වහන් ආදි කිසිවක් පය නොලා ප්‍රකෘති පාද යෙන් ම ඇක්ම පරතෙර ගියහොත් බුඩත්වයට පැමිණිය හැක් කේ ය සි කියේ වී නම් යමෙක් ඒ අසා මට ඒ දුෂ්කර දෙයක් නො වෙසි. තියුණු මුවහත් ඇති අසිපත්‍ර වනාදියෙහි ටෙහෙස විඳිනා සත්වශීයා එසින් නගා නිවන්පුරයෙහි පිහිටුවන පිණිස සතරගුලෙන් යුත් හෙළලොමින් කළ ඇතිරියක් පිට යන්නක් හු මෙන් සරු නොකොට ආයුධ මුනයෙන් ගැවසීගත් සක්වළ ගැබ පරතෙර ගොස් බුඩත්වයට පැමිණෙමි සි කියා යුහු ව යන්නට සමර්ථයෙක් ඇත් නම් ඔහු බුඩත්වයට පැමිණෙ සි.

. තව ද යමෙක් එ බඳු සක්වළ ගැබ විතච්චිකාඞ්ගාරයෙන් හරිත ව නිබෙන්නේ ය නෙවත් දිලිහෙන කිහිරහුරෙන් පිරී තිබෙන්නේ ය. මෙ බඳු දිලිහෙන අහුරු මැඩ පරතෙර ගියක් හට බුඩත්ව ය සිඩවන්නේ ය සි කියේ වී නම් ඒ අසා ඒ මට දුස්කර දෙයක් නොවෙසි. අඞ්ගාර නරකාදියෙහි දුක්විඳිනා මාගේ සත්වශීයා එසින් නගා නිවන්පුරයෙහි පිහිටුවනු පිණිස කණිකාර මල් දළඅස්නක් මැඩ යන්නාක්හු මෙන් සරුනොකොට දිලියෙන අහුරු මැඩ පරතෙර ගොස් බුදුවෙමි සි කියා යුහු ව පටන් ගෙණ යන්නට සමර්ථයෙක් ඇත් නම් ඔහු බුඩත්වයට පැමිණෙ සි.

තව ද යමෙක් සක්වළ ගැබ ජලයෙන් පිරිහිබෙන ඔහුද ද පිකා එතර ගොස් එසේ ම සක්වළගැබ හැමතැන ම ආකීර්ණ ව තිබෙන හුණ වනය ද විසුහත ය කොට පදසා ගමණින් ම එතර ගොස් එසේ ම ශස්ත්‍රයෙන් ගැවසී තිබෙන චක්‍රවාල ගර්භ ය පසින් මැඩගෙණ පරතෙර නොස් එසේ ම විතච්චිකාඞ්ගාරයෙන් හරිත ව තිබෙන සකල චක්‍රවාල ගර්භ ය පසින් පාගා එතර ගොස් පර තෙර දුටුවක්හට මිස සෙස්සනට බුදුබව ය සිඩ නොවෙ සි කියේ

වි නම් ඒ අසා සසර සසුරෙහි දුක් ගන්නා සත්ත්වසමූහයා එයින් ගොඩනගණු පිණිස සකල චක්‍රවාල ගභි ය විරි නිඛෙන මුහුදු ත් පිනා එතර ගොස්-

එසේ ම සක්වළ ගැබ අතුරු නැති ව ගැවසී තුබූ හුණ වනය ත් විසුහන ය කොට එතර ගොස් එසේ ම සක්වළ ගැබ අතුරු නැති ව ආකිර්ණ ව තුබූ ආයුධ රාශිය ත් පසින් ම මැඩ එතර ගොස් එසේ ම සක්වළ ගැබ පුරා තුබූ චිතුචිචික අතුරු රැස ත් පසින් මැඩ එතර ගොස් බුද්ධත්වයට පැමිණ සත්ත්වගි යා සසරදුකින් මුදු නිවන් පුර ගෙණයෙමි යි කියා ඒ සියල්ල දුෂ්කර දෙයක් මෙන් නොසිතා යුහු ව කිරිමෙහි පටන්ගන්නා වූ බුඩකාරක ධර්මයන් කෙරෙහි පැවති මෙබඳු ආලයෙන් මෙබඳු උත්සාහයෙන් ධන සොයන නිර්ධන පුරුෂයන්හු මෙන් ද-

ඖෂධ සොයන රෝගි පුරුෂයන්හු මෙන් ද, පරතෙර සොයන සමුදුගතයන්හු මෙන් ද, මානිය සොයන මංමුලා වූ විදෙශී පුරුෂයන්හු මෙන් ද, දරුවන් දක්නා කැමති නව ගර්භිණියක් මෙන් ද, ජව භූමියක් සොයන සංග්‍රාම රජන්හු මෙන් ද, සජාභිධර්තනය ප්‍රාර්ථිතා කරණ සත්ත්වි රජන්හු මෙන් ද විශෙෂයෙන් බුඩකාරක ධර්මයන් සෙවීමෙහි නියුක්ත යම් මහොත්තමයෙක් ඇත් නම් ඕහට අනිනීහාර සඞ්ඛ්‍යාත **මූලප්‍රණිධාන ය** සමඟ වේ.

කියේ මැ නෝ එම - දූරෙනිදානයෙහි

තන්ත්‍රිදං ඡන්දමහත්තතා ය ඔපම්මං: සචෙ හි එවමස්ස යෝ සකල චක්කවාළගබ්භං එකොදකීභූතං අත්තනෝ බාහුබලෙන සන්තරිත්වා පාරං ගන්තුං සමත්ථෝ සෝ බුද්ධත්තං පාපුණාති. යෝ වා පන සකල චක්කවාළගබ්භං වෙළුගුම්බසඤ්ඡන්නං විසුහිත්වා මද්දිත්වා පදසා ගවජ්ජන්තෝ පාරං ගන්තුං සමත්ථෝ - සෝ බුඩත්තං පාපුණාති. යෝ වා පන සකල චක්කවාළගබ්භං සත්තියෝ ආකොටෙත්වා නිරන්තරං සත්තිඵල සමාකිණ්ණං පදසා අක්කමමානෝ පාරං ගන්තුං සමත්ථෝ - සෝ බුඩත්තං පාපුණාති.

යෝ වා පන සකල චක්කවාළගබ්භං විතචිචිකඛාරහරිතං පාදෙහි මද්දමානෝ පාරංගන්තුං සමත්ථෝ සෝ බුඩත්තං පාපුණාති'ති. යෝ එතෙසු එකම්පි අත්තනෝ දුක්කරං න මඤ්ඤති. අහං එතම්පි තරිත්වා ගන්ත්වා වා පාරං ගමෙස්සාමී'ති එවං මහන්තෙන ඡන්දෙන ච උස්සාහෙන ච වායාමෙන ච පරියෙට්ඨියා ච සමන්නාගතෝ හොති. තස්ස පත්ථනා සම්ජ්ඣති-හි.

තව ද යම් කියිවෙක් සාරාසංඛ්‍යකල්පලක්ෂයක් මුලුල්ලෙහි නරකයෙහි පැසී බුඩකිය ලබන්නට කවරෙක් කැමැත්තෙහි ද යි විවාළේ නම් ඒ අසා යමෙක් මම ය යි කියන්ට උත්සාහ ඇත්තේ වී නම් බුඩබව ය කෙරෙහි පැවති ඡන්දය යි කියන ලද ආල ය ඔහට බලවතා යි දතයුතු.

එසින් කිහ-සාරසඞ්ග්‍රහයෙහි

සවෙ කොවි වදෙය්‍ය කො වත්තාරි අසංඛෙය්‍යානි සත සහස්සං ච කපෙ නිරයෙ පච්චිඞ්‍ඛා බුද්ධත්තං ඉච්ඡතී'ති?- තං සුඩා යො අහන්ති වත්තුං උස්සහති තස්ස බලවතී'ති වෙදි තබඛා—යි.

ලොකෙක සරණ වූ සුමෙඩ තාපසයන් වහන්සේ වනාහි යනපත් වූ **මනුෂ්‍යත්වය ද පුරුෂබව ය ද** එ ම අත්බැමිනි රහත්වන තරම් **හේතුසම්පත් ඇති බව ද සවිඥයන් වහන් සේ ගේ දැක්ම ද පැවිදි වූ බව ද පඤ්චාභිඥා අෂ්ටසමාපත්ති ලාභී බව ද** බුදුන්ට දිවි පුද **අධිකාර ය** සම්පූර්ණ කළ බව ද බුඩකාරක ධර්මයන් කෙරෙහි මහත් **ආල ය** ඇති බව ද යන මේ අෂ්ට ධර්මයන් සමොධාන ව ම බුදු බවට **අභිනීහාර** කොට වැද නොන් සේක.

එසින් කිහ

සුමෙධ තාපසො පන ඉමෙ අට්ඨ ධම්මෙ සමොධානෙත්වා'ව බුද්ධ භාවාය අභිනීහාරං කත්වා නිපජ්ජි—යි.

ලොක සිවංකර වූ **දීපඞ්කර** නම් සම්බුදුරජොහනමයානන් වහන්සේ ද වැඩ සුමෙඩ තාපසයන් වහන්සේගේ ශිවිනාගයෙහි සඤ්ඤා ඝන ප්‍රභා රශ්මිත රුවන් මෙරක් සේ සවනක් ඝනරසින් දිලිහි දිලිහී වැඩ සිට කනකප්‍රාසාදයෙක ඉන්ද්‍රනීලමාණික්‍යමය සීහපඤ්ජරයක් විවෘත කරන්නාක් හු සෙසින් පඤ්චවණ්ණ ප්‍රසාද සම්පන්න නෙත්‍ර යුග්ම ය උන්මීලන ය කොට කළල් පිට වැද නොන් සුමෙධ තාපසයන් බලා වදාරා මේ උග්‍රතපස් ඇති තපස් වී තෙමේ බුඩබවයට අභිනීහාරකොට වැද හොන්නේ ය.

මොහුට ඒ ප්‍රාර්ථනාව සඵල වේ දෝ? නො වේ දෝ නෝසි? ප්‍රමානානික්‍රාන්ත කල්ප කොටි සතසහස්‍ර ය දක්නා අනාගත ඥාන ය මෙහෙයා බලන සේක් මෙසින් කල්ප ශතසහස්‍රයක් අධිකකොට ඇති කල්ප සාරාසංඛ්‍යයක් අතික්‍රාන්ත කොට

ගෞතම නම් බුදු වන්නේ ය යි දැක පෂිත් මධ්‍යයෙහි ම වැඩ සිට කැටුව වඩතා සාරලක්ෂණයක් සම්පන්නාශ්‍රව භික්ෂූන් වහන්සේ ට ආමන්ත්‍රණය කොට කුරවීක සකුණ රවානුසාර වූ මධුරසවරයෙන්-

පස්සථ ඉමං තාපසං ජටිලං උග්ගතාපනං,
අපරිමෙය්‍ය ඉතෝ කප්පෙ බුද්ධෝ ලොකෙ භවිස්සති.

අහූ කපිලවහයා රමමා නිකඛමිත්වා තථාගතෝ,
පධානං පදහිත්වාන කත්වා දුක්කරකාරියං.

අජපාල රුක්ඛමූලෙ නිසීදිත්වා තථාගතෝ,
තත්ථ පායාසමග්ඝයහ නෙරඤ්ජර මුපෙහිති.

නෙරඤ්ජරාය තීරෙ පායාසං ආදුය සෝ ජිනෝ,
පටියත්තවරමගෙහන බොධි මූලමහි එහිති.

නතෝ පදක්ඛිණං කත්වා බොධිමණ්ඩං අනුත්තරෝ,
අස්සත්ථ රුක්ඛමූලමහි බුජ්ඣිස්සති මහායසෝ.

ඉමස්ස ජනිකා මාතා මායා නාම භවිස්සති,
පිතා සුද්ධොදනෝ නාම අයං හෙස්සති ගොඝමෝ.

අනාසවා විතරාගා සන්ත චිත්තා සමාහිතා,
කොලිතෝ උපතිස්සෝ ච අග්ගා හෙස්සන්ති සාවිකා.

ආනන්දෝ නාම්පට්ඨාකෝ උපට්ඨිස්සති තං ජිනං
ඛෙමා උප්පලවණ්ණා ච අග්ගා හෙස්සන්ති සාවිකා,

අනාසවා විතරාගා සන්තචිත්තා සමාහිතා
බොධි තස්ස භගවතෝ අස්සත්ථොති පවුච්චති-සි.

බුද්ධවංශයෙහි වදාරණ ලද ක්‍රමයෙන් බුඩඹුයට විවරණ දෙවා වදාරණ සේක් - "මහණෙනි! පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති ලාභී හෙයින් උග්‍ර වූ තපස් තේජස් ඇති මේ සුමේධ තාපසයන් බලව්! මේ තෙමේ අවශෙෂ සත්වයෙක් නොවෙයි, මේ කල්පයට සාරා සඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි උත්තරි මනුෂ්‍ය ධර්මයෙන් අනුත්තර වූ මා සෙයින් ලොවුතුරා බුදු ව පඤ්චමහා ගඞ්ගාවෙහි ජලයෙනු ත් නො නිමිය හැකි වූ ත්‍රිවිධාගනී නිවා සත්වයන්ට අමා මහ නිවන් බෙදා දෙන සෙණෙක.

එසේ හෙයින් මෙ බඳු උදාරාධ්‍යාස ය ඇති සත්වොත්තමයෝ ලොකයෙහි දුර්ලභ වෙති. මුලු ලොව සනාථ කරන්නේ ත් මෙබඳු එක්කෙණෙක් ම ය. තමන් මතු සම්බුදුඤාණයට පැමිණෙන කාල

යෙහි අනෙක වාරයෙහි ගර්ජනා කොට විඛා වන්නා වූ මිහිකාන්තාව අද මේ වැලඳ ගෙණ සතුටු කරවන්නා සේ තෙල මඬ මත්තෙහි වැදහෙන්න් මහාපුරුෂයානෝ සකල වස්තුවෙන් විපුල වූ **කපිල** වස්තු නම් පුරයෙක ඉපිද සතලිස් දහසක් දෙවඟනන් බදු වර නෘත්ත විසින් පිරිවරණ ලදු ව ගෘහවාසයෙහි වැස එකොනතිංශත් සංවත්සර යෙහි ගෘහාභිනිෂ්ක්‍රමණ ය කොට සඳුණපරිපාක ය වන තුරු සහවුරුදිදක් දුෂ්කරක්‍රියා කොට, **අජපාල** න්‍යග්‍රොධ වෘක්ෂ මූලයෙහි දී සක්‍රපායාස ය පිළිගෙණ **නෙරඤ්ජරා** නම් නදිතීරයෙහි දී වලඳ දෙවියන් විසින් අලංකෘත කොට පිළියෙළ කරණ ලද මාගී යෙන් බෝමැඩට එලඹ ප්‍රදක්ෂිණා කොට නිරුත්තර වූ **අශ්වත්ථ** නම් බොධිවෘක්ෂ මූලයෙහි බුදුවන්නේ ය" යි

යනාදීන් දැන් මේ බුදු වූ කාලයෙහි වූ සියලු ප්‍රවෘත්ත් ය සිව් වණක් පිරිස් මැද ප්‍රකාශ කොට වදාරා ඉදිරි රාජ්‍යශ්‍රී පදප්‍රාප්ත වන රජ කුමරක් හට ප්‍රසාද දෙවා පිරිස් මැද සතුටු කරවන තර දෙව රජක්හු සේ ප්‍රශංසා කොට විවරණ දී දැසමත් මල් අටමිට කින් පුදා ප්‍රදක්ෂිණා කොට වැඩ කල්හි සාරලක්ෂයක් පමණ ක්ෂීණාශ්‍රව භික්ෂූන් වහන්සේ ගඳ මල් ආදියෙන් පුදා ප්‍රදක්ෂිණා කොට වැඩි සේක.

දස දහසක් සක්වළ දෙවියන් හා එ තැන්හි රැස් වූ මනුෂ්‍යයෝ ද ගඳ දුම් මල් වස්ත්‍රාභරණාදීන් පුදා බෝසතුන් වැඳ ප්‍රදක්ෂිණා කොට, සවාමීනි! යම් සේ පුරුෂයෙක් ඍජු තොවින් එතර වන්නට උත්සාහකොට වැරදුන හොත් යටි තොවින් එතර වේ ද, එ පරිද්දෙන් මේ **දීපඞ්කර** බුදුන්ගේ සස්නෙන් පිරිහුන හොත් ඔබ බුදුවන කාලයෙහි ඔබ කථා පැමිණ නිවන් අමා බුදිම්හ යි ප්‍රාර්ථනා කොට **දීපඞ්කර** බුදුන් සමඟ ගිය කල්හි මාගේ සවාමිදරු වූ **සුමේධ** තාපසයන් වහන්සේ වැදහොත් තැනින් තැනී පාරමී ධර්මයන් සොයමි යි දෙවි මිනිසුන් පිදූ මල්ගොඩ මතුයෙහි පලක් බැඳ වැඩඋන් සේක.

මේසේ බොධිසත්වයන් වහන්සේ වැඩඋන් කල්හි සකල දශසහශ්‍රී ලොක ධාතුයෙහි දිව්‍ය බ්‍රහ්මාදීහු රැස් ව බොධිසත්වයන් වහන්සේට මෙසේ සතුති කොට කීහු-

කෙසේ ද යත්?

යං පුබ්බෙ බොධිසත්තානං පල්ලඞ්කවර මා භුජේ,
නිමිත්තානි පදිස්සන්ති තානි අජ්ජ පදිස්සරෙ-සි.

යනු හෙයින් සුමේධ තාපසයන් වහන්ස! පාරමිතාවන් සොයන පිණිස පලක් බැඳ වැඩවුහ් පූර්ව බොධිසත්ව වරයන්ට සිදු වන යම් පූර්ව නිමිති කෙණෙක් ඇද් ද, ඒ සියල්ල ම අද දක්නා ලැබෙනි-ඔහු කවුරු ද යත්?

සීතං ව්‍යපගතං හොති උණ්හඤ්ච උපසම්මති,
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි-සි.

යනු හෙයින් පෙර බෝසතුන්ගේ පාරමිතා සෙවීමෙහි අධික වූ ශීත ව්‍යපගත වෙයි. අධික වූ උෂ්ණ උපශම වෙයි ඒ සියල්ල ද අද ත් විද්‍යමාන වි ය. එසේ හෙයින් ඒකාන්තයෙන් බුදුවන සේක් ම ය. තව ද—

දසසහස්සී ලොකධාතු නිස්සද්දා හොන්ති නිරාකුලා,
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි-සි.

යනු හෙයින් දසසහශ්‍රී ලොකධාතු ව නිශ්ශබ්ද වෙයි. නිරාකුල වෙයි. අද ද සියලු ලොකධාතු ව නිශ්ශබ්ද වි ය. නිරාකුල වි ය. එසේ හෙයිනු ත් ඒකාන්තයෙන් බුදුවන සේක් ම ය. තව ද—

මහාවාතා න වායන්ති න සන්දන්ති සවන්තියො,
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුද්ධො භවිස්සසි-සි.

යනු හෙයින් සඛයනට අමතොඤ්ඤ වූ මහත් වාත නොහම් සි. ගඞ්ගා නෝ ඇල කඳුරැලි ආදීහු සන්දනය නො කෙරෙති. ඒ සියල්ල ම අද ත් විද්‍යමාන වූහ. එසේ හෙයිනු ත් ඒකාන්තයෙන් ම බුදුවන සේක් ම ය. තව ද-

ඵලජා ච කජා පුප්ඵා සබ්බ පුප්ඵන්ති තාවතෙ,
තෙ'පජ්ජ පුපඵිතා සබ්බෙ ධුවං බුද්ධො භවිස්සසි-සි.

යනු හෙයින් ගොඩෙහි දියෙහි හටගෙණ පිපෙන්නා වූ සියලු පුෂ්ප ජාතීහු එකල්හි පිපෙති.. ඒ සියල්ල ම අද ත් එසේ ම වි ය. එසේ හෙයිනු ත් බුදුවන සේක් ම ය. තව ද—

ලතා වා යදි වා රුක්ඛා ඵලභාරා හොන්ති තාවදෙ,
තෙ'පජ්ජ ඵලිතා සබ්බෙ ධුවං බුද්ධො භවිස්සසි-සි.

යනු හෙයින් එකල්හි සියලු ලතා වෘක්ෂයෝ ඵලයෙන් භරිත වෙති. අද ද ඒ සියල්ල ම ඵලයෙන් භරිත වූවාහු ය. ඒ කාරණ හෙනු ත් බුදුවන සේක් ම ය. තව ද—

ආකාසට්ඨා ව භූමට්ඨා රතනා ජොතනන්ති තාවදෙ.
තෙ'පජ්ජ රතනා ජොතනන්ති ධ්‍රුවං බුඩ්ඩො භවිස්සසි-යි.

යනු හෙයින් එසමයෙහි ආකාශස්ථ වූ ද භූම්‍යස්ථ වූ ද සියලු රත්නයෝ විශෙෂයෙන් දිලිහුනාහු ය. අද ද සියලු දසදහසක් සක්වළ ආකාශ භූමිගත සියලු රත්නයෝ දිලිහී ගියාහු ය. ඒ කාරණයෙනු ත් බුදුවන සේක් ම ය. තව ද—

මානුසිකා ච දිබ්බා ව තූරියා වජ්ජනන්ති තාවදෙ,
තෙ'පජ්ජුභො අභිරවන්ති ධ්‍රුවං බුඩ්ඩො භවිස්සසි-යි.

යනු හෙයින් මානුෂික වූ ද දිව්‍ය වූ ද උභය තූර්‍යයෝ කිසි වක්හු විසින් අවාදිත ව වාද්‍ය වූවාහු ය. අද ද ඒ උභය තූර්‍යයෝ අභිරවණ ය කළාහු ය. ඒ කාරණයෙනු ත් බුදුවන සේක් ම ය. තව ද—

චිත්තනප්පපථා ගගනා අභිවස්සන්ති තාවදෙ,
තෙ'පි අජ්ජ පවස්සන්ති ධ්‍රුවං බුඩ්ඩො භවිස්සසි-යි.

යනු හෙයින් පෙර බෝසතුන් පාරමිතා සම්මර්ශන ය කරමි යි වැඩඋන් සමයෙහි ආකාශයෙන් විචිත්‍ර පුෂ්පයෝ අභිවර්ෂණ ය කළාහු ය. අද ද එසෙයින් විසිතුරු මල් වර්ෂාව වට. එසේ හෙයිනු ත් බුදුවන සේක් ම ය. තව ද—

මහාසමුද්දෙ, ආභුජන්ති දසසහස්සී පකම්පති,
තෙ'පජ්ජුභො අභිරවන්ති ධ්‍රුවං බුඩ්ඩො භවිස්සසි-යි.

යනු හෙයින් මහා සමුද්‍රය. ආභුඤ්ජන ය වෙයි. දශ සහශ්‍රී ලොක ධාතුව ප්‍රකම්පිත වෙ යි. තදුභයෝ ම අද ත් එසේ වූවාහු ය. ඒ කාරණයෙනු ත් මතු බුදුවන සේක් ම ය. තව ද—

නිරයෙ'පි දසසහස්සී අභිනිබ්බත්තන්ති තාවදෙ,
තෙ'පජ්ජ නිබ්බුතා අග්ගි ධ්‍රුවං බුඩ්ඩො භවිස්සසි-යි.

යනු හෙයින් පෙර මෙසේ වූ කාලයෙහි දස දහසක් සක්වළ සියලු නරකවල ගිනි නිවී ගියේ ය. අද ද එසෙයින් ම සකල නරකයෙහි ගිනි නිවී ගියේ ය. ඒ කාරණයෙනු ත් ඒකාන්තයෙන් ම බුදුවන සේක් ම ය. තව ද—

විමලො හොති සුරියො සබ්බෙ දිස්සන්ති තාරකා,
තෙ'පි අජ්ජ පදිස්සන්ති ධ්‍රුවං බුඩ්ඩො භවිස්සසි-යි.

යනු හෙයින් සූර්‍ය්‍ය දිව්‍යරාජ තෙමේ අභිශයින් අභ්‍ර මහිකා ධූම රජෝ රාහු ය යන පඤ්චොප ක්ලෙශයන් කෙරෙන් විනිර්

මුඛය ව නිර්මල ව බබලන්නේ ය. සියලු තාරකාවෝ ද දක්නා ලැබෙති. ඒ සියල්ල ම අද ත් එසෙයින් ම වි ය. මේ කාරණ යෙනු ත් බුදුවීම ඒකාන්ත ම ය. තව ද—

අනොවට්ටෙන උදකා මහියා උබ්භිජ්ජි තාවදෙ,
තං'පජ්ජුබ්භිජ්ජතෙ මහියා ධුවං බුඩ්ඩො භවිස්සසි-සි.

යනු හෙයින් වැසි නො වැස පෘථිවියෙහි ජලධාරාවෝ නික්මෙති. අද ත් එ සෙයින් ම පෘථිවියෙහි උදකොත්ගත වි ය. මේ කාරණයෙනු ත් බුදුවීම නියත ම ය. තව ද—

තාරාගණා විරොචන්ති නක්ඛත්තං ගගන මණ්ඩලෙ,
විසාඛා චන්දිමා යුත්තා ධුවං බුඩ්ඩො භවිස්සසි-සි.

යනු හෙයින් තාරාගණාදීන් එ සමයෙහි බැබලීම් ආදි යක් ඇද්ද ඒ සියල්ල ම අද ත් එ සෙයින් ම වි ය. ඒ කාරණ යෙනු ත් නි බොරුව බුදුවන සේක් මි ය. තව ද—

බිලාසයා දරිසයා නික්ඛමන්ති සකාසයා,
තෙ'පජ්ජ ආසයාවිප්පුඩා ධුවං බුඩ්ඩො භවිස්සසි-සි.

යනු හෙයින් පෙර මෙබඳු කාලයෙහි බිලාස ය දරිස ය යන සත්වයෝ සක සකස්ථානයෙන් නික්මෙති. අද ත් එ සෙයින් ම එකපැහැර නික්මුනාහ. ඒ කාරණයෙනු ත් බුදුවන සේක් ම ය. තව ද—

න හොන්ති අරනි සත්තානං සන්තුට්ඨා හොන්ති තාවදෙ,
තෙ'පජ්ජ සබ්බෙ සන්තුට්ඨා ධුවං බුඩ්ඩො භවිස්සසි-සි.

යනු හෙයින් පෙර මෙබඳු කාලයෙහි සත්වයන්ගේ අරනි දුරු වෙයි. අභිසිත්තගාත්‍ර ඇතියවුන් සේ සතුටු වෙති. දැනු ත් එ සෙයින් ම වි ය. මේ කාරණයෙනු ත් බුදුවන සේක් ම ය තව ද-

රොගා තදුපසම්මන්ති ජිඝච්ඡා ව විනස්සති,
තානි අජ්ජ පදිස්සන්ති ධුවං බුඩ්ඩො භවිස්සසි-සි.

යනු හෙයින් පෙර බෝසත්හු පාරමිතා සම්මර්ශන ය කරම් හ සි මෙසේ ම උන් කල්හි යන්වයන්ගේ රාගව්‍යුපශමන ය වෙති. ජිඝච්ඡා සඞ්ඛ්‍යාත ක්ෂුධාරොගය ද විනාශ වෙයි. අද ත් එ සෙයින් ම වි ය. මේ කාරණයෙනු ත් බුදුවන සේක් ම ය. තව ද—

රාගො තදා තනු හොති දෙසො මොහොපි තස්සති,
තෙ'පජ්ජ විගතා සබ්බෙ ධුවං බුඩ්ඩො භවිස්සසි-සි

යනු හෙයින් සත්වයන්ගේ රාගය තුනී වෙයි. වෙෂ ය ද මොහය ද එසෙයින් ම තුනී. අද ත් එ සෙයින් ම වි ය. මේ කාරණයෙනු ත් බුදුවීම නියත ම ය. තව ද—

භයං තදූ න භවති අජේජපෙතං පදිස්සති,
තෙන ලිඞ්ගෙන ජානාම ධ්‍රුවං බුඩ්ඪා භවිස්සසි-යි.

යනු හෙයින් පෙර ත් මේසේ ම මහ බෝසත්හු පාරමිතා සම්මර්ශනයට උන් කල්හි ගුරුළුන්ට ගොදුර වූ නාගයෝ ගුරුළුන් කෙරෙහි භය නැති ව ඔවුනොවුන් පිල්කර ආදි ය ගෙණ කෙළිති. නාගයන්ට ගොදුරු වූ මැඩියෝ ඔවුන් පෙණ ගැස් ආදිය ගෙණ කෙළිති. බළලුන්ට ගොදුරු වූ මූෂිකයෝ ඔවුන් දරුවන් සේ ලහ කෙළිති. දිවියන්ට ගොදුරු වූ මෘගපෝතකයෝ ඔවුන් දරුවන් තන බැ අදිති. මේ ආදී ක්‍රියෙන් සමී හය සන්සිදෙයි. අද ත් එ සෙයින් ම දක්නා ලැබෙයි. මේ කාරණයෙනු ත් ඒකාන්ත යෙන් ම බුදුවන සේක් ම ය යි දනුම්හ. තව ද—

අනිට්ඨගන්ධෝ පකාමති දිබ්බගන්ධෝ පවායති,
සෝ' පජ්ජ වායති ගන්ධෝ ධ්‍රුවං බුඩ්ඪා භවිස්සසි—යි.

යනු හෙයින් මෙ බඳු වූ පූජාකාලයෙහි අනිෂ්ට ගන්ධ සංඛ්‍යාත දුර්ගන්ධ ය නසා සකලජන මනොඥ වූ දිව්‍ය සුරභි සුගන්ධි හම් යි. අදත් එසෙයින් ම වි ය. මේ කාරණයෙනු ත් බුදුවීම නියත කොට දනුම්හ. තව ද-

සබ්බෙ දෙවා පදිස්සන්ති ඨපයිත්වා අරූපිනෝ,
තෙ'පජ්ජ සබ්බෙ දිස්සන්ති ධ්‍රුවං බුඩ්ඪා භවිස්සසි-යි.

යනු හෙයින් අරූපාවචර දෙවියන් හැර දශදහස්‍රී ලොකධාතුවෙහි දෙවියෝ මෙ බඳු කාලයෙහි දක්නා ලැබෙති. දනු දු එ සෙයින් ම වි ය. මේ කාරණයෙනු ත් බුදුවීම නියත කොට දනුම්හ. තව ද-

යාවතා නිරයා නාම සබ්බෙ දිස්සන්ති තාවදෙ,
තෙ පජ්ජ සබ්බෙ දිස්සන්ති ධ්‍රුවං බුඩ්ඪා භවිස්සසි-යි.

යනු හෙයින් යම් පමණ නරකයෝ ඇද්ද ඒ සියලු නරකයෝ පෙර මෙ බඳු කාලයෙහි දක්නා ලැබෙති. අද ත් එසෙයින් ම වි ය. මේ කාරණයෙනු ත් ඒකාන්තයෙන් ම බුදුවන සේක් ම ය. තව ද-

කුඩ්ඩා කවාටා සෙලා ච න හොන්ත්‍යාවරණං තදා,
ආකාසභූතා තෙ පජ්ජ ධ්‍රුවං බුද්ධෝ භවිස්සසි-සි.

යනු හෙයින් හිතුනි ප්‍රකාර පරිච්ඡේදයෙන් කිසිවක් හු මූවහා නොවී මේ බදු කාලයෙහි දෙර සිටි සත්වයෝ දෙර වසා තුබූ ගෙයි සිටියන් දකිති. ගෙයි සිටි සත්වයෝ දෙර සිටියන් දකිති. ප්‍රාකාරයෙන් ඇතුළත පිටත සිටි සත්වයෝ ද එසේ ම ඔවුනොවුන් දකිති කුදු මහත් පරිච්ඡේද වලින් එපිට මෙ ටපි සිටි සත්වයෝ ද එ සෙයින් ම ඔවුනොවුන් දකිති.

ගමින් ගම රටින් රට දිවයිනින් දිවයින සක්වළින් සක්වළ ඒ ඒ තැන සිටි සත්වයෝ ද ඔවුනොවුන් දක්නා හු ඉදිරිපිට සිටියවුන් සේ කිසිවකින් ආවරණයක් නැති ව සැප සේ දකිති. අද ත් දසසහස්‍රී ලෝකධාතුව හැම තන්හි ම ආකාශභූත ව එකෙලි ව පෙණෙයි මේ කාරණයෙනු ත් ඒකාන්තයෙන් ම බුදුවන සේක් ම ය. අපි ව—

චුති ච උපපත්ති ච ඛණෙ තසම්ං න විජ්ජති,
තානි අජ්ජ පදිස්සන්ති ධ්‍රුවං බුද්ධෝ භවිස්සසි-ඝි.

යනු හෙමින් පූර්වයෙහි බොධිසත්වයෝ පාරමිතා සම්මශී නය කරම්හ යි සිතා වැඩ උත් කල්හි චුතී උත්පත්ති නැති අභය පුරයට සත්වයන් පැමිණවීමට පූර්වනිමිති දක්වන්නා සේ එකෙණෙහි දසසහස්‍රී ලොකධාතුයෙහි උපදනා සත්වයකුදු නසිනා සත්වයකුදු නැත

අද ත් ඔබ වහන්සේගේ පාරමිතා සම්මශීනයෙහි උපදින සත්ත්වයෙක් හෝ නස්නා සත්වයෙක් හෝ නැත. මේ කාරණයෙනු ත් ඒකාන්තයෙන්ම මතු බුදුවන සේක් ය යි මෙසේ තමන් දුටු පූර්ව නිමිති ප්‍රකාශ කොට දක්වා නැවත.–

දළහා පගහණහ විරියං මා නිවත්ත අභික්කම,
මයං පෙතං විජානාම ධ්‍රුවං බුද්ධෝ භවිස්සසි සි.

යනු හෙයින් මෛත්‍රී ක්ෂමොපශමාදී සකල ගුණ ගණාඩ්‍ය යෙන් යුක්තා වූ සුමේධ තාපසයන් වහන්ස! ඔබ වහන්සේ මතු බුදු වන පරිදි අප හැම දෙවියෝ ම ඒකාන්තයෙන් දනුම්හ. එසේ හෙයින් තොප සුබැසි වියදී දැනි කොට වදාළ මැනවැ යි යනාදීන් අනෙක ප්‍රකාරයෙන් මඟුල්‍ය වචනයන් කියා සතුටු කරවා දසදහසක් යක්වළ දෙවියන් කළ සතුති ද සාධුකාරයන් වහන්සේ විසින් වදාළ වචනය ද අසා සතුටු වූ සුමේධ තාපස යන් වහන්සේ මෙසේ සිතූ සේක. කෙසේ ද යත්?

සම්බුදුවරයෝ නම් නොසිස් තෙපුල් ඇති සේක් ලා ය සම්බුදුවරයන් ගේ කථාවෙහි අන්‍යථාත්වයක් නැත. යම් සේ ආකාශයෙහි දැමූ කැටක් භූමියෙහි ම ප්‍රපතිත වේ ද, උපන් සත්වයාගේ මරණ නියත වේ ද, අරුණු නැගුනු කල්හි සූර්‍යයාගේ උදාත වීම් නියත වේ ද, සයනයෙන් නික්මුනු සිංහයාගේ සිංහනාද කිරීම නියත ද, ගරුගර්භිණී ස්ත්‍රියගේ භාරමොචන ය නියත ද, එ පරිද්දෙන් ම සම්බුදුවරයන්ගේ වචනයන් නි බොරු ම ය. එසේ හෙයින් මම බුදුවෙමි. නියත කොට සිතූ සේක.

මෙම කිහ - දුරෙනිදානයෙහි

බොධිසත්තෝ දීපඞ්කර දසබලස්ස ච දසසහස්ස චක්කවාළ දෙවතානඤ්ච වචනං සුත්වා භව්‍යෝසොමත්තාය සඤ්ඤාතුස්සාහෝ හුත්වා විනෙතබ්බා නාම අමොඝවචනා. නත්ථි බුද්ධානං කථාය අඤ්ඤථත්තං. යථා හි ආකාසෙ ඛිත්තලෙඩ්ඩුස්ස පතනං ජාතස්ස මරණං අරුණෙ උග්ගතෙ සූරියස්සුට්ඨානං ආසාය නික්ඛන්ත සීහස්ස සීහනාදං නදනං ගරුගබ්භාය ඉත්ථියා භාරමොචනං ධ්‍රුවං අවස්ස භාවි. එවමෙවං බුද්ධානං වචනං නාම ධ්‍රුවං අමොඝං. අඩා අහං බුද්ධෝ භවිස්සාමි-සි.

මෙසේ යහපත "මම ඒකාන්තයෙන් ම බුදුවෙමි" සි කරණ ලද සනිටුහන් ඇති සුමේධ බොධිසත්ව තෙම බුඩකාරක ධම්මයන් සොයන සේක් උත්තරාධඃ ප්‍රාචීන දක්ඛිණ පශ්චිමා දී දශ දිශාවෙන් කවර දිශාවෙක වත්‍රාහි බුඩකාරක ධම්මෝ වෙසෙද්දෝ හෝ සි? අනෙක ප්‍රකාරයෙන් බලන සේක් කිසි දිසාවෙක ත් නොදක තමන් වහන්සේගේ චින්තසන්තාන ය බලා පූර්‍ව බොධිසත්වයන් විසින් ආසෙවිත නිසෙවිත වූ කරුණාව හා උපාය ප්‍රඥාවෙන් පිරි සිද ගත්තා ලද ආත්මොපකරණ පරිත්‍යාග චෙතනාව දාන පාරමිතාව නම් වෙයි. කියන ලද වස්තු පරිත්‍යාග ය ලක්ෂණ කොට ඇත්තා වූ - දෙය්‍යධම්මයෙහි ලොභය නැසීම කෘත්‍ය ය කොට ඇත්තා වූ-

තමා අයත් බව නැති කිරීම හා භවසම්පත්ති ය නුවණට වැටහීම් කොට ඇත්තා වූ - පරිත්‍යාග කටයුතු වස්තුව ආසන්න කාරණා කොට ඇත්තා වූ-**පළමුවැනි දානපාරමිතාව** දක සුමේධ පණ්ඩිතයෙනි! මෙතැන් පටන් දානපාරමිතාව පුරන්නා වූ තොප විසින් යම් සේ යවිකුරුකොට නඹන ලද උදක කුම්භයෙහි මද කුත් ජලය ඉතිරි නොව වහනය වේ ද, එපරිද්දෙන් ම තොප

සන්තක ධනයන් හෝ තොපගේ පුත්‍ර දුරුදීන් හෝ අඞ්ගප්‍රත්‍ය ඔහ ය හෝ රාජ්‍ය සම්පත් ආදියක් හෝ ඇද් ද, ඒ සියල්ලෙහි ම මදකුත් ලොභයක් නොකොට සියලු යාචකයන්ට අභිප්‍රායානුකූල වූ පරිද්දෙන් දන්දෙමින් දානපාරමිතාව පූරා කෘතප්‍රණිධි සම්භාර ඇති ව බොධිද්‍රැමමූලයෙහි හිඳ බුඩත්වයට පැමිණෙව සි කියා මේසේ පූර්ව දානපාරමිතාව අධොමුඛීකෘත උදකුම්භොපමායෙන් මාරශතසහස්‍ර යන් විසිනු දු නො වැලකිය හැකි පරිද්දෙන් අධිෂ්ඨාන කළ සේක.

එසින් කිහ—දූරෙනිදානයෙහි.

සො ධුවාහං බුඩො භවිස්සාමී'ති එවං කත සන්නිට්ඨානො බුඩකාරක ධම්මෙ උපධාරෙතුං– කතනු ඛො බුඩකාරකධම්මා කිං උඩ? උදහු අධො දිසාසු විදිසාසූ'ති? අනුක්‍රමෙන සකල ධම්ම ධාතුං විවිණනෙතා පොරාණක බොධිසතෙහි ආසෙවිත නිසෙවිතං පඨමං දානපාරමිං දිසවා එවං අත්තානං ඔවදි. සුමෙධපණ්ඩිත! එවං ඉතො පට්ඨාය පඨමං දානපාරමිං පූරෙහිසි,

යථා හි නිකඛුජ්ජිතො උදකුම්භො නිසෙසසං කත්වා උදකං වමති යෙව න පච්චාහරති. එවමෙවං ධනං වා යසං වා පුත්තදාරං වා අඞ්ගපච්චඞ්ගං වා අනොලොකෙත්වා සම්පත්තයාචකානං සබ්බං ඉච්ඡිතිච්ඡිතං නිසෙසසං කත්වා දදමානො බොධිරුක්ඛමූලෙ නිසීදිත්වා බුඩො භවිස්සසී'ති පඨමං දානපාරමිං දළහං කත්වා අධිට්ඨාසි.

මෙ ම කිහ—මහාබොධිවංශයෙහි න්

බුඩකාරකධම්මෙ විවිණනෙතා දසසු දිසාසු අදිසවා අත්තසන්තානං ඔලොකෙනෙතා සබ්බ බොධිසත්තෙහි ආසෙවිත නිසෙවිතං පඨමං දානපාරමිං දිසවා අත්තානං ඔවදනෙතා සුමෙධපණ්ඩිත! එවං ඉතො පට්ඨාය නිකඛුජ්ජිත සලිලකුම්භො විය නිරවසෙසං කත්වා පිතිවිකසිතමුඛො කරුණාප්‍රවණසරං දානං දදනෙතා දාන පාරමිං පූරෙය්‍ය'සීති දළහං මනසි පතිට්ඨාපෙත්වා වජිරගිරිමිව මාරුතෙන මාරසතෙනාපි අකම්පනීයං කත්වා අධිට්ඨාය.

බුදුන් විසිනු දු වදුළේ මැ නෝ–බුඩවංශ දෙශනාවෙහි

හන්ද බුඩකරෙ ධම්මෙ විවිණාමි ඉතො චිතො,
උඩං අධො දස දිසා යාවතා ධම්ම ධාතුයා.

විවිණන්තෝ තදද්දක්ඛිං පඨමං දානං පාරමිං,
පුබ්බකෙහි මහෙසීහි අනුවිණ්ණං මහාපථං

ඉමං තුවං පඨමං තාව දළ්හං කත්වා සමාදිය,
දානපාරමිතං ගච්ඡ යදි බොධිං පත්ථයිච්ඡසි

යථාපි කුම්භෝ සම්පුණ්ණෝ යස්ස කස්සචි අධොකතෝ
වමිතෙ උදකං නිස්සෙසං න තත්ථ පරිරක්ඛතී.

තථෙව යාවකෙ දිස්වා භීතමුක්කධාරාමපජ්ජිමේ,
දයුහි දානං නිස්සෙසං කුම්භෝ විය අධොකතෝ—යි

ඉක්බිත්තෙන් මේ පමණ බුඩකාරක ධර්මකෙනෙකුත්ථෙන් ම බුඩත්වයට පැමිණිය යුතු නොවෙයි සිතා මත්තෙහි දු බුඩකාරක ධර්මයන් බලන සේක් කරුණාව හා කරුණාප්‍රඥාවෙන් පිරිසිදු ගත්තා ලද කාය වාක් සුචරිත ය ද කාරණාවෙසින් අකර්තව්‍යයෙන් වැලකීම හා කර්තව්‍යයන් කරන්නා වූ චෙතනා වූ ශීලපාරමිතාව ය යි කියන ලද ප්‍රතිඥාව ලක්ෂණ කොට ඇත්තා වූ-දුශ්ශීල බව නැසීම කෘත්‍ය ය කොට ඇත්තා වූ-ශුචි බව ප්‍රත්‍යවණට වැට හිමි කොට ඇත්තා වූ-හිරි ඔතප් දෙක කෙළවර කොට ඇත්තා වූ-

දෙවෙනි ශීලපාරමිතාව දැක තමන්ට තමන් අවවාද වශයෙන් සුමේධ පණ්ඩිතයෙනි! "මේ තැන් පටන් ශීලපාරමිතාව පූරණ ය කරව, පුරන්නේ ද යම් සේ චමරි මෘග තෙමේ ජීවිතය ත් නො බලා තමන් ගේ වාලධිය ම රක්ෂා කෙරේ ද එ පරිද්දෙන් ම නෙපි ත් මෙතැන් පටන් ජීවිතය ත් අපෙක්ෂා නො කොට ශීලය ම රක්ෂාකරන්නේ බුඩත්වයට පැමිණෙව"යි මෙසේ දෙවෙනි ශීල පාරමිතාව චමරිමෘගවාලොපමායෙන් අධිෂ්ඨාන කළ සේක.

එයින් කිහ දුවේනිදානයෙහි

අථස්ස න එත්තකෙනෙව බුද්ධකාරක ධර්මෙහි හවිතබ්බනති. උත්තරිම්පි උපධාරයෙන්තෝ දුතියං සීලපාරමිං දිස්වා එතදහොසි: සුමේධ පණ්ඩිත! ත්වං ඉතෝ පාභාය සීලපාරමිං පූරයිස්සසි. යථාපි චමරිමිගෝ නාම ජීවිතම්පි අනොලොකෙත්වා අත්තනෝ වාලමේව රක්ඛති. එවං ත්වම්පි ඉතොපට්ඨාය ජීවිතම්පි අනොලොකෙත්වා සීලමෙව රක්ඛන්තෝ බුද්ධෝ භවිස්සසී'ති දුතියං සීලපාරමිං දළ්හං කත්වා අධිට්ඨාති.

කිහු මැයි- මහාබොධිවංසයෙහි ත්

ත එත්තකෙනෙව සක්කා සම්මාසම්බොධිං පාපුණිතුන්ති ආවජ්ජන්නෙතා දුතියං සීලපාරමිං දිසවා තම්පි වම්රි විය වාළ පාලිකා සීලපාරමිං පූරෙය්‍යාසී'ති අදිවච්චාය.

බුද්ධවංශයෙහි ද වදුලේ මෙ නෝ

නහෙතෙ එත්තකා යෙව බුද්ධධම්මා භවිස්සරෙ
අඤ්ඤේපි විවිණිස්සාමි යෙ ධම්මා බොධිපාවිතා.

විවිණන්නෙතා තදදක්ඛිං දුතියං සීලපාරමිං,
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං.

ඉමං ඛවං දුතියං තාව දළහං කත්වා සමාදිය,
සීලපාරමිතං ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

යථාපි වම්රි වාළං කිසම්ඤ්ඤි පතිට්ඨිලඟිතං,
උපෙති මරණං තත්ථ න විකොපෙති වාළධිං.

තථෙව චතූසු භූම්සු සීලානි පරිපූරය,
පරිරක්ඛ සබ්බදා සීලං වම්රි විය වාලධිං—යි.

ඊට ඉක්බිති ව මේ දැන සීල පාරමිතා දෙකින් ම බුද්ධත්වයට පැමිණිය යුතු නො වෙයි සිතා මත්තෙහි දු උපධාරණ ය කරණ සේක් කරුණාව හා කරුණා ප්‍රඥාවෙන් පිරිසිදගන්නා ලද ආදීනව දැක්ම පුථුඛගමකොට ඇති කාමභවයෙන් නික්මෙන්නා වූ චිත්ත ය නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව ය යි කියන ලද කාමයෙන් හා භවයෙන් නික්මීම ස්වභාවකොට ඇත්තා වූ කාමාදියෙහි ආදීනව ප්‍රකාශකිරීම කෘත්‍යකොට ඇත්තා වූ ඒ කාමාදියෙන් පරාංමුඛ ව නිස්මෙන බවක් මෙන් වැටහීම් කොට ඇත්තා වූ—

විතෙනාත්‍රාස ය හා ශරීරකම්පාව ආසන්න කාරණා කොට ඇත්තා වූ **තුන්වැනි** වූ **නෛෂ්ක්‍රම්‍යපාරමිතාව** දැක සුමෙධ පණ්ඩිතයෙනි! තෙපි මෙ තැන් පටන් නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පූරණ ය කරව, පුරන්නේ ද යම් සේ බන්ධනාගාරයෙහි වසන්නා වූ පුරුෂ තෙමේ චිරකාලයක් එහි විසූ ව ද සෙනඟයක් නො කෙළේ උත්කණ්ඨිත ව එහි නො වසා මුක්ත වීමක් ම කැමති වේ ද එ පරිද්දෙන් ම තෙපි ද සළිනව ය බන්ධනාගාරයක් මෙන් සිතා

සම්භවයෙහි කලකිරී මිදෙනු කැමැති ව නෛෂ්ක්‍රම්‍යාභිමුඛ ව බුද්ධත්වයට පැමිණේවා යි මෙසේ තුන්වැනි නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව බන්ධනාගාරොපමායෙන් අධිෂ්ඨාන කළ සේක.

හෙ ද කිහ-දූරෙනිදානයෙහි

අථස්ස ත එතකෙනෙව බුද්ධකාරක ධම්මෙහි හවිතබ්බන්ති එත්තරිමපි උපධාරයන්තෝ තතියං නෙක්ඛම්මපාරමිං දිස්වා එතද හොසි: සුමේධපණ්ඩිත! ත්වං ඉතෝ පට්ඨාය නෙක්ඛම්මපාරමිං පූරෙය්‍යාසි. යථාහි විරම්පි බන්ධනාගාරෙ වසමානෝ පුරිසෝ න තත්ථ සිනෙහං කරොති. අථ ඛෝ උක්කණ්ඨිතෝ යෙව අවසිතු කාමෝ හොති.

එවමෙව ත්වං සබ්බභවෙ බන්ධනාගාර සදිසෙ කත්වා සබ්බ භවෙසු උක්කණ්ඨිතෝ මුඤ්චිතුකාමෝ හුත්වා නෙක්ඛම්මාභි මුඛොව හොහි. එවං බුද්ධෝ භවිස්සසීති තතියා නෙක්ඛම්ම පාරමිං දළ්හං කත්වා අධිට්ඨාසි.

කි හු මෑ යි-මහාබොධිවංශයෙහි ත්

තතෝ තතියං නෙක්ඛම්ම පාරමිං දිස්වා අනවරත අරති බහුල බන්ධනාගාරෙ විය සබ්බභවෙ අනභිරමිත්වා නෙක්ඛම්මාභි මුඛෝ හොහි'ති අධිට්ඨාය.

බුදුන් වියිනු දු වදාළේ මෑ නෝ

විවිණන්තෝ තදද්දක්ඛිං තතියං නෙක්ඛම්ම පාරමිං,
පුබ්බකෙහි මනෙසීහි ආසෙවිත නිසෙවිතං.

ඉමං ත්වා තතියං තාව දළ්හං කත්වා සමාදිය,
නෙක්ඛම්ම පාරමිං ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

යථා අඤ්ඤරෙ පුරිසෝ විරුත්තෝ දුබ්භදිතෝ,
න තත්ථ රාගං අභිජනෙති මුත්තිං යෙව ගවෙසති.

තථෙව ත්වා සබ්බභවෙ පස්ස අඤ්ඤරෙ විය,
නෙක්ඛම්මාභිමුඛෝ හොහි භවතෝ පරිමුත්තියා—යි.

ඉක්බිත්තෙන් මේ පාරමිතා තුණින් ම බුද්ධත්වයට පැමිණිය යුතු නොවෙයි සිතා, මත්තෙහි දු බුබකාරක ධර්මයන් සොයන සේක් කරුණාව හා කරුණා ප්‍රඥාවෙන් පිරිසිඳ ගත්තා වූ ධර්මයන් ගේ සාමාන්‍යාවබොධ ය හා විශෙෂාවබොධ ය ප්‍රඥ

පාරමිතාව ය යි කියන ලද දෂ්ණ වූ දුනුවායක්හු විසින් විදිනා ලද ශරවෙගයක් මෙන් යථා සබනාව ප්‍රතිවෙධ ය හා අස්ඛලිත ප්‍රතිවෙධ ය ලක්ෂණ කොට ඇත්තා වූ—ප්‍රදීපයක් මෙන් අරමුණු බැබලීම කෘත්‍යය කොට ඇත්තා වූ අරණ්‍යගත සවදෙසිකයක් හු මෙන් නො මුළා වීම වැටහීම් කොට ඇත්තා වූ—

සමාධි ය හා චතුරාර්‍යසත්‍ය ය ආසන්න කාරණ කොට ඇත්තා වූ **සතරවැනි ප්‍රඥාපාරමිතාව** දැක සුමේධ පණ්ඩිතයෙනි! මේ තැන් පටන් ප්‍රඥාපාරමිතාව පූරණය කරව, පුරන්නේ ද හීන මධ්‍යමොත්කෘෂ්ට සංඛ්‍යාත ත්‍රිවිධ කුලයන් නො තෝරා ගෙපිළි වෙළින් පිඬු සිහන භික්ෂු කෙණෙකුන් සේ තමන්ට ධනකුල ආදි යෙන් උත්තම වූ ද මධ්‍යම වූ ද අධම වූ ද ප්‍රඥවන්තයන් නො තෝරා ඔවුන් කරා එළඹ කුසලාකුසලාදී පිළිවෙත් විචාරීම් වශ යෙන් ප්‍රඥාපාරමිතාව පූරණය කරව. මේ සේ පිණ්ඩගවෙසික භික්ෂූපමායෙන් සතරවැනි ප්‍රඥාපාරමිතාව අධිෂ්ඨාන කළසේක.

මෙ ම කීම-දූරෙනිදානයෙහි

අථස්ස න එත්තාවතෙනෙව බුද්ධකාරක ධම්මෙහි භවිතබ්බන්ති එත්තාරිමපි උපධාරයන්තො චතුන්නං පාරමීනං දිසවා එතද හොසි සුමේධ පණ්ඩිත! ත්වං ඉතෝ පට්ඨාය පාරමියෝ පූරෙය්‍යාසි. හීන මජ්ඣිමුක්කට්ඨෙසු කිඤ්චි අවජෙත්වා සබ්බපි පණ්ඩිතෙ උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡය්‍යාසි.

යථා හි පිණ්ඩචාරිකෝ භික්ඛු හීනාදිභෙදෙසු කුලෙසු කිඤ්චි අවජෙත්වා පටිපාටියා පිණ්ඩාය චරන්තො ඛිප්පං යාපනං ලභති. එවං ත්වම්පි සබ්බපණ්ඩිතෙ උපසඞ්කමිත්වා පඤ්හං පුච්ඡන්තො බුද්ධෝ භවිස්සසී'ති චතුන්නං පාරමීනං දළ්හං කත්වා අධිට්ඨාසි.

කීහු මෑ සි-මහාබොධිවංශ යෙහි ත්

තතෝ චතුන්නං පාරමී දිසවා පිණ්ඩගවෙසකෝ විය සපදානචාරිකෝ භික්ඛු උත්තම මජ්ඣිමාධමෙ මෙධාවිනෝ උපසඞ්කමිත්වා කුසලාකුසලාදි පටිපදං පුච්ඡන්තෝ පාරමීං පූරෙස්‍යාසී ති අධිට්ඨාය.

බුද්ධවංශයෙහි ද-වදාළේ මෑ නෝ

විවිණන්තෝ තදත්තකිං චතුන්නං පාරමිං,
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං.

ඉමං තුවං වතුත්තං තාව දළහං කත්වා සමාදිය,
පඤ්ඤාපාරමිතං ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

යථා හි නිකඛු භිකඛනෙතා ඡින මූකකටඨ මජඣිමෙ,
ඛුලාති න විවජෙජනෙතා එවං ලහති යාපනං.

තථෙව තුවං සබබකාලෙ පරිපුච්ඡනෙතා බුධං ජනං,
පඤ්ඤා පාරමිතං ගන්ත්වා සමෙබාධිං පාපුණිස්සසි සි.

තදනන්තරයෙන් මෙ පමණ පාරමිතා සතරදෙනෙකුන් ගෙන් ම බුඩත්වයට පැමිණි ය යුතු නොවෙ සි සිතා උත්තරයෙ හි දු පාරමී ධර්මයන් උපධාරණ ය කරණ සේක් කරුණාව හා උපාය කෞශල ඥානයෙන් පිරිසිද ගන්නා ලද කසින් හා සිතින් මෙරමාහට වැඩ කිරීමට නිරන්තරයෙන් පවත්නා උත්සාහ ය වීර්‍ය්‍ය පාරමිතා ව ය යි කියන ලද උත්සාහ ය සම්භාවකොට ඇත්තා වූ උපත්තම්භ ය කාත්‍ය ය කොට ඇත්තා වූ නො පසු බැස් ම නුවනට වැටහිම් කොට ඇත්තා වූ අනවවීර්‍ය්‍ය වසතු ව හා සංවෙගය ආසන්න කාරණා කොට ඇත්ඨා වූ—

පස්වැනි වීර්‍ය්‍ය පාරමිතාව දැක සුමෙධ පණ්ඩිතයෙනි! ඉදින් බුඩත්වයට පැමිණෙනු කැමැත්තෙහි වී නම් සසනාසන සථාන ගමන සංඛ්‍යාත චතුර්විධ ඊර්‍ය්‍යාපථයෙහි ම නොලිහිල් සවභාව ඇති උත්තම සිංහ රාජයන්හු මෙන් තොප විසින් සකී භවයෙහි ම සකී ඊර්‍ය්‍යාපථයෙහි ම උපන් අකුශල ධර්මයන්ගේ ප්‍රහාණයෙහි ද ප්‍රහාණ කළ අකුශලධර්මයන්ගේ නැවත නො ඉපදවීමෙහි ද නො උපන් කුශල ධර්මයන්ගේ ඉපදවීමෙහි ද උපන් කුශල ධර්මයන්ගේ වර්‍ධන ය කිරීමෙහි ද නොපසු බැස චතුර්විධ සම්‍යක්ප්‍රධාන වශයෙන් වීර්‍ය්‍ය පාරමිතාව පූරණ ය කොට බුඩත්වයට පැමිණෙව සි මෙසේ පස්වැනි වීර්‍ය්‍ය පාරමිතාව ප්‍රවර මෘගරාජොපමායෙන් අධිෂ්ඨාන කළ සේක.

මෙම කිහ – දූරෙනිදානයෙහි

අථස්ස න එත්තකෙනෙව බුඩකාරක ධර්මෙහි භවිතබබතා නි උත්තරිම්පි උපධාරයන්තා පඤ්චමං විරියපාරමිං දිස්වා එතදවොසි: සුමෙධපණ්ඩිත! ත්වං ඉතො පට්ඨාය විරියපාරමිං පූරෙය්‍යාසි යථා හි සීහො මිගරාජා සබබ ඉරියාපථෙසු දළ්හවිරියො හොති,

එවං තම්පි සබ්බ භවේසු සබ්බ ඉරියාපථෙසු දළ්හවීරියෝ අනෝ ලීන වීරියෝ සමානෝ බුඩෝ භවිස්සසී'ති පඤ්චමං වීරියපාරමිං දළ්හං කත්වා අධිට්ඨාසි.

කිඟු මැ සි - මහාබොධිවංශයෙහි න්

තතෝ පඤ්චමං වීරියපාරමිං දිස්වා ඨාන ගමනාසන සය නෙසු සමාන දළ්හවීරියෝ විය සීහෝ මිගරාජා සදා සම්පපවත්තන සම්මප්පධානෝ හුත්වා වීරියපාරමිං පූරෙය්‍යාසීති අධිට්ඨාය.

බුඩවංශයෙහි දු - වදලේ මැ නෝ

විවිණනෙනා තදද්දක්ඛිං පඤ්චමං වීරියපාරමිං,
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං.

ඉමං ත්වං පඤ්චමං තාව දළ්හං කත්වා සමාදිය,
වීරියපාරමිතං ගච්ඡ යදි බොධිං පත්තුමිච්ඡසි.

යථාපි සීහෝ මිගරාජා නිසජ්ජට්ඨාණ වඩ්ඪමේ,
අලීන වීරියෝ හොති පහාහිත මනෝ සදා.

තථෙව ත්වම්පි සබ්බත්ථ පග්ගණ්හ වීරියං දළ්හං,
වීරියපාරමිතං ගන්ත්වා සම්බොධිං පාපුණිස්ස'සි-සි.

ඉක්බිත්තෙන් මේ පමණ බුඩකාරක ධර්මයන් පස් දෙණෙ කුත් ගෙන් ම බුඩත්ව ය සිඩකොට ගත නො හැකි වෙයි. සිතා මත්තෙහි දු බුඩකාරක ධර්මයන් සොයන සේක් **කරුණාව** හා උපාය ප්‍රඥාවෙන් පිරිසිදගන්නා ලද සංසකාරයන්ගේ අපරාධ සහන ය කිරීම හා අදොෂය ප්‍රධානකොට ඇති තදුකාර ප්‍රවෘත්ත චිත්තොත්පාද ය **ඤාණනි** පාරමිතාව ය සි කියන ලද ඉවසීම සවභාව කොට ඇත්තා වූ - ඉෂ්ඨානිෂ්ට සහනය කිරීම කෘත්‍ය ය කොට ඇත්තා වූ - ඉවසීම වැටහීම් කොට ඇත්තා වූ-

අවිරොධ ය හා තත් වූ පරිද්දෙන් දැන් ම ආසන්නකාරණ කොට ඇත්තා වූ **සවැනි වූ ඤාණන පාරමිතාව** දැක සුමෙධ පණ්ඩිතයෙනි! මේ තැන් පටන් ගඬ මාලාදී සුවඳ වස්තූන් හා උච්චාර පස්සාවාදීදුගීඤ්ඡුද්‍රව්‍ය ය බැහිමෙහි සෙෂම ව වෙෂ නො කොට ඉවසීම සවභාව කොට ඇති මහපොළොව සේ අනෙකවිධ සත්ව යන් විසින් කරණ ලද සම්මානාවමානයෙහි අවෙෂ ප්‍රධාන වූ චිත්තොත්පාදයෙන් යුකත ව **ඤාණනිපාරමිතාව** පූරව සි මෙසේ ඉුව් අඟුව් නිඛෙෂපඛෂව ම සුන්දරොපමායෙන් සවැනි ඤාණනි පාරමිතාව අධිෂ්ඨාන කළ සේක.

කියෙ මෑ නෝ - දූරෙ නිදානයෙහි

අථස්ස න එත්තකෙනෙව බුද්ධකාරක ධම්මෙහි හවිතබ්බන්ති එත්තරිමපි උපධාරයන්තො ඡට්ඨං ඛන්තිපාරමිං දිසවා එතදහොසි: සුමෙධපණ්ඩිත! ඨං ඉතො පට්ඨාය ඛන්තිපාරමිං පූරෙය්‍යාසි. සම්මානනෙපි අවමානනෙපි ඛමොව භවෙය්‍යාසි. යථාපි පථවියං නාම සුචිම්පි පක්ඛිපන්ති අසුචිම්පි න තෙන පථවි සිනෙහං න පටිඝං කරොති. ඛමති සහති අධිවාසෙති යෙව එවමෙවං ඨම්පි සම්මානනාවමානනෙසු ඛමොව සමානො බුද්ධො භවිස්සසී'ති ඡට්ඨං ඛන්තිපාරමිං දළහං කත්වා අධිට්ඨාසි.

නිග්‍රු මෑ සි - මහාබොධිවංශයෙහි න්

තතො ඡට්ඨං ඛන්‍යිපාරමිං දිසවා සුචි අසුචි නිකෙඛප කඛමා මෙදිනී විය භිතාභිත සත්තදසසිත සම්මානාවමානකඛමෙ හුත්වා ඛන්තිපාරමිං පූරෙය්‍යාසී'ති අධිට්ඨාය.

බුද්ධවංශයෙහි දු - වදුළේ මෑ නෝ

විවිණන්තො තදදඛඛිං ඡඨං ඛන්තිපාරමිං,
පුබ්බකෙහි මහෙසිහි ආසෙවිත නිසෙවිතං.
ඉමං ඛා ඡඨමං තාව දළහං කත්වා සමාදිය,
තත්ථ අවෙජඛමිනසො සම්බොධිං පාපුණිස්සසි.

යථාපි පථවි නාම සුචිම්පි අසුචිම්පි ච,
සබ්බං සහති නිකෙඛපා න කරොති පටිඝං දයං.
තථෙව ඛමිපි සඛෙඛසං සම්මානාවමානඛඛමො,
ඛන්තිපාරමිතං ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි-ති.

ඉක්බිත්තෙන් මේ පාරමිධම්මයන් සදහාගෙන් ම බුද්ධත්ව යට පැමිණිය හැකි නොවෙයි සිතා මත්තෙහි දු පාරමී ධම්මයන් උපධාරණ ය කරණ සේක් කරුණාව හා උපාය ප්‍රඥාවෙන් පිරිසිඳ ගන්නා ලද විරති චෙතනාදීන්ගේ හෙදය නොකිරීම සත්‍යපාරමිතාව ය සි කියන ලද මෘෂාවාද සත්‍යවාද දෙක්හි දෙඹා දෙඹය දැන අවිසංවාද ය සවභාවකොට ඇත්තා වූ - යථාසවභාව ය ප්‍රකාශ කරණ බව කාත්‍ය කොට ඇත්තා වූ - සාධු බව වැටහීම් කොට ඇත්තා වූ විනීත බව ආසන්නකාරණා කොට ඇත්තා වූ—

සත්වැනි සත්‍ය පාරමිතාව දක සුමේධ පණ්ඩිතයෙනි! තෙපි මේ තැන් පටන් සත්‍යපාරමිතාව පුරව, පුරන්නේ ද හිම හිමිහා දී සියලු සෘතුයෙහි ම තමා යනු ඒපිය නොසික්මවත ඔෂධිතාරකාව

රිපද්දෙන් සෙන සියගණනක් මුදුනෙහි හෙළන ත් ධනාදියක් පිණිස ජනුදී වශයෙන් මෘෂාවාද නො කියා සත්‍යපාරමිතාව පුරව සි මෙසේ සදුකාල එකවිටිගත ඖෂධි තාරකොපමායෙන් සත්වැනි සත්‍ය පාරමිතාව අධිෂ්ඨා කළ සේක.

කියේ මැ නෝ-දූරෙනිදානයෙහි

අථස්ස න එත්තකෙනෙව බුද්ධකාරකධම්මෙහි භවිතබ්බන්ති උත්තරිම්පි උපධාරයන්තො සත්තමං සච්චපාරමිං දිස්වා එතදවොසි: සුමේධපණ්ඩිත! ත්වං ඉතො පට්ඨාය සව්වපාරමිම්පි පූරෙය්‍යාසි. අසනියා මත්ථකෙ පතමාතාය'පි ධනාදීනං අත්ථාය ජනුදීනං වසෙන සම්පජානමුසාවාදං නාම මා අකාසි.

යථා හි ඔසධිතාරකා නාම සබ්බ උතුසු අත්තනො ගමන වීථිං විජහිත්වා අඤ්ඤාය වීථියා න ගච්ඡන්ති. සකවීථියා ව ගච්ඡන්ති. එවමෙවං ත්වම්පි සච්චං පහාය මුසාවාදං නාම අකරොන්තො යෙව බුද්ධො භවිස්සසී'ති සත්තමං සච්චපාරමිං දළ්හා කත්වා අධිට්ඨාසි.

කියේ මැ නෝ-මිහාබොධිවංශයෙහි ත්

තතො සත්තමං සච්චපාරමිං දිස්වා හිමගිමහාදිසු සබ්බසම යෙසු වීථිමත්තිකකමන්ති ඔසධි විය මත්ථකෙ අසනිපාතසතෙසුපි පතමානෙසු මුසාවාදං අකරොන්තො සච්චපාරමිං පූරෙය්‍යාසී'ති අධිට්ඨාය.

බුඩවංශයෙහි දු වදුලේ මැ නෝ

විවිණන්තො තදදක්ඛි සත්තමං සච්චපාරමිං,
පුබ්බකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං.

ඉමං ත්වං සත්තමං තාව දළ්හං කත්වා සමාදිය,
තතො අද්වෙජ්ඣවචනො සම්බොධිං පාපුණිස්සසි.

යථා පි ඔසධි නාම තුලාභූතා සදෙවකෙ,
සමයෙ උතුවසෙ වා න ඔක්කමති වීථිතො.

තථෙව ත්වම්පි සච්චෙසු මා වොඅක්කමි වීථිතො,
සච්චපාරමිතං ගන්ත්වා යම්බොධිං පාපුණිස්සසි—යි.

තදනන්තරයෙන් මේ පාරමී ධර්මයන් සද්දෙතාගෙන් ම බුඩත්වයට පැමිණිය හැකි නො වෙයි සිතා මත්තෙහි දු බුඩකාරක ධර්මයන් සොයන සේක් කරුණාව හා කාරණයෙහි දක්ෂ ව

පවත්නා භුවණින් පිරිසිද ගන්නා ලද අළුල සමාදාන ය අධිෂ්ඨාන පාරමිතාව ය සි කියන ලද බොධිසම්භාරයෙහි අධිෂ්ඨාන ය හා ඒ ඒ ප්‍රකාරයෙන් පවත්නා වූ චිත්තෝත්පාදයෙන් අධිෂ්ඨාන ය බොධිසම්භාරයෙහි පිහිටීම සවභාවකොට ඇත්තා වූ-

ඒ බොධිසම්භාර ධර්මයන්ගේ ප්‍රතිපක්ෂ ධර්මයන් මැඩපැවැත් ම කෘත්‍යය කොට ඇත්තා වූ ඒ බොධිසම්භාරයන් කෙරෙහි නිශ්චල බව වැටහීම් කොට ඇත්තා වූ ඒ බොධිසම්භාර ය ආසන්න [illegible] කොට ඇත්තා වූ **අටවෙනි අධිෂ්ඨාන පාරමිතාව** දැක සුළුවා [illegible]ඛිතයෙහි! යම් සේ සවීදිශා භාගයෙන් පහරණ ලද වාතාසයෙන් සුනිෂ්ඨිත පවීත ය තෙමේ නො සෙල්වී යථාසථාන යෙහි ම පිහිටියේ ද පරිද්දෙන් ම නොප විසිනු දු කරණ ලද ආතමා ධිෂ්ඨානයෙහි නිශ්චල 'අධිෂ්ඨාන පාරමිතාව පුරා සම්‍යක්සම්බොධි යට පැමිණෙව සි මෙසේ අටවැනි අධිෂ්ඨාන පාරමිතාව වාතාවි [illegible]පිත සුප්‍රතිෂ්ඨිත පවීතොපමායෙන් අධිෂ්ඨාන කළ සේක.

එසින් කීන-දූරෙනිදානයෙහි

අළුල්ල එතතකෙතෙව බුඩකාරකධමෙමහි භවිතබබනති [illegible]පධාරයනෙතා අසථමං අධිවිඨානපාරමිං දිසවා එතද නොසි සුමෙධපණඩිත! භවං ඉතො පටඨාය අධිවිඨානපාරමිං පූරෙයයාසි යං අධිවිඨාසි තසමිං අධිවඨානෙ නිවවලෝ භවෙයයාසි. යථා හි පබබතො නාම සබබදිසාසුපි වාතෙ පහරනෙත න කමපති. න චලති. අතතනො ඨානෙයෙව තිට්ඨති. එවමෙවං තුමපි අතතනො අධිවිඨානෙ නිවවලෝ හොතෙතා ව බුඩො භවිසසසී'ති අසථමං අධිවිඨානපාරමිං දළහං කතවා අධිවිඨාසි.

කියේ මැ නෝ-මහාබොධිවංශයෙහි ත්

තතො අසථමං අධිවිඨානපාරමිං දිසවා සබබදිසාභාගොප ගතෙහි'පි වාතෙහි අවලෝ සුපපතිවිඨිතපබබතො විය අතතා ධිවිඨානෙ නිවවලෝ හුතවා අධිවඨානපාරමිං පූරෙයයාසි'ති අධිවඨාය.

බුඩවංශයෙහි ද වදලේ මැ නෝ

විවිණනෙතා තදදඤඤිං අසථමං අධිවඨානපාරමිං,
පුබබකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං.

ඉමං තුවං අසථමං තාව දළහං කතවා සමාදිය,
තතෝ තුවං අවලෝ හුතවා සමෙබාධිං පාපුණිසසසි.

යථා' පි පබ්බතෝ සෙලෝ අච්ලෝ සුපතිට්ඨිතෝ,
න කම්පති භුසවාතෙහි සකට්යානෙ'ව නිට්ඨති.

තථෙ' ව අහම්පි අධිට්ඨානෙ සබ්බදා අච්ලෝ භව,
අධිට්යානපාරමිං ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි—සි.

තදනන්තරයෙන් මේ පාරමිධර්මයන් අට දෙනාගෙන් ම බුඩත්වයට පැමිණිය හැකි නො වෙයි සිතා මත්තෙහි දු පාරමී ධර්මයන් උපධාරණ ය කරණ සේක් කරුණාව හා කාරණෝපාය කෞශල්‍ය පරිගාහිත වූ ලොකයාහට හිත සුඛ සාදනීම හා කාරණා හෙයින් අව්‍යාපාද ය මෛත්‍රී පාරමිතාව ය යි කියන ලද හිතාකාර ප්‍රවෘත්ති ය ලක්ෂණ කොට ඇත්තා වූ-සත්වයන්ට අහිවාඩි ඵලවත බව හා ආඝාත දුරුකරණ බව කෘත්‍යය කොට ඇත්තා වූ-සෞම්‍ය බව වැටහීම් කොට ඇත්තා වූ.

සත්වයන්ට මනාප බව දැක්වීම ආසන්න කාරණා කොට ඇත්තා වූ- **නවවැනි මෛත්‍රීපාරමිතාව** දැක සුමේධපණ්ඩිත යෙනි! යම් සේ සිසිල් ජලයතෙම කල්‍යාණ - පාප ජනදෙපක්ෂය ට ම සමසාතු දක්වා ද එපරිද්දෙන් තෙපි දු හිතාහිත සත්වයන් කෙරෙහි විප්‍රතිණාභුනය පවිඤයෙන් සම මෙත් පතුරුවා මෛත්‍රී පාරමිතාව පුරා බුඩත්වයට පැමිණෙව් ය සි මෙසේ කල්‍යාණපාප ජනාවිරොධ සම සෘතුදායක ශිශිර ජලොපමායෙන් නව වැනි වූ මෛත්‍රී පාරමිතාව අධිෂ්ඨාන කළ සේක.

කියේ මෑ නෝ-දූරෙනිදානයෙහි

අථස්ස තා එතහකෙනෙව බුඩකාරකධම්මෙහි භවිතබ්බන්ති ඵතහාපි උපධාරයන්තෝ තවමං මෙත්තාපාරමිං දිස්වා එතද හොසි සුමේධ පණ්ඩිත! තවං ඉතෝ පට්ඨාය මෙත්තාපාරමිං පූරෙ යාසි. හිතෙසුපි අහිතෙසු'පි එකචිත්තෝ භවෙය්‍යාසි.

යථා හි උදකං නාම පාපජනස්සාපි කල්‍යාණජනස්සාපි සීත භාවං එක සදිසං කත්වා ඵරති - එවමෙවං තුම්පි සබ්බසත්තෙසු මෙත්තෙන චිත්තෙන එකචිත්තෝ හොත්තෝ බුඩෝ භවිස්සසි'ති තවමං මෙත්තාපාරමිං දළහං කත්වා අධිට්ඨාසි.

කිහු මෑ සි - මහාබොධිවංශයෙහි ත්

තතෝ තවමං මෙත්තාපාරමිං දිස්වා කල්‍යාණ පාපජනස්ස සම්ඵුසමපදු දුයකං උදකං විය සකලහිතාහිත සත්තානං සම මෙත්තෝ පවත්තකෝ හුත්වා මෙත්තා පාරමිං පූරෙස්‍යාසි'ති අධිඨා ය

බුද්ධවංශයෙහි දැ වදාළේ මැනෝ

විචිණ්ණෙතා තදඤ්ඤඤ්ඤා තවමං මෙත්තා පාරමිං,
පුබ්බකෙහි මහෙසිහි ආසෙවිත නිසෙවිතං.

ඉමං ත්වං තවමං තාව දළ්හං කත්වා සමාදිය,
මෙත්තාය අසමෝ හොති යදි බොධිං පත්තුමිච්ඡසි.

යථාපි උදකං නාම කල්‍යාණෙ පාපකෙ ජනෙ,
සමං එරති සිතෙන පවාහෙති රජොමලං.

තථෙව ත්වම්පි අහිතහිතෙ සමං මෙත්තාය භාවය,
මෙත්තාපාරමිතං ගන්ත්වා සම්බොධිං පාපුණිස්සසි-සි.

තදනන්තරයෙන් මේ පාරමී ධර්මයන් තවදෙනාගෙන් ම බුද්ධත්වයට පැමිණිය යුතු නොවෙයි. සිතා උත්තරයෙහි දැ පාරමී ධර්මයන් උපධාරණය කරණ සේක් කරුණොපාය කෞශල්‍ය පරිගෘහිත වූ අනුනය ප්‍රතිඝ විධවංශන ය හා ඉෂ්ටානිෂ්ටයෙහි ත් සම සංස්කාරයන් කෙරෙහි ත් සමප්‍රවෘත්ති ඇති බව උපෙක්ෂා පාරමිතාව ය සි කියන ලද මධ්‍යස්ථාකාරයෙන් පවත්නා බව සවභාව කොට ඇත්තා වූ – සාධාරණ කොට දැක්ම කෘත්‍ය ය කොට ඇත්තා වූ – අනුනය ප්‍රතිඝයන් සන්හිඳවීම නුවණට වැටහීම් කොට ඇත්තා වූ—

කුශලාකුශලකර්ම ය සවසන්තක බැවින් ප්‍රත්‍යවෙක්ෂා කිරීම් ආසන්න කාරණාකොට ඇත්තා වූ **දසවැනි උපෙක්ෂා පාරමිතාව** දැක සුමේධ පණ්ඩිතයෙනි! යම් සේ ශුචි අශුචි ප්‍රක්ෂෙප කරණු ලබන්නී පෘථිවී තොමෝ ප්‍රහීණ කරණ ලද අනුනය ප්‍රඝති ඇති ව එහි මධ්‍යස්ථාකාර ව පවතී ද,

එ පරිද්දෙන් තෙපි දැ එක් පාර්ශ්වයෙක්හි වන්දනාදි සුවද ආලෙප කරන්නනු කෙරෙහි දැ එක් පාර්ශ්වයෙක්හි තියුණු මුවහත් ඇති වැයෙන් සස්නහු කෙරෙහි දැ දයාවක් හෝ වෙෂයක් හෝ නො කොට සැප දුක් දෙකෙහි ම මධ්‍යස්ථාකාරයෙන් උපෙක්ෂා පාරමිතාව පූරණය කොට දශසහශ්‍රී ලොකධාතුව කම්පාකරවා සත රුම්මර ලොකයාහට එකගුරුස්ථා වූ සර්ව්ඥතඥානයට පැමිණේව සි මෙසේ ශුචි අශුචි නික්ෂෙපක්ෂම වූ වසුන්ධරොපමායෙන් දසවැනි උපෙක්ෂා පාරමිතාව අධිෂ්ඨාන කළ සේක.

මේ ද දක්වන්නට කීහ – දූරෙනිදානයෙහි

අථස්ස ත එතහකෙහෙව බුඩකාරක ධමෙහි භවිතබබනති එතහරිමපි උපඩාරයනෙහා දසමං උපෙකඛාපාරමිං දිසවා එතද ඛොසි: සුමේධ පණ්ඩිත! ත්වං ඉතො පඨාය උපෙකඛාපාරමිම්පි පූරෙය්‍යාසි. සුඛෙ'පි දුකෙඛ'පි මජඣතෙහා'ව භවෙය්‍යාසි. යථාපි පඨවි නාම සුවිමපි අසුවිමපි පඤිපමානා මජඣතහාව හොනි. එවමෙවං ත්වමපි සුඛදුකෙඛසු මජඣතෙහා'ව හොනෙහා බුඩො භවිස්සසී'නි දසමං උපෙකඛාපාරමිං දළහං කත්වා අධිඨාසි.

මහාබොධිවංශයෙහි දූ – කීහු මැ සි

එතහරිමපි උපඩාරයනෙහා දසමං උපෙකඛාපාරමිං දිසවා යථා තවෙකමඞගං ගඞෙඛන කොවි ආලිමෙපය්‍ය. එකමඞගං කොවි වාසියා නවෙඡය්‍ය. තෙසු විපඤිතානුනයපටිඝෙ සුඛ දුකෙඛ මජඣතෙහා හුත්වා උපෙකඛාපාරමිං පූරෙය්‍යාසි. පූරෙත්වා ච බොධි තලෙ නිසීදිත්වා දසසහසසි ලොකධාතුං උන්නාදෙත්වා බුඩො භවිසසසී'නි දළහං හදයෙ නිධාය.

බුඩවංශයෙහි දූ වදලේ මැ නෝ

නහෙතෙ එතහකායෙව බුඩධමමා භවිසසරෙ,
අඤඤ'පි විවිනිසසාමි යෙ ධමමා බොධිපාවනා.

විවිණහෙනා තදඳකඛිං දසමං උපෙකඛාපාරමිං,
පුබබකෙහි මහෙසීහි ආසෙවිත නිසෙවිතං.

ඉමං ත්වං දසමං තාව දළහං කත්වා සමාදිය,
තුලාභූතො දළෙහා හුත්වා සමෙබාධිං පාපුණිසසසි.

යථාපි පඨවි නාම නිකඛිත්තං අසුවිං සුවිං,
උපෙකඛති උහො'පෙතෙ කොපානුනයවජිජතා.

තථෙව ත්වමපි සුඛදුකෙඛ තුලාභූතො සද භව,
උපෙකඛාපාරමිං ගන්ත්වා සමෙබාධිං පාපුණිසසසි–සී.

මෙසේ දශපාරමිතා ධර්මයන් සම්මර්ශනයකොට මේ ලොක යෙහි බොධිසත්වයන් විසින් පිරිය යුතු බොධිපරිපාවන බුඩකාරක ධර්මයෝ මෙ පමණෙක් ම ය. දශපාරමිතාවන් හැර අනෙක් බුඩකාරක ධර්මකෙණෙක් කිසි නැත. මේ දශපාරමිතාවෝ ද උඩිව දිශාවෙ හි ත් නැත්තාහ. අධොදිශාවෙහි ත් නැත්තාහ.

පූර්වජන්මයේදී සතර දිග සතර අනුදිග න් නැන්තාහ. මාගේ හෘදයෙහි ම පිහිටියහ යි දැක සියලු පාරමිතාවන් ම දැඩි කොට අධිෂ්ඨානකොට නැවත නැවත සම්මර්ශණ ය කරණ සේක් දානපාරමිතාවෙහි පටන් උපෙක්ෂා පාරමිතාව දක්වා ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන වශයෙන් අනුලෝමනය වශයෙන් සම්මර්ශන ය කොට අන්තයෙහි වූ උපෙක්ෂා පාරමිතාවෙහි පටන් දානපාරමිතාව දක්වා ප්‍රතිලෝමනය වශයෙන් සම්මර්ශණ ය කොට-

මධ්‍යයෙහි වූ ඒයෂී ඤාණනේ පාරමිතා දෙකෙහි පටන් ආදි අන්තදෙකෙළවර දක්වා උභතොවඩන ය වශයෙන් සම්මර්ශනය කොට දෙකෙළවරෙහි දාන උපෙක්ෂා පාරමිතා දෙකෙහි පටන් මධ්‍යයෙහි වූ ඒයෂී ඤාණනේ පාරමිතා දෙක දක්වා මධ්‍ය සංක්ෂේපනය වශයෙන් සම්මර්ශනය කොට ප්‍රථම පාරමිතාව සම්මර්ශන ය කොට විතියපාරමිතාවට ගොස් එහි දු සම්මර්ශනය කොට නැවත ත් ප්‍රථම පාරමිතාවට බැස මේ ක්‍රමයෙන් දසවන උපෙක්ෂා පාරමිතාව දක්වා නැඟි නැඟි ප්‍රථම වූ පාරමිතාව දක්වා බැස ගෙණ ප්‍රත්‍යාගතනය වශයෙන් සම්මර්ශන ය කොට මෙසේ දශපාරමිතාවන් පඤ්චවිධනය වශයෙන් සම්මර්ශනයකොට නැවත -

1. ඇස් ඉස් මස් ලේ ආදි අඞ්ග පරිත්‍යාග ය **දානපාරමිතා** නම් වෙයි.

2. අඞ්ගපරිත්‍යාගයට අධම වූ පුත්‍රදාර ග්‍රාම්‍යක්ෂේත්‍ර මුක්තා මාණික්‍යාදි බාහිර වස්තුපරිත්‍යාග ය "නගරස්ස සමීපං-උපනගරං" යන තන්හි සෙයින් පාරමිතාවගේ සමීප වූ හෙයින් **දානඋපපාරමිතා** නම් වෙයි.

3. අඞ්ගපරිත්‍යාගයට අධික වූ—

"භික්ඛාය උපගතං දිස්වා සකත්තානං පරිච්චජිං,
දානෙන මෙ සමෝ නත්ථි එසා මෙ දානපාරමී"-ති.

වදාරණ ලද බැවින් **සසදෘයෙහි** සෙසින් ජීවිත පරිත්‍යාග ය කොට දන්දීම **දානපරමත්ථපාරමිතා** නම් වෙයි-කියා මෙසේ ත්‍රිවිධාකාරයෙන් දානපාරමිතාව ද—

4. අඞ්ගප්‍රත්‍යඞ්ගයට වන උවදුරකින් මිදීම ආදියක් පිණිස ශීලභෙදයකට නොපමුණුවා පිරීමෙන් **ශීලපාරමිතාව ද,**

5. බාහිර වස්තු නිසා ශීලභෙදයකට නොපමුණුවා පිරීමෙන් **ශීල උපපාරමිතාව ද,**

6. ජීවිත ය නිසා ශීල භෙදයකට නොපමුණුවා—

"සූලෙහි විජ්ඣියනෙන'පි කොට්ටයනෙන'පි සත්තිහි,
හොජ්පුතෙන න කුපාම් එසා මෙ සීලපාරමී-සි.

වදාරණ ලද බැවින් සඞ්ඛපාලජාතකයෙහි සෙයින් පිරීමෙන් **ශීලපරමාර්ථපාරමිතාව** ද සි-කියා මෙසේ ත්‍රිවිධාකාරයෙන් ශීල පාරමිතාව ද,

7. අඞ්ගප්‍රත්‍යඞ්ගයෙහි ලොභ ය නොකොට කාමාදියෙන් නික්මීම් වශයෙන් **නෛෂ්ක්‍රම්‍යපාරමිතාව** ද-

8. බාහිරවස්තුවෙහි ලොභ ය සිඳ ගෘහජනයා විසින් සෙවුනාලද කාමාදියෙන් නික්මීම් වශයෙන් **නෛෂ්ක්‍රම්‍ය උපපාරමිතාව** ද-

9. ජීවිතයෙහි ලොභ ය හැර—

"මහාරජං හත්ථගතං ඛෙලපිණ්ඩං'ව ඡඩ්ඩයිං,
චජතො න හොති ලග්ගනං එසා මෙ නෙක්ඛම්ම පාරමී" සි.

වදාරණ ලද බැවින් චූලසුතසොම ජාතකයෙහි සෙයින් **නෛෂ්ක්‍රම්‍ය පරමාර්ථ පාරමිතා** ව ද සි කියා මෙසේ ත්‍රිවිධාකාර යකින් නෛෂ්ක්‍රම්‍යපාරමිතාව ද—

10. අඞ්ගපරිත්‍යාග ය කොට ද අඞ්ගප්‍රත්‍යඞ්ගයෙහි ලොභ ය හැර සඞ්ඛයන්ට වැඩ අදැඩ නිශ්චය කිරීම් වශයෙන් **ප්‍රඥාපාර මිතාව** ද-

11. බාහිරවස්තුවෙහි තෘෂ්ණාව හැර එ ම ප්‍රඥව මුහුකිරීම් වශයෙන් **ප්‍රඥා උපපාරමිතාව** ද-

12. ජීවිතයෙහි තෘෂ්ණාව හැර—

"පඤ්ඤය විවිණනෙත්‍රා 'හං බ්‍රාහමණං මොචයිං දුඛා'
පඤ්ඤය මෙ සමෝ නත්ථි එසා මෙ පඤ්ඤපාරමී"-සි

වදාරණ ලද බැවින් සත්තුභත්තජාතකයෙහි සෙයින් **ප්‍රඥා පරමාර්ථ පාරමිතාව** ද සි මෙසේ ත්‍රිවිධාකාරයකින් ප්‍රඥාපාරමි තාව ද-

13. අඞ්ගප්‍රත්‍යඞ්ගයෙහි තෘෂ්ණාව හැර පාරමිතා පූරණයට උත්සාහ කිරීම් වශයෙන් **වීර්‍යපාරමිතාව** ද-

14. බාහිරවස්තුවෙහි ලොභ ය හැර පාරමිතා පූරණයට උත්සාහ කිරීම් වශයෙන් **වීර්ය උපපාරමිතාව** ද-

15. ජීවිතයෙහි ලොභ ය හැර—

"අතීරදස්සි ජලමජ්ඣේ භතා සබ්බෝව මාහුසා,
චිත්තස්ස අඤ්ඤථා නත්ථි එසා මේ විරිය පාරමී"-සි.

වදාරණ ලද බැවින් මහාජන ජාතකයෙහි සෙසින් පාරමිතා පූරණයට උත්සාහකිරීම් වශයෙන් **වීර්යපරමාර්ථපාරමිතාව** ද සි මෙසේ ත්‍රිවිධාකාර වූ වීර්‍යපාරමිතාව ද- .

16. අඞ්ගයට උපද්‍රව කරන්නවුන් කෙරෙහි ක්ෂමාකිරීම් වශයෙන් **ක්ෂාන්තිපාරමිතාව** ද-

17. බාහිරවස්තුවට උපද්‍රව කරන්නවුන් කෙරෙහි ක්ෂමාකිරීම් වශයෙන් **ක්ෂාන්ති උපපාරමිතාව** ද-

18. ජීවිතයට උපද්‍රව කරන්නවුන් කෙරෙහි—

"අවෙතනං ව කොට්ටෙන්තෙ තිණේහත එරස්සුනා මම,
කාසිරාජෙ න කුපයාමි එසා මේ ඛන්තිපාරමී"-සි.

වදාරණ ලද බැවින් ක්ෂාන්තිවාදි ජාතකයෙහි සෙසින් ක්ෂමා කිරීම් වශයෙන් **ක්ෂාන්ති පරමාර්ථ පාරමිතාව** ද සි මෙසේ ත්‍රිවිධා කාරයකින් ක්ෂාන්තිපාරමිතාව ද-

19. අඞ්ගප්‍රත්‍යඞ්ග ය නිසා සත්‍ය ය නො බිඳීම් වශයෙන් **සත්‍ය පාරමිතාව** ද-

20. බාහිරවස්තු නිසා සත්‍ය ය නො බිඳීම් වශයෙන් **සත්‍ය උපපාරමිතාව** ද-

21. ජීවිත ය නිසා—

"සච්චවාචං අනුරක්ඛන්තෝ චජිත්වා මම ජීවිතං,
මොචෙසිං එකසතං ඛත්තියෙ පරම්හ සච්චපාරමී"-සි.

වදාරණ ලද බැවින් මහා සුතසෝම ජාතකයෙහි සෙසින් සත්‍ය ය නො බිඳ සත්‍ය ය නිසා ජීවිත පරිත්‍යාග කිරීම් වශයෙන් **සත්‍ය පරමාර්ථපාරමිතාව** ද සි මෙසේ ත්‍රිවිධාකාරයකින් සත්‍ය පාරමිතාව ද-

22. අඞ්ග ය නිසා පාරමිතාවන්ගේ අධිෂ්ඨාන ය නො බිඳීම් වශයෙන් **අධිෂ්ඨාන පාරමිතාව** ද-

23. බාහිරවස්තු නිසා පාරමිතාවන්ගේ අධිෂ්ඨාන ය නොබිඳීම් වශයෙන් **අධිෂ්ඨාන උපපාරමිතාව** ද-

24. ජීවිත ය නිසා,

"මාතා පිතා න මේ දෙස්සං නපි මේ දෙස්සං මහායසං,
සබ්බඤ්ඤුතං පියං මයහං තස්මා ව තමධිට්ඨහිං"-සි.

වදරණ ලද බැවින් මූගපක්ඛජාතකයෙහි මෙන් පාරමිතා වන්ගේ අධිෂ්ඨාන ය නොබිඳ අධිෂ්ඨාන ය පිණිස ජීවිත ය පරිත්‍යාග කිරීම් වශයෙන් **අධිෂ්ඨාන පරමාර්ථ පාරමිතාව** දැයි මෙසේ ත්‍රිවිධාකාරයකින් අධිෂ්ඨාන පාරමිතාව ද-

25. අඛයට උපද්‍රව කරන්නවුන් කෙරෙහි මෙත් කිරීම් වශයෙන් **මෛත්‍රීපාරමිතාව** ද-

26. බාහිරවස්තුවට උපද්‍රව කරන්නවුන් කෙරෙහි මෙත් කිරීම් වශයෙන් **මෛත්‍රී උපපාරමිතාව** ද-

27. ජීවිතයට උපද්‍රව කරන්නවුන් කෙරෙහි,

"න මං කොචි උත්තසති නපිහං භායාමි කස්සචි,
මෙත්තාබලෙනුපත්ථඩ්ඪෝ රමාමි පවනෙ තදා"-සි.

වදරණ ලද බැවින් එකරාජ ජාතකයෙහි මෙන් මෙත්කොට මෛත්‍රී නිසා ජීවිතය පරිත්‍යාග කිරීම් වශයෙන් **මෛත්‍රී පරමාර්ථපාරමිතාව** දැයි මෙසේ ත්‍රිවිධාකාරයෙන් මෛත්‍රීපාරමිතාව ද-

28. අඛයට සැප දුක් යොදන්නවුන් කෙරෙහි මෛත්‍රී දෙඹ දෙකින් වෙනස නොදක්වා මධ්‍යස්ථාකාර වීමෙන් **උපෙක්ඛාපාරමිතාව** ද-

29. බාහිර වස්තුවට විනාස අවිනාස කරන්නවුන් කෙරෙහි ද එබදු වස්තුවෙන් උපකාර අපකාර කරන්නවුන් කෙරෙහි ද එසේ ම මෛත්‍රී - චෙඹ දෙකකින් වෙනස නොදක්වා මධ්‍යස්ථාකාර වීමෙන් **උපෙක්ඛා උපපාරමිතාව** ද-

30. එසේ ම ජීවිතයට විනාස - අවිනාස කරන්නවුන් කෙරෙහි-

"සුසානෙ සෙය්‍යං කපෙපමි ඡවට්ඨිකං උපධායහං,
ගොමණ්ඩලා උපගන්ත්වා රූපං දස්සෙන්තනපපකං"-සි.

වදුරණ ලද බැවින් ලොමහංසජාතකයෙහි මෙත් දෙවෂ-මෛත්‍රී දෙකකින් වෙනස නොදක්වා මධ්‍යස්ථ ව ඒකාකාර කරුණාවෙන් **උපෙක්ඛාපරමාර්ථපාරමිතාව** දැයි මෙසේ ත්‍රිවිධාකාරයකින් උපෙක්ඛාපාරමිතාව ද-

මෙසේ අඞ්ගප්‍රත්‍යඞ්ගයෙහි ලොහය දුරුකොට ඒ ඒ පාරමිතාව ද ඒ ඒ පාරමිතාවන්ට කියන ලද ක්‍රමයෙන් පිළිපැද පූරණය කිරීම් වශයෙන් පාරමිතා දශයක් හා බාහිරවස්තුයෙහි ලොහය හැර ඒ ඒ පාරමිතාවන්ට කියන ලද ක්‍රමයෙන් පිළිපැදීමෙන් උපපාරමිතා දශයක් හා-

එසේම ජීවිතයෙහි ලොහය හැර ඒ ඒ පාරමිතාවන්ට කියන ලද ක්‍රමයෙන් පිළිපැදීමෙන් පරමාර්ථ පාරමිතා දශයක් හා මෙසේ තුන්දශය එක්කොට සමතිසකැයි කියන ලද පාරමිතාවන් යමකතෙලයක් විනිවර්තනය කරන්නක්හු මෙන් ද මහමෙර මන්ථනයකොට ගෙණ චක්‍රවාලසමුද්‍රය අලලන්නක්හු මෙන් ද සම්මශීණය කළ සේක.

මෙසේ පාරමීධර්මයන් සම්මශීණය කරණ සුමේධ තාපසයන් වහන්සේගේ ධර්මතේජසින් චතුනහුතාධික වියොජනශත සහස්‍රබහල වූ මේ පාපිවිතොම මත්තහස්තිරාජයක්හු විසින් ආක්‍රාන්තකරණ හුනකලාපයක් මෙන් ද, පිළියමාන වූ ඉක්ෂුයන්ත්‍රක් මෙන් ද, ශබ්ද පවත්වා උඩ්ඩවදිශාභාගයට සෙමින් කම්පා වූ ව උඩ්ඩ දිශාභාගයට හා හෙට්ඨිම දිශාභාගයට යෙමින් විශෙෂයෙන් කම්පා වූව පෞරස්ත්‍යාදී දිශාභාගයට යෙමින් විශෙෂයෙන් චක්‍රවාල ව කුලාල චක්‍රයක් මෙන් ද, තෙලයන්ත්‍ර චක්‍රයක් මෙන් ද පරිභ්‍රමණය කළ පරිදි දක්වන්නට කීහ - **දූරෙනිදානයෙහි.**

තතෝ විනෙතෘසි ඉමස්මිං ලොකෙ බොධිසත්තෙනහි පුරෙ තබ්බා බොධිපරිපාචනා බුඩකාරකධම්මා එත්තකායෙව: දසපාරමියෝ ඨපෙත්වා අඤ්ඤෙ නත්ථි. ඉමාපි දසපාරමියෝ උඩ්ඩං ආකාසෙපි නත්ථි. හෙට්ඨා පඨවියම්පි පුරත්ථිමාදිසු දිසාසුපි නත්ථි. මයහං යෙව පන හදයමංසන්තරෙ පතිට්ඨිතා'ති එවං තාසං හදයෙ පතිට්ඨිත භාවං දිස්වා සබ්බා'පි දළ්හං කත්වා අධිට්ඨාය පුනප්පුනං සම්මසනෙනා අනුලොම පටිලොමං සම්මසති. පරියන්තෙ ගහෙත්වා ආදිං පාපෙති. ආදිම්හි ගහෙත්වා පරියන්තෙ ඨපෙති. මජ්ඣෙ ගහෙත්වා උභතොඅසාපෙති උභතොකොට්ඨි ගහෙත්වා මජ්ඣෙ ඔසාපෙති.

අඞ්ගපරිච්චාගෝ පාරමියෝ නාම. බාහිර භණ්ඩ පරිච්චාගෝ උපපාරමියෝ නාම. ජීවිතපරිච්චාගෝ පරමත්ථ පාරමියෝ නාමා'නි දස පාරමියෝ දස උපපාරමියෝ දස පරමත්ථ පාරමියෝති යමක තෙලං විනිවට්ටනෙනා විය මහාමේරුං මත්ථං කත්වා වක්කවාළ මහාසමුද්දං ආලුලෙනෙනා විය ච සම්මසි.

තස්ස දසපාරමියෝ සම්මසන්තස්ස ධම්මතෙජෙන චතුනහුතා ඩිකාති වෙ යොජන සතසහස්සානි බහලා අයං මහාපඨවී හත්ථිනා අක්කන්ත නළකලාපෝ විය පීළියමානං උච්ඡුයන්තං විය ච මහා විරවං විරවමානා සංකම්පි සම්මක්කම්පි සම්පවෙධි. කුළාලචක්කං විය තෙලයන්තචක්කං විය ච පරිබ්භමි.

බුදුන් විසිනු දු වදුළේ මැ නෝ

ඉමෙ ධම්මෙ සම්මසතෝ සභාව සරස ලක්ඛණෙ,
ධම්මතෙජෙන වසුධා දසසහස්සී පකම්පථ-සි.

මෙසේ පොළොව කම්පාවෙන්ට වන් කල්හි රඹගම් නුවර වාසීහු සිහිඑළවා සිටින්නට අසමර්ථ ව කල්පාන්ත වාතයෙන් මූලිනුදුරා වැටෙන වෘක්ෂයන් මෙන් මූර්ඡිත මූර්ඡිත ව සිටි සිටි තැන ප්‍රපතිත වූවාහු ය. අනෙක ඝටාදී භාජන සහස්‍රයෝ වැටී ඔවුනොවුන් හා වැදී බිඳී සුණුවිසුණු ව ගියාහු ය. ඒ දැක මහා ජනයෝ භය සන්ත්‍රාසයට පැමිණ දීපඞ්කර සම්බුදුන් වහන්සේ කරා එළඹ,

කිනනු බො ඉමස්ස ලොකස්ස පාපකං වා භවිස්සති,
කථෙථෝ'දුහු කල්‍යාණං නො එතං කාරණං මුනි-සි.

ඝනාදීන් භාග්‍යවත් වූ සම්බුදුරජාණන්වහන්ස! මේ භූත යක්ෂ දෙවතාදීන් කෙරෙහි යක්ෂාවර්තයෙක් හෝ භූතාවර්තයෙක් හෝ දෙවතාවර්තාදියක් හෝ නො දනුම්හ. මේ සියලු ජනයෝ උපද්‍රැත වූවාහු ය. කිමෙක් ද්‍ෝ? ලොවට භයෙක් හෝ වේ ද, සැපයෙක් හෝ වේ ද තත් වූ පරිද්දෙන් වදාරා අපගේ කුකුස් දුරුකොට වදාළ මැනව සි යාචඤ්ඤ කළ හෙයින්-

යමහං අජ්ජ ව්‍යාකාසිං බුද්ධො ලොකෙ භවිස්සති,
එසෝ සම්මසතී ධම්මං පුබ්බකං පත සෙවිතං.

තස්ස සම්මසතෝ ධම්මං බුද්ධභූමිං අසෙසතෝ,
තෙනායං කම්පිතා පුථුවී දසසහස්සී සදෙවකෙ-සි.

යනාදීන් උපාසකවරුනි! තෙපි නොබවව්! මේ පෘථිවි කම්පාව නිසා තොපට වන භයෙක් නැත. මා විසින් සුමේධ පණ්ඩිතයන්ට මතු බුදුවෙති යි අද දවස විවරණ දෙන ලදුව දුන් පාරමිතා සම්මශීණ ය කෙරේ ය. ඔහුගේ පාරමිතා සම්මශීණ ය කරණ ධර්මතේජසින් මහා පෘථිවි ය කම්පාවී ය යි වදාළ සේක.

ඒ ඇසූ මහා ජනයෝ ගඳ දුම් මල් ආදිය ගෙණ තුටු පහටු සිතින් රඹගම් නුවරින් නික්ම බෝධිසත්වයන් කරා එළඹ ගඬ මාලාදීන් පුදා වැඳ ප්‍රදක්ෂිණාකොට ගිය කල්හි බොධිසත්වයන් වහන්සේ ද දශපාරම් ධර්මයන් සමාදන්වීම් වශයෙන් සිතෙහි දැඩිකොට තබා නිසින්නාසනයෙන් නැගි සේක.

එසින් වදාළහ

බුඩස්ස වචනං සුත්වා මනෝ නිබ්බායි තාවදෙ,
සබ්බෙ මං උපසඞ්කම්ම පුන'පි මං අභිවන්දියුං.

සමාදිසිත්වා බුඩගුණං දළහං කත්වාන මානසං,
දීපඞ්කරං නමස්සිත්වා ආසනා උඨහිං තදා-යි.

ආසනයෙන් නැගෙන්නා වූ සුමේධ බොධිසත්වයන් කරා දස දහසක් සක්වළ දිව්‍යබ්‍රහ්මාදීහු එළඹ දිවමල් දිවසුවඳ ආදියෙන් පුදා ආශ්චර්‍ය වූ සුමේධ තාපසයෙනි! තොප විසින් දීපඞ්කර සම්බුදුන් වහන්සේගේ ශ්‍රීපාද මූලයෙහි දී මහත් ප්‍රාර්ථනාවක් කරණ ලද්දේ ය. ඒ ප්‍රාර්ථනාව අනන්තරායෙන් ම සමෘඩ වේ ය යි භයක් හෝ නැතිගැන්මක් හෝ ඔබට නොවේව යි ඔබගේ ශරීරයෙහි සවලප මාත්‍රයෙක් වත් රෝගයෙක් නොඋපදිව යි ශීඝ්‍රව පාරමී ධර්මයන් පුරා සම්‍යක් සම්බොධි ය ප්‍රතිවෙධ කරණ සේක්ව යි, යම් සේ පුෂ්පොපග ඵලොපග වෘක්ෂයෝ ඒ ඒ කාල ය කොයික්මවා පුෂ්ප ඵල ගණ්හිද්ද-

එ පරිද්දෙන් ම ඔබවහන්සේ ද කාල ය අනතික්‍රාන්තකොට බුඩත්වයට පැමිණෙන සේක්ව යි යනාදීන් අනෙක ප්‍රකාරයෙන් සතුනිකොට මඞ්ගල්‍ය වචන සහස්‍රයෙන් සතුටු කරවා තම තමන්ගේ දෙවසථානයන් කරා ගියකල්හි බොධිසත්වයන් වහන්සේ ද දෙවියන් විසින් පුදනලදු ව මම දශපාරම් ධර්මයන් පුරා කල්ප" ශතසහස්‍රයක් අධිකකොට ඇති චතුරසඞ්ඛ්‍යයක්හුගේ මස්තකයෙහි 'බුඩත්වයට පැමිණෙම් යි දෘඪ ව වීර්‍යාධිෂ්ඨාන ය කොට අනිලපථයට නැගී හිම වත් පෙදෙසට ගිය පරිදි දක්වන්නට වදාළහ-බුඩවංශයෙහි

දිබ්බං මානුසකං පූජං දෙවමානුසකා උභො,
සමොකිරන්ති පුප්ඵෙහි වුඨහන්තස්ස ආසනා.

වෙදයන්ති ච තෙ සොත්ථිං දෙවමානුසකා උභො,
මහන්තං පත්ථිතං තුය්හං තං ලභස්සු යථිච්ඡිතං.

සබ්බී තියෝ විවජ්ජන්තු සබ්බරොගෝ විනස්සතු,
මා තෙ භවතු අන්තරායෝ ඵුස බ්‍යිපං බොධිමුත්තමං.

යථා'පි සමයෙ පත්තෙ පූජ්ජන්ති පුප්ඵිතෝ දුමා,
තථෙව ත්වං මහාවීර බුද්ධඤ්ඤෙහි පූජ්ජසි.

යථා යෙ කෙචි සම්බුද්ධා පූරයුං දසපාරමී,
තථෙව ත්වං මහාවීර පූරෙහි දසපාරමී.

යථා යෙ කෙචි සම්බුද්ධා බොධිමණ්ඩම්හි බුජ්ඣරෙ,
තථෙව ත්වං මහාවීර බුජ්ඣස්සු ජිනබොධියං.

යථා යෙ කෙචි සම්බුද්ධා ධම්මචක්කං පවත්තයුං,
තථෙව ත්වං මහාවීර ධම්මචක්කං පවත්තය.

පුණ්ණමාසෙ යථා චන්දෝ පරිසුද්ධෝ විරොචති,
තථෙව ත්වං පුණ්ණමානෝ විරොච දස්සහස්සියං.

රාහුමුත්තෝ යථා සූරියෝ තාපෙන අතිරොචති,
තථෙව ලොකං මුඤ්චිත්වා විරොච සිරියා තුවං.

යථා යා කාචි නදියෝ ඔසරන්ති මහොදධිං,
එවං සදෙවකා ලොකා ඔසරන්ති තවන්තිකං.

කෙහි ථුතිපපඤ්චෝ යෝ දසධම්මෙ සමාදිය,
තෙ ධම්මෙ පරිපූරෙන්තෝ පවනං පාවිසි තදා-සි.

මෙසේ තමන්වහන්සේ නොබුදුව අතීතකාලයෙහි දීම බුඩකාරක ධර්මයෝ නම් මුහු යැ යි කියා දත් හෙයිනු ත් ඒ බුඩකාරක ධර්මයන් අවිපරීත වශයෙන් පුරා ක්‍රමයෙන් අවුත් බෝඹැ වැඩහිඳ මේ අභිඥෙය ධර්ම ය පරිඥෙය ධර්ම ය, මේ ප්‍රහාතව්‍ය ධර්ම ය, මේ සෘත් සෘත් කටයුතු ධර්ම ය, මේ භාවිත කටයුතු ධර්මයැ යි

යනාදීන් චතුස්සත්‍ය ධර්මයන් තත් වූ පරිද්දෙන් දත් හෙයින් මාගේ ස්වාමිදරු වූ මට ම පිහිට වූ ත්‍රෛලෝක්‍යෛකබන්ධු වූ භාග්‍යවත් වූ බුදුරජානන්වහන්සේ බුබ තම් වත සේක.

එයින් වදළහ

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බඤ්ච භාවිතං,
පහාතබ්බං පහීණං මෙ තස්මා බුද්ධොඃස්මි බ්‍රාහ්මණ-යි.

මෙතෙකින් මේ සද්ධම්ම සාරාර්ථ සංග්‍රහ නම් වූ

ධර්ම්ප්‍රකරණයෙහි

ප්‍රථමාභිනීහාරකථා නම් වූ

දෙවැනි පරිච්ඡේදය

— නිමි —

3. පරිච්ඡේදය

තෘතීය සාමාන්‍යාභිනීහාර කථා

තව ද මේ සද්ධම් සාරාථීසඞ්ග්‍රහ නම් වූ ධර්ම්ප්‍රකරණයෙහි තෘතීය සාමාන්‍යාභිනීහාර කථා නම් කවර හ යත්?

හේ මෙසේ දනයුතු – කෙසේ ද යත්?

තව ද මේ සද්ධම් සාරාථීසඞ්ග්‍රහයෙහි කොණ්ඩඤ්ඤදී තෙවිසි බුදුන් කෙරෙන් ලද දෙවෙනි **සාමාන්‍යාභිනීහාර කථා** නම් කවර ය ත්?

යථොක්ත ක්‍රමයෙන් රඹගම් නුවර වාසිහු ද නුවරට ගොස් බුදුපාමොක් මහසහනට මහදන් දුන්නාහු ය. ශාස්තෘන් වහන්සේ ද ඔවුන්ට අනු මෙවෙනි බණ වදුරණ සේක් ප්‍රථමකොට දන කථා ව ද දෙවැනි ව ශීලකථාව ද තුන්වැනි ව සවර්‍ගකථාව ද කැවත කාමයන්ගේ ආදීනව ද කැවත ලාමක බව ද සකිලිටු බව ද මහණ වීමේහි අනුසස් ද යි මෙසේ නිවන් කෙළවරකොට බණ වදුරා කිසිකෙණෙකුන් සරණයෙහි ද, කිසිකෙණෙකුන් පඤ්චශීලයෙහි ද, කිසිකෙණෙකුන් අන්‍ය වූ දශශීලයෙහි ද පිහිටුවා කිසිකෙණෙකුන්ට ශ්‍රාමණ්‍යඵලය ද, කිසිකෙණෙකුන්ට ප්‍රතිසම්භිදාව ද, කිසි කෙණෙකුන්ට අෂ්ටසමාපත්තිය ද, කිසිකෙණෙකුන්ට ත්‍රිවිද්‍යාදිය ද දෙවා වදුරා වැඩි සේක.

මේ පමණක් මතු නොවෙයි. පූර්ව බුදුවරුන් කෙරෙහි දන ශීලාදී විසින් කරණ ලද කුසල් ඇති විනෙයජනයන් දැක ලක්ෂ යක් යොදනෙක වී නමුත් වැඩ ධර්මදේශනාදියෙන් ඔවුන් නිවන් පුර පමුණුවන සේක. ඒ එසේ ම ය.

ඒ සර්ව්‍වඥයන් වහන්සේ සූවිසි අසඞ්ඛ්‍යයක් නිවන්පුර පැමුණු වූවන් හැර සුනඤුරුමයෙහි දී දම්සක්පැවතුන්සූත්‍ර ය දෙසූ කල දෙව්මිනිසුන්ගෙන් සියක්කෙළක් නිවන් දුටහ. කැවත තමන් වහන්සේගේ උපසකඛන්ධ නම් පුතනුවන්වහන්සේ මුල් ව රාහුලෝ වාදසූත්‍ර ය වැනි වූ සූත්‍රයක් දෙසූ දවස අසූකෙළක් නිවන් දුටහ.

නැවත අමරවතී නම් නුවර මහරි රුක්මුල සමාමහ පෙළ හැර දක්වා තවිතිසා දෙව් නුවර පරසතු රුක්මුල්හි පාණ්ඩුකම්බල ශෛලාසන මස්තකයෙහි වැඩහිඳ මාතෘදිව්‍යපුත්‍රයා ප්‍රමුඛ කොට ඇති දෙවියන්ට අප බුදුන් සෙසින් පරම ගම්භීරාභිධර්ම ය දෙශනා කළ දවස් දෙවියෝ අනූකෙළ දහසක් නිවන් දුටහ. සුනාසූ නම් වෙහෙරදී දෙසූ දහමෙන් කෙළලක්ෂයක් දෙනා වහන්සේ රහත් වූ සේක.

එක්සමයෙක සාරලක්ෂයක් රහතුන් පිරිවරා දඹදිව සැරිසරා වඩනා සේක් බොහෝ දෙනාගෙන් ලබන සත්කාර සම්මාන ඇති ඉතා ප්‍රසිද්ධ යක්ෂයන්ගේ ම විසිම් ඇති භයානක වූ වලායෙන් ගැවසී සිටිනා කුළු ඇති ගසින් කුලින් සැදුම් ලද අතේක සිවිපා වුන්ගේ ගැවසිම් ඇති නාරද නම් පර්වතයක් කරා වැඩ හවුරුදු පතා දඹදිවින් මිනිස් බිලියක් ලබමින් වසන නාරද නම් යක්ෂයාට ඒ දවසු ත් බිලි පිණිස මිනිසුන් ගෙනා මහජනයාට නිවන් දක්වනු පිණිස සාරලක්ෂයක් රහතන්වහන්සේ ඒ ඒ දිග යවා තමන් වහන්සේ තනි ව කරුණාව පමණක් සහායකොට ගෙණ යක්ෂයානනු ත් නිවන් දක්වනු සඳහා පර්වතයට වැඩි සේක.

බුදුන් වඩනා ම ක්‍රොධයෙන් දිලිහී භය ගන්වා පළාපියනු කැමැති ව යක්ෂයා තමාගේ ආනුභාවයෙන් පර්වත ය වෙවුල්වාපී ය. එ කල බුදුන්ගේ ආනුභාවයෙන් ඔහු කරා නැමෙන්නට වත. ඒ දැක භයපත් ව ගිනිකඳක් මවාලී ය. හෙ ද බුදුන් දිසාවට නොගොස් ඔහු ම දවාගන්නට නමා ගත. යක්ෂයා ඒ නොදැන බුදුන් දැ ද නොදැ දේ සි බලන්නේ ශරත් සඳමඬල සේ දිලිහෙමින් වැඩහුන් බුදුන් දැක පාහැද ශ්‍රීපාදය වැඳ ක්ෂමාවන්නට යාඥා කෙළේ ය.

බුදුහු ද අමූතු ව කරණ ක්ෂමාවක් නොවන බැවින් පිළිවෙළ කථාවෙන් බණ වදාරා දස දහසක් යක්ෂයන් සමග නාරද නම් යක්ෂයා සෝවාන් කරවා වදාළ සේක. නාරද නම් යක්ෂයා ද දඹදිව එකි එකී ගමින් සාල් තෙල් පොල් ආදිය හා සමග එක එක මිනිසකු බැගින් බිලි පිණිස තමන්ට ගෙණා පඬුරෙන් සාල් තෙල් ආදිය ගෙනා වුන්ට ම දී බිලි පිණිස ලත් මිනිසුන් බුදුන්ට ම පූජා කළේ ය. සඞ්ඝයන් වහන්සේ ද ඔවුන් එහි භික්ෂුභාවයෙන් පැවිදි කරවා සතියක් ඇතුළත ම සියක්කෙළක් පමණ වූ ඒ භික්ෂූන් වහන්සේ රහත් කරවා නැවත සුදසුන් නම් පර්වතයෙක වස්වැස අනූලක්ෂයක් දෙනාවහන්සේ රහත් කොට මේ ආදි අනෙක

ප්‍රකාරයෙන් ලොකාභිවෘඩි ය කොට තුන් ලොවට තැතු පහන් රැකක් සේ අසූරියන් බුබ ශරීරයෙන් අග්නිස්කන්ධයක් සේ දිලිහින. එබඳු බුදුන් පවා සර්‍වසංස්කාර ධර්‍මයන් අනිත්‍ය හෙයින් පිරිනිවන් පා වදාළ සේක.

මේ කාරණ ය **"සද්ධර්‍මරත්නාවලියෙහි"** දක්නට ඇත ද-ඒ දීපඞ්කර බුදුන්ගේ ධාතු නොවිසිරි තුබූ හෙයින් දිව්‍ය මනුෂ්‍යයන් විසින් ඒ ධාතූන් වහන්සේ වඩා රන්හුලින් එක්සිය සුසාළිස් ගව්වක් උස රන්දාගැබක් බැඳ පාත්‍ර චීවරාදි පාරිභොගික ධාතු ඔබ බුදු වූ පුලිල බොධි සමීපයෙහි වඩා දෙළොස් ගව්වක් උස රන්දාගැබක් බැඳ පූජාකළ පරිදි "රත්නමාලි චෛත්‍යකථා නම් වූ ථූපවංශයෙහි" දක්නට ඇත ද-බුඩවංශපාලියෙනුත් සඞ්ග්‍රහ කරනු ලැබේ.

තදා තෙ භොජයිත්වාන සඝඤ්ච ලොකනායකං,
උපගඤ්ඡුං සරණං තස්ස දීපඞ්කරස්ස සත්ථුනො.

සරණාගමණෙ කිඤ්චි නිවෙසෙසි තථාගතො,
කඤ්චි පඤ්චසු සීලෙසු සීලෙ දසවිධෙ පරං.

කඤ්චි දෙති සාමඤ්ඤං චතුරො ඵලමුත්තමෙ,
කඤ්චි අඤ්ඤෙ ධම්මෙ දෙති සො පටිසම්භිදා.

කඤ්චි වරසමපත්තිං අථ දෙති නරාසභො,
තිසොඍ කඤ්චි විජ්ජායො ඡළභිඤ්ඤා පවෙච්ඡති.

තෙන යොගෙන ජනකායං ඔවදති මහාමුනි,
තෙන විත්ථාරිකං ආසි ලොකනාථස්ස සාසනං.

මහාහනු උසභක්ඛන්ධො දීපඞ්කර සනාමකො.
බහුජනෙ තාරයති පරිමොචෙති දුග්ගතිං.

බොධනෙය්‍යං ජනං දිස්වා සතසහසෙස්‘පි ගොජනෙ,
ඛණෙන උපගන්ත්වාන බොධෙති තං මහාමුනි.

පඨමාභිසමයෙ බුද්ධො කොටිසතමබොධයි,
දුතියාභිසමයෙ නාථො සතසහස්සං අබොධයි.

යදා ච දෙවභවනම්හි බුද්ධො ධම්මමදෙසයි.
නවුති කොටි සහස්සානං තතියාභිසමයො අහු,

සන්නිපාතා තයො ආසුං දීපඞ්කරස්ස සත්ථුනො,
කොටී සතසහස්සානං පඨමො ආසි සමාගමො.

පුන නාරදකූටම්හි පවිවෙක ගතෙ ජිනෙ,
ඛීණාසවා චිතමලා සම්පුණ්ණ සතකොටියෝ.

යදා වසී මහාවීරෝ සුදස්සන සිලුච්චයෙ,
නවුති කොටි සහස්සෙහි පවාරෙසි තදා මුනි.

අහං තෙන සමයෙන ජටිලෝ උග්ගතාපනෝ,
අනන්තජිනමාගම්ම චරණෙ පඤ්ඣාභිඤ්ඤාසු පාරගූ.

දසච්ඡං සහස්සානං ධම්මාභිසමයෝ අහු,
එකදච්චානං අභිසමයෝ ගණනාතෝ අසංඛියා.

චිත්තාරිකං බාහුජඤ්ඤං ඉද්ධ චිතා අන්න තදා,
දීපඞ්කරස්ස භගවතෝ සාසනං සුවිසොධිතං.

චත්තාරි සතසහස්සානි ඡළභිඤ්ඤා මහිද්ධිකා,
දීපඞ්කරං ලොකවිදූං පරිවාරෙන්ති සබ්බදා.

යෙ කෙචි ඉෙන සමයෙන ජහන්ති මානුසං භවං,
අපපත්තමානසා සෙඛා ගරහිතා ච භවන්ති තෙ.

සුප්පටිපන්නං පාවචනං අරහන්තෙහි නාදිහි,
ඛීණාසවෙහි විමලෙහි උපසොභති සදෙවකෙ.

නගරා රම්මවතී නාම සුදෙවෝ නාම ඛත්තියෝ,
සුමෙධා නාම ජනිකා දීපංකරස්ස සත්ථුනෝ.

සුමඞ්ගලෝ ච තිස්සෝ ච අඤ්ඤෙ අග්ගසාවකා,
සාගතෝ නාම උපට්ඨාකෝ දීපංකරස්ස සත්ථුනෝ.

නන්දා චෙව සුනන්දා ච අග්ගෙ අග්ගසාවිකා,
බොධි තස්ස භගවතෝ පිපඵලීති පවුච්චති.

අසීති හත්ථ මුබ්බෙධෝ දීපංකර මහාමුනී,
සොභති දීපරුක්ඛෝව සාලරාජාව ඵුල්ලිතෝ.

සත සහස්ස වස්සානි ආයුං තස්ස මහෙසිනෝ,
තාවතා නිට්ඨමානෝ සෝ තාරෙසි ජනතං බහුං.

ජොතයිත්වාන සද්ධම්මං සන්තාරෙත්වා මහාජනං,
ජලිත්වා අග්ගික්ඛන්ධෝව නිබ්බුතෝ සෝ සසාවකෝ.

සා ච ඉද්ධි සෝ ච යසෝ තානි ච පාදෙසු චක්කරතනානි,
සබ්බං සමන්න රහිතං නත්‍ථි රිත්තා සබ්බසංඛාරා--සි.

දීපංකරස්ස භගවතෝ කොණ්ඩඤ්ඤස්ස ච සත්ථුනෝ,
එතෙසං අන්තරා කප්පා ගණනාතෝ අසංඛ්‍යා-සි.

දක්වන ලද බැවින් සකල ලොක ශිවංකර වූ **දීපංකර** නම් බුදුන්ට ඉක්බිති ව අසංඛ්‍යයක් කප් බුඩශූන්‍ය ව නිබූ කල්හි—

දීපංකරස්ස අපරෙන කොණ්ඩඤ්ඤ නාම නායකෝ,
අනන්ත තෙජෝ අමිත යසෝ අප්පමේය්‍යෝ දුරාසදෙ-සි.

බුඩවංශ පාලියෙහි ආ හෙයින් සාර නම් කල්පයෙක්හි කොණ්ඩඤ්ඤ නම් ශාස්තෘන්වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වී. එයින් ප්‍රථම සන්නිපාතයෙහි කොටිශතසහස්‍රයෙක, දෙවෙනි ශ්‍රාවක සන්නිපාතයෙහි කොටිසහස්‍රයෙක, තෙවෙනි සමාගමයෙහි නවුතිකොටියෙක. එ කල අප මහසත් **විජිතාවි** නම් සක්විති රජක් ව කොටි ශතසහස්‍රයක් රහතන් සමග බුදුපාමොක් මහ සඟනට මහදන් දී ඒ බුදුන් කෙරෙනු ත් බුදුබවට විවරණ ලැබ සක්විතිරජ ය බුදුන්ට පුදු පැවිදි ව පිටකත්‍රය ධාරී ව පඤ්ච නිඥ අෂ්ටසමාපත්තිලාභී ව නොපිරිහුණු ධ්‍යානයෙන් බ්‍රහ්මලොක යෙහි උපන් සේක.

එයින් කිහ - දූරෙනිදානයෙහි

දීපංකරස්ස පන භගවතෝ අපරභාගෙ එකං අසංඛ්‍යෙය්‍යං අතික්කමිත්වා කොණ්ඩඤ්ඤෝ නාම සත්ථා උදපාදි. තස්සාපි තයෝ සාවකසන්නිපාතා අහෙසුං. පඨමසන්නිපාතෙ කොටිසතසහස්සං, දුතියෙ කොටිසහස්සං, තතියෙ නවුතිකොටියෝ. තදා බොධිසත්තෝ විජිතාවි නාම චක්කවත්තී හුත්වා කොටිසතසහස්ස සංඛාතස්ස බුඩප්පමුඛස්ස භික්ඛුසඞ්ඝස්ස මහාදානං අදාසි. සත්ථා බොධිසත්තස්ස බුඩෝ භවිස්සසී'ති ව්‍යාකරිත්වා ධම්මං දෙසෙසි. සෝ සත්ථු ධම්මකථං සුත්වා රජ්ජං නීයාදෙත්වා පබ්බජි. සෝ තීණිපිටකානි උග්ගහෙත්වා අට්ඨසමාපත්තියෝ පඤ්ච ච අභිඤ්ඤායෝ උප්පාදෙත්වා අපරිහීණ ජ්ඣානෝ බ්‍රහ්මලොකෙ නිබ්බත්ති-සි.

ඒ කොණ්ඩඤ්ඤ නම් බුදුන් උපන් නුවර රම්මවතී නම් වෙයි. පිය මහරජානෝ සුනන්ද නම් වෙයි. මව් වූ යේ සුජාතා නම් බිසෝ කෙණෙක. අග්‍රශ්‍රාවක වූයේ භද්‍ර ය සුභද්‍ර ය යන තෙර සඟලෙක. අග්‍ර උපස්ථායක වූයේ ගුණයෙන් සමෘඩ වූ අනුරුද්ධ නම්

මහතෙර කෙණෙක. අග්‍රශ්‍රාවිකා වූයේ තිස්සා ය උපතිස්සා ය යන ථෙරීසහළෙක. ඔබට බොධි වූයේ සාලකල්‍යාණී නම් රුකෙක. ශරීර ප්‍රමාණ ය අට අසූරියනෙක, ඔබගේ ආයු අවුරුදු ලක්‍ෂයෙකි.

එයින් කිහ - දුරෙනිදානයෙහි

කොණ්ඩඤ්ඤස්ස පන බුද්ධස්ස රම්මවතී නාම නගරං, සුනන්දෝ නාම ඛත්තියෝ පිතා, සුජාතා නාම දෙවී මාතා, භද්දෝ ච සුභද්දෝ ච වෙ අග්ගසාවකා, අනුරුද්ධෝ නාම උපඨාකෝ, තිස්සා ච උපතිස්සා ච අග්ගසාවිකා, සාලකල්‍යාණී බොධි, අඨාසීති හත්ථුබේධං සරීරං, වස්සසතසහස්සං ආයුපමානං අහොසි-සි.

ඒ බුදුන් **මඤ්ජර** නම් නුවර දී පිරිනිවන් පා වදාළ සේක. ධාතු තොවිසුරුණු හෙයින් ඒ ධාතු වඩා අටවිසි ගව්වක් උස රන්දගබක් බැඳි පරිදි **චූපවංශාදියෙන්** දතයුතු.

කොණ්ඩඤ්ඤස්ස ච අපරෙන මඞ්ගලෝ නාම නායකෝ,
තෙසම්පි අන්තරා කප්පා ගණනාතෝ අසංඛියා-සි

දක්වන ලද බැවින් **කොණ්ඩඤ්ඤ** නම් සම්බුදුන් වහන්සේට මෑත භාගයෙහි කප් අසංඛ්‍යයක් බුදශූන්‍ය ව තුබූ කල්හි:

කොණ්ඩඤ්ඤස්ස අපරෙන මඞ්ගලෝ නාම නායකෝ,
තමං ලොකෙ නිහන්ත්වාන ධම්මොක්කමහිධාරයි-සි.

දක්වන ලද **මඞ්ගල** නම් සම්බුදුන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඒ මඞ්ගල නම් සම්බුදුන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය. එහි ප්‍රථම ශ්‍රාවක සන්නිපාතයෙහි කොටිශතසහස්‍රයක් භික්‍ෂූන්වහන්සේ ය. ද්විතීය ශ්‍රාවකසන්නිපාත යෙහි කොටිසහස්‍රයෙක් භික්‍ෂූන්වහන්සේ ය. තෘතීය ශ්‍රාවකසන්නි පාතයෙහි නවුතිකොටියක් භික්‍ෂූන්වහන්සේ ය.

කියේ මෑ නෝ - දුරෙනිදානයෙහි:

මඞ්ගලස්ස භගවතෝ තයෝ සාවකසන්නිපාතා අහෙසුං. තෙසු පඨමසන්නිපාතෙ කොටිසතසහස්සං භික්ඛූ අහෙසුං. දුතියෙ කොටිසහස්සං, තතියෙ නවුතිකොටියෝ-සි.

ඒ **මඞ්ගල** නම් සම්බුදුන් වහන්සේගේ ආයුෂ නවුතිසහස්‍ර යෙක. මෙ පමණ කල් මුලුල්ලෙහි චන්ද්‍රසූර්‍යයෝ තම තමන්ගේ ආලෝකයෙන් බබලන්නට අසමර්‍ථ වූවාහු ය. රාත්‍රි දිවාදෙක වෙන සක් නොපෙණෙයි. සදාකාලයෙහි ම සත්ත්වයෝ දහවල් සෙසින් බුඩා ලොකයෙන් ම හැඳිදිති.

සවස පිපෙන මල් ආදියෙන් හා උදය පිපෙන මලින් ද අලුයම් ගඩන කුකුළු ආදීන්ගෙන් ද සත්වයෝ උදය සවස හඳුනති. කිමෙක් ද සෙසු සමීඳුවරයන්ට මෙබඳු ආනුභාවයෙක් නැද් ද? නැත්තේ නොවෙයි. ඒ සමීඳුවරයෝ ද කැමති වූවාහු නම් දස සහශ්‍රී ලෝකධාතුව හෝ එයින් පිටත හෝ ආලෝක පතුරුවන්නට සමර්ථ වෙති. ඒ භගවත්හුගේ වනාහි පූර්ව ප්‍රාර්ථනා වශයෙන් සෙසු බුදුන්ගේ බ්‍යාමප්‍රභාමණ්ඩල ය සෙයින් ශරීර ප්‍රභාව සතත යෙන් ම දසදහසක් සක්වල පැවැත්තේ ය.

කියේ මෑ නෝ - එහි ම:

ආයුප්පමාණං පනස්ස නවුති වස්සසහස්සානි අහොසි. එත්තකං කාලං චන්දසූරියාදයෝ අත්තනෝ පභාය විරොචිතුං නාසක්ඛිංසු. රත්තින්දිව පරිච්ඡේදෝ න පඤ්ඤායිත්ථ. දිවා සූරියාලොකෙන විය සත්තා නිච්චං බුඩ්ඪාලොකෙනෙව විචරිංසු. සායං ප්‍රපඤ්ච කුසුමානං පාතෝ ව රවන සකුණාදීනඤ්ච වසෙන ලොකෝ රත්තින්දිව පරිච්ඡේදං සල්ලක්ඛෙසි. කිම්පන අඤ්ඤසං බුඩ්ඪානං අයමානුභාවෝ නත්ථීති? නෝ නත්ථි. තෙහිපි ආකංඛමානා දසසහස්සි වා ලොකධාතුං තතෝ වා භීයෝ ආභාය ඵරෙය්‍යුං. මඞ්ගලස්ස පන භගවතෝ පුබ්බ පත්ථනාවසෙන අඤ්ඤසං බ්‍යාමප්පභා විය සරීර පභා නිච්චමෙව දසසහස්සි ලොකධාතුං ඵරිත්වා අට්ඨාසි.

මේ කවර කුසලයකින් ද යි යත හොත්? ඒ සමීඳුයන් වහන්සේ වනාහි බොධිසත්ව කාලයෙහි අප බුදුන්ගේ වෙසතුරු අත් බැව් වැනි ආත්මභාවයෙක්හි සිට සපුත්‍රදාර ව වංකපබ්බත ය වැනි පර්වතයක වසන සේක් ඉක්බිත්තෙත් **ඛරදාඨික** නම් යක්ෂ යෙක් බෝසත්හුගේ දානඛ්‍යාස ය අසා බ්‍රාහ්මණ වේසයකින් අවුත් දෙදරුවන් ඉල් වූ හෙයින් සතුටු වූ සිත් ඇති ව උදක පර්‍යන්ත වූ පෘථිවි ය කම්පා කරවමින් දෙදරුවන් ම දන්දුන් සේක.

ඒ දරුවන් යක්ෂතෙමේ සක්මන් කෙළවර ආලම්බන ඵලක ය නිසා සිට මහසත්ව බලාසිටියදී ම මූල කලාපයක් සෙයින් අනුභව කෙළේ ය.

ඔහුගේ මුඛයෙන් ගිනිදැල් සෙයින් නික්මෙමින් වැගිරෙන ලේ ධාරා දැක ත් කෙසගක් පමණක් දෙම්හස් නො උපදවා මා විසින් දෙන ලද දාන ය ඉතා යහපතැ යි සතුටු ව ප්‍රීති සොම්නස් උපදවා මේ කුසල බලයෙන් අනාගතයෙහි මොහුගේ මුඛයෙන්

නික්මෙන ලේ ධාරා සෙයින් මාගේ ශරීරයෙන් රත්වන්රැස් නික් මේවා සි ප්‍රාර්ථනා කළ සේක. ඒ ප්‍රාර්ථනා බලයෙන් බුඩහුත වූ ඒ සම්බුදුයන් වහන්සේගේ ශරීරයෙන් රශ්මීන් විහිද මෙ පමණ තැන් පැවැත්තේ ය.

එයින් කිහ – දූරෙනිදානයෙහි:

සෝ කිර බොධිසත්තචරියකාලෙ වෙස්සන්තර සදිසෙ අත්ත භාවෙ ඨිතෝ සපුත්තදාරෝ වංකපබ්බතසදිසෙ පබ්භතෙ වසි. අථෙකෝ ඛරදාඨිකෝ නාම යක්ඛෝ මහාපුරිසස්ස දානජ්ඣාස යතං සුත්වා බ්‍රාහ්මණවණ්ණෙන උපසඞ්කමිත්වා මහාසත්තං දෙව දූරතෙ යාව මහාසත්තෙනා දදමි බ්‍රාහ්මණස්ස පුත්තකෙ'ති හත්ථ පාදෙ උදකපරියන්තං පථවිං කම්පෙන්තෝ දෙවපි දූරතෙ අදාසි. යක්ඛෝ චංකමණකොටියං ආලම්බනඵලකං නිස්සාය ඨත්වා පස්ස න්තස්සෙව මහාසත්තස්ස මූලකලාපෙ විය දූරතෙ ඛාදි.

මහාපුරිසස්ස යක්ඛං ඔලොකෙත්වා මුඛෙ විවටමත්තෙ අග්ගි ජාලං විය ලොහිතධාරං උග්ගිරමානං තස්ස මුඛං දිස්වාපි කෙසග්ග මත්තම්පි දෙමනස්සං න උප්පජ්ජි. සුදිත්තං වත මෙ දානන්ති චින්ත යතෝ පනස්ස සරිරෙ මහන්තං පීතිසොමනස්සං උදපාදි. සෝ ඉමස්ස මෙ නිස්සන්දෙන අනාගතෙ ඉමිනාව නීහාරෙන රංසියෝ නික්ඛමන්තූති පත්ථනං අකාසි. තස්ස තං පත්ථනං නිස්සාය බුද්ධ භූතස්ස සරීරතෝ රංසියෝ නික්ඛමිත්වා එත්තකං ඨානං ඵරිංසු-සි.

අනික්ඛුත් ප්‍රාර්ථනාවකුත් ඇත. ඒ බොධිසත්වයන් වහන්සේ බොධිසත්ව කාලයෙහි එක් බුදුකෙණෙකුන්ගේ චෛත්‍යයක් දැක මේ බුදුන්ට මා විසින් ජීවිත පරිත්‍යාග කටයුතු ය සි සිතා දණ්ඩදීපික වෙඨන ය නියායෙන් සකල ශරීර ය වෙලා ලක්ෂයක් වටනා ඝනරන්තලියක සුවඳ තෙල් පුරා එහි දහසක් පහන් වැටි දල්වා හිසින් ගෙණ සකල ශරීර ය එක් දණ්ඩදීපික නම් ප්‍රදීපයක් සෙයින් එකජ්වාලා ව හවුළුවා ගෙණ චෛත්‍ය ය ප්‍රදක්ෂිණා කරණ සේක්, සකල රාත්‍රි ය ඉක්ම වූ සේක.

මෙසේ යාවත් අරුණෝදගමන ය දක්වා ව්‍යායාම කරන්නාවූ ඒ බෝසතුන්ගේ ලෝමකූපමාත්‍රයකට ද උෂ්ණයක් නොවූයේ ය. පියුම්ගැබකට ප්‍රවිෂ්ටවූවක්හු සෙයින් වූයේ ය. ඒ එසේ මැසි. මේ ධර්ම ය තෙමේ රක්කාහු තමා රකී.

එසින් වදළහ බුදුහු:

ධම්මෝ හවෙ රක්ඛති ධම්මචාරී ධම්මෝ සුචිණ්ණෝ සුඛමාවහාති,
එසානිසංසෝ ධම්මෙ සුචිණ්ණෙ න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී.

මේ කුසල බලයෙනු දු ඒ භාග්‍යවත් වූ සම්බුදුරජාණන්වහන්සේගේ ශරීරාලෝක ය දසදහසක් සක්වල පැවැත්තේ ය.

නෙ ද කියේ මැ නෝ:

ඉමස්සාපි කම්මස්ස නිස්සන්දෙන තස්ස භගවතෝ සරීරෝ භාසෝ දසසහස්සී ලොකධාතුං ඵරිත්වා අට්ඨාසි.

එ සමයෙහි අප මහසත් තෙමේ සුරුචි නම් බ්‍රාහ්මණයෙක් ව ඉපද බුදුන් නිමන්ත්‍රණ ය කොට දන්දෙමි සි, බුදුන් කරා එළඹ මධුර ධම් කථා අසා සඝාමීන්වහන්සේ සෙට මාගෙන් භික්ෂාව ගත මැනවැ සි ආරාධනා කළ සේක. එ කල සම්බුදුරජාණන් වහන්සේ බ්‍රාහ්මණයෙනි! කොපමණ භික්ෂූන්ගෙන් ප්‍රයෝජන දැ සි? විචාරා වදළ සේක. ඒ ඇසූ අප මහසත් සඝාමීන්වහන්ස! ඔබගේ පරිවාර භික්ෂූන් වහන්සේ කෙතෙක් දැසි? විචාළේ ය. ඒ කාලයට සම්බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ශ්‍රාවකසන්නිපාත ය පමණක් ම ය. එසේ නෙසින් කොටිශතසහස්‍රයෙකැසි වදළ සේක.

ඒ අසා බෝසතානෝ සඝාමීනි හැමිදෙනාවහන්සේ සමග මාගෙන් භික්ෂාව ගෙණ වදාරණසේක්ව සි ආරාධනා කළ සේක. මංගල නම් සම්බුදුරජාණන් වහන්සේ ද මුවෙන් නොබැණ ඉවසා වදළ සේක. බෝසතානෝ සෙට දවසට ආරාධනාකොට ගෙට යහ සේක් මෙසේ සිතූ සේක. මම මෙ පමණ භික්ෂූන් වහන්සේට දන් දෙන්නට අසමර්ථ නො වෙමි. වැඩ ඉන්නට සුදුසු ස්ථානයක් වතාහි කෙසේ වේ දැයි සිතූ සේක.

බෝසතානන්ගේ චින්තාබලයෙන් චතුරාශීති යෝජනසහස්‍ර යෙකින් මන්තෙහි සිටි සක්දෙවි රජහුගේ පාණ්ඩුකම්බලශෛලා සන ය හුණු වී ය. ශක්‍රදිව්‍යරාජතෙමේ ඒ දැක කාමාතුරයෝ කාම යෙන් පිරිහීමට නොකැමැති බැවින් සැක ඇති ව කවරෙක් මාගේ සම්පත් හැරගණී දෝ හෝ සි දිවසින් බලනුයේ මහබෝසතුන් දැක සුරුචිබ්‍රාහ්මණයෝ බුදුපාමොක් මහසඟහට නිමන්ත්‍රණ ය කොට නිසීදනස්ථානයක් කැමති ව සිතති. මාවිසිනු දු එතැන්හි ගොස් කුසල කොඨාශයක් ගත මැනව සි සිතා වඩු වෙසක් නිර්මිත

කොට ගෙන වැ පොරෝ ගත් අත් ඇති ව මහබෝසත්හුගේ ඉදිරියෙහි ප්‍රාදුර්භූත ව බැළ පිණිස කරවන මෙහෙයක් කවරක්හුගේ ඇද්දැයි? විවාළේ ය.

මහාපුරුෂයානෝ ඒ දැක කම්මාන්තයක් දන්නෙහි දැයි? විවාළෝ ය. වඩුවෙස් ගත් ශක්‍රයෝ මම නොදන්න ශිල්පයෙක් නම් නැත. ගෙයක් හෝ මණ්ඩපයක් හෝ යමෙක් කරවා නම් ඒ කරන්නට සමර්ථයෙමි යි කිහ. එසේ වී නම් මාගේ කම්මාන්තයෙක්ද ඇතැ යි කී කල්හි කවර කම්මාන්තයෙක්ද යි විවාළ හෙයින් සෙට දවස දන් දෙන පිණිස බුදුපාමොක් මහසඟනට ආරාධනා කෙළෙමි. රට සුදුසු මණ්ඩපයක් කරන්නෙහි දැ යි විවාළේ ය.

මණ්ඩපයක් මම කරමි. බැළදෙන්නට සමර්ථයෙහි දැ යි? කී හෙයින් බැළදෙන්නට සමර්ථයෙමි යි මණ්ඩප ය කරව යි බොධි සත්වයෝ කිකල්හි යහපතැ යි කියා ගොස් ශක්‍රයෝ එක් භූමි ප්‍රදෙශයක් බැලූ ය. දෙළොස් තෙළෙස් යොදුන් පමණ භූමි ප්‍රදෙශ ය කිසුණුමණ්ඩලයක් මෙන් සමතල වූයේ ය. සක්දෙව් රජතෙම මෙ පමණ භූමියෙහි සපා රත්නමය මණ්ඩපයෙක් පොළොව පලා ගෙණ නැගේව යි සිතා බැලූ ය. එකෙණෙහි ම මහ පොළොව බිඳ ගෙණ මණ්ඩප ය පැන නැංගේ ය.

එසින් කිහ

තදා අමහාකං බොධිසත්තෙනා සුරුචි නාම බ්‍රාහමණෝ හුත්වා සත්ථාරං නිමන්තෙසසාමීති, උපසඞ්කමිත්වා මධුර ධම්මකථං සුත්වා සෙව මයහං භික්ඛං ගණ්හථ භන්තෙති ආහ. බ්‍රාහමණ! කිත්තකෙහි තෙ භික්ඛූහි අත්ථොති? කිත්තකා පන වො භන්තෙ පරිවාරභික්ඛූනි? ආහ. තදා සත්ථු පඨමසන්නිපාතොයෙව හොති කොටිසතසහසසං, තසමා කොටිසතසහසසන්ති ආහ භන්තෙ සබ්බෙහිපි සද්ධිං මයහං ගෙහෙ භික්ඛං ගණ්හථා'ති සත්ථා අධිවාසෙසි. බ්‍රාහමණෝ සත්ථා තනාය නිමන්තෙත්වා ගෙහං ගච්ඡන්තෙ විත්තෙසි. අහං එත්තකානං භික්ඛූනං යාගුභත්තවත්ථාදීනි දාතුං නො න සක්කොමි. නිසීදනට්ඨානං පන කථං භවිසසති'නි?

තසස සා චින්තා චතුරාසීති යොජන සහසසමත්ථකෙ සිතසස දෙවරඤ්ඤො පණ්ඩුකම්බලසිලාසනසස උණ්හභාවං ජනෙසි සක්කො නු ඛො මං ඉමසමා ඨානා චාවෙතුකාමෝ'ති දිබ්බචක්ඛුනා ඔලොකෙන්තො මහාපුරිසං දිසවා සුරුචිබ්‍රාහමණෙ බුද්ධපමුඛං

භික්ඛූසංඝං නිමන්තෙත්වා නිසීදනට්ඨානත්ථාය විනෙතති. මයාපි තත්ථ ගන්ත්වා පුඤ්ඤකොඨාසං ගහෙතුං වට්ටතී'ති වඩ්ඪකිවණ්ණං නිම්මිනිත්වා වාසි ඵරසු ගහෙත්වා මහාසත්තස්ස පුරතෝ පාතුරහොසි. අත්ථි නු ඛෝ කස්සචි හත්ථියා කත්තබ්බන්ති? ආහ.

මහාපුරිසෝ දිස්වා භිංකම්මං කරිස්සතීති ආහ. මම අජානන සිප්පං නාම නත්ථි. ගෙහං වා මණ්ඩපං වා යෝ යං කාරෙති...තස්ස තං කාතුං ජානාමී'ති. තෙන හි මයාහං කම්මං අත්ථි. කිං අය්‍යෙති? සත්තානාය මේ කොටිසතසහස්ස භික්ඛූ නිමන්නිතා, තෙසං නිසීදන මණ්ඩපං කරිස්සසී'ති.

අහං නාම කරෙය්‍යං, සචෙ මේ හත්ථිං දාතුං සක්ඛිස්සථා'ති? සක්ඛිස්සාමි තතා'ති. සාධු කරිස්සාමී'ති ගන්ත්වා එකං පදෙසං ඔලොකෙසි. අඩ්ඪුඩ්ඩස තෙරස යොජනප්පමාණෙ පදෙසෙ කසිණමණ්ඩලං විය සමතලෙ අහොසි. සෙ එත්තකෙ ඨානෙ සත්තරතනමයෙ මණ්ඩපෙ උට්ඨහතූති, විනෙත්වා ඔලොකෙසි. තාවදෙව පඨවිං භින්දිත්වා මණ්ඩපෙ උට්ඨහි-සි.

දූරෙනිදානයෙහි කී ක්‍රමයෙන් සක්දෙව්රජ දිව්‍යානුභාවයෙන් සත්රුවන් කම්මතාදියෙන් මණ්ඩප ය විසිතුරුකොට සරහා බොධි සත්වයන් කරා එලඹ බ්‍රාහ්මණයෙනි! තොපගේ මණ්ඩප ය බලා මට බැළ දෙව යි කී හෙයින් මහසත් මණ්ඩප ය සමීපයට ගොස් බලා සකලශරීර ය පස්වනක් ප්‍රීතියෙන් පිරී ගොස් මේ මණ්ඩප ය මිනිසකු විසින් කරණ ලද්දේ නො වෙයි. මාගේ අධ්‍යාස ය මාගේ ගුණ ය නිසා පඬුපුල්සල අස්න හුණුවූවා දුටු සක්දෙව්රජහු විසින් මේ මණ්ඩප ය කරවණ ලද යි සිතා මෙබඳු මණ්ඩපයෙහි එක්දව සක් ම දන් දෙන්නට සුදුසු නොවෙයි. සත්දවසක් දන්දෙමි යි සිතූ සේක.

ඒ එසේ ම ය ඇස් ඉස් මස් ලේ ආදි ය දන් දී ත් දුන යෙහි තෘප්තියකට නො පැමිණෙන බෝසත්හු කෙසේ නම් බාහිර වස්තු දන්දී තෘප්තියකට පැමිණෙද්ද? හෙ ද එසේ ම ය. අපමහ බෝසතාණෝ සිව් ජාතකයෙහි දවස පහමුණක් කාවණ්ණ විස්සජ්ජන ය කොට සතර වහසල් දොර ද නුවර මධ්‍යයෙහි ද දානශාලා කරවා දන්දෙන්නාහට ඒ දානය පවා බොධිසත්වයන්ගේ සිත - ඒ කළ ත්‍යාග ය ඇතැ යි කියා සතුටුකරවන්නට නොහැකි වූ යේ යි. යම් දවසෙක සක්දෙව් රජහු අවුත් තමාගේ දානසක් නෙත් ඇත් ත්

ඒ මද ව ඉල්වන්නක් දේ හෝ නොහොත් බෝසතුන් විමසන පිණිස දේ හෝ නොහොත් ඒ මසැස සමා ගෙණ පසැස් බෝස තුන්ට දෙන පිණිස දේ බෝසතුන්ගේ නෙත්‍ර ය ඉල්වි ය. එ කල නෙත්‍ර යුග්ම ය උපුටා දන් දුන් කල ම සිත සතුටු වි ය. කෙස ගක් පමණකුත් සිත අන්‍යථාභවයකට නො පැමුණුනේ ය.

මෙසේ දන් දෙමින් බොධිසත්ත්වයන්ගේ සිත භාජනියකට නො පැමිණෙන්නේ ය. ඒ කාරණයෙන් බොධිසත්ත්වයන් වහන්සේ ද එක් දවසක් දන් දෙන්නට කළ ආරම්භයෙන් නො සතුටු ව සත් දවසක් මුලුල්ලෙහි කොටිශතසහස්‍රයක් භික්ෂූන් වහන්සේ හා සමග බුදුන්ට දන්දෙමි සි සිතා **ගවපාන** නම් දානයක් දන් දුන් සේක.

එසින් කිහ

අම්හාකම්පි හි බොධිසත්තස්ස සිවිජාතකෙ දෙවසිකං පඤ්ච කාහාපණමමණානි විස්සජ්ජෙත්වා චතූසු වාරෙසු මජ්ඣිම නගරෙ දානං දෙන්තස්ස තං දානා වාගතණ්හිං උප්පාදෙතුං නාසක්ඛි. යදා පනස්ස බ්‍රාහ්මණවණ්ණෙන ආගන්ත්වා සක්කො දෙවරාජා අක්ඛීනි යාචි. තදා කානි උප්පාටෙත්වා දදමානස්සෙව හාසො උප්පජ්ජි කෙසඤ්ඤමත්තම්පි චිත්තං අඤ්ඤථත්තං නාහොසි. එවං දානං නිස්සාය බොධිසත්තානං කිත්ති නාම නත්ථි. තස්මා සො මහාපුරිසො සත්තාහං මයා කොටි සතසහස්ස සංඛාතං භික්ඛූනං දානං දත්වා වට්ටතී'ති විනෙත්වා තස්මිං මණ්ඩපෙ නිසීදාපෙත්වා සත්තාහං ගවපානං නාම දානං අදාසි-සි.

කෙළවර දිනයෙහි හැමදෙනා වහන්සේගේ ම පාත්‍රා සෝදවා බෙහෙත් පිණිස සපි නවනීත මධු ඵාණිතාදීන් පුරවා තුන් සිවුරු හා සමග දුන් සේක. අලුත මහණ වූ සංඝනවක භික්ෂූන් වහන්සේට දුන් සිවුරු පිරිකර ලක්ෂයක් වටනේ ය.

එසින් කිහ

පරියොසාන දිවසෙ සබ්බනික්ඛූනං පත්තානි ධොවාපෙත්වා හෙසජ්ජත්ථාය සපිං නවනීත මධු ඵාණිතාදීනි පූරෙත්වා නිච්චරෙහි සද්ධිං අදාසි. සඞ්ඝනවක භික්ඛුනා ලද්ධ චීවරසාටකා සතසහස්ස ග්ඝනකා අහෙසුං-සි.

මඞ්ගල නම් සම්බුදුන් වහන්සේ ද අනුමෙවෙනි බණ වදාරණ සේක් මේ පුරාණ තෙමේ මෙබඳු මහා දානයක් දුන්නේ ය. කිමෙක් වේ දේ හෝ සි බලා වදාරා අනාගතයෙහි දෙයාසංඛ්‍ය

කල්පලක්‍ෂයකින් මත්තෙහි ගෞතම නම් බුදුවෙති යි දැක බොධිසත්ව යන්ට ආමන්ත්‍රණ ය කොට එම්බා බ්‍රාහ්මණයෙනි! තෙපි මේ පමණ කාලයක් අනික්‍රාන්තකොට ගෞතම නම් බුදුවෙති යි විවරණ දෙවා වදාළ සේක. මහාපුරුෂයාතෝ විවරණ ලැබ මම වනාහි බුදුවෙම් ල, මට ගිහිගෙන් ප්‍රයෝජන කවරේ ද? පැවිදිවෙමි යි සිතා එබදු සම්පත් අලුයම් දැමූ කෙල පිඬක් මෙන් හැර බුදුන් කෙරෙහි පැවිදි ව ත්‍රිපිටක බුද්ධවචන ය ඉගෙණ පඤ්චාභිඥ අෂ්ටසමාපත්ති උපදවා ආයු කෙළවර බ්‍රහ්මලොකයෙහි උපන් සේක.

කියේ මෑ නෝ

සත්ථා අනුමෝදනං කරොන්තො අයං පුරිසො එවරූපං මහා දානං අදාසි. කො නු ඛො භවිස්සති' ති උපධාරයන්තො අනාගතෙ කපසතසහස්සාධිකානං දවිත්‍යාං අසංඛෙය්‍යානං මත්ථකෙ ගොතමො නාම බුද්ධො භවිස්සති'නි දිස්වා මහාපුරිසං ආමන්තෙත්වා ඉමං එත්තකං නාම කාලං අතික්කමිත්වා ගොතමො නාම බුද්ධො භවිස්ස තී'ති ව්‍යාකාසි.

මහාපුරිසො ව්‍යාකරණං සුත්වා අහං කිර බුද්ධො භවිස්සාමි, කො මෙ කරාවාසෙන අත්ථො පබ්බජිස්සාමී'ති විත්තෙත්වා තථාරූපං සම්පත්තිං බෙලපිණ්ඩං විය පහාය සත්ථු සන්තිකෙ පබ්බජිත්වා බුද්ධ වචනං උග්ගහෙත්වා අභිඤ්ඤා ච සමාපත්තියො ච නිබ්බත්තෙත්වා ආයු පරියොසානෙ බ්‍රහ්මලොකෙ නිබ්බත්ති-සි.

ඒ මඞ්ගල නම් සම්බුදුයන් වහන්සේ උපන් නුවර උත්තර නම් වෙයි. පිය මහරජානෝ ද උත්තර නම් වෙයි. මාතා බිසවි ද උත්තරා නම් වෙති. අග්‍රශ්‍රාවක වූයේ සුදෙව ය ධම්මසේන ය යන ශ්‍රාවක සඟළෙක. අග්‍රොපස්ථායක වූයේ පාලිත නම් තෙරකෙණෙක. අග්‍ර ශ්‍රාවිකා වූයේ සීවලී ය අසොකා ය යන ශ්‍රාවිකා සඟලෙක. බොධි වූයේ නාගවෘක්‍ෂයෙක. බුද්ධශරීර ය අටාසූරියතෙක. අනූ දහසක් අවුරුදු වැඩ සිට පිරිනිවි කල්හි වනාහි එක පහරින් ම දසදහසක් සක්වල එකාන්ධකාර වි ය. සකල චක්‍රවාලයෙහි මනුෂ්‍ය යන්ගේ මහත් හැඬිම් වැලපිම් ආදිය වූයේ ය.

එසින් කිහ

මඞ්ගලස්ස පන භගවතො නගරං උත්තරං නාම අහොසි. පිතා'පි උත්තරො නාම ඛත්තියො, මාතාපි උත්තරා නාම, සුදෙවො ච ධම්මසෙනො ච දෙ අග්ගසාවකා, පාලිතො නාම උපට්ඨාකො,

සිවලි ච අසෝකා ච දෙව අග්ග සාවිකා. නාගරුක්ඛා බොධි, අට්ඨාසිති හත්ථිබෙබධං සරිරං අහොසි. නවුතිවස්සසහස්සානි ඨත්වා පරිනිබ්බුතෙ පන තස්මිං එකපපහාරෙනෙව දසචක්කවාළසහස්සානි එකන්ධ කාරානි අහෙසුං. සබ්බචක්කවාළෙසු මනුස්සානං මහන්තං ආරොදන පරිදෙවනං අහොසි-සි.

ඒ **මඞ්ගල** නම් සම්බුදුරජාණන් වහන්සේට මෑත භාග‍යෙහි එ ම කල්පයෙහි ම දෙවන අතුරුකප--

මංගලස්ස අපරෙන සුමනො නාම නායකො,
සබ්බධම්මෙසු අසමො සබ්බසත්තානා මුත්තමො-සි.

යනු හෙයින් **සුමන** නම් සම්බුදුරජාණන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේට ද ත්‍රිවිධශ්‍රාවක සන් නිපාතයෙක් වූයේ ය. එහි ප්‍රථම සන්නිපාතයෙහි කොටිශතසහස්‍ර යෙක. දෙවෙනි කඤ්චන පර්වතයෙහි දී නවුතිකොටිශතසහස්‍රයෙක. තුන්වෙනි ව අශීති කොටිශතසහස්‍රයෙක එ කල අපමණ බෝස තානෝ මහත් සෘඩි මහානුභාව ඇති **අතුල** නම් නාගරාජයන් ව ඉපද බුදුන් ලොව උපන් සේකැ යි යනු අසා සැතිසමූහයා පිරිවරා නාග භවනයෙන් නික්ම කොටිශතසහස්‍රයක් භික්ෂූන් පිරිවරකොට ඇති ඒ සම්බුදුරජාණන් වහන්සේට දිව්‍යතූර්‍යයෙන් උපහාර කොට මහදන් දී හැම්දෙනා වහන්සේට ම දිවසළු සඟළ සඟළ බැගින් පිළිගන්වා සරණයෙහි පිහිටා ඒ බුදුන් කෙරෙහි දු අනාගතයෙහි බුදුවෙති යි විවරණ ලැබූ සේක.

ඒ **සුමන** නම් බුදුන් උපන් නුවර ක්‍ෂෙම නම් වෙයි. පිය මහරජානෝ සුදත්ත නම් ක්‍ෂත්‍රිය රජෙක. මව් වූයේ සිරිමා නම් බිසෝ කෙණෙක. අග්‍රශ්‍රාවක වූයේ සරණ ය භාවිතත්ත ඝ යන තෙර සඟළෙක. අග්‍රොපස්ථායක වූයේ උදෙන නම් මහතෙර කෙණෙක. අග්‍රශ්‍රාවිකා වූයේ සොනා ය උපසොනා ය යන ශ්‍රාවිකා යුගළයෙක බෝධි වූයේ නාගවෘක්ෂයෙක් ම ය. බුබ්ඛරීර ය අනූ රියනෙක අනූ දහසක් අඩිරාදෑ වැඩ සිට පිරිනිවන් පෑ වදාළ සේක.

එසින් කිහ

තස්ස භගවතො අපරභාගෙ සුමනො නාම සත්ථා උදපාදි. තස්සා'පි තයො සාවකසන්නිපාතා, පඨම සන්නිපාතෙ කොටිසත සහස්සං භික්ඛූ අහෙසුං. දුතියෙ කඤ්චනපබ්බතමහි නවුතිකොටි සහස්සානි, තතියෙ අසීතිකොටිසතසහස්සානි. තදා මහා

සත්තෝ අතුලෝ නාම නාගරාජා අහොසි මහිද්ධිකෝ මහානුභාවෝ. සෝ බුද්ධෝ උප්පන්නෝ'ති සුත්වා සඤ්ඤතිසංඝ පරිවුතෝ නාගභවනා නික්ඛමිත්වා කොටිසතසහස්ස භික්ඛුපරිවාරස්ස තස්ස භගවතෝ දිබ්බතූරියෙහි උපහාරං කත්වා මහාදානං දත්වා පවෙච්ඡං දුස්ස යුගානි දත්වා සරණේසු පතිට්ඨාසි. සෝ'පි නං සත්ථා අනාගතෙ බුද්ධෝ භවිස්සසී'ති ව්‍යාකාසි.

තස්ස භගවතෝ නගරං ඛෙමං නාම අහොසි. සුදත්තෝ නාම රාජා පිතා, සිරිමා නාම මාතා, සරණෝ ච භාවිතත්තෝ ච අග්ගසාවකා, උදෙනෝ නාම්පට්ඨාකෝ. සෝතා ච උපසෝතා ච අග්ගසාවිකා, නාගරුක්ඛෝ බෝධි, නවුතිහත්ථුබ්බෙධං සරීරං, නවුති යෙව වස්සසහස්සානි ආයුප්පමාණං අහොසි-සි.

ඒ **සුමන** නම් සම්බුදුන් වහන්සේට මැතභාගයෙහි එ ම කල්පයෙහි තුන්වෙනි අතුරුකප:

සුමනස්ස අපරෙන රෙවතෝ නාම නායකෝ,
අනූපමෝ අසදිසෝ අතුලෝ උත්තමෝ ජිනෝ-සි.

යනු හෙයින් **රෙවත** නම් සම්බුදුන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඒ සම්බුදුන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන් නිපාතයෙක් වූයේ ය. එහි ප්‍රථම සන්නිපාතයෙහි ගණනෙක් නම් නැත්තේ ය. දෙවෙනි ශ්‍රාවක සන්නිපාතයෙහි කොටිශතසහස්‍රයක් භික්ෂූන් වහන්සේ ය. තුන්වෙනි සන්නිපාතයෙහි ත්. එ පමණ භික්ෂූන් වහන්සේ ය. එ කල මහබෝසතානෝ අත්‍යුදර ගුණ ඇති **අතිදෙව** නම් බ්‍රාහ්මණයෙක් ව ඉපිද බුදුන් කෙරෙන් බණ අසා සරණයෙහි පිහිටා දෙහොත්මුදුන් දී සිට ඒ බුදුන්ගේ කෙලස ප්‍රහාණයෙහි ගුණ වර්ණනාකොට උත්තරාසඞ්ගයෙන් පූජාකළ සේක.

ඒ **රෙවත** නම් සම්බුදුන් වහන්සේ උපන් නුවර ධඤ්ඤවතී නම් වෙයි. පිය මහරජානෝ විපුල නම් ක්ෂත්‍රිය රජෙක. මව් වූයේ විපුලා නම් ක්ෂත්‍රිය බිසෝ කෙණෙක. අග්‍රශ්‍රාවක වූයේ වරුණ ය බ්‍රහ්මදෙව ය යන ශ්‍රාවක යුගළයෙක. අග්‍රොපට්ඨායක වූයේ භව ය භින්නාකළ සම්භව නම් මහතෙර කෙණෙක. අග්‍රශ්‍රාවිකා වූයේ භද්‍රා ය සුභද්‍රා ය යන ශ්‍රාවිකා යුගළයෙක. බොධි වූයේ නාග නම් බොධිවෘක්ෂයෙක් ම ය. බුඩශරීර ය අසූරියයෙක. සැට දහසක් අවුරුදු ලෝවැඩකොට පිරිනිවි සේක.

එයින් කිහ

තස්ස අපරභාගෙ රෙවතො නාම සත්ථා උදපාදි. තස්සා'පි තයො සාවකසන්නිපාතා, පඨමසන්නිපාතෙ ගණනා නාම නත්ථි. දුතියෙ කොටිසතසහස්ස භික්ඛූ අහෙසුං. තථා තතියෙ, තදා බොධි සත්තො අතිදෙවො නාම බ්‍රාහ්මණො හුත්වා සත්ථු ධම්මදෙසනං සුත්වා සරණෙසු පතිඨාය සිරසි අඤ්ජලිං ඨපෙත්වා තස්ස සත්ථුනො කිලෙසපහාණෙ වණ්ණං වත්වා උත්තරාසඞ්ගෙන පූජං අකාසි. සෝ'පි නං බුද්ධො භවිස්සසී'ති ව්‍යාකාසි. තස්ස පන භගවතො නගරං ඛේමවතී නාම අහොසි. පිතා විපුලො නාම ඛත්තියො, මාතා විපුලා නාම, වරුණො ච බ්‍රහ්මදෙවො ච අග්ගසාවකා, සම්භවො නාම උපට්ඨාකො, භද්‍රා ච සුභද්‍රා ච අග්ගසාවිකා, නාගරුක්ඛො ච බොධි, සරීරං අසීති හත්ථුබ්බෙධං අහොසි. ආයුං සට්ඨිවස්ස සහස්සානි-සි.

ඒ **රෙවත** නම් සම්බුදුරජාණන් වහන්සේට මැතභාගයෙහි එම කල්පයෙහි සතරවන අතුරු කප:

රෙවතස්ස අපරෙන සොභිතො නාම නායකො,
සමාහිතො සන්තචිත්තෙනා අසමො අප්පටි පුග්ගලො-සි.

යනු යෙසින් මාරජිතකර වූ **සොභිත** නම් සම්බුදුරජාණන්වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඔබට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය. එහි ප්‍රථම සන්නිපාතයෙහි. කෙළසියයක් භික්ෂූන් වහන්සේ ය. දෙවෙනි සන්නිපාතයෙහි අනූකෙළක, තුන්වෙනි සන්නිපාතයෙහි අසූකෙළක, ඒ සමයෙහි අපමඛබෝසතා නෝ **අජිත** නම් බ්‍රාහ්මණයෙක් ව බුදුන්කෙරෙන් බණ අසා සරණ යෙහි පිහිටා බුදුපාමොක් මහසඟනට මහදන් දුන් සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේ ද බොධිසත්වයන්ට මතු බුදු වෙති සි විවරණ දෙවා වදාළ සේක.

ඒ සම්බුදුරජාණන් වහන්සේ උපන් නුවර සුධම්ම නම් වෙයි. පියමහරජානො සුධම්ම නම් වෙති. මෑනි වූයේ ද සුධම්මා නම් බිසෝ කෙණෙක. අග්‍රශ්‍රාවක වූයේ අසම ය සුනෙත්‍ර ය යන තෙර සඟ ළෙක අග්‍රොපස්ථායක වූ යේ අනොම නම් මහතෙර කෙණෙක. අග්‍රශ්‍රාවිකා වූයේ නකුලා ය සුජාතා ය යන ශ්‍රාවිකා සඟළෙක. ඔබට ද බොධි වූයේ නාගවෘක්ෂයෙක් ම ය. බුබශරීර ය අටපණස් රියනෙක, අනූදහසක් අවුරුදු ලොකාභිවෘඩ්ධියට පිරිනිවිසේක

කියේ මෑ නෝ.

තස්ස අපරභාගෙ සොභිතො නාම සත්ථා උදපාදි. තස්සා'පි තයො සාවක සන්නිපාතා, පඨම සන්නිපාතෙ කොටිසතං භික්ඛූ අහෙසුං. දුතියෙ නවුතිකොටියො, තතියෙ අසිති කොටියො, තදා බොධිසත්තො අජ්ජතො නාම බ්‍රාහ්මණො හුත්වා සද්ධම්ම දෙසනං සුත්වා සරණෙසු පතිට්ඨාය බුබ පමුඛස්ස භික්ඛු සංඝස්ස මහා දානං අදාසි, සො'පි තං බුඩ්ඩො භවිස්සසී'ති ව්‍යාකාසි. තස්ස පන භගවතො නගරං සුධම්මං නාම අහොසි. පිතා සුධමෙමා නාම රාජා, මාතා'පි සුධම්මා නාම අසමෝ ව සුනෙත්තො ව අග්ග සාවකා, අනොමෝ නාම, උපට්ඨාකො, නකුලා ව සුජාතා ව අග්ගසා විකා, නාගරුක්ඛා ව බොධි, අට්ඨපණ්ණාස හත්ථුබ්බෙධං සරීරං අහොසි. නවුතිවස්සසහස්සානි ආයුප්පමාණං—සී.

ඒ **සොභිත** නම් සම්බුදුරජාණන් වහන්සේ ගෙන් මෑත භාග‍යෙහි කල්ප අසංඛ්‍යයක් බුද්ධශූන්‍ය ව තුබුයේ ය.

හෙ ද දක්වන ලද මැයි.

සොභිතස්ස අපරෙන අනොමදස්සී මහායසො,
තෙස'ම්පි අනන්තරා සපුරා ගණනාතො අසංඛියා—සී.

නැවත

සොභිතස්ස අපරෙන සම්බුඩ්ඩො දිපදුත්තමෙ,
අනොමදස්සී අමිත යසෙ තෙජසී දුරතික්කමා—සී.

යනු හෙයින් **අනොමදස්සී** නම් සම්බුදුරජාණන් වහන්සේ ලෝක යෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය. එහි ප්‍රථම ශ්‍රාවක සන්නිපාතයෙහි අට ලක්ෂයක් භික්ෂූන් වහන්සේ.ය දෙවෙනි ව සත්ලක්ෂයක් භික්ෂූන් වහන්සේ ය. තුන් වෙනි ව සලක්ෂයක් භික්ෂූන් වහන්සේ ය. එ කල අප මහසත්හු මහානුභාව ඇති මහත් ඍද්ධි ඇති අනෙක කොටි ශතසහස්‍රයක් යක්ෂයන්ට අධිපති එක් **යක්ෂසෙනාධිපති**යෙක් ව ඉපද බුදුන් උපන් සේකැ සි යනු අසා බුදුන් කරා එළඹ බුදුපා මොක් මහ සඟනට මහ දන් දී ඒ බුදුන් කෙරෙනු දු අනාගතයෙහි බුදු වෙති සි, විවරණ ලත් සේක.

ඒ අනොමදස්සී නම් බුදුන් උපන් නුවර චන්ද්‍රවතී නම් වෙයි. පිය මහරජානෝ යසවා නම් වෙති. මෑනියෝ යසොධරා නම් වෙති. අග්‍ර ශ්‍රාවක තෙර සඟල නිසඟ ය අනොම ය යන නම්

වෙති. උපසථායක මහතෙරහු වරුණ නම් වෙති. අග්‍රශ්‍රාවිකා සහල සුජාදෙවි ය සුමනා ය යන නම් වෙති. ඔබට බොධි වූයේ අජපාල නම් රුකෙක, බුඩ ශරීර ය අටපණස් රියනෙක, හවු රුදු ලක්ෂයක් වැඩසිට සවයන් සවහී-මොක්ෂ සම්පතට පමුණුවා නිවන්පුර වැඩි සේක.

කියේ මැනෝ.

අනොමදස්සිස්ස භගවතො තයො සාවකසන්නිපාතා, පඨමෙ අඨනික්ඛ සතසහස්සානි අහෙසුං. දුතියෙ සත්ත, තතියෙ ඡ. තදා බොධිසත්තො එකො යක්ඛසෙනාපති අහොසි මහිඩ්ඩිකො මහානුභාවො අනෙකකොටි සතසහස්සානං යක්ඛානං අධිපති. සො බුඩො උපපජ්ජතී'ති සුත්වා ආගන්ත්වා බුඩපමුඛස්ස සංඝස්ස මහාදානං අදාසි. සත්ථා'පි නං අනාගතෙ බුඩො භවිස්සසී'ති ව්‍යාකාසි. අනොමදස්සිස්ස පන භගවතො වඤ්ඣවතී නාම නගරං අහොසි. යසවා නාම රාජා පිතා, යසොධරා නාම මාතා, නිසභො ච අනොමො ච අග්ගසාවකා, වරුණො නාම උපඨාකො, සුජාදෙවි ච සුමනා ච අගසාවිකා, අජපාල රුකෙඛා බොධි, සරීරං අඨපඤ්ඤාස රතනුබ්බෙධං අහොසි වස්ස සතසහස්සං ආයු— සි

ඒ **අනොමදස්සි** නම් සම්බුදුරජාණන් වහන්සේට මෑතභාගයෙහි–

අනොමදස්සිස්ස අපරෙන සම්බුඩො දිපදුත්තමො,
පදුමො නාම නාමෙන අසමො අපටිපුග්ගලො-සි,

දක්වන ලද **පදුම** නම් සම්බුදුරජාණන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඒ බුදුන්ට ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය. ප්‍රථම සන්නිපාතයෙහි කොටිශතසහස්‍රයක් භික්ෂූන් වහන්සේ ය. විතීය සන්නිපාතයෙහි තුන්ලක්ෂයෙක, තුන්වෙනි සන්නිපාත යෙහි අගාමික වූ අරණ්‍යයෙහි මහාවනසණ්ඩ වාසී භික්ෂූන් සම් බන්ධී වූ දෙලක්ෂයෙක එ සමයෙහි අපමහබෝසතාණන් ඒ වන සණ්ඩයෙහි යම්කිසි කරුණකින් සිංහරාජයක් ව ඉපද නිරොධ සමාසන්නියට සමවන් බුදුන් දැක ප්‍රසන්න සිත් ඇති ව වැඳ ප්‍රදක්ෂි ණාකොට ප්‍රීති සොම්නස් උපදවා තුන්වරක් සිංහනාද කොට බුඩාරම්මණ ප්‍රීති උපදවා සද්දවසක් මුළුල්ලෙහි බුඩාලම්බන ප්‍රීති ය නොබිඳ ප්‍රීති සැපයෙන් ම ගොදුරු පිණිස නොගොස් බුදු න්ට දිවි පුදනුයේ සිටි සේක.

පදුම නම් සම්බුදයන් වහන්සේ ද සද්දවස ඇවැමෙන් නිරොධ සමාපත්තියෙන් නැගී සේක් සිංහ රාජ යා බලා වදුරා භික්ෂු සංඝයා කෙරෙහි ත් සිත් පහදවා සංඝයා ත් වඳි ව සි යන අද හසින් භික්ෂුසංඝයා සමීපයට එලඹෙන ලෙසට සිතා වදුළ සේක. එ කෙනෙහි ම භික්ෂූන් වහන්සේ ත් වැඩි සේක. සිංහරාජ තෙමේ භික්ෂු සංඝයා කෙරෙහි ත් සිත් පහදවා වැන්දේ ය සම්බුදයන් වහන්සේ සිංහරාජයාගේ සිත් බලා අනාගතයෙහි බුදු වෙති යි, විවරණ දෙවා වදුළ සේක.

ඒ **පදුම** නම් සම්බුදයන් වහන්සේට වනාහි වමපක නම් නුවරෙක් වි ය. පියමහරජාකෝ පදුම නම් වෙති. මෑනියෝ අසමා නම් වෙති. අග්‍රශ්‍රාවක දෙදෙනා සාල ස උපසාල ය යන නම් වෙති. උපසථායක මහ තෙරහු වරුණ නම් වෙති. අග්‍ර ශ්‍රාවිකා සභළ රාමා ය සුරාමා ය යන නම් වෙති. බොධි වූයේ සොන නම් රුකෙක. බුඩ ශරීර ය අටපණස් රියනක් උස ඝ. අවුරුදු ලක්‍ෂයක් වැඩ සිට සතුන් සසරින් නගා නිවන්පුර වැනී සේක.

කියේ මැ නෝ.

තස්ස අපරභාගෙ පදුමෝ නාම සත්ථා උදපාදි. තස්සා'පි තයෝ සාවක සන්නිපාතා, පඨමසන්නිපාතෙ කොටිසතසහස්සං භික්ඛූ අහෙසුං. දුතියෙ තිණ්ණිසතසහස්සානි. තතියෙ අගාමකෙ අරඤ්ඤෙ මහාවනසණ්ඩවාසිනං භික්ඛූනං දෙවසතසහස්සානි. තදා තථාගතෙ තස්මිං වනසණ්ඩෙ වසන්තෙ බොධිසත්තොපි සීහො හුත්වා සත්ථාරං නිරොධ සමාපත්තිං සමාපන්නං දිස්වා පසන්න චිත්තො වන්දිත්වා පදක්ඛිණං කත්වා පීතිසොමනස්සජාතො නික්ඛත්තුං සීහ නාදං නදිත්වා සත්තාහං බුඩාරම්මණ පීතිං අජ්ඣොහරිත්වා පීතිසුඛෙ නෙව ගොචරාය අපක්කමිත්වා ජීවිතපරිච්චාගං කත්වා පයිරුපාසමානො අට්ඨාසි.

සත්ථා සත්තාහස්ස අච්චයෙන නිරොධා වුට්ඨිතො සීහං ඔලොකෙත්වා භික්ඛුසංඝෙපි චිත්තං පසාදෙත්වා සංඝං වන්දිස්සති'ති භික්ඛු සංඝෙ ආගච්ඡතූ'ති විනෙතසි. භික්ඛූ තාවදෙව ආගම්සු. සීහො සංඝෙ චිත්තං පසාදෙසි. සත්ථා තස්ස මනං ඔලොකෙත්වා අනාගතෙ බුද්ධා භවිස්සසීති, ව්‍යාකාසි.

පදුමස්ස පන භගවතෝ වම්පකං නාම නගරං අහොසි. පදුමෝ නාම රාජා පිතා, මාතා'පි අසමා නාම, සාලෝ ච උපසාලෝ ච අග්ග සාවකා, වරුණෝ නාමුපට්ඨාකෝ. රාමා ච සුරාමා ච අග්ගසාවිකා, සෝන රුක්ඛෝ නාම බෝධි, අට්ඨපණ්ණාස හත්ථුබ්බේධං සරීරං අහොසි. ආයුං වස්සසතසහස්සං-යි

ඒ **පදුම** නම් බුදුන්ට මෑත භාග‍යෙහි එ ම කල්පයෙහි හුන්වන අතුරුකප:

පදුමස්ස අපරේන සම්බුද්ධෝ දිපදුත්තමෝ,
නාරදෝ නාම නාමේන අසමෝ අප්පටිපුග්ගලෝ-යි.

දක්වන ලද බැවින් චතුවේසාරද්‍යයෙන් විශාරද වූ **නාරද** නම් සම්බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වී ය. එහි ප්‍රථම සන්නිපාතයෙහි කෝටිසතසහස්‍රයෙක් භික්ෂූන් වහන්සේ ය. දෙවෙනි ව නවුතිකෝටි සහස්‍රයෙක. තුන්වෙනි ව අසීතිකෝටි සහස්‍රයෙක. එ කල අප මහබෝසත් ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව පංචාභිඥ අෂ්ට සමාපත්තියෙහි වශිප්‍රාප්ත ව බුදුපාමොක්ෂ මහසඟනට මහ දන් දී ලොහිත චන්දනයෙන් පූජා කළ සේක.

ඒ **නාරද** නම් සම්බුදුරජාණන් වහන්සේ ද බොධිසත්ත්වයන්ට මතු බුදුවෙති යි විවරණ දෙවා වදාළ සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේ උපන් නුවර ධඤ්ඤවතී නම් වෙ යි. පියමහ රජානෝ සුමේධ නම් වෙති. මැණියෝ අනොමා නම් වෙති. අග්‍රශ්‍රාවක දෙනම භද්‍රසාල ය ජිතමිත්‍ර ය යන නම් වෙති. උපස්ථායක මහතෙරහු වාසෙට්ඨ නම් වෙති. අග්‍රශ්‍රාවිකා දෙනම උත්තරා ය ඵග්ගුණී ය යන නම් වෙති. බොධි වූ යේ මහාසෝන නම් රුක්ෙක. බුබ ශරීර ය අටඅසූ රියන් උස ය. අනූදහසක් අවුරුදු වැඩසිට ලොකාග්‍රශාසනාකොට පිරිනිවි සේක.

කියේ මැ නෝ.

තස්ස අපරභාගෙ නාරදෝ නාම සත්ථා උදපාදි. තස්සා'පි තයෝ සාවකසන්නිපාතා, පඨමසන්නිපාතෙ කෝටිසතසහස්සං භික්ඛූ අහෙසුං. දුතියෙ නවුතිකෝටි සහස්සානි. තතියෙ අසීති කෝටි සහස්සානි. තදා බොධිසත්තෝ ඉසිපබ්භජ්ජං පබ්බජිත්වා පංචසු අභිඤ්ඤාසු අට්ඨසු ච සමාපත්තීසු වසී හුත්වා බුබපමුඛස්ස සංඝස්ස මහාදානං දත්වා ලොහිත චන්දනෙන පූජං අකාසි. සෝ'පි තං අනාගතෙ බුද්ධොභවිස්සසී'ති ව්‍යාකාසි.

තස්ස භගවතෝ ධඤ්ඤවතී නාම නගරං අහොසි. සුමේධෝ නාම ඛත්තියෝ පිතා, අනොමා නාම මාතා, හදඝසාලෝ ච ජිත මිත්තෝ ච අග්ගසාවකා, වාසෙට්ඨෝ නාමුපට්ඨාකෝ, උත්තරා ච ඵග්ගුනී ච අග්ගසාවිකා. මහාසොනරුක්ඛෝ නාම බොධි, සරීරං අට්ඨාසීති හත්ථබ්බබ්ධං අහොසි. නවුතිවස්සසහස්සානි ආයු-සි.

ඒ **නාරද** නම් සම්බුදුන් වහන්සේට අපරභාගයෙහි මේ භද්‍ර කල්පයට ලක්ෂයක්වන **කල්පයෙහි:**

නාරදස්ස අපරෙන සම්බුද්ධෝ දිපදුත්තමෝ,
පදුමුත්තරෝ නාම ජිනෝ අක්ඛොභෙය්‍යෝ සාගරූපමෝ-සි.

දක්වන ලද **පදුමුත්තර** නම් සම්බුදුන් වහන්සේ එකලා ව ම ප්‍රාදුර්භූත වූ සේක. මේ **නාරද** නම් බුදුරජාණන් වහන්සේට මෑත භාගයෙහි **පදුමුත්තර** නම් බුදුන් දක්වා අසංඛ්‍යයක් කප් බුද්ධ ශූන්‍ය ව තුබුයේ ය. **හෙ ද දක්වන ලද මැයි—**

නාරදස්ස භගවතෝ පදුමුත්තරස්ස සත්ථුනෝ,
තෙස'මපි අනන්තරකප්පෝ ගණනාතෝ අසංඛ්‍යා-සි.

ඔබට ද ත්‍රිවිධශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය. ප්‍රථම සන්නි පාතයෙහි කොටි ශතසහස්‍රයෙක. දෙවෙනි සන්නිපාතයෙහි වෙ භාර පඤ්ඤයෙහි දී නවුති කොටිසහස්‍රයෙක, තුන්වෙනි ව අසිති කොටි සහස්‍රයෙක. එ සමයෙහි අපමඟ බෝසතාණෝ **ජටිල** නම් මහරිටි ව බුදුන් ප්‍රමුඛ කොට ඇති භික්ෂුසංඝයාට සිවුරු දන් දී ඒ බුදුන් කෙරෙහි දු මතු බුදුවෙති සි විවරණ ලත් සේක. ඒ පදුමුත්තර නම් බුදුන් සමයෙහි නිඵක්ඛෝ නම් නො වූවාහු ම ය. සියළු දිව්‍ය මනුෂ්‍යයෝ බුදුන් සරණ ගත්තෝ ම ය.

ඔබට වූ නුවර හංසවතී නම් වෙයි. පියමහ රජානෝ ආනන්ද නම් වෙති. මව් බිසව සුජාතා නම් වෙති. අගසව් යුගළ දේවල ය සුජාතා ය යන නම් වෙති. උපස්ථායක මහතෙරහු සුමන නම් වෙති. අග්‍රශ්‍රාවිකා දෙනම අමිතා ය අසමා ය යන නම් වෙති. ඔබට බොධිවූයේ සාලවෘක්ෂයෙක, බුද්ධ ශරීර ය අටඅසූරියනක් උස ය. ඔබගේ ශරීරප්‍රභාව හාත්පසින් දෙළොස් යොදුනෙක පැතිර සිටියේ ය අවුරුදු ලක්ෂයක් වැඩසිට සතුන් නිවන් පුර පමුණුවා පිරිනිවි සේක.

කියේ මැ නෝ.

තාරද බුඩසස අපරභාගෙ ඉතෝ සතසහසස කපප මත්ථකෙ එකසමිං කපෙප එකොව පදුමුත්තරබුඩෝ නාම උදපාදි. තසසාපි තයෝ සාවකසන්නිපාතා, පඨමෙ කොටි සතසහසසං භික්ඛු අහෙසුං. දුතියෙ වෙභාරපබ්බතෙ නවුතිකොටිසහසසානි, තතියෙ අසීතිකොටිසහසසානි. තදා බොධිසත්තොා ජටිලෝ නාම මහාරට්ඨිකෝ හුත්වා බුඩපමුඛසස සංඝසස තිච්වරදානං අදාසි. සෝපි නං අනාගතෙ බුඩෝ භවිසසතී'ති ව්‍යකාසි. පදුමුත්තරසස පන භගවතෝ කාලෙ තිත්ථියා නාම නාහෙසුං. සබ්බෙ දෙව මනුසසා බුද්ධමෙව සරණං අගමංසු.

තසස නගරං හංසවතී නාම අහොසි. පිතා ආනන්දෝ නාම ඛත්තියෝ, මාතා සුජාතා නාම, දෙවලෝ ච සුජාතෝ ච අග්ග සාවකා, සුමනෝ නාමුපට්ඨාකෝ, අමිතා ච අසමා ච අග්ගසාවිකා, සාලරුක්ඛෝ බොධි, සරීරං අට්ඨාසීති හත්ථුබ්බෙධං අහොසි. සරීරප්පභා සමන්තතෝ දසාදස යොජනානි ගණ්හි, වසසසතසහසසං ආයු-සි.

ඒ **පදුමුත්තර** නම් බුදුන් උපන් කල්පයෙන් ඉහිරි වූ දසනව යක් පමණ අතුරුකප්වල උපන් බුදුකෙණෙකුන් නැත. ඒ කපෙහි පටන් තිස්දහසක් කප් බුඩශූන්‍ය ව තුබූ කල:

පදුමුත්තරසස අපරෙන සුමෙධෝ නාම නායකෝ,
දුරාසදෝ උග්ගතෙජෝ සබ්බලොකුත්තමෝ මුනි-සි.

දක්වන ලද **සුමෙධ** නම් සම්බුදුන් වහන්සේ මේ කපට සැත් තැදහසක්වන කල්පයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඒ **සුමෙධ** නම් සම්බුදුයන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය. එහි ප්‍රථම සන්නිපාතයෙහි සුදස්සන නම් නුවරෙහි දී කෙළසියයක් ක්ෂීණාශ්‍රවයන් වහන්සේ වූ සේක. දෙවෙනි සන්නිපාතයෙහි අනූකෙළක් දෙනාවහන්සේ වූ සේක. තුන්වෙනි සමාගමයෙහි අසූකෙළක් වූ සේක එ කල අපමහබෝසතාතෝ **උත්තර** නම් මාණවකයක් ව ඉපද නිධානකොට තුබූ අසූකෙළක් පමණ ධන විසඳම්කොට බුදුපාමොක් මහසඟනට මහදන් දී බණ අසා සරණ යෙහි පිහිටා ගිහිගෙන් නික්ම පැවිදි වූ සේක. ඒ සුමෙධ සම්බුදුයන් වහන්සේ ද මතු බුදුවෙති යි විවරණ දෙවා වදාළ සේක.

ඔබ උපන් නුවර සුදර්ශන නම් වෙයි. පියමහරජානෝ සුදත්ත නම් වෙති. මෑණියෝ සුදත්තා නම් වෙති. අගසව් දෙනම සරණ ය සබ්බකාම ය යන නම් වෙති. උපස්ථායක මහතෙරහු ගුණයෙනු ත් සාගර ය වැනි සාගර නම් මහතෙරකෙණෙක, අග්‍ර ශ්‍රාවිකා දෙනම් රාමා ය සුරාමා ය යන නම් වෙති. ඔබට බොධි වූයේ මහනීප නම් රුකෙක. බුද්ධශරීර ය උස අටාසූරියනෙක, අනූ දහසක් අවුරුදු වැඩසිට පිරිනිවි සේක.

නියේ මෑ නෝ.

සුමේධස්ස'පි තයෝ සාවකසන්නිපාතා, පඨම සන්නිපාතෙ සුදස්සන නගරෙ කොටිසත ඛීණාසවා අහෙසුං. දුතියෙ නවුති කොටියෝ, තතියෙ අසීතිකොටියෝ තදා බොධිසත්තො උත්තරෝ නාම මාණවෝ හුත්වා නිදහිත්වා ඨපිතං යෙව අසීති කොටිධනං විස්සජ්ජෙත්වා බුධපමුඛස්ස සංඝස්ස මහාදානං දත්වා ධම්මං සුත්වා සරණෙසු පතිඨාය නික්ඛමිත්වා පබ්බජී. සෝ'පි තං අනාගතෙ බුද්ධෝ භවිස්සසී'ති ව්‍යාකාසි.

සුමේධස්ස භගවතො සුදස්සනං නාම නගරං අහොසි. සුදත්තො නාම රාජා පිතා, සුදත්තා නාම මාතා, සරණෝ ච සබ්බ කාමෝ ච දෙව අග්ගසාවකා, සාගරෝ නාම උපඨාකෝ, රාමා ච සුරාමා ච දෙව අග්ගසාවිකා, මහානීපරුක්ඛෝ බොධි, සරීරං අට්ඨාසීති හත්ථුබ්බෙධං අහොසි. ආයුං නවුති වස්ස සහස්සානි—සි.

ඒ සුමේධ සම්බුදුරජාණන් වහන්සේට මෑතභාගයෙහි-

තත්‍රෙව මණ්ඩකපපමහි සුජාතෝ නාම නායකෝ,
සීහහනු උසභක්ඛන්ධෝ අප්පමෙය්‍යෝ දුරාසදෙ-සි.

දක්වන ලද **සුජාත** නම් සම්බුදුරජාණන් වහන්සේ එම කල්පයෙහි දෙවන අතුරුකප පහළ වූ සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය ප්‍රථම සන්නිපාතයෙහි සැට දහසක් භික්ෂූන් වහන්සේ ය. දෙවෙනි සන්නිපාතයෙහි පණස්දහසෙක. තුන්වෙනි සන්නිපාතයෙහි සතලිස්දහසෙක. එ කල අපමහබෝසතාණන් වක්‍රවර්ත්තිරජක් ව ඉපිද බුදුන් උපන් සේකැ යි යනු අසා බුදුන් කරා එළඹ බණ අසා බුදු පාමොක් මහසඟනට සපතවිධරත්න ය හා සමග සතරමහන් දිවයින රාජ්‍ය ය පූජාකොට බුදුන් කෙරෙහි පැවිදිවූ සේක. සියලු රට

වාසිහු රාජ්‍යප්‍රාප්තිගෙණ ආරාමික කෘත්‍යය කරත්නාහු බුදුන් ප්‍රමුඛ කොට ඇති සංඝයාට නිරන්තරයෙන් මහදන් දුන්නාහු ය. ඒ **සුජාත** නම් සම්බුදුන් වහන්සේ ත් බොධිසත්ත්වයන්ට මතු බුදු වෙති සි විවරණ දෙවා වදාළ සේක.

ඒ බුදුන් උපන් නුවර **සුමඞ්ගල** නම් වෙයි. පියමහරජා නෝ උග්ගත නම් වෙති. මෑණියෝ ප්‍රභාවතී නම් වෙති. අග සව් දෙනම සුදර්ශන ය දෙව ය යන නම් වෙති. උපස්ථායක මහ තෙරහු නාරද නම් වෙති. අග්‍රශ්‍රාවිකා දෙනම නාගා ය නාගසමා ලා ය යන නම් වෙති. බබට බොධිවූයේ මහාවෙලු නම් රුක්හෙක. හෙතෙම මන්දාක්‍රාන්ත ය, ඝන වූ සඛාඪය ය උපරිම ශාඛාව වනාහි මයූරපිඤ්ඡකලාපයක් සෙයින් බබළ සි. ඒ බුදුන්ගේ ශරීර ය සම පණස්රියන් උස ය. අනූදහසක් අවුරුදු වැඩි වසමින් ලොකාභිවෘඩියකොට පිරිනිවි සේක.

කියේ මෑ නෝ.

තස්ස අපරභාගෙ සුජාතො නාම සත්ථා උදපාදි තස්සා'පි තයො සාවකසන්නිපාතා. පඨමසන්නිපාතෙ සට්ඨිභික්ඛුසහස්සානි අහෙසුං දුතියෙ පඤ්ඤාසං, තතියෙ චත්තාරීසං තදා බොධිසත්තො චක්කවත්තිරාජා හුත්වා බුද්ධො උපපන්නො'ති සුත්වා උපසංකමිත්වා ධම්මං සුත්වා බුද්ධප්පමුඛස්ස සඞ්ඝස්ස සඞ්ඝං සත්තහි රතනෙහි වතුමහාදීප රජ්ජං දත්වා සත්ථුසන්තිකෙ පබ්බජි. සකල රට්ඨවාසිනො රට්ඨුප්පාදං ගහෙත්වා, ආරාමික කිච්චං සාධෙන්තා බුද්ධප්පමුඛස්ස සංඝස්ස නිච්චං මහාදානං අදංසු. සො'පි නං සත්ථා අනාගතෙ බුද්ධො භවිස්සසී'ති ව්‍යාකාසි

තස්ස භගවතො නගරං සුමඞ්ගලං නාම අහොසි. උග්ග තො නාම රාජා පිතා, පභාවතී නාම මාතා, සුදස්සනො ච දෙවො ච අග්ගසාවකා, නාරදෝ නාමුපට්ඨාකො, නාගා ච නාගසමා ලා ච අග්ගසාවිකා, මහාවෙලු රුක්ඛො බොධි. සො කිර මන්දාක්‍රාන්තෙ ඝනකඛන්ධො උපරි මහාසාඛානි මෝරපිඤ්ඡ කලාපො විය විරොචිත්ථ. තස්ස භගවතො සරීරං පණ්ණාස හත්ථුබ්බෙධං අහොසි. ආයුං නවුති වස්සසහස්සානි.

ඒ සුජාත නම් සම්බුදුන් වහන්සේට මැතභාගයෙහි මේ කල්පයට අඩාරස කල්පයකින් මත්තෙහි එක් කප්පෙක පිය දස්සි ය අත්‍ථදස්සි ය ධම්මදස්සි ය යි තුන් බුදුකෙණෙක් ලොක යෙහි ක්‍රමයෙන් පහළවූ සේක් ලා ය.

එ හෙයින් කිහ.

සුජාතස්ස අපරේන සයම්භූ ලොකනායකෝ,
දුරාසදෝ අසමසමෝ පියදස්සි මහායසෝ-සි.

දක්වන ලද ප්‍රියදර්ශී නම් සම්බුදුන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය. ප්‍රථම සන්නිපාතයෙහි කෝටි ශතසහස්‍රයෙක, දෙවෙනි සමාගමයෙහි නවුති කෝටියෙක, තුන් වෙනි ව අසූකෝටියෙක, එ සමයෙහි අපමහබෝසතානෝ කාශ්‍යප නම් මාණවකයක් ව ඉපිද ත්‍රිවේදයෙහි පරතෙර දැක ඉගෙණ බුදුන් කෙරෙන් බණ අසා කෝටිශතසහස්‍රයක් ධන විසඳ සංඝා රාමයක් කොට පිළිගත්වා සරණසිලාදියෙහි පිහිටි සේක. එ කල බුදුරජාණන් වහන්සේ බොධිසත්වයන්ට අඩාරස කල්ප ශතයක් හුගේ ඇවැමෙන් බුදුවෙති සි විවරණ දෙවා වදාළ සේක.

ඒ භගවන්හු උපන් නුවර අනොම නම් වෙයි. පියමහ රජානෝ සුදින්න නම් වෙති. මැණියෝ වඤ්ඣා නම් වෙති. අග්‍ර ශ්‍රාවක දෙනම පාලිත ය සබ්බදස්සි ය යන නම් වෙති. උපස්ථා යක මහතෙරහු සොභිත නම් වෙති. අග්‍රශ්‍රාවිකා දෙනම සුජා තා ය ධම්මදින්නා ය යන නම් වෙති. බොධි වූයේ පියඟු නම් රුකෙක, බුඩශරීර ය උස අසූරියනෙක, අනූදහසක් අවිරුදු ලොකානුශාසනාකොට පිරිනිවි සේක.

කියාය්ම, නෝ.

තස්ස අපරභාගෙ ඉතෝ අඩාරස කපපසතමච්චයෙ එක සම්මිං කපෙ පියදස්සී අත්‍ථදස්සී ධම්මදස්සී'ති තයෝ බුඩා නිබ්බත්තිංසු. පියදස්සිස්සපි තයෝ සාවකසන්නිපාතා, පඨමෙ කොටිසතසහස්සා භික්ඛූ අහෙසුං. දුතියෙ නවුතිකොටියෝ, තතියෙ අසීතිකොටියෝ. තදා බොධිසත්තෝ කස්සපෝ නාම මාණවෝ තිණ්ණං වෙදානං පාරං ගන්ත්වා භුත්වා සත්ථු ධම්ම දෙසනං සුත්වා කොටිසතසහස්ස ධනපරිච්චාගෙන සංඝාරාමං කාරෙත්වා සරණෙසු ච සීලෙසු ච පතිට්ඨාසි. අථ නං සත්ථා අඨාරස කපපසතච්චයෙන බුඩෝ භවිස්සසී'ති ව්‍යාකාසි තස්ස භග වතෝ අනොම නාම නගරං, පිතා සුදින්නෝ නාම රාජා, මාතා වඤ්ඣා නාම, පාලිතෝ ච සබ්බදස්සී ච අග්ගසාවිකා, සොභිතෝ නාමුපට්ඨාකෝ, සුජාතා ච ධම්මදින්නා ච අග්ගසාවිකා, පියඞ්ගු රුක්ඛෝ බොධි. සරීරං අසීති හත්ථුබ්බෙධං අහොසි. නවුති වස්ස සහස්සානි ආයුනි—සි.

ඒ සම්බුදුන් වහන්සේට මෑතකාලයෙහි

තත්‍රේව මණ්ඩකප්පම්හි අත්‍රදස්සී නරාසභෝ,
මහාතමං නිහන්ත්වාන පත්තෝ සම්බෝධිමුත්තමං—යි.

දක්වන ලද එ ම මණ්ඩකල්පයෙහි **අත්‍රදස්සී** සම්බුදුන් වහන්සේ ප්‍රාදුර්භූත වූ සේක. ඒ සම්බුදුන් වහන්සේට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූයේ ය. ප්‍රථම සන්නිපාතයෙහි අෂ්ට නවුති භික්ෂු ශතසහස්‍රයෙක. දෙවෙනි ව අෂ්ටාශීති ශතසහස්‍ර යෙක. තුන්වෙනි සන්නිපාතයෙහි ත් එ පමණ ය. එ කල අපමහ බෝසතාණෝ මහත් ඍඩි ඇති **සුමිම** නම් තාපසයක් ව ඉපද දිව්‍යලෝකයෙන් මඳාර පුෂ්පචඡත්‍රයක් ගෙන බුදුන්ට පුදා ඒ බුදුන් කෙරෙහි දු විවරණ ලත් සේක.

ඒ භගවත්හට සොභිත නම් නුවරෙක් වි ය. පිය වූයේ සාගර නම් රජෙක. මව් වූයේ සුදර්ශනා නම්. බිසෝකෙණෙක. අගසව් වූයේ සන්ත ය උපසන්ත ය යන තෙරසඟලෙක. අභය නම් තෙරකෙණෙක් උපස්ථායක වූහ. ධම්ම ය සුධම්ම ය යන දෙනමෙක් අග්‍රශ්‍රාවිකා වූ සේක. චම්පක නම් රුකෙක් බෝධි වි ය. බුද්ධශරීර ය අසූරියනෙක, ශරීරප්‍රභාව හත්පසින් හැම කල්හි ම යොදනක් පමණකුත් පැතිර සිටියේ ය. යොදනක් පමණ තැන් රැ දවල් දෙක වෙනසෙක් නො පෙණෙයි. අව්රැදු ලක්ෂණයක් මුළුල්ලෙහි වැඩ සිට ලෝවැඩකොට පිරිනිවි සේක.

කියේ මැ නෝ

තස්ස අපරභාගෙ අත්‍රදස්සී නාම සත්ථා උදපාදි. තස්සාපි තයෝ සාවකසන්නිපාතා, පඨමෙ අට්ඨනවුති භික්ඛු සතසහස්සානි අහෙසුං. දුතියෙ අට්ඨාසීති සතසහස්සානි, තථා තතියෙ. තදා බොධි සත්තෝ සුසීමෝ නාම මහිඞ්ඛ තාපසෝ හුත්වා දෙව ලොකතෝ මන්දාර පුප්ඵචඡත්තං ආහරිත්වා සත්ථාරං පූජෙසි. සෝ පි නං බුද්ධෝ භවිස්සසීති ව්‍යාකාසි.

තස්ස භගවතෝ සොභිතං නාම නගරං අහොසි. සාගරෝ නාම රාජා පිතා, සුදස්සනා නාම මාතා, සන්තෝ ච උපසන්තෝ ච අග්ගසාවකා, අභයෝ නාමුපට්ඨාකෝ, ධම්මා ච සුධම්මා ච අග්ග සාවිකා, චම්පක රුක්ඛෝ බොධි. සරීරං අසීති හත්ථුබෙබධං අහොසි. සරීරප්පභා සමන්තතෝ සබ්බ කාලං යොජනමත්තං ඵරිත්වා අට්ඨාසි. ආයුං වස්ස සතසහස්සා නි—යි.

ඒ අත්ථදස්සි නම් සම්බුදයන් වහන්සේ ට මෑතභාගයෙහි-

තතෝව මණ්ඩකපපමහි ධම්මදස්සි මහායසෝ,
තමන්ධකාරං විධමෙත්වා අනිරොචනි සදෙවකෙ—සි.

දක්වන ලද **ධම්මදස්සි** නම් සම්බුදයන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඔබට ද ශ්‍රාවක සන්නිපාත තුනෙක් වි ය. ප්‍රථම සන්නිපාතයෙහි කෙළසියයක, දෙවෙනි ව සැත්තෑ කෙළක, තුන්වෙනි ව අසූකෙළක, එ කල අපමහ බෝසතාණෝ සක්දෙව් රජ ව ඉපද දිව්‍යගන්ධපුෂ්පයෙන් හා දිව්‍යතූර්‍ය රාවයෙන් පූජාකොට ඒ බුදුන් කෙරෙහි ත් විවරණ ලත් සේක.

ඒ භගවත්හට ද **සරණ** නම් නුවරෙක් වි ය. පියමහරජා නෝ ද සරණ නම් වෙති. මව්බිසව් සුනන්දා නම් වෙති. අගසව් දෙනම් පදුම ය තිස්සදෙව ය යන නම් වෙති. උපස්ථායක මහ තෙරහු සුනෙත්‍ර නම් වෙති. අග්‍රශ්‍රාවිකා දෙනම් ඛෙමා ය සබ්බ නාමා ය යන නම් වෙති. බොධි වූ සේ රත්නකුරවක නම් රුකෙක, බිම්බජාල රුකෙකැයි ද කියත්. බුදු ශරීර ය උස අර්‍යියනෙක, උක්‍ෂයක් හවිරුදු ලොකාභිවෘඬි කොට පිරිනිවි සේක.

කියේ මෑ නෝ.

තස්ස අපරභාගෙ ධම්මදස්සී නාම සත්ථා උදපාදි. තස්සා'පි තයෝ සාවකසන්නිපාතා, පඨමෙ කොටිසතං භික්ඛූ අහෙසුං. දුතියෙ සත්තනි කොටියෝ, තතියෙ අසීති කොටියෝ. තදා බොධිසත්තොපි සකෙකා දෙවරාජා හුත්වා දිබ්බ ගන්ධපුපෙඤ්ච දිබ්බ තූරියෙහි ච පූජං අකාසි. සොපි නං බුද්ධෝ භවිස්සසී'ති ව්‍යාකාසි.

තස්ස භගවතෝ සරණං නාම නගරං අහොසි. පිතා සරණෝ නාම රාජා, මාතා සුනන්දා නාම, පදුමෝ ච තිස්සදෙවෝ ච අග්ගසාවකා, සුනෙත්තෝ නාමුපට්ඨාකෝ, ඛෙමා ච සබ්බනාමා ච අග්ගසාවිකා. රත්නකොරව රුක්ඛෝ බොධි. බිම්බජාලොනි'පි වුච්චති. සරීරං පනස්ස අසීනි හත්ථුබ්බෙධං අහොසි. වස්සසත සහස්සං ආයු—සි

ඒ **ධම්මදස්සි** නම් සම්බුදයන් වහන්සේ ට මෑතභාගයෙහි මේ කල්පයට අනුසතරවන කප—

ධම්මදස්සිස්ස අපරේන සිඛණ්ඩී නාම නායකෝ,
නිහනිත්වා තමං සබ්බා සූරියෝ'ව්භුග්ගතෝ යථා-සි.

දක්වන ලද **සිඛාණ්ඩී** නම් සම්බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඔවුන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනෙක් වූයේ ය. ප්‍රථම සන්නිපාතයෙහි කෝටිශතසහස්‍රයක් භික්ෂූන් වහන්සේ ය. දෙවෙනි සන්නිපාතයෙහි අනූකෝටියක් භික්ෂූන් වහන්සේ ය. තුන්වෙනි සන්නිපාතයෙහි අසූකෝළක් භික්ෂූන් වහන්සේ ය. එ කල අපමණබෝසතානෝ උග්‍ර තෙජස් ඇති අභිඥ බලසම්පන්න වූ **මඬගල** නම් තාපසයක් ව ඉපද හිමවනින් මහ දඹපල ගෙණවුත් බුදුන්ට පිදීමෙහි වූ සේක. සම්බුදුරජාණන් වහන්සේ ඒ දඹපල වළඳා අනුමතරක් කප් අතික්‍රාන්තකොට මතු බුදු වෙති යි බොධිසත්ත්වයන්ට විවරණ දෙවා වදාළ සේක.

ඒ **සිඛාණ්ඩී** නම් සම්බුදුරජාණන් වහන්සේ උපන්නුවර **වේභාර** නම් වෙයි. පියමහරජානෝ ජයසේන නම් වෙති. මෑනියෝ සුප්‍රභා නම් වෙති. අගසවි දෙනම සම්බල ය සුමිත්‍රා ය යන නම් වෙති. උපස්ථායක මහතෙරහු රෙවත නම් වෙති. අග්‍ර ශ්‍රාවිකා දෙනම සිවලී ය සුරාමා ය යන නම් වෙති. බොධි වූයේ කණිකාර නම් රුක්කෙක, බුද්ධ ශරීර ය උස සැටරියනෙක. අවු රුදු ලක්ෂයක් මුළුල්ලෙහි ලොකානිවෘද්ධි කොට පිරිනිවි සේක.

කියේ මැනෝ.

තස්සා අපරභාගෙ ඉතෝ චතුනවුති කප්පමත්ථකෙ එකස්මිං කප්පෙ එකොව සිඛණ්ඩී නාම බුද්ධෝ උදපාදි. තස්සා'පි තයෝ සාවක සන්නිපාතා, පඨම සන්නිපාතෙ කෝටිසතසහස්සානි භික්ඛූ අහෙසුං. දුතියෙ නවුතිකෝටියෝ, තතියෙ අසීති කෝටියෝ. තදා බොධිසත්තෝ උග්ගතෙජෝ අනිඤ්ඤබලසම්පන්නෝ මඬගලෝ නාම තාපසෝ හුත්වා මහාජම්බුඵලං ආහරිත්වා තථාගතස්ස අදාසි. සත්ථා තං ඵලං පරිභුඤ්ජිත්වා චතුනවුති කප්පමත්ථකෙ බුද්ධෝ භවිස්සසී'ති බොධිසත්තං ව්‍යාකාසි.

තස්ස භගවතෝ නගරං වෙභාරං නාම අහොසි. පිතා ජයසෙනෝ නාම රාජා, මාතා සුප්‍රභා නාම, සම්බලෝ ච සුමිත්තෝ ච අග්ගසාවකා, රෙවතෝ නාම උපට්ඨාකෝ, සීවලී ච සුරාමා ච අග්ගසාවිකා, කණිකාර රුක්ඛෝ බොධි, සරීරං සට්ඨි හත්ථුබ්බේධං අහොසි. වස්සසතසහස්සං ආයු-සී.

ඒ සම්බුදුන් වහන්සේ ට මෑතනාගයෙහි **කල්ප** දෙකක් බුද්ධ ශූන්‍ය ව තුබූ කල-

සිඛිස්ස අපරෙන අසමෝ අපපටි පුග්ගලෝ,
අතන්තසිලෝ අමිත යසෝ නිසෙසා ලොකග්ග නායකෝ-සි.

දක්වන ලද **නිසස** නම් සම්බුදුන් වහන්සේ මේ **කල්පයට** අනුදෙවන කප ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඔවුන්වහන්සේ ට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වී ය. ප්‍රථම සන්නිපාතයෙහි භික්ෂූන් වහන්සේ කෙළසියයෙක. දෙවෙනි ව අනූ කෙළෙක. තුන්වෙනු ව අසූකෙළෙක. එ කල අපමහබෝසතානෝ මහත් නෝග ඇති මහත් යස ඇති **සුජාත** නම් ක්ෂත්‍රිය රජක් ව සියලු සම්පත් හැර සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව මහත් සෘඩි ඇති බවට පැමිණ බුදුන් උපන්සේකැ සි ඇසූ දිවමදුරා පියුම් ආදි ය ගෙණ සිව්පිරිස් මැද වඩනා බුදුන්ට පූජාකළ සේක අහසෙහි මල්වියනක් ද කළ සේක. ඒ **නිසස** නම් සම්බුදුන් වහන්සේ ද මෙසින් මතු අනුදෙවන කප බුදුවෙති සි බොධිසත්වයන්ට විවරණ දෙවා වදාළ සේක.

ඒ භගවන්හට **ක්ෂෙම** නම් නුවරෙක් වී ය. **ජනසන්ධ** නම් රජෙක් පිය වී ය. පදුමා නම් බිසෝකෙණෙක් මවු වූ ය. බ්‍රහ්ම දෙව ය උදය යන තෙර සහළෙක් අගසව් වූ සේක. සම්භව නම් තෙරකෙණෙක් උපස්ථායක වූහ. ඵුස්සා ය සුදත්තා ය යන ශ්‍රාවිකා දෙනමක් අග්‍රශ්‍රාවිකා වූහ. බොධි වූයේ අසත නම් රුකෙක, බුද්ධ ශරීර ය උස සැටරියනෙක, හවුරුදු ලක්ෂයක් මුළුල්ලෙහි බුද්ධකෘත්‍ය ය කොට පිරිනිවි සේක.

නිසසේ මෑ නෝ

නිස්සස්ස භගවතෝ තයෝ සාවකසන්නිපාතා, පඨමසන්නි පාතෙ භික්ඛූනං කොටිසතං අහොසි. දුතියෙ තවුතිකොටියෝ, තතියෙ අසීති කොටියෝ. තදා බොධිසත්තෝ මහාභොගෝ මහා යසෝ සුජාතෝ නාම ඛත්තියෝ හුත්වා ඉසිපබ්බජ්ජං පබ්බජිත්වා මහිද්ධිකතාවං පත්වා බුද්ධෝ උපපන්නෝ'ති සුත්වා දිබ්බමන්දාර්ව පදුම පාරිච්ඡත්තකා ච පුප්ඵානි ආදාය චතුපරිසමජ්ඣෙ ගච්ඡන්තං තථාගතං පූජෙසි. ආකාසෙ පුප්ඵවිතානං අකාසි. සෝ'පි නං සත්ථා ඉතෝ දෙනවුතිකපෙ බුද්ධෝ භවිස්සසී'ති ව්‍යාකාසි.

තස්ස භගවතෝ බෙමං නාම නගරං අහොසි. පිතා ජනසන්ධෝ නාම ඛත්තියෝ, මාතා පදුමා නාම, බ්‍රහ්මදෙවෝ ච උදයෝ ච අග්ගසාවකා, සම්භවෝ නාමුපට්ඨාකෝ, ථුස්සා ච සුදත්තා ච අග්ග සාවිකා, අසන රුක්ඛෝ බොධි, ශරීරං සට්ඨිහත්ථුබ්බේධං අහොසි. වස්සසතසහස්සං ආයු-සි.

ඒ **තිස්ස** නම් බුදුන්ට මෑතභාගයෙහි-

තත්‍රේව මණ්ඩකපබ්බති ආහු සත්ථා අනුත්තරෝ,
අනුපමෝ අසමසමෝ ථුස්සෝ ලොකග්ග නායකෝ-සි.

දක්වන ලද ථුස්ස නම් සම්බුදුයන් වහන්සේ එම කල්ප යෙහි දෙවෙනි අතුරු කප ප්‍රාදුර්භූත වූ සේක. ඔබට ද ත්‍රිවිධ ශ්‍රාවක සන්නිපාතයෙක් වූ සේ ය. ප්‍රථම සන්නිපාතයෙහි සෑට ලක්ෂයක් නික්ෂීණ වහන්සේ ය. දෙවෙනි ව පණස් ලක්ෂයක් නික්ෂීණ වහන්සේ ය. තුන්වෙනි ව දෙතිස්ලක්ෂයක් නික්ෂීණ වහන්සේ ය. එ කල අප මහ බෝසතාණෝ විජිතාවී නම් ක්ෂත්‍රිය රජක් ව රාජ්‍ය සම්පත් හැර බුදුන් සමීපයෙහි පැවිදි ව පිටක ත්‍රය ඉගෙණ මහජනයාට ධර්ම දේශනා කරමින් සීලපාරමිතා ව පිරූ සේක. ඒ ථුස්ස නම් බුදුරජාණන් වහන්සේ ද බොධිසත්ව යන්ට මතු බුදුවෙනි සි එසේ ම විවරණ දෙවා වදළ සේක.

ඒ භගවන්හු උපන් නුවර **ඛේමා** නම් වෙයි. පියමහ රජානෝ **ජයසේන** නම් වෙති. මැනියෝ **සිරිමා** නම් වෙති. අගසව් දෙනම සුරක්ඛිත ය ධම්මසෙන ය යන නම් වෙති. උපස්ථා යක මහතෙරහු සභිය නම් වෙති. අග්‍රශ්‍රාවිකා දෙනම වාලා ය උපවාලා ය යන නම් වෙති. ආමලක නම් රුක්ෙක් බොධි වූයේ ය. බුද්ධශරීර ය උස අටපණස් රියනෙක, අනුදහසක් හවිරුදු සතුන්ට නිවන් අමා බෙදා දී පිරිනිවි සේක.

සිංහල මෑ නෝ.

තස්ස අපරභාගෙ ථුස්සෝ නාම සත්ථා උදපාදි. තස්සාපි තත්‍රෝ සාවකසන්නිපාතා, පඨමසන්නිපාතෙ සට්ඨි භික්ඛුසත සහස්සානි අහෙසුං. දුතියෙ පණ්ණාස, තතියෙ අත්තිංස. තදා බොධිසත්තෝ විජිතාවී නාම ඛත්තියෝ හුත්වා මහාරජ්ජං පහාය සත්ථුසන්තිකෙ පබ්බජිත්වා තීණි පිටකානි උග්ගහෙත්වා මහාජනස්ස ධම්මකථං කථෙසි. සීලපාරමිං ච පූරෙසි. සෝපි නං බුද්ධෝ භවිස්සසී'ති තථෙව ව්‍යාකාසි.

තස්ස භගවතෝ කාසි නාම නගරං අහොසි. ජයසෙනෝ නාම රාජා පිතා, සිරිමා නාම මාතා, සුරක්ඛිතෝ ච ධම්ම සෙනෝ ච අග්ගසාවකා, සභියෝ නාමුපට්ඨාකෝ, චාලා ච උප චාලා ච අග්ගසාවිකා, ආමලක රුක්ඛෝ බෝධි, ශරීරං අට්ඨ පණ්ණාසහත්ථුබ්බේධං අහොසි. නවුතිවස්ස සහස්සානි ආයු-සි.

ඒ ඵුස්ස නම් බුදුන්ට මෑතනාගයෙහි-

ඵුස්සස්ස අපරේන සම්බුද්ධෝ දිපදුත්තමෝ,
විපස්සී නාම නාමේන ලෝකෙ උප්පජ්ජි වක්ඛුමා—සි.

දක්වන ලද **විපස්සි** නම් සම්බුදුරජාණන් වහන්සේ මේ කල්ප යට අනූ එක්වන කල්පයෙහි පහළ වූ සේක. ඒ විපස්සී නම් සම්බුදු රජාණන් වහන්සේ ද ක්ෂත්‍රිය කුලයෙහි උපන් සේක. ගොත්‍රයෙන් කොණ්ඩඤ්ඤ නම් වන සේක. ඔබගේ ආයුෂ අසූදහසක් හවිරුදු වි ය. පාටලී නම් රුක්මුල්හි දීම බුදු වූ සේක. ඔබට අග්‍රශ්‍රාවක වූයේ ගුණයෙන් අඛණ්ඩ වූ නමින් ඛණ්ඩ නම් තෙරකෙණෙකුත් හා නිස්ස නම් තෙරකෙණෙක. ඔබට ද ශ්‍රාවක සන්නිපාත තුනෙක් වි ය.

ප්‍රථම සන්නිපාතයෙහි අටසැට ලක්ෂයක් භික්ෂූන් වහන් සේ ය. දෙවෙනි ව ලක්ෂයක් භික්ෂූන් වහන්සේ ය. තුන්වෙනි ව අසූදහසක් භික්ෂූන් වහන්සේ ය. අසෝක නම් මහතෙර කෙණෙක් උපස්ථාන කළ සේක. චන්ද්‍රා ය චන්ද්‍රමිත්‍රා ය යන ශ්‍රාවිකා දෙනමෙක් අග්‍රශ්‍රාවිකා වූ සේක. බන්ධුමා නම් රජෙක් පිය වූහ. බන්ධුමති නම් දේවි කෙණෙක් මව් වූහ. බන්ධුමති නම් නුවරෙක් ම රාජධානි වි ය. ශ්‍රාවිකා දෙනම හැර සෙසු කරුණු—

වදලේ මෑ නෝ - දීඝනිකාය - මහාපදාන සූත්‍රයෙහි

ඉතෝ සෝ භික්ඛවේ එකනවුති කප්පේ'යං විපස්සී භගවා අරහං සම්මාසම්බුද්ධෝ ලෝකෙ උදපාදි. විපස්සී භික්ඛවේ භගවා අරහං සම්මා සම්බුද්ධෝ ඛත්තියෝ ජාතියා අහොසි. ඛත්තියකුලෙ උදපාදි. විපස්සි භික්ඛවේ භගවා අරහං සම්මාසම්බුද්ධෝ කොණ්ඩ ඤ්ඤෝ ගොත්තෙන අහොසි. විපස්සිස්ස භික්ඛවේ භගවතෝ අර හතෝ සම්මා සම්බුද්ධස්ස අසීතිවස්ස සහස්සානි ආයුප්පමාණං අහොසි: විපස්සී භික්ඛවේ භගවා අරහං සම්මාසම්බුද්ධෝ පාටලියාමූලෙ අභි සම්බුද්ධෝ, විපස්සිස්ස භික්ඛවේ භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ඛණ්ඩ-තිස්සං නාම සාවකයුගං අහොසි අග්ගං භද්දයුගං. විපස්සිස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස තයෝ සාවකානං සන්නි පාතා අහෙසුං.

එකෝ සාවකානං සන්නිපාතෝ අහොසි අඩ්ඪසට්ඨි භික්ඛූ සත සහස්සං, එකෝ සාවකානං සන්නිපාතෝ අහොසි භික්ඛූ සත සහස්සං. එකෝ සාවකානං සන්නිපාතෝ අහොසි අසීති භික්ඛූ සහස්සානි. විපස්සිස්ස භික්ඛවෙ භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස ඉමෙ තයෝ සාවකානං සන්නිපාතා අහෙසුං සබ්බෙපිසං යෙව ඛීණාසවානං. විපස්සිස්ස භික්ඛවෙ භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස අසොකෝ නාම භික්ඛු උපට්ඨාකෝ අහොසි අග්ගුපට්ඨාකෝ.

විපස්සිස්ස භික්ඛවෙ භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස බන්ධුමා නාම රාජා පිතා අහොසි. බන්ධුමතී නාම දෙවී මාතා අහොසි ජනෙත්ති. බන්ධුමස්ස රඤ්ඤෝ බන්ධුමති නාම නගරං රාජධානි අහොසි-සි.

ඒ **විපස්සි** නම් බුදුන්ගේ ශරීර ප්‍රභාව සත් - යොදුනක් තැන් පැතිර සිටියේ ය. එ සමයෙහි අපමණ බෝසතාණෝ මහත් සෘඩි ඇති මහත් ආනුභාව ඇති **අතුල** නම් නාගරාජයෙක් ව ඉපද සප්තරතන ඛචිත සුවර්ණමය පීඨයක් බුදුන්ට පූජාකොට ඒ බුදුන් කෙරෙහි ත් විවරණ ලත් සේක.

නිදේ මෑ නෝ - දූරෙනිදානයෙහි

තස්ස අපරභාගෙ ඉතෝ එකනවුති කප්පෙ විපස්සී නාම භගවා උදපාදි. තස්සා'පි තයෝ සාවකසන්නිපාතා, පඨම සන්නිපාතෙ අඩ්ඪසට්ඨි භික්ඛුසතසහස්සා අහොසි. දුතියෙ එකසතසහස්සං, තතියෙ අසීතිසහස්සානි. තදා බොධිසත්තෝ මහිද්ධිකෝ මහානුභාවෝ අතුලෝ නාම නාගරාජා හුත්වා සත්තරතන ඛචිතං සොවණ්ණමයං පීඨං භගවතෝ අදාසි. සෝ'පි තං ඉතෝ එකනවුති කප්පෙ බුද්ධෝ භවිස්සසී'ති ව්‍යාකාසි.

තස්ස භගවතෝ බන්ධුමතී නාම නගරං අහොසි. බන්ධුමා නාම රාජා පිතා, බන්ධුමතී නාම මාතා, බන්ධෝ ච තිස්සෝ ච අග්ග සාවකා, අසොකෝ නාම්‍රුපට්ඨාකෝ, චන්දා ච චන්දමිත්තා ච අග්ග සාවිකා, පාටලිරුක්ඛෝ බොධි, සරීරං අසීති හත්ථුබ්බේධං අහොසි. සරීරප්පභා සබ්බා සත්තයොජනානි එරිත්වා අට්ඨාසි. අසීති වස්සසහස්සානි ආයු සි.

ඒ **විපස්සි** නම් සම්බුදුන් වහන්සේට මෙන භාග්‍යයෙහි:

විපස්සිස්ස අපරෙන සම්බුඩ්ඪො දිපදුත්තමෝ,
සිඛිවහයෝ නාම ජිනෝ අසමෝ අප්පටිපුග්ගලෝ-සි.

දක්වන ලද සිබි නම් සම්බුදුරජාණන් වහන්සේ මේ කල්පයට එක් නිස් වන කප පහළ වූ සේක. ඔබට ද ශ්‍රාවක සන්නිපාත තුනෙක් වි ය. එයින් ප්‍රථම සන්නිපාතයෙහි ලක්ෂයක් භික්ෂූන් වහන්සේ ය. දෙවෙනි ව අසූදහසෙක. තුන්වෙනි ව සැත්තෑ දහසෙක. එ කල අප මහබෝසතාණෝ අරිඳම නම් රජක් ව ඉපිද බුදුන් ප්‍රමුඛකොට ඇති සඞ්ඝයාට සිව්රු සහිත වූ මහදන් පවත්වා සප්තරතනයෙන් ප්‍රතිමණ්ඩිත වූ හත්තිරතනයක් පූදු ඇතු උසට කප්පිය භාණ්ඩ දන් දී ඒ බුදුන් කෙරෙහි දු විවරණ ලත් සේක

ඒ භගවත්හූගේ නුවර අරුණවතී නම් වෙයි. අරුණ. නම් රජෙක් පිය වූ ය. ප්‍රභාවතී නම් බිසෝකෙණෙක් මව් වූ ය. අභිභූ ය සම්භව ය යන තෙර දෙනමෙක් අග සව් වූ සේක. ඛේමඞ්කර නම්. තෙරකෙණෙක් අග්‍ර උපස්ථායක වූහ. මඛිලා ය පදුමා ය යන ථෙරි දෙනමෙක් අග්‍ර ශ්‍රාවිකා වූ සේක. පුණ්ඩරීක නම් රුකෙක් බොධි වි ය. බුඩ ශරීර ය උස සත්නිස්රියනෙක. ශරීරප්‍රභාව තුන් යොදුනක් තැන් පැතිර සිටියේ ය. සත්තිස් දහසක් අවුරුදු සත් හට දම් දෙසා පිරිනිවි සේක.

කි යේ මැ නෝ

සිඛිස්සා'පි තයෝ සාවක සන්නිපාතා, පඨම සන්නිපාතෙ භික්ඛු සතසහස්සං අහොසි දුතියෙ අසීතිසහස්සානි, තතියෙ සත්තති. තදා බොධිසත්තෙනා අරින්දමෝ නාම රාජා හුත්වා බුඩපමුඛස්ස සඞ්ඝස්ස සබ්බරං මහාදානං පවත්තෙත්වා සත්තරතන පරිමණ්ඩිතං හත්ථිරතනං දත්වා හත්ථිප්පමාණං කත්වා කප්පිය භණ්ඩං අදාසි. සෝ'පි නං ඉතෝ එකතිංසෙ කප්පෙ බුඬෝ භවිස්සසී'ති ව්‍යාකාසි.

තස්ස පන භගවතෝ අරුණවතී නාම නගරං අහොසි. අරුණෝ නාම ඛත්තියෝ පිතා, පභාවතී නාම මාතා, අභිභූ ච සම්භවෝ ච අග්ගසාවකා, ඛෙමඞ්කරෝ නාමුපට්ඨාකෝ, මඛිලා ච පදුමා ච අග්ගසාවිකා, පුණ්ඩරිකරුක්ඛෝ බොධි, සරීරං සත්තනිංස හත්ථුබ්බෙධං අහොසි. සරීරප්පභා යොජනත්තයං එරිත්වා අට්ඨාසි. සත්තනිංස වස්ස සහස්සානි ආයු-සි.

ඒ සිබි නම් සම්බුදුරජාණන් වහන්සේට මැතභාගයෙහි දෙවන අතුරු කප:

තත්‍රේව මණ්ඩකප්පම්හි අසමෝ අප්පටිපුග්ගලෝ,
වෙස්සභූ නාම නාමේන ලොකෙ උප්පජ්ජි සෝ ජිනෝ-සි.

දක්වන ලද වෙස්සභූ නම් සම්බුදුරජාණන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඔබට ද ශ්‍රාවක සන්නිපාත තුනෙක් විය. ප්‍රථම සන්නිපාතයෙහි අසුලක්ෂයක් ශ්‍රාවකයන් වහන්සේ ය. දෙවෙනි ව සැත්තෑ ලක්ෂයක් භික්ෂූන් වහන්සේ ය. තුන්වෙනි ව සැටලක්ෂයක් භික්ෂූන් වහන්සේ ය. එකල අප මහ බෝසතාණෝ **සුදර්ශන** නම් රජෙක් ව ඉපද බුදුපාමොක් මහසඟනට චීවර සහිත මහදන් දී ඒ බුදුන් සමීපයෙහි පැවිදි ව ආචාර්ගුණයෙන් සමන්විත ව බුඩරහනයෙහි චිත්තීකාර ප්‍රීති බහුල වූ සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේ ද බොධිසඞ්ගයන්ට මතු එක්නිස්වන කප බුදුවෙනි සිවුරණ දෙවා වදාළ සේක.

ඒ භගවත්හු උපන් නුවර අනෝපම නම් වෙති. පියමහ රජානෝ සුපතීත නම් වෙති. මැනියෝ යසවති නම් වෙති. අග සවී දෙනම සෝන ය උත්තර ය යන නම් වෙති. උපස්ථායක මහ තෙරහු උපසන්ත නම් වෙති අග්‍ර ශ්‍රාවිකා දෙනම දුමා ය සමාලා ය යන නම් වෙති. බොධි වූයේ සල් රුකෙක, බුඩ ශරීර ය උස සැටරියනෙක, සැටදහසක් හවුරුදු සතුන් නිවන් දක්වා පිරිනිවි සේක.

නියේ මෑ නෝ.

තස්ස අපරභාගෙ වෙස්සභූ නාම සත්ථා උදපාදි. තස්සා'පි තයෝ සාවක සන්නිපාතා, පඨම සන්නිපාතෙ අසීති භික්ඛුසත සහස්සානි අහෙසුං. දුතියෙ සත්තති, තතියෙ සට්ඨි. තදා බොධි සත්තෝ සුදස්සනෝ නාම රාජා හුත්වා බුඩපමුඛස්ස සඞ්ඝස්ස සචීවරං මහාදානං දත්වා තස්ස සන්තිකෙ පබ්බජිත්වා ආචාරගුණ සම්පන්නෝ බුඩරහනෙ චිත්තීකාර පීතිබහුලෝ අහොසි. සෝ'පි තං භගවා ඉතෝ එකනිංස කප්පෙ බුඩෝ භවිස්සති'ති ව්‍යාකාසි.

තස්ස පන භගවතෝ අනොපමං නාම නගරං අහොසි. සුපතීතෝ නාම රාජා පිතා, යසවතී නාම මාතා, සෝනෝ ච උත්තරෝ ච අග්ගසාවකා, උපසන්තෝ නාමුපඨාකෝ, දුමා ච සමාලා ච අග්ගසාවිකා, සාලරුක්ඛෝ බොධි, සරීරං සට්ඨි හත්ථුබෙඛධං අහොසි. සට්ඨිවස්ස සහස්සානි ආයු-සි.

ඒ **වෙස්සභූ** නම් සම්බුදුරජාණන් වහන්සේට මෑත භාගයෙහි—

වෙස්සභුස්ස අපරෙන සම්බුඩෝ දිපදුත්තමෝ,
කකුසන්ධෝ නාම නාමෙන අප්පමෙය්‍යෝ දුරාසදෝ-සි.

දක්වන ලද **කකුසඳ** නම් සම්බුදුරජාණන් වහන්සේ මේ **කල්ප** යෙහි පළමුවෙනි අතුරු කල්ප පහළ වූ සේක. ඒ සම්බුදුරජාණන් වහන්සේට සතළිස් දහසක් පමණ එකශ්‍රාවක සන්නිපාතයෙක් වී ය. එ කල අපමණ බෝසතාණෝ ක්ෂේම නම් රජුක් ව ඉපද බුදුපාමොක් මහසඟනට පාසිවිරු සහිත මහදන් දී අදුන් බෙහෙත් ආදි ය ද දන් දී බණ අසා පැවිදි වූ සේක. බුදුරජාණන් වහන්සේ ද බොධිසත්ත්වයන්ට බුඩත්වයට විවරණ දෙවා වදාළ සේක.

ඒ **කකුසඳ** නම් භගවත්හු උපන් නුවර ක්ෂේම නම් වෙයි. පිය වූයේ අග්ගිදත්ත නම් බ්‍රාහ්මණොත්තමයෙක, මෑනි වූයේ විසාඛා නම් බ්‍රාහ්මණ දේවි කෙණෙක. අගසව් දෙනම විදුර ය සංජීව ය යන නම් වෙති. උපස්ථායක මහතෙරහු බුද්ධිජ නම් වෙති. අග්‍රශ්‍රාවිකා යුගළ සාමා ය චම්පකා ය යන නම් වෙති බොධි වූයේ මහාසිරීස නම් රුකෙක, බුඩශරීර ය උස සතළිස් රියනෙක, සතළිස් දහසක් හවුරුදු සත්නට දම් දෙසා පිරිනිවි සේක.

කියේ මෑ නෝ.

කකුසන්ධස්ස භගවතෝ එකෝ සාවක සන්නිපාතෝ, තත්ථ චත්තාළීස භික්ඛුසහස්සානි අහෙසුං. තදා බොධිසත්තෝ ඛෙමෝ නාම රාජා හුත්වා බුද්ධ පමුඛස්ස සංඝස්ස සපත්තචීවරං මහා දානං දෙව අඤ්ඤානි හෙසජ්ජානිවෙව දත්වා සත්ථු ධම්මදෙසනං සුත්වා පබ්බජි. සෝ'පි තං සත්ථා ව්‍යාකාසි.

කකුසන්ධස්ස පන භගවතෝ ඛෙමං නාම නගරං අහොසි. අග්ගිදත්තෝ නාම බ්‍රාහ්මණෝ පිතා, විසාඛා නාම බ්‍රාහ්මණී මාතා, විදුරෝ ච සංජීවෝ ච අග්ගසාවකා, බුද්ධිජෝ නාමුපඨාකෝ, සාමා ච චම්පකා ච අග්ගසාවිකා, මහාසිරීස රුක්ඛෝ බොධි, සරීරං චත්තාළීස හත්ථුබ්බේධං අහොසි. චත්තාළීස වස්ස සහස්සානි ආයු-යි.

ඒ **කකුසඳ** නම් බුදුන්ට මැතභාගයෙහි මෙම **කල්ප** යෙහි ම දෙවෙනි අතුරුකප:

කකුසන්ධස්ස අපරෙන සම්බුඩෝ දිපදුත්තමෝ,
කොණාගමනෝ නාම ජිනෝ ලොකජෙට්ඨෝ නරාසභෝ-යි.

දක්වන ලද **කොණාගමන** නම් සම්බුදුයන් වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඔබට ද. තිස් දහසක් පමණ එක් ශ්‍රාවක සන්නිපාතයෙක් වී ය. එ කල අප මහ බෝසතාණෝ **පණ්ඩිත** නම් රජක් ව අමාත්‍යගණයා පිරිවරා බුදුන් සමීපයට ගොස් දම් දෙසුම් අසා බුදුපාමොක් මහසංඝයාට නිමන්ත්‍රණය කොට මහදන් පවත්වා පත්‍යුණණ-වීනපට්ට-කොසෙය්‍ය-කම්බල දුකූල සඩර්ණපට්ටක දන් දී බුදුන් සමීපයෙහි පැවිදි ව ඒ බුදුන් කෙරෙහු ත් විවරණ ලබ් සේක.

ඒ බුදුන් උපත් නුවර සොභවතී නම් වෙයි. යඤ්ඤදත්ත නම් බ්‍රාහ්මණොත්තමයෙක් පිය වූ ය. උත්තරා නම් බැමිණිකෙණෙක් තොමෝ මව් වූ ය. භීයොස ය උත්තර ය යන තෙර සඟලෙක් අගසව් වූ සේක. සොත්ථිජ නම් තෙර කෙණෙක් උපස්ථායක වූ සේක. සමුද්‍රා ය උත්තරා ය යන ශ්‍රාවිකා යුගළයෙක් අග්‍රශ්‍රාවිකා වූ සේක. උදුම්බර නම් රුකෙක් බෝධි වී ය. බුඛශරීර ය උස නිස් රියනෙක, තිස් දහසක් හවුරුදු විනේයජන බඹුන්ට නිවන් අමා අනුභව කරවා පිරිනිවි සේක.

කියේ මැනෝ.

තස්ස අපරභාගෙ කොණාගමනෝ නාම සත්ථා උදපාදි. තස්සා'පි එකෝ සාවක සන්නිපාතෝ, තත්ථ භික්ඛුසහස්සානි අහෙසුං. තදා බොධිසත්තෝ පබ්බතෝ නාම රාජා හුත්වා අමච්ච ගණපරිවුතෝ සත්ථුසන්තිකං ගන්ත්වා ධම්මදෙසනං සුත්වා බුද්ධ පමුඛං භික්ඛුසංඝං නිමන්තෙත්වා මහාදානං පවත්තෙත්වා පත්තුණණ චීනපට්ටං කොසෙය්‍යං කම්බලං දුකූලානි චෙව සුවණණ පට්ටකඤ්ච දත්වා සත්ථුසන්තිකෙ පබ්බජි. සෝ'පි තං ව්‍යාකාසි

තස්ස භගවතෝ සොභවතී නාම නගරං අහොසි. යඤ්ඤදත්තෝ නාම බ්‍රාහ්මණෝ පිතා, උත්තරා නාම බ්‍රාහ්මණී මාතා, භියෝසෝ ච උත්තරෝ ච අග්ගසාවකා, සොත්ථිජෝ නාමුපට්ඨාකෝ, සමුද්දා ච උත්තරා ච අග්ගසාවිකා, උදුම්බරරුක්ඛෝ බොධි, සරීරං තිංස හත්ථුබ්බෙධං අහොසි තිංසවස්සසහස්සානි ආයු-සි

ඒ **කොණාගමන** නම් බුදුරජානන් වහන්සේට මෑත භාගයෙහි මේ කල්පයෙහි හුන්වෙනි අතුරුකප:

කොණාගමනස්ස අපරෙන සම්බුඩෝ දිපදුත්තමෝ,
කස්සපෝ නාම සෝ ජිනෝ ධම්මරාජා පභඞ්කරෝ-සි.

දක්වන ලද **කාශ්‍යප** නම් සම්බුදුයන් වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ සේක. ඔබට විසි දහසක් පමණ එක ම ශ්‍රාවක සන්නිපාතයෙක් වි ය. එ සමයෙහි අප මහ බෝසතාණෝ **ජෝතිපාල** නම් මාණවක ව ත්‍රිවේදයෙහි පරතෙර දැක භූමියෙහි ද ආකාශයෙහි ද ප්‍රකට ව ඝටිකාර නම් කුම්භකාරයක්හට මිත්‍ර ව ඔහු හා සමග බුදුන් කරා එලඹ බණ අසා පැවිදි ව ආරබ්ධ වීර්‍ය්‍ය ඇති ව හෙවත් නොපසු බස්නාලද වීර්‍ය්‍ය ඇති ව පිටකත්‍රය ඉගෙණ වත් පිළිවෙතින් බුදුසසුන් නොබවා ඒ බුදුන් කෙරෙනුත් විවරණ ලත් සේක.

ඒ භගවත්හුගේ උපන් නුවර බරණැස නම් වි ය. පියා නෝ බ්‍රහ්මදත්ත නම් වූ බ්‍රාහ්මණොත්තමයෙක, මැනියෝ ධනවතී නම් බැමිණිකෙණෙක. අග්‍රශ්‍රාවක දෙනම තිස්ස ය භාරද්වාජ ය යන තෙර සහළෙක. උපස්ථායක වූ යේ සබ්බමිත්ත නම් තෙර කෙණෙක, අග්‍රශ්‍රාවිකා වූ යේ අනුලා ය උරුවෙලා ය යන ථේරී යුගළෙක. බොධි වූ යේ න්‍යග්‍රොධ නම් රුකෙක. බුඩ ශරීර ය උස විසි රියනෙක, විසි දහසක් හවුරුදු විතෙය ජනබන්ධූන්ට නිවන් අමා අනුභව කරවා පිරිනිවි සේක.

කියේ මැ නෝ.

තස්ස අපරභාගෙ කස්සපෝ නාම සත්ථා ලොකෙ උදපාදි. තස්සා'පි එකොව සාවක සන්නිපාතෝ, තස්ස වීසති භික්ඛුසහස්සානි අහෙසුං. තදා බොධිසත්තෝ ජෝතිපාලෝ නාම මාණවෝ හුත්වා තිණ්ණං වෙදානං පාරගූ හුත්වා අනන්තලිකෙඛ ච පාකටෝ ඝටිකාරස්ස කුම්භකාරස්ස මිත්තෝ අහොසි. සෝ තෙන සද්ධිං සත්ථාරං උපසංකම්මිත්වා ධම්මකථං සුත්වා පබ්බජිත්වා ආරද්ධවිරියෝ තීණිපිටකානි උග්ගහෙත්වා වත්තාවත්ත සම්පත්තියා බුඩසාසනං සොභෙසි. සෝ'පි තං සත්ථා ව්‍යාකාසි.

තස්ස භගවතෝ ජාත නගරං බාරාණසී නාම අහොසි. බ්‍රහ්මදත්තෝ නාම බ්‍රාහ්මණෝ පිතා, ධනවතී නාම බ්‍රාහ්මණී මාතා, තිස්සෝ ච භාරද්වාජෝ ච අග්ගසාවකා, සබ්බමිත්තෝ නාම්පඨාකෝ, අනුලා ච උරුවෙලා ච අග්ගසාවිකා, නිග්‍රොධ රුකෙඛා බොධි, සරීරං වීසති හත්ථුබෙඛධං අහොසි. වීසතිවස්ස සහස්සානි ආයු-සි.

යම් කල්පයෙක්හි වනාහි **දීපඞ්කර** බුදුහු ප්‍රාදුර්භූත වූ සේක් ද ඒ කල්පයෙහි **තණ්හඞ්කර** ය **මෙධඞ්කර** ය **සරණඞ්කර** ය යන බුදුවරයෝ තුන් නමක් ප්‍රාදුර්භූත වූ සේක් ලා ය. ඔවුන් වහන්සේලා කෙරෙන් බෝධිසත්වයෝ නියත ව ගත් විවරණෙක් නැත. එසේ හෙයින් ඔවුන් වහන්සේලා මේ නිදානයේ දැක්වූයේ නැත. අටුවා කථාවෙහි වනාහි ඒ කල්ප ය පටන් සියලු බුදුවරයන් දක්වන පිණිස:

තණ්හඞ්කරෝ මෙධඞ්කරෝ අථොපි සරණඞ්කරෝ,
දීපඞ්කරෝ ච සම්බුද්ධෝ කොණ්ඩඤ්ඤෝ දීපදුත්තමෝ.

මඞ්ගලෝ ච සුමනෝ ච රේවතෝ සෝභිතෝ මුනි,
අනෝමදස්සී පදුමෝ නාරදෝ පදුමුත්තරෝ.

සුමේධෝ ච සුජාතෝ ච පියදස්සී මහායසෝ,
අත්ථදස්සී ධම්මදස්සී සිද්ධත්ථෝ ලෝකනායකෝ.

තිස්සෝ ඵුස්සෝ ච සම්බුද්ධෝ විපස්සී සිඛී වෙස්සභූ,
කකුසන්ධෝ කොණාගමනෝ කස්සපෝවා'පි නායකෝ.

එතෙ අහේසුං සම්බුද්ධා වීතරාගා සමාහිතා,
සත්තරංසි'ව උප්පන්නා මහාතම විනොදනා,
ජලිත්වා අග්ගික්ඛන්ධාව නිබ්බුතා තෙ සසාවකා—ති.

යනුවෙන් දක්වන ලදි.

දූරෙ නිදානයහි ද මේ දක්වන්නට හේතු

යස්මිං පන කප්පෙ දීපඞ්කර දසබලෝ උදපාදි: තස්මිං අඤ්ඤේපි තයෝ බුද්ධා අහේසුං. තෙසං සන්තිකා බොධිසත්තස්ස ව්‍යාකරණං නත්ථි, තස්මා තෙ ඉධ න දස්සිතා. අට්ඨකථායම්පන තම්හා කප්පා පට්ඨාය සබ්බෙ බුද්ධෙ දස්සෙතුං ඉදං වුත්තං:

එහි අපමාණ බෝසතානෝ දීපඞ්කරාදි සුවිසි බුදුන්ගේ සමීප යෙහි විවරණ ලබන සේක්, කල්ප ශතසහස්‍රයක් හා සතර සඞ්ඛ්‍යක් ආසේක. කාශ්‍යප බුදුන්ට ඕර භාගයෙහි මේ බුදුන් හැර අන්බුදුකෙණෙක් උපන්නේ නැත.

කියේ මෑ නෝ

තත්ථ අවිහාකා බොධිසත්තා දීපඞ්කරාදීනං චතුවීසතියා බුද්ධානං සන්තිකෙ අධිකාරං කරොන්තා කප්ප සතසහස්සාධි

කානි චත්තාරි අසඞ්ඛෙය්‍යානි ආගතො. කස්සපස්ස පන භගවතො ඔරභාගෙ ඨපෙත්වා ඉමං සම්මාසම්බුඩ්ඨං, අඤ්ඤෙ බුද්ධා නාම නත්ථි.

මෙසේ දීපඞ්කරාදි සූ විසි බුදුන්ගේ සමීපයෙහි ලද විවරණ ඇති බෝසතුන් විසින්:

මනුස්සත්තං ලිඞ්ගසම්පත්ති හෙතු සත්ථාර දස්සනං,
පබ්බජ්ජා ගුණ සම්පත්ති අධිකාරො ච ඡන්දතා,
අට්ඨධම්ම සමොධානා අභිනීහාරො සමිජ්ඣති-සි.

යන මේ අෂ්ටධර්මයෙන් සමන්විත ව දීපඞ්කර පාදමූල යෙහි කතාභිනීහාර ඇති ව:

"හන්ද බුඩ්ඨකරෙ ධම්මෙ, විවිණාමි ඉතොචිතො"-සි: යනුවෙන් උත්සාහකොට-"විවිණන්තො තදද්දසඞ්ඛිං - පඨමං දානපාරමිං-සි.

යනුවෙන් මේ දානපාරමිතාදි බුඩ්ඨකාරක ධර්ම ය අධිෂ්ඨාන කළ සේක් ද ඒ බුඩ්ඨකාරක ධර්මයන් පූරණ ය කරණ සේක් වෙස් සන්තාරණත්ථම් භාවයට ආසේක. මේ වෙසතුරු අත්බැව් දක්වා අපමණ බෝසතානෝ:

එවං සබ්බඞ්ගසම්පන්නා බොධියා නියතා නරා,
සංසාරං දීඝමද්ධානං කපපකොටි සතෙහිපි.

අවීචිම්හි න උපපජ්ජන්ති තථා ලොකන්තරෙසු ච,
භිජ්ඣාම තණ්හා බ්‍යාපාදා න හොන්ති කාලකඤ්ජිකා.

න හොන්ති බුද්ධා පාණා උපපජ්ජන්තා'පි දුග්ගතිං,
ජායමානා මනුස්සෙසු ජච්චන්ධා න භවන්ති තෙ.

සොත වෙකල්ලතා නත්ථි භවන්ති මූගපක්ඛිකා,
ඉත්ථිභාවං න ගච්ඡන්ති උභතො ව්‍යඤ්ජන පණ්ඩකා.

න භවන්ති පරියාපන්නා බොධියා නියතා නරා,
මුත්තා ආනන්තරිකෙහි සබ්බත්ථ සුඛගොචරා.

මිච්ඡාදිට්ඨිං න සෙවන්ති කම්මකිරිය දස්සනා,
විසමානා'පි සඞ්ගෙසු අසඤ්ඤං න උපපජ්ජරෙ.

සුද්ධාවාසෙසු දෙවෙසු හෙතු නාම න විජ්ජති,
නෙක්ඛම්ම නින්නා සප්පුරිසා විසංයුත්තා භවා භවෙ,
චරන්ති ලොකන්ථවරියාය පූරෙන්තා සබ්බ පාරමී-සි.

යනු නියත විවරණ ලත් සියලු බෝධිසත්වයන් විසින් නොපැමිණිය යුතු සථාන බැවින් අවීචි මහා නරකයෙහි ත් නූපන් සේක. ලෝකාන්තරික නරකයෙහි ත් නූපන් සේක. ක්ෂුත්පිපාස යෙන් පීඩිතවන නිජ්ඣාම තණ්හිකා නම් ප්‍රේත ලෝකයෙහි ත් නූපන් සේක.

කාලකඤ්ජික අසුරයෝනියෙහි ත් නූපන් සේක. තිරිසන් යෝනියෙහි උපදින ත් වටු කුරුලුවන්ට කුඩාව ත් නූපන් සේක. මනුෂ්‍ය ව උපදනේ ද ජාතියෙන් අඬ නොවූ සේක. ජාතියෙන් බිහිරි නො වූ සේක. ජාතියෙන් ගොලු නො වූ සේක. සන්ත්‍රී ව නො උපන් සේක. උභතොබ්‍යඤ්ජනක ව නො උපන් සේක. පණ්ඩක ව නො උපන් සේක. මාතෘඝාතක නො කළ සේක පිතෘ ඝාතක නො කළ සේක. අරහන්තඝාතක නො කළ සේක. ලෝහි තුප්පාදක නො කළ සේක. සඞ්ඝභෙද නො කළ සේක. සැම තන් හිම පිරිසිදු වූ අදහස් ඇති සේක. නියත මිථ්‍යාදෘෂ්ටි නො ගත් සේක. කම්මවාදී ක්‍රියාවාදී සම්‍යක්දෘෂ්ටි ඇති සේක. කාමාවචරයෙහි මාරදිව්‍යරාජ ව නො උපන් සේක රූපාවචරයෙහි අසංඥතලයෙහි නො උපන් සේක. පඤ්ච සුද්ධාවාසයෙහි අනාගාමීන් ම උපදනා බැවින් එහි ත් නො උපන් සේක.

මේ ආදී අභව්‍යඨාන කරා නො පැමිණ බෝධිසත්ව චරිත ය නො හැර අකිරිති බ්‍රාහමණ කාලයෙහි, සංඛ බ්‍රාහමණ කාලයෙහි, ධනඤ්ජය රාජ කාලයෙහි, මහා සුදර්ශන කාලයෙහි, මහා ගෝවින්ද කාලයෙහි, නිමි මහාරාජ කාලයෙහි, චන්ද්‍රකුමාර කාලයෙහි, විසයහ සිටුකාලයෙහි, සිවි මහාරාජ කාලයෙහි, වෙස්සන්තර කාලයෙහි ය යි මේ ආදී නොයෙක් ජාති කොටි සහස්‍රයෙහි දැන පාරමිතාව පිරූ පරිදි පමණෙක් නම් නැත්.

කී යේ මෑ නෝ

තෙ ආනිසංසෙ අධිගන්ත්වා ච ආගතො පාරමියො පූරෙ නත්‍යස්ස වස්ස අකිත්තිබ්‍රාහමණ කාලෙ සංඛ බ්‍රාහමණ කාලෙ ධනඤ්ජය රාජ කාලෙ මහාසුදස්සන කාලෙ මහාගොවින්ද කාලෙ නිමි මහාරාජ කාලෙ චන්දකුමාර කාලෙ විසයහසෙට්ඨි කාලෙ සිවිරාජ කාලෙ වෙස්ස න්තර කාලෙ'නි දානපාරමිතාය පූරිතත්තභාවානං පරිමාණං නාම නත්ථි-සි

එසේ ම සීලව නාගරාජ කාලයෙහි චම්පෙය්‍යනාගරාජ කාල යෙහි භූරිදත්ත නාගරාජ කාලයෙහි ඡද්දන්ත නාගරාජ කාලයෙහි

ජයද්දිස රජහුගේ පුත්‍ර වූ අලීනසත්තු කුමාරකාලයෙහි ය සි මේ ආදී තන්හි සීලපාරමිතාවගේ පිරූ පරිදි පමණෙක් නැත්.

කියේ මෑ නෝ.

තථාපි සීලව නාගරාජකාලෙ වමෙපය්‍ය නාගරාජකාලෙ භූරි දත්ත නාගරාජකාලෙ ඡද්දන්ත නාගරාජකාලෙ ජයද්දිස රාජස්ස පුත්ත අලීනසත්තුකුමාරකාලෙ'ති සීලපාරමිතාය පූරිතත්තභාවා නං පරිමානං නාම නත්ථි.— එසේ ම සොමනස්ස කුමාරකාලයෙහි හත්ථිපාල කුමාරකාලයෙහි අයොඝර පණ්ඩිත කාලයෙහි ය සි මේ ආදී තන්හි මහාරාජ්‍ය ය හැර නෙක්ඛම්මපාරමිතාවගේ පිරූ පරිදි පමණෙක් නැත්.

කි යේ මෑ නෝ

තථා සොමනස්ස කුමාරකාලෙ හත්ථිපාල කුමාරකාලෙ අයොඝර පණ්ඩිතකාලෙ'ති මහාරජ්ජං පහාය නෙක්ඛම්මපාරමිතාය පූරිතත්තභාවානං පරිමානං නාම නත්ථි.

එසේ ම විදූරපණ්ඩිත කාලයෙහි මහාගොවින්ද පණ්ඩිත කාල යෙහි කුද්දාලපණ්ඩිත කාලයෙහි අරකපණ්ඩිත කාලයෙහි බොධිපරි බ්‍රාජක කාලයෙහි මහෞෂධපණ්ඩිත කාලයෙහි ය සි මේ ආදී තන්හි ප්‍රඥාපාරමිතාවගේ පිරූ පරිදි ප්‍රමාණයෙක් නම් නැත්.

කි යේ මෑ නෝ

තථා විධුර පණ්ඩිතකාලෙ මහා ගොවින්දපණ්ඩිතකාලෙ කුද්දාලපණ්ඩිතකාලෙ අරකපණ්ඩිතකාලෙ බොධි පරිබ්බාජකකාලෙ මහොසධපණ්ඩිතකාලෙ'ති පඤ්ඤාපාරමියා පූරිතත්තභාවානං පරි මාණං නාම නත්ථි.

මෙසේ දන්වන ලද ක්‍රමයෙන් බෝධිසම්භාර ධර්මයන් පුර මින් අවුත් වෙසසන්තරාත්මභාවයෙහි සිට සිත් පිත් නැති මහා පෘථිවි ය සත්වරුන් කම්පා කරවා මහ දන් දුන් සේක.

එසින් වදලහ

අවෙතනා'යං පුථවී අවිඤ්ඤය සුඛං දුඛං,
සා'පි දානබලා මයහං සත්තකඛත්තුං පකම්පථ-සි.

මේ ලෝකයෙහි බොහෝ සෙයින් දානාදී මහ පින්කම් කොට ඉහලෝකයෙහි ම මහත් ඉසුරට පැමිණි සත්වයෝ ඇත. ඔහු කවි රූ ද යත්? සුමණමාලාකාරයෝ ය, එකසාටක බ්‍රාහ්මණයෝ ය,

පූණ් තම් බැළයෝ ය, මිලලිකාදෙවී ය, ගවපාලමාතාවෝ ය, සුපපිය නම් උපාසිකාවෝ ය, පුණණ නම් දැසි ය යන මොවුන් අතුරෙහි කියිවක්හුගේ දැනයෙහි එක් වරක් හෝ දෙවරක් හෝ කිපවාර යක් හෝ පෘථිවි ය කම්පා වූ තැන් දක්නට නැත.

මෙ ම කියේ මැ නෝ - මිලිඳුපැනයෙහි

සූයති නු ඛො මහාරාජ එතරහි ජිනසාසනෙ කතාධිකාරානං දිට්ඨධමෙම සුඛවෙදනියං කම්මං කිත්නි ව, යෙසං අඛ්හගතා දෙව මනුසෙසසූ'නි? ආම භනෙන! සූයති එතරහි ජිනසාසනෙ කතාධිකාරානං දිට්ඨධම්ම සුඛවෙදනියං කම්මං කිත්නි ව, යෙසං අඛ්හගතා දෙවමනුසෙසසු සත්ත තෙ ජනා'නි. කො ව කො ව මහාරාජ'නි? සුමනො ව භනෙත මාලාකාරො, එකසාටකො ව බ්‍රාහමණො, පුණෙණා ව භතකො, මලලිකා ව දෙවී, ගොපාලමාතා ව දෙවී, සුපපියා ව උපාසිකා, පුණණා ව දාසී'ති ඉමෙ සත්ත දිට්ඨ ධමෙම සුඛවෙදනියා සත්තා කිත්නි ව, ඉමෙසං අඛ්හගතා දෙව මනුසෙසසු-සි.

සෙසු ත් ගුත්තිල නම් ගාඛපීයෝ ය, සාධිනා නම් මහරජා නෝ ය, නිමි මහරජානෝ ය, මහාමඛාතු රජානෝ ය, යන මොහු මනුෂ්‍ය ශරීරයෙන් තිදස භවනයට ගිය බැවි අසනු ලැබෙ සි. ඔවුන් අතුරෙහි ද කියිවක්හුගේ දැනයෙහි ත් පෘථිවිකම්පා වූ තැන් දක් නට නැත්.

හෙ ද කියේ මැනෝ—එ ම මිලිඳුපැනයෙහි

අපරෙ'පි සූයනති නු ඛො අතීතෙ මානුසකෙනෙ'ව සරීර දෙහෙන තිදසභවනං ගතා'නි? ආම භනෙන! සූයනතීති. කො ව කො ව මහාරාජ'නි? ගුත්තිලො ව ගඛඛෙඛා, සාධිනො ව රාජා, නිමී ව මහාරාජා, මඛාතා ව රාජා'නි ඉමෙ චතුරො ජනා සූයනති තෙනෙ'ව මානුසකෙන සරීරදෙහෙන තිදසභවනං ගතා'නි. සුචිරං'පි කතං සූයති සුකත දුකකතං-යි

මේ මතු නොවෙයි. කාලත්‍රයෙහි ම වෙසතුරු අත් බැවි හැර කිසිවක්හුගේ දැනයෙහි ත් පෘථිවි කම්පා වූ තැන් දක්නට නැත්.

හෙ ද කියේ මැ නෝ—එහි ම

සුතපුබ්බං පන තයා මහාරාජ අතීතෙ වා අද්ධානෙ වත්ත මානෙ වා අද්ධානෙ ඉමස්සාමසස දුතෙ දීයමානෙ සකිං වා දවිකඛත්තුං වා තිකඛත්තුං වා මහාපඨවි කම්පිතා'නි? තහි

භන්තෙ'නි! අපි මේ මහාරාජ ආගමෝ අධිගමෝ පරියත්ති සවණං සික්ඛාබලං සුස්සූසා පරිපුච්ඡා ආවරියුපාසනං මයං'පි නයඤ්ඤතපුබ්බං ඉත්ථන්නාමස්ස දූතෙ දීයමානෙ සකිං වා දට්ඨකත්තුං වා නික්ඛත්තුං වං මහාපථවි කම්පිතාති එපෙතා වෙස්සන්තරස්ස රාජවසභස්ස දූතවරං, භගවතො ව මහාරාජ කස්සපස්ස භගවතො ව සක්කාය්‍යමුනිනොති, දිබ්බානං බුද්ධානං අන්තරෙන ගණනපථං වීතිවත්තා වස්සකොට්යො අතික්කන්තා. තත්'පි මේ සවණං නත්ථි ඉත්ථන්නාමස්ස දූතෙ දීයමානෙ සකිං වා දට්ඨකත්තුං වා නික්ඛත්තුං වා මහාපථවි කම්පිතා-සි.

වෙස්සන්තර මහරජහුගේ දූනයෙහි ඔහුගේ ගුණධර්ම ය අනිහරි තත්ත්ව ය කරණකොටගෙණ ධරන්නට අසමර්ථ ව මහා පෘථිවි චලනාදිය වී ය. යම් සේ භාණ්ඩයෙහි අනිහාරයෙන් සකට යෙහි නාභිය ද නෙමිය ද අක්ෂය ද බිඳේ ද, එ පරිද්දෙන් ම වෙස්සතුරු මහ රජහුගේ ගුණධර්ම ය සහිත වූ දූනබලයෙන් පෘථිවිය කම්පා වී ය. යම් සේ අහස වාත ජලවේගාදි ය පිණිස ශබ්ද පවත්වා ගර්ජනා කෙරේ ද, එ පරිද්දෙන් ම වෙස්සතුරු මහරජහුගේ ගුණධර්ම ය හේතුකොටගෙණ පෘථිවි කම්පා වී ය.

කියේ මැ නෝ — එ ම මිලිඳුපැනයෙහි

න මහාරාජ තාවතකෙන විරියෙන තාවතකෙන පරක්කමෙන මහාපථවි කම්පති. ගුණභාරහරිතා මහාරාජ සබ්බඤ්ඤු වෙය්‍ය කිරිය ගුණභාරහරිතා ධාරෙතුං නවිසහන්ති. මහාපථවි වලති කම්පති පවෙධති. යථා මහාරාජ සකටස්ස අතිභාරහරිතස්ස නාභියෝ ව නෙමියෝ ව ඵලන්ති අක්ඛා භිජ්ජති-එවමෙව ඛො— පෙ—යථා වා පන මහාරාජ ගගනං අනිල ජලවෙග සඤ්ජාදිතං උස්සන්නං ජලභාරහරිතං අතිවාතෙන පූරිතත්තා නදති රවති ගළගළායති. එවමෙව ඛො මහාරාජ මහාපථවි රක්ඛසු වෙස්සන්තරස්ස දූනබල විපුල උස්සන්න භාරහරිතා ධාරෙතුං නවිසහන්ති වලති කම්පති පවෙධති—යී.

තව ද වෙස්සතුරු මහරජානන්ගේ සිත රාග වසයෙන් නො පැවැත්තේ ය. දොෂවශයෙන් නො පැවැත්තේ ය. මොහ වශයෙන් නො පැවැත්තේ ය. මානවශයෙන් නො පැවැත්තේ ය. දෘෂ්ටි වශයෙන් නො පැවැත්තේ ය. කෙලෙශවශයෙන් නො පැවැත්තේ ය. විතර්කවශයෙන් නො පැවැත්තේ ය. අරති වශයෙන් නො පැවැත්තේ ය. බොහෝ සෙසින් දූනවශයෙන් සිත

පැවැත්තේ ය. කිමෙක් ද? යාවකයෝ මා සමීපයට කෙසේ නම් එලඹෙත් ද, එලඹි එලඹි යාවකයෝ කෙසේ නම් අභිමතාර්ථ වස්තු ලැබ සතුටු වෙත් ද යනාදීන් දැනයෙහි පැවැති බලවත් ශ්‍රද්ධාව ඇති සේක.

දම ය ශම ය ක්ෂාන්ති ය සංවර ය යනාදී දශසථානයක පැවැති සිත් ඇති සේක. කාමේෂනාදිය ප්‍රහීණ කළ සේක. බ්‍රහ්මචරියේෂනාදියෙහි උත්සාහයට පැමිණි සේක. කිමෙක් ද? මේ සියලු සත්වයෝ කෙසේ නම් නිදුක් නිරොගි වෙත් ද, සමගි වෙත් ද, කෙසේ නම් දිර්ඝායු වෙත් ද යනාදීන් සම්‍යක් අධ්‍යාස ය බහුල ව පැවැත්තේ ය.

මේ කරුණු විසතර වශයෙන් වදාළ හ නාගසෙන මහ තෙරහු මිලිඳු පැනයෙහි:

න හි මහාරාජ රඤ්ඤෝ වෙස්සන්තරස්ස චිත්තං රාග වසෙන පවත්තති, දෙසවසෙන නපපවත්තති මොහවසෙන නපප වත්තති. මානවසෙන නපපවත්තති, දිට්ඨිවසෙන නපපවත්තති, කිලෙස වසෙන නපපවත්තති. විතක්කවසෙන නපපවත්තති, අරතිවසෙන නපපවත්තති. අථ ඛො දානවසෙන බහුලං පවත්තති. කින්ති අනාගතා යාවකා මම සන්තිකං ආගච්ඡෙය්‍යුං. ආගතා ච යාවකා යථා කාමං ලභිත්වා අත්තමනා ලහෙය්‍යුන්ති සතතං සම්නං දානං පති මානසං ඨපිතං හොති.

රඤ්ඤෝ මහාරාජ වෙස්සන්තරස්ස සතතං සම්තං දසසු ඨානෙසු මානසං ඨපිතං හොති. දමෙ සමෙ ඛන්තියං සංවරෙ යමෙ නියමෙ අක්කොධෙ අවිහිංසාය සවෙව සොවෙය්‍යෙ. රඤ්ඤෝ මහාරාජ වෙස්සන්තරස්ස කාමෙසනා පහීණා භවෙසනා පටිපස්සද්ධා බ්‍රහ්මචරියෙසනා යෙව උස්සුක්කං ආපන්නා. රඤ්ඤෝ මහාරාජ වෙස්සන්තරස්ස අත්තරක්ඛා පහීණා පරා රක්ඛයා උස්සුක්කං ආපන්නා කි'න්ති අඪා ඉමෙ සත්තා සමගා අස්සු අරොගා සධනා දීඝායුක්කා'නි බහුලං යෙව මානසං සං වත්තති-සී.

තව ද දන්දෙනු ලබන්නා වූ වෙස්සන්තර මහරජානෝ ඒ දාන ය හවසම්පත්තියක් පිණිස ත් නුදුන් සේක. ධනයක් පිණිස ත් නුදුන් සේක. ප්‍රඥාදානය ක් පිණිස ත් නුදුන් සේක. කීර්ති පිණිස ත් නුදුන් සේක. වර්ණනා පිණිස ත් නුදුන්

සේක. සැප පිණිස ත් නුදුන් සේක. පුත්‍රයින් පිණිස ත් නුදුන් සේක. ධිතෘන් පිණිස ත් නුදුන් සේක. සම්‍යක්ඥාන ය පිණිස ම මේ බදු අතුල්‍ය වූ දානය දුන් සේක.

මේ ද වදාළහ-මිළිඳු මහරජහට නාගසේන මහතෙරහු. දදමානො ව මහාරාජ වෙස්සන්තරො රාජා තං දානං න භව සම්පත්ති හෙතු දෙති. න ධන හෙතු දෙති. න පටිදාන හෙතු දෙති. න උපලාපනෙතු දෙති. න ආයු හෙතු දෙති. න වණ්ණ හෙතු දෙති. න සුඛ හෙතු දෙති. න බලහෙතු දෙති. න යස හෙතු දෙති. න පුත්ත හෙතු දෙති. න ධිතුහෙතු දෙති. අථ ඛො සබ්බඤ්ඤුත ඤාණ රතනස්ස කාරණා එවරූපෙ අතුල දිපුලා නුත්තාරෙ දානවරෙ අදාසි-සි.

බුදුන් විසිනි දු වදාළේ මෑ නෝ.

ජාලිං කණ්හාජිනං ධීතං මද්දිදෙවිං පතිබ්බතං,
චජමානො න විනෙතාසිං බොධියා යෙව කාරණා-සි.

ඒ වෙස්සන්තර මහරජානෝ ක්‍රොධි සත්වයන් ක්‍රොධ නො කිරීමෙන් ජයගත් සේක. අසාධු ජනයන් සාධුභාවයෙන් ජය ගත් සේක. කදරින් දානයෙන් ජයගත් සේක. මෘෂාවාදීන් සත්‍යවචනයෙන් ජයගත් සේක. අකුසල ය කුසලයෙන් ජයගත් සේක. මේ බදු ගුණයෙන් යුක්ත ව ධම්මානුගත ව ධම්මසීසක ව දන් දෙන්නහුගේ විපුල වීර්‍යබල විහාරයෙන් යට මහාවාතයෝ වංවලවීම් ආදියෙන් පෘථිවි කම්පාවී.

මේ ද විස්තර වසයෙන් වදාළහ-මිළිඳුරජහට නාගසේන මහතෙරහු.

වෙස්සන්තරො මහාරාජ රාජා අක්කොධෙන කොධං ජිනාති. අසාධුං සාධුනා ජිනාති, කදරියං දානෙන ජිනාති, අලිකවාදිනං සච්චෙන ජිනාති, අභබ්බං අකුසලං කුසලෙන ජිනාති. තස්ස එවං දදමානස්ස ධම්මානුගතස්ස ධම්මසීසකස්ස දාන නිස්සන්ද බලවිපුල විහාරෙන යෙඪා මහාවාතා සංවලන්ති. සන්තං සන්තං සකිං සකිං ආකුලාකුලා වායන්ති. ඔණමන්ති උන්නමන්ති විනමන්ති සීනපත්තා පාදපා පපතන්ති. ගුම්බ ගුම්බං වලාහකා ගගනෙ සඤ්චරන්ති. රජෝ සංචිතා වාතා දුරුණා හොන්ති-ගගනං උපපී ළිතං වාත වායන්ති. සහසා ධම්ධමායන්ති. මහන්ති මහාභීමෝ සද්දෝ නිච්ඡරති.

තෙසු වාතෙසු කුපිතෙසු උදකං සනිකං සනිකං චලති. උදකෙ චලිතෙ ඛුබ්භනති, මච්ඡකච්ඡපා ජායන්ති, යමක යමකා ඌමියො තසන්ති, ජලචරා සත්තා ජලවිවි යුගනඩ්ඩො වත්තති. වීවි නාදෙ පවත්තති, සෝරා බුබ්බුලා උට්ඨහන්ති, ඵෙණමාලා භවන්ති. උත්තරන්ති මහාසමුද්දො, දිසාවිදිසං ධාවන්ති. උදකං උසෙසාත පටි සොතමුඛා සන්දන්ති, සලිලධාරා තසන්ති, අසුරා ගරුළා නාගා යක්ඛා උබ්බිජ්ජන්ති, කින්නු ඛො කථන්නු ඛො සාගරො විපරි වත්තතී'ති ? ගමන් පථමෙසන්ති භීතවිත්තා ඛුභිතෙ ලුලිතෙ ජලධරෙ පකම්පති මහාපථවි, සනාගා සසාගරා පරිවත්තන්ති සිනෙරු ගිරිකූට සෙලසිඛරො විනමම්නො හොති. විමිනා හොන්ති අහි නකුල බිළාර් කොඤ්චක සූකර මිගපක්ඛිනො රුදන්ති. යක්ඛා අපෙපසක්ඛා. හසන්ති යක්ඛා මහෙසක්ඛා කම්පමානාය මහාපථවි යා—සි.

මෙසේ කම්පාවන පෘථිවි ය කෙසේ කම්පා වි ද යත් ? යම් සේ මහත් සැළෙක දියපුරා සාලෙන් ආකිර්ණකොට උදුනෙහි තබා අධොභාගයෙන් මහත්කොට ගිනි දැල් වූ කල්හි ප්‍රථමයෙන් භාජන ය තප්ත වේ ද භාජන ය රත්වූ කල්හි ජල ය රත් වේ ද ජලය රත්වූ කල්හි සහල් රත්වේ ද, සහල් රත් වූ කල්හි, සහල් ඉපිලේ ද ගැලේ ද බුබුළු නැගේ ද පෙණමැල් ඉතිරේ ද එ පරිදි දෙන් ම වෙසතුරු මහරජානෝ දුන් අන්කිසිවක්හු විසින්. දී ගත නො හැකි වූ සත්තසතක මහාදාන යාගේ බලයෙන් යට මහා වාතය ධරාගන්ටඅසමත් ව කුපිත වි ය.

වාත ය කුපිත වූ කල්හි ජලපොළොව කුපිත වි ය. ජල පොළොව කුපිත වූ කල්හි මහාපෘථිවි ය කම්පිත වි ය. මෙ සේ එ සමයෙහි වාතය ද ජලය ද පෘථිවි ය ද යන තුන්දෙන එක්සිත් ව සසඳ ගත්තාක් මෙන් මහාදානයෙහි ආනුභාවයෙන් කම්පිත වි ය. සෙස්සන්ගේ දානයෙක්හි මෙසේ ඇත්තේ නොවේ.

එසින් වදාළ හ—නාගසේන මහතෙරහු මිළිඳුරජහට.

යථා මහාරාජ මහති මහාපරියොගෙ උද්ධනගතෙ උදක සම්පුණ්ණෙ ආකිණ්ණතණ්ඩුලෙ පෙළතො අග්ගි ජලමානො පඨමං තාව පරියොගං සන්තාපෙති, පරියොගෙ සන්තත්තෙ උදකං සන්තාපෙති. උදකං සන්තත්තං තණ්ඩුලං සන්තාපෙති. තණ්ඩුලං සන්තත්තං උම්මුජ්ජති නිම්මුජ්ජති බුබ්බුලකජාතං හොති. ඵෙණ

මාලි උත්තරති. එවමෙව ඛො මහාරාජ වෙස්සන්තරො රාජා යං ලොකෙ දුච්චජං තං චජිතස්ස තං දුච්චජං චජන්තස්ස දානස්ස සභාව නිස්සන්දෙන හෙට්ඨා මහාවාතා ධාරෙතුං න විසහන්තා පරිකුපිංසු.

මහාවාතෙසු පරිකුපිතෙසු උදකං කම්පි. උදකෙ කම්පිතෙ මහාපථවි කම්පි ඉති තදා මහාවාතො ච උදකං ච පථවිවා'නි ඉමෙ තයො එකමනා විය අහෙසුං මහාදාන නිස්සන්දෙන විපුල බලවිරියෙන. තතෝ'දිසො මහාරාජ අඤ්ඤස්ස දානානුභාවො, යථා වෙස්සන්තරස්ස රඤ්ඤ මහාදානානුභාවො—සි.

තව ද යම් සේ ඉන්ද්‍රනීල ජොතිරඹ වෙළුරිය සිරිස පුෂ්ප මනොහර සුයාමිකානති වන්‍රකානති වජ්‍රාදී සියලු මාණික්‍යයන් ම ඉක්ම සක් විති මහරජහුගේ හාත්පසින් යොදනක් තැන් ආලෝක පැතිරෙන මාණික්‍ය ය ම අග්‍ර ය සි කියනු ලැබේ ද, එ පරිද්දෙන් ම අසදෘශ මහා දානාදී යම්කිසි දානයෙක් ලෝකයෙහි විද්‍යමාන වී ද, ඒ සියලු ම දානයට වඩා වෙසතුරු බෝසතානන්ගේ දාන ය අග්‍ර වේ. වෙසතුරු මහරජානන්ගේ දානයෙහි මහ පොළොව සත්වරක් කම්පාවී—

මෙය ද වදුලහ—නාගසේන මහතෙරහු.

යථා මහාරාජ මහියා බහුවිධා මණයො විජ්ජන්ති. සෙය්‍ය පිදං: ඉන්ද්‍රනීලො මහානීලො ජොතිරසෙහා වෙළුරියො උම්මා පුප්ඵා සිරීසපුප්ඵා මනොහරෝ සුරියකන්තා චජිරෝ ඛජ්ජා පකකමකෝ පුස්සරාගෝ ලොහිතංකෝ මසාරගල්ලෝ, එතෙ සබ්බෙ අභිකකමම චකකවත්තිමණී අග්ගමක්ඛායති. චක්කවත්ති මණී මහාරාජ සමන්තා යොජනං ඔභාසෙති. එව'මෙව ඛො මහාරාජ යංකිඤ්චි මහියා දානං විජ්ජති. අපි අසදිස දානං පරමං තං සබ්බං අතික්කමම වෙස්සන්තරස්ස රඤ්ඤ මහාදානං අග්ග'මක්ඛායති. වෙස්සන්තරස්ස මහාරඤ්ඤ මහාදානෙ දීය මානෙ සත්තක්ඛත්තුං මහාපථවි කම්පිතා—සි.

බුදුන් විසිනු දු වදුලේ මැනෝ.

අවෙතනා'යං පථවි අවිඤ්ඤය සුඛං දුඛං,
සා'පි දානබලා මයඤං සත්තක්ඛත්තුං පකම්පථ—සී.

මෙසේ දක්වන ලද සත්වරෙක මහිකම්පා කිරීම පෙරදැරි කොට ඇති මහදන් දී ශ්‍රද්ධා නැමැති පෘථිවියෙහි පිහිටි "බුද්ධො භවෙය්‍යං" යනාදි ප්‍රතිඥ නැමැති බීජුවට ඇති, ප්‍රඥ නමැති

හෝතැනි ඇති, කරුණා නමැති ජලනිසෙකයෙන් වඩනාලද මෛත්‍රී නැමැති කද ගෙණ වැනි, ත්‍රිවිධ බොධිසත්ව චර්‍යා නැමැති ශාඛාවෙන් විශාල වූ පඤ්චමහා පරිත්‍යාග නැමැති පලලව පත්‍ර යන් ඇති, සම්ත්‍රිංශත් පාරමිතා නැමැති විකශිත පුෂ්පයන් ඇති, බොධිසම්භාර නැමැති උතුම් වූ කල්පවෘක්ෂයෙහි සම්භූතා ඥන නැමැති අමෘත ඵලගන්වනු කැමැති ව ඒ වෙස්සන්තරාත්ම භාවයෙන් චුත ව ගොස් තුෂිත දිව්‍යලෝකයෙහි ශ්වේතකේතු නම් දිව්‍යපුත්‍රයක් ව උපන් සේක.

එසින් කිහ—මහාබොධිවංශයෙහි.

වෙස්සන්තරත්තභාවේයෙව ඨත්වා සත්තක්ඛත්තුං වසුධා තල වලන පුරස්සරං මහාදානං දත්වා සද්ධාවලායං පතිට්ඨිතෙ පවිත්‍රසූ බීජෙ පස්සූ ලවාලයෙ කරුණා ජල සෙක සංවඩ්ඪිතෙ මෙත්තාක්ඛන්ධ සංරුළෙහ වරියා සාඛාවිසාලෙ මහාපරිච්චාග පලලවෙ පාරමී කුසුම සම්පුලෙල බොධිසම්භාර කපප තරුවරේ සබ්බඤ්ඤුත ඤාණාමතඵලං ගණ්හාපෙතුකාමෝ තතෝ චවිත්වා තුසිතපුරෙ නිබ්බත්තී--සි.

දූරෙ නිදානයෙහි දූ කියේ මැ නෝ.

එවං මහාපඨවි කම්පනානි මහාප්‍රභූසූනි කරිත්වා ආයුපරියොසානෙ තතෝ චුතෝ තුසිතභවනෙ නිබ්බත්තී-සි.

මේසේ දීපඞ්කර පාදමූලයෙහි පටන් ක්‍රමයෙන් අවුත් යම් කලෙක තුසිතපුරයෙහි උත්පත්තියෙක් ඇද්ද, ඒ තාක් පැවැති මේ පමණ කාරණය **දූරෙනිදාන** නමැ සි කියත්.

එම දක්වන්නට කිහ.

ඉති දීපඞ්කරපාදමූලතෝ පට්ඨාය යාව අයං තුසිතපුරෙ නිබ්බත්තී එත්තාකං ඨානං දූරෙනිදානං නාමාති වෙදිතබ්බං--සි.

මේසේ දීපඞ්කර පාදමූලයෙහි පටන් කාශ්‍යප බුදුන් දක්වා උපන්නුපන් බුදුන් නොවරදවා නොයෙක් ලෙසින් පුදා වීවරණ ලැබ තුසිතපුරයෙහි උත්පත්ති ය දක්වා සම්ත්‍රිංසත් පාරමීධර්මයන් පුරණ සේකැ ත් අන්කිසි කාරණයක් පිණිස නො පිරූ සේක. ලොව්තුරා බුඩබව ය පිණිස ම පිරූ සේක. එසේ

පූරණ ය කොට ක්‍රමයෙන් ගොස් බෝමැඩෙහි වැඩහිඳ අභිඤ්ඤෙය්‍ය ආදි වශයෙන් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මයන් දත් හෙයින් බුද්ධ නම් වන සේක.

එසින් වදුළහ.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං භාවෙතබ්බං ච භාවිතං,
පහාතබ්බං පහීණ'මෙම තස්මා බුද්ධො'ස්මි බ්‍රාහ්මණ-යි.

මෙතෙකින් මේ **සද්ධර්‍ම සාරාර්‍ථ සංග්‍රහ** නම ප්‍රකරණයෙහි
කොණ්ඩඤ්ඤ දී තෙවිසි බුදුන් කෙරෙන් ලද

සාමඤ්ඤාභිනීහාර කථා නම් වූ

තුන්වන පරිච්ඡේදය

නිමි.

4. පරිච්ඡේදය

අභිසම්බෝධි කථා

තව ද මේ **සද්ධම්ම සාරාර්ථ සංග්‍රහයෙහි අභිසම්බෝධි කථා** නම් කවර යත්? හේ දූරෙනිදුනාවසානයෙහි පටන් කියනු ලැබේ. කෙසේ ද යත්? තුසිත පුරයෙහි බොධිසත්වයන් වහන්සේ වසමින් සිටිය දී ම බුඩ හළාහළ් නම් කෝළාහලයෙක් පහළ විය. ලෝකයෙහි වනාහි කල්ප කෝළාහල ය, බුඩ කෝළාහල ය, චක්‍ර වර්ති කෝළාහල ය යි කෝළාහල තුනෙක් වන්නේ ය.

කියේ මැ නෝ.

තුසිතපුරෙ වසන්තෙයෙව පන බොධිසත්තෙ බුඩ හළාහළා නාම උදපාදි. ලොකසම්මිං හි තීනි හළාහළානි උපපජ්ජන්ති – කප්ප හළාහළං බුඩ හළාහළං චක්කවත්ති හළාහළං-සි.

ඒ ත්‍රිවිධ කෝළාහලයන් අතුරෙන් අවුරුදු ලක්‍ෂයක් ඉකුත් කල කල්පවිනාස ය වන්නේ යැ යි ලොකබ්‍යූහ නම් කාමාවචර දෙවතා කෙණෙක් අවමඟුල් වෙසක් ගෙණ හිසකේ මුදු විසුරුවිත ලදු ව හඬන මුහුණු ඇති ව යුවලතින් කඳුළු පිස පිස රත්පිළි ගැඳ පෙර ව ඉතා විරූප වූ වෙස් ධරා මනුෂ්‍ය පථයෙහි ඇවිදිනාහු

"නිදුකිනි! නිදුකිනි! මෙයින් හවුරුදු ලක්‍ෂයක් අතික්‍රාන්ත වූ කල කල්පවිනාස ය වන්නේ ය. මේ සමුද්‍ර ය ද වියලෙන්නේ ය. මේ මහා පෘථිවි ය හා මහාමෙරු පර්වත ය ද දවන්නේ ය. බඹලොව දක්වා ලොව නස්නේ ය. එ හෙයින් නිදුක් වූ සඬයෙනි! මෛත්‍රී භාවනා කරව්. කරුණා මුදිතා උපෙක්‍ෂා භාවනා කරව්. මවුන්ට උපස්ථාන කරව්. පියන්ට උපස්ථාන කරව්. කුලදෙටුවන්ට උපස්ථාන කරව්" ය යි මෙසේ කියා ඇවිදිනි. මේ කල්ප කෝළාහල ය නම් වන්නේ ය.

කියේ මැ නෝ.

තත්‍ථ වස්‍ස සතසහස්‍සස්‍ස අච්චයෙන කප්පුට්ඨානං භවිස්‍සති'නි ලොකබ්‍යූහා නාම කාමාවචර දෙවා මුත්තහිරා විකිණ්ණ කෙසා රුදමුඛා අස්සූනි හත්‍ථෙහි පුඤ්ඡමානා රත්තවත්ථ නිවත්ථා අතිවිය විරූප වෙසධාරිනො හුත්‍වා මනුස්සපථෙ විචරන්තා එවං ආරොචෙන්ති. මාරිසා! මාරිසා!! ඉතො වස්‍ස සතසහස්‍සස්‍ස

අවවයෙන කප්පුඨානං භවිස්සති. අයං ලොකො විනස්සිස්සති මහාසමුද්දොපි සුස්සිස්සති. අයං ච මහා පඨවී සිනෙරු ච පබ්බතරාජා උඩ්ඩයිහිස්සන්ති. යාව බ්‍රහ්මලොකා ලොකවිනාසො භවිස්සති'ති. මෙත්තං මාරිසා භාවෙථ කරුණං මුදිතං උපෙක්ඛං මාරිසා භාවෙථ. මාතරං උපඨහථ. පිතරං උපඨහථ. කුලෙජෙට්ඨාපචායිතෙ හොථා'ති ඉදං කප්ප ගළාගළං නාම-සි.

අවුරුදු දහසක් අතික්‍රාන්ත වූ කල සීඳු කෙණෙකුන් වහන්සේ ලෝකයෙහි උපදනා සේකැ සි ලෝකපාලක දෙවියෝ නිදුකිනි! මෙසින් අවුරුදු දහසක් අතික්‍රාන්ත වූ කල ලොවුතුරා බුදු කෙණෙකුන් වහන්සේ ලෝකයෙහි උපදනා සේකැ සි හඬගා කියමින් ආවිදිනි. මේ බුඩ කෝළාහළ නම් වේ

කියේ මැ නෝ.

වස්ස සහස්සස්ස අවවයෙන පන සබ්බඤ්ඤු බුඩො ලොකෙ උප්පජ්ජිස්සති'නි – ලොකපාල දෙවතා ඉතො මාරිසා වස්ස සහස්සස්ස අවවයෙන බුද්ධො ලොකෙ උප්පජ්ජිස්සති'නි උග්ඝොසෙන්තා ආහිණ්ඩන්ති – ඉදං බුඩ ගළාගළං නාම-සි

අවුරුදු සියයක් අතික්‍රාන්ත වූ කල චක්‍රවර්ති රජ්ජුරු කෙණෙක් උපදනාහු ය සි දෙවතාවෝ ම, නිදුක්නි! මෙසින් මතු අවුරුදු සියයක් ඇවැමෙන් චක්‍රවර්ති රජ්ජුරු කෙණෙක් උපදිනි සි උග්ඝොෂන ය කොට ඇවිදිනි. මේ චක්‍රවර්ති කෝළාහළ නම් වෙයි. මේ ත්‍රිවිධ කෝළාහළයෝ ලොකයෙහි මහත් වෙත්.

හේ කියේ මැ නෝ

වස්සසතස්ස පන අවවයෙන චක්කවත්තිරාජා උප්පජ්ජිස්සතී'නි දෙවතා යෙව ඉතො මාරිසා! වස්සසතවවයෙන චක්කවත්ති කො රාජා ලොකෙ උප්පජ්ජිස්සතී'නි උග්ඝොසෙන්තියො ආහිණ්ඩන්ති. ඉදං චක්කවත්ති ගළාගළං නාම. ඉමානි තීනි ගළාගළානි මහන්තානි හොන්ති-සි.

මේ ත්‍රිවිධ කෝළාහළයන් අතුරෙන් බුඩ කෝළාහළ ශබ්ද ය අසා සකල දශදහස් චක්‍රවාටයෙහි දෙවියෝ එකතැනට රැස් ව අසවල් නම් සැවයෙක් බුදුවන්නේ ය සි දැන ඔහු කරා එළඹ යාඥා කරන්නාහු ය. එ සේ යාඥා කරන්නාහු ද පසඳ පූජිනීමිත්තන සමහ වූ

කල්හි ම යාඥාකරන්නාහු ය. එසමයෙහි ත් සියලු ම දෙවියෝ එකෙකි සක්වළෙක චාතුර්මහාරාජික ශක්‍ර සුයාම සන්තුෂිත සුනිර්මිත වසවර්ති මහා බ්‍රහ්මයන් හා සමග මේ එක් සක්වළට රැස් ව:

තුසිත භවනයෙහි වසන බෝසතුන් කරා එලඹ නිදුකා නන් වහන්ස! දැනැදී දසපෙරුම් පුරන්නා වූ නුඹවහන්සේ විසින් ශක්‍ර සම්පතක් හෝ මාරසම්පතක් හෝ බ්‍රහ්මසම්පතක් හෝ චක්‍ර වර්ති සම්පතක් හෝ ප්‍රාර්ථනා කෙරෙමින් පිරුවේක් නො වෙයි. ලොව සතුන් සසර දුකින් මුදන පිණිස සර්ව්ඥතාඥාන ය ප්‍රාර්ථනා කෙරෙමින් ම දශපාරමී ධර්මයන් පුරණ ලද්දේ ය. දැන් වූ කලී නුඹවහන්සේට ඒ පාරමී ධර්මයෝ සම්පූර්ණ වූහ. එ හෙයින් නිදුකානන් වහන්ස! බුදුවීමට කල් වන්නේ ය. නිදුකානන් වහන්ස! බුදුවීමට සම ය වන්නේය යි කියා යාඥා කළාහු ය.

කියේ මැ නෝ.

බුඩ හළාහළසද්දං සුත්වා සකල දසසහස්‍ස චක්කවාළෙ දෙවතා එකතො සන්නිපතිත්වා අසුකො නාම සත්තො බුද්ධො භවිස්සතී'ති ඤත්වා තං උපසඞ්කමිත්වා ආයාචන්ති. ආයාචමානා ච පුබ්බනිමිත්තානි උප්පන්නානි ආයාචන්ති. තදා පන සබ්බා'පි තා එකෙකා චක්කවාළෙ චාතුම්මහාරාජ සක්‍ක සුයාම සන්තුසිත නිම්මානරති පරනිම්මිත වසවත්ති මහාබ්‍රහ්මානි සද්ධිං එකවක්කවාළෙ සන්නිපතිත්වා තුසිතභවනෙ බොධිසත්තස්‍ස සන්තිකං ගන්ත්වා මාරිසා! තුම්හෙහි දසපාරමියො පූරෙන්තෙහි න සක්‍ක සම්පත්තිං න මාර න බ්‍රහ්ම න චක්කවත්ති සම්පත්තිං පත්ථෙන්තෙහි පූරිතා. ලොක නිස්සරණත්ථාය පන සබ්බඤ්ඤුතඤාණං පත්ථෙන්තෙහි පූරිතා. සො වො'දානි කාලො මාරිස! බුද්ධත්තාය සමයො මාරිස! බුද්ධත්තාය'ති යාචිංසු-සි.

ඉක්බිත්තෙන් මහබෝසතානෝ දෙවියන්ට ප්‍රතිඥා නොදී ම—

කාලං දීපං ච දෙසං ච – කුලං මාතරමෙව ච,
එතෙ පඤ්ච විලොකෙත්වා – උප්පජ්ජන්ති තථාගතා.

යනු හෙයින් කාල දීප දෙස කුල ජනෙත්ති ආයු පරිච්ඡේද වශයෙන් පඤ්ච මහා විලොකන නම් වූ විලොකනයක් කළ සේක.

කි යේ මැ නෝ

අථ මහාසත්තෙනා දෙවතානං පටිඤ්ඤං අදත්වාව කාල දීප දෙස කුල ජනෙත්ති ආයුපරිච්ඡේද වසෙන පඤ්චමහා විලොකනං නාම විලොකෙසි-සි.

ඒ පඤ්චමහා විලොකනයන් අතුරෙහි මේ බුදුවන්ට කල් දෙ නොකල් දෙ හෝ යි ප්‍රථමයෙන් කාලවිලෝකන ය කළ සේක. එහි අවුරුදු ලක්‍ෂයකින් මත්තෙහි වැඩ සිටි ආයු ඇති කාල ය කල් නම් නොවෙයි. කුමක් හෙයින් ද යත්? එ සමයෙහි සත්ත්‍වයන්ට ජරා මරණ නොපෙණෙන්නේ ය. සම්බුදුරජාණන් වහන්සේගේ ධර්මදේශනාව නම් අනිත්‍ය ය දුඃඛ ය අනාත්ම ය යන ත්‍රිලක්‍ෂණයෙන් විනිර්මුක්ත වන්නේ නොවෙ යි.

අනිත්‍යාදි ය නොපෙණෙන සත්ත්‍වයන්ට ඒ ලක්‍ෂණත්‍ර ය ප්‍රකාශකොට ධර්මදේශනාකර වදාරණ කල්හි මුත්වහන්සේලා මේ කියන්නේ කිමෙක් දැ යි වදාරන්නාවූ ධර්ම ය අසන්ට ත් නොසිතති. නො කැමති වෙති. එසේ කල්හි මාගධිගම ය නොවන්නේ ය. මාගධ්‍ථලයට පැමිණීම නැති කල්හි බුදුන්ගේ අවවාද අනුසාසනා සත්ත්‍වයන් නිවණට පමුණුවන්නේ නැත. එසේ හෙයින් ශාසන ය අනෛය්‍යාණික වෙයි. මේ කාරණයෙන් ලක්‍ෂයක් අවුරුද්දෙන් වැඩුනාවූ ආයුෂ ඇති කාල ය බුදුවන්නට කල් නොවන්නේ ය.

මේ ද කිව

වස්සසතසහස්සතො උද්ධං වඩ්ඪිත ආයුකාලෝ කාලෝ නාම න හොති. කස්මා තදා හි සත්තානං ජාති ජරා මරණානි න පඤ්ඤායන්ති බුද්ධානඤ්ච ධම්මදෙසනා නිලක්ඛණමුත්තා නාම නත්ථි. තෙසං අනිච්ච දුක්ඛ 'මිනත්තානී'ති කථෙන්තානං කිඤ්ඤාමෙ 'නං කථෙන්තී'ති, නෙ'ව සොතබ්බං න සද්ධාතබ්බං මඤ්ඤන්ති. තතො අභිසමයෝ න හොති. තස්මිං අසති අනීයාණිකං සාසනං හොති. තස්මා සෝ අකාලෝ-සි.

අවුරුදු සියයකින් අඩු වූ ආයුෂ ඇති කාලය ත් බුදුවන්ට කල් නම් නොවන්නේ ය කුමක් හෙයින් ද යත්? එ සමයෙහි සත්ත්‍වයෝ උත්සන්න වූ ක්ලෙශයන් ඇති වන්නාහ. උත්සන්න ක්ලෙශයන් ඇති සත්ත්‍වයන්ට දුන්නාවූ අවවාද ය අවවාද ස්ථාන යෙහි නොපිහිට සි. දියෙහි දණ්ඩකින් ඇඳි ඉරක් මෙන් වහා ම නසි යි. ඒ කාරණයෙන් අවුරුදු සියයකින් අඩුවූ ආයුෂ ය ඇති කාලයත් බුදුවන්නට කල් නම් නොවන්නේ ය:

අවුරුදු ලක්‍ෂ ය පටන් අවුරුදු සියය දක්වා මේ කාල ය බුදුවන්ට කාල ය නම් වන්නේ ය. එ සමය ත් සියයක් අවුරුද්දට ආයු ඇති කාල ය බැවින් මහබෝසතානෝ මේ බුදුවන්නට කාල ය යි කියා කාලවිලොකන ය කළාහු ය.

මේ ද කිහ

වස්ස සතතෝ ඌන ආයු කාලෝ'පි කාලෝ න හොති. කසමා? යද සතතා උස්සන්නා කිලෙසා හොනති. උස්සන්න කිලෙසානඤ්ච දිස්සොවාදෙ, ඔවාදඤානෙ න තිඨති. උදකෙ දණ්ඩරාජී විය ඛිපං විගච්ඡති. තසමා සෝ'පි අකාලෝ වස්සසත සහස්සතෝ පන පඨාය හෙඨා වස්සසතතෝ පඨාය උඩං ආයුකාලෝ කාලෝ නාම. තදා ච වස්සසතකාලෝ. අථ මහාසත්තෝ නිබ්බත්තිතබ්බ කාලෝ'ති පස්සි-සි.

ඉක්බිත්තෙන් දීප විලෝකන ය කරන්නා වූ මහබෝ සතානෝ පිරිවර සහිත වූ සතර මහ දිවයින බලා භූන්දිවයිනෙක බුදුවරයෝ භූපදනාහ. ජම්බුදවීපයෙහි ම උපදනාහ යි දීප විලෝ කන ය කළ සේක. •

කියේ මෑ නෝ.

තතෝ දීපං විලොකෙන්තෝ සපරිවාරෙ වත්තාරෝ දීපෙ ඔලොකෙත්වා තීසු දීපෙසු බුඩා න නිබ්බත්තන්ති ජම්බුදීපෙ'යෙව නිබ්බත්තන්ති'ති දීපං ව පස්සි-සි.

ඉක්බිත්තෙන් ජම්බුදවීප ය නම් ඉතා මහත, දසදහසක් පමණ යොදුන් ඇත්තේ ය. කවර ප්‍රදේශයක සම්බුදවරයෝ උපදිනා සේක් ලා දේ නෝ යි බලන සේක් මධ්‍යදෙශ ය දුටු සේක.

කියේ මෑ නෝ

තතෝ ජම්බුදීපෝ නාම මහා, දසයොජන සහස්ස පරිමාණං, කතරස්මිං නු ඛෝ පදෙසෙ බුඩා නිබ්බත්තන්ති'ති, ඔකාස'මපි විලෝ කෙන්තෝ මජ්ඣිම දෙසං පස්සී-සි.

මධ්‍යදෙශ ය නම් කෙසේ ද යත්? පැදුම්දෙසෙහි කජඞ්ගල නම් නියම් ගම ය, අනතී දෙසෙහි සලලවතී නම් ගහ ය, දකුණු දෙසෙහි සෙතකර්ණිකා නම් නියම්ගම ය, පැලදෙසෙහි සුධන නම් බමුණු ගම ය, උතුරු දෙසෙහි උසීරධවජ නම් පර්වත ය යන මොවුන්ගේ මධ්‍යයෙහි වූ දෙශය මධ්‍යදෙශ නම් වේ.

එසින් කිහ - බොධිවංශයෙහි

කජඞ්ගල සලලවති සෙතකණ්ණික ථූනෝ'සීරධජාභිධා නානං නිගම නදී නිගම ගාම පබ්බතාතං මජ්ඣෙ-සි.

විනයෙ දු කිහු මැයි.

මජ්ඣිමදෙසො නාම පුරත්තිමදිසාය කජඞගලං නාම නිගමො, තස්ස අපරෙන මහාසාලො, තතො පරං පච්චන්තිමා ජනපද ඔරතො මජ්ඣෙ. පුබ්බදක්ඛිණාය දිසාය සලලවති නාම නදී, තතො පරං පච්චන්තිමා ජනපද ඔරතො මජ්ඣෙ. දක්ඛිණාය දිසාය සෙත කණ්ණිකං නාම නිගමො, තතො පරං පච්චන්තිමා ජනපද ඔරතො මජ්ඣෙ. පච්චිමාය දිසාය ථූනං නාම බ්‍රාහ්මණ ගාමො තතො පරං පච්චන්තිමා ජනපද ඔරතො මජ්ඣෙ. උත්තරාය දිසාය උසීරධජො නාම පබ්බතො, තතො පරං පච්චන්තිමා ජනපද ඔරතො මජ්ඣෙ-සි.

මෙසේ දක්වන ලද මධ්‍යදෙශ ය නම් දිගින් තුන්සියයක් යොදුන, පුළලින් දෙසියපණස් යොත්නෙක, වටින් නවසියයක් යොදුන, මේ ප්‍රදෙශයෙහි බුඩ ප්‍රත්‍යෙකබුඩ අග්‍රශ්‍රාවක මහාශ්‍රාවක අශීති මහාශ්‍රාවක චක්‍රවර්ති රජදරුවන් ගා අනිකු දු මහානුභාව සම්පන්න ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති මහාසාලාදීහු උපදනාහ. මේ බදු මධ්‍යමණ්ඩලයෙහි කපිලවස්තු නම් නුවරෙක් වන්නේ ය. එහි මා විසින් ඉපැද්දයුතු යැ යි නිශ්චාවට පැමිණි සේක.

මෙ ම කිහ—අවිදූරෙ නිදානයෙහි.

එවං විනයෙ වුත්තෙනා පදෙසො-සො ආයාමතො තීණි යොජන සතානි, විත්ථාරතො අඩ්ඪතිය යොජනසතානි, පරික්ඛෙපතො නවයොජනසතානී'ති එතස්මිං පදෙසෙ බුඩා පවෙචක බුඩා අග්ගසාවකා මහාසාවකා අසීති මහාසාවකා චක්කවත්තී රාජා අඤ්ඤෙ ච මහෙසක්ඛා ඛත්තිය බ්‍රාහ්මණ ගහපති මහාසාලා උප්පජ්ජන්ති. ඉදඤ්චත්ථ කපිලවත්ථුකං නාම නගරං, තත්ථ මයා නිබ්බත්තිතබ්බ'න්ති නිට්ඨම්'ගමාසි-සි.

ඉක්බිත්තෙන් ඉපැද්ද යුතු කුලය බලන්නා වූ මහ බෝ සතානෝ සත්තමවරයෝ නම් වෛශ්‍යකුලයෙහි හා ක්ෂුද්‍රකුලයෙහි න් නුපදනාහ. ලොකප්‍රසිඩ වූ පූජ්‍ය වූ ක්ෂත්‍රිය කුලයෙහි හෝ බ්‍රාහ්මණ කුලයෙහි හෝ යන මේ දෙකුලයෙහි ම උපදනාහ. දැනුදු ක්ෂත්‍රිය කුල ය ලෝකසම්මත ය එහි උපදිමි සුබොදන නම් රජානෝ මට පිය වන්නාහ යි කුල ය බැලූ සේක

මේ ද කිහ.

තතො කුලං විලොකෙන්තො බුඩා නාම වෙස්සකුලෙ වා සුද්ද කුලෙ වා න නිබ්බත්තන්ති. ලොකසම්මතෙ පන ඛත්තිය කුලෙ වා

බ්‍රාහ්මණ කුලෙවා'ති දිවිසු යෙව කුලෙසු නිබ්බත්තනති. ඉදානි ච ඛත්තිය කුලං යෙව ලොකසම්මතං. තත්ථ නිබ්බත්තිස්සාමි. සුඩොදනො නාම රාජා මෙ පිතා භවිස්සති'ති කුලං පසසී-සි.

ඉක්බිත්තෙන් මාතෘවිලොකන ය කරන්නා වූ මහ බෝසතනෝ බුඩමාතාවෝ නම් පුරුෂ ලොලඩයක් නැත්තාහ. සුරාධූර්ත නො වන්නාහ. කප්ලක්ෂයක් මුළුල්ලෙහි පුරණ ලද පාරමිතාවන් ඇත්තාහ. උපන් තැන් පටන් අඛණ්ඩ වූ පඤ්ච ශිල ය රක්ෂා කරන්නාහ. මේ මහාමායා දේවි ද වනාහි එ බඳු ගුණධර්මයන් ඇත්ති ය. එ හෙයින් මේ මහාමායා නම් දේවි මට මව් වන්නි ය. ඒ දේවින්ට ආයුෂ ය කොපමණෙක් දෝ හෝ සි පරීක්ෂාකොට බලා දසමසකින් මත්තෙහි සත්දවසක් ආයුෂ ය දුටු සේක.

කියේ මැ නෝ.

තතො මාතරං විලොකෙනෙතා බුඩමාතා නාම ලොලා සුරාධුත්තා නහොති. කපපසතසහසසං පන පූරිතපාරමී ජාතිතො පඨාය අඛණ්ඩ පඤ්චසීලායෙව හොති. අයං ච මහාමායා නාම දෙවී එදිසී. අයං ච මෙ මාතා භවිස්සති'ති, කිත්තකං පනස්සා'යුනන්ති දසන්නං මාසානං උපරි සත්තදිවසානි පසසී-සි.

මෙසේ මහබෝසතානෝ මේ පස්බැලූම් බලා නිදුක්නි! බුදු වීමට කල් වන්නේ යැයි දෙවියන්ට සංග්‍රහ කෙරෙමින් ප්‍රතිඥ දී, තෙපි හැමදෙන යව සි දෙවියන් යවා තුෂිත දිව්‍යලෝකයෙහි දෙවියන් විසින් පිරිවරණ ලදුව හැම දෙවිලොව ම නන්දනවන, ඇතිවන බැවින් නන්දන වනයට වැද එහි දෙවියන් විසින් මෙසින් චුත වූ නුඹවහන්සේ සුගති සඞ්ඛ්‍යාත වූ මනුෂ්‍යලොකයට ගිය මැනව. මෙයින් චුත වූ නුඹවහන්සේ සුගති සඞ්ඛ්‍යාත වූ මනුෂ්‍ය ලොකයට වැඩිය මැනවැ සි පූර්ව ජන්මානන්තර වල කරණ ලද කුශලකර්මයට අවසර සිහිකරවමින් ආවිදිනාහු ය.

මෙසේ කුශලකර්ම ය සිහිකරවන්නා වූ දෙවියන් විසින් පිරිවරණලද ඒ මහ බෝසතානෝ ඒ නන්දනොද්‍යානයෙහි ආවිදිමින් සිට ම චුත ව මහාමායා දේවින්ගේ කුක්ෂියෙහි ප්‍රතිසන්ධිග්‍රහණ ය කළ සේක.

මේ ද කිඹ.

ඉති ඉමං පඤ්චමහාවිලොකනං විලොකෙත්වා කාලො මෙ මාරිසා! බුඩනාවායා'නි දෙවතානං සංගහං කරොනෙතා පටිඤ්ඤං දත්වා ගච්ඡථ තුමෙහ'නි තා දෙවතා උය්‍යොජෙත්වා තුසිත

දෙවතාහි පරිවුතො තුසිතපුරෙ නන්දනවනං පාවිසි. සබ්බදෙව ලොකෙසුහි නන්දනවනං අත්ථියෙව, තත්‍ර නං දෙවතා ඉතො චුතො සුගතිං ගච්ඡ. ඉතො චුතො සුගතිං ගච්ඡා'නි පුබ්බෙ කත කුසල කම්මො'කාසං කාරයමානා විවරන්ති. සො එවං දෙවතා හි කුස ලං සාරයමානා නි පරිවුතො තත්‍ර විචරන්තො වජිරා මහා මායා ය දෙවියා කුච්ඡිසම්ං පටිසන්ධිං ගණ්හි-සි.

එහි විසතර මෙසේ දතයුතු. එ සමයෙහි වනාහි කපිල වස්තු පුරයෙහි උතුරාසළ නැකත ලද ඇසළ මස මැදි පොහො යෙහි කරණ ලද ඇසළකෙළි නම් මහත් වූ උත්සව කෙළියෙක් පළමු සත්වෙනිදා පටන් වි ය. මහජනයෝ ඉස් සෝදා නහා හැඳ පැළඳ නැකැත්කෙළි කෙළිති. මහාමායා දෙවී පළමු සත්දවස පටන් නැකැත්කෙළි සිරි විඳිමින් සත්වන දවසෙහි උදැසන්හි ම සුවඳ පැනින් ඉස් සෝදා නහා සාරලක්ෂයක් වියදම්කොට මහ දන් දී සම්පාලඞ්කාර විභූෂිත ව උතුම් භොජන ය අනුභවකොට පෞෂථාඞ්ගයන් අධිෂ්ඨානකොට අලංකෘතකොට පිළියෙළ කරණ ලද ශ්‍රී යහන්ගබඩාවට ප්‍රවිෂ්ට ව ශ්‍රී යහන්හි නිපන්න ව නිද්‍රොප ගත වූ තැනැත්තී මේ සුපින ය දුටුවා ය.

සතරවරම් මහ රජදරුවෝ බිසවුන් හොත් යහන හා සමග ඔසවාගෙණ හිමවතට ගෙණ ගොස් සැටයොදුන් සිරියෙල් ගල්තෙලෙහි සත්යොදුන් මහසල් රුක්මුල තබා එකත්පසෙක සිටියාහු ය. ඉක්බිත්තෙන් ඒ වරම් රජදරුන්ගේ අගමෙහෙස්හු අවුත් දෙවින් අනවතප්තාවිලට ගෙණ ගොස් මිනිස්ගඳ නරණා පිණිස නහවා දිවපිළි හඳවා දිවගඳ විලවුන් ගල්වා දිවමල් පළ දවා එයින් නුදුරු තෙන රිදී පළුතයෙක් ඇත. එහි පිහිටි රන් පායක් ඇත, එහි පශ්චිම දිගට සිරස ලා යැතපෙන ලෙසට දිවයහනක් පණවා ඒ දේවීන් එහි සතප්පුවා හු ය.

ඉක්බිත්තෙන් බොධිසත්වයෝ උතුම් ශ්වෙතහස්තිවිලාස යක් ව එයින් නුදුරු තෙන එක් සුවර්ණ පළුතයෙක් ඇත. එහි ඇවිද එයින් බැස රිදීපළුතයට නැගී උතුරුදෙසෙන් අවුත් රිදී දම්කවුන් සෙඬින් ශ්වෙතපද්මයක් ගෙණ කුසුම්භනාදකොට රන් විමනට ප්‍රවිෂ්ට ව බිසවුන්හොත් යහන තුන්වරක් ප්‍රදක්ෂිණා කොට දක්ෂිණ පාර්ශ්වයෙන් සිංහ ය කොට කුක්ෂියට ප්‍රවිෂ්ට වුනාක් මෙන් වි ය. මෙසේ ඇසළ මස උතුසළ නැකතින් ප්‍රති සන්ධිග්‍රහණ ය කළ සේක.

මෙම කිහ—දුරෙ නිදුනයෙහි.

"තදා කිර කපිලවත්ථුනගරෙ ආසාළහි නක්ඛත්තං ඝුට්ඨං අහොසි. මහාජනො නක්ඛත්තං කීළති-මායාදෙවී පුරෙ පුණ්ණමාය සත්තමෙ දිවසතො පට්ඨාය විගතසුරාපානං මාලාගන්ධ විභූති සම්පන්නා නක්ඛත්තකීළං අනුභවමානා සත්තමෙ දිවසෙ පාතොව පට්ඨාය ගන්ධොදකෙන නහාසිත්වා චත්තාරි සතසහස්සානි විස්සජෙත්වා මහාදානං දත්වා සබ්බාලංකාර විභූසිතා වරභොජනං භුඤ්ජිත්වා උපොසථඞ්ගානි අධිට්ඨාය අලඞ්කත පටියත්තං සිරිගබ්භං පවිසිත්වා සිරිසයනෙ නිපන්නා නිද්දං ඔක්කමමානා ඉමං සුපිනං අද්දස.

චත්තාරො කිර නං මහා රාජානො සයනෙනෙව සද්ධිං උක්ඛිපිත්වා හිමවන්තං නෙත්වා සට්ඨියොජනිකෙ මනොසිලාතලෙ සත්තායොජනිකස්ස මහාසාලරුක්ඛස්ස හෙට්ඨා ඨපෙත්වා එකමන්තං අට්ඨංසු. අථ නෙසං දෙවියො ආගන්ත්වා දෙවිං අනොතත්තදහං නෙත්වා වනුප්පලමාලහරණත්ථං නහාපෙත්වා දිබ්බවත්ථං නිවාසාපෙත්වා ගන්ධෙහි විලිම්පාපෙත්වා දිබ්බපුප්ඵානි පිළන්ධාපෙත්වා තතො අවිදූරෙ රජත පබ්බතො-තස්ස අන්තො කණකවිමානං අත්ථි. තත්ථ පාචීනසීසකං දිබ්බසයනං පඤ්ඤපෙත්වා නිපජ්ජාපෙසුං-

අථ බොධිසත්තොපි සෙතවරවාරණො හුත්වා තතො අවිදූරෙ එකො සුවණ්ණපබ්බතො-තත්ථ චරිත්වා තතො ඔරුය්හ රජත පබ්බතං අභිරුහිත්වා උත්තර දිසතො ආගම්ම රජතදම වණ්ණාය සොණ්ඩාය සෙතපදුමං ගහෙත්වා කුසුම්භනාදං නදිත්වා කණකවිමානං පවිසිත්වා මාතුසයනං තික්ඛත්තුං පදක්ඛිණං කත්වා දක්ඛිණ පස්සං ඵාලෙත්වා කුච්ඡිං පවිට්ඨ සදිසො අහොසි. එවං උත්තරාසාළහ නක්ඛත්තෙනෙව පටිසන්ධිං ගණ්හි-සි.

පිබිදුනා වූ දෙවෙනි දවස් ඒ සුපින ය රජහට දන්වූ කල සුදවුන් මහරජානෝ වේදයෙහි දක්ෂ වූ සිවිසැටක් පමණ උතුම් බමුණන් ගෙන්වා හරිතු පාත්‍රයෙහි ලාජාදීන් කෘත මඞ්ගල සත්කාර ඇති ව නෙවත් කළ පිරිබඩ ඇති ව විලඳ සුන්සාල් සිදු හතු සමන් කැකුළු නීතණ යන මෙයින් කරණලද මඞ්ගල සත්කාර ඇති භූමියෙහි මාහැඟි අසුන් පණවා බමුණන් එහි හිඳුවා සපපි මධු ශර්කරාහි සංසකෘත පැන් නුමුසු කිරිබත් පිරුරන් රිදී තලි සිවිසැටක් එසේ ම රන්තලි රිදිතලි සිවිසැටකින් වසා බමුණන්ට දන් දී සෙසු ත් අහතවස්ත්‍ර කපිලවත් දෙනුන් ආදීන් ඔවුන් සතුටුකරවා ඛිසවූන් දුටු සුපින ය කියා විවාළාහු ය.

බ්‍රාහ්මණයෝ කියන්නාහු මහ රජ්ජුරුවන් වහන්ස! ඔබගේ දෙවිත් කුස දරුගර්භ ය පිහිටියේ ය. හෙ ද වනාහි පුරුෂ ගර්භයෙක. සත්‍රී ගර්භයෙක් නො වෙයි. ඔබට වූ යේ පුත් රුව නෙක. හෙතෙම ඉදින් ගෘහවාසයෙහි විසුවහොත් සක්විති රජ වෙ යි. ඉදින් ගිහිගෙන් නික්ම පැවිදි වුවහොත් ලොවුතුරා බුදු වෙති යි කිවාහු ය.

කියේ මැ නෝ.

පුන දිවසෙ පබුබා දෙවිනං සුපිනං රඤ්ඤෝ ආරොචෙසි. රාජා චතුසට්ඨිමත්තෙන බ්‍රාහ්මණ පාමොක්ඛ පඤ්ඤාසාපෙත්වා හරිතූ පත්තාය ලාජාදීහි කත මඞ්ගල සක්කාරාය භූමියා මහා රහානි ආසනානි පඤ්ඤාපෙත්වා තත්ථ නිසින්නානං බ්‍රාහ්මණානං සපපිමධූ සක්කරාභි සංඛතස්ස වර පායාසස්ස සුවණ්ණ රජත පාතියො පූරෙත්වා සුවණ්ණ රජත පාතීහි යෙව පටිකුජ්ජිත්වා අදාසි. අඤ්ඤෙහි ච අභතවත්ථ කපිලගාමිදාදීහි තෙ ඤත්තපෙසි. අථ නෙසං සබ්බකාමෙහි සන්තප්පිතානං සුපිනං ආරොචාපෙත්වා කිං භවිස්සතීති පුච්ඡි.

බ්‍රාහ්මණා ආහංසු. මාවින්තයි මහාරාජ! දෙවියා කෙ කුච්ඡි මෙහි ගබ්භො පතිට්ඨිතොඃ සො ච ඛො පුරිසගබ්භො න ඉත්ථි ගබ්භො, පුත්තො තෙ භවිස්සති. සො සබ්බෙ අගාරං අජ්ඣාවසිස්සති රාජා භවිස්සති. චක්කවත්ති සබ්බෙ ආගාරා නික්ඛම්ම පබ්බජිස්සති බුද්ධො භවිස්ස ති-සී.

මෙසේ බොධිසත්වයන් මවුකුස පිළිසිඳගැන්ම හා සමග එක පැහැර සියලු දසදහසක් සක්වළ ඌර්ධව දිශාභාගයට යෙමින් කම්පාවූවා ය. පෙරසත්‍යාදි සිව්දිගට යෙමින් කම්පාවූවා ය. කුලාල චක්‍රයක් සෙයින් භ්‍රමනය වූවා ය. වෙවුළුවා ය. දෙතිස් මහා පුරීනිමිත්ත ද පහළ වි ය. සියලු දසදහසක් සක්වළ සියලු ප්‍රදීපයන්ගේ සියලු රත්නයන්ගේ සියලු දිව්‍ය විමානයන්ගේ සියලු තාරකාවන්ගේ සියලු චන්ද්‍ර සූර්‍යයන්ගේ ශක්‍රාදී සියලු දෙවියන්ගේ මහා බ්‍රහ්මාදි සියලු බ්‍රහ්මයන්ගේ ආලෝකයක් ඇද්ද ඒ සියල්ල හිරු උදයෙහි කතමැදිරි ආලෝකයක් සෙයින් මැඩ පවත්වා අප්‍රමාණ වූ ආලොකයෙක් ප්‍රාදුර්භූත වී.

එසින් කිහ - අවිදූරෙ නිදානයෙහි

බොධිසත්තස්ස පන මාතුකුච්ඡිම්හි පටිසන්ධි ගහණක්ඛණෙ එකපහාරේනෙව සකල දසසහස්සී ලොකධාතු සංකම්පි සම්පකම්පි සම්පවෙධි ඉත්තිංස පුබ්බ නිමිත්තානි පාතුරහේසුං. දසසු චක්කවාළසහස්සෙසු අප්පමාණෝ ඔභාසෝ ඵරි-සි.

තුසිතපුරෙන් චුත ව මවිකුස උපදින කල්හි පෘථිවි කම්පා වීම සියලු දසදහසක් සක්වළ ආලෝක පැනිරීම දෙනිස් මහා පුණ්‍යනිමිති පහළවීම් ආදි ය සියලු බොධිසත්වවරයන්ගේ ධර්මතා වෙකි.

එසින් වදුලහ—දික්සහිය මහාවහිය—මහාප්‍රදාන සූත්‍රයෙහි.

"ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තෝ තුසිතා කායා චවිත්වා මාතුකුච්ඡිං ඔක්කමති. අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය අප්පමාණෝ උළාරෝ ඔභාසෝ පාතුභවති. අනික්කමම දෙවානං දෙවානුභාවං. යා'පි තා ලොකන්තරිකා අභා අසංවුතා අන්ධකාරා අන්ධකාර නිමිසා යත්'පි'මෙ චන්දිමසුරියා එවං මහිද්ධිකා එවං මහානුභාවා ආභාය නානුභොන්ති.

තත්'පි අප්පමාණෝ උළාරෝ ඔභාසෝ පාතුභවති අනික්කමෙම'ව දෙවානං දෙවානුභාවං. යෙ'පි තත්‍ර සත්තා උපපන්නා තෙ'පි තතෝ'භාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති. අඤ්ඤං'පි කිර හෝ සන්ති සත්තා ඉධූ'පපන්නා'ති. අයං ච දස සහස්සී ලොකධාතු සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අප්පමාණෝ ච උළාරෝ ඔභාසෝ ලොකෙ පාතු භවති අනික්කමෙම'ව දෙවානං දෙවානුභාවං"-සි.

මේ ආශ්චර්‍ය්‍ය දක්නට කැමැත්තවුන් මෙන් අඹයෝ නේත්‍ර ලද්දාහු ය. ජාතියෙන් ම බිහිරි සත්වයෝ හීනිකා ශබ්දාදී ශබ්ද ඇසුවාහු ය. ජාතියෙන් ම කථාකරන්ට අසමර්ථ සත්වයෝ සැප සේ කථා කළාහු ය. කුදු වූ සත්වයෝ සෘජු වූ ගාත්‍ර ඇති වූවා හු ය. පිළිවූ සත්වයෝ පයින් ගමන් ගත්තාහු ය. බන්ධනගත සියලු සත්වයෝ අඤ්ඤ බන්ධන සංඛලික බන්ධන රජ්ජුබන්ධනාදීන් මිදුනාහු ය. සියලු නරකයෙහි ම ගිනි නිවීගියේ ය. ප්‍රෙතලෝක යෙහි දුකින් මඩනා ලද සියලු සතුන්ගේ ක්ෂුධා පිපාස සංසිඳූ

නේ ය. තිරිසනුන්ට භය නැති වී ය. සියලු සත්‍වයන්ගේ රෝග සංසිඳුනේ ය. සියලු සත්‍වයෝ ප්‍රිය තෙපුල් කියන්ට වන් හ. මියුරු හඬින් අශ්වයෝ හෙසාරව පැවැත් වූ හ. හස්තීහු කුසඳ නාද පැවැත්වූහ.

කිසිවක්හු විසින් නොසොල්වන ලද වීණා වෙණු ආදී වූ සියලු තූර්‍යභාණ්ඩයෝ සවකීය නාද පැවැත්වූ හ. මනුෂ්‍යයන් විසින් නොසොල්වන ලද ඔවුන් ඇඟ පැළඳ සිටි ආභරණයෝ තුමූ තුමූ ම සවකීය නාද පැවැත්වූහ. සියලු දසදික් විශෙෂ යෙන් ප්‍රසන්න වී ය. සත්‍වයන්ට සැප උපදවන්නා වූ මොළොක් සිහිල් පවන් හැමුයේ ය. නො කල් වැසි වට. පොළොව පලා ගෙණ ජල උද්ගත ව වතුර නැංගේ ය. සියලු පක්‍ෂීහු ආකාශ යෙහි ගමන් හැරිය හ. සියලු ගඞ්ගාජලයෝ යටිගං බලා වතුර නොගොස් ඇතිලිය පුරාළෑ පැන් පරිද්දෙන් නිශ්චල ව සිටියා හු ය. සියලු සමුද්‍රයෙහි ලවණ ජල ය මිහිරි පැන් වී ය. සියලු ජලතල ය පස්වණක් පියුමෙන් ගැවසී ගත්තේ ය. දියෙහි ගොඩෙහි පිපෙන සියලු මල් එක පැහැර පිපී ගියේ ය.

සියලු වෘක්‍ෂයන්ගේ කඳෙහි කද පියුම් ද අත්තෙහි අතු පියුම් ද ලතායෙහි ලතා පියුම් ද පිපී ගියේ ය පොළොව පලා ගෙණ මතු මත්තෙහි සතක් සතක් ව දණ්ඩක පද්ම නම් සත් බුමු මහපියුම් පිපී ගියේ ය. ආකාශයෙහි ඔලම්බක පද්ම නම් පියුම් එල්බී ගියේ ය. හාත්පසින් මල්වැසි වැස්සේ ය. ආකාශ යෙහි දිව්‍යවූ පඤ්චාඟික තූර්‍යනාද පැවැත්තේ ය. සියලු දස දහසක් සක්වළ වටකොට ලා දමාලූ මල්පටක් මෙන් ද තරකොට ගසුරුවා බඳනා ලද මල්මිටියක් මෙන් ද සරහා පිළියෙළ කරණ ලද මල් අස්නක් මෙන් ද ඒකමාලාවෙන් ගැවසී ගත්තේ ය. තෙවූ නා වූ වල්විදුනාවෙන් දසදිගින් බැබලී සිටියේ ය. පුෂ්ප ධූප ගන්ධ යෙන් එක සුගන්ධ වී ය. මේ සේ සියලු දසදහසක් සක්වළ උතුම් වූ ශ්‍රී සෞභාග්‍යයෙන් අග්‍රප්‍රාප්ත වී.

මෙම දක්වන්නට කිහ.

"තස්ස තං සිරිං දට්ඨුකාමා විය අක්ඛා වක්ඛූනි පටිලභිංසු, බධිරා සද්දං සුණිංසු. මූගා සමාලපිංසු. ඛුජ්ජා උජුගත්තා අහෙසුං පඛුලා පදසා ගමනං පටිලභිංසු. බන්ධනගතා සබ්බසත්තා අත්තූ බන්ධනාදීහි මුච්චිංසු. සබ්බ නරකෙසු අග්ගි නිබ්බායි. පෙත්ති

විසයෙ ඛුප්පිපාසා වූපසම්සු. නිරවජ්ජානානං භයං නාහොසි. සබ්බ සත්තානඃ රොගො වූපසම්. සබ්බසත්තා පියංවද අහෙසුං. මධු රෙනාකාරෙන අස්සා සෙසිංසු. වාරණා ගජ්ජිංසු.

සබ්බතූරියානි සක සක නිත්තාදං මුඤ්චි සු. අඤ්ඤානි යෙ'ව මනුස්සානං හත්ථූපගාදීනි ආභරණානි විරවිංසු. සබ්බදිසා විපසන්නා අහෙසුං. සත්තානං සුඛං උප්පාදයමානො මුදුසීත ලො වාතො වාසි. අකාල මෙඝො පවයසි. පඨවිතො'පි උදකං උබ්භිජ්ජිත්වා විස්සන්දි. පක්ඛිනො ආකාස ගමනං විජහිංසු. නදි යො අසන්දමානා අට්ඨංසු මහාසමුද්දෙ මධුරං උදකං අහොසි. සබ්බත්ථකමෙ'ව පඤ්චවණ්ණානි පදුමෙහි සඤ්ඡන්නතලො අහොසි. ථලජ ජලජාදීනි සබ්බපුප්ඵානි පුප්ඵිංසු.

රුක්ඛානං ඛන්ධෙසු ඛන්ධ පදුමානි සාඛාසු සාඛා පදුමානි ලතාසු ලතා පදුමානි පුප්ඵිංසු. ථලෙ සිලාතලානි භින්දිත්වා උපරූ'පරි සත්තසත්තා හුත්වා දණ්ඩකපදුමානි නාම නික්ඛමිංසු. ආකාසෙ ඔලම්බක පදුමානි නාම නිබ්බත්තිංසු. සමන්තතො පුප්ඵවස්සා වස්සිංසු. ආකාසෙ දිබ්බතූරියානි වජ්ජිංසු. සකලදස සහස්සී ලොකධාතු: වටෙත්වා ඨිස්සඪ මාලාගුලං විය උප්පිලෙත්වා බඛ මාලාකලාපො විය. අලඞ්කත පටියත්තං මාලා සතං විය. එකමාලමාලිනී විප්ඵුරන්ත වාළවීජනී ධූප ගන්ධ පරිවාසිතා පරම සොභග්ගපත්තා අහොසි සී.

ඒ මහ බෝධිසත්වයන්ගේ ප්‍රතිසන්ධිග්‍රහණයෙහි පටන් බොධි සත්වයන්ට ද මෙසේ ගන්නා ලද පිළිසඳ ඇති බොධිසත්ව මාතාවන්ට ද උපද්‍රව වලකනු පිණිස සතරවරම් රජදරුවෝ සතරදිග ශ්‍රී යහන්ගබඩාවෙහි කඩුගත් අත් ඇති ව රැකවල් ගත්තාහු ය. හුදෙක් ඒ සතරදෙන මතු නො වෙයි. වැලි කවුරු රැකවල් ගත්තු ද යත්? දසදහසක් සක්වලින් එකෙකි සක්වළෙක වරම් රජදරුවෝ සතර සතරදෙන බැගින් සතළිස් දහසක් වරම් රජදරුවෝ ගඟ්වාර ප්‍රාසාදවාර නගරවාරයෙහි පටන් සක්වළ ගල දක්වා හාත්පසින් කඩුගත් අත් ඇති ව රැකවල් ගත්තාහු ය. බොධිසත්ව මාතාවන්ට පුරුෂයන් කෙරෙහි රාගචිත්තයෙක් නො උපන්නේ ය. ඉදුළුදුක් ආදි කිසි පීඩාවකින් නො මිරිකී සතුටු සිනින් බොධිසත්වයන් ඇතුළු කුස උන් තැනැත්තන් විශෙෂයෙන් ප්‍රසන්න වූ ජොති රඹ මාණික්‍ය යක අවුනන ලද රත්පලස් හුයක් මෙන් බොධිසත්ව මාතාවෝ දක්නා හ.

යම් හෙයකින් බොධිසත්වයන් විසූ මවුකුස ද කරඬුවක් හා සමාන වේ ද එබැවින් අන්කිසි සත්වයක්හු විසින් වසන්ට ත් ප්‍රයෝජන විඳින්නට ත් නො පිළිවන් වේ ද ඒ කාරණයෙන් බොධිසත්ව මාතාවෝ බොධිසත්වයන් උපන් සත්දවසින් ම කාල ක්‍රියා කොට තුසිත පුරයෙහි උපදනාහ. යම් සේ අන්‍ය සත්ත්‍වයන් දස මසකට නො පැමිණ ත් දසමසක් ඉක්මවා ත් වැද්දේ ද, හිඳිමින් සැතපෙමින් වැද්දේ ද බොධිසත්ව මාතාවෝ වූකලී එසේ නො වදන්නාහ. බොධිසත්ව මාතාවෝ බොධිසත්වයන් දසමසක් මුළුල්ලෙහි කුසින් පරිහරණය කොට සිට ම වදන්නා හ. මේ බොධිසත්ව මාතාවන්ගේ සුභාව වූ ධර්මතාවෙකි.

එසින් නිහ—අවිදූරෙ—නිදානයෙහි.

"එවං ගහිත පටිසන්ධිකස්ස බොධිසත්තස්ස පටිසන්ධිතො පට්ඨාය බොධිසත්තසස්සෙව බෝධිසත්තමාතුයා ච උපද්දව නිවාරණත්ථං ඛග්ගහත්ථා චත්තාරෝ දෙවපුත්තා ආරක්ඛං ගණ්හිංසු. බොධිසත්තමාතු පුරිසෙසු රාගචිත්තා නුපජ්ජි. ලාභග්ග යසග්ග පත්තා ච අහොසි. සුඛිනී අකිලන්තකායා බොධිසත්තෝ ච අන්තෝ කුච්ඡිගතො විපස්සන්තෝ මණිරතනෙ ආවුත පණ්ඩු සුත්තං විය පඤ්ඤායිස්සති.

යස්මා ච බොධිසත්තෝත්ත වසිත කුච්ඡි නාම චෙතිය ගබ්භ සදිසා, න සක්කා හොති අඤ්ඤත්ත ආවසිතුං වා පරිභුඤ්ජිතුං වා, තස්මා බොධිසත්තමාතා සත්තාහජාතෙ බොධිසත්තෙ කාලං කත්වා තුසිතපුරෙ නිබ්බත්තති. යථා ච අඤ්ඤ ඉත්ථියෝ දස මාසෙ අපත්වා'පි අතික්කමිත්වා'පි නිසින්නා'පි නිපන්නා'පි විජායන්ති. න එවං බොධිසත්ත මාතා සා පන බොධිසත්තං දස මාසෙ කුච්ඡිනා පරිහරිත්වා ඨිතාව විජායති. අයං බොධිසත්ත මාතු ධම්මතා-සි.

මේ ම විස්තර වශයෙන් දක්වන්නට වදළහ.

දීඝනිකාය - මහාපදාන සූත්‍රයෙහි

"ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං ඔක්කන්තෝ හොති චත්තාරෝ නං දෙවපුත්තා චතුද්දිසං රක්ඛාය උපගච්ඡන්ති, මාතරං බොධිසත්තං වා බොධිසත්ත මාතරං වා මනුස්සෝ වා අමනුස්සෝ වා කොචි වා විහෙඨෙසී'ති: අයමෙත්ථ ධම්මතා. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තෝ මාතුකුච්ඡිං

ඔක්කන්තා හොති පකතියා සීලවතී බොධිසත්ත මාතා හොති: විරතා පාණාතිපාතා විරතා අදින්නාදානා විරතා කාමේසු මිච්ඡාචාරා විරතා මුසාවාදා විරතා සුරාමේරය මජ්ජපමාදට්ඨානා-අය මෙත්ථ ධම්මතා.

ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තා මාතුකුච්ඡිං ඔක්කන්තා හොති න බොධිසත්ත මාතු පුරිසෙසු මානසං උප්පජ්ජති කාමගුණූප සංහිතා. අනතික්කමනීයා ව බොධිසත්තමාතා හොති කෙනචි පුරිසෙන රත්තචිත්තෙන – අයමෙත්ථ ධම්මතා. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තා මාතුකුච්ඡිං ඔක්කන්තා හොති ලාභිනී බොධිසත්ත මාතා හොති පඤ්චන්නං කාමගුණානං. සා පඤ්ච හි කාමගුණෙහි සමප්පිතා සමඞ්ගීභූතා පරිචාරෙති – අය මෙත්ථ ධම්මතා. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තා මාතු කුච්ඡිං ඔක්කන්තා හොති – න බොධිසත්ත මාතු කොචි දෙව ආබාධො උප්පජ්ජති.

සුඛිනී බොධිසත්තමාතා හොති අකිලන්තකායා බොධිසත්තං ච. බොධිසත්ත මාතා තිරෝ කුච්ඡිගතං පස්සති සබ්බඞ්ග පච්චඞ්ගිං අහීනින්ද්‍රියං. සෙය්‍යථාපි භික්ඛවෙ මණි වෙළුරියෙ සුභෝ ජාතිමා අට්ඨංසෝ සුපරිකම්මකතෝ අවෙධා විප්පසන්නෝ සබ්බා කාරසම්පන්නෝ. තත්‍රස්ස සුත්තං ආවුතං නීලං වා පීතං වා ලොහිතං වා ඔදාතං වා පණ්ඩු සුත්තං වා. තමේනං චක්ඛුමා පුරිසෝ හත්ථෙ කරිත්වා පච්චවෙක්ඛෙය්‍ය: අයං බෝ මණිවෙළුරියෝ -පෙ- පණ්ඩුසුත්තං වා'ති. එවමේව බෝ භික්ඛවෙ යදා බොධිසත්තා -පෙ- පච්චඞ්ගිං අහීනින්ද්‍රියං -- අයමෙත්ථ ධම්මතා.

ධම්මතා එසා භික්ඛවෙ සත්තානාහජාතෙ බොධිසත්තා බොධිසත්ත මාතා කාලං කරොති. තුසිතං කායං උප්පජ්ජති – අයමෙත්ථ ධම්මතා. ධම්මතා එසා භික්ඛවෙ යථා අඤ්ඤා ඉත්ථිකා නව වා දස වා මාසෙ ගබ්භා කුච්ඡිනා පරිහරිත්වා විජායන්ති. න හෙවං බොධිසත්තං. බොධිසත්ත මාතා විජායති දසෙ'ව මාසානි බොධිසත්තං බොධිසත්ත මාතා කුච්ඡිනා පරිහරිත්වා විජායති – අයමෙත්ථ ධම්මතා. ධම්මතා එසා භික්ඛවෙ යථා අඤ්ඤා ඉත්ථිකා නිසින්නා වා නිපන්නා වා විජායන්ති. න හෙවං බොධිසත්තං. බොධිසත්ත මාතා විජායති. සිතාව බොධිසත්තං බොධිසත්ත මාතා විජායති – අයමෙත්ථ ධම්මතා-සි.

මහාමායා දේවී ද පුරවන ලද තෙල් පාත්‍රයක් සේ දසමාස යක් මුළුල්ලෙහි බොධිසත්වයන් කුසින් පරිහරණයකොට පූර්ණ වූ ගර්භය ඇති ව දෙව්දහ නුවරට යනු කැමති ව සුදොවුන් මහ රජානන්ට එ පවත් දැන් වූ කල්හි ඒ ඇසූ සුදොවුන් මහරජානෝ යහපතැ සි සතුටු ව කපිලවස්තු පුරයෙහි පටන් දෙව්දහ නුවර දක්වා මාර්ග ය සම කරවා පූර්ණඝට ධජපතාකාදීන් අලංකෘතකොට සරහා දේවීන් රන්සිවි ගෙයක හිඳුවා අමාත්‍යයන් දහසක් හා සමග මහත් පිරිවරින් දෙව්දහ නුවරට ගමන් කළාහු ය. දෙව්දහ නුවරට අතුරෙහි සපු හෝපළු නා දෙඹ කිණි දඹ ඕදෙල් සඳුන් ආදී වූ වෘක්ෂ පඞ්කතියෙන් සැදුම් ලද්දා වූ ලුම්බිනී නම් වූ මහුල් සල් උයනෙක් ඇත.

එ සමයෙහි මූල පටන් අග දක්වා සුපුෂ්පිත වූ නීලා දී පඤ්ච වර්ණ භෘඞ්ගයන් විසින් අතු පත් මල් අතුරු ආදියෙහි සඤ්චාරණ ය කරන්නා වූ නොයෙක් මත් මොණර කොවුලු කෙවිලි ආදී වූ සියගණන් පක්ෂි සමූහයා විසින් රැව් පිළිරැව් දෙන ලද්දා වූ දෙව්ලොවින් ගිලිහී බිම වැටී ගිය දිවඋයනක් වැනි වූ මහානුභාව සම්පන්න රජපුරුකෙණෙකුන්ට මනාකොට පිළියෙළ කරණ ලද ආපාන මණ්ඩලයක් වැනි වූ ඒ උයන දුටු මහාමායා දේවිතොමෝ සල්වෙනෙහි උද්‌ගත ක්‍රීඩා කරණු කැමති වූ ය. අමාත්‍යයෝ අභිප්‍රායානුකූල වූ ලෙසටම මහුල් උයනට දේවීන් වඩාළැ හ. මහාමායා දේවී සුපුෂ්පිත සල්රුකක් මූලට ගොස් අත්තක් අල්වනු කැමති වූ ය. එ කෙණෙහි ඉවූ වේ අගබඩක් සෙයින් ශාඛාව නැමී දේවීන්ගේ හස්තයට උපගත වි ය. ඒ ශාල ශාඛාව දකුණතින් ගෙණ නැගෙණහිර දිසාව බලා සිටිය දීම බොධිසත්වයෝ ප්‍රසූත වූහ.

යම් සේ අන්‍ය සත්වයෝ මවු කුසින් ප්‍රසූත වන්නාහු පිළිකුල් වූ මල මූත්‍රාදීන් ගැවසී ගත් ශරීර ඇතු ව ප්‍රසූත වෙද්ද මහබෝසතානෝ එසේ ප්‍රසූත නොවූහ මහබෝසතානෝ වූ කලී ධර්මාසන යකින් බස්නා මහා ධර්මකථික කෙණෙකුන් මෙන් දික්කරණ ලද හස්ත පාදයන් ඇති ව කශිවස්ත්‍රයෙක්හි තබන ලද ජාතිරඹ මාණික්‍යයක් මෙන් පිරිසිදු වූ ශරීර ඇති ව ප්‍රසූත වූහ. බුදුවන ජාතියෙහි මවු කුසින් ප්‍රසූත වන සියලු ම බොධිසත්ව වරයන්ගේ මේ ධර්මතාවෙකි. මේ විස්තර වශයෙන් වදාළහ.

දීඝනිකාය - මහාපදාන සූත්‍රයෙහි

"ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිසස්ස නික්ඛමති. දෙවා පඨමං පටිගණ්හනි පච්ඡා මනුස්සා-අයමෙත්ථ ධම්මතා. ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡි සම්ං නික්ඛමති අප්පත්තොව බොධිසත්තො පඨවිං නොති. චත්තා රොතං දෙවපුත්තා පටිග්ගහෙත්වා මාතුපුරතො ඨපෙනති. අත්ත මනා දෙවී හොති මහෙසක්ඛා තෙ පුත්තො උපපන්නො'ති-අය මෙත්ථ ධම්මතා.

ධම්මතා එසා භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිසම්ා නික්ඛමති විසදෙව නික්ඛමති. අමක්ඛිතො උදෙන අමක්ඛිතො සෙමෙහන අමක්ඛිතො රුහිරෙන අමක්ඛිතො කෙනචි අසුචිනා සුද්ධො විසදෙ - සෙය්‍යථාපි භික්ඛවෙ මණිරතනං කාසික්‍ෙ වත්‍ථෙ නික්ඛිත්තං නෙ'ව මණිරතනං කාසිකං වත්‍ථං මක්‍ෙඛති. න පි කාසිකං වත්‍ථං මණිරතනං මක්‍ෙඛති. තං කිසස හෙතු, උභින්නං සුද්ධත්තා. එව'මෙව ඛො භික්ඛවෙ යදා බොධිසත්තො මාතුකුච්ඡිසම්ා නික්ඛමති විසදෙව නික්ඛමති අමක්ඛිතො උදෙන අමක්ඛිතො සෙමෙහන අමක්ඛිතො රුහිරෙන අමක්ඛිතො කෙනචි අසුචිනා සුද්ධො විසදෙ-අයමෙත්ථ ධම්මතා"-සි.

ඉක්බිත්තෙන් ප්‍රතිඝ කාමරාගයන් ඇත් සුද්ධාවාස බ්‍රහ්ම ලොකයෙහි වසන්නා වූ මහා බ්‍රහ්මරාජයෝ සතරදෙනෙක් රන් දැලින් බොධිසත්වයන් පිළිගෙණ මායාදේවීන් ඉදිරියෙහි තබා, දේවිනි! සතුටු සිත් ඇති ව ව. මහානුභාව සම්පන්න පුත්‍රයෙණෙ කුන් තොසට උපන්නේ වේ දැ සි කීවාහු ය. ඒ මහා බ්‍රහ්මරාජයන් අතින් වරම්රජදරුවෝ උතුම් වූ සුව පහස් ඇති අඳුන් දිවිසමින් පිළිගත්තාහු ය. ඒ වරම්රජදරුවන් අතින් අමාත්‍යයෝ දුහුල් සුඹුලකින් පිළිගත්තාහු ය. මේ ද හැම බොධිසත්ව වරයන්ගේ ධර්මතාවෙකි. හෙ ද නිර්දිෂ්ට පෙළින් හැගේ.

ඉක්බිත්තෙන් බොධිසත්වයෝ ඔවුන් අතින් බැස සම්පත් ලෙන් භූමියෙහි පිහිටා නැගෙණහිර දිග බලමින් සිටිය හ, එ කෙණෙහි පිරිසිදු වූ ශරීර ඇති මහා බෝධිසත්වයන්ට හා මහා මායා දේවීන්ට ද සත්කාර පිණිස ආකාසයෙන් ස්ඵටිකමාණික්‍ය වත් ජලධාරාවෝ දෙදෙනෙක් අවුත් දෙදෙනාගේ ශරීරයෙහි සෘතු ග්‍රහණය නිරීමේන් සතුටු කළාහ. මේ ද හැම බෝසතුන්ගේ ධර්මතාවෙකි.

එසින් වදලහ

ධම්මතා එසා භික්ඛවෙ යද බොධිසත්තෝ මාතුකුච්ඡිසමිං නික්ඛමති දෙව උදකධාරා අන්තලික්ඛා පාතුභවන්ති එකා සීතස්ස එකා උණ්හස්ස, යෙන බොධිසත්තස්ස උදකකිච්චං කරොන්ති මාතුචව. අයමෙත්ථ ධම්මතා-සි.

මෙ පමණක් මතු නොවෙයි. දෙනිස් මහා පුළුතිමිත්තන ද පහළ වෙමින් සිටිය දී සුප්‍රතිෂ්ඨිත පාදතලයෙන් ධරණීතල ය පවිත්‍ර කළ සේක. එ ම විසාර වශයෙන් දක්වන්ට කීහ.

මහාබොධිවංශයෙහි

එකපහාරෙනෙව දසසහස්සී ලොකධාතුසු කපපමානාසු අන්ධකාරනිරන්තරෙසුපි ලොකන්තරෙසු උළාරවිපුලොභාසෙසු එරන්නෙසු සකල දසදිසාසු විපසන්නාසු රජනිකර සුරියතාරාගණෙසු අතිරෙකතරං විරොචින්නෙසු තනො භූමිගතරතනෙසු පජ්ජලන්නෙසු සුගන්ධ මුදු සීතල මාරුතෙසු වායන්නෙසු වාතුද්ධූපගත ජලධර මාලාසු වස්සමානාසු.

වෙගවතී සලිලවාහිනීසු අසන්දමානාසු සන්තකල්ලොල ජල නිධිසු ඔධුර සලිලකලිලෙසු විදෙසගතාසු නාවාසු සදෙසං සිඝමාගච්ඡන්තීසු කාකොලූකෙසු සාවරන්නෙසු සොතහරිණෙසු සහ කිළන්නෙසු අන්ධෙසු නවනවතරසොපෙතං සලිලං පඞ්ගුලනච්චං පස්සමානෙසු බධිරෙසු සත්තසරොපෙතං සඟාමරාගං මුගධීනිකං සුණමාණෙසු සකල නිබ්බුතාපාය දහන නරකමණ්ඩලෙසු මධුර ජල කමල සණ්ඩමණ්ඩිතෙසු පෙතෙසු දිබ්බාජා නිලං උගීරන්නෙසු සකුණෙසු ගගනතල ගමනං පහාය අවනිතල'මාවරන්නෙසු සන්නෙසු. විගතභය රොග සිසිර පරිළාහෙසු. ජින්නාසු සකල සඞ්කලිකාසු නිභුවන භවන ද්වාර කවාටෙසු සයං යෙ'ව විවටෙසු අසෙස ජනතුසු පියං වදන්නෙසු තුරගෙසු ඔධුර හෙසාරවං කරොන්නෙසු කුඤ්ජරෙසු අනිගජ්ජන්නෙසු කෙසරීසු අනිනද නෙසු.

අවාදිත තුරියෙසු සක සකනිත්‍යාදං මුඤ්චන්නෙසු අඤ්ඨිත සරීරාභරනෙසු මධුර රවං විරවන්නෙසු දෙවතාසු දිබ්බසංගීතිං කුරුමානාසු සුඵුල්ලෙසු තරුලතාගුමෙඛසු ජලථල සිලාතලානි භින්දිත්වා උපරුපරි සත්තසත්ත හුත්වා විවිත්ත පඤ්චවණ්ණ පදුමෙසු

නිත්‍යමනෙහසු අධොමුඛ කමලෙසු පදුමවිතානෙසු පවනපථෙ විහඟෙසු සමන්තතො දිබ්බපුපෙඵසු වස්සමානෙසු ආකාසෙ දිබ්බ තූරියෙසු වජ්ජමානෙසු සකලලොක හදයානන්දකාරී සුපපතිට්ඨිත පාදතලෙහි ධරණිතලමකාසි-සි.

මෙහි එක පැහැර දසසහස්‍රී ලොකධාතු කම්පිතවනු සර්ව්ඥ ඥාණුත්‍පත්ති ප්‍රතිලාභයට පූර්වනිමිත්තත ය. ලොකන්තර නරකයෙහි අන්ධකාර විධවංසත වනු අව්ඤ්ඤකාර විධමනුවට පූර්වනිමිත්තත ය. සියලු දශදිශා ප්‍රසන්නවනු සත්ත්වලොක දක්වන්නට ය. සදහු අනිෂය ව දිලියෙනු බොහෝ ජනයාහට කාන්ත වත බවට ය. සූර්‍යයා මදමෙලෙක් රැස් විසිරමින් දිලියෙනු කයට සිතට සුව වත බවට ය. තාරාගණයන් දිලියෙනු විකෙජනයන් සොම්නස් වත බවට ය. සුවද මෙලෙක් සිහිල් සුළඟ හමනුයේ කෙලශ පරිදාහ නිවනුවට ය. සතරමහාද්වීපයෙහි එක පැහැර වර්ෂණ ය කරණු ධර්ම මෙඝ වර්ෂාවට ය.

ගඞ්ගා නදී සන්දන ය නොකරණු චතුවෛශාරද්‍ය ප්‍රතිලාභ යට ය. සමුද්‍රයෙහි දිය මධුරවනු නිර්ෂාණරසයෙන් එකරස වනු වට ය. විදෙශයට ගිය නවුකාවන් සවදෙශයට එනු සතර ප්‍රතිසන්ධින් සම්ධිගමයට ය. කාකොලූකාදී වෛරී සඞ්ඝයන් ඔවුනොවුන් කෙරෙහි මෛත්‍රී කරණු සතර බ්‍රහ්මවිහාර ප්‍රතිලාභයට ය අන්ධයන් රූපදර්ශන ය කරනු දිව්‍යංචක්ෂුර්ප්‍රතිලාභයට ය. පඞ්ගුලයන් නර්තන ය කරණු චතුරිද්ධිපාදවෙගයට ය. බධිරයන් ශබ්ද ශ්‍රවණ ය කරණු දිව්‍යංශ්‍රොත්‍ර ප්‍රතිලාභ ය ට ය. මූගයන් ගායනා කරණු සඞ්ගීදෙශනාවට ය. නරකයෙහි ගිනි නිවෙනු එකාදසාග්නි නිවෙනුවට ය.

ප්‍රෙතයන් දිව්‍යභොජනයෙන් තෘප්තයන් සෙයින් පිණා යාම කායගතානුස්මෘති සඞ්ඛ්‍යාත අමෘතප්‍රතිලාභයට ය. සකුණින් ආකාශ ගමින් පියා පොළොතෙලෙහි සඤ්චාරණ ය කරණු අවවාද ලද ජනයන් ප්‍රාණයෙන් සරණ යනු වට ය. සත්තට භය රොග සිසිර පරිදාහ නොවනු චතුස්සත්‍ය ප්‍රතිලාභයට ය. ශෘඞ්ඛලාබන්ධිතවනු අසම්මාන සම්භෙදයට ය. දෙර කවුළු විවෘතවනු අෂ්ටාඞ්ගිකමාර්ගයෙහි දෙර විවර කරණුවට ය. හැම සතුන් ප්‍රීතිකොට බණනු ද අශ්වයන් මධුරකොට හෙසාරව කරණු ද ඇතුන් ගර්ජනා කරණු ද කෙසරින් සිංහනාද කරණු ද දෙවියන් දිව්‍ය සඞ්ගීති කරණු ද බුදුබවට පැමිණ උදන් උදනු කරණුවට ය.

නො වයන ලද තුයීයන් ධ්‍යානි විහිදුනේ මහත් ධර්මතෙරි ශ්‍රවණයට ය. නො සොල්වන ලද ශරීරාභරණයන් හඬනු නවානු පූජාවිහාර සමාපත්ති ලාභයට ය වෘක්ෂ ලතා ගුල්මයන් සුපුෂ්පිත වනු විමුක්ති පුෂ්පයෙන් සුපිෂ්පිත වන බවට පූජානිමිත්තය. සෙසු ප්‍රාතිහාර්‍යයෝ සෙසු බුදගුණ ප්‍රතිලාභයට පූජානිමිත්තයෝ සි ඇතු.

බොධිවංශ ග්‍රන්ථපද විවරණයෙහි කිහු

ඉක්බිත්තෙන් ශරත් කාලයෙහි නිර්මල වූ චන්ද්‍රමණ්ඩල ය සේ මහජනයාගේ නෙත් සිත් දෙකට රසායනයක් වැනි වූ මනා කුශල කර්මයන් විසින් සුසංවිධානකරණ ලද බහුප්‍රකාර වූ ද්වාත්‍රිංශත් මහාපුරුෂ ලක්ෂණයෙන් අශීත්‍යනුව්‍යඤ්ජනයෙන් සොභමාන වූ ශරීර ඇත්තාවූ පැහැද නැමුනා වූ නොයෙක් ලක්ෂගණන් බ්‍රහ්ම සුරාසුරොරග කින්නර මනුෂ්‍යයන්ගේ කිරීටමාලාවෙන් අලංකෘත වූ ශ්‍රීපාද යුගලයක් ඇත්තා වූ ප්‍රසාදයෙන් හා විස්මයෙන් සම්පූර්ණ වූ නුවණැති දිව්‍ය මනුෂ්‍යයන් විසින් ගායනාකරණු ලබන්නා වූ ශරත් චන්ද්‍ර සූර්‍යයන්ට නිහුකරණ ලද කාන්ති හා තේජස් ඇත්තා වූ-

මෙරුමහුරාදී වූ උත්තයන් කිළිල්කඩක් සේ සිදීමෙහි සමර්ථ වූ වජ්‍රායුධයක් සේ අවිද්‍යාදී වස්තූන් කඩකිරීමෙහි සමර්ථ බැවින් වජ්‍රායුධ සහස්‍රයෙක්හි දුර්ලභ වූ ප්‍රඥාසාරත්වයක් ඇත්තා වූ ආකාශ ය සේ නිර්විකාර වූ සමුද්‍රය සේ ගැඹුරු වූ සම්ප්‍රාප්ත සර්ව පාරමිතා නැමැති මහාර්ණවයෙහි පරතෙර ඇත්තා වූ කරුණා රාශියක් වැනි වූ ප්‍රාර්ථනා විශෙෂයෙන් ලබන ලද කුසල පරිපාක ඇති සේක් කුශලසම්භාරයෙන් භරිත වූ සන්තාන විශෙෂ ඇත්තාවූ උතුම් වූ ගුණයන්ට භවනයක් වැනි වූ සඩමී නමැති ශරීරයට වාසස්ථානයක් වැනි වූ මොහාන්ධකාර විධ්වංසන ය කිරීමට සූර්‍යයා වැනි වූ සර්ලොකයට ඇසක් වැනි වූ කරුණා නැමැති ජල ය සම්බන්ධ වූ ප්‍රවාහයක් වැනි වූ සංසාර නැමැති සාගරයෙන් එතර වෙන හෙයක් වැනි වූ-

කරුණා නැමති ජලයට ආධාරයක් වැනි වූ සත්තෝඝ නැමැති ජලයට සමුද්‍රයක් වැනි වූ නිර්වාණ මාර්ගයට උපදෙශ යක් වූ ප්‍රඥා නැමැති චක්‍රයාගේ නාභියක් වැනි වූ ධර්ම නැමැති ධ්වජ නැගීමට වෙළුයෂ්ටියක් වැනි වූ තෘෂ්ණා නැමැති ලියගහණ ය

සිදීමට එරසුවක් වැනි වූ සේක් ලොභ නැමැති සාගරයට වඩබා ගනියක් වැනිවූ සේක් ක්‍රොධ නැමැති නාගරාජයාට මන්ත්‍රයක් වැනි වූ රාග නැමැති පලලව පත්‍රයන්ගේ වියලීමට ලැව්ගින්නක් වැනි වූ කුශල රාශියට උත්පත්තිස්ථානයක් වැනි වූ-

මෙසේ මෙබඳු ගුණ සමූහයෙන් යුක්ත වූ මහාබෝධිසත්ව තෙමේ පූර්වදිග්භාග ය බලමින් එහි එකාඞ්ගත වූ නොයෙක් චක්‍ර වාට කොටි සහස්‍රයන් දැක මෙසේ දසදිග බලනුයේ බැළු බැළු දෙසෙහි දිව්‍ය බ්‍රහ්මයන් විසින් සවාමීනි! මේ දිසාවෙහි ඔබ හා සම කෙණෙකු ත් නැත ඔබට වැඩි කෙණෙකු ත් නැත. ඒ කාරණයෙන් මේ දිසාව බැලීමෙන් ප්‍රයෝජන නැතැ සි යනාදීන් දැන් වූ හෙයින් උත්තර දිසාභිමුඛ ව සහම්පතී මහාබ්‍රහ්මයා විසින් ධවල ච්ඡත්‍ර ධරණු ලබමින් සුයාම නම් දිව්‍යපුත්‍රයා විසින් වල්විදුනා සලනු ලබමින්-

ඒ ඒ දිව්‍යරාජයන් විසින් රත්නාකර්ෂණයෙන් සොහමාන වූ මහුල් කඩු ව හා රන්මිරිවැඩි තළල්පට ගත් අත් ඇති ව පිරිවරණ ලද්දේ එ දවස් උපන් තැනැත්තෝ සොළොස් හැවිරිදි පිරුණක්හු මෙන් ද නග්න වූ තැනැත්තෝ කසීසළු හැඳ සිටියක්හු මෙන් ද නො සැරහුණු තැනැත්තෝ චක්‍රවර්ති අලංකාරයෙන් අලංකෘත වූවක්හු මෙන් ද භූමියෙහි යන තැනැත්තෝ ආකාශයෙන් යන්නක්හු මෙන් ද සියලු ලෝවැස්සන්ට පෙනෙමින්-

සප්තපදවීනිහාරාවසානයෙහි සත් බුමු මහ පියුම් මස්තක යෙහි වැඩසිට විකසිත වන්නා වූ මහතෙල් ගැබෙක්හි පරිමල සුගන්ධියක් මෙන් මනොඥ වූ මුඛ සුගන්ධයෙන් සියලු භුවන තල ය සුවඳ කෙරෙමින් අභිනව ජලයෙන් හරිත වූ ගැඹුරු වූ මෙඝධ්වනියක් හා සමාන වූ ධෙයශී රහිත වූ ධවනි පවත්වා **"අග්ගොහමස්මි ලොකස්ස"** යනාදී සියලු සර්ව්ඥවරයන්ගේ චාරිත්‍ර වූ උතුම් වූ සිංහනාද කළ සේක.

එ හෙයින් කිහ.

තතො සෝ සරදකාලෙ නිම්මල වඳ මණ්ඩලෝ විය ජනනයන වෙතොරසායනෝ සුකත සත සුවිහිත බහුවිධ ලක්ඛණානුව්‍යඤ්ජන පනිමණ්ඩිත දෙහෝ පසාදුවනකානෙක සතසහස්ස බ්‍රහ්ම සුරාසුරොරග කින්නර මොළිමාලාලඞ්කත චරණ යුගලෝ පසාදවහනයා පුණ්ණ බුධ විබුධ මනුජ සතාභිනීයමාන ථුතිවචනෝ සරද රජනීකර සහස්සරංසි මිපනාසින කන්තිතෙජෝ-

කුලීස සහස්ස දුල්ලභ සාරභාවෝ ගගනතල නිබ්බිකාරෝ සලිලනිධි ගම්භීරෝ සමපත්ත සකල පාරමිතා මහණ්ණවපාරෝ කාරුඤ්ඤ 'මිව දෙහෙ බ්‍රහ්මා අනිනීහාරාභිසය පරිපාකලාභී කුසල සම්භාර භරිත සන්තානවිසෙසෝ ආවාසෝ'ව ගුණානං නිවාසෝ'ව ධම්මසරීරස්ස දිවසකරෝ'ව මොහන්ධකාරවිධමනස්ස චන්දූරි'ව සබ්බ ලොකස්ස පවාහෝ'ව කරුණාරසස්ස සන්තරණසෙතු සංසාර සින්ධුස්ස ආධාරෝ'ව

කරුණා ජලස්ස සාගරෝ සත්තෝසාමතස්ස උපදෙසකෝ සිද්ධිමගගස්ස නාභී පඤ්ඤුවක්කස්ස උට්ඨානවංසෝ ධම්මධජස්ස ඵරසු තණ්හාලතා ගහණස්ස වළ්ඹානලෝ ලොභ අණ්ණවස්ස මහාමත්තෝ'ව කොධභුජඞගමස්ස දුවානලෝ රාගපල්ලවස්ස පභවෝ පුඤ්ඤසඤ්චයස්ස පුරත්ථිමං දිසං ඔලොකෙත්වා තත්ථ එකඞග නානි අනෙක චක්කවාළ කොටිසහස්සානි දිසවා

එවං දසදිසාය මනුස්සලොකෙත්වා අත්තනා සම මධිකමෙක පුග්ගල'මපි අදිසවා උත්තරාභිමුඛෝ බ්‍රහ්මුනා සෙතච්ඡත්තං ධාරිය මානෝ සුයාම විබුධාධිපෙන වාලවීජනියා වීජයමානෙ

තෙන තෙන දෙවරාජෙන රතන ඛචිත මඞගලඛග්ගං කණ්ඨකපාදුකං දිබ්බමය මුණ්හීසං ගහෙත්වා පරිවාරිතෝ තදහු ජාතොපි සොළසවස්සිකෝ විය තග්ගෝ'පි කාසික වත්ථනිවත්ථෝ විය අනලඞකතෝ'පි චක්කවත්ති අලඞකාරෙණ අලංකතෝ විය භූමියා ගච්ඡන්නෝ'පි ආකාසෙන ගච්ඡන්නෝ විය

සකල ලොකස්ස පඤ්ඤුයන්නෝ සත්තපදවීතිහාරෙන ගන්ත්වා විජම්භමාන කමල කොස පරිමල මනොහරෙන සහජා තෙන'මොදෙන යකල භූවනතලං පරිවාසෙන්නෝ නවනීරහාර ගම්භීර ජලධරනි නිහං සධිරං ගිරං නිච්ඡාරෙත්වා **"අග්ගොහමස්මි ලොකස්සාති"** සබ්බ ජිනවර චාරිත්තමුත්තමං සීහනාද මකාසි-සි.

මේ සියලු චාරිත්‍ර හැම බුදුන්ගේ ධර්මතා බව දක්වන්නට වදාළහ බුදුන් විසින්.

ධම්මතා භික්ඛවෙ සම්පති ජාතෝ බොධිසත්තෝ සමෙහි පාදෙහි පතිට්ඨහිත්වා උත්තරාභිමුඛෝ සත්තපදවීතිහාරෙන ගච්ඡති සෙතම්හි ඡත්තෙන අනුහීරමානෙ, සබ්බා ච දිසා විලොකෙති.

ආසභිං ච වාචං භාසති. අග්ගොහමස්මි ලොකස්ස ජෙට්ඨොහමස්මි ලොකස්ස සෙට්ඨොහමස්මි ලොකස්ස අයමන්තිමා ජාති නත්ථි'දානි පුනබ්භවෝ'නි අයමෙත්ථ ධම්මතා-යි.

ඒ එසේ ම ය. අපමණ බෝසතාණෝ මහෞෂධාත්ම භාව යෙහි ය. වෙස්සන්තරාත්මභාවයෙහි ය. බුදුවන මේ ආත්මභාව යෙහි ය සි යන තුන් ආත්මභාවයෙක්හි මවුකුසින් නික්මෙන වේලෙහි ම කථාකිරීමෙන් නික්මුණු සේක. මහෞෂධාත්මභාව යෙහි වනාහි මවුකුසින් නික්මෙන වේලෙහි ම සක්දෙව්රජ අවුත් වන්දන සාරයක් හස්තයෙහි තබා ගියේ ය.

බෝධිසත්වයෝ ඒ වන්දන සාර ය මිටින් ගෙණ නික්මෙන් නේ මැනියෝ පුත කුමක්ගෙණ ආවෙහි දැ සි විවාළ නෙසින් මැනියෙනි! ඖෂධයෙකැ සි කියා කථා කළ සේක් මෙසේ ඖෂධ යක් ගෙණ ආ නෙසින් ඖෂධ කුමාරයෝ ය සි බෝධිසත්වයන්ට නම් තුබුවාහු ය. ඒ ඖෂධ ය ගෙණ භාජනයෙක්හි තුබුවා හු ය. අන්ධබධිරාදීන්ගේ රොගව්‍යපශමයට ඒ ඖෂධ ය වි ය. එ නෙසින් මේ මහත් ඖෂධයකැ සි උපත් වවන ය නිසා බොධි සත්වයන්ට මහෞෂධයෝ ය සි කියා ම (නාම) සංඥ වි ය.

වෙස්සන්තරාත්මභාවයෙහි වනාහි මවුකුසින් නික්මෙණ තැනැත්තෝ දකුණු අත දිහුකොට මැණියෙනි! ගෙයි කුමක් ඇද්ද? දන් දෙමි''සි කියා නික්මුණු සේක. එ කල බෝධිසත්ව යන්ගේ මැණියෝ පුන නොවී මහදන කුලෙහි උපන්නෝ වේ දැ සි කියා පුතනුවන්ගේ අත තමන්ගේ අත්ලෙහි තබා දන් දෙන පිණිස දහසින් බැඳි පියල්ලක් අත් තිබූ ය. මේ බුදුවෙන ආත්මයෙහි වනාහි ''අග්ගොහමස්මි ලොකස්ස'' යනාදීන් සිංහ නාද කෙරෙමින් නික්මුණු සේකැ සි මෙසේ බෝධිසත්වයෝ ආත්මභාව තුනෙක් හි මවුකුසින් නික්මෙමින් ම කථා කෙරෙ මින් නික්මුණාහු ය. එ ම දක්වන්නට කිම.

බොධිසත්තෙනා හි තීසු අත්තභාවෙසු මාතුකුච්ඡිතෝ නික්ඛ න්ත මත්තෙ එව වාචං නිච්ඡාරෙසි. මහොසධත්තභාවෙ වෙස්ස න්තරත්තභාවෙ ඉමස්මිං අත්තභාවෝ'ති. මහොසධත්තභාවෙ කිරස්ස මාතුකුච්ඡිතෝ නික්ඛමන්තස්සෙව සක්කො දෙවරාජා ආගන්ත්වා වන්දනසාරං හත්ථෙ ඨපෙත්වා ගච්ඡි.

සො තං මුට්ඨියං කත්වාව නික්ඛන්තෙනා අථ නං මාතා තාත කිං ගහෙත්වා ආගතොසී'නි පුච්ඡි. ඔසධං අම්මා'නි ඉති

ඔසධං ගහෙත්වා ආගතහත්ථා ඔසධ දූරකොත්වේ'වස්ස නාමං අකංසු. තං ඔසධං ගහෙත්වා වාරියං පක්ඛිපිංසු. ආගතාගතා නං අඞ්ඛධිරානං තදෙව සබ්බ රොගවූපසමාය හෙසජ්ජං අහොසි. තතෝ මහන්තං ඉදං ඔසධ'නති උපපන්න වචනං උපාදය මහොසධෝ ත්වේ'වස්ස නාමං ජාතං.

වෙස්සන්තරත්තභාවෙ පන මාතුකුච්ඡිතෝ නික්ඛමනෙනා දක්ඛිණහත්ථං පසාරෙත්වාව "අත්ථි නු ඛෝ අම්ම කිඤ්චි ගෙහසම්ං දුනං දස්සාමී"ති-වදනෙනා නික්ඛම්. අථස්ස මාතා සධනෙ කුලෙ නිබ්බත්තෙනා'සි. තාතා'නි පුත්තස්ස හත්ථං අත්ත නෝ හත්ථතලෙ කත්වා සහස්සත්ථවිකං ඨපාපෙසි. ඉමස්මිං පන අත්තභාවෙ අඤ්ඤා හමස්මිං ලොකසෙත්ථාදිං ඉමං සීහනාදං නදී'නි එවං බොධිසත්තෙනා නීසු අත්තභාවෙසු මාතුකුච්ඡිතෝ නික්ඛන්තමත්තෙනාව වාචං නිච්ඡාරෙසි-සි.

යම් කාලයෙක අප මහ බෝසතාණෝ ලුම්බිනීවනයෙහි උපන් සේක් ද එ වේලෙහි ම **රාහුල මාතාවෝ ය ඡනන** නම් අමාත්‍යයෝ ය **කාළුදායි** නම් අමාත්‍යයෝ ය. **ආජානිය** නම් හස්ති රාජයෝ ය. **කණ්ඨක** නම් අශ්වරාජයෝ ය. **බොධි වෘක්ෂ** ය සහර **මහ නිධානයෝ ය** යන මොහු උපන්නාහු ය. ඒ නිධාන යන් අතුරෙහි එකක් ගවුවෙක, එකක් දෙගවුවෙක, එකක් තුන්ගවුවෙක, එකක් සතර ගවුවෙක යන මේ වස්තු සත සහ ජාත වස්තු නම්ැ සි කියන්.

මේ ද කිහ

යසම්ං පන සමයෙ අම්හාකං බොධිසත්තෝ ලුම්බිනී වනෙ ජාතෝ තසම්ං යෙව සමයෙ **රාහුලමාතා** දෙවී **ජනෙතා** අමච්චෝ **කාළුදායි** අමච්චෝ **ආජානියෝ** ඝත්ථිරාජා **කණ්ඨකෝ** අස්සරාජා **මහාබොධිරුක්ඛා** චතස්සෝ **නිධිකුම්භියෝ** ච ජාතා, තත්ථ එකා ගාවුතපපමාණා එකා අඩ්ඪයොජන පපමාණා එකාති ගාවුතපපමාණා එකා යොජනපපමාණා අහොසි'නි ඉමෙ සත්ත සහජාතා නාම-සී

සිංහනාද කළ ඉක්බිත්තෙන් උභය නගරවාසීහු අපමණ වූ පූජාවෙන් ප්‍රමාණාතික්‍රාන්ත වූ ශ්‍රී සමෘඞ්ධියෙන් බොධිසත්වයන් කිඹුල්වත් පුරයට ම ගෙණ ගිය හ. එ දවස් කපිලවස්තු පුර යෙහි සුඩොදන මහ රජහුට පුත්‍රෝත්පත්තියක් උපන. ඔහු බෝ

මැඩ හිඳ බුදුවෙනැ සි නවුතිසා දිව්‍ය භවනයෙහි තුටුපහටු සිත් ඇති දිව්‍ය සමූහයෝ මහත් වූ කෙළියෙන් කෙළින්ට වන්හ.

එ සමයෙහි සුඩොදන රජ්ජුරුවන්ගේ කුලුපග වූ අෂ්ට සමාපත්තිලාභී වූ **කාලදෙවල** නම් තපස්විතෙම බත් කිස නිමවා දිවාවිහාර පිණිස තවුතිසා භවනයට ගොස් එහි දිවාවිහාරකොට හුන් තැනැත්තෝ ඒ දෙවියන් දැක එම්බා දෙවතාවෙනි! මෙසේ සතුටු වූ සිත් ඇති ව කුමන් හිසා කෙළිවූ ද, මට ත් මේ කාරණය නො වලහා කියව සි විවාළෝ ය. දෙවියෝ පින්වත් වූ තාපසයෙනි! සුදවුන් මහරජානන්ට පුත්‍රයෙක් උපන්නේ ය.

හෙතෙම බෝමැඩ හිඳ බුදු ව ධර්මචක්‍ර ය පවත්වන්නේ ය. ඔහුගේ අනන්‍ය වූ බුඩ ලීලාව දක්නට ද ධර්මශ්‍රවණ ය කරන්නට ද ලබම් හ. මේ කාරණයෙන් සතුටුවූවම්හ සි කිවාහු ය. කාලදෙවල තාපසයෝ එ පවත් අසා ශිඝ්‍ර ව දෙවිලොවින් බැස රජගෙට ප්‍රවිෂ්ට ව පණවනලද අස්නෙහි උන්තැනැත්තෝ මහ රජ! පුත්‍රයෙක් තොපට උපන්නේ ය. ඔහු දකිම් සි කිහ. රජ්ජුරුවෝ සරහා පිදීයෙළ කාරණලද කුමාරයන්ට අනවා පුත තපස්වීන් වැඳ පින් රැස්කරගණුව සි කියා තපස්වීන් වඳනා ලෙස යොමුකළෝ ය.

බොධිසත්ත්වයන්ගේ පාදයෝ පරිවර්තිත ව තාපසයන්ගේ ජටාමිසතකයෙහි පිහිටියේ ය. ඒ එසේ ම ය. බොධිසත්ත්වයන්ගේ ඒ ආත්මභාවයෙන් වැළුම් ගතයුතු අන්කිසිවෙක් නැත ඉදින් වනාහි නොදැන බොධිසත්ත්වයන්ගේ හිස තාපසයන්ගේ පාමුල තුබූ නම් ඒ තාපසයන්ගේ හිස සත්කඩක් ව පැලෙන්නේ ය. තාපසයෝ මා නොනැසුව මැනව සි හුන්තැනින් නැඟී දෙහොත් මුදුන් දී බොධිසත්ත්වයන්ට නමස්කාර කළෝ ය. ඒ ආශ්චර්‍ය්‍ය දුටු සුදවුන් මහරජතෙමේ තමන්ගේ පුතනුවන් වැන්දහ.

එසින් කිහ.

තං දිවසංයෙව ච කපිලවත්ථුනගරෙ සුඩොදන මහාරාජස්ස පුත්තො ජාතො, අයං කුමාරෝ බොධිමූලෙ නිසීදිත්වා බුඩො භවිස්සතී'ති තාවතිංසභවනෙ ඨඪා භූඨා දෙවසංඝා වෙළුකෙඨපාදීනි පවත්තෙනන්තා කීළිංසු. තස්මිං සමයෙ සුඩොදන මහාරාජස්ස කුලූගො අඨසමාපත්තිලාභී කාලදෙවලො නාම තාපසො භත්තකිච්චං කත්වා දිවාවිහාරත්ථාය තාවතිංසභවනං ගන්ත්වා

තස්ථ දිවාවිහාරං නිසිත්තෙනා තා දෙවතා දිසවා කිං කාරණා තුමෙහ එවං තුඨමානසා කීලථ? මයගමෙපතං කාරණං කථෙථා'නි පුච්ඡි.

දෙවතා ආහංසු. මාරිස! සුඩොදනස්ස රඤ්ඤ පුත්තෙනා ජාතො. සො බොධිමූලෙ නිසීදිත්වා බුඩො හුත්වා ධම්මවක්කං පවත්තෙස්සති. තස්ස අනන්තං බුඩලීළහං දට්ඨුං ධම්මඤ්ච සොතුං ලච්ඡාමාති ඉමිනා කාරණෙන තුඨමහාති. තාපසො තාසං වචනං සුත්වා ඛිපං දෙවලොකතො ඔරුයහ රාජනිවෙසනං පවිසිත්වා පඤ්ඤත්තාසනෙ නිසින්නෙනා-පුත්තෙනා කිර තෙ මහාරාජ ජාතො පස්සිස්සාමි න'න්නි ආහ. රාජා අලංකත පටියත්තං කුමාරං ආණාපෙත්වා තාපසං වන්දාපෙතුං අනිහරි.

බොධිසත්තස්ස පාදෙ පරිවත්තිත්වා තාපසස්ස ජටාසු පතිඨහිංසු. බොධිසත්තස්ස හි තෙනාත්තභාවෙන වඩ්ඪිතබබ්බයුත්තකො අඤ්ඤෙ නාම නත්ථි. සබෙ හි අජානන්තා බොධිසත්තස්ස සීසං තාපසස්ස පාදමූලෙ යපෙය්යුං. සත්තධා අස්ස මුඛං ඵාලෙය්ය. තාපසො න මෙ අත්තානං දාතබ්බං යුත්ත'න්නි උට්ඨායාසනා බොධිසත්තස්ස අඤ්ජලිමපග්ගහෙසි. රාජා තං අච්ඡරියං දිසවා අත්තනො පුත්තභාවං වණ්ණි-සි.

කාලදෙවල තපස්වීතෙමේ අතීතයෙහි සතළිස් කපෙක, අනාගතයෙහි සතලිස් කපෙකැ සි අසූකපක් සිහිකරණ ඤාණය ඇත්තෙක. එ හෙයින් බොධිසත්වයන්ගේ ලක්ෂණ සම්පත්ති ය දැක බුඩත්ව ය සිදුවේ දෝ නොවේ දෝ හෝ සි ආවර්ජනයකොට උපධාරණ ය කරන්නේ සැක නැති ව ම බුදුවෙති සි දැන මේ තෙමේ ආශ්වය්‍ය පුද්ගලයෙකැ සි සිතාසී තැවත එම මේ උතුමා නන් බුදුවූ කල දක්නට ලබම් දෝ නො ලබම් දෝ හෝ සි පරීක්ෂා කරන්නේ නො ලබම් සි බුදුවන අතුරෙහි කාලක්‍රියාකොට සිය යක් බුදුවරයන් විසිනු දු දහසක් බුදුවරයන් විසිනු දු ගොස් අවබොධ කරන්නට නො හැකි වූ අරූපභවයෙහි උපදින්නෙම් සි දැක, මෙ බදු ආශ්වය්‍ය පුරුෂයා බුදු වූ කල දක්නට නොලබම් සි මහත් වූ සෝකයෙන් ඇඬූ හ.

කියේ මැනෝ.

තාපසෝ අනිත්තෙ චත්තාළීසකප්පෙ අනාගතෙ චත්තාළීසා'නි, අසීතිකප්පෙ අනුස්සරති. බොධිසත්තස්ස ලක්ඛණ සම්පත්තිං දිස්වා භවිස්සති නු ඛෝ බුද්ධෝ උදාහු නෝ'නි ආවජ්ජිත්වා උපධාරෙන්තෝ නිස්සංසයං බුද්ධෝ භවිස්සති'නි ඤත්වා අච්ඡරිය පුරිසෝ අය'න්ති සිතං අකාසි. තතෝ අහං ඉමං බුද්ධභූතං දට්ඨුං ලභිස්සාමි නු ඛෝ නෝ'නි උපධාරෙන්තෝ න ලභිස්සාමි අන්තරායෙව කාලං කත්වා බුද්ධසතෙනපි බුද්ධසහස්සෙනපි ගණ්හිත්වා බොධෙතුං අසක්කුණෙය්‍ය අරූප භවෙ නිබ්බත්තිස්සාමී'නි දිස්වා එවරූපං නාම අච්ඡරියං පුරිසං බුද්ධභූතං දට්ඨුං න ලභිස්සාමී'නි මහති වත මෙ ජානි භවිස්සති'නි පරොදි-සි.

මනුෂ්‍යයෝ ඒ දැක අපගේ තාපසයෝ දැන් ම සිනාසී නැවත හඬන්නට වන් හ. මේ කාරණය කිමෙක්ද සි සිතා කිමෙක් ද? සවාමීනි! අපගේ උතුමානන්ට කිසි අන්තරායෙක් වී න්නේද සි විමසූ ය. ඒ අසා තාපසයෝ මේ කුමාරයන්ට අන්තරායෙක් නැත. සැක නැති ව ම බුදු වන්නේ ය සි කිහ. නැවත කුමක් හෙයින් හැඬූසේක්ද සි විමසූ ය.

තාපසයෝ මෙ බදු උතුමානන් බුදුවන කල දක්නට නොලැබී මා මහළු හෙයින් අතරෙහි කාලක්‍රියා කෙරෙමි. එ හෙයින් හැඬිමි සි කිහ. මෙසේ කියා මේ උතුමානන් බුදුවූ කල්හි දක්නට මාගේ නැයන් අතුරෙහි කිසිවෙක් ඇද්ද නැද් දෝ හෝසි පරීක්ෂා කරන්නේ භාගිනෙය්‍ය වූ නාලක නම් කුමරුවා දැක භගිනීන්ගේ ගෙට ගොස් ඔහු කෑදවා "දරුවෙනි! සුදුවුන් මහරජානන්ගේ කුලයෙහි පුතෙක් උපන්නේ ය. ඔහු බුබ්බුරයෙක, පන්නිස් අවුරුද්දක් අතික්‍රාන්තකොට බුදුවන්නේ ය. නෝ ඒ බුදුන් දක්නට ලබන්නෙහි ය එ හෙයින් අද ම පැවිදි වෙව'සි කිහ.

ඒ අසා නාලක කුමාරයෝ මාගේ මාතුලයෝ මා අනුව්‍යෙක නොයෙදුනි. මට වැඩක් පිණිස කිහු ම ය සි සිතා කිකරු ව සතාසූ කෙළක් ධන ඇති කුලෙහි උපන් තැනැත්තෝ ඒ සියලු ම සම්පත් හැර එ කෙණෙහි ම වීරියෙන් කසා වසත්‍ර හා මැටි පාත්‍රයක් ගෙන්වාගෙණ දැළි හිසකෙස් බහා කාසාය වස්ත්‍ර හැඳ පෙරව ලොකයෙහි යම් පුද්ගලයෙක් උත්තම වී නම්

මාගේ පැවිදිවීම ඔහු උදෙසා ය යි බොධිසත්වයන් දිසාවට අභිමුඛ කොට ඇදිලි බැඳ ජසත පිහිටුවා වැඳ පාත්‍ර ය ඵවිකායෙහි ඉහා අංසකූටයෙහි එල්වාගෙණ හිමවතට ප්‍රවිෂ්ට ව මහණදම් කෙළේ ය.

හෙතෙම පරමාභිසම්බොධියට පැමිණි බුදුන් කරා එළඹ නාලක ප්‍රතිපත්ති ඉගෙණ නැවතත් හිමවතට ප්‍රවිෂ්ට ව රහත් ව උත්කෘෂ්ට ප්‍රතිපත්තියට පිළිපන් තැනැත්තෝ සත්මසක් පමණ කල් ජීවත් ව එක් සුවර්ණ පර්වතයක් නිසා වැඩ සිට පිරිණිවි පරිදි නිදන වර්ණනායෙන් හා **සබ්බාරන්නාකර** යෙන් බලා දතයුතු.

බෝධිසත්වයන් උපන් පස්වෙනි දවසෙහි රජගෙය සිවුදා ගඳින් පිරිබඳගෙණ උදපස්මල් ඉස අසම්භින්න ක්ෂීරපායාස ය පිසවා ත්‍රිවේදයෙහි පරතෙර පැමිණි අටොරාසියක් බ්‍රාහ්මණයන් නිමන්ත්‍රණයකොට රජගෙයි පණවනලද අසුන්වල හිඳුවා මනා බොජුන් අනුභව කරවා මහත් සත්කාරකොට බ්‍රාහ්මණයෙනි! මේ කුමාරයන්ගේ ලක්ෂණ බලා තතු ලෙස කියව යි කියා විචාළ කල්හි ඔවුන් අතුරෙහි:

> ''රාමෝ ධජෝ ලක්ඛණෝ චා'පි මන්තී
> කොණ්ඩඤ්ඤෝ ච හොජෝ සුයාමෝ සුදත්තෝ,
> එතෙ තදා අට්ඨ අහෙසුං බ්‍රාහ්මණා
> ජළඞ්ගවා මන්තං ව්‍යාකරිංසු''යි.

දක්වන ලද මේ බ්‍රාහ්මණයෝ අටදෙන ලක්ෂණ ප්‍රතිග්‍රාහකයෝ නම් වෙති. ඒ අටදෙනා අතුරෙහි සත්දෙනෙක් ඇඟිලි දෙකක් ඔසවා මේ බඳු ලක්ෂණයෙන් සමන්විත වූයේ ගිහිගෙයි විසුවහොත් දෙදහසක් කොදෙවු පිරිවරකොට ඇති සතරමහත් දිවයිනට එකච්ඡත්‍ර නංවා චක්‍රවර්ති රජසිරි විඳිනි. පැවිදි වුව හොත් බුබත්වයට පැමිණෙනි යි කීවාහු ය.

ඔවුන් හැමදෙනහට වයසින් බාල ගොත්‍රයෙන් **කොණ්ඩඤ්ඤ** නම් වූ මාණවකයෝ බෝධිසත්වයන්ගේ ලක්ෂණ වර නිස්පත්ති ය බලා මේ පුරුෂයානන්ගේ ගිහිගෙයි විසීමෙක් නම් නැත. මේ කාරණයෙන් මේ පුරුෂයාහට ගිහිගෙයි විසීමට කාරණා නැත්තේ ය යි එකාන්තයෙන් ම මේ පුරුෂතෙම විවත්තචක්ඛුව බුදුවන්නේ ම ය යි නියතකොට එක ම ඇඟිල්ලක් ඔසවා එකක් ම කීයේ ය. ඒ එසේ ම ය.

මේ කොණ්ඩඤ්ඤ බ්‍රාහ්මණතෙම කප්ලක්ෂයක් මුළුල්ලෙහි කෘතාධිකාර ඇත්තා වූ එ ම ජත්මයෙහි රහත්වන පශ්චිම භවික සත්‍වයෙක. එ යෙසින් ඉතිරි සත්දෙනා පැරදවීමෙන් අති භවනයකොට මේ බදු ලක්ෂණයෙන් සමන්විතවූවහුගේ ගිහිගෙයි විසීමට කාරණා නැත. සැක නැති ව ම බුදුවන්හෝ ය යි කියා එක ම ගතියක් දුටුයේ ය. ඒ කාරණයෙන් එකහිල්ලක් ඔහුවා මේසේ කියේ ය.

එසින් කිහ:

අයං හි කතාධිකාරෝ පච්ඡිම භවිකසත්තෝ පඤ්ඤය ඉතරෙ සත්තාජනෙ අභිභවිත්වා ඉමෙහි ලකඛණෙහි සමන්නා ගතස්ස අගාරමජ්ඣෙ ඨානං නාම නත්ථි. අසංසයං බුඩො භවිස්ස ති'නි-එකමේ 'ව ගනිං අදඤ්ඤ. තස්මා එකඞ්ගුලිං උක්ඛිපිත්වා එවං ව්‍යාකාසි--යි.

මෙසේ ඒ බ්‍රාහ්මණයෝ බෝධිසත්වයන්ගේ කවර නම් ලක්ෂණයක් දැක සක්විතිරජ වෙති සි කියා නෝ බුදු වෙති සි කියා නෝ රජහට කෙසේ කිවු ද යත් ?

අත්තමනෝ දෙව නොහි. මඤ්ඤකඛා දෙව! පුත්තෙනා උප්පන්නා. ලාභා තෙ මහාරාජ සුලඛත්තෙ මහාරාජ-යස්ස තෙ කුලෙ එවරූපෝ පුත්තෙනා උපපන්නෙනා-අයං හි දෙව කුමාරෝ ඉතිනිංස මහාපුරිස ලකඛණෙහි සමන්නාගතෙනා යෙහි සමන්නා ගතස්ස මහා පුරිසස්ස ද්වේ'ව ගතියෙනා භවන්ති අනඤ්ඤ. සචෙ අගාරං අජ්ඣා වසති රාජා හොති චක්කවත්ති ධම්මිකෙනා ධම්ම රාජා චාතුරන්තෙනා විජිතාවි ජනපදත්ථාවරියප්පත්තෙනා සත්ත රතන සමන්නාගතෙනා-තස්සිමානි සත්තරතනානි භවන්ති.

සෙය්‍යථිදං ? චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණි රතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිනායක රතනමේ'ව සත්ත මං. පරොසහස්සං ඛො පනස්ස පුත්තා භවන්ති සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සො ඉමං පඨවිං සාගර පරියන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසති. සචෙ ඛො පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හොති සම්මා සම්බුඩො ලොකෙ විවත්තච්ඡදො--සි.

දීක්ඝභිය **මහා ප්‍රධානසූත්‍රයෙහි** ආ ක්‍රමයෙන් ම ද්වාත්‍රිංශත්වර මහා පුරුෂලක්ෂණ ය බලා **ප්‍රකාශ කළෝ.**

මෙසේ ද්වාත්‍රිංශත්වර මහාපුරුෂ ලක්ෂණ ය බලා ප්‍රකාශ කරන්නට ශාස්ත්‍ර දන්නා බාහිර සෘෂිහු ත් සමර්ථ වෙති. මේ කුශලකර්ම ය කළ ගෙයින් මේ පුරුෂ ලක්ෂණ ය ප්‍රතිලාභ වී ය සි කියා ප්‍රකාශකරන්නට නො ම දනිත්.

එසින් වදළහ.

බාහිරකා'පි ඉසයෝ ධාරෙන්ති නො ව බො තෙ ජානන්ති ඉමස්ස කම්මස්ස කත්තතා ඉදං ලක්ඛණං පටිලභන්ති-සි.

එසේ කල දන්නාහු කවුරුද යත්? ලක්ෂණ සූත්‍රයෙහි ඒ ඒ පුරුෂ ලක්ෂණ ය බලන්නට කළ කුසල් හා එහි අනුසස් දක්වා වදළ පරිදි **දීඝනිකාය - පාථිකවග්ගයෙහි** ඇත. එ හෙයින් එම පුරුෂ ලක්ෂණයෙන් සමන්විත වූ බුදුහු ම සම්පජ්ජේසේනි.

මෙසේ බෝධිසත්වයන්ගේ ලක්ෂණ වර්ණනාකොට ඉක්බිති ව තම් තමන්ගේ ගෙට ගොස් තමතමන්ගේ පුත්‍රයන්ට ආමන්ත්‍රණය කොට දරුවෙනි! අපි මහළුවූම් හ. සුදවුන් මහරජානන් ගේ පුත්‍රයා සම්බුදුකම්ලබා ධර්මචක්‍රය පවත්වන්නට ලැබෙම් දෝ නො ලැබෙම් දෝ සි නොදනුම් හ. තොපි ඒ කුමාරයන් බුදුවූකල්හි ඔවුන්ගේ ශාසනයෙහි පැවිදිවව් ය සි කියා ඒ බ්‍රාහ්මණයෝ සත්දෙන ම ආයු වූ පරිද්දෙන් සිට කම් වූ පරිද්දෙන් පරලොකප්‍රාප්ත වූ හ. කොණ්ඩඤ්ඤ නම් මාණවක යෝ ම නිරොගි වූහ.

ඒ කොණ්ඩඤ්ඤ නම් මාණවකයෝ බොධිසත්වයන් වැනි විය පැමිණ අභිනිෂ්ක්‍රමණයකොට ක්‍රමයෙන් උරුවෙල් ගොස් මේ භූමිප්‍රදෙශ ය සිත්කළ ය සි එහි මහාවීර්‍ය ය කෙරෙමින් වසන සමයෙහි මහාපුරුෂයානෝ පැවිදිවූහ සි අසා යටකී බ්‍රාහ්මණ යන් සත්දෙනාගේ පුත්‍රයන් කරා එළඹ සිද්ධාර්ථ කුමාරයෝ පැවිද්දාහ. නෙතෙම් ඒකාන්තයෙන් ම සැක නැති ව බුදුවන්නේ ය ඉදින් තොපගේ පිතා වූ බ්‍රාහ්මණයෝ නිරෝගි වූහු නම් අද නික්ම පැවිදි වෙති. ඉදින් තොපි ත් කැමැත්තාහු නම් එව මම ඒ මහා පුරුෂයන්ටඅනුව පැවිදි වෙම් කිවාහු ය.

ඒ ඇසූ බ්‍රාහ්මණයෝ හැමදෙන ම එකසිත්වන්ට අසම්පජ්ජී වූ හ. එ හෙයින් තුන්දෙනෙක් පැවිදි නොවූහ. කොණ්ඩඤ්ඤ නම් බ්‍රාහ්මණයන් ජ්‍යෙෂ්ඨකොට අනික් බ්‍රාහ්මණයෝ සතර දෙන පැවිදි වූහ. ඒ පස්දෙන **පඤ්චවග්ගියස්ථවිරයහු** නම් වෙත්.

ඔහු **ඉසිපතනාරාමයෙහි** දී අග්‍ර දහම් පිළිගත් පරිදි මතු පහළ වෙයි. එ සමයෙහි වනාහි **සුඩොදන** මහරජානෝ මාගේ පුත නුවෝ කුමක් දැක පැවිදිවෙද්දැ යි විචාළෝ ය.

එ කල සතර පූර්‍වනිමිත්ත දැක පැවිදි වෙති යි කීහ. සතර පූර්‍වනිමිත්ත නම් කවරෙක්දැ යි විචාරා **ජරා ජීර්‍ණ ව්‍යාධි මෘත ප්‍රව්‍රජිත රූප** ය යි අසා එසේ වුවහොත් මෙ තැන් පටන් මෙ බඳු වූවන් ම පුතනුවන්ට දක්නට නොදෙව. ම පුතනුවන්ට බුදුවීමෙන් කම් නැත. මම ම පුතනුවන් දෙදහසක් කොදෙවු පිරිවරකොට ඇති සතරමහා දිවිපයට අධිපති ව අගරජ කෙරෙ මින් සතිස් යොදනෙක පැනිර යිවිනා පිරිවරින් පිරිවරණ ලදුව අහස්තෙලෙහි ඇවිදින්නාහු දක්නා කැමැත්තම්හ යි කියා **ජරා ජීර්‍ණ ව්‍යාධි මෘත ප්‍රව්‍රජිත** යන මොවුන්ගේ රූම වළකනු පිණිස සිවුදිගින් ගවුවෙන් ගවුවට ආරක්ෂා කරවූ ය. එ දවස් වනාහි මහුල් පිණිස එ තැන්හි රැස්වූ අසූදහසක් ඤාතී වූ රජදරුවෝ අප හැමගෙන් එක එක කුමරුවා බැගින් දෙම් හ. මේ තෙමේ බුදු වුවහොත් ක්ෂත්‍රිය මහණුන් පිරිවරා ඇවිද්ද මැනව. රජ වුව හොත් රජකුමරුවන් ම පිරිවරා ඇවිද්ද මැනවැ යි කියා හැම රජදරුවන්ගෙන් ම එක එක කුමරුවා බැගින් අසූදහසක් කුමරුවන් දුන් හ.

සුඩොදන මහරජානෝ බෝධිසත්ත්වයන්ට උතුම් වූ රූප සම්පත් ඇති විගත දෙස වූ කිරි මවුන් සැලැස්වූහ. බොධිසත්ත්වයෝ මහත් වූ යසපිරිවරින් මහත් වූ ශ්‍රී සෞභාග්‍යයෙන් වැඩෙන්ට වන් සේක. එක් දවසක් වප් මඟුලෙහි දී කළ ප්‍රාතිහාර්‍ය්‍ය ය දැක සුදවුන් මහරජානෝ දෙවෙනි වැඳුමෙන් වැන්දහ. තුන් වෙනි වැඳුමෙන් වැඳි පරිදි මතු පහළ වෙ යි. ඉක්බිත්තෙන් අනුක්‍රමයෙන් බෝධිසත්ත්වයන් වහන්සේ සොළොස් හැවිරිදි වයසට පැමිණි කල්හි සුදවුන් මහරජානෝ බෝධිසත්ත්වයන්ට තුන් සාතුවට සුදුසු තුන් පහයක් කළෝ ය. එකක් නවතුමක ය. එකක් සප්තභූමක ය. එකක් පඤ්චභූමක ය. ප්‍රාසාද මතු නොවෙයි. සතළිස් දහසක් පමණ නාටක ස්ත්‍රීන් ද එළවූහ.

ත්‍රිභුවන තිලක වූ අපමඟ බෝසතාණෝ දහසක් රුවන් දොරටුවෙන් හා සප්තරත්න ප්‍රාකාරවලයෙන් හා පිරිකෙවු **ලත් කණක** රජතාදී විමාන මාලායෙන් සමලඞ්කෘත වූ රුවන් මෙර මුදුනෙහි පිහිටි ත්‍රයස්ත්‍රිංශත් දෙවුනුවර අඩුතුන්කෙළක් දෙවහනන්

විසින් පිරිවරණ ලදුව රජ පැමිණී සක්දෙව් රජහු සෙසින් සතළිස් දහසක් පමණ දෙවඟනන් වැනි වරඟනන් විසින් පිරිවරණ ලදුව ඒ ඒ සෘතුවට සැප සැප වූ පරිද්දෙන් තුන්පායෙහි රාහුල මාතාවන් අග්‍රමහෙසිකාකොට වසන සේක. මෙසේ මහ සම්පත් අනුභව කරන්නා වූ බොධිසත්වයන්ට ඤාති සමූහයා මධ්‍යයෙහි මේ බඳු කථාවක් පහළ විය. කෙසේ ද යත්? සිබාළිකුමාරයෝ ක්‍රීඩාපසුත ව හැඳිනේ ය. කිසි ශිල්පයක නොහික්මෙන්නේ ය. සංග්‍රාමයක් සමුප්‍රාප්ත වූ කල්හි කුමක් කරන්නේ දැ යි යන මේ වචන ය ප්‍රාදුර්භූත විය.

සුදුවුන් මහරජානෙනි එපවත් අසා බොධිසත්වයන්ට ආමන්ත්‍රණ ය කොට පුත! නොපැමේ නුයෝ සිබාළි කුමාරයෝ කිසි ශිල්පයක් නොහික්ම ක්‍රීඩා පසුත ව හැඳිනි සි කියන්නාහු ය. මේ බඳු ක්‍රියාවක් සමුප්‍රාප්ත වූ කල්හි කුමක් සිතවුදැ සි විචාළාහු ය එපවත් ඇසූ තුන්ලෝ සිරුරු මුදුන්මල්කඩක් වැනි වූ සිබාළි කුමාර වූ අපමහ බෝසතානෝ දේවයන් වහන්ස! වමෙපයය සුමන මකුරී කෙතකාදී සුගන්ධ පුෂ්පයෝ අන්කියි සුගන්ධ පුෂ්පයන් කරා ගොස් තමන්ට සුවඳ පිණිස අභ්‍යාසයෙක් නැද්ද, එ පරිද්දෙන් ම මේ අත්බැවිහි මාගේ ශිල්ප අභ්‍යාසයක් පිණිස අන් කිසිවක්හු කරා යාමෙක් නැත.

යම් සේ වඳන ගඤ්ඤෝ ගඤ්ඤාභ්‍යාස ය පිණිස අන්කිසි ගඤ්ඤයක් කරා නොයෙදී ද, එ පරිද්දෙන් ම මේ අත්බැවිහි අන් කිසිවක්හු කරා ගොස් අභ්‍යාස කරණ ශිල්පයෙක් නැත. මෑගේ ශිල්ප දක්නා පිණිස නුවරෙහි බෙර හසුරුවා වදුළ මැනව. මෙයින් සත්වෙනි දිනයෙහි නැයන්ට ශිල්ප දක්වමි සි කීසේක. සුදුවුන් මහරජානෙනි ද එ පරිද්දෙන් ම කළුන බොධිසත්වයෝ අෂ්ඨාණවෙධි වාලවෙධි ධනුර්ග්‍රහයන් රැස් කරවා මහජනයා මධ්‍යයෙහි සමස්ත ලොකයෙහි ඇතිනාක් ධනුර්ග්‍රහයන් හා අසාධාරණ වූ ද්වාදශ ශිල්පයෙක් ඤාතීන්ට දක්වූ සේක. ඒ ශිල්ප දැක්වූ පරිදි **සරභඞ්ග ජාතකයෙහි** ආ ක්‍රමයෙන් දතයුතු සි ඒ ආඛ්‍යාන ය දුටු ඤාතිහු බොධිසත්වයන් කෙරෙහි සෑක දුරු කළහ.

කියේ මෑ නෝ.

අථ අනුක්‍රමෙන බොධිසත්තෝ සොළස වස්ස පදෙසිකෝ ජාතෝ රාජා බොධිසත්තස්ස නිණ්ණං උත්තනං අනුවිජ්ජිවිකෙ තයෝ පාසාදෙ කාරෙසි. එකං නවභූමිකං, එකං සත්තභූමිකං,

එකං පඤ්චභූමිකං, චත්තාලීස සහස්සා ච නාටකිත්ථියෝ උපට්ඨාපෙයි බොධිසත්තෝ දෙවෝ විය අච්ඡරාසංඝ පරිවුතෝ අලඞ්කත නාටකපරිවුතෝ නිපපුරිසෙහි තූරියෙහි පරිවාරියමානෝ මහාසම්පත්තිං අනුභවන්නෝ උතුවාරෙන උතුවාරෙන තෙසු තෙසු පාසාදෙසු විහරති. රාහුලමාතා පනස්ස දෙවී අග්ගමහෙසි අහොසි. තස්ස එවං මහා සම්පත්තිං අනුභවනතස්ස එකදිවසං ඤාතිසඞ්ඝස්ස අබ්භන්තරෙ අයං කථා උදපාදි-සිද්ධත්ථෝ කිළාපසු තොව විවරති. න කිඤ්චි සිපපං සික්ඛති. සංගාමෙ පච්චුපට්ඨිතෙ කිං කරිස්සති'ති.

රාජා බොධිසත්තං පක්කොසාපෙත්වා තාත! තව ඤාතකා "සිද්ධත්ථෝ කිඤ්චි සිපපං අසික්ඛිත්වා කිළාපසුතෝ'ව විවරති'ති" වදන්ති. එත්ථ කිං පත්තකාලෙ මඤ්ඤසී'ති. දෙව! මම සිපපං සික්ඛන කිච්චං නත්ථි නගරෙ මම සිපපං දස්සනත්ථං හෙරිං චරාපෙථ. ඉතෝ සත්තමෙ දිවසෙ ඤාතකානං සිපපං දස්සෙස්සා මී'ති. රාජා තථා අකාසි. බොධිසත්තෝ අක්ඛණවෙධි වාලවෙධි ධනුග්ගහෙ සන්නිපාතාපෙත්වා මහාජනස්ස මජ්ඣෙ අඤ්ඤෙහි ච ධනුග්ගහෙහි අසාධාරණං-ඤාතකානං මාදිසවිධං සිපපං දස්සෙසි. තං සරභඞ්ගජාතකෙ ආගත නයෙ'නෙව වෙදිතබ්බං. තදා'ස්ස ඤාතිසඞ්ඝා නික්කඞ්ඛා අහොසි-සි.

ඉක්බිත්තෙන් එක්දවසක් උයන්කෙළියට යනු කැමැත්තා වූ මහ බෝසතානෝ රථාචාරීන්ට ආඥාපන්නය කොට රථ ස යොදවා සි කියා ඔහු විසින් මැනවැ සි පිළිගෙණ මහාඝී වූ උතුම් රථයක් සර්වාලඞ්කාරයෙන් අලඞ්කාරකොට කුමුදුපත්‍ර වර්ණ වූ මහුළුස්සන් සතරදෙනෙකු යොදා බොධිසත්වයන්ට දැන් වූ නෙසින් දෙවුවිමනක් වැනි වූ ඒ රථයට බොධිසත්වයෝ ආරූඪ ව උයනට අභිමුඛ ව නික්මුණුකල්හි දෙවියෝ සිඛාවී කුමාරයන් බුදුවන්නට කල් ආසන්න වි ය. පූජිනීමිනි දක්වමිහ සි එක් දිව්‍යපුත්‍රයෙකු ජරා ජජ්ජරාදී වෙස් ගන්වා දැක්වූ හ.

ඒ රූප ය බෝධිසත්වයන් හා රථාචාරීහු දුටුකල්හි "කිමෙක්ද? යහළු රථාචාරිනි! මේ පුරුෂතෙම අන්‍ය සත්ව යන්ගේ කේසයන් පරිදේදෙන් හිසකෙස් ඇන්තේ ත් නොවෙ සි" යනාදීන් **දික්ඝනිය මහාප්‍රදාන සූත්‍රයෙහි මහාවිදර්ශී** කුමාරයන් සිවාළ ක්‍රමයෙන් විචාරා "ධිරත්ථු වත හො ජාතියා, යත්‍ර හි නාම ජාතස්ස ජරා පඤ්ඤායිස්සති"සි—ජාති ය ඇත්තහුට ජරාව

ද පෙණෙන්නේ ය සි යනාදී මඛාදෙව කාලයෙ හි හිස නර කෙසක් දැක කලකිරි මහාජනක ජාතකයෙහි දු උයන් දොර තුබූ අඹගසට කළ විනාස ය දැක කලකිරි මහනීක්මන් කොට පුරුදු ඇති හෙයිනු ත්--

යෞවන මද ය හැර කලකිරුනා වූ සිත් ඇති බෝධි සත්වයෝ උයන් කෙළියට නො ගොස් එතන සිට පෙරලා නුවරට අවුත් නැවතත් එක් දවසක් උයන් කෙළියට යන්නාහු පඤ්ච කාමරති ය නැසීමට කාරණ වූ ව්‍යාධි රූපයක් දැක ආරොග්‍ය මද ය දුරුකොට උයනට නො ගොස් පෙරලා නුවරට අවුත් නැවත ත් එක් දවසක් උයන් කෙළියට යන්නාහු එසේ ම දෙවියන් විසින් නිර්මිතකොට දක්වන ලද මෘත රූපයක් දැක ජීවිත මද ය හැර විදුරු පළිතයෙක්හි දක්නාලද සිදුරක් මෙන් ද උතුම් වූ අළුත පිපි රත් පියුමෙක්හි දක්නා ලද නිශ්‍රීකයක් මෙන් ද හිරු විමනෙක්හි දක්නාලද අඬකාරයක් මෙන් ද ශරත් කාල යෙහි සම්පුණ්ණ වූ චන්ද්‍රමණ්ඩලයෙහි දක්නාලද අසෞම්‍ය බවක් මෙන් ද දිව්‍ය බ්‍රහ්ම විමානයෙක්හි දක්නා ලද මල මූත්‍රයක් මෙන් ද තමන්ගේ ශ්‍රී සමෘඩියෙහි දක්නාලද විපිළිසර ඇන්තාහු නන්දන වනයෙහි උකටලී වූ දිව්‍යපුත්‍රයන්හු මෙන් වස්තු කාම කෙලෙශ කාම යෙහි ආදීනව දැන්මෙන් තමන් ශ්‍රී සමෘඩියෙහි කලකිරී—

නැවත එක් දවසක් උයන් කෙළියට යන්නාහු දෙවියන් විසින් දක්වන ලද ප්‍රව්‍රජ්‍යා සැපයෙන් සුඛිත වූ ශ්‍රමණ රූපය දැක හත්‍ථිපාල කාලයෙහි සෘෂි වෙස් ගෙණ අවුත් තමන් විමසූ පිය බමුණන් හා රජ්ජුරුවන් දැක මහාභිනීක්මන් කොට කරණ ලද අභ්‍යාස ඇති හෙයිනුත් ඊට අභිනන්දනයකොට. පැවිදි වීමෙහි අභිප්‍රාව උපදවා උයන්කෙළි කෙළනා පිණිස උයනට ගොස් එහි දහවල් උයන්කෙළි කෙළිමින් දිවසභාග ය අතික්‍රා නතකොට මහුල් පොකුණෙන් ජලස්නාන ය කොට සුඛීයා අත්‍ත ඔහත වූ කල්හි මහුල් ශෛලය පිට හුන් සේක් තමන් වහන්සේ සර්‍වාලඞ්කාරයෙන් සැරහෙනු කැමති වූ සේක. ඉක්බිත්තෙන් පරිවාර ජනයෝ අනෙක වර්ණ වූ නානාප්‍රකාර පිළි හා නානා ප්‍රකාර ආභරණ විකෘතීන් ද මල් ගඳ විලවුන් ද ගෙණ හාත් පයින් පිරිවරා සිටියාහු ය.

කියේ මැ නෝ.

"තත්‍ථ දිවසභාගං කීළිත්වා මඞ්ගලපොක්ඛරණියං තහා සිත්වා අත්‍තංගතෙ සුරියෙ මඞ්ගලසිලාපට්ටෙ නිසීදි අත්‍තානං

අලඞ්කාරාපෙතුකාමෝ. අථ'ස්ස පරිචාරිකා පුරිසා නානාවණ්ණානි දුස්සානි නානාපකාරා ආභරණවිකතියෝ මාලාගන්ධවිලෙපනානි ච ආදාය සමන්තා පරිවාරෙසුං අට්ඨංසු"-සි.

එකෙණෙහි සක්දෙව් රජහුගේ හුන් අස්න හුන්නු වී ය. ඒ දැන සක්දෙව් රජතෙමේ මා මෙතනින් කවරෙක් චුත කරන්නට කැමැත්තේ දැ සි උපධාරණය කරන්නේ. බොධිසත්වයන්ගේ අලංකාර කරණයට කල් දැක විශ්වකර්මයාට ආමන්ත්‍රණය කොට "එම්බා විශ්වකර්මය! සිඛාවී කුමාරතෙම අද මධ්‍යම රාත්‍රියෙහි මහාභිනිෂ්ක්‍රමණ නික්මෙන්නේ ය. මේ ඔහුගේ පශ්චිමාලංකාර ය වන්නේ ය තෝ උයනට ගොස් මහා පුරුෂයා දිව්‍යාලඞ්කාර යෙන් සරසව"සි කිහ. ඒ අසා විස්කම් දෙවිපුත් මැනවැසි පිළිගෙණ එ කෙණෙහි ම දිව්‍යානුභාවයෙන් එළඹ බෝධිසත්වයන් සරහන්ට සිටි මහල් කපුවෙස් ගෙණ ඔහු අත හුබු සළු ගෙණ දසදහසක් දිවසළුවෙන් හිස වෙළා මිණි ඔටුනු පළඳවා සක්දෙව් රජහු පරිද්දෙන් සරහා පිළියෙළ කෙළේ ය

කියේ මැනෝ.

තස්මිං ඛණෙ සක්කස්ස නිසින්නාසනං උණ්හං අහොසි. සෝ කොනු ඛෝ මං ඉමම්හා ඨානා වාවෙතුකාමෝ'ති උපධාරෙන්තෝ බොධිසත්තස්ස අලඞ්කරණකාලං දිස්වා විස්සකම්මං ආමන්තෙසි. සම්ම විස්සකම්ම! සිඛණ්ඩිකුමාරෝ අජ්ජ අඩ්ඪරත්තසමයෙ මහාභිනික්ඛමණං නික්ඛමිස්සති. අය'මස්ස පච්ඡිමෝ අලඞ්කාරෝ, උය්‍යානං ගන්ත්වා මහාපුරිසං දිබ්බාලඞ්කාරෙහි අලඞ්කාරෙහි"නි. සෝ සාධු'නි, පටිස්සුණිත්වා දෙවතානුභාවෙන තං ඛණං යෙව උපසඞ්කමිත්වා තස්සෙව කපපක සදිස්සෙ හුත්වා කපපකස්ස හත්ථතෝ චෙතනදුස්සං ගහෙත්වා බොධිසත්තස්ස සීසං වෙයෙසි-"සි.

බොධිසත්වයෝ විශ්වකර්මයාගේ හස්ත ස්පර්ශයෙන් ම මේ මනුෂ්‍යයෙක් නොවේ සි මොහු එක් දිව්‍යපුත්‍රයෙකැ සි දන් සේක.

එම දක්වන්නට කිහ.

"බොධිසත්තෝ හත්ථ සම්ඵස්සෙනෙ'ව නා'යං මනුස්සෝ දෙවපුත්තෝ එකෝ'ති අඤ්ඤාසි"—සි.

මෙසේ විශ්වකර්ම දිව්‍යපුත්‍රයා විසින් සරහන ලද්ද ගරුබෝධිසත්වයන්ගේ ජවබල බදු ගමන් ඇති ධවල වූ සෛන්ධවයන් සතර

දෙතෙකු යොදවන ලද උතුම් වූ රන් රිදී මිණිරුවන් සැදුම් ලද්දා වූ එල්වන ලද නොයෙක් මල්දම් ඇති රථයකට පැන නැගී රාජ්‍යශ්‍රියගේ වාසයට ශ්වෙතපද්මයක් බඳු වූ ක්ෂීරසාගරයෙහි පෙණපිඬු සේ ධවල වූ සප්ත්‍ර වූ මුක්තාකලාපයෙන් හා මුක්තා ජාලයෙන් සමාවෘත ධවලාතපත්‍රයෙන් වළකනලද සූර්‍යරශ්මීන් ඇත්තේ උද්ධූයමාන වූ සෙමෙරවල් කලප්හි පවනින් ආහර්නිත කර්ණපල්ලවයන් ඇත්තේ—

ලඳුරියන්ගේ ගමන් වශයෙක් හඬවනලද මාණික්‍යමය වූ නූපුරවලායෙහි ද මැණික්ම ය වලල්ලෙහි මෙවුල්දමිහි හඬින් මුඛරිත වූ මධුර ධවනියෙන් නාද කරණලද විණා ධවනියෙන් කොලාහල කරණලද මහුල් ගීතිකාවෙන් ගායනාකරණලද යසස් ප්‍රබන්ධ ඇත්තේ මදජලයෙන් මලින කපෝලයෙහි එල්බ ඇවිදිනා වූ මධුකරයන් ඇති හස්තිසමූහයෙන් මෙඝ දිනයක් බඳු වූ හඬන ලද මිහිරි වූ සුවර්ණ ඝණ්ටිකා හඬින් ගුගුරනු වූ කඳට ඇති මදට සේ රන් වූ පිටිකර කෙසුරු වූ සලා හා වාලධි පල්ලවයන් ඇති වැන්න.

හස්තීන්ගේ රුධිර සෙසින් රන් වූ කෙසරුසළා ඇති කෙශර සිංහයන් බඳු වූ අශ්වයන් විසින් බබලන්නා වූ පැළඳ ගත්තා වූ ශරීරාභරණයෙහි සොභාවෙන් දිලියෙන්නා වූ මනොඥ වූ සුවඳ මලින් හා වස්ත්‍රාභරණයෙන් විභූෂිත වූ ප්‍රවාළසාගරයෙහි තරඟ සමූහයක් බඳු වූ කලකල ධවනියෙන් සනීභූත වූ නොයෙක් ලක්ෂගණන් පදාති සෙනායෙන් සොභමාන වූ සිවුරඟ සෙනග විසින් පිරිවරණ ලදු සේ එ දවස් සියලු පෘථිවි තල ය අශ්වයන්ගෙන් ගැවසී සිටියාක් මෙන් ද දික්වලල්ල හස්තීන්ගෙන් ගැවසී සිටියාක් මෙන් ද සියලු අහස් තලය ශ්වෙතඡත්‍රයෙන් ගැවසී සිටියාක් මෙන් ද සියලු ගගනතලය ධජමාලාවෙන් ගැවසී සිටියාක් මෙන් ද—

සියලු මාරුතය ඇතුන්ගේ මදජල ගන්ධයෙන් ගැවසි ගත්තාක් මෙන් ද සියලු ජන සමූහයා සර්‍වාභරණයෙන් සැරහුනු රජදරුවන් මෙන් ද ආකාශය ආභරණ රශ්මීන් ගැවසි ගත්තාක් මෙන් ද සූර්‍යරශ්මීන් ඔටුනු ආලෝකයෙන් ගැවසි ගත්තාක් මෙන් ද දිනය චාමරයෙන් ගැවසි ගත්තාක් මෙන් ද භුවනත්‍රය ජල ශොෂාවෙන් පතළාක් මෙන් ද කරන්නේ කොයෙක් රශ්මි සමූහයෙන් දිලියෙන්නා වූ රූපයෙන් ද සත්ත්වයන්ගේ නෙත් සිත් තමා කරා අදනේ කුසලානුභාව ය ප්‍රකාශකරණ කලක් මෙන් ද

ඉතා සින්කළු වූ ශ්‍රී සෞන්දර්‍යයෙන් ද සවස් වේලෙහි තරුණ ස්ත්‍රීන්ගේ රන්රුවන්මය වූ කවුළු දෙරින් නික්මෙන ලද ආභරණ රශ්මි සහස්‍රයෙන් ගැවසී ගත්තා වූ කිඹුල්වත් පුරයට වන් සේක.

එසින් නිහ—මහාබෝධිවංශයෙහි.

"එතුහි ගරුළ ජවවෙග මඞ්ගල සිත සින්ධවෙහි යුත්තං වර කණක රජතමණී රතන විරචිතං සමොසරිත විවිධ සුරභි කුසුමදාමං රථං අභිරුයහ රාජසිරිනිවාස ප්‍රණ්ඩරීකෙන ඛීර සාගර ඵෙණ ධවලෙන ථූල මුත්තාකලාප ජාලකාවුතෙන ඝිතාත පත්තෙන නිවාරිතාතපෝ උද්ධූයමාන වාරු වාමර කලාප පවනා නතතිත කණණපල්ලවෝ—

යුවති ගතිවසා රණිත නූපුර පාරිහාරිය රසනාරව මූඛ රෙන මධුරසාරණාරණිත විණාරව කොලාහලෙන මඞ්ගල ගීතෙ න ගීයමාන යසසන්තානෝ මදජල මලින කපොල දෙලායමාන මධුකර කුලානි කුඤ්ජරඝටාහි ජලධර විවසායමානාය රණිත මධුර කණක ඝණ්ටිකාරව මුඛරකණෙඨහි මඤ්ඡට්ඨ ලොහිත ඛඞ්ග කෙසරඝටා වාලපල්ලෙදෙහි—

වනගජ රුධිරජාටල කෙසරඝටානි කෙසරීහි විය තුරඞ්ග මෙහි නූසුරාය අලඞ්කාර කායාභරණ ජුතියා සමුජ්ජොතෙන සුරභි කුසුම වසනාභරණ භූසිතෙන පලය ජල නිධිජල කල්ලොල සංඝාතෙන විය කලකල බහලෙන අනෙක සතසහස්‍ර පත්තිකාජනෙන සොභිතාය චතුරඞ්ගිනියා සෙනාය පරිවුතෝ තුරඞ්ගමය'මිව, මහිතලං කුඤ්ජරමය'මිව දිසාවලයං ආතපත්ත මණ්ඩලමය'මිව අනන්තලිඛඛං ධජමය'මිව—

අම්බරතලං ගජමදගන්ධමය'මිව සමීරණා භූපාලමය'මිව පජාරාසිං ආභරණ රංසිමය'මිව ගගනං කිරීටමය'මිව ආතපං චාමරමය'මිව දිවසං ජයසද්දමය'මිව නිනුවනං කරොන්තෝ නානා ජුති විසර සමුජ්ජලෙන වණ්ණන ජන නයනානි ආකඞ්ඛන්තෝ ප්‍රඤ්ඤානුභාවං සමුග්ගොසෙන්තෝ විය අතිමනොහරෙන සිරිසොභගෙන සායණහසමයෙ අනෙකවාතපාන විවරණිගගත යුවති භූසන කිරණ සහස්ස සංකලං කපිල පුරං පාවිසි"—යි.

මෙසේ නුවරට වඩනා වූ තුන් ලෝ වාසීන් විසින් ප්‍රාර්ථනා කටයුතු වූ බොධිසත්ත්වයෝ—

නිබ්බුතා නූන සා මාතා නිබ්බුතා නූන සෝ පිතා
නිබ්බුතා නූන සා නාරී යස්සා'යං ඊදිසෝ පති"—යි.

කිසාගොතමී නම් බිසවුන් විසින් කියන ලද නිර්වුතපද නිඝෝෂයෙන් විසිතුරු වූ මේ ගාථාව අසා මෝ තොමෝ මට යහපත් අස්නක් අස්ව සි කියා ඉතා මනොඥ වූ ලක්ෂයක් වටනා මුක්තාහාර ය ගලවා කිසාගොතමී නම් බිසවුන්ට යවා කලුවැල් දුම් සමූහයෙන් මෙඝ පටලයක් බඳු වූ යාමාවසථිත වූ ගජඝටාවන්ගේ මදපොදින් හිමබිඳු බානාක් වැනි වූ තමළු ලියෙන් සැරහුනා වූ වීථියෙහි අඛ්කාරයෙන් රාත්‍රිභාගයක් වැනි වූ රාජචාර සමීපයට පැමිණ රත්නාලෝකයෙන් ලහිරු කලඹක් වැනි වූ මුතුලැල් කලඹින් තාරකා සමූහයා විසින් ගැවසි ගත් තාක් මෙන් ධාරාග්‍රහයෙන් වර්ෂා සමූහයක් වැනි වූ—

ගසන ලද මංගල තූර්‍යඝොෂයෙන් සම්පූණී වූ බදුනාවද සුපිෂ්පිත කමල කුසුමඝන් කලබ් ඇති ලීලොපෙත වූ අඬහනා වන්ගේ පත්ලෙහි පැහැයෙන් ගැවසි ගත්තා වූ ඇතුළු රජගෙයි ඇවිදිනා වූ උතුම් පුරාණ සත්‍රීන්ගේ නුරුවලායෙහි ඛ්කාර නාද යෙන් මනොඥ වූ වලිත වූ ආභරණයෙහි මාණීක්‍ය ධවනියෙන් සිත්කළු වූ ප්‍රාසාදයෙහි මතුමහල් තලයට පැන නැහි යහපත්කොට බඳනා ලද සුදු වියන් ඇති එල්වන ලද මුතුලැල් ඇති මාණීක්‍ය ප්‍රදීපයෙන් දුරුකරණ ලද අඳුරු ඇති සඳරැස් කලඹක් සේ අතු රණලද යහපත් දෙපත් වියන් පට ඇති කෙලාශකූට පර්වත මස්තකයක් සේ විශාල වූ ශ්‍රීයහන් මස්තකයෙහි සැතපුනු සේක

මෙම කිස—මහාබොධිවංශයෙහි.

කිසාගොතමියා රාජධිතරාභිනීතං නිබ්බුතපද නිඝ්ඝතනීතං සුත්වා අයං මෙ සුසසවතං සාවෙතී'ති පරම රතිකරං හාරං ඔමුසදිත්වා තසසා පෙසෙත්වා සජල ජලධර'මිව කාලාගරුධූම මණ්ඩලෙහි සනීහාරමිව යාමකුසුඤ්ජර ඝඩ සිකරෙහි සනිසමිව තමං ලවීවිකාඛ්කාරෙහි රාජාචාර සමීප'මුපගනත්වා සබාලාතප'මිව රතනා ලොකෙහි සනාරාගණ'මිව මුත්තාකලාපෙහි සවසස සමය'මිව ධාරාඝරෙහි අබ්භාහත මඬ්ගලතූරිය රවපූජිතං උප රවිත විකව කමල කුසුමපපකාරං ලලිත වනිතා පාදරාගඛ්කිතං අනෙනාපුර වර ජන නූපුරඛ්කාර මනොහරං පවලිත භූසන මණිරව රමණීය පාසාදං අභිරුහිත්වා උපරවිත සිතවිතානෙ ආසතන මුත්තගුණෙ මණිපපදීපපහත තිමිරනිකරෙ ඉන්‍දුසි ධිති ධවල පවඡදපටෙ කෙලාස සිලාතල විසාලෙ සයනතලෙ නිපජ්ජි—සි.

එ කෙණෙහි සුර යුවතීන් බඳු රූප සොභා ඇති වරහනන් විසින් මියුරු වූ හඬ ඇති පසහතුරු ගෙණ ඒ මහාපුරුෂයා පිරිවරා සින් අලවනුවෝ නවනාට්‍ය රසයෙන් යුක්ත වූ දිව්‍ය නෘත්‍ය යන් හා සප්තස්වරයෙන් යුක්ත වූ දිව්‍ය ගීතිකාවන් බඳු ගීති කාවන් හා ආතත විතතාදී වූ දිව්‍යවාද්‍යයන් හා සමාන වූ පඤ්චාඞ්ගික තූර්‍යනාද පවත්වන්ට පටන්ගත්තාහු ය.

හෙ ද කි යේ මෑ නෝ

තාවදෙව තං සුර යුවති සදිස රූපසොභාවර යුවතියෝ මධුරවානි තූරියානි ගහෙත්වා මහාපුරිසං. සමපරිවාරෙත්වා රමය නතියෝ නච්චගීතවාදිතානි පයොජයිංසු—යි.

එ සමයෙහි මකරධවජාඛ්‍යාත අතඞ්ගයාගේ ජයඝොෂා වක් බඳු වූ ආභරනඛනි ය හා සමග පැවැත්තා වූ නෘත්‍ය ය බලන්නා වූ මහාබොධිසත්ව තෙමේ අභිනව මෙඝධවනියක් හා ගැඹුරු වූ වීණා නාදයෙන් හා වස්කුලල් හඬින් සිත්කළු වූ මිහිතු බෙර හඬ අසන්නේ එහි ඇල්ම නැති බැවින් මදක් නිදි පිබිද දල්වන ලද නෙත්‍ර යුනලයෙන් නික්මුණා වූ ප්‍රභාසමූහයෙන් බබුළුවන ලද ප්‍රාසාද කුහරයක් ඇත්තේ ශ්වෙතහංසයෙකු සේ ධවල වූ ශ්‍රී යහන් මසකයෙහි උන් සේක් සුගන්ධතෙල ප්‍රදීපා ලොකයෙන් හා දෙවතානුභාවයෙන් නිද්‍රාවට පැමිණියා වූ නාටක සත්‍රීන්ගේ අනෙකප්‍රකාර වූ විප්‍රකාර දුටු සේක. කෙසේ ද යත්?

ඒ නාටක සත්‍රීහු ගත්ගත් තූර්‍යභාණ්ඩයන් ඒ ඒ තැන දමා නිද්‍රාවට පැමිණියාහු ඇතැම්. කෙණෙක් මුඛයෙන් නික් මෙණ දුගන්ධ සහිත වූ කුණු කෙලින් තෙත් වූ ගාත්‍ර ඇත්තාහු වෙති. ඇතැම්හු සාරාසංඛ්‍ය කප්සුවහසක් මුළුල්ලෙහි බුදුබැව් පතා මහපෙරුම් පුරා අවුත් තව කුමක් පිණිස ගිහිගෙයි වසන්නෙහි දැ සි කියා බෝසතුන් භයගන්වන රාක්ෂසයින් සේ දත් කති. ඇතැම්හු නිවණෙහි මිස කාමයෙහි සැප නම් මේ කුණුකෙල කැමි වැන්න.

එ හෙයින් මහභිනිෂ්ක්‍රමන් නික්ම වැඩිය මැනව සි බෝසතුන්ට භවත්නවුන් සේ තලුපහරමින් හොවිති ඇතැම්හු සාර වූ නිවන් දහම් මිස කාමයෙහි සැප අසාර බැවු මේ දෙඩුම් වැන්න. මේ කරුණු සැලකුව මැනව සි බොධිසත්වයන්ට අභවන්නවුන් සේ නන්දෙඩති. ඇතැම්හු සුගන්ධයෙක් නම් නිවන් සුගන්ධය මිස වෙන නැත. පංචකාම සුගන්ධය දහවල් දවස බුලත් ආදී වූ සුවඳින් වසා තුබූ අපගේ මුඛයෙහි දුගන්ධයෙන් ම දූන වදාළ මැනවැ සි කියා භවත්නවුන් සේ විවෘත වූ මුඛ ඇති ව

හොවිත්. ඇතැම් සත්‍රිහු කාමුක පුරුෂයෝ ඇතුලෙන් අසුවි පුරා පිටින් සිහියම් කළ බදුන් සේ කළු ය. හෙලළු ය, යනාදී ජිවිමාත්‍රයක් නිසා ත් වස්ත්‍රාභරණාදි ය නිසා ත් කාමිතාර්ණා වෙන් අඛ්ධ වූ ඇස් ඇති හෙයිනු ත් අපගේ පමණ නොදුන සාරකොට සිතූ හ. ඔබ වනාහි මුහුකළු තුවණ ඇති සේක.

එ හෙයින් පඤ්චකාමයෙහි ආදීනව දුගඹ සහිත ව අසුචි නික්මෙන අපගේ මේ හිරිකොපිනස්ථානයෙන් ම දන මහබ්තික් මන් නික්ම වදුළ මැනව යි ඉහවන්නවුන් සේ අපගත වස්ත්‍ර යෙන් භයානක සෙය්‍යාවෙන් ප්‍රකට ව නොවිනි. මෙසේ අනෙක ප්‍රකාරයෙන් ඒ සත්‍රින්ගේ විප්‍රකාර ය දැක කාමවිඡන්ද ය ප්‍රහීණ වූ හෙයින් අම්සොහොනක් සේ නිශ්‍රිකකොට සිඟා නැවත ත් අභිශයින් කාමයෙහි කලකිරුණු සේක.

එම දක්වන්නට නිහ.

බොධිසත්තොපි මහත්තන සිරිසොභග්ගෙන අත්තනො පාසාදං අභිරුහිත්වා සිරිසයනෙ නිපජ්ජි. තාවදෙව නං සබ්බා ලඞ්කාර පතිමණ්ඩිතා නච්චගීතාදිසු සුසික්ඛිතා දෙවකඤ්ඤා විය රූපග්ගපප්පත්තා ඉත්ථියො නානාතුරියානි ගහෙත්වා සමපරිවාර සිත්වා අභිරමාපෙතබ්බියො නච්චගීතවාදිතානි පයොජයිංසු. බොධි සත්තො. නිලෙසෙසු විරත්තචිත්තතාය නච්චාදිසු අනභිරතො මුහුත්තං නිද්දං ඔක්කමි.

තාපි ඉත්ථියො යස්සත්ථාය ව මයං නච්චාදීනි පයොජයෙම. සො නිද්දං උපගතො, ඉදානි කිමත්ථං කිලමාමාති ගහිත ගහිතානි තුරියානි අජ්ඣොත්ථරිත්වා නිපජ්ජිංසු. ගන්ධ තෙලපප දීපා ඣායන්ති බොධිසත්තො පබුජ්ඣිත්වා සයනපිට්ඨෙ පල්ල ඞ්කෙන නිසින්නො අද්දස තා ඉත්ථියො තුරියහත්ථාහි අවත්ථරිත්වා නිද්දායන්තියො, එකච්චා පඤ්චඞ්ගිකං බෙලා ළාලා කිලින්න ගත්තා, එකච්චා දන්තෙ ඛාදන්තියො, එකච්චා කාකච්ඡන්ත්‍යො. එකච්චා විපලපන්තියො, එකච්චා විවටමුඛා, එකච්චා අපගත වත්ථා, පාකට බීභච්ඡසම්බාධට්ඨානා. සො තාසං තං විප්පකාරං දිසවා භියොසො මත්තාය කාමෙසු විරත්තො අහොසි—සි.

ඒ එසේ ම ය. අසුභනිමිත්ත වශයෙන් බලත්නහුගේ කාමවිඡන්ද ය ප්‍රහීණ වේ. එසින් වදුළහ. "නාහං භික්ඛවෙ අඤ්ඤං. එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නො වා කාම චිඡන්දො නුප්පජ්ජති, උප්පන්නො වා කාමචිඡන්දො පහියති. යථ ඉදං භික්ඛවෙ අසුභ නිමිත්තං"සි. වදාරණ ලද අසුභනිමිත්ත

වශයෙන් ග්‍රහණයකොට සියලු භුවනත්‍රය කල්පාන්ත වහ්නි යක් සේ සිතා "උපද්දුතං වත භො උපස්සට්ඨං වත භො"යි යනුවෙන් මේ සසර හුන් සත්වයාට ඉතා උපද්‍රවයෙක් වි ය. ඉතා පරිහානියෙක් වි ය යි උදන පවත්වා අනිශයින් මහණ වීමේහි සින් උපදවා **ඡන්න** නම් අමාත්‍යයා ලවා **කන්ථක** නම් අශ්වරාජයා ගෙන්වා ගෙණ ඡන්න නම් අමාත්‍යයා අසු වාළඩි ය ගන්වා අසුපිටට පැන නැඟී දෙවියන් විසින් හළදෙරින් මධ්‍යම රාත්‍රියෙහි මහබිනික්මන් නික්මෙන්ට වන් සේක.

එ කෙණෙහි ම මාරදිව්‍යරාජතෙමේ "බෝධිසත්වයන් යා නොදී නවත්වම්"කියා ආකාශයෙහි සිටියේ යහළු සිබාඡීකුමාර යෙනි! නොනික්මෙව, මෙසින් සත්වෙනි දිනයෙහි තොපට චක්‍ර රත්න ය ප්‍රාදුර්භූත වන්නේ ය. දෙදහසක් කොදෙවු පිරිවර කොට ඇති සතරමහාද්වීපයෙහි රාජ්‍ය ය කරව, මහබිනික්මන් නොනික්මෙව යි කියේ ය. ඒ අසා බොධිසත්වයෝ තෝ කව රෙක්දූ යි විචාළ හ. ඒ අසා මාරයා 'මම වසවත් දෙවුරජ ය'යි කිය. බොධිසත්වයෝ මාර ය! මම් දනිමි සතර මහාද්වීපයෙහි රාජ්‍යයෙන් මට කම් නැත. දසසහස්‍රීලොකධාතුව කම්පාකරවා බුද්ධත්වයට පැමිණෙමි යි වදළ සේක. ඒ අසා මාරයා එසේ වී නම් මෙ තැන් පටන් කාමවිතකී ව්‍යාපාද විතකී විහිංසා විතකී යන් අතුරෙන් යමක් සිතුවිට ඊට කාරණා දනිමි යි කියා ඡායා වක් මෙන් සිදුරු බලා ඇවිද්දේ ය.

මෙ ම කිහ—අවිදූරෙ නිදානයෙහි.

"තසම්ං යෙව ඛණෙ මාරො බොධිසත්තං නිවත්තෙතුකා මී'ති ආගන්ත්වා ආකාසෙ ඨිතො ආහ. "මාරිස මානික්කම! ඉතො තෙ සත්තමෙ දිවසෙ චක්කරතනං පාතුභවිස්සති දවිසස්ස පරිත්තදීප පරිවාරානං වත්තුන්නං මහාදීපානං රජ්ජං කාරෙස්සසි. නිවත්ත මාරිසා'ති ආහ. කොසි ත්වං අහං වසවත්තී'ති "මාර ජානාම'හං මියඤ චක්කරතන පාතුභාවං අනපේක්ඛොහං රජෙජන දසසහසසී ලොකධාතුං උන්නාදෙත්වා බුඩො භවිස්සාමී"ති ආහ. මාරො ඉතො දුනි තෙ පඨාය කාමවිතක්කං වා ව්‍යාපාදවිතක්කං වා විහිංසා විතක්කං වා චින්තිතකාලෙ ජානිස්සාමී'ති ඔතාරාපෙක්ඛො ඡායා විය අනුපප ගච්ඡන්නො අනුබන්ධි—යි.

ඉත්ථිත්තෙන් අනන්‍ය සාධාරණ උත්තම සුරගුණ ගණාභරණ විභූෂිත විසුද්ධ බුද්ධ බුඩාඞ්කුර වූ අපගේ ශ්‍රී මහාබෝධි සත්වයෝ සතියෙන් ලැබෙන සක්විති රජසැපත් අලුයම දැමූ කෙලපිඬක් කොට ත් නොසිතා මහත් වූ සත්කාරයෙන් නුවරින් නික්මුණු සේක.

මෙසේ ඇසළමස මැදිපොහොදා උතුරාසළ නැකතින් මධ්‍යම රාත්‍රියෙහි මහබිනික්මන් නික්මෙණ සේක් නුවර බලනු කැමති වූ හෙයින් එකෙණෙහි පෘථිවි ය කුලාල චක්‍රයක් සේ භ්‍රමණය ව නුවර දක් වූ ඒ ස්ථාන ය **කන්තකනිවර්ථන** චෛත්‍ය යක් මතුවන්නේ ය යි සලකුණු දක්වා සැටදහසක් මිණිදඬුවැට පහන් ගෙණ පෙරටුව නික්මුණ දෙවියන් විසින් ද දකුණු ඇල යෙන් සැටදහසක් මිණිදඬුවැට පහන් ගෙණ නික්මුණු දෙවියන් විසින් ද, වම් ඇලයෙන් සැටදහසක් මිණිදඬුවැට පහන් ගෙණ නික්මුණු දෙවියන් විසින් ද, පිටිපසෙහි සැටදහසක් මිණිදඬුවැට පහන් ගෙණ නික්මුණු දෙවියන් විසින් ද, සක්වළගල දක්වා උරෙන් උර පැහැර මිණිදඬුවැට පහන් ගෙණ සිටි අවශෙෂ දෙවියන් විසින් ද පිරිවරණ ලදු ව අසුර නාගාදීන් විසින් ඉසිනා ලද පරසතු මඳරා කඩුපුල් මාලාදීන් වූ පූජා ලබන ලදු ව දස දහසක් සක්වළ දෙවියන් විසින් පවත්වන ලද දිවපසඟතුරු ආදී වූ අපමණ පූජා ලබමින් තුබූ පසලොස්පෑය ඇතුළත නිස් යොදුන් මාඟී ය ගෙවා අලුයම් වේලෙහි අනොමා නම් ගංතෙරට පැමිණි සේක.

ගංගාවගේ සමීපයට ගොස් මේ කිනම් ගංගාවෙක් දැ යි ඡන්නයා අතින් විමාරා අනොමා නම් ගංගාව ය යි අසා මාගේ පැවිදිවීම ත් අනොම ය, අලාමක ය යි සතුටු ව පෘෂ්ණි යෙන් අසුට සාඳුකොට අටසියයක් රියන් පුළුල ඇති ගඟ එතරට ඡන්නයා හා සමඟ අසු පන්නා අසු පිටින් බැස වැලි තලා මතුයෙහි වැඩසිට ඡන්නයෙනි! මම පැවිදිවෙමි යි කී ය. ඔහු ද මම ත් පැවිදිවෙමි යි කී හෙයින් තොපගේ පැවිදිවීම දැන් ම සුදුසු නොවෙයි. නොපි දැන් පැවදිවුව නොත් මේ ආභරණ හා අසු නස්නේ ය. එ හෙයින් මා පැවිදි වූ බැව් මාගේ පිය වූ සුදවුන් මහරජානන්ට දන්වනු පිණිස මේ ආභරණ හා අසු ගෙණ ගොස් පසු ව මහණවෙව යි කියා ආභරණ හා අශ්වයා ඔහුට පාවා දී මෙසේ සලකනුවෝ මේ මාගේ ඉසකෙස් ශ්‍රමණ සාරූප්‍ය නොවන්නේ යයි සිතූ සේක.

බොධිසත්වයන්ගේ හිස අල්වා ඉසකෙස් බහනට සුදුසු අන්කිසිවෙක් නැත. එ හෙයින් මම ඡේදන ය කෙරෙමි යි සිතා දකුණතින් සුවර්ණ ඛඩ්ගය ගෙණ. වමතින් මුනුළස හා සමඟ කෙසවර්තනිකාව ගෙණ ඡේදන ය කළ සේක. කේස යෝ දැගුල් පමණ ව දක්ෂිණාවෘත්ත ව නැමී සිරස හා සම ව

ඇලී ගියෝ ය. ඒ කේසයෝ යාවජීවයෙන් ම එසේ ම වී ය. දැළි රුවුළ ද තදනුරූප වී ය. නැවත පිරිනිවී තැන් දක්වා දැළිනිස කෙස් බැමෙන් කිසි නැති වී ය. බොධිසත්වයෝ මුහුළස හා සමග කෙස්වැටි ය ගෙණ ඉදින් මම බුදුවන්නෙමි නම් අහස රැදේව යි නැහැඟොත් භූමියෙහි පතිත වේව යි අනිලපථ සංඛ්‍යාත නහස් තලයට නික්ෂේප කළ සේක. ඒ ශිඛාමාණික්‍ය ය සහිත වූ ධම්මිල්ලකලාප ය යොදනක් පමණ තැන් ගොස් ආකාශයෙහි සිටියේ ය. වාසව සංඛ්‍යාත සක්දෙවිරජ දිවයින් බලා යොදනක් පමණ රුවන්සරඹුවකින් පිළිගෙණ තවුතිසා දෙවිනුවර සිඳුමිණි සෑය නම් චෛතයක් කොට පූජාකරන්ට පටන් ගත්තේ ය.

එම දක්වන්නට කිහ.

"ජෙත්වාන මොලිං වරගන්ධවාසිතං
වෙහාසයං උක්කිපි අග්ගපුග්ගලෝ,
සහස්සනෙත්තෙනා සිරසා පටිග්ගහි
සුවණ්ණවඩ්ඪෙනාට වරෙන වාසවෝ"යි.

නැවත ත්‍රිභුවන තිලක වූ ශ්‍රී මහා බොධිසත්වයෝ මේ සසී සළු අතර්ඝ ය, ශ්‍රමණසාරූප්‍ය නොවන්නේ ය යි සිතූ සේක. ඒ සිත දුටු පූර්වයෙහි කාශ්‍යප බුදුන් දවස විශාසී වූ ඝටීකාර නම් මහාබ්‍රහ්මතෙම—

"නිච්චරං ව පත්තෝ ව-වාසි සුචිං ව බන්ධනං,
පරිස්සාවනෙන අඥේ'තෙ-යුත්තායොගස්ස භික්ඛුනෝ"යි.

දක්වන ලද මේ අෂ්ටපරිෂ්කාර ය ගෙණවුත් පිළිගැන්වී ය. ත්‍රිභුවන චූඩාමාණික්‍ය වූ අප මහ බෝසතාණෝ ඒ අර්හත් ධජ ය ගෙණ පෙර ව උතුම් පැවිදිවෙස් ගෙණ යහළු වූ ඡන්න යෙනි! මාගේ වචනයෙන් මාතාපිතෘන්ට මා නිරෝගි බැව් කියව යි කියා නික්ම වූ සේක. ඔහු බොධිසත්වයන් වැඳ ප්‍රදක්ෂිණාකොට ගියේ ය. කන්ථක නම් අශ්වරාජතෙම ඡන්න නම් අමාත්‍යයා හා සමග කථාකරන්නා වූ බොධිසත්වයන් ගේ වචන යන් අසමින් සිට මතු මාගේ සවාමීන් ගේ දර්‍ශනයෙක් මට නැතැ යි සිතන්නේ ඒ ශොක ය ඒ අධිවාසන ය කොට ගත නොහී හෘදය පැළී කාලක්‍රියාකොට තවුතිසා දෙව් ලොව කන්ථක නම් දිව්‍යපුත්‍රයෙක් ව උපන්නේ ය. ඡන්නා මාත්‍යයාට ප්‍රථමයෙන් එක් සොකයෙක් වී ය. කන්ථකයා ගේ කාලක්‍රියාවෙන් උපන් දෙවෙනි සෝකයෙන් හඬමින් වැළපෙමින් නුවරට ගියේ ය.

මේ ද කියේ මැනෝ.

"බොධිසත්තොා අරහද්ධජං නිවාසෙත්වා උත්තම පබ්බජ්ජා වෙසං ගණ්හිත්වා ඡන්න මම වචනෙන මාතාපිතූනං ආරොග්‍යං වදෙනී'ති උය්‍යොජෙසි. ඡත්තොා බොධිසත්තං වන්දිත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. කන්ථකොා පන ඡත්තොන සද්ධිං මන්තය මානස්ස බොධිසත්තස්ස වචනං සුණන්තොා ඨත්වා නත්ථි'දානි මයහං පුන සාමිනොා දස්සනන්ති චක්ඛුපථං විජහන්තොා සොකං අධිවාසෙතුං අසක්කොන්තොා හදයෙන ඵලි. තෙන කාලං කත්වා තාවතිංස භවනෙ කන්ථකොා නාම දෙවපුත්තොා හුත්වා නිබ්බත්ති. ඡන්නස්ස පඨමං එකොා සොකොා අහොසි. කන්ථකස්ස පන කාලකිරියාය දුන්යෙන සොකෙන පීළිතොා රොදන්තොා පරිදෙවන්තොා නගරං අගමාසි—සි.

ත්‍රිභුවන විලොභනීය වූ ඒ බොධිසත්වයෝ ද පැවිදි ව ඒ ගංගාසම්පයෙහි අනුපිය නම් අඹවනයෙහි සත්දවසක් නිරාහාර යෙන් පැවිදි සුව අනුභව කරණ සේක් දවස් යවා එක් දවස ම තිස්යොදුන් මග ගෙවා පදසා ගමනින් ගොස් **රාජගහ** නම් පුර යට ප්‍රවිෂ්ට ව—

"වණ්ණුපමෝ නිච්ච නවෝ කුලෙසු
අමච්ඡරී සබ්බ සමානුකම්පෝ,
කුලූපකාදීනව විප්පමුත්තොා
හොති'ධ භික්ඛු සපදානචාරී-සි.

විශුද්ධිමාර්ග නම් ග්‍රන්ථ අට්ඨකථාවෙහි දක්වන ලද අන්‍යක අනුසස් ඇති සපදානයෙන් නොහොත් හැම බුදුන්ගේ සිරිත් වූ ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසුරුණු සේක. එ කල සියලු මුළු නුවර බොධිසත්වයන්ගේ රූපදර්ශනයෙන් ධනපාලයා විසින් ප්‍රවිෂ්ට වූ රජගහනුවර සේ අසුරෙන්ද්‍රයා විසින් ප්‍රවිෂ්ට වූ දෙවු නුවරක් සේ ඇලලී ගියේ ය.

කියේ මැනෝ.

"බොධිසත්තොාපි පබ්බජිත්වා තස්මිං යෙව පදෙසෙ අනුපිය න්නාම අම්බවනං අත්ථි, තත්ථ සන්නාහං පබ්බජ්ජාසුඛෙන වීති නාමෙත්වා එකදිවසෙනෙ'ව නිංසයොජන මග්ගං පදසා ගන්ත්වා රාජගහං පාවිසි. පවිසිත්වා සපදානං පිණ්ඩාය චරි. සකල නග රං බොධි සත්තස්ස රූපදස්සනෙන ධනපාලකෙන පවිට්ඨ රාජ ගහං විය අසුරින්දෙන පවිට්ඨ දෙවනගරං විය ච සංඛොභං අගමාසි—සි.

රාජපුරුෂයෝ ගොස් දෙවයන්වහන්ස! මේ බඳු රූප සොභාවෙන් අගතැන්පත් උතුමෙක් නුවරෙහි පිඬු සිහන්නේ ය. දිව්‍ය මනුෂ්‍ය නාග සුපර්ණාදීන් අතුරෙහි කවරෙක් බව ත් නොදනුම්හ සි කීවාහු ය. රජතෙම ප්‍රාසාදතලයෙහි සිට බලා ආශ්චර්‍ය්‍ය අද්භූත පුරුෂයෙක, තොපි ගොස් විමස ව. ඉදින් අමනුෂ්‍යයෙක් වී නම් නුවරින් නික්ම අතුරුදන් වෙයි. ඉදින් දෙවියෙක් වී නම් ආකාශයෙන් යෙ යි. නාගයෙක් වී නම් පොළොව කිමිද ගෙණ යෙයි. මිනිස් කෙණෙක් වී නම් ලද අග්‍රක් සුදුසු තැනෙක්හි හිඳ අනුභව කෙරෙති සි කියා දූතයන් යැවූ සේක.

හෙ ද කියේ මැ නෝ

රාජ පුරිසා ගන්ත්වා දෙව! එවරූපො නාම සත්තා නගරෙ පිණ්ඩාය චරති. දෙවො වා මනුස්සො වා නාගො වා සුපණ්ණො වා කො නාමෙ සො'ති න ජානාමා'ති ආරොචෙසුං. රාජා පාසාදතලෙ ඨත්වා මහාපුරිසං දිස්වා අච්ඡරියබ්භුතො ජාතො පුරිසෙ ආණාපෙසි. ගච්ඡථ භනෙ! වීමංසථ සචෙ අමනුස්සො භවිස්සති නගරා නික්ඛමිත්වා අන්තරධායිස්සති. සචෙ දෙවතා භවිස්සති ආකාසෙන ගච්ඡිස්සති. සචෙ නාගො භවිස්සති පථවියං නිමුජ්ජිත්වා ගමිස්සති. සචෙ මනුස්සො භවිස්සති යථා ලද්ධං භික්ඛං පරිභුඤ්ජිස්සති-සි.

නිහුවන නයන වූ මහාපුරුෂයානෝ නොයෙක් දෙයින් මිශ්‍රක බත් ලබන් සේක්—

චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ
අලං ඵාසු විහාරාය පහිතත්තස්ස භික්ඛුනො-සි.

දක්වන ලද ප්‍රමාණානුකූල ලෙස ලැබගෙණ කරකැවි ප්‍රවිෂ්ට වූ චාරයෙන් ම නුවරින් නික්ම **පාණ්ඩව** නම් පර්වතච්ඡායාවෙහි පෙරැස්සාභිමුඛ ව වැඩහිඳ ආහාර වළඳන්නට ආරම්භ කළ සේක. ඉක්බිත්තෙන් උපන්දු පටන් ඒ අන්බැව්හි මෙබඳු බැගෑපත් ආහාරයක් ඇසිනු ත් නුදුටු විරූ හෙයින් අනෙකයන් පරිවර්තන ව මුඛයට නැගෙණ ආහාර ප්‍රතික්කූල වී ය. අනෙකප්‍රකාර කෙලෙසුන් තවන ප්‍රඥාව ඇති හෙයින් තමන්වහන්සේ තමන්වහන්සේට ම අවවාද කොට "පටිසංඛා යොනිසො" යනාදී අෂ්ටාඞ්ග සමන්විත ව සෙඛියා කී සෙයින් වළඳන කල්හි රජහුගේ දූත පුරුෂයෝ එපවත් දැක රජහට දැන්වූ හ.

බිම්බිසාර රජ ඒ අසා වහා නුවරින් නික්ම අවුත් ත්‍රෛලොක්‍ය සවාමී වූ බෝධිසත්ත්වයන් සමීපයට ගොස් ඊර්ය්‍යාපථයෙහි ප්‍රසන්න ව කම් ගොත් විචාරා රාජ්‍යයෙන් පැවරූ හෙයින්-"මයහං

මහාරාජ වත්‍ථුකාමෙහි වා කිලෙසකාමෙහි වා අත්‍ථො නත්‍ථි. අහං පරමාභිසම්බොධිං පත්‍ථයනෙනා නික්ඛන්තොා''සි. යනාදින් මහ රජ්ජුරුවෙනි! මට වස්තුකාමයෙන් හෝ කෙලෙශකාමයෙන් කම් නැත. මම පරමාභිසම්බෝධි ය ප්‍රාර්ථනාකෙරෙමින් මහාභිනිෂ්ක්‍රමන් කෙළෙමි සි කියා රාජ්‍ය ය ප්‍රතික්ෂේප කළ කල්හි-

'අද්ධා සඞ්ඛා බුද්ධො භවිස්සසි. බුද්ධ භූතෙන පන තෙන පඨමං මම ඉජ්ඣිතං ආගන්තබ්බං''-සි. යනාදින්. සවාමිනි! ඔබ ඒකාන්තයෙන් බුදුවන සේක් ම ය. බුදුවූ කල ප්‍රථමයෙන් මාගේ නුවරට වැඩිය මැනවැ සි යාඥාකළ හෙයින් මැනව, මහරජ්ජුරුවෙනි! සි ප්‍රතිඥාදී යථාක්‍රමයෙන් සැරිසරණ සේක් **ආළාරකාලාම ය- උද්දකරාම ය** යන තාපසවරුන් සමීපයට එළඹ අෂ්ටසමාපත්ති උපදවා මේ ධ්‍යාන මාත්‍රාවෙකින් බුදු ව ලෝවැඩ කළ නොහැක්කා සි එහි ත් ලොභ ය හැර දෙවියන් සහිත වූ ලොවට තමන්වහන්සේ ඉයස්බල දක්වන පිණිස මහත් වූ දුෂ්කරක්‍රියා කෙරෙමි සි උරුවෙලා නම් දනවුවට ගොස් මේ භූමි භාග ය තපසට රම්‍ය ය සි සිතා එහි ම වාසයට පටන්ගත් සේක.

කියේ මැ නෝ

බොධිසත්තොාපි රඤ්ඤෝ පටිඤ්ඤං දත්වා අනුපුබ්බෙන වාරිකං චරමානොා ආළාරං ච කාලාමං උද්දකං ච රාමපුත්තං උපසංකමිත්වා සමාපත්තියොා නිබ්බත්තෙත්වා නායං මග්ගොා බොධායා'ති තම්පි සමාපත්තිං භාවනං අනලංකරිත්වා සදෙවකස්ස ලොකස්ස අත්තනොා ථාම විරිය සංදස්සනත්ථං මහාපධානං පදහිතු කාමොා උරුවෙලං ගන්ත්වා රමණීයොා වනා'යං භූමිභාගොා'ති තත්‍රෙව වාසං උපගන්ත්වා මහාපධානං පදහි-සි.

ඉක්බිත්තෙන් යට කියනලද කොණ්ඩඤ්ඤ ය භද්දජි ය වප්ප ය මහානාම ය අස්සජි ය යන පඤ්චවර්ගික භික්ෂූහු ග්‍රාම නිගම රාජධානීන් සැරිසරන්නාහු එ තැන්හි පැමිණි බෝධිසත්ව යන් දැක මහාප්‍රධාන ය කරන්නාහු දැන් ම බුදුවෙති දැන් ම බුදුවෙති සි පිරිවෙණ හැමදීම් ආදී වූ වත් පිළිවෙත් උපස්ථාන කෙරෙමින් සන්තිකාවචර වූවාහු ය. ත්‍රිභුවන සුරපාදප වූ බොධිසත්වයෝ වනාහි කොටිප්‍රාප්ත වූ දුෂ්කරක්‍රියා කෙරෙමි සි එක නිල තණ්ඩුලාදියක් ලද ද එ පමණ ආහාරයකිනි දු යැපෙන සේක. සම්ප්‍රකාරයෙන් ආහාරූපවෙජදක කළ සේක. ඒ දෙවතාවෝ ද ආහාර වර්ජිත යෙන් නොනසින සේක්ව සි සිතා මුඛයෙන් අනුභව නොකරණ හෙයින් නවාභූදහසක් ලොමකූප යෙන් දිව ඕජස් ඛහා ජීවිත ය රක්ෂා කෙරෙති.

කියේ මැනෝ.

තෙපි බොහෝ කොණ්ඩඤ්ඤප්පමුඛා පඤ්චවග්ගිකා ගාම නිගම රාජ ධානීසු භික්ඛාය චරන්තා තථා බෝධිසත්තං සමුපාප්‍රණිංසු. අථ නං ඡබ්බස්සානි මහාපධානං පදහන්තං "ඉදානි බුද්ධෝ භවිස්සති"ති පරිවේණ සම්මජ්ජනාදිකාය වත්ත පටිවත්තාය උපට්ඨහමානා සන්තිකාවචරා වස්සා අගෙස්සුං. බෝධිසත්තොපි බෝ "කෝ ටිප්පත්තං දුක්කරකාරිකං කරිස්සාමී"ති එකතිලතණ්ඩුලාදිකම්පි ජීරිතාමෙසි. සබ්බසොපි ආහාරූපච්ඡේදං අකාසි. දෙවතාපි ලොමකූපෙහි ඔජං උපසංහරමානා පටික්ඛිපි-සි.

ඉක්බිත්තෙන් නිරාහාරතායෙන් ත්‍රිභුවන විත්තාමාණික්‍ය වූ බොධිසත්වයන්ගේ සවණ්ණවණ්ණ වූ ශරීර ය කාලවණ්ණ වි ය. දෙතිස් මහා පුරුෂලක්ෂණ ය ද ප්‍රතිච්ඡන්න වි ය. මෙසේ සාවුරුද්දක් මුළුල්ලෙහි නිදුනවණ්ණාවෙහි දැක්වූ ක්‍රමයෙන් මහා වීර්‍ය්‍ය ය කරන්නා වූ මහබෝසතාණන්ගේ වීර්‍ය්‍ය ය අහස පොළොව ගැට ලන්නා සේ වි ය. මෙසේ දුක් ගෙණ බුදු විය නොහැක්ක. මේ බුදුබවට යන මගෙක් නොවෙයි සිතා ඔළාරිකාහාර ආහරණ ය කොට කායබල ද උපදවා ගෙණ වීර්‍ය්‍යයකොට බුදුවෙමි යි සිතා ග්‍රාමනිගමයෙහි පිඬුපිණිස හැසිර මධුර වූ ආහාර ය වලඳන්ට පටන්ගත් සේක. එ කල දෙතිස් මහා පුරුෂලක්ෂණ ය ද ප්‍රකෘතිමත් වි ය. ශරීර ය සවණ්ණවණ්ණ වි ය.

ඒ දැක පඤ්චවග්ගීය භික්ෂූහු මෙතෙම සාවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට ත් සම්බෝධඤාණ ය ප්‍රතිවෙධකොට ගත නොහැකි වූයේ ය. දැන් ග්‍රාමාදියෙහි භික්ෂාටනයකොට සියුම් ආහාර වලඳ කෙසේ නම් බුදුවන්නේද යි කියා මෝහට දුක්ගැන්ම, ඉස්සෝදු නහනු කැමැත්තෙක් පිණ්බිත්දු අවුලා රැස්කොට නාමී සිතන්නක් වැන්න. මොහු සමීපයෙහි වැස කවර ගුණයක් ලබමෝද යි කියා තමතමන්ගේ පායිව්‍රා ගෙණ මහා පුරුෂයන් හැර අටලොස් යොදුන් මග ගෙවා ඉසිපතනයට ප්‍රවිෂ්ට වූහ.

එසින් කිහ:

පඤ්චවග්ගියා භික්ඛවෙ අයං ඡබ්බස්සානි දුක්කරකාරිකං කරොන්තොපි සබ්බඤ්ඤුතං පටිවිජ්ඣිතුං නාසක්ඛි. ඉදානි ගාමාදිසු පිණ්ඩාය චරිත්වා ඔළාරිකං ආහාරං ආහරියමානො කිං සක්ඛිස්සති බාහුලිකො එස පධානවිබ්භන්තොති. සීසං නහායිතුකාමස්ස උස්සාව බින්දුතක්කනං විය අමහාකං එතස්ස සන්තිකා විසෙස තක්කනං,

කිං නො ඉමිනා'නි මහාපුරිසං පසාය අත්තනො අත්තනෝ පත්ත චීවරං ගහෙත්වා අට්ඨාරස යොජන මග්ගං ගන්ත්වා ඉසිපතනං පවිසිංසු-සි.

මෙසේ ත්‍රිභුවන ජනශෙඛර වූ බොධිසත්වයෝ දිව්‍යලොකයෙහි දිව්‍යාඞ්ගනාවන් විසින් පිරිවරණ ලදු ව දිව්‍යරාජ්‍යශ්‍රී සම්පත් අනුභවකරණ ශක්‍රදෙවෙන්ද්‍රයන් පරිද්දෙන් පළමු කි කිඹුල්වත් පුරයෙහි රාජ්‍යශ්‍රී සැප ය බොහෝ කලක් අනුභවකොට කාමසුඛල්ලි කානු යොග ය සි කියන ලද රූපාදී පඤ්චකාම විෂයාසවාදයෙහි සිහින් ඇලීමෙන් කයින් යෙදීමෙන් නිවන් නැති බව ලොකයාහට ප්‍රකාශකොට, උරුවෙල් දනවිවෙහි දී සාවුරුද්දක් මුළුල්ලෙහි අහසට ගැටලන්නක්හු මෙන් පෘථිවි ය පෙරලන්නක්හු මෙන් කිසිකෙණෙකුන් විසින් නො කට හැකි වූ හො පැමිණිය හැකි වූ දුෂ්කරක්‍රියා කෙරෙමින් අත්තකිලමථානුයොග ස සි කියන ලද ශරීර පීඩායෙහි යෙදීමෙනු ත් නිවන් නැති බව ලොකයා හට ප්‍රකාශ කොට-

මධ්‍යම ප්‍රතිපදා යසි කියන ලද ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහි පිළිපදිනා සේක් ඕදාරික වූ ආහාරපාන වර්ගාදි ය අනුභව කෙරෙමින් ශරීර ය සන්තර්පණ ය කොට ගෙණ වෛශාඛ මාසයෙහි වූ මැදි පොහෝ දිනයෙහි උදයගිරි පර්වතයට ශිඛාමාණික්‍යයක් බඳු වූ පළමු වන ප්‍රබෝධ කරන්නා වූ හිරු නැඟී කල්හි මිතභාෂ්‍ය රජක්හුගේ ගමන් බඳු වූ විලාස ගමන් ඇත්තේ උදුසන ම ගොස් භික්ෂාටනයට යන වේලා පරිභෝග කරන්නේ අජපාල න්‍යග්‍රොධ වෘක්ෂමූලයෙහි තැගෙණහිර ලොකධාතුව බලමින් ශරීරාලොකයෙන් ඒ සියලු වෘක්ෂ ය සුවර්ණවර්ණ කොට නීලවර්ණ වූ මෙඝපටලයකින් නිෂ්ක්‍රාන්ත වූ සූර්‍ය්‍ය මණ්ඩලයක් මෙන් බබලමින් වැඩහුන් සේක.

මෙම දක්වන්නට කිහ - බොධිවංශයෙහි

පුබෙබ සුරිඤ්ඤ විය සුරසුන්දරීහි පරිවුතො සුරභවන සුඛමි'ව කපිලපුර සුඛං සුවිරම'නුභවනෙනා කාමසුඛල්ලිකානුයොගෙන මොක්ඛභාවං පකාසෙනෙනා ඉදානි දිනකර වවුමෙ ගණ්ඩිං කරොනෙනා ඉය මෙදිනී මණ්ඩලං පරිවත්තෙනෙනා විය ච කෙහිචි කාතු මසක්කුණෙය්‍යං කොටිපපත්තං දුක්කරකාරිකං කරොනෙනා අත්ත කිලමථානුයොගෙන නිබ්බාණාභාවං සන්දසෙසවා.

මජ්ඣිමාය පටිපදාය පටිපජ්ජනෙනා ඔළාරිකාහාර පරිභොගෙන සරීරං සන්තපෙත්වා විසාකපුණ්ණමදිවසෙ උදිතෙ උදය ගිරිසිඛර සිඛාමණිහුනෙ කමලවන විකසනකරෙ අසිසිර කිරණෙ

මත්තහාස විලාසගාමී ජාතොව ගත්වා භික්ඛාචාරකාලං ආගමය මානො අජපාල නිග්‍රොධමූලෙ පාචින ලොකධාතුං ඔලොකෙන්තො සරිරප්පභාහි සකලං තං රුක්ඛං සුවණ්ණවණ්ණං කත්වා ඝනවිවර ගත දිවසකරො විය විරොචමානො නිසීදි—සි.

බොධිසත්වයෝ එසේ උන් ඉක්බිත්තෙන් එ ම උරුවෙල් නම් දනවුවෙහි **සෙනානි** නම් කෙළෙඹි පුත්‍රයාගේ දූ වූ කඤ්ඤ යක් පිරූ පෙරුම් ඇති **සුජාතා** නම් සිටුදියනි කෙණෙක් වැඩි විය පැමිණ අජපාල න්‍යග්‍රොධ වෘක්ෂයෙහි එක් ප්‍රාර්ථනාවක් කොට පිරුණා වූ මනදෙළ ඇති තැනැත්තී වෛශාඛ මාසයෙහි වූ පෞර්ණමී පොහෝ දිනයෙහි ඒ වෘක්ෂයෙහි අධිගෘහිත දෙවතා වාට තමන් යැද ගත් බලිපූජාකරණු පිණිස එ දවස් උදැසන ම ඉස් සෝදා නහා නිරායාසයෙන් අතිමධුර වූ ක්ෂීරපායාඤ්ඤ ය තිදුන වර්ණනායෙහි මහ පූජාවලියෙහි කියන ලද ක්‍රමයෙන් වැල්මී වන යෙහි කවන ලද පන්සියයක් දෙනුන් පටන් අටදෙන දක්වා ගත් කිරෙන් දසදහසක් සක්වළ දෙවියන් විසින් බහන ලද මියුරු රසයෙන් පිස ලක්ෂයක් වටනා ගණ රන් තලියෙක ඒ ක්ෂීර පායාස ය පුරා ලක්ෂයක් වටනා රන්තලියකින් වසා-

තමාගේ ම ඉස තබා ගෙණ සුවඳ මල් හා වස්ත්‍රාභරණයෙන් සැදුම් ලද්දී භ්‍රමරවැලයක් බදු කේස කලාපයක් ඇතිවන බැවින් සන්නිහිත බහලාන්ධකාර වූවා දිලිහෙන්නා වූ ශරීර ශොභා ඇති වන බැවින් හා සමාන තුන්‍රසමපතු දූ ඇති වුව යනාදීන් මහා බොධිවංශයෙහි කියන ලද ක්‍රමයෙන් රූ සිරින් හා යසපිරිවරින් යුක්ත වූ ඒ සුජාතාවෝ අනෙකප්‍රකාර ආභරණයෙන් හා විසිතුරු වස්ත්‍රයෙන් හා සුගන්ධාඛරාගයෙන් යුක්ත වූ හවභාවයෙන් ලීලොපෙත වූ තරුණ සත්‍රීන් විසින් පිරිවරණ ලද්දා වූ ස්ථට වූ නෙවත් ව්‍යක්ත වූ පටහ නෙරි ධවනි බඳු ප්‍රබන්ධයෙන් සක්වළ ගැබ පුරන්නාක් වැන්නී සියලු ලොකධාතු ව පුෂ්පයෙන් ගැවසී ගත්තාක් මෙන් ද සුවඳින් ගැවසීගත්තාක් මෙන් ද කෙරෙමින් යන්නා වූ තැනැත්තී—

ඒ න්‍යග්‍රොධ වෘක්ෂ ය හා අධික වූ කුසල සම්භාරානුභාව යෙන් නිපන් බැවින් රූපත් වූ කුසල රාසියක් මෙන් උපන්නා වූ මහ බොධිසත්වයන් දුරදී ම දැක උපන්නා වූ ප්‍රීති සොම්නස් ඇති තැනැත්තී වෘක්ෂ දෙවතාවා ය සි සිතන්නී දැක්ම හා සමග නැමී නැමී ගොස් ලඟිරු මඩලක් බඳු රන්තලි ය ඉසින් බා තබා ඒ මහ බොධිසත්වයන් වහන්සේගේ රන් ඇඹුල මලක් බඳු වූ කොමල අන්ලෙහි රන්තලි ය තබා පොළෝතෙලෙහි තබන ලද තළල්

නමැති අඹ සඳ ඇත්තී මාගේ මනදෙළ යම් සේ සම්බුදු ද එ පරිද්දෙන් ම බුඹුවහන්සේගේ මනොරථය ත් සිඳුවේව යි කියා ඉතා සිත්කළු වූ තෙපුල් කියා සතුටුවෙමින් ගියා ය.

කියේ මැනෝ - මහාබොධිවංශයෙහි

තතො උරුවෙලායං සෙනානී නිගමෙ සෙනානි කුටුම්බි කස්ස ධිතා සුජාතා වයපත්තා තස්මිං රුක්ඛෙ එකං පත්ථනං කත්වා පරිපුණ්ණ චිත්තසංකප්පා තස්මිං දිවසෙ අජ්ජ බලිකම්මං කරිස්සා මී'නි පාතො පායාසං අනායාසං පරම මධුරං සම්පටිපාදෙත්වා සතසහස්සඝනිකං සුවණ්ණපාතිං අලංකරිත්වා තත්ථ මධුපායාසං පූරෙත්වා අපරාය සුවණ්ණපාතියා පිදහෙත්වා සිසෙනා'දාය සුරභි කුසුම වසනාභරණ භූසිතා සුනිල භමර කෙසෙහි සන්නිභිත ඔහලාඞ්කාරා හාසමාන තනුසමපදූ ව -පෙ- විචිධාලංකාර වන කුසුම දුමානුලෙපනොපෙත ලලිත ස්‍රුවනි පරිවුතා පටුපටහත්ථා දුනුපපබන්ධෙන පූරයන්තී'ව චක්කවාළා කුසුම මයම්'ව ගන්ධ මය මිව බුපමියම්'ව ච කරොන්ති සකල මෙව ලොකධාතුං ගවජ්ජන්ති.

නිග්‍රොධපාදං දූරතොව තං මහාසත්තං පුඤ්ඤසඤ්ඤයම්'ව රූපවන්තං නිසින්නං දිසවා පීති සොමනස්ස ජාතා රුක්ඛදෙවතා'නි මඤ්ඤමානා සහදසනෙනෙ'ව ඔනතා ගන්ත්වා සිසතො තමිනිනව භානුබිම්බනිභං සුවණ්ණපාතිං ඔතාරෙත්වා තස්ස රත්ත කුවලය කොමල පාණිතලෙ ඨපෙත්වා මිහිසඤ්ඤිනිත ලලාට වන්ද සකලා, යථා මෙ මනොරථො නිප්ඵන්නො එවං තොපි නිප්ඵජ්ජතූ'නි අති මනොහරං ගිරමුදීරයිත්වා පමොදමාන ගතා.-සි

ක්ෂීරපායාස ය නිපත් පරිදි හා ක්‍රමයෙන් බෝමැඩට නික් මුණු පරිදි අවිදූරෙ නිදාන වණ්ණනායෙහි ආ ලෙසින් විස්තර වශ යෙන් බලා දනයුතු-මෙසේ **සුජාතාවන්** විසින් පිළිගන්වනලද ක්ෂීරපායාස ය මහාබ්‍රහ්මයා පැවිදිවන දිනයෙහි පිළිගැන් වූ පාත්‍ර ය සාවුරුද්දක් තිබී එ දවස් අතුරුදන් වූ හෙයින් ද බෝමැඩට එළ ඹෙන දිනයෙහි ලක්ෂයක් වටනා ඝන රත්තලියෙන් ක්ෂීරපායාස ය වැළඳීම. හැම බුදුන්ගේම ධර්මතාවක් බැවින් ත් සුජාතාව න් කැප කොට දුන් හෙයින් ත් තලි ය හා සමග පිළිගෙණ හුන් තැනින් නැඟී ඒ වෘක්ෂ ය ප්‍රදක්ෂිණාකොට තලි ය ගෙණ **නෙරඤ්ජරා** නම් ගංතෙරට ගොස් නොයෙක් බොධිසත්ව ශතසහස්‍රයන් බුදුවන දින යෙහි බැස නහනා සුප්‍රතිෂ්ඨිත නම් තොටෙක් ඇත.

ඒ ගංහානීරයෙහි රත්තලි ය තබා තොටට බැස නහා නොයෙක් බුඩ ශතසහස්‍රයන්ගේ නිවාසන වූ අතීත්ධ්වජ ය හැඳ පෙර ව

පූර්වදිග බලා වැඩහිඳ එක් බිජු ඇති තල්ඵල පමණ ඇති එකුන් පණස්පිඩක් කොට නිරූදක යියලු ක්ෂීරපායාස ය වලඳ, වදාළ සේක.

නිදේ මෑ නෝ.

බොධිසත්තොපි බෝ නිසින්නාවස්සානා උට්ඨාය රුක්ඛං පදක්ඛිණං කත්වා පාතිං ආදාය නෙරඤ්ජරාය තීරං ගන්ත්වා අනෙකබුද්ධ සතසහස්සානං අනිසේවිතඤ්ඣාන දිවසෙ ඔතරිත්වා නාහාතට්ඨානා සුපප්පිටිතං නිත්ථං නාම අත්ථි තස්සා තීරෙ පාතිං ඨපෙත්වා ඔතරිත්වා නහාත්වා අනෙක බුද්ධසහස්සානං නිවාසනං අරහද්ධජං නිවා සෙත්වා පුරත්ථාභිමුඛෝ නිසීදිත්වා එකට්ඨි තාලපක්කපපමාණෙ එකූන පඤ්ඤාස පිණ්ඩෙ කත්වා සබ්බං අපෙපාදක මධුපායාසං පරිභුඤ්ජි -යි.

ඒ එසේ ම ය, එදා වැලඳූ ඔහිරි කිරිබත ම බුදු වූ සත්සති යක් මුළුල්ලෙහි බෝමැඩ වසන්නා වූ බුදුන්ට එක එක පිඬ බැගින් ආහාර වෙයි. මේ පමණ කලක් මුළුල්ලෙහි අන්කිසි ආහාරයක් වැලඳුයේ නැත. නහන මුඛධොවනාදී ක්‍රියාවකු ත් නැත ධ්‍යාන සැපයෙන් මාගී සැපයෙන් ඵලසැපයෙන් ම දවස් යැවූසේක.

හෙද කිහ.

සෝ එව හිස්ස බුධභූතස්ස සත්තාසත්තනාහං බොධිමණ්ඩ වස්සත්තස්ස එකූණ පඤ්ඤස්ස දිවසානි ආහාරෝ අහොසි. එත්තකා කාලං නෙව අක්ඛිකූ ආහාරෝ අත්ථි. න නහානං න මුඛධොවනං න සරිර වලඤ්ජා. ඣානසුඛෙන මග්ගසුඛෙන ඵලසුඛෙනේව වීතිනා මෙසි. යි.

ඒ ක්ෂීරපායාස ය වලඳ, රන්තලි ය ගෙණ ඉදින් මම අද බුදු වෙන්ට හැකි වී නම් මේ තලිය ප්‍රතිශ්‍රොතයට යේව යි නොහැකි වේ නම් අනුශ්‍රොතයට යේව යි කියා ඒ තලි ය ප්‍රක්ෂෙප කළ සේක. ඒ තලි ය එකෙණෙහි දිය කපාගෙණ දිවන නැවක් සේ ගහමැදට දිව නැවත ජවසම්පන්න වූ සෙන්ධවයෙකු සේ අසුරියනක් තැන් ප්‍රති ශ්‍රොත්‍ර ය යි කියන ලද උඩුගහට ගොස් එක් ආවර්තයෙක්හි හෙවත් එක් සළායෙක ගැලී කාළ නම් නාගරාජයන්ගේ භවනයට ගොස් **කණ්හ සද-කොණාගමන-කාශ්‍යප** ය යි යන තුන්බුදුවරයන්ගේ පාරිභොගික රන්තලිවල වැදී කිලි කිලි යන රාව ය කෙරෙමින් ඒ රන් තලි තුනෙහි ම හෙට්ඨිමභාවයට පැමිණ සිටියේ ය.

කාළ නම් නාගරාජතෙම ඒ ශබ්ද ය අසා ඉන් පළමු ද ත් බුදුකෙණෙක් බුදුවූ සේක. පෙරෙයි ද ත් බුදුකෙණෙක් බුදුවූ සේක.

ර්යේ ත් බුදු කෙණෙක් බුදුවූ සේක. අද ත් බුදුකෙණෙක් බුදුවෙති සි කියා නොයෙක් පදසතයෙන් සතුති කරණුයේ--තමින්ගේ නාත එවන් රැස්කොට පූජා සරහා සිට ගත.

හෙ ද කියේ මැ නෝ.

තං පන පායාසං භුඤ්ජිත්වා සුවණ්ණපාතිං ගහෙත්වා සව්'හං අජ්ජ බුබොහෙතුං සක්ඛිස්සාමි අයං පාති පටිසොතා ගච්ඡතු නෙ වෙ සක්ඛිස්සාමි අනුසොතා ගච්ඡතු'ති වත්වා පක්ඛිපි. සා සොතං ඡින්දමානා තාදිමජ්ඣං ගන්ත්වා මජ්ඣිමජ්ඣට්ඨානෙනෙව ජවඤ්ඤපත්තා අසෙසා, ඉය අසිනි හත්ථිමත්තට්ඨානා පටිසොතං ගන්ත්වා එකසම්මා ආව තෙත නිමුජ්ජිත්වා කාළනාගරාජභවනං ගන්ත්වා, නිණණා, උඩ්ඩානං පරි හොග පානියො කිලි කිලි'ති රවං කාරයමානා පහරිත්වා නාසං සබ්බහෙටිමා හුත්වා අට්ඨාසි. කාළො නාගරාජා තං සද්දා සුත්වා භියේ‍යා එකො බුබෙ, නිබ්බත්ති පුන අජ්ජ එකො නිබ්බත්තොා'නි අනෙකෙහි පදසතෙහි ථුනියො වදමානො අට්ඨාසි,-යි.

මෙසේ ක්ෂීරපායාස ය වලඳ කියන ලද ක්‍රමයෙන් තලි ය උඩු ගං බලා හැර ඒ ගංගාතීරයෙහි සුවඳ මලින් සැදුම් ලද නිල් වූ පැහැ යෙන් සිත්කළු වූ සල්වතයෙහි දිවා විහාරකොට සවස්වේලෙහි සවර්ණ වර්ණ වූ මනොඥ වූ සුගන්ධ ඇති පුෂ්පයන් නටුයෙන් ගිලිහි සිවුර මත්තෙහි වැටෙන්නට වත් කල්හි දිව්‍යාසුරයන් විසින් පූජා ලද්දාවූ නිල්මහනෙල් රත්පියුම් නෙලුපියුම් මිදුරා ආදී වූ පුෂ්ප වරුෂා අතුරුක් නැති ව වස්නට පටන්ගත් කල්හි දිව්‍යාඞ්ගනාවන් හා කින්නරාඞ්ගනාවන් විසින් ද සාධුකාර දෙන්ට පටන්ගත්තා ලද කල්හි සුවඳවත් වූ වඳන චූර්ණයෙන් ගැවිසී ගත්තා වූ පුෂ්පයෙන් හා කොකුම් කෙසුරෙන් හා සුවඳ දුමින් එකසුගන්ධ වූ අනෙකප්‍රකාර වූ විචිත්‍ර වූ සුන්දර වූ විසල් මහාධවජ මාලාවන් ඇති-

දසදහසක් සක්වළ වෙවුලන්ට පටන්ගත් කල්හි ඇලලෙන ලද කමල කුමුදුවන ඇති මකරන්ද සංඛ්‍යාත කුසුම රෙණුයෙහි මධුර බිඳු වහන ය කර වත්නාවූ පුෂ්ප සුගන්ධයෙන් පිණවන ල්ද භ්‍රමර වැල ඇති මාරුත ය මදමි ද ව හමින්ට වත් කල්හි දෙවියන් විසින් රත්තොරණ රිදීතොරණ පුන්කලස් ආදියෙන් සරහා පිළි යෙළ කරණ ලද අටඉස්බක් පමණ පුළුන්ති මාගීයෙන් මතත හසතීන්ගේ කුම්භසතල ය විදාරණ ය පිණිස තීක්ෂිත ව පැළඹි යත් නාවූ කෙසර සිංහරාජයක්හු මෙන් බොධිවෘක්ෂ ය සමීපයට වඩනා සේක් කප්ලක්ෂයක් මුළුල්ලෙහි ප්‍රාර්ථනාකොට ආවා වූ සොත්තිය නම් බ්‍රාහමණයෙකු විසින් පිළිගන්වනලද කුසතණ අටමිටක් ගෙණ පපටිකා රහිත වන බැවින් සුපරිසුබ වූ කානතිමත් වන බැවින්

සිනිදු වූ ඉතා වට වූ ඍජු වූ කද ඇති ඝනකොට බඳනාලද මොණර පිල් කලඹෙක්හි පිල්මඩුල්ලක් බඳු වූ සදෘකාලයෙහි ම නිල්වූ පත් අතරතුරෙහි පබළුදලු පෙති හා සමාන වූ මද පවනින් කම්පිත වන පලලව පත්‍රයන් ඇති-

එසේ ම මන්දමාරුතයෙන් චලිත වූ සාධුයෙන් ප්‍රීතියෙන් නටන්නාක් වැනි වූ කද ඇති සියලු පෘථිවිමණ්ඩල ය අලංකාර කරන්නාවූ මනිකාන්තාවට තිලකාභරණයක් වැනි වූ තමින්වහන්සේ උපදිනා දවස් ම උපන්නා වූ හැම බුදුවරයන් බුදු වන ජයභූමියෙහි හට ගන්නාවූ එ හෙයින් ම විජයවෘක්ෂ වූ කරුණාවෙන් සීතල වූ තමින්වහන්සේගේ ලය සෙසින් සිහිල් වූ ඡායා ඇති අශ්වත්ථ නම් බොධිවෘක්ෂරාජ යා කරා එළඹ තුන්වරක් ප්‍රදක්ෂිණාකොට එශානී කෝණයෙහි සිටි සේක්-

සියලු සම්‍යඤ්ඣරයන් විසින් අවිජහිතස්ථානයෙහි තෘෂ්ණයන් අත් උඩුකුරුකොට සලා වගුරුවා තෙලි අහින් පරිභ්‍රාන්තවූවාක් මෙන් උපන්නා වූ තුදුස්රියන් පමණ වූ තෘෂ්ණාසන්ධ්‍යාණයෙන් දක්නා බැවින් ද තෘෂ්ණයෙන් නිපත් බැවින් ද නිර්ණාසයන ය යි කියනලද ජයපය්‍යඞ්ක ය මංගලපය්‍යඞ්ක ය යනාදී නම් ලද බොධිපය්‍යඞ්කා රූඪ ව වැඩහිඳ මෙසේ සිත ත් මේ මහාපෘථිවි ය යම් කාරණයකින් පරිවර්තන ය වෙත ත් සියදහස්ගණන් සෙන හෙන කල්හි ද ආකාශ පථ ය ශුෂ්කගර්ජනා වෙන් පැළෙන කල්හි දු නිහිගෙණ දිලියෙන කිහිරහුරු සමූහයන් වස්නට වන් කල්හි දු මාගේ මේ ශරීරයෙහි සේ ලේ ඇට නහර වියලී සුණුවිසුණු වන කල්හි දු සම්‍යක්සම්බොධියට පැමිණ මිස මාගේ වීර්‍ය්‍ය ය නොහරිමි සි ඉටා බඳනාලද බද්ධ්‍යඞ්ක ඇති ව වට මට සිඑටු වූ බෝකඳට පිටලා නැගෙණහිරට මූණලා වැඩ හුන් සේක.

එසේ හෙයින් නිදා-මහාබොධිවංසයෙහි

පටිසොතගාමිනිං සුවණ්ණ නාවා විසඡෙජිවා තතෝව සුරභි කුසුම සමලඞ්කතෙ නීලොභාසෙ මනොරමේ සාලවනෙ දිවාවිහාරං කත්වා දිවසාවසානෙ සුවණ්ණ පුරභි ගන්ධකුසුමෙසු වණ්ටතෝ පති ගලිත්වා චීවරසෙසා පරිපතමානෙසු සුරාසුර පූජිතාසු ඉන්දිවරාරවින්ද මණ්ඩාදී කුසුම වුට්ඨිධාරාසු නිරන්තරං වස්සමානාසු සුරකින්නර සුන්දරීසු සාධු කාරං දදමානාසු සුරනිවන්දන චුණ්ණ සමාකුලාසු කුසුම ධූම ධූම සුගන්ධිනිසු විවිධා චාරු මාඛජ මාලිනීසු.

දසසහස්සි ලොකධාතුසු කම්පමානාසු ලුලිත කමල කුමුද වනෙ මකරන්ද මධුබින්දු සන්‍යෝගවෙ කුසුමාමොදතප්පිතාලි ජාලෙ මන්ද මන්දං වහති ගන්ධවාහෙ දෙවගණාලඞ්කාත මහෙහන මනොහ

කුඹිනබෙහෙදය විජම්භමානෝ මිගරාජා විය බොධිදුමං සමීපං ගච්ඡ නෙනා සොත්තිය දිජෙපණ්ණත කුසමුට්ඨියෝ ගහෙත්වා සුපරිසුද්ධ සිනිඩ සුවට්ට උජුඝනඛඤ්ඤං ඝණබඩ මෝරපිඤ්ඡ කලාපමණ්ඩල සංකා සං නිච්චකාලං නීලපත්තං අනන්තරනන්තරා පවාලඞ්කුර දළුසන්නිභ ලලමාන රත්තපල්ලවං-

මහුනිල වලිත සාඛාහි නච්චන්තමි'ව පිනියා සකල පඨවි මණ්ඩලමලඞ්කරොන්තං ධරණිතල තිලකභූතං සහජාතා ජයහුම්ජං විජය පාදං නිජහදයමි'ව කරුණා සීතලං සීතලච්ඡායං අසසත්ථ බොධිමූපගන්ත්වා නිඝච්චතූ පදකිණං කත්වා පුබ්බුත්තර දිසාභාගෙ සිතො-

සබ්බ බුද්ධෙහි අවිජහිතට්ඨානෙ නිණාති වාලෙඛා තුලිකාහ පරිච්ඡින්න'මිව ජාතං චුද්දසහත්ථං නිණ සන්ථාරං දිසවා තසමිං විපරි වත්තමානායමපි මහාපඨවියං නිපතනෙනපූ'පි නිග්ඝාත සඝසෙසපූ ඵලනෙනපූපි පවනපථෙ පසසනෙනපූපි බදිරඞ්ගාර නිඝරෙපූ සුසස නෙනපූ'පි මෙ මංසලොහිතෙසු සම්මාසම්බොධිං අපපත්වා න විරියා සංහරිසසාමි'නි පල්ලඞ්කමාභුජ්ත්වා බොධිරුක්ඛමූලෙ පුරත්ථාභිමුඛෝ නිසීදි-සි.

මේසේ බොධිපයඞ්ඛාරුස ව වැඩහුන් කල්හි මෝහ නිමිර නිකර අසිසිර කිරණ වූ බොධිසත්වයන්ට අමරපුරෙශ්වර වූ **ශක්‍රදේ** වෙණ්ඩු තෙමේ එක්සිය විසි රියන් පමණ දිග ඇති භූවනොදරයෙහි ව්‍යාප්තවන ධවනි ඇති විජයුත්තර නම් සංඛ ය පිඹිමින් සිටියේ ය. එසේ ම **පඤ්චසිඛ** නම් වූ ගාන්ධර්ව දිව්‍යපුත්‍රතෙමේ තුන්ගවුවක් පමණ දිග ඇති බෙළුවපණ්ඩු මිණාව ගෙණ ගායනා කෙරෙමින් සිටියේ ය.

සුයාම නම් විබුධාධිපති තෙම තුන්ගවුවක් පමණ ඇති ශරත් කාලයෙහි චන්ද්‍රමරිචි සමූහයක් සේ සශ්‍රීක වූ දිව්‍යචාමර ය ගෙණ මදින් මදින් සලමින් සිටියේ ය. සන්තුසිත නම් දිව්‍යපුත්‍ර තෙම මැණික් තල්වැටක් ගෙණ සැප වූ පවන පරම්පරාවෙන් පිණවමින් සිටියේ ය. එසේ ම චතුර්මුඛොපලක්ෂිත හිරණ්‍යගර්භ සංඛ්‍යාත සහම්පති මහාබ්‍රහ්මතෙම තුන්යොදනක් පළල ඇති චිතිය පුන්සඳ මඬලක් වැනි වූ සෙතච්ඡත්‍ර ය මස්තකයෙහි දරමින් සිටියේ ය.

කාළ නම් නාගරාජතෙම දසසහසක් පමණ නාගකාවන් විසින් පිරිවරණ ලදු ව සතුති වචන සහස්‍රයන් ගායනාකෙරෙමින් සිටියේ ය. දෙතිස්දිව්‍ය පුත්‍රයන්ගේ දෙතිස් කුමාරිකාවෝ දිවම්ලින් සම්පූර්ණ වූ අනෙකවිධ රත්නාවුධ ගෙණ පුදමින් සිටියාහු ය සියලු දශසහස්‍රී ලොකධාතුයෙහි සියලු දෙවියෝ සැනවෙස් ගෙණ හාත්

පසින් නගණ ලද ධවජ පතාක හා කෙහෙල් තොරණ මල්දම් ගත් අත් ඇත්තාහු ගත්නාලද පුන්කලස හා දුම්ළොසු හා මිණිදඬුවැට පහත් ඇත්තාහු දරණ ලද රැවන්මය වූ සිරිවසපෙළ වල්ළිදුනා පෙළ ආදී වූ අෂ්ට මඞ්ගල පඞ්කතින් හා රැවන්මය වූ ආදර්ශී ය සි කියන ලද කැටපත් පඞ්කති ඇති ඔ ධරණීතල සංඛ්‍යාත පෘථිවියෙහි පටන් අකණිට්ඨ බ්‍රහ්මලෝක ය දක්වා අතුරක් නැතු ව ගැවසී පූජා කෙරෙමින් නිදිවාඩාරුවලායමාන ධානිගුණ සම්පන්න වූ බෝමැඩ වැඩහුන් බොධිසත්ත්වයන් පිරිවරා සිටියාහු ය.

වේ ද කියේ මැ නෝ-එහි ම.

තදා මිනාපුරිසස්ස දසසතනයනෝ විජයුත්තරා නාමං විසා සතායාමං භුවනව්වරව්‍යාපිනාදං සංඛං ධම්මයනෙතා අට්ඨාසි. තථා පඤ්චසිඛෝ ගන්ධබ්බපුත්තෝ නිගාවුතායතං බේළුවපණ්ඩුවීණං මාදාය වාදයනෙතා, සුයාම දෙවරාජා නිගාවුතායතා සරද සම්ය රජතිකර කරනිකර සස්සිරිකං දිබ්බවාම්රං ගහෙත්වා මන්ද මන්දං විජයමානෝ, සන්තුසිත දෙවරාජා මණිතාලවණ්ඨා ගහෙත්වා සුඛානිල පරම්පරාහි සන්තාපෙපනෙතා, සහම්පති මහාබ්‍රහමා නියොජන විත්ථතං දුනියම්ව පුණ්ණවිඳුං සෙතච්ඡත්තා උපරි ධාරයනෙතා-

කාළෝ නාගරාජා අසිනිසහස්ස නාටිකා පරිවුතෝ ථුතිවවන සහස්සානි ගායනෙතා අට්ඨාසි. ඛත්තිංස දෙව කුමාරියෝ දිබ්බ පූපඵසම්පුණ්ණ විවිධරතන මඤ්ජූසා ගහෙත්වා පූජයනතියෝ අට්ඨංසු. සකල දසසහස්ස චක්කවාළ දෙවතා ජාණ වෙසං ගහෙත්වා සමන්තා සම්මසින ධජපතාක කදලිතොරණ කුසුමදාමහත්ථා ගන්ධ පුණ්ණ ඝටධූම කටච්ඡු මණිදණ්ඩදීප ධාරිණා අට්ඨමඞ්ගල රතනාදාස පන්නි යෙ පඨවිතෝ යාව අකණිට්ඨා නිරන්තරං අට්ඨංසු-සි

එසමයෙහි මාරදිව්‍යපුත්‍රතෙම සිඛාසී කුමාරතෙමේ මාගේ විෂය අතික්‍රාන්ත කරණු කැමැත්තේ වී ය. ඔහුට මාගේ විෂය අතික්‍රාන්තකොට ගත නොදෙමි සි මරසෙනඟ සමීපයට ගොස් එප වත් කියා බ්‍රහ්මාණ්ඩ ය දක්වා ඇති දිව්‍යබ්‍රහ්මයන් වෙවුල්වන මාර ඝොෂා නම් වූ ඝොෂාවක් කොට ඒ භෙරිඝොෂාව අසා නොයෙක් ආයුධගෙණ අවුත් ඔහු පිරිවැරූ මරසෙන් ගෙණ නික්මුණේ ය. ඒ මරසෙනඟ මරහුට ඉදිරි ව අටසාලිස් ගවුවෙක දිවෙති. දකුණාලු යෙන් අටසාළිස් ගවුවෙක දිවෙති. වම් ඇලයෙන් අටසාළිස් ගවුවෙක දිවෙති. පශ්චාත්භාගයෙන් මුහුදු රළ සේ චක්‍රවාට පර්වත ය දක්වා දිවයෙති. උඩින් සතිස් ගවුවෙක දිව යෙති.

ඒ මරසෙනඟගේ ඝොෂාව සාරදහසක් ගවුයෙහි පොළව පැලී යන හඬක් සේ ඇසෙයි. ඉක්බිත්තෙන් මරදෙව්පුත් යෙලසියයක්

යොදුන් ගිරි මෙඛලා තම් ඇත්රජෙකුට ආරූඪ ව් හස්සාසහස්සයක් මවා අනෙක ප්‍රකාර ආයුධ ගත්තේ ය. අවශෙෂ මාරපිරිසෙනු දු දෙදෙනෙක් එකෙක් ගත් ආයුධයක් නොහෙණ විශෙෂ ආයුධ ගත්තාහු අනෙක ප්‍රකාරවූ වර්ණ හා අනෙක ප්‍රකාර වූ මුඛ මවා නෙණ ගුරුළු රජක්හු ගන්නට නික්මෙන දියඹරනන් සේ නෙලොලෙ කෙක ප්‍රවර සුරදුම් වූ බොධිසත්වයන් මැඩපවත් වින්නට නික් මුණාහු ය.

මෙම සිහ—අවිදූරෙ නිදානයෙහි.

තසම්ං සමයෙ මාරො දෙවපුත්තො සිඛණ්ඩිකුමාරෙ මියාං වසං අනික්කමිතුකාමෙ නදනිසස අනික්කමිතුං දස්සාමී'ති මාර බලස්ස සන්තිකං ගන්ත්වා එතමත්ථං ආරොචෙත්වා මාරඝොසනං නාම ඝොසාපෙත්වා මාරබලං ආදය නික්ඛමි. සා මාරසෙනා මාරස්ස පුරතො දවාදසයොජනානි හොති. දක්ඛිණතො ච වාම තො ච දවා දසයොජනානි, පච්ඡතො යාව චක්කවාලපරියන්තං ඨත්වා සිතා උද්ධං නවයොජනුබෙඛධා, යස්සා උන්නා ද සද්දෙ යොජන සහස්සතො පට්ඨාය පථවි උදීරයන සදේන වීය සුයති. අථ මාරෙ දෙවපුත්තො දියඩ්යොජන සතිකං ගිරිමෙඛලං නාම හත්ථිං අභිරුහිත්වා බාහු සහස්සං මාපෙත්වා නානාවුධානි අග්ගහෙසි. අවසෙසාපි මාරපරි සාය වෙජනා එකසදිසකං ආයුධං නගණ්හිංසු නානපපකාර වණණා නානපපකාර මුඛා හුත්වා මහාසත්තං අභිකාත්තරමානා ආගම්ංසු.

මෙසේ මරසෙන් බෝමැඩට එලඹෙත් එලඹෙත් බොධි සත්වයන් පුරිවරා සිටි දෙවියන් අතුරෙහි එකෙකු දු සිටිනට අසමර්ථ වූහ. අභිමුඛ අභිමුඛ දිසාවෙහි පලාගියාහු ය. කාළ නම් නාගරාජතෙම පොළොව කිම්ද තමන්ගේ පන්සියයක් යොදුන් මාංජෙරික නාගභවනයට ගොස් උභය හස්තයෙන් මුහුණ වසා ගෙණ වැද හොක්තේ ය.

සක්දෙවි රජතෙම විජයුත්තර නම් සඬ්ඛ ය පිට වතුරාවා ගෙණ සක්වළගල මුදුනට නැඟී සිටියේ ය. මහාබ්‍රහ්ම රාජ තෙම අත තුබූ සෙතච්ඡත්‍ර ය සක්වලගල මුවව්ට දමා තමාගේ බ්‍රහ්මලොකයට ම ගියේ ය. එක් දෙවතාවෙකු දු සිටිනට අසමර්ථවූවා ය. ධෘති ර්‍යස්‍යාදි ගුණභාරධාර ධරණීධරායමාන වූ මහාපුරුෂයානන් වහන්සේ හුදකලාව ම වැඩහුන් සේක.

හෙ ද කියේ මැ නෝ

මාරබලං පන බොධිමණ්ඩූපසංකමනෙත උපසංකමනෙත තෙසං එකොපි ඨාතුං නාසක්ඛි. සම්මුඛ සම්මුඛට්ඨානෙනෙ ව පලාසිංසු. කාළො නාගරාජා පථවියං නිමුජ්ජිත්වා පඤ්චයොජන

සතිකං මාසෙජ්ඣිකං නාගභවනං ගන්ත්වා උභොහි හත්ථෙහි මුඛං පිදහිත්වා නිපජ්ජාපෙත්වා, සකෙකා විජයුත්තර සංඛං පිට්ඨියං කත්වා චක්කවාළ මුඛ විට්ටියං අධ්‍යාසි. මහාබ්‍රහ්මා සෙතච්ඡත්තං චක්ක වාළ කොට්ටියං ඨපෙත්වා බ්‍රහ්මලොක‘මේව අගම්සි. එකා දෙවතාපි ඨාතුං සමත්ථෝ නාහොසි. මහාපුරිසෝ එකකොං‘ව නිසීදි-සි.

මේසේ වැඩහුන්නා වූ ප්‍රඥාසිරි නිකෙත වූ අවලගුණ වජ්‍රා වලම්භන වූ මාගේ සවාමිදරුවාණන් වහන්සේ යථොක්ත ප්‍රකාරයෙන් එන මරසෙනහ දූක මෙහෙක් මරසෙනහ මා එක්කෙණෙකුත් උදෙසා මහත් ව්‍යායාමයක්, මහත් වූ උත්සාහයක් කරන්නාහු වෙති. මේ සථානයෙහි මාගේ මාතෘ පිතෘ කෙණෙක් හෝ භ්‍රාතෘ කෙණෙක් හෝ කිසි නැකෙණෙක් හෝ නැත. මාගේ මේ දස පාරමිතාවෝ වනාහි මා විසින් දිඝිකාලයක් මුළුල්ලෙහි පොෂ්‍ය කළ පිරිසක් වැන්නේ ය.

එසේ නෙයින් පාරමී ධර්මයන් ඵලකකොට පාරමී ධර්මයන් නැමැති ශස්ත්‍රයෙන් ම පැහැර මේ මරසෙනහ මා විසින් විධ්වංශන ය කරන්නට වටනේ ය යි දැනැදී දශපාරමී ධර්මයන් ආවර්ජනා කෙරෙමින් දෙදෙවුලොව දෙවියන් විසින් පිරිවරණ ලදු ව ප්‍රේත සෙනහට භය නොවන සක්දෙවි රජහු සෙයින් සිංහරාජ යන් විසින් පිරිවරණ ලදු ව ශ්‍වඛ්‍යාල සෙනහට භය නොවන සම්‍යඤ්ඤා සම්පන්නා උත්තම කෙශර සිංහරාජයාහු සෙයින් මාගේ සවාමිදරු වූ තෙවින් වහන්සේගේ තේජස් නැමැති ගිනි කදෙහි මිරිසෙන් නැමැති පළඟැටියහු ගැසී වැටෙනි සි සිතා නිර්භීත ව වැඩහුන් සේක් මි ය.

කියේ මැනෝ.

මහාපුරිසෝ‘පි තිනි පඤ්ඤානි ඔලොකෙත්වා සබ්බදෙවතානං පලාතත්තා සුඤ්ඤානි අද්දස. පුන උත්තරපඤ්ඤාන මාරබලං අජ්ඣාසත්තමිනා දිස්වා අයං එත්තකොා ජනෝ මං එකකං සඤ්ඤාය මහන්තං වායාමං පරක්කමං කරොති. ඉමස්මිං ඨානෙ මයනං මාතා වා පිතා වා භාතා වා අඤ්ඤතරා වා කොචි ඤාතකෝ නත්ථි. ඉමා පන දසපාරමි‘යොව මයහං දීඝරත්තං පුථ්ථපරිජන සදිසා, තස්මා පාරමියොව ඵලකං කත්වා පාරමී ඤඤෙනෙව පහරිත්වා අයං බලකායා මයා විධංසෙතුා වට්ටතී‘ති දසපාරමියෝ ආවජ්ජමානෝ නිසීදි-සි.

ඉච්ඛිත්තෙන් මාරදිව්‍යරාජ තෙමේ මෙසින් ම සිඛාවී කුමාරයන් පලවම් හි සිතා කල්පාන්ත වාතයක් වැනි වූ මහත් වාතයක් නගා මෙහෙයා ලී ය. එ කෙණෙහි ම පෙඟරසත්‍යාදි හෙද ඇති වාතයෝ නැගී අඩ යොදුන් සම යොදුන් දෙයොදුන් තුන්

යොදුන් පමණ පර්‍වත කූටයන් ප්‍රදලන ය කොට වනගස් වෘක්ෂාදින් උන්මූලන ය කොට හාත්පසින් ග්‍රාම නිගමයන් සුණුවිසුණු කරන්නට සමර්ථ වුව ද ධීර ධීර ගුණ ප්‍රභාකර වූ මහාපුරුෂයන් වහන්සේගේ අසදෘශානුභාවයෙන් බොධිසත්වයන් කරා පැමිණ සිවුරු කොණක් පමණකු දු සොලවන්නට නො හැකි වූහ.

කියේ මෑ නෝ.

අථ මාරෝ දෙවපුත්තෝ එතෙනේ'ව සිද්ධත්තං පලාපෙස්සා මීහි, වාතමණ්ඩලං සමුට්ඨාපෙසි. තං ඛණංයෙව පුරත්ථිමාදි භෙදා වාතා සමුට්ඨහිත්වා අඩ්ඪයොජන යොජන දවියොජන තියොජන පපමාණානි පබ්බතකූටානි පදාලෙත්වා වනගච්ඡ රුක්ඛාදිනි උම්මූලෙත්වා සමන්තා ගාම නිගමෙසු චුණ්ණ විචුණ්ණං කාතුං සමත්ථාපි මහාපුරිසස්ස පුඤ්ඤතෙජෙන විගතානුභාවා බොධිසත්තං පත්වා චීවරකණ්ණමත්තනමපි චාලෙතුං නාසක්කිංසු -සි.

ඉක්බිත්තෙන් මෝහු උදකයෙන් අජ්ඣොත්ථරණ ය කොට මරම්සි කියා කල්පාන්ත වර්‍ෂාවක් සේ මහත් මහත් වූ වර්‍ෂාවක් වැස් වි ය. ඔහුගේ ආනුභාවයෙන් මතු මත්තෙහි සතපටල සහස්‍ර පටලාදී භෙද ඇති ව වලාහකයෝ නැඟී වස්නට වන්හ වර්‍ෂාධාරා වේගයෙන් පාවිවි ය ඡිද්‍රවෙමින් වනවෘක්ෂාදින්ගේ උපරිභාගයෙන් මහ චතුරා අවුත් මාරනිමිර නිකර අසිසිර කිරණයමාන වූ මහාපුරුෂයානන් වහන්සේ කරා පැමිණ ඔබගේ චීවරයෙහි පිහිණි බිඳුවක් පමණ සථානයකු දු තෙමන්නට අසමර්ථ වි ය.

හෙ ද කියේ මෑ නෝ

තතෝ උදකෙන තං අජ්ඣොත්ථරිත්වා මාරෙස්සාමී'ති මහා වස්සං සමුට්ඨාපෙසි. තස්සානුභාවෙන උපරුපරි සතපටල සහස්ස පටලාදි භෙද වලාහකා උට්ඨහිත්වා වස්සිංසු. වුත්තධාරා වෙගෙන පථවි ඡිද්දා අහොසි. වනරුක්ඛාදිනං උපරිභාගෙන මහාඔඝෝ ආගන්ත්වා මහාසත්තස්ස චීවරෙ උස්සාව බින්දුට්ඨානමත්තනමපි තෙ මෙතුං නාසක්ඛි-සි.

ඉක්බිත්තෙන් පර්‍වත වැස්සක් වැස් වි ය මහත් මහත් පර්‍වත කූටයෝ දුම්මින් ගිනි ගෙණ දිලියෙමින් ගගනතලයෙන් අවුත් ත්‍රිවිධාගනි නිර්‍මාපණ සද්ධම් මෙඝ ඇති බොධිසත්වයන් කරා පැමිණ දිව්‍යමාලාගුල භාවයට පැමිණිය හ.

කියේ මෑ නෝ.

තතෝ පාසාණවස්සං සමුට්ඨාපෙසි. මහන්තානි මහන්තානි පබ්බතකූටානි ධූපායන්තානි පජ්ජලන්තානි ආකාසෙනා'ගන්ත්වා බොධිසත්තා පත්වා දිබ්බමාලාගුල භාවා ආපජ්ජිංසු -යි

ඉක්බිත්තෙන් ආයුධ වර්ෂාවක් වැස්සේ ය. එ කෙණෙහි එක ධාරා ද්විධාරා කඩු කොන්ත සර තෝමර මැඩගහුදුනු ශර ආදි වූ ඒ සූක්ෂ්ම වූ ආයුධ වර්ෂාවෝ දුම්මින් ගිනි ගෙණ දිලියෙමින් ආකාශයෙන් අවුත් ප්‍රවරතර ප්‍රභූනිධි නිකෙත වූ බෝධිසත්වයන් කරා පැමිණ දිවමල් පූජාවක් මෙන් වූහ.

එසින් කිහ.

තතෝ පහරණ වස්සං සමුට්ඨාපෙසි. එකතොධාරා උභතොධාරා අසි සත්ති ඛුරපාදයෝ ධූපායන්තා පජ්ජලන්තා ආකාසෙනා ගන්ත්වා බොධිසත්තං පත්වා දිබ්බපුප්ඵානි අහෙසුං-සී.

ඉක්බිත්තෙන් මොහු දවා හළුකෙරෙමි සි කියා අහුරු වැස්සක් වස්වා ලී ය. කිංසුක වණ්ණ වූ අඞ්ගාරයෝ ආකාසයෙන් අවුත් කෙලශ මක්ඛික වත්නිසකක්ඛායමාන වූ බොධිසත්වයන් කරා පැමිණ ශ්‍රී පාදමූලයෙහි පිදූ දිව මල් පූජාවක් මෙන් වැගිර ගියහ.

එසින් කිහ

තතෝ අඞ්ගාර වස්සං සමුට්ඨාපෙසි. කිංසුකවණ්ණා අඞ්ගාරා ආකාසෙනාගන්ත්වා බොධිසත්තස්ස පාදමූලෙ දිබ්බපුප්ඵානි හුත්වා විකිරිංසු-සි.

ඉක්බිත්තෙන් හුණුඇළ වර්ෂාවක් වැස්සේ ය. අත්‍යුෂ්ණ වූ අග්නි වර්ණ වූ ඒ ඡාරිකා ආකාසයෙන් අවුත් සජීකෙලශාග්නි නිර්වාපණ ගඞ්ගාප්‍රවාහ වූ බොධිසත්වයන් කරා පැමිණ ශ්‍රීපාද මූලයෙහි චන්දන චූර්ණ ව වැගිර ගියහ.

එසින් කිහ

තතෝ කුක්කුල වස්සං සමුට්ඨාපෙසි. අච්චුණ්හා අග්ගි වණ්ණා කුක්කුලෝ ආකාසෙනාගන්ත්වා බොධිසත්තස්ස පාද මූලෙ චන්දනචුණ්ණා හුත්වා නිපති-සි.

ඉක්බිත්තෙන් මහත් වැලි වර්ෂාවක් වස්වා ලී ය. එ කෙණෙහි අති සියුම් වැලි දුම්මින් දිලිසෙමින් ආකාසයෙන් අවුත් සජීලෝ කෙක තිලක වූ බොධිසත්වයන් කරා පැමිණ ශ්‍රීපාදමූලයෙහි දිව්‍ය පුෂ්පයන් ව ප්‍රපතිත වූහ.

එසින් කිහ.

තතෝ වාලුකවස්සං සමුට්ඨාපෙසි. අතිසුඛුම වාලුකා ධූපායන්තා පජ්ජලන්තා ආකාසෙනා ගන්ත්වා බොධිසත්තස්ස පාදමූලෙ දිබ්බපුප්ඵානි හුත්වා නිපතිංසු-සි.

ඉක්බිත්තෙන් ගිනිගෙණ දිලිහෙන කළල් විශ්වාස වැස්සී ය. ඒ මඩ කළල් දුමමින් දිලිසෙමින් ආකාසයෙන් අවුත් තෙලොකෙකාවායෑ වූ බොධිසත්වයන් කරා පැමිණ ශ්‍රීපාදමූලයෙහි දිවි විලවුන් ව නිපතිත වූහ.

එසින් යහ

තතො කළල වස්සං සමුඨාපෙසි. තං කළලං ධූපායන්තං පජ්ජලංතං ආකාසෙනාගන්ත්වා බොධිසත්තස්ස පාදමූලෙ දිබ්බ විලෙපනං හුත්වා නිපති-සි.

ඉක්බිත්තෙන් අඳුරෙන් භය ගත්වා සිඩාඑී යා පලවම් සි ගණඳුරක් නැගී ය. ඒ අඛ්කාර ය චතුරඛ්ග සමන්විත වෙමින් සවාසනා සමෙමාහ තිමිර නිකර සහස්‍ර කිරණායමාන වූ බොධි සත්වයන් කරා පැමිණ සූයස්‍ප්‍රභාව වැදගත් කලත් මෙන් අඳුරු අතුරු දන්කොට ආලොක පැනිරින.

කි සේ මැ නෝ

තතො ඉමිනා හිංසෙත්වා සිඛත්තං පලාපෙස්සා'මීති අඛ්කාරං සමුඨාපෙසි. තං චතුරඛ්ග සමන්නාගතං විය මහාතමං ගුත්වා බොධිසත්තං පත්වා පුරියපපහා විහතං විය අඛ්කාරං අන්තරධායි—සි.

මෙසේ මාරදිව්‍යරාජතෙම වාහවතී - පාෂාණ - ප්‍රහරණ ඛාර - කුකකුල - වාළක කළලාඛ්කාර ය සි කියන ලද මේ නව විධ වශියෙන් නිශ්චල ගුණමහිම ධරණී ධාරයමාන වූ බොධිසත්ව යන් පලවන්නට නොහැකි වූ තැනැත්තේ තමා කළ කළ දෙය පූජාවට වන්වා දැක තමාගේ මරසෙනහට ආමන්ත්‍රණ ය කොට කිපී, එම්බා තොපි කුමක් කරමින් සිටිවු ද? මේ සිඩාඑී යා වහා ගණු ව - විදු ව - බඳු ව · ගෙණෙ ව - යා නොදෙව සි යනාදීන් කිය කියා තමා ද ගිරිමෙඛලා නම් ඇත්රජ පිට හුන්නේ—

චක්‍රායුධ ය ගෙණ ත්‍රිභුවන ජන භ්‍රමර නිසෙවිත පාදාරවි ඳෙපලක්ෂිත වූ බොධිසත්වයන් කරා පැමිණ "සිඩාඑී ය! මේ පයඞ්ඛ ය තෝ සතු නොවෙ සි" මා සතු ය. එ හෙයින් මාගේ පයඞ්ඛයෙහි නො හිද හැගීසිටුව සි කියා සමුපචිත කුසලබල ඇති ඍෂිත්‍රි ය කුලසම්භූත වූ තොප වැන්නවුන්ට මේ චක්‍රරත්න ය අයිති නොවන්නේ ය. අප වැනි සැඩොලන්ට මේ චක්‍ර රත්න ය අයිති ය සි කියන්නා සේ කිසි භය චකිතයක් නැති ව කියේ ය.

හෙ ද දක්වන ලදි.

එවං මාරෝ ඉමිනා නවහි වාත වස්ස පාසාණ පහර ඛණ්ඩාර කුඨකුල වාලික කළලඛඤාර වුට්ඨිහි බොධිසත්තං පලාපෙතුං අසක්කොන්තෝ'' කිං භණේ නිඨථ, ඉමං කුමාරං ගණ්හථ ගහථ පලාපෙථා'නි පරිසං ආණාපෙත්වා සයම්පි ගිරි මේඛලස්ස හත්ථිනෝ බන්ධේ නිසිත්තෝ චක්කායුධං ආදාය බෝධි සත්තං උපසඞ්කමිත්වා'' සිඛණ්ඩි උඨහථ, එතස්මා පලලඞ්කා නායං තුයහං පාපුණාති මයහං එසෝ පාපුණාති''ති ආහ—සි.

එ පවත් අසා ත්‍රිභුවන භවන සවර්ණ ථූපිකා වූ බොධි සත්වයෝ ''පාපී වූ මාර ය තා විසින් පිරූ දසපාරමිතාවකුත් නැත. දස උප පාරමිතාවකුත් නැත. දස පරමාර්ථ පාරමිතාව කුත් නැත. සළ පඤ්චමහා පරිත්‍යාගයකුත් නැත. පිරූ ඥානාර්ථ චරියාවකුත් නැත. ලොකාර්ථ චරියාවකුත් නැත. බුඛ්චරියාවකුත් නැත. එ හෙයින් තට මේ පය්‍යඞ්කය නො පැමිණෙ සි මට මේ අස්න පැමිණෙන්නේ''ය සි වදාළ සේකි.

කියේ මැනෝ.

මහාසත්තෝ තස්ස වචනං සුත්වා අවොච ''මාර! නෙව තයා දසපාරමියෝ පූරිතා න උපපාරමියෝ න පරමත්ථ පාරමියෝ නපි පඤ්චමහාපරිච්චාගෙ පරිච්චත්තා න ඤාණත්ථචරියා න ලොකත්ථචරියා න බුද්ධිචරියා පූරිතා. නා'යං පල්ලඞ්කෝ තුයහං පාපුණාති මයෙහෙවෙසෝ පාපුණාති''—සි.

එ පවත් ඇසූ මාරදිව්‍ය රාජතෙම කිපී ක්‍රොධ ඉවසාගත නොහී සනරාමර ලොක ප්‍රතිවර්නිත නිරුත්තර ධම්මක්‍ර ප්‍රවර්තනයෙහි සමර්ථ වූ මහාපුරුෂයාණන් වහන්සේට තමාගේ මහානුභාව සම්පන්න වූ චක්‍රායුධ ය දමා ගැසී ය. ඒ චක්‍රායුධ ය දස පාරමීධර්මයන් ආවර්ජන ය කරන්නා වූ මෝහ තමිස් ප්‍රඛණ්ඩ විද්වංඝන ප්‍රවරාදිත්‍ය වූ මහාපුරුෂයානන් වහන්සේගේ මස්තක යෙහි මල්වියනක් මෙන් සැදී සිට ගත.

හෙ ද කිහ

මාරෝ කුද්ධෝ කොධවෙගා අසහන්තෝ මහාපුරිසස්ස චක්කායුධං විස්සජ්ජෙසි. තං තස්ස දසපාරමියෝ ආවජ්ජෙත්වත්තස්ස උපරිභාගෙ මාලාවිතානං හුත්වා අට්ඨාසි—සි.

ක්ෂුරධාරා සංඛ්‍යාත කර මුවහත් ඇති ඒ චක්‍රායුධ ය වනාහි සෙසූ දවස්හි කිපී ඔහු විසින් ගැසී තම් ඒක ඝණ මහමෙර සා ගල්ටැඹෙක්හි දූ වැදුනහොත් වංස කලීර සංඛ්‍යාත හුන දළුවක් සේ සිදී යෙයි. මෙහි වනාහි ධෘතිගුණ සම්පන්න වූ බොධිසත්වයන් කරා පැමිණ මල් වියනක් සේ සිට ගත්තේ ය.

එ කල්හි අවසෙස මරසෙනහ මේ විට පලහින් නැගී යන්නේ ය යි ගිණිගෙන දිලියෙන මහත් මහත් පර්වතකූටයන් දමාලූ ය. ඒ පර්වත කූටයෝ දශපාරමී ධර්මයන් ආවර්ජන ය කරන්නා වූ තිඛිර තිමිර නිකර දසසත කිරණායමාන වූ මහාපුරුෂයානන් වහන්සේට මල්වට බවට පැමිණ භූමියෙහි ප්‍රපතිත වූවාහු ය. එ කෙණෙහි සෙසු දෙවතාවෝ සක්වළහල මේරිට සිටියාහු කර ඔසව ඔසවා බල බලා හවත්නි! අද සිඛාසී කුමාරයන්ගේ රූපාග්‍රප්‍රාප්ත වූ ආත්මභාව ය නැසුනේ ය. කුමක් කරන්නේ ද යි කියා බලත් ම ය.

හෙ ද නිහ.

දෙවතා වක්කවාළ මුඛවට්ටියං ඨිත්වා තිවං පසාරෙත්වා සිසා උක්කිපිත්වා උක්කිපිත්වා තථෝ වත හෝ සිද්ධත්ථකුමාරෝ පත්තෝ අත්තභාවෝ කිනනු ඛෝ කරිස්සතී'ති ඔලොකෙන්ති සී.

ඉක්බිත්තෙන් වාදීහකුම්භ විදාරණ ප්‍රවර ඛිංගරාජ වූ මහා පුරුෂයානෝ පූරිත පාරමී ධර්මයන් ඇති [illegible] බුදුවන දවසෙහි ප්‍රාප්ත වන පර්‍යාඞ්කය මට [illegible] සිවි මාරයාට බණවා, මාර ය! මේ පර්‍යාඞ්කය තට පැමණෙයි කිය යි. තෝ මේ පර්‍යාඞ්කය නිසා පෙරැම් පුරමින් දන් දුන් බැව්හි කටරෙක් සාක්ෂිදෑ යි වදාළ සේක. එ පවත් ඇසූ මාර තෙම මාගේ මේ මරසෙනහ සාක්ෂි ය යි කියා මාරසෙනානිමුඛ කොට අත දිගුකෙළේ ය. එ කෙණෙහි මරසෙනහ මම සාක්ෂි යෙමි යි මම සාක්ෂි යෙමි යි කිය කියා පැවැත් වූ ශබ්ද ය පොළොව පැලෙන හඬක් සෙයින් මහත් ව බඹලොව දක්වා නැගි දෙව් බඹුන් භයපත්කර වී ය. ඉක්බිත්තෙන් මාරදිව්‍යරාජතෙම සිද්ධාඛියෙනි! තොපගේ දානයෙහි කවරෙක් සාක්ෂිදෑ යි විවාළේ ය.

එ පවත් ඇසූ විනෙයජන කුමුදුවන තරුණාකිමණ්ඩල වූ මහා පුරුෂයන් වහන්සේ පාපී වූ මාර ය! තාගේ දානයෙහි සාක්ෂිවූයේ සවෙතන වූ තාගේ පිරිස් ම ය. මට මේ සථානයෙහි සවෙතන වූ කිසිකෙණෙක් සාක්ෂි කියන්නට නැත. මාගේ සාරා සංඛ්‍ය කප්සුවහස්යෙහි දුන් දන් හැර එක ම වෙස්සන්තරාත්ම භාවයෙහි සිට සප්ත ශතක දානය දීමෙහි මේ අවෙතන පෘථිවි ය සාක්ෂි ය යි. රන් වලාගැබකින් නික්මුණු විදුලිය කළඹක් සේ චීවර ගර්භයෙන් දක්ෂිණ ශ්‍රී හස්ත ය ප්‍රසාරණයකොට වෙස්සන්ත රාත්මභාවයෙහි සිට දෙනලද මාගේ සප්ත ශතක දානයෙහි නි

සාක්ෂි ඇද්ද නැද්දැ යි වදාරා මහාපෘථිවියට අභිමුඛකොට ශ්‍රී හස්ත ය දිගු කළ සේක. එ කල මහාපාථිවි ය මම එ කල්හි නොපට සාක්ෂි යෙමි යි කියා සහාරාවයෙන් සහශ්‍ර රාවයෙන් ශත සහස්‍රාවයෙන් මරසෙනහ අවත්‍රාසමාන ය කරන්නියක්හු මෙන් ගුගුරා නැගියාහ.

එසින් කිහ.

තතෝ මහාපුරිසෝ පූරිතපාරමීනං බොධිසත්තානං අභි සම්බුජ්ඣනදිවසෙ සත්තපල්ලඞ්කා මයහා පාපුණාතී'ති වත්වා සීතං මාරං ආහ. මාර තුයහං දානස්ස දින්නභාවෙ කෝ සක්ඛී'ති ආහ. මාරෝ ඉමෙ එත්තකා සක්ඛිනෝ'ති මාරබලානිමුඛං හත්ථං පසාරෙසි. තස්මිං ඛණෙ මාරපරිසා අහං සක්ඛි, අහං සක්ඛී'ති පවත්තසද්දෝ, පථවි උද්‍රියන සද්ද සදිසෝ අහොසි. අථ මාරෝ මහා පුරිසං ආහ: සිඛණ්ඩි තුයහං දානස්ස දින්නභාවෙ කෝ සක්ඛී'ති මහා පුරිසෝ තුයහං තාව දානස්ස දින්නභාවෙ සවෙතනා සක්ඛිනෝ, මයහං පන ඉමස්මිං ඨානෙ සවෙතනෝ කොචි සක්ඛි නාම නත්ථි. තිඨතු තාව මේ අවසෙසත්තභාවෙසු දින්නදානං, වෙස්සන්තරත්තභාවෙ පන ඨත්වා සත්තසතක මහා දානස්ස තාව දින්නභාවෙ අයං අවෙනා'පි ඝණමහාපථවි සක්ඛී'ති විවරගබ්භන්තරතෝ දක්ඛිණහත්ථං අභිනීහරිත්වා වෙස්සන්තරත්ත භාවෙ ඨත්වා මයහං සත්තසතක මහාදානස්ස දින්නභාවෙ ඉමං සක්ඛි-න සක්ඛි,නි මහාපථවි අභිමුඛං හත්ථං පසාරෙසි. මහා පථවි අහං තෙ තදා සක්ඛී'ති විරාව සතෙන විරාව සහස්සෙන විරාව සතසහස්සෙන මාරබලං අවත්‍රාසමානා විය උන්නදි--සි.

රත්නමාලී වෛත්‍යකථා නම් වූ ථූපවංශයෙහි වනාහි එ වේලෙහි පොළොව පළාගෙණ මී දේදූ මාරුක් මලක් සහිත රන් කලසක් වම් අත්ලෙන් දරාගෙණ සවාමිදරුවාතත් දකුණු දන මඩලට නුදුරුතෙනින් පොළොව පළාගෙණ නැගී දකුණත ඔසවාගෙන බුදුබව සවාමීන්ට මා යි තුන්ලොවට ඇසෙන සේ තුන්විටක් කොට දෙස් කියා එව, එ වේලෙහි වසවර්තිමාරයා පැරද පලාගියේ ය සි යනු කවර නම් පෙල අටුවාවෙක තුබූ වූවා දෝ ගෙණ දැක්වූහු ඉක්බිත්තෙන් ත්‍රෛලොක්‍යෛක බන්ධු වූ මහ පුරුෂයානන් වහන්සේ වෙසතුරු අත්බැවිහි දුන් උතුම් වූ මහා දාන ය සම්මර්ශන ය කරත් කරත් දියඬ්සයොජන සහස්‍රික සංඛ්‍යාත පෙළසියයක් යොදුන් උස ඇති ගිරිමෙඛලා නම් හස්තිරාජ තෙම බුදුන් දිසාවට දනබිම් ඇත වැටී ගියේ ය.

මරපිරිස දිසා විදිසායෙහි ගියහ. දෙදෙනෙක් එකමග ගියෝ නම් නැත. ශීර්ෂාභරණ උතුරුසළු ආදි ය දමා හිස් වූ වූ

අතෙහි කල්‍යාණනවාත ය වැදගත් ඉඟුල්පුළුන් සේ වෙවුල වෙවුලා පලාගිය හ. මහා පූජාවලියෙහි වනාහි ඒ වසවර්ති මාරයා ඇතුපිටින් බිම හි දහසක් අවි සලා සිඛාඬීකුමාරයෙනි! තොප බල ඇති බව දනිමි ම ය. තොප තෙද ඇති බව දනිමි ම ය. තොප පින් ඇති බව දනිමි ම ය. තොප සමතිස් පෙරුම් පිරූ බව දනිමි ම ය. තොපගේ වීරත්ව ය මුළුලොවට හඟවමි. තොපගේ බල දක්වන්නට ආමි. මා ක්‍ෂමා කරව. මා ක්‍ෂමා කරව යි තුන් යලක් කියා තමාගේ වසවර්ති දිව්‍යලොකයට දිව ලජ්ජාවෙන් තමාගේ සෙනහ මුහුණු බැලිය නොහෙනු යේ යහතෙහි මුහුණින් සුසුන් ලලා වැදහොත්තේ ය යි යනු කිහු. මෙසේ දුවන්නා වූ පිරිස් සහිත මාරයා දුටු දිව්‍යසමූහයෝ වස වර්තිමාරයාහට පරාජය වි ය. සිඛාඬීකුමාරයන්ට ජය වි ය.

එ හෙයින් ජය පූජාකරම්හ යි නාගයෝ නාගයන්ට සුපර්ණයෝ සුපර්ණයන්ට දෙවතාවෝ දෙවතාවන්ට බ්‍රහමයෝ බ්‍රහමයන්ට කියා ගඬමාලාදීන් ගන්නා ලද අත් ඇති ව සුර නර මුනි මනුජ වන්දනීය මහාපුරුෂයානන් වහන්සේගේ සමීපයට බෝමැඩට එළඹියාහු ය.

කියේ මැ නෝ.

තතෝ මහාපුරිසෙ දිස්‍සනං තෙ සිඛත්ථ මහාදනං උත්තම දුන'නති වෙස්සන්තරදනං සම්මසන්තෙ සම්මසන්තෙ දියඩ්ඪයොජන සතිකෙ ගිරිමෙඛලාහත්ථි ජණ්ණුකෙහි පතිඨාසි. මාරපරිසා දිසාවිදිසා ඵලායි. දෙව එකමගෙහන ගතා නාම නත්ථි. සීසාහරණානි චෙව නිවත්ථ වත්ථානි ච පහාය සම්මුඛ සම්මුඛදිසාහි එව ජලායිංසු. තතෝ දෙවසංඝා පලායමානං මාරබලං දිසවා මාරස්‍ස පරාජයෝ ජාතො, සිඛත්ථ කුමාරස්‍ස ජයො, ජයපූජං කරිස්සා මා'නි නාගා නාගානං සුපණ්ණා සුපණ්ණානං දෙවතා දෙවතානං බ්‍රහමානො බ්‍රහමානං පෙසෙත්වා ගඬමාලාදිහත්ථා මහාපුරිසස්‍ස සන්තිකං බොධිපල්ලඬකං අගමංසු—සි.

මෙසේ ආවාවුන් අතුරෙහි වනාහි-

"ජයො හි බුඬස්‍ස සිරීමතො අයං
මාරස්‍ස ච පාපිමතො පරාජයො,
ඵගේඝාසයුං බොධිමණ්ඩ පමොදිතා
ජයං තදා නාගගණා මහෙසිනො"සි.

දක්වන ලද ක්‍රමයෙන් නාගයෝ ද-

ජයො හි බුඛස්ස සිරීමතො අයං
මාරස්ස ච පාපිමතො පරාජයො,
උපෙක්ඛාසයුං බොධිමණ්ඩ පමොදිතා
සුපණ්ණසංඝා'පි ජයං මහෙනො-සී.

දක්වන ලද ක්‍රමයෙන් සුපර්ණරාජයෝ ද-

"ජයො හි බුඛස්ස සිරීමතො අයං
මාරස්ස ච පාපිමතො පරාජයො,
උපෙක්ඛාසයුං බොධිමණ්ඩ පමොදිතා
ජයං තදා දෙවගණා මහෙසිනො"සී.

දක්වන ලද ක්‍රමයෙන් දෙවසමූහයෝ ද-

ජයො හි බුඛස්ස සිරීමතො අයං
මාරස්ස ච පාපිමතො පරාජයො,
උපෙක්ඛාසයුං බොධිමණ්ඩ පමොදිතා
ජයං තදා බ්‍රහ්මගණා'පි තාදිනො-සී.

දක්වන ලද ක්‍රමයෙන් බ්‍රහ්මසමූහයෝ ද අවශෙෂ වූ දසදහ සක් සක්වළ දිව්‍යසමූහයෝ ද මාලාගන්ධ විලෙපනාදීන් පූජා කෙරෙමින් නානාප්‍රකාර සතුති වචන සහස්‍රයෙන් පූජාකෙරෙමින් සිටියාහු ය. මෙසේ හිරුහසනයට යන්නාට පළමුකොට ම සපරිවාර මාරපරාජ ය කොට ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසානුස්මෘති ඥානය ලත් සේක. **පූර්වේනිවාසානුස්මෘති ඥාන ය** නම් කවර හ යත්? පෙරවිසූ කඳපිළිවෙළ දන්නා ඤාණ ය සි. පෙර විසූ කඳපිළිවෙළ දන්නා වූ ඤාණ ය ඇත්තාහු සදෙනෙක් වෙත්. ඔහු නම් කවුරෑ ද යත්--**කාලදෙවලාදි** ඇතැම් තීර්ථකයෝ ය. ප්‍රකෘති ශ්‍රාවකයෝ ය. මහා ශ්‍රාවකයෝ ය. අග්‍ර ශ්‍රාවකයෝ ය. ප්‍රත්‍යෙක බුඛයෝ ය. සම්‍යක් සම්බුඛයෝ ය.

මෙම කීහ-විශුද්ධිමාර්ගයෙහි-

"ඉමං පුබ්බෙ නිවාසං ජජනා අනුස්සරනති-නිත්තියා පකති සාවකා මහාසාවකා අග්ගසාවකා පච්චෙකබුඛා සම්බුඛා"සි. මොවුන් කෙරෙහි තීර්ථකයෝ සතළිස් කපක් පමණ ම අනුස්මරණ ය කෙරෙති. එයින් මත්තෙහි අසමර්ථ වෙති. කුමක් හෙයින් ද යත්? දුර්ල ප්‍රඥ ඇති හෙයිනි.

හෙ ද කි සේ මැ නෝ

"නත්ථි නිත්ථියා චත්තාළීසං'යෙව කප්පෙ අනුස්සරන්ති න තතො පරං. කස්මා දුබ්බල පඤ්ඤත්තා"-යි. ප්‍රකෘති ශ්‍රාවකයෝ කල්ප සියයකුදු දහසකුදු සිහිකෙරෙත් මැ යි, කුමක් හෙයින් ද යත් බලවත් ප්‍රඥ ඇති හෙයිනි.

එසින් කිහ.

"පකතිසාවකා කප්පසත'ම්පි කප්පසහස්ස'ම්පි අනුස්සරන්ති යෙව බලව පඤ්ඤත්තා"යි, අශීති මහාශ්‍රාවකයෝ කල්පලක්ෂයක් අනුස්මරණ ය කෙරෙත්.

එසින් කිහ

"අසීති මහාසාවකා ඡනසහස්සකප්පෙ අනුස්සරන්ති"යි. දෙ අගසවුවෝ එකාසංඛෙය්‍ය කල්පලක්ෂයක් අනුස්මරණය කෙරෙත්.

එසින් කිහ

"වෙ අග්ගසාවකා එක මසංඛෙය්‍යකප්පසතසහස්සස්ස'මිපි ව"යි. පසේබුදුවරයෝ දෙයාසංඛ්‍ය කල්ප ශතසහස්‍රයක් අනුස්මරණ ය කෙරෙත්.

එසින් කිහ.

"පවෙචකබුඩා වෙ අස-ඛෙය්‍යානි කප්ප සතසහස්සානි සි". ඒ එසේ වූයේ ඔවුන්ගේ අභිනීහාර සංඛ්‍යාත ප්‍රථම ප්‍රාර්ථනා ව ත් එ පමණෙක් ම ය. ඒ කාරණයෙන් අභිනීහාර ය දක්වා අනුස්මරණ ය කෙරෙත්.

හෙ ද දක්වන්.

"එත්තකො හි නෙසං අභිනීහාරෝ"යි. එසේ වුවහොත් ලොවුතුරා බුදුවරයන්ගේ ත් අනුස්මරණ ය අභිනීහාර කළ තැන් දක්වා මිස මත්තෙහි නැතිවුවමනා ද යත්? එසේ නො වෙයි. යම් සේ ග්‍රාම නිගම ජනපදාදියට නායකයෝ තම තමන් ගේ ග්‍රාමාදියට මිස එයින් පිටත ආඥාපත්‍රාවන්ට අසමර්ථ වෙද්ද, එ පරිද්දෙන් ම ශ්‍රාවකාදීහු තමතමන්ගේ ප්‍රාර්ථනාව දක්වා අනුස්මරණය කරති. එයින් මත්තෙහි අසමර්ථ වෙත්.

යම් සේ සකල පෘථිවීශ්වර වූ සක්විති රජතෙම ග්‍රාමනිගමාදියෙහි ද එයින් පිටත් සමුද්‍රපර්‍යන්ත වූ සකල චක්‍රවාලයෙහි ද ආඥ පවත්වන්ට සමර්ථ වේ ද, ඒ සක්විති රජහට අසවල් ග්‍රාම නිගමයට මිස අසවල් ග්‍රාමනිගමාදියට ආඥාපවත්වන්ට අසමර්ථ ය යි

නියමයෙක් නැද්ද එ පරිද්දෙන් ම දසපෙරුම් පුරා බුදුවුන සවිඥ වරයන්ට පෙණෙන්නා වූ පූජේනිවාස ය කෙළවරක් නැත්තේ ය.

එසින් නිහ

"බුඩානං පන පරිවෙජෙදෙ නාම නත්ථි" මෙහි දැක් වූ පූජේ නිවාස ය තීර්ථකයෝ කෙසේ සිහිකෙරෙත් ද යත්? මේ ලෝක යෙහි දෘෂ්ටිගතික වූ සමහර ශ්‍රමණයෙක් හෝ බ්‍රාහමණයෙක් හෝ කෙළෙසුන් තවන වීර්‍ය්‍ය ය සි කියන ලද ආතප්ප ය නිසා, එම වීර්‍ය්‍ය ය පිහිටවීම් වසයෙනැ සි කියන ලද ප්‍රධාන ය නිසා, එම වීර්‍ය්‍යයෙහි නැවත නැවත යෙදීම් වසයෙන් අනුයොග ය නිසා, සම්‍රතියගේ අවිප්‍රවාස ය සි කියන ලද අප්‍රමාද ය නිසා, උපාය මනසිකාර ය ප්‍රථම මනසිකාර ය සි කියන ලද සම්‍යඥන ය නිසා, යම් පරිද්දකින් එකඟ වූ චිතනයෙහි අනෙකප්‍රකාර වූ පූජේනිවාස ය සිහි කෙරේ ද, එබඳු වූ සඩභාව ඇති චිතනසමාධි ය ලබන්නේ ය. ඒ කවරේ ද? එක ම ජාතියක් ද සිහිකරන්නේ ය. ජාති දෙකක් ද ජාති තුනක් ද ජාති සතරක් ද ජාති පසක් ද ජාති දසයක් ද ජාති විස්සක් ද ජාති තිසක් ද ජාති සතළිසක් ද ජාති පණසක් ද ජාති සියයක් ද ජාති දහසෙක් ද ජාති ලක්‍ෂයෙක් ද නොයෙක් ජාති සියයෙක් ද නොයෙක් ජාති දහසෙක් ද නොයෙක් ජාති ශතසහස්‍රයෙක් ද අසවල් තැන උපන්මි. එහි දු මෙ බඳු නාම යක් ඇතිවිමි. මෙබඳු ගොත්‍රයක් ඇතිවිමි. මෙබඳු වණ්ණයක් ඇති විමි. මෙබඳු ආහාරයක් අනුභව කෙළෙමි. මෙබඳු සුව දුක් දෙකක් විත්දෙමි. මෙබඳු ආයුෂ්‍යයක් කෙළවර කොට ඇත්තෙක් වීමි. හේ මම එසින් චුතවූයෙමි අසවල් තැන උපන්මි. එ තැන්හි දු මෙබඳු නාමයකුත් ඇතිවිමි —පෙ— හේ මම ම එසින් චුතවූයෙමි මෙහි උපන්මි සි මෙසේ සුඳුර වූ ආකාර ඇති උද්දේස සහිත වූ අනෙක ප්‍රකාර වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරන්නේ සි.

එසින් වදළහ බුදුහු - බ්‍රහ්මජාල සූත්‍රයෙහි

ඉධ භික්ඛවෙ එකවෙවා සමණො වා බ්‍රාහමණො වා ආතපප මඤ්ඤාය පධානමඤ්ඤාය අනුයොගමඤ්ඤාය අපපමාදමඤ්ඤාය සමමාමනසි කාරමඤ්ඤාය තථාරූපං චෙතොසමාධිං ඵුසති. යථා සමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථිදං-එක මපි ජාතිං දෙවපි ජාතියො තිස්සොපි ජාතියො චතස්සොපි ජාතියො පඤ්චපි ජාතයො දසපි ජාතියො වීසතිමපි ජාතියො තිංසම්පි ජාතියො චත්තාළීසම්පි ජාතියො පඤ්ඤාසම්පි ජාතියො ජාති සතම්පි ජාති සහස්සම්පි ජාති සතසහස්සම්පි අනෙකානිපි ජාති සතානි අනෙකානිපි ජාති සහස්සානි අනෙකානිපි ජාති සත

සහස්සානි අමුත්‍රාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං තත්‍රාපා'සිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවෙදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝ'ති ඉති සාකාරං ස උද්දෙසං අනෙක විහිතං පුබ්බෙනිවාසං අනුස්සරති-සි.

තව ද මේ ලෝකයෙහි දුෂ්ටිගතික වූ සමහර ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ කෙලෙසුන් තවන වීර්‍ය ය යි කියන ලද ආතප්ප ය නිසා දුෂ්කර වීර්‍ය ය යි කියන ලද ප්‍රධාන ය නිසා නැවත නැවත යෙදෙන වීර්‍ය ය යි කියන ලද අනුයෝග ය නිසා සමෘති සම්ප්‍රයුක්ත බව ය යි කියන ලද අප්‍රමාද ය නිසා උපාය මනසිකාර ය යි කියන ලද සම්‍යක් මනසිකාර ය නිසා යම් පරිද්දකින් එකඟ වූ චිත්තයෙහි අනෙකප්‍රකාර වූ පූර්වේනිවාස ය සිහිකෙරේ ද, එබඳු වූ චිත්ත සමාධියක් ලබන්නේ ය. ඒ කවරේ ද? එක ම සංවර්ත විවර්තයක් ද සංවර්ත විවර්තදෙකක් ද සංවර්ත විවර්ත තුනක් ද සංවර්ත විවර්ත සතරක් ද සංවර්ත විවර්ත පසක් ද සංවර්ත විවර්ත දසයක් ද යට කී පරිද්දෙන් අනෙකප්‍රකාර වූ පූර්වේනිවාස ය සිහි කරන්නේ ය.

හෙ ද දක්වන්නට වදාළහ-එහිම.

ඉධ භික්ඛවෙ එකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා ආතප්ප මන්වාය පධානමන්වාය අනුයෝගමන්වාය අප්පමාදමන්වාය සම්මා මනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති. යථා සමාහිතෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථිදං-එකම්පි සංවට්ට විවට්ටං ද්වෙපි සංවට්ට විවට්ටානි තීණිපි සංවට්ට විවට්ටානි චත්තාරිපි සංවට්ට විවට්ටානි පඤ්චපි සංවට්ට විවට්ටානි දසපි සංවට්ට විවට්ටානි. අමුත්‍රා'සිං එවං නාමෝ එවංගොත්තෝ එවංවණ්ණෝ එවමාහාරෝ එවංසුඛදුක්ඛ පටිසංවෙදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං තත්‍රාපා'සිං එවංනාමෝ එවංගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛපටිසංවෙදී එව'මායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නෝ'ති ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති-සී.

නැව ද මේ ලෝකයෙහි දුෂ්ටිගතික වූ සමහර ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ යටකී ත්‍රිවිධවීර්‍ය ය හා සමාධි සම්ප්‍රඥ දෙක නිසා එකඟ වූ චිත්තයෙහි අනෙක ප්‍රකාර වූ පූර්වේනිවාස ය සිහි කෙරේ ද එබඳු වූ චිත්තසමාධි ය විඳිනේ ය. ඒ කවරේ ද-යටකී පරිද්දෙන් සංවර්ත විවර්ත දසයක් ද විස්සක් ද තිසක් ද සතළිසක් ද

අසවල් නැන උපන්මි. එහි දු මෙබඳු නාමයක් ගොත්‍රයක් වර්ණයක් ආහාරයක් ඇතිවිමි. මේ බඳු සුවදුක් දෙකක් වින්දෙමි. මේ බඳුවූ ආයුෂයක් කෙළවරකොට ඇත්තෙමි. ඒ මම එයින් චුත වූ යෙම් අසවල් නැන උපන්මි. එතැන්හි දු මේ බඳු නාමයක් ගොත්‍රයක් වර්ණයක් ආහාරයක් ඇතිවිමි. මේ බඳු සුවදුක් දෙකක් වින්දෙමි. මේ බඳු ආයුෂයක් කෙළවරකොට ඇත්තෙමි. හේ මම එයින් චුතවූයෙම් මෙහි උපන්මි සි. මෙසේ සුඤ්ඣරවූ ආකාර ඇති උද්දෙස සහිත වූ අනෙක ප්‍රකාර වූ පෙරවිසූ කඳපිළිවෙළ සිහි කරන්නේ සි.

මෙ ද වදලහ එහි ම.

ඉධ භික්ඛවෙ එකච්චො සමණො වා බ්‍රාහ්මණො වා ආතප්ප මන්වාය පධානමන්වාය අනුයොගමන්වාය අප්පමාදමන්වාය සම්මා මනසිකාරමන්වාය තථාරූපං චෙතොසමාධිං ඵුසති. යථා සමා හි තෙ චිත්තෙ අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථිදං- දසපි සංවට්ට විවට්ටානි ඵීසතිම්පි සංවට්ට විවට්ටානි තිංසම්පි සංවට්ට විවට්ටානි වත්තාළීසම්පි සංවට්ට විවට්ටානි. අමුත්‍රා'සිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛ පටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො අමුත්‍ර උප්පාදිං. තත්‍රා පා'සිං එවං නාමො එවං ගොත්තො එවං වණ්ණො එවමාහාරො එවං සුඛදුක්ඛ පටිසංවෙදී එවමායුපරියන්තො. සො තතො චුතො ඉධූ පපන්නො'ති ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති සි.

මෙසේ නීඩිකයෝ එකජාතියක පටන් ක්‍රමයෙන් අනෙක ජාති ශතසහස්‍රයක් ද එකසංවර්ත විවර්තයෙක පටන් දශසංවර්ත විවර්තයෙක් ද දශසංවර්ත විවර්තයක පටන් සතලිස් සංවර්ත විවර්තයෙක් ද පෙරවිසූ කඳපිළිවෙළ සිහිකරන්නාහු ස්කන්ධපරම්පරාවෙන් ම සිහිකෙරෙති. පරම්පරාව හැර චුතිප්‍රතිසන්ධි වසයෙන් සිහිකරන්නට නොහැකි වෙත්. ඒ එසේ ම ය. යම් හෙයකින් වනාහි අන්‍යයෝ යෂ්ටිකොටි ය අතහැරයන්ට අසමර්ථවෙද්ද, එපරිද්දෙන් ම ඔවුහු කඳපිළිවෙළ හැර චුතිප්‍රතිසන්ධි වශයෙන් සිහිකරන්ට අසමර්ථ වෙත්. කඳපිළිවෙළින් ම සිහිකරත්.

එයින් කිම

නිජ්ඣායා ච ඛන්ධපරම්පාටිමෙව සරන්ති. පරම්පාටිං මුඤ්චිත්වා චුතිපරම්පන්ධවසෙන සරිතුං නසක්කොනන්ති. තෙසං හි අඤ්ඤානං විය ඉච්ඡිත පදෙසොක්කමනං නත්ථි. යථා පන අඤ්ඤා යට්ඨිං අමුඤ්චිත්වා ගච්ඡන්ති. එවං තෙ ඛන්ධපරම්පාටිං අමුඤ්චිත්වාව සරන්ති-සි.

ප්‍රකෘතිශ්‍රාවකයෝ කදපිළිවෙළ සිහිකෙරෙති. බලවත් ප්‍රඥ ඇතිවන බැවින් චුතිප්‍රතිසන්ධි වශයෙන් ද සංක්‍රමණ ය කෙරෙත්. අශීති මහාශ්‍රාවකයෝ ත් එසේ මැ යි.

හෙ ද කිහ.

පකතිසාවකා බන්ධපටිපාටියම්පි අනුස්සරන්ති. චුතිපටිසන්ධි වසෙනපි සංකමන්ති-තථා අසීතිමහාසාවකා-යි.

දෙ අගසව්වන්ට වනාහි කදපිළිවෙළින් ප්‍රයෝජන නැති. එක ආත්මභාවයක්හුගේ චුති ය දැක ප්‍රතිසන්ධිය දකිති. මෙම ක්‍රමයෙන් මතුමත්තෙහි බලත් පසේ බුදුවරයෝ ද-එසේ මැ යි.

එසින් කිහ.

දීඝනඛ පත අඟභසාවකානං බන්ධපටිපාටි කිච්චං නත්ථි. එක සස අත්තභාවස්ස චුතිං දිස්වා පටිසන්ධිං පස්සන්ති. පුන අපරස්ස චුතිං දිස්වා පටිසන්ධිං පස්සන්ති. පුන අපරස්ස චුතිං දිස්වා පටිසන්ධි'න්ති එවං චුතිපටිසන්ධිවසෙ'නෙව සංකමන්තා ගච්ඡන්ති-තථා පවෙචකබුබා-යි.

සම්මාසම්බුදුරජාණන්ට වනාහි යම් පමණ ඥෙය්‍ය ඒ නම් එ පමණ ඥාන ය වෙයි. යම් පමණ ඥානය ඒ නම් එපමණ ඥේය්‍ය වෙයි. එසේ නොයින් කදපිළිවෙළින්දු කම් නැත. චුතිප්‍රතිසන්ධි වශයෙනු දු සංක්‍රමණයෙන් කම් නැත. ඔවුන්ට වූකලී අනෙක කල්පකොටි සත සහස්‍රයෙහි යටගිය කල්හි වේව යි මතු එනකල්හි වේව යි යම් කපෙ ක යම් භවයෙක යමක් යම්ක් දක්නට කැමති වෙද්ද-ඒ ඒ කැමති කැමති සථානයෙහි ම යට ප්‍රකාශව ම පෙණෙයි. එයින් නොයෙක් කල්ප කොටිහු පෙය්‍යාල පාළියක් මෙන් සංක්ෂෙපකොට ම යමක් යමක් කැමති වෙත් නම් ඒ ඒ තන්හි ම ඤණයෙන් බස්නාහු සිංහ යන්ගේ ගමන් වශයෙන් සිහි කෙරෙත්.

එසින් කිහ.

බුද්ධානං පන නෙව බන්ධපටිපාටිකිච්චං න චුතිපටිසන්ධිවසෙන සංකමන කිච්චං අත්ථි. තෙසං හි අනෙකාසු කපපකොටිසු හෙට්ඨා වා උපරි වා යං යං ඨානං ඉච්ඡන්ති තං තං පාකටමෙව හොති. තසමා අනෙකාපි කපපකොටියො පෙය්‍යාලපාළි විය සංඛිපිත්වා යං යං ඉච්ඡ නති. තත්ථ තත්ථෙ'ව ඔකකමනතා සීහොකකනතවසෙන ගච්ඡති-යි.

එසේ ඤණයෙන් බස්නාවූ ද ඒ සම්මාසම්බුදුරජාණන්ගේ ඤණය නම් යම් සේ කරුණලද පරිවය ඇති **සරභඞග** බොධිසත්වයන් වැනි ධුරුර්

ධරයක්හුවිසින් විදිනාලද ශරයතෙම අතුරෙහි වෘක්ෂලතාදියෙහි නොපැකිළෙන්නේ ලකෙහි ම වැද-නොපැකිළේද නොවරදීද එපරිදී දෙන් ම අතරතුරේ ජාතියෙහි නොපැකිල නොවැරද කැමති කැමති තැනකට බැසගණී.

එසින් කිහ.

ගච්ඡන්තානං ව තෙසං ඤාණං යථා නාම ඝතවාළවෙධ පරිව යසස සරභඞගසදිසස්ස ධනුග්ගහස්ස ඛිත්තෙනා සරෙ අනන්තරා රුක්ඛ ලතාදිසු අසජ්ජමානෙ ලකෙඛයෙව පතති. නසජ්ජති නවිරජ්ඣති. එවං අනන්තරනන්තරාසු ජාතිසු නසජ්ජති නවිරජ්ඣති. අසජ්ජමානං අවිරජ්ඣමානං ඉච්ඡිති'ච්ඡිතට්ඨානං යෙව ගණ්හාති.-සි.

මෙසේ දක්වනලද පූජේතිවාස ය සිහිකරන්නවුන් අතුරෙහි තීව්‍රඥයන්ගේ පූජේනිවාසඥන ය අල්පානුභාව ය ඇතිවන බැවින් ඛද්‍යොත සංඛ්‍යාත කණමැදිරියන්ගේ ප්‍රභාඛ්‍යාත ආලොකයක් මෙන්ද, ප්‍රකෘතිශ්‍රාවකයන්ගේ ඤාණය දීපසංඛ්‍යාත පහනක ආලෝකය මෙන් ද, මහාශ්‍රාවකයන්ගේ පූජේනිවාසඥනය උල්කාපාතප්‍රභා සංඛ්‍යාත ආකාසයෙන් වැටෙන ගිනිසිළුක ආලෝකයක් මෙන්ද, අග්‍රශ්‍රාවකයන්ගේ පූජේනිවාසඥනය සඳට අනුවූ ඔෂධිතාරකාවගේ ප්‍රභාව හා සදෘශය සි කියා ද පසේබුදුවරයන්ගේ පූජේනිවාසඥනය චන්ද්‍රාලෝකයක් හා සදෘශය සි කියාද සර්ව්ඥවරයන්ගේ පූජේනිවාස ඥනය සහස්‍රරශ්මීන් ප්‍රතිමණ්ඩිත ශරත් සූර්‍යයාගේ ප්‍රභාව හා සදෘශ ය සි කියා ද වැටහේ

එසින් කිහ.

ඉමෙසු ච පන පුබ්බෙනිවාසං අනුසරන්තෙසු තිත්ථියානං පුබ්බෙ නිවාසදසනං බාහිරුපනකූපනා සදිසං හුත්වා උපට්ඨාති පක නිසාවකානං දීපපභා සදිසං, මහාසාවකානං උක්කාපභා සදිසං, අග්ගසාවකානං ඔසධිතාරකූපනා සදිසං, පච්චෙකබුද්ධානං වඳුපප භා සදිසං, බුද්ධානං රසමිසනස්ස පතිමණ්ඩිත සරද සුරිය මණ්ඩල සදිසං හුත්වා උපට්ඨාති-සි.

තව ද තීව්‍රඥයන්ගේ පූජේනිවාසානුස්මරණය කඳපිළිවෙළ නොහරණ බැවින් දඹුකෙළවර ගෙණ යන අඹයන්ගේ ගමනක් හා සදෘශවෙයි. ප්‍රකෘති ශ්‍රාවකයන්ගේ පූජේනිවාසානුස්මරණය සෙතු යයි කියනලද ක්ෂුද්‍රනදීන්ගේ අතික්‍රමණය පිණිස කරණලද නෙයක යනු ගමනක් හා සදෘශවෙයි. අශීතිමහාශ්‍රාවකයන්ගේ පූජේනිවාසාස්ත මරණය ජංඝසෙතුයයි කියනලද සතර දෙනෙකු හෝ පස්දෙනෙකු යන්නට පිළිවන්කොට පෝරු ඇද ඇණ ගසා කළ නෙයක යාමක්

හා සදෘශ වෙයි. අග්‍රශ්‍රාවකයන්ගේ පූර්වේනිවාසානුස්මරණය සකට සෙතු ය යි කියනලද ගැලක් හා යානැතිකොට කරණලද හෙයක යමක් හා සදෘශ වෙයි. පසේබුදුවරයන්ගේ පූර්වේනිවාසානුස්මරණය ජංඝාමාගී ය යි කියනලද මහත්වූ ජඞ්ඝාසාර්ථකයන් යානැතිකොට කරණලද ජංඝාමාගී ගමනක් හා සදෘශ වෙයි. සම්‍යක්සම්බුදුවරයන්ගේ පූර්වේනිවාසානුස්මරණය මහා සකට මාගී සංඛ්‍යාත විස්සක් හෝ තිසක් හෝ සකටයන් එක්කොට ගෙණ යානැති මහාසකට මාණියෙහි යාමක් හා සදෘශ වෙයි

මේ ද අභිඤ්ඤා-විසුද්ධිමාගීය- පූර්වේනිවාසානුස්මෘතිඥාන කථාවෙහි-

නිත්‍යියානඤ්ච පුබ්බේනිවාසානුස්සරණං අඤ්ඤානං යථාසීඝාවට ගමනං විය හොති. පකතිසාවකානං දණ්ඩකසෙතුගමනං විය, මහාසාවකානං ජඞ්ඝසෙතුගමනං විය, අග්‍රසාවකානං සකට සෙතු ගමනං විය, පච්චේකබුද්ධානං මහාජඞ්ඝමග්ග ගමනං විය, බුද්ධානං මහාසකට මග්ග ගමනං විය-යි.

මෙහි නිත්‍යිකයෝ ත් පූර්වේනිවාසානුස්මෘතිය සිතිසෙරෙනියි යි පමණකින් පුරුණ කාශ්‍යපාදී සියලු පාපිහු ම පූර්වේනිවාසය සිහි කෙරෙනියි නොසිතව. ත්‍රිවිධබෝධියට පැමිණීමට අසමර්ථ බව හා පඤ්චසුද්ධාවාස බ්‍රහ්මලෝකයෙහි අනාගාමීන් ම උපදනා හෙයින් එයට යන්නට අසමර්ථ බව මුත් සෙසු බ්‍රහ්මලෝකවල උපදින ධ්‍යාන භාවනා ඇති ප්‍රාණඝාතාදී අකුසල් මැඩ පවත්වා ඉන්ද්‍රිය දමනයෙහි සමර්ථ වූ කෙලෙසුන් සමූලිත් නසන්නට අසමර්ථ වූ නමුත් කෙලෙසුන් තවන වීර්‍යය ඇත්තාවූ ධ්‍යානලාභීවූ කාලදෙවලාදි ඍෂිවරයෝ ය යි දතයුතු.

මෙසේ දක්වනලද ප්‍රභෙද ඇති පූර්වේනිවාසානුස්මෘතිඥනය නෙවත් නොයෙක් අසංඛ්‍යගණන් කල්පයෙහි පැවති සියලු මෝහාඛ්‍යකාරය දුරුකොට එහි පැවති සියලු ප්‍රවෘත්තිය හස්තාමලකයයි කියනලද අතින් ගත් මාණික්‍යයක් පරිද්දෙන් සම්‍යක්ප්‍රකාරයෙන් දක්නා ඥනය බොධිද්‍රුම මූලයෙහිදී ප්‍රථම යාමයෙහි ලත් සේක. මධ්‍යම යාමයෙහි—

සෙ දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උප්පජ්ජමානෙ හීණෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති—යි.

මෙසේ දක්වන ලද ක්‍රමයෙන් විසුද්ධිමාගීයෙහි විභාගකරණලද ක්‍රම ඇති චවමාන වූ උත්පාද්‍යමාන වූ හීන වූ ප්‍රණීත වූ සුවණ්ණ

වූ දුර්ණි වූ සුගත් වූ දුගතිනි වූ යථාකර්මොපගත වූ සත්ත්වයන් දක් නාවූ ද මේ සත්ත්වයා කායදුශ්චරිතයෙන් සමන්විත ය. මේ සත්ත්වයා වචීදුශ්චරිතයෙන් සමන්විත ය. මේ සත්ත්වයා මනොදුශ්චරිතයෙන් සමන්විත ය. මොහු ආර්‍යෝපවාද කෙළේ ය. මොහු මිථ්‍යාදෘෂ්ටි කර්ම සමාදන කෙළේ ය.

එ හෙයින් ඔහු කාබුන් මරණින් මත්තෙහි අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නරකයෙහි උපන්නාහු ය සි යනාදී විසින් ද මේ සත්ත්වයා කායසුචරිතයෙන් සමන්විත ය. වචීසුචරිතයෙන් සමන්විත ය. මනොසුචරිතයෙන් සමන්විත ය. ආර්‍යෝපවාද නො කෙළේ ය. සම්‍යක්දෘෂ්ටි සමාදන කෙළේ ය. එ හෙයින් ඔහු කාබුන් මරණින් මත්තෙහි සුගති සවර්ග සංඛ්‍යාත ලෝක යෙහි උපන්නාහු ය සි යනාදී මේසේ දක්නා දිව්‍යංචක්ෂුර්ඥාන ය ලත් සේක. හෙවත් බොධිද්‍රුමමූලයෙහි සත්ත්වයන්ගේ චුතූපපත්ත්‍යාදි ය දක්නා ඥාන ය ප්‍රතිවෙධ ය කරමින් අනාගත කාලයෙහි පවත්නා මොහ නැමැති අන්ධකාරය නැසූ සේක. පශ්චිමයාමයෙහි වාදශාඞ්ගප්‍රතීත්‍යසමුත්පාද ය අනුලොම ප්‍රතිලොමාදී වශයෙන් සම්මර්ශන ය කළ සේක.

ඒ ප්‍රතීත්‍යසමුත්පාද ය නම් කවරහ යත් ?

අවිජ්ජාපච්චයා භික්ඛවෙ සංඛාරා සංඛාරපච්චයා විඤ්ඤාණං විඤ්ඤාණපච්චයා නාමරූපං නාමරූපපච්චයා සළායතනං සළායතනපච්චයා ඵස්සො ඵස්සපච්චයා වෙදනා වෙදනා පච්චයා තණ්හා තණ්හාපච්චයා උපාදානං උපාදානපච්චයා භවො භව පච්චයා ජාති ජාතිපච්චයා ජරාමරණං සොක පරිදෙව දුක්ඛ දොමනස්සූපායාසා සම්භවන්ති එව'මෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධ ස්ස සමුදයො හොති. අයං වුච්චති භික්ඛවෙ පටිච්ච සමුප්පා දෙ—සි.

මෙසේ බුදුන් විසින් වදාරණලද්දේ ප්‍රතීත්‍යසමුත්පාද නම් වේ. එහි අවිජ්ජාපච්චයා යන තන්හි **අවිද්‍යා** නම් කවරහ යත් ? දුක්ඛ සත්‍ය ය සමුදය සත්‍ය ය නිරොධ සත්‍ය ය මාර්ගසත්‍ය ය යන චතුරාර්‍ය සත්‍යධර්මයන් දක්නට නොදන්නා වූ මොහ ය සි කියන ලද නුවණ මදබව අවිද්‍යා නම් වේ. කවර අර්ථයකින් අවිද්‍යා නම් වීද යත්. නොවිඳු යුතු වූ දුශ්චරිතය විඳිනු සි අවිද්‍යා නම් වේ. එ හෙයින් දක්වන ලදී—"අවින්දියං වින්දතී'ති—අවිජ්ජා"සි—පැමිණිය යුතු වූ කාය සුචරිතාදියට නොපැමිණෙන්නේනු සි අවිද්‍යා නම් වේ. "වින්දියං න වින්දතී'ති—අවිජ්ජා"සි. මේ ආදි අර්ථයෙන් අවිද්‍යා නම් වූ නුනුවණ බව ප්‍රත්‍යයකොට ගෙණ; සංඛාරා "සොම්

නඤ්ඤ සහගතං දිට්ඨිගත සම්පයුත්තං අසඞ්ඛාරිකමේකං සසඞ්ඛාරික මේකං" යනාදීන් අභිධර්මාර්ථ සඞ්ග්‍රහාදියෙහි විභාග කරණ ලද එකුන්තිසක් පමණ ලෞකික කුශලා කුශල චෙතනාවෝ සඵල වෙත්. සඞ්ඛාර පච්චයා, කුසල්අකුසල් හෙතුකොට ගෙණ; විඤ්ඤාණං, එකුන්විස්සක් පමණ පිළිසිඳගන්නා සිත සඵල වේ. විඤ්ඤාණපච්ච යා, එකුන්විස්සක් පමණ ප්‍රතිසන්ධිචිත්තයන් හෙතුකොටගෙණ; නාමරූපං, චිත්ත චෛතසිකයනු ත් අඞ්ගය ත් සඵල වන්නේ ය.

මෙහි නාමය නම්—සිත ය. රූපය නම් ඇඟය හෙවත් සිත හා කය යි. නාමරූපපච්චයා, ඒ සිත ත් කය ත් දෙක හේතුකොටගෙණ; සළායතනං; ආයතනයෝ සදෙන සමඟ වෙත්. ඔහු කවුරු ද යත් ? ඇස-චක්ඛායතන නම් වෙ යි. කණ-සොතා යතන නම් වෙ යි. නාසය-ඝාණායතන නම් වෙ යි. දිව--ජිව්හා යතන නම් වෙ යි. ශරීරය—කායායතන නම් වෙ යි. සිත—මනා යතන නම් වෙ යි දතයුතු. සළායතන පච්චයා, ඒ ෂඩ් ආයතන යන් හේතුකොටගෙණ; එසෙසා, ස්පර්ශය සමඟ වේ. කෙසේ සමඟ වේ ද යත් ?

ඇසට පෙණෙන සියලු දෙය රූප නම් වෙ යි. ඒ රූප ය ඇස දෘෂ්ටි වැදගැන්මෙන් ස්පර්ශ වෙ යි. කණට ඇසෙන සියලු ශබ්දය ම ශබ්ද නම් වෙ යි. ඒ ශබ්දය කණ වැදගැන්මෙන් ස්පර්ශ වෙ යි. නාසයට ඇඟෙන සියලු සුගඳ දුගඳ දෙක ම ගන්ධ නම් වෙ යි. ඒ ගන්ධය නාසිකාවෙහි වැදගැන්මෙන් ස්පර්ශ වෙ යි. දිවට දැනෙන සියලු දෙය ම රස නම් වෙ යි. ඒ රසය දිව වැද ගැන්මෙන් ස්පර්ශ වෙ යි. එසේ ම කයට ප්‍රෂ්ටව්‍ය වැදගැන්මෙන් ස්පර්ශ වෙ යි මනසට ඒ ඒ චෛතසිකයන් අරමුණුවීම් වශ යෙන් ස්පර්ශ වෙ යි. එඤ්ඤපච්චයා, ඒ ස්පර්ශය ප්‍රත්‍යයකොට ගෙණ; වෙදනා, "චක්ඛුසම්ඵස්සජා වෙදනා" යනාදීන් දක්වන ලද ෂට්ආලම්බණයෙහි සුඛවෙදනා ය යි කියන ලද සැපවිඳීම ද, අනිෂ්ටාලම්බණයෙහි දුක්ඛවෙදනාය යි කියන ලද දුක් විඳීම ද මධ්‍යස්ථාලම්බණයෙහි උපෙක්ඛා වෙදනාය යි කියන ලද සැප දුක් දෙක ම විඳීම ද යන මේ ත්‍රිවිධ වෙදනාව සඵල වන්නේ ය. වෙදනා පච්චයා, විඳීම හේතුකොටගෙණ; තණ්හා, එක්සිය අටක් ප්‍රභේද ඇති තෘෂ්ණාව සඵල වේයි. තෘෂ්ණාව එක්සිය අටක් ප්‍රභේද වූ පරිදි මෙසේ දතයුතු. සියලු සත්වයන්ගේ තෘෂ්ණාව ම රූපාදී ෂට්ආ ලම්බණයෙහි තෘෂ්ණා වශයෙන් එකක් ශා අටක්‍රොස් ප්‍රභේදයක් ඇති ශාස්වත දෘෂ්ටියෙහි පැවති තෘෂ්ණා වශයෙන් එකක් හා

සූසාස්‍රිස් ප්‍රභෙදයක් ඇති උවෙජද දෘෂ්ටියෙහි පැවතීම් වශයෙන් එකක් හා තුනෙක් වෙ සි. මේ ත්‍රිවිධ තෘෂ්ණාව අතීතාදි කාලත්‍රයෙහි ම ඇත්තේ ය.

එසින් අතීතයෙහි දී චක්ඛායතන ය සොතායතන ය ඝාණායතන ය ජිව්හායතන ය කායායතන ය මනායතන ය යන ෂඩායතනයන්ට කාමතෘෂ්ණාව සම්භවීමෙන් සයක් හා එම ෂඩායතනයන්ට භවතෘෂ්ණාව සම්භවීමෙන් සයක් හා එම ෂඩායතනයන්ට විභවතෘෂ්ණාව සම්භවීමෙන් සයක් හා මේ තුන් සය එක්කොට ගිණීමෙන් අධ්‍යාත්මික තෘෂ්ණා දශඅටෙන් වෙයි ඒ දශඅට ම රූපායතන ය සද්දායතන ය ගන්ධායතන ය රසායතන ය ඵොට්ඨබ්බායතන ය ධම්මායතන ය යන බාහිරායතනයන් දශඅටදෙනෙකු ඇති බැවින් අතීත තෘෂ්ණාව සතිස් ප්‍රභෙදයෙක් වි ය. එසේ ම වර්තමාන තෘෂ්ණාව ද සතිස් ප්‍රභෙදයෙක් වෙ සි. අනාගත තෘෂ්ණාව ත් සතිස් ප්‍රභෙදයෙක් වෙ සි. ඒ තුන් සතිස එක්කොට ගිණූ කල එක්සිය අටක් ප්‍රභෙද ඇත්තේය සි දත යුතු.

තණ්හා පච්චයා, ඒ තෘෂ්ණාව හේතුකොටගෙණ; උපාදානං, කාමාදියෙහි අරමුණු දැඩිකොට ගැන්ම වන්නේ සි. උපාදානපච්චයා, ඒ අරමුණු දැඩිකොට ගැන්ම හේතුකොටගෙණ; ජාති, කාමභවාදියෙහි උත්පත්තිය සි කියන ලද ජාතිය සම්භවන්නේ ය; ජාතිපච්චයා, ඒ ජාතිය හේතුකොට ගෙණ; ජරා, ජරාව ද; මරණං, මරණය ද; සොක, සොකය ද; පරිදෙව, තනතනා ශ්‍රිත ආලාපය ද; දුක්ඛ, දුක් ද; දෞමනස්ස, මනොවිඤ්ඤාත ලක්ෂණ ඇති දෞර්මනස්‍යය ද; උපායාස, සිත්තැවුලි ද යන මේ දුක්ඛ රාශිහු; සම්භවන්ති, සම්භව වෙත්; එවං, මෙසේ; එවමෙතස්ස කෙවලස්ස දුක්ඛක්ඛන්ධස්ස, මේ සියලු දුක්පිඬක් වැනි ශරීරයාගේ; සමුදයො හොති, ඉපදීම් වන්නේ ය; ඊශ්වර නිර්මාණාදී වශයෙන් උත්පත්තියෙක් නොවෙ සි වෙදිතව්‍ය සි. ජරා මරණාදීහු වනාහි ප්‍රතීත්‍ය සමුත්පන්න ධර්මය හ සි දත යුතු.

එසින් වදළහ.

කතමාව භික්ඛවෙ පටිච්ච සමුප්පන්නා ධම්මා-ජරාමරණං භික්ඛවෙ අනිච්චං සංඛතං පටිච්චසමුප්පන්නං ඛයධම්මං වය ධම්මං විරාගධම්මං නිරොධධම්මං—සි.

මේ මෙහි සංක්ෂේපය. මෙහි විස්තරය වනාහි විශුද්ධි මාර්ගයෙහි සතලොස්වන පරිච්ඡේදයෙන් බලා දත යුතු. මේ ආදි ක්‍රමයෙන් පශ්චිමයාමයෙහි පාරමිතා සම්මර්ශනයෙහි යෙදින් වත්මාන කාලයෙහි පැවති අවිද්‍යා නැමැති අන්ධකාර සමූහය නස්නට ප්‍රතීත්‍යසමුද්පාද ධර්ම කැමැති සාගරයෙහි ඤාණ නැමැති මේරු මන්ථය ගෙණ බහා ආලොලනය කෙරෙමින් "අවිජ්ජා පච්චයා සංඛාරා" යනාදින් නැගි ජරාමරණ පර්‍යන්ත වූ වාදශාඞ්ග ය වර්ත නම්. "අවිජ්ජානිරොධා සංඛාර නිරොධෝ" යනාදින් නැගි ජරා මරණ පර්‍යන්ත වූ වාදශාඞ්ග ය විවර්ත නම්. මෙසේ වර්ත විවර්තවශයෙන් අනුලෝම ප්‍රතිලෝමාදි නය වශයෙන් සම්මර්ශන ය කරණ සේක් දශබල චතුවෛශාරද්‍යාදී වූ ගුණ නැමැති රත්න යෙන් පිරිවරණ ලද සර්වඥතාඥාණ නැමැති අමාතය සම්බෝධියට ගෙණ යෑසනා සහිත වූ කාමාදි ආශ්‍රවයන් සිද ආශ්‍රවක්ෂය කර ඥානය සම්ප්‍රාප්තියකොට කාලත්‍රය වර්ති වූ සියලු අර්ථයන් අත් ලෙහි තුබූ මාණික්‍යරත්නයක් පරිද්දෙන් නිරවශෙෂකොට දැක පිරුණා වූ මනොරථය ඇතිව "අනෙකජාති සංසාරං" යනාදීන් ප්‍රීති වාක්‍ය පවත්වා වදාළ සේක.

එසින් කිහ.

පච්ඡිමයාමෙ පච්චුප්පන්න කාලවත්තී අවිජ්ජානීවරණ නිකරං සම්භඤ්ඤාතෙතුං පටිච්චසමුප්පාදසාගරෙ ඤාණමෙරුමන්ථං ඔතාරෙත්වා ආලොලෙනෙන්ා විය වට්ටවිවට්ටානුලොම පටිලොමාදී නය වසෙන සම්මසනෙන්ා දසබලචතුවෙසාරජ්ජාදි ගුණරතන පරිවාරිතං සබ්බඤ්ඤුතඤාණාමතං සම්පාදෙත්වා සවාසනාසවෙ සමුච්ඡින්දිත්වා කාලත්තයවත්තිනං සබ්බවත්ථූං කරතලාමලක'මිව නිරවසෙසං දිසවා පරිපුණ්ණසංකප්පො පීතිවෙගෙන අනෙක ජාතිසංසාර'න්ති උදානං උදනෙසි.

මෙ ම විස්තර වශයෙන් කිහ—අවිදූරෙ නිදානවිභාගයෙහි.

එවං ධර්මතෙයෙව සුරියෙ මහාපුරිසො මාරබලං විධමෙත්වා චීවරාපරිපතමානෙහි බොධිරුක්ඛඞ්කුරෙහි රත්තපවාළ දලෙහි විය පූජයමානො පඨමෙ යාමෙ පුබ්බනිවාසඤාණං මජ්ඣිමයාමෙ දිබ්බචක්ඛුං විසොධෙත්වා පච්ඡිමයාමෙ පටිච්චසමුප්පාදෙ ඤාණං ඔතාරෙසි.

අථස්ස වාදසපදිකං පච්චයාකාරං වට්ටවිවට්ට වසෙන අනුලොම පටිලොමතො සම්මසන්තස්ස දසසහස්සී ලොකධාතු

උදකපරියන්තං කත්වා වාදසඤ්ඤිත්තුං සංකම්පි. මහා පුරිසෙ පන දසසහස්සි ලොකධාතුං උන්නාදෙත්වා අරුණුග්ගමනවෙලාය සබ්බ ඤ්ඤුතඤාණං පටිවිජ්ඣනෙන සකල දසසහස්සි ලොකධාතු අල ඞ්කත පටියත්තා අහොසි. පාචීනවක්කවාළ මුඛවට්ටියං උස්සාපි තානං ධජානං පටාකානං පච්ඡිමවක්කවාළ මුඛවට්ටියං පහ රන්ති. තථා පච්ඡිමවක්කවාළ මුඛවට්ටියං, උස්සාපිතාහං පාචීන චක්කවාළ මුඛවට්ටියං, උත්තර චක්කවාළ මුඛවට්ටියං උස්සාපිතා නං දක්ඛිණවක්කවාළ මුඛවට්ටියං දක්ඛිණවක්කවාළ මුඛවට්ටියං උස්සාපිතානං උත්තරවක්කවාළ මුඛවට්ටියං පහරන්ති. පඨවිතලෙ උස්සාපිතානං පන ධජානං පටාකානං බ්‍රහ්මලොකං ආහච්ච අට්ඨංසු බ්‍රහ්මලොකෙ බද්ධානං පඨවිතලෙ පතිට්ඨහිංසු.

දසසහස්සවක්කවාළෙ පුප්ඵූපගරුක්ඛා පුප්ඵං ගණ්හිංසු. එලූ පගරුක්ඛා ඵලපිණ්ඩභාරභරිතා අහෙසුං. බන්ධෙසු බද්ධපදුමානි පුප්ඵිංසු. සාඛාසු සාඛාපදුමානි, ලතාසු ලතාපදුමානි, ආකාසෙ ඔලම්බක පදුමානි, සිලාතලානි භින්දිත්වා උපරූපරි සත්ත සත්තභූමිවා දණ්ඩක පදුමානි උට්ඨහිංසු. දසසහස්සී ලොකධාතු වට්ටෙත්වා විජ්ඣිත්වා මාලාගුලා විය සුසත්ථන පුප්ඵසන්ථාරෝ විය ච අහොසි. චක්කවාළන්තරෙසු අට්ඨයොජනසහස්ස ලොකන්තරිකා සත්ත සූරියප්පභායපි අනොභාසිතපුබ්බා එකොභාසා අහෙසුං. චතුරාසිති යොජනසහස්ස ගම්භීරෝ මහාසමුද්දෝ මධුරොදකෝ අහොසි. නදියෝ නපපවත්තිංසු. ජවච්ඡා රූපානි පජ්ජිංසු. ජාතිබධිරා සද්දං සුණිංසු. ජාතිපීඨසපි පදසා ගච්ඡිංසු. අන්ධබන්ධනාදීනි ඡින්දිත්වා පතිංසු. එවං අපරිමාණෙන සිරිවිභවෙන පූජයමානෙ නෙකපපඤ්චාරෙසු අවිජ්ජරියධම්මෙසු පාතුභූතෙසු සබ්බඤ්ඤුතඤාණං පටිවිජ්ඣිත්වා සබ්බබුද්ධානං අවිජහිතං උදානං උදානෙසි-සි.

මේසේ සර්ලොකෙක ප්‍රදීපායමාන වූ මහාපුරුෂයාතන් වහන්සේ තුසිතපුරයෙන් චුත ව ආ තැන් පටන් යම් තාක් මේ බෝමැඩ වැඩහිඳ සර්ඥතාඥාන ප්‍රාප්තිය ද ඒ තාක් කල් පැවති මේ කාරණ ය **අවිදූරෙනිදාන** නමැ සි කියත්.

එසින් කිහ

ඉති තුසිත පුරතො පඨාය යාව අයං බොධිමණ්ඩෙ සබ්බඤ්ඤුතපපත්ති එත්තකං ඨානං අවිදූරෙ නිදානං නාම'ති වෙදිතබ්බං-සි.

චතුරාර්‍යසත්‍ය ධර්මයෝ ත් මේ ප්‍රතීත්‍ය සමුත්පාදයෙහි ම අන්තර්ගතයහ. එසේ නොසින් පරොපදෙශ රහිත ව චතුරාර්‍යසත්‍ය ධර්මයන් ත්‍රිපරිවර්ති විසින් ද්වාදසාකාර විසින් ෂොඩශ ධර්මයන් විසින් බොධිද්‍රම මූලයෙහි දී අවබොධ කොට තමන්වහන්සේ දන් නොසින් "බුජ්ඣිතා සච්චානී'ති බුබ්බෝ" යන අර්ථයෙන් බුද්ධ නම් වන සේක.

එසින් වදළහ

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං
භාවෙතබ්බං ච භාවිතං,
පහාතබ්බං පහීණං මේ
තස්මා බුබ්බෝ'ස්මි බ්‍රාහ්මණා-ති.

මෙතෙකින්

මේ සද්ධර්ම සාරාර්ථ සඞ්ග්‍රහයෙහි

අභිසම්බෝධි කථා නම් වූ සත්තරවන පරිච්ඡේදය

නිමි.

5 පරිච්ඡේදය.

5. දම්සක් පැවතුම් සූත්‍රදේශනා

තව ද මේ **සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහයෙහි දම්සක් පැවතුම් සූත්‍ර දෙශනා** කථා නම් කවරහ යත්? හේ "බොධෙතා පජායති-බ්බෝ" යන පදයට සඞ්ග්‍රහකොට දක්වනු ලැබේ. කෙසේ ද ය ත්?

"ඵලනිබ්බාණජං සෙරී සෙවමානෝ රසුත්තමෝ,
බොධිමූලෙ වසී සත්ත දිවසානි විනායකෝ.
සත්තාහං සීතකෝ බුබෝ ඤාපෙතුංව කතඤ්ඤුතං,
බොධිං අනිමිසකඛිනි සමමා පූජෙසි පූජයං"සි.

යනු හෙයින් අර්හත්ඵාදී නොයෙක් ගුණ නැමැති ආභරණයෙන් සැරසුනා වූ ත්‍රෛලොක්‍යෛක චින්තාමණිසඞ්කාස වූ සම්බුදරාජොත්තමයානන් වහන්සේ සුයඃ්‍රශ්මිස්පර්ශීලත් පද්මයක් සේ අභිශයින් සතුටු වූ චිත්ත සන්තාන ඇති සේක්, මම අනන්ත වූ කල්පකොටි ශතසහස්‍රයක් මුළුල්ලෙහි මෙම බොධිපය්‍යඞ්ක ය කාරණාකොට සසර දිවඇවිද්දෙමි. මේ පය්‍යඞ්කයෙහි හුන්නා වූ මා විසින් මාරසෙනාව විධ්වංසනය කරණ ලද්දේ ය. මෙහි ම උන්නා වූ මාගේ මනදෙළ පිරිණ.

එ හෙයින් මම මේ පය්‍යඞ්කයෙන් නො නැහෙමි සි කියා නොයෙක් කෙළලක්ෂගණන් සමාපත්තියට සමවදනාසේක් විමුක්ති සුඛ සඞ්ඛ්‍යාත නිවන් සැපයෙන් සතියක් මුළුල්ලෙහි වාසය කොට ඉක්බිත්තෙන් ඒ පය්‍යඞ්කයෙන් නැගී සම්බුදු ප්‍රතිලාභය වි ද නොවී දෝ හෝ සි, සැක උපදවා සිටි සම්භර දෙවතාවන්ගේ සැක දුරුකරණු පිණිස අටවැනි දිනයෙහි ආකාශයට පැන නැගී යමක ප්‍රාතිහාර්‍ය දක්වා ආකාශයෙන් බැස මහා බොධිපය්‍යඞ්කයට ඊසානකොණයෙහි සිට ඒකාන්තයෙන් මා විසිනුදු මේ මහා බොධිදුම සම්පයෙහි දී සම්බුදුඤාණය ප්‍රතිවෙධකරණලද සි කියා ප්‍රමාණාතික්‍රාන්ත කාලයක් මුළුල්ලෙහි රැස්කරණලද පාරමිතාවන්ගේ ඵලයට පැමිණෙන්නා වූ ස්ථාන ය ද පය්‍යඞ්කය ද බොධිවෘක්ෂය ද පස්වණක් පැහැයෙන් බබලන්නා වූ ප්‍රීතියෙන් විකසිත වූ අනිමිසලොචන ය සි කියන ලද නො හෙලන ලද ඇස්පිය ඇති ව ප්‍රේමයෙන් හරිත වූ නෙත්‍ර යුගල යෙන් පූජා කෙරෙමින් එ තැන්හි සතියක් මුළුල්ලෙහි වැසිවි සේක.

එසින් කිහ-මහාබොධිවංශයෙහි.

"අථානෙක ගුණගණානුසරණභූසිතො සුගතො සුරිය රාසි සම්
ඵුටඨම්ව පදුමං සුවිකසිත චිත්තසන්තානො අනන්තානි කපපකොටි
සතසහසසානි ඉමසස මහාබොධිපලලඞකසස කාරණා සඞඛාවිං.
එතථ මයා නිසිනෙනන මාරුරිසෙනා විධංසිතා. එතෙව මෙ නිසිනන
සස සඞඛපපා පරිපුණණා-න තාව ඉතො වුටඨහිසසාමී'ති අනෙක
කොටිසතසහසස සමාපත්තියො සමාපජජනෙතා සත්තාහං වීනිනා
මෙවා තතො වුටඨාය සබබඤඤුතඤඤණපටිවෙධෙ උපපන්නසඤඤෙ
හානං එකවචාතං දෙවතානං කඞඛාවිඛමනත්ථං ආකාසමබභුගගන්ත්වා
යමකපාටිහාරියං දසෙසන්තා තතො ඔරුයහ මහාබොධි පලලඞකතො
ඊසකං පාචිනනිසසිතෙ උත්තරදිසා භාගෙ ඨත්වා ඉමසමිං වත මෙ
මහාබොධිමූලෙ සබබඤඤුතඤඤණං පටිවිජඣ'නති අපරිමිත සමය සඤ
චිත පාරමිතා ඵලාදිගමටඨාන පලලඞකා බොධිරුකඛං ච පඨිපප
භාසමුදයසමුජජලෙන පිතිවිකසිතෙන අනිමිසෙන පෙමභාරනයන
යුගලෙන පූජයනෙතා සත්තාහං තත්ථ අවඨාසි"-සි. ඉක්බිත්තෙන්:

"විමුත්තිජං සුඛං විඳං පරිපුණණමිනොරථෝ,
වඩකමෙ වඩකමී බුදධා සත්තාහං රතනාමයෙ"සි.

දක්වනලද ක්‍රමයෙන් බොධිපර්‍යඞකයට ද, වැඩසිටි සථාන
යට ද අතුරෙහි පුවීසක්වළ මුඛවාටයෙහි පටන් පශ්චිම සක්වළ මුඛ
වාටය දක්වා දෙවියන් විසින් මවනලද රැවින්සක්මණෙහි සක්මින්
කරණ සේක්, සතියක් අතික්‍රාන්ත කළසේක. ඒ සථානය දුන්
රත්නවඞ්ක්‍රමණ චෛත්‍යසථාන නම් වි ය. එයින් කිහ උපාසක
ජනාලඞකාරයෙහි. "අථ පලලඞකසස ච සීතවථානසස ච අනතරා
පුරත්ථිමපඨිමතො ආයතෙ රතනවඞකමෙ වඞකමිනෙතා සත්තාහං
වීතිනාමෙසි. තං ඨානං රතනවඞකමණවෙතියං නාම ජාතං"සි.

මෙසේ තුන්වන සප්තාහයෙහි රැවන් සක්මිණ සක්මින්
කොට එසින් මත්තෙහි:—

"නිසිනෙනා භගවා රමෙම මන්දිරෙ රතනුජජලෙ,
සත්තාහං සමමසි සමමා ධමමධාතුමනුත්තරං"-සි.

දක්ඛනලද ක්‍රමයෙන් ශ්‍රී මහාබොධියට පශ්චිමොත්තර දිශා
භාගයෙහි දෙවිඹෝ රුවන් ගෙයක් මැවූහ. ත්‍රෛලොකජනත්‍රාමර
නිෂෙවිත පාදපඞකජෝපශොභිත වූ සර්‍වඥයන් වහන්සේ ඒ රුවන්
ගෙයි පලඟින් වැඩහිඳ පරමගම්භීර වූ අනන්තනය ඇති අභිධම්
පිට කය විශෙෂ හෙයින් වනාහි සම්නන්නපථානය සොයනසේක්, අභිධම්
සම්මර්‍ශනය කරමින් සප්තාහයක් අතික්‍රාන්ත කළසේක. ඒ සථානය
රත්නඝර චෛත්‍ය නම් වි ය.

එයින් කිහ.

"තතෝ පඤ්චමදිසාභාගෙ දෙවතා රතනඝරං නාම මාපයිං සු. තත්ථ පල්ලඞ්කෙන නිසිදිත්වා අනිමිසමට්ඨකං විසෙසතෝ වෙත්ථ අනන්තඤාණය සමන්නාහරිත්වා විවිනන්තෙතා සත්තාහං වීතිනාමෙසි. තං ඨානං රතනඝරවෙනියං නාම ජාතං"-යි.

මෙසේ ශ්‍රී මහාබොධින් වහන්සේගේ සමීපයෙහි ම සතර සප්තාහයක් අතික්‍රාන්තකොට:—

"සත්තාහඤ්ච මාරත්තිං මුඛමුබ්භජ චනඛුසං,
සත්තාහං අජපාලස්ස මූලෙ බුබවසි වසි"යි

දක්වනලද ක්‍රමයෙන් පස්වනසප්තාහයෙහි බොධිවෘක්ෂමූලය කෙරෙන් යම්තැනෙක්හි අජපාල න්‍යග්‍රොධවෘක්ෂය ද එතැන්හි එළඹ සේක. එළඹ එහි වැඩහිඳ රාගවසහක්ෂයට පමුණුවන්නට දෑ මාර සන්‍රින්ගේ අභිප්‍රාය සාධාරණතනොදී ඔවුන් සංක්ෂොභනය කොට රාග පාසයෙන් බඳිමිහ යි කියා සතුටුවීම්වසයෙන් ප්‍රබොධවූ ඔවුන්ගේ මුඛනැමැති අම්බුජවනය දමපියාගාථා නැමැති සඳ රැසින් මලානික කරවා තෙත්‍රලොකාග්‍ර වූ සමීඳ නැමැති වඳුදිව්‍ය රාජතෙම ධර්ම්ය සම්මර්ශනය කෙරෙමින් විමුක්තිසුඛ සඞ්ඛ්‍යාත නිවන්සැප විඳිමින් අජපාල න්‍යග්‍රොධමූලයෙහි සතියක් අතික්‍රාන්ත කළ සේක.

එයින් කිහ.

"එවං බොධිසම්පෙයෙව චත්තාරි සත්තාහානි වීතිනාමෙත්වා පඤ්චමේ සත්තාහෙ බොධිරුක්ඛමූලා යෙන අජපාල නිග්‍රොධො තෙනුපසංකමි. උපසංකමිත්වා තත්‍රෙව ධම්මා විචිනන්තෙතායෙව විමුත්ති සුඛං ච පටිසංවෙදෙන්තෙතා නිසීදි"-යි.

මෙසේ අජපාලන්‍යග්‍රොධවෘක්ෂ මූලයෙහි පස්වන සතිය අතික්‍රාන්තකොට ඉක්බිත්තෙන්:-

"සත්තාහං මුචලින්දස්ස එණ්ඩෙතා භොගමන්දිරෙ,
වසි වසි මහාවීරෙ තදනුග්ගහ බුද්ධියා"-යි.

දක්වනලද ක්‍රමයෙන් සත්දවසක් මුළුල්ලෙහි ධාරුණිප්‍රාතයෙන් චාතුර්දධිකගත ව වස්නා වෂාවට මූවලිඳු නම් විලෙහි මහ මිදෙල් රුක්මූල මුචලින්ද නම් නාගරාජයාගේ භොගමන්දිරයෙහි නොහොත් දරණගර්භයෙහි ධර්මසම්මර්ශනය කෙරෙමින් සතියක් අතික්‍රාන්ත කළසේක. එයින් නික්ම ගොස්:—

"භුඤ්ජමානෙතා සුඛං සෙට්ඨං විරලද්ධිං විමුත්තිජං,
රාජායතනමූලම්හි සත්තාහං භගවා වසී"-යි.

දක්වනලද ක්‍රමයෙන් සත්වනසතියෙහි මිගකිරිපලුවනයට වැඩ කිරිපලු රුකක් මූල ගලස්නෙක වැඩහිඳ ධ්‍යානස්‍රවයෙන් මී සප්තා හානික්‍රාන්ත කළ සේක. මෙසේ සත්සති ය සි කියනලද එකුන් පණස්දවස මුළුල්ලෙහි ආහාරකෘත්‍යයක් නොකොට නිවන්සැප වලඳ, දවස් යවූ කල බුදු වූ පණස්වන දා අරුණෝදයෙහි ශක්‍ර දෙවෙන්ද්‍රයන් විසින් පිළිගන්වනලද දිවඅමාඅරළු පිළිගෙණ වළඳ, එ ම සක්දෙවිරජහු විසින් පිළිගන්වනලද නාලිය දුවිටි වලඳ, අනවතප්ත ජලයෙන් මුඛදෙවන ය කොට නැවත වැඩ එම රාජායතනමූලයෙහි වැඩහුන් කල්හී:—

"සිලාමය වතුපත්තම්හි මහාරුක්ඛේ ආභතේ,
මුඛරෙඛාවසානම්හි මධුපිණ්ඩා අහුඤ්හි සෝ"–යි.

යනු හෙයින් බුදුකෙණෙකුන්ට අග්‍රභොජනයක් පිළිගන්වම් යි ප්‍රාර්ථනාකොට ආවා වූ තපුස්ස, භල්ලික නම් වෙළඳ දෙබෑයන් විසින් මිනිපිඬු ගෙණවූත්–

"පනිගණ්හාතු නො භන්තෙ භගවා ඉමං ආහාරං අනුකම්පං උපාදාය"යි.–යනුවෙන් පිළිගන්වන්ට ආරම්භකළ කල්හි බ්‍රහ්මයා දුන් පාත්‍රය ක්ෂීරපායාස ප්‍රතිග්‍රහණ දිනයෙහි අතුරුදන් වූ හෙයිනුත් කිරි පිඬු පිළිගත් තලිය නාගභවනයට ගිය හෙයිනුත් සිව්වරම් රජදරු වන් විසින් පිළිගන්වනලද මුංවන් ශෛලපාත්‍රයන් සතර ඔවුන්ට අනුග්‍රහපිණිස මතුමත්තෙහි තබා අධිෂ්ඨාන වශයෙන් චතුස්රෙඛා දක්වමින් එක්කොට ගෙණ ඒ ශෛලපාත්‍රයෙන් මීපිඬු පිළිගෙණ වළඳ, ඔවුන්ට අනුමෝදනා වශයෙන් බණවදරා එයින් නික්ම නැවත අජපාලන්‍යග්‍රොධවෘක්ෂ මූලයට වැඩ එහි වැඩහිඳ හැම්බුදුන්ගේ සිරිත් හෙයින්–

"අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරෝ දුද්දසෝ දුරනුබොධෝ සන්තෝ පණීතෝ අතක්කාවචරෝ නිපුණෝ පණ්ඩිත වෙදනීයෝ, ආලයරාමා ඛො පනායං පජා ආලයරතා ආලය සම්මුදිතා, ආලයරාමාය ඛො පන පජාය ආලයරතාය ආලය සම්මුදිතාය දුද්දසං ඉදං ඨානං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදෝ-ඉදම්පි ඛො ඨානං දුද්දසං යදිදං සබ්බසඞ්ඛාරසමථෝ සබ්බූපධි පටිනිස්සග්ගෝ තණ්හා ක්ඛයෝ විරාගෝ නිරොධෝ නිබ්බාණං, අහඤ්චම්ව ඛො පන ධම්මං දෙසෙය්‍යං පරෙ ච මෙ න ආජානෙය්‍යුං. යො මම්සස කිලමථෝ, සා මම්සස විහෙසා"–යි.

යනාදීන් දීඝනිකාය මහාප්‍රදාන සූත්‍රයෙහි වදාළ ක්‍රමයෙන් ද,

"අධිගතො ඛො ම්‍යායං ධම්මෝ පඤ්චසඞ්ඛාරක උදඤ්ඤඛ ඤ්ඩො විය ගම්භීරෝ, පබ්බතෙන පටිච්ඡාදෙත්වා ඨපිතෝ විය දුද්දසෝ,

දුද්දසත්තායෙව දුරනුබොධො, නිබ්බුත සබ්බපරිළාහත්තා සන්තො, සාධුරසභොජනමිව අනිත්තිකරථෙන පණීතො, න තකෙකන අවචරිතබබත්තා අතක්කාවචරෝ, සතධා භින්නස්ස වාලස්ස කොටි විය අණු, බාලානං අවිසයත්තා පණ්ඩිතවෙදනියො, මයා හි ඉමං ධම්මං පටිවිජ්ඣිතුං වායමන්තෙන ආගතාගතානං යාවකාතං අලඞ්කාරපටියත්තං සිසංකත්තිත්වා ගලලොහිතං නීහරිත්වා සුඅඤ්ජිතානි අක්ඛීනි උපපාටෙත්වා කුලවංස පදීපකං පුත්තං මනාපවාරිණිං හරියං දෙන්තෙන මයා අදින්නං දානං නාම නත්ථි.

සඞ්ඛපාලාදිසු අත්තභාවෙසු ජීවිතපරිච්චාගං තිණලවමිව කරොන්තෙන සිලවීනික්කමං පථවි මුබබත්තනම්ව මඤ්ඤමානෙන අරක්ඛිතං සීලං නාම නත්ථි, චූලසුතසොමාදිසු අත්තභාවෙසු මනුස්සත්තං විහනිං පරිච්චජන්තෙන ඛන්තිවාදිපභූනිසු අත්තභාවෙසු ඡෙජ්ජභෙජ්ජාදීනි පාපුණන්තෙන අපූරිතා කාචි පාරමී නාම නත්ථි, තස්ස මෙ වාසර සඤ්ඤා මාරබලං විධමෙන්තස්සාපි පඨමේ න කම්පිත්ථ. පඨමයාමෙ පුබෙබනිවාසං අනුස්සරන්තස්සාපි මජ්ඣිම යාමෙ දිබබචක්ඛුං විසොධෙන්තස්සා පි න කම්පිත්ථ, පච්ඡිමයාමෙ පන පටිචචසමුප්පාදං පච්චවෙක්ඛන්තස්සෙව මෙ දසසහස්සි ලොක ධාතු අයදණ්ඩෙන ආකොටිත කංසතාලං විය විරාව සතං විරාව සහස්සං මුඤ්චමානා වාතාහතෙ පදුමිණිපණ්ණෙ උදකබින්දු විය පකම්පිත්ථ.

ඉති මාදිසෙනාපි තිකඛක්ඛුණෙන කිවෙජනෙවායං ධම්මො පටිවිජ්ඣිතබ්බො, තං ඉමෙ ලොකියමහාජනා කඤ්ඣියපුණ්ණලාබු විය තක්කනරිත වාටි විය වස්ස තෙලෙහි පරිපීතපිලොතිකා විය අඤ්ජන මක්ඛිත්ත හත්ථො විය ච කිලෙසනරිතා අතිසංකිලිට්ඨා රාගරත්තා දොසදුට්ඨා මොහමූළ්හා අවිජ්ජාරාසිනා අජ්ඡොත්ථටා, තෙ කිත්තාවම් පටිවිජ්ඣිස්සන්ති. කො අත්ථො දෙසිතෙනා'ති සඤ්ඤානිරුස්සා හො''සී-යනාදීන් මහාබොධිවංශයෙහි ආ ක්‍රමයෙන් ද ධම්දෙශනා කිරීමෙහි මනෙත්සාහබවට පැමිණි සේක.

කෙසේ ද යත්? මා විසින් පැමිණෙනලද මේ නිර්ඵලධම්ය තෙම පොළොව දරාසිටි උදකස්කන්ධයක් සෙයින් අතිගම්භීර වන්නේ ය. පණිතයකින් වසා තුබු දෙයක් සෙයින් කිසිකෙණෙකුන් විසින් නොදක්කා හැක්කේ ය. නොදක්ක හැකි බැවින් ම අවබොධය කොටගත නොහැක්කේ ය. නිවියා වූ සියලු ක්ලේශ පරිදාහ ඇති බැවින් ශාන්ත වන්නේ ය. මධුර රස ඇති භොජනයක් සෙයින් තෘප්තියකට නොපැමිණෙන කාරණයෙන් ප්‍රණීතය, ආයුෂ්මත් යෙන් මෙස සෙස්සන්ගේ කල්පනායෙන් තර්කණය කොට ගත

නොහැකි බැවින් අනකීර්ණවචරය, සියක්වර පළනලද අස් ලොම් අගක් මෙන් ඉතා සූක්ෂම බැවින් නිපුණය, ධාතුආයතන ප්‍රත්‍යයාකාර කාරණා කාරණ සඞ්ඛ්‍යාත චතුර්විධ කෞශල්‍යයෙන් යුක්ත පණ්ඩිත ජනයන් විසින් දූනගතයුතු බැවින් පණ්ඩිත වේදනීය වන්නේ ය.

එසේ වූ මේ ධර්මය ප්‍රතිවෙධ කරණ පිණිස උත්සාහකරන්නා වූ මා විසින් වනාහී පැමිණි පැමිණි යාචකයන්ට මිණිඔටුහු ආදීන් සරහා පිළියෙළ කරණ ලද්ද, වූ ඉස් කපා දන්දීමෙන් ද ගල ලොහිතය දීමෙන් ද මනාකොට අඳුන් ගා සරහනලද ඇස් උපුටාදීමෙන් ද කුලවංශයට ප්‍රදීපයක් වැනි වූ පුත්‍රයන් හා මනවඩන්නා වූ භාර්‍යාවුන් දන්දීමෙන් ද නුදුන්නා වූ දනයෙක් නම් නැත්තේය. සංඛපාලජාතකාදි වූ ආත්ම භාවවල්හි ජීවිත පරිත්‍යාගය තාණ්ඩ වයක් මෙන් කරන්නාවූ ද ශීලව්‍යතික්‍රමය පොළව පෙරලීමක් මෙන් සිතන්නාවූ ද මා විසින් නොරක්නා ලද ශීලයෙක් නම් නැත්තේ ය. චූල සුතසෝමාදීවූ ආත්ම භාවවල්හි මනොඥ වූ සම්පත්හි ය පරිත්‍යාග කරන්නා වූ මා විසින් ද ඛාන්තිවාදී දී ආත්මභාවවල්හි ඡේදෘහෙදීයට පැමිණෙන්නා වූ මා විසින් ද නුපුරණලද කිසි පාරමිතාවෙක් නම් නැත්තේ ය. මෙබඳු වූ මා සවස් වේලෙහි මාර සෙනාව විධ්වංසනය කරන්නාහට ත් මහිකම්පාව නොකෙළේ ය.

ප්‍රථම යාමයෙහි පූර්වේනිවාසානුස්මෘති ඥානය සම්පිණ්ඩනය කරන්නාහට ද මධ්‍යමයාමයෙහි දිව්‍යංචක්ෂුර්ඥාන ය උපදවන්නාහට ද පශ්චිමතෝමෝ කම්පා නොවී ය. පශ්චිමයාමයෙහි වනාහී ද්වාදශාඞ්ග ප්‍රතීත්‍යසමුත්පාද ය අනුලෝම ප්‍රතිලෝම වශයෙන් ප්‍රතිවෙධය කරන්නා වූ මට ම දසදහසක් සක්වළ යදණ්ඩකින් ප්‍රහාරලන් ලෝහතලියක් සෙයින් සියදහස් ගණන් ධවනි පවත්වමින් පවනින් පහරණලද පියුම් පතෙහි ජලබිඳුවක් මෙන් කම්පා කළා ය.

මෙසේ මෙබඳු වූ තීක්ෂණ ප්‍රඥ ඇත්තා වූ මා විසිනුදු මේ ධර්මය දුකසේ ප්‍රතිවෙධය කරණලද මේ ලෞකික මහජනයෝ කාඞ්ක්ෂා යයි කියනලද කළකැඳින් පුරණලද ලබුඵලයක් සෙයින් ද හක්‍රෝධ යයි කියනලද මෝරු පිරුණු සැලක්මෙන් ද වසා තෙල් ය යි කියනලද මස්තෙලින් රඳනාලද රෙදිකඩක් මෙන් ද අඳුන් වැකිගිය හස්තයක් මෙන් ද ක්ලේශයෙන් හරිතයහ. ඉතා සංක්ලිෂ්ටයහ. රාගයෙන් රක්තයහ. දෝෂයෙන් දූෂ්‍යයහ. වතුස්සත්‍යාදීන් නොදක්නා, අවිද්‍යා රාශින් මැඩ මිරිකාපියන ලදහ. එසේ වූ සත්වයෝ මෙසේ වූ ගාම්භීර ධර්මය කෙසේ නම් ප්‍රතිවෙධ කෙරෙද් ද. එසේ වූ කල ධර්මදේශනාව

කිරීමෙන් ප්‍රයෝජන කවරේදැයි ධර්මදේශනාවට උපන්නා වූ මහේන්ද්‍රාභ ඇතිසේක් ඒ පරිවිතර්කය දුටු සහම්පති මහාබ්‍රහ්මයා විසින්:—

"නස්සන්ති වත භෝ ලෝකෝ විනස්සති වත භෝ ලෝකෝ යත්‍ර හි නාම තථාගතස්ස අරහතෝ සම්මාසම්බුද්ධස්ස අප්පෝස්සුක්කතාය චිත්තං නමති නෝ ධම්මදේසනාය"–යි.

යනුවෙන් දසසහස්‍රලෝකධාතුව එකනින් නාදකෙරෙමින් මහත් සවරයක් විහිද මහාබ්‍රහ්මරාජතෙම දසදහසක් සක්වළ සපිරිවර වූ දසදහසක් මහාබ්‍රහ්මයන් හා එසෙයින් ම සපිරිවර වූ දසදහසක් පරනිර්මිත දිව්‍යරාජයන් හා දසදහසක් සුනිර්මිත දිව්‍යරාජයන් හා දසදහසක් තුෂිතදිව්‍යරාජයන් හා දසදහසක් සුයාමදිව්‍යරාජයන් හා දසදහසක් ශක්‍රදිව්‍යරාජයන් හා සතළිස් දහසක් වරම් රජදරුවන් හා සමග:—

"සෙය්‍යථාපි නාම බලවා පුරිසෝ සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය, පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එවමෙවං බ්‍රහ්මලෝකෙ අන්තරහිතෝ භගවතෝ පුරතෝ පාතුරහොසි"–යි.

දක්වනලද ක්‍රමයෙන් බුදුන්ගේ අභිමුඛයට ප්‍රාදුර්භූත ව උතුරුසළුව එකාංශකොට දකුණු දනමඬල බිම හැන දෙහොත් මුදුනෙහි තබා:—

"දෙසෙතු භන්තෙ භගවා ධම්මං. දෙසෙතු සුගතෝ ධම්මං. සන්තීධ සත්තා අපරජක්ඛජාතිකා අස්සවණතා ධම්මස්ස පරිහායන්ති· භවිස්සන්ති ධම්මස්ස අඤ්ඤාතාරෝ–යි.

යනුවෙන් ධර්මදේශනාවට ආරාධනා කෙළේ ය. සුරාසුර මුනි මනුජ වන්දනීය වූ සම්බුදුරජාණන් වහන්සේ ත් බුඩ චක්‍ෂුසින් ලොව බලා වදුරා බ්‍රහ්මාරාධනාව පිළිගෙණ මම කවරක්හට ධර්මදේශනා කෙරෙම් ද කවරෙක් නම් මාගේ ධර්මය වහා පිළිගන්නට සමර්ථ වේ දෝ සි බලා ආලාරකාලාමයන් හා උද්දකරාම පුත්‍රයන් කළුරිය කළ නියාව දැක කෘෂ්ණාභිජාතියක් මුළුල්ලෙහි අග්‍ර දහම් පිළිගන්නට කරණ ලද ප්‍රාර්ථනා ඇති අඤ්ඤාකොණ්ඩඤ්ඤාදී පස්වග මහණුන් වහන්සේ දැක කාසීපුරයට වඩනා සේක් අතර මගදී උපක නම් ආජීවකයන්හට වන වැඩ දැක භූමියෙහි වැඩ ඔනුට සුදුසු අනුකම්පා කොට දිව්‍යමනුෂ්‍යයන් හා අතරමග දුටු මෘග පක්ෂීන් සතුටු කරවමින් අටළොස් යොදුන් මග ගෙවා ඓරණ්‍යෘෂි ඉසිපතනාරාමයට වැඩි සේක. ප්‍රතීත්‍යසමුත්පාද ධර්ම සාගර විලෝලිත ඥානමෙරුමස්තකවූ සම්බුදු රාජෝත්තමයානන් වහන්සේ වඩනා බැව් දුටු පස්වග මහණුන්නාන්සේ ශ්‍රමණ භවත්

ගෞතමයෝ දුෂ්කරක්‍රියා හැර තමන් රජකුලෙහි උපන් සෙයින් සුඛිතයන් විසින් දෙන ලද රසමසවුලෙන් යුක්ත වූ මධුරාහාර ය අනුභව කොට ශරීර වර්ණ ලදින් රන්කඳක් සේ දිලිහි දිලිහි බුදු ව ගත නොහී අප කරු දැන් එති.

රජ කුලෙහි උපන් හෙයින් හිඳිනා අසුන් පමණක් දෙන බව මුත් වන්දනමානාදියක් නොකරම්හ යි කපිකා කළහ. සතර මර ලෝකයාගේ සාකල්‍යාඛ්‍යාස ය දක්නා ඥන තැමිති කැටපතින් සර්වාම්දරුවානෝ ඒ භික්ෂූන් වහන්සේගේ අඛ්‍යාස ය දැක සියලු සත්වයන් කෙරෙහි පතළා වූ මහාකරුණාව ඒ පස්වග මහණුන් වහන්සේ කෙරෙහි ද පවත්වා වදළ සේක. එකල් බලවතුරෙන් ඉපිලෙන පරඛලා පත් සේ හුනස්නේ හිඳගත නොහී පස්වග මහණුන් වහන්සේ නැඟී බුදුන්ගේ ශ්‍රීපාද මූලයෙහි වැඳ පෙරළී පාසිවුරු අතින් ගෙන සියලු ආගන්තුක වත් සපයා බුදු වූ බැවි නොදැන සමසමයන් සේ ආවුසොවාදයෙන් කථාකෙරෙමින් සිටි කල්හි "මාහිකඛවෙ තථාගතං නාමෙන ව ආවුසොවාදෙන ව සමුදාචරථ. අරහං හිකඛවෙ තථාගතො සම්මාසම්බුඩ්ඩො"-යි.

යනුවෙන් තමන් වහන්සේ සම්බුදු වූ පරිදි හඟවා ඇසළ මස පුණුපොහොය දිනයෙහි උත්‍රාසළ නැකත්හි මහා පූජාවලියෙහි කියන ලද ක්‍රමයෙන් දෙනිස් මහා ප්‍රාතිහාර්‍යතා ප්‍රාදුර්භූතවෙමින් සිටිය දී හැම බුදුන් දම්සක් පැවතුම් සූත්‍රදෙශනාවට වැඩහුන් සථානයෙහි ම ප්‍රඥප්තාවර බුඛාසනයෙහි යුගදුරු මුදුනෙහි දසදිග අදුරු විදාහ දිලිහෙන ලඟිරුමඩලක් සේ නීල පීත ලොහිතාවදාත මාඤ්ජිෂ්ට ප්‍රභාසවර ය යන ෂට්වර්ණ ඝණ බුඛරශ්මි මාලායෙන් සියලු ලොව එකෙලි කෙරෙමින් වැඩ හිඳ තමන්වහන්සේගේ පාරමිතා නැමැති ජලයෙන් සම්පූර්ණ වූ බුඛ ඥන නැමැති අසිසිර කානනියෙන් ප්‍රබොධ වූ අතිරකත වූ ජිවිතාධාතු නැමැති කර්ණිකා ඇති දන්තධාතු නැමැති කෙසුරු ඇති සුරකත වූ දන්තාවරණ නමැති පත්‍ර ඇති, දෙශනා ධම් නමැති මධුබින්දුයෙන් ශ්‍රවණ ජත නමැති භෘඞ්ගයත් පිණවන පිණිස-

"මෙමෙ භිකඛවෙ අනනා පබ්බජිතෙන න සෙවිතබබා"

යනාදීන් දම්සක් පැවතුම් සූත්‍රදෙශනාවට පටන් ගත් සේක. මේ ධම් චක්‍රය පැවැත්වීම නම් ලොකයෙහි රජ පැමිණි සියලු රජ දරුවන් විසින් ම දැරිය යුතු මුකතාභාරයක් සෙසින් සම්තේ ගෙවා දත් සියලු සම්බුදු වරයන්ගේ ම ධම්තාවෙකි.

ඒ එසේ ම ය. සම්බුදුයන් වහන්සේ ලොකයෙහි ප්‍රාදුර්භූත වූ කල්හි ආශ්චය්‍ය අද්භූත ධම්යෝ සතර දෙනෙක් ප්‍රාදුර්භූත වෙත්.

එයින් වදළහ

'තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතු භාවා චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්ති. කතමෙ චත්තාරො? ආලයරාමා ඛො භික්ඛවෙ පජා ආලය රතා ආලය සම්මුදිතා, සා තථාගතෙන අනාලයෙ ධම්මෙ දෙසියමානෙ සුස්සුසති සොතං ඔදහති අඤ්ඤු චිත්තං උපට්ඨපෙති. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං පඨමො අච්ඡරියො අබ්භුතො ධම්මා පාතුභවති. මානාරාමා භික්ඛවෙ පජා මානරතා මානසම්මුදිතා, සා තථාගතෙන මානවිනයෙ ධම්මෙ දෙසියමානෙ සුස්සුසති සොතං ඔදහති අඤ්ඤු චිත්තං උපට්ඨපෙති. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මා සම්බුද්ධස්ස පාතුභාවා අයං දුතියො අච්ඡරියො අබ්භුතො ධම්මා පාතුභවති.

අනුපසමාරාමා භික්ඛවෙ පජා අනුපසමරතා අනුපසමසම්මුදිතා, සා තථාගතෙන ඔපසමිකෙ ධම්මෙ දෙසියමානෙ සුස්සුසති සොතං ඔදහති අඤ්ඤුචිත්තං උපඨපෙති. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මා සම්බුද්ධස්ස පාතුභාවා අයං තතියො අච්ඡරියො අබ්භුතො ධම්මා පාතුභවති. අවිජ්ජාගතා භික්ඛවෙ පජා අඛ භූතා පරියොනද්ධා සා තථාගතෙන අවිජ්ජාවිඝාතෙ ධම්මෙ දෙසිය මානෙ සුස්සුසති සොතං ඔදහති අඤ්ඤුචිත්තං උපට්ඨපෙති. තථා ගතස්ස භික්ඛවෙ අරහතො සම්මා සම්බුද්ධස්ස පාතුභාවා අයං චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මා පාතුභවති. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මා සම්බුද්ධස්ස පාතුභාවා ඉමෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්ති''-යි.

මාගේ ධම්ප්‍රකරණය සාරාර්ථ සඞ්ග්‍රහයෙහු ත් ත්‍රිපිටක යෙහු ත් ප්‍රඥසකති වූ පරිද්දෙන් චතුරාර්ය්‍යසත්‍යාදී සාරාර්ථයන් ගෙණ මේ බුඩ ශබ්දයෙහි සඞ්ග්‍රහ කෙරෙමි යි කියා කළ ප්‍රතිඥව මූදන පිණිස ත් 'බොධෙතා පජායාති බුඩ්ඩො'' යන පදයට ම යොග්‍ය වූ හෙයින් ත් මේ තැන් සිට නිය අගින් ගෙණහැර දක්වන මහාපාපිච්ය පස් සේ එක දෙශයකින් දම්සක් පැවතුම් සූත්‍රයෙහි අර්ථ ගෙණහැර දක්වමි. ඒ මාවිසින් ප්‍රකාශ කරන්නා වූ ධර්මචක්‍ර යෙහි අර්ථ සිත්හි ලා මනාකොට ඇසිය යුතු

මෙසේ භික්ඛවෙ, යන තන්හි සප්තධර්ම කොණෙකුත් හිඳුන කළ හෙයින් භික්ෂු නම් වේ.

එයින් වදළ හ.

''සත්තන්නං භික්ඛවෙ ධම්මානං හිඳුනත්තා භික්ඛු හොති. කතමෙසං සත්තන්නං? සක්කායදිට්ඨි හිඳුනා හොති විචිකිච්ඡා,

භික්‍ෂූ හොති. සීලබ්බතපරාමාසෝ භික්‍ෂූ හොති. රාගෝ භික්‍ෂූ හොති. දෝසෝ භික්‍ෂූ හොති. මෝහෝ භික්‍ෂූ හොති. මානෝ භික්‍ෂූ හොති. ඉමේසං ඛෝ භික්‍ඛවේ සත්තන්නං ධම්මානං භික්‍ෂූනත්තා භික්‍ඛු හොති''යි.

සාමාන්‍යයෙන් සසරෙහි භය දක්නා අර්‍ථ ය ගෙණ ''සංසාරෙ භයං ඉක්‍ඛතීති භික්‍ඛු''යී කියා විශුද්ධිමාර්‍ගයෙහි කිහු-ඒහි භික්‍ෂූනපට දරණ නෙයින් භික්‍ෂූ ය යි කියා අභිධර්‍ම අට්ඨවාවෙහි කිහු-''භික්‍ඛවෙ'' යනු ''ලතෝ වොකාරෙ ව'' යන කාත්‍යායන සූත්‍රයෙහි වග්‍රහණයෙන් හෝ ''පුමාලපනෙ වෙවෝ'' යන මෞද්ගල්‍යායන සූත්‍රයෙන් හෝ ''වෙ'' යනු ආදෙශ වූ ආමන්ත්‍රණයෙහි ප්‍රථමා යි. නොඑසේ නම් දිව්‍යබ්‍රහ්මයන් විද්‍යමානවූ ව කවර හේතුව කින් භික්‍ෂූන් ම ආමන්ත්‍රණ ය කළ සේක් ද යත්?-ඔවුන් ජ්‍යෙෂ්ඨ හෙයිනු ත් ශ්‍රෙෂ්ඨ හෙයිනු ත් සද්‍සන්නිහිත හෙයිනු ත් ආමන්ත්‍රණය කළෝ.

ඔහු ප්‍රථමොත්පන්න වන බැවින් ජ්‍යෙෂ්ඨය හ. සකල ශාසන ප්‍රතිග්‍රාහක වන බැවින් ශ්‍රෙෂ්ඨය හ. තථාගත සම්පවර්නි වන බැවින් සද්‍ සන්නිහිත ය හ. ඒ හේතුවෙන් ''භික්‍ඛවෙ''යි කරුණා විස්ථාර සෞම්‍යහෘදය සන්නිපාත වූ පූර්‍ණඝම වචනයෙන් සහුන්ගේ ම ආමන්ත්‍රණ ය කළෝ ය යි කියා බොධිවංශ ග්‍රන්ථි පද විවරණයෙහි කිහු.

මෙසේ පවත්වන්ට ආරම්භකළ ධර්‍මචක්‍රය ශ්‍රද්ධාවත් කුලපුත්‍ර යන්ට දර්‍ශනීය වූ චතුර්විධ කාරණයන් අතුරෙන් එක් කාරණයෙකි.

එසින් වදුලහ—මහාපරිනිර්‍වාණ සූත්‍රයෙහි ආනන්ද ස්ථවිරයන්ට.

''චත්තාරිමානි ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි, කතමානි චත්තාරි? ඉධ තථාගතෝ ජාතොති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉධ තථාගතෝ අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉධ තථාගතෙන අනුත්තරං ධම්මචක්කං පවත්තිතන්ති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉධ තථාගතෝ අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතොති ආනන්ද සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං, ඉමානි ඛෝ ආනන්ද චත්තාරි සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි''යි.

මෙසේ භික්ෂූන්ට ආමන්ත්‍රණය කළා වූ සම්මැතෙම භික්ෂු වෙ, මහණෙනි! නිනො, ලාමක වූ (හෙවත් නිවණට මෙහෙයන ලද සිත් නැත්තා වූ සසරෙහි කරණ ලද ඇලුම් ඇත්තා වූ නීව යන්ට ම සුදුසු හෙයින් නීව වූ); ගමෙමා, ග්‍රාම්‍ය වූ (හෙවත් පඤ්චස්ථානයකින් ලැමෙහි ඇලිගිය වදුරකු සෙයින් නිවන් සැපයෙහි ආල ය හැර පඤ්චකාමයෙහි ම ආල ය කළ ගිහිගෙයි වැස්සන්ගේ ම සවභාවධර්මය වූ); පොථුජ්ජනිකො, අඛ්බාල පෘථග් ජනයන් විසින් පුරුදු කරණ ලද (හෙවත් ඛ්‍රගීඛ්‍රාශූවි පූතිමාංශා දිය සෙවුනා නීලමක්ෂිකාදින් සෙයින් පඤ්චකාමයෙහි ලොභී වූ මොහයෙන් මුළා වූ බාලජනයන් විසින් සෙවනය කරණ ලද්දා වූ);

අනරියො, අනාර්‍ය්‍ය වූ (හෙවත් බුඛප්‍රත්‍යෙකබුඛ අග්‍රශ්‍රාවක මහා ශ්‍රාවකාදී ආර්‍ය්‍යයන් විසින් ආශිර්විෂයක් සේ උච්චාර ප්‍රස්‍රාව යක් සේ නිතුකොට හරණ ලද බැවින් ද, අඥාණ ජනයන් විසින් රූපයෙහි ආසාවෙන් හින්නෙහි වැටී නස්නා පලඟැටියන් සේ, ශබ්දයෙහි ආශාවෙන් මිණිපන්දමෙන් නස්නා මෘගයන් සේ, සුග න්‍ධයෙහි ආශාවෙන් ඇතුන් කණවැදී නස්නා භෘඞ්ගයන් සේ, රසයෙහි ආශාවෙන් මහා ගොදුරු සි සිතා බිලියෙහි ඇවිණී නස්නා මත්ස්‍යයන් සේ, ස්පර්‍ශයෙහි ආශාවෙන් වනයෙහි නොසිට ඇතින්න කෙරෙහි බැඳී ගමට අවුත් මිනිසුන් කෙරෙන් අනෙකවධයට පැමිණී හස්තීන් සෙයින්, ක්‍රීඩාවට සුදුසු වසතුවෙ කැ සි සිතා දිලිහෙන අඟුරු අල්වා නස්නා ලදරුවන් සෙයින්, වර්ණයෙන් ගන්‍ධයෙන් ආකාරයෙන් රසයෙන් අඹ වැනි කිම්පකක නම් විෂඵල අනුභවකොට නස්නා සත්වයන් සෙයින්, සේවනය කරණ හෙයින් ද එ බඳු අඥාන ජනයන් විසින් භජනය පර්‍යුපාසනය කරණලද බැවින් ද අනාර්‍ය්‍ය වූ උතුම් නොවන්නා වූ);

අනර්‍ථසංහිතො, බුඛාදි මහොත්තමයන්ට සෙයින් හිත සැප එළවන ලොකොත්තර සැපතින් පිරිහුණු හෙයින් හිත සැප එළවන කාරණ යෙ ආශ්‍රය නො කළා වූ හෙවත් අවැඩ ම ආශ්‍රය කළා වූ; කාමේසු, වසතුකාමයෙහි; යොවායං, යම් මේ; කාම සුඛල්ලිකානුයොගො, කෙලෙසකාම සැපයාගේ යෙදීමෙක් ඇද්ද; (හෙ ද) දුකෙඛා, දුකඛයට කාරණා වූ (හෙවත්) කණ්ටකා පසසය සර්‍යනාදි වූ ආත්මබාධක දුකඛය එලවන්නා වූ);

අනරියො, ආර්‍ය්‍යයන් සතුටු නො වූ; අනර්‍ථසංහිතො, අනර්‍ථක වූ; යොවායං, යම් මේ; අත්තකිලමථානුයොගො, ආත්මකල මථයෙහි යෙදීමෙක් ඇද්ද; (යත) ඉමෙනේව අනනා, මේ

කොට්ඨාසද්වය නෙවත්, මේ දෙ කාරණයෝ; පබ්බජිතෙන, ගෘහස්ථ බන්ධනය ඡේදෘ කොට ප්‍රව්‍රජිත භාවයට ළඟිය‍ා වූ තොප විසින්; න සෙවිතබ්බා, වලඤ්ජනය නො කට යුත්තා හ නෙවත් නො සෙවිය යුත්තාහ යි වදළ සේක.

යථොක්ත අර්ථයෙන් "කාමසුඛල්ලිකානුයොගො" යන තන්හි සුඛල්ලිකානුයොගය වනාහි අනෙකවිධ වේ.

එසින් වදළ හ—දීඝනිකායෙහි.

"ඨානං ඛො පනෙතං චුන්ද විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං සුඛල්ලිකානුයොග මනුයුත්තා සමණා සක්‍ය පුත්තියා විහරන්ති'ති. එවං වාදිනො චුන්ද අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා, කතමො සො ආවුසො සුඛල්ලි කානුයොගො සුඛල්ලිකානුයොගාපි හි බහු අනෙකා විවිධා නාන පකාරකා"යි.

එසින් හීන වූ සඛභාව ඇති පෘථග් ජනික වූ එ හෙයින් ම උතුම් නො වන්නා වූ උතුම් නො වන බැවින් අනර්ථ ඉශ්‍ර වූ එ හෙ යින් ම නිර්වේදන විරාග නිරොධූපසමාභිඥා සම්බොධි නිර්‍වාණ සම්ප්‍රාප්ත නැපය පිණිස නො පවත්නා වූ සතරෙක් වේ. කවර නම් සතරෙක් ද යත්:—

මේ ලොකයෙහි හෝ සත්ත්වයෙහි හෝ ඇතැම් කෙණෙක් ප්‍රාණීන් නස නසා ජීවත් වෙමින් තමාට සැපතැ යි සිතා සතුටු වෙති. මේ ප්‍රථම සුඛල්ලිකානුයොගය නම් වේ.—ඇතැම් කෙණෙක් එසේ ම අදත්තාදනයෙන් සතුටු වෙති. වේ දෙවෙනි සුඛල්ලිකානු යොගය නම් වේ—ඇතැම් කෙණෙක් අභූත වචන සම්ප්‍රයොග මුසා වාදය කියා තමා සැපතෙහි යොදා සතුටු වෙති. මේ තුන්වෙනි සුඛල්ලිකානුයොගය නම් වේ.—ඇතැම් කෙණෙක් රූප, ශබ්ද, ගන්ධ, රස ස්ප්‍රෂ්ටව්‍යසම්බන්ධිත පඤ්චකාම ගුණයෙන් තමා සතුටු කරවති. මේ සතරවැනි සුඛල්ලිකානු යොගය නම් වේ. මේ සතර සුඛල්ලිකානු යෝගයෝ බාලයන් විසින් සේවනා දිය කරණ ලද බැවින් නිර්‍වාණය පිණිස නො පැමිණෙත්.

එසින් වදළ හ.

"චත්තාරො ඛො චුන්ද සුඛල්ලිකානුයොගා හීනා ගම්මා පොථුජ්ජනිකා අනරියා අනත්ථ සංහිතා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බා ණාය සංවත්තන්ති. කතමෙ චත්තාරො? ඉධ චුන්ද එකච්චෙ‍ා

පාණෙ වධිත්වා අත්තානං සුඛෙති. පිණෙති, අයං පඨමෝ සුඛල්ලි කානුයොගෝ, පුන ච පරං චුන්ද ඉධෙකච්චෝ අදින්නං ආදිසිත්වා අත්තානං සුඛෙති. පිණෙති. අයං දුතියෝ සුඛල්ලිකානුයොගෝ.

පුන ච පරං චුන්ද ඉධෙකච්චෝ මුසා භණිත්වා අත්තානං සුඛෙති. පිණෙති. අයං තතියෝ සුඛල්ලිකානුයොගෝ, පුන ච පරං චුන්ද ඉධෙකච්චෝ පඤ්චහි කාමගුණෙහි සමප්පිතෝ සමඞ්ගිභූතෝ පරිවාරෙති. අයං චතුත්ථෝ සුඛල්ලිකානුයොගෝ. ඉමෙ ඛෝ චුන්ද චත්තාරෝ සුඛල්ලිකානුයොගා නිනා ගම්මා පොථුජ්ජනිකා අන රියා අනත්ථසංහිතා න නිබ්බිදාය න විරාගාය න නිරොධාය න උපසමාය න අභිඤ්ඤාය න සම්බොධාය න නිබ්බානාය සංවත්තන්ති:—

එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති:—

එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති:—

එකන්ත නිබ්බිදය පිණිස විරාගය පිණිස නිරොධය පිණිස කෙලෙසුන්පසම්ය පිණිස සත්‍ය ප්‍රතිවෙධය පිණිස ඔවුන්ගේ ම අවබෝධය පිණිස නිර්‍වාණය පිණිස පවත්නා වූ සුඛල්ලිකානු යොගයෝ සතර දෙනෙක් වෙත්:—

ඔහු කවරහු ද යත්:—

මේ ශාසනයෙහි භික්ෂු තෙමේ කාමයන් කෙරෙන් වෙන්ව අකුශල ධර්මයන් කෙරෙන් වෙන්ව විතර්ක සහිත වූ විචාර සහිත වූ විවේකයෙන් උපන්නා වූ ප්‍රීති සැප ඇති ප්‍රථමධ්‍යානයට පැමිණ වෙසේ ද, මේ කුශල පක්ෂයෙහි ප්‍රථම සුඛල්ලිකානුයෝගය නම් වේ.

විතර්ක විචාර දෙදෙනා ගේ සංසිදීම් හේතුකොටගෙණ සව සන්තානය විශෙෂයෙන් පැහැදීම් කරන්නා වූ චිත්තයා සම්බන්ධ ව එකඟබව ඇති විතර්ක රහිත වූ විචාර රහිත වූ සමාධියෙන් උපන් නා වූ ප්‍රීති සැප ඇති දවිතියධ්‍යානය උපදවා වෙසේ ද මේ එහි දෙවෙනි සුඛල්ලිකානු යෝගය නම් වේ.

ප්‍රීති විරාගය හේතුකොට ගෙණ උපෙක්ෂා ඇත්තේ ද සමෘති ඇත්තේ ද සම්ප්‍රජානකාරී වූයේ ද වසන්නේ ය. ආර්‍ය්‍ය යෝ යම් බඳු වූ ඕහට උපෙක්ෂා ඇත්තේ ය. සමෘතිසම්පන්නය. සැප වූ විහරණයන් ඇත්තේ ය යි කියද්ද එ බඳු වූ සැපය ද කයින් විඳිනේ .ය ඒ තෘතීයධ්‍යානයට සමවැද වසන්නේ ය. මේ එහි තුන්වෙනි සුඛල්ලිකානුයෝග නම් වන්නේ ය.

නැවත සැපයාගේ ප්‍රහාණය හේතුකොටගෙණ ද දුක්ඛයා ගේ ප්‍රහාණය හේතුකොට ගෙණ ද සොමනස්ස දෞමනස්සයන්ගේ

පළමු විනාශය හේතුකොටගෙණ ද දුක් නැති සැප නැති උපෙක්ෂා සමාධි පාරිසුද්ධි ඇති චතුර්ථධ්‍යානයට සම්වැද වෙසේ ද, මේ එහි සතරවැනි සුඛල්ලිකානුයොගය නම් වේ. මේ සුඛල්ලි කානුයෝගයෝ සතරදෙන වනාහි නිර්‍වාණය පිණිස පවත්නා හු සි. එසින් වදළ හ:—

"චත්තාරෝ මේ චුන්ද සුඛල්ලිකානුයොගා එකන්ත නිබ්බි දාය විරාගාය නිරොධාය උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති. කතමේ චත්තාරෝ? ඉධ චුන්ද භික්ඛු විවිච්චේව කාමේහි විවිච්ච අකුසලේහි ධම්මේහි සවිතක්කං සවි චාරං විවේකජං පීතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. අයං පඨමෝ සුඛල්ලිකානුයොගෝ. පුන ච පරං චුන්ද භික්ඛු විතක්කවිචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසෝ එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පීතිසුඛං දුතියජ්ඣා නං උපසම්පජ්ජ විහරති. අයං දුතියෝ සුඛල්ලිකානුයොගෝ.

පුන ච පරං චුන්ද භික්ඛු පීතියා ච විරාගා උපෙක්ඛකෝ ච විහරති. සතෝ සම්පජානෝ සුඛං ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකෝ සතිමා සුඛ විහාරීති-තති යජ්ඣානං උපසම්පජ්ජ විහරති. අයං තතියෝ සුඛල්ලිකානු යොගෝ. පුන ච පරං චුන්ද භික්ඛු සුඛස්ස ච පහාණා පුබ්බෙව සෝමනස්ස දෝමනස්සානං අත්ථඞ්ගමා අදුක්ඛං අසුඛං උපෙක්ඛා සති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති-අයං චතුත්ථෝ සුඛල්ලිකානුයොගෝ. ඉමේ ඛෝ චුන්ද චත්තාරෝ සුඛල්ලිකානු යොගා එකන්ත නිබ්බිදාය විරාගාය නිරොධාය උපසමාය අභි ඤ්ඤාය සම්බොධාය නිබ්බාණාය සංවත්තන්ති"සි.

මෙසින් ප්‍රථමයෙන් දැක්වූ සුඛල්ලිකානුයෝගයෝ සතර දෙන අනෙක ප්‍රකාරයෙන් අධම වෙත්. දෙවෙනි ව දැක් වූ ප්‍රථම ධ්‍යානාදි සුඛල්ලිකානුයෝගයෝ සතරදෙන ප්‍රවර වෙත්. (උතුම් වෙත්.) හෙ ද මතු දක්වන පාළික්‍රමය බලා සැක දුරු කටයුතු.

"වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි වෙ? ගිහිසුඛං ච පබ්බජ්ජා සුඛං ච. ඉමානි ඛෝ භික්ඛවෙ වෙ සුඛානි. එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං පබ්බජ්ජා සුඛන්ති.

වෙමානි භික්ඛවෙ සුඛානි, කතමානි දෙ? කාම සුඛං ච නෙක්ඛම්ම සුඛං ච. ඉමානි ඛෝ භික්ඛවෙ දෙ සුඛානි, එතදග්ගං භික්ඛවෙ ඉමෙසං ද්වින්නං සුඛානං යදිදං නෙක්ඛම්මසුඛන්ති.

දෙවමානි භික්ඛවෙ සුඛානි, කතමානි දෙව? උපධි සුඛං ච නිරුපධි සුඛං ච, ඉමානි ඛො භික්ඛවෙ දෙව සුඛානි, එතදග්ගං භික්ඛවෙ ඉමෙසං දවින්නං සුඛානං යදිදං නිරුපධි සුඛන්ති.

දෙවමානි භික්ඛවෙ සුඛානි, කතමානි දෙව? සාසවං ච සුඛං අනාසවං ච සුඛං, ඉමානි ඛො භික්ඛවෙ දෙව සුඛානි; එත දග්ගං භික්ඛවෙ ඉමෙසං දවින්නං සුඛානං යදිදං අනාසවං සුඛන්ති.

දෙවමානි භික්ඛවෙ සුඛානි, කතමානි දෙව? සාමිසං ච සුඛං නිරාමිසං ච සුඛං, ඉමානි ඛො භික්ඛවෙ දෙව සුඛානි, එත දග්ගං භික්ඛවෙ ඉමෙසං දවින්නං සුඛානං යදිදං නිරාමිසං සුඛන්ති.

දෙවමානි භික්ඛවෙ සුඛානි, කතමානි දෙව? අරියසුඛඤ්ච අන රිය සුඛං ච. ඉමානි ඛො භික්ඛවෙ දෙව සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං දවින්නං සුඛානං යදිදං අරියසුඛන්ති.

දෙවමානි භික්ඛවෙ සුඛානි, කතමානි දෙව? කායිකං ච සුඛං වෙතසිකං ච සුඛං, ඉමානි ඛො භික්ඛවෙ දෙව සුඛානි; එත දග්ගං භික්ඛවෙ ඉමෙසං දවින්නං සුඛානං යදිදං වෙතසිකං සුඛන්ති.

දෙවමානි භික්ඛවෙ සුඛානි, කතමානි දෙව? සපීතිකං ච සුඛං නිපීතිකං ච සුඛං, ඉමානි ඛො භික්ඛවෙ දෙව සුඛානි; එතදග්ගං භික්ඛවෙ ඉමෙසං දවින්නං සුඛානං යදිදං නිපීතිකං සුඛං"යි.

ත්‍රෛලොක්‍යවායසී වූ සම්බුදුරජාණන් වහන්සේ පළමුකොට ම කුමක් හෙයින් කාම සුඛල්ලිකානු යොග ය යි කියන ලද වස්තු කාම-කෙලෙසකාම ය පැවිදි වූවන් විසින් නො සෙවිය යුතු ය යි කියා ප්‍රතික්ෂේපකොට වදාළ සේක් ද යත්? පඤ්චකාම සේවනය කරන්නා හට බොහෝ අකුසල් වඩනා හෙයිනි. ඒ පඤ්චකාම යෝ නම් කවුරු ද යත්?

ඇසින් දක්නා රූපය, කණින් අසන්නා වූ ශබ්දය, නාසයෙන් ආඝ්‍රාණය කරන්නා වූ සුගන්ධය, දිවින් විඳිනා වූ රසය, කයින් විඳිනා වූ ස්පර්ශය, සත පස යි. එහි නෙත්‍රයෙන් දක්නා සුලු වූ වස්තු සියල්ල ම රූපයෙහි ඇතුළත් වුව ද සත්‍රී රූපය හැර පුරුෂයන් ගේ සිත් ගන්නා අන් කිසි රූපයක් නම් නැත.

එසින් වදළ හ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සම්නුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථි රූපං-ඉත්ථිරූපං භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිඨති"සි.

කණින් අසන්නා වූ සියලුම ශබ්දය ශබ්දයෙහි ඇතුළත් වුව ද සත්‍රීන්ගේ වවන ශබ්දය, ගායනා ශබ්දය ආභරණ වලනාදි ශබ්දය යන මේ හා සමාන වූ පුරුෂයන්ගේ සිත්ගන්නා අන් කිසි ශබ්දයෙක් නම් නැත්.

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එක සද්දම්පි සම්නුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථි සද්දෝ. ඉත්ථිසද්දෝ භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිඨති"සි.

නාසිකාවෙන් ආඝ්‍රාණය කරන්නාවූ සියලු ගඤ්ඡය ගඤ්ඡයෙහි ඇතුළත් වුව ද සත්‍රීන්ගේ ශරීර සුගඤ්ඡය හා සමාන වූ පුරුෂයන්ගේ සිත් ගන්නා අන්කිසි ගඤ්ඡයෙක් නම් නැත්—

එසින් වදළ හ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකගඤ්ඡම්පි සම්නුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථි ගන්ධෝ. ඉත්ථි ගන්ධෝ භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිඨති'සි.

දිවින් විඳිනා සියලු රසය රසයෙහි ඇතුළත් වුව ද සත්‍රීන් ගේ දනනාවරණ, සත්‍රීන් විසින් අනුභව කළ තාම්බූල කවවාදි සත්‍රීරසය හා සමාන වූ පුරුෂයන්ගේ සිත් ගන්නා අන්කිසි රසයෙක් නම් නැත්.

එසින් වදුළ හ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකරසම්පි සම්නුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථිරසෝ. ඉත්ථිරසෝ භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති"සි.

ශරීරයට සුවපහස් ඵලවත්නා වූ මෘදු මොලොක් මල් අතුල අසුන් කත්වසින් සිහින් ඇතිරිලි ආදිය ප්‍රභවවුව ද සත්‍රීන් ගේ ශරීරය වැළඳ ගන්නා ස්පර්ශය හා සමාන වූ පුරුෂයන්ගේ සිත්ගන්නා අන්කිසි ස්පර්ශයෙක් නම් නැත්.

එසින් වදළ හ

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකඵොඨබ්බම්පි සමනුපස්සාමි යං එවං පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ ඉත්ථි ඵොට්ඨබ්බා. ඉත්ථි ඵොට්ඨබ්බා භික්ඛවෙ පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති"යි

සත්‍රින්ගේ සිත් ගන්නා රූපාදී පසකුත් පුරුෂ රූපාදිය මෙන් සෙසු නැත්.

එසින් වදළ හ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එක රූපම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිස රූපං. පුරිසරූපං භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිඨති.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකසද්දම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති. යථයිදං භික්ඛවෙ පුරිස සද්දෙ. පුරිසසද්දෙ භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකගන්ධම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිස ගන්ධො. පුරිසගන්ධො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එක රසම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිස රසො. පුරිස රසො භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති.

නාහං භික්ඛවෙ අඤ්ඤං එකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි යං එවං ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති, යථයිදං භික්ඛවෙ පුරිස ඵොට්ඨබ්බා. පුරිස ඵොට්ඨබ්බා භික්ඛවෙ ඉත්ථියා චිත්තං පරියාදාය තිට්ඨති"යි.

මෙසේ ගූථයත් හා එක්වෙන ගූථය සේ, මූත්‍ර හා එක් වෙන මූත්‍ර සේ, සොරුන් හා සමග එක්වෙන සොරුන් සේ, අතීතාදි කාලත්‍රයෙහි ම අනිත්‍යාදියෙහි නිත්‍යාදි කල්පනා ඇති අඥාන සවභාවයෙන් යුක්ත වූ කාමුක සත්‍රී පුරුෂයෝ ඔවුනොවුන් හා සමග එක් වෙත්. කුමක් හෙයින් සත්‍රීන් කෙරෙහි තෘෂ්ණාව විසි ද යත්? ඉන්ද්‍රිය සංවරයක් නැති හෙයිනි. ඒ එසේ ම ය. අඥාන යෝ අසුචි පිඬක් වැනි වූ ශරීරයාගේ වර්ණමාත්‍රයක් ම දැක සදෘස වූ කිසිවක් නො ලදින් පියුම් ආදීන් හා සදෘශ කොට එක්වැනී ය සි සොදත්.

එසින් කිහ—සඳ්ධම්මොපායනයෙහි.

"දිසවා අසුචිපිණ්ඩස්ස වණ්ණමත්තංව බාලියා,
අලද්ධා සදිසං කිඤ්චි යොජෙන්ති පඤ්ඤාදිහි"යි

පයොධර රන්කරඬුවක් වැන්නෑ යි කියා ද මුහුණ පුල් පියුමක් වැන්නෑ යි කියා ද නෙත් නිල් මහනෙල් පෙති වැන්නෑ යි කියා ද දන්නයන් විසින් මුතුපෙළ පරදවන ලදු යි නෝ තත් සදෘශ ය යි නෝ සොදත්.

එසින් කිහ.

"එතා සොණ්ණසමුග්ගහානා මුඛං පුලුලබුජොපමං
නෙත්තා නීලම්බුජනිභා මුත්තා දන්තෙහි නිජ්ජිතා"යි.

අනිත්දින වූ ඇඟ ඇත්තියකගේ (උතුම් තුනුවඟ ඇත්ති යකගේ) ශරීරය අනඹයා ඇලුම් වඩන්නේ ය යි ද, මේ ආදීන් සිතන්නාහු තමන් සිත් කිලිටු කෙරෙත්.

එසින් කිහ:-

"අඹගං අනිඤ්ඡිතඹාය අනඹා සඹ වඩ්ඪනං,
ඉච්චෙවමාදිං විඤ්ඤාතා චිත්තං දූසෙන්ති අත්තනෝ"යි.

මෙසේ ඉනවඟයෙන් සිත්මෙන් මොහයෙන් මුළාව මේ ශරීර යෙහි කරණලද ඇල්ම නමැති මලින් වෙළන ලද්දාහු තමන් වර දවා සිතාගත් විපරීත කල්පනාවෙන් ඝෝර වූ අනයව්‍යසනයට පැමිණෙත්.

එසින් කිහ:-

"තතෝ මොහවසෙනෙව සඹපාසෙන වෙඨිතා,
අනයව්‍යසනං ඝොරං පපොන්ති පරිකප්පිතා"යි.

අමෙඛ්‍යයෙන් කළ පොතලු රුවක් බදු තුනී වූ, ඡවිමාත්‍රයෙන් මුළාකරණලද මේ ශරීරය සවභාවයෙන් දක්නට පෘථග්ජනයෝ නොපොහොත් වෙත්.

එසින් කිහ:-

"අමෙඤ්ඣපොත්ථකාකාරං තත්‍රවඡවි විමොහිතා,
දෙහං සභාවතෝ දට්ඨුං නසක්කොන්ති පුථුජ්ජනා"යි.

තථාගත ශ්‍රාවකයන් කෙරෙත් පිටත් අන්හු තමන් සිත්හි වන කෙලෙසදෙඹයන් රක්ෂාකරන්නට නොහැකි ව තමන්ගේ ඉන්ද්‍රිය යන් කෙලෙසති, පෙළති. සවීඥශ්‍රාවකයෝ වනාහි ඉන්ද්‍රියයන් හා ආලම්බනයන් කෙරෙහි ඇලුම් වලකත්.

එසින් කිහ:-

"ඉන්ද්‍රියානි කිලෙසෙනති දෙසෙ සංරක්ඛිතුං පරෙ,
ඉන්ද්‍රියෙසු සඛං තු වාරෙනති ජින සාවකා"සි.

සිහිය ම ආරක්ෂා කොට ඇති සිහිය ම රැකවල් කොට ඇති මහණ තෙම ඉඳුරන් හා ඉන්ද්‍රියගෝචරයෙහි අනිත්‍ය ය දුකඛ ය අනාත්ම ය යන ත්‍රිලක්ෂණ ය විශෙෂ යෙන් (නොයෙක් පරිද්දෙන්) දන්නේ ඇල්ම කටයුතු වූ දෙයකා නොම දනී.

එසින් කිහ:-

"සතාරකෙඛා හි සමණො ඉන්ද්‍රියින්ද්‍රිය ගොචරෙ,
අනිච්චාදිං විපස්සනෙතා සඵජ්ජනීයං න පස්සති"සි.

මේ ලෝකයෙහි දෙවියන් අසුරයන් රාක්ෂසයන් සහිත වූ ජනතෙම, ඉන්ද්‍රියන් නමැති නොහික්මුණු අශ්වයන් විසින් නොමග ගෙණ යන ලදුයේ හිතමාගීයෙන් දුරුකොට දමනලදී.

එසින් කිහ:-

"ඉන්ද්‍රියසෙසෙහි දුන්නීතො දූසතො හිතමග්ගතො,
අපවිඛො ජනො ලොකෙ සදෙවා සුර රක්ඛසො"සි.

අගසික්ඛඩේඩොපම සූත්‍රාදියෙහි දක්වා වදාරණලද ක්‍රමයෙන් නොඇසිය හැකි වූ නොසිනිය හැකි වූ දුකඛදායකවන බැවින් ද, කාම චිතකී, ව්‍යාපාද චිතකී, විහිංසා චිතකී, සඞඛ්‍යාත ත්‍රිවිධ චිතකී යෙන් මඩනාලද භික්ෂූහු බොහෝකාලයක්. අපායාදියෙහි ප්‍රමාණ නික්‍රාන්ත දුක්ඛිද වෙනසෙන බැවින් ද ලෝකනාථ වූ බුදුරජානන් වහන්සේ විසින් ලෝකයා කෙරෙහි කරුණාවෙන් සර්ඥතාඥානයට පැමිණ එම සර්ඥතාඥානයෙන් ලොකයාහට වන සුවදුක් ද ඒ සුව දුකට කාරණා වූ කුශලාකුශලයන් ද ප්‍රත්‍යක්ෂයෙන් දැන ප්‍රථමයෙන් කාමසුඛල්ලිකානුයොගය හා පඤ්චතාපනාදියෙන් ආත්මකලමථය කිරීම ය යන මේ අනතද්වයට භික්ෂූන් විසින් නො පැමිණෙන ලෙසට:-

"දෙව මෙ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා. යොා, වායං කාමෙසු කාමසුඛල්ලිකානුයොගොා හීනොා ගම්මොා පොථුජ්ජනිකොා අනරියොා අනත්ථසංහිතොා"සි- යන පාළිය වදාළ සේක.

මෙසේ අන්තද්වය ප්‍රතික්ෂෙප කොට මත්තෙහි මධ්‍යමප්‍රතිපදා වෙහි පිහිටුවන පිණිස ලොකාලොක දිවාකර වූ භාග්‍යවත් බුදුරජානන් වහන්සේ:-

"එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා. චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති. කතමා ච සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා. චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති? අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො, සෙය්‍යථිදං? සම්මාදිට්ඨි සම්මා සංකප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මාආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි"යි.

යන මේ පාළිය වදුල සේක.

එහි අභිප්‍රාය තම්-මහණෙනි! තොප විසින් මා ප්‍රතිසේවන කළ මේ අනන්තඥයට නොපැමිණ ප්‍රඥාචක්ෂුස විශුද්ධ කරණු පිණිස හෙවත් පැණඇස් පිරිසිදු කරණ පිණිස, මොහාන්ධකාරය දුරුහුවා කොට නුවණැස් කරණ පිණිස, කෙලෙශ ප්‍රශ්‍රබ්ධිය දුරුකරණ පිණිස, අභිඥා සංඛ්‍යාත සත්‍යප්‍රතිවෙධය කරණු පිණිස, ඔවුන්ගේ ම අවබොධය පිණිස, නිවන් පසක් කරණු පිණිස, පවත්නා වූ යම් මධ්‍යම ප්‍රතිපදාවක් නොමෝ තථාගතත්වාදී කාරණයෙන් යුක්ත වූ සම්‍යක් යන් වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේද, මිහණෙනි, ඥානාදිය නිසා පවත්නා වූ සම්‍යක්වහන්සේ විසින් ප්‍රත්‍යක්ෂ කරණලද ඒ මධ්‍යම ප්‍රතිපදානොමෝ කවරක් වන්නීද? මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය මැයි.

ඒ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගාඞ්ගයෝ නම් කවුරු ද යත්? මිථ්‍යා දෘෂ්ටි ආදියෙන් පහ වූ සම්‍යක් දෘෂ්ටි ආදිය ය. මෙය ම ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වන්නේ ය සි වදුල සේක, යන අභිප්‍රායයි. මේ මේහි සංක්ෂේපාර්ථයි විස්තරාර්ථ ය වනාහි කුහුඹුවන් විසින් සෙල්වය නොහැකි මහමෙර සේ සම්බුද්ධයන් සම්භාරයෙන් දත් බුදුන්ට මුත් අන්කිසි වක්හට අගොචර ය. එතකුදු වූවත් පෙළ අටුවාවෙහි දුටු ලෙසකින් මාගේ ප්‍රඥාශක්තිය වූ පරිද්දෙන් එකදෙශයකින් වර්ණනා කෙරෙමි. හේ කෙසේ ද යත්?

මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයට විපරීත වූ අනාර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය අධර්ම නමුදු වෙයි. අනර්ථ නමුදු වේ. ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ගය ධර්ම නමුදු වේ.අර්ථ නමුදු වේ.

එසින් වදුලහ:-

"අධම්මො ච භික්ඛවෙ වෙදිතබ්බො ධම්මො ච. අනත්ථො ච වෙදිතබ්බො අත්ථො ච. අධම්මඤ්ච විදිත්වා ධම්මං ච, අනත්ථංච විදි

වා අහං ච, යථා ධම්මෝ යථා අත්ථෝ, තථා පටිපජ්ජිතබ්බං. කත මෝ ච භික්ඛවෙ අධම්මෝ? කතමෝ ච අනත්ථෝ? මිච්ඡාදිට්ඨි භික්ඛවෙ අධම්මෝ. සම්මාදිට්ඨි ධම්මෝ යෙව. මිච්ඡාදිට්ඨි පච්චයා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති අයං අනත්ථෝ සම්මාදිට්ඨි පච්චයා ච අනෙ කා කුසලා ධම්මා භාවනා පාරිපූරිං ගච්ඡන්ති. අයං අත්ථෝ. මිච්ඡා සංකප්පෝ භික්ඛවෙ අධම්මෝ. සම්මාසංකප්පෝ ධම්මෝ. මිච්ඡාවාචා භික්ඛවෙ අධම්මෝ සම්මාවාචා ධම්මෝ, මිච්ඡාකම්මන්තෝ භික්ඛවෙ අධම්මෝ. සම්මාකම්මන්තෝ ධම්මෝ. මිච්ඡා ආජීවෝ භික්ඛවෙ අධම්මෝ. සම්මා ආජීවෝ ධම්මෝ. මිච්ඡාවායාමෝ භික්ඛවෙ අධම්මෝ. සම්මාවායාමෝ ධම්මෝ. මිච්ඡාසති භික්ඛවෙ අධම්මෝ. සම්මාසති ධම්මෝ. මිච්ඡාසමාධි භික්ඛවෙ අධම්මෝ. සම්මාසමාධි ධම්මෝ"සි.

නව ද - මේ ආයස්‍යිඅෂ්ටාඞ්ගික මාගීයට විපරීත වූ අනාය්‍යිඅෂ්ටා ඞ්ගික මාර්ග ය ඔරිම තීර නම් වේ. ආය්‍යි අෂ්ටාඞ්ගිකමාගීය පාරිම තීර නම් වේ—එසින් වදළහ. එහෙර මෙහෙර විවාළ **සඞ්ඛාරව නම් බ්‍රාහ්මණයාහට:—**

"මිච්ඡාදිට්ඨි ඛො බ්‍රාහ්මණ ඔරිමං තීරං සම්මාදිට්ඨි පාරිමං තීරං, මිච්ඡාසඞ්කප්පෝ ඔරිමං තීරං සම්මා සඞ්කප්පෝ පාරි මං තීරං, මිච්ඡාවාචා ඔරිමං තීරං සම්මාවාචා පාරිමං තීරං, මිච්ඡා කම්මන්තෝ ඔරිමං තීරං සම්මාකම්මන්තෝ පාරිමං තීරං, මිච්ඡාආජී වෝ ඔරිමං තීරං සම්මාආජීවෝ පාරිමං තීරං, මිච්ඡාවායාමෝ ඔරිමං තීරං සම්මාවායාමෝ පාරිමං තීරං, මිච්ඡාසති ඔරිමං තීරං සම්මාසති පාරිමං තීරං, මිච්ඡාසමාධි ඔරිමං තීරං සම්මාසමාධි පාරිමං තීරං, මිච්ඡාඤාණං ඔරිමං තීරං සම්මාඤාණං පාරිමං තීරං, මිච්ඡාවිමුත්ති ඔරිමං තීරං සම්මාවිමුත්ති පාරිමං තීරං. ඉදං ඛො බ්‍රාහ්මණ ඔරිමං තීරං--ඉදං පාරිමං තීරං"සි.

නව ද- මේ අනාය්‍යි අෂ්ටාඞ්ගික මාගීයෙහි විභාග හා ආය්‍යි අෂ්ටාඞ්ගික මාගීයෙහි විභාග මෙසේ දත යුතුයි. කෙසේද යත්?

මිච්ඡාදිට්ඨි, යන තන්හි මිථ්‍යාදෘෂ්ටි නම් කිමයත්? විපරීත දර්ශනය මිථ්‍යාදෘෂ්ටි නම් වේ, හෙවත් යමෙක්, දුන් දනෙහි විපාක නැතැ සි කියා ද කළ කුශලයෙන් ලැබිය යුතු සුගතියකුත් නැත්තේ ය. එසේ ම කරණලද අකුශලයෙන් ලැබිය යුතු දුර්ගතියකුත් නැත්තේය. මව්පියන් ගුරුන් සිල්වතුන් කුලදෙටුවන්ට කළ අනාදර යෙහි අකුසල් නැත, බුදුන් නැත, දහම් නැත, සඟුන් නැත, මෙලොව නැත, පරලොව නැත, සත්‍යතෙම මරණින් මත්තෙහි නූපදනේ ය, යනාදී වශයෙන් ඇතිලෙස නබා, නැතිලෙස සිතා, දෘෂ්ටිගණි නම් හේ මිථ්‍යාදෘෂ්ටි නම් වේ.

මේ හැමතන්හි ඇතිදෙය ඇතිලෙසින් ද, නැතිදෙය නැතිලෙසින් ද, සෘජුකොට දක්නා දෘෂ්ටිය සම්‍යක් දෘෂ්ටි නම් වේ. යම්ක් කරණකොට ගෙණ නොඋපන් අකුශල ධර්මයෝ උපදිද්ද, උපන් අකුශල ධර්මයෝ විපුලත්වයට යෙද්ද, එබඳු දෙයක් වේ මිථ්‍යාදෘෂ්ටිය හා නො ම දක්නා ලැබෙයි. මිථ්‍යාදෘෂ්ටික වූ පුද්ගලයාහට නො උපන් අකුසල් උපදින්. උපන් අකුසල් විපුලත්වයට යෙත්—

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා අකුසලා ධම්මා භියෝ භාවාය වෙපුල්ලාය සංවත්තන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නා වෙව අකුසලා ධම්මා උප්පජ්ජන්ති උප්පන්නා ව අකුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති"සි.

යම්ක් කරණකොට ගෙණ නො උපන් කුශල ධර්මයෝ නූපදිද්ද, උපන් කුශල ධර්මයෝ පිරිහෙද්ද, එබඳු දෙයකුදු මේ මිථ්‍යා දෘෂ්ටිය හා නො ම දක්නා ලැබෙයි. විපරීත දෘෂ්ටි ඇති පුද්ගලයා හට නොඋපන් කුශල ධර්මයෝ නො උපදින්, උපන් කුශල ධර්මයෝ පිරිහෙත්.

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා නූප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නා වෙව කුසලා ධම්මා නූප්පජ්ජන්ති, උප්පන්නා ව කුසලා ධම්මා පරිහායන්ති"සි.

යම් ධර්මකෙණෙකුත් කරණකොට ගෙණ නො උපන් කුශල ධර්මයෝ උපදිද්ද, උපන් කුශල ධර්මයෝ විපුලත්වයට යෙද්ද, එබඳු ධර්මයෙක් මේ සම්‍යක් දෘෂ්ටිය හා නො ම දක්නා ලැබෙයි. සම්‍යක්දෘෂ්ටික වූ පුද්ගලයාහට නොඋපන් කුශල ධර්මයෝ උපදින්. උපන් කුශල ධර්මයෝ විපුලත්වයට යෙත්—

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා කුසලා ධම්මා උප්පජ්ජන්ති, උප්පන්නා වා කුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති, යථයිදං භික්ඛවෙ සම්මාදිට්ඨි. සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නාවෙව කුසලා ධම්මා උප්පජ්ජන්ති. උප්පන්නා ව කුසලා ධම්මා භියොභාවාය වෙපුල්ලාය සංවත්තන්ති"සි.

යම් ධර්මකෙණෙකුත් කරණකොටගෙණ නොඋපන් අකුශල ධර්මයෝ නුපදිද්ද, උපන් අකුශල ධර්මයෝ පිරිහෙද්ද, එබදු ධර්මකෙණෙකුත් මේ සම්‍යක්දෘෂ්ටිය හා නො ම දක්නා ලැබෙයි. සම්‍යක් දෘෂ්ටික පුද්ගලයාහට නොඋපන් අකුශල ධර්මයෝ නො උපදින්. උපන් අකුශල ධර්මයෝ පිරිහෙත්—

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා අකුසලා ධම්මා නුප්පජ්ජන්ති උප්පන්නා වා අකුසලා ධම්මා පරිහායන්ති, යථයිදං භික්ඛවෙ යථාදිට්ඨි. සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ අනුප්පන්නාවෙව අකුසලා ධම්මා නුප්පජ්ජන්ති. උප්පන්නා ච අකුසලා ධම්මා පරිහායන්ති"යි.

යමෙක් අනුවණින් යෙදී කාරණා 'කාරණ නොදන්නා අඥාන භාවයෙන් යුක්ත ව වසන්නේ වී නම්, ඔහුට නො උපන් මිථ්‍යා දෘෂ්ටිය උපදියි. උපන් මිථ්‍යාදෘෂ්ටිය වඩිනයට යෙයි—

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා මිච්ඡාදිට්ඨි උප්පජ්ජති. උප්පන්නා වා මිච්ඡාදිට්ඨි පවඩ්ඪති, යථයිදං භික්ඛවෙ අයොනිසො මනසිකාරෙ. අයොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නාවෙව මිච්ඡාදිට්ඨි උප්පජ්ජති. උප්පන්නා ච මිච්ඡාදිට්ඨි පවඩ්ඪති"යි.

යමෙක් කාරණා 'කාරණ දන්නා නුවණින් යුක්ත වී නම් ඔහට නො උපන් සම්‍යක්දෘෂ්ටිය උපදියි. උපන් සම්‍යක්දෘෂ්ටිය වැඩියට යෙයි.

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙන අනුප්පන්නා වා සම්මාදිට්ඨි උප්පජ්ජති, උප්පන්නා වා සම්මාදිට්ඨි පවඩ්ඪති, යථයිදං භික්ඛවෙ යොනිසො මනසිකාරෙ යොනිසො භික්ඛවෙ මනසිකරොතො අනුප්පන්නාවෙව සම්මාදිට්ඨි උප්පජ්ජති. උප්පන්නා ච සම්මාදිට්ඨි පවඩ්ඪති"යි.

මේ ලෝකයෙහි යමෙක් මිථ්‍යාදෘෂ්ටි වී නම්, හෙතෙම කා බුන් මරණින් මත්තෙහි අපාය දුගතිය විනිපාත සංඛ්‍යාත නරකයෙහි උපදී—

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එක ධම්මම්පි සමනුපස්සාමි යෙනෙ වං සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති, යථයිදං භික්ඛවෙ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨියා භික්ඛවෙ සමන්නාගතා සත්තා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජන්ති"යි.

මේ ලෝකයෙහි යමෙක් සම්‍යක්දෘෂ්ටි වී නම්, නෙතෙම කාබුන් මරණින් මත්තෙහි සුගති සඟි සංඛ්‍යාත දිව්‍යලෝකයෙහි උපදී.

එසින් වදළහ.

"නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යෙනෙවං සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති, යථයිදං භික්ඛවෙ සම්මාදිට්ඨි. සම්මාදිට්ඨියා භික්ඛවෙ සමන්නාගතා සත්තා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති"යි.

තව ද—මිත්‍යාදෘෂ්ටික පුද්ගලයා විසින් කරණ ලද යම් කායකර්මයක් වචීකර්මයක් මනඃකර්මයක් ඇද්ද සමාදන්වන ලද යම් චෙතනාවක් ඇද්ද, යම් ප්‍රාර්ථනාවක් ඇද්ද, යම් ප්‍රණිධියෙක් ඇද්ද, ඒ සියල්ල ම ඔහුට අනිෂ්ටයට, අකාන්තයට, අමනාපයට, අහිතයට, දුකඛයට, වැටෙන්නේ ය. ඊට කාරණා කවරේ ද? විපරීත දෘෂ්ටියෙන් සමන්විත හෙයිනි. යම් සේ කොසඹ බිජු හෝ, කෝසාතකී බිජු හෝ, හෙවත් තිත්ත වැටකොළු බිජු හෝ, තිත්තකාලාබු බිජු හෝ, තෙත් භූමියෙහි දමනු ලබන්නේ පෘථිවිරසය ආපොරසය එයට එක්වෙන්නේ ය. බිජුවටය තිත්ත හෙයින් ඒ සියල්ල ත් තිත්තයට කටුකයට අසාතයට පැමිණෙන්නේ ය. ඊට කාරණා කවරේ ද? පවිටු බිජුවට හෙයිනි. එ පරිද්දෙන් ම මිත්‍යාදෘෂ්ටියෙන් යුක්ත වූ පුද්ගලයා විසින් කරණ ලද සියල්ල ම ඔහුට අහිතාදියට පැමිණෙන්නා හ. ඊට කාරණා කවරේ ද? පවිටු දෘෂ්ටිය හෙයිනි.

එසින් වදළහ.

"මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස යං වෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නා යං ව වචීකම්මං, යථාදිට්ඨි සමත්තං සමාදින්නා, යං ව මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නා, යා ව චෙතනා යා ව පත්ථනා යො ව පණිධි යෙ ව සංඛාරා සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්සහෙතු? දිට්ඨි හි භික්ඛවෙ

පාපිකා. සෙය්‍යථාපි භික්ඛවෙ නිම්බබීජං වා කොසාතකිබීජං වා තික්තකා ලාබු බීජං වා අල්ලායං පඨවියා නික්ඛිත්තං යඤ්චව පඨවි රසං උපාදියති යං ච ආපොරසං උපාදියති සබ්බන්නං තික්ත කත්තාය කටුකත්තාය අසාතත්තාය සංවත්තතති. තං කිස්ස හෙතු ?

බීජං භික්ඛවෙ පාපකං, එවමෙව ඛො භික්ඛවෙ මිච්ඡා දිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යං වෙව කායකම්මං යථාදිට්ඨි සම ත්තං සමාදින්නං, යං ච වචීකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යං ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සංඛාරා සබ්බෙ තෙ ධම්මා අනිට්ඨාය අකන්තාය අමනාපාය අහිතාය දුක්ඛාය සංවත්තතති. තං කිස්ස හෙතු ? දිට්ඨි හි භික්ඛවෙ පාපිකා''ති'

යමෙක් සම්‍යක්දෘෂ්ටි ඒ නම්, ඔහු විසින් දෘෂ්ටිගතික ව කරණ ලද යම් කායකර්මයෙක් වචීකර්මයෙක් යම් මනඃකර්මයෙක් සමා දන්වන ලද චෙතනාවෙක් යම් ප්‍රාර්ථනාවෙක් යම් ප්‍රණිධියෙක් ඇද්ද, ඒ සියලු සංස්කාර ධර්මයෝ ඔහුට ඉෂ්ටයට කාන්තයට මිනාපයට හිතයට සුඛයට පැමිණෙන්නාහු ය. ඊට කාරණා කවරේ ද ? දෘෂ්ටිය යහපත් නෙයිනි. යම් සේ ඉක්ෂු බීජ හෝ, සාලි බීජ හෝ, මුද්දිකා බීජ හෝ; අල්ල භූමි සඞ්ඛ්‍යාත තෙත් භූමියෙහි නික්ෂිප්ත කරණු ලබන්නේ යම් පෘථිවි රසයක් ආපෝ රසයක් ඒ ඉක්ෂු ආදියෙහි එක්වීමෙන් ඒ රසය ද මධුරත්වයට සාතත්වයට ආසෙවකත්වයට පැමිණෙන්නේ ය. ඊට කාරණා කවරේ ද ?

බීජවට යහපත් නෙයිනි. එ පරිද්දෙන් ම සම්‍යක්දෘෂ්ටික පුද්ගලයා විසින් යම් කායකර්මයක් වචීකර්මයක් මනඃකර්මයක් සම්‍යක්දෘෂ්ටි වශයෙන් කරණ ලද ද, හේ ඔහුට ඉෂ්ටයට කාන්ත යට මිනාපයට හිතයට සුඛයට පැමිණෙන්නේ ය. ඊට කාරණා කවරේ ද ? ඔහුගේ දෘෂ්ටිය යහපත් නෙයිනි.

එසින් වදළහ.

''සම්මාදිට්ඨිකස්ස භික්ඛවෙ පුරිසපුග්ගලස්ස යං වෙව කාය කම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යං වෙව වචීකම්මං යං ච මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං, යා ච චෙතනා යා ච පත්ථනා යො ච පණිධි යෙ ච සංඛාරා, සබ්බෙ තෙ ධම්මා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තතති. තං කිස්ස හෙතු ? දිට්ඨි හි භික්ඛවෙ භද්දිකා. සෙය්‍යථාපි භික්ඛවෙ

උච්ඡුබීජං වා සාලි බීජං වා මුද්ධිකා බීජං වා අල්ලාය පඨවියා නික්ඛිත්තං, යං වෙව පඨවි රසං උපාදියති. යං ව අපෝරසං උපා දියති. සබ්බන්තං මධුරත්තාය සාතත්තාය ආසෙවකත්තාය සං වත්තන්ති. තං කිස්ස හෙතු? බීජං භික්ඛවෙ භද්දකං. එවමේව බො භික්ඛවෙ සම්මාදිට්ඨිකස්ස පුරිසපුග්ගලස්ස යං වෙව කායකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං යං ව වචීකම්මං යං ව මනොකම්මං යථාදිට්ඨි සමත්තං සමාදින්නං. යා ව චෙතනා යා ව පත්ථනා යො ව පණිධි යෙ ව සඞ්ඛාරා සබ්බෙ තෙ ධම්මා ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු? දිට්ඨි හි භික්ඛවෙ භද්දිකා"යි.

නව ද- මේ ලෝකයෙහි එක් පුද්ගලයෙක් උපදනේ දිව්‍ය මනුෂ්‍යයන් සහිත වූ බොහෝ ජනයාහට අහිතයට අසුඛයට අනර්ථයට කාරණාව උපදනේ ය. කවර නම් එකපුද්ගලයෙක් ද යත්? යමෙක් මිථ්‍යාදෘෂ්ටි සඞ්ඛ්‍යාත විපරීත දෘෂ්ටි ඇත්තේ වී නම් ඒ පුද්ගලතෙම බොහෝ ජනයන් සද්ධර්මයෙන් ඉවතලුවා අසද්ධර්මයෙහි පිහිටුවන්නේ ය. එ හෙයින් හෙතෙම ලෝකයෙහි උපදනේ දිව්‍ය මනුෂ්‍යයන් සහිත වූ ජනයන්ට අහිත දුකඛාදි යට කාරණා ව උපදින්නේ ය;

එයින් වදාළහ.

"එකපුග්ගලෝ භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානෙ උප්පජ්ජති බහුජනාහිතාය බහුජනාසුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහි තාය දුක්ඛාය දෙවමනුස්සානං. කතමෙ එකපුග්ගලෝ මිච්ඡාදිට්ඨි කො හොති විපරීතදස්සනෙ, සෙ බහුජනෙ සද්ධම්මා උට්ඨාපෙත්වා අසද්ධම්මෙ පතිට්ඨාපෙති. අයං බො භික්ඛවෙ එකපුග්ගලෝ ලොකෙ උප්පජ්ජමානෙ උප්පජ්ජති බහුජනා හිතාය බහුජනා සුඛාය බහුනො ජනස්ස අනත්ථාය අහිතාය දුක්ඛා ය දෙවමනුස්සානං"යි.

එ හෙයින් ම ලෝකයෙහි එක පුද්ගලයෙක් උපදින්නේ, දිව්‍ය මනුෂ්‍යයන් සහිත වූ බොහෝ ජනයන්ට හිතසැප පිණිස උපදනේ ය. කවර නම් පුද්ගලයෙක් ද යත්? යම් පුද්ගල යෙක් සම්‍යක් දෘෂ්ටි වී නම් අවිපරීත දෘෂ්ටි ඇති හෙයින් හෙතෙම බොහෝ ජනයන් අසද්ධර්මයෙන් ඉවතලුවා සද්ධර්මයෙහි පිහිටුවන් නේ ය. එ හෙයින් සම්‍යග්දෘෂ්ටික පුද්ගල තෙම ලෝකයෙහි උප දනේ දිව්‍ය මනුෂ්‍යයන් සහිත වූ බොහෝ ජනයන්ට හිතයට සුඛයට අර්ථයට කාරණා ව උපදනේ ය.

එසින් වදළහ.

"එකපුග්ගලෝ භික්ඛවේ ලොකෙ උප්පජ්ජමානෝ උප්පජ්ජති බහුජනහිතාය බහුජන සුඛාය බහුනෝ ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං. කතමෝ එකපුග්ගලෝ—සම්මාදිට්ඨිකෝ හොති අවිපරීත දස්සනෝ. සෝ බහුජනෙ අසද්ධම්මා වුට්ඨාපෙ ඩිා සද්ධෙමේ පනිට්ඨාපෙති. අයං බෝ භික්ඛවේ එකපුග්ගලෝ ලොකෙ උප්පජ්ජමානෝ උප්පජ්ජති බහුජනහිකාය බහුජනසුඛාය බහුනෝ ජනස්ස අත්ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං"යි.

මේ ලෝකයෙහි මහත් සාවද්‍යයක් ඇද් ද නෙවත් වරදක් ඇද්ද, ඒ සියලු සාවද්‍යයන් අතුරෙහි යම් මේ මිත්‍යාදෘෂ්ටියෙන් ඇද්ද, ඒ මිත්‍යාදෘෂ්ටිය හා සම වූ සාවද්‍යයෙක් වරදෙක් නැත්.

එසින් වදළහ.

"නාහං භික්ඛවේ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං මහා සාවජ්ජං, යථයිදං භික්ඛවේ මිච්ඡාදිට්ඨි. මිච්ඡාදිට්ඨි භික්ඛවේ පරමානි වජ්ජානි"යි.

යමෙක් මිත්‍යාදෘෂ්ටි වී නම් ඔහට දෙගතියක් අතුරෙන් එක් නරා ගතියක් වෙයි. හේ කවරහ ය ත්? නරක ගතිය හෝ තිරශ්චීන ගතිය හෝ යන දෙ ගතියෙන් එක් ගතියකි.

එසින් වදළහ.

"මිච්ඡාදිට්ඨිකස්ස භික්ඛවේ දවිඤ්ඤං ගතීනං අඤ්ඤතරා ගති පාටිකඞ්ඛා. නිරයෝ වා තිරච්ඡානයොනි වා"යි.

යමෙක් සම්‍යක්දෘෂ්ටි වී නම් ඔහට ද දෙගතියකින් එක් ගතියෙක් වෙයි. හේ කවරේ ද යත්? දිව්‍ය ගතිය හෝ මනුෂ්‍ය ගතිය හෝ යන දෙ ගතියෙන් එක් ගතියෙකි.

එසින් වදළහ.

"සම්මාදිට්ඨිකස්ස භික්ඛවේ දවිඤ්ඤං ගතීනං අඤ්ඤතරා ගති පාටිකඞ්ඛා දෙවා වා මනුස්සා වා"

"**සම්මාසඞ්කප්පෝ**" යන තන්හි සම්‍යක්සංකල්පනාවට විරුද්ධ වූ මිත්‍යාකල්පනාව හා සම්‍යක්කල්පනාව යන දෙදෙනාගේ භිනාග කෙසේ ද යත්? රූපාදී පඤ්චකාමයෙන් විනිර්මුක්ත ව අනිනිෂ්ක්‍රමණ ය කෙරෙමි-යන කල්පනාව ද සඞ්ඛයන් කෙරෙහි

ව්‍යාපාද වසයෙන් නසිව යි නොයිතා පවත්නා අව්‍යාපාද කල්පනාව ද සත්වයන්ට හිංසා නොකෙරේ යි පවත්නා වූ අවිහිංසා කල්පනාව ද යන මේ ත්‍රිවිධ කල්පනාව සම්‍යක්කල්පනාව නම් වෙ යි.

එයින් වදාළ හ—**මහා සතිපට්ඨාන සූත්‍රයෙහි**:—

"කතමෝ ච භික්ඛවෙ සම්මාසංකප්පෝ? නෙක්ඛම්ම සංකප්පෝ අව්‍යාපාද සංකප්පෝ අවිහිංසා සංකප්පෝ—අයං වුච්චති භික්ඛවෙ සම්මාසංකප්පෝ"යි.

ත්‍රිවිධ අකුශල විතර්කයෝ ත් කාමාදිහු මැ යි. එසින් වදාළ හ. දම්සෙනෙවි සැරියුත් මහ තෙරහු—

දීඝනිකායෙහි වූ සංගීති සූත්‍රයෙහි.

"තයෝ අකුසල විතක්කා, කාමවිතක්කෝ ව්‍යාපාදවිතක්කෝ විහිංසා විතක්කෝ"යි.

ත්‍රිවිධ කුසල විතර්කයෝ ත් අව්‍යාපාදාදීහු මැ යි. සෙ ද වදාළේ මැනෝ එහි ම:—

"තයෝ කුසල විතක්කා, නෙක්ඛම්මවිතක්කෝ අව්‍යාපාද විතක්කෝ අවිහිංසා විතක්කෝ"යි.

ත්‍රිවිධ අකුශල සංකල්පයෝ ත් කාමසංකල්පාදිහු මැ යි. හේ වදාළේ මැනෝ:—

"තයෝ අකුසල සංකප්පා—කාමසංකප්පෝ ව්‍යාපාද සංකප්පෝ විහිංසා සංකප්පෝ" යි.

ත්‍රිවිධ කුශල සංකල්පයෝ ද නෛෂ්ක්‍රම්‍ය සංකල්පාදිහු මැ යි—සෙ ද වදාළේ මැ නෝ:—

"තයෝ කුසල සංකප්පා—නෙක්ඛම්ම සංකප්පෝ අව්‍යාපාද සංකප්පෝ අවිහිංසා සංකප්පෝ"යි.

ත්‍රිවිධ අකුශල සංඥාවෝ ද කාමසංඥාදිහු මැ යි—**එසින් වදාළ හ..**—

"තිස්සෝ අකුසලසඤ්ඤායො—කාමසඤ්ඤා ව්‍යාපාදසඤ්ඤා විහිංසා සඤ්ඤා"යි.

ත්‍රිවිධ කුශල සංඥාවෝ ද නෛෂ්ක්‍රම්‍ය සංඥාදීහු මැ යි. **එසින් වදාළ හ**:—

"තිස්සෝ කුසලසඤ්ඤායො—නෙක්ඛම්මසඤ්ඤා අව්‍යාපාද සඤ්ඤා අවිහිංසා සඤ්ඤා"යි.

ත්‍රිවිධ අකුශල ධාතුහු ද කාමධාතු ව්‍යාපාදධාතු විහිංසා ධාතු යන මොහු මැ සි.—එසින් වදාළ හ:—

"නිස්සෝ කුසලධාතුයෝ නෙක්ඛම්මධාතු අව්‍යාපාදධාතු අවිහිංසාධාතු"සි

ත්‍රිවිධ කුශල ධාතුහු ද නෛෂ්ක්‍රම්‍යධාතු අව්‍යාපාදධාතු අවිහිංසාධාතු යන මොහු සි—එසින් වදාළහ:—

"නිස්සෝ අකුසලධාතුයෝ නෙක්ඛම්මධාතු අව්‍යාපාදධාතු අවිහිංසාධාතු"සි.

මේ යුගල පාඨ චතුස්ක ය දික්සහියෙහි දම්සෙනෙවි සැරියුත් මහ තෙරුන් වහන්සේ විසින් දෙසූ සංගීති සූත්‍රයෙන් සඞ්ග්‍රහ කළ පාඨයෝ සි. තව ද,-ධම්මානුකූල ව මාගේ ප්‍රඥාවෙන් දක්නා ලද ක්‍රමයකු දු මෙහි සඞ්ග්‍රහ කෙරෙමි. හේ කෙසේ ද යත්?

යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක් අසවල් ස්ත්‍රියගේ රූප ය ගහපත් වන්නේ ය. ඇගේ කථාව ගහපත් වන්නේ ය. ඇගේ ශරීර ගන්ධ ය ගහපත් වන්නේ ය. ඇගේ හස්තයෙන් කරණ ලද සූපව්‍යඤ්ජන හෝ ඇගේ තාම්බූල කවවරාදි ය හෝ රස ඇත්තේ ය. ඇගේ ශරීර ස්පර්ශ ය ගහපත් වන්නේ ය සි කියා හෝ මේ බඳු කාමයක් පෙර මා විසින් පරිභොග කරණ ලද්දේ ය සි කියා හෝ මේ බඳු කාමයක් මතු කෙසේ ලබම් දැ සි කියා හෝ අසවල් රජ යුව රජ ඇමති ආදීහු මේ බඳු පඤ්චකාමයක් අනුභව කෙරෙති සි කියා හෝ කාමාස්වාද වශයෙන් සිතන්නේ වී නම්, මේ ද නිර්ණයට විරෝධ ව පෙණෙන බැවින් මිථ්‍යා කල්පනාවෙහි ඇතුළත් කොට හනිමි.

තව ද—යමෙක් පැවිද්දිම නම් කර්කශ වන්නේ ය. දැළි හිස කෙස් බැහැමේන්, කඩකඩ කොට කපන ලද රෙදි කඩින් වැසූ හෙයින් කිසි අගයක් නැත්තා වූ, පණහ දමනු ආදීවූ කසට දියෙන් රැඳි හෙයින් ගහපත් වර්ණයක් නැත්තා වූ, සිවුරු දරමින් කර්කශ වන්නේ ය. ය පය කබලකින් හෝ මැටි පය කබලකින් හෝ දෙර දෙර සිට සිට සිහා ලද මුසු අහරින් ජීවත් වීම් ත් කර්කශ වන්නේ ය. හෙ ද බුද්ධාදී මහොත්තමයන් විසින් පිරූ නෙසිනුත් මේ හැර අන්කිසි පිළිවෙතකින් නිවණට නො පැමිණිය හැකි නෙසිනුත් උතුම් වූව ද, මා මේ බඳු උතුම් වූ කුලයෙහි ඉපද මේ බඳු සැපතින් වැඩී දෙරට අවුත් ඉල්වූවන්ට දුන් බව මුත් යමක්හුගේ දෙර සිට කිසිකලෙක ත් කිසිවක් නොසිහා දුන් කෙසේ නම් කබලක් ගත් අත් ඇති ව දෙර දෙර සිට සිහම් ද,

යහපත් සුව පහස් ඇති මාගමුන් හා සමග සුවඳ මල් අතුරණ ලද යහන් ඇති ගෙයි වැස කෙසේ නම් අරණ්‍යයෙහි වෙසෙම් ද, පා කබලක් පිට බැඳගෙණ කෙසේ නම් තණ්ව හැවිදිම් ද, අනිනව කථා නො කළ ලදරුවෙකු සේ නො ගිලන් ව කෙසේ නම් යමක් නො ඉල්වා අල්පෙච්ඡතාවෙන් දවස් යවම් ද, මාගේ මේ පඤ්චකාම සැපත හැර මේ බදු කඨිණ පිළිවෙත් කෙසේ නම් පුරම් දෑ යි, යනාදී වසයෙන් ගිහිගෙයි සිට කාම යෙන් නො මිදීමට සිතන්නේ වී නම් හෙ ද නිර්‍වාණ ගාමිණී පිළිවෙතට විරොධ ව පෙණෙන බැවින් මිථ්‍යා කල්පනාවෙහි ඇතුලත්කොට හනිම්.

තව ද--යමෙක් ගෘහස්ථභාවයෙන් මිදී පැවිදි වුව ද ආරණ්‍ය වෘක්ෂමූලාදියට ගිය ද මිකුළුවන් යන මග නො කඩවන මිකුළු හුය සේ සිතින් නො තබා පඤ්චකාමයෙහි පැවති කාම විතර්‍ක යෙන් යුක්ත ව වසන්නේ වී නම් මේ ද නිර්‍වාණයට විරොධ ව පැණෙන බැවින් මිථ්‍යාකල්පනාවෙහි ඇතුළත්කොට හනිම්.

තව ද, යමෙක් තුන්‍රුරුවන්ට කෙසේ නම් අයස අපකිර්‍ති අලාභ කෙරෙම් ද, තුන්‍රුරුවන් සතු වසතුව කෙසේ නම් සිද බිඳ ශණ්මි ද, දෙ මව් පිය ගුරුවරයන්ට කෙසේ නම් අයස අපකිර්‍ති අලාභ කෙරෙම් ද, රජ යුව රජ ඇමති ආදීන්ට කෙසේ නම් අනර්‍ථ කෙරෙම් ද, ඔවුන්ගේ ඉසුරෙන් කෙසේ නම් පිරිහෙලම් ද, මාගේ සතුරු වූ අසවලාගේ අඹු දරුවන් ග්‍රාමක්ෂෙත්‍ර ගවමහිසා දිහු කවර කලෙක නසිද්ද, ඔදින් නසා කවරකලෙක සුවපත් වෙම් ද මාගේ සතුරු වූ අසවල්හුගේ ශිල්ප ශාස්ත්‍ර කෙසේ නසි ද, කවරකලක නසම් ද, ඔහු මෙ නම් ආයුධයකින් මෙ නම් විෂය කින් මෙ නම් මන්ත්‍රයකින් මෙ නම් ප්‍රයොගයකින් කවරකලෙක නසම් දෑ යි යනාදි වශයෙන් විතර්‍කණය කරන්නේ වී නම් හෙ ද නිර්‍වාණයට විරොධව පෙණෙන බැවින් මිථ්‍යාකල්පනාවෙහි ඇතුලත්කොට හනිම්.

තව ද—යමෙක් අහොරාත්‍රියෙහි ද්විපද චතුෂ්පදදීන්ට අසවල් වෘක්ෂයෙහි දී අසවල් කඳුරැල්ලියෙහි දී අසවල් මාගීයෙහි දී මල සදම් යි කියා හෝ බොරුවල කනම් යි කියා හෝ විෂ කවම් යි කියා හෝ දුනු සදම් යි කියා හෝ හිස ගල් හෙලම් යි කියා හෝ යනාදි වශයෙන් සිතන්නේ වී නම් මෙරමා සතු වසතු සොර සිනින් ගණ්මි යි කියා හෝ මිථ්‍යාචාරයෙහි හැසිරෙම් යි කියා හෝ මුසාවාද කියම් යි කියා හෝ රාමෙර බොම් යි කියා හෝ යනාදී වශයෙන් සිතමින් නැවත නැවත විතර්‍කණය කරන්නේ වී නම් හෙ ද මිථ්‍යාකල්පනාවෙහි ඇතුළත් කොට හනිම්.

මේ ආදී වශයෙන් කී නොකී සියලු ම යම් කල්පනාවෙක් දාහමින් පිටත් ද සවඟී මොක්ෂයට බාධක ද එබඳු කල්පනාව මිත්‍යාකල්පනාවෙහි ඇතුළත් ව සවඟී මොක්ෂයට බාධා වෙයි. එ බැවින් ඒ දුරුකටයුතු. යම් ගෘහස්ථයෙක් මේ ගෘහාවාසයෙහි මාගේ විසීම නුසුදුසු වන්නේ ය, ඊට කාරණා කවරේද? ගෘහාවාස යෙහි සිත එතහකොට කුශල ධර්මයට යොමුකොටගත නොහැක්කේ ය. කවර කාරණයෙන් හෙයින් ද යත්? සසරෙහි අක්මුල් නැත්නා සේ ගිහිගෙයි දු අක්මුල් නැති ක්‍රියාව ඇත්තේ ය. අනෙක විඩ අකුශලයට අවකාශ ව තිබෙන්නේ ය.

මේසේ අකුශලයට අවකාශ ඇති ගෘහ වාසයෙහි කෙසේ නම් වෙසෙම් දැ යි, යනාදීන් ගිහි ව සිරිමෙහි ආදීනව නුවණැසින් දකිමින් බඹනාගාරයකින් නික්මෙන්නට සිතන්නක්හු මෙන් නැවත නැවත විතර්කණය කරන්නේ ඒ නම් මෙබඳු කල්පනාව ද නිර්වාණයට අවිරෝධ මාර්ගය ව පෙණෙන බැවින් සම්‍යක්කල්පනා වෙහි ඇතුළත් කොට ගනිමි.

තව ද-සම් කෙණෙක් අනුන්ගේ ග්‍රාම ක්ෂෙත්‍ර දැසි දාසාදී සම්පත් හා අනුන් ලබන ලාභ සත්කාර වන්දන මානනාදිය දැක සතුටු ව මේ සම්පත් ඔවුන් විසින් පූර්ව ජාතියෙහි මනාකොට කරණ ලද සුචරිතයෙහි පිණින් ලද්දේ ය. මේ සම්පත්තීහු නොපිරිහී පුර පැළ වියෙහි වඩනා සඳ සෙයින් වැඩෙත්වා! යි, යනාදී වශයෙන් කල්පනා කරන්නේ ඒ නම් මෙබඳු කල්පනාව ද නිර්වාණයට අවිරෝධ ව පෙණෙන හෙයින් සම්‍යක් කල්පනාවෙහි ඇතුළත් කොට ගනිමි.

තව ද- සමෙක් බුඩාදී රත්නත්‍රයෙහි කෙසේ නම් සරණ යෙම් දැ යි කියා හෝ දැඟිබ් මහබෝ පෙනිපිළිම කෙසේ නම් කෙරෙම් ද කරවම් දැ යි කියා සසුන් පවත්නා පිණිස පිටකත්‍ර ය කෙසේ නම් ලියම් ද ලියවම් දැ යි කියා හෝ ජරාවාස විහාරාදිය දැක කෙසේ නම් මෙහි ජරාවාස හරවා යහපත් කෙරෙම් දැ යි කියා හෝ දැන ගිලාදී වූ දශපුණ්‍යක්‍රියා වස්තූන් සෙසේ නම් පුරම් දැ යි කියා හෝ බුඩාදී මහොත්තමයන් ගළ අකුසල් කෙසේ නම් හරිම් දැ යි කියා හෝ ඒ මහොත්තමයන්ගේ පිළිවෙතට කෙසේ නම් ඇතුළත් වෙම් දැ යි කියා හෝ පෙර බුඩාදී මහොත්තමයන් භජනය පර්යුපාසනය නොකළ හෙයින් අද දක්වා සසර සිටියෙමි.

දැන් කවර තරම් කුශල බලයකින් අපේ සසුන් පවත්නා කාලයෙහි උපතිමි. යහපත් ව ලත් මිනිසත් බව සඵල කෙරෙමි යි කියා හෝ කෙසේ නම් බොහෝ අවැඩට කාරණා වූ අසත්පුරුෂ

සමාගමයෙන් දුරුවෙම් දැ යි කියා හෝ කෙසේ නම් බොහෝ වැඩට කාරණා වූ සත්පුරුෂ සමාගමයට එක් ව කුසල් රැස්කෙරෙම්දැ යි කියා හෝ · කවර උපායකින් දැන් මා කෙරෙහි පවත්නා ලොභ දෙවෂ මොහාදී අකුසල් නසම්දැ යි කියා හෝ නැසූ අකුසල් කවර උපායකින් මා කරා නැවත වැද්ද නොදෙම් දැ යි කියා හෝ කවර උපායකින් නො කළ කුසල් රැස්කෙරෙම් දැ යි කියා හෝ රැස් කරණ ලද කුශල ධම්යන් කවර උපායකින් නො නස්නා පරිද්දෙන් රක්ෂාකොට ගණිම් දැ යි කියා හෝ මාගේ දෙම්විපිය ගුරුවරයෝ මට නොයෙක් උපකාර කළෝ ය.

ඔවුන්ට කෙසේ නම් මම සින් සේ උපකාර කෙරෙම්දැ යි කියා හෝ මාගේ හිතානිත මධ්‍යස්ථ සියලු සතුන්ට කෙසේ නම් ඓහලෞකික පාරලෞකික සම්පත් සාදා දී ස්ථාපත් කෙරෙම් දැ යි කියා හෝ මට උපකාර කළ සත්වයන්ට කෙසේ නම් ප්‍රත්‍යුපකාර කෙරෙම් දැ යි කියා ඥාහ්, යනාදී වසයෙන් යම් යම් කල්පනාවක් තමහට හෝ පරහට නෝ ඉහලෝකයෙන් පරලෝකයෙන් අවැඩට අනර්ථයට නොවැටේ ද යම් කල්පනාවක් ඉහලෝක පරලෝක දෙකින් ආත්මාර්ථයට පරාර්ථයට වැටේ ද එබඳු කල්පනාව සවගී මොක්ෂයට මාගී ව පෙණෙන බැවින් සම්‍යක් කල්පනාවෙහි ඇතුළත් කොට දැක්ක යුතු.

සම්මාවාචා යන තන්හි – සම්‍යක් වචනයට විරොධ වූ මිත්‍යා වචන ය හා සම්‍යක් වචන ය යන දෙදෙනාගේ විභාග කෙසේ ද යත්? යමෙක් මුසාවාදයෙහි බිය නැති ව ඇති දෙය නැති කොට කිමෙන් හා නැතිදෙය ඇති කොට කිමෙන් ද, දුටුවා නුදුටුවි මි. නුදුටුවා දුටුවි මි. යනාදී වසයෙන් මුසාවාද කියන්නේ වී නම් අවිශ්වාස ව වසන්නවුන් නැවත ත් විශ්වාස නොවන ලෙසට හා විශ්වාස වූවන් භෙදවන ලෙසට ත් මේ ආදී වශයෙන් ප්‍රෛශුන්‍ය වචන කියන්නේ වී නම් ද, කණියට කකීශ වූ එරුෂ වචන කියන්නේ වී නම් ද, නෙවත් තාගේ මව්පියන්ගේ නම් ගොත් මෙසේ ය. ඔවුන් කැ පී ලෙස මෙසේ ය. මෙනම් කුලයක් දරු ය. යනාදීන් එරුෂ වචන කියන්නේ වී නම් ද, ඓහලෞකික පාරලෞකික අර්ථයට නැත්තාවූ සම්ඵප්‍රලාප දෙඩන්නේ වී නම් මේ ද, සවගී මොක්ෂයට බාධක වන බැවින් මිත්‍යාවචන නම් වේ.

තව ද–යමෙක් බුඩාදී රතනත්‍රයෙහි අයුණු කියා ද, දෙම්විපිය ගුරුවරුන්ගේ අයුණු කියා ද, සත්වයන්ට ප්‍රාණඝාතාදී අකුශල යෙහි හැසිරෙණ ලෙසට අවවාද කෙරේ ද, කුශල ධම්යෙහි පිහිටි සත්වයන් එයින් පිරිහෙන ලෙසට උපදෙස් කියා ද, ශ්‍රඩාවන්තයන්

අශ්‍රද්ධා වන්ට සුදුසු බස් කියා ද, ළජ්ජිවන්ත වූ වන් අලජ්ජවන සේ කියා ද, සුශීලයන් දුශ්ශීලවන සේ කියා ද, යනාදීන් විසින් යම් යම් වචනයක් ආත්මාර්ථ පරාර්ථ නසා උභයලෝක උභයාන්ථ දූසක වේ ද එබඳු වචන ය මිථ්‍යා වචනයෙහි ඇතුළත් වේ.

යමෙක් මුසාවාදයෙන් දුරු ව සත්‍ය වචන කියා ද, කේලාමෙන් දුරු ව අසමගි වූවන් සමගිවන ලෙසට සමගි වූවන් නොබිඳෙන ලෙසට සුදුසුකොට කියා ද, ඵරුෂ වචනයෙන් දුරු ව යම් වචනයක් කි කල සඤ්ඤයන්ට නිර්දෝෂ නෙසින් කණ්ණියට සුව ද, ප්‍රේම උපදවා ද, හෘදයඞ්ගම් ද, සිවුමැලි ද, බොහෝ ජනයාට ප්‍රිය මනාප වේ ද, එබඳු වචනයක් ම කියා ද, සම්ඵප්‍රලාපයෙන් දුරු ව අර්ථාන්විත වූ ධර්මාන්විත වූ විනයාන්විත වූ වචනයක් කියා ද, මෙබඳු වචන ය සැගී මොක්ෂ සම්පත් සාදදෙන නෙසින් සම්‍යක් වචන නම් වෙයි.

තව ද-යමෙක් බුදුනු අහින් සේක. ධර්මය නෛය්‍යාණික ය. සඞ්ඝයා සුප්‍රතිපන්නයැ යි යනාදි විසින් රත්නත්‍රයෙහි ගුණ කියා ද, දෙමව්පියන් හා ගුරුවරයන්ගේ ගුණ කියා ද, දුටු දුටු සඤ්ඤයන්ට රත්නත්‍රයෙහි සරණ යන සේ කියා ද, පඤ්චදුශ්චරිතයෙහි දසඅකුසලයෙහි ආනන්තර්‍ය කර්මයෙහි ආදීනව කියා එයින් සඤ්ඤයන් මුදා දුනාදී කුශල ධර්මයෙහි අත්‍රසස් කියා එහි සමාදන් කරවා ද, ශ්‍රද්ධා නැති සඤ්ඤයන් ශ්‍රද්ධාවෙහි පිහිටන සේ, ප්‍රඥා නැති සඤ්ඤයන් ප්‍රඥාවෙහි පිහිටන සේ, දුශ්ශීලයන් ශීලයෙහි පිහිටන සේ, උපන් අකුසල් නස්නා සේ, නොඋපන් අකුසල් නූපදනා සේ, නොඋපන් කුසල් උපදනා සේ, උපන් කුසල් ථාවර වන සේ, අසත්සමාගමයෙන් දුරුවන සේ, සත් සමාගමයට පැමිණෙන සේ, බාලයන් නොසෙවූනා සේ, ප්‍රඥාවන්තයන් සෙවූනා සේ, අවවාද අනුසාසනා වසයෙන් කියා ද,

යම් වචනයක් කි කල ඇසුවන්ගේ සිත්හි තුබූ බැවත් ලොභ බලවත් දෝෂ බලවත් මෝහ බලවත් මදමාන මාත්සර්‍යාදී අකුසල් තුනී වේ ද, තමාගේ ලෝභාදිය ත් මැඩපවති ද යම් වචනයක් කි කල ඇසුවන්ගේ ද තමාගේ ද අලොභ අදෝෂාදි ගුණ සහස්‍රයන් වඩී ද, මෙබඳු වචන කිම තමන්ට ද අනුන්ට ද සැගී මොක්ෂයට මාර්ග ව පෙණෙන බැවින් සම්‍යක් වචනයෙහි ඇතුළත් කොට දැන්ක යුතු.

විදැලේ මැනෝ: සම්‍යක් වචනයෙහි විභාග-මහා සති පට්ඨාන සූත්‍රයෙහි:-

"කතමා ච භික්ඛවෙ සම්මාවාචා, මුසාවාදා වෙරමණී පිසුනා වාචා වෙරමණී ඵරුසාවාචා වෙරමණී සම්ඵප්පලාපා වෙරමණී-අයං වුච්චත් භික්ඛවෙ සම්මාවාචා"යි.

සම්මාකම්මන්තෝ, යන තන්හි, සම්‍යක් කර්මාන්තයට විරුද්ධ වූ මිථ්‍යාකර්මාන්ත යෙහි ද, සම්‍යක් කර්මාන්තයෙහි ද විභාග කෙසේ ද යත්?

යමෙක් ප්‍රාණවධ කෙරේ ද, අදත්තාදාන කෙරේ ද, කාම මිථ්‍යාචාරයෙහි හැසිරේ ද, මේ මිථ්‍යාකර්මාන්ත නම් වෙයි. යමෙක් ප්‍රාණවධයෙන් විරති වේ ද, අදත්තාදාන යෙන් විරති වේද, කාම මිථ්‍යාචාර යෙන් විරති වේ ද, මේ සම්‍යක් කර්මාන්ත නම් වෙයි.

වදළේ මැනෝ:-

"කතමෝ ච භික්ඛවෙ සම්මාකම්මන්තෝ, පාණාතිපාතාවෙර මණී අදින්නාදානා වෙරමණී කාමෙසු මිච්ඡාචාරා වෙරමණී-අයං වුච්චති භික්ඛවෙ සම්මා කම්මන්තෝ"යි.

සම්මාආජීවෝ, යන තන්හි, සම්‍යක් ආජීවයට විරෝධ වූ මිථ්‍යා ආජීව ය හා සම්‍යක් ආජීව යන දෙදෙනාගේ විභාග කෙසේ ද යත්?

සම්‍යක් ආජීව ය නම් මිථ්‍යා ආජීව යෙන් දුරු ව ඒයෂී වශ යෙන් පුරණ සම්‍යක් ආජීව ය යි. මිථ්‍යා ආජීවයෙන් දුරු ව ඒයෂී වශයෙන් පුරන්නේ සම්‍යක් ආජීව ය යි කියා සංක්ෂේප වශයෙන් කී හෙයින් ආගම බහුශ්‍රැතඛයක් නැත්තවුන්ට යථාවබෝධ නො වන්නේය. එබැවින් මිථ්‍යා ආජීවය හා මිථ්‍යා ආජීවයෙහි ආදීනව ද සම්‍යක් ආජීවය හා සම්‍යක් ආජීවයෙහි අනුසස් ද මෙහි සැකෙවින් සඞ්ග්‍රහ කෙරෙමි. කෙසේ ද යත්?

මිථ්‍යා ආජීවය ට ප්‍රත්‍ය ය වන්නේ ඒයෂී වැඩිමේ කුසීත බව ය. හෙ ද අටවැදෑරුම් වේ. හෙවත් භික්ෂූන්ට හානභාගිය වූ කුසීත වස්තු අටෙක් වේ කෙසේ ද යත්?

මේ යස්තෙහි භික්ෂූන් වහන්සේ දැඟබ් මහබෝ ආදියෙහි හෝ ආචාර්‍ය්‍ය උපාධ්‍යාය යන් හිලන් මහළු ආදීන් කෙරෙහි හෝ පැවති ක්‍රියාවක් කටයුතු වන්නේ ය. කුසීතයන් ට එය සම්ප්‍රාප්ත වූ කල්හි මෙබඳු සිතිවිල්ලෙක් වන්නේය කෙසේ ද යත්:—

මා විසින් මෙබඳු කර්මාන්තයක් කටයුතු වන්නේ ය. කර්මාන්ත කරන්නා වූ මාගේ මේ සුකුමාල වූ ශරීර ය ක්ලාන්ත වන්නේ ය. එ හෙයින් මම සැතපෙමි කියා හෙතෙම සැතපෙන්නේ ය. අප්‍රාප්ත ගුණධර්මයානේ ප්‍රාප්ති ය පිණිස අනධිගත ගුණධර්මයාගේ අධිගම ය පිණිස අසාක්ෂාත් කෘත ගුණධර්මයාගේ සාක්ෂාත් ක්‍රියාව පිණිස වීර්‍යාරම්භ නොකරන්නේ ය. මේ ප්‍රථම කුසීත වස්තුව ය.

එසින් වදළහ. දම්සෙනෙවි සැරියුන් මහතෙරහු:-

"ඉධාවුසෝ භික්ඛුනා කම්මං කත්තබ්බං හොති. තස්ස එවං හොති- කම්මං බෝ මේ කත්තබ්බං භවිස්සති කම්මං බෝ පන කරොන්තස්ස කායෝ කිලමිස්සති. හන්දාහං නිපජ්ජාමි'ති සෝ නිපජ්ජති. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියා ය. ඉමං පඨමං කුසීත වත්ථුං"සි.

නැවත එසේ ම සම්ප්‍රාප්ත වූ කර්මාන්තයක් කළහොත් ඒ කුසීත භික්ෂූහට මෙබඳු සිතිවිල්ලෙක් සිතෙන්නේ ය. කෙසේ ද යත්? මම වනාහි මේබඳු දුෂ්කර කර්මාන්තයක් කෙළෙමි. එසේ කරණලද කර්මාන්ත ඇති මාගේ ශරීරය ක්ලාන්ත විය. ඒ හෙයින් මම සතප් නෙමි, සි කියා වීර්‍යාරම්භ නො කරන්නේ ය. මේ දවිතීය කුසීත වස්තුව ය.

එසින් වදළහ.

පුන ච පරං ආවුසෝ භික්ඛුනා කම්මං කතං හොති. තස්ස එවං හොති-අහං බෝ කම්මං අකාසිං, කම්මං බෝ පන මේ කරොන්තස්ස කායෝ කිලන්තෝ, හන්දාහං නිපජ්ජාමි'නි, සෝ නිපජ්ජති. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං දුතියං කුසීත වත්ථුං"සි.

නැවත එසේ ම මාර්ගයෙහි යා යුතු ගමනක් සම්භව වන්නේ ය. එ කල්හි ඒ කුසීත භික්ෂූහට මෙ බඳු සිතිවිල්ලෙක් සිතෙන්නේ ය. කෙසේ ද යත්? මා විසින් මාර්ගයෙක යා යුතු ගමනක් සම්ප්‍රාප්ත විය. මාර්ගයෙහි ගමන් යන්නා වූ මාගේ ශරීරය වනාහි ක්ලාන්ත වන්නේ ය. එසේ හෙයින් මම සතප්මි සි කියා සතප්නේ ය. වීර්‍යාරම්භ නො කරන් ය. මේ තෘතීය කුසීත වස්තුව ය.

පුන ච පරං ආවුසෝ භික්ඛුනා මඤ්ඤා ගන්තබ්බා හොති. තස්ස එවං හොති-මඤ්ඤා බෝ ගන්තබ්බා භවිස්සති මඤ්ඤං බෝ පන මේ ගච්ඡන්තස්ස කායෝ කිලමිස්සති හන්දාහං නිපජ්ජාමි'නි, සෝ නිපජ්ජති. න විරිය ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය. ඉදං තතියං කුසීත වත්ථුං"සි.

නැවත එසේ ම මාර්ගයෙක ගමනක් ගිය කල්හි මෙබඳු සිතිවිල්ලෙක් සිතෙන්නේ ය. කෙසේ ද යත්? මම වනාහි මෙබඳු දුෂ්කර ගමනක් ගියෙමි. ආම්. එසේ හෙයින් මාගේ ශරීරය ක්ලාන්ත වී ය. හියඩි කොටගත නොහෙමි සි කියා සතප්නේ ය. වීර්‍යාරම්භ නො කරන්නේ ය. මේ සතරවැනි කුසීත වස්තුව ය.

එසින් වදුල හ.

පුන ච පරං ආවුසෝ භික්ඛුනා මග්ගෝ ගතෝ හොති තස්ස එවං හොති. අහං ඛෝ මග්ගං අගමාසිං – මග්ගං ඛෝ පන මේ ගච්ඡන්තස්ස කායෝ කිලන්තෝ හඤ්ඤං නිපජ්ජාමී'ති. සෝ නිපජ්ජති න විරියං ආරභති අපත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය– ඉදං චතුත්ථං කුසීත වත්ථුං''සි.

නැවත ග්‍රාමයෙක හෝ නිගමයෙක හෝ පිඬුපිණිස හැසිරෙන්නේ යැපෙන ලෙසට ලූඛ වූ හෝ ප්‍රණීත වූ හෝ භෝජනයක් නොලබන්නේය. එකල්හි ඒ කුසීත භික්ෂුවට මේබඳු සිතිවිල්ලෙක් සිහෙන්නේ ය. කෙසේ ද යත්? මම වනාහි ග්‍රාමාදියෙහි පිඬුපිණිස ගියෙමි. ලූඛ වූ හෝ ප්‍රණීත වූ හෝ භෝජනයක් යැපෙන පමණ නොලදිමි. එහෙයින් මාගේ ශරීර ය ක්ලාන්තවී ය සි කියා සිතප්නේය. වීර්‍යාරම්භ නොකරන්නේ ය. මේ පස්වැනි කුසීත වස්තුව ය.

එසින් වදුල හ.

පුන ච පරං ආවුසෝ භික්ඛුනා ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තෝ නලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං–තස්ස එවං හොති අහං ඛෝ ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තෝ නාලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මේ කායෝ කිලන්තෝ අකම්මඤ්ඤෝ හඤ්ඤං නිපජ්ජාමී'ති සෝ නිපජ්ජති. න විරියං ආරභති අපත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය– ඉදං පඤ්චමං කුසීතවත්ථුං''සි.

නැවත එසේ ම ග්‍රාම නිගමාදියෙහි පිඬුපිණිස හැසිර ලූඛ වූ හෝ ප්‍රණීත වූ හෝ භොජනයක් යැපෙන සේ ලැබෙන්නේ ය. ඒ වලදී මේ බදු භෝජනයක් ලැබ වැලදීමි. එහෙයින් කය ගරුක වී ය අකර්මණ්‍ය ය සි කියා සිතප්නේ ය. වීර්‍යාරම්භ නොකරන්නේ ය. මේ සවැනි කුසීතවස්තුව නම් වේ.

එසින් වදුල හ.

පුන ච පරං ආවුසෝ භික්ඛුනා ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තෝ ලභති ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස එවං හොති–අහං ඛෝ ගාමං වා නිගමං වා පිණ්ඩාය චරන්තෝ අලත්ථං ලූඛස්ස වා පණීතස්ස වා භොජනස්ස යාවදත්ථං පාරිපූරිං. තස්ස මේ කායෝ ගරුකෝ අකම්මඤ්ඤෝ මාසාවිතං

මඤ්ඤේ. හන්දාහං නිපජ්ජාමී'ති සෝ නිපජ්ජති. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය-ඉදං ඡට්ඨං කුසීතවත්ථු''සි.

නැවත සවලප වූ හෝ ආබාධයක් උපදනේ ය. එකල්හි ඒ කුසීත භික්ෂුවට මෙබදු සිතිවිල්ලෙක් උපදනේ ය. කෙසේ ද යත්? මට වනාහි සවලපමාත්‍ර වූ ආබාධයක් උපන්නේ ය. එ හෙයින් ඊයේ කොට ගතනොගෙමි යි කියා සතප්නේ ය. වීර්‍යාරම්භ නො කරන්නේ ය. මේ සත්වැනි කුසීත වස්තුව ය.

එසින් වදළ හ.

පුන ච පරං ආවුසෝ භික්ඛුනෝ උප්පන්නෝ හොති අප්පමත්තකෝ ආබාධෝ. තස්ස එවං හොති- උප්පන්නෝ ඛෝ මේ අයං අප්පමත්තකෝ ආබාධෝ අත්ථකපෝ නිපජ්ජිතුං. හන්දාහං නිපජ්ජාමී'ති සෝ නිපජ්ජති. න විරියං ආරභති. අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය-ඉදං සත්තමං කුසීතවත්ථුං''සි.

නැවත ශිලන්කමින් නැඟි නැනැත්තාහට ත් මෙ බදු සිනිවිල්ලෙක් සිතෙන්නේ ය. කෙසේ ද යත්? මම වනාහි අලුත ලෙඩින් නැහෙමි. ඒ මාගේ ශරීර ය දුර්‍බල ය, අකර්‍මණ්‍ය ය යි කියා ත් සතප්නේ ය. වීර්‍යාරම්භ නොකරන්නේ ය. මේ අටවැනි කුසීත වස්තුව ය.

එසින් වදළ හ.

පුන ච පරං ආවුසෝ භික්ඛු ගිලානා වුට්ඨිතෝ හොති අචිර වුට්ඨිතෝ ගෙලඤ්ඤකෝ. තස්ස එවං හොති-අහං ඛෝ ගිලානා වුට්ඨිතෝ ගෙලඤ්ඤකෝ. තස්ස මේ කායෝ දුබ්බලෝ අකම්මඤ්ඤෝ. හන්දාහං නිපජ්ජාමී'ති සෝ නිපජ්ජති. න විරියං ආරභති අප්පත්තස්ස පත්තියා අනධිගතස්ස අධිගමාය අසච්ඡිකතස්ස සච්ඡිකිරියාය-ඉදං අට්ඨමං කුසීතවත්ථුං''සි.

මේ කුසීත වස්තු අට දීඝනිකායෙහි දම්සෙනෙව් සැරියුත් මහ තෙරුන් වහන්සේ විසින් දෙසූ **දසුත්තර** සූත්‍රයෙන් සංග්‍රහ කළහ යි දතයුතු. වීර්‍යවශයෙන් පිරිය යුතු සම්‍යක් ආජීව ය මෙ බදු කුසීත භික්ෂූන් විසින් පිරිය නොහැකි වේ. භික්ෂාටනයට කුසීත ව මිථ්‍යා ජීවයෙන් ජීවත් වෙත්. මෙසේ අනෙකප්‍රකාරයෙන් දක්වනලද මිථ්‍යාජීවයෙන් දුරු ව යම් භික්ෂු කෙණෙක් අසත් ගුණ පෑලකිරීම් ආදියක් නැති ව ධර්‍මදේශනායෙහි ප්‍රසන්න වූවන් විසින්, ඊර්‍යාපථ යෙහි ප්‍රසන්න වූවන් විසින් ද, දෙනලද ප්‍රත්‍යය පරිභොග කිරීම ධුතාඞ්ග සමාදාන ය නොකළ භික්ෂූන්ට සම්‍යක් ආජීව ය කිළිටු නොකෙරෙයි.

ධුතාඞග සමාදාන ය ඇති නැති සියලු භික්ෂූන්ට ම පිණ්ඩපාත වස්ත්‍රාදියෙන් ලද ප්‍රත්‍ය ය පරිභොග කිරීමෙන් ම සම්‍යක් ආජීව ය පිරිසිදු වේ. ධුතාඞග සමාදානය වූ කලී භික්ෂූන්ට ඒ ඒ ධුතාඞගයට කී ලෙස පිළිපැදීමෙන් පිණ්ඩපාත වස්ත්‍රාදියෙන් ලද ප්‍රත්‍යය ද, ධුතාඞග අල්පෙච්ඡතායෙන් තමා විසින් නොඇඟවුව ද ලීලාවෙන් හෝ සෙස්සවුන් කෙරෙන් අසා හෝ මොවුන්වහන්සේ ධුතාඞගධරයෝ කැ යි ප්‍රසන්න වූ ශ්‍රද්ධාවන්තයන් විසින් ධුතාඞගයට අවිරුද්ධ වූ පරිද්දෙන් දුන් ප්‍රත්‍ය ය පරිභොග කිරීමෙන් ද, සම්‍යක් ආජීව ය අනිශයින් පිරිසිදු වේ. යථොක්ත ප්‍රකාරයෙන් දක්වනලද මිථ්‍යා ආජීව ය සම්‍යක් ආජීව ය යන දෙදෙනාගේ විභාග දැන මිථ්‍යාආජීව ය හලාහල විසයක් සේ දුරුකොට සම්‍යක් ආජීවයෙන් ජීවත්වීම සම්‍යක් ආජීව නම් වේ.

එසින් වදාළහ මහාසතිපට්ඨාන සූත්‍රයෙහි:

"කතමෝ ච භික්ඛවෙ සම්මාආජීවෝ? ඉධ භික්ඛවෙ අරිය සාවකෝ මිච්ඡාආජීවං පහාය, සම්මාආජීවෙන ජීවිකං කප්පෙති- අයං වුච්චති භික්ඛවෙ සම්මාආජීවෝ"යි.

මෙතෙකින් සම්‍යක් ආජීවයෙහි ප්‍රභෙද සැකෙවින් දක්වන ලදී.

සම්මාවායාමෝ, යන තන්හි සම්‍යක් ව්‍යායාමයට විරුද්ධ වූ මිථ්‍යා ව්‍යායාමයෙහි ද, සම්‍යක් ව්‍යායාමයෙහි ද, ප්‍රභෙද දක්වනු ලැබේ. කෙසේ ද යත්?

"කතමෝ ච භික්ඛවෙ සම්මාවායාමෝ? ඉධ භික්ඛවෙ භික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදය ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භියෝභාවාය වෙපුල්ලාය භාවනාය පාරි පූරියා ඡන්දං ජනෙති වායමති විරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. අයං වුච්චති භික්ඛවෙ සම්මාවායාමෝ"යි. යනුවෙන් සතිපට්ඨාන සූත්‍ර ය වදාරණ බුදුන් විසින්:—

මහණෙනි! යමෙක් නුපන් අකුශලධර්මයන්ගේ අනුත්පාදන යෙහි ද, උපන් අකුශල ධර්මයන්ගේ ප්‍රහාණියෙහි ද, අනුත්පන්න කුශලධර්මයන්ගේ උත්පාදනයෙහි ද උත්පන්න කුශලධර්මයන්ගේ

නීයොහාව වෙපුල්ල භාවනා පාරිපූරිඩියෙහි ද උත්සාහ කෙරේ නම්, මේ සම්‍යක් ව්‍යායාමයැ යි, වදුළ බැවින් චතුර්විධ සම්‍යක් ප්‍රධාන සංඛ්‍යාත වීර්‍ය්‍ය සම්‍යක් ව්‍යායාම නම් වේ.

සම්මාසති, යන තන්හි, සම්‍යක් සමාධියට විරොධ වූ මිථ්‍යා සමාධි ය හා සම්‍යක්සමාධි ය යන මේ දෙදෙනාගේ විභාග කෙසේ ද යත්? සම්‍යක් සමාධියට විරොධ වූයේ මිථ්‍යාසමාධි ය නම් වේ. සම්‍යක්සමාධි ය නම් කවරහ යත්? ලෞකික ලොකොත්තර සුබ දායක වූ මේ සර්ව්ඥශාසනයෙහි සැදැහැයෙන් පැවිදි වූ භික්‍ෂූ තෙමේ රූප කයෙහි ක්ලේශයන් තවන වීර්‍ය්‍ය ය ඇත්තේ සම්පජඤ්ඤ ය යි කියන ලද ඤාණයෙන් සමන්විත වූයේ කායපරිග්‍රාහික සතියෙන් සමන්විත වූයේ ලුප්ත පලුජ්ජනාර්ථයෙන්ලෝක නම් වූ, මේ ශරීර යෙහි අභිජ්ඣාය යි කියනලද කාමච්ඡන්‍දය ද, දෞමනස්‍ස ය යි කියන ලද ව්‍යාපාදය ද, සාභිදුවා කායගතාසති කම්මට්ඨාන ය මෙනෙහි කර මින් වාසය කරන්නේ ය එසේ ම සුඛවේදනාව ය, දුක්ඛ වේදනාව ය, උපේක්‍ඛා වේදනාව ය යන ත්‍රිවිධ වේදනාවන් කෙරෙහි ක්ලේශයන් තවන වීර්‍ය්‍ය ඇති ඤාණයෙන් සමන්විත වූ වේදනා පරිග්‍රාහික සති යෙන් සමන්විත වූයේ වේදනාවන් කෙරෙහි කාමච්ඡන්‍දය ද ව්‍යාපාද යද සන්හිදුවා, වේදනානුපස්සනා සති කම්මට්ඨානය මෙනෙහි කරමින් වාසය කරන්නේය එසේ ම චිත්තානුපස්සනා කම්මට්ඨානය මෙනෙහි කරමින් වාසය කරන්නේය. එසේ ම පඤ්චනීවරණයන් කෙරෙහි ක්ලේශයන් තවන වීර්‍ය්‍ය ඇති ධම්මානුදර්ශි කම්මට්ඨානය මෙනෙහි කරන්නේ ය යි දක්වන ලද මේ සතර සතිපට්ඨාන ධර්මකොණෙක් ඇද්ද, මේ සම්‍යක් සමාධිය නම් වේ.

එසින් වදළහ.

"කතමා ච භික්ඛවෙ සම්මාසති? ඉධ භික්ඛවෙ භික්ඛු, කායෙ කායානුපස්සී විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්‍සං, වෙදනාසු වෙදනානුපස්සී විහරති ආතාපී සම්ප ජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්‍සං, චිත්තෙ චිත්තානුපස්සි විහරති ආතාපී සම්පජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣාදෙමනස්‍සං, ධම්මෙසු ධම්මානුපස්සී විහරති ආතාපී සම්ප ජානො සතිමා විනෙය්‍ය ලොකෙ අභිජ්ඣා දෙමනස්‍සං- අයං වුච්චති භික්ඛවෙ සම්මාසති"යි.

සම්මාසමාධි, යන තන්හි, මිථ්‍යා සමාධියට විරොධ වූ සම්‍යක් සමාධිය නම් කවරහ යත්? සර්ව්ලොක කල්පද්‍රුම වූ මේ සර්ව්ඥශාසන යෙහි භික්‍ෂූතෙමේ රූපාදී පඤ්චකාමයන් කෙරෙන් වෙන් ව අකු ශල ධර්මයන් කෙරෙත් වෙන් ව, විතර්ක සහිත වූ, විචාර සහිත වූ, විවේකයෙන් උපන් ප්‍රීතිසැප ඇති ප්‍රථමධ්‍යාන ය ට පැමිණ වෙසේ.

විතර්ක විචාර දෙදෙනාගේ සන්සිඳීම හෙතුකොට ගෙණ සවසන් කානය විශෙෂයෙන් ප්‍රහැදීම කරන්නා වූ, චිත්තයා සම්බන්ධ ව එකඟබව ඇති, විතර්ක රහිත වූ, විචාර රහිත වූ, සමාධියෙන් උපන් ප්‍රීති සැප ඇති, දවිතීයධ්‍යාන ය උපදවා වෙසේ ද, ප්‍රීතිවිරාගය හේතු කොටගෙණ ද උපෙක්ෂා ඇත්තේ ද සමෘති ඇත්තේ ද සම්ප්‍රජාන කාරිවූයේ ද වසන්නේ ය. ආර්‍යයෝ යම් බදු වූ ඕහට උපෙක්ෂා ඇත්තේ ය, සමෘති සම්පන්න ය, සැප වූ විහරණයන් ඇත්තේ ය යි කියද්ද, එබදු වූ සැපය ද කයින් විඳින්නේ ය. තෘතියධ්‍යානයට සම්වැද වසන්නේ ද, සැපයාගේ ප්‍රහාණිය හේතුකොට ගෙණ ද දුකයාගේ ප්‍රහාණිය හේතුකොට ගෙණ ද සොමනස්ස දෙමනස්ස යන්නේ පළමුව විනාශය හේතුකොට ගෙණ ද දුක් නැති සැප නැති උපෙක්ෂා සමෘති පාරිශුද්ධි ඇති චතුර්ථධ්‍යානයට සම වැද වෙසේ ද, මේ සම්‍යක් සමාධිය නම් වේ.

එසින් වදාළහ:

"කතමා ච භික්ඛවෙ සම්මාසමාධි? ඉධ භික්ඛවෙ භික්ඛු, විවිෙච්ච කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පිතිසුඛං පඨමජ්ඣානං උපසම්පජ්ජ විහරති. විතක්ක විචාරානං වූපසමා අජ්ඣත්තං සම්පසාදනං චෙතසො එකොදිභාවං අවිතක්කං අවිචාරං සමාධිජං පිතිසුඛං දුතියජ්ඣානං උපසම්පජ්ජ විහරති. පීතියා ච විරාගා උපෙක්ඛකො ච විහරති. සතො ච සම්පජානො සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති. යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරීති, තතිය ජ්ඣානං උපසම්පජ්ජ විහරති. සුඛස්ස ච පහාණා දුක්ඛස්ස ච පහාණා පුබ්බෙව සොමනස්ස දෙමනස්සානං අත්ථඞගමා, අදුක්ඛං අසුඛං උපෙක්ඛාසති පාරිසුද්ධිං චතුත්ථජ්ඣානං උපසම්පජ්ජ විහරති- අයං වුච්චති භික්ඛවෙ සම්මා සමාධි"සි.

මෙසේ යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද නොහොත්, "එතෙ තෙ භික්ඛවෙ"සි යනුවෙන් දැක් වූ තැන් පටන් මේ සම්‍යක් සමාධිය දක්වා වර්ණනා කරණ ලද, ආර්‍යඅෂ්ටාඞ්ගික මාගී නම් වූ මධ්‍යම ප්‍රතිපදාව පුරණ සේ:—

"අයං ඛො සා භික්ඛවෙ මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා, චක්ඛුකරණී ඤාණකරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති"සි යන පාළිය වදාළ සේක. එහි අර්ථ කෙසේ ද යත් ?

භික්ඛවෙ, මහෙනෙ; චක්ඛුකරණී, ප්‍රඥාචක්ෂුස විශුද්ධ කරණ පිණිස හෙවත් පෑණ ඇස පිරිසිදු කරණ පිණිස; ඤාණ

කරණී, මොහාන්ධකාර දූරීභූතකොට නුවණැස කරණු පිණිස හෙවත් මොහ දුරු කොට නුවණැස් කරණු පිණිස; උපසමාය,; කෙලෙසපරිදාහ ප්‍රශ්‍රබ්ධි දුරුකරණු පිණිස; හෙවත් කෙලෙසයන්ගේ ව්‍යුපසමය පිණිස; අභිඤ්ඤාය, සත්‍යප්‍රතිවෙධ ය කරණු පිණිස; හෙවත් දුක්ඛ-සමුදය-නිරෝධ-මාර්ග යන චතුස්සත්‍ය ය ප්‍රතිවෙධ කරණු පිණිස; සම්බොධාය, ඔවුන්ගේ ම අවබෝධය පිණිස; හෙවත් උපාදිශෙෂ නිර්වාණධාතුව දක්නා පිණිස; නිබ්බාණාය, අනුපාදිශෙෂ නිර්වාණ ධාතුව ප්‍රත්‍යක්ෂ කරණු පිණිස; හෙවත් නිවන් පසක් කරණු පිණිස; සංවත්තති, පවත්නා වූ; අයං ඛෝ සා මජ්ඣිමා පටිපදා, ඒ මේ මධ්‍යම ප්‍රතිපදාතොම; තථාගතෙන, තථාගතත්වාදි කාරණයෙන් යුක්ත සර්ව්ඥයන් වහන්සේ විසින්; අභිසම්බුද්ධා, ප්‍රත්‍යක්ෂ කරණ ලද්දේ ය. හෙවත් පසක් කරණ ලද්දේ ය; (එ හෙයින්) ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය පිරිය යුතු ය යි වදාළ සේක යනු මෙහි අර්ථ යි.

මධ්‍යම ප්‍රතිපදාව දක්වා වදාරා, නැවත කරුණා නැමැති පයෝධරයෙහි දරා තිබෙන චතුරාර්‍ය්‍යසත්‍ය නැමැති ක්ෂීර පාන යෙන් වෛනෙයජන නමැති ලදරුවන් සන්තර්ප්පණ ය කරණු පිණිස, චතුස්සත්‍ය ය දක්වනසේකැ ත් භවප්‍රබන්ධවාද ග්‍රථිත සත්ත්ව යන්ට සංවේග උපදවා සසරෙහි භයගන්වනු පිණිස:—

"ඉදං ඛෝ පන භික්ඛවෙ දුක්ඛං අරියසච්චං. ජාති පි දුක්ඛා, ජරා පි දුක්ඛා, ව්‍යාධි පි දුක්ඛෝ, මරණම්පි දුක්ඛං, අප්පියෙහි සම්පයොගෝ දුක්ඛෝ, පියෙහි විප්පයොගෝ දුක්ඛෝ, යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං, සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා"යි. යන මේ පාළිය වදාළ සේක. ඒ පාළියෙහි අර්ථ තම් ?

භික්ඛවෙ, මහණෙනි; ජාතිපි දුක්ඛා, ඒ ඒ තැන්හි ස්කන්ධයන්ගේ ප්‍රාදුර්භූතභාවය යි කියන ලද ජාතිය ද දුක් වන්නේ ය. ජරාපි දුක්ඛා, අඞ්ගප්‍රත්‍යඞ්ගයන්ගේ සෛථිල්‍යභාවය හා යෞවන විනාශ කිරීම ය යි කියන ලද ජරාව ද දුක; ව්‍යාධි පි දුක්ඛෝ, ජීවිත විනාශ කිරීමට සුදුසු වූ අනෙකප්‍රකාර ව්‍යාධීන්ගේ ප්‍රාදුර්භූත භාවය ද දුක් වන්නේ ය. මරණම්පි දුක්ඛං, ජීවිතෙන්ද්‍රිය ප්‍රබන්ධයාගේ විච්ඡේද ය යි කියන ලද මරණය ද දුක. අප්පියෙහි සම්පයොගෝ දුක්ඛෝ, අප්‍රිය වූ සත්ත්වයන් හා සමග එක්වීම ද දුක් වන්නේ ය. පියෙහි විප්පයොගෝ දුක්ඛෝ, ප්‍රිය වූ සත්ත්වයන් කෙරෙන් වෙන්වීම ද දුක. යම්පිච්ඡං න ලභති, අභිමතාර්ථ වූ යම් කිසිවක් නො ලැබේ ද; තම්පි දුක්ඛං, හෙ ද දුක් වන්නේ යි. සංඛිත්තෙන, සංක්ෂෙප වශයෙන්; පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා, උපාදානස්කන්ධයන් පස්දෙනාගේ උත්පත්තිය ද

දුක් වන්නේ ය. යන; ඉදං ඛො පන, මේ යථොක්ත දුක්ඛය වනාහි; දුක්ඛං අරිය සච්චං, දුක්ඛායථී සත්‍ය ය නම් වන්නේ ය යි වදාළ සේක. යන අර්ථ යි.

මෙසේ, යථොක්ත ප්‍රකාරයෙන් වදාරණ ලද්ද වූ දුක්ඛය ට භවය හේතු ය. භවය ඇති කල්හි ඒ ඒ දුක් විත්ද යුතු ය යි කියා භවයෙහි ඇලුම් ඇති සඳයන් භවයෙහි ඇලුම් හරවන පිණිස:—

"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛසමුදයං අරියසච්චං, යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍ර තත්‍රාභිනන්දිනි, සෙය්‍යථීදං? කාමතණ්හා භවතණ්හා විභවතණ්හා"යි—යන මේ සමුදය සත්‍ය ය ගත පාළිය වදාළ සේක. ඒ පාළියෙහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; යා'යං තණ්හා, යම් මේ තෘෂ්ණා වක් තොම්; පොනොභවිකා, පුනර්භව ය කෙරේ ද; නන්දිරාග සහගතා, නන්දිරාග සම්ප්‍රයුක්ත වන්නී ද; තත්‍ර තත්‍රා'භිනන්දිනි, ඒ ඒ භවයෙහි ඇලීම පිපාසාව තොසය කරන්නී ද; සෙය්‍යථීදං? ඒ තෘෂ්ණා ව නම් කවරේ ද? කාමතණ්හා, කාමාස්වාදයෙන් පැවති තෘෂ්ණාව ය; භවතණ්හා, සාස්වතදෘෂ්ටි ය හා එක්ව පැවති තෘෂ්ණාවය; විභවතණ්හා, උච්ඡේද දෘෂ්ටිය හා එක්ව පැවති තෘෂ්ණාව ය (යන); ඉදං ඛො පන, මේ තෘෂ්ණාත්‍රය වනාහි; දුක්ඛ සමුදයං අරියසච්චං, දුක්ඛසමුදයායථී සත්‍ය නම් වන්නේ ය යි වදාළ සේක. යන අර්ථ යි.

මෙසේ යථොක්ත ප්‍රකාරයෙන් සමුදය සත්‍ය ය දක්වා වදාරා, මෙයට හසින් නැති ගෙණ අභිභූත වූ සත්ත්වයන් මේ සංසාර ව්‍යසනයෙන් මිදෙනු කැමති කෘතපුණ්‍ය සත්ත්වයන්ට පිහිටැ'නි බව ගහවා අස්වසා වදාරණ පිණිස-

"ඉදං ඛො පන භික්ඛවෙ දුක්ඛනිරොධං අරියසච්චං, යො තස්සා එව තණ්හාය අසෙස විරාග නිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො"යි යන මේ නිරොධ සත්‍යගත පාළිය වදාළ සේක. එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; තස්සා එව තණ්හාය, සමුදය සත්‍ය යෙහි ලා දක්වන ලද කාම භව විභව වසයෙන් තුන් වැදෑරුම් වූ ඒ තෘෂ්ණාවගේ ම; යො අසෙස විරාග නිරොධො, යම් නිශ්ශෙෂයෙන් මාගීයෙන් නො ඇලී නැසීමෙක් ඇද් ද; චාගො, හැරීමෙක් ඇද් ද; පටිනිස්සග්ගො, නිශ්ශෙෂයෙන් හැරීමෙක් ඇද් ද;

මුත්ති, මිදීමෙක් ඇද්ද; අනාලයෝ, ආලය නොකිරීමෙක් ඇද්ද (යන); ඉදං බෝ පන, මේ තෘෂ්ණාවගේ හැරීම වනාහි; දුක්ඛ නිරෝධං අරියසච්චං; දුක්ඛ නිරෝධාය්‍යී සත්‍ය නම් වන්නේ ය යි වදාළ සේක යන අර්ථ යි.

මෙසේ යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද නිරෝධ ය යි කියන ලද, නිර්වාණයට පැමිණෙනු කැමති සත්වයන් විසින් වැඩිය යුතු වූ, පිරිය යුතු වූ, සෙවිය යුතු වූ, මාර්ග දක්වනු පිණිස:—

"ඉදං බෝ පන භික්ඛවෙ දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා අරියසච්චං, අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ. සෙය්‍යථීදං? සම්මාදිට්ඨි, සම්මාසංකප්පෝ, සම්මාවාචා, සම්මාකම්මන්තෝ, සම්මා ආජීවෝ, සම්මාවායාමෝ, සම්මාසති, සම්මාසමාධි."යි යන මේ මාර්ගසත්‍යගත පාළි ය වදාළ සේක. එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; අයමේව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ, මේම ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග ය වන්නේ ය; සෙය්‍යථීදං? ඒ අෂ්ටාඞ්ගාර්‍ය්‍ය මාර්ග ය නම් කවරේ ද? සම්මාදිට්ඨි, මිථ්‍යා දෘෂ්ටියෙන් පහ වූ සම්‍යක්දෘෂ්ටි ය; සම්මාසංකප්පෝ, මිථ්‍යා සංකල්පනාවෙන් පහ වූ සම්‍යක්සංකල්පනාව ය; සම්මාවාචා, මිථ්‍යා වචනයෙන් පහ වූ සම්‍යග්වචන ය; සම්මාකම්මන්තෝ, මිථ්‍යා කර්මාන්තයෙන් පහ වූ සම්‍යක් කර්මාන්ත ය; සම්මාආජීවෝ, මිථ්‍යා ආජීවයෙන් පහ වූ සම්‍යක් ආජීව ය; සම්මාවායාමෝ, මිථ්‍යා ව්‍යායාමයෙන් පහ වූ සම්‍යක්ව්‍යායාම ය; සම්මාසති, මිථ්‍යා සංඥාවෙන් පහ වූ සම්‍යග් සංඥා ය; සම්මාසමාධි, මිථ්‍යාසමාධියෙන් පහ වූ සම්‍යක්සමාධි ය, (යන); ඉදං බෝ පන, මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග ය වනාහි; දුක්ඛනිරෝධගාමිණී පටිපදා අරිය සච්චං; දුක්ඛනිරෝධගාමිනී ප්‍රතිපදාර්‍ය්‍යසත්‍ය නම් වන්නී ය යි වදාළ සේක යන අර්ථ යි.

මෙසේ චතුස්සත්‍ය ය ධර්මයන් දක්වා වදාරා, තැවත තමන් වහන්සේ මේ දුක්ඛ සත්‍ය ය දුක්ඛ සත්‍ය ය යි කියා, කිසිකෙණෙකුන් කෙරෙනු ත් නොඅසා බොධිද්‍රුම මූලයෙහි දී තමන් වහන්සේ ම දත් බව ගහවා වදාරණ සේක්:—

"ඉදං දුක්ඛං අරියසච්චන්‍ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි. විජ්ජා උදපාදි ආලොකෝ උදපාදි." යන මේ දුක්ඛ සත්‍යය ගන සත්‍යඥාන ප්‍රකාශක පාළිය වදාළ සේක. එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ, මට; ඉදං දුක්ඛං අරියසච්චං ඉති, මේ දුක්ඛාය්‍යී සත්‍ය ය යි කියා; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්‍මයන් නිමිත්ත කොට ගෙණ (චතුස්සත්‍ය ධර්‍මයෙහි); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥන වූ චක්‍ෂුස උපන; ඤාණං උදපාදි, තත්වාර්‍ථඥන වූ ප්‍රඥව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්‍ථ වූ ප්‍රඥව උපන; විජ්ජා උදපාදි, කෙලෙස හෙද ය කරණ විද්‍යව උපන; ආලොකො උදපාදි, සත්‍යප්‍රතිවේධ දක මොහාන්ධකාර ය විධ්වංශන ය කරණ ආලෝක ය උපනැ යි වදළ සේක—යන අර්‍ථ යි.

තදනන්තරයෙන් ඒ දුක්ඛාය්‍යී සත්‍ය ය පිරිසිඳ දතයුත්තේ ය යි කියා කිසි කෙණෙකුන් කෙරෙනු ත් නො අසා ම දත් පරිදි හඟවා වදරණ සේක්:—

"තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං පරිඤ්ඤෙය්‍ය'න්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛු උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි"යන කෘත්‍යඥන ප්‍රකාශක පාළිය වදළ සේක—එහි අර්‍ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන් නිමිත්ත කොට ගෙණ (චතුස්සත්‍ය ධර්‍මයෙහි); තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං, හේ මේ දුක්ඛාය්‍යී සත්‍ය ය; පරිඤ්ඤෙය්‍යන්ති, පිරිසිඳ දතයුත්තේ ය යි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥන වූ චක්‍ෂුස උපන; ඤාණං උදපාදි, තත්වාර්‍ථඥන වූ ප්‍රඥව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්‍ථ වූ ප්‍රඥව උපන; විජ්ජා උදපාදි, කෙලෙස හෙද කරණ විද්‍යව උපන; ආලොකො උදපාදි, ප්‍රඥා නැමැති ආලොක ය උපනැ යි වදළ සේක—යන අර්‍ථ යි.

තදනන්තරයෙන් එම දුක්ඛාය්‍යීසත්‍ය ය පිරිසිඳ දත්තා ලද්දා යි නියා පරොපදෙශ රහිත ව දත් පරිදි හඟවන සේක්:—

"තං ඛො පනිදං දුක්ඛං අරියසච්චං: පරිඤ්ඤාත'න්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛු උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි" යි යන කෘතඥන ප්‍රකාශක පාළි ය වදළ සේක—එහි අර්‍ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්‍මයන් නිමිත්ත කොට ගෙණ

(චතුස්සත්‍යධර්මයෙහි); තං බො පනිදං දුක්ඛං අරියසච්චං, හේ මේ දුක්ඛාර්යසත්‍ය ය; පරිඤ්ඤාතන්ති, පිරිසිඳ දන්නා ලදු සි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥාන වූ චක්ෂුස උපන; ඤාණං උදපාදි, නිර්වාර්ථඥාන වූ ප්‍රඥ ව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථ වූ ප්‍රඥව උපන; විජ්ජා උදපාදි; කෙලශ භෙද කරණ විද්‍ය ව උපන; ආලොකො උදපාදි, ප්‍රඥ නමැති ආලොකය උපනැ සි වදළ සේක—යන අර්ථ සි.

තදනන්තරකොට දුක්ඛ සත්‍යයට හේතු වූ සමුදය සත්‍ය ය පරොපදෙශ රහිතව ම් සමුදය සත්‍ය ය යි කියා දත් පරිදි හඟවන සේක්:—

"ඉදං දුක්ඛසමුදයං අරියසච්ච'න්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛු, උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි." යි යන සමුදය සත්‍ය ඥාන ප්‍රකාශක පාළි ය වදළ සේක—එහි අර්ථ කෙසේ ද යත්?

නික්ඛවෙ, මහණෙනි; මේ, මට; ඉදං දුක්ඛසමුදයං අරිය සච්චන්ති, මේ දුක්ඛසමුදයාර්ය සත්‍ය ය යි කියා; පුබ්බෙ අන නුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙණ (චතුස්සත්‍ය ධර්මයෙහි); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥාන වූ චක්ෂුස උපන; ඤාණං උදපාදි, නිර්වාර්ථඥාන වූ ප්‍රඥ ව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථ වූ ප්‍රඥ ව උපන; විජ්ජා උදපාදි, කෙලශ භෙද කරණ විද්‍ය ව උපන; ආලොකො උදපාදි, ප්‍රඥා නමැති ආලෝක ය උපනැ සි වදළ සේක—යන අර්ථ සි.

තදනන්තර කොට ඒ සමුදයාර්ය සත්‍ය ය ප්‍රහාතව්‍ය ය යි කියා දත් පරිදි හඟවන සේක්—

"තං බො පනිදං දුක්ඛසමුදයං අරියසච්චං: පහාතබ්බ'න්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙ චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උද පාදි."යි යන කෘත්‍යඥාන ප්‍රකාශක පාළි ය වදළ සේක—එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙණ (චතුස්සත්‍ය ධර්මයෙහි); තං බො පනිදං දුක්ඛ සමුදයං අරිය සච්චං, ඒ මේ දුක්ඛ සමුදයාර්ය සත්‍ය ය; පහාතබ්බන්ති, ප්‍රහීණ කටයුතු ය යි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥාන වූ චක්ෂුස

උපන; ඤාණං උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථ වූ ප්‍රඥා ව උපන; විජ්ජා උදපාදි, ක්ලෙශ හෙද කරණ විද්‍යා ව උපන; ආලොකො උදපාදි, ප්‍රඥා නැමති ආලෝක ය උපනැ සි වදළ සේක යන අර්ථ සි.

තදනන්තර කොට ඒ දුක්ඛ සමුදයාර්ය්‍ය සත්‍ය ය ප්‍රහීණ ය සි, කියා පෙර නො අසා ම දත් පරිදි ගහවා වදරණ සේක්:—

"තං ඛො පනිදං දුක්ඛ සමුදයං අරිය සච්චං: පහීණ'න්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි."සි යන සමුදය සත්‍යගත කෘතඥන ප්‍රකාශක පාළි ය වදළ සේක—එහි අර්ථ කෙසේ ද යත් ?

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්මයන් නිමිත්ත කොට ගෙණ (චතුස්සත්‍යය ධර්මයෙහි); තං ඛො පනිදං දුක්ඛ සමුදයං අරිය සච්චං, ඒ මේ දුක්ඛ සමුදයාර්ය්‍ය සත්‍ය ය; පහීණන්ති, ප්‍රහීණ ය සි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥාන වූ චක්ෂුස උපන; ඤාණං උදපාදි, තත්ත්වඥාන වූ ප්‍රඥා ව උපන: පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථ වූ ප්‍රඥාව උපන; විජ්ජා උදපාදි, භෙද කරණ විද්‍යාව උපන; ආලොකො උදපාදි, ප්‍රඥා නැමති ආලෝකය උපනැ සි වදළ සේක—යන අර්ථ සි.

මේසේ සමුදය සත්‍යයෙහි සත්‍යඥන, කෘතඥන, කෘත්‍යඥන, යන ඥනත්‍රය ලත් පරිදි දක්වා වදරා නිරොධ සත්‍යයෙහි නිරොධ ය නම් මේ ය සි කියා පෙර නො අසා ම දත් පරිදි ගහවා වදරණ සේක්:—

"ඉදං දුක්ඛනිරොධං අරියසච්ච'න්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛු උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි"සි. යන නිරොධ සත්‍යගත සත්‍යඥන ප්‍රකාශක පාළි ය වදළ සේක—එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මෙ, මට (නොහොත්) මා විසින්; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්මයන් නිමිත්ත කොටගෙණ (චතුස්සත්‍ය ධර්මයෙහි) ඉදං දුක්ඛ නිරොධං අරිය සච්චන්නි, මේ දුක්ඛනිරොධාර්ය්‍ය සත්‍ය ය සි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥන වූ චක්ෂුස උපන; ඤාණං උදපාදි, තත්ත්වඥන වූ ප්‍රඥ ව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථ වූ ප්‍රඥ ව

උපන; විජ්ජා උදපාදි, ඔලෝභ හෙදකරණ විදූ ව උපන; ආලොකො උදපාදි, ප්‍රඥ නැමති ආලොක ය උපනැ සි වදළ සේක යන අර්ථයි.

නදනපාර කොට ඒ නිරොධ සත්‍ය ය සාක්ෂාත් කටයුතු ය සි කියා ද පෙර නො අසා ම දත් පරිදි දක්වන සේක:—

"තං, ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං: සච්ඡිකාතබ්බන්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි" සි- යන නිරොධ සත්‍යගත ඤාත්‍යඥන ප්‍රකාශක පාළි ය වදළ සේක. එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ, මට; පුබෙබ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙණ (චතුස්සත්‍යධර්ම යෙහි); තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං, ඒ මේ දුක්ඛ නිරොධාර්‍ය්‍ය සත්‍ය ය; සච්ඡිකාතබ්බන්ති, සාක්ෂාත් කටයුතු ය සි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥන වූ චක්ෂුස උපන; ඤාණං උදපාදි, තත්වාවබෝධඥන වූ ප්‍රඥ ව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාර යෙන් ජානනාර්ථ වූ ප්‍රඥ ව උපන; විජ්ජා උදපාදි, ඔලෝභ හෙද කරණ විදූ ව උපන; ආලොකො උදපාදි, ප්‍රඥ නැමති ආලොක ය උපනැ සි වදළ සේක යන අර්ථයි.

ඊට ඉක්බිති ව එ ම නිරොධසත්‍ය ය සාක්ෂාත් කෘත ය සි කියා ත් පෙර නො අසා ම දත් පරිදි ගහවා වදරණ සේක්:—

"තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං: සච්ඡිකතන්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි" සි යන නිරොධ සත්‍යගත කෘතඥන ප්‍රකාශක පාළි ය වදළ සේක- එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ, මට; පුබෙබ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නො ඇසූ විරූ ධර්මයන් නිමිත්තකොට ගෙණ (චතුස්සත්‍ය ධර්මයෙහි); තං ඛො පනිදං දුක්ඛනිරොධං අරියසච්චං, ඒ මේ දුක්ඛනිරොධාර්‍ය්‍ය සත්‍ය ය; සච්ඡිකතන්ති, සාක්ෂාත්කෘත ය සි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥන වූ චක්ෂුස උපන; ඤාණං උදපාදි, තත්වාවබෝධඥන වූ ප්‍රඥ ව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථ වූ ප්‍රඥ ව උපන; විජ්ජා උදපාදි, ඔලෝභ හෙද කරණ විදූ ව උපන; ආලොකො උදපාදි, ප්‍රඥ නැමති ආලොක ය උපනැ සි වදළ සේක යන අර්ථයි.

මෙසේ නිරෝධ සත්‍යගත ඤාණ, කෘත්‍යඥාන, කෘතඥාන, සංඛ්‍යාත ඥානත්‍ර ය වදාරා තදුත්තරයෙහි නිරෝධ ය සි කියන ලද ඒ නිර්වාණයට පැමිණෙන ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග ය පෙර නොඅසා ම නිවණට පැමිණෙන්නේ මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙනැ සි කියා දන් පරිදි හඟවා වදාරණ සේක්:—

"ඉදං දුක්ඛනිරොධගාමිණී පටිපදා අරියසච්චන්ති මේ නිකඛවෙ පුබෙබ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි" සි. යන දුක්ඛ නිරොධ ගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍යගත ඤාණ ප්‍රකාශක පාළි ය වදාළ සේක - එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ, මට; පුබෙබ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නොඇසූවිරූ ධර්මයන් නිමිත්තකොට ගෙණ (චතුස්සත්‍ය ධර්මයෙහි): ඉදං දුක්ඛනිරොධගාමිණී පටිපදා අරියසච්චන්ති, මේ දුක්ඛනිරොධගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍ය ය සි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍යඥාන චක්ෂුස උපන; ඤාණං උදපාදි, තත්ත්වාර්‍ථ ඥාන වූ ප්‍රඥ ව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්‍ථ වූ ප්‍රඥ ව උපන; විජ්ජා උදපාදි, ක්ලෙශ භෙදකරණ විද්‍යා ව උපන; ආලොකො උදපාදි, ප්‍රඥ නැමැති ආලෝක ය උපනැ සි වදාළ සේක - යන අර්ථ සි.

තදනන්තරයෙන් ඒ මාර්ගසත්‍ය ය භාවනා කටයුතු ය සි කියා ත් පෙර නොඅසා ම දත් පරිදි හඟවා වදාරණ සේක්:—

"තං ඛො පනිදං දුක්ඛනිරොධ ගාමිණී පටිපදා අරියසච්චං: භාවෙතබබන්ති මේ භික්ඛවෙ පුබෙබ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි" සි යන මාර්ගසත්‍ය ගත ඤාතඥාන ප්‍රකාශක පාළි ය වදාළ සේක- එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ, මට; පුබෙබ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නොඇසූ විරූ ධර්මයන් නිමිත්ත කොට ගෙණ (චතුස්සත්‍ය ධර්මයෙහි); තං ඛො පනිදං දුක්ඛනිරොධගාමිණී පටිපදා අරියසච්චං, ඒ මේ දුක්ඛනිරොධගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍ය ය; භාවෙතබබන්ති, භාවිතා කටයුතු ය සි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥාන වූ චක්ෂුස උපන; ඤාණං උදපාදි, තත්ත්වාර්‍ථඥාන වූ ප්‍රඥ ව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්‍ථ වූ ප්‍රඥ ව උපන; විජ්ජා උදපාදි, ක්ලෙශ භෙදකරණ විද්‍යා ව උපන; ආලොකො උදපාදි, ප්‍රඥ නමැති ආලෝක ය උපනැ සි වදාළ සේක යන අර්ථ සි.

තදනන්තර කොට ඒ මානුසත්‍ය ය භාවිතා කරණ ලදැයි යන ඤාණය පෙර නොඅසා ම දත් පරිදි ගඟවා වදාරණ සේක්:—

"තං බො පනිදං දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා අරියසච්චං: භාවිත'න්ති මේ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි ඤාණං උදපාදි පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි ආලොකො උදපාදි"යි යන මානුසත්‍ය ගත ඤාතඥාන ප්‍රකාශක පාළිය වදාළ සේක- එහි දැ අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; මේ, මට; පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු, පෙර නොඇසූ විරූ ධර්මයන් නිමිත්තකොට ගෙණ (චතුස්සත්‍ය ධර්මයෙහි); තං බො පනිදං දුක්ඛ නිරොධ ගාමිණී පටිපදා අරියසච්චං, ඒ මේ දුක්ඛ නිරොධගාමිණී ප්‍රතිපදාර්‍ය්‍ය සත්‍ය ය; භාවිතන්ති, භාවිතා කරණ ලදැයි (යන); චක්ඛුං උදපාදි, චතුස්සත්‍ය ඥාන වූ චක්ෂුස උපන; ඤාණං උදපාදි, තත්ත්වාර්ථඥාන වූ ප්‍රඥාව උපන; පඤ්ඤා උදපාදි, ප්‍රකාරයෙන් ජානනාර්ථ වූ ප්‍රඥාව උපන; විජ්ජා උදපාදි, ඥෙලඝ භෙදකරණ විද්‍යාව උපන· ආලොකො උදපාදි, ප්‍රඥා නමැති ආලෝක ය උපනැ යි වදාළ සේක- යන අර්ථ යි.

තදනන්තරයෙහි-"යාව කීවඤ්ච මේ භික්ඛවෙ ඉමෙසු චතූසු අරිය සච්චෙසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථාභූතං ඤාණදස්සනං න සුවිසුද්ධං අහොසි. නෙව තාවාහං භික්ඛවෙ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙව මනුස්සාය අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුද්ධො පච්චඤ්ඤාසිං" යන පාළිය වදාළ සේක- එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; යාව කීවඤ්ච, යම්තාක් කල්; එවං තිපරිවට්ටං, මෙසේ සත්‍යඥාන, කෘත්‍යඥාන, කෘතඥාන සඞ්ඛ්‍යාත වූ ත්‍රිපරිවෘත්තයක් ඇති; දවාදසාකාරං, එකි එකි සත්‍ය ය තුන්තුන් ආකාරයන්ගේ වශයෙන් දෙළොස් ආකාරයක් ඇති; ඉමෙසු චතූසු අරියසච්චෙසු, මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන් කෙරෙහි; යථාභූතං ඤාණදස්සනං, යථාභූත ඥානදර්ශන ය (යන) අර්ත්ථඵල වූ පරිදි ද; මේ, මට; න සුවිසුද්ධං අහොසි, අත්පරිශුද්ධ නොවී ද; භික්ඛවෙ, මහණෙනි; තාව, ඒ තාක් කල්; සදෙවකෙ, දෙවියන් සහිත වූ; සමාරකෙ, මරුන් සහිත වූ; සබ්‍රහ්මකෙ, බඹුන් සහිත වූ; ලොකෙ, සත්ව ලෝක යෙහි ද; සස්සමණබ්‍රාහ්මණියා, මහණ බමුණන් සහිත වූ; සදෙව මනුස්සාය, දෙව් මිනිසුන් සහිත වූ; පජාය, ප්‍රජාවෙහි ද; අහං, මම; අනුත්තරං සම්මා සම්බොධිං, අනුත්තර වූ සම්‍යක් සම්බෝධි ය; අභිසම්බුද්ධො, ප්‍රත්‍යක්ෂ කෙළෙමි හෙවත් පසක් කෙළෙමි. නෙව පච්චඤ්ඤාසිං, නොම දනිමි; නොම ප්‍රතිඥ කෙළෙමි යි වදාළ සේක යන අර්ථ යි.

තදනන්තරයෙහි- "යථෝ ච ඛෝ මේ භික්ඛවේ ඉමේසු චතූසු අරියසච්චේසු එවං තිපරිවට්ටං ද්වාදසාකාරං යථා භූතං ඤාණදස්සනං සුවිසුද්ධං අහොසි. අථාහං භික්ඛවේ සදේවකෙ ලෝකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදේවමනුස්සාය අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධෝ පච්චඤ්ඤාසිං. ඤාණඤ්ච පන මේ දස්සනං උදපාදි. අකුපපා මේ වේතෝ විමුත්ති. අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ" යි. යන පාළි ය වදාළ සේක - එහි අර්ථ කෙසේ ද යත්?

භික්ඛවෙ, මහණෙනි; යතෝ ච ඛෝ, යම් තැනක පටන් ද; එවං තිපරිවට්ටං, මෙසේ ත්‍රිපරිවෘත්තයක් ඇති; ද්වාදසාකාරං, ද්වාදසාකාරයක් ඇති; ඉමේසු චතූසු අරියසච්චේසු, මේ චතුරාර්ය සත්‍යයන් කෙරෙහි; යථාභූතං ඤාණ දස්සනං, යථාභූත ඥාන දර්ශන ය (යන අර්හත්ඵල වූ පරිදි ද); මෙ, මට; සුවිසුද්ධං අහොසි, අති පරිසුද්ධ වී ද; භික්ඛවෙ, මහණෙනි; අථ, එකල්හි; සදේවකෙ, දෙවියන් සහිත වූ; සමාරකෙ, මරුන් සහිත වූ; සබ්‍රහ්මකෙ, බඹුන් සහිත වූ; ලොකෙ, ලොකයෙහි ද; සස්සමණ බ්‍රාහ්මණියා, මහණ බමුණන් සහිත වූ; සදෙව මනුස්සාය, දෙව් මිනිසුන් සහිත වූ; පජාය, ප්‍රජාවෙහි ද; අහං, මම; අනුත්තරං සම්මාසම්බොධිං, නිරුත්තර වූ සම්‍යක් සම්බෝධි ය; අභිසම්බුද්ධෝ, පසක් කෙළෙමි; පච්චඤ්ඤාසිං, දනිමි (ප්‍රතිඥා කෙළෙමි); මෙ, මට; දස්සනං ච ඤාණං පන, ප්‍රත්‍යවේක්ෂා ඥාන ය ද වනාහි; උදපාදි, උපන; මෙ, මාගේ; වේතෝ විමුත්ති, අර්හත් ඵල ය; අකුපපා, අකෝප්‍ය ය; අයමන්තිමා ජාති, මේ තොම පශ්චිම ජාති ය වන්නීය; ඉදානි, දැන්; පුනබ්භවෝ; පුනර්භවයක්; හෙවත් නැවත භවොත්පත්තියක්; නත්ථි, නැත්තේ ය යි වදාළ සේක යන අර්ථ යි.

"දෙවමේ භික්ඛවෙ" යන පාඨයෙහි පටන් දම්සක් පැවතුම් සූත්‍රයෙහි "නත්ථිදානි පුනබ්භවෝ" යන තැන් දක්වා මේ සියල්ල බුද්ධභාෂිත මය යි දතයුතු යි. මෙසේ යථොක්ත ප්‍රකාරයෙන් භාග්‍යවත්බවාදි ගුණ යෝගයෙන් යුක්ත වූ සම්බුදුරජාණන් වහන්සේ චතුස්සත්‍ය ය දෙශනා කොට වදාළ සේක. ඒ අසා සන්තොෂ භාවයට පැමිණියා වූ පස්වග මහනුන් වහන්සේ ලා භාග්‍යවතුන් වහන්සේගේ ධර්මදෙශනාවට විශෙශයෙන් සන්තොෂ වූවාහු යි. මෙතැන්හි වනාහි, ගාථා රහිත හෙයින් වෙය්‍යාකරණ ය යි කියන ලද නිගාථක වූ දම්සක් පැවතුම් සූත්‍ර ධර්මදෙශනා ව කරණු ලබන කල්හි ආයුසම්පන්න වූ කොණ්ඩඤ්ඤ ස්ථවිරයන් වහන්සේට පහ වූ රාගාදී රජස් ඇති දෘෂ්ටි විවිකිච්ඡා මලාපගමයෙන් නිර්මල වූ

ශ්‍රෝතාපත්ති මාර්ග ය පහළ වූයේ ය. කෙසේ ද? යම් කිසි උත්පාද සභාව ධර්ම කෙණෙක් ඇද්ද, ඒ සියල්ල නිරෝධ සභාව ය (නස්න සභාව ය) ඇත්තේ ය යි කියා යි.

එසින් කිහ.

"ඉදමවොච භගවා. අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති. ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ ආයස්මතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්ම චක්ඛුං උදපාදි යං කිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මන්ති"යි.

මෙසේ භාග්‍යවත් වූ සම්බුදුරජාණන් වහන්සේ විසින් ධර්මචක්‍ර ය පවත්වන ලද කල්හි, භාග්‍යවත් හු විසින් බරණැස් නුවර ඉසිපතන නම් වූ මිගදායෙහි දී ශ්‍රමණයෙකු විසින් හෝ බ්‍රාහ්මණයෙකු විසින් හෝ දෙවියෙකු විසින් හෝ මාරයෙකු විසින් හෝ බ්‍රහ්ම යෙකු විසින් හෝ (අන්) කිසිකෙණෙකුන් විසින් හෝ ලෝක යෙහි නො පැවැත්විය හැකි වූ නොහොත් නො නැවැත්විය හැකි වූ මේ ධර්මචක්‍ර ය පවත්වන ලදැ යි කියා, භූම්‍යෂ්ඨ දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූහ.

එසින් කිහ.

"පවත්තිතෙ ච පන භගවතා ධම්මචක්කෙ භූම්මා දෙවා සද්දමනුස්සාවෙසුං. එතම්භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මින්ති"යි.

එසේ ම, භූම්‍යෂ්ඨ දෙවියන්ගේ ශබ්ද ය අසා චාතුර්මහාරාජික දිව්‍යලෝකයෙහි දෙවියෝ ද ශබ්ද ශ්‍රවණ ය කරවූහ. —**එසින් කිහ:—**

භුම්මානං දෙවානං සද්දං සුත්වා චාතුම්මහාරාජිකා දෙවා සද්දමනුස්සාවෙසුං. එතම්භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං, අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙණ වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මින්ති"යි.

එසේ ම චාතුර් මහාරාජික දිව්‍ය ලෝකයෙහි දෙවියන්ගේ ශබ්ද ය අසා, ත්‍රයත්ත්‍රිංශත් දිව්‍ය ලෝකයෙහි වාසය කරණ දෙවියෝ ශබ්ද ය ඇස්සූ—**එසින් කිහ.**

එසින් කිහ.

"චාතුම්මහාරාජිකානං දෙවානං සද්දං සුත්වා තාවතිංසා දෙවා සද්දමනුස්සා වෙස්සං එතමහගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අපතිවත්තියං සම්ණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙණවි වා ලොකසම්නති"

එසේ ම ත්‍රයත්ත්‍රිංශත් දිව්‍ය ලෝකයෙහි දෙවියන්ගේ ශබ්දය අසා යාම දිව්‍ය ලෝකයෙහි දෙවියෝ ශබ්ද ය ඇස්සු—

එසින් කිහ.

"තාවතිංසානං දෙවානං සද්දං සුත්වා යාමා දෙවා සද්ද මනුස්සාවෙස්සං එතමහගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අපතිවත්තියං සම්ණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනවි වා ලොකසම්'නති."සි.

එසේ ම යාම දිව්‍යලෝක වාසි වූ දෙවියන්ගේ සාධුකාර ශබ්ද ය අසා තුෂිත දිව්‍යලෝකයෙහි දෙවියෝ ශබ්ද ය ඇස්සු—

එසින් කිහ.

"යාමානං දෙවානං සද්දං සුත්වා තුසිතා දෙවා සද්ද මනුස්සා වෙස්සං එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිග දයෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අපතිවත්තියං සම ණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනවි වා ලොකසම්නති"සි.

එසේ ම තුෂිත දිව්‍යලෝකයෙහි දෙවියන්ගේ සාධුකාර ශබ්ද ය අසා නිම්මාණරති දිව්‍යලෝකයෙහි දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කර වූ හ.

එසින් කිහ.

"තුසිතානං දෙවානා සද්දං සුත්වා නිම්මානරති දෙවා සද්ද මනුස්සාවෙස්සං එතමහගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අපතිවත්තියං සම්ණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනෙවි වා ලොකසම්'නති"සි.

එසේ ම නිම්මාණරති දිව්‍යලොකයෙහි දෙවියන්ගේ සාධුකාර ශබ්ද ය අසා පරනිර්මිත වසවර්ති දිව්‍යලෝකයෙහි දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ-එසින් කිහ.

"නිම්මානරතීනං දෙවානං සද්දං සුත්වා පරනිම්මිතවසවත්තී නෝ දෙවා සද්දමනුස්සාවෙසුං, එතමහගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අපපතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසම්'නති"සි.

එසේ ම පරනිර්මිත වසවර්ති දිව්‍යලොකයෙහි දෙවියන්ගේ සාධුකාර ශබ්ද ය අසා බ්‍රහ්මපාරිසද්‍ය නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ-**එසින් කිහ.**

"පරනිම්මිත වසවත්තීනං දෙවානං සද්දං සුත්වා බ්‍රහ්මපාරිසජ්ජා දෙවා සද්ද මනුස්සාවෙසුං. එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අපපතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසම්'නති"සි.

එසේ ම බ්‍රහ්මපාරිසද්‍ය නම් බඹලොව දෙවියන්ගේ සාධුකාර ශබ්ද ය අසා බ්‍රහ්මපුරොහිත නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ-**එසින් කිහ.**

"බ්‍රහ්මපාරිසජ්ජානං දෙවානං සද්දං සුත්වා බ්‍රහ්මපුරොහිතා දෙවා සද්දමනුස්සාවෙසුං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අපපතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසම්'නති"සි.

එසේ ම බ්‍රහ්මපුරොහිත නම් බඹලොව දෙවියන් ගේ සාධුකාර ශබ්ද ය අසා මහාබ්‍රහ්ම නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ-**එසින් කිහ.**

"බ්‍රහ්මපුරොහිතානං දෙවානං සද්දං සුත්වා මහාබ්‍රහ්මා දෙවා සද්ද මනුස්සාවෙසුං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අපපතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසම්'නති"සි.

එසේ ම මහාබ්‍රහ්ම නම් බඹලොව දෙවියන්ගේ සාධුකාර ශබ්ද ය අසා පරිත්තාභ නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණය කරවූ හ. **එසින් කිහ.**

"මහාබ්‍රහ්මානං දෙවානං සද්දං සුත්වා පරිත්තාභා දෙවා සද්ද මනුස්සාවෙසුං, එතමහගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ

අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං නත්ථි''යි.

එසේ ම පරිත්තාභ නම් බඹලොව දෙවියන්ගේ සාධුකාර ශබ්ද ය අසා අප්පමාණාභ නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ.

එසින් කිහ.

''පරිත්තාභානං දෙවානං සද්දං සුත්වා අප්පමාණාභා දෙවා සද්ද මනුස්සාවෙස්සං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං නත්ථි''යි.

එසේ ම අප්පමාණාභ නම් බඹලොව දෙවියන්ගේ ශබ්ද ය අසා ආභස්සර නම් බඹලොව දෙවියෝ ශබ්දශ්‍රවණ ය කරවූ හ.

එසින් කිහ:-

''අප්පමාණාභානං දෙවානං සද්දං සුත්වා ආභස්සරා දෙවා සද්ද මනුස්සාවෙස්සං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං නත්ථි''යි.

එසේ ම ආභස්සර නම් බඹලොව දෙවියන්ගේ ශබ්ද ය අසා පරිත්තසුභ නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ.

එසින් කිහ.

''ආභස්සරානං දෙවානං සද්දං සුත්වා පරිත්තසුභා දෙවා සද්ද මනුස්සාවෙස්සං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං නත්ථි''යි.

එසේ ම පරිත්තසුභ නම් බඹලොව දෙවියන්ගේ ශබ්ද ය අසා අප්‍රමාණසුභ නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ.

එසින් කිහ.

''පරිත්තසුභානං දෙවානං සද්දං සුත්වා අප්පමාණසුභා දෙවා සද්ද මනුස්සාවෙස්සං, එතම්භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මචක්කං පවත්තිතං අප්පටිවත්තියං සමණේන වා බ්‍රාහ්මණේන වා දෙවේන වා මාරේන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මිං නත්ථි''යි.

එසේ ම අප්‍රමාණ සුභ නම් බඹලොව දෙවියන්ගේ ශබ්දය අසා සුභකිර්ණක නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණය කරවූහ.

එයින් කිහ.

"අප්පමාණසුභානං දෙවානං සද්දං සුත්වා සුභකිණ්ණකා දෙවා සද්ද මනුස්සාවෙස්සං, එතමහගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මි'න්ති"යි.

එසේ ම සුභකිර්ණක නම් බඹලොව දෙවියන්ගේ ශබ්දය අසා වෙහප්ඵල නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණය කරවූහ.

එයින් කිහ.

"සුභකිණ්ණකානං දෙවානං සද්දං සුත්වා වෙහප්ඵලා දෙවා සද්දමනුස්සාවෙස්සං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මි'න්ති"යි.

එසේ ම වෙහප්ඵල නම් බඹලොව දෙවියන්ගේ ශබ්දය අසා අවිහා නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණය කරවූහ.

එයින් කිහ.

"වෙහප්ඵලානං දෙවානං සද්දං සුත්වා අවිහා දෙවා සද්දමනුස්සාවෙස්සං, එතං භගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මි'න්ති"යි.

එසේ ම අවිහ නම් බඹලොව දෙවියන්ගේ ශබ්දය අසා අතප්ප නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණය කරවූහ.

එයින් කිහ.

"අවිහානං දෙවානං සද්දං සුත්වා අතප්පා දෙවා සද්දමනුස්සාවෙස්සං, එතමහගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ අනුත්තර ධම්මවක්කං පවත්තිතං අප්පතිවත්තියං සමණෙන වා බ්‍රාහ්මණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකස්මි'න්ති"යි.

එසේ ම අතප්ප නම් බඹලොව දෙවියන්ගේ ශබ්දය අසා සුදස්ස නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණය කරවූහ.

එසින් කිහ.

"අතපපානං දෙවානං සද්දං සුත්වා සුදසසා දෙවා සද්ද මනුසසා වඤ්ඤං. එතමභගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අපපතිවත්තියං සමණෙන වා බ්‍රාහමණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසමි'නති"සි.

එසේ ම සුදසස නම් බඹලොව දෙවියන්ගේ ශබ්ද ය අසා සුදසසී නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ.

එසින් කිහ.

සුදසසානං දෙවානං සද්දං සුත්වා සුදසසී දෙවා සද්ද මනුසසා වෙසුං. එතමභගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අපපතිවත්තියං, සමණෙන වා බ්‍රාහමණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසමි'නති"සි.

එසේ ම සුදස්සී නම් බඹලොව දෙවියන්ගේ ශබ්ද ය අසා අකණිට්ඨක නම් බඹලොව දෙවියෝ ශබ්ද ශ්‍රවණ ය කරවූ හ.

එසින් කිහ.

"සුදසසීනං දෙවානං සද්දං සුත්වා අකණිට්ඨකා දෙවා සද්ද මනුසසාවෙසුං එතමභගවතා බාරාණසියං ඉසිපතනෙ මිගදයෙ අනුත්තරං ධම්මවක්කං පවත්තිතං අපපතිවත්තියං සමණෙන වා බ්‍රාහමණෙන වා දෙවෙන වා මාරෙන වා බ්‍රහ්මුණා වා කෙනචි වා ලොකසමි'නති"සි.

මෙසේ මේ ප්‍රකාරයෙන් හෙවත්, මේ කාරණයෙන් ඒ ක්ෂණයෙහි, ඒ මුහුතීයෙහි, බ්‍රහ්මලොක ය දක්වා **"චෙතමි භික්ඛවෙ"** යනාදීන් සඳ්ඝයන්වහන්සේ විසින් දෙශනාකර වදළ ශබ්ද ය ඉතා උස්ව පැන නැංගේ ය. මේ දශසහශ්‍රී ලොකධාතු ව උඩඩිව දිශාභාග යට යෙමින් කම්පා වූවා ය. උඩඩිව දිශාභාගයට හා හෙට්ඨිම දිශා භාගය ට යෙමින් විශෙෂයෙන් කම්පා වූවා ය. පූර්‍වාදී සිවු දිශාව ට යෙමින් වාවල වූවා ය. ලොකයෙහි සියලු දෙවියන්ගේ දිව්‍යානුභාවයක් ඇද්ද ඒ සියල්ල ඉක්ම නෙවත් මැඩ ප්‍රමාණ රහිත වූ ආලෝකයක් ප්‍රාදුර්භූත වී නෙවත් හිරු උදයෙහි බබ්බෙන කෘමීන්ගේ ආලෝක සෙසින් සියලු දෙවියන්ගේ ආලෝක ය ආනුභාව ය මැඩ එක සක්වළට හිරුදාස් සඳදාස් නැංගා සේ මහත් ආලොකයෙක් ප්‍රාදුර්භූත වී.

එසින් කිහ

"ඉති හතෙන ඛණෙන තෙන මුහුතෙනන යාව බ්‍රහමලොකා සද්දො අබභුගඤ්ඡි. අයඤ්ච දසසහසසි ලොකධාතු සංකම්පි සම්ප

කරිති සම්පවෙයි. අප්පමාණෝ ච උළාරෝ ඔභාසෝ ලොකෙ පාතුර හොති අතික්කමෙම දෙවානං දෙවානුභාවං''යි.

ඒ එසේ ම ය. යම් කලෙක්හි තථාගතබෝදි කාරණයෙන් යුක්ත වූ සච්ඡයත් වහන්සේ ප්‍රාදුර්භූත වන සේක් ද ඔබගේ ප්‍රාදුර් භූත වීමෙහි ලොකයෙහි ආශ්චර්‍ය්‍ය අද්භූත ධර්මයෝ සතර දෙනෙක් ප්‍රාදුර්භූත වෙත්.

එසින් කිහ.

''තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මා සම්බුද්ධස්ස පාතු භාවා චත්තාරෝ අච්ඡරියා අබ්භුතා ධම්මා පාතුභවන්ති. කතමෙ චත්තාරෝ ? යදා භික්ඛවෙ බොධිසත්තෝ තුසිතා කායා චවිත්වා සතෝ සම්පජානෝ මාතුකුච්ඡිං ඔක්කමති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණෝ උළාරෝ ඔභාසෝ පාතුභවති අතික්කමෙම ව දෙවා නං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධ කාරා අන්ධකාර තිමිසා යත්‍ථපිමෙසං චන්දිමසුරියානං එවමම හිද්ධිකානං එවං මහානුභාවානං ආභා නානුභොන්ති, තත්‍ථපි අප්ප මාණෝ උළාරෝ ඔභාසෝ පාතුභවති අතික්කමෙම ව දෙවානං දෙවානුභාවං. යෙපි තත්‍ථ සත්තා උපපන්නා තෙපි තෙනොභාසෙන අඤ්ඤං මඤ්ඤං සඤ්ජානන්ති. අඤ්ඤෙපි කිර හො සන්ති සත්තා ඉධූපපන්නා'ති. තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං පඨමෝ අච්ඡරියෝ අබ්භුතෝ ධම්මෝ පාතුභවති.

පුන ච පරං භික්ඛවෙ යදා බොධිසත්තෝ සතෝ සම්පජානෝ මාතු කුච්ඡිසමිං නික්ඛමති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අප්පමාණෝ උළාරෝ ඔභාසෝ පාතුභවති අතික්කමෙම ව දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අඝා අසංවුතා අන්ධකාරා අන්ධකාර තිමිසා යත්‍ථපි' මෙසං චන්දිම සුරියානං එවං මිහිද්ධිකානං එවං මහානුභාවානං ආභා නානුභොන්ති. තත්‍ථ පි අප්පමාණෝ උළාරෝ ඔභාසෝ පාතුභවති අතික්කමෙමෙව දෙවානං දෙවානුභාවං. යෙ'පි තත්‍ථ සත්තා උපපන්නා තෙ'පි තෙනෝ'භාසෙන අඤ්ඤං මඤ්ඤං සඤ්ජානන්ති, අඤ්ඤෙපි කිර හො සන්ති සත්තා ඉධූපපන්නා'ති. තථාගතස්ස භික්ඛවෙ අරහතෝ සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං දුතියෝ අච්ඡරියෝ අබ්භුතෝ ධම්මෝ පාතුභවති.

පුන ච පරං භික්ඛවෙ යදා තථාගතෝ අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය. අප්ප

මාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කමෙම ච දෙවානං දෙවානුභාවං. යා'පි තා ලොකන්තරිකා අසා අසංවුතා අන්ධකාරා අන්ධකාර තිමිසා යත්‍රපි'මෙසං වන්දිමසුරියානං එවමමහිද්ධිකානං එවමමහානුභාවානං ආභා නානුභොනති. තත්‍රපි අපමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කමෙම ච දෙවානං දෙවානුභාවං. යෙපි තත්‍ර සත්තා උප්පන්නා තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති අඤ්ඤපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා'ති. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං තතියො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති.

පුන ච පරං භික්ඛවෙ යදා තථාගතො අනුත්තරං ධම්මචක්කං පවත්තෙති, අථ සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අපමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කමෙම ච දෙවානං දෙවානුභාවං. යාපි තා ලොකන්තරිකා අසා අසංවුතා අන්ධකාරා අන්ධකාර තිමිසා යත්‍රපි'මෙසං වන්දිමසුරියානං එවමමහිද්ධිකානං එවමමහානුභාවානං ආභා නානුභොනති. තත්‍රපි අපමාණො උළාරො ඔභාසො පාතුභවති අතික්කමෙම ච දෙවානං දෙවානුභාවං. යෙපි තත්‍ර සත්තා උප්පන්නා තෙපි තෙනොභාසෙන අඤ්ඤමඤ්ඤං සඤ්ජානන්ති අඤ්ඤපි කිර භො සන්ති සත්තා ඉධූපපන්නා'ති. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා අයං චතුත්ථො අච්ඡරියො අබ්භුතො ධම්මො පාතුභවති. තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවා ඉමෙ චත්තාරො අච්ඡරියා අබ්භුතා ධම්මා පාතු භවන්ති''සි.

මේ දම්සක් පැවතුම් සූත්‍රානන දෙශනාවෙහි යම් පෘථිවි කම්පාවක් ඇද්ද ඒ පෘථිවි කම්පාව පෘථිවි කම්පා වීමේ අට්ඨකාරණයන් අතුරෙහි එකෙකැ සි දත යුතු. ඒ අට්ඨකාරණය නම් කවර යත්?

මේ මහා පෘථිවි තොමෝ ජලපොළොව පිට පිහිටියේ ය. ජල පොළව වා පොළවෙහි පිහිටියේ ය. වාත ය ආකාශයෙහි පිහිටියේ ය. යම් කලෙක මහත්කොට වාතයෝ බලවත් ව හමද් ද එ බදු කාලයෙහි හමන්නා වූ වාතයෝ ජල පොළව කම්පාකෙරෙති. ජල ය කම්පිත වූ කල්හි පෘථිවි ය කම්පා වෙයි. මහා පෘථිවිහුගේ කම්පා වීමෙහි මේ කාරණය තෙමේ ප්‍රථම ප්‍රත්‍ය ය, ප්‍රථම කාරණය නම් වන්නේ ය. තව ද, ඉර්ධිමත් වූ වෙතොවශිප්‍රාප්ත වූ ශ්‍රමණයෙක් හෝ වේව සි බ්‍රාහ්මණයෙක් හෝ වේව සි ආනුභාව සම්පන්න දෙවියෙක් වේව සි කැමති වී

නම් මේ මහා පෘථිවි ය කම්පා කරවන්නේ ය. මහා පෘථිවි ය කම්පාවීමෙහි මේ දෙවෙනි කාරණය වන්නේ ය.

තව ද, යම් කලෙක බෝධිසත්ත්වයෝ තුෂිත දිව්‍යලෝකයෙන් චුතව සම්‍යක් සම්ප්‍රජන්‍ය යෙන් යෙදී මාතෘ කුක්ෂියෙහි ප්‍රතිසන්ධිග්‍රහණය කරන්නාහු වේද්ද, එකල්හි මේ මහා පෘථිවි ය කම්පා වන්නේ ය. මහා පෘථිවිහු ගේ කම්පාවෙහි මේ තුන්වෙනි කාරණය වන්නේ ය.

තව ද, යම් කලෙක බෝධිසත්ත්වයෝ සිහි නුවණින් යෙදී මාතෘකුක්ෂියෙන් ප්‍රසූත වේද්ද, එ කල්හි මේ මහා පෘථිවි ය කම්පා වන්නේ ය. මහා පෘථිවියගේ කම්පාවීමෙහි මේ සතරවැනි කාරණය වන්නේ ය.

තව ද, යම් කලෙක තථාගත තෙමේ නිරුත්තර වූ සම්‍යක් සම්බොධියට පැමිණෙන සේක් ද, එ කල්හි මේ මහා පෘථිවි ය කම්පා වන්නේ ය. මහා පෘථිවියගේ කම්පා වීමෙහි මේ පස්වැනි කාරණය වන්නේ ය.

තව ද, යම් කලෙක්හි තථාගත තෙමේ නිරුත්තර වූ ධර්ම චක්‍රය පවත්වා වදාරණ සේක් ද, එ කල්හි මේ මහා පෘථිවි ය කම්පා වන්නේ ය. මහා පෘථිවියගේ කම්පා වීමෙහි මේ සවෙනි කාරණය වන්නේ ය.

තව ද, යම් කලෙක තථාගත තෙමේ සිහිනුවණින් යෙදුන සේක් ආයුසංස්කාරය හැර වදාරණ සේක් ද එ කල්හි මේ මහා පෘථිවිය කම්පා වන්නේ ය. මහා පෘථිවියගේ කම්පා වීමෙහි මේ සත්වෙනි කාරණය වන්නේ ය.

තව ද, යම් කලෙක තථාගත තෙමේ අනුපාදිශෙෂ නිර්වාණ ධාතුවෙන් පරිනිර්වාණය කර වදාරණ සේක් ද එ කල්හි මේ මහා පෘථිවි ය කම්පා වන්නේ ය. මහා පෘථිවියගේ කම්පා වීමෙහි මේ අටවෙනි කාරණය වන්නේ ය. එසින් වදාළ හ—දීඝනිකාය මහා වග්ගයෙහි වූ මහා පරිනිර්වාණ සූත්‍රය තුන්වෙනි බණවරෙහි **ආනන්ද ස්ථවිරයන් වහන්සේ** ට:—

"අට්ඨ ඛෝ ඉමේ ආනන්ද හෙතූ අට්ඨපච්චයා මහතෝ භූම්චාලස්ස පාතුභාවාය. කතමේ අට්ඨ? අයං ආනන්ද මහා පඨවී උදකෙ පතිට්ඨිතා උදකං වාතෙ පතිට්ඨිතං වාතෝ ආකාසට්ඨෝ හොති. යෝ ඛෝ ආනන්ද සමයෝ'යං මහා වාතා වායන්ති. මහා වාතා වායන්තා උදකං කම්පෙන්ති උදකං කම්පිතං පඨවිං

කම්පති. අයං පඨමෝ හෙතු පඨමෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතු භාවාය, පුන ච පරං ආනන්ද සමණෝ වා හෝති බ්‍රාහ්මණෝ වා ඉද්ධිමා චෙතෝ වසිප්පත්තෝ දෙවතා වා මහිද්ධිකා මහානුභාවා යස්ස පරිත්තා පඨවිසඤ්ඤා භාවිතා හෝති අප්පමාණෝ ආපෝ සඤ්ඤා, සෝ ඉමං පඨවිං කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං දුතියෝ හෙතු දුතියෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. පුන ච පරං ආනන්ද යදා බෝධිසත්තෝ තුසිතා කායා චවිත්වා සතෝ සම්පජානෝ මාතු කුච්ඡිං ඔක්කමති. තදා'යං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං තතියෝ හෙතු තතියෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතු භාවාය. පුන ච පරං ආනන්ද යදා බෝධිසත්තෝ සතෝ සම්පජානෝ මාතු කුච්ඡිසමා නික්ඛමති තදා'යං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං චතුත්ථෝ හෙතු චතුත්ථෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය.

පුන ච පරං ආනන්ද යදා තථාගතෝ අනුත්තරං සම්මා සම්බෝධිං අභිසම්බුජ්ඣති තදා'යං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං පඤ්චමෝ හෙතු පඤ්චමෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. පුන ච පරං ආනන්ද යදා තථාගතෝ අනුත්තරං ධම්මචක්කං පවත්තෙති තදා'යං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං ඡට්ඨෝ හෙතු ඡට්ඨෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. පුන ච පරං ආනන්ද යදා තථාගතෝ සතෝ සම්පජානෝ ආයුසඞ්ඛාරං ඔස්සජ්ජති තදා'යං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං සත්තමෝ හෙතු සත්තමෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය. පුන ච පරං ආනන්ද යදා තථාගතෝ අනුපාදිසෙසාය නිබ්බාණ ධාතුයා පරිනිබ්බායති. තදා'යං පඨවි කම්පති සංකම්පති සම්පකම්පති සම්පවෙධති. අයං අට්ඨමෝ හෙතු අට්ඨමෝ පච්චයෝ මහතෝ භූමිචාලස්ස පාතුභාවාය නි. ඉමේ ඛෝ ආනන්ද අට්ඨ හෙතු අට්ඨ පච්චයා මහතෝ භූමිචාලස්ස පාතු භාවාය"සි.

එසින් කිහ—බ්‍රහ්මජාල සූත්‍ර වර්ණනායෙහි:—

"තත්ථ අට්ඨහි කාරණේහි පඨවිකම්පෝ වෙදිතබ්බෝ. ධාතු කොපෙන, ඉද්ධිමතෝ ආනුභාවෙන, බෝධිසත්තස්ස ගබ්භොක්කන්තියා, මාතුකුච්ඡිතෝ නික්ඛමණෙන, සම්බෝධිපත්තියා, ධම්ම චක්කපවත්තනෙන, ආයු සංඛාරොස්සජ්ජනෙන පරිනිබ්බාණෙන"සි.

මේ හැර අන්‍ය වූ අට කාරණයෙක් හි මහිගර්ජනා කෙළේ ය. එනම්:—මහාභිනික්මන් නික්මීමෙහි ය. බෝමැඩට එළඹීමෙහි ය, පාංශුකූල චීවර ය ගැන්මෙහි ය, පාංශුකූල චීවර ධෝවන යෙහි ය, කාලකාරාම සූත්‍ර දේශනාවෙහි ය, ගොතමක සූත්‍ර දෙශනාවෙහි ය, වෙස්සන්තර ජාතකයෙහි ය, බ්‍රහ්මජාල සූත්‍ර දේශනාවෙහි ය, යන මේ අන්‍ය වූ අට කාරණයන්හි ද මහි ගර්ජනා කෙළේ සි.

එහි මහාභිනික්මන් හා බෝමැඩට එළඹීමෙහි වියැති බල යෙන් මහිගර්ජනා වි ය. පාංශුකූල ග්‍රහණයෙහි දෙ දහසක් කොදෙව් පිරිවරකොට ඇති සතර මහා ද්වීපයෙහි චක්‍රවර්ති රාජ්‍ය ශ්‍රී ය හැර පැවිදි ව සුසානයට පැමිණ පාංශුකූල ගන්නා වූ සම්බුදු යන් වහන්සේ විසින් ඉතා දුෂ්කරයෙක් කරණ ලදැ සි ආශ්චර්‍ය්‍ය වේගයෙන් පහරණ ලදු ව මහි ගර්ජනා වි ය. පාංශුකූල ධෝවන යෙහි ත් වෙස්සන්තර ජාතකයෙහි ත් අකාල කම්පනයෙන් කම්පිත වි ය. කාලකාරාම සූත්‍රදේශනාවෙහි ත් ගොතමක සූත්‍රදේශනා වෙහි ත් භාග්‍යවතුන් වහන්ස! මම සාක්ෂියෙමි සි කියා සාක්ෂි භාව ය ප්‍රකාශ කෙරෙමින් කම්පා වි ය. බ්‍රහ්මජාල සූත්‍රයෙහි දෙසැට දෘෂ්ටි ගතින් නිරවුල් කොට කැලැල් නො කොට දෙසන්ට පටන් ගත් කල්හි සාධුකාර දුන වශයෙන් දසසහස්‍රී ලොකධාතු වෙහි දිය පොළව අවසන් කොට ශත රාව සහස්‍ර රාවයෙන් එක නින් නාද කෙරෙමින් මහි ගර්ජනා වූ යේ සි.

එසින් කිහ—එ ම බ්‍රහ්මජාල වණ්ණනාවෙහි:—

"අයං පන මහාපඨවි අපරෙසු අට්ඨසු ඨානෙසු අකම්පිත්ථ. මහාභිනික්ඛමණෙ, බොධි මණ්ඩල උපසංකමනෙ, පංශුකූල ගහනෙ, පංශුකූල ධොවනෙ, කාලකාරාම සුත්තෙ, ගොතමක සුත්තෙ, වෙස්සන්තර ජාතකෙ, ඉමස්මිං බ්‍රහ්මජාලෙති. තත්‍ථ මහාභි නික්ඛමණ බොධිමණ්ඩල උප සංකමනෙසු විරිය බලෙන අකම්පිත්ථ. පංශුකූල ගහණෙ දවිසහස්‍ස දීප පරිවාරෙ නාම චත්තාරො මහා දීපෙ පහාය පබ්බජිත්වා සුසානං ගන්ත්වා පංශු කූලං ගණ්හනෙනත්‍ත දුක්කරං භගවතා කතන්ති අච්ඡරිය වෙගා'භිහතා අකම්පිත්ථ. පංශුකූල ධොවන වෙස්සන්තර ජාත කෙසු අකාල කම්පණෙන අකම්පිත්ථ. කාලකාරාම—ගොතමක සුත්තෙසු "අහං සක්‍ඛි භන්තෙ"ති සක්‍ඛි භාවෙන අකම්පිත්ථ ඉමස්මිං පන බ්‍රහ්මජාලෙ ඛාසඨීයා දිට්ඨි ගතෙසු විජටෙත්වා නිග්ගුම්බං කත්වා දෙසිය මානෙසු සාධුකාර දුනවසෙන අකම්පිත්ථ"සි

හුදෙක් යටකී සථානවල්හි මතු නොවෙ සි, වැලි කොතැන් හි දී පාපිවි කමපා විද යන්? ධම් සංගායනා කරණ තන්හි ද මිහිදු මහ තෙරුන් වහන්සේ මේ ලඞකාදවිපයට අවුත් චේත වනයේ වැඩහිඳ ධම් දෙසනා කළ දවස් ද මෙහිගර්ජනා වි ය. කැලණි විහාරයේ පිණඩපානිය මහ තෙරුන් වහන්සේ චෛත්‍ය ඛනය හැමද එහි ම වැඩහිඳ බුදුරැලඹන ප්‍රිති ය උපදවා බ්‍රහම ජාල සූත්‍ර දේසනා ව පටන්ගෙණ දේසනාව සමාප්ත කළ කල්හි ද දිය පොළව අවසන් කොට මෙහි ගර්ජනාව කෙළේ ය. ලෝවා මහා ප්‍රාසාදයට නැගෙණහිර දිග්භාගයෙහි අම්බලටඨික නම් වූ සථානයෙක් ඇත. එහි වැඩහිඳ දීඝභාණක සථවිරයන් වහන් සේ බ්‍රහමජාල සූත්‍ර ය පිරුවන්ට පටන්ගත් සේක. ඒ සථවිරයන් වහන්සේගේ ගණ සජ්ඣායනාවසානයෙහි දිය පොළව අවසන් කොට යදන්ඩෙන් ගසා පූ ලෝ තලියක් මෙන් ශත රාව සහස්‍ර රාවයෙන් එකනින් නාද කෙරෙමින් මහි ගර්ජනා ව කෙළේ ය.

හෙ ද දන්වන ලද මැ සි—බ්‍රහමජාල වණ්ණනාවෙහි.

"න කෙවලඤ්ච එතෙසු එව ඨානෙසු පඨවි අකම්පිත්ථ. අථ ඛො තීසු සංගායනාසු පි මිහාමහින්දතෙරස්ස ඉමං දීපං ආගනත්වා ජෙතවනෙ නිසීදිත්වා ධම්මං දෙසිත දිවසෙ පි අකම්පිත්ථ. කල්‍යාණිය විහාරෙ ව පිණඩපානියතෙරස්ස චෙතියඛගණං සම්මජ්ජිත්වා තත්ථෙ ව නිසීදිත්වා බුද්ධාරම්මණං පිතිං ගහෙත්වා ඉමං සුත්තන්තං ආරද්ධස්ස සුත්ත පරියොසානෙ උදක පරියන්තං කත්වා අකම්පිත්ථ. ලොහ පාසාදස්ස පාචීන දිසාභාගෙ අම්බලටඨිකථානං නාම අහොසි. තත්ථ නිසීදිත්වා දීඝ භාණතෙරා බ්‍රහම ජාල සුත්තන්තං ආරභිංසු. තෙසං සජ්ඣාය පරියොසානෙ පි උදක පරියන්ත මෙව කත්වා පඨවි අකම්පිත්ථ'සි.

මෙසේ මහා පෘථිවි කම්පා වීම ආදී වූ ආශ්චය්‍ය අද්භූත යන් ප්‍රාදුර්භූත වූ කල්හි භාග්‍යවත් වූ සම්බුදු රාජොත්තමයාණන් වහන් සේ "අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤ, අඤ්ඤාසි වත භො කොණ්ඩඤ්ඤ"සි යනුවෙන් භවත්නි! කොණ්ඩඤ්ඤ සථවිර තෙම ඒකාන්තයෙන් චතුස්සත්‍ය ය දන්නේ ය. භවත්නි! කොණ්ඩඤ්ඤ සථවිර තෙම ඒකාන්තයෙන් චතුස්සත්‍ය ය දන්නේ ය යි කියා ප්‍රීතිවේගයෙන් උදන් අනා වදාළ සේක. මෙහි "අ" පූර්ව වූ "ඤ, අවබොධනෙ" යන ධාතු ය. එසේ හෙයින් පූර්වයෙහි කොණ්ඩඤ්ඤ නම් වූ ඒ සථවිරයන් වහන්සේ ට "අඤ්ඤාසි"සි කියා බුදුන් විසින් වදාළ උදාන වාක්‍ය ය එක් ව "අඤ්ඤා කොණ්ඩඤ්ඤ" සථවිරයන් වහන්සේ ය යන නමින් ම ප්‍රසිද්ධ වූ සේක. එම සූත්‍ර අවසානයෙහි "ඉතිහිදං ආයසමතො කොණ්ඩ ඤ්ඤස්ස අඤ්ඤාකොණ්ඩඤ්ඤෙත්වෙව නාමං අහොසි"සි මෙම කථා කි හ.

මේ දම්සක් පැවතුම් සූත්‍රයෙහි "එවං මේ සුතං" යන පද ය ආදිකොට "නිස්සු ආමෙහොසි" යන තැන් දක්වා ශ්‍රාවක භාෂිත ය වන්නේ ය. "දෙව මේ භිනඛවෙ" යන තැන් පටන් "නත්ථිදානි පුනබ්භවොති" යන තැන් දක්වා ශ්‍රී මුඛ පාළිය වූ බුද්ධ භාෂිත ය වන්නේ ය "ඉදමවොච" යන තැන් පටන් "අඤ්ඤාසි වත හො කොණ්ඩඤ්ඤො අඤ්ඤාසි වත හො කොණ්ඩඤ්ඤොති" යනුවෙන් වදාළ උදාන වචන ය හැර සෙසු සියල්ල ත් ශ්‍රාවක භාෂිත ය යි දත යුතු. මෙසේ දේශනා කර වදාළා වූ දම්සක් පැවතුම් සූත්‍ර දෙශනාව ඉතා ආශ්චර්‍ය්‍ය වශයෙන් දේශනා කර වදාරා බොහෝ ප්‍රාණීන්ට සඟී මොක්ෂ සම්පත් දෙවා වදාළ.සේක. කෙසේ ද යත්?

සත්ත්වලොක කල්පදාරම් වූ ඒ සම්බුදුරජාණන් වහන්සේ අනන්‍ය පරියන්ත වූ බුදුන් පළමුවන දම්සක් දේශනාවට වැඩ හිඳිනා වූ සද්ධම් භූමියෙහි පැණ නැඟි බුද්ධාසනයෙක් වි ය. මහ මුහුදු රළ පෙළ මැඩ අදුරු විහිදු උදය පර්වතයට පැන නැංගා වූ සම පණස් යොදුන් ලක්ෂ්‍ය රැස්මඬල සේ, ඒ බුද්ධාසනයට පැන නැඟී සිය ලඟින් බුදු රැස් කද හරින්ට පටන් ගත් සේක. දිවූ දිවූ ඒ බුදු රැස් බඹ ලොව ගැසී සක්වළින් සක්වළ පැන දිවගන්නට පටන් ගත. එ කෙණෙහි නිශා නමැති කාන්තාව තරු පෙළ නමැති ගෙල මුතුදම් පැලඳ නිල් වලා නමැති කෙස් වැටි තනා දික් නමැති හස්තයෙන් සඳ රැස් නමැති දිවි සළු වීදු හැඳ බඹ ලෝ නමැති මිණි ඔටුනු දරා තුන් ලෝ නමැති ඇඟ සොලවා කෞමුදී නමැති ඇස දල්වා භෘඞ්ග නාද නමැති ගායනා පතුරුවා මාගේ සවාමි දරුවන් ගේ පළමු වත මහුල් බණ පූජාවට මෙසේ ලීලෝ පේන ව සැරසී සිට ගත. එ කෙණෙහි ඇට ම අලඞ්කාර වූ රුවන් හෝඩුදෙකක් නිබුවා සේ සම පණස් යොදුන් හිරු මඬල පෙම්වම වක්‍රවාට කණිය සදහා සිට ගත. පුළු වක්‍රවාට කණින් පැන නැඟී එතුන් පණස් යොදුන් සඳ මඬල ප්‍රභා විහිදුවමින් සිට ගත.

එ කෙණෙහි මාගේ සවාමි දරුවන්ගේ ධර්මදෙශනා කාලය ද සම්ප්‍රාප්ත වි ය. මේර ගල තටා පැන නැඟි සත්කුල පව්වෝ බුදුන් දිසාවට වැඳුන් ගත් හ. සක්වළ ගල සක් වලල්ලක් සේ බිඳී ගිය. මහ මුහුදු සැදලූ බෙරක් සේ රළ සංහිඳී පස් පියුමෙන් සැදී ගිය. මහ පොළොව සෙලවී පැන නැඟ. මේ ආදී වූ දෙනිස් මහා පුළු නිමිත්ත පූජාවෝ ද ඒ මහුල් බණට පහළ වූහ. එ කෙණෙහි දස දහසක් සක්වළ දිව්‍ය බ්‍රහ්මයෝ අපගේ සවාමියා දහම් අමා වතුරෙහි අප හැම ගලා සංසාර දුක් නමැති මහ ගිනි නිවා සි. ඔහුගේ දහම් අමා රස බොන්නට යම්හ සි කියා දස දහසක් සක්වළ අසුරයන් වත්, ශක්‍රපුර ය සේ හලලා

දසදහසක් සක්වළ දිවූ ය. නාගයෝ කඩුපුල් මල් මිටි ගෙණ දිවූ ය. ගරුඩයෝ මහ පියුම් තුඩින් කඩා ගෙණ දිවූ ය. ගඬිලියෝ තූයිල් නාද ගෙණ දිවූ ය අසුරයෝ පළොල් මල් ගෙණ දිවූ ය. දෙව්යෝ පරසතු ආදී වූ නන් දිව මල් ගෙණ දිවූ ය. බ්‍රහ්මයෝ සේසත් ගෙණ දිවූ ය. දස දහසක් සක්වළ මුළුල්ලෙහි සඳ හිරු දෙව්යෝ දිවූ ය.

පළමු ව දිවූ පිරිස ගව්වක් සා තැන් සැට සැත්තෑ දෙන බැගින් සිටිය හ දෙවනු ව දෙව්යෝ එන් එන් අල්ලක් සා තැන අසූ අනූ බැගින් සිටියාහ. තුන්වැනි ව දෙව්යෝ එ ත් එ ත් අඟලක් සා තැන සියක් බැගින් සිටියා හ. සතර වැනි ව දෙව්යෝ එ ත් එ ත් ඉදිකටු මුලක් සා තැන දහසක් බැගින් සිටි ස හ. පස් වැනි ව දෙව්යෝ එ ත් එ ත් ඉදිකටු අගක් සා තැන දසදහසක් බැගින් සිටියා හ. ස වැනි ව දෙව්යෝ එ ත් එ ත් එ ම සා තැන සුවහස් බැගින් සිටියා හ. මේසේ දසදහසක් සක්වළ මුළුල්ලෙහි සැට දහසක් කාමාවචර දිව්‍යලෝක වල දෙවියන් තම තමන් දෙව් ලොව සිස් කොට ගහණ ව අවුත් හිවි ගැවසී සිටගත් වේලෙහි තව ද දසදහසක් සක්වළ අරුනළ අසංඥ තලයන් හැර එක් ලක්ෂ පණස් දහස් රූපාවචර බ්‍රහ්මලෝක වල එක බ්‍රහ්මයෙකුත් නො රඳ, දෙළොස් යොදුන් උස ඇති ඒ සා බ්‍රහ්ම සේනාව තුන් ගව් සා සේසත් ගෙණ අවුත් සිටගත් හ.

යාලක් පමණ ධාන්‍යයන් එක ලාස්සෙක නො ගන්නා සේ මේ සා සක්වළ ගැබ සතර රියන් ගබඩා සුහක් සේ අවකාශ මදි වී ය. එ කල දෙව්යෝ සත්වැනි ව බ්‍රහ්ම සේනා ව දැක තව ද සියුම් වෙස් මවාගෙණ නෙළුම් අඟක් සා තැන සැට සැත්තෑ අසූ අනූ බැගින් සිටගත්තා හ. මෙසේ සිටි දිව්‍ය බ්‍රහ්ම සේනා ව සක්වළ ගල පරියන්ත ව අඝණීටා බඹ ලොව දක්වා නලෙක පුරා පූ රන් සුණු සමූහයක් සේ අවකාශ නැති ව ම සිටගත් හ. බඹ ලොව සිට වට පැලක් සා ගලක් හෙළාපු කල සාරම්ස් දෙ පෝය කින් අවුත් පොළොවට පැමිණෙ සි. මෙසේ දුර වූ අවකාශය මාගේ බුදුන්ගේ පළමු වන මහුල් බණෙහි පිරිස් ගහණයෙන් මෙසේ අස්ලෝමක් සා තැනු ත් අවකාශයක් නැති ව සිටගත්තා වූ බණ පිරිස ය. තව ද බුදුන් වැඩහුන් බුද්ධාසනයෙහි පටන් බ්‍රහ්මා ණ්ඩය දක්වා බුදුන් සිරසින් පැන නැගි බුදුරැස් කඳට ම අවකාශ වී ය. විමණෙක්ක වේව යි දෙවි බඹ කෙණෙක් වේව යි එ බුදුරැස් කදෙහි නො ගැවෙන්නක් හු නැත. ඉක්බිත්තෙන් මාගේ සවාමි දරුවන් සිරසට පිදූ සඳ මඬුළු සේ දස දහසක් මහා බ්‍රහ්මයෝ දස දහසක් සේසත් මතු මතුයෙහි තබා සිටගත් හ. දසදහසක් ශක්‍රයෝ

බුදුන්ගේ යස රැස් ඵරා බොන්නවුන් සේ දසදහසක් ජය සක් තුඩ තබා ගෙණ එකවිට පිඹින්ට පටන්ගත් හ. දසදහසක් සුයම් දෙවියෝ ද දසදහසක් චාමර සලති. දසදහසක් සන්තුසිත දෙවියෝ දසදහසක් මිණි තල් වැට සලති. සෙසු දෙවියෝ රන් තොරණ, රුවන් තොරණ, මිණි තොරණ, රන් ඇඟෑ, මිණි ඇඟෑ, රන් පියුම්, රිදී පියුම්, රුවන් පියුම්, රන් මල්, රිදී මල්, රුවන් මල්, රන් කරඬු, රුවන් කරඬු, රන් සුණු, රිදී සුණු, රුවන් සුණු, මුතු සුණු, රන් දම්, රිදී දම්, රුවන් දම්, මුතු දම්, ආදී පූජා භාණ්ඩ ගෙණ සිට පූජා කරන්ට පටන් ගත් හ. එ කල දෙවියන්ගේ පූජා කෝලාහලයෙන් බ්‍රහ්මාණ්ඩ ය දක්වා ගැවසීගත් මුහුදු ගිගුමක් සේ එකතින් නාද වී ය. දෙවියන්ගේ අරගල සංසිඳුවා ලන්ට සමර්ථ අනික් කිසි සත්ව කෙණෙක් නැත් ම ය. බුදුන් විදා සිටි දසදහසක් ශක්‍රයෝ ඒ තෙත් කළ මහා ධූර සෙයින් දසදහසක් ශක්‍රයෝ දකුණු සක් පිඹ පිටවතුරාවා ගෙණ විසි දහසක් අත් උඩ ඔසවා එකවිට අත්පොලසන් දී ඕ! හෝ! බණ පිරිස් සාහිත්‍ය ව සි කියා තුන් ලෝ වෙවුල් වා බැණ නැංහා හ. එ වේලෙහි ශක්‍ර භෝගාව අසා තුන් ලෝ පුරා සිටි දෙව් බඹ පිරිස් රැළ නැති මුහුදක් සේ නිශ්ශබ්ද වූ හ. එ කෙණෙහි දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ඝනකඩ බොල් මහ පොළොව සාධුකාර දින. මාගේ සවාමි දරුවෝ ඒ මහි නාද ය හා සමග තමන් වහන්සේගේ පාරමිතා නමැති දියෙන් පිරුණා වූ බුද්ධ ඥාන නමැති සූයෂ්‍ කාන්තියෙන් ප්‍රබෝධ වූ සුරකුත වූ ජීවිතා ධාතු නමැති කෙමි ඇති, දෘතධාතු නමැති කෙසරු ඇති, සුරකුත වූ ඔජස ධාතු නමැති පත්‍ර ඇති, සද්ධර්ම නමැති මධු බිඳු ඇති, ශ්‍රීමත් වූ මුඛ පද්මි ය විවෘත කොට බැණ නැති බසින් දිව සුවඳ ගඳින් සියලු බණ පිරිස සුවඳ පිඹක් සේ කරවමින්:—

"නෙව මේ භික්ඛවෙ අන්තා පබ්බජිතෙන න සෙවිතබ්බා. යො චායං කාමේසු කාමසුඛල්ලිකානුයොගො හීනො ගම්මො පොථුජ්ජනිකො අනරියා අනත්ථසංහිතො, යොවායං අත්තකිලමථානුයොගො දුක්ඛො අනරියා අනත්ථසංහිතො, එතෙ තෙ භික්ඛවෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣිමා පටිපදා තථාගතෙන අභිසම්බුද්ධා. චක්ඛු කරණී ඤාණ කරණී උපසමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති" යනාදීන් දම්සක් පැවතුම් සූත්‍ර දේශනා ව පටන්ගත් සේක.

එ කල පූර්ව චක්‍රවාටයෙහි සිටි දෙවියෝ බුදුහු අප මුහුණ බලා ම හිඳ බණ දෙසති සි සිතති. දක්ෂිණ චක්‍රවාටයෙහි සිටි දෙවියෝ බුදුහු දකුණු දිග බලාම වැඩහුන් සේකැයි සිතති. පශ්චිම චක්‍රවාටයෙහි

සිටි දෙවියෝ බුදුහු පශ්චිම දිග් බලා ම වැඩහුන් සේකැ යි සිතති. උත්තර චක්‍රවාටයෙහි සිටි ය දෙවියෝ බුදුහු උතුරුදිග් බලා ම වැඩහුන් සේකැ යි සිතති දස දිග සිටි ය දෙවියෝ තම තමන් දිසාවට ම වැඩහුන් සේකැ යි සිත සිතා පිණ පිණා ම බණ අසති. සදෙවි ලොව සිටි ය දෙවියෝ තම තමන්ගේ දිව්‍ය ලොකයෙහි දී ම බණ වදුරණ සේකැ යි සිත සිතා සතුටු ව ම අසන්නාහු ම ය. බ්‍රහ්මලෝක වල සිට බණ අසන බ්‍රහ්මයෝ තම තමන්ගේ බඹලොව දී ම වදුරණ බණකැ යි සිත සිතා විද විද අසති. බුදුහු නම් සඳ සේ උපමා ඇති සේක. යම් සේ ගුවින් මුදුනේ දිලිසෙන්නා වූ සඳ බැළු බැළු සඳවයන් අභිමුඛයට ම පෙණේ. ඉවත් ව නොපෙණේ ද – එ සෙයින් ම මාගේ සවාමිදරු වෝ ත් තමන් වහන්සේ සියලු සතුන් කෙරෙහි සම ව පවත්නා වූ මහා කරුණා ඇති නෙයින් සියලු සතුන් අභිමුඛයට ම පෙණී පෙණේ, සියලු සතුන්ගේ සින් තමන් වහන්සේ කරා ම හැද හැද, සියලු සතුන්ගේ ඇස් තමන් වහන්සේගේ ඇස් හමුවට ම හස් හයා, සියලු සතුන්ගේ ප්‍රේම නමැති මහා ගඟාව ත් තමන් වහන් සේගේ රූප නමැති මහමුනුදට හැද හැද, පෙම් වඩ වඩා ම බණ වදුරණ සේක් ම ය

තව ද අසංඛ්‍යේය බඹලොව සිට බණ අසන්නා වූ දෙලොස් යොදුන් උස ඇති මහා බ්‍රහ්මරාජයෝ දෙලොස් රියන් උසකින් මිනිස් ලොව වැඩ හිඳ බණ වදුරන්නා වූ මාගේ සවාමිදරු වූ බුදු රජාණන් වහන්සේගේ ශ්‍රී මුඛ ය පුන් හඳ බලන්නවුන් සේ කර ඔසවා බල බලා ම බණ අසන්නාහු ම ය. අනව ලෝ මුදුන් ධාතු ව සැමදුම කිසි කෙණෙක් නො දක්නාහු ය. එදු නබා සවාමිදරුවන් බුදු ව වැඩහුන් ඒ පන්සාළිස් හවුරුද්ද මුළුල්ලෙහි කිසි දෙවියෙක් මිරෙක් බඹෙක්, ඒ අනව ලෝ මුදුන් ධාතු ව නුදුටුයේ ම ය. ඒ වේලෙහි පොළොව පටන් බඹ ලොව ගසා ගැවසී සිටි මේ සා බණ පිරිසෙහි මේ සත්ත්වයා රාග චරිත ය මේ සත්ත්වයා දෝෂ චරිත ය මේ සත්ත්වයා මෝහ චරිතය මේ සත්ත්වයා ශ්‍රද්ධා චරිත ය මේ සත්ත්වයා බුද්ධි චරිත ය මේ සත්ත්වයා විතර්ක චරිත ය යනාදීන් එකි එකී සත්ත්වයෙකුගේ සිත් තෙ සැටක් නියාමයෙන් වෙන වෙන ම චරිත බල බලා බණ වදුරණ සේක් ම ය. තව ද මේ බ්‍රහ්මයා සිතුයේ මේ ය. මේ දිව්‍යයා සිතුයේ මේ ය. මේ අසුරයා සිතුයේ මේ ය. මේ යක්ෂ රාක්ෂසයා මේ සිද්ධ විද්‍යාධරයා සිතුයේ මේ ය. මේ වස්ස වලාහකයා සිතුයේ මේ ය. මේ නාග සුපර්ණයා සිතුයේ මේ ය. මේ සත්‍රී, මේ පුරුෂයා සිතුයේ මේ ය. මේ අපාද ද්විපාදයා සිතුයේ මේ ය. මේ චතුෂ්පාද බහුපාදයා සිතුයේ මේ ය. යටත්

පිරිසෙසින් මේ පඤ්ච පැණියා සිටුයේ මේ ය. මේ කුරා කුහුඹුවා සිටුයේ මේ ය. යනාදීන් සියලු සතුන්ගේ සිත් දැන බණ වදාරණ සේක් ම ය.

එසින් කිහ.

"අා භවඝහා නිසින්නාසු - පරිසාසු විනායකෝ,
චිත්තෙන ගඤ්ඡවා දෙසෙයි - ධම්මං තෙසං විසුං විසුං" යි.

තව ද- මාගේ ම සවාමි දරුවන් එක මානසික ශබ්දයෙන් වදාරන්නා වූ බණ බ්‍රහ්මයෝ බ්‍රහ්ම භාෂාවෙන් කියති සි සිතති. අසුරයෝ අසුර භාෂාවෙන් කියති සි සිතති. නාගයෝ නාග භාෂා වෙන් කියති සි සිතති. ගරුඩයෝ ගරුඩ භාෂාවෙන් කියති සි සිතති. මනුෂ්‍යයෝ වෙන වෙන ම තම තමන්ගේ නොයෙක් මනුෂ්‍ය භාෂාවෙන් කියති සි සිතති සිවුපාවෝ තම තමන් ගේ භාෂාවෙන් කියති සි සිතති. හංස මයුරා දි පක්ෂීහු තම තමන් ගේ භාෂාවෙන් කියති සි සිතති. යටත් වශයෙන් දිසෙහි ගොවෙහි සුදු ප්‍රාණීහු තම තමන්ගේ භාෂාවෙන් කියති සි සිතති. කුරා කුහුඹු සිනි පැණි ආදී සූක්ෂම වූ ප්‍රාණීහු තම තම න් ගේ භාෂාවෙන් ම කියති සි සිතා චිඳ චිඳ අසති. මෙසේ සියලු සතුන්ගේ භාෂානුකූල ව බණ වදාරණ සේක් ම ය.

එසින් කිහ.

"මුනිඤ්ඤ මූලභාසාය
දෙසෙන්තා ධම්මමුත්තමං
ජානන්ති සත්තා සබ්බෙපි
සකභාසාය සබ්බසෝ" යි.

මෙසේ සාරාසංඛෙය්‍ය කල්ප ලක්ෂය ක් මුලුල්ලෙහි ඉස් දි මස් දි ඇස් දී අඹුදරුවන් දී රාජ්‍ය ය දී උතුම් වූ ධන දී කළා වූ පාරමිතාවන් ගේ ආනුභාවයෙන් ජනිත වූ පුණ්‍ය සම්භාරයන් හෙයින් මාගේ සවාමි දරු වූ බුදුරජාණන් වහන්සේගේ මේ අසාධාරණ වූ බුද්ධානුභාව හා බුද්ධඥන හා බුද්ධ වික්‍රම හා බුද්ධ ශ්‍රී අචින්ත්‍ය ම ය. අසදෘශ ම ය. ඔබ සේ වූ බුදු කෙණෙකුට ම මුත් අනිත් සඵයක් හට ඒ අචිස ය. දචින්ත්‍ය ම ය. නොදනේ ම ය. නොසිතේ ම ය. අසාධාරණ ම ය. ආශ්චය්‍යී ම ය. විස්මය පත්ම ය. මට ද මේ ඇසූ සියලු සතුන්ට ද මේ වික්‍රම වාසනා වේව යි මෙසේ සවාමිදරුවෝ සියලු සතුන් කැමති කැමති රස කවා පුරණ එක මැණි කෙණෙකුන් සේ හැමදෙනා කැමති කැමති චරිතයෙන් බණ වදාරා ඒ දම්සක් පැවතුම් පළමු වන සූත්‍රදේශනා ව මෙසේ සමහර කොට වදාළ සේක. එ කෙණෙහි පස් දෙනා වහන්සේ ට වැඩි මහළු "අඤ්ඤා කොණ්ඩඤ්ඤ" නම් මහ තෙරුන් වහන්සේ යටකී පරිද්දෙන්

කෙළ දහසක් පමණ කෙලෙසුන් නසා දහසක් නසින් සම්පූර්ණ වූ සොවාන් මාගීයෙන් වැද හිවන් පුර දුටු සේක. එදා අසංඛ්‍යයක් දෙවියෝ සොවාන් මාගීයෙන් වැද අමාමහ නිවන් පුර ය දැක සතුටු වූහ.

තව ද-අසංඛ්‍යයක් දෙවියෝ දෙවන වූ සෙදගැමි මාගීයෙන් වැද අමා මහ නිවන් පුර ය දැක පියා ගියහ. තව ද, අසංඛ්‍යයක් දෙවියෝ තුන්වන වූ අනාගාමි මාගීයෙන් වැද අමා මහ නිවන් පුර ය දුටුහ. තව ද-අටලොස් කෙළක් මහා බ්‍රහ්මයෝ සතර වන වූ රහත් මගින් වැද අමා මහ නිවන් පුර ය දැක සසරදුකින් මිදී ගිය හ. මේසේ එදා මාගේ සවාමි දරුවෝ ඇසළ මැදි පොහෝ දා පතළ සඳ පහනේ කළා වූ පළමුවන ධර්ම දෙශනාවෙහි තුන් අසංඛ්‍යයක් දෙවියන් හා අටලොස් කෙළක් බ්‍රහ්මයන් නිවන් දක්වා කෙළවර බණ සමහර කොට තොප තොප ගේ විමන් යව සි අවසර දෙවා වදාළ සේක. දිව්‍යබ්‍රහ්මයෝ සවණේ රස ධාරා වෙන් අනිඤ්ඡිපත ගාත්‍ර ඇතිවුන් සෙයින් පිණ පිණා සාධු නාද පවත්වා බුදුන් වැඳ ප්‍රදක්ෂිණා කොට බුදුන්ට සතුති කොට තම තමන් ගේ භවනයට ම ගියාහු ය.

මේ අඤ්ඤාකොණ්ඩඤ්ඤ මහ තෙරුන් වහන්සේ හැමට පළමු නිවන් ලබන්ට කවර කලෙක ප්‍රාර්ථනා කළ සේක් දැ සි යත හොත්? මේ මහා භද්‍රකල්පය ට ඒකානූන වන සප විපස්සි නම් බුදු කෙණෙක් ලොව පහළ වි ය. එ කල මහාකාල--චූල කාල ය සි පසිදු වූ දෙබා කෙණෙක් මහා හැල් හේනක් වැපිර වූ හ. ඉක්බිත්තෙන් එක් දවසක් චූලකාල නම් මලනුවෝ හැල් කෙතට ගොසින් හැල් බඩයක් තලා පියා කැවූ ය. ඒ හැල්බඩ ය ඉතා ම පැණි යන්නේ වි ය. එ ඒ රස ය බලවත් හෙයින් මෙසේ වූ බලවත් රස ය දනක් දිපුවොත් මිට වඩනා නිවන් රසත් ලද හැක්කා සි බුදුපාමොක් සඟනට හැල්බඩ වළඳන්ට නිසිලෙසක ඉදිකරවා දන්දෙනු කැමති ව බැණත් කරා ගොසින් බැණත් වගන්ස! හැල්බඩ තලවා පියා බුදුපාමොක් සඟනට නිසිකොට ඉදිකරවා දන් දෙමිහ සි කිවූ ය. බැණෝ ද ඒ අසා හැල්බඩ තලවා දන්දීමක් ගියදවස වූයෙ ත් නැහ. එන දවස වනදෙයකු ත් නො වෙ සි. ගොයම් නොනසව සි කියාලා මලනුවන් හැල්බඩ දන්දෙන්ට ම තර හෙයින් එසේ වී නම් සේන බෙදා පියා මැසන්නක භාගයට අලෙවි නොකොට තොප සන්නක භාගයට කැමැත්ත කරව සි කිවි ය.

ඒ අසා යහපතැ යි සේන බෙදූ පියා බොහෝ අත්කැමි යන් හැරගෙණ ඇල්බඳ තලවා පියා සැලවලට නගා පැනක් නුමුසු කිරෙන් මී පැසවා පැසෙන අවස්ථාවෙහි ගිතෙල්, මී, සකුරු ආදි ය ඔහා කිරිබත පිසවා ලා එක්ලක්ෂ අටසැටදහසක් පමණ බුදුපාමොක් සහනට දන් දී වළඳා අනතයෙහි සවාමිනි ! මා දුන් මේ අගසස් දන හැමදෙනාට පළමු නිවන් පුර වදිනට හෙතු වේව යි පැතූ හ. බුදුහු ත් ඒ එසේ ම වන නියාව දූන එසේ මී වෙ යි වදාළ සේක. ඌ පෙරලා ත් සේනට ගොසින් බඩතලා ගත් සේන් කැබැල්ල බලා හැල්කරල් මිටි කඩා බැන්ද සේ යහපත් ව පැසි සිටි සේන්කැබැල්ල දූක සෙසු කෙත් වත් ඇහ ත් පින්කෙත් උදම්ව එන නියාව දූන මපුරුසින් නැමැති වල්කසල නෙලා හැරපි හෙයින්දෝ, එක ද කරලකට හානි නැති ව සවක් ව පැසි සිටියේ ය යි සිතා ගොයම් නො දෙන තෙක් දුටු සතුටේ අගසස් බහක් දන් දුන් හ. උක්පිටි කරණ දවසුත් දනක් දුන් හ· කදුකරණ දූත් දනක් දුන් හ. කලවිට ලන දූත් දනක් දුන් හ. වී මිරිකා රාසි කරණ දූත් දනක් දුන් හ. අවිවේ ලන දූත් දනක් දුන්හ යි නව වාරයෙක නව අගසස් බහක් දුන් හ. නව වර ම සූරා පැහැරගත් දෙයෙහි අඩුවක් නැති ව සුසල්හි අදහස් පිරෙන්නා සේ තත්වසතුක වූ සශ්‍යඵලය ත් අඩු නැති වේව යි ඒ නවඅගසස් දන් දී එසේ පතා මෙයට ලක්ෂයක් වන කප පිටුමතුරා නම් බුදුන් සමයෙහි ත් සතියක් මුළුල්ලෙහි මහ දන් දී එලෙස ම පැතූ සේක. ඒ ප්‍රාර්ථනා බලයෙන් අප බුදුන්ගේ සස්නෙහි සියල්ලට පළමුකොට නිවන් සම්පත් ලත් සේක යි දත යුතු.

මේසේ මේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් අසූඅසූකොණ්ඩඤ්ඤ දී වේනෙය ජනසන්ථප්‍රජාවට අවබෝධ ය කර වූ හෙයින් ද, බුද්ධ නම් වන සේක—

එසින් වදාළහ—දම්සෙනෙවි සැරියුන් මහ තෙරහු:—

"බොධෙතා පජානාති වා බුද්ධෝ"යි. මෙසේ සබ ප්‍රජාවට අවබෝධකරවූයෙ ත් තමන් වහන්සේ දන් හෙයින් ම ය. එසේ හෙයින් අනිඤ්ඤෙය ධර්ම ය යි කියන ලද විශිෂ්ට ඥානයෙන් දත යුතු වූ චතුස්සත්‍ය ධර්මයන් පූර්වභාගයෙහි විදර්ශනා ප්‍රඥාවෙන් අධිගම්ක්ෂණයෙහි මාර්ග ප්‍රඥාවෙන් මතුයෙහි සම්පිණ්ඩනඥානයෙන් දත යුතු හෙයින් ද පරිඤ්ඤෙය ධර්ම ය යි කියන ලද දුක්ඛසත්‍ය ධර්මයන් එසේ ම දත යුතු හෙයින් ද ප්‍රහාතව්‍ය ධර්ම ය යි කියන ලද සමුදය පාක්ෂික ධර්මයන් එසේ ම දත යුතු හෙයින් ද,

ප්‍රත්‍යක්ෂ කටයුතු ධර්ම යයි කියන ලද නිරෝධ සත්‍ය ධර්මයන් එසේ ම දත යුතු හෙයින් ද, භාවිතව්‍යධර්ම යයි කියන ලද මාර්ග සත්‍ය ධර්මයන් එසේ ම දත යුතු හෙයින් ද, දත් සේකැ යි යනු භගවන්ට—**විශුද්ධිමාර්ගයෙහි:—**

"අභිඤ්ඤෙය්‍ය ධම්මෙ අභිඤ්ඤෙය්‍යතො බුද්ධො. පරිඤ්ඤෙය්‍ය ධම්මෙ පරිඤ්ඤෙය්‍යතො පහාතබ්බෙ පහාතබ්බතො සච්ඡිකාතබ්බෙ සච්ඡිකාතබ්බතො භාවෙතබ්බෙ භාවෙතබ්බතො" යනු කිහ—එ ම දක්වන්නට වදළ බුදුහු:--

"අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤුතං
භාවෙතබ්බං ච භාවිතං
පහාතබ්බං පහීණමෙම
තසමා බුද්ධොසමි බ්‍රාහමණ"යි.

මෙතෙකින් මේ සද්ධම්ම සාරාර්ථ සංග්‍රහ යෙහි

දම්සක් පැවතුම් සූත්‍ර දේශනා කථා නම් වූ

පඤ්චම පරිච්ඡේදය

— නිමි —

6. පරිච්ඡේදය.

6. ආර්‍යසත්‍ය කථා.

තව ද—මේ **සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහයෙහි** විශුද්ධිමාර්ගී යෙන් සඞ්ග්‍රහ කළ **ආර්‍ය සත්‍ය කථා** නම් කවරය න්? මේ මතු දක්වන ක්‍රමයෙන් දතයුතු, කෙසේ ද යන්?

විභාගතෝ නිබ්බචන ලක්ඛණා දිප්පභෙදතෝ
අඤ්ඤාඩ්ඩාරතෝ චෙව අත්‍ථනාධිකතෝ කථා
කම්මතෝ ජාති ආදීනං නිච්ඡයා ඤාණ කිච්චතෝ
අනෙකා'ගධානං පභෙදූ උපමාතෝ චතුක්කතෝ
සුඤ්ඤතෙක ච්ඡාදීහි සභාගච්ඡභාගතෝ
විනිච්ඡයෝ වෙදිතබ්බෝ විඤ්ඤූනා සාසනක්කමෝ-සි.

යනු ආරබ්ධ සි—එහි **විභාගතෝ**, යන්නෙහි දුක්ඛාදී චතු රාර්‍ය සත්‍යයන්ගේ වදළ තැන් අර්ථයෝ අමෘත සභාව ඇති බැවින් අවිතථ ය හ. අත්‍යාකාර රහිත බැවින් අනඤ්ඤථ ය හ. සි යනාදින් විභාග කළ පරිදි දතයුතු-තව ද—දුක්ඛසත්‍යයෙහි පීළ නට්ඨ ය සංඛතට්ඨ ය සන්තාපට්ඨ ය විපරිණාමට්ඨ ය සි කියා සතර ධම් කොණක් වෙති. එය **පීළනට්ඨ** නම් සසර රාගාදී කෙලෙසුන් විසින් පෙළෙන බව සි. **සංඛතට්ඨ** නම් ප්‍රත්‍යයන් විසින් රැස්කරණ ලද සභාව ය. ප්‍රත්‍යයෝ නම් පඤ්චස්කන්ධ යෝ සි. **සන්තාපට්ඨ** නම් රාගාදී කෙලෙසුන් විසින් තවන සභාව ය. **විපරිණාමට්ඨ** නම් ජරා මරණ දෙකින් පෙරළෙන සභාව ය. සමුදය සත්‍යයෙහි දූ, ආයූහනට්ඨ ය නිදානට්ඨ ය සංයොගට්ඨ ය පළිබොධට්ඨ ය සි කියා සතර ධම් කොණක් වෙති. එහි **ආයූහනට්ඨ ය** නම් කුශලාකුශල කර්මයන් රැස්කරණ සභාව ය හෙවත් දුක් රැස්කරණ සභාව ය.

මෙ ම කිහ—විශුද්ධිමාර්ග පිකාවෙහි.

"තත්‍ර තත්‍රාභිනන්දන වසෙන ව්‍යාපිබා උග්ගහනං රාසිකරණං දුක්ඛස්ස නිබ්බත්තනං ආයූහනං"සි. **නිදානට්ඨ** නම් සසර පිහිටුවන බව ය හෙවත් දුකට කරුණුවන සභාව සි. මේ ද කි හ. **විභාවෙහි** "නිදෑනි දුක්ඛන්ති නිදානං. ඉදං තං දුක්ඛන්ති සමප විඡාපෙන්තං විය සම්භාවෙති"සි. **සංයොගට්ඨ** නම් සංසාර ය හා එක්කොට යොදන සභාව ය. **පළිබොධට්ඨ** නම් සසර බලා වලකා අනාදිමත් සසර සිටුවනු සභාව ය. නිරොධසත්‍යයෙහි නිස්සරණට්ඨ ය විවෙකට්ඨ ය අසංඛතට්ඨ ය අමතට්ඨ ය සි කියා

සතර ධම් කෙණෙක් වෙති. එහි **නිස්සරණට්ඨ** නම් සසර හා නොහැනී පහ වූ සවභාව ය. **විවෙකට්ඨ** නම් සසර නවැති මහ කතරින් වෙන් වූ නිරාකුල වූ විවෙක සථාන ඇති සවභාව ය. **අසංඛතට්ඨ** නම් හේතු නිසා නොඋපන් සවභාව ය. **අමතට්ඨ** නම් හඟතැති බැවින් අමරණ සවභාව ය. මාගීසත්‍යයෙහි ද **නියාණට්ඨ** ය **හෙතට්ඨ** ය **දසසනට්ඨ** ය **ආධිපතෙය්‍යට්ඨ** ය යි කියා සතර ධම්කෙණෙක් වෙති. එහි **නියාණට්ඨ** නම් සංස්කාරයන් අරමුණු නො කොට සියලු සංස්කාරයෙන් නික්මෙන බැවිනු දු සවභයන් සංසාරයෙන් නෙරපන බැඳිනු දු නියාණ සවභාව ය හෙවත් නිවන් පසක් කරණ සවභාව ය. **හෙතට්ඨ** නම් මොක්ෂ යට සම්ප්‍රාප්ත හෙතු සවභාව ය. "පලිබොධුපචෙජ්දනෙන නිබ්බාණාධිගමො ව නිබ්බාණ නිමිත්තතා මහසස හෙතවො"යනු මෙයට ම **විභාසි. දසසනට්ඨ** නම් මාගී ය ප්‍රඥ ප්‍රධාන බැවින් නිර්‍වාණ ය හෝ චතුසසත්‍ය ය හෝ දක්නා සවභාව ය හෙවත් නිවන් දක්නා සවභාව ය. **ආධිපතෙය්‍යට්ඨ** නම් ප්‍රම්ප්‍රයුක්ත යෙන් තමා වසයෙහි පවත්වන සවභාව ය හෙවත් අනනතා පරිමාණ සක්වල තමා සරි කෙණෙකුන් නැති බැවින් ආධිපතෙය්‍ය සවභාව ය. මේ සතර සත්‍යයෙහි ම කියන ලද සතර සතර ධම්යෝ එක්කොට සොළසෙක් වෙති. මොහු සියල්ල ම ඒ ඒ යත්‍යයට කියන ලද ක්‍රමයෙන් තත් සවභාව ය හා මුසා නො වන සවභාව ය ඇති හෙයින් අවිතථය හ. අනසසඥථ ය හ යි දත යුතු.

එසින් වදළහ.

"දුකඛසස, පීලනටෙඨා සංඛතටෙඨා සනතාපටෙඨා විපරිනාමටෙඨා. ඉමෙ චතතාරො දුකඛසස දුකඛටඨා, තථාවිතථා අනසසඥථා. සමුදයසස, ආයූහනටෙඨා නිදානටෙඨා සංයොගටෙඨා පලිඛොධටෙඨා. නිරොධසස, නිසසරණටෙඨා විවෙකටෙඨා අසංඛතටෙඨා අමතටෙඨා. මහහසස, නියාණටෙඨා හෙතටෙඨා දසසනටෙඨා ආධිපතෙය්‍යටෙඨා. ඉමෙ චතතාරො මහහසස මහහටඨා තථා අවිතථා. අනසසඥථා"යි.

මෙ තෙකින් "විභාගතො" යන්නෙහි විනිශ්ච ය දත යුතු. නිබ්බවණ ලකඛණාදිපහෙදතො" යන්නෙහි, නිහරිතා වතත බවං වචනං නිබ්බවතං. යි කී බැවින් අක්‍ෂරද්වාරයෙන් අර්ථ නො හැර කිම නිර්වන නම් වේ. අක්‍ෂරද්වාරයෙන් අර්ථ නැර කියන ක්‍රම නම්, පළමුවන දුකඛ සත්‍යයෙහි "දු" ශබ්ද ය කුත්සිතාර්ථ යෙහි දක්නා ලැබෙ යි. යම් හෙයකින් කුත්සිත වූ පුත්‍රයහට

දුප්පඤ්ඤ ය යි කියද්ද එ සෙයින් දුක්ඛ සත්‍යයෙහි "දු" ශබ්ද ය ඤාත්‍යර්ථයෙහි වැටෙ යි. එම සත්‍යයෙහි වනාහි "ඛ"ශබ්ද ය ඤාත්‍යර්ථයෙහි වැටෙ යි. යම් හෙයකින් ආකාශ ය "ඛ"ය යි කියනු ලැබේ ද එ සෙයින් ම මේ පළමුවන සත්‍ය ය ද අනෙ කොපදුවාධිෂ්ඨාන වන බැවින් ඤාත්‍යර්ථ වෙ යි. බාලජන පරිකල්පිත, නිත්‍ය, සුභ, සුඛාත්මභාව රහිත වන බැවින් තුච්ඡ වෙ යි. මෙසේ ඤාත්‍යර්ථ වන බැවින් හා තුච්ඡ වන බැවින් ද දුක්ඛ ය යි කියනු ලැබේ.

එසින් කිහ—විශුද්ධිමාර්ගයෙහි සොළොස්වන **ඉන්ද්‍රියසත්‍ය නිද්දේශයෙහි**; "නිබ්බචනතෝ තාව ඉධ දු ඉති අයං සද්දෝ කුච්ඡිතෙ දිස්සති. කුච්ඡිතානං හි පුත්තානං දු පුත්තෝ ති වදන්ති. ඛ සද්දෝ පන තුච්ඡෙ. තුච්ඡං හි ආකාසං ඛන්ති වුච්චති. ඉදඤ්ච පඨම සච්චං කුච්ඡිතං. අනෙක උපද්දවාධිට්ඨානතෝ තුච්ඡං බාලජන පරිකප්පිත ධුව සුභ සුඛත්ත භාව විරහිතතෝ. තසමා කුච්ඡිතත්තා තුච්ඡත්තා, ච දුඛන්ති වුච්චති"යි. දෙවෙනි සමුදය සත්‍යයෙහි සං යන මේ ශබ්ද ය තෙමේ සමාගම යෙහි වැටෙ යි. සමෙතං යනාදියෙහි සංයොග ය ප්‍රකාශ කෙරෙ යි. උ යනා මේ ශබ්ද ය උප්පන්නං උදිතං යනාදියෙහි උත්පත්තියෙහි වැටෙ යි. අය ශබ්ද ය කාරණ ය ප්‍රකාශ කෙරෙ යි. මේ දෙවෙනි සත්‍ය ය අවශෙෂ ප්‍රත්‍ය යන්ගේ සමාගමයක් ඇති කල්හි දුක්ඛයාගේ උත්පත්තියට කාරණා වෙ යි. දුක්ඛයාගේ සංයොගොත්පත්තියට කාරණා වන බැවින් දුක්ඛසමුද ය යි කියනු ලැබේ.

එසින් කිහ.

"සං ඉති ව අයං සද්දෝ සමාගමෙ සමෙතානන්ති ආදිසු සංයොගං දීපෙති. උ ඉති අයං උප්පන්නං උදිතනන්ති ආදිසු උප්පත්තිං. අය සද්දෝ කාරණං දීපෙති. ඉදං වාපි දුතිය සච්චං. අවසෙස පච්චය සමොයොගො සති දුක්ඛස්සුප්පත්ති කාරණන්ති දුක්ඛස්ස සංයොගො උප්පත්ති කාරණතෝ දුක්ඛසමුදයන්ති වුච්චති"යි.

තෘතීය සත්‍යයෙහි වනාහි යම් හෙයකින් **නි** ශබ්ද ය අභාව ය ප්‍රකාශ කෙරේ ද, **රොධ** ශබ්ද ය වාරක ය ප්‍රකාශ කෙරේ ද, එ හෙයින් මේ සංසාර වාරක ය යි කියන ලද දුක්ඛරොධ යාගේ අභාව ය සම්භවනි ශූන්‍ය වන බැවින් නිරොධ ය ඝට නු යි දුක්ඛ නිරොධ නම් වේ.

මේ ද විඤ්ඤාර වශයෙන් දක්වනු ලැබේ.

තතිය සච්චං පන යසමා නි සද්දෝ අභාවං, රොධ සද්දෝ වාරකං දීපෙති. තසමා අභාවෝ එත්ථ සංසාර වාරක සංඛා තස්ස දුක්ඛ නිරොධස්ස සබ්බගති සුඤ්ඤතත්තා සම්භිගතෙ වා

තස්මිං සංසාර වාරක සංඛාතස්ස දුක්ඛනිරෝධස්ස අභාවෝ හොති. තපපටිපක්ඛත්තාති පි දුක්ඛ නිරොධන්ති පි වුච්චති. දුක්ඛ ස්ස වා අනුප්පාද නිරොධපපච්චයත්තා දුක්ඛනිරොධන්ති-සි.

සතරවන සත්‍ය ය වනාහි යම්කින් මේ දුක්ඛ නිරොධයට යේ ද දුක්ඛ නිරොධයට පමුණුවන ප්‍රතිපත්ති ය තදනිමුඛී භූත වන බැවින් මාර්ගීය වේ.

එසින් කිම.

චත්තාරි සච්චං භන්ත යසමා එතං දුක්ඛ නිරොධං ගච්ඡති ආරම්මණවසෙන තදනි මුඛභූතත්තා පටිපදා ව හොති දුක්ඛනිරොධ පපත්තියා සි. කවර නෙයකින් ආර්‍ය්‍යසත්‍ය ය සි කියනු ලැබේද්ද යත්. යම් හෙයකින් වනාහි බුද්ධාදී ආර්‍ය්‍යයෝ මේ චතුස්සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙද්ද එ හෙයින් ආර්‍ය්‍යසත්‍ය ය සි කියනු ලැබෙත්.

එසින් වදාළ හ.

චත්තාරි මානි භික්ඛවෙ අරියසච්චානි කතමානි චත්තාරි? දුක්ඛං අරියසච්චං දුක්ඛසමුදයං අරියසච්චං දුක්ඛනිරොධං අරිය සච්චං දුක්ඛනිරොධගාමිනි පටිපදා අරියසච්චං. ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අරියසච්චානි. අරියා ඉමානි පටිවිජ්ඣන්ති. තස්මා අරිය සච්චානි ති වුච්චන්ති—සි.

අපි ච සදෙවමනුස්ස ලොකයෙහි බුදුහු ආර්‍ය්‍ය නම් වන සේක. මේ ආර්‍ය්‍ය සත්‍යයෝ බුදුන්ගේ නු සි ආර්‍ය්‍යසත්‍ය නම් වෙත්.

එසින් වදාළ හ.

සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණ බ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අරියෝ. තස්මා අරියසච්චානි ති වුච්චන්ති—සි.

නොහොත් මේ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ ආර්‍ය්‍යභාව සිද්ධියෙන් අභිසම්බුද්ධ හෙයින් ද ආර්‍ය්‍යසත්‍ය නම් වෙත්.

එසින් වදාළ හ.

ඉමෙසං ඛො භික්ඛවෙ චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසම්බුද්ධත්තා තථාගතො අරහං සම්මාසම්බුද්ධොති වුච්චති-සි.

අපි ච ඛො පන, ආර්‍ය්‍ය වූ සත්‍යයෝ නු සි කියා ආර්‍ය්‍යසත්‍ය යෝ නම් වෙත්. ආර්‍ය්‍ය නම් අමෘෂාවාද ය අවිසංවාද ය යනු අර්‍ථයි.

එසින් වදාළ හ.

ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අරියසච්චානි තථානි අවිත ථානි අනඤ්ඤථානි. තස්මා අරියසච්චානී'ති වුච්චන්ති-සි.

මෙසේ විනිශ්චය කරණ ලද නිර්වන සංඛ්‍යාත අක්ෂරද්වාර යෙන් අර්ථ නාර කියන ක්‍රමයට ගමනිර වූ ශ්‍රී මුඛ පාළි ය හා අට්ඨවා පාඨ ය සම්බන්ධ වූ හෙයින් දුරවබෝධ ය මේ නම්—දුක්ඛසත්‍යයෙහි **දු** ශබ්ද ය කුත්සිතාර්ථයෙහි වැටේ. **ඛ** ශබ්දය තුච්ඡාර්ථයෙහි වැටේ. පළමුවන සත්‍ය ය අනෙකොපද්‍රවාධිෂ්ඨාන වන බැවින් කුත් සිත සි. බාලජන පරිකල්පිත නිත්‍ය සුභ සුඛාත්මභාව රහිත වන බැවින් තුච්ඡ ය සි මේසේ කුත්සිත වන බැවින් දුක්ඛ වේ-සමුදය සත්‍යයෙහි **සං** යනු සංයොග යෙහි වැටෙ සි. උ ය නු උත්පත්තියෙහි වැටෙසි. **අය** ශබ්ද ය කාරණයෙහි වැටෙ සි. මෙසේ දෙවන සත්‍ය ය සමාගොග යක් ඇතිකල්හි දුක්ඛොත්පත්තියට කාරණා වන බැවින් සමුදය වේ. නිරෝධ සත්‍යයෙහි **නි** ශබ්ද ය අභාවයෙහි වැටේ. **රොධ** ශබ්දය චාරකයෙහි වේ. චාරක නම් දහගෙ ය සි. මේ හේතූන් වන සත්‍ය ය සළිගති ශූන්‍යවන බැවින් සංසාර චාරක සංඛ්‍යාත වූ දුක්ඛ නිරොධයාගේ අභාව ය හෙයින් නිරොධ වේ—සතරවන සත්‍ය ය දුක්ඛ නිරෝධයට පමුණුවන ප්‍රතිපත්ති ආලම්බණ වශයෙන් තදනි මුවිභූත වන බැවින් මාගී වන්නේ ය සි කියා නවගුණ සන්තයෙහි පූර්වාචාරීන් විසින් කළ විනිශ්ච ය ද පිරිසිඳිය යුතු මෙහෙකින් නිවී වන විසින් විනිශ්ච ය දත යුතුසි.

ලක්ෂණාදීන්ගේ ප්‍රභෙද හෙයින් අර්ථ කියන ක්‍රම කෙසේ ද යත්? "බාධන ලක්ඛණං දුක්ඛ සච්චං" කි බැවින් දුක්ඛසත්‍ය ය බාධන සංඛ්‍යාත පීඩා ව ලක්ෂණ කොට ඇත්තේ ය. දුක්ඛසත්‍යයෙහි රස කෙසේ ද යත්? "සන්තාපන රසං" කි බැවින් තවන්නා වූ කාතෘ ඇත්තේ සි. මේහි **කෘතෘත්‍ය ය රස ය** යනු එකාර්ථ සි හවාදියෙහි ජාත්‍යාදී වශයෙනු දු වක්‍ඛු රොගාදී වශයෙනු දු අනෙක ප්‍රකාරයෙන් දුක්ඛ ප්‍රවර්තන ය ම පුද්ගලයාගේ සන්තාපන නමැ සි දනයුතු. දුක්ඛ සත්‍යයෙහි ප්‍රත්‍යුපස්ථාන කෙසේ ද යත්? "පවත්ති පච්චුපට්ඨානං"යි. කි බැවින් ප්‍රවෘත්ති ය ප්‍රත්‍යුපස්ථාන නම් වෙයි ප්‍රත්‍යුපස්ථාන නම් වැට හි ම් සි. මෙහෙකින් දුක්ඛ සත්‍යයෙහි ලක්ෂණ ය, රස ය, ප්‍රත්‍යුපස්ථාන ය, යන මොවුන්ගේ විනිශ්ච ය දතයුතු සි.

සමුදය සත්‍යයෙහි ලක්ෂණ කෙසේ ද යත්? "පභව ලක්ඛණා සමුදය සච්චං"යි කි බැවින් සමුදය සත්‍යය **ප්‍රභව** ලක්ෂණකොට ඇත්තේ ය. ප්‍රභව නම් මූල සවභාව ඇත්තේ ය. උපදවන සවභාව ඇත්තේ ය යන අර්ථ සි. පභවති එතස්මා දුක්ඛං නිබ්බත්තතීති-පභවෝ ප්‍රභවයෙන් පශ්චිමභව ය ඝටිත ව සාස්‍රක්ත ව, පවතී නු සි. පභව නම් වේ සමුදය සත්‍යයෙහි රස කෙසේ ද යත්? "අනුපච්ඡේදකරණ රසං"යි කී බැවින් නැවත නැවත උත්පාදන ය සි කියන ලද **අනුපච්ඡේදකරණ ය** රස නම් වේ. හෙවත් දුක්ඛ

අවිච්ඡින්න කරණ ය කෘත්‍ය ය වේ. සමුදය සත්‍යයෙහි ප්‍රත්‍යුපස්ථාන කෙසේ ද යත්? "පලිබෝධ පච්චුපට්ඨානං" කි හෙයින් සසරින් නික්මී ය නොදෙන **පලිබෝධ ය** වැටහීම් කොට ඇත්තේ ය. මේ හෙයින් සමුදය සත්‍යයෙහි ලක්ෂණ ය, රස ය, ප්‍රත්‍යුපස්ථාන ය, යන මොවුන්ගේ විනිශ්ච ය දතයුතු.

නිරෝධ සත්‍යයෙහි ලක්ෂණ කෙසේ ද යත්? "සන්ති ලක්ඛණං නිරෝධසච්චං"යි කි බැවින් කිසිසේ ත් කෙලෙසයන් විසින් නොගත නොහෙන බැවින් නිවුනා වූ **සාන්ත** බව ලක්ෂණකොට ඇත්තේ ය. "රාගක්ඛයාදිභාවෙන සබ්බදුක්ඛ සන්තනායනති" යනු මේ ය ට ම **විකා යි.** නිරෝධසත්‍ය යෙහි රස කෙසේ ද යත්? "අච්චුති රසං"යි කි බැවින් **නොනෂ්ටතා** බව සම්පත්කොට ඇත්තේ ය මේහි දු සම්පත්තිය රස ය කෘත්‍ය ය යනු එකැඟී යි. "අච්චන්තිච්චං වා නිච්චනති වචනාභාවං නිච්චම්ව කත්වා පරියායෙන වුත්තං, අච්චන්තස්ස භාවා පරිජතං, අවිකාරිතා දට්ඨබ්බා" යනු මේ යට ම විකා යි නිරෝධ සත්‍ය යෙහි ප්‍රත්‍යුපස්ථාන කෙසේ ද යත්? "අනිමිත්ත පච්චුපට්ඨානං"යි කි බැවින් සකල නිමිත්තයෙන් විවික්ත වන බැවින් **අනිමිත්ත ව** අවිශ්‍ර හ ව වැටහීම් කොට ඇත්තේ වෙයි. මේ තෙකින් නිරෝධ සත්‍යයෙහි ලක්ෂණ ය රස ය ප්‍රත්‍යුපස්ථාන ය යන මොවුන්ගේ විනිශ්ච ය දත යුතු යි.

මාගීසත්‍යයෙහි ලක්ෂණ කෙසේ ද යත්? "නියාන ලක්ඛණං මග්ග සච්චං"යි කි බැවින් නිවණට යන සුභාව ඇත්තේ සසරින් **පහවන සුභාව** ඇත්තේ මාගීසත්‍යයෙහි ලක්ෂණ වේ. "අනුසය සමුච්ඡින්දනෙන සංසාර වාරකතො නිග්ගමනූපාය භාවො නීයානං"යි යනු මෙයට ම **විකා යි.** මාගීසත්‍යයෙහි රස කෙසේ ද යත්? "කිලෙ සපහාන කරණ රසං"යි කි බැවින් අනුපපාද නිරෝධ වශයෙන් කෙලෙසුන් **ප්‍රහාණ කරණ** බව කෘත්‍ය ය (කොට) රසකොට ඇත්තේ ය. මාගී සත්‍යයෙහි ප්‍රත්‍යුපස්ථාන කෙසේ ද යත්? "වුට්ඨාන පච්චුපට්ඨානං"යි කි බැවින් නිවීත්ත ය නු දු නැගෙනු ව වැටහෙන්නේ යි. නිරෝධ සත්‍යයට ද පදස්ථාන නැති බැවින් ඒ හා සමග කියන සෙසු තුන් සත්‍යයට ද පදස්ථාන නොකි හ යෙත්. මේ තෙකින් මාගීසත්‍යයෙහි ලක්ෂණ ය, රස ය, ප්‍රත්‍යුපස්ථාන ය, යන මොවුන්ගේ විනිශ්ච ය දතයුතු යි.

"අත්ථඤ්ඤුධාරතො වෙව" යන මේහි එනාහි අර්ථ හෙයින් පළමුකොට අර්ථවිසින් කවරෙක් සත්‍යඥ යි කිව හොත්- ප්‍රඥාචක්ෂුසින් පරිඤ්ඤාකරනු ලබන්නා වූ බුද්ධාදීන්ට අසවණී ම සවණී කොට දක්වන මායා කාරයාගේ ක්‍රියාවක් මෙන් විපරීත නොදෙයි. එසතු

මිත්‍රයකු දු නැති බැවින්, මිරිහු දිය බඳු ව පෙණෙන බැවින්, විසංවාදන ය කාරණ මිරිහු මෙන් විසංවාදක නො ද වෙයි. කවර හෙයකින් දු නොදක්ක හැකි බැවින්, නොලැබිය හැකි සවභාව ඇති වූ නිර්‍වික යන්ගේ ආත්මභාව මෙන් නොලැබිය හැකි සවභාව ද ඇත්තේ නො වෙයි. කෙසේ ද යත්? ඒකාන්තයෙන් ම බාධන ලක්ෂණයෙන් දුකඛ සත්‍ය ය වෙයි. ප්‍රභව ලක්ෂණයෙන් සමුදය සත්‍ය ය ද ශාන්තිලක්ෂණ යෙන් නිරෝධසත්‍ය ය ද නියාණ ලක්ෂණයෙන් මාර්ගසත්‍ය ය ද, වෙයි. හෙ ද තථ්‍ය විපරීත භූත සවභාවෙන් වෙයි. හෙවත් මිරිවි සෙයින් විසංවාද නොවන බැවින් භූත සවභාවයෙන් හෙවත් මිරිවි සෙයින් විසංවාදන නොවන බැවින් තථ්‍ය වූ මායා සෙයින් විපරීත නොවන බැවින් අවිපරීත වූ නිර්‍වීකයන්ගේ ආත්ම සෙයින්, අනුප ලභ්‍ය සවභාව නොවන බැවින් භූත වූ, සවභාව යෙන් වැටහීම් වශයෙන් ප්‍රතිවෙධ වශයෙන් අරමුණ වශයෙන් ආර්‍යඥානයට ගොචර වෙයි. ලෞකිල් ආදී උපාදාන වශයෙන් ශක්ලිකාග්නි ය යනාදි ප්‍රභෙද හෙතු දු උෂ්ණත්වයෙන් එක් වූ වහ්නි ලක්ෂණ මෙන් ද, ලෝක ප්‍රකෘති ය මෙන් ද තථ්‍යාවිපරීත භූතභාව ය සත්‍යාර්‍ථ නමැ සි වෙදිතව්‍ය සි.

එසින් වදළහ- බුද්ධඝොස මහ තෙරහු.

අත්‍ථද්ධාරතො වෙවං'නි, එත්ථ පන අත්‍ථතො තාව කො සච්චට්ඨොති වෙ? යො පණ්ඩිතෙහි චක්ඛුනා උප පරික්ඛ මානානං මායා'ව විපරිතකෝ මිරිවි'ව විසංවාදකෝ නිත්තියානං අත්තාව අනුපලබ්භ නෙය්‍ය භාවෝ ච න හොති අථ කෝ බාධනපපහවඤ්ඤති නියාණපප කාරෙණ තථා 'විපරිත භාවෙන අරිය ඤාණස්ස ගොචරෝ හොති යෙව. එස අත්‍ථෝ ලක්ඛණං විය ලොක පකති විය ච තථා 'විපරිත භූත භාවෝ සච්චට්ඨෝ ති වෙදිතබ්බෝ-සි.

අපි ච, කවර කාරණයකින් දුකඛ ය සත්‍ය ය සි කියනු ලැබේ ද යත්?

තබාධකං යතෝ දුක්ඛං දුක්ඛා අඤ්ඤං න බාධකං,
බාධකත්තා නියාමෙන තතෝ සච්ච මිදං මතං-සි.

දක්වන ලද බැවින් යම් හෙයකින් යම් කාරණයකින් දුකඛ ය නෙමේ නොපෙළෙන්නේ නොවේ ද? පෙළෙන්නේ ම වේ ද දුකඛ සත්‍ය යෙන් පිට ත් බාධක දෙයෙක් නැත් ද. ඒ කාරණයෙන් දුකඛ සත්‍ය ය බාධක ම ය, දුකඛ ම ය හෝ බාධක ය සි මෙසේ දෙපරිද්දෙන් ම දුකඛ සත්‍ය ය සි සලකන ලදි. කවර කාරණයකින් සමුදය සත්‍ය ය සි කියනු ලැබේ ද යත්?

තං විනා නාඤ්ඤතෝ දුක්ඛං න හොති න ච නං හතෝ,
දුක්ඛ හෙතු නියාමෙන ඉති සච්චං විභාවිකා-සි.

යනු හෙයින් ඒ විසතනික තෘෂ්ණා ව හැර අනිකෙකින් දුක්ඛ ය නොවේ ද, ඒ දුක්ඛ ය ඒ විසතනික තෘෂ්ණාවෙන් නො වනු යේ නොවේ ද, මේසේ දුක්ඛයට හේතු භාවයෙහි නියමයෙන් විසතනිකා සංඛ්‍යාත තෘෂ්ණා තොමෝ සත්‍ය නම් වේ. අවශෙෂ ක්ලෙශාදීන්ගේ දුක්ඛ ය හේතුභාව ය ඇත ද තෘෂ්ණා ව හැර ඔවුන් ගේ දුක්ඛයට හේතුභාව ය නොවෙ සි. ඔවුන් හැර තෘෂ්ණාවගේ දුක්ඛයට හේතුභාව ය වේ.

මෙම කිහ - විශුද්ධිමාර්ග විභාගයෙහි.

සති පි අවසෙස කිලෙස අවසෙස කුසල සාසව කුසල මූලා අවසෙස සාසව කුසල ධම්මානං දුක්ඛ හෙතු භාවෙන තණ්හාය විනා තෙසං දුක්ඛහෙතු භාවො අත්ථි. තෙහි පන විනා පි තණ්හාය දුක්ඛ හෙතු භාවො අත්ථි. කුසලෙහි විනා අකුසලෙහි රූපාවචරාදි කුසලෙහි විනා කාමාවචරාදීහි ව තණ්හාය දුක්ඛ නිබ්බත්ත කත්තා-සි.

කවර කාරණයකින් නිර්‍වාණ ය නිරොධසත්‍ය නම් වේ ද යත්?

නාඤ්ඤ නිබ්බාණතො සන්ති සන්තං න ච න තං යතො
සන්තභාව නියාමෙන තතො සච්ච'මිදං මතං-සි.

දක්වන ලද බැවින් යම් කාරණයකින් නිර්‍වාණයෙන් පිටත් අනික් ශාන්තියෙක් නැද්ද, ඒ නිර්‍වාණ ය අසාන්ත නොවේ ද, සාන්ත ම වේ ද, ඒ කාරණයෙන් ශාන්තභාව නියමයෙන් මේ නිර්‍වාණ ය සත්‍ය ය සි සලකන ලදි. මාර්‍ගසත්‍ය ය කවර කාරණයකින් සත්‍ය ය සි කියනු ලැබේ ද යත්?

මග්ගා අඤ්ඤං න නියාතං අනියාතො න චාපි සො,
තච්ඡනියාන භාවත්තා ඉති සො සච්ච සම්මතො-සි.

දක්වන ලද බැවින් මාර්‍ගසත්‍යයෙන් පිට ත් අන්‍ය වූ නියර්‍ණ යෙක් නැද්ද, මාර්‍ගසත්‍ය ය තෙමේ නො අනෙයර්‍ණික වේ ද, නෙයර්‍ණික ම වේ ද, මේසේ තත්ථාවනෙයර්‍ණ වූ බැවින් ඒ මාර්‍ගසත්‍ය ය සි සලකන ලදී.

දට්ඨා'පි නියාමෙන තච්ඡෙ නියානභාවො එතස්ස මිච්ඡා මග්ගස්ස විය විපරීතතාය න ලොකිය මග්ගස්ස විය වා. අනෙකන්ති කතාය අතච්ඡෙති තච්ඡනියාතභාවො මඤ්ඤා. තස්සභාවො තච්ඡනියාතභාවත්තං. තස්මා තච්ඡනියාන භාවත්තා" යනු මෙයට ම **විශුද්ධිමාර්ග විභාග සී.**

මේ ද්විවිධ නියමයෙන් තථ්‍ය වූ අවිපරීත වූ අසත්‍යය දුක්ඛාදි සතරදෙනා කෙරෙහි සාමාන්‍යයෙන් සත්‍යාර්ථ ය යි කියා පණ්ඩිතයෝ කියත්.

එසින් කිහ.

ඉති තථා'විපල්ලාස භූතභාවං වතුස්වපි,
දුක්ඛාදිසු විසෙසෙන සච්චට්ඨං ආහු පණ්ඩිතා-සි.

මේසේ අර්ථ විසින් අර්ථ විනිශ්චය දතයුතු සි. අඤ්ඤාර හෙයින් අර්ථ කියන ක්‍රම කෙසේ ද යත්? මේ තැන්හි **සච්ච** ශබ්ද ය අනෙකාර්ථයෙහි දක්නා ලැබේ. කෙසේ ද යත්? 'සච්චා භණෙ න කුජ්ඣෙය්‍යා''හි යනාදී තන්හි වාක්‍යත්‍යයෙහි වැටෙ සි. සච්ච සීතා සමිණබ්‍රාහ්මණාවාහි'' යනාදී තන්හි යමකින් වෙන්වෙන විරති සත්‍යයෙහි වැටෙ සි. ''ඉදමේව සච්චා මොඝමඤ්ඤා,'' යනු තන්හි දෘෂ්ටි සත්‍යයෙහි වැටෙ සි. ''එකා හි සච්චා න දුතියා'' යනාදී තන්හි පරමාර්ථ සත්‍යයෙහි වැටෙ සි. ''චතුන්නා සච්චානා කති කුසලා''යි යනාදී තන්හි ආර්‍ය්‍ය සත්‍යයෙහි වැටෙ සි. ඒ මේ සත්‍ය ශබ්ද නෙමේ මේ තැන්හි ආර්‍ය්‍යසත්‍යයෙහි වැටේ. **අභිධාන ප්‍රදීපිකා** යෙහි කියන ලද මැ සි.

නිබ්බාණ මග්ග විරති සපථේ සච්ච භාසිතෙ,
තථෙ ච'රිය සච්චෙහි දිට්ඨියං සච්චමීරිතං-සි.

මේසේ මේහි අඤ්ඤාර විසින් විනිශ්චය දත යුතු සි. අඤ්ඤාර නම් සත්‍ය ශබ්දයෙහි සම්භවින අර්ථයන්ගේ උද්ධරණය හා සමග වන අර්ථයන් දන්වා අනිප්‍රෙතාර්ථයාගේ උද්ධරණය නිර්‍වාණය අත්‍රෝද්ධාර නමැ සි ද දත යුතු. අනූනාධිකතො යනුවෙන් කවර හෙයකින්. ''චත්තාරි අරියසච්චානි'' සි කියා සතරක් ම කියන ලද ද යත්? බොහෝවක් මදකොට කිවහොත් ඌන දෙෂ ය වෙ සි මදක් බොහෝ ව කිවහොත් අධික දෙෂ ය වෙ සි. ඒ දෙෂද්වය මුදා අනූන අනධික කොට ''චත්තාරි අරියසච්චානි''යි කිනු-නොහොත් ආර්‍ය්‍ය සත්‍ය කෙණෙක් මේ සතරට වඩා නො ද ඇති. මේ සතරින් ආර්‍ය්‍ය සත්‍යයන් කෙරෙහි නොගෙණ හැරිය යුතු එකකු දු නො ද ඇති. ඒ කාරණයෙනැ සි දතයුතු. මේ මෙහි සංක්ෂෙප ය. විස්තර වශයෙන් වනාහි විශුද්ධිමාර්ගයෙන් බලා දත යුතුයි-මෙහෙකින් ''අනූනාධිකතො''යන්නෙහි විනිශ්චය කරණ ලදී.

කමතො ජාති ආදිනං, යන්නෙහි කුමක් හෙයින් ක්‍රම යෙන් දෙසන ලද්දේ ද යත්? ජාත්‍යාදීන්ගේ දුක්ඛභාව ය සැම සත්වයන්ට සාධාරණ බැවින් ද, දෙසූ කල මනාකොට අවබොධ

වන්නේ ය යි දුක්ඛ සත්‍ය ය පළමුකොට වදාරා එයට මූ හේතු දක්වනු පිණිස දෙවනු ව සමුදය සත්‍ය ය ද, හේතු නිරෝධයෙන් ඵල නිරෝධ ය වන්නේ ය යි දක්වනු පිණිස තුන්වෙනි ව නිරෝධ සත්‍ය ය ද, ඒ නිරෝධයට පමුණුවන උපාය දක්වනු පිණිස සතර වැනි ව මාර්ග සත්‍ය ය ද, වදළහ යි දත යුතු යි.

එසින් කිම

ඔලාරිකත්තා සබ්බ සත්ත සාධාරණත්තා ච සු පිසෙඤ්ඤ යාතනති දුක්ඛසච්චං පඨමං වුත්තං තසෙසව හෙතු දස්සනත්ථං තදනන්තරං සමුදය සච්චං. හෙතුනිරොධා ඵලනිරොධොති ඤාප නත්ථං තතො නිරොධ සච්චං. තදධිගමූපාය දස්සනත්ථං අන්තෙ මග්ග සච්චං-යි.

අපි ච, භව සුඛාසවාද ග්‍රථිත සත්ත්වයන්ට හෙවත් භව ය, සුඛ ය යන ආස්වාදයෙහි ඇලුනු සත්ත්වයන්ට සංවේග ජනන ය කරණු පිණිස ප්‍රථමයෙන් දුක්ඛ සත්‍ය ය දෙසිත ය. දුක්ඛ ය අනිවර්නිත වූයේ අනිෂ්පාදිත කාරණ අති ඇත්තේ ඊශ්වර නිර්මාණාදියකින් වන්නේ නො වෙයි. මේ තාෂණා ව නිසා ම ජාත්‍යාදි දුක්ඛ ය වන්නේ ය යි දුක්ඛයට භවහෙතු දක්වන පිණිස දෙවෙනි සමුදය සත්‍ය ය දෙසිත ය. සහෙතුක දුක්ඛයෙන් අනිහුත බැවින් කල කිරණු සිත් ඇත්තවුන්ට මෙබදු දුකින් ගැලවීමට සුදුසු සරණෙක් ප්‍රතිෂ්ඨාවෙක් ඇද්දේ නෝ යි සිතමින් සරණ සොයන්න වුන්ට සහේතුක දුක්ඛයෙන් ගැලවෙන්ට ප්‍රතිෂ්ඨා ඇති බව හඟවා ආස්වාද ජන වන පිණිස නිර්‍වාණයෙහි ආලය උපදවන පිණිස නිරොධ සත්‍ය ය තුන්වෙනි ව දෙසිත ය. මෙසේ නිර්‍වාණයට පැමිණෙන්නේ මේ ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ගයෙහැ යි කියා නිර්‍වාණාධිගමොපාය දක්වනු පිණිස සතරවැනි ව මාර්ගසත්‍ය ය දෙසිත ය යි මෙසේ චතු රාර්‍ය්‍ය සත්‍යයන්ගේ ක්‍රමයෙන් චිනිශව ය වෙදිතව්‍ය යි.

කියේ මෑ නෝ

භවසුඛස්සාද ගථිතානං වා සත්තානං සංවෙග ජනනත්ථං පඨමං දුක්ඛමාගතං. නෙව අකතා ආගච්ඡති. න ඉස්සර නිම්මානාදිතො හොති. ඉතො පන හොතීති ඤාපනත්ථං තදනන්තරං සමුදයං. තතො සහෙතුකෙන දුක්ඛෙන අභිභූතත්තා සංවිග්ග මානසානං දුක්ඛ නිස්සරණ ගවෙසීනං නිස්සරණ දස්සනෙන අස්සාස ජනනත්ථං නිරොධං. තතො නිරොධාධිගමත්ථං නිරොධ සම්පාපකං මග්ගන්ති. එවමෙත්ථ කතිතො විනිච්ඡයො වෙදිතබ්බො යි.

ජාති ආදිකං-යන්නෙහි විනිශ්චය කෙසේ ද යත්?

යෙ තෙ අරියසච්චානි නිද්දිසන්තෙන භගවතා, ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා මරණම්පි දුක්ඛං සොකා පරිදෙව දුක්ඛ දෙමනස්සුපායාසා පි දුක්ඛා අප්පියෙහි සම්පයොගෝ දුක්ඛා පියෙහි විප්පයොගෝ දුක්ඛා යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා'ති දුක්ඛනිද්දෙසෙ ද්වාදස ධම්මා සි.

දක්වන ලද බැවින් යම් ඒ ආර්‍ය්‍යසත්‍ය කෙණෙකුන් දෙසන්නා වූ බුදුන් විසින් ජාතිදුක්ඛ ය, ජරාදුක්ඛ ය, මරණදුක්ඛ ය, සොක දුක්ඛ ය, පරිදෙව දුක්ඛ ය, දුක්ඛදුක්ඛ ය, දෞර්මනස්‍ය දුක්ඛ ය, උපායාස දුක්ඛ ය, අප්‍රිය සම්ප්‍රයොග දුක්ඛ ය, ප්‍රිය විප්‍රයොග දුක්ඛ ය, කැමති දෙයක් නො ලැබීම දුක්ඛ ය, සංක්ෂෙපයෙන් පඤ්චුපාදානස්කන්ධ දුක්ඛ ය සි කියා දුක්ඛ සත්‍යයෙහි ද්වාදස ධර්‍මකොණෙකුන් වදාරණ ලදි.

යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා තත්‍ර තත්‍රාභිනන්දිනී. සෙය්‍යථීදං? කාම තණ්හා භවතණ්හා විභව තණ්හා'ති සමුදය නිද්දෙසෙ තිවිධා තණ්හා.

යනු හෙයින් යම් මේ තෘෂ්ණාවක් තොමෝ පුනර්භව ය කරණ සුලු වූ නන්දිරාග සංඛ්‍යාත සප්‍රීතික තෘෂ්ණා වූ ඒ ඒ ආත්ම භාවයෙහි ඒ ඒ අරමුණෙහි හෝ තෘෂ්ණා වූ සවභාව ඇත්තේ ද හෝ කවරක් වන්නී ද? කාම තෘෂ්ණාව ය භව තෘෂ්ණාව ය විභව තෘෂ්ණාව ය සි කියා සමුදය සත්‍යයෙහි ත්‍රිවිධ තෘෂ්ණා කොණෙකුන් වදාරණ ලදි.

යෝ තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධෝ චාගෝ පටිනිස්සග්ගෝ මුත්ති අනාලයෝනි, එවං නිරොධ නිද්දෙසෙ අට්ඨ තෝ එකමෙව නිබ්බාණං සි.

යනු හෙයින් යම්'මේ ත්‍රිවිධ තෘෂ්ණාවගේ යම් නිසෙසසයෙන් නො හැලි නැසීමෙක් ඇද්ද, නිසෙසසයෙන් හැරීමෙක් ඇද්ද, මිදීමෙක් ඇද්ද, ආලය නොකිරීමෙක් ඇද්ද, යන මේ තෘෂ්ණාවගේ හැරීම නිරොධ ය සි කියා අට්ඨ හෙයින් එක ම නිර්‍වාණ ය වදාරණ ලදි, "අයමෙව අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ සෙය්‍යථීදං? සම්මාදිට්ඨි—පෙ—සම්මාසමාධි"සි.

යනු හෙයින් සම්‍යක්දෘෂ්ටි ආදී වූ අෂ්ටධර්‍ම කොණෙකුන් මාර්ග සත්‍යයෙහි වදාරණ ලදි, මේසේ චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මයන්ගේ නිද්දේශයෙහි ජාති ආදි වූ ධර්‍මකොණෙකුන් වදාරණ ලදි, ඒ ජාති

ආදීන්ගේ නිශ්චය ද මේහි ලා විනිශ්චය වෙදිතව්‍ය යි යන අර්ථ යි. ඒ කවරේ ද? මේ ජාති ශබ්දය වනාහි අනෙකාර්ථ ඇත්තේ වෙයි. ඒ එසේ ම ය. "එකම්පි ජාතිං දෙවපි ජාතියෝ" යන තන්හි භව යෙහි ආයේ ය. "අත්ථි විසාඛෙ නිගණ්ඨා නාම සමණජාති"යි යන තන්හි නිකායෙහි ආයේ ය. "ජාති දඩ්ඪි ඛණ්ඩෙහි සංගහිතා"යි යන තන්හි සංඛ්‍යා ලක්ෂණයෙහි ආයේ ය. "යං භූතස්සුප්පත්තිසමිං පඤ්ඤං චිත්තං උප්පන්නං, පඤ්ඤා විඤ්ඤුණං පාතුභූතං, තදුපාදාය සාවස්ස ජාති" යන තන්හි ප්‍රතිසන්ධියෙහි ආයේ ය. "සම්පති ජාතෝ ආනන්ද බොධිසත්තෝ," යන මෙහි ප්‍රසූතියෙහි ආයේ යි. අසාකුතෝභා අනු පක්කුතෝභා ජාතිවාදෙන" යන තන්හි කුලයෙහි ආයේ ය. ඒ මේ ජාතිශබ්ද ය තෙමේ මෙහි ගර්භ සෙය්‍යකයන්ගේ ප්‍රතිසන්ධියෙහි පටන් යම් තාක් මව්කුසින් බිහිවීමක් ඇද්ද ඒ තාක් පැවති ස්කන්ධ යෙහි වැටෙයි" යනාදීන් විනිශ්චය කරණු

මේ ජාති තොමෝ කවර කාරණයකින් දුක් වන්නී ද යත්? අනෙක දුකකයට වසඟ වූ හෙයිනි. ඒ කවරේ ද? දුක්ඛ දුක්ඛ ය, විපරිණාම දුක්ඛ ය, සංඛාර දුක්ඛ ය, ප්‍රතිවිඡන්න දුක්ඛ ය, අප්‍රතිවිඡන්න දුක්ඛ ය, පර්‍යාය දුක්ඛ ය, නිෂ්පර්‍යාය දුක්ඛ ය යි කියා. එහි කායික, චෛතසික දුක්ඛයෝ වේදනා වශයෙන් ද සභාව වශයෙන් ද නාම වශයෙන් ද දුක් වූ හෙයින් දුක්ඛ දුක්ඛය යි කියනු ලැබෙත්. සුඛවේදනාවෙන් ද විපරිණාමයෙහි දුක්ඛතාපත්ති යට හේතුවන බැවින් විපරිණාම දුක්ඛ නම් වේ. උපේක්ෂා වේදනාව ද අවශෙෂ ත්‍රෛභූමික සංස්කාරයෝ ද උදයව්‍යය පීඩිත වන බැවින් සංස්කාර දුක්ඛ නම් වේ. කාම්ධාතු ය දන්නාතු රාගජ පරිළාහ දෙෂජ පරිළාහ දී කායික චෛතසික දුක්ඛ ය තෙමේ විවාරා දූනගත යුතු බැවින් ද, උපක්‍රමයට ද අප්‍රකට වන බැවින් ද ප්‍රතිවිඡන්න දුක්ඛ නම් වේ. ද්වත්තිංස කම්කරණාදීන් සමුට්ඨාන වූ ආබාධ ය තෙමේ තොවිවාරා ම දූනගතයුතු බැවින් ද උපක්‍රමයට ප්‍රකට වන බැවින් ද අප්‍රතිවිඡන්න දුක්ඛ නම් වේ. දුක්ඛ දෞර්මනස්‍යෝපායාස සඞ්ඛ්‍යාත දුක්ඛතත්‍ය ය තඹා දුක්ඛතත්‍ය විභඞ්ගයෙහි ජාතිපි දුක්ඛා යනාදීන් ආගත වූ ජාත්‍යාදි සෙසු සියල්ල ද ඒ ඒ දුක්ඛයට වසඟ භාවයෙන් පර්‍යාය දුක්ඛ නම් වෙයි. දුක්ඛය වනාහි නිෂ්පර්‍යාය දුක්ඛ නම් වෙයි.

කිසේ මැනෝ - විඤ්ඤාණාදීසුපි.

කසමා පන සා දුක්ඛාති වෙ අනෙකෙසා? දුක්ඛානං වත්ථු භාවතෝ අනෙකානි හි දුක්ඛානි. සෙය්‍යථිදං? දුක්ඛ දුක්ඛං විපරිණාම දුක්ඛං සංඛාර දුක්ඛං පටිවිඡන්න දුක්ඛං අපටිවිඡන්න දුක්ඛා පරියාය දුක්ඛං නිප්පරියාය දුක්ඛංති. තත්‍ථ කායික චෙතසික දුක්ඛ වෙදනා සභාවතෝ කාමතෝ ච දුක්ඛතත්තා දුක්ඛ දුක්ඛන්ති වුච්චන්ති. සුඛ වෙදනා විපරිණාමේ දුක්ඛුප්පත්ති

හෙතුතො විපරිණාම දුක්ඛං. උපෙක්ඛා වෙදනා චෙව අවසෙසා ච තෙභූමිකා. සංඛාරා උදයබ්බය පරිපීළිතත්තා සඞ්ඛාර දුක්ඛං. කණණසූල දන්තසූල රාගජ පරිළාහ දොසජ පරිළාහාදී කායික චෙතසිකො ආබාධො ප්‍රච්ඡේදා ජානිතබ්බතො, උපක්කමස්ස ච අපාකට භාවතො, පටිච්ඡන්න දුක්ඛං. දාත්තිංස කාමකරණාදි සමුට්ඨානො ආබාධො අප්‍රච්ඡේදා විජානිතබ්බතො උපක්කමස්ස ච පාකටභාවතො අපටිච්ඡන්න දුක්ඛං. ඨපෙත්වා දුක්ඛ දුක්ඛං, සෙසං දුක්ඛ සච්චනිද්දෙසො ආගතං. ජාත්‍යාදි සබ්බම්පි තස්ස තස්ස දුක්ඛස්ස වත්ථුභාවතො පරියාය දුක්ඛං. දුක්ඛ දුක්ඛං පන නිප්පරියාය දුක්ඛන්ති වුච්චති-සි.

අපි ච-මේ සඳ තෙම මවු කුස උපදිනු ලබන්නේ උත්පල ප්‍රණ්ඩරීකාදියෙහි උපදනා කෙසරු සෙසින් එහි උපදනේ ද නොවෙ සි. ආදි ශබ්දයෙන් මුක්තා මාණික්‍යාදී රත්නයෙක උප දනේ ද නොවෙ සි. කොතැනක උපදී ද යත්? ආමාසයෙන් යට පක්වාසයෙන් උපරිභාගයෙහි උදර පටල ය හා පිටසිකණ්ටක දෙදෙනාගේ මධ්‍යයෙහි පරම සම්බාධ වූ බොල් වූ ඇඳිරි ඇති පිත් සෙම් සූයා රුධිර පැසුනු ආහාර නො පැසුනු ආහාර යනාදී නානා ප්‍රකාර කුණප ගන්ධයෙන් පරිභාවිත වූ, අතිශයින් දුගීන්ධ වූ පවනින් හැසිරෙණ ලද අධි මාත්‍ර වූ ජිගුප්ඡා ජනක මාතෘ කුක්ෂි ප්‍රදෙශයෙහි පූතිමිත්සස්‍ය පූතිකුල්ලාස සඤ්ඤනිකායෙහි, ක්‍රිමියන්හු මෙන් උපදනේ ය. එසේ උපන් තැනැත්තෝ දසමාසයක් දවස් මව් කුස්හි සම්භවීමෙන් පත්‍ර පුටයෙහි හුයන බෙහෙදක් සෙසින් ද පිටි පිඬෙක් සෙසින් ද, දනු ලබන්නේ යටි හක්කෙහි තබන ලද සංකුචිත වූ හස්තාදිය ඇති ව උක්කුටුකයෙන් හිඳිනා බැවින් ආකුඤ්චන ප්‍රසාරණාදි රහිත වූ අධිමාත්‍ර දුක්ඛයක් අනුභව කෙරෙ සි. මේ ගර්භාවක්‍රාන්ති මූලක දුක්ඛ නම් වේ.

එසින් කිහ – විශුද්ධිමාර්ගයෙහි.

අයං හි සත්තො මාතුකුච්ඡිහි නිබ්බත්තමානො න උප්පල පදුම පුණ්ඩරීකාදිසු නිබ්බත්තති. අථ ඛො ගෙට්ඨා ආමාසයස්ස උපරි පක්වාසයස්ස උදර පටල පිට්ඨිකණ්ටකානං වෙමජ්ඣෙ පරම සම්බාධෙ, නිබ්බන්ධකාරෙ, නානා කුණප ගන්ධ පරිභාවිත පරම දුග්ගන්ධ පවන විවරිතෙ, අධිමත්ත ජෙගුච්ඡ කුච්ඡිපදෙසෙ, පූතිමච්ඡ පූතිකුම්මාස වඤ්ජනිකාසු, කිමි විය නිබ්බත්තති. සො තත්ථ නිබ්බත්තො දසමාසෙ මාතුකුච්ඡි සම්භවෙන උසමෙන පුට පාකං විය පචමානො, පිට්ඨ පිණ්ඩි විය සෙදියමානො. සම්මිඤ්ජන පසාරණාදි රහිතො, අධිමත්තං දුක්ඛං පච්චනුභොති ති – ඉදං කාව ගබ්භොක්කන්ති මූලකං දුක්ඛං සි.

යම් බඳු වූ ඔහු මව් තොමෝ වහා පැකිලෙන ගමන නිසීදන වූහුත් පරිවර්තනාදී අපේක්ෂාහරණ කාලයෙහි, සුරාධූර්ත හස්ත ගත දික්ලොම් ඇති එළුවෙකු මෙන් ද, අභිගුණ්ඨික හස්ත ගත සර්පපොතකයෙකු මෙන් ද, තමනට අනිමුඛ කොට ඇදීම් වශයෙන් ආකර්ෂණ විසින් ද, හාත්පසින් ඔබිනොබ අන් දැමීමෙන් පරිකර්ෂණ විසින් ද, අධොමුඛ කොට වලන ය කිරීමෙන් අව ධුනන විසින් ද, ඌර්ධ්ව මුඛ කොට වලන ය කිරීමෙන් නිර්ධුනන විසින් දැසි යනා දීන් විසින් උපක්‍රමයෙන් අධිමාත්‍ර වූ දුකඛානුභව කෙරෙ සි. මව සීතොදක පාන කාලයෙහි තරුණ ව්‍රණ සදෘශ වූ ඉතා සිවුමැලි වූ ගර්භගත ශරීර ය සඛලප වූ සීතාදියක් සමනොවන බැවින් සීත නරකයෙහි උපන්නාක් සෙසින්, උෂ්ණ වූ යාගු බත් ආදි ය අපේක්ෂා හරණ කාලයෙහි අඛභාව විශයෙන් වටකරණ ලද්දක්හු සෙසින්, ලුණු ඇඹුල් අපේක්ෂාහරණ කාලයෙහි සැනින් කෙදි හෙලා ලුණු ඇඹුල් ගල්වා කාරණ කාරාපන තර්ජකාදී කම් කරණ ප්‍රාප්ත යක්හු මෙන් තිව්‍ර වූ බොල් වූ දුකඛානුභව කෙරෙ සි. මේ ගර්භ පරිහරණ මූලක දුකඛ නම් වේ

කියේ මැනෝ

යං පන සො මාතු සහසා උපඝඨන ගමන නිසීදන වුට්ඨාන පරිවත්තනාදීසු සුරාධූත්ත හත්ථගතො එලකො විය අභිගුණ්ඨික හත්ථගතො සප්පපොතකො විය ච ආකඩ්ඪන පරිකඩ්ඪන ඔධුනන නිද්ධුනනාදී උපඝඝාතෙන අධිමත්තං දුකඛ මනුභවති. යඤ්ච මාතු සීතුදකපාන කාලෙ සීත නරකුපපන්නා විය, උණ්හ යාගු භත්තා දිනි අපේක්ඛාහරණ කාලෙ අඛභාවවුට්ඨි සම්පරි කිණෙණා විය ලොණම්බිලාදි අපේක්ඛාහරණ කාලෙ බාරාපනතර්ජකාදි කම්මකරණ පපත්තා විය නිබ්බං දුකඛමනුභොති. ඉදං ගබ්භ පරිහරණ මූලකං දුකඛං සි-

සබ්බයාගට මූසගර්භ ය සි කියන ලද සරස් වූ ගර්භ ඇති මාතෘවගේ මිත්‍රාමාත්‍ය ඥාතිජනයන් විසිනු දු අදර්ශනීය වූ දුකෙඛා තපතනි සථානයෙහි ඡේදන ඵාලනාදී විසින් යම් දුකඛයක් විඳුනා ලබනු ලද්දේ ද, මේ ගර්භ විපත්තිමූලක දුක් නම් වේ.

එසින් කිහ.

"යම්පනස්ස මූළ්හා ගබ්භාය මාතුයා මිත්තාමච්ච ඤාතිජාදීහි පි අදස්සනාරහෙ දුකඛුප්පත්තිට්ඨානෙ ඡේදන ඵාලනාදීහි දුකඛං උප්පජ්ජති. ඉදං ගබ්භ විපත්ති මූලකං දුකඛං" සි. විජායමාන මාතෘ සඞ්ඛ්‍යාත වදන්නා වූ මාතෘවගේ කම්ජ වාතයන් විසින්

උඤ්ඡ පාදව අධෝසිරොභාවයෙන් පෙරලා නරක ප්‍රපාතකයක් බඳු අති භයානක යොනි මානසයට පිළිපනු ලබන්නහුගේ හෙවත්, ප්‍රතිපාද්‍යමාන සත්වයාගට පරම සම්බාධ වූ යොනි මුඛයෙන් කාල චක්ඛල ය කුසල්වික්කා ඡද්ද ය සි කියන ලද කෙසි සිදුරකින් නික්මෙන්නා වූ දැතෙකුට මෙන් සංඝාත පඨිතයෙන් විවුණණීය මාන නිරිසතක් හට මෙන් යම් දුකක් උපදී ද - මේ විජායන මූලක දුක්ඛ නම් වේ.

එසින් කිහ.

යං විජායමානාය මාතුයා කම්මජෙහි වාතෙහි පරිවතෙතබ්බා නරකපපපාතකං ඉය අති භයානකං යොනිමඛං පටිපාතිය මානස්ස පරම සම්බාධෙන යොනි මුඛෙන කාලචක්ඛලෙන විය නික්කඛ්ඛිය මානස්ස මඛානාගස්ස නරක සහාතස්ස විය ව සංඝාත පබ්බතෙහි විවුණණීයමානස්ස දුක්ඛං උපපජ්ජති. ඉදං විජායන මූලකං දුක්ඛං සි.

ජාත සත්වයාගට අලුත් වණයක් වැනි ශරීර ඇත්තාහට අත් ගැසීමෙහි හෙවත් ඇලවීමෙහි නැහැවීමෙහි ධොවනයෙහි රෙදිකඩින් පරිමද්දනාදියෙහි හිදිකාවූ තුඹින් විදිනා බඳු ව කර මුවහතින් පලන බඳු ව යම් දුකඛයක් උපදී ද, මේ ගර්භයෙන් ඛනිනිස්ක්‍රමණ මූලක දුක්ඛ නම් වේ.

එසින් කිහ.

යං වා පන ජාතස්ස තරුණ වන සදිසස්ස සුකුමාර සරීරස්ස හත්ථගහණ නහාපන ධොවන වොළ පරිමජ්ජනාදි කාලෙ සුවිමුඛ ඛුරධාර විජ්ජන ඵාලන සදිසා දුක්ඛං උපපජ්ජේ - ඉදං මාතු කුච්ඡිතො ඛනිනික්ඛමණ මූලකං දුක්ඛං-සි.

එසින් මත්තෙහි ප්‍රවෘත්ති ය තමා ම තමහට වධකරනුවහට අවෙලකවුතාදී වශයෙන් ආතාපන ය සි කියන ලද හිර බලා සිටීම් ආදි විසින් විශෙෂයෙන් තැවි ම ය, පරිතාපන ය සි කියන ලද පඤ්චතාපනයෙන් හාත්පසින් තැවි ම ය. යන මේ අනුයොගයෙහි යුක්තයනට ක්‍රොධ වශයෙන් අහඤ්ඤමානයගට රජ්ජු විසින් උද්බඛ්ධ්‍ය මානයනට යම් දුකෙක් උපදී ද, මේ ආත්මොපක්‍රම මූලක දුක්ඛ නම් වේ.

එසින් කිහ.

යං තතො පරං පවත්තියං අත්තනාව අත්තානං වධෙන්තස්ස අවෙලකත්තාදි වසෙන ආතාපන පරිතාපනානුයොග මනුයුත්ත තස්ස කොධවසෙන අහඤ්ඤන්තස්ස උබ්බඛ්ඛන්තස්ස ව දුක්ඛං හොති- ඉදං අත්තූපක්කම මූලකං දුක්ඛං-සි.

අනුන් කෙරෙන් වධබන්ධනාදීන් අනුභව කරන්නාහට යම් දුකක්‌යෙක් උපදී ද, මේ පරෝපක්‍රම මූලක දුකය. ගර්භ පරිහරණ මූලක දුකය, ගර්භ ඕපත්ති මූලක දුකය, විජායන මූලක දුකය, ගර්භයෙන් බහිනිෂ්ක්‍රමණ මූලක දුකය, ආත්මෝපක්‍රම මූලක දුකය, පරෝපක්‍රම මූලක දුකය, යන මේ ආදී අනෙක දුකයන්ට මුල්වන හෙයින් ජාති දුකය නම් වේ.

ජරා දුකය නම් කවර යත්? ජරායෙන් ජීර්ණයාගේ අත් බැව ජරපත් සකටයක් සෙයින් බල රහිත වෙයි. ඉදිමී, සිටීමී, සක්මන් කිරීම් උදෙසා උත්සාහ කරන්නාහට ද, බලවත් වූ කාය දුකයෝ උපදින්. යම් කාරණයෙකින් ලදරු කාලයෙහි සූක්ෂම වූ සකවිෂය සුවයෙන් ගන්නට පොහොසත් වූ චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ ජරා ප්‍රාප්තයහට පරිපක්ව අලුලිත අවිසද වූයේ ඖදරික වූ සකවිෂය ග්‍රහණයට අසමර්ථ වේ ද, ඒ කාරණයෙන් පුත්‍රදාරාවන් පූජයෙහි මෙන් රක්ෂා කරන්නට අසමර්ථ වන්නාහට පුත්‍රදාරාවන් විසින් අවඥා කරණ බවට නිසිවන බැවිනු දු, දුකය දෞර්මනස්‍ය උපද්දි. මෙ සෙයින් අඞ්ග ප්‍රත්‍යඞ්ග ශෛථිල්‍ය ඉන්ද්‍රිය විකාර විරූපතා යෞවන විනාශ ය ඒයස්‍ය හානි සම්භෝග විප්‍රවාස පරිභවා දි අනෙක ප්‍රකාර වූ කායික චෛතසික දුකය උපද්දි. ජරා ව එයට ම වසතු වේ.

එසිත් කිහ.

අඞ්ගානං සිථිලීභාවා ඉන්ද්‍රියානං විකාරතෝ
යොබ්බනස්ස විනාසෙන බලස්ස උපඝාතතෝ,

විපපවාසා සතාදීනං පුත්තාදරෙහි අත්තනෝ
අපසාදනියතෝ වෙව භියෝ බාලත්ත පත්තියා.

පපෙපාති දුකඛං යං මවෙවා කායිකං මානසං තථා
සබ්බමෙතං ජරා හෙතු යසමා තසමා ජරාදුඛා-යි.

මේ සෙයින් ජරා දුකය දත යුතු යි. ජරාව මතු දුක් නොවෙයි. මරණ ය ද දුක් වන්නේ ය. මරණ ය නම් කිම යත්?

යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්ත නිකායා චුති චවනතා භෙදෙ අන්තරධානං මවවු මරණං කාල කිරියා ඛන්ධානං භෙදෙ කලෙබරස්ස නිකෙඛපෝ. ඉදං වුච්චති භික්ඛවෙ මරණං-යි.

යනුවෙන් වදාරණ ලද්දේ මරණ ය නම් වේ. මේ සෙයින් දක්වන ලද මරණ ය කවර හෙයකින් දුක්ඛී ය යත්? කායික දුකය යන්ට වසතු වූ හෙයින් දුකය නම් වේ.

එසින් කිහ.

පාපස්ස පාප කම්මාදි නිමිත්ත මනුපස්සතෝ
හද්දස්සෝපසහනතස්ස වියෝගං පියවත්ථුකං.

මියමානස්ස යං දුක්ඛං මානසං අවිසෙසතෝ
සබ්බසං චාපියං සත්ති බන්ධනවෙජ්දනාදිකං.

විතුජ්ජමානධම්මානං හොති දුක්ඛං සරීරජං
අසඤ්ඤ මප්පතිකාරං දුක්ඛස්සෙකස්සිදං යතෝ
මරණං වත්ථු තෙනෙතං දුක්ඛ මිවෙවව භාසිතං-සි.

මේ මරණ දුක්ඛයෙහි විනිශ්චය සි. සොක දුක්ඛ ය කෙසේ ද යත්?

කතමෝ ච භික්ඛවෙ සොකෝ? යෝ ඛෝ භික්ඛවෙ අඤ්ඤ තරඤ්ඤ තරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤ තරෙන දුක්ඛ ධම්මෙන ඵුට්ඨස්ස සොකෝ සොචනා සොචිතත්තං අන්තෝ සොකෝ අන්තෝ පරිසොකෝ- අයං වුච්චති භික්ඛවෙ සොකෝ-සි.

යනුවෙන් වදාරණ ලද්දේ සොක ය නම් වේ. සොක ය කුමක් හෙයින් දුක්ඛ ද යත්? සොක ය නම් ඤාතිව්‍යසනාදියෙන් සත්වයන්ගේ හෘදයට වැද වින්ධ සල්ලයක් සෙයින් වින්ධ පෙවූ හුලක් සෙයින් හෘදය විදියි. නැවත නුසංප්‍රාප්ත තප්ත නාරාව සෙයින් හෘදය දවයි. යම් කරුණෙන් ව්‍යාධි ජරා මරණාදී ප්‍රභෙද ඇති නෙකවිධ දුක්ඛ ය එළවා ද. කිසේ ද යත්? දුර්ලභ වූ ද සොක යෙන් වහා ජරාවට පැමිණෙන බැවින් සොක ය ම ජරා ව ද එළවයි. බලවත් සොකයෙන් අනීසාරාදී ව්‍යාධි වන බැවින් සොක ය ම ව්‍යාධි ය ද එළවයි. වෛපුල්‍යප්‍රාප්ත සොකයෙන් ලය පැලී මියන බැවින් සොක ය ම මරණ දු එළවන්නේ වේ ද, ඒ කාරණයෙන් සොක ය දුක්ඛ ය නම් වේ.

එසින් කිහ.

සත්තානං හදයං සොකෝ විස සල්ලංව භුජ්ජති
අග්ගි තත්තෙනාව නාරාවෝ භුසං ව ඩහතෙ පුන

සමාවහති ව ව්‍යාධි ජරා මරණ වෙදනං
දුක්ඛමපි විවිධං යස්මා තස්මා දුක්ඛොති වුච්චති.

මේ සොක දුක්ඛයෙහි විනිශ්චය සි. පරිදෙව ය කෙසේ ද යත්?

යෝ ඛෝ භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආදෙවෝ පරිදෙවෝ ආදෙවනා පරිදෙවනා ආදෙවිතත්තං පරිදෙවිතත්තං – අයං වුච්චති භික්ඛවෙ පරිදෙවෝ ති.

යනුවෙන් වදාරණලද්දේ පරිදෙව නම් වේ. පරිදෙව ය කුමක් හෙයින් දුක්ඛී ද යත්? සොක නමැති විෂ පිත සල්ලයෙන් විහත ව හඬනු ලබන්නා වූ සත්වතෙමේ යම් හෙයකින් කට දනනාවරණ ඵඟුරු වියලීම් වශයෙන් නො ඉවසි ය හැකි වූ අධිමාත්‍ර වූ යම් දුක්ඛයකට පැමිණේ ද, ඒ කාරණයෙන් පරිදෙව ය දුක්ඛ ය යි කියා බුදුන් විසින් වදාරණ ලදී.

එසින් කිහ.

යං සොක සල්ල විහතො පරිදෙවමානො
කණ්ඨෙඨාඨ තාලු ගල සොසජ්ජපපඤ්ඤහං
භියෝඛි මත්ත මධිගච්ඡති යෙව දුක්ඛං
දුක්ඛනති තෙන භගවා පරිදෙවමාහ-යි.

මේ පරිදෙව දුක්ඛයෙහි විනිශ්ච ය යි. දුක්ඛ ය නම් කවරහ යත්?

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං? යං ඛෝ භික්ඛවෙ කායිකං දුක්ඛං අසාතං කාය සම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං – ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛං—යි.

යනුවෙන් මහාසතිපට්ඨානයෙහි වදාරණලද්දේ දුක්ඛ ය නම් වේ. හේ කුමට දුක්ඛී ද යත්? දුක්ඛ ය නම් කායික දුක්ඛ ය. ඒ කායික දුක්ඛ ය පීළන ය කිරී ම ලක්ෂණකොට ඇත්තේ ය. දුර්ප්‍රාඥයන් ට දෞර්මනස්‍ය උපදවන බව කෘත්‍ය ය කොට ඇත්තේ ය. කායිකා බාධ ය ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේ ය. දුක්ඛ ය වනාහි දුක්ඛං දුක්ඛ ය හෙයින් ද සිතට දුක් එළවන හෙයින් ද දුක්ඛ නම් වේ.

එසින් කිහ.

දුක්ඛං නාම කායිකං දුක්ඛං තං කායපීළන ලක්ඛණං දුප්පඤ්ඤානං දෙමනස්සකරණ රසං කායිකාබාධ පච්චුපට්ඨානං දුක්ඛං පන දුක්ඛ දුක්ඛතො මානසං දුක්ඛාවහනතො ච-යි.

ව්‍යාපාද සම්ප්‍රයොගයෙන් රහතුන් අනගැමියන් බොධි සත්වයන්ට කායික වේදනාව සිත්හි දෞර්මනස් ඉපදවි ය නොහෙන බැවින් "දුප්පඤ්ඤානං දෙමනස්සකරණං" යි කිහ යි යෙත්. මේ දුක්ඛ යෙහි විනිශ්ච ය යි. දෞර්මනස්‍ය ය කෙසේ ද යත්?

කතමඤ්ච භික්ඛවෙ දෙමනස්සං? යං ඛො භික්ඛවෙ වෙතසිකං අසාතං මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං- ඉදං වුච්චති භික්ඛවෙ දෙමනස්සං—යි.

යනුයෙන් වදාරණලද්දේ දෞර්මනස්‍ය ය නම් වේ. හේ කුම කින් දුක් වී ද යත්? දෞර්මනස්‍ය ය නම් සිතට දුක් එළවන්නේ ය. ඒ දෞර්මනස්‍ය සිතට පිඩාකිරී ම ලක්ෂණකොට ඇත්තේ ය. සිත්හු වෙහෙස කාන්‍ය ය කොට ඇත්තේ ය. සිතට ව්‍යාධි එළවන බව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේ ය. දුක්ඛ ය වනාහි දුක්ඛ දුක්ඛ ය හෙයින් ද කායික දුක්ඛ ය එළවන හෙයින් ද චෛතසික දුක්ඛයෙන් සමන්විත වූයේ හිසකෙස් වනා හඬනි. ලෙහි අත් සපනි. ඇඹරෙනි. ආවතී න ය වෙනි. පෙරළෙනි. උර්ධ්වපාද ව හෙනි. තමාගේ ශරීර ය ඇත ගැන්මෙන් කොටා ගැන්මෙන් ශස්ත්‍ර එළවනි. නැසෙනු පිණිස විස කනි. රජ්ජුයෙන් උද්බන්ධන ය කෙරෙනි. ගින්නට ප්‍රවිෂ්ට වෙ නි. නා නා ප්‍රකාර දුක් අනුභව කෙරෙනි යි යනු දක්වන්නට කිහ.

දෙමනස්සං නාම මානසිකං දුක්ඛං තා චින්තපීළන ලක්ඛණා මනො විඤ්ඤාත රසං මානසං ව්‍යාධිපච්චුපට්ඨානං දුක්ඛං පන දුක්ඛ දුක්ඛතො කායික දුක්ඛාචානතො ච චෙතො දුක්ඛ සමප්පිතා හි කෙසෙ පකිරිය කන්දන්ති උරුනි පහිපිංසෙන්ති ආවටෙන්ති විව ටෙන්ති උද්ධපාදං පතන්ති සත්ථං ආහරන්ති විසං ඛාදන්ති රජ්ජුයා උබ්බන්ධන්ති අග්ගිං පවිසන්ති නි නානප්පකාරං දුක්ඛං අනු භවන්ති—යි.

මේ දෞර්මනස්‍යයෙහි විනිශ්චය යි. උපායාස ය කෙසේ ද යත්?

කතමො ච භික්ඛවෙ උපායාසො? යො ඛො භික්ඛවෙ අඤ්ඤ තරඤ්ඤ තරෙණ ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤ තරෙණ දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං- අයංවුච්චති භික්ඛවෙ උපායාසො යි.

යනුවෙන් වදාරණලද්දේ උපායාස නම්. ඒ කුමකින් දුක්වී ද යත්? උපායාස නම් ඤාතිව්‍යසනාදීන් පහරණු ලබන්නාහට අධි මාත්‍ර වූ චිත්ත දුක්ඛයන් උපයන ලද දොම නස්සාඛ්‍යාත ප්‍රතිඝ ය ම 'භූසමාදාන උපාදානං, යනුවෙන් 'භූසො ආයාසො'' යනාදීන් දක්වන ලද ඒ උපා යාස ය නෙමේ සිත දහඬන්‍ය කිරී ම ලක්ෂණ කොට ඇත්තේ ය. තත්තා බව කාන්‍ය ය කොට ඇත්තේ ය. විසාද බව ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේ ය. හෙතෙ ම චින්තපරිදහණාදි ය බැවින් දුක්ඛනම් වේ. දක්වන ලද මැයි.

චින්තස්ස පරිදහණා කායස්ස විසාදනා ව අධිමත්තං
යං දුක්ඛමුපායාසො ජනෙති දුතෙඛා තතො වුත්තෙනා-යි.

මේ උපායාසයෙහි විනිශ්ච ය යි. අප්‍රිය සම්ප්‍රයෝග ය නම් කෙසේ ද යත්? අප්‍රි ය සම්ප්‍රයෝග ය නම් අමිනාප සත්ත්වසංස්කාර යන් හා සමග සමොධාන ය හෙවත් එක්වීම ය. හේ අනිෂ්ට සමොධාන ය ලක්ෂණ කොට ඇත්තේ ය. චිත්තවිඝාත ය කෘත්‍ය ය කොට ඇත්තේ ය. අනඒ භාව ය වැටහීම් කොට ඇත්තේ ය. දුකඛයට වසතු බැවින් දුකඛ ය නම් වෙයි.

එසින් කිහ.

දිසවා ව අපපියෙ දුකඛං පඨමං හොති චෙතසි
තදුපකඛම නමනුත මථ කායෙ යතො ඉධ
ත්තො දුකඛඤව යසසාපි වඤ්ඤතො සො මහෙසිනා
දුකෙඛා වුත්තොනාති විඤ්ඤුයේ‍යා අපපියෙහි සමාගමො-සි.

මේ අප්‍රිය සම්ප්‍රයෝගයෙහි විනිශ්ච ය යි. ප්‍රිය විප්‍රයෝග ය නම් කිම යත්? ප්‍රිය විප්‍රයෝග ය නම් මිනාප සත්ත්වසංස්කාරයන් කෙරෙන් වෙන්වන බව ය. හෙතෙම ඉෂ්ට වසතුහුගේ වෙන්වී ම. ලක්ෂණ කොට ඇත්තේ ය. සොකොත්පාද ය රසකොට ඇත්තේ ය. ව්‍යසන ය ප්‍රත්‍යුපසථා න ය කොට ඇත්තේ ය. සොක දුකඛයට වසතු වූ හෙයින් හෙ ද දුකඛ නම් මේ.

එසින් කිහ.

ඤාතිධනාදි වියොගා සොකසර සමපපිතා විතුජජන්
බාලා යතො තතොයං දුකෙඛානි මතො පියවියොගො-සි.

මේ ප්‍රිය විප්‍රයෝගයෙහි විනිශ්ච ය යි. යම් කැමති දෙයක් නොලැබී ම කෙසේ ද යත්? මෙහි වනාහි-

කතමඤව භික්ඛවෙ යම්පිච්ඡං න ලභති තම්පි දුකඛං-ජාති ධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති. අහො වත මයං න ජාති ධම්මා අස්සාම න ව වත නො ජාති ආගචේඡය්‍යා ති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබබං ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුකඛං. ජරාධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති. අහො වත මයං න ජරාධම්මා අස්සාම නව වත නො ජරා ආග චේඡය්‍යා ති. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබබං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුකඛං. ව්‍යාධි ධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති. අහො වත මයං න ව්‍යාධි ධම්මා අස්සාම් න ව වත නො ව්‍යාධි ආගචේඡය්‍යානි. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබබං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුකඛං. මරණ ධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති. අහො වත මයං න මරණ ධම්මා අස්සාම් න ව වත නො මරණං ආගචේඡය්‍යා ති. න ඛො පනෙ තං ඉච්ඡාය පත්තබබං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුකඛං.

සොක ධම්මානං නිකඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති. අහො වත මයං න සොක ධම්මා අස්සාම. න ච වත නො සොකො ආගචේඡය්‍යාති-පෙ-දුකඛං. පරිදෙව ධම්මානං නිකඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති. අහො වත මයං න පරිදෙව ධම්මා අස්සාම න ච වත නො පරිදෙවෝ ආගචේඡය්‍යාති—පෙ—දුකඛං දුකඛ ධම්මානං නිකඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති. අහො වත මයං න දුකඛ ධම්මා අස්සාම් න ච වත නො දුකඛං ආගචේඡය්‍යාති —පෙ— දුකඛං. දොමනස්ස ධම්මානං නිකඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති.අහො වත මයං න දොමනස්ස ධම්මා අස්සාම් න ච වත නො දොමනස්සං ආගචේඡය්‍යාති—පෙ—දුකඛං. උපායාස ධම්මානං නිකඛවෙ සත්තානං එවං ඉච්ඡා උපපජ්ජති. අහො වත මයං න උපායාස ධම්මා අස්සාම් න ච වත නො උපායාසෝ ආගචේඡය්‍යාති. න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදමපි යම්පිච්ඡං න ලභති තම්පි දුකඛං.

යනුවෙන් වදාරණ ලද්දේ යම් කැමති දෙයක් නොලැබී ම යන්නෙහි විභාග ය යි. හෙ ද අලභ්‍යමාන වස්තූනුගේ කැමති වීම ලක්ෂණ කොට ඇත්තේ ය. ඒ අලභ්‍යමාන වස්තු ව පර්‍යේෂන ය කිරීම් කෘත්‍ය ය කොට ඇත්තේ ය. ඔවුන්ගේ අසම්ප්‍රාප්ත වීම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේ ය දුකඛයට වස්තු නොයෙන් නෙ ද දුක් නම් වේ.

ඒසින් කිහ.

තං තං පත්ථය මානානං තස්ස තස්ස අලාභතො
යං විඝාතමයං දුකඛං සත්තානං ඉධ ජායති
අලබ්භනෙයය වත්ථූනා පත්ථනා තස්ස කාරණං
යස්මා තසමා ජිනෝ දුකඛං ඉච්ඡිතා ලාභමිබ්‍රැව්-සි.

මේ ඉච්ඡිතාලාභයෙහි විනිශ්ච ය යි. සංක්ෂෙපයෙන් පඤ්චු පාදානක්ඛන්ධ දුකඛ ය කෙසේ ද යත්?මේ සත්‍ය නිදේශයෙහි ජාතිය ප්‍රභෘති කොට යම් දුකඛයෙක් කියන ලද්දේ ද-දුකඛකඛන්ධ පාලි ය පණ්ඩිත සූත්‍රාදියෙහි ඒ කියන ලද ද, මෙහි සවරූපයෙන් නො කියන ලද ද යම් දුකඛයෙක් ඇද්ද ඒ සියලු දුකඛය ම උපාදානස්කන්ධ යන් හැර නො ලැබෙ යි. යම් කාරණයෙනින් සංක්ෂෙපයෙන් උපාදානස්කන්ධයන් කෙරෙන් මේ දුකඛයෝ වෙද් ද ඒ කාරණ යෙන් දුකඛ සත්‍ය ය දෙශනා කරණ බුදුන් විසින් උපාදානස්කන්ධ ය යි වදාරණ ලද්දේ ය යි යනු දක්වන්නට කිහ.

ජාතිපභූනිං දුකඛං යං වුත්තමිද තාදිනා
අවුත්තං යඤ්ච තං සබඛං විනා එතෙ න විජ්ජති
යස්මා තසමා උපාදානකඛන්ධා සංඛෙපතො ඉධ
දුකඛානි වුත්තා දුකඛඤ්ච දෙසකෙන මහෙසිනා-සි.

මෙහි පඤ්චසඤ්ඤා ය නම්-

භූතපසාද විසයා භාවෝ හදයම්චචපි,
ජීවිතාහාරරූපෙහි අට්ඨාරස විධං තථා හි.

යනු හෙයින් සන්‍නිබ්ධ ලක්ෂණ වූ පෘථිවිධාතු ය ද්‍රව ලක්ෂණ වූ ආපොධාතු ය උෂ්ණත්ව ලක්ෂණ වූ තේජොධාතු ය චලන ලක්ෂණ වූ වායෝ ධාතු ය යන භූතරූප ය. රූපදර්‍ශනයට කාරණ වූ චක්ෂුඃප්‍රසාද ය ශබ්දශ්‍රවණයට කාරණ වූ ශ්‍රොත්‍රප්‍රසාද ය ගන්ධ ඝ්‍රාණයට කාරණ වූ ඝ්‍රාණප්‍රසාද ය රසාස්වාදයට කාරණ වූ ජිව්හාප්‍රසාද ය ස්පර්‍ශග්‍රහණයට කාරණ වූ කායප්‍රසාද ය යන ප්‍රසාද රූප ය. චක්ෂුවට ගොවර වූ රූපාලම්බන ය ශ්‍රොත්‍රයට ගොවර වූ ශබ්දාලම්බනය ඝ්‍රාණයට විෂය වූ ගන්ධාලම්බනය ජිව්හාවට විෂය වූ රසාලම්බන ය කායෙන්ද්‍රියයට විෂය වූ ස්පර්‍ශාලම්බන ය යන විෂය රූපයෝ ය. සන්‍නිභාව ය ප්‍රරූඪභාව ය මනොධාතු මනොවිඤ්ඤාණ ධාතූන්ට ආධාර වූ හෘදය වස්තුව ය දෙහසපිනියට කාරණ වූ රූපජීවිතෙන්ද්‍රිය ය ශරීර ය පවත්නා වූ ඕජාරූප ය යන මේ අටළොස් වැදෑරුම් වූ රූපයෝ රූපස්කන්ධ ය නම් වේ.

ඉෂ්ටානුභවන ලක්ෂණ වූ සුඛ වෙදනාව ය අනිෂ්ටානුභවන ලක්ෂණ වූ දුක්ඛ වෙදනාව ය මධ්‍යස්ථානුභවන ලක්ෂණ වූ උපෙක්ෂා වෙදනාව ය යන වෙදනාත්‍රය වෙදනාස්කන්ධ ය නම් වේ. රූපාදී අරමුණු ඇදින ගැන්ම සවභාව කොට ඇති සංඥව සංඥාස්කන්ධ නම් වේ.

සංඛාරෝ වෙතනා එසෙසා මීනක්ඛාරෝ සුසණ්ඨිති
තක්කෙකා වාරෝ ව වායාමෝ පිතිඡන්දෙධි මොක්ඛතා
සද්ධා සති හිරොත්තපපං චාගෝ වෙත්තා මති පුන
මජ්ඣත්තතා ව පස්සද්ධි කායචිත්තනවසා දුවෙ.

"ලහුතා මුදුකම්මඤ්ඤ පාගුඤ්ඤමුජුත්තා තථා
දයා මුදු මිච්ඡාව කම්මනතා ජීවසංවරෝ
ලොභෝ දෙසෝ ව මොහෝ ව දිට්ඨි උද්ධච්චමෙව ච
අහිරික මනොත්තපපං විවිකිච්ඡිත මෝව ච.

මානෝ ඉස්සා ච මච්ඡා ච කුක්කුච්චං ථීනමිද්ධිකං,
ඉති එතානි පඤ්ඤස සංඛාරක්ඛන්ධ සඤ්ඤිතා.

යනු හෙයින් සංස්කාර ය වෙතනාව ය ස්පර්‍ශ ය මනස්කාර ය අරූප ජීවිතෙන්ද්‍රිය ය එකාග්‍රතාව ය විතර්‍ක ය විචාර ය

වීර්‍ය්‍ය ය ප්‍රීති ය ඡන්ද ය අධිමොක්ෂ ය ශ්‍රද්ධාව ය සමෘති ය හිරි ය ඔත්තප්ප ය අලොභ ය අදොෂ ය අමොහ ය තත්‍රමධ්‍යස්තතාව ය කායප්‍රශ්‍රබ්ධි චිත්තප්‍රශ්‍රබ්ධි දෙදෙන ය කායලඝුත්ව චිත්ත ලඝුත්ව දෙදෙන ය කායමෘදුත්ව චිත්තමෘදුත්ව දෙදෙන ය කායකර්මණ්‍යතා චිත්ත කර්මණ්‍යතා දෙදෙන ය කායප්‍රාගුණ්‍යතා චිත්තප්‍රාගුණ්‍යතා දෙදෙන ය කාය ඍජුතා චිත්ත ඍජුතා දෙදෙන ය කරුණාව ය මුදිතාව ය සම්‍යක්වාචා ය සම්‍යක් කර්මාන්ත ය සම්‍යක් ආජීව ය ලොභ ය ද්වේෂ ය මොහ ය මිථ්‍යා දෘෂ්ටි ඖද්ධත්‍ය ය අහිරික ය අනොත්තප්ප ය මාන ය ඊර්ෂ්‍යාව ය මාත්සර්‍ය්‍ය ය පශ්චාත්තාප ය ථින ය මිද්ධ ය යන මේ පණස් චෛතසික ධර්මයෝ සංස්කාරස්කන්ධ නම් වේ.

විඤ ය විජානන ලක්ෂණයෙන් එකවිධ වූ කුසලාකුසල අව්‍යාකෘත වශයෙන් ත්‍රිවිධ වූ කාමාවචර රූපාවචර අරූපාවචර ලොකොත්තර වශයෙන් චතුර්විධ වූ වෙදනා ඤත සංස්කාරාදි භෙදයෙන් එකුන් අනුවක් පමණැති චිත්ත ය විඥානස්කන්ධ නම් වේ. මේ පඤ්චස්කන්ධයෙහි—

> චෙනපිණ්ඩූපමං රූපං වෙදනා බුබ්බුළූපමා,
> මරීචිකූපමා සඤ්ඤා සංඛාරා කදලූපමා
> මායූපමං ච විඤ්ඤාණං දෙසිතා දිච්චබන්ධූනා.

යනු නෙසින් රූපස්කන්ධ ය පෙණ පිඩකට බඳු වූ උපමා ඇත්තේ ය. වෙදනාස්කන්ධ ය දිය බුබුලකට බඳු වූ උපමා ඇත්තේ ය. සංඥස්කන්ධ ය මහ අව්වෙහි පෙණෙන මිරිඟු දියට බඳු උපමා ඇත්තේ ය. සංස්කාරස්කන්ධ ය කෙහෙල් කඳකට බඳු උපමා ඇත්තේ ය. විඤ්ඤාණස්කන්ධ ය ඉන්ද්‍රජාලයකට බඳු වූ උපමා ඇත්තේ සි.

රූපස්කන්ධ ය පෙණපිඩක් වැනි වූයේ කෙසේ ද? යම් සේ පෙණපිඩෙහි කිසි සාරත්වයක් නැත්තේ ද, එයින් පාත්‍රයක් හෝ තලු තැටියක් හෝ වීත් පලින් ආදි වූ කිසිවක් හෝ කරම්හ සි ඇරගත නො හැක්කේ ද, ගත ත් එ බඳු වැඩක් සිදු නො කොට බිඳී යන්නේ ද, එ මෙන් රූපස්කන්ධ ය ද නිත්‍ය යසි කියා ව ත් ධ්‍රුව ය සි කියාව ත් මම ය මාගේ ය කියාව ත් නුවණින් සිතා ගත නො හැක්කේ වේ. තව ද-යම් සේ පෙණපිඩ සිදුරු වී නොයෙක් සැඩ දක්වා බොහෝ දියබරණ ඇටමැඩි කොඩයින් ආදි වූ නොයෙක් ප්‍රාණීන් ලඟිනා තැන් වේ ද එ පරිද්දෙන් ම රූපස්කන්ධ ය මුඛනාසිකාදි කුඩා මහත් සිදුරු හා නොයෙක්

ඇට නහර සැඩි ගැලවී තත් කෝට ය ගණ්ඩුප්පාද ය නාලනිර ක ය සුවි මුඛ ය පටතන්තු සූත්‍ර ය යනාදී වූ අසූ කුලයක පණු වන්ට ලගිනා ගේ න් වේ ද, දරු වදනා ගේ න් වේ ද වැසිකිළි ය න් වේ ද නාන ගෙය න් වේ ද ගිලාන ගෙය න් වේ ද, සුසාන යන් වේ ද යම් සේ පෙණ පිඩක් ආදියෙන් දෙඛර ගෙණියක් පමණ ඇති ව අනුක්‍රමයෙන් ගඞ්ගාවර්තී වූ සමුද්‍රාදියෙහි පර්වතකූට පමණ ත් මහත් වේ ද එ පරිද්දෙන් රූපස්කන්ධය ද පළමුවෙන් මාතෘකුක්ෂියෙහි හිමාලයෙහි හුණපුපුලු නම් ප්‍රාණියක්හු ගේ උදර රෝමයක් ප්‍රසන්න තල තෙල ගලා සත් විටක් ගැසූකල සත් වෙනි වාරයෙහි රොමාග්‍රයෙහි සිටි තෙල් බින්දු පමණ වූ කලල රූපයක් ඇති වේ.

ඒ කලල රූපයෙහි ප්‍රතිසන්ධි විත්ත ය දටහනී. මේසේ හටගත් ඒ ප්‍රතිසන්ධි විත්තයට අනතුරුව භවාඞ්ග සින් තුදු සෙක් පහළ වේ. ඊට අනතුරුව මනොද්වාරාවර්ජන ය පහළ වේ. ඊට අනතුරුව ජන්මයෙහි සන්තොෂ උපදවමින් ආත්ම ග්‍රහණ ය කරමින් ලොභ සම්ප්‍රයුක්ත සින් පහළ වේ. මේසේ ඇතිවූ පහත් තලතෙලින්තක් වැනි වූ ඒ පූර්වොක්ත වූ කලල රූපය ක්‍රමයෙන් වැඩී සතියක් ගිය කල්හි මස් දෙවි දියන්තක් වැනි වූ අර්බුදවස්ථාවට පැමිණේ. දෙසතියක් ගියකල්හි මේ අර්බුදවස්ථාවෙන් පෙරලී බොල්කොට පසු ලතුදියන්තක් වැනි පෙශි අවස්ථාවට පැමිණේ තුන් සතියක් ගියකල්හි මේ පෙශි අවස්ථාවෙන් පෙරලී මුරුතමල් කැකුලක් වැනි ඝන අවස්ථාවට පැමිණේ. සිව් සතියක් ගියකල්හි සේදූ මස්කැටියෙක නැහි පස්පොළක් මෙන් දෙ අත දෙ පය ඉස තේරී ප්‍රශාඛාවස්ථාවට පැමිණේ

ඉක්බිති පස්වෙනි සතියෙහි පටන් එකොළොස්වන සතිය දක්වා මේ දෑතුරෙහි අතුල්-පතුල්-ඇඟිලි-ඇස්-මුඛ-කන්-නාසා පසමග වසමග ආදිය ද ඉතා සූක්ෂම වූ ඇට ද ඉසකෙස් ද වෙර ලොම් ද හටගෙණ ක්‍රමයෙන් වැඩී සම්පූර්ණ ව බඹයක් පමණ වේ. ගව මහිස හස්ත්‍යස්වාදීන්ගේ ශරීර වශයෙන් පර්වත කූට ප්‍රමාණ වේ. මහමුහුදු මස් කැස්බන්ගේ වශයෙන් තොයෙක් සිය ගණන් යොදුන් පමණ වේ. තව ද-යම් සේ පෙණ පිඩ හටගත් කෙණෙහි න් නැසෙන්නේ ද මදක් තැන් ගොසි නු ත් නැසෙන්නේ ද මුහුදට ගියකල ඒකාන්තයෙන් ම නැසෙන්නේ ද එ මෙන්, රූපස්කන්ධය ද කලලාවස්ථාවෙහි ත් නැසෙන්නේ ය. අර්බුදවස්ථාවෙහි ත් නැසෙන්නේ ය. පෙශි අවස්ථාවෙහි ත් නැසෙන්නේ ය ඝන අවස්ථාවෙහි ත් නැසෙන්

නේ ය. ප්‍රසාදාදි අවස්ථාවෙහි ත් නැසෙන්නේ ය. මවු කුසින් බිහි වූ කල්හි ත් නැසෙන්නේ ය. මන්ද දසකයෙහි ත් නැසෙන්නේ ය. ස්ත්‍රීඛා දසකයෙහි ත් නැසෙන්නේ ය. වණ් දසකයෙහි ත් නැසෙන්නේ ය. බල දසකයෙහි ත් නැසෙන්නේ ය. ප්‍රඥ දසකයෙහි ත් නැසෙන්නේ ය. ආයන දසකයෙහි ත් නැසෙන්නේ ය. ප්‍රාග්භාර දසකයෙහි ත් නැසෙන්නේ ය. ප්‍රවංක දසකයෙහි ත් නැසෙන්නේ ය. මොමූඛ දසකයෙහි ත් නැසෙන්නේ ය. සයන දසකයෙහි ත් නැසෙන්නේ ය.

මේ අතර නොනැසී සිටියේ වී නමුත් සතාගුප්තකයන් ගේ රූපය අවුරුදු සියයක් පිරුණුකල ඒකාන්තයෙන් බිඳේ මරුමුඛයට පැමිණ සුණු විසුණු වේ. එ හෙයින් බුදුහු රූපස්කන්ධය පෙණපිඬකට බඳු වූ උපමා ඇත්තේ ය යි වදාළ සේකි.

වේදනාස්කන්ධය දිය බුබුලක් බඳු වූ යේ කෙසේ ද? යම් සේ දියබුබුල කිසි සාරවතයක් නැත්තේ දුම්ල ද ඇරගත නොහැක්කේ ද එයින් ඵලකයක් හෝ ආසනයක් හෝ අඞ්ගුළිමුද්‍රිකාවක් හෝ කණිහුඡණයක් හෝ කොට ගත නොහැක්කේ වේ ද, එ මෙන්-වේදනාව ද අසාර ය දුම්ල ය නිත්‍ය ය ධ්‍රුව ය යි සිතාගත නොහැක්කේ වේ. ගත ත් එ ලෙස සථිර ව නොසිටී. තව ද-යම් සේ ඒ දිය බිඳුවෙන් නැංගා වූ බුබුලු එතන එතන ම නැසෙන්නේ බොහෝ කලක් සිටින්නේ නොවෙ යි. එ පරිදි දෙන් එක අසුරාසනක් පමණ කල්හි නොයෙක් කෙළ ලක්ෂ ගණන් සුඛ දුක්ඛොපෙක්ෂා වේදනා පහළ ව නැසෙන්නේ වේ. තව ද-යම් සේ දියබුබුල දියපිට නැඟී ධූලි මල දියබිඳු දියරොම් එකතැන්කොට දුවාන කරඹු පියනක් මෙන් වටකොට ගන්නා වායුව ය යි යන කාරණා සතරකින් ඇති වේ ද එ පරිදිදෙන් ම වේදනාව ද චක්ෂුඃප්‍රසාදාදී වස්තුව ය රූපාදි ආලම්බන ය ලොභාදී කෙලසමල ය චක්ෂුස්පශීාදී ස්පශී ඝට්ටන ය යන සතර කාරණයන් නිසා පහළ වේ.

එ හෙයින් බුදුහු වේදනාස්කන්ධය දියබුබුලත් හා සදෘශ ය යි වදාළ සේකි.

සංඥස්කන්ධය මිරිහුදිය හා සදෘශ වූ යේ කෙසේ ද? යම් සේ ග්‍රීෂ්ම කාලයෙහි මහ අවිවෙහි පෙණෙන මිරිහුදිය චක්ඛුපථ ව මහවතුරක රළ ගසන්නා සේ පෙණේ ද, එ මෙන්, නිල් පැහැ ය රත්පැහැ ය යනාදින් සළකුණු ගන්නා සඤ්ඤාව ද අනුභව පිණිස පොපි ගනී. තව ද-යම් සේ මිරිහු දිය පිරුණු පොකුණත් මෙන් පෙණී පිපාසාවෙන් පීඩිත වූ මෘගයන් වඤ්චාකෙරේ ද

එ මෙන් ම, මේ නිල්වන් රූප ය මේ රන්වන් රූප ය මේ සම්වන් රූප ය සුභ ය මනාප ය සැප ය නිත්‍ය ය යි ප්‍රශංසා කරවා සඤ්ඤා යන් වඤ්චා කෙරෙ යි. එ හෙයින් බුදුහු සංඥස්කන්ධ ය මිරිකුදිය හා සමාන ය යි වදාළ සේකි.

සංස්කාරස්කන්ධ ය ද අසාර නිස්සාරාර්‍ථයෙන් කදලිස්කන්ධයක් හා සදෘශ වේ. යම් සේ කෙනෙල්කඳින් කිසිවක් ගෙණ ගොනැස් පලහත් පට්ටිකාදී වූ කිසි ගෘහකර්‍මාන්තාදියක් කොට ගත නො හැකි වේ ද ගත ත් ඵලිර ව නොසිටී ද, එ පරිද්දෙන්, සංස්කාරයෝ ද නිත්‍ය ය ධ්‍රුව ය මම ය මාගේ ය යි ග්‍රහණ ය කටයුත්තාහු නො වෙ ත්. තව ද-යම් සේ කදලිස්කන්ධ ය බොහෝ පතුරුවැඩී සමූහ වේ ද, එ පරිද්දෙන්, සංස්කාරස්කන්ධය බොහෝ ධර්‍ම රාශියෙක් වේ තව ද-යම් සේ කදලිස්කන්ධයෙහි පිටපතුරු වෙන පැහැයෙක් වේ ද ඇතුළු පතුරු ත් ක්‍රමයෙන් වෙන ආකාර ඇතිවේ ද, එ පරිද්දෙන් වෙඤ්ඡා ස්පර්‍ශාදි නා නා සවභාව ඇති සම්පණස් ධර්‍මයෝ එක් ව සංස්කාරස්කන්ධ නම් වේ. එ හෙයින් බුදුහු සංස්කාරස්කන්ධ ය කදලිස්කන්ධයක් හා සදෘශ ය යි වදාළ සේකි.

විඥානස්කන්ධ ය ද අසාරාර්‍ථයෙන් ඉන්ද්‍රජාලයක් වැනි වේ. හේ කෙසේ ද යත් ? යම් සේ ඉන්ද්‍රජාල ය මදකල් පැවත ඉතා ශීඝ්‍ර ව නැති වේ ද ඊට වඩා සහසහස්‍ර ගුණයෙන් චිත්ත ය ම සවල්ප කාලයක් පැවත නැසෙන්නේ වේ ද එක ම චිත්ත යෙන් පුරුෂයා ආයේ ය. ගියේ ය. සිටියේ ය. උන්නේ ය යි වැටහෙන්නේ ය. එන කල්හි වෙන සිතෙක් වේ. යන කල්හි වෙන සිතෙක් වේ. සිටින කල්හි වෙන සිතෙක් වේ. භිදිනා කාලාදියෙහි ද වෙන වෙන සිත් වෙත්. තව ද— යම් සේ ඉන්ද්‍රජාල ය මහජනයා වඤ්චිතකොට කැටකැබි ලිති ආදී කිසිවක් රත් රිදී මිණි මුතු ය යි ග්‍රහණ ය කරවා ද එ පරිද්දෙන් මේ විඥානස්කන්ධ ය නම් වූ චිත්තය ත් එක ම චිත්තයෙන් ආවාක් මෙන් ගියාක් මෙන් සිටියාක් මෙන් උන් නාක් මෙන් සත්ත්වයන් වඤ්චා කෙරේ. එ හෙයින් බුදුහු මේ විඥානස්කන්ධ ය ඉන්ද්‍රජාලයකට බඳු උපමා ඇත්තේ ය යි වදාළ සේකි.

තව ද—

රාශිවත් සාර්‍ථවෙවව චක්‍රවත් මුෂ්ටි වත්තථා,
සකක්‍රෙඡ පඤ්චඡ ප්‍රාඥෙ රාතම ගබ්දඃ ප්‍රගීයතෙ.

කියා ඡ්‍රිදගීතසඞ්ග්‍රහ නම් වූ බෞද්ධ තන්ත්‍රයෙහි කී බැවින් රාශි වත්, ධාන්‍යරාශි ය ගවරාශි ය මුද්ගරාශි ය යි කී කල ධාන්‍ය

යම් මුද්ගයන් හෝ අන් රාශියක් නැත්තාක් මෙන් ද; සාඪ්‍ය වන්, ජංඝසාඪ්‍ය සකටසාඪ්‍ය යි කී කල ගැල් ගොන් බඩු පොදි වණික් ජනයා හැර අනික් සාර්ථ ය යි යන දෙයක් නැත්තාක් මෙන් ද; චක්‍රවත්, අලාතචක්‍ර ය රථචක්‍ර ය කුලාලචක්‍ර ය යි කී කල මණ්ඩලාකාරයෙන් වලල්ලක් මෙන් වට ව ගිය ගිනිපෙනෙල්ලක් පෝරුකඹ විනා අන් චක්‍ර ය යි යන දෙයක් නැත්තාක් මෙන් ද; මූර්ධිවත්, මිට ය යි කී කල අකුලුවාගත් කල ඇඟිලිපසට මිට ය යි යන ව්‍යවහාරමුත් ඇඟිලි හැර මිට ය යි යන අන් වස්තුවක් නැත්තාක් මෙන් ද; සකායෙඛ්‍ය පඤ්චස්කන්ධ, රූප වේදනා සංඥා සංස්කාර විඥාන ය යන පඤ්චස්කන්ධයෙහි; ආත්ම ශබ්දය, ආත්ම ශබ්ද ය යන ව්‍යවහාර ශබ්ද මාත්‍රයෙක්; ප්‍රාඥයෝ, නුවණැත්තන් විසින්; ප්‍රඥයනෙ, කියනු ලැබේ. නෙවත් ව්‍යවහාර කරණු ලැබේ. එ හෙයින් මේසේ සවභාව ධර්මරාශි මාත්‍ර වූ ආත්ම ආත්මී ය ශූන්‍ය වූ සස්කන්ධපඤ්චකයෙහි මම ය මාගේ ය යන විපරීත ග්‍රහණ ය නොකටයුත්තේ ය යි සමෙමාහවිනොදනී විභඞ්ගාර්ථ කථා නම් වූ අටුවායෙහි කියනලද මැ යි.

නිඝෙය ය හි.

තත්‍ථ රූපාදීනං ඵෙණපිණ්ඩාදීහි එවං සදිසතා වෙදිතබ්බා. යථා හි, ඵෙණපිණ්ඩෝ නිස්සාරෝ ව – එවං රූපම්පි නිච්චසාර ධ්‍රුවසාර අත්තසාර විරහෙන නිස්සාර මෙව. යථා ච සෝ ඉමිනා පත්තා වා ථාලකං වා කරිස්සාමීති ගහෙතුං න සක්කා. ගහිතෝ පි තම්හත්‍ථං න සාධෙති භිජ්ජතෙ ව. එවං රූපම්පි නිච්චන්ති වා ධ්‍රුව න්ති වා මම න්ති වා ගහෙතුං න සක්කා. ගහිතම්පි න තථා තිට්ඨති. අනිච්චා දුක්ඛං අනත්තා අසුභඤ්ඤ ව හොති‘ති එවං ඵෙණපිණ්ඩසදිසමේ ව හොති යථා වා පන ඵෙණපිණ්ඩෝ ඡද්ධුවස්සදෙ, අනෙකසඞ්ඝ ඝටිතෝ බහූනං උදකසපපාදීනං පාණානං ආවාසෝ, එවං රූපම්පි ඡද්ධුවස්සදං අනෙකසඞ්ඝඝටිතං කුලවසෙනෙවෙත්‍ථ අසිනි කිමිකුලානි වසන්ති. තදෙව තෙසං සූනිඝරම්පි වච්චකූටි පි ගිලානසාලා පි සුසානම්පි න තෙ අඤ්ඤත්‍ථ ගන්ත්වා ගබ්භවුට්ඨා නාදිනි කරොන්ති. එවම්පි ඵෙණපිණ්ඩ සදිසං.

යථා ච, ඵෙණපිණ්ඩෝ ආදිතෝ ව බදරපක්කමත්තෝ හුත්වා පූත අත්‍රුබෙබන පබ්බත කූටමත්තෝ පි හොති. එවං රූපම්පි ආදිතෝ කලලමත්තං හුත්වා අත්‍රුබෙබන ව්‍යාම මත්තම්පි. ගො මහිස හත්‍ථි ආදීනං වසෙන පබ්බතකූටමත්තම්පි හොති. මච්ඡකච්ඡපාදීනං වසෙන අනෙක යොජනසතපප්‍රමාණම්පි – එවම්පි ඵෙණපිණ්ඩසදිසං. යථා ච. ඵෙණපිණ්ඩෝ උට්ඨිතමත්තෝ හිජ්ජති

ථොකං ගන්ත්වා පි, සමුද්දං පත්වා පන අවස්සමේ ව භිජ්ජති. එව මෙව රූපම්පි කලලභාවෙ භිජ්ජති. අබ්බුදදිභාවෙ පි, අන්තරා පන අභිජ්ජමානම්පි වස්සසතායුකානං වස්සසතං පත්වා අවස්ස මෙ ව භිජ්ජති. මරණමුඛෙ චුණ්ණ විචුණ්ණං හොති – එවම්පි ඵෙණපිණ්ඩ සදිසං.

යථා ජත බුබ්බුලෝ අසාරෝ එවං වෙදනා පි, යථා ච සෝ අබලෝ අගයහූපගෝ න සක්කා තං ගහෙත්වා ථලකං වා ආසනං වා කාතුං, ගහිත ගහිතෝ පි භිජ්ජතෙ ව—එවං වෙද නා පි අබලා අගයහූපගා න සක්කා නිච්චාති වා ධුවාති වා ගහෙ තුං, ගහිතා පි න තථා තිට්ඨති. එවං අගයහූපගතාය පි වෙදනා බුබ්බුල සදිසාය. යථා පන තස්මිං තස්මිං උදකබින්දුම්හි බුබ්බුලෝ උපජ්ජති වෙව නිරුජ්ඣති ච, න චිරට්ඨිතිකෝ හොති. එවං වෙදනාපි උපජ්ජති වෙව නිරුජ්ඣති ච, න චිරට්ඨිතිකෝ හොති. එකචිත්තක්ඛණෙ කොටිසතසහස්ස සඛ්‍යා උපජ්ජිත්වා නිරුජ්ඣති. යථා ච බුබ්බුලෝ උදකබින්දුං උදකජල්ලකං සංකඩ්ඪිත්වා පූටං කත්වා ගහණ වාතක්ඛොභෙ'ති චත්තාරිත්ත රජනානි පටිච්ච උපජ්ජති. එවං වෙදනා පි වත්ථුං ආරම්මණං කිලෙස ජාලං ඵස්ස සංඝට්ටං චා ති චතනාරි කාරණානි පටිච්ච උපජ්ජති—එවම්පි වෙදනා බුබ්බුල සදිසා.

සඤ්ඤාපි අසාරකට්ඨෙන මිරීචිකා සදිසා, න හි සක්කා තං ගහෙත්වා පිවිතුං වා භාජනං වා පූරෙතුං. තථා අගයහූපගට්ඨෙන තදහයම්පි වෙදනා සදිසමෙ ව. අපි ච යථා මිරීචි විප්ඵන්දති සංජාතූමිවෙගොව්‍ය ඛායති. එවං නීලසඤ්ඤාදිභෙදා සඤ්ඤා පි නීලාදි අනුභවනත්ථාය එන්දති විප්ඵන්දති. යථා ච මිරීචි මහාජනං විප්පලමෙහති පරිපුණ්ණාවාපි ව්‍ය පරිපුණ්ණ නදී ව්‍ය දිස්සති'ති වදුපෙති එවං සඤ්ඤා පි විප්පලමෙහති. ඉදං නීලකං සුභං සුඛං නිච්චන්ති වදුපෙති. පීතකාදිසු පි එසෙව නයෝ. එවං විප්පලමෙහ නා පි මිරීචි සදිසා.

සඞ්ඛාරා පි අසාරකට්ඨෙන කදලික්ඛන්ධසදිසා, තථා අගයහූ ප්ගට්ඨෙන. යථෙ ව හි කදලික්ඛන්ධතෝ කිඤ්චි ගහෙත්වා න සක්කා ගොපානසි ආදීනං අත්ථාය උපනෙතුං. උපනීතම්පි න තථා හොති, එවං සඞ්ඛාරා පි න සක්කා නිච්චාදිවසෙන ගහෙතුං, ගහිතා පි න තථා හොන්ති. යථා ච කදලික්ඛන්ධෝ බහූ වට්ටි සමොධානතෝ හොති, එවං සඞ්ඛාරක්ඛන්ධෝ පි බහුධම්ම සමොධානතෝ, යථා ච කදලික්ඛන්ධෝ නානා ලක්ඛණෙ අක්ඛෙයූ යෙව හි බාහිරාය පත්ත වට්ටියා වණ්ණෙ, අක්ඛෙයූ තතෝ අබ්භන්තරබ්භන්තරානං. එව මෙ ව සඞ්ඛාරක්ඛන්ධෝ පි අක්ඛෙයූ

දෙව එසසස්ස ලක්ඛණං, අඤ්ඤං චෙතනාදීනං සමොධානෙත්වා පන සඞ්ඛාරක්ඛන්ධොව වුච්චතී'ති. එවමපි සඞ්ඛාරක්ඛන්ධො කදලි ක්ඛන්ධ සදිසො.

විඤ්ඤාණම්පි අසාරකට්ඨෙන මායා සදිසං. තථා අගය්හූප ගට්ඨෙන. යථා ච මායා ඉත්තරා ලහු පච්චුපට්ඨානා, එවං විඤ්ඤාණං. තඤ හි තතො පි ඉත්තරතරං වෙව ලහු පච්චුපට්ඨාන තරං ච. තෙනෙව ඛි විත්තෙන පුරිසො ආගතො විය ඨිතො විය නිසින්නො විය නොති. අඤ්ඤදෙව ආගමනකාලෙ චිත්තං අඤ්ඤං ගමනකාලාදිසු. එවං පි විඤ්ඤාණං මායා සදිසං. මායා ව මහාජනං වඤ්චෙති. යං කිඤ්චි වදෙ ඉදං සුවණ්ණ රජතං මුත්තාති පි ගාහා පෙති. විඤ්ඤාණම්පි මහාජනං වඤ්චෙති. තෙනෙ ව විත්තෙන ආගච්ඡන්තං විය ගච්ඡන්තා විය ඨිතං විය නිසින්නා විය කථා ගාහා පෙති. අඤ්ඤදෙව ව ආගමනෙ චිත්තා අඤ්ඤං ගමනාදිසු. එවමපි විඤ්ඤාණං මායා සදිසං.

තව ද මේ පඤ්චඋපාදානක්ඛන්ධයෝ ම සියලු සංසාර දුක්ඛයට පිහිට ව සිටින්. ඒ එසේ ම ය. දැවීමෙන් දරට ගහ ම කරණ ගින්නක් මෙන් ආයුධ ප්‍රහාරයට ලක සෙයින් ඛංස මක්ඛාදී පීඩා වට පිහිට වූ ගෝරූප සෙයින් නිෂ්පන්න සස්‍යලාභයන්ට ක්ෂෙත්‍ර ය සෙයින් ග්‍රාම්ඛාතකයන්ට ග්‍රාමය සෙයින්, පඤ්චුපාදානක්ඛන්ධයෝ ම දුක්ඛයට පිහිට වෙත්. ජාත්‍යාදීනු නානාප්‍රකාරයෙන් විබාධන ය කරන්නාහු භූමියෙහි තෘණලතාදීන් සෙයින්, වෘක්ෂයන් කෙරෙහි පුෂ්ප ඵල පල්ලව සෙයින්, උපාදානස්කන්ධයන්ට ද ජාති ය ආදි දුක්ඛ ය වේ. ජරා ව මධ්‍ය දුක්ඛ වෙයි. මරණ ය පරියොසාන දුක්ඛ වෙයි. මරණාසන්නයෙහි වූ දුක් පෘථක් පරිදහණ වසයෙන් සොක දුක්ඛ වෙයි. ඒ අයාචන වසයෙන් අතිසසින් විප්‍රලාප වසයෙන් පරිදෙව දුක්ඛ වෙයි. ඉක්බිත්තෙන් චිත්තාවෙන් වූ ශරීර දුඃඛ ය සොඝ ය රුජා ය යන මොවුන් කරණ ධාතුසංක්ෂොභ ය සංඝාර ය අනිෂ්ට ප්‍රාප්තව්‍ය සම්යොගයෙන් කයට ආබාධන දුක්ඛ ය වන්නේ ය ඒ දුක්ඛයෙන් බාධියමාන වූ පෘථග්ජනයන්ට ඒ ප්‍රත්‍යයොප්පත්ති වශයෙන් බාධනක වූ දුක්ඛ ය දෞර්මනස්‍ය ය නම් වේ.

සොකානිවෘද්ධියෙන් ජනිත වූ විසාදන සඞ්ඛ්‍යාත බැහැබව ඇත්තවුන්ගේ අන්‍යොන්‍යාඝාතන දුක්ඛ ය උපායාස නම් වෙයි. මනොරථ විඝාතප්‍රාප්තයන්ට උපදනා ඉච්ඡාවිඝාත දුක්ඛ ය ඉච්ඡා තාලාභ දුක්ඛ නම් වෙයි. මෙසේ නානාප්‍රකාරයෙන් උපපරික්ඛය මාන වූ උපාදානස්කන්ධයෝ ම දුක්ඛ ය යි නොයෙක් අක්ෂි රෝග කර්ණ රෝගාදි වශයෙන් එකක් එකක් වර්ණනා කරන නොත්

නිරවශේෂයෙන් වර්ණනා කිරීමට නොයෙක් කල්ප කෝටි ශත සහස්‍රයෙහිදු උත්සාහ කළ නොහැකිවන. ඒ කාරණයෙන් සියලුම දුකඛ ය එක ජල බිඳුවක රස දැන්වූ කල්හි සියලු සමුද්‍ර ජල ය රසයන් මෙබඳු ය යි හැඟෙන්නා සේ, යම්කිසි පඤ්චස්කන්ධ කෙණෙහි ඇද්ද ඒ සියල්ලෙහි ම පැවති දුකඛයන් සාමාන්‍ය නිර්දේශයෙන් සංක්ෂේපයෙන් පඤ්චුපාදානස්කන්ධයෝ දුක් වන්නාහු ය යි භාග්‍යවත් වූ සර්ව්ඥ රාජෝත්තමයාණන් වහන්සේ විසින් වදාරණ ලද්දේ ය යි යනු ද දක්වන්නට වදාළ හ.

බුදුරජාණන් මහ තෙරහු - විශුද්ධි මාර්ගයෙහි.

තථා හි ඉඛ්භනම්ව පාවකෝ, ලඛ්භම්ව පහරණානි, ගොරූපම්ව ඛංසමකසාදයෝ, ඛෙත්තම්ව ලායකා, ගාමංව ගාමඝාතකා, උපාදානක්ඛන්ධ පඤ්චකමේව ජාති ආදයෝ නානප්පකාරෙ බාධාමයනා නිණලතාදීනි විය භූමියං පුප්ඵඵල පල්ලවාදීනි විය රුක්ඛෙසු උපාදානක්ඛන්ධෙසු යෙව නිබ්බත්තනන්ති. උපාදානක්ඛන්ධානඤ්ච ආදි දුකඛං ජාති, මජ්ඣෙ දුඛං ජරා, පරියොසන දුකඛං මරණං. මාරණන්තිඛ දුකඛානිඝාතෙන පරිඩයහමානදුකඛං සොකෝ තදස ගනතෝ ලාලප්පනදුකඛා පරිදෙවෝ. නතෝ ධාතුක්ඛොභ සංඛාත අනිට්ඨඵොට්ඨබ්බ සමායොගතෝ වෙතෝ කායස්ස ආබාධනදුකඛං. තෙන බාධියමානානං පුථුජ්ජනානං තත්ථ පටිඝප්පතතිතෝ ඛාධන දුකඛං දෙමනස්සං සොකාභිවිධියා ජනිත විඝාදනං අනුසඤ්චරන දුකඛං උපායාසෝ. මනොරථ විඝාතප්පත්තානා ඉච්ඡාවිඝාතදුකඛං ඉච්ඡිතා ලානොති. එවං නානප්පකාරතෝ උපපරික්ඛියමානා උපාදානක්ඛන්ධා ව දුකඛානි යදෙහං එක මේකං දස්සෙත්වා වුච්චමානං අනෙකෙහි පි කප්පෙහි න සක්‍යා අනවසෙසතෝ වත්තුං. තං සබ්බම්පි දුකඛං එකජලබිඳුම්හි සකල සමුද්දජලරසා විය යෙසු කෙසුචි පඤ්චසු උපාදානක්ඛන්ධෙසු සංඛිපිත්වා දස්සෙතුං සාඛ්‍යෙතෙන පඤ්චුපාදානක්ඛන්ධා දුකඛා නි භගවා අවොච-සි.

මේ පඤ්චස්කන්ධයෙහි විනිශ්චය යි. දුකඛ සත්‍ය විනිශ්චය මෙතෙකින් දත යුතු. සමුදය නිර්දේශයෙහි වනාහි යම් මේ තෘෂ්ණාවක් තොමෝ පුනර්භව ය කරන්නී ද රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය ධර්ම අරමුණෙහි ලන්න වන්නා වූ නන්දිරාගයෙන් යුක්ත වන්නී ද නන්දිරාග ය හා සමග පවත්නී ද ඒ ඒ භවයෙහි ඇල්ම පිපාසා වසයෙන් තෝස ය කරන්නී ද ඒ තෘෂ්ණා තොමෝ කවරක් වන්නී ද, කාමාස්‍රවාදි වශයෙන් පැවති කාමතෘෂ්ණාව ය.

අටලොස් ප්‍රභෙදයක් ඇති ශාස්වතදෘෂ්ටිය හා එක් ව පැවති භවතෘෂ්ණාව ය. සුසාන්ත්‍රික් ප්‍රභෙදයක් ඇති උච්ඡේද දෘෂ්ටිය හා එක් ව පැවති විභව තෘෂ්ණාව ය, යන මේ ත්‍රිවිධ තෘෂ්ණාව සමුදය සත්‍ය නම් වන්නේ ය.

මේ සමුදය සත්‍යයෙහි නන්දිරාගය මිස් වැදුල්ලක් කොට කියන්ට කාරණා ඇත්තේ ය. ඒ කවර අර්ථයකින් ද යත්? මිස් වැදුල්ල රජ බමුණු වෙළඳ ගොවි ආදි වූ බොහෝ සත්වයන් විසින් ද, කාක සොණ සිඟාලාදි නිරශ්චීන ය යන බොහෝ සත්වයන් විසින්ද, ප්‍රාර්ථනා කරණ ලද්දිය. අවිද්‍යාමදයෙන් මත් වූ එසේ ම සත්වයෝ රූපශබ්දාදී වූ ඒ ඒ අරමුණෙහි ඇලෙන්නා වූ නන්දිරාගයට පැමිණ භවය ප්‍රාර්ථනා කරන්නා වූ,යම් සේ මිස්වැදුල්ල තිබූ තිබූ තැන ඇලේ ද එ පරිද්දෙන් නන්දිරාගයෙන් සත්වයන් භවයෙහි ලග්න වන්නාහ. දුකට පැමිණ ද උකටලි නොවන්නා හ. එ හෙයින් නන්දිරාගයට මිස්වැදුල්ල ය සි කියනු ලැබෙයි. එයින් වදාළ හ. කුමාර කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ට–

වම්මික සූත්‍රයෙහි.

මංසපෙසිනි ඛො භික්ඛු නන්දිරාගසෙසතා අධිවචනං. යි මෙයින් විනිශ්චය කරණ ලද්දේ සමුදය සත්‍ය ය සි දතයුතු සි. දුක්ඛ නිරොධ සත්‍යයට "යො තස්සායෙව තණ්හාය අසෙස විරාග නිරොධො"යනාදින් සමුදය නිරොධ ය මි කියනලද්දේ ය.කුමක් හෙයින් ද යත්? සමුදය නිරොධ වූ කල්හි දුක්ඛනිරොධ ය වෙයි. අන් පරිද්දෙකින් නොවන්නේ ය.

යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ
ඡින්නොපි රුක්ඛො පුනරෙව රුහති,
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනං-සි.

යනු හෙයින් යම් සේ පණුවත් විදීමි සැත්පෑහැරීමි ආදී වූ උපද්‍රව රහිත කල්හි එ හෙයින් ම ස්ථිරකල්හි ශාඛාදි ඡේදයෙන් ඡින්න වූ වෘක්ෂ ය නොනැසුනු සෙයින් නැවත ත් උපදී ද එහෙයින් ම කාමරාගානුසය භවරාගානුසය සඞ්ඛ්‍යාත වූ තෘෂ්ණානුසය නොනා කල්හි මේ දුක්ඛ ය ද නැවත නැවත උපදනේ ය. මෙසේ යම් හෙයකින් සමුදය නිරොධයෙන් ම දුක්ඛනිරොධ ය වේ ද ඒ කාරණයෙන් දුක්ඛනිරොධ ය දෙශනා කරන්නා වූ සුගතයන් වහන්සේ සමුදය නිරොධයෙන් දෙශනාකොට වදාළ සේක.

එසින් නිහ.

ඉනි යසමා සමුදය නිරොධෙනෙව දුකඛං නිරුජඣති. තසමා භගවා දුකඛනිරොධං දෙසෙනෙනා සමුදය නිරොධෙන දෙසෙසි.

ඒ එසේ ම ය.සිංහතෙමේ යමක් හු විසින් ශරය තමා කෙරෙහි විදුනා ලද ද ඔහු කෙරෙහි ම තමාගේ බල දක්ව සි. ශරයෙහි නො දක්ව සි. එසේ ම බුදුහු කාරණයෙහි ම පිළිපදිනි. ඵලයෙහි පිළි නො පදිනි. යන මේ අර්ථ ය දක්වන පිණිස 'සීහසමාන වුත්තිනො හි තථා ගතා, නෙ දුකඛං නිරොධෙනතා දුකඛ නිරොධඤව දෙසෙනතා නෙතුම්හි පටිපජජනති න ඵලෙ. යනු දක්වන ලදි. යම් සේ සුනඛ හෙමේ කිසිවක් හු විසින් කැටින් පහර දුන් කල්හි බුරමින් කැට මැඩ නෙසි. ප්‍රහාර දුයක යා කරා නො දි වේ.

එසේ ම අනය තිත්ථිකයෝ දුකඛ ය නිරුඛ කරණු කැමැත්තා හු කායකලමථයෙහි ම යෙදෙති. කෙලශ නිරොධයෙහි නොයෙ දෙති. යන මේ අර්ථ ය දක්වන පිණිස 'සුඛානවුත්තිනො පන අඤඤ නිත්ථියා' නෙ දුකඛං නිරොධෙනතා දුකඛ නිරොධඤව දෙසෙනතා අතතකිලමථානුයොග දෙසනාදිහි ඵලෙ පටිපජජනති න හෙතුම්හි. යනු දක්වන ලදි. මෙසේ දුකඛ නිරොධයට සමුදය නිරොධ වශ යෙන් දෙශනාකිරීමෙහි සප්‍රයොජන ය වෙදිතවය සි. මේ වනාහි අර්ථ සි. යො තසසායෙව තණහාය-යන්නෙහි තෘෂණාව නම් පොනොභව් ක ය සි කියා කාමතෘෂණාදී වශයෙන් විභාග කළ තෘෂණාවගේ විරාග ය සි කියනු ලැබෙ සි.

තසසායෙව තණහාය'ති-තසස පොනොභවිකානි වතථූ කාම තණහාදි වසෙන විභතතතණහාය විරාගො වුච්චති මහෙතා විරාගා විමුච්චතීති හි වුත්තං. විරාගෙන නිරොධො විරාග නිරොධො. අනු සය සමුඤඤාතතො අසෙසවිරාගෙන නිරොධො අසෙසවිරාග නිරොධො. අථ වා විරාගෙති පහානං වුච්චති. තසමා අසෙසො නිරොධොති එවමෙපත්ථ යොජනා දට්ඨබබා. අත්ථතො පන සබබානෙව එතානි නිබබාණසස වෙවවනානි පරමත්ථතො හි දුකඛනිරොධං අරියසච්චනති නිබබාණං වුච්චති. යසමා පන තං ආගමම තණහා විරජජති වෙව නිරුජඣති ච. තසමා විරාගොති ච නිරොධොති ච වුච්චති. යසමා ච තදෙව තසස වාගාදයො හොනති කාමගුණාලයෙසු වෙත්ථ එකොපි ආලයො නත්ථි. තසමා වාගො පටිනිසසග්ගො මුත්ති අනාලයො වුච්චති-සි.

යනුවෙන් කළ විනිශව ය ද දත යුතු සි. ඒ මේ නිර්‍වාණ ය සහි දුකඛ ශානතියට ප්‍රත්‍ය ය වන බැවිනු ද සියලු කෙලශ සනතාප නැති බැවිනු ද ශානත ලක්ෂණ ඇත්තේ ය. භඩග නැති බැවින්

නොයිලියෙන රස ඇත්තේ ය. හෙවත් අවවුනි බව කෘත්‍ය ය කොට ඇත්තේ ය. රස ය කෘත්‍ය ය යනු එකාර්ථ යි. හෙ ද නොගිලියෙන සමපත් ඇත්තේ ය. යන අර්ථ යි. අනාදිමත් සසර යිහි නෙනු දු නොදක්නා ලද විරූප බැවිනු දු දුටු කෙණෙහි ම භය නො කරයි. කියන බඳු ව අස්වස් කෙරෙ යි. කෘත්‍යාර්ථයෙන් අස්වස් කරණ කෘත්‍ය ය ඇත්තේ ය. සඤ්ඤානිමිත්තන නැති බැවිනු දු රාගාදි නිමිත්ත නැති බැවිනු දු අනිමිත්ත ව වැටහෙන්නේ යි. රාගාදි සංක්ලේශ ව්‍යුපශමනයට නිමිත්ත බැවින් නිස්ක්ලේශ බව එළවන්නේ ය.

එසින් කිහ.

තයිදං සඤ්ඤාලක්ඛණං අවවුනිරසං අසසාස කරණරසං වා අනිමිත්ත පවවුපට්ඨානා නිපපපඤ්ච පවවුපට්ඨානං වා-යි.

මේ මෙහි සංක්ෂේප ය. විසතර ය වනාහි විශුද්ධිමාර්ගයෙහි නිරෝධප්‍රත්‍ය නිර්දෙශ කථාවෙන් බලා දත යුතු යි. දුක්ඛනිරෝධ ගාමිනි ප්‍රතිපදාර්‍ය සත්‍යයෙහි චතුස්සත්‍ය ය ප්‍රතිවෙධ ය පිණිස ප්‍රතිපන්න යෝගිහුගේ නිවන් අරමුණුකොට ඇති අවිද්‍යානුස ය සමුච්ඡේද කරණ වූ ප්‍රඥාචක්ෂුස සම්‍යක්දෘෂ්ටි ය නම් වේ. ඒ සම්‍යක්දෘෂ්ටි තොමෝ අවිපරීත වශයෙන් මනාකොට දැක්ම ලක්ෂණ කොට ඇත්ති ය. තඩාලියන් ප්‍රකාශකරණ බව කෘත්‍ය ය කොට ඇත්ති ය අවිද්‍යා නමැති අන්ධකාර ය විධවංශන ය කිරීම ප්‍රත්‍යුපස්ථාන සඞ්ඛ්‍යාත වැටහීම් කොට ඇත්ති ය.

එසින් කිහ.

චතුසච්චපටිවේධාය පටිපන්නස්ස යොගිනෝ නිබ්බාණාරම්මණා අවිජ්ජානුසය සමුග්ඝාතකං පඤ්ඤාචක්ඛු සම්මාදිට්ඨි. සා සම්මාදස්සන ලක්ඛණා තප්පකාසන රසා අවිජ්ජන්ධකාර විද්ධංසන පවවුපට්ඨානා-සි.

එසේ ම සම්‍යක්දෘෂ්ටීන් සම්පූර්ණ වූ දෘෂ්ටි ඇතියහුගේ ඒ සම්‍යක් දෘෂ්ටිය හා සම්ප්‍රයුක්ත වූ කාමසංකල්පාදී මිථ්‍යාසංකල්ප යන් සමුච්ඡින්න ය කරණ සිත්හු නිවන් කොටස්හි ආරොපන ය සම්‍යක්කල්පනා නම් වෙයි. ඒ සම්‍යක් කල්පනා තෙමේ සිත්හු නිවන් අරමුණෙහි නැඹීම ලක්ෂණකොට ඇත්තේ ය. අර්පණ ය සි කියන ලද නිවන් අරමුණෙහි මාගීසිත්හු අලවන කෘත්‍ය ය ඇත්තේ ය. මිථ්‍යාසංකල්පනාවගේ ප්‍රහාන කිරීම වැටහීම් කොට ඇත්තේ ය. **එසින් කිහ.**

තථා සම්පන්නදිට්ඨිනො හං සම්පයුත්තානං මිච්ඡාසඞ්කප්ප සමුට්ඨාත චේතසො නිබ්බාණා, පටිපදාභිනිරොපනං සම්මාසඞ්ක පො සො සම්මාවිත්‍යානාභිනිරොපන ලක්ඛණො අපපණා රසො මිච්ඡා සඞ්කප්පපහාන පච්චුපට්ඨානො-සි.

එසේ ම සම්‍යක්දෘෂ්ටියෙන් බලන්නහුගේ ද ඒ සම්‍යක්සඞ්ක ල්පනාවෙන් සිත්හු නිවන් අරමුණෙහි ආරොපණ ය කරණුවහු ගේ ද සම්‍යක්දෘෂ්ටි සම්‍යක් සඞ්කල්ප දෙදෙනා හා සම්ප්‍රයුක්ත වූ චතුර්විධ වාක්දුශ්චරිතයන් සමුච්ඡේද කරණු වූ මිථ්‍යාවචනයෙන් විරති තොමෝ සම්‍යක්වාචා නම් වෙයි. ඒ සම්‍යක්වාචා තොමෝ විසංවාදනාදී කෘත්‍ය ය ඇති බැවින් රූක්ෂ වූ අපරිග්‍රාහක වූ මුසාවාදාදීන් ට ප්‍රතිපක්ෂ බැවින් ස්නිග්ධ භාවයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් පරිග්‍රහ කරණ ලකුණු ඇත්තී ය. මිථ්‍යාවචනයෙන් වළක්නා බව කෘත්‍ය ය කොට ඇත්තී ය. මිත්‍යාවචන ය ප්‍රහාණ කිරීම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තී ය. **එසින් කිහ.**

තථා පස්සතො විතක්කයතො ච තං සම්පයුත්තා ව වචී දුච්චරිත සමුට්ඨානිකා මිච්ඡාවාචා ය විරති සම්මාවාචා නාම. සා පරිග්‍රහණ ලක්ඛණා, විරමණ රසා, මිච්ඡාවාචා පහාන පච්චුප ට්ඨානා-සි.

ඒ මිත්‍යා වචනයෙන් විරමණ ය කරන්නහුට ඒ සම්මා වාචා ව හා සම්ප්‍රයුක්ත වූ ප්‍රාණ වධාදී මිත්‍යා කර්මාන්තයන්ගේ සමුච්ඡේද ය වූ ප්‍රාණ වධාදීන් කෙරෙන් විරමණ ය සම්‍යක් කර්මා න්ත නම් වේ. හෙතෙම කායික ක්‍රියාව කිසි කටයුත්තක් උපදවන බැවින් සමුට්ඨාන ලක්ෂණ කොට ඇත්තේ ය. නොහොත් දැරූ බිපන යක් මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් නගන ලකුණු ඇත්තේ ය. මිත්‍යා කර්මාන්තයෙන් වැලැක් ම කෘත්‍ය ය කොට ඇත්තේ ය. ප්‍රාණ වධාදී මිත්‍යාකර්මාන්ත ය ප්‍රහාණ කිරීම වැටහීම් කොට ඇත්තේ ය.

එසින් කිහ.

තථා විරමතො තං සම්පයුත්තා මිච්ඡාකම්මන්ත සමුට්ඨ දිකා පාණාතිපාතාදි විරති සම්මාකම්මන්තා නාම. සො සමුට්ඨාන ලක්ඛණො, විරමණ රසො, මිච්ඡා කම්මන්ත පහාන පච්චුප ට්ඨානො-සි.

ඒ යෝගිහුගේ ඒ සම්‍යක්වාචා සම්‍යක්කර්මාන්ත දෙදෙනා හට විශුද්ධිභූත වූ ඒ සම්‍යක් වාචාදීන් හා සම්ප්‍රයුක්ත වූ කුහන ලපනාදීන් උපවෙජ්ද කරණු වූ යම් මිත්‍යාජීවයෙන් විරතියෙක් ඇද්ද හේ සම්‍යක් ආජීව නම් වේ. ඒ සම්‍යක් ආජීව ය තෙමේ

පිරිසිදු බව ලක්ෂණකොට ඇත්තේ ය. සම්‍යග් ආජීවයෙන් ජීව මාන සත්වයන්ගේ හෝ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ හෝ ජීවිතෙන්ද්‍රිය ප්‍රවෘත්ති සංඛ්‍යාත ආජීවයාගේ හෝ සුද්ධි ය වොදන නමැ සි දත යුතු සි මිනා ආජීවයාගේ ප්‍රවෘත්තිය කෘත්‍ය ය කොට ඇත්තේ ය. සම්‍යග්ආජීවයාගේ ප්‍රවෘත්තියෙහි පටන් මිථ්‍යාආජීව යා නො පවත්නා බැවින් බුද්ධ නින්දිත නො වූ සම්‍යක් ජීවිකාවගේ ප්‍රවෘත්තිය සුද්‍යා ජීව ප්‍රවෘත්ති නමැ සි දතයුතු සි යෙන්. මිථ්‍යාජීව ය ප්‍රතිඛ්‍ර කිරි ම වැටහීම් කොට ඇත්තේ ය.

එසින් කිහ.

යා පනස්ස තෙසං සම්මාවාචා සම්මාකම්මන්තානං විසුද්ධි භූතා තං සමුට්ඨාපනා ච කුහනාදි උපවෙජේදිකා මිච්ඡාජීව විරති සම්මා ආජීවෝ නාම. සෝ වොදන ලක්ඛණෝ, සුද්ධාජීවපච්චුපට්ඨානෝ, මිච්ඡාජීවපහාන පච්චුපට්ඨානෝ-ති.

ඉක්බිත්තෙන් සම්මාවාචා ය සම්මාකම්මන්ත ය සම්මාආජීව ය යි කියන ලද සිල භූමියෙහි පිහිටි ඔහුගේ සීල භූමියට සුදුසු ඒ සම්මාවාචාදීන් හා සම්ප්‍රයුක්ත වූ කොසජ්ජ සමුච්ඡේදක වූ නොමුකුශල චිධවංශක වූ යම් සම්‍යක් ව්‍යායාමයෙක්-වීර්‍ය්‍ය රාශියෙක් ඇද්ද-මේ තෙමේ සම්‍යක් ව්‍යායාම නම් වේ සි. හෙ තෙම නො පසු බැසීම ලක්ෂණකොට ඇත්තේ ය. නොවුපන් අකුශල ධර්මයන් නොඋපද වීම ය. උපන් අකුශල ධර්මයන් නැසීම ය. නොඋපන් කුශල ධර්මයන් ඉපදවීම ය උපන් කුශල ධර්මයන් වැඩීම ය යන මොවුන් කෘත්‍ය ය කොට ඇත්තේ ය. මිථ්‍යා ව්‍යායාම ය නැසීම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තේ ය.

එසින් කිහ.

අථස්ස යෝ තස්සා සම්මාවාචා කම්මන්තාජීව සංඛාතාය සිල භූමියං පතිට්ඨිතස්ස භදන්තරූපෝ තං සමපයුත්තෝ ච කොසජ්ජ සමුච්ඡේදකෝ චිරියාරම්භෝ එස සම්මාවායාමෝ නාම. සෝපගහන ලක්ඛණෝ, අනුප්පන්නා කුසලානුප්පාදනාදි රසෝ, මිච්ඡාවායා මප්පහාන පච්චුපට්ඨානෝ-ති.

මේසේ සම්‍යක් ව්‍යායාම කරණ ඒ යොගීහට කායාදියෙහි ශූන්‍යාදි ආකාරයන් ග්‍රහණ වශයෙන් ප්‍රවෘත්ත වූ ශූන්‍ය සංඥ ව ප්‍රහීඩනම කොට ඇති අකුශල ස්කන්ධයෝ ම මිථ්‍යාසති නම් වන බැවින් ඒ මිථ්‍යාසමෘති ය නසන්නා වූ සිත්හුගේ අරමුණු සිහි නැති නොවන බවක් ඇද්ද, ඒ සම්‍යක්සති නම් වන්නී ය. ඒ සම්‍යක්සති තොමෝ අරමුණු නො විනිද වැටහෙන බැවින් අරමුණට එළඹ සිටිනා ලකුණු ඇත්ති ය. අරමුණු සිහි නැති නොවන කෘත්‍ය ය කොට ඇත්තී ය. මිථ්‍යා සමෘතියගේ ප්‍රහාණ කිරී ම ප්‍රත්‍යුපස්ථාන කොට ඇත්තී ය.

එසින් කිහ.

තස්සෙවං වායමතෝ තං සම්පයුත්තෝ ව මිච්ඡාසති විනිබ්බුජන න කෝ වෙතසෝ අසමෙමාසෝ සම්මාසති නාම. ස උපට්ඨාන ලක්ඛණා, අසම්මුස්සන රසා, මිච්ඡාසතිපපහාන පච්චුපට්ඨානා-සි.

මෙසේ අනුත්තර සතියෙන් සංරක්ෂිය මාන වූ චිත්තයාගේ ඒ සමානි ය හා සම්ප්‍රයුක්ත වූ මිථ්‍යා සමාධි ය නසන්නා වූ විදෙහෙනකා ග්‍රහා තොමෝ සම්‍යක් සමාධි නම් වේ. තෙතෙම අවික්ඛෙප ලක්ඛණ ඇත්තේ ය. මනා ව පිහිටන බව කෘත්‍ය ය කොට ඇත්තේ ය මිථ්‍යා සමාධි ය ප්‍රහාණ ය කිරී ම වැටහීම් කොට ඇත්තේ ය.

එසින් කිහ.

එවං අනුත්තරාය සතියා සංරක්ඛියමාන චිත්තස්ස තං සම්ප යුත්තා ව මිච්ඡාසමාධි විද්ධාසිකා චිත්තෙනකග්ගතා සම්මාසමාධි නාම. සෝ අවික්ඛෙප ලක්ඛණෝ, සඞ්ඛානරසෝ, මිච්ඡා සමාධිපපහාන පච්චුපට්ඨානෝ සි.

මේ මෙහි ජානි ආදීන්ගේ විනිශ්ච ය වශයෙන් විනිශ්ච ය වෙදිතව්‍ය සි. **ඤාණකිච්චතෝ** යනුයෙහි සත්‍යයන් අරභයා පවත්නා ඤාණයාගේ කෘත්‍ය ය වශයෙන් විනිශ්ච ය දත යුතු ය යන අර්ථයි. ඒ එසේ ම ය. සත්‍ය ඥන ය, තෙමේ අනුබොධ ඥන ය පටි බොධ ඥන ය සි කියා දැක්වීම වෙ සි. එහි අනුබොධ ඥන ය නම්- ප්‍රත්‍යක්ෂකොට නො දනුත් දු අනුශ්‍රව ය අනුව දන්නා නුවණ අනු බොධ ඥන නම් වෙයි. නොයොත් නැවත නැවත උපදනා බැවින් පළමු පළමු උපන් නුවණ අනුව දන්නා නුවණ ය ප්‍රතිවෙධ කරණ නුවණ පටිබොධඥන නම් වෙයි.

"චතුන්නං භික්ඛවෙ සච්චානං අනනුබොධා අප්පටිවෙධා" යන තන්හි අනනුබොධ නම් විදර්ශනා ඤාණයෙහි ප්‍රතිවෙධ ඥන ය, මාර්ගඤාණයෙහි වන බැවින් මෙ තන සත්‍යඥන දර්ශන කොට කිහ සි යෙත්. ඒ අනුබොධ ය පටිබොධ ය යන ඤාණ දෙක්හි අනුබොධ ඥන ය ලෞකික වූ යේ අනුස්සව-ආකාර-පරිවිතර්ක-දිට්ඨි-නිජ්ඣා න-ඛන්ති-විසින් නිරොධයෙහි දු ඥානියෙහි දු පවති. ප්‍රතිවෙධඥන ය ලොකොත්තර වූයේ නිවන් අරමුණු කොට පරිජානනාදි කෘත්‍ය ය වශයෙන් චතුස්සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙ සි.

එසින් කිහ.

ඤාණකිච්චතොති- සච්චඤාණස්ස කිච්චතොපි විනිච්ඡයෝ වෙදිතබ්බොති අත්ථෝ. දුවිධා හි සච්චඤාණං අනුබොධඤාණඤ්ච පටිවෙධඤාණඤ්ච. තත්ථ අනුබොධඤාණං ලෝකියං අනුස්සවාදි

වසෙන නිරොධෙ මග්ගො ච පවත්තති. පටිවෙධඤාණං ලොකුත්තරං නිරොධ මාරම්මණං කත්වා කිච්චතො චත්තාරිපි සච්චානි පටිවිජ්ඣති—සි.

ඒ පරිජානනාදි කෘත්‍ය ය කිරීමෙන් පරිඥෙය්‍යාදීන් මෙන් සත්‍යයෝ ද ඒ ප්‍රතිවෙධ ඥානයට ප්‍රකට වෙන්. විවට්ටානු පස්සනාවෙන් සංස්කාරයන් කෙරෙන් පනිලියමාන මනස් ඇත්තහුට උපදනා මහ නුවණ විසංස්කාර වූ දුකඛ නිරොධ ය අරමුණුකොට දුකඛය ද පිරිසිඳින්නේ ය. දුකඛගත තෘෂ්ණා ව පහවන්නේ ය. නිරොධය ද සාක්ෂාත් කරන්නේ ය. සවභාවයෙන් ප්‍රකට වන ආදිත්‍ය යා මෙන් සම්මාසංකප්පාදීන් සමග පවත්නේ ය. මාර්ග ය ද වඩන්නේ ය. මෙසේ හෙයින් මේ කෘත්‍යයන් කරණ නුවණ දුකඛාදියෙහි සමෙමාහ නිවතී නයෙන් එක ප්‍රතිවෙධනයෙන් චතුස්සත්‍යයන් ම ප්‍රතිවෙධ කෙරෙ යි දත යුතු.

එසින් වදළහ.

සො භික්ඛවෙ දුකඛං පස්සති, දුකඛසමුදයම්පි සො පස්සති, දුකඛනිරොධම්පි පස්සති දුකඛනිරොධගාමිනි පටිපදම්පි පස්සතීති-සි.

ඒ ප්‍රතිවෙධ ඥානයාගේ පරිජානනාදී කෘත්‍ය ය ඇති ඤාණ ය විශුද්ධිමාර්ගයෙහි ඤාණදස්සන විසුද්ධිකථාවෙහි කී ක්‍රමයෙන් ගන්නේ ය. යම් ලෞකික වූ අනුබොධ ඤාණ කෙණෙක් ඇද්ද ඒ නුවණෙහි දුකඛඥන ය උත්පත්තිය ම විසින් පවත්නේ සංස්කාර පුඤ්ජමාත්‍ර වූ දර්ශනයෙන් සක්කායදිට්ඨි පරියුට්ඨාන ය වලක්නේ ය. සමුදය ඤාණ ය හෙතු ඵල සම්බන්ධයන්ගේ අවිච්ඡේද ය දක්නා බැවින් පරියුට්ඨානාදී භව විසින් පවත්නා උච්ඡේද දෘෂ්ටිය වලක්නේ ය.

නිරොධ ඤාණ ය හෙතුනිරොධයෙන් ඵලනිරොධ ය දක්නා බැවින් ශාස්වත දෘෂ්ටි ය වලක්නේ ය. මාර්ගඤාණ ය "නත්ථි අත්තා කාරෙ නත්ථි පරෙකාරෙ නත්ථි පුරිසකාරෙ" යනාදීන් අක්‍රිය දෘෂ්ටි ය වලක්නේ ය. දුකඛඥන ය හෝ ධ්‍රුව-ශුභ-සුඛාත්මභාව-රහිත වූ ස්කන්ධයන් කෙරෙහි ද ධ්‍රුව-සුභ-සුඛාත්මභාව-සංඥ සංඛ්‍යාත වූ සමුදය ඵල වූ දුකඛයෙහි විප්‍රතිපත්ති ය වලක්නේ ය. "ඉස්සරො ලොකං පවත්තෙතීති සඤ්ඤති නිවත්තෙතීති සංහරතී-සි" යනුවෙන් ඊශ්වර කාරණ වාදී හු කියති. "පධානතො ලොකො ආවිභවති තත්තෙවසඤ්ඤ පලීයතී" යනුවෙන් ප්‍රධාන කාරණ වාදීහු කියති.

කාලො කරොති භූතානි කාලො සංහරති පජං,
කාලෙ සුත්තෙ ජාගරති කාලෙහි දුරතික්කමො-සි.

යනුවෙන් කාලවාදීහු කියත්. කණ්ටයන්ගේ කපිල ඵලා දීන්ගේ පරිමණ්ඩල භාව ය මෙන් මෘගපක්ෂි ආදීන්ගේ විචිත්‍ර භාව ය මෙන් සවභාවයෙන් මේ ලෝක ය වන්නේ ය යි සවභාව වාදිනු කියති. ආදිග්‍රහණයෙන් "අත්‍ර හි ලොකො පවත්තති" යනාදී ගත්හු. මෙසේ අකාරණයෙහි කාරණාභිමාන වශයෙන් පවත්නා හේතුයෙහි විප්‍රතිපත්ති ය සමුදය ඤ්‍ඣණ ය වලක්නේ ය.

උද්දඛ ආලාරකාදීන් මෙන් අරූප ලොකයෙහි ද නිගණ්ඨයන් ලොකත්‍ථපිකාවෙහි ද මොක්ෂ ය යි ගන්නා නිරොධ විප්‍රතිපත්ති ය නිරොධඤ්‍ඣණ ය වලක්නේ ය. ඉන්‍ද්‍රිය-තපණ-පුත්‍රමුඛ-දර්ශණාදි මිස අපවගි නැතැ යි ගෙණ තථා ප්‍රවෘත්තී සංඛ්‍යාත කාමසුඛල්ලිකානුයොග ය කෙසලුඤ්චනාදී තප වස්‍යාවෙන් ද ගෞසිල කුක්කුට සීලාදීන් ද ආත්ම පරිතාපනයෙන් මොක්ෂයාගේ සිද්ධි ය වෙ යි. කරණ කාමසුඛල්ලිකානුයොග ය අත්තකිලමථානු යොග ය යන ප්‍රභෙද ය ඇති අවිශුද්ධි මාගීය විශුද්ධිමාගී ය යි ග්‍රහණ වශයෙන් ප්‍රවෘත්තා වූ උපායෙහි විප්‍රතිපත්ති ය මාගීඤ්‍ඣන ය වලක්නේ ය.

දක්වන ලද මැසි-විශුද්ධිමාගියෙහි.

යං පනෙතං ලොකියං තත්‍ථ දුක්ඛඤ්‍ඣණං පරියුට්ඨානාභිභව වසෙන පවත්තමානං සක්කායදිට්ඨිං නිවත්තෙන්ති. සමුදය ඤ්‍ඣණං උච්ඡෙදදිට්ඨිං, නිරොධඤ්‍ඣණං සස්සතදිට්ඨිං, මග්ගඤ්‍ඣණං අකිරිය දිට්ඨිං, දුක්ඛඤ්‍ඣණං වා ධ්‍රුව සුභ සුඛත්තභාව රහිතෙසු ඛන්ධෙසු ධ්‍රුව සුභ සුඛත්ත භාව සඤ්ඤා සංඛාතං ඵලෙ විපරිවිපත්තිං, සමුදය ඤ්‍ඣණං ඉස්සර පධාන කාලසභාවාදීහි ලොකො පවත්තති ති අකාරණෙ කාරණාභිමාන පවත්තං හෙතුම්හි විපරිවිපත්තිං, නිරොධ ඤ්‍ඣණං අරූප ලොකෙ ලොකත්‍ථපිකාදිසු අපවග්ගභාගි භූත නිරොධ විපරිවිපත්තිං, මග්ගඤ්‍ඣණං කාමසුඛල්ලික අත්තකිලමථානු යොගපපභෙදෙ අවිසුද්ධිමග්ගෙ විසුද්ධිමග්ග ගාහවසෙන පවත්තං උපායෙ විපරිවිපත්තිං නිවත්තෙන්ති—යි.

අපි ච—ලොක ය යි කියන ලද පස්කඳු කෙරෙහි ද ලොක පභව ය යි කියන ලද ඒ පස්කඳුන් උපයන්නහු කෙරෙහි ද ලොක අග්ගම ය යි කියන ලද ඒ පස්කඳුන්ගේ අපගම වූ නිවන්හි ද තදුපා ය යි කියන ලද ඒ පස්කඳුන්ගේ අපගමයට උපාය වූ මාගීයෙහි ද සව් තෙමේ යම් තාක් කල් සත්‍යයන් නොදනී ද ඒ තාක් කල් මුළා වන්නේ ය.

එසින් කිහ.

ලොකෙ ලොකපහවෙ ලොකත්ථගමෙ සිවෙ ච තද්‍රූපායෙ,
සම්මුයාති තාව නරොා න විජානාති යාව සච්චානි-සි.

මේ ගාථාවෙහි "ලොකෙ" යන්නෙන් දුකඛ සත්‍ය ය ද, "ලොකපහවෙ" යන්නෙන් සමුදය සත්‍ය ය ද, "ලොකත්ථගමෙ සිවෙ"යන්නෙන් නිරොධ සත්‍ය ය ද, "තද්‍රූපායෙ" යන්නෙන් මාර්ග සත්‍ය ය ද, සඞ්ග්‍රහ වූ පරිදි සප්‍රාඥයන් විසින් යථා ක්‍රම යෙන් පිරිත්සිය යුතු. මෙසේ චතුරාර්ය සත්‍යයන් කෙරෙහි කෘත්‍යයෙනු දු විනිශ්චය දත යුතු. "**අනෙනාගධානා පහෙදු**" යනුවෙහි දුකඛ සත්‍යයෙහි වනාහි තෘෂ්ණා ව ද අනා ශ්‍රව ධර්මයනු දු තබා සෙසු එකාසූ ලෞකික ධර්මයෝ ආතුළත් වෙත්. සමුදය සත්‍යයෙහි අධ්‍යාත්මික-බාහිර වූ ද්වාදසායතන යන් කෙරෙහි කාම-භව-විභව-තෘෂ්ණා විසින් සතිස් වැදෑරුම් වූ තෘෂ්ණා විචරිතයෝ ඇතුළත් වෙත්.

නිරොධ සත්‍ය ය එකක් ම බැවින් කිසිවක්හු නොා මුසු වේ. අනන්තගින නැති වේ. මාර්ග සත්‍යයෙහි සම්‍යක් දෘෂ්ටි වා රයෙන් ඒමිංසිද්ධිපාද-පඤ්චේන්ද්‍රිය-ප්‍රඥාබල-ධර්මවිචය-සම්බොධ්‍යඞ්ග යෝ සංගෘහීත වෙත්. විමිසිද්ධිපාදාදි බොධි පාක්ෂික ධර්මයන්ගේ කෘත්‍ය ය නානත්ව ඇත ද ධර්ම හෙයින් එකක් බැවින් කිසිවක්හු සම්‍යක් දෘෂ්ටියෙහි සංග්‍රහ වෙ සි. සම්‍යක්දෘෂ්ටි මුඛයෙන් තද නන්තගීත භාව ය කියන ලදූ සි දත යුතු වෙත්. සම්‍යක් සංකල්ප ද්‍රදෙශයෙන් නෛෂ්ක්‍රම්‍ය චිතර්කී ය අව්‍යාපාද චිතර්කී ය අවිහිංසා චිතර්ක ය යන ත්‍රිවිධ චිතර්කියෝ සංගෘහීත වෙත්.

ලෞකිය කුසලෙ -අලොභ--මෛත්‍රා-කරුණා-සමාධියොග ව සෙන නිත්‍රා. මහාකුසලෙ-ලෝභ-ව්‍යාපාද විහිංසා-සමුච්ඡේද වසෙන තයෝ එකොා ව වුත්තෙනා, එසතයෝ සම්මාවාචාදිසු-යනු මෙයට—**විසුද්ධිමාගී විකා සි.**

කාමවිතර්කියෙහි ඇස දූක ඒ නසන පිණිස ප්‍රතිපත්තිය හට උපන් මාර්ගයෙහි චිතර්ක ය නෙකඛම්ම චිතර්ක ය නම් වෙසි. සෙසු දෙ චිතර්කියෝ ද එසේ මැ සි අශුභධ්‍යාන පාදක කොට ඉපද වූ මාර්ගයෙහි චිතර්ක ය නෛෂ්ක්‍රම්‍ය චිතර්ක නම් වෙ සි. මෛත්‍රීධ්‍යාන පාදකකොට ඉපද වූ මගෙහි චිතර්ක ය අව්‍යාපාද චිතර්ක නම් වෙ සි. කරුණාධ්‍යාන පාදකකොට ඉපද වූ මගෙහි චිතර්ක ය අවිහිංසා චිතර්ක නම් වෙ සි—**විභඞ්ග අට්ඨකථාවෙහි**—කිහ සි යෙත්.

සම්‍යක් වාචා ප්‍රදෙශයෙන් කථනයෙන් චතුර්විධ වාක් සුචරිතයෝ සංග්‍රහ වෙත්. මුසාවාද දී චතුර්විධ වාක් දුශ්චරිත යෙන් වන සතර විරතීහු ම චතුර්විධ වාක් සුචරිත නම් වෙති යි දන්නේ; කාය සුචරිතයෙහි දු මෙ ම නියා යි යෙත්. සම්‍යක් කර්‍මාන්ත ප්‍රදෙශයෙන් ත්‍රිවිධ කාය සුචරිතයෝ සංග්‍රහ වෙත්. සම්‍යග්ආජීව මුඛයෙන් අපිස් සතොස් ගුණ ඇත්තාහට සම්‍ය ගාජීව ය වන බැවින් අපචිඡතා සන්තුට්ඨිතාවෝ ද සංග්‍රහ වෙත් ඒ සියලු සම්මාවාචා කම්මන්තාජීවයන් භවාන්තර යෙහි දු ජීවිත හේතුවෙනු දු ආයත්‍යන් විසින් අනති ක්‍රමණීය වූ ආයත්‍යිකාන්න සිල නම් වන බැඳින්, සිල ය ද ශ්‍රද්ධාහස්න ය කින් ගත යුතු බැවින් සද්ධින්ද්‍රිය සද්ධාබල, ඡන්දිද්ධිපාදයන්ගේ අස්තිත්ව යෙන් සීලයාගේ අස්තිත්ව ය වන බැවින් සද්ධින්ද්‍රි ය සද්ධාබල ඡන්දිද්ධිපාදයෝ සංගෘහීත වෙත්.

සම්මාවාචා දී සීලයන්ගේ ග්‍රහණයෙන් යම් ශ්‍රද්ධා හස්තය කින් ඒ සීලයෝ ගන්නා ලැබේද් ද ඒ ශ්‍රද්ධා හස්ත ය ද ගෘහීත ම වේ නු යි. ඒ ශ්‍රද්ධාවෙන් අනන්‍ය වූ සද්ධින්ද්‍රිය සද්ධා බල යෝ සංගෘහීත වෙත්. ඡන්දිද්ධිපාද ය වනාහි ශ්‍රද්ධා ගුණ හෙයින් ඡන්දිද්ධිපාද ය තදන්තර්ගත වෙනි යි දත යුතු යි යෙත් සම්‍යක් ව්‍යායාම ප්‍රදෙශයෙන් චතුර්විධ සම්‍යක් ප්‍රධාන ය හා විරියින්ද්‍රි ය වීර්‍යබල-වීර්‍යසම්බොධ්‍යඞ්ගය-යන මොහු සඞ්ග්‍රහ වෙත්. සම්‍යක් සති ය කිමෙන් චතුර්විධ සතිපට්ඨාන ය-සතින්ද්‍රි ය-සතිබල ය-සති සම්බොජ්ඣඞ්ග ය-යන මොහු ඇතුළත් වෙත්. සම්‍යක් සමාධිය ගේ කිමෙන් සවිතර්කී සවිචාරා දී ත්‍රිවිධ සමාධි ය-චිත්තිද්ධිපාද ය-සමාධින්ද්‍රි ය-සමාධිබල ය-ප්‍රීතිප්‍රශ්‍රබ්ධි-උපෙක්ෂා සම්බොධ්‍යඞ්ගයෝ ඇතුළත් වෙත්. මෙසේ අනන්තර්ගත යන්ගේ ප්‍රභෙද විසිනු දු විනිශ්ච ය දත යුතු යි

මේ ද දක්වන ලද මෑයි—විශුද්ධිමාර්ගයෙහි.

අනෙකාගධානං පහෙදෙ'නි දුකඛසච්චසමිං හි ඨපෙත්වා තණ්හාවෙ ව අනාසව ධම්මෙ ච සෙසා සබ්බධම්මා අනෙකාගතා සමුදය සච්චෙ. ඡන්තිංස තණ්හා විචරිතානි නිරොධ සච්ච මසම්මිස්සං මග්ග සච්චෙ සම්මාදිට්ඨි මුඛෙන වීමංසිද්ධිපාද පඤ්ඤින්ද්‍රිය පඤ්ඤා බල ධම්මවිචය සම්බොජ්ඣඞ්ගානි සම්මා සංකප්පාපදෙසෙන තයෝ නෙක්ඛම්ම විතක්කාදයෝ-

සම්මාවාචාපදෙසෙන චත්තාරි වචීසුචරිතානි, සම්මාකම්මන්තා පදෙසෙන තීනි කායසුචරිතානි. සම්මාජීව මුඛෙන අපචිඡතා සන්තුට්ඨිතා ච සබ්බසඞ්ඛෙපෙනෙව වා එතෙසං සම්මාවාචා

කම්මෙනාජීවානං අරියකන්තා සීලත්තා සීලසඞ්ඛාතෙන පටිඤ්ඤාතබ්බත්තා තෙසං අත්ථිතාය අත්ථිභාවතො සද්ධින්ද්‍රිය සද්ධාබල ඡන්දිද්ධිපාදෘ-

සම්මා වායාමා පදෙසෙන චතුබ්බිධ සම්මප්පධාන විරිසින්ද්‍රිය විරියබල විරියසම්බොජ්ඣඞ්ගානි, සම්මාසති අපදෙසෙන චතුබ්බිධ සතිපට්ඨාන සතින්ද්‍රිය සතිබල සති සම්බොජ්ඣඞ්ගානි, සම්මා සමාධි අපදෙසෙන සවිතක්කා සවිචාරාදයෝ තයෝ සමාධි, චිත්ත සමාධි සමාධින්ද්‍රිය සමාධිබල පීතිපස්සාදි සමාධි උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගානි, අනෙකාගධානි'ති එවමෙත්ථ අනෙකාගධානං පභෙදපි විනිච්ඡයෝ වෙදිතබ්බෝ—සි.

උපමාතෝ—යන්නෙහි මෙම චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් උපමා විසිනු දු දන යුතු ය යන අර්ථ සි. හේ කෙසේ ද යත්? දුක්ඛසත්‍ය ය තෙමේ සංසාදන වශයෙන් පෙළෙන බැවින් භාර යක් මෙන් දන යුතු ය. සමුදය සත්‍ය ය තෙමේ ඒ ඒ භව යෙහි උපදනා දුක්ඛයට හේතුවන බැවින් භාරයාගේ ගැන්මක් මෙන් දන යුතු ය. නිරොධ සත්‍ය ය ප්‍රවෘත්ත දුක්ඛයාගේ ව්‍යුප ශමනයක් බැවින් භාර ය බහා නිබීමක් සෙයින් දන යුතු ය. මාර්ගසත්‍ය ය ප්‍රවෘත්ත දුක්ඛ ව්‍යුපශමනයට හෙතු බැවින් භාර ය බහා තබන්ට කාරණ උපායක් සෙයින් දන යුතු ය.

අපි ච—පීඩා කාරණ අර්ථයෙන් දුක්ඛසත්‍ය ය රෝගයක් සෙයින් දන යුතු ය. ප්‍රභව ලක්ෂණ බැවින් සමුදය සත්‍ය ය රෝගයාගේ උත්පත්තියට කාරණයක් නිදානයක් බඳු ය. නිරොධ සත්‍ය ය ශාන්ත ලක්ෂණ බැවින් සුව බවක් රෝග ව්‍යුපශමනයක් සන්සිදීමක් දුක්ඛහෙතුව නිසා හිඳුනා බැවින් රොගයාගේ අප ගමයක් බඳු ය. උප ශමනයට උපා ය බැවින් නෛර්‍ය්‍යාණික ලක්ෂණ මාර්ග සත්‍ය ය බෙහෙදත් බඳු ය

අපි ච—බාධක බැවින් දුක්ඛසත්‍ය ය දුර්භික්ෂයක් බඳු ය ප්‍රභව සම්භාව බැවින් සමුදයසත්‍ය ය වෘෂ්ටියක් විසම වර්‍ෂාවක් බඳු ය නිරොධසත්‍ය ය ශාන්ත ලක්ෂණ හෙයින් සුබ බැවින් සුභික්ෂයක් බඳු ය. දුක්ඛහෙතු ව සිඳුනා බ ව හෙයින් දු ඔහු ගේ අපගමයට උපා ය බැවිනු දු නිර්‍ය්‍යාණ ලක්ෂණ මාර්ගසත්‍ය ය සුවෘෂ්ටියක් බඳු ය.

මේ ද දක්වන ලදමැ සි.

උපමාතෝ'නි භාරෝ විය හි දුක්ඛසච්චං දට්ඨබ්බං. භාරා දානම් ව සමුදය සච්චං. භාර නික්ඛෙපනං විය නිරොධසච්චං, භාරනික්ඛෙපනුපායෝ විය මග්ගසච්චං. රොගෝ විය දුක්ඛසච්චං.

රොගනිදානමිව සමුදයසච්චං, රොග වූපසමො විය නිරොධසච්චං භෙසජ්ජමිව මග්ගසච්චං. දුබ්භික්ඛමිව වා දුක්ඛසච්චං. දුබ්බුට්ඨි විය සමුදයසච්චං. සුභික්ඛමිව නිරොධසච්චං, සුවුට්ඨි විය මග්ග සච්චං.

අපි ච—වෙරි වෙරමූල වෙරසමුග්ඝාත වෙරසමුග්ඝාතූපා යෙහි විසරුක්ඛ-රුක්ඛමූල-මූලූපච්ඡේද-තදුපච්ඡේදූපායෙහි-භය-භයමූල -නිබ්භය- තදධිගමූපායෙහි ඔරිමතීර-මිහොඝ-පාරිමතීර-තං සම්පාපක වායාමෙහි ච යොජෙත්වා'පෙතානි උපමානෙ වෙදිතබ්බානි-සි.

දක්වන ලද උපමා වශයෙන් ද මේසේ චතුරාර්ය සත්‍යයන් ගේ විනිශ්ච ය දත යුත්තේ ය. දෙවෙනි පාඨපඬිභානියෙන් දැක් වූ උපමාවන් අතුරෙහි වෛරතුම්,-ව්‍යාපාද ය සි. ප්‍රතිපක්ෂ බව හෝ සි. වෙරමූල නම් ආක්‍රොශ වස්තු සි වෙර සමුග්ඝාත නම් වෛර සන් හිදීම ය මෛත්‍රි ය හෝ සි. වෙර සමුග්ඝාතූපාය නම් සංග්‍රහ වස් තු සි. **චතුක්ඛත්තුං** යන්නෙහි ද **සුඤ්ඤතො** යන්නෙහි ද විනිශ්ච ය විශුද්ධිමාර්ගයෙහි ආ ක්‍රමයෙන් දත යුතු.

එකවිධාදිභි--යන්නෙහි විනිශ්ච ය කෙසේ ද යන්? මොවුන් කෙරෙහි සියලු ම දුක්ඛ ය සංසාර ප්‍රවෘත්ති බැවින් එකවිධ වෙ සි. නාමරූප වසින් ද්විවිධ වෙ සි කාමූපපත්තිභව ය-රූපූප පත්තිභව ය-අරූපූපපත්තිභව ය-යන ප්‍රභෙද වසින් ත්‍රිවිධ වෙ සි. මෙසින් විපාකඛන්ධයන් ම දුක්ඛසත්‍ය ය බව කිහු සතර ආහාර ප්‍රත්‍ය ය වසින් චතුර්විධ වෙ සි. මෙසින් කබලිංකාරාදි සතර ආහාර වින්‍ය විශෙෂයන් ද අභ්‍යවහරණී ය වස්තු ය-ඤ්ඤවායතන ය-අවිද්‍යා ය-අභිසංඛාර ය සි කියන ලද තත් ප්‍රත්‍ය ය වූ ධර්ම විශෙෂයන් ද ඔජාෂ්ටමක රූප ය-වෙදනා ය-ප්‍රති සන්ධිඤ්ඤාණ ය-නාමරූප ය-යන තදනිවෘත්ත ධර්මවිශෙෂයන් ද සංග්‍රහ කළෝ ප්‍රවෘත්ති ද දුක්ඛයට ප්‍රවෘත්තික බැවිනැ සි දත යුතු. පඤ්චොපාදානඛන්ධ භෙදයෙන් පඤ්චවිධ මේ.

එසින් කිහ.

සබ්බමෙව වෙත්ථ **දුක්ඛං** එකවිධං පවත්තිභාවතො, දුවිධං නාම රූපතො, තිවිධං කාමරූපාරූපූපපත්තිභාව භෙද තො, චතුබ්බිධං චතු ආහාර භෙදතො, පඤ්චවිධං පඤ්චූපාදා නක්ඛන්ධභෙදතො-සි.

සමුදය සත්‍ය ය දුක්ඛ ය පවත්වන බැවින් එකවිධ වෙ සි. දිට්ඨි ය හා සම්ප්‍රයුක්ත ය අසම්ප්‍රයුක්ත ය යන ප්‍රභෙදයෙන් ද්විවිධ වෙ සි. කාමතණ්හා ව ය භවතණ්හා ව ය විභවතණ්හා ව ය

යන භෙදයෙන් ත්‍රිවිධ වෙයි. සතර මාර්ගයෙන් ප්‍රහාතව්‍ය බැවින් සතර මාර්ගයන්හේ භෙදයෙන් චතුර්විධ වෙයි. රූපාදී පඤ්ච ස්කන්ධයෙහි අභිනන්දන වශයෙන් හෝ රූපාලම්බනාදි වශයෙන් හෝ පඤ්චවිධ වෙයි. ෂට්ෂෘෂ්ණා කාය භෙදයෙන් ෂට්විධ වෙයි. මේහි රූපතෘෂ්ණාදිහු ප්‍රත්‍යේකයෙන් අනෙක භෙද නිත්‍ය නොයෙහි තෘෂ්ණාකාය නම් වෙත්. ඔවුන්ගේ භෙදයෙ නැයි සේයි.

එයින් කිහ.

සමුදයො සි එකවිධො පවත්තක භාවතො, ද්‍විවිධො දිට්ඨි සම්පයුත්තාසම්පයුත්තතො, තිවිධො කාම භව විභව තණ්හා භෙදතො, චතුබ්බිධො චතුමග්ගපහෙදතො, පඤ්චවිධො රූපාභි නන්දනාදි භෙදතො, ඡබ්බිධො ඡ තණ්හා කායභෙදතො-යි.

නිරොධ ය නෙමේ අසංඛත ධාතු භාවයෙන් එකවිධ වෙයි. පත්‍තිය ය යි කියන ලද ව්‍යවහාර වශයෙන් වතාහි සොපාදිශෙෂ අනුපාදිශෙෂ වශයෙන් ද්විවිධ වෙයි. මේහි "උපාදතෙහි උපාදිය තිති උපාදි" උපාදනයන් විසින් ගන්නා ලැබේ නු යි (උපාදනස් කඬ පඤ්චකය) උපාදි නම් වෙයි. තන්නිස්සරණ වූ නිබ්බාණ ය උපාදනස්කඬ පඤ්චක ය ව්‍යපශමන ය කෙරේ නු යි ඔහුගේ පශ්චිම විත්ත ය දක්වා නෙෂතාව ද එයින් මතුයෙහි අනවශෙෂ තාව ද නිසා සොපාදිසෙස නිබ්බාණධාතු ය නිරුපාදිශෙෂ නිබ්බාණ ධාතු ය යි ද්විවිධ වියින් ව්‍යවහාර කරණු ලැබෙයි

යම් සේ මේ භෙද ය ව්‍යවහාර වශයෙන් වේ ද එසේ ම සෙසු භෙදයෝ ත් වෙති යි දක්වන පිණිස **තිවිධො** යනාදීන් කියන ලද යි සෙත්. භවත්‍රය ව්‍යපශමන ය කරණ නෙයින් ත්‍රිවිධ වේ. සතර මාර්ගයෙන් පැමිණිය යුතු බැවින් චතුර්විධ වෙයි රූපාභි නන්දනාදි පඤ්චාභි නන්දනයන් සන්හිදුවන බැවින් පඤ්චවිධ වෙයි. තණ්හාකාය ෂඩය භෙදයෙන් ෂට්විධ වෙයි

එයින් කිහ.

නිරොධො සි එකවිධො අසංඛත ධාතුභාවතො, පරියායෙන ද්විවිධො සඋපාදිසෙස අනුපාදිසෙසතො, තිවිධො භවත්තය වූප සමිතො, චතුබ්බිධො චතුමගහාදි ගමනීයතො, පඤ්චවිධො පඤ්චාභිනන්දන වූපසමතො, ඡබ්බිධො ඡ තණ්හා කායඛය භෙදතො — යි.

මාර්ගසත්‍ය ය ද භාවිතව්‍ය බැවින් එකවිධ වෙයි. සමථ විද ර්ශනාදි බැවින් ද්විවිධ වෙයි. මේහි සම්මාදිට්ඨි සම්මාසංකප්ප දෙදෙන ප්‍රඥා ය හ. ඉතරයෝ සමථ ය හ. සීල ය ද සමථයට උප කාර බැවින් සමථ ග්‍රහණයෙන් ගන්නා ලැබෙයි. ඔවුන්ගේ

අනිප්‍රාය ය සි යන දවය වශයෙන් ලබ්ධ වූ මාගී ය සමථ විදර්ශනා ය සි ආගමන වශයෙන් හෙද කියන ලදැ සි දත යුතු. විදර්ශනා මාගී ය භාවනා මාගී ය යන හෙදයෙන් හෝ දවිවිධ වෙයි. ශීලස්කන්ධ ය සමාධිස්කන්ධ ය ප්‍රඥාස්කන්ධ ය යන ස්කන්ධත්‍රය හෙදයෙන් ත්‍රිවිධ වෙයි. ශ්‍රොතාපත්තාාදී මාගී වශයෙන් චතුර්විධ වෙයි.

එසින් කිහ.

මගෙහා පි එකවිධෝ භාවෙතබ්බතෝ, දුවිධෝ සමථවිපස්සනා හෙදතෝ දස්සනභාවනා හෙදතෝ වා, තිවිධෝ ඛන්ධත්තය හෙදතෝ, චතුබ්බිධෝ සොතාපත්තාදි මග්ගවසෙන-සි.

අනික් දු සියලු ම සත්‍යයෝ අවිතථ බැවින් නිබොරු බැවින් එකවිධ වෙයි. අනිමුඛකොට ප්‍රත්‍යක්ෂ වශයෙන් දනයුතු බැවින් හෝ විශිෂ්ටඥනයෙන් දතයුතු බැවින් හෝ එකවිධ වේ. දුක්ඛ සමුදය දෙදෙනා ලෞකික වශයෙන් ද නිරොධ මාගී දෙදෙනා ලොකොත්තර වසයෙන් ද හැතෙන බැවින් ලෞකික ලොකොත්තර විසින් හෝ දවිවිධ වෙයි. නිරොධ ය අසංඛත ය සෙස්ස සංඛත ය සි කියා හෝ දවිවිධ වෙයි. දර්ශනාදී විසින් ත්‍රිවිධ වෙයි. පරිඤ්ඤෙය්‍ය - පහාතබ්බ - සච්ඡිකාතබ්බ - භාවෙතබ්බ හෙදයෙන් චතුර්විධ වෙයි

එසින් කිහ.

අපි ච - සබ්බානෙ ව ඇවඩිනි එකවිධානි අවිතථත්තා අනිඤ්ඤෙය්‍යත්තා වා. දුවිධානි ලොකිය ලොකුත්තරතෝ සංඛතා සංඛතතෝ වා. තිවිධානි දස්සන භාවනාහි පහාතබ්බතෝ අපපහාතබ්බතෝ ච, චතුබ්බිධානි පරිඤ්ඤෙය්‍යාදි හෙදතෝ-සි.

මෙසේ එකවිධාදී හෙදයෙන් විනිශ්ච ය දත යුතු සි.

සහාග විසභාගතෝ යන්නෙහි සියලු සත්‍යයෝ ම අවිතථ බැවින් ද අනත්ම ශූන්‍ය බැවින් ද දුෂ්කර වූ ප්‍රතිවෙධ ඇති බැවින් ද සදෘශයෝ ය. ඒ එසේ ම ය. යමෙක් දුරුතැනෙක සිට කෙසි සිදුරෙන් ශර ය විදී ද හෙ ද පළමු යන ශරපොඩියෙහි හෙවත් දන්තෙහි පසු පසු ව විදි ශරයෙහි ශරතුඩ නො වරදවා විදී ද යමෙක් හෝ සියක් වරක් ඉරන ලද අස් ලොමෙහි කෙළවරින් වැදී අනික් කෙළවරින් නික්මෙන ලෙසට ප්‍රතිමුඛ භාවයෙන් විදුනේ ද මෙයට ත් වඩා චතුස්සත්‍ය ය ඇති ලෙස දැනගැන්ම දුෂ්කර වන්නේ ය.

වදුලේ මෑ නෝ

තං කිම්මඤ්ඤසි ආනන්ද කතමනනු ඛෝ දුක්කරතරං වා දුරභිසම්භවතරං වා යෝ වා දූරතෝ ව සුඛුමේන තාලවණ්ටග්ග

ලෙන අසනං අතිපාතෙය්‍ය පොඛ්ඛානුපොඛ්ඛං අවිරාධිතං යො සතධානිත්‍යාසස වාලසස කොටියා කොටිං පටිවිජේඛය්‍යා හි. එත දෙව හනෙත දුක්කර තරයෙඤ්ච දුරභිසම්භවතරඤ්ච-යො සතධා නිත්‍යාසස වාලසස කොටියා කොටිං පටිවිජේඛය්‍යා හි. තතො ඛො තෙ ආනන්ද දුප්පටිවිජ්ඣතරා පටිවිජ්ඣන්ති-යෙ ඉදං දුක්ඛ නති යථාභූතං පටිවිජ්ඣන්ති. අයං දුක්ඛසමුදයොති යථාභූතං පටිවිජ්ඣන්ති. අයං දුක්ඛනිරොධො හි යථාභූතං පටිවිජ්ඣන්ති. අයං දුක්ඛනිරොධ ගාමිනි පටිපදාති යථාභූතං පටිවිජ්ඣන්ති-සි.

බාධක ප්‍රභවාදී තමින්ගේ සවභාව ය නියම විසින් විස භාගයෝ සි. පළමු දුක්ඛ සමුදය දෙදෙන ඖදාරිකයෝ නු සි නියාගතයන්ට ද ආහාරාදියෙහි තෘෂ්ණා ව ප්‍රකට ම ය. පීඩනා යූහනාදී වශයෙන් වනාහි මේ දුක්ඛ ය මෙයට කාරණ ය සි තත් වූ පරිද්දෙන් අවගාහනයට නො පිළිවන් බැවින් ගැඹුරු බැවිනුදු ලෞකික බැවිනුදු සාසව බැවිනුදු සභාග ය හ. ඵල ය හෙතු ය සත මෙවුන්ගේ භෙදයෙන් ද පරිඤ්ඤෙය්‍ය ය ප්‍රහාතව්‍ය ය යත මෙවුන්ගේ භෙදයෙන් ද විසභාග ය හ. පශ්චිම සත්‍යද්වය ද ගැඹුරු බැවින් ද දුරවගාහ බැවින් ද ලොකොත්තර බැවින් ද අනාසව බැවින් ද සභාගයහ. විෂය විෂයී බැවින් අරමුණු අරමුණු බැවින් ද සච්ඡිකාතබබ භාවෙතබබ වශයෙන් ද විසභාග වෙත්. ප්‍රථම තෘතීය වූ දුක්ඛනිරොධ දෙදෙන ඵල ය සි කියනු ලබන බැවින් සභාග යහ. දුක්ඛ ය සංඛත බැවින් නිරොධ ය අසංඛත බැවින් විසභාගයහ.

දෙවෙනි සතරවැනි වූ සමුදය මාර්ග සත්‍ය දෙදෙන හෙතු ය සි කියනු ලබන බැවින් සභාගය හ. සමුදය එකාන්ත අකු සල් බැවින් ද මාගී ය එකාන්ත කුසල් බැවින් ද විසභාගය හ. ප්‍රථම චතුර්ථ වූ දුක්ඛමාගී දෙදෙන සංඛ්‍යා හෙයින් සභාගය හ. දුක්ඛ ය ලෞකික හෙයින් ද මාගී ය ලොකොත්තර හෙයින් ද විසභාගය හ. දෙවෙනි තුන්වෙනි වූ සමුදය නිරොධ දෙදෙන ද නෙවසෙඛ නාසෙඛ වසයෙන් විසභාග ය හ. සාරම්මණ අනා රම්මණ වසයෙන් විසභාග ය හ මේ ක්‍රමයේ මේ බදු ප්‍රකාර ඇති නයින් නුවනැත්තේ ආර්‍ය්‍ය සත්‍යයන්ගේ සභාග විසභාග තාව දන්නේ සි.

දන්වන ලද මැ සි—විශුද්ධිමාගීයෙහි.

ප්‍රබ්බානි ච දෙව සභාගානි දුරවගාහත්තා ගම්භීරත්තා ලෝකියත්තා සාසවත්තා ච විසභාගානි ඵලහෙතු භෙදතො පරි ඤ්ඤෙය්‍යපහාතබබතො ච. පච්ඡිමානි පි දෙව සභාගානි ගම්භී

රහිතා දුරවගාහත්තා ලොකුත්තරත්තා අනාසවත්තා ච. විසභාගානි විසය විසයී හෙදතො සච්ඡිකාතබ්බ භාවෙතබ්බතො ච. පඨම තතියානි වාපි සභාගානි, එලාපදෙසතො විසභාගානි, සංඛතා සංඛතතො. දුතිය චතුත්ථානි වාපි සභාගානි නෙව සෙඛ නාසෙඛ භාවතො විසභාගානි සාරම්මණා නාරම්මණතා.

ඉති එවං පකාරෙහි නයෙහි ච විවත්ථණා,
විජඤ්ඤු අරියසච්චානං සභාග විසභාගතං—සි.

මේ මේසේ **විභාගතො නිබ්බචනං** යනාදියෙහි පටන් අරියසච්චානං සභාග විසභාගතං යන මෙතන දක්වා අනෙක ප්‍රකාරයෙන් විභාග කරණ ලද හෙවත්—

විභාගතො නිබ්බචන ලක්ඛණාදිපප හෙදතො,
අත්ථුද්ධාරතො වෙව අනූනාධිකතො තථා.
කමතො ජාති ආදීනං නිවජ්ඣා ඤාණ කිච්චතො,
අනෙකාගධානං පභෙදූ උපමාතො චතුක්කතො.

සුඤ්ඤතෙක විධාදීහි සභාග විසභාගතො,
විනිච්ඡයො වෙදිතබ්බා විඤ්ඤූනා සාසනක්කමෙ-සි.

යන මාතෘකාවෙන් දක්වන ලද විභාග නිර්වචනාදී වසින් වණ්නා කර වදාරන්නා වූ බුද්ධඝෝෂ මහා සථවිරයන් වහන්සේ ලොකානන්ද කර වූ බුදුරජාණන් වහන්සේ විසින් වදාළ චතු රාර්‍ය්‍ය සත්‍ය ය ම ගෙණ විර්ණනා කර වදාළ සේක. අඤ්ඤ කොණ්ඩඤ්ඤාදීන්ට දම්සක් පැවතුම් සූත්‍රාදියෙහි බුදුන් විසින් අවබොධ කරවූයේ න් මේ චතුරාර්‍ය්‍ය සත්‍ය ම ය. එසේ අවබොධ කර වදාරණ සේකැ ත් තමින් වහන්සේ අභිඤ්ඤෙය්‍යාදී විශයෙන් චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්‍මයන් බොධිදුම මූල සම්පයෙහි දී දැන් නෙසින් ම ය. එසේ හෙයින් සද්ධර්‍මාවතා දායක වූ සද්ධර්‍ම ගඩාප්‍රවාහ වූ සම්නන්තාභද්‍ර වූ සකල ලොක චින්තාමණික්‍ය වූ ලොකස්වාමි වූ බුදුරජානන් වහන්සේ බුද්ධ නම් වන සේක.

එසින් වදාළ හ.

අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤූනං භාවෙතබ්බං ච භාවිතං,
පහාතබ්බං පහීණමෙම තසමා බුද්ධොසමි බ්‍රාහ්මණ-සි.

මෙතෙකින් මේ සද්ධර්‍ම සාරාර්‍ථ සඞ්ග්‍රහ යෙහි

විසුද්ධිමාර්ගයෙන් සඞ්ග්‍රහ කළ

චතුරාර්‍ය්‍ය සත්‍යකථා නම් වූ

සවෙනි පරිච්ඡේදය නිමි

7. වෙනි පරිච්ඡේදය.

මහාකාශ්‍යප සථවිරාවබෝධ කථා

තව ද මේ සද්ධර්ම සාරාර්ථ සංග්‍රහ යෙහි මහාකාශ්‍යප සථවිරාවබෝධ කථා නම් කවරහ යත්?

චතුවෛශාරද්‍ය ඥානයෙන් විශාරද වූ කායබල දසයක් හා ඤාණබල දසයක් ද දරණ හෙයින් දසබලධාරී වූ පූජා සත්ත්වවරයන් පිහිටියා වූ ස්ථානයෙහි පිහිටි හෙයින් ආසභණ්ඨානට්ඨායි වූ නිර්භීත නාද පවත්වන හෙයින් සිංහනාද පවත් වන්නා වූ සියලු සත්ව යන්ට උතුම් වූ හෙයින් සත්සත්තොත්තම වූ ධර්මයට ඉසුරු බැවින් ධර්මේශ්වර වූ ධර්මයෙන් සියලු සත්ත්වජනයා රඤ්ජන ය කරණ හෙයින් ධර්මරාජන් වූ ධර්මයට නායක බැවින් ධර්මාධිපති වූ ධර්මාලෝක ය දක් වන හෙයින් ධර්මප්‍රදීප වූ ධර්මයට ප්‍රතිඤා හෙයින් ධර්මශරණ වූ ධර්මයෙන් ආඥාවක්‍ර ය පවත්වන හෙයින් සද්ධර්මවර චක්‍රවර්ති වූ සද්ධර්මයන් සළකාරයෙන් පරොපදෙශ රහිත ව සවයම්භූ ඥානයෙන් දන් හෙයින් සම්‍යක් සම්බුද්ධ වූ යම් බුදුරජාන කෙණෙකුන් වහන්සේ නමක් ඇද් ද?

ඒ සත්ත්වයන් වහන්සේ ද්වාත්‍රිංශත් වර මහාපුරුෂ ලක්ෂණ යෙන් හා අශීත්‍යානුව්‍යඤ්ජනයෙන් නෙඹි සේත් නීල පීත ලොහිතා වදාත මාඤ්ජිෂ්ඨ ප්‍රභාස්වරයෙන් විසිතුරු වූ සොභා ඇති බ්‍යාමප්‍රභා මණ්ඩලයෙන් පරික්ෂිප්ත වූ රූපවිලාසයෙන් යුක්ත සේක් සුපුෂ්පිත වූ පද්මොත්පල පුණ්ඩරීකයෙන් නෙඹියා වූ ජලතලය ක් මෙන් ද තාරකා සමූහයාගේ රශ්මිප්‍රාලා සොභාවෙන් බබලන්නා වූ ආකාස තලයක් මෙන් ද සදවලාගෙන් හා දෙවිදුන්හෙන් වටකරණ ලද සවර්ණ පර්වත කූටයක් මෙන් ද තමන් වහන්සේගේ ශ්‍රී සමෘද්ධින් සියලු ලොක ය ඒකාලෝක කරණ සේක්, චතුස්සත්‍යාව බොධයට නිසි වූ පුද්ගලයන් දැක මහා කාශ්‍යප සථවිරාදීන් පිණිස තුන් ගව්වක් පමණ තැන්හි ද ආලවකාදීන් සඳහා තිස් යොදනක් පමණ තැන්හි ද මහා කපපින සථවිරාදීන් සඳහා එක්සිය විසියොදනක් පමණ තැන්හි ද වැඩ චතුස්සත්‍යාවබොධ ය කර වදාළ සේක.

එහි මහාකාශ්‍යප සථවිරාදීන් සඳහා තුන්ගව්වක් පමණ තැන්හි වැඩ චතුස්සත්‍යාවබොධ ය කර වදාළ පරිදි කෙසේ ද යත්?

ඒ මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ නම් මේ මහා භද්‍ර කල්පයට ලක්ෂයක් වන කපින් මත්තෙහි ප්‍රාදුර්භූත වූ පියුමතුරා නම්

සම්බුදුයන් වහන්සේ සමයෙහි හංසවතී නම් නුවර නොයෙක් කෙළ ගණන් වස්තු ඇති **වෙදෙහ** නම් කෙළෙඹි පුත්‍රයෙක් ව ඉපද බුදුන් කරා එළඹ බණ අසා බුදුපාමොක් මහාසඞ්ඝයාට මහදන් සරහා නොයෙක් ලෙසින් විසිතුරු කොට සරහන ලද තමන්ගේ ගෘහයෙහි දී දන් දෙන දිනයෙහි ධුතාඞ්ග ධරයන් කෙරෙහි අගතැන් පත් වූ **වඞ්ගීස** නම් තෙරතෙණෙකුන් වහන්සේ ගෙපිළිවෙළින් සිහමින් එන තට සම්ප්‍රාප්ත වූවා දැක තුදුස් බතෙහි ඇතුළත්කොට නොකියා සප දන චාරිකයන්ගේ පාත්‍ර ය ගෙණ නෝ සිහ සිටි තැනට ගොස් නෝ භික්ෂාටනයෙන් පිළිගන්වන ක්‍රම ය නො දන සවාමීනි! බුදුපාමොක් මහාසඞ්ඝයා මාගේ ගෙයි දී වළඳ වදුරණ සේක නුඹවහන්සේ න් මට අනුග්‍රහ කොට වැලඳීමට වැඩිය මැනවැ යි ආරාධනා කළ හෙයින් තමන් වහන්සේ ඒ නොයිවසා වැඩිය කල්හි බුදුන් කරා එළඹ සවාමීනි! තුන්ලොවෙහි සියලු ගුණයෙන් බුදුන්ට වැඩි කෙණෙක් ඇද්ද යි විචාළ කල්හි—

පාලෙනති නිම්මලං කඬා පානිමොක්ඛාදි සංවරං,
සමාදිහනධුතඞ්ගා ව අප්පිච්ඡා මුනිසූනවෝ.

නිච්චමනතක යුද්ධමහි නද්ධා යොධා'ව තපපිතා,
පුඤ්ඤානං වත්ථුභූතා තෙ දෙවමානුසකාදිනං.

ධාරෙමහං චණණවනතං සිවෙය්‍යමපි ච චීවරං,
බුද්ධපුත්තා මහානාගා න ධාරෙනති තථා විධං.

ධාරෙනති තෙ පංසුකූලං සංඣාටෙත්වා පිලොතිකෙ,
වණචජ්ජාදන වොලං'ව ඉච්ඡාලොභ විවජ්ජිතා.

සාදියාමි සදු'හමෙහා උපාසක නිමනතණං,
නෙ'ව සාදෙනති සම්බුද්ධ පුතෙතා'පාසකයාචනං.

සපදානෙන යං ලඬං ලූඛං වාපි පණීතකං,
තෙන තුසසනති මෙ පුතතා රසගෙධ විවජ්ජිතා-සි.

යනාදීන් එම්බල කෙළඹි පුත්‍ර ය චීවර පිණ්ඩපාත සෙනාසන ගිලාන ප්‍රත්‍ය ය යන මේ සිවුපස ලාභයෙහි ඉතා අල්පෙච්ඡ වූ මාගේ සහහු වනාහි.ප්‍රාතිමොක්ෂ සංවරශීල ය ඉන්ද්‍රිය සංවර ශීල ය ආජීව පාරිශුද්ධි ශීල ය ප්‍රත්‍යය සන්නිශ්‍රිත ශීල ය යන මේ සතර සංවර ශීල ය අත්‍යන්ත නිර්මලකොට තමන් ජීවිත ය පරිද්දෙන් නිරන් තරයෙන් රක්ෂා කරන්නා හ. එසේ ම පාංශුකූලිකඞ්ග ය තෙචීවරි කඞ්ග ය පිණ්ඩපාතිකඞ්ග ය සපදාන චාරිකඞ්ග ය එකාසනිකඞ්ග ය පත්තපිණ්ඩිකඞ්ග ය යනා දී නාම ව්‍යවහාර වශයෙන් තෙරස ප්‍රකාර යක් ඇත්තා වූ උත්කෘෂ්ට මධ්‍යම මෘදුක වශයෙන් එකුන්සාළිස්

ප්‍රකාරයකින් යුක්ත වූ මේ සියලු ම ධූතාඞ්ග ගුණයන් නොපිරිහෙලා සම්පූර්ණ ව අඛණ්ඩයෙහි රක්ෂා කරන්නාහු ය. නිරන්තරයෙන් මාර යුද්ධ ය පිණිස හෙවත් "කාමා තේ පඨමා සේනා" යනාදීන් දක්නා හෙයින් මරහුගේ සේනාව ය සි කියන ලද කාම ක්‍රෝධාදී වූ කෙලෙස් සතුරන්ගේ එඩි මඩිනා පිණිස සන්නාහ සන්නද්ධ ව සැරහී දැප්වත් ව සිටියා වූ සටන් නි අඩි පසු නො ලන එඩිතර යෝධහටයන් වැනියාහ. සියලු දෙව් මිනිසුන් විසින් කරණ ලද්දා වූ කුසල් නැමති බීජ ප්‍රති ෂ්ඨාවට ක්ෂේත්‍ර ව සිටියා හ.

එම්බල කෙළෙඹි පුත්‍ර ය! මම වනාහි මනහර වර්ණසම්පත්තීන් යුක්තා වූ සිවෙයය වස්ත්‍රයෙන් කරණ ලද්දා වූ මාහැනි සිවුරු ද ප්‍රයෝජන විදිමි ම ය. මණි කාව සන්නද්ධ ගඞ්ග හස්තිරාජයන් හා සමාන සිංහ පුත්‍ර වූ මහ සඟහු වනාහි රනිජනක වූ එබඳු වර්ණ සම්පත්තීන් යුක්තා මහානඞ්ග චීවරයන් නො ඉවසන්නාහු ම ය. චීවර ප්‍රත්‍යයෙහි ඉතා අල්පෙච්ඡ වූ හෙයින් ලොභ තෘෂ්ණාවෙන් පහ වූ නිස්පෘහ වූ වාරිත්‍ර වාරිත්‍ර හා නිර්මල වූ චිත්තසන්තාන ඇති ප්‍රතිපත්ති සාර වූ මාගේ සඟහු වනාහි ගඳ පිළිකුල් වණ වසන්ට ලන තෙල් පියලි සෙයින් කඩ රෙදි ගොතා කරණ ලද ඉතා රූක්ෂ වූ පාංශුකූල චීවරයන් දරන්නාහ. තව ද මම වනාහි ඇමතිකල්හි මි උපාසක ආරාධනා ගිවිස නොයෙක් සූපව්‍යඤ්ජන යෙන් යුක්තා වූ දිව බොජුන් හා සමාන වූ මිහිරි ආහාර ය අනුභව කෙරෙමි ම ය.

සම්‍යක් සම්බුද්ධයන්ගේ පුත්‍ර වූ මේ සුපිළිපන් මහසඟහු වනාහි එ පරිද්දෙන් උපාසක ආරාධනා නො ගිවිස්නා හ. යලි කෙසේ ජීවත්වේද් ද යත හොත්? නිරන්තරයෙන් වෙහෙර කළ මිනා වත් සපයා සියල්ලවුන් කෙරෙහි මෙත් පතුරුවා ධාතු සම්සර්ග මෙනෙහි කරමින් සිවුරු ගැට ගන්වා පාත්‍ර ය අතින් ගෙණ ගමට වැද හීන මධ්‍යමෝත්කෘෂ්ට ය යන හැම සඞ්ඝයන් සොරෙහි එකාකාරයෙන් පවත්නා සොමි සිසිල් සොම්සඳ පහණක් සේ සපදාන චාරිත්‍රයෙන් යෙදී ගෙපිළිවෙළින් සිහා රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ යම්කිසි ආහාරයක් ලද්දාහු වී නම් රසයෙන් ගිජුබවක් නැත්තා වූ මාගේ සඟහු එයින් ම සන්තුෂ්ට වන්නා හ.

තව ද කෙළෙඹිපුත්‍ර ය! මම වනාහි චතුර්විධ ඒෂණාපථ ය පරිවර්ජිත ය කෙරෙමි. මාගේ සඟහු සිංහ ව්‍යාඝ්‍රාදී වණඩ සඞ්ඝයන් කෙරෙහි හයින් නිදිවර්ජිත ව වසන මෘග ජාතීන් මෙන් ප්‍රතිභය සහිත වූ අසාර වූ සංසාරයෙහි ආදීනව දැක සසර හයින් භය පත්වූවාහු එ පරිද්දෙන් නො සතපෙන්නාහු ම ය., චිත්තානුකූල වූ

කම්සථානයක් ගෙණ හිඳීම සිටීම සක්මන් කිරීම යන මේ තුන් වැදෑරුම් වූ ඊර්‍යාපථ පරිවර්‍තනයෙන් දවස් යවන්නා හ.

තව ද මම වනාහි එක් මහල් දෙ මහල් තුන්මහල් සතර මහල් පස්මහල් සමහල් සත්මහල් ආදි වූ ප්‍රභෙද ඇති දිව්‍ය විමාන හා සමාන උතුම් ප්‍රාසාදයෙහි දු වාසය කෙරෙමි මි ය. මාගේ ශ්‍රාවක සඞ්ඝයා වනාහි අරණ්‍ය සෙනාසනයෙහි එකහ වූ සිතින් භාවනානුයෝගයෙහි යෙදී උදකලා ව වාසය කරන්නාහ – මේ බදු මේ සියලු ගුණගණාඞ්ගයෙන් සැරසී සිටියා වූ ඒ මාගේ ශ්‍රාවක සමූහයා කෙරෙහි ඇතුලත් වූ මේ වඤ්ඣ නම් මහ තෙරහු වනාහි නසන ලද සියලු අකුසල කම්යන් ඇති ව ධුතාඞ්ග ධරයන් කෙරෙහි අග්‍ර වූ සථානාන්තර ලදින් මාගේ ශාසන නැමැති ආකාශයෙහි හිර සඳ සේ ප්‍රසිද්ධ වූ උත්තමයාණ කෙණෙක් වේ ද යනාදීන් මෙසේ ඒ භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ අත ඔසවා සඳමඬල පානා සේ තෙරුන් වහන්සේගේ අප්‍රමෙය්‍ය වූ ගුණ සමූහයන් ප්‍රකාශකොට වදාළ හෙයින්–

තමන්ට ද ඒ තනතුර කැමැති ව මම ද මේ තෙරුන් වහන්සේ පරිද්දෙන් එන දවස එක්තරා බුදුකෙණෙකුන්ගේ ශාසනයෙහි ධුතාඞ්ග ධරයන් කෙරෙහි අග්‍ර වෙම්වා යි ප්‍රාර්‍ථනා කොට ලබන ලද විවරණ ඇති ව සසර සැරිසරා අවුත් මීට එකානූවන කප බුදු වූ මහා විපස්සි නම් බුදුන් සමයෙහි දඹදිව එකසාටක නම් බ්‍රාහමණ ව ඉපද මහදන් දී ඒ බුදුන් කෙරෙනුත් මේ තනතුරට විවරණ ලැබ දිව්‍ය මනුෂ්‍ය සමපත් විඳිමින් අවුත් දඹදිව කෙළෙඹි පුත්‍රයෙක් ව ඉපද පසේබුදු කෙණෙකුන්ගේ සිව්රකට නුවා පිණිස උතුරු සළුවක් පුදා ඒ පිණින් තව්තිසා දෙව්ලොව ඉපද එහි සැපවිඳ නැවත දඹදිව තුන්යොදුන් පමණ තන්හි එක්තරා නියම් ගමේ එක්තරා කුලගෙයක ජන්ධිය යන නමින් යුක්ත ව ඉපද "රසවාහිනියෙහි" කියන ලද ක්‍රම යෙන් ගොස් බරණැස් නුවර නන්දිය නම් රජ ව බිසවුන්ගේ යාඥුවෙන් පන්මාවනී බිසවුන්ගේ පුත්‍ර වූ පන්සියයක් පසේබුදු වරයන් වහන්සේට මහදන් දී උන්වහන්සේලා පිරිණිවි කල්හි අනිත්‍ය මෙනෙහිකොට දෙටු පුත්හට රාජ්‍යය දී බිසවුන් තමනු ත් මහණ ව උයනෙහි දෙතැනක හිඳ තපස්කොට පඤ්ච අභිඥ අෂ්ට සමාපත්ති උපදවා අපරිහීණ ධ්‍යානයෙන් දෙදෙන ම බඹලොව ඉපද ධ්‍යාන සැප විඳ අප බුදුන් සමයෙහි එයින් චුත ව–

දඹදිව එක්තරා ගමෙක කාශ්‍යප ගොත්‍ර වූ බමුණු මහසල් කුලයෙක්හි දෙව්ලොවින් බට දිව්‍ය කුමාරයෙකු සේ රූපශ්‍රීන් යුක්ත ව ඉපද පිප්පලි කුමාර යන නමින් ලොක ප්‍රසිද්ධ වූහ.

පෙර නන්දිය රාජකාලයෙහි බිසව් තමන් හා බ්‍රහ්මලෝකයෙහි උපන්නී එයින් චුත ව එම බමුණු ගම බ්‍රාහ්මණ කුලයෙහි දිව්‍ය කුමාරිකාවක් සේ රැසිරින් යුක්ත ව **භද්දකාපිලානිය** යන නමින් ප්‍රසිද්ධ ව ඉපද වැඩිවඩින වූවා පූර්ව්‍වජාතියෙහි හේතුබලයෙන් පිපඵලිකුමාරයන් කෙරෙහි වැස කල්‍යාණකින් දෙදෙන ම හිඟි ගෙයි කලකිරී ලෝකෝත්තර ගුණ උත්තමයාණ කෙණෙකුන් වහන්සේගේ නමට මහණ වම්හ යි කියා ව්‍යවසය කරණ කල්හි දවසක ලෝකයෙහි ලොව්තුරා සම්බුදුරජාණන් වහන්සේ ප්‍රාදුර්භූත ව අමෘත මහා මෙඝයක් වස්කාරන්නා සේ සද්ධම්මදේශනා කෙරෙමින් සකල සත්ත්වයන්ට නිවන් පුර සිරි ගෙණ හැර දෙන සේකැ යි යනු අසා අපි ද ඒ උත්තමයාණන් වහන්සේ උදෙසා ම මහණ වම්හ යි කියා කාෂාය වස්ත්‍රයන් ගෙණ හැඳ පෙරව මහණ වෙස් ගෙණ බුදුන් දක්නා පිණිස සවකිය සථානයෙන් නික්මුණා හ.

එ දවස් අළුයම් වේලෙහි බුදුහු කෙළලඝ්‍යක් සමාපත්තියට සම්වැද අද දවස කවරක්හු සසරින් ගොඩ ලා නිවන්පුර සිරි ගෙණ හැර දෙම් දෝ හෝ යි සිතා කරුණාවෙන් ලොව බලන සේක් මේ දෙදෙනා දිවසින් දැක ඔවුන් කෙරෙහි ජනිත වූ මෛත්‍රියෙන් තුන් ගව්වක් පමණ තැන් ඉදිරියට වැඩ මගින් ඉවත් ව එක්තරා වෘක්ෂ මූලයෙක්හි වැඩ සිටි සේක.

එ දවස් නික්ම එන්නා වූ මේ පිපඵලි කුමාරයන් හා භද්දකාපිලානී යන දෙදෙන එනුන් හා කථා කරන්නාහු අපි දැන් අහිනව යෞවන අවස්ථාවෙහි සිට මහණ ව එකමග යන කල්හි දුටු දුටු කෙණෙක් නිසා කරන්නාහු ය යි අතුරෙහි මං දෙකක් බෙදුනු තැනක දැක දකුණත් මග පිපඵලී කුමාරයෝ නික්මුණා හ. වමත භද්දකාපිලානි නොමෝ නික්මුණා ය. මෙසේ වෙන් ව නික්මුණා වූ ඒ දෙදෙනාගෙන් පිපඵලී කුමාරයෝ අවුත් ඒ පෙර මග සමීපයෙහි වෘක්ෂමූල සරණා වැඩ සිටි සම්බුදු රාජෝත්තමයාණන් වහන්සේ දැක මහත් වූ ප්‍රීතීන් ප්‍රමුදිත ව පසඟ පිහිටුවා වැඳ එකත්පස් ව තමන් පෙර නොදුටු විරූ රූපශ්‍රියක් සෙයින් විද විද බල බලා සිටි ය හ.

එ කල්හි කරුණා නිධාන වූ දිපදෙත්තමයාණන් වහන්සේ ඔවුන් වහන්සේට ගොත්‍ර නාමයෙන් කාශ්‍යපයිනි! යි ආමන්ත්‍රණය කොට ධම්දෙශනා කරණ සේක් ත්‍රිවිධ අවවාදයෙන් උපසම්පද කොට ඔහු උගන්වා බණ වදාළ සේක මේ කවර සිත් සැනසී මෙක් දැ යි සද්ධම් ප්‍රීතීන් ප්‍රමුදිත ව සද්ධම්මාමෘත රසාස්වාද ය කෙරෙමින් රහත් ව වැඩ සිටි සේක් තමන් වහන්සේගේ කර තුබූ

පටපිලොතිකා සංඝාටිකා චීවර ය සතර පටින් ඒ වෘක්ෂ මූලයෙහි පණවා භාග්‍යවතුන් වහන්සේ මට බොහෝ කලක් වසන්නා වූ ඝන සැප පිණිස සංඝාටි ය මස්තකයෙහි වැඩ හිඳිනේ යනපතැ යි ආරාධනා කළ හෙයින් බුදුහු සංඝාටි ය මස්තකයෙහි වැඩහිඳ රඤ්ඤ පද්මියක් වැනි වූ තමන් වහන්සේගේ මෘදු කොමල ශ්‍රී හස්තයෙන් වැඩඋන් සහල සිවුර පිරිමැද වදාරණ සේක් කාශ්‍යපයෙනි! තොපගේ මේ පටකඩ සහල සිවුර ඉතා මෘදු ය යි වදාළ සේක.

එ සඳ මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ බුදුන් සිවුරෙහි ගුණ වදාළ හෙයින් නැවත ඒ සිවුර තමන් වහන්සේ හැරගෙණ වැළඳ ගැන්ම සුදුසු නොවෙ යි සිතා මහතුන් විසින් කිසි යම් වස්තුවෙක ගුණ කිව හොත් ඒ වස්තු ව ඒ මහත්මයන්ට පැමිණීම චාරිත්‍ර ධර්මයක් හෙයිනු න් – බුදුන් වදාළ වචන ය අසා දන්වන සේක් ධර්මස්වාමීන් වහන්ස! මා කෙරෙහි අනුකම්පාකොට පටකඩ සිවුර පිළිගත මැන ව යි කී සේක. එ සඳ සර්ෂයන් වහන්සේ ද තමන් වහන්සේ වැලඳි පාංශුකූල චීවර ය මහාකාශ්‍යප සථවිර යන් වහන්සේ මුත් මේ ලෝකයෙහි වැලඳගන්ට කිසිවෙක් හට ත් නො පිළිවත් හෙයින් කාශ්‍යපයෙනි! මා විසින් කලක් වැලන්ද වූ සහල සිවුර ධරන්නට තොපට පුළුවන් දැ යි වදාළ සේක.

එ පවත් මුදුනෙන් පිළිගෙණ ස්වාමිනි! පාංශුකූල චීවර ය ධරන්ට මට පිළිවනැ යි දැන් වූ සේක. බුදුහු උන්වහන්සේ ඇතුන් පස්දෙනෙකුගේ බල දරණ බව දැන මේ සිවුර ධරන්ට පිළිවන් දැ යි වදාළේ නම් මතු පන්දහසෙහි තෙළෙස් බුත්ඝ ය ම උන්කෘෂ්ට වශයෙන් පුරමින් මාගේ ප්‍රතිපත්ති ශාසන ය බබුළුවන්ට හැක්කේ දැ යි විමාළ තියා ය. උන්වහන්සේ ද එසේ ම ප්‍රතිපත්ති ශාසන ය බබුළුවන්ට සමර්ථ හෙයින් මේ සුගත් චීවර ය පිළිපදනෙම් මම් ම ය යි සිතා ධර්මාශෝතතමයාණන් වහන්ස! පාංශුකූල චීවර ය ධරමි යි කී සේක.

එ කල්හි බුදුහු චීවර ය පරිවර්තන ය කරණ සේක් උන්වහන්සේගේ සිවුර තමන්වහන්සේ වැලඳ ගත් සේක. සර්ෂයන් වහන්සේ වැලඳි චීවර ය මහාකාශ්‍යප සථවිරයන් වහන්සේ පෙරවගත් සේක. එ සඳ දෙලක්ෂ සතළිස් දහස් යොදුන් ඝනකඩ බොල් මහ පොළොව ජල පොළොව දක්වා මහත් පවන් පහළ පල්ලවයක් සේ කම්පිත ව ශතසහස්‍ර රාවයෙන් ගර්ජනා කෙළේ ය. මෙසේ බුදුහු මේ පාංශුකූල චීවර ය පූර්ණ නම් දැසියක් කාලක්‍රියා කළ පසු අනර්ඝ වූ වස්ත්‍රයෙකින් වසා අම්බසොහොතකට ගෙණ

ගොස් දැමූ කල්හි ඉදිමී නිල් ව කෘමිකුලයන් විසින් ආකුල ව වැසූ වස්ත්‍රය බර ව තිබූ තිඹක් පමණ කෘමි සමූහයා සලා මහත් වූ ආයුෂ්මත් වංශයෙහි සිට ඇරගත්තා වූ චීවර ය හෙයිනුත් ඒ සිවුර ඇරගත් දවස් දසදහසක් සක්වළ දසදහසක් මහා පෘථිවිහු චීවර වන්නාක්හු මෙන් ගජිනා කළ හ. අහස ද එසේ ම මහත් කොට ගජිනා කෙළේ ය.

දසදහසක් සක්වල හැම දෙවි බඹහු සාධුකාර දුන්හ. එසේ හෙයින් ලොවුතුරා බුදුන් හැර මේ සිවුර දරන්නා වූ අන් භික්ෂුවක් ඇත් නම් ඔහු විසින් තෙළෙස් ධුතාඞ්ග ය ම උත්කෘෂ්ට වශයෙන් පිරිය යුත්තේ ය. සර්ව්ඥයන් වහන්සේට ද උන්වහන් සේගේ සිවුර කුමක් පිණිස පරිවර්තන ය කිරීමට අභිප්‍රා වූ සේක් ද යත්? ඒ සිවුර ගෙන තමන් වහන්සේගේ අනුසස් මහත් වූ පාංශුකූල චීවර ය දෙමින් මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ද තමන් වහන්සේට සම වූ ස්ථානාන්තරයෙහි තබන පිණිස චීවර ය පරිවර්තන ය කරණු කැමති වූ සේක. කිමෙක් ද එකාසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා පුරා අග්‍රශ්‍රාවක ස්ථානාන්තර ය ප්‍රාප්තිනා කොට ආවා වූ **සැරියුත්-මුගලන්** දෙදෙනා වහන්සේ වැඩ සිටි ය දී කුමක් පිණිස **මහාකාශ්‍යප** ස්ථවිරයන් වහන්සේ තමන් වහන්සේට සම වූ ස්ථානාන්තරයෙහි තුබූ සේක් ද යත්?

ඒ අගසව් දෙදෙනා වහන්සේ තම් බුදුන් ජීවමාන කාල යෙහි ම පිරිණිවන් පානා සේක. මහාකාශ්‍යප ස්ථවිරයන් වහන් සේ වනා හි එක්සිය විසි අවුරුද්දක් සම්පූර්ණ වූ ආයු ඇති සේක. එසේ හෙයින් බුදුන් පිරිණිවි ය ත් උන්වහන්සේ බුදුන් වැඩ සිටියා සේ ම සපර්‍යාප්තික නවලොකොත්තර සද්ධම්ම ය පාළි කොට තඹාගෙණ නවාඞ්ග ශාස්තෘශාසන ය නිම්ල කොට බබුලුවා බුදුන් වදළා වූ ධර්ම ය පන්දහසක් අවුරුදු පවත්නා ලෙස සංගා යනා කරණ සේකැ යි කියා බුදුහු තමන් වහන්සේට සම වූ ස්ථානාන් තරයෙහි පිහිටු වූ කල භික්ෂූන් වහන්සේ ත් උන්වහන්සේට ආදර බහුමාන කිරීමට සිතන සේකැ යි යන මෙ හැම බුදුහු අනාවරණ ඥානයෙන් ම දැක සන්නිධ්‍යාන ය කොට චීවර ය පරිවර්තන ය කල සේකැ යි දත යුතු යි.

එ සඳ චක්‍රවර්ති රජෙක්හු සඛකීය රාජවංශ ය කලක් පවත්වන්නා වූ පුත්‍ර රත්නයකට තමාගේ ශරීරයෙහි බහන ලද්දා වූ කවචයක් දී ඔහු ප්‍රසාධන ය කරවා මත්තට ලෝ වැඩ පිණිස පිහිටුවාක් මෙන් තමන් වහන්සේ වැලඳි මෙ බදු චීවර ය දෙමින් මත්තෙහි ශාසනය ආරක්ෂා කරවන ලෙස කාශ්‍යප ස්ථවිරයන්

වහන්සේට භාරකළේ ඉතා ම යහපත. ලොකසවාමී වූ බුදුරජාණන් වහන්සේගේ කරුණා මහිමයකැ යි මුළුතුන් ලොව දිව්‍ය බ්‍රහ්මාදීහු එක පැහැර සාධුකාර දුන් හ.

මෙසේ එ තැන්හි වැඩ උන් කල්හි බුදුන්ගේ අසිඝ්‍යාන බලයෙන් හඳුකපිලානි ද එ තැන්හි පැමණ ජනිත වූ අප්‍රමාන සන්තොෂයෙන් යුක්ත ව පසහ පිහිටුවා වැඳ සමීඳයන් වහන්සේ ඕසින් වදුරණ ලද්දා වූ සඳ්ධම්මාමෘත පාන ය කොට මාගීඵල ප්‍රාප්ත ව අමෘත මහා නිර්‍වාණ ය සාක්ෂාත් කළා ය.

මෙසේ ඒ කාශ්‍යප සථවිරයන් වහන්සේ මීට යට ලක්ෂ යක් වන කල්පයෙහි දී පියුම තුරා නම් බුදුන් දැක ලත් විවරණ යට සුදුසු ලෙස ප්‍රාර්‍ථනා කෙරෙමින් අවුත් මෙ කල බුදු සසුන් වැද මහණ ව බණ අසා රහත් ව ප්‍රාර්‍ථනා කළ ලෙස ම අප බුදුන්ගේ ශාසනයෙහි තෙළෙස් ධුතාඞගධර ප්‍රතිපත්තිසාර මහා සඞ්ඝයා වහන්සේට අග්‍රප්‍රාප්ත ව ධුතාඞගධරයන් කෙරෙහි මහා කාශ්‍යප සථවිරයෝ අග්‍රප්‍රාප්තයෝ ය සි බුදුන් අතින් සථානාන්තර ලැබ තෙළෙස් ධුතාඞගයන් උත්කෘෂ්ට වශයෙන් පිරූ සේක.

තෙළෙස් ධුතාඞග ය නම් කවරේ ද සි යත හොත්

පංසුකූලිකඞග ය තෙච්වරිකඞග ය. පිණ්ඩපාතිකඞගය සප දානචාරිකඞග ය එකාසනිකඞග ය පත්තපිණ්ඩිකඞග ය. ඛලුපච්ඡා භත්තිකඞග ය ආරඤ්ඤිකඞග ය රුක්ඛමූලිකඞග ය අබ්භොකාසි කඞග ය සොසානිකඞග ය යථා සන්තතිකඞග ය නෙසජ්ජිකඞග ය සි යන මේ තෙළෙස් ධුතාඞග නම් වෙත්. මෙ බදු තෙළෙස් ධුතාඞග ය උත්කෘෂ්ට වශයෙන් ම පූරමින් ප්‍රතිපත්ති ශාසන නැමති පද්මරාශි ය ප්‍රබෝධ කළ සේක. ඒ තෙළෙස් ධුතාඞග යන්ගේ වර්ණනා ව මේ මතු කියන ක්‍රමයෙන් දතයුතු.

කෙසේ ද යත්? තෘෂ්ණාවෙන් පිරිමැන්ද බැවින් ද ලොක පය්‍යාපන්න බැවින් ද ලාභ සත්කාරාදීහු ලොකාමිස නම් වෙති. ඒ ලොකාමිස ය දුරුකලා වූ කයෙහි දු ජීවිතයෙහි දු නිරපෙක්ෂක වූ නිර්වාණාධිගමයට අනුලොම් පිළිවෙත් සිද්ධකරණු කැමති කුලපුත්‍රයන්ට සමීසතු හිතොපකාර විශුද්ධ ගුණරත්න පූරිත නිධි නිකෙත වූ භාග්‍යවත් සමීඳ රාජෝත්තමයාණන් වහන්සේ ඕසින් අනුදන්නා ලද ධුතාඞගයෝ තෙළෙස් දෙනෙකි. ඔහු කවර හු ද යත්? පාංශුකූලිකඞගාදි තෙළෙස යි.

එසින් කිහ. විශුද්ධිමාගියෙහි

භගවතා පරිචත්තත ලොකාමිසානං කායෙ ච ජීවිතෙ ච අනපෙක්ඛානං අනුලොම පටිපදං යෙ ච ආරාධෙතු කාමානං කුලපුත්තානං තෙරස ධුතඞ්ගානි අනුඤ්ඤාතානි. සෙය්‍යථීදං? පංසුකූලිකඞ්ගං තෙචීවරිකඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං සපදානචාරි කඞ්ගං එකාසනිකඞ්ගං පත්තපිණ්ඩිකඞ්ගං ඛලුපච්ඡාභත්තිකඞ්ගං ආරඤ්ඤිකඞ්ගං රුක්ඛමූලිකඞ්ගං අබ්භොකාසිකඞ්ගං සොසානි කඞ්ගං යථා සන්ථතිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං-සි. මෙහි පංශුකූලිකාදී ඒ ඒ ශබ්දයන්ගේ අර්ථ විසින් ද ලක්ඛණ රසාදී විසින් ද සමාදාන විධාන විසින් ද ප්‍රභෙද විසින් ද භෙද විසින් ද ඒ ඒ ධුතාඞ්ගයාගේ අනුසස් විසින් ද කුසලත්‍රික විසින් ද ධුත ය ධුතවාද ය ධුතධර්ම ය ධුතාඞ්ග ය යන මොවුන්ගේ විභාග වසයෙන් ද සංක්ෂෙප විසින් ද විස්තර විසින් ද විනිශ්චය ද දතයුතු.

එසින් කිහ.

අත්ථතො ලක්ඛණාදීහි සමාදාන විධානතො,
පභෙදතො භෙදතො ච තස්ස තස්සානිසංසතො.

කුසලත්තිකතො චෙව ධුතාදීනං විභාගතො,
සමාස ව්‍යාසතො වාපි විඤ්ඤාතබ්බො විනිච්ඡයො-සි.

ඒ ධුතාඞ්ගයන් කෙරෙහි:—

අත්ථිතො තාව රථිකා සුසාන සංකාරකූටාදීනං යත්ථ කත්ථ චි පංසූනං උපරි සිතත්තා අබ්භුග්ගතට්ඨෙන නෙසු පංසු කූලම්වාති පංසුකූලං, අථ වා පංසුං විය කුච්ඡිතභාවං උලතීති පංසුකූලං, කුච්ඡිත භාවං ගච්ඡතීති වුත්තං හොති. එවං ලද්ධනිබ්බචනස්ස පංසුකූලස්ස ධාරණං පංසුකූලං, පංසුකූලං සීලමස්සාති පංසුකූලිකො. පංසුකූලි කස්ස අඞ්ගං පංසුකූලිකඞ්ගං, අඞ්ගන්ති කාරණං වුච්චති. තස්මා යෙන සමාදානෙන සො පංසුකූලිකො හොති තස්සෙතං අධිවචනන්ති වෙදිතබ්බං-සි.

යතු හෙයින් පළමුකොට වචනාර්ථ හෙයින් චීර ය සුසාන ය කසල ගොඩ ය යනාදීන් කෙරෙන් යම්කිසි තැනෙක්හි පසු ව මසන්නකයෙහි සිටිනා හෙයින් උස් ව සිටිනා අර්ථයෙන් ඒ පංසු වෙ සි. ඉවුරු බඳු නු සි පංසුකූල නම් වේ ද නොහොත් කූ ශබ්ද ය කුත්සිත නාර්ථයෙහි අල්පාර්ථයෙහි වැටෙන බැවින් ද ල ශබ්ද ය ගත්‍යර්ථ යෙහි වැටෙන බැවින් ද කුත්සිත බවට යේ නු සි මෙ ලෙස ලබන ලද නිර්වචන ය සි කියන ලද අර්ථාර්ථ ඇති පංසුකූල චීවරයාගේ දැරී ම උත්තරපද ලොප සමාස වසයෙන් පංසුකූල නම් වේ. ධාරණ

ශබ්ද ය "පූජ ඛාදනම් පූජං, තත් ශීලමස්‍යෙත්‍ය පූජිකඃ" යනුයෙනි මෙන් ලොප්කොට පංසුකූල යනුවෙහි පංසුකූල දූරී ම ප්‍රකෘති වූ යේ සවභාව වූයේ මෝ හට නු සි පංසුකූලික නම් වෙ සි.

පංසුකූලිකායාගේ සමාදාන චෙතනා ය සි කියන ලද ධර්‍ම ය පංසුකූලිකඞ්ග නම් වෙ සි. අඞ්ග ය සි කියා කාරණ ය කියනු ලැබෙ සි. එ හෙයින් සමාදානයක් හෙතුකොට ගෙණ ඒ පාංසුකූල ය දරණ භික්‍ෂුතෙම පංසු කූලික ය සි කියනු ලැබෙ සි ද, ඒ සමාදාන චෙතනා ලක්‍ෂණයට මේ අඞ්ග ය කියා නමකැ සි දත යුතු සි. මෙම ක්‍රමයෙන් සංඝාටි උත්තරාසඞ්ග අන්තරවාසක ය සි කියන ලද සඟල සිවුර ය පොරෝනා සිවුර ය ගඳනා සිවුර ය යන තුන් සිවුර ප්‍රකෘති වූයේ මෝහට නු සි- තෙචීවරික නම් වෙ යි. තෙචීවරිකයාගේ අඞ්ග ය තෙචීවරිකඞ්ග නම් වෙ සි.

එසින් කිහ.

එහෙතෙව නයෙන සංඝාටි උත්තරාසඞ්ග අන්තරවාසක සංඛාතං තිචීවරං සීලමෙසාන්‍ති තෙචීවරිකෝ, තෙචීවරිකස්‍ස අඞ්ගං තෙචීවරිකඞ්ගඃ—යි.

භික්‍ෂා ය සි කියන ලද ආමිස පිණ්ඩයන්ගේ හි ම පිණ්ඩපාත නම් වේ. හෙවත් පරයා විසින් දෙනලද පිණ්ඩයන්ගේ පාත්‍රයෙහි හි ම ය සි කියනු ලැබෙ සි. ඒ අනුන් විසින් දෙන ලද පිණ්ඩපාත ය පාත්‍රයෙහි නිපාතන ය හවුලා ඒ ඒ කුලයට එලඹෙන්නේ සොයා නු සි පිණ්ඩපාතික නම් වේ. පිඬු පිණිස හෝ ඇවිදීමට වුත ය වූ යේ මෝහට නු සි පිණ්ඩපාතික නම් වෙ සි. පතිතුං යනු වරිතුං යන අර්‍ථ සි. පිණ්ඩපාති ම පිණ්ඩපාතික වෙසි. පිණ්ඩපාතිකයාගේ අඞ්ග ය පිණ්ඩපාතිකඞ්ග නම් වේ සි.

එසින් කිහ.

භික්‍ඛා සංඛාතානං පන ආමිස පිණ්ඩානං පාතෝ පිණ්ඩපාතෝ. පරෙහි දින්නානං පිණ්ඩානං පතෙන නිපතනන්‍තීති වුත්තා හොති. තං පිණ්ඩපාතං උඤ්ඡන්‍ති තං තං කුලං උපසංකමන්‍තෙනා ගවෙසන්‍තීති පිණ්ඩපාතිකෝ, පිණ්ඩාය වා පතිතුං වතමෙතස්‍සාන්‍ති පිණ්ඩපාති. පතිතුන්‍ති වරිතුන්‍ති වරිතුං. පිණ්ඩපාති එව පිණ්ඩපාතිකෝ. පිණ්ඩපාතිකස්‍ස අඞ්ගං පිණ්ඩපාතිකඞ්ගං—යි.

දුන ය සි කියා විවෙජ්ද ය කඞකිරී ම කියනු ලැබෙ සි. විවෙජ්ද ය සි කියන ලද දුන ය කෙරෙන් අපේත වූයේ අපදුන නම් වෙ සි. නො කඞ කිරීම යන අර්‍ථ සි. කඞ නොකිරී ම හා සමග පවත්නු සි සපදුන නම් වෙසි. අවඛණ්ඩන රහිත ව ගෙපිදීවෙළින් සිගීම ය සි

කියන ලද්දේ වෙ යි. ගෙපිළිවෙළින් හැසිරෙ නු යි මේ සපදාන චරණ ය මෝහට ප්‍රකාශිනු යි සපදානචාරි නම් වේ. සපදානචාරි ම සපදාන චාරික නම් වෙයි. ඔහුගේ අඞ්ග ය සපදාන චාරිකඞ්ග නම් වෙයි.

එසින් කිහ.

දානං වුච්චති අවඛණ්ඩනං අපෙතං, දානතො අපදානං අනව ඛණ්ඩනහති අත්ථො. සහ අපදානෙන සපදානං, අවඛණ්ඩන විරහිතං අනුසරන්තීති වුත්තං හොති. සපදානං චරති ඉදමස්ස සීලන්ති සප දානචාරී. සපදානචාරි එව සපදානචාරිකො. තස්ස අඞ්ගං සපදානචාරි කඞ්ගං-සි.

එක අස්නේ හිද කරණ හොජන ය උත්තරපද ලොපයෙන් එකාසන නම් වෙයි. එ ම එකාසන හොජන ය ම එකාසනික නම් වෙ යි ඔහුගේ එක අස්නේ හිද වැළඳී ම ප්‍රකෘතිවීමට කාරණ ය නෙවත් එකාසනික වීමට කාරණ ය එකාසනිකඞ්ග නම් වේ.

එසින් කිහ.

එකාසනෙ හොජනං එකාසනං. තං සීලමස්සාති එකාසනි කො. තස්ස අඞ්ගං එකාසනිකඞ්ගං-සි.

දුතිය භාජන ය ප්‍රතිසේධ කළ බැවින් හුදෙක් එක ම පාත්‍ර යෙහි පිණ්ඩ ය පත්ත පිණ්ඩ නම් වෙයි. දැන් පාත්‍ර ය පිණ්ඩග්‍රහණ යෙහි පත්ත පිණ්ඩ ය යන සංඥා කොට එක ම පාත්‍රයෙහි පිණ්ඩග්‍රහ ණ ය සිලවූයේ මෝ හට නු යි කියා "සඤ්ඤං කත්වා" යන උත්තර පදලොපයෙන් පත්තපිණ්ඩික නම් වේ. ඔහුගේ අඞ්ග ය (එකපාත්‍ර යෙහි පිණ්ඩග්‍රහණ ප්‍රකෘතිවීමට කාරණ ය) පත්තපිණ්ඩිකඞ්ග නම් වෙයි.

එසින් කිහ.

දුතියක භාජනස්ස පටික්ඛිත්තත්තා කෙවලං එකස්මිං යෙව පතෙහ පිණ්ඩො පත්තපිණ්ඩො. ඉදානි පත්තපිණ්ඩගහණෙ පත්ත පිණ්ඩසඤ්ඤං කත්වා පත්තපිණ්ඩො සීලමස්සාති පත්තපිණ්ඩිකො. තස්ස අඞ්ගං පත්තපිණ්ඩිකඞ්ගං—සි.

බලුපච්ඡාභත්තිකඞ්ගයෙහි බලු ය යි ප්‍රතිසෙධාර්ථයෙහි නිපා ත ය පෑවරි අවන්නහු විසින් පසු ව ලබන බත පශ්චාත් භක්ත නම් වේ. ඒ පශ්චාත් භක්තයාගේ භෝජන ය පශ්චාත් භක්ත භොජන නම් වේ. ඒ පශ්චාත් භක්ත භොජනයෙහි පශ්චාත් භක්ත සංඥාකොට ඒ පශ්චාත් භක්ත ය ප්‍රකෘති වූයේ මෝ හට නු යි පශ්චාත් භක්තික නම් වේ. පශ්චාත් භොජන ය නොකරණ සුලු වූයේ බලුපච්ඡා භත්ති ක නම් වේ. සමාදාන වසයෙන් ප්‍රතික්ෂිප්ත කළ භොජනයට පච්ඡා

හත්තික ය යන මේ නමෙකි. අටුවා කථාවෙහි වනාහි බලු නම් එක් සකුණියක. හෙතෙම මුඛයෙන් ඵලයක් ගෙණ ඒ ඵල ය වැටුන කල්හි නැවත අනිකක් නො කන්නේ ය. මේ තෙම මේඛඳු නු යි බලුපවත්‍ය හත්තික නම් වෙයි කියන ලදී. ඔහුගේ අඞ්ග ය බලුපවත්‍ය හත්තිකඞ්ග නම් වේ.

එසින් කිහ.

බලූ'නි පටිසෙධත්ථෙ නිපාතො, පවාරිතෙන සතා පවත්‍යාලද්ධං හත්තං පවත්‍යාහත්තං නාම. තස්ස පවත්‍යාහත්තස්ස හොජනං පවත්‍ය හත්තහොජනං, තස්මිං පවත්‍යාහත්ත හොජනෙ පවත්‍යාහත්ත සඤ්ඤං කත්වා පවත්‍යාහත්ත සීලමස්සාති පවත්‍යාහත්තිකො, න පවත්‍යාහත්තිකො බලුපවත්‍යාහත්තිකො. සමාදුන වසෙන පටික්ඛිත්තානිරිත්ත හොජ නස්සෙතං නාමං. අථ්‍යකථායං පන වුත්තා-බලූනි එකො සකුණිකො, සො මුඛෙන ඵලං ගහෙත්වා තස්මිං පතිතෙ පුන අඤ්ඤං න ඛාදති. තාදිසො අයන්ති බලුපවත්‍ය හත්තිකො, තස්ස අඞ්ගං බලුපවත්‍ය හත්තිකඞ්ගං-යි.

ආරණ්‍යකඞ්ගයෙහි වල්හි විසි ම ප්‍රකෘති වූයේ මෝ හට නු යි ආරණ්‍යක නම් වේ. ඔහුගේ අඞ්ග ය ආරණ්‍යකඞ්ග නම් වේ.

එසින් කිහ.

අරඤ්ඤෙ නිවාසො අස්සාති ආරඤ්ඤිකො, තස්ස අඞ්ගං ආරඤ්ඤිකඞ්ගං-යි.

වෘක්ෂ මූලයෙහි විසි ම වෘක්ෂමූල නම් වේ ඒ වෘක්ෂමූලයෙහි විසි ම සිලවූයේ මෝ හට නු යි වෘක්ෂමූලික නම් වෙයි. වෘක්ෂමූලික යාගේ අඞ්ග ය වෘක්ෂමූලිකඞ්ග නම් වේ.

එසින් කිහ.

රුක්ඛමූලෙ නිවාසො රුක්ඛමූලං, තං සීලමස්සාති රුක්ඛ මූලිකො, රුක්ඛමූලිකස්ස අඞ්ගං රුක්ඛමූලිකඞ්ගං—යි

අබ්භොකාසික අඞ්ගයෙහි ද සොසානිකඞ්ගයෙහි ද මේම නියා යි.

එසින් කිහ.

අබ්භොකාසික සොසානිකඞ්ගසු පි එසෙව නයො-යි

යථාසන්ථතිකඞ්ගයෙහි යම් සෙනස්නක් පණවන ලද ද හෙ තෙම යථාසන්ථති නම් වේ. මේ ඔබවහන්සේට පැමිණෙන්නේ ය යි මෙසේ පැමිණි පළමුකොට උදෙසන ලද සෙනාසනයට යථාසන්ථති ය යි යනු නමෙකි. ඒ යථාසන්ථතියෙහි විසි ම ප්‍රකෘති වූයේ මෝ හට නු යි යථාසන්ථතික නම් වේ ඔහුගේ අඞ්ග ය යථාසන්ථතිකඞ්ග නම් වේ

එයින් කිහ.

යදෙව සන්‍ථතං යථාසන්‍ථතං, යථා තං ඉදං පුග්ගලං පාපුණාතීති-එවං පඤ්ච උද්දිට්ඨේ සෙනාසනසෙතං අධිවචනං. තස්මිං යථා සන්‍ථතෙ විහරිතුං සීලමස්සාති යථාසන්‍ථතිකෝ, තස්ස අඞ්ගං යථා සන්‍ථතිකඞ්ගං-සි.

නෙසජ්ජිකඞ්ගයෙහි ද බැස නෙවි ම ප්‍රතිසෙධකොට නිසදනු වෙන් විසි ම ප්‍රකාර වූයේ මෝ හට නු සි නෙසජ්ජික නම් වේ. ඔහු ගේ අඞ්ග ය නෙසජ්ජිකඞ්ග නම් වේ.

එයින් කිහ.

සයනං පටික්ඛිපිත්වා නියජ්ජාය විහරිතුං සීලමස්සාති නෙසජ්ජිකෝ, තස්ස අඞ්ගා නෙසජ්ජිකඞ්ගං-සි.

මේ සියලු ධුතාඞ්ගයෝ වනාහි ඒ ඒ පංසුකූලාදි අඞ්ගයන්ගේ සමාදනයෙන් නසන ලද ක්ලෙශයන් ඇති බැවින් ධුතාඞ්ග වසයෙන් ප්‍රතිණ තෘෂ්ණාපාදදි පාප ධර්මයන් ඇති බැවින් ධුත භික්ෂුහුගේ අඞ්ගයෝ නු සි කෙලෙසුන් නසන හෙයින් නෝ ධුතාඞ්ග ය සි ලද ව්‍යවහාර ඇති නුවණ අඞ්ග වූයේ මේ සමාදනයට නු සි. ඒ සමාදන යෝ ධුතාඞ්ග නම් වෙත්. නොනොත් ධුතාඞ්ග වූවාහු ත් ඔහු ම ය. ප්‍රතිපක්ෂයන් නසන හෙයින් ශීලාදී සම්‍යක් ප්‍රතිපත්තියට අඞ්ගයෝ ත් ඔහු ම නු සි ධුතාඞ්ගයෝ නම් වෙත්. මෙසේ ඵලමු කොට මේ ධුතාඞ්ගයෙහි අර්ථ විනිශ්චය දත යුතු සි.

එයින් වදළහ.

සබ්බානෙව පනෙතානි තෙන තෙන සමාදනෙන ධුතකිලෙසා ධුතස්ස භික්ඛුනො අඞ්ගානි කිලෙස ධුනනතො වා ධුතනති ලද්ධවොහාරං ඤාණං අඞ්ගං එතෙසන්ති ධුතඞ්ගානි. අථ වා ධුනාති ව තානි පටිපක්ඛනිද්ධුනනතො අඞ්ගානි ව පටිපත්තියාති පි ධුතඞ්ගානි. එවන්නාමෙහි අත්‍ථතො විඤ්ඤුතබ්බා විනිච්ඡයො-සි.

මේ සියලු ධුතාඞ්ගයෝ සමාදන චෙතනා ව ලක්ෂණ කොට ඇත්තාහු සි.

එයින් කිහ.

සබ්බානෙව චෙතානි සමාදන චෙතන ලක්ඛණානි-සි.

සියලු ම ධුතාඞ්ගයෝ තෘෂ්ණාචාර සඞ්ඛ්‍යාත ලොලුප්ප විද්ධංසන කෘත්‍ය ය කොට ඇත්තාහු සි.

එසින් කිහ.

සබබානෙව ලොලුපප විඝාංසන රසානි-සි.

විකාසෙහි දු මෙම කිහ.

කුසලහණඩසස භුසං විළොපනටෙන ලොලුපපං තණහා වා රෝ තසස විඝාංසනතතා ලොලුපප විඝාංසන රසානි-සි.

තෘෂ්ණාවාර සංඛ්‍යාත ලොලුපප භාවයක් නැති බව ප්‍රත්‍යුප සථාන සංඛ්‍යාත වැටහීම් කොට ඇත්තාහු සි.

එසින් කිහ

නිලෙලාලුපපභාව පවවුපටයානා-සි. අල්පෙච්ඡතාදි වූ පරි සුද්ධ ශිලාදි ධම්යන් පදසථාන සංඛ්‍යාත ආසන්න කාරණා කොට ඇත්තාහු සි.

එසින් කිහ.

අපපිචඡතාදි අරියධම්මා පදටඨානානි-සි. මෙසේ ලකෂණ රස ප්‍රත්‍යුපසථාන පදසථාන ය යන මොවුන්ගේ වශයෙන් විතිශව ය දතයුතු සි. සම්දුන විධානාදියෙහි වනාහි මේ සියලු ම ධුතාඞග යෝ ඝන තර අවිදූ නිමිර නිකර ඕධවංසන කර ප්‍රඥප්‍රදීප වූ භග වත් සම්‍යක් සම්බුද්ධ සම්ඥයන් වහන්සේ ජීවමාන කාලයෙහි බුදුන් සම්පයෙහි ම සමාදන් විය යුතු ය. බුදුන් පිරිණිවි කල්හි මහා ශ්‍රාවකයක්හු සම්පයෙහි සමාදන් විය යුතු ය. මහසවිවක් හු නැති කල්හි රහත් නමක් සම්පයෙහි සමාදන් විය යුතු ය. එ සේ නැති කල්හි අනාගාමි නමක් සම්පයෙහි සමාදන් විය යුතු ය. එසේ නැති කල්හි සකෘදාගාමි නමක් සම්පයෙහි සමා දන් විය යුතු ය. එසේ නැති කල්හි සෝවාන් නමක් සම්පයෙහි සමාදන් විය යුතු ය.

එසේ නැති කල්හි පිටකත්‍ර ය ධාරී නමක් සම්පයෙහි සමා දන් විය යුතු ය. එසේ නැති කල්හි ද්වීපිටකධර නමක් සම්ප යෙහි සමාදන් විය යුතු ය. එසේ නැති කල්හි එක පිටක ධර නමක් සම්පයෙහි සමාදන් විය යුතු ය. එසේ නැති කල්හි සඟි යක් හෝ ධරණ නමක් සම්පයෙහි සමාදන් විය යුතු ය. එසේ නැති කල්හි අටුවාචාරි නමක් සම්පයෙහි සමාදන් විය යුතු ය. එසේ නැති කල්හි ධුතාඞගධාරී නමක් සම්පයෙහි සමාදන් විය යුතු ය. ධුතාඞගධර නමක් නැති කල්හි චෛත්‍යාඞගනයක් හැම ද උක්කුටුකයෙන් හිද ජීවමාන බුදුන් සම්පයෙහි කියන්නක්හු මෙන් සමාදන් විය යුතු ය. අනිකෙකු දු ඇත. හේ කවරේ ද? නමන් විසිනු දු සමාදන් වන්ට වටනේ මැ සි. **එසින් වදළේ ය.**

බුද්ධඝොෂ මහතෙරහු-විශුද්ධිමාර්ගයෙහි.

සම්මදන විධානතොති ආදිසු පන පඤ්චසු සබ්බානෙ ව ධුතඞ්ගානි ධර්මානෙ භගවති භගවතො ව සන්තිකෙ සමාදානබ්බානි. පරිනිබ්බුතෙ විභාසාවකස්ස සන්තිකෙ, තස්මිං අසති ඛීණාසවස්ස අනාගාමිස්ස සකදාගාමිස්ස සොතාපන්නස්ස තිපිටකස්ස දවි පිටකස්ස එකපිටකස්ස එකසංගීතිකස්ස අට්ඨකථාචරියස්ස. තස්මිං අසති ධුතඞ්ගධරස්ස. තස්මිම්පි අසති චෙතියඞ්ගනං සම්මජ්ජිත්වා උදකඝටිකං නිසිදිත්වා සමා සම්බුද්ධස්ස සන්තිකෙ වදතෙතන විය සමාදානබ්බානි. අපි ච සයම්පි සමාදාතුං වට්ටති-සි.

මේ සියලු ධුතාඞ්ගයන්ම රක්ෂාකරන්නවුන් විසින් ධන නිධාන කොට සියල්ලට නො ගහවා රක්නා ධනලෝභී පුරුෂයන් හු සෙසින් තමා ධුතාඞ්ගධර බව කිසිවක් හට නො ගහවා රක්ෂා කටයුතු. ඒ එසේ ම ය. තමා සමාදන් වීමෙහි චෙතිය පර්වතයෙහි විසූ දෙබෑ තෙරුන් කෙරෙන් වැඩිමහළු තෙරුන් ගේ ධුතාඞ්ග අල්පෙච්ඡතා ව මෙහි කිය යුතු සි. ඒ කෙසේ ද යත්? එක් දෙබෑ තෙර දෙනමක් සැගිරි ය වෙසෙනි. ඒ දෙනමින් වැඩිමහළු තෙරහු නෙසජ්ජිකඞ්ග ය දරන බව කිසිවෙක් නො දන්නේ ය.

එක් දවසෙක මධ්‍යම රාත්‍රියෙහි යහන්හි පලඟ බැඳ වැඩහුන් කල්හි මල් මඟ තෙරහු විදුලි ආලෝකයෙන් වැඩහුන්න වුන් දැක ස්වාමීනි! නෙසජ්ජිකඞ්ග ය රක්නා සේක්ද සි විවා ළෝ ය. තෙරහු තමන් ධුතාඞ්ග අල්පෙච්ඡතාවෙන් යුක්ත බැවින් එම වේට ම විදුලි ය ආලෝක ය ත් බොහෝ වේලාවක් නො පවතින බැවින් බැස ගෙවිමෙන් ධුතාඞ්ගධර බව නො ගහවා පසුව නැඟී වැඩහුන් හ. මේ වනාහි සියලු ධුතාඞ්ගයන්ට ම සාධාරණ කථාවෙකි.

මෙම කථා කිහ—විශුද්ධිමාර්ගයෙහි.

එහි ව චෙතිය පබ්බතෙ දොභාතික ථෙරානං ජෙට්ඨ භාතු ධුතාඞ්ගපරිච්ඡතාය වඤ්ඤ කථෙතබ්බං. අයං තාව සාධාරණ කථා-සි.

දැන් එක එක ධුතාඞ්ගයක්හුගේ ඒ ඒ ධුතාඞ්ග ය සමා දන් වන ක්‍රම හා ධුතාඞ්ගයෙහි පිළිපදිනා විධි හා හීන මධ්‍ය මොත්කෘෂ්ට වශයෙන් ප්‍රභෙද හා ධුතාඞ්ගයන්ගේ බිඳී ම හා ධුතාඞ්ග ය පූරණයෙහි අනුසස් හා යන මේ පස වර්ණනා කෙරෙත්—ඒ කෙසේ ද යත්?

පංසුකූලිකඞ්ගං නාම "ගහපති දුන චීවරං පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගං සමාදියාමි" යනුවෙන් ගිහින් දුන් සිවුරු ප්‍රති ක්ෂේප කෙරෙමි. පංසුකූලිකඞ්ග ය සමාදන්වෙමි යි-යන මේ දෙකින් එක්තරා වචනයකින් සමාදන් විය යුතු ය මේහි ගෘහ පතීන් විසින් දුන් සිවුරු නොගනිත නොත් එයින් පිටත් වූයේ පාංසුකූලික ම ය. එ හෙයින්, "ගහපතිදුන චීවරං පටික්ඛිපාමි" කිව ද පංසුකූලිකඞ්ග ය සමාදන්වීමි යි කිවා නම් වෙ යි. "පංසු කූලිකඞ්ගං සමාදියාමි" කිව ද පංසුකූලිකඞ්ග ය සමාදන්වූව නොත් ගෘහපති චීවර නොපිළිගත හැකි බැවින් ගෘහපති චීවර ය ප්‍රතික්ෂේප කළා නම් වෙ යි. එ හෙයින් "ගහපතිදුන චීවරං පටික්ඛිපාමි පංසුකූලිකඞ්ගං සමාදියාමි" යි යන මේ වචනයෙන් දෙදෙනා කොරෙන් එක්තරා වචනයකින් සමාදන් විය යුතු ය යි යනු කිහු. මේ පංසුකූලිකඞ්ගයෙහි සමාදන් වන ක්‍රම ය යි.

මෙහි පිළිපදින ක්‍රම ය කෙසේ ද යත්?

එවං සමාදින්න ධුතඞ්ගෙන පන තෙන සොසානිකං පාප ණිකං රථිය වොළං සඞ්කාර වොළා සොත්තියං නහාන වොළං නිත්ථවොළං ගතපච්චාගතං අහිදඞ්ඝං ගොඛායිතං උපච්චිකා ඛායි තං උන්දූර ඛායිතං අනාවජ්ජිත්වා දසවජ්ජිත්වා ධජාහටං ථූප චීවරං සමණචීවරං ආහිසෙකිකං ඉද්ධිමයං පඤ්චකං වාතාහතං දෙවදත්තියං සාමුද්දියන්ති එතෙසු අසඤ්ඤත්තං චීවරං ගහෙත්වා ථාලෙත්වා දුබ්බලා ඨානං පහාය විරථ්‍යානානි ධොවිත්වා චීවරං කත්වා පොරාණ ගහපති චීවරං අපනෙත්වා පරිභුඤ්ජිතබ්බං—යි.

දක්වන ලද බැවින් මෙ සේ සමාදන් වන ලද ධුතාඞ්ග ඇති එ ම මහණහු විසින් සොසානික ය යි කියන ලද සොහොනෙහි කිසිවක්හු විසින් දැමූ පිළි ය, පාපණික ය යි කියන ලද බඩු විකු ණන අවුණුදොර දැමූ පිළි ය, රථිය වොළ ය යි කියන ලද පින් කැමැත්තවුන් විසින් කවුළුදොරින් ඇලලූ විටියෙහි දැමූ පිළි ය, සංකාර වොළ ය යි කියන ලද කසලගොඩ දැමූ පිළි ය, සොත්ති ය යි කියන ලද ගර්භමල පිසදැමූ පිළි ය, නහාන වොළ ය යි කියන ලද යකැදුරන් විසින් ඉසින් නහවන ලද නිශ්‍රිත කඩ ය යි කියා දමා යන පිළි ය නිත්ථවොළ ය යි කියන ලද නහනතොට දැමූ පිළි ඝ ගත පච්චාගත ය යි කියන ලද සොහොනට ගොස් නැවත ආවාහු නහා දමා යන පිළි ය—

අහිදඞ්ඝ ය යි කියන ලද ගින්නෙන් දැ කල දෙස් ඇතා යි මිනිසුන් විසින් දැමූ පිළි ය, ගොඛායිත ය යි කියන ලද

ගවයන් කැවෙන් දෙස් ඇතැයි මිනිසුන් විසින් දුම්මු පිළිය, මෙයත් මීයත් කැ පිළිය, අන්තයෙන් දහයෙන් සුන් පිළිය, ධජාහට යයි කියන ලද නැවට නැගෙන්නවුන් විසින් ධජ බැඳ නැවි නැගී නිය කල ඔවුන්ගේ දඟිනා'නි ක්‍රමයෙන් ගත යුතු වූ පිළි ඟා යුද්ධ භූමියෙහි ධජ බැඳ දෙසෙනග ගිය කල ගතයුතු පිළිය, ථූපච්චර යයි කියන ලද තුඹස සිසාරා බලිකම් කොට දුම්මු පිළිය, සමණ චීවර යයි කියන ලද ශ්‍රමණ සන්තක චීවරය, ආභිසෙකික යයි කියන ලද රජහුගේ අභිසෙක සථාන යෙහි දුම්මු පිළිය—

සාඳිමිය යයි කියන ලද එහි භික්‍ෂුභාවයෙන් ලද සිවුරු ය, පත්පික යයි කියන ලද අතුරුමග යම් කෙණෙකුන්ගේ සිහි මදවීමෙන් වැටුනේ ඇතැම් ආචාරිකෙණෙක් මදක් කල් රුක සිට ගතයුතු ය යි කියා ද ඇතැම් ආචාරිකෙණෙහ් දෙතුන් දවසක් රුක හිඳ ගතයුතු ය යි කියා ද කියන ලද පිළිය, වාතාහත ය යි කියන ලද වාතවේගයෙන් දුරහෙලන ලද්දේ ඊට හිමියක්හු නො පෙණෙන කල්හි ගතයුතු පිළිය, දෙවදත්තිය යි කියන ලද අනුරුන් මහ තෙරුන්ට දෙවියන් දුන් වස්ත්‍ර ය මෙන් දෙවියන් දුන් පිළිය, සාමුද්දි ය යි කියන ලද මුහුදු රළින් ගොඩ ලන ලද පිළිය, යන මොවුන් කෙරෙහි එක්තරා සිවුරක් ගෙණ පලා දුර්ලසථානයන් හැර තර තැන් දෙව ගෙණ සිටිරුකොට පුරාණ ගෘහපති චීවර ය හැර පසුල් සිවුර වැළඳ ගත යුතු යි.

තව ද—යම් සිවුරෙක් ධනාඩ්‍ය සහගට දෙම්හ යි දෙන ලද ද කඩසිඹිම් පිණිස ඇවිදිනවුන් විසින් හෝ ලද්දේ ද හේ පංසුකූල නම් නොවේ. භික්‍ෂුණි ය චීවර ය ද, යමෙක් සහනට හෝ ගණයට හෝ දෙන්නවුන් විසින් වස්සාග්‍රයෙන් පමුණුවා දෙනු ලැබේ ද සෙනසුන් කෙරෙවින් විසින් සෙනස්නෙහි වස නුවන් මි වැලදගන මැනවැ යි දෙනලද සෙනසුන් සිවුරෙක් හෝ වේ ද හේ ද පසුල් සිවුරු නම් නො වේ. වචන සංඥාවෙන් නො පමුණුවා දෙන ලද්දේ ම පංසුකූල නම් වේ. ඒ වාක්සංඥාවෙන් නො පමුණුවා දෙන ලද සිවුරෙහි දු යම් යම් සිවුරෙක් දායකයන් විසින් භික්‍ෂූහුගේ පා මුල්හි තබන ලද ද, ඒ මහණහු විසින් වනාහි පංසුකූලිකයට අතෙහි තබා දෙන ලද ද, ඒ චීවර ය දාය කයා විසින් පා මුල්හි තබා දුන් බැවින් එකතොා සුදු නම් වේ.

යම් සිවුරෙක් භික්‍ෂූහුගේ අතෙහි තබා දෙන ලද ද, ඒ භික්‍ෂූහු විසින් වනාහි පංසුකූලිකයාගේ පා මුල්හි තබා දෙන ලද ද, ඒ සිවුරු ද භික්‍ෂූහු විසින් පා මුල්හි තබා දුන් බැවින්

එකතොසුදුසික නම් වේ. යම් සිවුරෙක් නිසුළුහුනේ පා මුල්හි තබා දෙනලද ද, ඒ නිසුළුහු වියිනු දු එසේ ම පා මුල තබා දෙන ලද ද, ඒ සිවුරු ලාභයෙහි ද දූනයෙහි ද පාමුල්හි තැබූ බැවින් උභතොසුදුසික නම් වේ. යම් සිවුරෙක් අත්හි තබා දෙන ලද ද, දෙන කල ත් අත්හි තබා දෙන ලද්දේ වී නම් හේ අනුත්කණ්ඨ චීවර නම් වේ. මේ සේ මේ පංසුකූලිකභෙද ය දූන පංසුකූලිකයා විසින් සිවුරු වැළදගන්නේ ය යි මේ මෙහි පිළිපදිනා විධි ය යි.

මේ වනාහි එහි ප්‍රභෙද යි. පංසුකූලිකයෝ තුන්දෙනෙකි. ඔහු කවුරු ද යත්?

උත්කණ්ඨපංසුකූලික ය, මධ්‍යම පංසුකූලික ය, මෘදුක පංසුකූලික ය, යන මේ තුන්දෙන යි. ඒ තුන්දෙනා කෙරෙහි යමෙක් සොහොනෙහි පියූ සඬ ම ගන්නේ ද හේ උත්කණ්ඨ පංසුකූලික නම් වේ. ප්‍රව්‍රජිතයෝ ගනිත් ව යි තබන ලද දූ ගන්නේ මධ්‍යම පංසුකූලික නම් වෙ යි පාද මූලයෙහි තැබුවා ගන්නේ මෘදුක පංසුකූලික නම් වෙ යි ඔවුන් කෙරෙහි යම් කිසිවක්හට තමාට කැමති වීමෙන් ගිහීන් දුන් සිවුරු ඉවසූ කෙණහි දුවහ බිඳේ. මේ මෙහි භෙද ය යි. "පබ්බජිතා ගණ්හිස්සන්ති'නි ඨපිතකං ගණ්හනෙනා මජ්ඣිමෝ" යි කී බැවින් සොහොනෙන් පිටත් සෙසු තැන්හි දු නො උදෙසා නිබුවා ගන්නේ උසට ම වේ යනු සිද්ධ ය. "සොසානිකං යෙව ගණ්හනෙනා" යන මේ වනාහි අනි උක්තාර්ථ විසින් කියන ලද යෙත්. මේ මතු දක්වන්නේ එහි අනුසය යි.

කෙසේ ද යත්? පංසුකූල ය නිසා පැවිදි ය යි වදාළ බැවින් ද මහණ මළුවෙහි විවාරණ ලදු ව පාංසුකූල ය නිසා පැවිදි වෙමි යි තමා ම ප්‍රතිඥා කළ බැවින් ද වචන නිශ්‍රයට සුදුසු වූ පිළිවෙත් බව ය, පළමු වන ඉතරීතර ආර්‍ය්‍ය වංසයෙහි පිහිටි බව ය, නොයෙක් තැනින් අවුලාගත් සඬ තබා මැසූ බැවින් ලොභ නොකට යුතු බැවින් ද සිවුර රක්ෂාවෙහි දුක් නැති බව ය, යම් කිසිවක්හට පැවත සිට ලැබිය යුතු දෙයක් නොවන බැවින් අනුන් අසිනි වෘත්ති නැති බව ය, සොරුන් විසින් ලොභකොට ගතයුතු අනඝ දෙයක් නොවන බැවින් සොරභයෙන් භය නැති බව ය, යම් අනඝ සිවුරක් ඇත් නම් ඒ පරිභොග කිරීමෙහි පෘථග්ජනයන්ට තෘෂ්ණා ව උපදනේ ය. මේ පසුල් සිවුර වනාහි විශෙෂයෙන් ම ලුඛ ය. එ හෙයින් පරිභොග තෘෂ්ණා ව නැති බව ය, ලොභාදි අකුසල් ඔත් මැඩ පවත්වන්නට නිසි ව සිටි බැවින් ශ්‍රමණ සාරූප්‍ය පරිසස්කාර බව ය, මහත් අනර්ඝ නො වන බැවින් අල්ප ය හ.

එක තැනකින් ම සැපයි ය යුතු නොව නොයෙක් තැනින් සපයාගත හැකි බැවින් සුලභ ය හ. සුලභ වුව ද එක්වීහි අනෙස් නෙන් නො උපදවන බැවින් ද මට අයහපත් කඩ දී නොපි යහපත් කඩ ගතු යනාදී යම් කිසි ලජ්ජා කටයුතු වචනයක් මේහි නො උපදනා බැවින් ද අනිගමනක් සම්ප නැති බැවින් ද යනාදීන් නොයෙක් කාරණායෙන් නිවැරදි බව ය. සද්ධම්මඝඨා ප්‍රවාහ වූ භගවත් සම්‍යක් සම්බුද්ධයන් විසින් වණිනා කොට වදුල ප්‍රත්‍යයක් බව ය. ඇසූ දුටු නොයෙක් දිව්‍ය මනුෂ්‍යයන්ට ප්‍රසාද ඵලවන බව ය. ලොභාදී අකුශල ධර්මයන්ගේ උත්පත්ති යට කාරණ ව සිටි මහෙච්ඡතාව නසා අලොභාදි නොයෙන් කුශල ධර්මයන්ගේ උත්පත්තියට කාරණ ව සිටි අල්පෙච්ඡතාදී ගුණ සහස්‍රයන්ගේ නිෂ්පත්තියට කාරණ බව ය. ධුතාඞ්ග ප්‍රතිපත්ති නා වූ ප්‍රතිපත්ති උපයන පිණිස යි. මතුයෙහි වන සම්‍යක් ප්‍රතිපත්ති ය වඩන්නේ ය. පශ්චිම ජනයාගේ මෙ ම දෘෂ්ටි ය අනුවිමට පැමිණීම ය. යන මොහු අනුසස් නම් වෙත්.

අපි ච මාරා හා මාර සේනාවගේ ප්‍රහාණි ය පිණිස පංසු කූල චිවර ය දරා තපස්විය්‍යෙක් ඇද් ද, ඒ තපස්විතෙම කෙසේ සොභමාන ව බබලා ද යත්? යුද්ධ භූමියෙහි යම් ක්ෂත්‍රිය රජෙක් බඳනා ලද සන්නාහ ඇති ව අවශෙෂායුධයෙන් පිරිවරණ ලදුයේ සොභමාන වේ ද බබලා ද ඒ ක්ෂත්‍රිය රජහු සෙසින් සොභ මාන ව බබලන්නේ ය.

එසින් කිහ.

මාරසෙන විඝාතාය පංසුකූල ධරෝ යති,
සන්නද්ධ කාවචෝ යුද්ධෝ ඛත්තියෝ විය සොභති-සි.

කසිසළු ආදී වූ උතුම් වූ අනර්ඝ වස්ත්‍ර ජාතීන් ප්‍රතික්ෂෙප කොට මෘත ශරීර හා සමග සොහොනෙහි දැමූ කඩගෙණ සිවුරුකොට නිලෝගුරා බුදුන් විසින් යම් පසුල් සිවුරක් දරණ ලද ද දැරීමෙන් ප්‍රතිපත්ති ගෞරව ය කරණ ලද ද ඒ කාරණ යෙන් කවරෙක් නම් ඒ පංසුකූල චීවර ය නො දරන්නේ ද-දරන්නේ මැ සි.

එසින් කිහ.

පහාය කාසිකාදීනි වරවත්ථානි ධාරිතං,
යං ලොක ගරුනා සො හං පංසුකූලං න ධාරයෙ-සි.

එ සේ ලොකාචාර්‍යහු විසින් දුරු බැහින් මේ සස්නෙහි නිෂ්ඵ නෙම් තමාගේ ප්‍රථම මහණ මළුයෙහි කළ ප්‍රතිඥ ව සිහි කරන්නේ යොගාවචරයන්ට අනුලොම් වූ පංසුකූල චීවරයෙහි ඇලෙන්නේ ය. ඒ දැරීමෙහි උත්සාහ වඩන්නේ ය.

එසින් කිහ.

තසමා හි අත්තනෝ හිතඤ්ච පටිසඤ්ඤං සම්පුස්සරං,
යොගාවචරානු කුලමහි පංසුකූලෙ රතෝ සියා-සි.

මේ පංසුකූලිකඞ්ගයෙහි සමාදාන ය-විධාන ය-ප්‍රභෙද ය-භෙද ය-ආනිසංස ය-යන මොවුන්ගේ වසයෙන් සංවර්ණනා සි.

තෙච්වරිකඞ්ගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්? "වතු ත්‍රික චීවරං පටික්ඛිපාමි තෙච්වරිකඞ්ගං සමාදියාමි" යනුවෙන් සහලසිවුර ය, පොරෝණ සිවුර ය, අදනා සිවුර ය යන තුනට වැඩි සතරවන සිවුර ප්‍රතික්ෂෙප කෙරෙමි. තෙච්වරිකඞ්ග ය සමාදන් වෙමි යන මේ වචනඛ්‍රයෙන් එක්තරා වචනයක් කියා සමාදන් විය යුතු ඒ තෙච්වරිකඞ්ග ය සමාදන් වූවාහු විසින් පිටුරු පිළි ලදින් යම් තාක් අඵාසු බැවින් හෝ කරන්නට නො පොහොසත් වේ ද යම් තාක් සිවුරු කරන්නට දන්නක්හු හෝ නො ලැබේ ද භික්ඛාටු ආදියෙහි කිසිවෙක් හෝ සමඟ නො වේ ද ඒ තාක් කල් නිබ්බය යුතු සිවුරු කරණ තැන් දක්වා වසත්‍ර නිබ්බ කරුණෙන් සන්නිධි දොස ද නොවෙ සි. ඛ්‍රතාඞ්ගභෙද ය නො වෙ සි. සිවුරුකොට රැඳ තැන් පටන් නො වැලඳ තබන්ට නො වටනේ ය. පරණ සිවුරු හැර මේ සිවුරු වැළඳ ගනිමි සි තබන් නහුට ඛ්‍රතාඞ්ග භෙද නොවෙ සි. ඛ්‍රතාඞ්ග වෛර ය හ සි කියත්.

මේ උක්ත ප්‍රකාර වූ විධි ය තෙච්වරිකඞ්ගයාගේ විධි ය සි. ප්‍රභෙද නෙසින් විනාහි මේ තෙච්වරිකඞ්ග ය ද තුන්වැදෑරුම් වේ. එහි උත්කෘෂ්ට තෙච්වරිකඞ්ගයා විසින් සිවුරු රඳන කල්හි පළමු කොට හඳනා සිවුර හෝ පොරෝණ සිවුර හෝ රඳ ඒ හැඳ පෙර ව නැවත සහලසිවුරු රැඳි ය යුතු ය. සහල සිවුර විනාහි හඳනට නො වටනේ ය. මේ ඔහු ගාමන්ත සෙනාසනයෙහි වසන කල කටයුතු වත ය. ආරණ්‍යයෙහි වසන තෙච්වරිකයා විසින් විනාහි දෙ සිවුර එක් කොට සෝදා රඳන්ට වටනේ ස. යම් සේ කිසිවක්හු දූක සිවුරු හැඳ මතුයෙහි කරන්ට පොහොසත් වේ ද එසේ වූ ආසන්න සථානයෙහි හින්ද යුතු ය මධ්‍යම තෙච්වරික යාහට සිවුරු රඳන කල රජ්ජන සාලාවෙහි සිවුරු රඳන තුරා හඳනට තබන ලද රඳන සිවුරු ඇත හොත් ඒ හැඳ පෙර ව තමාගේ සිවුර රඳන්නට වටනේ ය. මෘදුක තෙච්වරිකයාහට සභාග සදෘශ භික්ෂූන්ගේ සිවුරු හැඳ පෙරව සිවුර රඳන්ට වටනේ ය.

අටුවාවෙහි--හමා සතු හදනා පොරෝනා පිණිස නො ඉටා සෙනස්නෙහි පස තරණකොට ඉටන ලද සිවුර ද මෘදුක ය හට වටනේ ය. රදනකලට ම අනුදත් බැවින් නිත්‍ය පරිභොග ය වශයෙන් පරිහරණ ය කරන්ට නො වටිනි සි යෙත්. සභාග භික්ෂූන්ගේ සිවුරු රදන කලට ම වටනේ ය. තෙච්වරිකයාහට වනාහි සතරවන සිවුර වටනේ අංසක කාසාව ම වටනේ ය. නෙද වනාහි පලලින් වියතෙක් ම දිගින් තුන්රියනෙක් ම වූයේ වටනේ ය. මේ තුන් දෙනාහට ම තුන් සිවුරෙන් පිටත් ව පෙරහන් සඬ ආදි වූ බාහිර පිරිකර ත් මේ සිවුරු ලැබ සෙස් සන්ට දෙමි නො වළඳමි සි සිතා ලබන සිවුරු ත් හැර තමා පිණිස තුන් සිවුරෙන් වැඩිකොට හදනා පොරෝනා පිණිස සත රුන් ඉවසූ කෙණෙහි ධුතාඞ්ග හෙද ය වන්නේ ය.

උක්ත ප්‍රකාර ක්‍රම ය මේ තෙච්වරිකඞ්ගයෙහි හෙද සි. මේ මිතු දක්වන්නේ මෙහි අනුසසි. තෙච්වරිකඞ්ග ය රක්නා නිස්‍රුතෙමේ කාය පරිහරන කරන සිවුරෙන් සතුටු වන්නේ එහි ත් ආකාසයෙහි නහර රහිත බැවින් සැප සේ යන පක්ෂියක්හු සේ යාමි ය, මිදු වූ කාන්‍ය ය ඇති බැවින් අල්ප සමාරම්භතා බව ය, වසත්‍රසන්තිසි ය සි කියන ලද වසත්‍ර සඟවා තබා රක්ෂාකිරීමෙන් දුරුවි ම ය, බොහෝ පරිසකාර නැති බැවින් ලඝු වූ ප්‍රවෘත්ති ඇති බව ය, තුන්සිවුරෙන් වැනි චීවරයෙක්හි උපදනා ලොභ ය දුරුවීම ය. නිසීදනාදී අනුදත් බොහෝ සිවුරු ඇදී ද කැපයෙහි දු පමණ දන්නා බව ය. සල්ලේඛ වුර්නිතා ය, අලෙපවජ්ජ භාවාදින්ගේ ඵල නිෂ්පත්ති ය සි යන මේ ආදී ගුණයෝ නිෂ්පන්න වෙත්.

අපි ච—අනිරේක වස්ත්‍ර තෘෂ්ණා සඞ්ඛ්‍යාත තුන් සිවුරෙන් වැනි සිවුරෙහි තෘෂ්ණා ව හැර වසත්‍ර ය සන්නිධින් වර්ජිත වූ ධිර වූ සොඹ තෙමේ සනෙනාස සැපයෙහි රත ය දන්නේ තුන්සිවුරු ධරන්නේ ය එ හෙයින් සපත්‍ර වරණ වූ සපක්ෂ වූ පක්ෂියෙකු මෙන් තුන්සිවුරු ධර යොගිතෙමේ සුව සේ ඇවිදිනා කැමැත්තේ තුන්සිවුරු නියමෙහි වඩ වඩා ඇලුම් කරන්නේ ය. ගාථාවෙනු දු දක්වන ලද මැ සි.

අනිරෙක වත්ථතණ්හා—පහාය සන්නිධි විවජ්ජිතෝ,
ධීරෝ සනෙනාස සුඛරසඤ්ඤූ— තිචීවරධරෝ භවති යොගී.
තසමා සපත්ත වරණෝ—පක්ඛීව සචීවරොව යොගිවරෝ,
සුඛමනු විවරිතුකාමෝ—චීවරනියමෙ රතිං කයිරා-සි.

මේ සේ යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ තෙච්වරි කඞ්ගයෙහි සමාදාන-භිධාන-ප්‍රභෙද--හෙදුනිසංස ය යන මොවුන් ගේ වර්ණනා ව යි.

පිණ්ඩපාතිකඞ්ගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්? "අතිරෙකලාභං පටික්ඛිපාමි පිණ්ඩපාතිකඞ්ගං සමාදියාමි" යනුවෙන් පිණ්ඩියාලොප භොජනයෙන් අධික වූ සංඝභත්තාදි අතිරෙක ලාභ ය ප්‍රතික්ෂෙප කෙරෙමි යි පිණ්ඩපාතිකඞ්ග ය සමාදන් වෙමි යි යන වචනඛ්‍යයෙන් එක්තරා වචනයක් කියා සමාදන් විය යුතු. මේ සමාදන් වන අඞ්ග ඇති පිණ්ඩපාතිකයා විසින් වනාහි—

තෙන පන පිණ්ඩපාතිකෙන සඞ්ඝභත්තං උද්දෙස භත්තං නිමන්තණං සලාකභත්තං පක්ඛිකං උපොසථිකං පාටිපදිකං ආගන්තුක භත්තං ගමිකභත්තං ගිලානභත්තං ගිලානුපට්ඨාක භත්තං විහාර භත්තං ධුරභත්තං වාරභත්තන්ති—එතානි වුද්ධස භත්තානි න සාදිතබ්බානි-යි.

දක්වන ලද සඞ්ඝභත්ත ය යි කියන ලද සියලු සඟනට දියයුතු බත ය, උද්දෙසික භත්ත ය යි කියන ලද භික්ෂූන් කිප නමක් උදෙසා දියයුතු බත ය, එසේම නිමන්ත්‍රණ ය යි කියන ලද සඟනට වත් පුගුලට වත් නිමන්ත්‍රණ ය කොට දෙන බත ය, සලාකභත්ත ය යි කියන ලද ලඟ බත ය, පක්ඛික ය යි කියන ලද එක් පක්ෂයක එක් දවසක් දියයුතු බත ය, උපොසථික ය යි කියන ලද පොහොය දවස දියයුතු බත ය, පාටිපදික ය යි කියන ලද පැලැවිය දවස දියයුතු බත ය. ආගන්තුක භත්ත ය යි කියන ලද ආගන්තුක ව එන් සඟනට ආගන්තුක බත්ත් දෙමහ යි කියා මිනිසුන් විසින් දියයුතු බත ය,

එසේම ගමික බත් දෙමින යි කියා දියයුතු බත ය, ගිලානභත්ත ය යි කියන ලද ගිලනුන්ට දියයුතු බත ය, ගිලානුපට්ඨාක භත්ත ය යි කියන ලද ගිලනුන්ට උපස්ථාන කරණු වන්ට දෙන බත ය, විහාරභත්ත ය යි කියන ලද තමා කරවූ සඟසතු ආවාසයෙහි වසන සඟනට දෙන කුටික බත හෝ වෙහෙර උදෙසා දෙන බත ය, ධුරභත්ත ය යි කියන ලද සඟනට වත් පුගුලට වත් ධුරබත් දෙමි යි නිත්‍යයෙන් දෙන භොජන ය දනවා කළගෙහි තබා සඟනට දෙන බත් හෝ විසා මෙහි "ධුරගෙහෙ එව ඨපෙත්වා දාතබ්බං භත්තං ධුරභත්තං" ය යි දක්වන ලද බත හෝ ය, වාරභත්ත ය යි කියන ලද ගම්වැසි ආදීන් විසින් වාරයෙන් දෙන බත ය යි යන මේ තුදුස් බත්හු නො ඉවසිය යුතු වෙත්.

"සචෙ පන සඞ්ඝභත්තං ගණ්හාථා'ති ආදිනා නයෙන අවත්වා අම්හාකං ගෙහෙ සඞ්ඝස්ස භික්ඛං ගණ්හාති, තුම්හෙහි භික්ඛං ගණ්හථා'ති වත්වා දින්නානි නොහොති. තානි සාදිතුං වට්ටති. සඞ්ඝතො ආවිස සලාකාපි විනාරෙ පක්කාහත්තනාමපි වට්ටති යෙවාති- ඉදමස්ස විධානං"යි.

දක්වන ලද හෙයින් යම් කිසි නුවණැති දායකයන්හු විසින් වනාහි සඟවත් ගන්නේ ය යි යනාදී විසින් තුදුස් බනෙහි ඇතුළත් කොට නොනියා අපගේ ගෙහි සංඝයා වහන්සේ භික්ෂා ව ගෙණ වදාරණ සේක. ඔබවහන්සේ ද භික්ෂා ව ගෙණ වදාළ මැනවැ යි කියා භික්ෂා නාමයෙන් දෙන ලද බතෙක් ඇද්ද ඒ බත්හු භික්ෂා නාමයෙන් කි හෙයින් ඉවසන්ට වටින්. යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ මෙහි පිණ්ඩපාතිකඞ්ගයෙහි පිළිපදිනා විධි ය යි.

මේ පිණ්ඩපාතිකඞ්ගයෙහි ප්‍රභෙද කෙසේ ද යත්? ප්‍රභෙද යෙහි වනාහි මේ පිණ්ඩපාතිකඞ්ග ය ද ත්‍රිවිධ වෙ යි. ඔවුන් අතුරෙහි උත්කෘෂ්ට පිණ්ඩපාතික තෙමේ පෙරටින් ද පසුයෙන් ද ගෙණා භික්ෂා ව ගන්නේ ය-හෙවත් යම් තැනක වලඳන්ට හුනන්නේ සිහා නො ගිය විටියෙන් ගෙණා පෙරටු බත් හා සිහා ගිය විටියෙන් ගෙණා පසු බත් හා යන මේ බත් දෙක ත් ලබන්නේ ය. සම්ප්‍රාප්ත ද්වාරයෙහි දී පාත්‍ර ය ගන්නවුන්ට ද දෙන්නේ ය. පටික්කමණ ය යි කියන ලද භෝජන ශාලාවට පාත්‍ර ය ගෙණ ගොස් දෙන බත් ද ගන්නේ ය. වහන්සේ පිඬු පිණ්ඩ නො වැඩිය මැනව. වෙගෙරට ම ආහාර ගෙණෙම්හ යි කියන උපාසකයන්ගේ බස් ඉවසා එ දවස් භිඳ නො ගන්නේ ය.

මධ්‍යම පිණ්ඩපාතික තෙමේ එසේ කියා දෙන බත එ දවස් භිඳ ලබන්නේ ය. සෙට දවස පිණ්ඩ වනාහි එසේ කිව ද නො ඉවසන්නේ. මෘදුක පිණ්ඩපාතික තෙමේ සෙට දවස පිණ්ඩ ද, අනිද් දවස පිණ්ඩ ද භික්ෂා ව ඉවසන්නේ ය. මේ මෙසේ සෙට දවස පිණ්ඩ ද අනිද් දවස පිණ්ඩ ද ඉවසන ඒ දෙදෙන ම අනුන් අයත් නො ව වසන සෙරි විහාරසුඛ ය නො ලබත්. උත්කෘෂ්ට තෙමේ ලබන්නේ ය. ඒ එසේ ම ය. එක් ගමෙක වනාහි ආයුෂ්මත්වංශ සූත්‍ර ප්‍රතිසංයුක්ත ධර්ම කථාවෙක් වේ. එ කල්හි උත්කෘෂ්ට පිණ්ඩපාතික භික්ෂු තෙමේ සෙසු මධ්‍යම මෘදුක දෙදෙන හට මෙසේ කිවු ය.

කෙසේ ද යත්? පින්වත්නි! බණ අසන්ට යම්හ යි කිවු ය. ඒ අසා මධ්‍යම මෘදුක දෙදෙනා අතුරෙන් එක් නමක්

වහන්ස! එක් මිනිසෙකු විසින් අද දවස ආරාධනාකොට මා හිඳුවන ලදී සි කී සේක. අනික් මෘදුක වනාහි, වහන්ස! මා විසින් සෙට පිණිස එක් උපාසකයෙක් හුගේ ආරාධනාවක් ඉවසන ලදී සි කී සේක. මෙ සේ ඒ දෙදෙනා ම ඖජන රස ය නිසා ධම්මරසයෙන් පිරිහුනාහු ය. උත්කෘෂ්ට පිණ්ඩපාතික නම් උදැසන්හි ම පිඬු පිණිස ගොස් සිහා වලඳ නැවත බණ අසන පිණිස ගොස් භෝජන රසයට ලා ලොභ නො කෙළේ ධම්මරසයට ලොභ කොට ධම්මී නැමැති රස ය අනුභව කළ සේක. මේ ද දක්වන ලද මැ සි.

එකසමිං කිර ගාමෙ අරිය වංසො හොති. උක්කට්ඨො ඉතරෙ ආහ ආයාමාවුසො ධම්ම සවනායාති. තෙසු එකො එකෙ නමහි භනන්තෙ මත්‍රසෙසන නිසීදාපිතොනි ආහ, අපරො මයා භන්තෙ සවාතනාය එකස්ස භික්ඛා අධිවාසිතානි. එවං තෙ උභොපි පරිහීණා. ඉතරො පානො ව පිණ්ඩාය වරිත්වා ගන්ත්වා ධම්මරසං පටිසංවෙදෙසි-සි.

මේ සේ දක්වන ලද තුන්දෙනහට ම සඞ්ඝභත්තාදි අති රෙක ලාභ ය ඉවසූ කෙණෙහි ම ධූතාඞ්ග හෙද වේ. මේ සේ උක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ පිණ්ඩපාතිකඞ්ගයාගේ හෙද ය සි.

ඒ පිණ්ඩපාතිකඞ්ගයෙහි අනුසස් කිම යත්? පිණ්ඩියාලොප භොජන ය නිසා පැවිදි ය සි වදාළ බැවින් නිශ්‍රයානු රූප වූ පිළි වෙත් ඇති බව ය, දෙවන වූ ආයාජීවංශයෙහි පිහිටි ම ය, අනුන් අයත් නො වන ප්‍රවෘත්ති ඇති බව ය, අල්පය හ සුලභය හ ඔහු දු නිවරද ය හ සි බුදුන් විසින් සංවර්ණිත ප්‍රත්‍ය ය බව ය, ජඞ්ඝා බල ය නිසා පිඬු සිහන බැවින් කුසිත නාවයාගේ මැඩි ම ඇති බව ය, පිරිසිදු වූ ආජීව ඇති බව ය, අනන්තර ඝරයට වදනා හෙ සින් සෙඛියා ප්‍රතිපත්ති පිරෙන බව ය, පමණ දන පිළිගැන්මෙන් ද අනුන් හා හැනි නො වසන බැවින් ද පරපොෂණයක් නැති බව ය, ගෙන් ගෙන් මදින් මදින් පිළිගැන්මෙන් පරානුග්‍රහ කරණ බව ය.

"අත්තනම්දං භික්ඛවෙ ජීවිකාපනං යදිදං පිණ්ඩොල්‍යං" සි වදාළ බැවින් අන්‍යම ජීවිකා ව කරණකොට ගෙණ මානයාගේ ප්‍රහාණී වීම ය, නො යෙක් ගෙයින් ලද මුසු අහරින් යැපෙන බැවින් රස තෘෂ්ණාවගේ චලකිම ය, නිමන්ත්‍රණ ය නො ඉවසන බැවින් ගණ භොජන සිකපද ය පරම්පරා භොජන සිකපද ය යන මෙ සින් ඇවැත් නැති බව ය, අල්පෙච්ඡතාදීන්ට අනුලොම් පැවතුම්

ඇති බව ය, මනා පිළිවෙත් වැඩීම ය, ධනාදියෙන් හීන වූ සඬ්ඝ යෝ ද තමන් ගෙදරට සම්ප්‍රාප්ත කල තමන් ලද දෙයකින් **අනුරුද්ධ** මහතෙරුන්ට **ඉඤ්ඤ** දුගියා සේ **මුගලන්** මහතෙරුන්ට **ඛාණුවලිය** දුගිහු සෙයින් පින් රැස්කොට ගෙන සුගතියට යන බැවින් පශ්චිම ජනයාට අනුකම්පා ඇති බව ය යන මේ සි

අපි ච-පිඬු සිහිමෙන් ආලොපයෙන් සතුටු වූ උපාසකයා ගේ ආරාධනා නො ඉවසන බැවින් හා එක් විසි අනෙස්නෙන් ජීවිකාව නො කරණ බැවින් අනුන් අයත් නො වන ජීවිකා ඇති රසමිසවුලෙන් නො යෙක් ලෙසින් සරහා දෙන ලද තුදුස් බත් ප්‍රතික්ෂෙප කොට සිහා ලද ආහාර වළඳන බැවින් පහ කරණ ලද ලොල් බව ඇති මහණ තෙමේ නො පැකිලෙන ලද පැවතුම් ඇති බැවින් සතර දිගට ම නිසි වූයේ සතර දිගින් අභිප්‍රායානුකූල වූ දිගකට යන්නට සමර්ථ වන්නේ ය. වැසි අවි සුලන් සෙල් කඳු ආදී නො සලකා භික්ෂාවට ඵළඹිය යුතු බැවින් කුසීත බව දුරුකරන්නේ ඒ හෙයින් ම ආජීව ය පිරිසිදු වන්නේ ය.

මේ ආදී නොයෙක් ගුණ සහස්‍රයන්ගේ උත්පත්තියට කාරණා ව සිටි බැවින් භික්ෂාචාර ය නො සික් ම වන්නේ ය. මෙ බඳු ගුණයෙන් සමන්විත තමා ම රක්නා වූ එයින් ම අපරිපොෂිත පිණ්ඩපාතික භික්ෂු තෙමේ ඉදින් ලාභ ය යස ය යන මොවුන් ඇසුරු නො කළේ වී නම් හෙවත් මේ බඳු ගුණ ය දුටු ලෝක වාසීන් විසින් කරණ ආදර බහුමානයෙහි ලොභ දෙවිෂ ඉපද වීමෙන් අනිත්‍යාදි ය නොසලකා ලාභ කැමති වීමෙන් බොහෝ පිරිවර කැමති වීමෙන් යුක්ත නො ව නොයෙක් දිගින් වදනා වාතයෙන් කම්පා කොට ගත නො හැකි පඨිතයක් සේ ලාභාදියෙහි ලොභාදි ය නො කොට අපිස් සතොස් ගුණයෙන් ම සමන්විත වී නම් ශක්‍රාදී දෙවියෝ පවා පතත්. ඔහුගේ සිල් ආදී ගුණෙහි බහුමන් කරන්නාහු ආදර කෙරෙත්.

එසින් කිහ.

පිණ්ඩියාලෙ ප සනතුට්ඨා අපරායත්ත ජීවිකෝ,
පහීණාහාර ලොලුපෙපා නොති ච්‍ඡාදිසෝ යති.
විනොදයති කොසජ්ජං ආජීවස්ස විසුජ්ඣති,
තසමා හි නාති මඤ්ඤෙය්‍ය භික්ඛාචරියං සුමෙධසෝ.

එවරූපස්ස හි

පිණ්ඩ පාතිකස්ස භික්ඛුනෝ-අත්තහරස්ස අනඤ්ඤපොසිනෝ,
දෙවා පිහයන්ති තාදිනෝ - නෝ වෙ ලාභ සිලොක නිස්සිතෝ- සි.

යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ මේ පිණ්ඩපාතිකඞ්ග යෙහි සමාදාන ය-විධාන ය-ප්‍රභෙද ය-භෙද ය - ආනිසංස ය- යන මොවුන්ගේ සංවණ්ණනා යි.

සපදාන වාරිකඞ්ගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්? "ලොලුපපවාරං පටික්ඛිපාමි සපදාන වාරිකඞ්ගං සමාදියාමි" යනු හෙයින් ලොලභාවයෙන් ගෙපිළිවෙළ ඉක්ම හැසිරීම ප්‍රතික්ෂෙප කෙරෙමි. සපදාන වාරිකඞ්ග ය සමාදන්වෙමි යි යන මෙයින් එක් තරා වචනයක් කියා සමාදන් විය යුතු වේ. මෙසේ සමාදන් වන ලද අඞ්ග ඇති ඒ සපදාන වාරිකයා විසින් භික්ෂා පිණිස ගමට පැමිණි කල්හි ගම් දොර සිටි ඇත් අස් ගව මහිෂාදි යම් කිසි වක්හු කෙරෙන් උපද්‍රව නැති බව සැලකිය යුතු යි. එසේ සැලකූ කල්හි යම් වීථියක හෝ ගමක හෝ යම් කිසි උපද්‍රවයන් පෙණේ නම් ඒ වීථි ය හෝ ගම් හෝ හැර උවදුරු නැති තන්හි සිහන්ට වටනේ ය.

උපද්‍රවයෙන් මිදෙන පිණිස ම ගිය බැවින් ලොල භාවයෙන් ගෙපිළිවෙළ නො ඉක්මවූ බැවින් දුහහ හෙද නොපෙණෙ යි යම් ගෙදරක හෝ වීථියක හෝ ගමෙක හෝ තුන්දවසක් සිතූ කල්හි කිසිවක් නො ලැබී නම් ඒ ගම් ත් ගමක් නොවෙ යි යන සංඥාවෙන් හැරයන්ට වටනේ ය. යම් තැනක තුන් දවසින් එක් දවසක් යම් කිසි කරුණකින් නො ලැබුන ද දෙවෙනි තුන්වෙනි දවස හෝ ලැබේ ද සැම දවස්හි ම හෝ පලාබට්ට පුපා පුප කැඳ බත් ආදියෙන් කිසිවක් ලැබේ නම් ඒ හැර අන් තැනක සිහනට නො වටනේ ය.

මේ සපදාන වාරික භික්ෂූහු විසින් උදෑසන්හි ම භික්ෂා ව පිණිස පැමිණිය යුතු ය එසේ කල්හි අඵාසුක ස්ථානයන් හැර සෙසු තන්හි සිහන්නට කල් ඇති හෙයින් හැකි වන්නේ ය. ඉදින් වනාහි වෙහෙර දන්දෙන උපාසකවරු හෝ අතුරුමග එන මිනිසුන් හෝ නෙවත් අතුරුමගදී දුටු යම් කිසි කෙණෙක් සවාමීනි! මම ඔබ වහන්සේට දනක් දෙනු කැමත්තෙමි. එ බැවින් මා කෙරෙහි කරුණාවෙන් පාත්‍ර ය දෙවා වදුරන්නේ ය යි මේ සපදාන වාරිකයාගේ පාත්‍ර ය ගෙණ ආහාර සම්පාදන ය කො ට දෙන් නම් ඒ පිළිගන්නට වටනේ ය. මාගධයෙහි යන මේ සපදාන වාරිකයා විසින් වනාහි පිඬු සිඟීමට සුදුසු කලට සම්ප්‍රාප්ත ගම් නොසික්ම ම සිඟිය යුතු වෙ යි. එහි සිහා නොලදින් හෝ මදක් ලදින් හෝ ගමෙහි පලමුවන ගෙහි පටන් පිළිවෙළින් ම සිහි ය යුතු ය යි මෙසේ දක්වනලද සියල්ල සපදාන වාරිකඞ්ගයෙහි පිළිපදිනා විධි ය යි.

මේහි ප්‍රභේද කෙසේ ද යත්? උත්කෘෂ්ට සපදාන චාරික තෙම සිඟා නොගිය විටියෙන් වළඳන්ට උන් තැනට ගෙණා පෙරටුබත ද එසේ ම උන් තැනට සිඟා පසුඋනු විටියෙන් ගෙණා පසුබත ද පිණ්ඩපාතිකයා සෙසින් නො පිළිගන්නේ ය. එ සේ ම පිණ්ඩපාතිකයහට සෙසින් බොජුන් හලට පය ගෙණ දෙන බත ද නො පිළිගන්නේ ය. පත්තාඛ්‍යාර සංඛ්‍යාත සමුදාය ද්වාරයෙහි දී යම් කිසිවක්හු විසින් යාචයදු කොට ඉල්වන ලදු ව පාත්‍ර ය දෙන්නේ ය සි. ඒ එසේ ම ය. සපදාන චාරිකඞ්ගයෙහි තෘතීය ශ්‍රාවක වූ මහාකාශ්‍යප ස්ථවිරයන් වහන්සේ හා සදෘශයෝ මේ බුදුසස්නෙහි නැත.

එ සේ සපදාන චාරිකයන් කෙරෙහි අග්‍රතාන් පත් මොවුන් වහන්සේ පවා පෙනෙර වෙස් ගෙණ පෙහෙර වීථියෙහි දුහී ලෙසින් සිට තමින් සක්දෙව් බව නො හඟවා පාත්‍ර ය ඉල් වූ සක්දෙව් රජහු ගෙදොර දී දිවස් ඇත ද නිකරුණේ පහුරුවා නො බලන බැවින් මේ බදු දුගියන්ට අනුකම්පා කෙරෙමි යන කරුණාවෙන් පාත්‍ර ය දෙවා වදුළ තැන් දම්පියා අටුවාවෙහි ප්‍රකාශ ව පෙණෙන්නේ ය. එ හෙයින් සමුදාය ද්වාරයෙහි දී පාත්‍ර ය ඉල්වන උපාසකයන්ට පාත්‍ර ය දීමෙහි සැක නොකට යුතු. **මෙම කිහ-විතුඬිමාණියෙහි.**

ඉමිසම්පදාව හි බුහඩ්ඩ මහාකස්සපත්ථේරෙන සදිසෝ නාම නත්ථි. තස්සපි පත්තං විස්සට්ඨානමේව පඤ්ඤායති- සි.

මධ්‍යම සපදාන චාරික තෙමේ පිණ්ඩපාතිකයා සෙසින් පෙරටින් ගෙණා බත ද බොජුන් හලට පය ගෙණ දෙණ බත ද පිළිගන්නේ ය. උත්කෘෂ්ට සපදාන චාරිකයා පවා සමුදාය ද්වාරයෙහි පා විසදන බැවින් හමුදොර පය විසදන්නේ ය. තෙවත් පැමිණි දොරදී පාත්‍ර ය ගන්නවුන්ට දෙන්නේ ය. වහන්සේ සිඟා නො වැඩිය මැන ව . වෙනරට ම අනර ගෙණ දෙම් හ සි කී උපාසකයන්ගේ වචන ය අසා බත් ගෙණෙන තුරු බලා නො හිඳින්නේ ය. ඒ මධ්‍යම සපදාන චාරික තෙමේ ගෙපිළිවෙළ නොසික්ම සිනිමෙන් ම විශෙෂ බව මුත් උත්කෘෂ්ට පිණ්ඩපාතිකයහට අනුලොම් වේ. මේ මෘදුක සපදාන චාරික තෙමේ මධ්‍යම පිණ්ඩපාතික යා සෙසින් උපාසකයන් වෙනෙර ගෙණෙම්හ සි කියා නෙණා අනර පිළිගන්නේ ය. මේ මෙහි ප්‍රභෙද ය.

භෙද ය කෙසේ ද යත්?

මේ තුන්දෙනහට ම වනාහි ලොල් බැවින් ගෙවිළිවෙළ ඉක්ම නැසිරීම් උපන් මාත්‍රයෙහි දුනහ බිඳෙන්නේ ය. මේ සපදාන චාරිකඞ්ග යෙහි භෙද ය සි.

මෙහි අනුසස් කිම යන්?

කුලෙසු නිච්ච නවකතා, වඤ්ඣපමිතා, කුදාචෙජ්‍රපහාණා, සමානුකම්පිතා, කුලූපකාදීනවා භාවෝ, අවිහානානනිනඤ්ඤා, අනිතාරෙන අනත්තිකතා, අපපිච්ඡතාදීනං අනුලොමී වුත්තිතා--යි.

දක්වන ලද බැවින් කිසි කුලයෙක්හි නිඛදයෙන් නො එල ඔන බැවින් ඇ ම දවස්හි ම අළුත් බව ය,හැමතන් හි අලන්න මනස් ඇති බැවිනු දු සෞම්‍ය බැවිනු දු සඳහුට බදු උපමා ඇති බව ය, පරි ග්‍රහ චිත්තභාවයෙත් දන්දෙන උපාසක කුලයෙහි මසුරුබව දුරුවී ම ය, අවිභාගයෙන් ගිත පසස්නෙන් සම වූ අනුග්‍රහ ඇතිබව ය, කුලූපකාදීන්ගේ දුරුවීම ය, නිමන්ත්‍රණයෙන් නො තුස් බව ය, භික්ෂා ව හැර එදිවසෙහි අඩි නොවන අලෙපච්ඡතාදීන්ට අනුලොම් වෘත්ති ඇති බව ය, යන මොනු අනුසස් නම් වෙත් සවගී‘පවගී සම්පත් සාධක වූ මේ සම්බුදසාසනයෙහි සපදානචාරික පිළිවෙත් පුරණ මහණ තෙමේ සියලු කුලයෙහි වඤ්ඣයාට බදු උපමා ඇති වූයේ හැම දව සෙහි ම අලුත් වූයේ කුලයෙහි මසුරු බවක් නැත්තේ සම්පජානු කම්පා ඇත්තේ කුලූපගාදීනවයන්නෙන් විපුමුක්ත වූයේ වන්නේ ය. ඒ මෙබඳු අනුසස් ඇති බැවින් ලොල් බැඳින් ගෙපිළිවෙළ ඉක්ම සිගිමි හැර යට නෙලූ ඇස් ඇති ව එ නෙසින් ම වියදඬු පමණක් ම බලන් නේ ය. පෘථිවියෙහි සෙවෙරි විහාර කැමැත්තේ ධීර වූයේ සපදාන චාරි ක දුහන පුරන්නේ ය.

දක්වන ලද මෑ සි.

වඤ්ඣපමෝ නිච්ච නවෝ කුලෙසු අමච්ඡරී සබ්බ සමානුකම්පෝ.
කුලූපකාදීනව විප්පමුත්තෝ හොතී‘ධ භික්ඛු සපදානචාරී.

ලොලුප්පචාරඤ්ච පහාය තත්‍රමා ඔකඛිත්තචක්ඛු යුගමත්තදස්සී,
ආකඞ්ඛ මානෝ භුවි සෙරිවාරං චරෙය්‍ය ධීරෝ සපදානචාරං –යි.

තව ද-මෙහි දැක් වූ අනුසසුන් අතුරෙහි නිඛදයෙන් නො එළ ඹීමෙන් හැමදවස්හි ම අලුත් බව ය යි කියන ලද අනුසස් කවර අර්ථ යකින් සැප වී ද යත්? යම් යම් උපාසක කුලයකට නිරන්තරයෙන් එළඹුන හොත් එහි බොහෝ ආදීනව ඇත්තේ ය. ඒ කවර ආදීනව යෙක් ද යත්? ප්‍රථමයෙන් මහත් ගෞරවයෙක් ඇති ව දන් දුන උපා සකයන්ගේ කටයුත්තෙහි අලස වීමෙන් හෝ සම්පත් හිණ වීමෙන් හෝ නිරන්තරයෙන් බණ නැසීමෙන් හෝ මේ සේ හැම දවස ම එළ ඹෙන භික්ෂූන් කෙරෙහි යම් කිසි කරුණකින් ශ්‍රද්ධා ව පිරිහීම හෝ වන්නේ ය.

නිත්‍යයෙන් පුරුදුවීම හෙතුකොට ගෙණ සවාමීනි! අපගේ අසවලාට මේ නම් අපාසුවක් වී ය. ඊට කිසි බෙහෙදක් හෝ දෙවා වදුළ මැනව. වෙදකමක් හෝ කර වදුළ මැනව. මහන්සේ හැර අපට ඉහලොක පරලොක දෙකින් ම උපකාර වීමට අන්කිසි තෙණෙක් නැතැ සි යනාදීන් කිව හොත් ඒ අසා තමාගේ චිත්ත ය ද මෘදු ව ඊට උපකාර වෙමි සි සිතා යම් කිසි බෙහෙත් ආදියක් දෙමින් මට සංග්‍රහ කරණ උපාසකවරු නොවේද සි සිතා උපකාරයක් කළ හොත් එක්වීසි අන්මෙසනයට ඇතුළත් ව ආජීව පාරිසුද්ධි සීල ය කිලුටු ව මහත් අනර්ථ උපදනේ ය. මේ ආදී වූ අනෙකාදීනව එළවීමට කාරණා වන බැවින් කුලයට නිරන්තරයෙන් එළඹීම දුක් වන්නේ ය.

යම් කිසි කුලයකට නිරන්තරයෙන් එළඹ පුරුදුවීමක් නැති නිසාත් මේකි ආදීනව සියල්ල නැන්තේ ය. එසේ හෙයින් නිරන්තරයෙන් කුලයට නො එළඹීමෙන් අලුත් ව වසන බව සැප කොට දුක්වූහ සි දත යුතු තව ද ඒ අනුසසුන් ඇත උපාසකයන් කෙරෙහි කුලූපග වීමෙන් දුරුවීම කවර අර්ථයකින් අනුසස් වී ද යත්? උපාසකයන් හා කුලූපග ව පෙර සේ ම නිරන්තරයෙන් ඔවුන් ගෙට එළඹ වැලඳීම් ආදියට යන කල්හි ඔවුන්ගේ යම් කිසි ධන ධානය දියකට හානියක් වුව හොත් මුන්වහන්සේ නිසා වන් හානියක් වනැ සි සිතා ත් සැක කොට නොයෙක් ලෙසින් උවදුරට කාරණා වන් නේ ය ඒ එසේ මි ය මේ කුලූපගාදීනව ය දක්වන පිණිස **මණිකාර** කුලූපග තෙරුන් වහන්සේගේ කථාවසතු ව මෙහි සඞ්ග්‍රහ කරණු ලැබේ.

කෙසේ ද යත්? ඒ තෙරුන් වහන්සේ එක **මැණික්සැව්වර** තෙණෙකුගේ ගෙහිදී දෙළොස් හවුරුද්දක් විවර වැලඳූ සේක. මැණික් සැව්වර දෙමාල්ලෝ දෙමව්පියෝ තරමේ සිට තෙරුන් වහන්සේට උපස්ථාන කළෝ ය. එක් දවසක් මැණික් සැව්වරා ණෝ තෙරුන් වහන්සේ ලහ හිඳ දඬමසක් කපති. එ වෙලාවට කොසොල් රජ්ජුරුවෝ අසවල් ලෙස මැණික ගා විදලා එවාලව සි එක් මැණිකක් සැවූ ය. මැණික් සැව්වරාණෝ ද ලේ වැකි අතින් මැණික හැරගෙණ පෙව්ටියක් පිට තබාලා අතසෝදන්ට ඇතුළු ගෙට වන් හ. ඒ ගෙයි වැඩෙන කොස්වා ලිහිණියෙක් ඇත. එ තෙමේ ලෙහෙ ගදින් මස්කැටියකැ සි සිතා තෙරුන් වහන්සේ බල බලා. ඉන්දදී ම මැණික ගිල්ලේ ය මැණික්ගල නියා ව ඔබ ත් දුටු සේක.

මැණික් සැව්වරා අවුත් මැණික නො දැක මැණික ගතුදැ සි අඹුවන් අහිනු ත් දරුවන් අහිනු ත් පිළිවෙළින් විමාරු උන් දෙපළ ස ම හැර නො ගතුම් හ සි කි කල්හි තෙරුන් වහන්සේ හැරගත්

නියා යි සිතා ගන ඇඹනියන්ට කිවු ය. ඇ ඒ අසා එ සේ නොසිය මැන ව. දෙලොස් අවුරුද්දක් මුළුල්ලෙහි එ බන්දෙක් ඇත් නම් හැඟී නො යේ ද? ඔබ එ බන්දෙක් නොකරණ සේකැ යි ඔබගේ තරම් දැන ම කිවු ය. එසේ උන් කිව ත් මැණික් සැට්ටරා මැණික් වල තරම් දනී. නමුත් ඔබගේ තරම් නොදැන සවාමිනි! මෙතන තිබූ මැණික ගත්තේ ඇද්දැ යි විවාළෝ ය. උපාසකයෙනි! අපි නො ගතුම්හ යි වදළ සේක. සවාමීනි! තුඹ වහන්සේ විනා අනික් කෙණෙකුත් නැත. ගණින ත් තුඹ වහන්සේ ම ය. මැණික වහා දුන මැන ව යි කිවු ය. තෙරුන් වහන්සේ හැර නොගත් ම නෙසින් තර ව නොගනිමි යි කී සේක

ඇඹනියන්ට තවත් කියන්නෝ සොරා හැරගත් දෙයක් හැර ගතුම්හ යි කියන්නෝ ඇද් ද, නිකම් නොකියන බැවින් ගතයක් කොට විවාරමෝ දැ යි කිවූ ය. උපාසිකාවෝ නමින් සැදැ ඇති හෙයිනු ත් ඔබගේ එ බදු තරමක් නැති නියා ඉදුරා දන්න හෙයිනු ත් අප නොනැසු ව මැන ව. මැණික නිසා අපි ගැම්ඹිවෝ ව. නුමුත් සදම්බල ගොම ගානා සේ මුන්වහන්සේට තෙල ලෙස කිම නපුරැ යි කිවු ය. අපි හැම දෙන ම මිල කල ත් මැණික නො අගුම්හ යි කියාලා ලණුවක් හැරගෙණ, තෙරුන් වහන්සේගේ හිස වෙළීමෙන් කමියා වෙළාගෙණ දණ්ඩකින් මිරිකාලී ය තෙරුන් වහන්සේගේ හිසින් ද කණින් ද නාසයෙන් ද ප්‍රවෘත්ති විපාක වශයෙන් සේස ව සිටි අකුසල විපාකය ත් බාහ්‍යවන්නා සේ ලේ වැගිරෙන්ට වන. ඇස් දෙක ත් පිටත්වන්නා සේ වි ය. වෙදනා බලවත් ව බිම වැටී හුන්නු සේක.

කොස්වා ලිහිණියා ත් ලෙහෙ ගදින් අවු ත් ලේ බොයි. මැණික් සැට්ටරා ත් තෙරුන් වහන්සේ කෙරෙහි උරණින් තොප කරන්නේ කිමිදැ යි කියා පයින් කොස්වා ලිහිණියා ගසා දැමී ය. උයි ත් තෙරුන් වහන්සේට බිළි වූ සෙසින් මලේ ය. තෙරුන් වහන්සේ ත් පාර කා හුණුවා වූ ලිහිණියා දැක උපාසකයෙනි! මා හිසවෙළුම ලිහිල් කොට ලා තුළු මල නොමිල නියා ව බලව යි වදළ සේක. ඌ වන්නා මෙ වකට මලෝ ය යි උන්නබා මුඛ ත් මැණික නොදී මියනදැ වේ දැ යි කිවු ය. උපාසකයෙනි! ලේ වැකි මැණික දැක ගිලු යේ තෙලේ ය. මැණික ගිල නියාව මම දිටිමි. තුළු මලහෙයින් මුත් නොමල නම් කමියා නුරූප ව මම මිය යන නමු ත් නොකියමි යි වදළ සේක.

ඔහු ත් ලිහිණියාගේ බඩ පලා පියා කසල ගොඩක සඟවා ලු මැණිකක් මෙන් මැණික දැක තමා කළ වරද කාරිය බලවත් හෙයින් වෙවුලා තෙරුන් වහන්සේ වැදගෙණ වැදහෙව සවාමිනි! නොදැන

කළ දෙයට ක්ෂමා කළ මැනව සි කිවූ ය. උපාසකයෙනි! තොපගේ වරදකු ත් නොවෙ සි. සසර සිටිනාකල එක්වූ වැරැද්දක. අක්ෂමාවක් නැති හෙයින් ක්ෂමා කෙළෙමි සි වදළ සේක. සවාමීනි! ක්ෂමා වී තම් ආදිලෙසින් මි අප ගෙයි දි නිරන්තරයෙන් ම වලඳන්ට වුව මැනව සි කිවූ ය. තෙරුන් වහන්සේ ත්—

පච්චති මුනිනෝ භත්තං ථොක ථොකං කුලෙ කුලෙ,
පිණ්ඩිකාය චරිස්සාමි අත්ථි ජඞ්ඝාබලං මම.

යනු හෙයින් උපාසකයෙනි! මෙවක් පටන් මේරමා ගෙයක සෙවිත්තක් ඇතුළතට නො වදිමි. මේ වූයේ ගෙවල භිඳ වැලඳීමෙහි දෙස ය. පය බල ඇත් නම් සිහාගොසින් පත් දෙර සිට ලත් දෙයක් සරූප තෙනක භිඳ වලඳමි සි කියාලා තෙරුන් වහන්සේ ඒ පිඬාව මුල්කොට නොබෝ කලකින් සසරදුක් නිවා පිරිනිවි සේක. කොස්ඹි ලිගිණියා ත් මැණික් සැවිටරාණන්ගේ අඹුවන් බඹ පිළිසිඳ ගත මැණික්සැවිටරා අරහන්තඤාතක කම් සිද්ධ වූ හෙයින් අවීචියෙහි උපන. මැණික් සැවිටරානන්ගේ අඹුවෝ තෙරුන් වහන්සේ කෙරෙහි පහන් සිතින් මිය දෙව්ලොව උපති සි එක තැන රඳ භිඳලා ඒ ඒ කටයුත්තෙහි වෙන වෙන කඩාගියා සේ ඒ ඒ තෙන උපන්හ. වහන්දැ බුදුන් අතින් උන් හැ ම උපන් තැන් විවාළ සේක.

බුදුහු එවිබා මහණෙනි! මල සතර පක්ෂයෙන් කොස්වා ලිගිණියා මිවුකුස උපන. මැණික්සැවිටරා නරකයෙහි උපන. ඔහුගේ අඹු රහත් සතුන් කෙරෙහි කළා වූ චිත්ත ප්‍රසාදයෙන් දෙලොස් හවුරැද්දක් මිතර කළ උපස්ථානයෙහි විපාකයෙන් දෙව්ලොව උපන්හ. ජානිකාරණා වූ භව නැසූ හෙයින් උන්ගේ උපස්ථාන ත් විඳ ගෑට ත් වූ රහත් සතුන් පිරිනිවිසෑ සි වදළ සේක. සපදාන වාරිකයා හැම දවස ම ගෙට්ට්‍රිවෙළින් සිහා ලද අහරින් ජීවත් ව සිටි කුලයක කුලූපග වීමක් නැති හෙයින් මෙ බඳු ආදීනවයට නොපැමිණෙන බැවින් කුලූපග ආදීනවයෙන් දුරුවීම අනුසස් කොට දක්වූහ සි දතයුතු.

තව ද- ඒ සපදාන වාරිකාඞගයෙහි දැක් වූ අනසසුන් අතුරෙහි කුලමසුරු බවෙන් දුරුවීම කුමක් හෙයින් අනුසස් කොට දක්වූ ද යත්? යම් භික්ෂු කෙණෙකුන්ට දන්දෙන උපාසක කුලයන් කෙරෙහි ම මසුරු ව මෙ උපාසකවරු මට ම උපකාර කරණ බව මුත් සෙස් සන්ට මෙ ලෙස උපකාර නොකෙරෙත් වා සි යන මසුරු සිතක් උපන හොත් මසුරුබව හේතුකොට ගෙණ ලොකසථවිරයන් වහන්සේට හා ජම්බුකාජීවක සථවිරාදීන්ට මෙන් නොයෙක් අකුසල් රැස් ව ප්‍රමාණාතික්‍රාන්ත වූ දුකට බත් වන්නේ ය. ඒ සාරණයෙනි.

එකාසනිකඞ්ගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්? "නානා සන හොජනං පටික්ඛිපාමි එකාසනිකඞ්ගං සමාදියාමි" යනුවෙන් වෙන වෙන ගස්තේ හිද කරණ ආහාර පරිභොග ප්‍රතික්ෂෙප කරමි. එකාසනිකඞ්ග ය සමාදන් වෙමි යි යන මෙයින් එක්නරා වචනයකින් සමාදන් විය යුතු. මේ සේ සමාදන්වන ලද ධුතාඞ්ග ඇති එකාසනිකඞ්ගයා විසින් වනාහි ආසන ශාලාවෙහි හිදිනා කල ථෙරාසනයෙහි නො හිඳ මේ අස්න මට පැමිණෙන්නේ ය සි නැගී නොසිටිය යුතු අස්නක් සලකා හිදි ය යුතු ය. ඉදින් ඔහුගේ භෝජන ය අඩාල වූ කල්හි ආචාර්‍ය්‍ය තෙරහු හෝ උපාධ්‍යාය තෙරහු හෝ වැඩිය නොත් නැගී සිට වත් කරන්ට වටනේ ය යෙත්.

මේ සේ දක්වන ලද්දේ එකාසනිකඞ්ගයෙහි පිලිපදිනා විධි සි ප්‍රභෙද නෙසින් වනාහි මේ ධුතාඞ්ග ය ත්‍රිවිධ වෙ සි. එහි උත්කෘෂ්ට එකාසනිකඞ්ග තෙමේ මද වුව හෝ වේ ව සි බොහෝ වුව හෝ වේ ව සි යම් භෝජනයක් වළඳන්නට අත එලවුව හොත් එසින් මත්තෙහි අනිකක් ගන්නට නො ලබන්නේ ය. ඉදින් මනුෂ්‍ය යෝ තෙරුන් වහන්සේ විසින් කිසිවක් නො වළඳන ලදූ සි සැපවි ආදින් එළවත් නම් නෙද වළඳන වේලෙහි බොහෝ පිණිස ම වටිනේ ය. ආහාර පිණිස නො වටිනේ ය. මධ්‍යම එකාසනික තෙමේ යම් තාක් කල් පාත්‍ර ය තුබූ බත් වළඳ, එ තෙක් නො වේ ද එ සෙක් කල් පිලිගැන් වූ අනිකක් ගන්නට ලැබෙන්නේ ය.

මේ මධ්‍යම ඒකාසනික තෙමේ පාත්‍රයෙහි බොජුන් නිමින තෙක් අතරෙහි දුන් යමක් වළඳන බැවින් හොජන පර්‍ය්‍යන්තික නම් වේ. මෘදුක එකාසනික තෙමේ යම් තාක් කල් වළඳන්ට උන් අස්නෙන් නො නැගේ ද ඒ තාක් කල් අතුරෙහි පිලිගැන් වූ යම් ආහාරයක් වළඳන්නට ලැබෙන්නේ ය. හෙතෙමේ පාත්‍ර ය සේදූ තැනින් මත්තෙහි නො ගන්නා බැවින් උදක පර්‍ය්‍යන්තික නමු දු වෙ සි. යම් තාක් ආසනයෙන් නො නැගේ ද ඒ තාක් වළඳන බැවින් ආසන පර්‍ය්‍යන්තික නමු දු වෙ සි. මේ තුන්දෙනහට ම වනාහි නොයෙක් අස්තේ හිද වැළඳු කෙණෙහි දුහඟ බිදේ. මේ මෙහි භෙද සි.

මේ ඒකාසනිකඞ්ගයෙහි අනුසස් කිම යත්?

අල්පාබාධතා ය, සිරාරෝ දුක් නැති බැවින් අල්පාතඞ්ක බව ය, ලඝුවන්නා බව ය, සිරාරෝ බල ය, ඵාසු විහාර බව ය,

කැප නොකළ බොජුන් පසයෙන් තන් අස්නෙහි වළඳනුවනට වත ඇවැත් ඒකාසනිකයනට නොවත බැවින් අනතිරික්ත ප්‍රත්‍ය යෙන් අනාපත්ති බව ය, රසතෘෂ්ණාවගේ නැසීම ය, අලෙවඡ නාදීන්ට අනුලොම් පැවතුම් ඇති බව ය, යන මොහු අනුසස් නම් වෙත්.

අපි ව—ඒකාසන භෝජනයෙහි ඇලුනා වූ මිහණහු ආහාර ප්‍රත්‍යයෙන් වන රෝගයෝ නො මඩිති. රසයෙහි ලොල් නොවූයේ තමාගේ සමථ විදර්ශනා කම් ය බොජුන් පිරි ය නස්නා පියොමනා බැවිනු දු නිරෝග වන බැවිනු දු නො පිරිහෙලන්නෝ මෙසේ ඵාසුවිහාර කාරණා වූ පිරිසිදු වූ සලෙලබ ගුණයෙහි ඇලුනන් විසින් සෙවිනා ලද එකාසන භොජනයෙහි පිරිසිදු වූ සිත් ඇත්තේ හැම කල්හි.ම ඇලුම් කරන්නේ ය.

එ හෙයින් කිහ.

එකාසන භොජනේ රතං
න යතිං භොජන පච්චයා රුජා,
විසහන්ති රසෙ අලොලුපෝ
පරිහාපෙති න කම්ම මත්තනෝ.

ඉති ඵාසුවිහාර කාරණෙ
සුචි සලෙලබ රතූපසෙවිතෙ,
ජනයෙථ විසුද්ධ මානසෝ
රතිමේකාසන භොජනෙ සදා-සි.

මේ එකාසනිකඞ්ගයෙහි සමාදානාදි ය සි. මෙසේ මේ එකාසනිකඞ්ග ය විසුද්ධිමාගීානුකූල කොට දක්වා උපාසකයන් විසින් රක්නා සේ උපාසක ජනාලංකාරයෙහි දැක් වූ පරිදි ද මෙහි සඞ්ග්‍රහ කෙරෙමි.

තත්‍ර එකාසනිකඞ්ගං තාව සමාදියනෙතන නානාසන භොජනං පටික්ඛිපාමීති වා එකාසනිකඞ්ගං සමාදියාමී'ති වා සමා දා තබ්බං. නානාසන භොජනෝ පටික්ඛිත්තෙ එවං අත්ථතෝ එකාසන භොජනං අනුඤ්ඤාතං තසම්ං ච අධිට්ඨිතෙ නානාසන භොජනං පටික්ඛිත්තං හොති. තසමා දවිණණමඤ්ඤතරෙන දවිහිපි වා පටිකෙඛපං අධිට්ඨාන මුඛෙන සමාදාතබ්බං. එවං සමා දින්න ධුතඞ්ගෙන පන භොජන කාලෙ පතිරූපට්ඨානං සල්ලක්ඛෙත්වා නිසීදි තබ්බං.

යථේ තං කොචි ගරුට්ඨානියෝ යාව භොජන පරියොසානා න උපසංකමිත් යදි වා පන කොචි තාදිසෝ'පි ඨානෙ අභිවිසඤ්ඤා භාවෙන උපසංකමේය්‍ය යාව භුඤ්ජිතුං නාහරති තාව වුට්ඨා තබ්බං. අයං පන භික්ඛක භොජනෝ පනිරූපමිඤ්ඤ ආසනං පඤ්ඤපෙත්වා ඔකාසං කාරෙත්වා භුඤ්ජිතබ්බං. සචෙ බලවසද්ධාය ගරුට්ඨානියං දිසවා සහසා වුට්ඨහති න භුඤ්ජිතබ්බං. කසමා ආසනා වුට්ඨිතත්තා'ති .. ඉදම්සසවිධානං-අයං පහෙදෙ.

තයෝ එකාසනිකා උක්කට්ඨෝ-මජ්ඣිමෝ - මුදුකොති-තත්ථ උක්කට්ඨෝ අපපං වා හොතු බහුං වා යථිහි භොජනෙ භුඤ්ජිතු කාමෝ හත්ථං ඔතාරෙති තතෝ අඤ්ඤං න ගණ්හාති. කිං තතෝ අඤ්ඤං නානාසනභොජනං හොති ති? න හොති.

යදි සියා මුදු මජ්ඣිමානං ධුතඞග හෙදෙසියා තව හොති. අයං පන පරමපණීතභාවාය ආහතාහතස්ස ගහණං නාම නානාසන භොජනං විය'නි මඤ්ඤමානෝ තතෝ අඤ්ඤං අගහෙත්වා තෙනෙව යාපෙති. යදි පනස්ස ගෙහෙ පරිවාරකා න කිඤ්චි භුත්තං අරියෙනාති සපපි ආදිනි ආහරන්ති, නෙසජ්ජිකමෙව වට්ටති. න ආහාරත්ථං. මජ්ඣිමෝ යාව පානියා භත්තං න ඛියති තාව අඤ්ඤං ගණ්හිතුං ලභති. අයං හි භොජන පරියන්ති කෝ නාම හොති. යාව පානියා භත්තං පරි යොසානං තාව ගණ්හතෝ මුදුකෝ යාව ආසනා න වුට්ඨාති තාව භුඤ්ජිතුං ලභති. සොහි ආසන පරියන්තිකෝ නාම. ඉමෙසං පන නිණ්ණමපි නානාසන භොජනං භුත්තකඛණෙ ධුතඞගං භිජ්ජති. අයමෙත්ථ හෙදෙ.

මේ එහි ආ ක්‍රමය යි.

පත්තපිණ්ඩිකඞගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්?

"දුතියකභාජනං පටික්ඛිපාමි පත්තපිණ්ඩිකඞගං සමාදියාමි"

යනුවෙන් දුතියක භාජන ය ප්‍රතික්ෂෙප කෙරෙමි පත්ත පිණ්ඩිකඞග ය සමාදන් වෙමි යි යන මෙයින් එක්තරා වචන ය කින් සමාදන් විය යුතු. මෙසේ සමාදන්වන ලද ධුතාඞග ඇති පත්තපිණ්ඩිකයා විසින් කැඳ වළඳන කල් හි භාජනාදි ය හා සමග ත් අවුළු ආදි ය දායකයන් විසින් පිළිගැන්වීම් ඇති බැවින් භාජනයෙහි තබා අවුළු ලද කල කැඳ නො පිළිගෙණ පළමුකොට අවුළු හෝ වැළඳි ය යුතු ය. අවුළු ඔත් බත්ත් නො පිළිගෙණ පළමුකොට කැඳ හෝ වැළඳි ය යුතු ය. ඉදින් අවුළු කැදෙහි ම බහාලත් නම් පූතිමාංසාදි අවුළු බහා ලූ කල්හි කැඳ පිළිකුල් වේ නම් පිළිකුල් නො එන සේ කොට වළඳන්ට වටනේ ය.

කුමක් නිසා ද යත්? පිලිකුල් දේ වැළඳූ කල්හි බඩපෙර ලීම් උද්ගාරණය වීම් ආදිය වන්නේය. එ හෙයින් පිළිකුල් නොවන සේ වෙන වෙන ම් වැළඳිය යුතුය. එ හෙයින් එ බඳු වූ ව්‍යඤ්ජනය සඳහා මේග කියන ලදී. කෙසේ ද යත්? මධුශර්කරාදී යම් අවුළෙක් කැදෙනි බහාලූ කල පිලිකුල් නොවේ ද? එ බඳු දෙය කැදෙනි ම බහාලිය යුතුය. පිලිගන්නහු විසිනුදු එක භාජනයෙහි ම පිලිගන්නෙමි නොවේදැ සි සිතා බොහෝ කොට පිලිගෙණ නොදැමීමෙන් පමණ දැන පිලිගත යුතුය. මිරිස් අතු ආදී අඹු අතු අනින් ගෙණ කඩ කඩා වළඳන්ට වටනේය. ඒ වනාහි රසවිඳීම පිණිස ම කරණ දෙයක් බැවින් එ සේ නොකොට අන ද දෙවන පාත්‍රයක් වන බැවින් සරුප් පිණිස පාත්‍රයෙහි බහා වැළඳිය යුතුය. දෙවන භාජනය ප්‍රතික්ෂේප කළ බැවින් අනික් සල් මීලිල ආදී රැක් පතකුදු නොවටනේය. සි මේ මෙහි පිලිපදනා විසි සි.

මෙහි ප්‍රභෙද කෙසේ ද යත්?

ප්‍රභෙද හෙයින් වනාහි මේ පත්තපිණ්ඩිකඞ්ගය ද තුන් වැදෑරුම් වෙයි එහි උත්කෘෂ්ටයාට සප දැමි ය යුතු බැවින් උක්ද්‍රව්‍ය කන කවවරයෙන් පිටින් අනික් කසලක් සපා හරණට නොවටනේය. බත් පිඬු මත්ස්‍ය මාංස පූප ය යන මේ දෙය බිඳ වළඳන්නට නොවටනේය. මධ්‍යම පත්තපිණ්ඩිකයහට එක අතකින් බිඳ වළඳන්ට වටනේය. එ හෙයින් මේ මධ්‍යම නෙම් හත්‍ථයොගි නම් වෙයි මෘදුක පත්තපිණ්ඩිකයා වනාහි පත්තයොගි නම් වේ. ඒ පත්තයෝගීහට යම් කිසි දෙයක් පාත්‍රයෙහි බහාලන්නට පිළිවන් වි නම් ඒ සියල්ල අත්ත් හෝ දනින් හෝ බිඳ වළඳන්නට වටනේය. මේ මෙහි ප්‍රභෙද සි.

භෙදය වනාහි "ඉමේසං පන තිණ්ණම්පි දුනියක භාජනං සාඩිතක්ඛණෙ ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්‍ථ භෙදෙ"සි දක්වන ලද බැවින් මේ තුන්දෙන හට ම දෙවෙනි භාජනය ඉවසූ කෙණෙහි දුනහ බිඳේ.

මෙහි අනුසස් කිම යත්?

නොයෙක් රස වැළඳීමෙන් වන රසතෘෂ්ණා දුරුකිරීම ය නානා භාජනගත රසෙහි ඉවහා දුරුකිරීම ය, ආහාරයෙහි ප්‍රයෝජන මාත්‍ර දැන්ම ය හෙවත් නුමුසු රසෙහි ගිදුණු නොව එක්කොට වළඳන බැවින් ආහාරයෙහි බුදුන් විසින් අනුදත් ජීවිතෙන්ද්‍රිය පවත්වන මතු ප්‍රත්‍යවේක්ෂණ දක්නා බව ය, තලුතැටි ආදින්ගේ

පරිභරණයෙහි වේදනා නැති බව ය, නානා භාජන ගත වූ ව්‍යඤ්ජනයෙහි එක භාජනගත සංඥ ඇති බැවින් අවික්ඛිත්ත වූ භොජන ඇතිබව ය, අල්පෙච්ඡතාදීන්ට අනුලොම් පැවතුම් ඇතිබව ය, යන මොහු අනුසස් නම් වෙත්.

අපි ච—නානා භාජන ගත විඤ්ඤපය හැර පාත්‍ර ය සංඥ වෙන් යට හෙළූ ඇස් ඇති ව බොහෝ අකුසල් රැස්වන්නට කාරණා ව සිටි රස තෘෂ්ණාවෙහි මුල් කරන්නක්හු මෙන් සුන් දර වූ වුත ඇති සිරුරු ඇති තුෂ්ටි ය දරන්නාක්හු මෙන් නො හොත් මෑතිමිත් තුෂ්ටි ය දරන්නාක්හු මෙන් සුඳුර වූ මනස් ඇති ව පත්තපිණ්ඩිකයා මිස අන් කවරෙක් අහර වළඳන්නට සමර්ථ වන්නේ ද, නානා භාජනයෙහි විඤ්ඤප දුරුකොට පාත්‍ර යෙහි හුණු ඇස් ඇති ව රසතෘෂ්ණා ව මුළින් උදුරන්නක්හු මෙන් සුඳුර වූ වුත ඇති ව සිරුරු ගත් සන්තුෂ්ටි ය දරන් නක්හු මෙන් සුඳුර වූ මනස් ඇති ව පත්තපිණ්ඩිකයා මිනා කොට ආහාර වළඳන්ට සමර්ථ වේ.

දක්වන ලද මෑ සි.

නානා භාජන විකෙඛපං හිත්වා ඔකඛිත්තා ලොචනෝ,
ඛණනෙත්තා විය මූලානි රස තණ්හාය සුබ්බතෝ.
සරූපං විය සන්තුට්ඨිං ධාරයනෙත්තා සුමානසෝ,
පරිභුඤ්ජත්‍යය ආහාරං කෝ අඤ්ඤෝ පත්තපිණ්ඩිකා—සි.

මෙසේ දක්වන ලද අනුසසුන් අතුරෙහි රසතෘෂ්ණා ව දුරු කිරීම කවර අර්ථයකින් අනුසස් කොට දක්වන ලද ද යත් ?

යම් ශ්‍රමණ බ්‍රාහ්මණ කෙනෙක් රසතෘෂ්ණාවෙන් මිඩනා ලද්දාහු වූ නම් ඔවුන්ට චූල්ලපිණ්ඩපාතික නිසස සථවිරාදීන්ට මෙන් මහත් අනර්ථ වන නෙයිනි. චූල්ල පිණ්ඩපාතික නිසස සථවිරාදීන්ට රසතෘෂ්ණාවෙන්—

අනර්ථ වූ පරිදි කෙසේ ද යත් ?

සකල ගුණ කුසුම මඤ්ජරී සමලඞ්කෘත භවලෝ කොත්තර ධම් මිඩුර ඵලභරිත කල්පදුම වූ සම්බුදයන් වහන්සේ නානා විධ කුසුම ඵල පල්ලවාලඞ්කෘත නෙක ජන චිත්ත නන්දන ය කරවන වේලු වනාරාමයෙහි වැඩවදුරණ සමයෙහි **නිසස කුමාර** නම් වූ මහත් සම්පත් ඇති සිටු කුලයක පුත්‍රයෙක් ඇත්තේ ය. ඒ සිටුපුත්‍ර තෙමේ එක් දවසක් වේලුවනාරාමයට ගොස් සම්බුදයන් වහන්සේගේ ධම්දෙශනා ව අසා පැවිදිවනු කැමති ව පැවිදි

වීමට යාච්ඤා කොට දෙම්විපියන් විසින් අනුදන්නා නොලද්දා ගෙයින් ප්‍රතික්ෂේප කරණ ලද්දේ, සත් දවසක් නිරාහාර ව හිඳ රට්ඨපාල සථවිරයන් මෙන් මව් පියන් දෙදෙන අනුදන්වා සම්බුදුන් වහන්සේගේ සමීපයේ දී පැවිදි වූ සේක.

සම්බුදුන් වහන්සේ ඔහු පැවිදි කරවා අඩ මසක් කල් වේලුවනාරාමයෙහි වාස ය කොට ජේතවනාරාමයට වැඩි සේක. එ තැන්හි දී මේ කුලපුත්‍රයන් වහන්සේ තෙළෙස් ධුතාඞ්ග ය සමාදන් ව සැවැත් නුවර ගෙපිළිවෙළින් පිඬු පිණිස හැසිරෙමින් කල් යවන සේක චුල්ල පිණ්ඩපාතික තිස්ස සථවිරයන් වහන්සේ ය යි කිකල්හි ආකාසයෙහි චන්ද්‍රයා මෙන් සම්බුදු ශාසනයෙහි ප්‍රකාශව ප්‍රසිද්ධ වූ සේක.

එ සමයෙහි රජගහ නුවර නැකත් කෙළි පවත්නා කල්හි සථවිරයන් වහන්සේගේ මව්පිය දෙදෙන උන්වහන්සේ ගිහි කල්හි යම් ආභරණ භාණ්ඩයෙක් ඇද්ද ඒ ආභරණ- බඳු රිදී කරඬුයෙන් බහා අභිමුඛයෙහි තබාගෙණ අතිකුත් නැකත් කෙළිවල අපගේ පුත්‍ර මෙනම් මෙනම් අලඞ්කාරයෙන් සැරහී නැකත් කෙළ්ළේ කෙළීනේ ය. අපගේ ඒ එක පුත්‍රයා ගෙණ ශ්‍රමණ භවත් ගෞතමයාණන් වහන්සේ සැවැත් නුවරට වැඩි සේක. අපගේ පුත්‍ර දැන් කොතැන්හි හුන් සේක් ද කොතැන්හි සිටි සේක් දැ යි කියා හඬන්නාහු ය. ඉක්බිත්තෙන් එක් වණි දැසියක් ඒ සිටුකුලයට නොස් හඬන්නා වූ සිටුනායිනී ව දැක ආයිනීවෙනි! කවර හෙයකින් හඬන්නෙහි දැ යි විමාලා ය.

සිටුභාර්‍යාවෝ ඒ කාරණා ව දැන්වූවා ය. ආයිනීවෙනි! සවාමි පුත්‍රයාණෝ කවර දෙයකට කැමති වෙතවාදැ යි කිවු ය. අස වල් අසවල් දෙය යි කිවුවා ය. ඉදින් නුඹ වහන්සේ මේ ගෙයි සියලු ඓශ්වර්‍ය්‍ය ය මට දෙවත් හොත් මම තොපගේ පුත්‍රයා ගෙණ එන්නෙමි යි කිවා ය. සිටුනායිනී ව ඒ වචන ය ඇසූපතා යි කියා පිළිගෙණ වැටුප් දී මහත් වූ පිරිවරින් ඒ වණිදැසි ය යවන්නී සව තිගේ බලයෙන් මාගේ පුත්‍රයා ගෙණෙව යි කියා යැව්වා ය. ඒ වෛශ්‍යාඞ්ගනා ව පිළිසන් යානාවෙක් හි හිඳ සැවැත් නුවරට නොස් තෙරුන් වහන්සේ භික්ෂා ව පිණිස හැසිරෙන වීථියෙහි නවාතැන් ගෙණ සිටුකුලයෙන් ආ මනුෂ්‍යයන් තෙරුන් වහන්සේට නොදක්වා තමාගේ පිරිවරින් ම පිරිවරණ ලද්දී.

පිඬු පිණිස හැසිරෙන්නා වූ තෙරුන් වහන්සේට පළමුකොට බත් සැන්දෑන් පිළිගන්වා ක්‍රමයෙන් බත් මලාවක් පිළිගන්වා රස තෘෂ්ණාවෙහි බඳවා අනුක්‍රමයෙන් ගෙයි වැඩ ඉදිනට සලස්වා

ආහාර ය දෙනු ලබන්නී තමාගේ වසඟභූයට පැමිණි බැව් දැන ගිලන් ආකාර දක්වා ඇතුළු ගබඩාවෙහි සයන ය කළා ය. තෙරුන් වහන්සේ ද භික්ෂාචාර වේලාවෙහි ගෙපිළිවළින් හැසිරෙන සේක් ගෙයි දොරට පැමිණි සේක. පිරිවර ජනයෝ තෙරුන් වහන්සේගේ පාත්‍ර ය ගෙණ තෙරුන් වහන්සේ ගෙයි වැඩ සිටිනට සැලැස්වූ හ. තෙරුන් වහන්සේ හිදගෙණ ම උපාසිකාවෝ කොයිදැ යි විචාළ සේක. සවාමීන් වහන්ස! ගිලන් වූ වා ය, නුඹ වහන්සේ දක්නට කැමති ය යි කිවු ය. උන් වහන්සේ රස තෘෂ්ණාවෙහි බැඳුනු සේක් තමාගේ ව්‍රත සමාදන ය බිඳ වෙශ්‍යාඞ්ගනා ව ගොත් කැනට වන් සේක.

ඒ සත්‍රී තමා ආ කාරණා ව කියා උන්වහන්සේ පොළඹා රස තෘෂ්ණාවෙන් බැඳ සිවුරු හරවා තමාගේ වසඟභූයෙහි නඟා යානා වෙහි හිඳිනට සලස්වා මහත් වූ පිරිවරින් රජගහ නුවරට ම ගියා ය. ඒ ප්‍රවෘත්ති ය හැමතැන්හි ම ප්‍රකාශ වූයේ ය. භික්ෂූන් වහන්සේලා දම්සභා මණ්ඩපයෙහි වටින් රැස් ව උන්නාහු, ඇවැත්නි! **චුල්ල පිණ්ඩපාතික තිස්ස** සථවිරයන් වහන්සේ වනාහි එක් වර්ණ දූයියක් රස තෘෂ්ණාවෙන් බැඳගෙණ ගියාහ යි කියා කථාවක් පහළ කළාහු ය.

සර්ව්ඥයන් වහන්සේ දම්සභා මණ්ඩපයට එළඹ එ පවත් අසා වදාරා මහණෙනි! මේ චුල්ලපිණ්ඩපාතික තිස්ස සථවිරයෝ රස තෘෂ්ණාවෙහි බැඳී විනාසයට ගියේ දැන් මතු නොවේ යි පෙර ත් මේ සත්‍රී ය විසින් රස තෘෂ්ණාවෙන් බැඳගත්තෝ ම වේ දැ යි කියා වෘත මෘග ජාතක ය වදාළ සේක. එක පාත්‍රයෙහි ලා මුත්‍ර ආහාර වළඳන පත්තපිණ්ඩිකයාට මේ බදු රස තෘෂ්ණාවක් උපදවන්නට කාරණා නැත. මේ ආදී වසයෙන් එහි අනුසස් සැලකිය යුතු. මේ පත්තපිණ්ඩිකඞ්ගයෙහි සමාදානාදි ය විශුද්ධිමාර්ගයෙහි ආක්‍රමයෙන් දක්වා අන්තයෙහි තදනුරූප කථාවකු දු එහි සඞ්ග්‍රහ කොට උපාසක ජනාලඞ්කාරයෙහි උපාසකයන් විසින් රක්නට මේ පත්තපිණ්ඩිකඞ්ග ය දැක් වූ පරිදි ද මෙහි සඞ්ග්‍රහ කෙරෙම්.

හේ කෙසේ ද යත්?

පත්ත පිණ්ඩිකඞ්ගමපි දුතියක භාජනං පටික්ඛිපාමී'ති වා පත්ත පිණ්ඩිකඞ්ගං සමාදියාමී'ති වා පුරිම නයෙනෙ ව සමාදාතබ්බං. තෙන පන පත්ත පිණ්ඩිකෙන හොජනකාලෙ එකස්මිං යෙව භාජනෙ භුඤ්ජිතබ්බං. සමන්නතො භාජනා නික්ඛිපිත්වා තතිං තතිං හත්ථං ඔතාරෙත්වා න භුඤ්ජිතබ්බං. සචෙ පනස්ස පරිවාරිකා නා නා භාජ

නෙහි ඛ්‍යඤ්ජනානි උපනාමෙනති, එකභාජනෙ යෙව සංගණ්හි තබ්බං. ඔදනෙහි පන අසම්මිස්සං කත්වා සිඤ්ඤවි අපෙක්ඛාහරිතු කාමෙන පුරිමං භාජනං පටිඝඤ්ඡිපිත්වා' ව භාජනන්තරෙන පතිගණ්හි තබ්බං.

එවං තං දුතියක භාජනං න හොති. අථ යාපන මභතස්ස අභුත්තත්තා පුන භුඤ්ජිතු කාමා හොති, තම්පි පටිඝඤ්ඡිපිත්වා පුරිම භාජනෙන අඤ්ඤෙන වා භුඤ්ජිතබ්බං. නානා භාජන ලොලුප්ප විද්ධංසනත්තා යෙව හි අසඝ ධුතඞ්ගස්ස සමාදානං. යාගු පාන කාලෙ'පි භාජනෙ ඨපෙත්වා ව්‍යඤ්ජනෙ ලද්ධෙ ව්‍යඤ්ජනං වා පඨමං ඛාදිතබ්බං, යාගු වා පාතබ්බා. සචෙ පන යාගුයං පක්ඛිත්තා පූති මච්ඡකාදීනි ව්‍යඤ්ජනෙ පන පක්ඛිත්තෙ යාගු පටිඝකූලා යියා, අපප විත්තකූලමෙව කත්වා භුඤ්ජිතුං වට්ටති. තසමා තථා රූපං ව්‍යඤ්ජනං සඤ්ඤාය ඉදං වුත්තං.

යා පන මිධු සක්කාරාදිකං අපපටිඝකූලා හොති තං පටික්ඛිපි තබ්බං. ගණ්හන්තෙන ච පමාණ යුත්තමෙ ව ගහෙතබ්බං. න එක භාජනෙ එව ගණ්හාමි'ති බහුං ගහෙත්වා න නාසෙතබ්බං. ආමඝ සාඛං හත්ථෙන ගහෙත්වා ඛාදිතුං වට්ටති. හත්ථෙ භාජන සඤ්ඤාය අභාවතො. තථා පන අකත්වා පත්තෙයෙ ව පටිඝඤ්ඡිපි තබ්බං දුතියක භාජනස්ස පන පටික්ඛිත්තත්තා අඤ්ඤං රුක්ඛ පත්තම්පි න වට්ට තී නි ඉදමස්ස විධානං. පනෙදතො පන අයම්පි නිච්ඡෙ හොති. තත්ථ උකකට්ඨස්ස අඤ්ඤතු උච්ඡු ඛාදන කාලෙ කවචරම්පි ඡඩ්ඩෙතුං න වට්ටති. ඔදන පිණ්ඩ මච්ඡ මංස පූපෙ පි භිඤ්ඤිත්වා ඛාදිතුං න වට්ටති. අඤ්ඤෙසු හි අප නිත කවචරං භිඤ්ඤිත්වා ඨපිතමෙව පන ඛාදිතබ්බං. මරක්ඛිමස්ස එකෙන හත්ථෙන භිඤ්ඤිත්වා ඛාදිතුං වට්ටති. හත්ථයොනි නාමෙස. මුදු කො පන යං පානියා දකඛිත්තා සබ්බං හත්ථෙන වා දන්තෙහි වා භිඤ්ඤිත්වා ඛාදිතුං ලභති. යතො නං පත්තයොනීති වදන්ති. ඉමෙසං පන තිණ්ණම්පි දුතියක භාජනං සාදිතකඛණෙ ධුතඞ්ගං භිජ්ජති. අයමෙත්ථ හෙදෙ. සි මේ මෙහි ආ ක්‍රම ය සි.

මේ යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ පත්තපිණ්ඩිකඞ්ගයෙ හි සමාදාන-විධාන-ප්‍රභෙද-භෙදානිසංස යන මොවුන් ගේ වර්ණනාව සි.

බලුපවජ්ජා භත්තිකඞ්ගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්?

"අතිරිත්තභොජනං පටික්ඛිපාමි බලුපවජ්ජාභත්තිකඞ්ගං සමා දියාමි" යනුවෙන් පැවරි ඇවැද්ද කළ පළමුකොට වැලඳි ය යුතු භෝ ජන ය ප්‍රතික්ෂෙප කෙරෙමි සි බලුපවජ්ජා භත්තිකඞ්ග ය සමාදන් වෙමි සි යන මෙයින් එක්තරා වචනයකින් සමාදන්වෙන ලද්දේ වේ. මේ මෙහි සමාදාන ය සි. මෙහි පිළිවෙත විධි කෙසේ ද යත්?

ඒ ඛලුපච්ඡා භත්තික යා විසින් පැවරි ආහාර ය කෑප කරවා නැවත නො වැළඳි ය යුතු මේ. මේ මෙහි පිළිපදිනා විධි ය සි. ප්‍රභේද කෙසේ ද යත්?

ප්‍රභේද හෙයින් වනාහි මේ ඛලුපච්ඡා භත්තිකඞග ය ද තුන් වැදෑරුම් වෙයි. එහි උත්කෘෂ්ට ඛලුපච්ඡා භත්තික තෙමේ යම් හෙයකින් පළමු වන පිඬුයෙහි පැවරීම නම් නැද්ද ඒ ප්‍රථම පිණ්ඩ ය වළඳනු ලැබෙමින් සිටි කල්හි අන් බොජුන් ප්‍රතික්ෂේප කරන්නාහට පැවරි වේ. එ හෙයින් මෙසේ පැවරි අවන්තේ පළමු පිණ්ඩ ය වළඳ, දෙවෙනි පිණ්ඩ ය නොවළඳන්නේ ය. මධ්‍යම ඛලුපච්ඡා භත්තික තෙමේ යම් හෝජනයක් පැවරි ඇවැත් ද එම වළඳ, මෘදුක ඛලුපච්ඡා භත්තික තෙමේ යම් තාක් ආසනයෙන් නොනැගේ ද ඒ තාක් වළඳන්නේ ය. මේ මෙහි ප්‍රභේද සි. මෙහි හෙද කෙසේ ද යත්?

මේ තුන්දෙනහට ම කෑපකරවා වැළඳු කෙණෙහි ධුතාඞග හෙද ය වන්නේ ය. මේ මෙහි හෙද සි. මෙහි අනුසස් කිම යත්? කෑප නොකළ වැළඳීමෙන් වන ඇවතින් දුරුවීම ය එක පිඬකිනි දු යෑපෙන බැවින් කුස පුරණ බැවි නැති බව ය, කෑපකරවා වළඳම් සි තබන ආහාරයක් නැති බව ය, නැවත ආහාර සෙවීමෙක් නැති බව ය, අල්පෙච්ඡතාදීන්ට අනුලොම් ව පැවතුම් ඇති බව ය, යන මොහු අනුසස් නම් වෙත්. අපි ව-ධීර ගුණයෙන් යුක්ත වූ ඛලුපච්ඡා භත්තික යොහි තෙමේ පැවරි ව නො බුදින බැවින් නැවත බත් සෙවීමෙන් වන ශ්‍රමයට නො පැමිණෙන්නේ ය. සභව තබා පරිභෝග කරණ ආමිස සන්නිධි ය නොකරන්නේ ය. කුස පුරණ සුලු බව දුරුකරන්නේ ය. එ හෙයින් බුදුන් විසින් පසස්නා ලද සන්තොෂ ගුණාදීන්ගේ වෘද්ධි ය කරන්නා වූ මේ ධුතාඞග ය අල්පයන් නසනු කැමැති යෝගීතෙමේ භජන ය කරන්නේ ය.

එසින් කිහ.

පරියෙසනාය ඛෙදං - න යාති න කරොති සන්නිධිං ධීරො,
ඔදරිකතනං පජහති - ඛලුපච්ඡාභත්තිකො යොහි.
තස්මා සුගතපසත්ථං - සන්තොස ගුණාදි වුද්ධි සංජනනං
දෙසෙ විධුනිතු කාමො - භජෙය්‍ය යොහි ධුතඞගමිදං-සි.

මෙසේ දක්වන ලද්දේ ඛලුපච්ඡා භත්තිකඞගයෙහි සමාදාන-විධාන-ප්‍රභේද-භෙදානිසංස ය යන මොවුන්ගේ වර්ණනා ව සි. **ආරණ්‍ය කාඞගයෙහි** සමාදානාදිය කෙසේ ද යත්?

"ගාමන්ත සෙනාසනං පටික්ඛිපාමි ආරඤ්ඤකඞගං සමාදියාමි" යනුවෙන් ග්‍රාමාන්ත සේනාසන ය ප්‍රතික්ෂේප කෙළෙමි,

ආරණ්‍යකාඞ්ග ය සමාදන් වෙමි යි යන මෙයින් එක්තරා වත යකින් සමාදන්වන ලද්දේ වේ. මේ මෙහි සමාදාන ය යි. මෙහි පිළිපදිනා විධි කෙසේ ද යත්? පිටකත්‍රයෙන් සඞ්ගෘහීත විසුද්ධි මාර්ගයෙහි විනයාදීන් බුද්ධඝෝෂ මහතෙරුන් වහන්සේ සඞ්ග්‍රහ කොට වදාළ ක්‍රමයෙන් දක්වනු ලැබේ. කෙසේ ද යත්? ඒ ආරණ්‍ය කයා විසින් ග්‍රාමාන්ත සෙනසුන් හැර අරණ්‍යයෙහි ම අරඤ්ඤ නැගි ය යුතු. එහි ගාමන්ත සෙනාසන ය නම්, උපචාරයා සමග ග්‍රාම ය ග්‍රාමාන්ත සෙනාසන ය නම් වේ.

එ හෙයින් ම කිහ.

"සඳ්ධිං උපචාරෙන ගාමොයෙව ගාමන්ත සෙනාසනං"යි. එහි ග්‍රාම ය නම් කිම යත්? යම් කිසි එක කුටියක් ඇති වූ ද අනෙක කුටික වූ ද වැට පවිරු ආදීන් පරික්ඛෙප සහිත වූ ද එසේ පරික්ඛෙප නැති වූ ද මිනිසුන් ඇති වූ ද නැවත මේ ගමට එමිහ යි යන සිනින් ගිය මිනිසුන් ඇති ගම් ද යටත් පිරිසෙයින් අනිරෙක සාරම්සක් වසන ලද යම් කිසි ජඞ්ඝසාඛී ය සකට සාඛීය යන යම් කිසි සාඛීයකු දු ග්‍රාම නම් වේ.

එසින් කිහ.

"ගාමෝ නාම-යෝ කොචි එකකුටිකෝ වා අනෙකකුටිකෝ වා සපරිකඛිත්තෝ වා අපරිකඛිත්තෝ වා සමන්තසෝ වා අමන්තසෝ වා අන්තමසෝ අනිරෙක චාතුමාස නිවිට්ඨෝ යෝ කොචි සත්තෝ පි" යි. ගාමූපචාර ය නම් කවරේ ද යත්? පවුරු ආදියෙන් පරික්ඛෙප ඇති ග්‍රාමයාගේ ඉදින් අනුරාධ පුරයාගේ මෙන් ඉඤ්ඛීල සංඛ්‍යා ත එලිපත් හු දෙන්නෙක් වී නම්, ඇතුළු එලිපත්හි සිටියා වූ මධ්‍යම බල ඇති පුරුෂයක්හුගේ ලෙඩ්ඩුපාතයක ලක්ඛණ ය නම්, හේ ලදරු මිනිස්සු තමන්ගේ බල දක්වා අත දික්කොට කැටක් ගසද්ද එසේ ගසන ලද කැට හුණු තැනින් ඇතුළත ය යි විනය ධරයෝ කියත්. **එ හෙයින් ම කියන ලදි.**

ගාමූපචාරෝ නාම - පරිකඛිත්තස්ස ගාමස්ස සචෙ අනුරාධ පුරසෙසව දෙව ඉඤ්ඛීලා හොන්ති, අබ්භන්තරිමෙ ඉඤ්ඛීලෙ ඨිතස්ස ථාම මජ්ඣිමස්ස පුරිසස්ස ලෙඩ්ඩුපාතො, තස්ස ලකඛණං, යථා තරුණ මනුස්සා අත්තනො බලං දස්සෙන්තා බාහුං පසාරෙත්වා ලෙඩ්ඩුං ඛිපන්ති, එවං ඛිත්තස්ස ලෙඩ්ඩුස්ස පතනට්ඨානබ්භන්ත රන්ති විනයධරා-සි.

සෞත්‍රාන්තිකයෝ වනාහි කවුඩුවන් වාරණ නියමේන් ගැසූ ගල වැටෙන තැනින් ඇතුළත ය යි කියත්. **එම දක්වන ලදි.** "සුත්තන්තිකා පන කාක වාරණ නියාමෙ න ඛිත්තස්සානි වදන්ති"

ප්‍රාකාරාදීන් පරික්ෂේප නැති ගමෙහි හැම ගෘහවලින් කෙළවර වූ ගෘහද්වාරයෙහි සිටි මාගම භාජනයෙන් යම් දියක් දමා ද ඒ වැටෙන තැන ඝරූපචාර නම් වේ. එසින් කියන ලද ක්‍රමයෙන් එක් ලෙඩ්ඩුපාතයෙක් ග්‍රාම ය නම් වේ. දෙවන ලෙඩ්ඩු පාත ය ග්‍රාමූපචාර නම් වේ. අරණ්‍ය ය වනාහි පළමුකොට ග්‍රාම ය ද ග්‍රාමූපචාර ය ද තබා සෙසු සියල්ල අරණ්‍ය ය යි විනයෙහි ද කියන ලදි.

හෙ ද දක්වන ලද මැ සි. අපරික්ඛිත්ත ගාමෙ යං සබ්බ පවවනනිමසය ඝරද්වාරෙ සිතො මාතුගාමො භාජනෙන උදකා ඡඩ්ඩෙති, තසස පතනට්ඨානං ඝරූපචාරො. තතො වුත්ත නයෙන එකො ලෙඩ්ඩුපාතො ගාමො. දුතියො ගාමූපචාරො. අරඤ්ඤං පන විනය පරියායෙන තාව ඨපෙත්වා ගාමඤ්ච ගාමූපචාරඤ්ච සබ්බ මෙතං අරඤ්ඤනති වුත්තං-සි

අභිධම් පරියායෙහි බහි ඉන්ද්‍රඛිලයෙන් නික් ම මේ සියල්ල පශ්චිම අරණ්‍ය ය සි කියන ලදි.

එසින් කිම.

අභිධම්ම පරියායෙන නික්ඛමිත්වා බහි ඉන්ද්‍රඛිලා සබ්බමෙතං අරඤ්ඤනති වුත්තං-සි. මේ සෞත්‍රාන්තික දෙශනාවෙහි වනාහි අරණ්‍ය ය පශ්චිමාරණ්‍ය ය. සේනාසන ය නම් පන්සියයක් පමණ දුනු ඇති තැන ය සි මේ ලකුණි. ඒ ලක්ෂණ ය ද නව විසත් ඇති ඇදුරු දුන්නෙන් ගතයුතු වෙ සි. පරික්ෂේප ඇති ගම ඉන්ද්‍රඛිල ය පටන් ගත යුතු වෙ සි. පරික්ෂේප නැති ගම ප්‍රථම ලෙඩ්ඩුපාතයේ පටන් මෙතන ග්‍රාම ය ග්‍රාමූපචාර නම් වෙ සි. යම් තාක් විහාර පරික්ෂේප ය ද ඒ තාක් දක්වා මැන නිශ්චය කට යුතු. ඉදින් වනාහි වෙහෙර පරික්ෂේප නැත්තේ වී නම් සියලු වෙහෙරට පළමුවෙන් නිබෙන යම් සෙනස්නක් හෝ බත් සලෙක් හෝ ධුව සන්නිපාත සථාන සංඛ්‍යාත නිති රැස්වෙන තැනක් හෝ බෝධියක් හෝ චෛත්‍යයක් හෝ සෙනස්නට දුරු ද වී නම් ඒ සථාන ය නිමි කොට මැණිය යුතු ය. සි විනය අට්ඨාවෙහි කියන ලදි.

මැදුම්සහි අට්ඨාවෙහි වනාහි විහාරයාගේ ද ග්‍රාමයාගේ මෙන් උපචාර ය එලවා උභ ය ලෙඩ්ඩුපාතයන්ගේ අතුර මිණිය යුතු ය සි කියන ලදි. මේ ද සෞත්‍රාන්තික වණ්නා නු සි මේ මෙහි පමණ සි. ඉදින් ආසන්නයෙහි ගමෙක් වී නම්, වෙහෙර සිටියවුන් විසින් ශබ්ද ය අසනු ලැබේ නම්, පැහැන නදී ආදීන් වනාහි

අපහරිත හෙයින් සෘජු ව යන්නට නොපිළිවන් ද ඒ වෙහෙරට යම් ප්‍රකෘති මාර්ගයෙක් වේ ද ඉදින් ඒ මග නැවින් යායුතු වී නම්, ඒ මාර්ගයෙන් පන්සියයක් දුනු පමණ ගත යුතු.

යමෙක් වනාහි ආසන්න ග්‍රාමයාගේ දුනු පන්සියයක් මැන අඩිය සපයන පිණිස කුඩා මංවසා ද මේ දුහන සොරා නම් වේ. ඉදින් වනාහි ආරණ්‍යක භික්ෂූහුගේ උපාධ්‍යාය තෙරහු හෝ ආචාර්‍ය්‍ය තෙරහු හෝ ගිලන් වූ නම් ආරණ්‍යක භික්ෂූහු විසින් අරණ්‍යයෙහි සැප නොලැබෙන විසින් ග්‍රාමාන්ත සේනාසනයට ගෙණ ගොස් උපස්ථාන කට යුතු ය. එසේ කර තු දු කලින් ම නික්ම අඩියට සුදුසු සථානයෙහි අරුණු නැගිය යුතු වෙත්. ඉදින් අරුණු නැගෙණ වේලෙහි ඔවුන්ගේ ආබාධ ය වඩී නම් ඔවුන්ගේ ම කෘත්‍ය ය කට යුතු ය. හෙ ද ධුතාඞ්ග ය පිරිසිදු කරන්නහු විසින් නොවිය යුතු වෙයි. මේ මෙහි පිළිපදිනා විධි ය යි.

මෙහි ප්‍රභෙද කෙසේ ද යත්? මේ ආරණ්‍යකාඞ්ග ය ද වනාහි තුන් වැදෑරුම් වෙයි. එහි උත්කෘෂ්ට ආරණ්‍යක යා විසින් හැමකල්හි ම අරණ්‍යයෙහි අරුණු නැගිය යුතු වෙයි. මධ්‍යම නෙමේ වස් සාර මස ග්‍රාමාන්තයෙහි වසන්නට ලැබෙන්නේ ය. මෘදුක තෙම සතර වැනි මාස ය හා හෙමන්ත සාර මස ද ගම්හි වසන්නට ලැබෙන්නේ ය. මේ මෙහි ප්‍රභෙද යි. මේ තුන් ඍතු වෙහි ප්‍රභෙද කෙසේ ද යත්? හිල්මස කාලපක්ෂයෙහි පටන් සාර මසෙක් හෙමන්ත ඍතු ව ය, ගිම්හාන ඍතු ව ය, වස්සාන ඍතු ව ය යන තුන් ඍතු ව පිළිවෙළින් දත යුතු.

එ හෙයින් කිහ. අභිධාන ප්‍රදීපිකායෙහි

චතුරෝ චතුරෝ මාසා කතනික කාල පක්ඛතෝ,
කමා හෙමන්ත ගිම්හාන වස්සානා උතුයෝ දසු.

මේ ධුතාඞ්ගයෙහි භෙද කෙසේ ද යත්? මේ තුන්දෙනහට නමින්ට පිළිපැදුන් කල්හි හෙවත් උත්කෘෂ්ටයහට තුන් ඍතුවෙහි අරණ්‍යයෙහි ම අරුණු නැගි ය යුතු ය. මධ්‍යමයාහට හේමන්ත ගිම්හාන යන ඍතු දෙයෙහි ම අරණ්‍යයෙහි අරුණු නැගි ය යුතු ය. මෘදුකයාහට හිමිහාන ඍතුවෙහි අරණ්‍යයෙහි අරුණු නැගි ය යුතු ය. මෙසේ කියන ලද කල්හි අරණ්‍යයෙන් අවුත් ග්‍රාමාන්ත සේනාසනයෙහි බණ අසන්නාහට දැන අරුණු නැගුව ද සෝත් සාඝ බැවින් දුනහ නොබිඳේ. බණ අසා වලට යන්නවුන්ට අඳුරුමග අරුණු නැගුව ද දුනහ නොබිඳේ. ඉදින් වනාහි ධර්මකථික යා අස්නෙන් නැගි කල්හි දු මොහොතක් හෙව සෑතපී

යම්හ යි නිදන්නාහට අරණ්‍ය නැගුණ හෝත් සැනපී යම්හ යි සිත ලිහිල් කළ බැවින් දුහහ බිඳෙ යි. තමාට ගාමාන්තයෙහිදී අරණ්‍ය නගම් යන කැමැත්තෙන් ග්‍රාමාන්ත සෙනාසනයෙහි අරණ්‍ය නැගු ව හොත් දුහහ බිඳේ. මේ මෙහි භෙද යි.

මෙහි අනුසස් කවර යත්? ආරණ්‍යක භික්ෂුතෙමේ මම අරණ්‍යයෙහි විවේක ව වෙසෙමි කියා හෝ ලද කාය විවේක ය සාර්ථක කට යුතු ය යි කියා හෝ මෙසේ අරණ්‍ය සංඥ මෙනෙහි කරණුයේ නො ලද සමාධි ය ලබන්නට ද ලද සමාධි ය රක්‍ෂා කරණුවට ද පොහොසත් වන්නේ ය. මම නාගින නම් භික්‍ෂූහට ඒ අරණ්‍යයෙහි වාසයෙන් සතුටු වෙමි යි කියා බුදුන් විසිනු දු ඕ හට සතුටුවනු ලැබෙ යි. ප්‍රාන්ත සේනාසනයෙහි වසන්නා වූ. ඕ හට නො සරුප් අරමුණු ආදී වූ චිත්ත වික්‍ෂෙප නො කෙරෙති. විවේක ය පරිව ය ඇති බැවින් පහ වූ ත්‍රාස ඇති වෙයි. බොහෝ පරිපන්ථ ඇති අරණ්‍යයෙහි විසීමෙන් මරණ භය දුරුවීමෙන් ජීවිතයෙහි ආල ය දුරු කෙරෙ යි. ජන සංසර්ගී නැති බැවින් විවේක සුව රස අනුභව කෙරෙ යි. ඕ හට පංසුකූලාදී භාව ය ද සුදුසු වෙ යි. යන මොහු අනුසස් නම් වෙන්.

අපි ච

පවිවිත්තෙනා අසං සථෙඨා පන්ත සෙනාසනෙ රතො,
ආරාධයන්තෙනා නාථස්ස වනවාසෙන මානසං.

එකො අරඤ්ඤනිවසං යං සුඛං ලභතෙ යති,
රසං තස්ස න විඳන්ති අපි දෙවා ස ඉන්දකා.

පංසුකූලඤ්ච එසො ච කවචං විය ධාරයං,
අරඤ්ඤ සඞ්ගාම ගතො අවසෙස ධ්‍රතායුධො

සමත්ථො න විරසෙ ව ජෙතුං මාරං සවාහිනිං,
තස්මා අරඤ්ඤවාසම්හි රතිං කයිරාථ පණ්ඩිතො-යි.

දක්වන ලද බැවින් කාය විවේක ඇත්තේ කිසිවක්හු හා සංසර්ගියක් නැත්තේ අරණ්‍යයෙහි විසීමෙන් ලොකනාථ වූ සම්බුදු යන් වහන්සේගේ සිත මනා පිළිවෙතින් සතුටුකරන්නේ අරණ්‍ය යෙහි වසන්නේ යම් සැප ක් ලබන්නේ වී නම් සක්දෙවිරජ සහිත වූ දෙවියෝ පවා ඒ සැප ය නො ලබත්.

තව ද – මේ පසුල් සිවුරු කවවයක් මෙන් දරන්නේ ය. අවශේෂ වූ පිණ්ඩපාතිකඞ්ගාදී ධුතාඞ්ග නැමති ආයුධ ඇත්තේ අරණ්‍යයෙහි කෙලෙස් නැමති සංග්‍රාමයට ගියේ වාහිනී සහිත වූ

මරහු දිනන්නට නොබෝ කලසින් ම සමර්ථ වෙයි. එ හෙයින් අරණ්‍ය වාසයෙහි නුවණැති පණ්ඩිත තෙමේ ඇලුම් කරන්නේ ය. මේ සේ යථොක්ත ක්‍රමයෙන් දක්වන ලද්දේ ආරණ්‍යකාඞ්ගයෙහි සමාදාන ය – විධාන ය – ප්‍රභෙද ය – භෙද ය – ආනිසංස ය යන මොවුන්ගේ වර්ණනා ව යි.

තව ද- අරණ්‍ය වනපස්ථ පන්ත සෙනාසන පිළි සොයන්නට අයෝග්‍ය භික්ෂූහු ද ඇති. යෝග්‍ය භික්ෂූහු ද ඇති. අයෝග්‍ය භික්ෂූහු කවරු ද යත්? යම් භික්ෂු කෙණෙක් ගෘහස්ථයන් විසින් මිස භික්ෂූන් විසින් සිතිනෙනු ද කල්පනා නො කට යුතු වූ කාම විතර්කයෙන් යුක්ත වූවාහු ද ව්‍යාපාද විතර්කයෙන් යුක්ත වූවාහු ද විහිංසා විතර්කයෙන් යුක්ත වූවාහු ද දුස්ප්‍රාඥ ජඩ එල මූග වූවාහු ද යන මේ සතර ධර්මයෙන් යුක්ත වූ භික්ෂුතෙමේ අරණ්‍යයෙහි වසන්නට පමණ නො වෙයි. අයෝග්‍ය වේ.

එසින් වදාළහ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු නාලං අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. කත මෙහි චතූහි? කාම විතක්කෙන ව්‍යාපාද විතක්කෙන විහිංසා විතක්කෙන දුප්පඤ්ඤෙහි හොති ජළො එලමූගො. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු නාලං අරඤ්ඤ වනපත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං–යි.

අරණ්‍යයෙහි වියය යුතු ආරණ්‍ය සෙනාසන ය පිළි සොයන්නට සුදුසු පමණ යෝග්‍ය භික්ෂූහු කවරු ද යත්? යම් භික්ෂු කෙණෙක් කාම විතර්ක ය දුරුකොට නෛෂ්ක්‍රම්‍ය විතර්කයෙන් යුක්ත ව වෙසේ ද, එ සේ ම අව්‍යාපාද විතර්කයෙන් යුක්ත ව වෙසේ ද, අවිහිංසා විතර්කයෙන් යුක්ත ව වෙසේ ද, අජඩ ව අනේල මූන ව නුවණින් යුක්ත ව වේසේ ද, මේ සතර ධර්මයෙන් යුක්ත වූ භික්ෂු තෙමේ ආරණ්‍ය සෙනාසනයෙහි වසන්නට ආරණ්‍ය සෙනාසන ය පිළි සොයන්නට පමණී. යෝග්‍ය වේ.

එසින් වදාළහ.

චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අරඤ්ඤ වන පත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං. කත මෙහි චතූහි? නෙක්ඛම්ම විතක්කෙන අව්‍යාපාද විතක්කෙන අවිහිංසා විතක්කෙන අජලො අනෙලමූගො. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අලං අරඤ්ඤෙසු වන පත්ථානි පන්තානි සෙනාසනානි පටිසෙවිතුං–යි–

තව ද-අරණ්‍යවාසී භික්ෂූහු පිරිසිදු සීලාදියෙහි නො පිහිටා වෙසෙත් නම් අරණ්‍යයෙහි අධිගෘහීත දෙවතාවෝ මේ බදු පාප භික්ෂූහුගේ අරණ්‍යයෙහි විසීමෙන් ප්‍රයෝජන කවරේ දැ යි භයානක ශබ්ද පවත්වා අස්වති. අතින් හිස පැහැර පලායනාකාර කෙරෙති. අසවල් මහණ අරණ්‍යයට ප්‍රවිෂ්ට ව මේ නම් මේ නම් පාප කර්මයක් කෙලේ ය යි අයස පතල වන්නේ ය.

එසින් කිහ.

අරඤ්ඤස්මිං අධිවත්ථා දෙවතා කිං එවරූපස්ස පාප භික්ඛු නො අරඤ්ඤා වාසෙනා'ති භෙරව සද්දං සාවෙන්ති. හත්ථෙහි සීසං පහරිත්වා පලායනාකාරං කරොන්ති. අසුකො භික්ඛු අරඤ්ඤං පවිසිත්වා ඉදඤ්චිදඤ්ච පාපකම්මං අකාසීති අයසො පත්ථරති-සි.

යම්කිහට අරණ්‍යයෙහි විසී ම කැමති වේ නම් තමාගේ ප්‍රත්‍යවෙක්ෂා කරන්නේ තල ඇටක් පමණකු දු කිසි කැලලක් නො දක්නේ ප්‍රීති උපදවා පාපයන් ක්ෂය කරන්නේ ම සිහියෙන් සමාහිත ය කරන්නේ ආර්‍ය්‍ය භූමියට අවක්‍රාන්ත වේ ද, අරණ්‍යයෙහි අධිගෘහීත දේවතාවෝ ඕ හට සතුටු වූවාහු ගුණ කියන්නෙහි හෙළී තෙල් බිඳුවක් සේ ගුණ කිර්ති ආදියෙන් ඔහු [illegible] ප්‍රසිද්ධ ව විසතාර බවට පැමිණේ.

එසින් කිහ.

යස්ස අරඤ්ඤවාසො ඉච්ඡිනි සො අත්තනො සීලං පච්චවෙක්ඛනෙනා කිඤ්චිකාලකං තිලක්ඛං වා අපස්සනෙනා පීතිං උප්පාදෙත්වා තං ඛයතො වයතො සම්මසනෙනා අරිය භූමිං ඔක්කමති. අරඤ්ඤස්මිං අධිවත්ථා දෙවතා අත්තමනා වණ්ණං භණන්ති. ඉතිස්ස උදකෙ පක්ඛිත්ත තෙලබින්දු විය යසො විත්ථාරිතො හොති-සි.

රුක්ඛ මූලිකඞ්ගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්?

"ඡන්නං පටික්ඛිපාමි රුක්ඛමූලිකඞ්ගං සමාදියාමි" යනුවෙන් ඉෂ්ටකා ඡදන සංඛ්‍යාත. උළු ආදීන් සෙයන ලද සෙවෙනි ය සෙසු ගෘහයක් හෝ හෙවත් ආවාස ය ප්‍රතික්ෂෙප කෙළෙමි. වෘක්ෂ මූලිකඞ්ග ය සමාදන් වෙමි යි යන මොවුන් අකුරෙන් එක්තරා වචනයකින් සමාදන් වන ලද්දේ වේ-**මේ මෙහි සමාදාන ය යි.**

මෙහි පිලිපිදිනා විධි කෙසේ ද යත්?

ඒ වෘක්ෂමූලිකා යා විසින් රාජ්‍ය සීමාවෙහි සිටි රුක ය, මේ රුකෙහි දෙවියන් වෙසෙති යි මිනිසුන් විසින් පිදිය යුතු චෛත්‍ය රුක ය, ලහටු බස්නා නියාය රුක ය, බොහෝ සතුන් එළඹෙන

හෙයින් ඵලගත්තා රුක ය, වවුලන් වසන රුක ය, සිදුරු තිබෙන සුසිර රුක ය, විහාර ය මැද පිහිටි රුක ය, යන මෙකී රුක් දුරු කොට විහාර කෙළවර සිටි රුකෙක් ගත යුතු ය යි. ඉම් මෙහි විලි පදිනා ඒකි ය යි.

මේහි ප්‍රභෙද කෙසේ ද යත්? ප්‍රභෙද හෙයින් වනාහි තුන් වැදෑරුම් වේ. එහි උත්කෘෂ්ට තෙමේ රිසියෙන යම් කිසි රුකක් ගෙණ පිලිදගවන්නට නොලැබෙන්නේ ය. පසින් පමණ වගුල පරඩල් පහකොට විසි ය යුතු වේ. මැදුම් තෙමේ එතනට පැමිණියවුන් ලවා ම විලිදක්වන්ට ලැබෙන්නේ ය. මෘදුක තෙමේ නො හොත් මෘදුක යා විසින් ආරාමික සාමණේරයන් ගෙන්වා ගෙණ පිරිසිදු කරවා සමකොට වැලි අතුට ප්‍රාකාර පරික්ෂේප කොට දෙර යොදවා විසි ය යුතු ය. මහ දිවස ය සි කියන ලද පුද දිනයෙහි වනාහි වෘක්ෂමූලික යා විසින් ඒ රුක්මූල නො හිඳ අනික් සුදුසු මුවහ තෙනකට ගොස් තමන් වෘක්ෂමූලික බව කිසි වක් හට නො හඟවන පිණිස හිඳිය යුතු වේ. මේ මෙහි ප්‍රභෙද යි.

මේනි භෙද කෙසේ ද යත්? "ඉමෙසං පන නිණ්ණණම්පි ඡන්නෝ වාසං කප්පිනකඛණෙ ධුතඞගං භිජ්ජති"-යි. දක්වන ලද බැවින් වසනු කැමති ව වැද ඡන්න සංඛ්‍යාත ආවාසයක වාස ය කළ කෙණෙහි දුහඟ බිඳේ. දැන දැන ඡන්නයෙහි අරුණු නැගූ ව දුහඟ බිඳෙන බව අඞ්ගුත්තර භාණකයෝ කියති යනු භගවන්නට "ජානිඩා ඡනෙන අරුණං උට්ඨාපිතමෙතෙන නි අඞ්ගුත්තරභාණකා"යි යනු කිහු. පළමු කී ඇජර මතයෙහි නිකරුණෙහි වැද පිහුව හට විසීමෙන් ම දුහඟ බිඳෙන සේ කිහ.. දෙවන මතයෙහි බණ අසනු ආදී කමින් වැද වසන්නහුට දැන දැන අරුණු නැගූ සඳ දුහඟ බිඳෙන සේ කිහු. ඉනි බැවින් දෙ මත ය ම කැමති වනු ලැබෙ යි යනු විශුද්ධිමාගී ව්‍යාඛ්‍යානයෙහි කිහු. මේ මෙහි භෙද යි.

මෙහි අනුසස් කිම යත්? රුක්මුල් සෙනසුන් නිසා පැවිදි ය යි වදළ බැවින් නිශ්‍රයට අනුරූප ප්‍රතිපත්ති ඇතිබව ය, අල්ප යහ. සුලභයහ. ඔවුනු දු නිරවද්‍ය සි භගවත්හු විසින් වණ්ණිතා කර විදරණ ප්‍රත්‍යයක් බව ය, එක්වන් ම තර පණ විකාර දැක් මෙන් ද අනිත්‍ය සංඥාවන් උපදවන බව ය, ආවාස මාත්සර්‍ය්‍ය නව කර්මාන්තයෙහි ඇලුනු බව ය, යන මොවුන්ගේ නොවීම ය, රුක් නිසා සිටි විමන් හි වසන බැවින් රුක් දෙවියන් හා වසන බව ය, අල්පෙච්ඡතාදීන්ගේ ඵල නිෂ්පත්ති ය හෝ අල්පෙච්ඡතාදීන්ට අනුලොම් පැවතුම් ඇති බව ය, යන මොහු අනුසස් නම් වෙත්.

අපිච-සනරාමර ලොක ගුරු බුද්ධශ්‍රේෂ්ඨයාණන් වහන්සේ විසින් "අපසාණිවෙව සුලභානි" යනාදීන් පසස්නා ලද "රුක්ඛමූල සෙනාසනං නිස්සාය පබ්බජ්ජා"යි මේයේ නිශ්‍රය සි දු කියන ලද පව්විත්තකයට විවෙකයෙහි ඇලුනාහට වෘක්ෂමූල ය හා සම් වූ සෙනස් නෙක් නම් ඇද් ද නැත් මැ සි. ආවාස මාත්සර්‍ය්‍ය ය දුරුකරන්නා වූ දෙවතා විසින් පරි පාලිත වූ විවෙක වූ රුක්මූල වසන්නා වූ සුන් දර වූ වෘත්ත ඇතුනා වූ මහණ නොවී තරුණ කල ඉතා රත් වූ ද මද නිල් වූ ද මුහුකළ කල පබුවන්වූ ද බිම් වගුලා වූ ද වෘක්ෂ පණ යන් දක්නේ අනිත්‍යයෙහි නිත්‍ය වශයෙන් වරදවා සිතන නිත්‍ය සංඥ ව දුරු කරන්නේ ය.

මේ කාරණයෙන් බුදුන්හිමි වූ නොහොත් යම් නෙයකින් ත්‍රෛලොකාවාර්‍ය්‍ය වූ සම්බුදුනෙමේ දෙනිස් මහා පුරිනිමිත්තන ප්‍රාදුර්භූත කෙරෙමින් ප්‍රසූත වන කාලයෙහි ත් ලුම්බිනි නම් වනයෙහි සුපිපි සාලවෘක්ෂ මූලයෙහි ම ප්‍රසූත වූ සේක් ද, නැවත ක්‍රමයෙන් වැඩි මහ බිනික්මින් නික්ම ප්‍රධන් භූමියොගකොට සම්බුදුකාඥන පදප්‍රාප්ත වන කාලයෙහි ත් අශ්වත්ථ නම් බොධි වෘක්ෂයක් මූල ම වැඩහිද බුදු වූ සේක් ද, නැවත භූන්ලොව අමා වතිාව වස්වන්නා සේ දහම් වතිාව වස්වමින් සඩ්ඝයන්ගේ කොලෙස් ගිම් නිවා එකෙක දෙකක යනාදීන් හැර සුවිසි අසඞ්ඛ්‍යයක් සඩ්ඝයන් සුවිසි මණ්ඩලයෙක් හි දී නිවන්පුර පමුණුවා, ලක්ෂයක් හවුරුදු බුදු ව වැඩහිද කර වදුරණ සම්බුදු වරයන්ගේ සියලු බුද්ධකෘත්‍ය ය පන්සාලිස් හවුරුද්දෙ ඇතුළෙහි ම කොට නිමි වා කෙළවර මල්ල රජ දරුවන්ගේ උපවත්ත න නම් සාලවනයෙහි වෘක්ෂමූලයෙහිදී ම පිරිනිවන් පෑ වදුළ සේක් ද? මේ කාරණයෙන් වෘක්ෂමූලයා බුදුන්ගේ දයාද නම් වෙයි. බුදුන් හිමි වෙයි. එසින් භාවනාවෙහි ඇලුම් ඇත්තන්ට ආලය වූ විවික්ත වූ වෘක්ෂමූල ය නො ඉක්ම පවත්වමි සි සිතන්නේ ය.

මෙම දක්වන ලද මැ සි විශුද්ධිමාගියෙහි.

වණ්ණිතෝ බුද්ධසෙට්ඨෙන නිස්සයෝති ච භාසිතෝ,
නිවාසෝ පවිවිත්තාසු රුක්ඛමූලේසු සමෝ කුතෝ.

ආවාස මච්ඡර හරෙ දෙවතා පරිපාලිතෙ,
පවිවිත්තෙ වසන්තෝ හි රුක්ඛමූලම්හි සුබ්බතෝ.

අභිරත්තානි නීලානි පණ්ඩූනි පතිතානි ච,
පස්සන්තෝ තරුපණ්ණානි නිච්ච සඤ්ඤං පනූ දති.

තස්මාහි බුද්ධදයජ්ජං භාවනාභි රතාලයං,
විවිත්තං නාති මඤ්ඤේය්‍ය රුක්ඛමූලං විචක්ඛණෝ—සි.

මේසේ උක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ වෘක්ෂමූලිකාඞ්ග යෙහි සමාදාන ය-විධාන ය-ප්‍රභෙද ය-භෙද ය-ආනිසංස ය යන මොවුන්ගේ වර්ණනා ව සි.

වෘක්ෂමූල ය සොයන්නා වූ මිනොහැමයෝ දස ගුණයක් තකා සොයත්. හේ කවරේ ද යත්? එයින් කිය. **දුරෙනිදානයෙහි.**

තත්‍රිමේ දසගුණා-අප්පසමාරම්භතා එකො ගුණො උපගමන මත්තක මෙව හි තත්ථ හොතීති. අප්පජඤ්ඤතා දුතියො තා හි සම්මට්ඨපිටි අසම්මට්ඨමපි පරිභොග ථාසුකංභොති යෙව. අනුඤ්ඤාප නියභාවො තතියො ගරහං න පටිවිජානෙති. තත්ථ හි පාපංකරොතොා ලජ්ජතීති ගරහාය අපටිවිජ්ඣනා භාවො චතුත්ථො. අබ්භොකාසවාසො විය කායං න සන්ථම්භෙතීති. කායස්ස අසන්ථම්භන භාවො පඤ්චමො. පරිඤ්ඤා කරණ භාවො ඡට්ඨො. ගෙභාලය පටිකෙඛපො සත්තමො. බහු සාධාරණාය ගෙභෙ විය පටිජගිස්සාමිතං නිකඛිට්ඨානි නීහරණක භාවො අට්ඨමො. වසනත්ථස්ස සප්පීනික භාවො නවමො. රුක්ඛමූල සෙනාසනස්ස ගතගතට්ඨානෙ සුලභතාය අනපෙක්ඛභාවො දසමො-සි. දක්වන ලද්දේ අනුසස් නම් වෙත්.

බුදුන් විසිනු දු වදුලේ මැණෙහි.

"උපාගමිං රුක්ඛමූලං ගුණෙහදසහුපාගතං"සි.

අබ්භොකාසිකඞ්ගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්? "ඡන්නා ච රුක්ඛමූලං ච පටික්ඛිපාමි අබ්භොකාසිකඞ්ගං සමාදියාමි" යනුවෙන් ඡන්න ය ද වෘක්ෂ මූල ය ද ප්‍රතික්ෂෙප කෙරෙමි අබ්භොකාසිකඞ්ග ය සමාදන් වෙමි සි යන මෙසින් එක්තරා වචනයකින් සමාදන්වන ලද්දේ වේ. මේ මෙහි සමාදන් වන ක්‍රම ය සි.

මෙහි පිළිපදිනා විධි කෙසේ ද යත්? මේ අබ්භොකාසිකඞ්ග ය රක්නාහට ධම්ශ්‍රවණය කරණ පිණිස නෝ පොහොය කරණ පිණිස පොහොය ගෙට වදනට වටනේ ය. "ධම්මසවනාය" යනුවෙන් ම දෙසන්නනු විසිනු දු අසන්නවුන් සිත් රක්නා සඳහා ඔවුන් විසින් යාචිත ව ඡන්නයට වදු ත් වරි. බණකියා වනාහි අබවසට ම ඉය යුතු ය රුක්ඛමූලිකයා හට ද මෙම නය සි යනු විසුද්ධිමාගී ව්‍යාඛ්‍යානයෙහි කිනු.

ඉදින් උපොසථාගාරයට වන්නාහට වැසි වසී නම් වසිමින් සිටි කල්හි නො නික්ම වැසි වැලකි කල්හි නික්මිය යුතු ය බොදුන් හලට ද ගිනිහලට ද වැද වත් කරන්නට ද, සඵවිර භික්ෂු බනින් පිළි විසින්නට ද, අනුන්ට කියවා දෙන්නාහු විසිනු දු කියවා ගන්නාහු විසිනු දු ඡන්නයට වදනට ද, පිටත නොතැන්හි තබන ලද හැඳ පුටු ආදී පරිසකාරයන් ඇතුලෙහි තැන්

පත් කොට තබන පිණිස ප්‍රවිෂ්ට වන්නට ද වටනේ ය. ඉදින් මාගේ යෙහි යන්නහු විසින් මහළු වරුන්ගේ පරිසකාරයන් ගන්නා ලද්දේ වී නම් වැසි වස්නා කල්හි මාගි ය මැද මගින් පහනොව ඉදි ව වැද්ද යුතු ශාලාවක් වී නම් ඒ ශාලාවට වදනට වටනේ ය.

"මඝමේඝේ සාලා සිතං"සි කී වද "මඤ්ඤපිඨාදිකා අන්තෝ පවෙසෙතුං වට්ටති" කී බැවිනු දු "වෙගෙන ගන්තුං න වට්ටති, යන තන්හි අනුන්ගේ පිරිකර ගත හොත් වේගයෙන් යා යුතු ය යනු කී වත බැවිනු දු මගමැද නොසිට හලට ද අනුන් පිරිකර ගත්තහු විසින් වැද්ද යුතු බව කිවෙන් ය සි යනු **විශුද්ධිමාර්ග** ව්‍යාඛ්‍යානයෙහි කිහු. ඉදින් කිසි පරිසකාරයෙක් නොගන්නා ලද්දේ වී නම් සාලාවෙහි සිටිමි සි වේගයෙන් යන්නට නොවටනේ ය. ප්‍රකෘති සංඛ්‍යාත සවභාව ගමනින් ගොස් වන්නහු විසින් වනාහි වැසි වලක්නා තෙක් සිට යා යුතු වන්නේ ය. මේ මෙහි පිළිපදිනා විධි ය සි. රුකඹුලික යා හට ද මෙම නය සි.

මෙහි ප්‍රභෙද කෙසේ ද යත්? ප්‍රභෙද හෙයින් වනාහි මේ ද ත්‍රිවිධ වේ. එහි උත්කෘෂ්ටයහට රුකක් හෝ පර්වතයක් හෝ නිසා වසන්නට නොවටනේ ය. අබෙහාකාසයෙහි ම සිවුරු කුටියක් කොට විසිය යුතු වෙයි. මධ්‍යම ය හට රුක ය පර්වත ය යන මොවුන් නිසා හිර සඳ මුදුනෙහි සිදිනා සඳ වෘෂ්ටියෙහි පර්වතයෙහි ඡායා ව පැහි රෙන තැනට ද ගෙහි දිය හෙළමේන් ඇතුළට ද නොවැද වසන්නට වටනේ ය. මෘදුක ය හට ද දිය වදනා බැවින් අබ්වසස්ඛදු දිය කටාර නොසුන් ලෙන ද තුනුකොට සෙවූ කොල මඩුව ද පිටාපට ය ද ක්ෂෙත්‍ර පාලාදීන් විසින් හරණ ලද එතැන්හි ම සිටි කුටි ද වටනේ ය. **මේ මෙහි ප්‍රභෙද ය සි.**

මෙහි භෙද කෙසේ ද යත්? මේ තුන් දෙන හට ම වාස ය පිණිස ඉෂ්ටකා ඡදනාදීන් සොයන ලද සෙවෙනි ඇති ඡන්නයට හෝ රුක්මුලට හෝ පැමිණි කෙණෙහි දුහඟ බිඳෙ සි. ධර්මශ්‍රවණාදි ය පිණිස ඡන්නයට හෝ රුක්මුලට හෝ වැද හුන්නහු දැන එහි අරණ්‍ය නැගූ මතුයෙහි දුහඟ බිඳන බව අඞ්ගුත්තර භාණකයෝ කියති යනු දක්වන්නට "ඡානිඤ්ච තත්ථ අරණ්ණං උට්ඨාපිත මත්තෙ' ති අඞ්ගුත්තර භාණකා" සි යනු කිහු. මේ මෙහි භෙද සි.

මෙහි අනුසස් කිම යත්? කිසි රුක් මුලෙක්හි දු ඵාසු බව ඇති නම් එහි ආසඞ්ඝ ය සි කියන ලද ඇලුම් පුළුවු ආවාස පළිබොධ ය වන්නේ ය. එහි ආවාස පළිබොධයාගේ දුරු කිරීම් ඇති බව ය, පීතමිද්ධ දෙදෙනාගේ දුරුකිරීම් ය, යන අනිකෙත ය සි කියන ලද ගේ නැති මහණහු මෘගයන් මෙන් අසඞ්ගචාරි ව වෙසෙති සි

කියන ලද ප්‍රශංසා ව පිණිස නිරාල ය භාවයෙන් සුදුසු බව ය, ආවාස පරිග්‍රහයක් නැත්තෙන් ම එහි ඇල්මක් නැති බව ය, එක් දිගෙක වසන තැන් නැත යන චිතකියක් නැති බැවින් සතර දිගට සුදුසු බවය, අල්පෙච්ඡතාදීන් ට අනුලොම් පැවතුම් ඇති බව ය, යන මොහු අනුසස් නම් වෙත්.

අපිව-අනගාරික භාවයට සුදුසු වූ කිසිතැනක දුර්ලභ නොවන්නා වූ තාරකා තැම්බි බිබුලෙන් සැරහූ නිලාම්බර ය තැමැති මිණි විතාන ඇති සඳ තැමැති ප්‍රදීපයෙන් ආලොක කරණ අඛ්ඩොකාස යෙහි පරිග්‍රහ නැති බැවින් මෘගයන්ට බඳු වූ සිතින් වසන මහණ තෙමේ පින මිදිදෙක දුරුකොට භාවනායෙහි ඇලුනු බැවින් ආශ්‍ර ය කෙළේ යම් හෙයකින් විවෙක රසාස්වාද ය නොබෝ කලකින් ම ලැබේ ද එ හෙයින් ම සප්‍රාඥ තෙමේ අඛෙභාකාසයෙහි ම ඇලුම් වන්නේ ය.

එසින් කිහ.

"අනගාරිය භාවස්ස අනුරූපෙ අදුලුභෙ,
තාරාමණ්ඩි විතානම්හි වන්ද දීපපහාසිතෙ.

අඛෙභාකාසෙ වසං නිඝ්ඣ මිගභූතෙන. චෙතසා,
පීනමිද්ධං විනොදෙත්වා භාවනාරාමිතා සියා.

පවිවෙක රසස්සාදං නවිරසෙසව විඳති,
යසමා තසමාහි සප්පඤ්ඤ අඛෙභාකාසෙ රතොසියා-සි.

මේ යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ අඛෙභාකාසි කඞ්ගයෙහි සමාදාන ය-විධාන ය-ප්‍රභෙද ය-භෙද ය-ආනිසංස ය යන මොවුන්ගේ වර්ණනාව සි. යට කී වෘක්ෂමූලිකඞ්ග ය. මේ අඛෙභාකාසි කඞ්ග ය සොයන්නා වූ මහොත්තමයෙ අෂ්ට දොෂයකින් සමකිණි වූ පන්සල ප්‍රතික්ෂෙප කොට සොයත්. ඒ කවරේ ද යත්? **කියේ මෑභා දුරෙ නිදානයෙහි.**

පණ්ණසාලාය දොසෙ විචිනන්තො අට්ඨදොසෙ පසසි. පණ්ණසාලා පරිභොගසමිං හි අට්ඨ ආදීනවා. මිහා සමාරම්භෙන දබ්බ සම්භාරෙ සමොධානෙත්වා කරණ පරියෙසන භාවො එකො ආදීනවො. තිණ පණ්ණ මත්තිකාසු පතිතාසු තාසං පුනප්පුන ඵපෙතබ්බතාය නිබද්ධජගහන භාවො දුතියො. සෙනාසනං නාම මහල්ලකස්ස පාප්‍රණාති අවෙලාය දිට්ඨාපියමානස්ස විත්තෙනකහා නා න හොතී ති උට්ඨාපනිය භාවො තතියො. සීතුණ්හ පටිඝා තෙන කායස්ස සුඛුම්ලක කරණ භාවො චතුත්ථො. ගෙහං පවි ටෙත්ත යං කිඤ්චි පාපං සක්කා කාතුනති ගරහ පටිඝාදන

භාවෝ පඤ්ඤමෝ පරිහානා කාරණං ඡට්ඨෝ ගෙහස්ස අත්ථිභාවෝ නාමෙස දුනියක වාසෝති සත්තාමෝ. ඵෙකමංකුන සරගොලිසා දිනා සාධාරණභාය බහු සාධාරණ භාවෝ අට්ඨමෝ.-සි.

බුදුන් විසිනු දු වදාළ මැනෝ.

"අට්ඨදෙස සමාකිණණං පජහිං පණණ සාලකා"සි.

සොසානිකඛණයෙහි සමාදානාදි ය කෙසේ ද යත්?

"න සුසානං පවිකඛිපාමි සොසානිකඛහා සමාදියාමි"සි යනු සොහොන් ලකුණ නැති ව වසන තැන් ය සි කියන ලද නො සොහොන් පිළිකෙවු කෙරෙමි සොසානිකඛහ ය සමාදන් වෙමි සි යන මෙසින් එක්තරා වචනයකින් සමාදන් වන ලද්දේ වේ. මේ මෙහි සමාදාන ය සි.

මෙහි පිළිපදිනා විධි කෙසේ ද යත්? ඒ සොසානික යා විසින් වනාහි ගම පිහිටුවා කරවා මෙතන සොහොන ය සි යම් කැනක් නියම කෙරෙන් නම් ඒ සොහොන ය සි නියම කළ තැන්හි නො විසි ය යුතු ය. මෘතශරීර ය නො දවන ලද කල්හි එතන සොහොන නම් නො වෙ සි. දැවූ තැන් පටන් වනාහි ඉදින් දෙළොස් හවුරුද්දක් නො දවා හරණ ලද්දේ නමු දු සොහොන ම වේ එහි වසන්නහු විසින් සක්මන් මඩු ආදි ය කරවා හැඳ පුටු පණවා පැන් එළවා බණ කියන්නහු විසින් නො විසි ය යුතු ය. මේ ධුතාඞග ය වනාහි ගරුක ය. දුක සේ පරිහරණ ය කට යුතු ය. එ හෙයින් උපන් උවදුරු නසන සිණිස වෙහෙර නායක මහ තෙරුන්ට හෝ හොවර ග්‍රාමයෙහි රජුන් විසින් යුක්ත වූ පුරුෂයොහට හෝ සොහොනෙහි වසන බව හහවා නොපමාව විසි ය යුතු. සක්මන් කරන්නහු විසින් හමුනො වූ සංවේග උපයනු පිණිස සක්මන්හි එන යන කල ඇස් කෙලින් සොහොන දෙස බල බලා සක්මන් කටයුතු. සොහොනට යන්නහු විසිනු දු මිහ මිගින් පහ ව තමා සොසා නික බව නො හහවන පිණිස කුඩා මඟකින් යා යුතු.

තව ද—දහවල් ම මේ තුඹස ය, මේ රුක ය, යනාදීන් අරමුණු නියම කටයුතු වෙ සි. එසේ කල්හි දුටු තුඹස් රුක් ආදි ය මේ අසවල් දෙය සි නියම දනෙන බැවින් රාත්‍රියෙහි භය නොගන්නේ ය. අමනුෂ්‍යයෝ රාත්‍රියෙහි හඬා ඇවිදිනාහු දු කැටපහණ ආදී කිසිවෙකින් ලහ ඇවිදිනි සි නො ගැසි ය යුතු වෙ සි. එක දවසහු දු සොහොනට නො යන්නට හො වටි

මධ්‍යම යාම ය සොහොන්හි ගෙවා පශ්චිම යාමයෙහි නවත් නට වටිනි ය සි යන බව අඞ්ගුත්තර භාණකයෝ කියති සි යනු දක්වන්නට මජ්ඣිම යාමං සුසානෙ ඛෙපෙත්වා පච්ඡිම යාමෙ පටිකඞ්ඛිතුං වට්ටතීති අඞ්ගුත්තර භාණකා" සි කිහු. යක්ෂ යන්ට ප්‍රිය වූ නලසුනු තලමූලාවට තල හෝ පිටි ම හෝ මාස ය සි කියන ලද උදුයෙන් පිසි බත් හෝ මාංශ කිරි තල් සකුරු ආදි කැම් බීම් නො සෙවි ය යුතු. සොහොන් දැම් නිවා සිත බැඳුනු ද සොසොන් ගඳින් ම පිශාචයන් විසින් අනුබඳනා ලද බැවින් ද කුලගෙට නො වැදිය යුතු ය. **මේ මෙහි පිළි පදිනා විධි ය සි.**

මෙහි ප්‍රභෙද කෙසේ ද යත්? මේ සොසානිකඞ්ග ය ද ප්‍රභෙද යෙසින් තුන් වැදෑරුම් වේ. එහි උත්කෘෂ්ටයා විසින් යම් සොහොනක දවස දවස මිනි දැවීම් දවස දවස කුණප දැමීම් දවස දවස හැඬීම් ඇත්තාහු ද එහි ම විසි ය යුතු වෙ සි. මධ්‍යමයාහට ධුව ඛාදාදි තුන්දෙනා කෙරෙහි එකුක්හු ඇති කල්හිදු වටනේ ය. මෘදුකයාහට කිනසින් ම සොහොන් උකුණු පැමිණි කල්හි මතු යෙහි වටනේ ය. මේ මෙහි ප්‍රභෙද ය සි.

මෙහි භෙද ය කෙසේ ද යත්? මේ තුන්දෙනාහට ම නොසොහොන්හි වාස ය කිරීමෙන් දුහඟ බිඳේ. මේ මෙහි භෙද සි. අඞ්ගුත්තර භාණකයෝ දහවල දු වි නම් සොහොනට නො ගිය දවස දුහඟ බිඳෙනි සි කියන බව හඟවන්නට "සුසා නං අගත දිවසෙති අඞ්ගුත්තරභාණකා"සි කිහු—මේ එහි භෙද සි.

මෙහි අනුසස් කිම යත්? සොහොන්හි නිත්‍යයෙන් මල ශරීර දැන්මෙන් මරණ සිතියගේ ප්‍රතිලාභ ය වීම ය, නිරන්තර යෙන් මම ඉසේ ම නසිමි සි යන මරණ සති ය ඇති බැවින් භාවනාදියෙහි නො පමා බව ය, මෘත ශරීර දර්ශනයෙන් මාගේ ශරීරය ත් මේ බදු නො වේදැ සි අසුබ නිමිත් පිළි ලැබීම ය, පහත් ලහ දුරුවෙන අදුරක් සේ අසුබ නිමිත් ඇති බැවින් තුන්ලෝ මැඩසිටි කාමරාගයාගේ දුරුවීම ය, බොහෝ සේ සිරුර පිළිකුල් දුගඳ බව සැලකීමෙන් එක්වන් කාය සවභාව දැක්මෙන් ද මරණ සති ය පිළි ලැබීමෙන් ද සංවේග බහුල බව ය, ව්‍යාධිත වූ ද ජරා ජීර්ණ වූ ද මල සිරුරු ඉහි පැණෙන බැඳින් ආරෝ ග්‍ය මද යෞවන මද ජීවිත මද යන මේ අපා ය භාග්කරණ මදයන්ගේ දුරුවීම ය, කුඩා මහත් භය සහන බව ය නොහොත් භය හා භය එළවන අරමුණු සහන බව ය, සංවේගයට පැමිණි

යේ නුවණින් ව්‍යායාම කෙරෙයි. අවනුෂ්‍යයන් විසින් ගරු කොට සම්භාව්‍ය කරණු ලබන බව ය, අපිස් බැව් ආදීන්ට අනු ලොම් පැවතුම් ඇති බව ය, යන මොවුහු අනුසස් නම් වෙත්.

අපි ච — සොසානික මහණහු මරණානුස්මෘතියෙහි ආනුභාවයෙන් නිද්‍රොපගතවූවාහු සිහිනෙහු දු ප්‍රමාද දෙෂයෝ ස්පර්ශ නො කෙරෙත්. බොහෝ කුණපයන් දක්නා වූ ඔහුගේ සිත ද කාමරාග වසඟ ද නොවේ. විපුල වූ සංවේගයට පැමිණෙයි. ආරෝග්‍යාදී මදයට නො පැමිණෙයි. නැවත නිවන් සොයනු යේ මනාකොට ව්‍යායාම කෙරෙයි. වෙසේ නොයෙක් ගුණ ඵලවන බැවින් සොසානිකඞග ය තෙමේ නිවන්හි නැමුහු සිතැත්තවුන් විසින් සෙවි ය යුතු.

එසින් කිහ.

සොසානිකඞගි මරණානු සතිපභාවා,
නිද්දාගතමපි න ථුසනති පමාද දොසා.

සමපස්සතො ව කුණපානි බහූනි තස්ස,
කාමානුරාග වසගමපි න හොති චිත්තං.

සංවෙග මෙති විපුලං න මදං උපෙති,
සම්මා අථො ඝටති නිබ්බුති මේ සමානො.

සොසානිකඞග මිතිකෙන ගුණාවහත්තා,
නිබ්බාණ නින්න හදයෙන නිසෙවිතබ්බං-සි.

මෙසේ යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ සොසා නිකඞගයෙහි සමාදාන ය-විධාන ය-ප්‍රභෙද ය-භෙද ය-ආනිසංස ය -යන මොවුන්ගේ. වණිනා ව සි.

යථාසන්ථතිකඞගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්? සෙනාසන ලොලුපං පටිකඛ්‍යාමි යථා සන්ථතිකඞගා සමාදියාමි" යනුවෙන්. සෙනස්නෙහි ලොල් බව පිළිකෙවු කෙරෙමි සි යථා සන්ථතිකඞගය සමාදන් වෙමි'සි යන මෙසින් එක්නා වවනයකින් සමාදන්වන ලද්දේ වේ. මේ මෙහි සමාදාන ය සි.

මෙහි පිළිපදිනා විධි කෙසේ ද යන්? ඒ යථාසන්ථතිකඞග යා විසින් යම් සෙනස්නක් මේ මේ සෙනස්න තොපට පැමිණෙ සි ඔහු විසින් ගන්වනු ලැබේ ද ඒ සෙනස්නෙන් සතුටු විය යුතු ය. අනිකෙක් නොනැගි ය යුතු ය. මේ මෙහි පිළිපදිනා විධි සි.

මෙහි ප්‍රභෙදය කෙසේ ද යත්? යථාසන්ථනිකඞ්ගය ද ප්‍රභෙද යෙයින් වනාහි තුන්වැදෑරුම් වේ. එහි උත්කෘෂ්ට තෙමේ තමහට පැමිණි සෙනස්න දුරු කළේ වරද සි කියා ද බොහෝ දෙන රැස්වන ලදැ සි කියා ද අමනුෂ්‍ය දිඹිජාති ආදීන් විසින් උපදුන ලදැ සි කියා ද උෂ්ණ දැ සි කියා ද සිහිල් දැ සි කියා ද පිළිවිස්නට නො ලැබේ. පිළිවිස්මෙනු දු දුහඟ කොලෙ සෙන බැවින් මධ්‍යම තෙමේ පිළිවිසින්ට ලබන්නේ ම ය. මිනා වුව ගණිමි නොමිනා වුව නො ගණිමි සි ගොස් බලන්නට නො ලැබේ. මෘදුක තෙමේ ගොස් බලා ඉදින් ඔහට අඵාසුවකින් නො රිසි වේ නම් අනික් සෙනස්නක් ගන්නට ලැබේ. මේ මෙහි ප්‍රභෙද සි.

මෙහි භෙද කෙසේ ද යත්? මේ තුන්දෙනහට ම තමාට පැමිණි සෙනස්න නොගෙණ අසවල් දහර මහණහු වසන සෙනස්න දෙව සි ද, අසවල් සෙනස්න දෙව සි ද, විඤ්ඤත්තියට පමුණුවා සෙනසුන් ලොල් බැව් උපන් කෙණෙහි ම දුහඟ බිඳෙ සි. මේ මෙහි භෙද සි.

මෙහි අනුසස් කිම යත්? යම්කි ලබන ලද ද එයින් සතුටු විය යුතු ය සි කියන ලද අවවාද ය මිනාකොට කරණ බව ය, තමහට බාල වූ නැහි ය යුත්තනු දු නො නහන බැවින් සබ්‍රහ්මචාරීන්ට ඟිත පසස්නා බව ය, එයින් කරුණා විහාරයට අනුකූල බව ය, සුන්දරාසුන්දර විභාග ය නො කරණ බැවින් ඟින ප්‍රණීත විකල්ප ය දුරුකිරීම ය, එයින් තාදී ගුණයට අනුකූල බව ය, එයින් අනුරෝධ විරෝධයන්ගේ දුරුකිරීම ය, අනිච්ඡාවයට අවකාශ දුනයෙන් දෙරපිම ය, අපිස් බැවු ආදීන්ට අනුලොම් පැවතුම් ඇතිබව ය, යන මොහු අනුසස් නම් වෙත්.

අපි ච— යමක් ලබන ලද ද එයින් ම සතුටු වූ මහණ විකල්ප රහිත වූ තෘණ ඇතිරියෙහි දු සැපසේ හෝනේ ය. උතුම් සෙනස්නෙහි ඔහු රාග නො කෙරෙ සි. නපුරු සෙනස්නක් ලදි නුත් නො කිපෙ සි. දහර මහණුන් නොනගන බැවින් නවක සබ්‍රහ්මචාරීන්ට ඟිත පසස්නා බව ය, ඒ හෙයින් නොයෙක් ආශ්චර්යයන් විසින් පුරුදු කරණ ලද කථාගතයන් විසින් පසස් නා ලද නුවණැත්තේ යථා සන්ථනිකඞ්ගයෙහි ඇලුනු බැවිනි. යෙදෙන්නේ සි.

එයින් කිහ.

යං ලඵං තෙන සන්තුට්ඨෝ යථාසන්ථනිකෝ යති,
නිබ්බිකප්පෝ සුඛං සෙති තිණසන්ථරකෙසුපි.

න සො රජ්ජති සෙය්‍යමහි හිනං ලඛ්ධා න කුප්පති,
සබ්‍රහ්මචාරි නවකෙ හිතෙන අනුකම්පති.
තසමා අරිය සතාවිණණං මුනිපුඞගව වණණීනං.
අනුයුඤ්ජථ මෙධාවී යථා සඤ්ඤ රාමිතං-සි.

යථොක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ යථාසඤ්ඤිතඞග යෙහි සමාදාන ය-විධාන ය-ප්‍රභෙද ය-හෙද ය-ආනිසංස ය-යන මොවුන්ගේ වර්ණනා ව සි.

නෛසජ්ජිකාඞගයෙහි සමාදානාදි ය කෙසේ ද යත්?

"සෙය්‍යං පටික්ඛිපාමි නෛසජ්ජිකඞගං සමාදියාමි"යනුවෙන් ඊර්‍ය්‍යාපථ ලක්ෂණ වූ ශය්‍යා ව ප්‍රතික්ෂෙප කෙරෙමි නෛසජ්ජිකඞග ය සමාදන් වෙමි යන මෙයින් එක්තරා වචනයකින් සමාදන් විය යුතු වෙ සි. ඊර්‍ය්‍යාපථ ශය්‍යා ව පිළි කෙවු කිරීමෙන් තදථී වූ මඤ්චක ය හිසි ය යනාදී වූ ශය්‍යාවෝ ද පිළිකෙවු කරණ ලදුවෝ නම් වෙති සි විසුද්ධිමාගී ව්‍යාඛ්‍යානයෙහි දක්වන ලදි. මේ මෙහි සමාදාන ය සි.

මෙහි පිළිපදිනා විධි කෙසේ ද යත්? ඒ නෛසජ්ජිකයා විසින් වනාහි රෑ තුන්යමෙහි එක් යමක් නෛසජ්ජිකයෙමි සි සියලු රෑ නො හින් ද යුතු බැවින් නැගී සිට සක්මන් කටයුතු වෙ සි. ඊර්‍ය්‍යාපථයන් කෙරෙහි වනාහි හෝනට ම නො වටින් නේ ය. මේ මෙහි පිළිපදිනා විධි ය සි.

මෙහි ප්‍රභෙද කෙසේ ද යත්? උත්කෘෂ්ට නෛසජ්ජිකයා හට අපසස ය සි කියන ලද පිටාවු ව ද නො වටී සි. දුසසපලල ත්‍යිකා ය සි කියන ලද සිවුරෙන් අකවටු ව ද නො වටී සි. අයොග පට ය ද නො වටී සි. මධ්‍යමය හට වනාහි මේ තුන්දෙනා කෙරෙහි යම් කිසිවෙක් වටී සි. මෘදුකයනට පිටාවුව ද සිවුරෙන් අකවටුව ද අයොගපට ය ද කන්වැසිනු දු පඤ්චාඞග ය ද සප්තාඞග යද වටී සි පඤ්චාඞග ය නම්, පිට අපසස ය නා සමග කෙළේ සි. හේ සතර පයින් හා පිටසී අපසසයෙන් යුක්ත බැවින් පඤ්චාඞග ය නම් වී. සප්තාඞග ය නම්, පිටසී අපසසයෙහි ද දැලයේ අපසස දෙක ය යන මෙයින් ද කෙළේ සි. හේ සතර පයින් හා අපසස තුණකින් යුක්ත බැවින් සප්තාඞග නම් වේ. මේ මෙහි ප්‍රභෙද සි.

මෙහි භෙද කෙසේ ද යත්?

"ඉමෙසං පන තිණණම්පි සෙය්‍යං කාපිත මතෙන ඛුත ඞගං භිජ්ජති. අයමෙත්ථ භෙදෙ"සි.

දක්වන ලද බැවින් මේ තුන්දෙනාට ම ශය්‍යා ව කළ මියුයෙහි ද්‍රාහ බිඳේ. මේ මෙහි හෙදයි.

මෙහි අනුසස් කිම යත්?

ශය්‍යාසුඛ ය යි කියන ලද හෙව්මෙන් වන සුවෙහි ඵස්ස සුඛ ය යි කියන ලද ඇලයෙන් ඇලයට පෙරළී පෙරළී නිදන් නහුට වන පාර්ශ්ව සුඛයෙහි මිද්ධසුඛයෙහි යෙදී වසන්නේ ය යි කියන ලද වෙනෝ විනිබන්ධයාගේ උපවේජද ය කරන්නේ ය, නිසඳ්ධ ව අළුත අනුද්ධත පාඝාතික වන බැවින් සියලු කම්ටහන යෙදීමට සැපවන බව ය, එ හෙයින් ප්‍රසාදකර ඉරියව් බව ය, ව්‍යායාමහයට අනුකූල බව ය, එ හෙයින් සම්‍යක් ප්‍රතිපත්ති ය ගේ වැඩීම ය යන මොහු අනුසස් නම් වෙත්.

අපිව—

ආභුඤ්ජිත්වාන පල්ලඞ්කං පණිධාය උජුං තනුං,
නිසීදනෙනා විකම්පෙති මාරස්ස හදයං යති.

සෙය්‍ය සුඛං මිද්ධ සුඛං හිත්වා ආරද්ධ වීරියෝ,
නිසජ්ජානිරතෝ භික්ඛු සෝහයනෙනා තපෝ වනං

නිරාමිසං පීතිසුඛං යසමා සම්ඩි ගවජ්ඣති,
තසමා සම්නුස්සුඤ්ඣය්‍ය ධිරෝ නෙසජ්ජිකං වතං–යි.

පලක් බෑද සිරුර ඍජුකොට පිහිටුවා භිදිනා වූ මහණ තෙමේ මාරයාගේ හෘදය කම්පා කෙරෙයි. නිසඳ්ධවයෙහි ඇලුනා වූ මහණ තෙමේ ශය්‍යා සුව ය මිද්ධසුව ය හැර වැඩූ වීර්‍ය්‍ය ඇත්තේ තපොවන ය හොබවමින් යම් හෙයකින් ලොකාමිස රහිත වූ ප්‍රීතිසුඛයට පැමිණේ ද එ හෙයින් නුවණැති මහණ තෙමේ නෛසජ්ජික දූහහ යෙදෙන්නේ යි. මෙසේ යථෝක්ත ප්‍රකාරයෙන් දක්වන ලද්දේ නෙසජ්ජිකඞ්ගයෙහි සමාදාන ය-විධාන ය-ප්‍රභෙද ය-හෙද ය-ආනිසංස ය-යන මොවුන්ගේ වර්ණනා ව යි

මේ සියලු ම ධුතාඞ්ගයෝ සංක්ෂෙපයෙන් තිසි කෙණෙහුන් විනා නොපවත්නා හෙයින් ද සුවසේ රැකෙන බැවින් ද සෙසු දූහහනු දූ සාග්‍රහ වන බැවින් ද උත්තමාඞ්ගයෝ තුන් දෙනෙකි නොමුදු අඞ්ගයෝ පස් දෙනෙකැ යි අට දෙනෙක් වෙත්. එහි සපදාන චාරිකඞ්ග ය එකාසනිකඞ්ග ය අඩෙඩාකාසිකඞ්ග ය යන මොහු තුන්දෙන උත්තමාඞ්ගයෝ යි. යම් හෙයකින් සපදාන චාරිකඞ්ග ය රක්ෂන් පිණ්ඩපාතිකඞ්ග ය ද රක්නේ මේ ද එකාසනිකඞ්ග ය රක්නාහුට පත්තපිණ්ඩිකඞ්ග ය ඛලු

පවජ්ජාභත්තිකඞ්ග ය යන මොහු සුවසේ රැක්ක හැකි වන්නාහු වෙද් ද අඛෙහාකාසිකඞ්ග ය රක්නාගට රුකමුලිකඞ්ග ය යථා සන්ථතිකඞ්ග ය යන දෙකෙහි රැක්ක යුතු නම් කිමෙක් ඇද් ද (නැත).

මෙ සේ මේ තුන්දෙන උත්තමිඞ්ග හෙයින් සිසඞ්ග යෝ යි. ආරණ්‍යකාඞ්ග ය පාංසුකූලිකාඞ්ග ය තෙචීවරිකාඞ්ග ය නෙසජ්ජි කාඞ්ග ය සොසානිකාඞ්ග ය යි මොහු පස්දෙන අසම්භින්නඞ්ග න යි දුනඟහු අට දෙනෙක් වෙත්. නැවත චීවර ප්‍රතිසංයුක්තයෝ දෙ දෙනෙක පිණ්ඩපාත ප්‍රතිසංයුක්තයෝ පස් දෙනෙකි. සෙනාසන ප්‍රතිසංයුක්තයෝ පස් දෙනෙකි. එකක් චීය්‍ය ප්‍රතිසංයුක්ත වෙ යි. මේ සේ සතර දෙන ද වෙත්. එහි නෙසජ්ජිකඞ්ග ය චීය්‍ය ප්‍රතිසංයුක්ත ය. සෙස්සෝ ප්‍රකටයෝ මැ යි. නැවත ප්‍රත්‍ය ය සන්නිශ්‍රිතයෝ දෙළෙනෙක. චීය්‍ය නිශ්‍රිත එකෙ කැ යි නිශ්‍රය විසින් දෙකෙක. **සෙවිතව්‍යා සෙවිතව්‍ය** වශයෙන් දෙවදෑරැම් වේ.

කෙසේ ද? යම් සේ ධුතාඞ්ග සෙවන ය කරන්නාහට කමටහන් වඩී ද, ඔහු විසින් සෙවි ය යුතු ය. යමක්හට ධුතාඞ්ග සෙවන ය කිරීමෙන් කමටහන් සිවුමැලි බැවින් රැඟ පිළිවෙත් හෝ නො ගන්නාහට පිරිහේ ද, ඔහු විසින් නො සෙවි ය යුතු ය. යමක්හට වනාහි සෙවුනේ ද නො සෙවුනේ ද කමටහන් වඩි නම් කමටහන් නො පිරිහේ නම් ඔහු විසිනු දු පච්ඡිම ජනයාහට අනුකම්පා කරණුවහු විසින් සෙවිය යුත්තාහු ය. යමක්හට දුනඟ සෙවුනේ ද නො සෙවුනේ ද පින් නැති බැවින් කමටහන් නො වඩී ද ඔහු විසිනු දු ආයති වාසනා ව ය යි කියනා ලද මත් තට වාසනා පිණිස සෙවිය යුත්තාහු ය යි මේසේ සෙවිතව්‍ය සෙවිතව්‍ය වසයෙන් දෙ වැදෑරැම් වේ. සියලු ම ධුතාඞ්ගයෝ චේතනා වසයෙන් එකවිධ යි. යම් හෙයකින් චේතනා සවභා වයෙන් දුනඟ එකෙක් ම වේ ද එ හෙයින් දුනඟ සමාදාන චේතනා හු යි, සමාදාන චේතනා වසයෙන් එකක් වෙ යි.

එයින් කිඹ.

"සබ්බානෙව චේතනා වසෙන එකවිධානි ගොනනි. එක මෙව හි ධුතඞ්ගං සමාදාන චේතනා" යි. ව්‍යාස ය යි කියන ලද විසතර හෙයින් වනාහි භික්ෂූන්ට තෙළසෙක. භික්ෂුණීන්ට අටෙක. සාමණෙරයන්ට දෙළසෙක ශික්ෂාමානයන් හා ගොර ණින්නන්ට සතෙක. උපාසක උපාසිකාවන්ට දෙකෙකැ යි දෙ සාළිසෙක් වෙත්. ඉදින් වනාහි අඛෙහාකාසයෙහි ආරණ්‍යකාඞ්ග යෙන් යුක්ත වූ සොළොසෙක් වේ ද එක ම මහණ එකපැහැර

සියලු ධුතාඞ්ගයන් වළඳන්නට සම්මත වේ. භික්ෂුණීන්ට වනාහි ආරණ්‍යකාඞ්ග ය ද බලුපච්ඡාභත්තිකාඞ්ග ය ද යන දෙදෙන ම ශික්ෂාපදයෙන් ප්‍රතික්ෂිප්ත ය හ. අබ්භොකාසිකඞ්ග ය ද රුක්ඛමූලිකඞ්ග ය ද සොසානිකඞ්ග ය ද යන මොහු තුන්දෙන දුස්පරිහාර ය හ. කුමක් හෙයින් ද යත්?

භික්ෂුණීන්ට වනාහි දථිනියිකාවක් නැති ව වසන්නට නො වටී සි මේ බුදු තැන්හි දු සමාන අදහස් ඇති දථිනියිකාවක් දුර්ලභ ය. ඉදින් ලැබුනු නමුදු සංඝයි විහාරයෙන් නො ඉවත් නේ ය. එසේ කල්හි යම් විවේකයක් පිණිස ධුතාඞ්ග සෙවී ද ඒ අර්ථය ඒ භික්ෂුණියට සම්ප්‍රාප්ත නො වෙ සි. මේ සේ වළඳන්ට නො පිළිවන් බැවින් පසක් පිරිහෙලා පංසුකූලිකාඞ්ග ය තෙච්වරිකාඞ්ග ය පිණ්ඩපාතිකාඞ්ග ය සපදානචාරිකාඞ්ග ය පත්තපිණ්ඩිකාඞ්ග ය එකාසනිකාඞ්ග ය යථාසන්ථතිකාඞ්ග ය නෙසජ්ජිකාඞ්ග ය සත භික්ෂුණීන්ට අටෙක් ම වෙත් නු සි දත යුත්තාහු සි. යථොක්ත ධුතාඞ්ගයන් කෙරෙහි භික්ෂූන්ට කියන ලද තෙළෙසෙහි මෙහෙණට කී අටෙහි තෙච්වරිකාඞ්ග ය තබා සෙසු දෙළස සාමණේරයන්ට දත යුත්තා හ.

සාමණේරයන්ට ද තෙච්වරිකාඞ්ග ය ප්‍රතික්ෂේප කළ හෙයින් පංසුකූලිකාඞ්ග ය පිණ්ඩපාතිකාඞ්ග ය සපදානචාරිකාඞ්ග ය පත්තපිණ්ඩිකාඞ්ග ය එකාසනිකාඞ්ග ය යථාසන්ථතිකාඞ්ග ය නෙසජ්ජිකාඞ්ග ය යන සත ශික්ෂාමාන සාමණේරීන්ට දත යුත්තා හු සි. උපාසක උපාසිකාවන්ට වනාහි උපාසක ජනාලඞ්කාර යෙහි දැක්වූ ක්‍රමයෙන් එකාසනිකාඞ්ග ය පත්තපිණ්ඩිකාඞ්ග ය යන දෙක ම සුදුසු වෙනි. වළඳන්නට පිළිවන්හු නු සි ධුතාඞ්ග යෝ දෙදෙනෙකැ සි මේ සේ විසතර හෙයින් සතලිස් දෙකෙක් වෙත්. කවරෙක්හට ධුතාඞ්ග සේවන ය සැප ද යත්? රාග චරිතයහට ද මොහචරිතයහට ද සැපයෝ සි. කුමක් හෙයින් ද යත්?

ධුතාඞ්ග සෙවනා තොමෝ දුක්ඛප්‍රතිපත්ති ද වෙ සි. සල්ලේඛ විහාර ද වෙ සි. දුක්ඛප්‍රතිපත්ති ය ද නිසා රාග ය ව්‍යපශමනය වෙ සි. රාග ය දුක්ඛප්‍රතිපත්තියෙහි පිහිටා නො ලබන හෙයිනි. සල්ලේඛ ය නිසා අප්‍රමත්තතයහට මොහ ය පහ වෙ සි. සල්ලේඛ ය සම්ප්‍රඥාන ය ඇතිකල්හි අප්‍රමාද ය සම්භවන බැවිනි මේ ධුතාඞ්ගයන් කෙරෙහි ආරණ්‍යකාඞ්ග ය රුක්ඛමූලිකාඞ්ග ය සේවනාවෝ දෝෂ චරිතයහට හෝ සැපයෝ සි. ඒ අරණ්‍ය යෙහි වෘක්ෂමූලයෙහි සංඝටනයන් කරණු නො ලදින්, වසන්නා වූ

ඒ යෝගීනට දොෂ ය සන්සිදෙන්නේ ය. භික්‍ෂූන් වහන්සේට ආරණ්‍යකාඞ්ග ය ප්‍රතික්‍ෂෙප කෙළේ කවර කාලෙක්හි ද යි යන නොත්? උපුල්වන් සථවිරින් වහන්සේට සිටුපුත්‍රයෙක් කළ අනදර ය මුල්කොට ය යි කි. **රතනාවලියෙන්** බලා දත යුතු. ධුතාඞ්ගයන් කෙරෙහි අප්‍රකට අර්ථයන් **විශුද්ධිමාර්ගයෙහි** ධුතාඞ්ග නිර්දේශයෙන් ගන්නට අවකාශ තබා අනෙක ප්‍රකාර යෙන් මෙහි යම් ධුතාඞ්ග කෙණෙකුත් සංග්‍රහ කරණු ලැබේද් ද ඒ ධුතාඞ්ගයන් නිසා මිලිඳු රජතෙම—

පස්‍ස තෙ රඤ්ඤසෙ භික්‍ඛු අරෝඤාගාලෙහ ධුතෙ ගුණෙ,
පුන පස්‍සති ගිහි රාජා අනාගාමි ඵලෙ ඨිතෙ.

උභොපි තෙ විලොකෙත්වා උපපජ්ජි සංසයො මහා,
බුද්ධෙඤය්‍ය වෙ ගිහී ධම්මෙ ධුතඞ්ගං නිප්ඵලං සියා.

පරවාදී වාද මථනං නිපුණං පිටකත්තයෙ,
ගන්‍ථපුවෙජ්ජ කථිසෙට්ඨං සො මෙ කඞ්ඛං විනෙස්‍සති,

යනුවෙන් අතිශයින් ගැඹුරු වූ ධුතාඞ්ග පූරණ ය කරන්නා වූ භික්‍ෂූනු දු දක්නා ලැබෙ නි. නැවත ගෘහස්ථ ව සිට අනාගාමි ඵල යෙහි පිහිටි රජුනු දු දක්නා ලැබෙති. මේ දෙපක්‍ෂ ය ම බලා මහත් සංසයක් උපන්නේ ය. ඉදින් ගිහිහු දුරනුබොධ වූ දහම් අවබෝධ කෙරෙත් නම් නිවණට පැමිණෙත් නම් ධුතාඞ්ග නිෂ්ඵල වන්නේ ය. එ හෙයින් පරවාදීන්ගේ වාද මථන ය කරන්නා වූ නිපුණ වූ පිට කත්‍රයෙහි එ හෙයින් ම ශ්‍රෙෂ්ඨ වූ කථික වූ යම් නාගසෙන සථවිර කෙණෙක් ඇද්ද ඔවුන් වහන්සේගෙන් විචාළ කල්හි මාගේ මේ සැක ය දුරුකරණ සේකැ යි සිතා–

අථ ඛො මිලින්දො රාජා යෙනායස්මා නාගසෙනො තෙනුප සංකම්. උපසංකමිත්වා ආයස්මන්තං නාගසෙනං අභිවාදෙත්වා එක මන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො මිලින්දො රාජා ආයස්ම න්තං නාගසෙනං එතදවොච්. භන්තෙ නාගසෙන අත්ථි කොචි ගිහි අගාරිකො කාමභොගී පුත්තදාර සම්බාධ සයනං අජ්ඣා වසන්තො කාසික චන්දනං පච්චනුභොන්තො මාලාගන්ධ විලෙපනං ධාරයන්තො ජාතරූප රජතං සාදියන්තො මණි මුත්තා කඤ්චන විච්ඡාත මොලි බද්ධො යෙන සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකතං–යි.

දක්වන ලද ක්‍රමයෙන් තදනන්තරයෙන් ම ඒ **මිලිඳු** රජතෙම වාදීහ කුම්භ විදාරණ ප්‍රවර කෙහරී මාගරාජ නිර්විශෙෂ පින් වත් වූ **නාගසෙන** සථවිරයන් වහන්සේ යම් තැනෙක් හි වැඩවසා වදාරණ සේක් ද එ තැන්හි එළඹියේ ය. එළඹ පින්වත් **නාගසෙන** සථවිර

යන් වහන්සේට පසඟ පිනිටුවා නමස්කාර කොට එකත් පසෙක් හි අෂ්ටදෝෂයෙන් විනිර්මුක්ත ව හුන්නේ ය. එකත් පසෙක හුන්නා වූ ඒ **මිලිඳු** රජතෙම ආයුෂ්මත් වූ **නාගසේන** සථවිරයන් වහන්සේට, සවාමි වූ **නාගසේන** සථවිරයන් වහන්ස! අගාරික ය යි කියන ලද ගෘහ වාස ය ඇත්තා වූ පඤ්චකාමයන් අනුභව කරණ හෙයින් කාම භොගී වූ පුත්‍රදාර සම්බාධ සහිතයෙහි අජ්ඣාවාස ය කරන්නා වූ කාසික චන්දනයන් ප්‍රත්‍යනුභව ය කරන්නා වූ මල්ගඳ විලවුන් දරන්නා වූ රන්රිදී මිසු කහවණු ඉවසන්නා වූ මණිමුත්තා කසුඛනයෙන් විසිතුරු ඔවුනු දරන්නා වූ යම් ගෘහසථයන්හු විසින් ශාසන වූ පරමාර්ථ වූ නිර්වාණ ය සාක්ෂාත් කෙළේ ඇද් ද යි විවාළේ ය.

ඒ ඇසූ ප්‍රඥා ප්‍රදීප වූ **නාගසේන** සථවිරයන් වහන්සේ "න මහාරාජ එකන්තේනේව සතං, න දට්ඨබ්බානි, න වතු පඤ්ච සතානි, න සහස්සං, න සත සහස්සං, න කොටි, නකොටි සතං, නකොටි සහස්සං, නකොටි සතසහස්සං, යනාදීන් ගෘහවාසයෙහි සිට අධිගමකළ සථයන් බොහෝ පරිදි දක්වා මත්තෙහි-

යා කාචි නවඞ්ගසු බුද්ධ වචනෙසු සල්ලේඛිතාචාර පටිපත්ති ධුතගුණවරඞ්ග නිස්සිතා කථා තා සබ්බා ඉධ සමෝසරිස්සන්ති. යථා මහාරාජ නින්නට්ඨානත සම විසම අථල ථල දෙසභාගෙ අනි වට්ට උදකං සබ්බන්තං තතෝ තතෝ විනිගලිත්වා මහොදධිං සාගරං සමෝ සරති, එවමෙව ඛෝ මහාරාජ සම්පාදකෙ සත්ථු යා කාචි නවඞ්ග බුද්ධවචන සල්ලේඛිතාචාර පටිපත්ති ධුතගුණ වරංග නිස්සිතා කථා, තා සබ්බා ඉධ සමෝසරිස්සන්ති. මයාමෙපත්ථ මහාරාජ පරිව්‍යත්තනතාය බුද්ධියා කාරණ පරිදීපනං සමෝසරිස්සති. නෙතෙසෝ අත්ථෝ සුවිඤ්ඤෙයෝ පරිපුණ්ණා සමානිතෝ භවිස්සති-යි.

යහුවෙන්, මහරජ්ජුරුවෙනි! නවාඞ්ග බුද්ධවචනයෙහි සල්ලේඛිතාචාර ප්‍රතිපත්ති ධුතගුණ නිශ්‍රිත වූ උතුම් කථා කෙණෙක් ඇද්ද ඒ සියල්ල ම මෙහි සමෝසරිත වෙති. මහරජ්ජුරුවෙනි! යම් සේ නින්න සථාන උන්නත සථාන සම විසමසථාන අථල ථලසථාන දේසභාගයෙහි අභිවර්ෂිත ය කරණ සියලු උදක ය ඒ ඒ තැනින් ගිලිනි මහොදධි සංඛ්‍යාත සාගරයට සමෝසරිත වේද් ද, ඒ පරිද් දෙන් ම මහරජ්ජුරුවෙනි! සම්පාදක කථාසූතු වූ යම් නවාඞ්ග ශාසනා ශාසනයෙහි සල්ලේඛිතාචාර ප්‍රතිපත්ති ධුතගුණ නිශ්‍රිත වූ උතුම් කථා කෙණෙක් ඇද්ද, ඒ සියලු කථාවෝ ම මෙහි සමෝසරිත වෙත්. නෙවත් මේ ප්‍රශ්න ය කරා ඉසිනි. එල්ඛ සිටිනි. මාගේ පරව්‍යත්තනතා සහිත බුද්ධියගේ ද පරිදීපන සංඛ්‍යාත ප්‍රකාශ කිරීමට කාරණා වී ය. එසේ හෙයින් මේ අර්ථ ය සුවිඤ්ඤ වී ය. පරිපූර්ණ වීය සමානිත වී ය. යි යනාදීන් වදාරා තදුභතර යෙහි—

නගරෙ මහාරාජ සාවත්ථියා පඤ්චකොටි මත්තා අරිය සාවකා භගවතො උපාසක උපාසිකායෝ සත්තපණ්ණාස සහස්සානි තිණ්ණිස තසහස්සානි අනාගාමිඵලෙපතිට්ඨිතා තෙසබෙබපි ගිහියෙවන පබ්බජිතා. පුන තත්ථේ ව ගණ්ඩම්බ මූලෙ යමක පාටිහාරියෙ ඒසති පාණකොටියො අහි සම්මිංසු. පුන මහාරාහුලොවාදෙ මහාමඞ්ගල සුත්තන්තෙ සමචිත්ත පරියායෙ පරාභව සුත්තන්තෙ පුරාතෙද සුත්තන්තෙ කලහවිවාද සුත්තන්තෙ චූලබ්‍යූහ සුත්තන්තෙ මහාබ්‍යූහ සුත්තන්තෙ තුවටක සුත්තන්තෙ සාරිපුත්ත සුත්තන්තෙ ගණනපථ මතිතානං දෙවතානං ධම්මාභිසමයො අහොසි.

නගරෙ රාජගහෙ පඤ්ඤාස සහස්සානි තිණි සතසහස්සානි අරිය සාවකා භගවතො උපාසක උපාසිකායෝ, පුන තත්ථේ ව ධන පාල හත්ථිනාග දමනෙ නවුති පාණකොටියෝ, පාරායන සමාගමෙ පාසානකෙ වෙතියෙ චුද්දස පාණකොටියෝ, පුන ඉන්දසාල ගුහායං අසීතිදෙවතා කොටියෝ, පුන බාරාණසියං ඉසිපතනෙ මිගදායෙ පඨම ධම්ම දෙසණාය අට්ඨාරස බ්‍රහ්ම කොටියෝ අපරිමාණා ව දෙවතා යෝ, පුන තාවතිංස භවනෙ පණ්ඩු කම්බල සිලායං අභිධම්ම දෙස නාය අසීති දෙවතා කොටියෝ, දෙවොරොහණෙ සංකස්ස නගරද්වා රෙ ලොක විවරණ පාටිහාරියෙ පඤ්ඤානං නරාමරානං තිංස කොටි යෝ අභිසමිංසු.

පුන සක්කෙසු කපිලවත්ථුසමිං නිග්‍රොධාරාමෙ බුද්ධවංස දෙස නාය මහාසමය සුත්තන්ත දෙසනාය ච ගණනපථ මතිතානං දෙවතා නං ධම්මාභිසමයෝ අහොසි. පුන සුමන මාලාකාර සමාගමෙ ගරහ දින්න සමාගමෙ ආනන්ද සෙට්ඨි සමාගමෙ ජම්බුකාජීව සමාගමෙ මණ්ඩුක දෙවපුත්ත සමාගමෙ මට්ඨකුණ්ඩලි දෙවපුත්ත සමාගමෙ සුලසා නගරසොභිනී සමාගමෙ සිරිමා නගරසොභිනී සමාගමෙ පෙසකාර ධීතු සමාගමෙ චූල සුභද්දා සමාගමෙ සාකෙත බ්‍රාහ්මණස්ස ආලාහණ දස්සන සමාගමෙ සුනාපරන්තක සමාගමෙ සක්කපඤ්හ සමාගමෙ නිරොකුඩ්ඩ සමාගමෙ රතනසුත්ත සමාගමෙ ච පවෙචකං චතුරාසීතියා පාණසහස්සානං ධම්මාභිසමයෝ අහොසි.

යාවතා මහාරාජ භගවා ලොකෙ අට්ඨාසි, තාව තීසු මණ්ඩ ලෙසු සොළසසු මහාජනපදෙසු යත්ථ යත්ථ භගවා විහාසි, තත්ථ තත්ථ යෙහුය්‍යෙන දෙව තායෝ චතුපඤ්චසතං සහස්සං සත්තසහස්සං දෙවා ව මනුස්සා ව සන්තා පරමත්ථං නිබ්බාණං සච්ඡිකරිංසු. සබෙබ තෙ මහාරාජ ගිහියෙව න පන පබ්බජිතා. එතානි ව මහාරාජ අඤ්ඤානි ව අනෙකානි දෙවතා කොටිසතසහස්සානි ගිහි අගාරිකා කාමභොගිනො සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකරිංසු සි.

යනුවෙන්, මහරජ්ජුරුවෙනි! ශ්‍රාවස්ති නම් රාජධානියෙහි බුදුන්ගේ උපාසක උපාසිකාවෝ පස් කෙළක් පමණ ආර්‍ය්‍ය ශ්‍රාවකයෝ ය. ඔවුන් අතුරෙහි තුන්ලක්ෂ සත්පණස් දහසක් දෙන අනාගාමී ඵල යෙහි පිහිටියාහු ය. ඒ සියල්ලෝ ම පැවිදි වූවාහු නොවෙති. ගෘහවාසයෙහි ම සිටියාහු ය. නැවත එහි ම ගණ්ඩම්බ නම් වෘක්ෂ මූලයෙහි වූ යමක ප්‍රාතිහාර්‍ය්‍යයෙහි ධර්මාභිසමය කළ විසි කෙළක් පමණ ප්‍රාණීහු ද රාහුලෝවාද සූත්‍රාන්ත දෙශනාවෙහි ද මහාමඞ්ගල සූත්‍රාන්ත දෙශනාවෙහි ද සම්විත්ත පර්‍ය්‍යාය සූත්‍ර දෙශනාවෙහි ද පරාභව සූත්‍ර දෙශනාවෙහි ද පුරාණෙද සූත්‍රාන්ත දෙශනාවෙහි ද කලහවිවාද සූත්‍රාන්ත දෙශනාවෙහි ද චූලබ්‍යූහ සූත්‍රාන්ත දෙශනාවෙහි ද මහාබ්‍යූහ සූත්‍රාන්තයෙහි ද තුවටක සූත්‍රාන්තයෙහි ද සාරිපුත්ත සූත්‍රාන්තයෙහි ද සංඛ්‍යාපථානික්‍රාන්ත වූ දෙවතාවන්ට ධර්මාභිසමය විය

රාජගෘහ නම් පුරප්‍රවරයෙහි තුන් ලක්ෂ පණස්දහසක් පමණ භගවත්හුගේ උපාසක උපාසිකා වූ ආර්‍ය්‍යශ්‍රාවකයෝ ය. නැවත එහි ම ධනපාල නම් හස්තිරාජයාගේ දමනයෙහි ප්‍රාණීන් අනූකොටියෙක පාරායන සමාගමයෙහි ද පාසාන චෛත්‍යයෙහි දී තුදුස් කොටියක් ප්‍රාණීහු ය. නැවත ඉන්ද්‍රසාල ගුහාවෙහි දී අසූ කොටියක් දෙවියෝ ය. නැවත බරණැස ඉසිපතන නම් මෘගදායෙහි ප්‍රථම ධර්මදෙශනාවෙහි අටළොස් කෙළක් බ්‍රහ්මයෝ ය. ප්‍රමාණානික්‍රාන්ත දෙවතා කොටිහු ය නැවත තාවතිංස භවනයෙහි පාණ්ඩුකම්බල ශෛලාසනයෙහි දී කළ අභිධර්මදෙශනාවෙහි අසූ කොටියක් දෙවියෝ ය. දෙවොරොහණ කාලයෙහි සංකාස්‍ය නම් නගරද්වාරයෙහි දී ලොක විවරණ නම් ප්‍රාතිහාර්‍ය්‍යයෙහි ප්‍රසන්න දෙවිමිනිසුන්ගෙන් ධර්මාභිසමය කළෝ නිස්කොටියක් ප්‍රාණීහු ය.

නැවත ශාක්‍ය නම් රජදරුවන්ගේ කපිලවස්තු පුරයෙහි වූ න්‍යග්‍රොධාරාමයෙහි දෙසූ බුද්ධවංශ දෙශනාවෙහි ද මහාසමය සූත්‍රාන්ත දෙශනාවෙහි ද සංඛ්‍යාපථානික්‍රාන්ත වූ දෙවතාවන්ට ධර්මාභිසමය විය. නැවත සුමන මාලාකාර සමාගමයෙහි ද ගරහදින්න සමාගමයෙහි ද ආනන්ද සෙට්ඨි සමාගමයෙහි ද ජම්බුකා ජීවක සමාගමයෙහි ද මණ්ඩුක දෙව පුත්‍ර සමාගමයෙහි ද මටකුණ්ඩලී දෙව පුත්‍ර සමාගමයෙහි ද සුලසා නගරසෙට්ඨිනී සමාගමයෙහි ද සිරිමා නගර සෙට්ඨිනී සමාගමයෙහි ද පෙසකාර ධීතු සමාගමයෙහි ද චූලසුභද්‍රා සමාගමයෙහි ද සාකෙත නම් බ්‍රාහ්මණයාගේ ආදුනන දර්ශන සමාගමයෙහි ද සුනාපරන්තක සමාගමයෙහි ද ශක්‍රප්‍රශ්න සමාගමයෙහි ද රතනසූත්‍ර සමාගමයෙහි ද වෙන වෙන ම සුවාසූදහසක් ප්‍රාණීන්ට ධර්මාභිසමය වී ය.

තවද මහරජ්ජුරුවෙනි! යම් තාක් කල් භගවත් තෙමේ ලොකයෙහි වැඩවසා වදාළ සේක් ද, ඒ තාක් කල් අනෙකාර්ඝඛුලි ය

මධ්‍ය මණ්ඩල ය මහාමණ්ඩල ය යන මණ්ඩලත්‍රයෙහි ද සොළොස් ජනපද යෙහි ද යම් යම් තැනක වැඩවසා වදාළ සේක් ද ඒ ඒ තැන්හි බොහෝ සෙයින් දහ ති වහු පසළු සත සහස්‍ර ලක්ෂ වස යෙන් දෙවියෝ ද මනුෂ්‍යයෝ ද ශාන්ත වූ පරමාර්ථ වූ නිර්‍වාණ ය සාක්ෂාත් කළාහු ය. මහ රජ්ජුරුවෙනි! ඒ මේ සියල්ලෝ ම ගිහිනු ම ය. ප්‍රව්‍රජිතයෝ නො වෙති. මෝ හු ද අන්‍ය වූ දිව්‍ය කොටි සහස්‍ර යෝ ද ගිහිහු ම ය. අගාරික යෝ ම ය. කාමභොගිහු ම ය. ඔවුහු ශාන්ත වූ පරමාර්ථ වූ නිර්‍වාණ ය සාක්ෂාත් කළාහු ම ය යි වදාළ සේක.

ඒ අසූ මිලිඳුරජ නෙම

යදි හනෙන නාගසෙන! ගිහි අගාරිකා කාමභොගිනො සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකරොන්ති, අථ ඉමානි ධුතඞ්ගානි කිමත්ථං සාධෙන්ති, තෙන කාරණෙන ධුතඞ්ගානි අකිච්චකරානි හොන්ති යදි හනෙන නාගසෙන! විනා මන්තොසධෙහි ඛ්‍යාධයො වූප සමන්ති, කිං වමන විරෙචනාදිනා සරීර දුබ්බල කාරණෙන, යදි මුට්ඨිහි පථිවත්තූ නිහතහො භවති, කිං අසි සත්ති සර ධනු කොදණ්ඩ ලගුල මුග්ගරෙහි, යදි ගණ්ඩි කුට්ඨ සූසීර කට්ඨලතා සාඛා ආලම්බිත්වා රුක්ඛ මභිරුහණං භවති, කිං දීඝ දළ්හ නිස්සෙනි පරියෙසනෙ න-සි.

යනුවෙන් සමන්ත භද්‍ර ධර්ම සාගර විලොළන කෘණ මෙරු මන්ථ වූ සවාමිනි නාගසෙන සථවිරයන් වහන්ස! ගිහි වූ එ හෙ සින් ම අගාරික වූ අගාරික හෙයින් ම කාමභොගී වූ සත්වයෝ සාන්ත වූ පරමාර්ථ වූ නිර්‍වාණ ය සාක්ෂාත් කෙරෙත් නම්, මේ ධුතාඞ්ගයෝ කවර අර්ථයක් සාදන්නාහු ද? ඒ කාරණයෙන් ධුතාඞ්ගයෝ අකෘත්‍යකරයෝ නම් වෙති. ක්‍රියාවක් සාදා දෙන්නාහු නොවෙති. ඉදින් සවාමි වූ නාගසේන සථවිරයන් වහන්ස! මන්ත්‍ර යක් හෝ ඖෂධයක් හෝ නැති ව ව්‍යාධිහු උපසමන ය වෙත් නම් වමන විරේචනාදී ශරීර දුර්‍බල කරණයෙන් ප්‍රයෝජන කවරේ ද?

ඉදින් මිටින් ගසා නිග්‍රහ කොට හැකි ප්‍රතිශත්‍රුන්ට අසි සත්ති ශර ධනු කොදඬු ලගුල මුද්ගරයන් ගැන්මෙන් ප්‍රයෝ ජන කවරේ ද? ඉදින් ගණ්ඩි කුට්ඨ සූසීර කට්ඨ ලතා සාඛායෙහි සැප සේ එල්ලී යන්නට හැකි වූ වෘක්ෂයට දිඹී වූ දැස වූ හිනි මන් සෙලීමෙන් ප්‍රයෝජන කවරේ දැ යි යනාදීන් උපමා සහිත කොට කියා, සවාමිනි! එ පරිද්දෙන් ම කාමභෝගිහු ශාන්ත වූ පරමාර්ථ වූ නිර්‍වාණ ය සාක්ෂාත් කෙරෙත් නම් ධුතාඞ්ග සමාදාන යෙන් ප්‍රයෝජන කවරේ දැ යි විවාළේ ය.

එසේ විමාළ මිලිඳු මහරජහට ශ්‍රී ඝන ශ්‍රී ශාක්‍යසිංහ ප්‍රවර ශාසනානිලපථ සරද සිසිරකර නිර්විශෙෂ වූ නාගසෙන සථවිර යන් වහන්සේ· "අථඛ්විසති බො පනිමෙ මහාරාජ ධුතගුණා. යථා භුඩිවගුණෙහි ධුතඞහානි සබබබුද්ධානං පිහිතානි පසිතානි"යි.

යනාදින් ධුතාඞහ සෙවන ය සියලු බුද්ධාදින් විසින් ප්‍රාඝිතා කිරීම් ආදි වූ අටවිසි ගුණයක් ඇති පරිදි දක්වා වදාරා මත්තෙහි-

යෙ බො තෙ මහාරාජ! ධුතගුණෙ සම්මා උප සෙවන්ති තෙ අථාරසහි ගුණෙහි සමුපෙතා භවන්ති. කතමෙහි අථාරසෙහි? චාරො තෙසං සුවිසුද්ධො හොති. පවිපදා සුපූරිතා හොති. කායිකා වාචසිකා සුරක්ඛිතා හොති. මනො සම්චාරො සුවිසුද්ධො හොති. විරියං සූපගහිතා හොති. භයං වූපසම්මති. අත්තානුදිට්ඨිං ව්‍යපගතා හොති. අඤතො උපරතො හොති. මෙත්තා උපට්ඨිතා හොති. ආහාරෙ පරිඤඤතො හොති සබබසත්තානං ගරුකතො හොති. නොජනෙ මත්තඤඤූ හොති. ජාගරියං අනුයුත්තො හොති. අනිකෙතො හොති යත්ථ ඵාසු තත්ථ විහාරී හොති. පාප ජෙගුච්ඡි හොති. විවෙකාරාමෙ හොති. සතතං අපපමත්තො හොති. යෙ තෙ මහාරාජ ධුතගුණෙ සම්මා උප සෙවන්ති, තෙ ඉමෙහි අථාරස ගුණෙහි සමුපෙතා භවන්ති-යි.

යනුවෙන් මහරජ! මේ ධුතාඞහයන් යම් කෙණෙක් මනා කොට සෙවන ය කෙරෙත් නම්, ඔහු අටළොස් ගුණයකින් සමුපෙත වෙති. කවර නම් අටළොස් ගුණයකින් ද යත්? ඒ ධුතාඞහ ධරයන්ගේ චාර ය සුවිසුද්ධ වෙ යි. ප්‍රතිපත්ති ය මනා කොට පිරුවා නම් වෙ යි. කාය වාක් දෙක රක්ෂිත වෙ යි. මනස්සමා චාර සුවිසුද්ධ වෙ යි. වීර්‍ය්‍ය ය මනාකොට පටන්ගන්නා බැවින් සුපගෘහිත වෙ යි. භයව්‍යපශමන වෙ යි. ආත්මානුදෘෂ්ටි ය ව්‍යප ගත වෙයි. අඤත ය උපරත වෙ යි මෛත්‍රී භාවනා ව උපසථිත වෙ යි. ආහාර ය පරිඤඤත වෙ යි. සියලු සත්වයන් විසින් ගරු කට යුතු වෙයි.

නොජනයෙහි පමණ දන්නා ලැබෙ යි. නිදි දුරුකිරීමෙහි අනුයුක්ත වෙ යි. අනිකෙත වෙ යි. යම් තැනක ඵාසු නම් එතැන්හි සැප සේ වසනු ලැබෙ යි. පාපයට ජිගුප්ඡා කරනු ලැබෙ යි. විවෙකයෙහි ඇලුම් ඇති වෙ යි. නිරන්තරයෙන් අප්‍රමාද වෙ යි. මහ රජ! යම් කෙණෙක් ධුතාඞහයන් මනා කොට සෙවන ය කළාහු වූ නම්, ඔහු මේ අටළොස් ගුණයෙන් සමුපේත වෙති යි වදාරා මත්තෙහි ඒ ධුතාඞහ පූරණයට සුදුසු පුද්ගලයන් දක්වන සේක්-

දස ඉමෙ මහාරාජ! පුග්ගලා ධුතගුණාරහා කතමේ දස? සද්ධා හොති. හිරිමා ඨිතිමා අකුහෝ අත්ථවසි අලොලා සික්ඛා කාමෝ දළ්හසමාදානෝ අනුජ්ඣානබහුලෝ මෙත්තා විහාරී, ඉමේ ඛෝ මහාරාජ දසපුග්ගලා ධුතගුණාරහා-සි.

යනුවෙන් මහරජ්ජූරුවෙනි! ධුතාඞ්ගපූරණයට යොග්‍ය වූ පුද්ගලයෝ දසදෙනෙක. ඔහු කවුරු ද යත්? අවංක වූ ශ්‍රද්ධා ව ඇත්තේ වේ ද, පාපයෙහි ලජ්ජා ඇත්තේ වේ ද, ධෛර්‍යයෙන් සම් පන්න වේ ද, කොහොම් කම් නැත්තේ ද, අල්ප වශී වූයේ ද, රාහුල තෙරුන් සෙයින් ශික්ෂාකාමී ද, හෙවත් හබ ඇට පමණ වරද කොට පණවා සේ දෙසූ ශික්ෂාපද ය ද මිහමෙර සේ සිතා.

යම් සේ ආතුරයෙක් කරුණා ඇති වෛද්‍යවාසභයන්හු මේ නොකව මේ නොබොව යනාදීන් ප්‍රතික්ෂේප කළ සියල්ල දුරු කොට මේ කව මේ බොව යනාදීන් කී සියල්ල පිළිගණී ද එ පරිද්දෙන් ම භගවත්හු විසින් මේ කරව මේ නොකරව යනාදීන් පැණ වූ ශික්ෂාපද ය මුදුණෙන් පිළිගෙණ රක්නා කැමැති හෙයින් ශික්ෂාකාමී වේ ද, බොල් ගොඩෙහි හිඳුවන ලද දණ්ඩක් සේ නොඉපිළී මනාකොට විදුරු පොළොව කැණ හිඳුවන ලද ටැඹක් සේ අෂ්ටලෝක ධර්මයෙන් හා ලොභ දෝෂාදි ය කරණකොට ගෙණ තමාගේ සමාදාන ය නො බිඳීමෙන් දැඩ වේ ද, සමාදාන ය ඇත්තේ වේ ද, දුටු දුටු වරද කිපීමෙන් වෙහෙස නොව අනුජ්ඣාන බහුල වේ ද, කල්‍යාණ පාප ජනයන් කෙරෙහි සම සෘතු දයක වූ සිහිල් ජලයක් සේ සියලු හිතාහිත භාවයන් කෙරෙහි පතළ කරුණා ඇති හෙයින් මෛත්‍රීවිහාරී ව වෙසේ ද, මහරජ්ජූරුවෙනි! මේ දස ගුණයෙන් සමන්විත වූ මෙම පුද්ගලයෝ ධුතාඞ්ග පූරණයට සමර්ථ බැවින් යෝග්‍යවන්නාහු ය සි වදුරා තදුභතරයෙහි දු-

යෙ තෙ මහාරාජ ගිහී අගාරිකා කාම භොගිනෝ සන්තා පරමත්ථං නිබ්බාණං සච්ඡි කරොන්ති. සබ්බෙ තෙ පුරිමාසු ජාතිසු තෙරාසු ධුත ගුණෙසු කතූපාසනා කතහුම්කම්මා තෙ තත්ථ චාරඤ්ඤ පටිපත්තිඤ්ඤ සොධයිත්වා අජ්ජතග්ගෙ ගිහි යෙව සන්තා සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡි කරොන්ති. යථා මහාරාජ කුසලෝ ඉස්සත්ථෝ අන්තෙ වාසිකෙ, පඨමං තාව ඵලූපාසන සාලා ය චාප භෙද චාපාරොහණ මුට්ඨිපතිපීළන අඞ්ගුලි නාමන පාද ඨපන සරගහණ සන්ධානහණ ආකඩ්ඪන සඞ්ගාරන ලක්ඛ නියමන ඛිපණෙ, තීනපුරිසක ඡකණ තිණපලාල මත්තිකාපුඤ්ඤ ඵලක ලක්ඛවෙධෙ, අනුසික්ඛාපෙත්වා රඤ්ඤෝ සන්තිකෙ උපාසනං ආරුඨයිත්වා ආජඤ්ඤ රථ ගජ තුරග ධන ධඤ්ඤ හිරඤ්ඤ සුවණ්ණ දූසි දස හරිය ගාමවරං ලභන්ති.

එව මේව බො මහාරාජ යෙ තෙ ගිහි අගාරිකා කාම හොගිනො සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකරොන්ති, තෙ සබ්බෙ පුරිමාසු ජාතිසු තෙරසසු ධුතගුණෙසු කතූපාසනා කතභූමිකම්මා තෙ තත්තෙව වාරසඳව පටිපත්තියඳව සොධයිත්වා අජ්ජතරහි ගිහි යෙව සන්තාසන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකරොන්ති. න මහා රාජ ධුතගුණෙසු පුබ්බාසෙවනං විනා එකිස්සා යෙව ජාතියා අරහත්තා සච්ඡිකිරියා හොති-සි.

යනුවෙන් මහරජ්ජුරුවෙනි! ගිහි වූ අගාරික වූ කාමභෝගී වූ සත්වයෝ සාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණ ය සාක්ෂාත් කෙරෙද් ද ඒ සියල්ල ම පූර්ව ජන්මාන්තරවල තෙළෙස් ධුතාඞ්ගයන් කෙරෙහි කරණ ලද අභ්‍යාස ඇති, කරණ ලද වාසනා භූමික්‍රියා ඇති, ඒ සත්වයෝ එනි ම චාරය ද ප්‍රතිපත්ති ය ද සොධා දැන් මේ කාලයෙහි ගිහිව සිට ශාන්තාති ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණ ය සාක්ෂාත් කෙරෙති.

තව ද - මහරජ්ජුරුවෙනි! යම් සේ දක්ෂ වූ ධනුර්ධර තෙමේ ප්‍රථමයෙන් අභ්‍යාස්සන් විදමින් උගන්නා ශාලාවෙහි දී ධනුප්‍රහෙදයෙහි ද දුනුදිය බැමෙහි ද හෙවත්, දුනු ඇටවීමෙහි ද දුනුමිට ගැන්මෙහි ද එම දුන්න මිටින් දැඩි කොට ගැන්මෙහි ද ඇඟිලි නැමීමෙහි ද පය තිබ්මෙහි ද හිය ගැන්මෙහි ද දුනුදිය සැර බැහි මෙහි ද දුනු ඇදීමෙහි ද ඇද සිටීමෙහි ද ලක නියම කොට ශර ප්‍රේරණය කිරීමෙහි ද පුරාණාකාර වූ පඞ්රූප ය ගොම වැරටි ය තාණ කැරලි ය මැටිපිඬු ය පෝරුව ය යන ලක් විදීමෙහි ද හික්මිවා නැවත රජුගේ සම්පයෙහි ශිල්ප දක්වා සිත් ගෙණ රථ ගජ තුරග ධන ධාන්‍ය හිරණ්‍ය සුවර්ණ දාසි දාස භාර්‍යා ග්‍රාමවරාදිය ලබන්නේ වේ ද,

එ පරිදෙන් ම මහරජ්ජුරුවෙනි! යම් ගිහි වූ අගාරික වූ කාමභොගී වූ සත්ව කෙණෙක් ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණ ය සාක්ෂාත් කෙරෙත් නම් ඒ සියල්ලෝ ම පූර්ව ජන්මානන්තර වල තෙළෙස් ධුතගුණයන් කෙරෙහි කරණ ලද අභ්‍යාස ඇත්තාහු කරණ ලද වාසනා භූමික්‍රියා ඇත්තාහු පූර්වයෙහිදී ම චාරය ද ප්‍රතිපත්ති ය ද සුද්ධ කොට දැන් මේ කාලයෙහි ගිහි භාවයෙහි ම සිට ශාන්තාති ශාන්ත වූ පරමාර්ථ වූ නිර්වාණ ය සාක්ෂාත් කෙරෙති.

තව ද- මහරජ්ජුරුවෙනි! ධුත ගුණයන් කෙරෙහි පෙර අභ්‍යාසයක් නැති සත්වයන්ට එක ජාතියෙහි ම අර්හත්ව ය සාක්ෂාත් වන්නේ නොවෙ සි වඳුරා සදෘකාලයෙහි ම අක්ෂය වන ජල ඇති ආකාශ ගඞ්ගා ව සේ අක්ෂය වන ප්‍රඥාවක් ඇති නෙසින් තදුත්තර යෙහි දු-

උත්තමේන පන විරියෙන උත්තමාය පටිපත්තියා තථා රූපෙන ආචරියෙන කල්‍යාණ මිත්තෙන අරහත්තං සච්ඡිකිරියා හොති. යථා වා පන මහාරාජ නිසභෙකා සල්ලකත්තෝ ආචරියං ධනෙන වා වත්තපටිපත්තියා වා ආරාධෙත්වා සත්ථ ගහණ ඡේදන ලෙඛන වෙධෙන සල්ලුද්ධරණ වණධොවන සොසන තෙසජ්ජානු ලිම්පන වමන විරෙචනානුවාසන කිරියමනුසික්ඛිත්වා විජ්ජාය කත සිකෙඛා කතූපාසනෝ කතහත්ථෝ ආතුරෙ උපසඞ්කමිත්වා නිකිච්ඡාය.

එව මෙව ඛෝ මහාරාජ යෙ තෙ ගිහි අගාරිකා කාමි හොගිනෝ සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකරොන්ති. තෙ සබ්බෙ පුරිමාසු ජාතිසු තෙරසසු ධුතගුණෙසු කතූපාසනා කතහත්ථකම්මා. තෙ තත්ථෙව චාරඤ්ච පටිපත්තිඤ්ච සොධෙත්වා අජ්ජතග්ගෙ ගිහියෙව සන්තා, සන්තං පරමත්ථං නිබ්බාණං සච්ඡිකරොන්ති. න මහාරාජ ධුතගුණෙහි අවිසුද්ධානං ධම්මාභිසමයෝ හොති. යථා මහාරාජ උදකස්ස අසෙචනෙන බීජානං විරුහනං න හොති, එව මෙව ඛෝ මහාරාජ ධුතගුණෙහි අවිසුද්ධානං ධම්මාභිසමයෝ න හොති. යථා වා පන මහාරාජ අකත කුසලානං අකතකල්‍යාණානං සුගති ගමනං න හොති, එව මෙව ඛෝ මහාරාජ ධුතගුණෙහි අවිසුද්ධානං ධම්මාභිසමයෝ න හොති.

යනුවෙන්, මහරජ්ජුරුවෙනි! උතුම් වූ ප්‍රතිපත්තියෙන් මෙ බඳු වූ ආචාර්‍යියන් සරණ කොටගෙණ කල්‍යාණ මිත්‍රයන් කරණකොට ගෙණ නිර්‍වාණය සාක්ෂාත් කට යුතු ය. යම් සේ මහරජ්ජුරුවෙනි! හිසකෙස සල්ලකතා තෙමේ ධනයෙන් හෝ පිලිවෙතින් හෝ ආචාර්‍යින් සිත්ගෙණ ශස්ත්‍ර ග්‍රහණ ඡේදන ලෙඛන වෙධන සල්ලෝද්ධාරණ වූණ ධොවන සොසන ගෙහෙජ්ජානුලිම්පන වමන විරෙචනානුවාසන ක්‍රියාවෙහි මනා කොට හික්ම හැම වෛද්‍යයෙහි ම සුකාතශික්ෂා ඇතා වූ එ හෙයින් ම කරණ ලද අභ්‍යාස ඇති ව කාතහස්ත වූයේ ආතුර යන් කරා චිකිත්සාවට එලඹෙන්නේ ද?

එ පරිද්දෙන් මහරජ්ජුරුවෙනි! ගිහි වූ අගාරික වූ කාම හොගී වූ යම් ඒ සත්ත්වයෙක් ශාන්ත වූ පරමාර්ථ වූ නිර්‍වාණය සාක්ෂාත් කෙරෙත් නම් ඒ සියලු සත්ත්වයෝ ම පූර්‍ව ජන්මාන්තර වල්හි තෙළෙස් ධුතගුණයන් කෙරෙහි කරණ ලද අභ්‍යාස ඇති ව කරණ ලද වාසනා භූමි ක්‍රියා ඇති ව ඒ සත්ත්වයෝ එහිදී ම චාරිත්‍රය ද ප්‍රතිපත්තිය ද සුද්ධිකොට ගෙණ දැන් මේ කාලයෙහි දී පැවිදි නො වූව ද පූර්‍ව පුණ්‍යානුභාවයෙන් ගිහි ව සිට ම ශාන්තානි ශාන්ත වූ පරමාර්ථ වූ නිර්‍වාණය සාක්ෂාත් කෙරෙති. මහරජ්ජුරුවෙනි! ධුතගුණයෙන් පිරිසිදු නො වූ සත්ත්වයන්ට ධර්‍මාභිසමය

වන්නේ නො වෙයි වදුරා ඊට කාරණා දක්වන සේක් යම් සේ මහරජ්ජුරුවෙනි! ජලයාගේ සෙවන ය නො කිරීමෙන් බීජයන්ගේ පලනැති ම නො වේ ද, එ පරිද්දෙන් ම මහරජ්ජුරුවෙනි! ධුතගුණ යෝ පිරිසිදු නො වූ සත්‍වයන්ට ධර්මානිසංස නොවෙ සි.

තව ද- යම් සේ හෝ මහරජ්ජුරුවෙනි! නො කරණ ලද කුසල ධර්මයන් ඇති නො කරණ ලද කල්‍යාණ ධර්මයන් ඇති සත්‍වයන්ට සුගති ගමනෙක් නැද් ද, එ පරිද්දෙන් ම මහ රජ්ජුරු වෙනි! ධුතාඞ්ග සූරණ ය කොට ඒ ගුණ නැමැති පිරිසිදු ජල යෙන් කෙලෙස් නැමැති මල පිරිසිදු නො කළ සත්‍වයන්ට ධර්මානි සර්ය නො වන්නේ සි නෙවන් නිවන් සිද්ධනො වෙ සි. වදුරා තදුත්තරයෙහි ධුතාඞ්ගානිසංස දක්වා වදුරන්නා වූ ප්‍රවර සුවිසුද්ධ ප්‍රඥාඞ්ගාප්‍රවාහයෙන් සකල සනරාමර ලොකයා විසින් විවාරණ ලද ප්‍රශ්න නැමැති වත්තින් නිර්ගාපණයට සමර්ථ වූ නාගසේන සථවිරයන් වහන්සේ-

චාතුර්මහාරාජිකාදී සදිව්‍යලොක ය හා ඡොඩශවිධ බ්‍රහ්ම ලොක ය ආදර්ශ තලයකින් දක්වන්නා සේ, මේර මුදුණට ගෙණ ගොස් සතර මහාද්වීප ය දක්වන්නා සේ, හිමවතට ගෙණ ගොස් මහ දඹ රුක ආදී වූ සියලු හිමාල විස්තර ය දක්වන්නා සේ, සතර මහා සාගරයෙහි පැන් ඉවත් කොට සියලු රුවන් ආකරයන් දක්වන්නා සේ, පෘථිවි ය පෙරලා ආකරසහිත වූ නිධා නයන් දක්වන්නා සේ, මේරු මන්ඩ ය ගෙණ මහා සමුද්‍ර ය අලලා දමා නගා අනුභව කරන්නා සේ, ප්‍රයෝපචිත කුසල බලයෙන් නිපන් ප්‍රඥා නැමැති මේරුමන්ඩ ය ගෙණ ත්‍රිපිටක ධර්ම නැමැති සාගරයෙහි බහා අලලා රජහු විසින් පුළුවුස්නා ලද ධුතාඞ්ග ප්‍රශ්නයට අනුකූල වූ ධුතඞ්ගානිසංස නැමැති අමා ගෙණ රජහු ගේ කුකුස් නැමැති සා පිපාස සන්හිඳුවන සේක්.

පඨවි සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං පතිට්ඨථෙන, ආපෝ සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං සබ්බකිලෙස මලධොවනථෙන, තෙජෝ සමං මහාරාජ ධුතගුණං විසුද්ධි කාමානං සබ්බකිලෙස වනඩ්ඩහනථෙන, වායෝ සමං මහාරාජ ධුතගුණං විසුද්ධි කාමානං සබ්බ කිලෙස රජෝපවාහනථෙන, අගද සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං සබ්බකිලෙස ව්‍යාධි වූප සමනථෙන, අමත සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං සබ්බකිලෙස විනාසනථෙන, ඛෙත්ත සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං සබ්බ සාමඤ්ඤ ගුණස්ස විරුහනථෙන, මනොහර

සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං පඤ්ඤිච්ඡිත සබ්බ සම්පත්තිවර දදථෙන, නාවාසමං මහාරාජ ධුතගුණං විසුද්ධිකා මානං සංසාර මහණ්ණව පාරගමිනථෙන.

ජිරුත්තාන සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං ජර මරණ ජිරුතානං අසසාස කරනථෙන, මාතු සමං මහාරාජ ධුත ගුණං විසුද්ධිකාමානං කිලෙස දුකඛ පතිපීලිතානං අනුගහාතක ථෙන, පිතු සමං මහාරාජ ධුත ගුණා විසුද්ධිකාමානං කුසලවඩ්ඩි කාමානං සබ්බ සාමඤ්ඤගුණ ජනකථෙන, මිත්ත සමං මහාරාජ ධුත ගුණං විසුද්ධිකාමානං සබ්බ සාමඤ්ඤ ගුණ පරියෙසනං අවිසංවාදක ථෙන, පදුම සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං සබ්බ කිලෙස මලෙහිඅනූපලිත්තතථෙන, චතු ජාතිය වරගන්ධ සමං මහාරාජධුත ගුණං විසුද්ධිකාමාන්ං කිලෙස දුගන්ධ පටි විනොදනථෙන, ගිරිරාජ සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං අට්ඨලොක ධම්මෙ වානෙහි අකම්පියථෙන.

ආකාස සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං සබ්බත්ථ ගහ ණාපගත උරුවිසට විත්ථත මහන්නථෙන, නදිසමං මහාරාජ ධුතගු ණා විසුද්ධිකාමානං කිලෙසමල පවාහනථෙන, සුදෙසික සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං ජානිකන්තාර කිලෙස වන ගහණ නිත්ථරණථෙන, මහා සත්ථවාහ සමං මහාරාජධුත ගුණා විසුද්ධිකාමානං සබ්බ භය සුඤ්ඤ - ඛෙම - අනය - වර- නිබ්බාණනගර සම්පාපනථෙන, සුමජ්ජිත විමලාදස සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං සඞ්ඛාරානා සභාව දසසනථෙන, එරක සමංමහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං කිලෙස ලගුල සර සන්ති පටි බාහනථෙන, ජන්තාසමං මහාරාජ ධුතගුණා විසුද්ධිකාමානං කිලෙස වසස නිවිධාහි සන්නාපාත පටිබාහනථෙන, චන්දසමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං පිහයිත පත්ථිතථෙන, සුරිය සමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං මොහ තම නිමීර නාස නථෙන, සාගරසමං මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං අනෙක විධ සාමඤ්ඤ ගුණවර රතනුට්ඨානථෙන, අපරිමිත මසංඛ්‍ය මපපමෙය්‍යථෙන ච,

එව මෙව ඛො මහාරාජ ධුතගුණං විසුද්ධිකාමානං බහූප කාරං සබ්බදරථ පරිළාහනුදං භයනුදං බිලනුදං මලනුදං සොකනුදං දුකඛනුදං රාගනුදං දොසනුදං මොහනුදං මානනුදං දිට්ඨිනුදං සබ්බ කුල ධම්ම නුදං යසාවහං හිතාවහං සුඛාවහං ථාසුකරං පිනිකරං යොගකෙඛම කරං අනවජ්ජං ඉට්ඨසුඛ විපාකං-ති.

යනුවෙන්, මහරජ්ජුරුවෙනි! විසුද්ධි ය යි කියන ලද නිර්වාණ ය කැමති සත්වයන්ට මේ ධුතගුණ ය තෙමේ පිහිට වන අර්ථයෙන් මහා පෘථිවි ය හා සමාන වන්නේ ය. එසේ ම විසුද්ධි කැමති සත්වයන්ගේ කෙලෙස් නැමැති මල සුද්ධිකරණ අර්ථයෙන් පිරිසිදු ජලයක් හා සමාන වන්නේ ය. එසේ ම සියලු කෙලෙස් නැමැති වන ය දවා හරණ අර්ථයෙන් තෙජෝ කඳක් හා සමාන වන්නේ ය. සියලු නිවන් කැමති සත්වයන්ගේ කෙලෙස් නැමැති මල රජස් ගසා හරණාර්ථයෙන් වණ්ඩවාතයක් හා සමාන වන්නේ ය. නිවන් කැමති සත්වයන්ගේ සියලු කෙලෙස් නැමැති ව්‍යාධි උපසමන ය කරණ අර්ථයෙන් මේ ධුතගුණ ය අගදයක් හා සමාන වන්නේ ය. තව ද-

මහරජ්ජුරුවෙනි. මේ ධුතගුණ ය නිවන් කැමති සත්වයන්ගේ කෙලෙසුන් විනාස කරණ අර්ථයෙන් අමෘතයක් හා සමාන වන්නේ ය තව ද මහරජ්ජුරුවෙනි! යමෙක් නිවන් කැමති වී නම් ඒ සත්වයාට මේ ධුතගුණ ය සියලු ශ්‍රාමණ්‍ය ගුණ විරූහ නාර්ථයෙන් ක්ෂේත්‍රයන් හා සමානවන්නේ ය. තව ද මහරජ්ජුරුවෙනි! මේ ධුතගුණ ය මනෝහර ය යි කියන ලද චින්තා මාණික්‍ය යන් හා සමාන වන්නේ ය. විසුද්ධි කැමැත්තාවුන්ට සිතූ පැතූ සම්පත්ති වර දදනාර්ථයෙනි. තව ද මහ රජ මේ ධුතගුණ ය විසුද්ධි කැමැත්තවුන්ට නැවක් හා සමාන වන්නේ ය. සංසාර මහාර්ණවයෙන් එතරවන අර්ථයෙනි.

තව ද මහරජ මේ ධුතගුණ ය නිවන් කැමති සත්වයන්ට නිරුත්තාන ය යි කියන ලද භයට සැඟවුණු මහා ස්ථානයක් හා සමවන්නේ ය. ජරාමරණයන්ට අස්වසා ප්‍රතිෂ්ඨාවන අර්ථයෙනි. තව ද මහරජ මේ දුහ පූරණ ය නිවන් කැමති සත්වයන්ට ප්‍රෙම භරිත මාතෘවක් හා සමවන්නේ ය. කවර අර්ථයකින් ද? කෙලෙස් දුකින් ප්‍රතිපීඩිත සත්වයන්ට අනුග්‍රහ කරණ අර්ථයෙනි. තව ද මහරජ මේ ධුතාඞ්ගසෙවන ය විසුද්ධිකාමයන්ට පිතා කෙණෙකුන් හා සමවන්නේ ය. කවර අර්ථයකින් ද කුසල් වඩනු කැමති සත්වයන්ට සියලු ශ්‍රාමණ්‍ය ගුණ ජනකාර්ථයෙනි.

තව ද මහරජ මේ ධුතගුණ ය නිවන් කැමති සත්වයන්ට මිත්‍රයෙකු හා සමවන්නේ ය. කවර අර්ථයක්ින් ද සියලු ශ්‍රාමණ්‍ය ගුණ පයෝසනයට අවිසංවාදනාර්ථයෙනි. තව ද මහරජ මේ ධුතාඞ්ග පූරණ ය නිවන් කැමති සත්වයන්ට සුදුමයක් හා සමවන්නේ ය. කවර අර්ථයකින් ද සියලු කෙලෙස් නැමැති මලෙහි අනුපලිත්තා ර්ථයෙනි. තව ද මහරජ මේ ධුතගුණ ය නිවන් කැමැත්ත වුන්ට සිව් දෑ ගද සමවන්නේ සි. කවර අර්ථයකින් ද කෙලෙස් දුගී භාවයන්ගේ ප්‍රහීනෝදනාර්ථයෙනි.

තව ද-මහරජ! විසුද්ධිකාමයන්ට මේ ධුතගුණ ය පථිනයක් හා සම්වන්නේ ය. කවර අර්ථයකින් ද ලාභ ය අලාභය යනාදි අෂ්ට ලොක ධම් නැමැති වාතයෙන් අකම්පාර්යෙති. තව ද මහරජ මේ ධුතගුණ ය විසුද්ධි කාමයන්ට ආකාස ය හා සම්වන්නේ ය. කවර අර්ථයකින් ද සම්වාත ග්‍රහණාපගත උරු විසතත මහන්තාර්යෙති. තව ද මහරජ විසුද්ධි කාමයන් විසින් සෙවුනා ලද ධුතගුණ ය ගඩාවක් හා සම්වන්නේ ය. කෙලෙස් මල පරිසුද්ධි කරණ අර්ථයෙති.

තව ද- මහරජ මේ ධුතගුණය විසුද්ධිකැමැත්තවුන්ට සුදෙසි කයක් හා සම්වන්නේ ය. කවරාර්යකින් ද ජාති කාන්තාර කෙලෙස වන ගහණ නිස්ථරණාර්යෙති. තව ද මහරජ මේ ධුතගුණය මහා සාර්වාහයක් හා සම්වන්නේ ය. කවර අර්යකින් ද නිවන් කැමති සඩයන් සම්නය සූන්‍ය ක්ෂෙම අභය වර ප්‍රවර නිර්ාණ නගර ප්‍රවෙස කරණාර්යෙති. තව ද මහරජ මනාකොට පුරණ ලද මේ ධුතගුණ ය මනාකොට මැද ඔප් නගන ලද ආදුස සංඛ්‍යාන කැඩපතක් හා සම වන්නේ ය. කවර අර්යකින් ද විසුද්ධි කාමයන් ට සම් සංස්කාර යන්ගේ සවභාව දශීනාර්යෙති.

තව ද මහරජ මේ ධුතගුණ ය ඵලකයක් හා සම්වන්නේ ය. කවර අර්යකින් ද විසුද්ධි කාමයන්ට ක්ෂේශ සුල සර සත්ති ප්‍රති ඛානනාර්යෙති. තව ද මහරජ මේ ධුතගුණ ය ඡත්‍රයක් හා සම්වන්නේ ය. ක්ලේශ වර්ෂා ත්‍රිවිධාග්නි සන්තාපාතප ප්‍රතිඛානනාර්යෙති. තව ද මහරජ මේ ධුතගුණ ය ඵලදායා හා සම්වන්නේ ය. කවර අර්යකින් ද විසුද්ධි කාමයන්ට පිහයිත ප්‍රාර්ථිතාර්යෙති. තව ද මහරජ මේ ධුතගුණ ය විසුද්ධි කාමයන්ට තම් නිමිර සාඛ්‍යාත මොහාන්ධකාර ය විනාස කරනාර්යෙන් සාස්‍ර රශ්මීන් ප්‍රතිමණ්ඩිත වූ සූය්‍ර දිව්‍යරාජයා හා සම්වන්නේ ය.

තව ද මහරජ ධුතාඞ්ග පූරණ ය සාඛ්‍යාත ගුණ ය විසුද්ධි කාමියන්ට අනේකවිධ ශ්‍රාමණ්‍ය ගුණ නැමැති උතුම් රත්නයන්ගේ උත්පත්තියට කාරණා හෙයින් ද අපරිමිත අසංඛේය්‍ය අප්‍රමේය්‍යාර්යෙන් ද සාගර ය හා සම්වන්නේ ය. මහරජ මේ ධුතාඞ්ග පූරණ සංඛ්‍යාත ගුණ ය විසුද්ධි ය හි කියන ලද ඒ නිර්ාණ ය කැමැත්තවුන්ට මහෞෂධ උපකාරී වන්නේ ය, සම් දරථ පරිළාහ නසන්නේ ය. හය නසන්නේ ය, ඒ ඒ කැත්හි උපදනා භවය නසන්නේ ය. බිදු නසන්නේ ය. රාගාදි මිල නසන්නේ ය.

සෝක නසන්නේ ය. භයදුක් නසන්නේ ය. රාග නසන්නේ ය. දෝෂ නසන්නේ ය. මෝහ නසන්නේ ය. මාන නසන්නේ ය ය. දෘෂ්ටි නසන්නේ ය. සම්භාකුශල ධර්මයන් නසන්නේ ය. යසඵල වන්නේ ය. ඛීන ඵලවන්නේ ය ඵාසු කරන්නේ ය. ප්‍රීති කරන්නේය යොගක්ෂේම කරන්නේ ය. නිවරදි වන්නේ ය. ඉෂ්ට සුඛ විපාක වන්නේ ය සි. යනාදින් ආකාස ගඞ්ගාව ගෙණ හැර දක්වන්නා සේ, අනෙක ප්‍රකාර ධුතඞ්ගානිසංස දක්වා වදාරා වර්‍ෂාවක් පිට වර්‍ෂාවක් වස්නා සේ, තව ද දැක්වුව මනා තන්නිශ්‍රිතාර්‍ථයන් නැති තෙසින්—

යථා මහාරාජ මනුස්සා උපත්ථම්භ වසෙන භොජනං උපසෙවන්ති හිත වසෙන භෙසජ්ජං උපසෙවන්ති. උපකාර වසෙන මිත්තං උපසෙවන්ති. තාරණ වසෙන නාවං උපසෙවන්ති. සුගන්ධ වසෙන මාලාගන්ධා උපසෙවන්ති. අභය වසෙන භීරුත්තානං උපසෙවන්ති. පතිට්ඨාන වසෙන පථවියං උපසෙවන්ති. සිප්ප වසෙන ආචරියං උපසෙවන්ති. යස වසෙන රාජානං උපසෙවන්ති. කාම දද වසෙන මණි රතනං උපසෙවන්ති. එව මෙව ඛෝ මහාරාජ සබ්බ සාමඤ්ඤ ගුණ දද වසෙන අරිය ධුතගුණං උපසෙවන්ති-සි.

යනුවෙන්, මහරජ්ජුරුවෙනි! යම් සේ මේ ලෝකයෙහි ම මිනිස්‍යයෝ උපත්‍ථම්භ වශයෙන් භොජන ය සේවන ය කෙරෙද් ද, හිත වශයෙන් භෙෂජ්‍ය ය සෙවන ය කෙරෙද් ද, උපකාර වශයෙන් මිත්‍රයන් සේවන ය කෙරෙද් ද, එතර වීම් වශයෙන් නෞකා සෙවන ය කෙරෙද් ද, සුවඳ පිණිස මාලා ගන්ධයන් සෙවන ය කෙරෙද් ද, අභය පිණිස භීරුත්තාන සෙවන ය කෙරෙද් ද, පිහිට පිණිස පෘථිවි ය සෙවන ය කෙරෙද් ද, ශිල්ප පිණිස ඇදුරන් සෙවන ය කෙරෙද් ද, යස පිණිස රජදරුවන් සෙවන ය කෙරෙද් ද, කැමති කැමති වසතු ලැබෙන පිණිස චින්තාමණික්‍යයන් සෙවන ය කෙරෙද් ද, එ පරිද්දෙන් ම මහරජ සියලු ශ්‍රමණ ගුණ ලැබෙනු පිණිස ආර්‍යයෝ ධුතාඞ්ග සෙවන ය කෙරෙති. සි වදාරා, තදුත්තරයෙහි දු කාරණා දක්වන්නාහු සම්භාවිත විමලප්‍රඥ ගුණරත්න නිධි නිර්විශෙෂ නාගසෙන සථවිර සන් වහන්සේ—

යථා වා පන මහාරාජ උදකං බීජ විරුහනාය, අග්ගි ඣාපනාය, ආහාරෝ බලහරණාය, ලතා ඡේදනාය, සත්ථං ඡේදනාය, පානීයං පිපාසා විනාසනාය, නිධි අසාසකරණාය, නාවා තීර සම්පාපනාය, භෙසජ්ජං ව්‍යාධි වූපසමනාය, යානං සුඛගමනාය, භීරුත්තානං භය විනොදනාය, රාජං ආරක්ඛත්තයතාය, ඵලකං දණ්ඩ ලෙඩ්ඩු ලගුල සංරක්ඛනි පටිඝාතනාය, ආචරියෝ අනුසාසනාය, මාතා පොසනාය, ආදාසෝ ඔලොකනාය, අලංකාරෝ සොභනාය, වත්ථං පටිච්ඡාද

නාය, නිසෙසනිං ආරොහනාය, තූලා නිකෙඛපනාය, මනනං පරි ජපනාය, ආවුධං තජජනීය පටිබාහනාය, පදීපො අඛකාර විධ මනාය, වාතො පරිළාහ නිබබාපනාය, සිපපං වුතති නිපපාදනාය, අගදං ජීවිත රකඛණාය, ආකරො රතනුපපාදාය,රතනං අලංකාරාය, ආණා අනතිකකමාය, ඉසසරියං වසවතතනාය.

එව මෙව ඛො මහාරාජ ධුතගුණං සාමඤඤබීජ විරුහනාය, කිලෙස මලඛාපනාය, ඉදධි බල හරණාය, සති සංවර නිඛඛනාය, විමති විවි කිචඡා සමුචෙඡදනාය, තණහා පිපාස විනාසනාය, අනිසයසසාස කාරණාය, චතුරොඝ නිතථරණාය, කිලෙස ව්‍යාධි වූපසමාය, නිබබා ණසුඛ පටිලාභා ය,ජාති ජරා ව්‍යාධි මරණ සොක පරිදෙව දුකඛ දොම නසසූපායාස භය විනොදනාය, සාමඤඤගුණ පරිකඛනාය, අරති කුවිතකකා පටි බාහනාය, සකල සාමඤඤතථානු සාසනාය, සබබසා මඤඤගුණපොසනාය, සමථ විපසසනා මගඵල නිබබාණ දසසනාය.

සකල ලොක ථුත ථොමිත මහනි මහාසොභා කාරණාය,සබබා පාය විදහනාය, සාමඤඤතථ සෙලසිඛර මුදධනි අභිරුහනාය, වංක කුටිල විසම විතතං නිකෙඛපනාය,සෙවිතබබා සෙවිතබබ ධමෙම සාධු සඤඤාය කරණාය, සබබකිලෙස පටිසතතු තජජනාය, අවිජජඛ කාර විධමනාය, තිවිධගහි සනතාප පරිළාහ නිබබාපනාය, සණහ සුඛුම සනති සමාපතති නිපථාදනාය, සකල සාමඤඤගුණ පරිඛනාය, බොජඣංග වර රතනුපපාදනාය, යොනී ජනාලංකරණාය, අනවජ ජිත නිපුණ සුඛුම සනතිසුඛුම මනතිකකමනාය, සකල සාමඤඤ අරියධමම වසවතතනාය.

ඉති මහාරාජ ඉමෙසං ගුණානං අධිගමාය යදිදං එකමෙකං ධුතගුණං එව මහාරාජ අතුලියං. ධුතගුණං, අපපමෙයයං, අසමං, අපපටිසමං, අපපටිභාගං, අපපටිසෙඨං, උතතමං, සෙඨං, විසිටඨං, අධිකං, ආයතං, පුථුලං, විසටවිතථතං, ගරුකං භාරියං, මහනතං—සි.

යතුවෙන්, මහරජ යම් සේ නෝ උදක ය ඛිජයන්ගේ වැපි රීම් පැල නැගීම් පිණිස වේ ද, වහ්නි ය සියල්ල දැවීම් පිණිස වේ ද, ආහාර ය සියල්ලවුන්ගේ බල ය ගෙණහැර දෙන පිණිස වේ ද, ලතාජාති ය බැඳීම් පිණිස වේ ද, ශස්ත්‍ර ය කැපීම් පිණිස වේ ද, පැන් පිපාස නැසීම ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, නිධාන ය ඒ ඒ සැලට අස්වැසීම ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, නෞකා තොමෝ ගංගාදීන් එතරවීම ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද,

භෛෂජ්‍ය ය ව්‍යාධි ව්‍යුපසමන ය ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, රථ ඵෙලි ආදි යානා ව සැප ගමන් ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, නිරාතඞ්ක ය භය නැසි ම ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද.

නරදෙව් රජ තෙම ලෝක ශාන්තයට ආරක්ෂා ව ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, එළක ය දණ්ඩාදි ය ප්‍රතිබාහන ය ප්‍රයෝජන කොට ම වේ ද, ආචාර්‍ය්‍ය තෙව අනුශාසනා ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, මාතෘතොමෝ පුත්‍රයන් පොෂ්‍ය ය කිරීම ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, කැටපත බැලීම ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, අලංකාර සංඛ්‍යාත සැරහිම් පොහොව ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, විසත්‍ර ය අඞ්ගජාතාදි ය දැසීම් ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, නිසෙසනි ය සි කියන ලද හිනි මඟ ප්‍රාසාදාදියට නැඟීම් ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, තුලාව නික්ෂේපන ය ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද.

මන්ත්‍ර ය ජප කිරීම් ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, ආයුධ ය තර්ජන ය ප්‍රතිබාහන ය ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, ප්‍රදීප ය අන්ධකාර විධ්වංසන ය ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, ශිල්ප ය වෘත්ති නිෂ්පාදන ය ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, අගද ය සි කියන ලද ඖෂධ ය ජීවිත ය රක්ෂා කිරීම් ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, ආකර ය රත්නයන්ගේ උත්පත්ති ය ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, රත්න ය අලංකාර ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, ආඥ ව භික්මීම් ප්‍රයෝජන කොට ඇත්තේ වේ ද, ඉසුරු බව සියල්ල වසඟවියට පැමිණ වීම ප්‍රයෝජනකොට ඇත්තේ වේ ද.

එ පරිද්දෙන් ම මහරජ! ඉම් ඛුතගුණ නැමැති ජල ය ශ්‍රමණ ගුණ නැමැති බීජයන්ගේ රෝපණ ය පිණිස වෙ සි. ඛුත ගුණ නැමැති වහ්නි ය කෙලෙස් නැමැති මල දවන පිණිස වෙ සි. ඛුතගුණ ය නැමැති ආහාර ය ඍද්ධි නැමැති බල ය හොන දෙන පිණිස වෙ සි. ඛුතගුණ නැමැති ලතාව සනිසංවර ය බැඳී ම පිණිස වෙ සි. ඛුතගුණ නැමැති ශස්ත්‍ර ය විවිකිත්සා නැමැති සතුරන්ගේ ඡේද්‍ය ය පිණිස වෙ සි. ඛුතගුණ නැමැති පානීය ය තෘෂ්ණා ව නැමැති පිපාස ය නැසීම් පිණිස වෙ සි. ඛුතගුණ නැමැති නිධාන ය ධම්මානිසමය නැමැති අස්වැසීම් පිණිස වෙ සි. ඛුතගුණ නැමැති නෞකා ව කාමෝඝාදී (වතුරොඝ) සතරගඟ වතුරෙන් නිසටරණ ය පිණිස වෙ සි.

ඛුතගුණ නැමැති භෛෂජ්‍ය ය කෙලෙස් නැමැති ව්‍යාධි ව්‍යුපශමන ය පිණිස වෙ සි. ඛුතගුණ නැමැති යානා ව අරී අටහි මඟින් ගොස් නිර්‍වාණ සුඛ ප්‍රතිලාභ ය පිණිස වෙ සි. ඛුතගුණ

නැමති සීරාහනාත ය ජාති ජරා ව්‍යාධි මරණ සොක පරිදෙව දුක්ඛ දෞර්මනස්‍ය උපායාස නැමැති භය විනෝදන ය පිණිස වෙ සි. ධුතගුණ නැමැති රජතෙම ශ්‍රමණ ගුණයට ආරක්ෂා පිණිස වෙ සි. ධුතගුණ නැමැති ඵලක ය අරහිකුවිතකී නැමැති දණ්ඩා දි ය ප්‍රතිඛාහණ ය පිණිස වෙ සි. ධුතගුණ නැමැති ආචාර්‍යතෙම සමී ශ්‍රාමාණ්‍යාඛ්‍යානු ශාසනා ව පිණිස වෙ සි ධුතගුණ නැමැති මව ශ්‍රමණ ගුණ නැමැති දරුවන්ට පොෂ්‍ය ය පිණිස වෙ සි.

ධුතගුණ නැමැති කැටපත සමථ විදර්ශනා මැණිඵල නිර්‍මා ණ ය දක්වන පිණිස වෙ සි ධුතගුණ නැමැති අලංකාර ය සියලු ලොව වැස්සන් විසින් මහත් කොට කරණ ලද සතුතිප්‍රශංසා නැමැති සොභා ව පිණිස වෙ සි ධුතගුණ නැමැති වසත්‍ර ය සියලු අපාය වැසි ම පිණිස වෙ සි ධුතගුණ නැමැති භික්ෂුමග ශ්‍රාමා ණ්‍යාඛ්‍ය නැමති හෙවත් ශ්‍රමණ අඛ්‍ය නැමැති පර්‍වතයාගේ මුදුනට නැගීම පිණිස වෙ සි. ධුතගුණ නැමැති තුලා ව වංක කුටිල විසම විතත ය නික්ෂෙපන ය පිණිස වෙ සි ධුතගුණ නැමැති මන්ත්‍ර ය සෙවිතව්‍ය‘සෙවිතව්‍ය ධර්‍මයන් මෙනා කොට සඤ්ඣායනා කරණ පිණිස වෙ සි. ධුතගුණ නැමැති ආයුධ ය සියලු ක්ලෙශ නැමැති ශත්‍රූන් තර්ජන ය කොට ප්‍රතිඛාහණ ය පිණිස වෙ සි.

ධුතගුණ නැමති ප්‍රදීප ය අවිද්‍යා නැමැති ජීවිත අන්ධකාර ය විධ්වංශන ය පිණිස වෙ සි. ධුතගුණ නැමැති වාත ය ත්‍රිවි ධාග්නි සන්තාප පරිළාහ නිර්‍වීම පිණිස වෙ සි. ධුතගුණ නැමැති ශිල්ප ය අතිසූක්ෂම වූ සමාපත්ති ඉපදවීම පිණිස වෙ සි ධුත ගුණ නැමැති ඖෂධ ය ශ්‍රාමාණ්‍ය ගුණ නැමැති ජීවිතයා රක්ෂා කිරීම පිණිස වෙ සි ධුතගුණ නැමැති ආකර ය බොධ්‍යඞග නැමැති උතුම් රත්නයන්ගේ උත්පත්ති ය පිණිස වෙ සි. ධුත ගුණ නැමැති රත්න ය යොනී ජනයන්ට හෙවත් නිදන් සොයන ශ්‍රමණයන්ට අලංකාර පිණිස වෙ සි. ධුතගුණ නැමැති ආඥා ව අණවදනදී සැප ය අනති ක්‍රමණ ය පිණිස වෙ සි. ධුතගුණ නැමැති ඉසුරු බව සියලු ශ්‍රාමාන්‍ය ආර්‍යධර්‍මයන් වසඟකිරීමට පමුණුවාගැණීම පිණිස වෙ සි.

මේ සේ මහරජ! මේ ගුණයන්ගේ අධිගම සාධා දීමට එක ම ධුතගුණ ය පොහොසත් වෙ සි. එ හෙයින් ධුතගුණ ය යමක් හා සාදෘශ්‍ය ය නොකොට හැකි බැවින් අතුල්‍ය වෙ සි. පමණ කොට ගත නොහැකි බැවින් අප්‍රමෙය්‍ය වෙ සි. කිසිවක් හා සම් නොවන බැවින් අසම වෙසි. විශෙෂයෙන් ම දෙවෙනි ව මේ ධුතගුණ ය හා සම ගුණ යක් නැති බැවින් අප්‍රතිසම වෙසි. මේ ධුතගුණයෙහි අනුසස් මෙතෙ කැ යි කියා විභාග කොට ගතනොහැකි බැවින් අප්‍රතිභාග වෙ සි. මේ ධුතගුණයට ශ්‍රෙෂ්ඨ දෙයක් නැති බැවින් අප්‍රති ශ්‍රෙෂ්ඨ වෙ සි.

සියලු ගුණ ධර්මයට ඉදිරි ව සිටිනා බැවින් ද ලොකොත්තර ගුණ ය සධාදෙන බැවින් ද උත්තර වෙ සි. සියලු ගුණයනට අග්‍ර හෙයින් ශ්‍රෙෂ්ඨ වෙ සි. සම්ප්‍රකාර ගුණයෙන් යුක්ත බැවින් විශිෂ්ට වෙ සි. සියලු ගුණයට අධිකතර වෙ සි. දීඝ කාලයක් නිවන් පුර යේ සිටුවන බැවින් දෝ හෝ නො හොත්, දිගු සැප ඇති බැවින් ආයත වෙසි. මහත් ගුණ ඇති හෙයින් පෘථුල වෙ සි. යනාදින් ධුතාඞ්ගානිසංස ය දක්වා වදාරා තදුත්තරයෙහි ඒ ධුතාඞ්ගයන් ලාභා දි ය පිණිස පූරණ ය කිරීමෙහි නපුර ගහවන්නා වූ සම්වාද පිසාච නිතකර වජිරපාණි සංකාස වූ නාගසෙන සථවිරයන් වහන්සේ—

යො ඛො මහාරාජ පුග්ගලො පාපිච්ඡො ඉච්ඡාපකතො කුහකො ලුද්ධො ඔදරිකො ලාභකාමෝ කිත්තිකාමෝ අයුත්තො අපපත්තො අනනුච්ඡවිකො අනාරහො අපපතිරූපො ධුතඞ්ගා සමාධිය නි. සො දිගුණ දණ්ඩමාපජ්ජති. දිට්ඨධම්මිකං භිඤ්ඤං ඛිලනං ගරහනං-සි.

යනුවෙන්, මහ රජ්ජුරුවෙනි! යම් පුද්ගලයෙක් වනාහි ලාමක වූ ඉච්ඡා ඇත්තේ එම ඉච්ඡාවෙන් මඩනාලද්දේ කුහක වූයේ ලුබ්ධ වූ යේ ඔදරික වූයේ ලාභ කැමති වූයේ යස කැමති වූයේ කීර්ති කැමති වූයේ එසින් ම ධුතාඞ්ග සේවනයට අයුක්ත හෙයින් ම ගුණයට අප්‍රාප්ත වූයේ නුසුදුසු වූයේ අර්හ නො වූයේ අප්‍රතිරූප වූයේ ධුතාඞ්ග සමාදාන ය කෙළේ වී නම් හෙ තෙම දැඩිගුණ වූ දණ්ඩ ය කට පැමිණෙ සි. ඒ දැඩිගුණ වූ දණ්ඩයන් අතුරෙන් දෘෂ්ට ධර්ම ය සි කියන ලද ඉහලොකයෙහි ඔහුගේ සියලු ගුණ නැසී අනෙක ප්‍රකාර නින්ද, ගර්හාදියට පැමිණෙ සි. මේ එක් දණ්ඩයකි. සම්පරායික ය සි කියන ලද පරලොව ගිය කල්හි—

සතයොජනිකෙ අවීචි මහා නිරයෙ උණ්හ කඩින තත්ත සන්තත්ත අයිජාල මාලකෙ අනෙකවස්ස කොටිසත සහස්සානි උද්ධමධො තිරියං ඵෙන්‍රුදෙහකං සම්පරිවත්තකං පච්චති-.

යනුවෙන්, සියක් යොදුන් පමණ ඇති අනිර්ෂණ වූ කසිණ වූ තප්ත වූ සන්තප්ත වූ ගිනි සිලෙන් ගැවසී ගත් අවීචි මහා නරකයෙහි. ඉපද අනෙකකොටි ශතසහස්‍රයක් මුළුල්ලෙහි උඊර්ධව දිසාභාගයට ද අධො දිසාභාගයට ද සරසට ද පෙරළි පෙරළී පැසෙන්නේ ය. එයින් මිදී නිරුඬාම් තෘෂ්ණිකා නම් ශ්‍රමණ මහාප්‍රෙත ව ඉපද එරුළු වූ කෘෂ වූ උද්ගුමාත වූ අඞ්ගප්‍රත්‍යඞ්ග ඇති ව කපල් වූ ශීර්ෂ ඇති ව පිපාසිත ව විෂ්මගීම රූප ව හග්න කර්ණශ්‍රොත්‍ර ඇති ව ඇසිපිය නො හෙළීමෙන් දල්වන ලද (නෙත්‍ර)

නයන ඇති ව පණුවන් විසින් ගැවසි ගත් ශරීර ඇති ව වාත මුඛයෙහි ඇවිලෙන ගිනිකඳක් සේ ඇතුළත ඇවිලගත් ගින් නෙන් දිලිහි දිලිහි අසරණ ව මහත් දුක්ඛාදියෙන් හඬ හඬා පෘථිවියෙහි මහත් භයානක ශබ්ද පවත්වමින් හැඳිනේ ය සි වදාරා එයට කාරණා දක්වන සේක්—

යථා මහාරාජ කොචි අයුත්තෙනා අපපත්තෙනා අනනුච්ඡවිකෝ අනාරහෝ අපපතිරූපෝ හීණෝ කුජාතිකෝ ඛත්තියානි සෙකෙන අභිසිඤ්චති. සෝ ලභති හත්ථෙච්ඡදං පාදෙච්ඡදං හත්ථපාදෙච්ඡදං කණ්ණෙච්ඡදං නාසෙච්ඡදං කණ්ණනාසෙච්ඡදං බිලඞ්ගථාලිකං සඞ්ඛමුණ්ඩිකං රාහුමුඛං ජෝතිමාලිකං එරකවත්තිකං චීරකවාසිකං එණෙය්‍යකං බලිසමංසිකං කහාපණකං ඛාරාපතච්ඡිකං පලිඝපරිවත්තිකං පලාලපීඨිකං තත්තෙනතෙලෙන ඔසිඤ්චනං සුනඛෙහි ඛාදාපනං ජීවසූලාරොපනං අසිනා සීසච්ඡෙදං අනෙකවිහිතම්පි කම්මකරණං අනුභවති. කිං කාරණං අයුත්තෙනා අපපත්තෙනා අනනුච්ඡවිකෝ අනාරහෝ අපපතිරූපෝ හීණෝ කුජාතිකෝ මහන්තෙන ඉස්සරියෙඨානෙ අත්තානං ඨපෙසි. වෙලං ඤාතෙසි—සි.

යනුවෙන්, මහරජ යම් කිසි අයුක්ත වූ අප්‍රාප්ත වූ අනනුච්ඡවික වූ අනාර්හ වූ අප්‍රතිරූප වූ සම්ප්‍රකාරයෙන් ම රජවීමට නුසුදුසු වූ නීච ජාතියෙක උපන් තැනැත්තෙක් ක්ෂත්‍රියානි ෂෙකයෙන් අභිෂෙකයට පැමිණියේ වී නම් හෙතෙම රජසැපත විඳිනා තබා හස්තච්ඡේදයට ද පාදච්ඡේදයට ද හස්තපාදච්ඡේදය ට ද පැමිණෙ සි. කර්ණච්ඡේදයට ද නාසච්ඡේදයට ද කර්ණ නාස ච්ඡේදයට ද පැමිණෙ සි.

තව ද—**බිලඞ්ගථාලිකා** ය සි කියන ලද ඉස්කබෝල උගුලුවා කාඩිදිය උනුකොට වත්කිරීමට ද **සඞ්ඛමුණ්ඩිකා** ය සි කියන ලද ඉසමිකුයේ වම් ය උගුලුවා බොරළු ගෙණ ඉසෙහි උලා සක් පතක් මෙන් කිරීමට ද **රාහුමුඛ** ය සි කියන ලද හෙණ්ඩුවෙන් මුඛ ය විවෘත කොට පහන්කඩ අවුලුවා මුඛයෙහි බැහිමට ද **ජෝතිමාලිකා** ය සි කියන ලද සියලු ශරීරයෙහි පිළිසිසාරා තෙල් ගල්වා ගිනිඇවිලීමට ද **එරකවත්තිකා** ය සි කියන ලද කටියෙහි පටන් වම් ය උගුලුවා කෙණෙහි වලලුකොට නිබීමට ද **චීරක වාසිකා** ය සි කියන ලද කණමත්තෙහි පටන් වම් ය උගුලුවා ඉහෙහි බහා වැහැරිකොට හැඳවීමට ද **එණෙය්‍යකා** ය සි කියන ලද දෙදන දෙවැලම්පි එක් කොට යපත් ගසා යවුලෙහි හිඳුවා වටකොට ගිනි ඇවිලවීමට ද—

බලිසමංසිකා ය යි කියන ලද බිලියෙහි අමුතා එල්වීමට ද **කාහාපණිකා** ය යි කියන ලද කහවණු සෙයින් ශරීරයෙහි මස් කප කපා හැරීමට ද, **ඛාරාපතච්ඡිකා** ය යි කියන ලද ශරීරයෙහි කෙදිවත් කොටසක්හාර වූ ලුණු ඇඹුල් ආදිය ගැල්වීමට ද, **පලිඝ පරිවත්තිකා** ය යි කියන ලද එක් ඇලයකින් භූමියෙහි සයන ය කරවා කණෙහි යහුල් ගසා එක් කකුලක් ගෙණ වටකොට කර කැවීමට ද, **පලාල පීඨිකා** ය යි කියන ලද ශරීරයෙහි ඇට මස් පොඹකොට පිදුරුබිස්සක් සේ කිරීමට ද, රත් කරන ලද තෙලින් ඉසීමට ද, සුනඛයන් ලවා කෑවීමට ද, දිවස්හුල හිඳුවීමට ද, කඩු වෙන් හිස කැපීමට ද, අනෙක ප්‍රකාර වූ කම් කටුල් අනුභවකිරීම ට ද පැමිණෙන්නේ ය.

ඒ කුමක්නෙසින් ද යත්? අයුතු වූ අප්‍රාප්ත වූ අනනුවජ්ජ වූ අනාර්ය වූ අප්‍රතිරූප වූ හිණ වූ නීච ජාතියෙහි උපන් නා වූ නුසුදුසු වූ ඒ පුද්ගල තෙම මහත් ඉසුරෙහි තමා පිහිට වි ය. මය්‍හාද්ව ඉක්මි වි ය. ඒ කාරණයෙන් මෙ බඳු ව්‍යසන යට ප්‍රාප්ත වි ය. එ පරිද්දෙන් මහරජ යම් කිසි පුද්ගලයෙක් නෙවත්, යම් කිසි ශ්‍රමණයෙක් පාපෙචජ වූයේ ඉච්ඡාවෙන් මඩනා ලද්දේ වූයේ කුහක වූයේ ලුබ්ධ වූයේ ඔදරික වූයේ ලාභ කැමති වූයේ කිරිනි කැමති වූයේ අයුක්ත වූයේ අප්‍රාප්ත වූයේ අන නුවජ්ජවිකා වූයේ අනාර්ය වූයේ අප්‍රතිරූප වූයේ ඉහලෝක ය උදෙසා ධුතාඞ්ග සමාදාන ය කෙළේ නම්, යථොක්ත වූ දවිගුණ ද්‍රව්‍යයට පැමිණෙන්නේ ය යි වදාරා තදුත්තරයෙහි, ධුතාඞ්ග සමාදානයට සුදුසු පුද්ගලයන් හා ඔවුන්ට වන වැඩ ද දක්වන සේක්—

යෝ පන මහාරාජ පුග්ගලෝ යුත්තෝ පයුත්තෝ අනුවජ්ජිකෝ අරහෝ පනිරූපෝ අපචෙජෝ සන්තුට්ඨෝ පවිවිත්තෝ අසංසට්ඨෝ ආරද්ධවිරියෝ පහිතත්තෝ අසඨෝ අමායෝ න ඔදරිකෝ න ලාභකාමෝ න සක්කාරකාමෝ න කිත්තිකාමෝ සද්ධෝ සද්ධාපබ්බජිතෝ ජරාමරණාමුඤ්චිතු කාමෝ සාසනං පග්ගණ්හිස්සාමී'ති ධුතගුණානං සමාදියති. සෝ දිගුණං පූජං අරහති. දෙවානඤ්ච මනුස්සානඤ්ච පියොහොති මනාපෝ පිණයිතෝ පසත්ථෝ—

ජාතිසුමන මල්ලිකාදීනං විය පුප්ඵං නහානානුලිත්තස්ස, ජගච්ඡිතස්ස විය පණීත භොජනං, පිපාසිතස්ස විය සීත විමල සුරභිපාණීයං, විසගතස්ස විය ඔසධවරා, සීඝ ගමන කාමස්ස විය ආජඤ්ඤරථවරාරුහනං, අත්ථකාමස්ස විය මනොහර

මණිරතනං, අනිඝසඤ්ඤිතු කාමස්ස විය පණ්ඩර විමල සෙතච්ඡත්තනං, ධම්ම කාමස්ස විය අරහත්ත ඵලාධිගම මත්තුත්තරං, තස්ස චත්තාරෝ සතිපට්ඨානාභාවනා පාරිපූරිතුං ගච්ඡන්ති චත්තාරෝ සම්ම පධානා චත්තාරෝ ඉද්ධිපාද පඤ්චින්ද්‍රියානි පඤ්චබලානි සත්ත බොජ්ඣඞ්ගානි අරියෝ අට්ඨඞ්ගිකෝ මග්ගෝ භාවනාපාරිපූරිං ගච්ඡන්ති. සමථවිපස්සනා අධිගච්ඡන්ති. අධිගමපටිපත්ති පරිනමති. චත්තාරි සාමඤ්ඤඵලානි චතස්සෝ පටිසම්භිදා තිස්සෝ විජ්ජා ඡළභිඤ්ඤා කෙවලෝ ච සමණ ධම්මෝ සබ්බතස්ස සාධේය්‍යා නොනති. විමුත්තිපණ්ඩර විමල සෙතච්ඡත්තෙන අභිසිඤ්චති-සි.

යනුවෙන් මහරජ යමෙක් වනාහි හෙවත්, යම් පුද්ගලයෙක් ධූතාඞ්ග සෙවනයට ප්‍රයුක්ත ප්‍රයුක්ත වූයේ අනුච්ඡවික වූයේ අර්හ වූයේ ප්‍රතිරූප වූයේ සච්ත්‍රකාරයෙන් ම ධූතාඞ්ග පූරණයට සුදුසු වූයේ අල්පෙච්ඡ වූයේ සන්තුෂ්ට වූයේ විවේකයෙහි ඇලුම් ඇත්තේ කුලෙහි ගෙණෙහි නො ඇලී අසංසට්ඨ වූයේ වඩන ලද වීය්‍ය ඇත්තේ නිවණට මෙනෙයන ලද සිත් ඇත්තේ අසඨ ගුණ ඇත්තේ මායාරහිත වූයේ අනොදරික වූයේ ලාභ කාමනි නො වූයේ යස කාමනි නො වූයේ කිර්ති කාමනි නො වූයේ ශ්‍රද්ධා සම්පන්න වූයේ ශ්‍රද්ධාවෙන් ම පැවිදි වූයේ ජරා මරණයෙන් මිදෙනු කැමැත්තේ දුර්ලභ සසුන් පිළිගනිමි සි සිතා ධූතගුණ සමාදන ය කෙළේ නම් හෙතෙම දිගුණ වූ පූජාවට යොග්‍ය වෙ සි දෙව්යන්ට ද මනුෂ්‍යයන්ට ද ප්‍රිය වෙ සි. මනාප වෙ සි. පිහ සිත වෙ සි ප්‍රාර්පිත වෙ සි.

කෙ බඳු ද යත්? යහපත්කොට ඵලා නහන ලද පුරුෂ යක් හට දෑ සමින් මල්ලිකාදී වූ පුෂ්පයක් මෙන් ද, ක්ෂුධා පීඩිත යක්හට ප්‍රණීත භොජනයක් මෙන් ද, පිපාසිතයක්හට සිහිල් නිමිල සුවඳ පැනක් මෙන් ද, විෂයක්හට උතුම් ඖෂධයක් මෙන් ද, ගමන් කැමැත්තාහට සෛඛවයන් යොදන ලද උතුම් රථ යක් මෙන් ද, වස්තු කැමැත්තක් හට චින්තාමාණික්‍යයක් මෙන් ද, අභිෂෙක කැමැති රජකුමරහට පණ්ඩර විමල ශ්වෙතච්ඡත්‍රයක් මෙන් ද, නිවන් කැමැත්තක්හට අනුත්තර වූ අර්හත් ඵලාදිගම යක් මෙන් ද, සියලු දිව්‍ය මනුෂ්‍යයෝ ඔහු ප්‍රාර්ථනා කෙරෙත්. ඕහට චතුර්විධ සතිපට්ඨාන භාවනාවෝ පාරිපූරිතඛ්බයට යෙති. චතුර්විධ සම්‍යක් ප්‍රධාන ය චතුර්විධ ඍද්ධිපාද ය පඤ්චවිධ ඉන්ද්‍රිය යෝ ය පඤ්චබල ය සප්ත බොධ්‍යාඞ්ගයෝ ය ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග ය යන මොහු භාවනා පාරිපූරිතඛ්බයට යෙති.

සම්‍යක් විදර්ශනාව ද අධිගත වෙයි. අධිගම ප්‍රතිපත්තිය ද පිරිනැමෙයි. චතුර්විධ ශ්‍රාමණ්‍ය ඵලයෝ ද චතුර්විධ ප්‍රතිසම්භිදා ව ද ත්‍රිවිධ විද්‍යා ව ද, ෂට්අභිඥා ව ද, කෙවල ශ්‍රමණ ධර්ම ය ද මේ සියල්ල ම ඔහු ආශ්‍රය කරති. විමුක්ති නැමැති ශ්වේතවර්ණ ත්‍රත්‍රයෙන් අභිෂේක ලබන්නේ ය යි වදාරා ඊට කාරණා දක්වන සේක්, මහරජ! ක්ෂත්‍රිය කුල සඤ්ජාත ව අභිෂේක ලත් යම් ක්ෂත්‍රිය රජුන්ගට යුවරජ අමාත්‍යාදි සියල්ල ම ප්‍රසන්න ව ඔහු පිරිවරා ගනිද්ද එ පරිද්දෙන් ම මහරජ! යුක්ත ප්‍රයුක්ත වූ ධුතඞ්ග සෙවනයට සුදුසු පුද්ගලයෙක් මහත් ප්‍රත්‍යයෙහි ආලය නොකොට ලද දෙයින් සතුටු වන්නේ විවේක කැමති වූයේ කුලෙහි ගෙණෙහි නො ඇලුනේ ආරබ්ධවීර්‍ය්‍ය ඇත්තේ නිවණට මෙහෙයන ලද සිත් ඇත්තේ, අසඨ වූයේ මායා රහිත වූයේ කුස පිරීමෙහි නො යෙදුනේ ලාභකැමති නැත්තේ කීර්ති කැමති නැත්තේ සැදැහැයෙන් මි පැවිදි වූයේ ජරා මරණයෙන් මිදෙනු කැමැත්තේ—

සුදුල්ලභං ලභිත්වාන පබ්බජ්ජං ජිනසාසනෙ,
සීලාදි සඞ්ගහං ඛෙමං එසමිගෙහා විසුද්ධියා.

යනු සිහිකොට දුර්ලභ වූ ශාසන ය පිළිගනිමි යි සිතා ධුතාඞ්ග සමාදාන ය කෙළේ විනම් යට කී සියලු ගුණයෙන් සම්පන්න ව සියලු ශ්‍රමණ ගුණ විසින් පිරිවරණ ලදු ව විමුක්ති නැමැති ශ්වේතවර්ණ ත්‍රත්‍රයෙන් අභිෂේක ලබන්නේ ය යි වදාළ සේක. මේ ආදීන් වදාරා තදුත්තරියෙහි—

තෙරස හි මේ මහාරාජ ධුතඞ්ගානි යෙහි වුද්ධිකතෝ නිබ්බාණ මහාසමුද්දං පවිසිත්වා බහුවිධ ධම්ම කිළමිතිකිළන්ති. රූපාරූප අට්ඨ සමාපත්තියෝ වලඤ්ජන්ති. ඉද්ධිවිධා දිබ්බසොතධාතුං පර චිත්ත විජානනං පුබ්බෙනිවාසානුස්සතිං දිබ්බචක්ඛුං සබ්බාසවක්ඛය ං ච පාපුණන්ති. කතමෙ තෙරස? පංසුකූලිකඞ්ගං, තෙචීවරිකඞ්ගං, පිණ්ඩපාතිකඞ්ගං, සපදානචාරිකඞ්ගං, ඒකාසනිකඞ්ගං, පත්තපිණ්ඩිකඞ්ගං, ඛලුපච්ඡාභත්තික්ඛඞ්ගං, ආරඤ්ඤකඞ්ගං, රුක්ඛමූලිකඞ්ගං, අබ්භොකාසිකඞ්ගං, සොසානිකඞ්ගං, යථාසන්ථතිකඞ්ගං නෙසජ්ජිකඞ්ගං, ඉමෙහි ඛො මහාරාජ තෙරසහි ධුතගුණෙහි පුබ්බෙ ආසෙවිත නිසෙවිතෙහි චිණ්ණෙහි අතිචිණ්ණෙහි චරිතෙහි උපචරිතෙහි පූරිතෙහි පරිපූරිතෙහි කෙවලං සාමඤ්ඤං පටිලභති තස්සාධෙය්‍යා ඛොනති කෙවලා සන්තා සුඛ සමාපත්ති යො—සි.

යනුවෙන් මහරජ! යම් ධුතගුණ ධර්මකෙණෙකුන් විසින් වෘද්ධිකරණු ලබන්නේ නිර්‍වාණ නැමැති මහා සමුද්‍රයට ප්‍රවිෂ්ට ව ධර්ම නැමැති ක්‍රීඩා කරණු ලබන්නේ රූපාරූප අෂ්ටසමාපත්ති

වළඳ ද ඍද්ධිවිධ දිව්‍යශ්‍රොත්‍ර ධාතු පරචිත්ත විජානන ප්‍රභේනි වාසානුසමෘති දිව්‍ය චක්‍ෂු යන මේ ගුණයන් ලැබ සියලු චතුරා ශ්‍රවයන්ගේ ක්‍ෂයකිරීමට පැමිණේ ද එ බඳු ධූතගුණයෝ තෙළෙස්දෙනෙකි. ඔහු කවිරු ද යත්? පාංසුකූලිකඞ්ග ය —පෙ—නෙසජ්ජිකාඞ්ග ය යන මොහු තෙළෙස් දෙන ය.

මහරජ! මේ තෙළෙස් ධූතගුණඃන් කෙරෙහි ප්‍රතියෙනි ආසෙවිත නිසෙවිත වූ පුරුදු කරණ ලද්දා වූ අනිශයින් පුරුදු කරණ ලද්දා වූ චරිත වූ උපචරිත වූ පූරිත පරිපූරිත වූ වහු විසින් සියලු සාමඤ්ඤ ගුණ ය පිළි ලබන්නේ ය. සියලු සාන්ත සුඛ සමාපත්තිහු ඔහු අදහති. නොහොත් සමාපත්ති ආදි ගුණ යෝ ඔහු පිරිවරති. යනාදීන් වදුරා කාරණයක් දක්වන සේක්—

යථා මහාරාජ කස්සකො පඨමං ඛෙත්තදෙසං තිණකට්ඨ පාසාණං අපනෙත්වා කසිත්වා වපිත්වා සම්මා උදකං පවෙසෙත්වා රකඛිත්වා ගොපෙත්වා ලාවන මද්දනෙන බහුධඤ්ඤකො හොති, ඨස්සාධෙය්‍යා භවන්ති යෙකෙචි අධනා කපණ දලිද්‍ර දුග්ගත ජනා. එවමෙව ඛො මහාරාජ! ඉමෙහි තෙරසහි ධූතගුණෙහි ප්‍රුබෙබ ආසෙවිත නිසෙවිතෙහි—පෙ—කෙවලඤ්ඤ වසන්තා සුඛ සමාපත්තියො යථා වා පන මහාරාජ! ඛත්තියො හි මුද්ධාව සිපපතෙනා අභිජාත කුල කුලීනො ඡෙජ්ජ හෙජ්ජ මනුසාසනෙ ඉස්සරො හොති, වසවත්ති සාමිකො ඉච්ඡාකරණෙ කෙවලාව මහාපඨවි තස්සාධෙය්‍යා හොති, එවමෙව ඛො මහාරාජ ඉමෙහි තෙරසෙහි ධූතගුණෙහි ප්‍රුබෙබ ආසෙවිතෙහි නිසෙවිතෙහි චිණෙණහි පරිචිණෙණහි චරිතෙහි උපචරිතෙහි පූරිතෙහි පරි පූරිතෙහි යො හි ජිනසාසනවරෙ ඉස්සරො හොති වසවත්ති සාමි කො ඉච්ඡාකරණෙ කෙවලා ව සමණගුණා තස්සාධෙය්‍යා හොනති-සි.

යනුවෙන්, මහරජ! කස්සක ය යි කියන ලද ගොවි තෙමේ ප්‍රථමයෙන් තෘණකාෂ්ඨ පාෂාණාදී ක්‍ෂෙත්‍ර දෙෂයන් දුරුකොට හා වපුට මනා දිය බැඳ රක්‍ෂිත ගොපිත කොට ලාවන මර්දනයෙන් මැඩ ධාන්‍ය රැස්කොට ධනපති භාවයට පැමිණේ ද එ සේ පැමිණි කල්හි යම් කිසි අධන වූ කෘපණ වූ දිළිඳු වූ දුර්ගත ජනකෙණෙක් ඇද් ද ඒ සියල්ල ම ධනපතිහු අදහද් ද ඔහු කෙරෙහි ප්‍රසන්න ව ඔහු ආශ්‍රය කෙරෙද් ද එ පරිද්දෙන් ම මහ රජ්ජුරුවෙනි! මේ තෙළෙස් ධූතගුණයෙන් පිරිසිදු වූවහු විසින් ම සාමඤ්ඤගුණ ය ලබන්නේ ය. එ කල්හි සමාපත්‍යාදීහු ඔහු කරා පැමිණෙන්නේ ය.

නවද--මහරජ! යම් සේ උත්තම වංශයෙහි උපන් අභිජාතක්ෂත්‍රිය මහරජ තෙමේ වරදට සුදුසු වූ ජේද්‍ය හෙදුදී අනුශාසනයෙහි ඉසුරුබවට පැමිණෙන්නේ ද අනිප්‍රේත කායය්‍යි යක් කිරීමෙහි ප්‍රධාන වේ ද සියලු රටවාසීහු ඔහු වසඟවීයට යෙද්ද, එ පරිද්දෙන් ම මේ තෙළෙස් ධුතගුණයෙන් පෙර පිරිසිදු වූවහු ම මේ සම්බුදුසසුනෙහි අනිප්‍රේත කායය්‍යි කිරීමෙහි ඊර්ෂ්‍යාදිභාවයට පැමිණෙන්නේ ය. සියලු ශ්‍රමණ ගුණධර්මයෝ ඔහු ආශ්‍රය කෙරෙති සි වදාරා නැවත--

මහරජ! ධුතාඞ්ග පූරණයෙහි නියුක්ත වූ **උපසේන** සථවිරයන් වහන්සේ තමන් වහන්සේ හා සමානකොට ධුතගුණයෙන් යුක්ත භික්ෂූන් සමග බුදුන් දක්නට වැඩිකල්හි ලොකනාථ වූ සම්බුදුයන් වහන්සේ අසම්භින්න වූ බ්‍රහ්මස්වරයෙන් "පාසාදිකා බෝ පනත්‍යායං උපසේන පරිසා. කථං හි නාම උපසේන පරිසං විනෙසි"සි-යනුවෙන් උපසේන සථවිරයෙනි! තොපගේ පිරිස වනාහි ඉතා ප්‍රසාදක ය. උපසේන සථවිරයෙනි! තොපි පිරිස කෙසේ භික්ම වූ දැ සි විචාරා වදාළ සේක. දසබල ධාරී වූ සම්බුදුයන් වහන්සේ විසින් විචාරා වදාරණ ලදුව ඒ තෙරුන් වහන්සේ ද තමන් පිරිස භික්ම වූ පරිදි තත් වූ පරිදි දෙන් දක්වන සේක්--

යෝ කොචි මං භන්තෙ උපසංකමිත්වා පබ්බජ්ජං වා නිස්සයං වා යාචති, තමහං එවං වදාමි. අහං බෝ ආවුසෝ ආරඤ්ඤිකෝ පිණ්ඩපාතිකෝ පංසුකූලිකෝ තෙචීවරිකෝ. සචෙ ත්වම්පි ආරඤ්ඤිකෝ භවිස්සසි පිණ්ඩපාතිකෝ පංසුකූලිකෝ තෙචීවරිකෝ එවාහං තං පබ්බාජෙස්සාමීති. නිස්සයං දස්සාමීති. සචෙ සෝ මෙ භන්තෙ පටිසුණාති ඔරමතී එවාහං තං පබ්බාජෙමි. නිස්සයං ච දෙමි. සචෙ න පටිසුණාති න ඔරමති න නං පබ්බාජෙමි. න නිස්සයං දෙමි. එවමෙවාහං භන්තෙ පරිසං විනෙමි සි--

යහුවෙන් සවාමිනි! බුදුරජාණන් වහන්ස! යම් කිසි කෙණෙක් මා කරා එළඹ පැවිදිවීමට හෝ නිස ගන්නට හෝ යාචඤ්ඤ කෙරෙද් ද ඕහට මම මේ සේ කියමි. ආවැන්නි! මම වනාහි ආරණ්‍යකයෙමි පිණ්ඩපාතිකයෙමි, පංසුකූලිකයෙමි, තෙචීවරිකයෙමි, ඉදින් තොපත් ආරණ්‍යක වෙත් නම්, පිණ්ඩපාතික වෙත් නම්, පංසුකූලික වෙත්නම් තෙචීවරික වෙත් නම්, පැවිදි කරවමි සි නිසදෙමි සි කියමි. ඒ අසා රිට සතුටු වෙත් නම් පැවිදි කරමි. නිස දෙමි. ඉදින් ඒ අසා සතුටු නො වෙත් නම් පැවිදි නො කරමි. නිස ත් නො දෙමි.

සවාමිනි! මම පිරිස් හික්මවන්නේ මෙසේ ය යි ප්‍රතිවචන දුන් සේකැ යි දක්වා තදුත්තරයෙහි මහරජ්ජුරැවෙනි! උතුම් වූ ජාතියෙහි උපන්නා වූ සිනිඳු වූ මෘදුවූ ලොහනීය වූ සුගන්ධ වූ ප්‍රිය වූ ප්‍රාර්ථිත වූ ප්‍රශසත වූ ජලයෙක් හා කර්දමයෙන් අනුප ලිප්ත වූ නො ඇලුනා වූ සම්ප්‍රාප්ත කෙසුරු කර්ණිකායෙන් ප්‍රතිමණ්ඩිත වූ භ්‍රමර සමූහයා විසින් නිසේවිත වූ සිතල ජල යෙන් පරිවර්ධිත වූ පද්ම ය යම් සේ ශොභමාන වේ ද, එ පරිද්දෙන් ම මහරජ! තෙළෙස් ධුතගුණයන් පූරීයෙහි ආසෙ වින නිසෙවිත වූ ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම උතුම් සමනිස් ගුණධර්‍ම යකින් සමූපෙත වන්නේ ය. කවර සමනිස් ගුණධර්‍මයකින් ද යත්?

සිනිඳු මුදු මද්දව මෙත්ත චිත්තෝ හොති, ඝාතන හත ව්හත කිලෙසෝ හොති, හත නිහත මාන දපෙපා හොති, අමල දළහ නිවිටඨ නිබෙබමිතික සදධා හොති, පරිපුණණ පණ්ඩිත පහටඨ ලොහනීය සන්ත සුඛසමාපත්ති ලාභීහොති, සීල වර පවර අසම සුවිගන්ධ පරිභාවිතෝ හොති, දෙවමනුස්සා නං පියොහොති, මනාපෝ, ඛීණාසව අරිය වරපුග්ගල පත්තෝ, දෙවමනුස්සානං වන්දිතෝ පූජිතෝ, බුධවිබුධ පණ්ඩිත ජනානං ථවිත ථුත ථොමිත පසත්ථෝ, ඉධවා හුරංවා ලොකෙන අනුප ලිත්තෝ, අපපථොක වජ්ජෙපි භයදස්සාවී, විපුල වරසමපත්ති කාමී නං මහඵල වරත්ථාධනෝ, අයාචිත විපුල පණ්ඩිත පච්චය භාගි අනිකෙත සයනෝ, ඛානා රක්ඛායින පවර විහාරී, විජටිත කිලෙස ජාලවජ්ජ්‍ර, නිහත හත්ත සංකුචිත සංඡන්න ගති නිවර ණෝ, අඛුප ධමෙමා, අභිතවාසෝ, අනවජ්ජහොගි, ගනිවිමුත්තෝ, උත්තිණණ සබබ විචිකිච්ඡෝ, විමුත්තනිඛා සිතත්තෝ, දිට්ඨධමෙමා, අවල දළහ භීරුත්තානුප්පගතෝ, සමුච්ඡින්නානුසයෝ, සබබාස වකඛයපපත්තෝ, සන්ත සුඛ සමාපත්ති විහාරබහුලෝ, සබබ සමණගුණ සමූපෙතෝ—යි.

යන මේ උතුම් සමනිස් ගුණයෙන් සමූපෙත වන්නේ ය යි මේ ආදී වශයෙන් අනෙක ප්‍රකාරයෙන් (උපමායෙන් කාරණ යෙන්) ධුතාඞ්ගානිසංසාදී විභාග ය විස්තර කොට වදාළ කල්හි ඒට ප්‍රසන්න වූ මිලිඳු රජතෙම් සාධු භන්තෙ නාගසෙන! යං කිංචි නවඞග බුද්ධවචනං යාව ලොකුත්තරා කිරියා යාව ලොකෙ අධිගම විපුල වර සමපත්තියෝ සබබං තං තෙරසසු ධුත ගුණෙසු සමොධානොපගතං—යි.

යනුවෙන්, සවාමී වූ නාගසෙන සථවිරයන් වහන්ස! යම් කිසි නවාඞ්ග බුද්ධවචනයෙක් ඇද්ද එහි පෙණෙන යම් කිසි ලොකොත්තර ක්‍රියාවෙක් ඇද්ද ලොකයෙහි විපුල වූ උතුම් සම්පත්හි කෙණෙක් ඇද්ද ඒ සියල්ල තෙළෙස් ධුතාඞ්ගයන් කෙරෙහි ම ඇතුළත් බවට හිය හ. එ හෙයින් වහන්සේ ප්‍රශ්න විසඳ වදාළ සේ ඉතා යහපත. මේ ද ප්‍රත්‍යක්ෂකොට වහන්සේ වදාළ පරිද්දෙන් පිළිගනිමි සි ප්‍රතිවචන දුන්නේ ය.

මේ සේ අනෙක ප්‍රකාරයෙන් ම විභාගකරණ ලද චිතිඝව ය ඇති තෙළෙස් ධුතගුණාඞ්ගයෙහි අගතැන් පත් ව සම්ඵ ශාසන නැමැති ගගනතලයෙහි ශරත් චන්ද්‍රයා සේ මුළු තුන්ලොවෙහි ප්‍රසිද්ධ වූ ඒ මහා කාශ්‍යප සථවිරයන් වහන්සේ නම් ධුතාඞ්ග යෙන් මේ උත්කෘෂ්ට ගුණයෙහි පිහිටියේ පමණක් නො වෙ සි. චිරකාලයක් සුපරිසුද්ධ සීලී ව ආ බැවින් පූර්වහෙතුක සිලයෙහි පිහිටි බැවින් සුද්ධ සත්ව කෙණෙකැ සි දත යුතු. එසින් වදාළහ. බුද්ධඝොස අටුවා කතීන් වහන්සේ විසුද්ධිමාර්ග **ශීලනිර්දෙශ** යෙහි "මහාකස්සපාදිනං පන සුද්ධ සත්තානං බොධිසත්තසස ව තාසු තාසු ජාතිසු සීලං පුබ්බහෙතුක සීලං"-සි.

මේ බදු ගුණයෙන් සමන්විත වූ ඒ මහා කාශ්‍යප සථවිරාදීන්ට නිවන් සම්පත් දෙවා වදාරන්නා වූ සම්ඵයන් වහන්සේ තමන් වහන්සේ බොධිමූලයෙහි දී අනිඤ්ඤයාදී වශයෙන් දත් චතුරාර්ය සත්‍ය කෙළවරකොට ඇති ධම් දෙශනායෙන් ම දෙවා වදාළ සේක. එ සේ හෙයින් ලොකානඳකර වූ ලොකාවාර්ය වූ ලොකා ලොක කර වූ ලොකාවබොධ ය කර වූ ලොකාභය කර වූ දිප දෙත්තාම වූ මාගේ බුදුරජාණන් වහන්සේ බුද්ධ නම් වන සේක.

එසින් වදාළහ.

අනිඤ්ඤසුදයය්‍යං අනිඤ්ඤසුතං
භාවෙතබ්බං ච භාවිතං
පහාතබ්බං පහීණමෙම
තසමාබුද්ධොසම්බ්‍රාහමණ-සි.

මෙතෙකින් මේ සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහයෙහි

මහාකාශ්‍යප සථවිරාවඥාධ කථා නම් වූ

7 වෙනි පරිච්ඡේද ය

——නිමි.——

8. පරිච්ඡේදය

8. මහාකප්පින සථවිරාවබොධ කථා

මහාකප්පින සථවිරාදීන් නිසා එක්සියවිසි යොදුන් වැඩ චතුසසත්‍යාවබොධ කරවදුල පරිදි කෙසේ ද යත්?

හේ ඔවුන් වහන්සේගේ පිළිවෙළ කථාවෙහි පටන් කියනු ලැබේ. කෙසේ ද යත්?

ප්‍රවර රත්නත්‍රයාරබ්භ්‍යාවල ශ්‍රද්ධා ඇති ආයුෂ්මත් වූ **කප්පින** සථවිරයන් වහන්සේ මේ මහාභද්‍රකල්පයට ලක්‍ෂයක්වන කපින් මත්තෙහි ඒ ඒ බුදුමගුලෙහි දසදහසක් සක්වළෙහි එකතොළා පියුම් වැසි වැස් වූ හෙයින් පියුමතුරා නමින් ප්‍රසිද්ධ වූ සම්බුදයන් වහන්සේ ගේ සමයෙහි මහාශ්‍රාවක සථානානන්තරයට ප්‍රාර්ථනා කොට එ තැන් පටන් දානාදී කුසල සම්භාර ය රැස්කෙරෙමින් සසර සැරිසරණ සේක් සකලනඛරාඛග ශ්‍රී සමෘද්ධීන් සම්පූර්ණ බාරාණසී නම් ප්‍රර ප්‍රවරයට නුදුරු වූ පෙසකාර ය යි කියනලද එක් සාලි ගමෙක (එගම) සාලින්ට මුදලි ව උපන් සේක.

එ සමයෙහි ශීලසමාධ්‍යාදී ගුණයෙන් ලොවුතුරා බුදුන් හැර සෙසු දිව්‍ය බ්‍රහ්ම නාග සුපර්ණී ශ්‍රමණ බ්‍රාහ්මණාදීන් හා අසාධාරණ වූ ගුණ ඇති දහසක් පමණ පසේ බුදුවරයන් වහන්සේ අටමසක් මුළුල්ලෙහි හිමේ පියස වාස ය කොට ලුණු ඇඹුල් මුසුදෙය වළඳ ශරීර පීඩා දුරුවෙන පිණිස වැසි සාරමසෙහි දනව්වට බැස එහි වසන සේක.

එක් අවදියක බරණැස් නුවරට නුදුරු වූ එක් සථානයකට බැස වස්වසන්ට සුදුසු ගෙවල් ඉදිකොට දෙන නියායෙන් (හස්ත කර්මය නම් එක්තරා ද්‍රව්‍යයක් නොවන හෙයින්) එය ඉල්වා රජ්ජුරු වන් ලඟට යව යි පසේ බුදුවරයන් වහන්සේලා අටනමක් යැවූ සේක. එ සමයෙහි රජ්ජුරුවන්ගේ වප්මගුලෙක් ඇත. පසේ බුදුවරුන් වහන්සේ වැඩිසේකැ යි අසා වප්මගුල් නිබ්‍යදී අවුත් සවාමීන් වහන්සේලා කුමක් පිණිස වැඩිසේක්ලා දැ යි අසා ඇතිලෙස වදුල කල්හි එ සේ ය සවාමීනි! අපගේ වප් මගුලෙක් ඇති හෙයින් අද ත් සෙට ත් අවසර නැත. අනික් දවස කරවම් යි කියා පසේ බුදුවරයන් වහන්සේලාට ආරාධනාවකු ත් නොකොට ම රජගෙට ප්‍රවිෂ්ටවූහ. පසේ බුදුවරයන් වහන්සේ අනික් ගමකට යම්හ යි සිතා වැඩිසේක.

එ වේලෙහි යට කී සාලි මුදලියාණන්ගේ භාර්‍යාවෝ කිසි කට යුත්තක් පිණිස බරණැස් නුවරට යන තැනැත්තී පසේ බුදුවරයන් වහන්සේලා දැක වැඳ සවාමීනි! මේ අවේලාවෙහි කුමක් පිණිස වඩනා සේක්ලා දැ යි විවාරා ආදියෙහි පටන් වැනි පවත් වදුළ කල්හි ශ්‍රද්ධා සම්පන්න වූ නුවණැති සත්‍රිතොමෝ සවාමීනි! සෙට දවසට මිඩියට කරුණාකොට වදුලොත් යහපතැ යි කියා ආරාධනා කළා ය. ඒ අසා පසේ බුදුවරයන් වහන්සේ උපාසිකාවෙනි! අපි බොහෝදෙන ය යි වදුළ කල්හි සවාමීනි! කෙතෙක් දෙනා වහන්සේද යි විවාරා උපාසිකාවෙනි! අපි දහසක්දෙනා ය යි වදුළ කල්හි සවාමීනි! මේ සාලිගම් ත් දහසක් නෙවල් ඇති ගමෙකි. එ හෙයින් එකෙකි කෙණෙක් එක එක නමට දන්දෙති. මට ම බරෙක් නැත. ආරාධනා ව ඉවසා වදුළ මැනව යි කියා නිමන්ත්‍රණ ය කොට මාගේ බල යෙන් මි හැම්දෙන සම්මාදන් කරවා වස් වසන පිණිස හැම්දෙනා වහන්සේට මි පන්සලු ත් කරවා දෙමි යි කිවු ය.

පසේ බුදුවරයන් වහන්සේලා අටනම් ද ආරාධනා ව ඉවසා වදුළසේක ඒ උපාසිකාවෝද ගම්ටවැද සිට අඬගා කියන්නී මම නුඹ හැම් සලකා දහසක් පමණ පසේ බුදුවරුන් වහන්සේට මේ ගමෙහිදී සෙට දවස වළඳන පිණිස ආරාධනා කෙළෙමි. එ හෙයින් හැම්දෙනා වහන්සේට වැඩහිඳ වළඳන්ට සුදුසු තැනකුත් ඉදිකළ මැන ව ඛාද්‍යභොජ්‍යාදි ය ත් සපයා ලු ව මැනවැ යි කිවු ය. ඒ අසා හැම්දෙනා ම එක් වූ හෙයි ත් හැම්දෙනා හා සමග තමන් ප්‍රධාන ව භොජන ශාලාවකු ත් කරවා එනි අසුන් පණවා දෙවෙනි දිනයෙහි පසේ බුදුවරයන් දහසක්දෙනා වහන්සේ වඩා හිඳුවා මධුරාහාර ය වලඳවා භොජනාවසානයෙහි එගම ඇති සියලු සත්‍රී පුරුෂයන් කැඳවා ගෙණ ගොස් පසේ බුදුවරුන් වහන්සේ වැඳ වස්වසන්ට ආරාධනා ත් කොට නැවත ගම්ටවැද දෙමව්පියනි! මල්බැයෙනි! එකි එකි ගෙන් එකි එකි පිරිමි දරුකෙණෙක් වැ පොරෝ ආදි ය ගෙණ වලට ගොස් දඹුපත් ආදි ය සපයා සවාමිදරුවන්ට වස්වසන්ට සුදුසු ලෙස පන්සැල් කළ මැනවැ යි කිවු ය.

ඒ ගම්වැස්සෝ ත් ඊට සතුටු ව එකි එකි කෙණෙක් එකක් එකක් බැගින් පන්සැල් දහසක් කොට ඒ ඒ පන්සැල්වල වස්වැසූ පසේ බුදුවරයන් වහන්සේලාට අප්‍රමාද ව උපස්ථාන කොට වස් අන්තයෙහි තම තමන් උපස්ථාන කළ පසේ බුදුවරයන් වහන්සේලාට සිවුරුපිරිකර සම්මාදන් කොට දහස දහස වටනා නියායෙන් දශලක්ෂයක් වටනා සිවුරු පිරිකර පිළිගැන්වූ හ. පසේ බුදුවරුන් වහන්සේ ත් වස් අන්තයෙහි අනුමේවෙනි බණවදුරා වැඩිසේක් ලා ය. ප්‍රධාන සාලිදුවනියන් පටන් හැම්දෙන ම ආසුන කෙළවර ඒ කුශලානුභාව

යෙන් තවුතිසා දෙව්ලොව ඉපද සමූහ ව උපන් නෙසින් ගණදෙවතා වෝ ය සි ප්‍රසිද්ධව එහි දිව්‍යසම්පත් විඳ මේ කප තුන්වන අන්තර කල්පයෙහි ලොව පහළ වූ කාශ්‍යප නම් බුදුන් සමයෙහි බාරාණසි නම් නගර වරයෙහි කෙළෙඹි කුලවල ඉපද්නාහු ය. එ වක නායක සාලිමුදලියාණෝ නායක කෙළඹියාණන්ට පුත්‍ර ව උපන්හ. සෙස්සෝ ඒ ඒ කෙළෙඹිකුලවල උපන්හ. එවක පින්කමට නායක වූ සාලි දියනි යෝ අනික් කෙළෙඹියාණ කෙණෙකුන්ට දූව ඉපද පුළුයෙහි සවාමි වූ ඒ කෙළෙඹි පුත්‍රයාණන් හා සරණ ගියාය.

සෙසු සත්‍රිහු අනික් අනික් කෙළෙඹි කුලවල ඉපද වැඩිඉිය පැමිණ පුළුයෙහි සවාමිවූවන් කරා ම සරණ ගියහ. එසේ වසන්නාහු එක් දවසක් වෙහෙරට බණට හඬගැ ය. බුදුහු බණ වදාරණ සේ කැ සි යනු අසා සියලු කෙළෙඹියෝ තමතමන්ගේ කෙළෙඹි දුන් හා සමග බණ අසම්හ සි කියා විහාරයට ගියහ. උන් විහාරයට යන වේලෙහි ම වඕවක් වසිමින් තෙමෙන්ට වන. එ කල යම් කෙණෙකුන්ගේ ඤාති වූ හෝ කුලූපග වූ හෝ එහන්සේ ඇත් නම් උතුමු ඒ ඒ වහන්සේගේ පිරිවෙන් ආදියට වන්හ. මොහු හැම දෙන තමන් අමුතු ව ගිය නෙයින් එ බදු කෙණෙක් නොලැබ වෙහෙර මැද සිට තෙමෙන්ට වන්හ තෙම්පියා කෙළෙඹියාණෝ අපහැමට වූ දු දුටුවා ද කුලදරුවන්ට නම් ලජ්ජාවන්ට මේ පමණක් ම මද දැ සි කිවු ය.

ඒ අසා හැමදෙන ම සැබව ලජ්ජාවන්ට මේ පමණෙක් ම ඇත. ඊට කුමක් කරමෝදැ සි විමසුවෝ ය. එ කල නායක කෙළෙඹියාණෝ එම්බා අපි හැම නො තෙමී සිටින්ට නිසි තැනක් ලබන්ට පෙරපිනක් නො කළහෙයින් නොලැබුන ත් මතුත් ඒ නම් ලබන්ට හැමදෙන ම රණක් එක්කොටලා එක්මිහාරයක් කරවම්හ සි කිවු ය. ඒ ඇසූ හැමදෙන ත් යහපතැ සි ගිවිස්සාහ. නායක තැනැත්තෝ මසුදහසක් දුන්හ. සෙසු කෙළෙඹියෝ පන්සිය ය පන්සිය ය දුන්හ. සත්‍රිහුද දෙසියපණස දෙසියපණස දුන්හ.

මේ සේ සත්ලක්ෂ පණස් දහසක් එක්කොට ගෙණ බුදුන්ට පිළිගන්වන පිණිස කුළුගෙවල් දහසකින් සොහමාන වූ මහාවිහාර යක් කරවන්ට පටන් ගත්හ. කම්මාන මහත් හෙයින් ප්‍රථමයෙන් සමාදන් කොට ගත් රන් මද වූ නියා ව බලා ආදියෙහි දහස දුන් තැනැත්තෝ පන්සියයක් ද පන්සිය ය දුන්නවුන්ගෙන් දෙසියපණස බැගින් ද දෙසියපණස දුන්නවුන්ගෙන් එකසියපස්විස්ස බැගින් ද එක් වූ තුන්ලක්ෂ පන්සැත්තෑ දහසක් වසතු ද ගදකිලි ය නිම වා

අනන්‍යයෙහි විහාරමධ්‍යේ පූජා ව කරන්නාහු බුදුන් ප්‍රමුඛ කොට ඇති විසිදහසක් පමණ මහරහතුන් වහන්සේට සතියක් මුළුල්ලෙහි මහ දන් දී සිවුරුපිරිකර ත් දී ආදී ඇති පොහොසත් කමින් එ වක විසි දහසක් දුන්හ.

කෙළෙඹි මුදලින්ගේ භාර්‍යා වෝ තමන් මහත් ශ්‍රද්ධා ව හා නුවණ ඇති හෙයින් සෙස්සන් හා සරියේ පින්කම් කොට වඩා ත් කරණු කැමති ව අනොජා මල් සමූහයක් සේ සවණිවණී වූ දහසක් අගනා වස්ත්‍රයක් හා අනොජාමල් පිරූ කරඬුවක් ගෙන්වාගෙණ බුදුන් බණ වදාරණ වේලෙහි අනොජා මල් හා වස්ත්‍ර ය ශ්‍රීපාදමූලයෙහි පුදා සවාමිනි! මේ කුශලානුභාවයෙන් උපනුපන් තන්හි මාගේ ශරීර ය ත් අනොජා මල් දමක් සේ රන්වන් වේ ව සි මාගේ නාම ය ත් අතික් නමක් නො ව අනොජා නම් වේ ව සි කියා ප්‍රාර්‍ථනා කළා ය. බුදුරජාණන් වහන්සේ ද ප්‍රාර්‍ථනා ව කළ පරිද්දෙන් ම සම්‍යක්සම්බුදුවේ ව සි වදාළ සේක.

ඔහු හැම දෙන ත් ආයු කෙළවර එයින් චුත ව දෙව්ලොව ඉපද දිව්‍යසම්පත් අනුභව කොට අප බුදුන් සමයෙහි දෙව්ලොවින් චුත ව නායක කෙළෙඹියාණෝ ජම්බුද්වීපයෙහි කුකකුටවතී නම් නුවරෙහි රජකුලයේ ඉපද කප්පින මහරජ්ජුරුවෝ ය යන නමින් ප්‍රසිද්ධිවූහ. එක් ව පින්කළ සෙසු ජනයෝ ඇමති කුලවල උපන්හ නායක කෙළෙඹියාණන්ගේ භාර්‍යාවෝ මදුරට සාගල නුවර රජකුල යෙහි උපන්හ. කළප්‍රාර්‍ථනා ව ලෙසට ම උන්ගේ ශරීරයන් අනොජා මල්දමක් සේ රන්වන් ව අනොජාදෙවි ය යන නමින් ප්‍රසිද්ධ ව වැඩි විය පැමිණ කප්පින මහරජ්ජුරුවන්ට ම සරණ ගියහ. සෙසු සත්ත්‍වයන් ද ඇමති කුලවල ඉපද වැඩිවිය පැමිණ යම් යම් කෙණෙක් පූජ්‍යයෙහි සවාමි වූ නම් උන් උන් කරාම සරණ ගියාහ. කප්පින නම් නර ශ්‍රේෂ්ඨයාණන් හා සමග පින්කළ හැමදෙන මහරජකම් ත් සෙසු සැපත් සරියේ ම අනුභව කෙරෙති.

යම් දවසෙක කප්පින නම් මහරජ්ජුරුවෝ රාජාභරණ ලා සැරහී හස්ත්‍යශ්වාදී වාහනයක නැඟි ඇවිදින් නම් එ සමයෙහි උන් සැම ත් එ සේ ම ඔටුනු හැර සෙසු ආභරණ ලා සැරහී වාහනාරූඪ ව ඇවිදිහි. මෙ සේ ඔහු හැමදෙන ම එක්ඝිත් ව කුසල් කළ හෙයින් සම්පතු ත් සරියේ ම විඳිහි කප්පින මහරජ්ජුරුවන්ගේ ද **බාල ය බාලවාහන ය පුඤ්ඤය පුඤ්ඤවාහන ය සුපන්න ය** සි බලවත් අස් වාහන පසක් ඇත.

රජ්ජුරුවෝ තුමූ සුපන්න නම් අශ්වයා නැගෙති සෙසු අසුන් සතරදෙන සතර දිග ගොඝින් මට සැප අසුන් ගෙණ එව සි කියා අසරුවන් සතරදෙනෙකුට දී උදය ම කවා පොවා සතර දිගට යවති.

යවන්නාහු ද නොපි මේ අසූන් නැති දසදෙළොස් ගව් විතර තැන් ගොස් විමසා තුනුරුවන් ලොව පහළ වූ නියාවක් මි තතුලෙස දැන අවුත් මාගේ කණියෙහි අමා වක්කරන්නා සේ කියව සි විධාන කොට යවති. ඔහු හැමදෙන ද සතර වාසලින් නික් ම දසදෙළොස් ගවි විතර තැන් ගොස් විමසා තුනුරුවන් ලොව පහළ වූ නියාවක් නො අසා ම එති. දහම්සොඬ බෝසතාණෝ අබුද්ධොත්පාද කාලයෙහි ඉපද ධර්‍ම් ය සෙව්වා මෙන් කප්පින මහරජ්ජුරුවෝ ද පූර්‍වහේතු බල යෙන් තුනුරුවින් කෙරෙහි මහත් ඇදහිලි ඇති ව චක්‍රරත්න ය ප්‍රාර්‍තනාකරණ සක්විති මහරජෙකු සෙයින් තුනුරුවන් ම පත පතා කාලානික්‍රාන්ත කරණුවෝ.

එක් දවසක් සර්‍වාභරණාලංකාරයෙන් සරහන ලද සුපත්‍ත නම් ප්‍රවර තුරඟවාහනාරූඪ ව අමාත්‍යයන් දහස පිරිවරා උයනට යන්නෝ කල්‍යාන්ත වූ ශරීර ඇති ව නුවරට ප්‍රවිෂ්ට වන වෙලෙඳුන් පන්සියයක් දැක රාක්‍ෂස විලාසයෙන් ආ සක්දෙව් රජ දැක ආතම් ලෝභ ය හැර මොහුවත් දහම් දනී දෝ හෝ සි සිතූ දහම්සොඬ මහබෝසතාණන් සේ මොවුහු අධ්‍යාන කල්‍යාන්තයෝ ය. මොවුන් කෙරෙන් එක් යහ පත් අස්නක් අසන්ට උවමැනව සි සිතා ඔවුන් කැඳවා ඕහිරි තෙපු ලෙන් සගයෙනි! තෙපි කොයි සිට එවිදැ සි විවාළෝ ය.

ඒ ඇසූ වෙළඳහු සවාමිනි! මෙ තනට සාරසිය අසූගව්වක් පමණ තැනින් ඔබ්බෙහි සර්‍වසමාපත්තීන් සමාධි වූ ශ්‍රාවස්ති නම් නුවරෙක් ඇත. අපි ඊ සිට ආවම්හ සි කිවූ ය. ඒ ඇසූ මහරජ්ජුරුවෝ ඒ තොපගේ රට අමුතු පවත් කිවිදැ සි විවාළෝ ය. එවිට වෙළඳහු රජ්ජුරුවන් වහන්ස! අනික් පවතෙක් නැත. ඇත ත් ඒ සවල්ප ය. දිවකුරුබුදුන් සමයෙහි අෂ්ටධර්‍ම් සංගෝධානයෙන් ලද විවරණ ඇති ව දසපෙරුම් පුරා බෝමැඩ හිද වසවතුගේ මත්බිඳ සව් කෙලෙස් නසා බුදු වූ සම්‍යක් සම්බුදු රජාණන් වහන්සේ අනේපිඬු මහ සිටාණන්ගේ ජේතවනාරාමයෙහි චතුර්වධ ඊර්‍යාපථ බ්‍රහ්මවිහාරයෙන් ප්‍රකාශ ව වැඩවසා වදරණ සේකැ සි කියා ක්‍ෂුධාපිඩිතයක් හට දිව බොජුනක් ලූවා සේ සතුටු කොට කීහ.

කප්පින නම් භූපාලතෙම ඒ බස් අසමින් ම ප්‍රමාණාතික්‍රාන්ත කල්පකොටි සතසහස්‍රයෙක්හි දු දුර්ලභ වූ නො ඇසි ය හැකි වූ වචන යක් හෙයිනු ත් බුදුහු පිරිනිවිසේකැ සි යනු අසා සෝකයෙන් පිඬිත ව සිහිමුළා බවට පැමිණ මූර්ඡා වූ අජාසත් මහරජ සෙයින් තමනු ත් බුදුන් කෙරෙහි බලව ත් ශ්‍රද්ධා ව ඇති හෙයින් අහෝ ආශ්චර්‍ය්‍ය කැ සි සිතන්නාහුගේ ශරීර ය හා සිත පස්වණක් ප්‍රීතියෙන් පිණා ගොස් කිසිවකු ත් සලකාගත නොහී මොහොතක් කල් යවා තැවත සිහි ලැබ දරුවෙනි! තොපි කුමක් කිවූදැ සි දෙවෙනි ව ත් විවාළෝය.

මහරජ්ජුරුවන්! නිලබිජයක් පමණ ශරීරප්‍රදෙසයෙකින් නික්මුණු බුදුරැස් කලඹින් එක්සක්වළට හිරුදහස් සඳදහස් නැංගා සේ මේ සක්වළෙහි පටන් අනන්තාපරියන්ත සක්වළ අඳුකාරවිධවංශන ය කොට බබලන තරම් මහානුභාව සම්පන්න වූ බුදුරජාණන් වහන්සේ ලොව පහළ වූ සේ කැයි කිවුවාහු ය.

එ විට මහරජ්ජුරුවෝ ප්‍රීතියෙන් පිණාගොස් කිසිවකු ත් සල කාගත නොහි මිදක් කල්යවා නැවත සිහිලැබ මියුරු වචනයෙන් දරුවෙනි! තොපි කුමක් කිවුදැ සි තුන්වෙනිව ත් විචාළෝය. එ විට වෙළඳහු සාමිනි! දෙළොස් යොදුන් උස ඇති මහ බඹනු විසින් තුන් යොදුනක් පමණ ධවලච්ඡත්‍රයකින් පුදනු ලබන දෙදෙව් ලොවට අධිපති සක්දෙව් රජහු විසින් එන්සියවිසි රියන් දකුණුසකත් තුඩ තබා සංඛනාදයෙන් පුදමින් ගිලන්කමක් වූ විට කිකරා අභියුක්තයෙකු සේ නුසුසින ව කෙලමිලා ආදි ස නිසින් ගෙණගොස් දමා සියලු උප සථාන කරණු ලබන තුන්ලොව ම බඹසුර මුනි මනුජයන්ගේ මුදු නෙති කෙළනා ලද පා පියුම් ඇති මහමේර සේ සථිර වූ ගුණ ඇති මහපොළොව සේ විසාල වූ ගුණ ඇති මහමුහුදු සේ ගැඹුරු වූ ගුණ ඇති ආකාස ය සේ අපමණ ගුණ ඇති සඳ දෙව් පුත් සේ සොමිගුණ ඇති සම්‍යක් සම්බුද්ධසීහ රාජෝත්තමයාණන් වහන්සේ ලොක යෙහි ප්‍රාදුර්භූත වූ සේ කැ සි කිවාහු ය.

එ විට ද මහරජ්ජුරුවෝ ප්‍රීතින් කිසිවකුත් සලකාගත නොහි මොහොතක් කල් යවා සතරවෙනි වාරයෙහි දරුවෙනි! තොපි කුමක් කිවුදැ සි විචාළෝ ය. එවිට වෙළඳහු මහරජ්ජුරුවෙනි! ලොක නායක වූ ලොකාචාරි වූ තුන්ලොවට නැගූ පහන් රැකක් වැනි වූ තුන්ලෝ වාසීන්ගේ පූජාවට සුදුසු වූ තුන්ලොවට මාතා වූ තුන් ලොවට පිතා වූ තුන්ලොවට බඹු වූ තුන්ලොවට මිත්‍ර වූ තුන්ලොවට කල්‍යාණමූ වූ තුන්ලොවට විත්තාමාණික්‍ය වූ තුන්ලොවට ප්‍රතිෂ්ඨාධාර වූ නිවැරැදි නැමැති පියුම් වනයට වඳුරා වැනි වූ වෛනෙය ජන නැමැති පියුම් වනයට සූර්‍යයා වැනි වූ නිවැරැදි නැවැති කෞමද වනයට සූර්‍යයා වැනි වූ වෛනෙයජන නැමැති කෞමද වනයට වඳුරා වැනි වූ.

මහා මේරු තද ගල් නැම්මී වූ ඒ ඒ බුදුමගුලෙහි නරක යෙහි ගිනි තිවූ මුනුදු කරදිය පෙරලා මිරිදිය කර වූ ප්‍රේතයන්ගේ සා පිපාස සන්සිඳු වූ තිරිසනුන් ගේ භය දුරුකළා වූ ලොකාන්තරික යෙහි අඳුරු නැසුවා වූ ජාත්‍යන්ධයන් ට නෙත් දුන්නා වූ ජාතිබධිර යන්ට කන්දුන්නා වූ ජාතිමූනයන් ලවා කථා කර වූ කොරුන් ලවා ඍජු ගමන් කර වූ බලුළුන් හා මූසිකයන් මිත්‍ර කර වූ නාගයන් හා ගුරුළුන් මිත්‍ර කර වූ දිවියන් හා මෘගයන් මිත්‍ර කර වූ වාඝයන් හා

උලූකයන් මිත්‍රකර වූ සමන්‍රිංශත් පාරමී ධර්‍ම නැමැති චිත්‍රාවරින් විසින් දෙනිස් මහාපුරුෂ ලක්‍ෂණයකින් හා අසූ අනුව්‍යඤ්ජනයකින් විසිතුරු කොට නිර්මිත කරණ ලද රූපයක් වැනි වූ සම්‍යක් සම්බුද්ධ යාණන් වහන්සේ දෙවිරම් වෙහෙර නැමැති යුගඳුරු මුදුනෙහි දිලි යෙන ලහිරු මඩලක් සේ වැඩවසා වදාරණ සේකැ සි කිවාහු ය.

සතාරවෙනි වාරයෙහි කී වචන ය අසා සලකා සිතියෙන් යෙදී දරාවෙනි! නොයෙක් කප්සුවහසකිනු දු නො ඇසිය හැකි වූ උතුම් වචනයක් මගේ කණෙහි අමා වක්කරන්නාක් මෙන් මට කිවා වූ තොපට සතුටු සඬුරු පිණිස ලක්‍ෂයක් වසතු දෙමි කියා ඔවුන් සතුටුකොට නැවත එම්බා දරුවෙනි! අනිකුත් කිවමනා අස්නෙක් ඇත්දැ සි විවාලෝ ය.

එ විට වෙළඳහු මහරජ්ජුරුවෙනි! සඞ්ඝයන්ගේ මෝන නැමැති අඳුරු තසන පිණිස සම්‍බුද්ධ නැමැති උදුගලින් දහම් නැමැති හිරු පහළවි ය. සඞ්ඝයන් ගේ කෙලෙස් පිපාස සන්සිඳුවනු පිණිස සම්‍බුද්ධ නැමැති හිමවත් පර්‍වතයෙන් දහම් නැමැති අනස්ගහ පහළවිය. සකි සන්තාන ගත කෙලෙස් ගිවි නිවන පිණිස සම්‍බුද්ධ නැමැති මෙඝ ගහි යෙන් නැගි බ්‍රහ්මස්වර නැමැති ගර්ජනා ඇති ව දෙසනා නැමැති අමාවැසි ව අටපිරිස් නැමැති සතරමහත් දිවයින එක පැහැර වස් නට වන සසර නැමැති සාගරයෙන් එතරවන පිණිස දහම් නැමැති රුවන් නැව පහළ වි ය. වතුරොඝ නැමැති සිවිගඟ තරණයට දහම් නැමැති පසුර පහළ විය. සපතකාම සවනී නැමැති සත්බුමු ප්‍රසාදයට නැගෙණ පිණිස දහම් නැමැති රුවන් ගිණි පහළ වි ය. තෙ දරස වසයෙන් එකෙක් වි ය ධර්‍ම විනය වසයෙන් දෙකක් වි ය. පිටක වස යෙන් තුණෙක් විය. ආදිමධ්‍යාවසාන වසයෙන් ද තුණෙක් වි ය. නිකාය වසයෙන් පසෙක් වි ය. අඞ්ග වසයෙන් නවයෙක් වි ය. සකඤ්ඣ වසයෙන් සුවාසූ දහසෙක් වි ය.

මේ පාළිධර්‍ම ය හා සොතාපත්ති මාර්‍ගාදී නවලෝකෝත්තර ධර්‍ම ය ලොකයෙහි ප්‍රාදුර්භූත වූයේ ය සි කියා සතුටු කොට කිහ. එ බස් අසන්නා ම රජ්ජුරුවෝ ප්‍රීතින් පිණා ගොස් කිසිවකු ත් සලකාගත නොහී දෙවෙනිව ත් තුන්වෙනුව ත් විචාරා ප්‍රථමයෙහි මෙන් තුන්වාරයෙක සිහිමුළා බවට පැමිණ සතරවෙනි වාර යෙහි ධර්‍ම ය පහළ වූ පරිදි කී කල්හි දරාවෙනි! තොපට සතුටු පඬුරු පිණිස මීට ද ලක්‍ෂයක් වසතු දෙමි කියා සතුටු කරවා සෙසු ත් කිවමනා අසුන් ඇද්දැ සි විවාලෝ ය.

එ විට වෙළඳහු මහරජ්ජුරුවෙනි! සම්‍බුද්ධ නැමැති රුවන් මේර වටා සංඝ නැමැති සත්කුල පවු පහළ වි ය. සම්‍බුද්ධ නැමැති

චන්ද්‍රයා වටා සංඝ නාමැති තරුපෙළ පහළ වී ය. සම්බුදු නාමැති සක්විති මහරජ හට සංඝ නාමැති සත්රුවන් පහළ වී ය. සම්බුදු නාමැති කල්පවෘක්ෂයෙන් සංඝ නාමැති අංකුර පහළ වී ය. සම්බුදු නාමැති සමුද්‍රයෙහි සඞ්ඝ නාමැති නන් රුවන් පහළ වී ය. පය්‍යාප්තික ධර්ම නාමැති සිංහ තෙල ය දැරීමට සඞ්ඝ නාමැති සුවඳ භාජන ය පහළ වී ය. කුසල බීජ වාපනයට පුණ්‍ය ක්ෂේත්‍ර පහළ වී ය.

ඒ සඟහු ද මනා ව පිළිපන් හෙයින් සුප්‍රතිපන්න ය හ. මධ්‍යම ප්‍රතිපදාවට පිළිපන් හෙයින් ඍජුප්‍රටිපන්න ය හ. නිවන් නිසා පිළිපන් හෙයින් ඤායප්‍රටිපන්න ය හ. යනාදී වශයෙන් මෛත්‍රී ක්ෂමොපශමාදී සියලු ගුණ නාමනි ආභරණ ලා සැරහී සම්බුදු නාමැති පියරජහු පිරිවරා සිටින්නේ අෂ්ටාර්‍ය්‍ය පුද්ගල නාමනි රජකුමරුවෝ පහළ වූහ සි යනාදීන් රජ්ජුරුවෝ සතුටු කොට කිහ. එ විට රජ්ජුරුවෝ පෙර ලෙසින් ම කුල් මත් ව ගොසින් තුන්වාරයක කිසිවකු ත් සලකා ගත නොහී සතරවෙනි වාරයෙහි සලකා සිහි එළවා දරුවෙනි! මීට ද සතුටු පඬුරු පිණිස ලකුණක් වසතු දෙම් සි කියා—

බුද්ධොති වචනං සෙට්ඨං විද්ධොති පදමුත්තමං,
නත්ථි තෙන සමං ලොකෙ අඤ්ඤං සොත රසායනං.

ධම්මොති වචනං සෙට්ඨං ධම්මොති පදමුත්තමං,
නත්ථි තෙන සමං ලොකෙ අඤ්ඤං සොත රසායනං.

සඞ්ඝොති වචනං සෙට්ඨං සඞ්ඝොති පදමුත්තමං,
නත්ථි තෙන සමං ලොකෙ අඤ්ඤං සොත රසායනං-සි.

යනු හෙයින් ඒ අසුන් නුනට වැඩි කණ් රසායන වූ අස් නක් සම්‍යක ලොකයෙහි නැති හෙයින් අන් කිසි අස්නක් ඇද් දැ සි කියා නො විචාරා ඇමනි දනස මුණ බලා සඟයෙනි! නොපි කුමක් කරවි දැ සි විචාලෝ ය. එ විට අමාත්‍යවරු සවාමිනි! කුමක් කර වදරණ සේක් දැ සි විචාළ කල්හි--

සඟයෙනි! උතුම් රත්නත්‍ර ය ලෝකයෙහි ප්‍රාදුර්භූත වී ය සි යනු අසා නිස්සාර වූ රාජසම්පත්තියක් පිණිස නැවත නුවරට නො වදිමි. යම් සේ ආකාශයෙහි දැමූ කැට පෘථිවියෙහි මුත් අහස නොරඳා ද, යම් සේ හිමවත් පර්වතයෙන් බට ගංගා වෝ සමුද්‍රයට නො වැද අන්තැනක නො රඳද්දා ද, යම් සේ උදය ගිරි සිඛරයෙන් නැගි චන්ද්‍ර සූර්‍ය්‍යයෝ අවරගිරි පර්වතයට නොගොස් අතරෙහි නො රඳද්දා, එ පරිද්දෙන් ම දුර්ලභ වූ නො ඇසිය

හැකි වූ නො දැකිය හැකි වූ රත්නත්‍රය ලෝකයෙහි ප්‍රාදුර්භූත වී ය සි අසා පඤ්ච සාධාරණ වූ නිස්සාර වස්තුවෙහි ආලයකින් නැවත ඇතුළු නුවරට නො වදිමි.

සජීඤ නැමැති වෛද්‍යාචාර්‍යයා කරා ගොස් කෙලෙස් නැමැති රෝගයට දහම් නැමැති පිළියම් කරවමි සි සජීඤ නැමැති විලෙහි ගැලී කෙලෙස් නැමැති ගිම් නිවමි සි සජීඤ නැමැති අනවතප්තවිලට බැස දහම් නැමැති සිහිල් පැන් බී සජීඤ නැමැති වෛද්‍යාචාර්‍යයා කරා ගොස් කෙලෙස් නැමැති පිපාස නැසමි. සජීඤ නැමැති ප්‍රලයාචාරිහු කරා පැමිණ කෙලෙස් නැමැති යක්ෂයා පලවමි. සජීඤ නැමැති කල්පවාක්ෂය කරා පැමිණ ශ්‍රමණ වෙස් නැමැති ආභරණ ලා සැරහී නිවන් නැමැති ඉසුරට පැමිණෙමි සි කිවු ය. එ විට අමාත්‍යවරු රජ්ජුරුවන් වහන්ස! නුඹ වහන්සේ සක්විති රජසැපතක් වැනි වූ සියලු රජසැප ත් හැර පැවිදිවන කල් අපට ඇමති සැපතින් ප්‍රයෝජන කවරේ ද? ගංගා ජල ය සමුද්‍රයට යන කල ගඟට නැමුණු ඇල කඳුරැජ්ජි ආදියෙහි ජල ය ගංගා හා සමඟ මුහුදට නොගොස් කොතැනක රදා ද අපි හැම ත් ඔබ හා සමඟ බුදුන් කරා ගොස් පැවිදි වමිහ සි කිහ.

රජ්ජුරුවෝ බිසවුන්ට කියා යවන පවත් රන්පෙතක දැ හිතුලෙන් ලියා යවා වෙළඳුන්ට කියන්නෝ අපගේ අනොජා බිසවු මසු හුන්ලක්ෂයක් තොපට දෙති. එයින් හැරගනු ව බිස වුන්ට කියන කල රජ්ජුරුවන් වහන්සේ සියලු රජසැපත නුඹ. වහන්සේට හළ සේක බිසෝවරුන් රජසැපතට හැකිවන බැවින් රජ සිරි විඳුව සි කියා ඉදින් රජ්ජුරුවන් වහන්සේ කොයි වැනිසේක් ද සි විමාළෝ නම් බුදුන්ලහ මහණවන්ට ගිය සේකැ යි කියව සි කිවු ය. අමාත්‍යවරු දහස ද තමතමන්ගේ භය්‍යාවන්ට කියා යවන හසුනු ත් කියා යැවූ හ. රජ්ජුරුවෝ වෙළඳුන් යවා ඇමති දහස පිරිවරා එ කෙණෙහි ම බුදුන් කරා යන්නට නික්මුණාහු ය.

කියේ මෑ නෝ-දම්පියා අටුවායෙහි—

"අථෙකදිවසං රාජා අස්සං අභිරුහිත්වා අමච්ච සහස්ස පරිවුතො උය්‍යානං ගච්ඡන්තො කිලඤ්ජරූපෙ පඤ්චසත මත්තෙ වාණිජකෙ නගරං පවිසන්තෙ දිසවා ඉමෙ අද්ධාන කිලන්තා අද්ධා ඉමෙසං සන්තිකා එකං භද්‍දකං සාසනං සොස්සාමීති තෙ පක්කොසාපෙත්වා කුතො ආගච්ඡථාති පුච්ඡි. අත්ථි දෙව ඉතො වීසං යොජන සත මත්ථකෙ සාවත්ථි නාම නගරං. තතො

ආගච්ඡාමාති. අත්ථිපන වෝ දෙයෙ කිඤ්චි සාසනං උපප
න්නානි, දෙව අඤ්ඤං කිඤ්චි නත්ථි, සම්මාසම්බුද්ධෝ පන
උපපන්නොනි.

රාජා තාවදෙව පඤ්ච වණ්ණාය පිතියා ඵුට සරීරෝ කිංචි
සල්ලකෙඛතුං අසක්කොන්තෝ මුහුත්තං ඒතිනාමෙත්වා තාතා
කිං වදෙථාති පුච්ඡි. බුද්ධෝ දෙව උපපන්නොනි. රාජා දුතියම්පි
තතියම්පි තථෙව ඒතිනාමෙත්වා චතුත්ථෙ වාරෙ කිං වදෙථ තාතා
නි පුච්ඡිත්වා බුද්ධෝ දෙව උපපන්නොනි වුත්තෙ තාතා සත
සහස්සං වෝ දදමීනි වත්වා අපරම්පි කිංචි සාසනං අත්ථි නි පුච්ඡි.
අත්ථි දෙව ධම්මෝ උපපන්නොනි. තම්පි සුත්වා පුරිම තයෙ
නෙව තයොවාරෙ ඒතිනාමෙත්වා චතුත්ථෙ වාරෙ ධම්මොනි පදෙ
වුත්තෙ ඉධාපි වෝ සතසහස්සං දම්මීනි වත්වා අපරම්පි සාසනං
අත්ථි තාතාති පුච්ඡි. අත්ථි දෙව සඞ්ඝරතනං උපපන්නානි.

රාජා තම්පි සුත්වා තථෙව තයොවාරෙ ඒතිනාමෙත්වා චතු
ත්ථෙ වාරෙ සඞ්ඝොනි පදෙ වුත්තෙ ඉධාපි සතසහස්සං දම්මීති
වත්වා අමච්ච සහස්සං ඔලොකෙත්වා තාතා කිං කරිස්සථාති
පුච්ඡි. දෙව තුම්හෙ කිං කරිස්සථාති? අහං තාතා බුද්ධෝ උප
පන්නොති ධම්මෝ උපපන්නොති සඞ්ඝෝ උපපන්නොනි සුත්වා න පුන
නිවත්තිස්සාමි. සත්ථාරං උද්දිස්ස ගන්ත්වා තස්ස සන්තිකෙ
පබ්බජිස්සාමීනි. මයම්පි දෙව තුම්හෙහි සද්ධිං පබ්බජිස්සාමාති,

රාජා සුවණ්ණපටෙ අක්ඛරානි ලිඛාපෙත්වා වාණිජකෙ
ආහ. අනොජා නාම දෙවී තුම්හෙකා තීණි සත සහස්සානි දස්ස
නි. එවං ච පන වදෙය්‍යාථ. රඤ්ඤා කිර තෙ ඉස්සරියං විස්සජ්ජිතං
යථා සුඛං සම්පත්තිං පරිභුඤ්ජාහීනි. සචෙ පන වෝ රාජා
කාහනති පුච්ඡති, සත්ථාරං උද්දිස්ස පබ්බජිස්සාමීනි වත්වා ගතොනි
ආරොචෙය්‍යාථානි. අමච්චා පි අත්තනො අත්තනො භරියා
නං තථෙව සාසනානි පහිණිංසු රාජා වාණිජකෙ උය්‍යොජෙත්වා
අමච්ච සහස්ස පරිවුතො තං ඛණංයෙව නික්ඛම්—සි.

ලොකස්වාමී වූ බුදුරජාණන් වහන්සේ පෙරාතු දවස අලු
යම් වේලෙහි ලොව බැඳා වදුරණ සේක් පිරිවර සහිත වූ කපිල
රජ්ජුරුවන් දැක මේ මහාකපිල රජ වෙළඳුන් කෙරෙන් ඔගදී
තුනුරුවන් ලොව පහළ වූ නියා ව අසා බස් තුණට තුන්ලක්ෂ
යක් වසතු පුදා රජ සැපත් හැර පැවිදිවෙනු කැමති ව මා
උදෙසා සෙට නික්මෙ සි. අවුත් මානෙන් ඛණ අසා

සහ පිරිවරින් සිව්පිළිසිඹියාපත් හා සමග රහත් වෙ සි. මම ද ඕ හට පෙරගමින් කොට යෙමි සි දෙවන දවස් සක්විති රජකෙ ණෙකුත් ප්‍රාදෙශික රජකෙණෙකුට පෙරගමින් කරණ කලක් මෙන් අනද මහනෙරුන් වහන්සේ පමණකු ත් කැදවා නො ගෙණ -

බොධනෙය්‍යං ජනං දිසවා සතසහසෙසපි යොජනෙ,
ඛණෙන උපගනත්වාන බොධසිසසති සො ජිනො-සි.

යනු සියලු බුදුවරයන්ගේ සවභාවයක් හෙසිනු ත්, භවින් වහන්සේ තමන් වහන්සේගේ සංඝාටි චීවර ය හා පාත්‍රා ධාතූන් වහන්සේ ත් හැරගෙණ කරුණා චිසින් මෙහෙයන ලද සාරසිය දසූ ගවිවක් පමණ වැඩ **චඤ්ඣභාගා** නම් ගංගාවගේ සමීපයෙහි රජත වණ් වූ සඛාඛයෙන් හා නිල මේඝකූටයක් සේ අනිශයින් නිල් වූ ශාඛා මණ්ඩලයෙන් සොභමාන වූ නයග්‍රොධ වෘක්ෂමූලයෙක්හි නිල මේඝ ගර්භයක් පලා නොයෙක් දිග දිවනා සිය දහස් ගණන් විදුලි ය රැළි සේ නයග්‍රොධ වෘක්ෂයෙහි කද වෙලෙප් සාඛාදි ය සොභාමන් කරවමින් දිවන සවණක් ඝන රැයින් යුක්ත ව වැඩ හුන් සේක.

මහාකපින නම් නරාධිපති ද බුදුන් කරා එන්නෝ එක් ගංගාවක් සමීපයට පැමිණ මේ ගංගාව කිනම්දැ සි විචාරා **අරවඡා** නම් ගංගා ව ය සි කී කල්හි ගැඹුර හා පලල් කෙතෙක්දැ සි විචාරා ගැඹුරෙන් ගවිවෙක පලලින් දෙගවිවෙකැ සි කී කල්හි මෙසින් එතර වන්ට ඔරු අහුළ ඇද්දැ සි විචාරා නැතැ සි කී කල්හි ඔරු අහුල් ආදි ය බලා හිඳුමෝ නම් මේ ජාති ය ජරා වට පමුණුව සි. ජරා තමා මරණයට පමුණුව සි. පසු ව මහණ වන්ට යන්නෝ කවුරු ද, ඒකාන්තයෙන් මම තුණුරුවන් කෙරෙහි විමති නැති ව ඒකාන්ත භක්තියෙන් ආයේ ම වී නම් එහි ආනු භාවයෙන් මේ ගහෙහි පැන් පැන් සේ නොවේව සි කියා සාමා නයෙනු ත් තුණුරුවන් ගුණ සලකා මේ කාරණයෙනු ත් බුදුහු අර්හත් සේක ය යනාදීන් නව අරහාදී බුදුගුණ සඳහන් කෙරෙ මින් අසුන් දහස දියට පැන්න වූහ.

වඤ්ඣා අදහසක් නොව සැබෑ අදහස ම බැවින් ඒ අශ්වයෝ දහස ම ගල්තලාවෙකින් නික්මුණු කලක් මෙන් නික්ම යන්ට වන්හ. අශ්වයන්ගේ කුර අක් පමණක් ම තෙමින. **කපින** මහ රජ්ජුරුවෝ බුද්ධානුභාව ය හේතුකොට ගෙණ පිරිවර හා සමග ඒ ගඟින් එතර ව ඔබ්බේ යන තැනැත්තෝ අනිකුත් ගංගාවක් දැක මේ ගඟ කිනම්දැ සි විචාරා **නීලවාහිනී** නම් ය සි කී කල්හි

ගැඹුර පළල විචාරා ගැඹුරෙනුත් පලලිනුත් දෙගවූ දෙගවූ පමණය යි කී කල්හි ඔරු අතුල් ආදිය ඇද්දැයි විචාරා එසින් නැතැයි කී කල්හි සෙස්ස ආදිය ලෙසින් ම සලකා ඒ ගහින් එතරවන තැනැත්තෝ සපයඃප්නික නවලොකොත්තර සද්ධම්යෙහි ගුණ සලකා පෙර ලෙසින් ඒ ගහිනුත් එතර ව ඉදිරියෙහි යන තැනැත්තෝ-

අනික් ගහක් දැක මේ ගහ කිනම් දැයි විචාරා **චඤ්ඤාණා** නමැයි කී කල්හි ගැඹුර පළල විචාරා ගැඹුරිනුත් පලලිනුත් සතර සතර ගව්ව ය යි කී කල්හි හොරු අතුල් ආදිය ඇත්දැයි විචාරා නැතැයි කී කල්හි සෙස්ස ආදිය ලෙසින් ම සලකා ඒ ගහින් එතරවන රජ්ජුරුවෝ බුදුන්ගේ ශ්‍රාවකයන් වහන්සේ මධ්‍යම ප්‍රතිපදාවට පැමිණි හෙයින් සුපිළිපන්සේක. යනාදීන් සඞ්ඝ ගුණ සලකා ඒ ගහිනුත් එතර වූහ.

(අහෝ! පින්වත් වූ ලොක සඞ්ඝයෙනි! රජක්හුගේ ශ්‍රද්ධා බලයෙක් බලවි. තුණුරුවන්ගේ පවතක් නොඅසා ම බොහෝ කලක් තුණුරුවන් ලොව පහළ වී දෝ හෝ යි විමස විමසා සිට උයනට යන මාර්ගයෙහිදී වෙළඳුන් කෙරෙන් අසා නවාරයක ප්‍රීතියෙන් සිතිමුළා බවට පැමිණ නැවත එවන තුණ කී වෙළඳුන්ට තුන් ලක්ෂයක් වසතු දී රජසැප ත් හැර එමින් සිට අතුරෙහි දුටු ඔරු අතුල් නැති ගංඟා තුණක දී තුණුරුවන් උදෙසා ජීවිත පරිත්‍යාග කොට තුණුරුවන් කෙරෙහි කළ අවල ශ්‍රද්ධා බලයෙන් එසින් එතර වූ නියාවක් බලවි. මේ බදු ශ්‍රද්ධාවනත යෝ ලෝකයෙහි දුර්ලභ වෙති. එ හෙයින් තුණුරුවන් කෙරෙහි කරණ ලද ඒ රජහුගේ අවල ශ්‍රද්ධාව වැනි අවල ශ්‍රද්ධා ව මිට ද සියලු දෙව් බඹුන්ට ද අපගේ ශ්‍රී ලඞ්කාධිපති වූ මහරජ්ජුරුවන් ට ද මාගේ දෙමව්පිය ආදීන්ට ද සියලු හිතාහිත මධ්‍යස්ථ සඞ්ඝ යන්ට ද හේතු වේවා.)

මේ සේ ගඞ්ගාවෙන් එතර ව යන මහරජ්ජුරුවෝ බුදුන් වැඩහුන් නුගගහ කඳු වෙලෙප් ආදිය නොයෙක් පැහැ ඇති කෙරෙමින් දිවෙන සවණක් ඝන බුදුරැස් දැක සිතන සේක් අප දුටු මේ ආලෝක ය හම් සූර්‍යාලෝකයකු ත් නොවෙයි. රාත්‍රි ය නොවන බැවිනුත් මෙසේ වූ සෝභාවක් නැති හෙයිනුත් චන්ද්‍රයාගේ ආලෝකයකු ත් නොවේ. දිව්‍ය බ්‍රහ්ම නාග සුපණ්ණාදීන් අතුරෙන් අන්‍යතර කෙණෙකුන්ගේ ශරීරාලෝකයකු ත් නොවෙයි. මම ඒකාන්තයෙන් ම බුදුන් අරහයා අසිමි. ඒ බුදු රජාණන් වහන්සේගේ ශරීරාලෝකයක් වනැයි සිතා දුටු වේලෙහි ම

අස්සුපිටින් බැස බුදුරැස් දුටු අනුසාරයෙන් ම බුදුන් වැඩ හුන් තැනට අවනත සිරිර ව ගොස් සිරියෙල් කල්කයක ගැලෙන කෙණෙකුත් සේ බුදුරැස් ඇතුළට ප්‍රවිෂ්ට ව බුදුන් වැඳ අෂ්ට ඥෙෂයෙන් විනිර්මුක්ත ව එකත් පසෙක හුන්ග.

බුදුහු විඩා ව ආ පුත්‍රාවණක් දැක අනුග්‍රහ කරණ ප්‍රේම හරිත මාතෘවක් සේ චතුස්සත්‍යාවබොධයට නිසිකොට පිළිවෙළ කථාවෙන් බණ වදාළ සේක. දේශනාවසානයෙහි දහසක් අමාත්‍ය යන් හා **කපිරාජ** මහ රජ්ජුරුවෝ සෝවාන් වූ සේක. මේ හැම දක්වන ලද මැ යි. **දම්පියා අට්ඨකථායෙහි** –

සත්ථාපි තං දිවසං පච්චූස කාලෙ ලොකං ඔලොකෙන්තො **මහාකපිරාජා** රාජානං සපරිවාරං දිසවා අයං **මහාකපිරාජා** වාණිජකානං සන්තිකා නිණ්ණං රතනානං උපපන්න භාවං සුත්වා තෙසං වචනං නීහි සතසහස්සෙහි පූජෙත්වා රජ්ජං පහාය අම්චසහස්ස පරිවුතො මං උද්දිස්ස පබ්බජිතුකාමො සෙව නික්ඛමිස්සති. සො සපරිවාරො සඟපටිසම්භිදාහි අරහත්තං පාපුණිස්සති. පච්චුග්ගමනමස්ස කරිස්සාමීති, පුනදිවසෙ චක්කවත්තී විය බුද්ධක ගාමභොජකං පච්චුග්ගච්ඡන්තො සයමෙව පත්තචීවරං ගහෙත්වා වීසං යොජනසතං පච්චුග්ගන්ත්වා **චන්දභාගාය** නදියා තීරෙ නිග්‍රොධ රුක්ඛමූලෙ ඡබ්බණ්ණ රස්මියො විස්සජ්ජෙන්තො නිසිදි.

රාජාපි ආගච්ඡන්තො එකං නදිං පත්වා කතමෙසානි ප්‍රච්ඡි. **අරච්ඡා** නාම දෙවාති. කිමස්සා පරිමාණං තාතාති. ගම්භීරතො ගාවුතං. පුථුලතො දෙගාවුතා දෙවාති. අත්ථි පනෙත්ථ නාවා වා උළුමෙපාවාති? නත්ථි දෙවාති. නාවාදීනි ඔලොකෙන්තා අමෙහ ජාතිජරා උපනෙති. ජරා මරණං. අහං නිබ්බ්‍රහ්මණිකො හුත්වා තිණ්ණං රතනානි උද්දිස්ස නික්ඛන්තො තෙසං මෙ ආනුභාවෙන ඉමං උදකං උදකං විය මා අහොසීති තිණ්ණං රතනානං ගුණං ආවජ්ජිත්වා "ඉතිපි සො භගවා අරහං සම්මාසම්බුද්ධොති" බුද්ධානුස්සතිං අනුස්සරන්තො සපරිවාරො අස්සසහස්සෙන උදකපිට්ඨිං පක්ඛන්දි, සීඝවා පිට්ඨපාසාණෙ විය පක්ඛන්දිංසු. බ්‍රාහ්මණා අඟ ඝනානෙව තෙමිංසු.

සො තං උත්තරිත්වා පුරතො ගච්ඡන්තො අපරම්පි නදිං දිසවා අයං කිං නාමාති ප්‍රච්ඡි, **නීලවාහිනී** නාම දෙවාති. කිමස්සා පරිමාණන්ති. ගම්භීරතො පි පුථුලතො පි අඩ්ඪයොජනං දෙවාති. සෙසං පුරිම සදිසමෙව. තං පන නදිං දිසවා "සවාකඛාතො භගවතා ධම්මොති" ධම්මානුස්සතිං අනුස්සරන්තො පක්ඛන්දි.

තම්පි අතික්කමිත්වා ගච්ඡන්තෝ අපරං නදිං දිස්වා අයං කිං නාමාති පුච්ඡි. **චන්දභාගා** නාම දෙවාති. කිම්ඝනා පරිමාණන්ති. ගම්භීරතෝ පි පුථුලතෝ පි යොජන යොජනං දෙවාති. සෙසං පුරිමසදිසමේව. ඉමං පන නදිං දිස්වා ''සුපටිපන්නෝ භගවතෝ සාවක සඞ්ඝෝති'' සඞ්ඝානුස්සතිං අනුස්සරන්තෝ පක්කන්දි.

තම්පි නදිං අතික්කමිත්වා ගච්ඡන්තෝ සබ්බ සරීරතෝ නික්ඛන්ත ඡබ්බණ්ණ රසමියෝ අද්දස. නිග්‍රොධරුක්ඛස්ස සාඛා විටප පලාසානි සොවණ්ණමයානි විය අහෙසුං. රාජා වින්දෙත්ථ. අයං ඔභාසෝ නෙව චන්දස්ස න සූරියස්ස න දෙව මාර බ්‍රහ්ම නාග සුපණ්ණානං අඤ්ඤතරස්ස අද්ධා අයං සත්ථාරං උද්දිස්ස ආගච්ඡන්තා මහා ගොතම බුද්ධෙන දිට්ඨෝ භවිස්සාමීති. සෝ තාව දෙව අස්ස පිට්ඨිතෝ ඔතරිත්වා ඔනත සරීරෝ රස්මී අනුසාරෙන සත්ථාරං උපසඞ්කමිත්වා මනෝසිලා රසෙ නිමුජ්ජන්තෝ විය බුද්ධ රස්මිනං අන්තෝ පවිසිත්වා සත්ථාරං වන්දිත්වා එකමන්තං නිසීදි සද්ධිං අම්චච සහසෙන්න. සත්ථා ආනුපුබ්බිකථං කථෙසි. දෙස නාවසානෙ රාජා සපරිවාරෝ සොතාපන්නිඵලෙ පතිට්ඨහි-සි

ඉක්බිත්තෙන් සාමිනි භාග්‍යවතුන් වහන්ස! අප හැම මහණ කොට වදාළ මැනව සි කියා ආරාධනා කළ හ. බුදුරජාණන් වහන්සේ ද මොවුන්ට සෘද්ධිමය වූ පා සිවුරු ප්‍රාදුර්භූත වේ වේ හෝ සි බලා වදාරා මේ කුලදරුවෝ පසේ බුදුවරුන් දහසකට පිරිකර දහසක් දුන්හ. කසුප් බුදුන්ගේ විසිදහසක් රහතන්ට ද විසිදහසක් පිරිකර දුන්හ. එක් පිරිකරක් දෙපිරිකරක් පවා දුන් නන්ට පහළ වන කල මුන්ට පහළවීම ආශ්චර්‍යයෙක් නොවෙ සි. දැන රන් වලාගැබකින් කිස්මෙන විදුලිය කලඹක් සේ දක්ෂිණ ශ්‍රී හස්ත ය දිගුකොට වදාරා

පත්තං පරිස්සාවන කායබන්ධනං - නිච්චරං වාසි සුවිසුද්ධ සංඝෙ
දදන්ති යෙ නිච්ච පහන්න සත්තා-තෙ එති භික්ඛූනි වදන්ති බුද්ධා-සි.

යනු හෙයින්, මහණෙනි! සසර දුක් නසන පිණිස බඹසර හැසිරෙන්ට එව සි වදාළ සේක. ඒ ඇසිල්ලෙහි ම ගිහිවෙස් අතුරා දන් ව තුන්සිවුරු පාත්‍රාදී වූ අටපිරිකර දරා සියවස් පිරුණු තෙර වරුන් මෙන් අලුත මහණ වූ බවක් නො දැනෙන සේ ආකල්ප සම්පන්න ව අහසට පැන නැගිලා බැස බුදුන් වැඳ පිරිවරා වැඩ හුන්හ.

මේද දක්වන ලද මැසි.

අථ සබ්බෙව උට්ඨහිත්වා පබ්බජ්ජං යාචිංසු සත්ථා ආගම් සෙති නු ඛො ඉමෙසං කුලපුත්තානං ඉද්ධිමය පත්තචීවරන්ති උප

ධාරෙනෙතා ඉමෙ කුලපුත්තා පවෙචක බුදධ සහසසස නිවවර සහසසං අදංසු. කසසප බුදධකාලෙ වීසතියා භික්ඛු සහසසානමපි වීසති චීවර සහසසං අදංසු. අතවඡරියං ඉදධිමය පත්ත චීවරාගමනනති දකඛිණාහඨං පසාරෙතවා එථ නිකඛවො එවරථ බ්‍රහමචරියං සමමාදුකඛසස අනතකිරියායානි ආහ. තෙ තාවදෙව අටඨපරිකඛාර ධරා වසසසතික ථෙරා විය හුතවා වෙහාසං අබ්භු ගහනතවා පවෙචාරොහිතවා සතථාරං වනදිතවා නිසිදිංසු-සි.

එසේ සපිරිවරින් වැඩහුන් **මහාඛපඨින** සථවිරයන් වහන්සේ අනාචාර ආචාර දෙක හා ගොචර අගොචර දෙක ද විසෙසයෙන් දැන නොයෙක් ආදීනව ඇති දුස්සීල භාවයෙන් මිදී නොයෙක් අනුසස් ඇති සීලයෙහි ද පිහිටා වැඩහුන් සේක. එහි අනාචාර කිමෙක්ද ආචාර කිමෙක්ද අගොචර කිමෙක්ද ගොචර කිමෙක්ද දුස්සීලභාව ය හා එහි ආදීනව කිමෙක්ද සීල ය හා සීලයෙහි අනුසස් කිමෙක්ද යි යන හොත්? මේ මතු දක්වන ක්‍රමයෙන් දත යුතු. හේ කෙසේ ද යත්?

කායදවාරයෙන් සිදධවන ත්‍රිවිධ කාය දුශචරිත ය හා වාක් දවාරයෙන් සිදධවන චතුර්විධ වාක් දුශචරිත ය හා කාය වාක් දවාර දෙකින් ම සිදධවන සියලු දුශචරිතයන් කිරීම අනාචාර නම් වේ. සියලු දුසසීල්‍ය ය ම අනාචාර නම් වේ.

මේ සාසනයෙහි ඇතැම් භික්ෂු කෙණෙක් ප්‍රත්‍ය ය උපදවන පිණිස මිණිස්නට ප්‍රයෝජනවත් වූ හුණ දඬු දීමෙන් හෝ තල්පත් ආදි වූ පත්‍ර දීමෙන් හෝ සපු දුනුකේ ආදි වූ මල් දීමෙන් හෝ හාල් පොල් දෙල් පුසුල් පනසාදී ඵල දීමෙන් හෝ ඇඟ ඉලීමට සුදුසු සුණු දීමෙන් හෝ එසේ ම දැහැටි දඬු දීමෙන් හෝ තමා දැසයකු මෙන් නිවසථානයෙහි තබා ප්‍රියකාමතාවෙන් අනුන් හුවා බණන නෙපුල් ආදී ලාමක වාර්තින් හෝ මුද්ග සූප යක් වැනිවීමෙන් හෝ අනුන් දරුවන් වැඩීමෙන් ගිහින්ගේ ග්‍රාමානතර දෙසානතරාදියෙහි ශාසන ප්‍රතිශාසන හරණාහරණ සඬ්ඛ්‍යාත කකුල් මේවර කිරීමෙන් හෝ වෛද්‍යකම් නක්ෂත්‍ර භාණඩා ගාරික ග්‍රාමවිධාන පිණඩ පනිපිණඩාදි යම් කිසි බුදුන් විසින් හරණ ලද මිථ්‍යාජීවයකින් ජීවිකා කෙරෙද් ද මේ තෙම අනාචාර නම් වේ.

වදලේ මෑ නෝ ඛ්‍යාන විභඞ්ග පාලියෙහි-

ආචාරගොචර සමපන්නොනි, අත්ථි ආචාරො අත්ථි අනාචාරො තත්ථ කතමො අනාචාරො? කායිකො චීතික්කමො වාචසිකො චීතික්කමො කායික වාචසිකො චීතික්කමො. අයං වුච්චති අනා

චාරෝ. සබ්බම්පි දුස්සිල්‍යෑ අනාචාරෝ. ඉධෙකච්චෝ වෙලුදානෙන වා ප්‍රපඨ ඵල සිනාන දන්තකට්ඨ දානෙන වා චාටුකම්‍යතාය වා මුඤ්ඣසුප්පයතාය වා පාරිභට්ටතාය වා ජංඝ පෙසනිකෙන වා අඤ්ඤතරඤ්ඤතරෙන වා බුද්ධපතිරූපෙන මිච්ඡාජීවෙන ජීවිකං කප්පෙති අයං වුච්චති අනාචාරෝ-සි

මේතෙක්ත් අනාචාර දත්‍යුතු. ආචාර නම් කිම යත්? ත්‍රිවිධ කාය දුශ්චරිත නොකිරීම ය, චතුර්විධ වාක් දුශ්චරිත නොකිරීම ය, කාය වාක් දුශ්චරිත දෙක ම නොකිරීම, යන යම් මේ කාරණයක් ඇද්ද, මෙය ආචාර නම් වේ. සියලු ම සිලසංවර ය ආචාර නම් වේ ප්‍රත්‍ය ය පිණිස හුණදඬු දීම් ආදී වූ යටකී සියලු අනාචාරයෙන් දුරැලීම හා සියලු සුචරිතයන්ගේ පිරීම ආචාර නම් වේ. වදලේ මැ නෝ.

තව් කතමෝ ආචාරෝ? කායිකෝ අවීතික්කමෝ වාචසිකෝ අවීතික්කමෝ අයං වුච්චති ආචාරෝ සබ්බෝපි සීලසංවරෝ, ඉධෙ කච්චෝ න වෙලුදානෙන න පත්ත න ප්‍රපඨ න ඵල න සිනාන න දන්තකට්ඨ දානෙන න චාටුකම්‍යතා ය න මුඤ්ඣ සුප්‍යතාය න පාරිභට්ටතාය න ජංඝපෙසනිකෙන අඤ්ඤතරඤ්ඤතරෙන බුද්ධපතිරූපෙන මිච්ඡාජීවෙන න ජීවිකං කප්පෙති. අයං වුච්චති ආචාරෝ-සි.

මේතෙකින් ආචාර ය දැකට්ය සි. අගොචර නම් කවර යත්? මේහි ඇතැම් කෙණෙක් ශ්‍රමණත්වයට අන්තරාය කරණ බැවිනු දු පිරිසිදු වූ අද්ධ්‍යාශ ය ඇත්තාහට ද, ගම්‍ය හේතුවන බැවිනු දු මිත්‍ර සඤ්ඤ වශයෙනු දු නො ඵළඹිය යුතු ය සි කියන ලද වෛශ්‍යාවන් ගොචර කොට යායුතු තැන් කොට ඇත්තේ ද, වැණඹුවන් ම මල සැමියන් බැහැර ගිය සැමියන් ඇත්නවුන් ගොචර කොට ඇත්තේ ද, යා යුතු තැන් කොට ඇත්තේ ද සවාමි කුලයට නොගොස් ගෙයි හිඳ වැඩිමහළු කුමාරිය සි කියන ලද ථූලූ කුමාරිකාවන් ගොචර කොට යායුතු තැන් කොට ඇත්තේ ද, උත්සන්න වූ අව්‍යුපශාන්ත කෙලෙසුන් ඇති බැවින් ලොකාමිෂ නිශ්‍රිත කථා ව බහුලයෝනු සි නොඵළඹිය යුත්තාහ සි කියන ලද පණ්ඩකයන් ගොචරකොට යා යුතු තැන්කොට ඇත්තේ ද-

මේහෙණවුන් උන ත් සන්ත බ්‍රහ්මචර්‍යාහි ඇති බැවින් මහණු දු එසේ ම බැවින් නිරන්තරයෙන් ඵළඹිමෙහි බ්‍රහ්මචර්‍යාහි අන්තරාය ද වේනු සි නොඵළඹිය යුත්තාහ සි කියන ලද මෙහෙණින්නන් ගොචර කොට යා යුතු තැන් කොට ඇත්තේ ද, රා සොඬුන් විසින්

අවිමිකත බැවින් බ්‍රහ්මවිහරණාදිගුණ සාරණ බැවින් රහගෙය නො ඵළඹිය යුත්තාහ සි කියන ලද පානාගාර ගොචර කොට ඇත්තේ ද, යා යුතු තැන් කොට ඇත්තේ ද-

රජදරුවන් හා රජ ඉසුරු වැනි මහත් ඉසුරෙන් යුක්ත රාජ මහාමාත්‍යයන් හා තීර්ථකයන් හා ද ඔවුන් කෙරෙහි දැඩ භක්ති ඇති ප්‍රත්‍ය ය දායක වූ ශ්‍රාවකයන් හා ද ත්‍රිවිධ ශික්ෂා වන්ට ප්‍රතිපක්ෂ වූ සංසගියෙන් හැනි වෙසේ ද, යම් සේ ඒ කුල කෙණෙක් බුද්ධාදීන් කෙරෙහි ශ්‍රද්ධා නැති හෙයින් ම අප්‍රසන්න වූ හෙවත් කම්ඵල ශ්‍රද්ධා නැත්තෙන් අශ්‍රද්ධා වූ දශාක්‍රොශ වස්තු වෙන් භය දැක්වීමෙන් සංතර්ජන ය කෙරෙද් ද, අනර්ථ කැමති වෙද් ද, අහිත කැමති වෙද් ද, අඵාසු කැමතිවෙද් ද, අයොගක්ෂෙම කැමති වෙද් ද, භය කැමති වෙද් ද, භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යන සිව්වනක් පිරිසට අනර්ථාදිය කැමති වෙද් ද, එබඳු කුලයන් සෙවීම නිසා ජීවත් වෙද් ද, උන්කරා ඵළඹීමෙන් භජන ය කෙරෙද් ද, නැවත නැවත යාමෙන් පයුරුපාසන ය කෙරෙද් ද, මේ සියල්ල ම අගොචර ය සි කියනු ලැබේ.

වදලේ මැනෝ.

තත්‍ථ කතමෝ අගොචරෝ? ඉධෙකච්චෝ වෙසියා ගොචරෝ වා හොති, විධ ව ථුල්ලකුමාරිකා පණ්ඩක භික්ඛුණී පානාගාර ගොචරෝ වා හොති, සංසට්ඨෝ විහරති රාජූහි රාජමහාමත්තෙහි තිත්ථියෙහි තිත්ථිය සාවකෙහි අනනුලොමිකෙන සංසග්ගෙන, යානි වා පනෙතානි කුලානි අස්සද්ධානි අප්පසන්නානි අක්කොසක පරිභාසකානි අනත්ථකාමානි, අහිතකාමානි, අඵාසුකාමානි, අයොගක්ඛෙමකාමානි, භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති අයං වුච්චති අගොචරෝ-සි.

මෙහි පඤ්චකාම ගුණ නිශ්‍රිත බැවින් ශ්‍රමණ ධර්මයට අනුප නිශ්‍ර ය හෙයින් වෛශ්‍යාදීහු ද ලාභ සත්කාර සංස්තව නැමැති අසනිපාතයට හෙතුවන බැවින් රජදරුවන් හා මහාමාත්‍යයෝ ද දෘෂ්ටි විපත්තියට හෙතුවන බැවින් තීර්ථකයන් හා තීර්ථක ශ්‍රාවකයෝ ද ශ්‍රද්ධාහානි ය, චිත්ත ඛෙද ය, යන මොවුන් ඵළවන හෙයින් අශ්‍රද්ධාදී කුලයෝ ද අගොචර නම් වෙති සි විශුද්ධිමාගී ව්‍යාඛ්‍යාන යෙහි කිහු.

ගොචර නම් කිම යත්? අගොචර නිදේශයෙහි අගොචර කොට දැක් වූ වෛශ්‍යාවිධ ව ථුල්ලකුමාරිකා පණ්ඩ ව භික්ෂුණී පානාගාර රාජ රාජ මහාමාත්‍ය තීර්ථක තීර්ථක ශ්‍රාවකයෝ ය

යන දස අගොචරයෙහි නොහැසිර භජනය පයිරුපාසනාදිය නොකොට යම් ඒ කුල කෙණෙක් අශ්‍රද්ධාදී දෙඅයෙන් යුක්ත නොවේද ද, සිව්වණක් පිරිසට වැඩක් ම මුත් අවැඩ කැමති නොවේද ද, බුද්ධාදීන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් යුක්තයෝ ද, එ හෙයින් ම ප්‍රසන්නයෝ ද, හෙවත් කම්ඵල ශ්‍රද්ධා ඇත්තෙන් ශ්‍රද්ධා විහතයෝ ද, රත්නත්‍රය ප්‍රසාද ඇති බැවින් ප්‍රසන්නයෝ ද, දශා ක්‍රෝශ වස්තුවෙන් ආක්‍රෝශ හා භය දැක්වීමෙන් සංතර්ජන ය නොකෙරෙන් ද, අඩියක් ම කැමති වෙත් ද-

භිතයක් ම කැමැති වෙද්ද, සැපයක් ම කැමැතිවෙද් ද, යොගක්ෂේම කැමැතිවෙද් ද, අභය කැමැතිවෙද් ද, සිව්වණක් පිරිසට අර්ථාදියක් ම කැමැතිවෙද් ද, සඞ්ඝයාට සතරමන් සඤ්ඤෙහි බුන් උදක පානයක් වැනි වෙද් ද, භික්ෂූන් පෙරවූ සිවුරෙහි ප්‍රභාවයෙන් එකාලොක වෙද් ද, ගෙට වදනා නික්මෙන භික්ෂු භික්ෂුණී සඞ්ඝයාත සාඞ්ගේ චීවර වාත සංඝට්ටන ප්‍රභාරණයෙන් ජනිත ශරීර වාතයෙහු දූ යුක්තයෝ ද, "අත්තකාමානි" යනාදීන් දක්වන ලද ගුණයෙන් යුක්තයෝ ද, ඒ බදු කුලයන් නිසා ජීවත් වේ ද, භජනය පයුරුපාසනය කෙරේ ද, මේ තෙමේ ගොචර නම් වේ

එසින් වදාළහ.

තත්‍ථ කතමෝ ගොචරෝ ඉධෙකච්චෝ න වෙසියා ගොචරෝ විධවා ථුල්ලකුමාරිකා භික්ඛුණී පාණාගාර ගොචරෝ වා නොහෝ, අසංසට්ඨෝ විහරති රාජූහි රාජමහාමත්තෙහි නිත්ථියෙහි තිත්ථිය සාවකෙහි අනුලොමිකෙන සංසග්ගෙන, යානි වා පන තානි කුලානි සද්ධානි පසන්නානි ඔපාන භූතානි කාසාවපජ්ජොතානි ඉසි වාත පරිවාතානි අත්තකාමානි භිතකාමානි ඵාසුකාමානි යොගක්ඛෙම කාමානි භික්ඛූනං භික්ඛුණීනං උපාසකානං උපාසිකානං තථාරූපානි කුලානි සෙවති භජති පයිරුපාසති. අයං වුච්චති ගොචරෝ—ති.

අපි ච—යට කී අනාචාර ආචාර දෙකෙහි කායික අනාචාරය වාචසික අනාචාරය යි කියා අනාචාරය ද්විප්‍රකාර වේ. ඒ දෙක්හි කායික අනාචාර නම් කවර යත්?

ඇතැම් භික්ෂු කෙණෙක් සඞ්ඝ සන්නිපාතයට පැමිණියේ ද, නොකරණ ලද ගෞරව ඇති ව සථවිර භික්ෂූන් සිවුරෙන් හෝ ශරීරයෙන් හෝ ගටමින් සිටිනේ ද, එ සේ ම ගටමින් හිඳිනේ ද, ඉදිරියෙහි සිටිනේ ද, මිතුයෙහි සිටින්නාක්හු සෙයින් ගෞරව නැති ව සිටිනේ ද, එ සේ ම ගෞරව නැති ව

ඉදිරියෙහි හිඳී ද, උස් අස්නේ හිඳී ද, හිස වසා පෙරව හිඳී ද, ආසන්න තැන සිට බෙණේ ද, අත වන වනා බෙණේ ද සථවිර භික්ෂූන් වහන් තැනි ව සක්මන් කරද්දී වහන් තැනී සක්මන් කෙරේ ද, සථවිර භික්ෂූන් මිටි සක්මණෙහි සක්මන් කරද්දී උස් සක්මණෙහි සක්මන් කෙරේ ,ද

බිම සක්මන් කරද්දී පිරිසුදු සක්මණ සක්මන් කෙරේ ද, සථවිර භික්ෂූන් සිවිතැනට වැද ආසන්න ව සිටි ද, නවිහට බාල භික්ෂූන් වළඳන්නට උන් අස්න ආදී වූ පස්අස්නෙන් නගා පිළිබහා ද ගිනිගල් ගෙයි සථවිර භික්ෂූන් නොවිවාරා දර දමා ගිනි දල්වා ද, ගිනිගල් ගෙයි දොර වසා ද, පැන්තොටෙහි සථවිර භික්ෂූන් ගටමින් බසී ද, ඉදිරි ව බසී ද, ගටමින් නහා ද ඉදිරිව නහා ද ගටමින් නැගේ ද, ඉදිරිව නැගේ ද ඇතුළු ගමට වදනේ සථවිර භික්ෂූන් ගටමින් යේ ද, ඉදිරි ව යේ ද, සථවිර භික්ෂූන් ඉක්ම පළමු ව යේ ද, කුලවැස්සන්ගේ යම් ඒ ගර්හ සඞ්ඛ්‍යාත ගෙවල් ආදියක් ආවරක වෙද් ද, පියවින් ම මුවහ කඩතුරා ආදියකින් ම මූවහ වූ ගමෙක ගෙදොරක කුලසන්‍ථිහු කුලකුමාරීහු හිඳිද් ද, ඒ සථානයට වහා වදනේ ද, කුමාරවරුන්ගේ හිස පිරිමදී ද, මේ කායික අනාචාර නම් වේ.

වාචසික අනාචාර නම් කවර යන්? මේහි ඇතැම් සහ කොණෙක් ගෞරව තැනි ව සථවිර භික්ෂූන් නොවිවාරා බණ කියා ද, පැන විසඳ ද, පාමොක් උදෙසා ද, නො නැමී සිටි තැන ම සිට බෙණේ ද, අත වන වනා බෙණේ ද, ඇතුළු ගමට වන්නේ ද, සත්‍රියකට හෝ කුමාරියකට හෝ මෙ නම් තැනැත්නි ය මෙ නම් ගොත්‍රයන් ඇත්නි ය. කිමෙක් ඇද් ද කෑද ඇද් ද බත් ඇද් ද කැවුම් ඇද් ද. කුමක් බොමෝ ද කුමක් කමෝ ද කුමක් වළඳමෝ ද මට කුමක් දේ දැ සි දෙඩා ද, මෙ තෙම වාචසික අනාචාර ය සි කියනු ලැබේ. ආචාර ය වනාහි මෙයට ප්‍රතිපක්ෂ වසයෙන් වෙදිතව්‍ය සි.

එසින් වදාළ හ.

දුව්ඩොහි අනාචාරෝ කායිකෝ වාචසිකෝ ච. තත්‍ථ කත මෝ කායිකෝ අනාචාරෝ? ඉධෙකච්චෝ සඞ්ඝගතොපි අවිත්‍ථති කාරකතෝ ථෙරෙ භික්ඛූ ඝට්ටයන්තොපි තිට්ඨති. ඝට්ටයන්තොපි නිසීදති. පුරතොපි තිට්ඨති. පුරතොපි නිසීදති. උභෙවපි ආසනෙ නිසීදති, සසීසමාවෙ පාරුපිත්වා නිසීදති, සීතකොපි හණ්ත් බාහාවිකොපකොපි හණති ථෙරානං භික්ඛූනං අනුපාහනානං

වඞ්කමිනානං සඨපායනෝ වංකමති, නීවෙ වංකමේ වංකමිනනා නං උවෙව වංකමේ වංකමති ඡම්‍යා වංකමිනනානං වංකමේ වංකමති. ථෙරෝ භික්ඛූ අනුපඛජ්ජාපි නිට්ඨති අනුපඛජ්ජාපි නිසීදති න වෙපි භික්ඛූ ආසනෙන පටිබාහති--

ජනතාඅරෙපි ථෙරෙභික්ඛූ අනාපුච්ඡා කථං පක්ඛිපති දවාරං විදහති උදකතිත්ථෙපි ථෙරෙභික්ඛූ ඝට්වයනෙනාපි ඔතරති පුරතොපි ඔතරති ඝට්වයනෙනාපි නහායති පුරතොපි නහායති ඝට්වයනෙනාපි උත්තරති පුරතොපි උත්තරති අන්තරඝරං පවිසනෙනාපි ථෙරෙභික්ඛූ ඝට්වයනෙනාපි ගච්ඡති පුරතොපි ගච්ඡති වොක්කමෙමෙව ථෙරානං භික්ඛූනං පුරතො ගච්ඡති යානි පි තානි හොනති කුලානං ඔවරකානි ගුළ්හානි ව පටිච්ඡන්නානි ව යත්ථ කුලිත්ථියො කුල කුමාරියො නිසීදනති තත්ථ සහසා පවිසති කුමාරකස්සපි සිරං පරාමසති. අයං වුච්චති කාසිකො අනාචාරො.

තත්ථ කතමො චාවසිකො අනාචාරො? ඉධෙකච්චෙ අච්ත්තිකාරකතො ථෙරෙ භික්ඛූ අනාපුච්ඡා ධම්මං භණති පඤ්හං විස්සජ්ජෙති පාතිමොක්ඛං උද්දිසති සිතකොපි භණති බාහා විකොපකොපි භණති අන්තරඝරං පවිට්ඨොපි ඉත්ථිං වා කුමාරිං වා එවමාහ. ඉත්ථන්නාමෙ ඉත්ථං ගොත්තෙ කිං අත්ථි යාගු අත්ථි භත්තං අත්ථි බාදනීයං අත්ථි කිං පිවිස්සාම කිං බාදිස්සාම කිං භුඤ්ජිස්සාම කිං වා මෙ දස්සථාති විපලපති. අයං වුච්චතාවුසො චාවසිකො අනාචාරො. පටිපක්ඛවසෙන පනස්ස ආචාරො වෙදිතබ්බො--සි.

නිස්සුහට හැම තැන්හි ම ආචාර දර්‍ශන වසයෙන් ප්‍රවෘත අර්ථ කථා වචන නිර්දේශ පාළි නො වෙ යි කියා විශුද්ධිමාගී ව්‍යාඛ්‍යානයෙහි කිහු. අනිකෙකු දු, මහණතෙමේ ශ්‍රද්ධා ත්‍යාගාදි ගුණ හේතුකොට ඇති ගෞරවයෙන් යුක්ත වූයේ ගුරුස්ථාන යෙහි ගෞරවාකාරාදී වසයෙන් ප්‍රතිශ්‍රව සහිත වූයේ හෙවත් ගුරු ස්ථානයෙහි නීව වෘත්ති ඇත්තේ හිරි ඔතප් දෙකින් යුක්ත වූයේ සෙඛිය ධම් පාරිපූර වසයෙන් මනාකොට හැඳ පෙරවියේ ප්‍රසාද ළුවනු වූ ගමන් ඇනියේ ඊම ඇනියේ ඉදිරි බලන බැලුම් ඇනියේ අනුදික් බැලුම් ඇනියේ හසන පාදයන් හැකිළීම් හා දික්කිරීම් ඇනියේ දික් ආදි ය නො බලා යුගමාත්‍ර දර්‍ශන වස යෙන් යටට හෙළූ ඇස් ඇනියේ ප්‍රසාදකර ඉරියව් ඇතිඔන බැවින් ම සම්පූණී වූ ඉරියව් ඇනියේ පසෙඛ්ඛඤ්ඤය යන් කෙරෙහි

සුසංවෘත ආරක්ෂා ඇතියේ පරිභුඤ්ජිතව්‍ය බැවින් භොජන සංඥා වූ චතුධම්ප්‍රත්‍යයෙහි පර්‍යේෂණ ප්‍රතිග්‍රහණ පරිභෝගාදී විසින් සම්‍ප්‍රකාරයෙන් ප්‍රමාණ දන්නේ භාවනා මනස්කාර සඞ්ඛ්‍යාත ජාගර්‍යානුයෙහි යුක්ත ප්‍රයුක්ත වූයේ සතිසම්පජඤ්ඤ සඞ්ඛ්‍යාත සිහි නුවණ දෙකින් යුක්ත වූයේ අල්පේච්ඡ වූයේ සන්තුෂ්ට වූයේ වැඩි ඊර්‍ෂ්‍යා ඇත්තේ ආභිසමාචාරික සිලයෙහි සකාර්‍යකාරී වූයේ ආදරකරන්නේ ගුරුස්ථානයෙහි ආදරබහුල වූයේ වෙසේ ද, මේ සගාරවාදි ය තෙමේ ආත්ම කාමයන් විසින් ආචරිතව්‍ය බැවින් ආචාර ය සි කියනු ලැබේ.

හෙ ද දන්වන ලද මැ සි.

භික්ඛු සගාරවෝ සප්පතිස්සෝ භිරොත්තප්ප සම්පන්නෝ සුනිවත්ථෝ සුපාරුතෝ පාසාදිකෙන අභික්කන්තෙන පටික්කන්තෙන ආලොකිතෙන විලොකිතෙන සම්මිඤ්ජිතෙන පසාරිතෙන ඔක්කිත්ත චක්ඛු ඉරියාපථ සම්පන්නෝ ඉන්‍ද්‍රියෙසු ගුත්තද්වාරෝ භොජනෙ මත්තඤ්ඤූ ජාගරියානුයුත්තෝ සතිසම්පජඤ්ඤෙන සමන්නාගතෝ අප්පිච්ඡෝ සන්තුට්ඨෝ ආරද්ධවිරියෝ ආභිසමාචාරිකෙසු සක්කච්චකාරී ගරුචිත්තීකාර බහුලෝ විහරති. අයං වුච්චති ආචාරෝ. එවං තාව ආචාරෝ වෙදිතබ්බෝ—සි.

ගොචර ය වනාහි ත්‍රිවිධ වේ. හේ කවරේ ද? උපනිශ්‍ර ය ගොචර ය-සමීපනිසඞ්ඛ්‍යාත වූ සිතට ආරක්ෂක වූ ගොචර ය-කර්‍ම ස්ථාන සඞ්ඛ්‍යාත වූ සිත්හු උපනිබන්ධ ගොචර ය-යන වේ සි. එහි උපනිශ්‍රය ගොචර ය නම් කවරෙක් ද? අල්පේච්ඡ කථා ආදී වූ දස කථාවන්ට පිහිට වූ ගුණයෙන් සමන්විත වූ කල්‍යාණමිත්‍ර තෙම උපනිශ්‍රය ගොචර නම් වේ. යම් කල්‍යාණ මිත්‍රයෙක් නිසා අශ්‍රැත සඞ්ඛ්‍යාත පෙර නො ඇසූ සූත්‍ර ගෙය්‍යාදී ධර්‍මයන් අසනු ලැබේ ද, ඇසූ දෙය නැවත නැවත පරිපුච්ඡාවෙන් සාකච්ඡාවෙන් ඇසීමෙන් විසුද්ධ වේ ද, ශ්‍රැතස්ථානයෙහි සංස ය සි කියන ලද සැක දුරු වේ ද, කර්‍මඵලයෙහි දු රත්නත්‍රයෙහි දු සම්‍යක් දෘෂ්ටි ය සෘජු කරණ වසයෙන් දෘෂ්ටි ය සෘජු කෙරේ ද, එහි ම ශ්‍රද්ධාවෙන් සිත පහදවා ද, යමක්හු අනුව නික්මෙන්නේ ශ්‍රද්ධාවෙන් වඩි ද සීලයෙන් වඩි ද, ශ්‍රැතයෙන් වඩි ද, ත්‍යාගයෙන් වඩි ද, ප්‍රඥාවෙන් වඩි ද, මේ උපනිශ්‍රය ගොචර නම් වේ.

ආරක්ෂක ගොචර නම් කවර යත්? මෙහි භික්ෂුතෙමේ ඇතුළගමට හිපියට වන්නේ යටට හෙළූ ඇස් ඇති ව යුගමාත්‍ර යක් ම බලන්නේ සංයත වූයේ සිහි ඇති ව යන බැවින් ඇත්

අස් රථ පනහි යන්ති පුරාණයන් නො බලනු යේ උඩ නො බලනු යේ කොදු නමා කදට බිඳ බිම් නො බලනු යේ දික් අනුදික් නො බලනු යේ සෙඛියා ප්‍රතිපත්තියෙන් . හැසිරේ ද, මේ ආරක්‍ෂක ගොචර නම් වේ.

කවරෙක් උපනිබන්ධ ගොචර නම් ද යත්? සතරමහා සිවටන්හු යි. යම් සතිපට්ඨානයෙක්හි භාවනා චිත්ත ය එළවා බඳී ද, ඒ සතරමහා සතිපට්ඨානයෝ උපනිබන්ධ ගොචර නම් වෙති. මහණෙනි! භික්‍ෂූහුගේ ගොචර ය කවරෙක් ද? තමා ගේ පිතෘ වූ සම්‍යක් සම්බුද්ධයන් සන්තක වූ යම් මේ සතරමහා සිවටන් කෙණෙහි ඇද් ද, මේ උපනිබන්ධ ගොචර ය යි කියා ද වදාරණ ලදි. මේ සේ මේ ආචාරයෙන් ද මේ ගොචරයෙන් ද උපෙත වූයේ ද සමන්විත වූයේ ද ඒ හෙයින් ආචාර ගොචර සම්පන්න ය යි කියනු ලැබේ. හෙ ද පාළි ය හා සම්බන්ධ අර්ථ වසයෙන් දක්වන ලදි.

ගොචරෝ පන තිවිධෝ, උපනිස්සය ගොචරෝ ආරක්ඛ ගොචරෝ උපනිබන්ධ ගොචරෝති. කතමෝ උපනිස්සය ගොචරෝ? දස කථා වත්ථු ගුණ සමන්නාගතෝ කල්‍යාණ මිත්තෝ යං නිස්සාය අස්සුතං සුණාති සුතං පරියොදපෙති කඞ්ඛං විතරති දිට්ඨිං උජුං කරොති චිත්තං පසාදෙති යස්ස වා පන අනුසික්ඛමානෝ සද්ධාය වඩ්ඪති සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය වඩ්ඪති. අයං උපනිස්සය ගොචරෝ. කතමෝ ආරක්ඛ ගොචරෝ? ඉධ භික්ඛු අනන්තරස්සං පච්චෙය්‍ය චීවරං පටිපන්නෝ ඔක්ඛිත්තචක්ඛු යුගමත්ත චක්ඛු යුගමත්තදස්සාවී සංවුතෝ ගච්ඡති න හත්ථිං ඔලොකෙ නෝ න අස්සං න රථං න පත්තිං න ඉත්ථිං න පුරිසං ඔලොකෙන්තෝ න උද්ධං ඔලොකෙන්තෝ න අධෝ ඔලොකෙන්තෝ න දිසා විදිසම්පි පෙක්ඛමානෝ ගච්ඡති. අයං ආරක්ඛගොචරෝ. තත්‍ථ කතමෝ උපනිබන්ධ ගොචරෝ? චත්තාරෝ සතිපට්ඨානා යත්‍ථ චිත්තං උපනිබන්ධති. වුත්තං හෙතං භගවතා කොච භික්ඛවෙ භික්ඛුනෝ ගොචරෝ සකෝ පෙත්තිකෝ විසයෝ යදිදං චත්තාරෝ සතිපට්ඨානානි. අයං උපනිබන්ධගොචරෝ. ඉති ඉමිනා ච ආචාරෙන ඉමිනා ච ගොචරෙන උපෙතෝ සමන්නා ගතෝ, තෙන වුච්චති ආචාර ගොචර සම්පන්නෝ—ති.

මේ ආදී නොයෙක් ආකාරයෙන් විසුද්ධිමාර්ගයහි විභාග කොට දක්වන ලද ප්‍රභෙද ඇති සීලයාගේ සංකිලෙස බව පිරිසිදු බව කෙසේ ද යත්? ඛණ්ඩාදිභාව ය සකිලිටු බව නම් වේ. අඛණ්ඩාදි භාව ය පිරිසිදු බව නම් වේ

ඒ හෙයින් කිහ.

"සෝ පන ඛණ්ඩාදිභාවෝ සීලස්ස සංකිලෙසෝ අඛණ්ඩාදි භාවෝ වොදානං-සි" ඒ ඛණ්ඩාදිභාව ය වනාහි ලාභ යස ඥති ආදීන් හෙතුකොට ඇති හෙදයෙන් ද සප්තවිධ මෛථුන සංයොගයෙන් ද සංග්‍රහ කරණ ලදි.

එසින් කිහ.

"සෝ පන ඛණ්ඩාදිභාවෝ ලාභ යසාදි හෙතුකෙන ච සත්තවිධ මෙථුන සංයොගෙන ච සංගහිතෝ-සි.

ඒ එසේ මැ සි. යමක්හුගේ සත් ඇවැත් කදුන් කෙරෙහි ආදියෙහි හෝ කෙළවර හෝ සිකපදයෙක් බිඳෙන ලද්දේ වේ ද ඔහුගේ සීල ය පර්‍යන්තයෙහි සිදුනා ලද වස්ත්‍රයක් මෙන් ඛණ්ඩ නම් වේ යමක්හුගේ සීල ය වනාහි මධ්‍යයෙහි ශික්ෂාපදයෙක් භින්න වී නම් ඔහුගේ සීල ය මධ්‍යයෙන් සිදුරා වූ පිළියක් මෙන් ඡිද්‍ර නම් වෙ සි යමක්හුගේ සීල ය පිළිවෙළින් දෙතුන් ශික්ෂාපද කෙණෙක් බිඳෙන ලද්දහු වෙද් ද ඔහුගේ සීල ය වනාහි පිට පිට හෝ කුස හෝ නැඩහා වූ එක වර්ණයක් නැති හෙයින් විසභාග වර්ණයෙන් යුක්ත වූ කාළ රත්තාදි එක්තරා වර්ණයක් ඇති දෙනක මෙන් හෙවත් කබර දෙනක මෙන් සබල නම් වෙ සි. යමක්හුගේ සීල ය අතරතුරෙහි ශික්ෂා පදයෝ බිඳෙන ලද්දහු වෙද් ද ඔහුගේ සීල ය අතරතුරෙහි සභාග වර්ණ බිඳුනෝ සමපැහැ ඇති බිඳුමෙන් විසිතුරු දෙනක මෙන් තිත් දෙනක මෙන් කල්මාස නම් වෙසි. මේ සේ පළමු කොට ලාභාදීන් හේතුකොට ඇති හෙදයෙන් ඛණ්ඩාදි භාව ය ලාභාදීන්ගේ හෙතුවෙන් ද සප්තවිධ මෛථුන සංයෝග යෙන් ද සංග්‍රහ කරණ ලදැ සි දත යුතු වේ.

දක්වන ලද මැ සි විසුද්ධිමාර්ගයෙහි

"එවං ලාභාදිහෙතුකෙන නෙදෙන සත්තවිධ මෙථුන සංයෝ ගෙන ච ඛණ්ඩාදිභාවෝ සංගහිතොති වෙදිතබ්බා"සි අඛණ්ඩාදි භාව ය වනාහි සියලු ම ශික්ෂාපදයන්ගේ නොබිඳීමෙන් ද භින්න වූ ශික්ෂාපදයන්ට ධර්මානුකූල ව පිළියම් කිරීමෙන් ද සත්වැදෑරුම් වූ මෛථුන සංයොගයන්ගේ අභාවයෙන් ද අනික් කිපෙණ ලකුණු ඇති ක්‍රොධ ය, උපනාහ ය සි කියන ලද නැවත නැවත වෛර බඳිමින් උපදනා දොෂ ය සහගියා වූ චිත්තොත්පාද ය, පලාස ය සි කියන ලද අනුන් ගුණ හා සමගුණ ඇතිවි ය නො හෙම් යන දෙම්නස් සහගි ය චිත්තොත්පාද ය, ඊර්ෂ්‍යා ය සි කියන ලද අනුන් ගේ ලාභ සත්කාර ගරුකාර මානන වන්දන පූජාදි ය දැක

ගැටෙමින් උපදනා ර්ෂ්‍යා ය, මාත්සර්‍ය ය යි කියන ලද තමාගේ සැපත අන් කිසිවක්හට නො මෙව යි යන මිසුරු බව ය, මායා ය යි කියන ලද ඇති දෙස් මුවහ කරණ ලොභාකාර චිත්තොත්පාදය.

සාඨෙය්‍ය ය යි කියන ලද තමා කෙරෙහි නැතිගුණ පහළ කරණු කැමති ලොභ සහගත චිත්තොත්පාද ය, ථම්භ ය යි කියන ලද නගුලිස හිලි පිඹුරෙකු මෙන් උත්තමයන් ට නොනැමෙන මාන සහගත චිත්තොත්පාද ය, සාරම්භ ය යි කියන ලද පැන්වසන සෙවලයක් මෙන් හිරසද වසන වලාවක් මෙන් අනුන්ගේ ගුණ මැකුවිස නො දී වසනු කැමති දෙම්නස් සහගිය චිත්තොත්පාද ය, මාන ය යි කියන ලද ජාති ආදියෙන් තමා ම උසස් කරණ ලකුණු ඇති මාන ය, අතිමාන ය යි කියන ලද අතිශයින් අභිමාන ඇති බව ය, මද ය යි කියන ලද ජාති විද්‍යා වසතු ආදියෙන් මත්වෙන බව ය, ප්‍රමාද ය යි කියන ලද පඤ්චකාම ගුණයෙහි උපදනා චිත්තොත්පාද ය, යන මේ ආදී වූ පාප ධර්මයන් නො ඉපද වීමෙන් ද, අලොල් අදහස් ඇති බව හා ඉතරිතර පසයෙන් සහිටු බව හා සල්ලේඛ ය යි කියන ලද බහුනඤ්ඤා දි භාවයෙන් සැහැල්ලු බව හා යන මේ ආදී වූ ගුණයන්ගේ උත්පත්තියෙන් ද, සඞ්ග්‍රහ කරණ ලදි. **දන්වන ලද මැ සි**—

අඛණ්ඩාදිභාවෝ පන සබ්බසෝ සික්ඛාපදානං අභෙදෙන නිත්‍යානඤ්ච සපපටිකම්මානං පටිකම්ම කරණෙන සත්තාවිධ මෙථුන සංයොගාභාවෙන අපරාය ව කොධෝ උපනාහෝ මක්ඛෝ පළාසෝ ඉස්සා මච්ඡරියං මායා සාඨෙය්‍යං ථම්භෝ සාරම්භෝ මානෝ අතිමානෝ මදෝ පමාදෝති ආදීනං පාපධම්මානං අනුප්පත්තියා අපිච්ඡතා සන්තුට්ඨිතා සල්ලේඛතාදීනඤ්ච ගුණානං උප්පත්තියා සංගහිතෝ-සි.

යම් සීල කෙණෙක් ලාභාදීන් පිණිස අනිත්‍යයෝ ද යම් කිසි ප්‍රමාද දෙෂයකින් භින්න වුව ද තදනුකූල පිළියම් කරණ ලද්දහු ද සත් වැදෑරුම් වූ මෛථුන සංයෝගයෙන් ද ක්‍රොධූපනාහාදී වූ පාප ධර්මයන් විසින් නො පහරණ ලද්දහු ද නෙවත් නො නටුවාහු ද සීඃකාරයෙන් අඛණ්ඩ ය හ අවිච්ඡිද්‍ර ය හ අසබ්‍බල ය හ අකල්මාසයන සි කියනු ලැබෙද් ද, ඒ සීලයෝ ම තෘෂ්ණාදූසව්‍යයෙන් මුදන බැවින් භුජිස්‍ය නම් වෙති. නුවණැත්තන් විසින් ප්‍රශස්ත බැවින් විඤ්ඤූප්‍රශස්‍ය නම් වෙති. තෘෂ්ණා දෘෂ්ටි දෙදෙනා විසින් නො පිරි මට බැවින් අපරාමට්ඨ නම් වෙති. උපචාර සමාධි ය හෝ අප්පණා සමාධි ය හෝ පවත්වානු යි සමාධි සංවත්තනිකනම් වෙති. ඒ හෙයින් ඒ සීලයන්ගේ මේ අඛණ්ඩාදි භාව ය පිරිසිඳු බව ය යි දත යුතු.

කියේ මැ නෝ

යානි සීලානි ලාභාදීනම්පි අත්ථාය අභින්නානි පමාදෙ දෙසෙ න වා භින්නානිපි පටිකම්මානි මේථුන සංයොගෙනි ච කොධූප නාහාදී හි පාපධම්මෙ හි අනුපහතානි සබ්බසෝ අඛණ්ඩානි අච්ඡ ඡානි අසබලානි අකම්මාසානීති වුච්චන්ති, තානියෙව භුජිස්සභාව කාරණතො ච භුජිස්සානි විඤ්ඤූහි පසත්ථතා විඤ්ඤූපපසත්ථානි. තණ්හාදිට්ඨිහි අපරාමට්ඨතා අපරාමට්ඨානි. උපචාරසමාධිං අපපණාසමාධිං වා සංවත්තන්තීති සමාධි සංවත්තනිකානි ච හොන්ති. තසමා තෙසං එස අඛණ්ඩාදි භාවො වොදානන්ති වෙදි තබ්බො.

ඒ පිරිසිදු භාවය වනාහි දෙයාකාරයකින් සිදු වේ. හේ කෙසේ ද යත්? සීලවිපත්තියෙහි ආදීනව දැක්මෙන් ද සිල සම් පත්තියෙහි අනුසස් දැක්මෙන් ද යන මේ දෙකිනි. එහි සිල විපත්තියෙහි ආදීනව ය කවර යත්? දුස්සිල පුද්ගල තෙමේ තමා ගේ දුස්සීල තෙතුවෙන් දිව්‍යමනුෂ්‍යයන්ට අමනාප වෙයි. සබ්බ්‍රහ්ම සරුන් විසින් පිළිකුල් බැවින් අනුසාසනා කටයුතු නො වෙ යි. දුස්සීලයන්ට ගර්හා කරණ කල්හි මම ත් මෙ බදු ගර්හාවට යොග්‍ය වීමි යි තෙමේ දුකඛිත වෙ යි. සිල්වත් හට ප්‍රසංසා කරණ ලද කල්හි මම මෙ බඳු ප්‍රශංසාවට අයොග්‍ය වීමි යි සිතා කළ කිරෙ යි. එ ම දුස්සීල භාවයෙන් සඟවා වැහැරියෙන් කළ රෙදි කඩක් මෙන් ගුණවණ්ණයෙන් සරීර වණ්ණයෙන් රහිත වෙ යි. යම් කෙණෙක් වනාහි ඒ දුස්සීලයාගේ ලබ්ධි ය අනුව යාමට පැමි ණෙද්ද ඔවුන්ට බොහෝ කලක් අපාය දුක් එළවන බැවින් දුක්ඛස්පර්ශී ඇති වෙ යි. යම් කෙණෙකුන්ගේ දෙය්‍ය ධර්‍ම ය පිළිගෙණ ඔවුන්ට මහත් ඵල කොට දීමට අසමර්‍ථ බැවින් මදක් අගනේ යි. අනෙක වර්‍ණ සමූහයෙහි සඤ්ඡාත වූ ගුථ කූපයක් මෙන් පිරිසිදු කිරීමට නුපුලුවන් වෙ යි. දෙකොණ හිනිහත් මැද අමේධ්‍යයෙන් වැකුණු සොහොන් පෙතෙල්ලක් මෙන් ශ්‍රමණ භාවයට ද ගිහි භාවයට ද නො ගත යුතු වෙ යි.

මම භික්ෂු ය යි කියා ප්‍රතිඥා කරණ ලද්දේ ද මහණ දම් නැති හෙයින් අභික්ෂු ම වෙ යි. හොඟ ණයන් අනුබඳනා වූ කොටළුවෙකු මෙන් සහතයෙන් උද්බිග්න වන්නේ කල කිරෙ යි. සියළු දෙනා හට වෛරී පුද්ගලයෙක්හු මෙන් දුටු දුටු සිල්වතුන් විසින් ධර්‍මචිත්‍ත ය වසයෙන් නිහඬ කොට හරණ බැවින් සංවාසයට සුදුසු නො වෙ යි. මෘත කලෙබරයක් මෙන් බහුශ්‍රුතාදි ගුණ යෙන් යුක්ත වූයේ ද නොනොත් ත්‍රිපිටක ධාරී වූයේ ද සබ්බ්‍රහ්ම සරුන්ගේ පූජාවට සුදුසු නො වෙ යි. බ්‍රාහ්මණයන්ට සොහොන්

යින්නක් මෙන් විසෙසාධිගමයට අභව්‍ය වෙයි. රූපයන්ගේ දැක්මේහි අඤ්ඤපුරිසයක් හු මෙන් සද්ධම්යෙහි ආශා නැති වෙයි. රාජ්‍යයෙහි සැබෑල් කුමාරයක් හු මෙන් සුව වෙමි යි සිතන්නේ ද දුසඤ්ඤිත ම වෙයි. මේ ආදී වසයෙන් සීල විපත්තියෙහි ආදීනව දත යුතු.

දැන්වන ලද මැ සි. විශුද්ධි මාර්ගයෙහි—

දුස්සීලෝ පුග්ගලෝ දුස්සීල්‍යහෙතු අමනාපෝ හොති දෙව මනුස්සානං, අනනුසාසනියෝ සබ්‍රහ්මචාරීනං, දුක්ඛිතෝ දුස්සීල ගරහාසු, විප්පටිසාරී සීලවතං පසංසාසු, තාය ව පන සීල්‍යතාය සාණසාටකෝ විය දුබ්බණ්ණෝ හොති. යෙ බෝ පනස්ස දිට්ඨානුගතිං ආපජ්ජන්ති, තෙසං දීඝරත්තං අපාය දුක්ඛාවහනතෝ දුක්ඛ සම්පත්තෙසා. යෙසං දෙය්‍යධම්මං පතිගණ්හාති, තෙසං න මහප්ඵල කරණතෝ අප්පඡෙසා. නෙකවස්ස ගණික ගුථකූපෝ විය දුබ්බිසොධෝ, ඡවාලාතමිව උනතෝ දුරිබාධිරෝ, භික්ඛු භාවං පවිජානනෙනා'පි අභික්ඛුයෙව, ගොහනං අනුබද්ධ ගද්‍රහෝ විය. සතතුබ්බිගෙහා සබ්බවෙරි පුරිසෝ විය අසංවාසාරහෝ, මත කබෙළරං විය, සුතාදි ගුණයුත්තෙනා පි සබ්‍රහ්මචාරීනං අදූජාරහෝ, සුසානග්නි විය බ්‍රාහ්මණානං, අහබෙබා විසෙසාධිගමෙ අඩෙඩාව රූපදස්සනෙ, නිරාසෝ සද්ධම්මෙ චණ්ඩාල කුමාරකෝ විය රඤ්ඤෝ, සුඛිනොසම්හි ඉඤ්ඣමානෝ පි දුක්ඛිතෝ යි.

නව ද යම් උපක්ලෙශ කෙණෙකුන් විසින් උපක්ලෙශ වූ (කිලුටු) චන්ද්‍රසූර්‍යයෝ නො බබලද්ද විසෙසයෙන් නො දිලිහෙද්ද එ බඳු වූ උපක්ලෙශයෝ සතර දෙනෙක් වෙත්. ඔහු කවුරු ද යත්? අභ්‍යාගතික ය-ධූමරාජ ය-රාහු ය-යන මොහු චන්ද්‍රසූර්‍යයන්ට උපක්ලේශ නම් වෙත්. එ පරිද්දෙන් ම යම් උපක්ලෙශ කෙණෙකුන් විසින් උපක්ලෙශ වූ ශ්‍රමණබ්‍රාහ්මණයෝ නො බබලද්ද විශෙෂයෙන් නො දිලිහෙද්ද එ බඳු වූ උපක්ලෙශයෝ සතර දෙනෙක් වෙත් ඔහු කවුරු ද යත්? සුරාපානය කෙරෙද්ද සුරාපාන ය කිරීමෙන් වෙන් නොවෙද්ද එසේ වූ සමහර ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ද ඇත. යම් උපක්ලෙශ කෙණෙකුන් කරණ කොට ගෙණ ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක් නො බබලද්ද විසෙස යෙන් නො දිලිහෙද්ද මේ එහි ප්‍රථමොපක්ලෙශ ය නම් වේ.

එ සේ ම මෛථුන ධම්ම ය සෙවන ය කරන්නානු වෙද්ද මෛථුන ධම්යෙන් දුරු නො වේ ද එසේ වූ සමහර ශ්‍රමණබ්‍රාහ්මණ කෙණෙක් ඇත. යම් උපක්ලෙශ කෙණෙකුන් කරණ කොට ගෙණ ශ්‍රමණබ්‍රාහ්මණයෝ නො බබලද්ද විසෙසයෙන් නො දිලිහෙද්ද මේ එහි දෙවෙනි උපක්ලෙශ ය නම් වේ. රන්රිදී

මසු කහවණු පිළිගන්නාහු වෙද් ද කැමතිවෙන්නාහු වෙ ද්ද එසින් දුරුනොවෙද් ද, එසේ වූ සමහර ශ්‍රමණබ්‍රාහ්මණ කෙණෙකුන් ඇත. යම් උපක්ලේශ කෙණෙකුන් කරණකොට ගෙණ ශ්‍රමණ බ්‍රාහ්මණයෝ බැබලීම් ආදියට නො පැමිණෙද් ද මේ එහි කුත් වෙති උපක්ලේශ ය නම් වේ. මිථ්‍යාජීවයෙන් ජීවත් වෙද් ද ඒ මිථ්‍යාජීවයෙන් දුරු නො වෙද් ද එසේ වූ සමහර ශ්‍රමණබ්‍රාහ්මණ කෙණෙකුන් ඇත. යම් උපක්ලේශ කෙණෙකුන් කරණ කොට ගෙණ ශ්‍රමණබ්‍රාහ්මණයෝ බැබලීම් ආදියට නො පැමිණෙද් ද මේ එහි සතරවෙනි උපක්ලේශ ය නම් වේ.

එසින් වදළහ.

වත්තාරෝ මෙ භික්ඛවෙ චන්දිමසුරියානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති කතමෙ වත්තාරෝ? අබ්භා භික්ඛවෙ චන්දිමසුරියානං උපක්කිලෙසෝ යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. මහිදඩ්ඪා භික්ඛවෙ චන්දිමසුරියානං උපක්කිලෙසෝ යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. ධූමරාජෝ භික්ඛවෙ චන්දිමසුරියානං උපක්කිලෙසෝ යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. රාහු භික්ඛවෙ අසුරින්දෙ චන්දිමසුරියානං උපක්කිලෙසෝ යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති. ඉමෙ ඛො භික්ඛවෙ වත්තාරෝ චන්දිමසුරියානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා චන්දිමසුරියා න තපන්ති න භාසන්ති න විරොචන්ති.

එව මෙව ඛො භික්ඛවෙ වත්තාරෝ සමණ බ්‍රාහ්මණානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා. එකෙ සමණ බ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. කතමෙ වත්තාරෝ? සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහ්මණා සුරං පිවන්ති මෙරයං, සුරාමෙරය පානා අපපටි විරතා. අයං භික්ඛවෙ පඨමෝ සමණ බ්‍රාහ්මණානං උපක්කිලෙසෝ යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණ බ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහ්මණා මෙථුනං ධම්මං පටිසෙවන්ති මෙථුනසමා ධම්මා අපපටිවිරතා. අයං භික්ඛවෙ දුතියෝ සමණ බ්‍රාහ්මණානං උපක්කිලෙසෝ යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණ බ්‍රාහ්මණා න තපන්ති න භාසන්ති න විරොචන්ති.

සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහමණා ජාතරූප රජතං සාදියන්ති ජාතරූප රජත පටිග්ගහණා අපපටි විරතා. අයං භික්ඛවෙ තතියෝ සමණ බ්‍රාහමණානං උපක්කිලෙසෝ යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණ බ්‍රාහමණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. සන්ති භික්ඛවෙ එකෙ සමණ බ්‍රාහමණා මිච්ඡාජීවෙන ජීවන්ති මිච්ඡාජීවා අපපටිවිරතා. අයං භික්ඛවෙ චතුත්ථෝ සමණ බ්‍රාහමණානං උපක්කිලෙසෝ යෙන උපක්කිලෙසෙන උපක්කිලිට්ඨා එකෙ සමණ බ්‍රාහමණා න තපන්ති න භාසන්ති න විරොචන්ති. ඉමේ ඛෝ භික්ඛවෙ චත්තාරෝ සමණබ්‍රාහමණානං උපක්කිලෙසා යෙහි උපක්කිලෙසෙහි උපක්කිලිට්ඨා එකෙ සමණ බ්‍රාහමණා න තපන්ති න භාසන්ති න විරොචන්ති-යි.

තව ද - යමෙක් දුස්සීල වී නම් ඕහට නිසු වේ - කෙසේ ද යත්? අධන්‍ය වූ හෙවත් පින් නැත්තා වූ ශ්‍රමණ ජනයාගේ වේස දරා මහණ දම් නැති හෙයින් අශ්‍රමණ වූ සීලවිනාසයෙන් නැසුනා වූ කණත ලද කුසල් මුල් ඇති නොහොත් කුශලධර්ම ය මුලින් උදුරා හැරියා වූ සරීර ඵ ලත්තා වූ ඒ දුස්සීලයාගේ ජීවිත යට නිසු වේ ව යි යනු දක්වන්නට වදාළහ - විබුධ ජන භ්‍රමර පරවුම්බිත පාදපද්මොපලක්ෂිත වූ බුදුහු-

ධිජීවිත අධම්මඤ්ඤස්ස - තස්ස සමණජත වෙසධාරිස්ස,
අස්සමිනස්ස උපඨිතං - බහමත්තානං වහන්තස්ස යි.

ශරීර ය මණ්ඩන ය කැමැත්තවුන්ට ගූථයක් මෙන් ද යම් සේ ශරීර මණ්ඩන ය කැමැත්තාහු ගූථ කුණප දුරුකෙරෙද් ද එසේ ම මේ සාසනයෙහි සිල්වත් වූ සත්පුරුෂයෝ යමක් වරද නම් ඒ දුරුකෙරෙත්. ඔහුගේ ජීවිතයට කිමෙක් ද කවර නම් දෙඹයෙක් ද,

එසින් වදාළහ.

"ගූථං විය කුණපං විය - මණ්ඩන කාමා විවජ්ජයන්තීධ
යංනාම සීලවන්තෝ - සන්තෝ කිං ජීවිතං තස්ස"-යි.

දුස්සීල කමෙහි භය ලජ්ජා නැති ඔහු හා සම වූ සියලු ම භයින් මුක්ත නුනා වූ සියලු අධිගම සැපතින් මුක්ත වූ මනා කොට වසන ලද සඟී ඛාර ඇති අපාය මාගීයට නැංගා වූ කරුණා ඇති ජනයන්ගේ කරුණාවට වස්තු වූයෙක් හාජන වූ යෙක් දුස්සීල යා හා සම වූ සදෘශ වූ මේ ලෝකයෙහි අනික් කවරෙක් නම් ඇද් ද,

එසින් වදළහ.

සබ්බභයෙහි අමුත්තෝ - මුත්තෝ සබ්බෙහි අභිභූ සුබෙහි,
සුපිහිත සහභද්ධාතරා - අපායසමග්ගා සම්භාරුළෙහා.

කාරුණාය වසුං භූතෝ-කාරුණික ජනස්ස නාම කෝ අඤ්ඤ,
දුස්සීල සමෝ දුස්සී - ලතාය ඉති බහුවිධා දෙසා-සි.

තඹ ද- දුස්සීල ව විසීමෙහි නපුර හඟවන්නෙමි. සද්ධම් රත්නාවලියෙන් මේ මතු කියන කථා ඛය සංග්‍රහ කෙරෙමි. කෙසේ ද යත්? එක් සමයෙක්හි **මුගලන්** මහතෙරුන් වහන්සේ **ලකුණ** මහතෙරුන් වහන්සේ හා සමග ගිජ්ඣකූළු පව්වෙන් බස්නා සේක් නොයෙක් ප්‍රේතයන්ගේ ඇටසැකිලි ආදී වූ අන්ඛවි දැක සිනා පහළ කොට **ලකුණ** මහතෙරුන් වහන්සේ සිනාවට කාරණා විවාළ කල්හි දැන් සිනා යන වේලා ව නෙසින් සිනා යමින් සිට කරණ කථා නම් වත් නොවන හෙයින් යුක්ත නො වෙයි. බුදුන් ලහදී ම විවාළ මැනවැ යි කියා ලා සිහිමත් තැන් හෙයින් සිත තබා ගෙණ බුදුන් ලඟ දී විවාළ කල්හි ප්‍රේතයන් දැක සිනා පහළ කළ නියා ව වදාරණ සේක්-

මම ඇවැත්නි! ගිජ්ඣකූළු පව්වෙන් බස්නෙමි තුන් සිවුරු පාත්‍රා ත් ගෙණ ගිනි ගෙණ දිලියෙන්නා වූ ඇටසැකිල්ලක් හික්ෂු ලිංගයෙන් හා සාමණේර ලිංගයෙන් ද භික්ෂුණී ලෙසින් හා සාමණේරී ලෙසින් ද භික්මන් ලෙසින් ද ඇවිදින්නා ප්‍රේතයන් දිටිමි. උන් දැක සංසාර දෙසයෙන් මම මිදිනිමි සි සිනා පහළ කෙළෙමි යනාදීන් ප්‍රේත වත ආ ලෙසට වදළ සේක. බුදුහු ත් ප්‍රේත වත් ආ ලෙසින් ම **සාසුජ** බුදුන්ගේ සස්නෙහි මහණ ව උන් කළමනා ලෙස තිබියදී දුස්සීල ව විසූ නියා ව වදාරා ඒ ඇසිල්ලෙහි එතන රැස් ව හුන්නා වූ පවිටු අදහස් ඇති වහන්දූට දුස්සීල ව වසා නරක දුක් බොහෝ කලක් විඳ තව ත් කම් ය නො ගෙවුණු හෙයින් ප්‍රේත ව ඉපද ගන්නා දුකුත් වදාරා බණ වදාරන්නා වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ-

කාසාවකණ්ඨා බහවෝ පාපධම්මා අසඤ්ඤතා,
පාපා පාපෙහි කම්මෙහි නිරයං තෙ උප පජ්ජරෙ-සි.

යන ගයින් මහණෙනි! කාසාය වස්ත්‍රයෙන් වෙළන ලද ග්‍රීවා ඇති හෙවත් අදහස් නපුරු හෙයින් මේ ලොව ජීවිකා ව නිසා සිවුරු පෙරවාගෙණ මහණ පිළිවෙත නො හැසිර ලාමක වූ සවභා ව ඇති ව වසනා කාය වාක් සංයම රහිත වූ පුද්ගලයෝ

බොහෝ වූ ය. ඒ පාප පුද්ගලයෝ තමන් විසින් කරණ ලද පාප කර්මයෙන් නරකයෙහි උපදනාහු ය. කළා වූ අකුසල් බලයෙන් නිරාදුක් විඳ ගිනිනෙන් පෙළී ගියවුන් අවිවෙහි ලූවා සේ ප්‍රේතව ත් ඉපි ද බොහෝ දුක් විඳිනි සි වදාළ සේක.

තව ද- දුස්සිල ව විසිමෙහි නපුර හඟවන්ට **වඟ්ගුමුදා** ගංගා තෙර වසන වහන්දූගේ වස්තු ව ද මෙහි සංග්‍රහ කෙරෙමි. කෙසේ ද යත්? මෙහි කථා සවරූප ය විනයෙහි උත්තරිමනුස්සධම්ම පාරාජිකාවෙහි ප්‍රකාශ වි ය. ඒ තමාකෙරෙහි උතුම් ලොවිතුරා ගුණ හඟවා ජීවත්වෙන භික්ෂූන්ට බණ වදාරණ බුදුරජාණන් වහන්සේ-

සෙය්‍යො අයො ගුලෝ භුත්තෝ තත්තෝ අග්ගි සිඛූපමෝ,
යඤ්චේ භුඤ්ජේය්‍ය දුස්සීලෝ රට්ඨපිණ්ඩං අසඤ්ඤතෝ-යි.

යන ගසින් මිහණෙනි! භින්න වූ සිල් ඇති හෙයින් දුස්සීල වූ කාය වාක් සංයම් නැති හෙයින් අසඤ්ඤත වූ මහණතෙම රට වැස්සන් විසින් සැදැහැයෙන් දෙන ලද ආහාර මම් ත් ශ්‍රමණ යෙමි සි ප්‍රතිඥකොට වලඳන්නේ වේ ද, එයට වඩා දිලියෙන ගිනි සිලක් වැනි වූ යවට වලඳන්නේ මැන ව. සැදැහැ ඇත්තවුන් දුන් සිවුරු පොරෝණා බලා ත් ගිනි ගෙණ දිළිඳියෙන යපට පොරෝන්නේ මැන ව. සැදැහැ ඇත්තවුන් කරවා දුන් සෙනස්නෙහි ලනිනා බලා ත් ගිනි ගෙණ දිලියෙන ලොහොං ගෙයි ලග්නේ මැන ව. කුමක් නිසා ද යත්?

එසින් ඒ ජාතියෙහි වන දුකක් මූත් දෙවන ජාතියට යන දෙයක් නැත. දුස්සිල ව සැදැහැ ඇත්තවුන්ගෙන් දුන් සතර පස ය අනුභව කිරීමෙන් එක ජාති ය නිසා නොයෙක් ජාති ය නැසෙන්නේ ය සි වදාළ සේක. මේ ආදී නොයෙක් තැන්හි වදාළ ධර්මයන් ද ප්‍රඥවන්තයන්ගේ නුවණින් පරීක්ෂාකොට බැලූ කල අවැඩක් මුත් වැඩක් නැති බැවින් ද සීලවිපත්තියෙහි ආදීනව දැක්මෙන් ද සිල ය පිරිසිදු වන්නේ ය සි දතයුතු. එකත ප්‍රකාර යට ප්‍රතිපක්ෂ වසයෙන් ශීල සම්පත්තියෙහි ආනිසංස දර්ශන ය දතයුතු සි.

මෙම වදාළහ - බුද්ධඝෝෂ මහතෙරහු

"එවම්පි පචවෙක්ඛණෙන සීලවිපත්තිං ආදීනව දස්සනං වුත්තපපකාර විපරීතතො සීලසම්පත්තියං ආනිසංස දස්සනඤ්ච වෙදිතබ්බං"-සි.

සීලයෙහි අනුසස් දක්වනු ලැබේ. කෙසේ ද යත්? යම්ක් හුගේ ශීල ය තෙමේ මනාකොට නිමිල ද ඔහුගේ පාත්‍ර චීවර ධාරණ ය ප්‍රසාදකර වෙයි. ඔහුගේ ප්‍රව්‍රජ්‍යා ව සඵල වන්නේ ය දක්වන ලද මැ සි.

"තස්ස පාසාදිකං හොති පත්තචීවර ධාරණං
පබ්බජ්ජා සඵලා තස්ස යස්ස සීලං සුතිම්මලං"

පිරිසිදු වූ සිල් ඇති භික්ෂූහුගේ හෘදයට අත්තානුවාදදී භය නොඛස්නේ ය. කුමක් මේන්ද යත්? සහස්‍ර රශ්මීන් ඛබලන සූයඝියා කරා නොඛස්නා අඛකාර ය මෙනි.

තව ද- තපොවනයෙහි සීලසම්පත්තින් හොඛනා වූ මහණ තෙමේ හොඛනේ ය. කෙසේ හොඛනේ ද යත්? ප්‍රඥාසම්පත්ති යෙන් හොඛනා වූ ආකාශයෙහි චන්ද්‍රයා මෙනි. තව ද ශීලවන්ත භික්ෂූහුගේ ශරීර ගන්ධ ය පවා දෙවියන්ට ද ප්‍රීති ය කෙරෙ සි. සීලගන්ධයට කරණ ප්‍රීති ය කවරෙක් තම් කියා ද. තව ද- තගර මල්ලිකාදී සියලු ගන්ධජාතීන්ගේ සම්පත්ති ය මැඩ අප්‍රකෘති ව හෙවත් පැකිළීමක් නැති ව සීලගන්ධ ය හමන්නේ ය. තව ද- සිල්වත්හු කරා කරණ ලද මද වූ ද ක්‍රියා කෙණෙක් මහ ත් ඵල වෙත්නු සි සිල්වත් තෙමේ පූජා සත්කාරයට භාජන වෙ සි.

තව ද--- මේම ආත්මභාවයෙහි සම්භවන ආශ්‍රව සඞ්ඛ්‍යාත වදබන්ධනාදී උපද්‍රවයෝ සිල්වත්හු නො පෙළෙත්. වෙහෙස නො කෙරෙත්. සිල්වත් තෙමේ පරලෝකයෙහි වන දුකඛයන්ගේ දුස් සීල සඞ්ඛ්‍යාත මූල ය ඛණන ය කරන්නේ ය. තව ද--මිනිසුන් කෙරෙහි යම් සම්පත්තියක් ඇද් ද දෙවියන් කෙරෙහි යම් සම් පත්තියක් ඇද්ද, ඒ සම්පත්තිතොම කැමති වූ තම් ශීලසම් පත්තයහට දුර්ලභ නො වෙ සි. තව ද--අත්‍යන්තයෙන් හැම දවස් ම සාන්ත වූ යම් මේ නිර්‍වාණ සම්පත්තියක් ඇද් ද සම් පත්ති ශීලයාගේ සිත ඒ නිර්‍වාණ සම්පදව ම අනුව දිවෙ සි. සියලු සැපතට මුල් ශීලයෙහි මෙසේ නුවණැති පණ්ඩිත මහණ තෙමේ අනෙක ප්‍රකාරයෙන් විසතර වූ අනුසස් පහළ කරන් නේ සි. මේ හැම දක්වන ලද මැ සි--

විශුද්ධි මාර්ගයෙහි

අත්තානුවාදදිභයං—සුද්ධසීලස්ස භික්ඛුනො,
අඛකාරං විය රවිං—හදයං නාවගාහති,

සීලස්සම්පත්තියා භික්ඛු—යොහමාතෝ තපොවනෙ,
පභා සම්පත්තියා චන්දෝ—ගගනෙ විය සොභති.

කායගන්ධෝ පි පාමොජ්ජං—සීලවන්තස්ස භික්ඛුනො,
කරොති අපි වොදානං—සීලගන්ධෙ කථාවකා.

සබ්බසං ගන්ධජාතානං—සම්පත්තිං අභිභුය්‍යති,
අච්ඡාති දසදිසා—සීලගන්ධෝ පවායති.

අප්පකාපි කතාකාරා—සීලවන්තා මහප්ඵලා,
හොන්තීති සීලවා හොති—පූජාසක්කාර භාජනං.

සීලවන්තා න බාධෙන්ති— ආසවා දිට්ඨධම්මිකා,
සම්පරායික දුක්ඛානං—මූලං ඛණති සීලවා.

යා මනුස්සෙසු සම්පත්ති—යාව දෙවෙසු සම්පදා,
න සා සක්‍යපුත්තස්ස—ඉච්ඡතෝ හොති දුල්ලභා.

අච්චන්ත සන්තා පන යා—අයං නිබ්බාණ සම්පදා,
සම්පත්තා සීලස්ස මනෝ—තමේව අනුධාවති.

සබ්බ සම්පත්ති මූලම්හි—සීලම්හි ඉති පණ්ඩිතෝ,
අනෙකාකාර විත්ථාරං—ආනිසංසං විභාවයෙ-යි.

තව ද--සීල සම්භාදනයක් නැති හෙයින් දුස්සීල වූ උපචාර සමාධි ය අර්පණා සමාධි ය යන දෙවිප්‍රකාර සමාධියෙන් සමාහිත නු වූ හෙයින් අසමාහිත වූ යම් පුද්ගලයෙක් හවුරුදු සියයක් ජීවත් වන්නේ වී නමුදු ඔහුගේ ජීවත්වීමට වඩා චතුපාරිසුද්ධි ශීලයෙන් සමන්විත හෙයින් සිල්වත් වූ ආලම්බනූපනිධ්‍යාන ය යි කියන ලද අෂ්ටසමාපත්තියෙන් හා ලක්ඛණූපනිධ්‍යාන ය යි කියන ලද දෙවිප්‍රකාර ධ්‍යානයෙන් ධ්‍යායී වූ හෙවත් සමථ විදර්ශනා භාවනාවෙහි නියුක්ත වූ භික්ෂූන්ගේ එක දවසකුදු ජීවත්වීම උතුම් වන්නේ මේ ය එසින් වදාළ ධම්මපද ය සහස්‍ර වග්ගයෙහි—

යෝ ච වස්ස සතං ජීවෙ—දුස්සීලෝ අසමාහිතෝ,
එකාහං ජීවිතං සෙය්‍යෝ—සීලවන්තස්ස ඣායිනෝ-යි.

තව ද—පරිපූර්ණ වූ සිල් ඇත්තාහට එම සීල සම්පත්තියෙහි පස් අනුසස් කෙණෙක් වෙති. ඔහු කවරහ යත්? මේ ලෝකයෙහි සිල්වත් වූ සීලසම්පන්න පුද්ගල තෙමේ තමාගේ අප්‍රමාද කාරණයෙන් මහත් වූ භොගසක්‍රාශයට පැමිණෙ යි. මේ තෙම සිල්වත් භාවයේ සීලයෙහි ප්‍රථමානිසංස ය වන්නේ ය. එ සේ ම සිල්වත් වූ ශීලසම්පන්නයාගේ කල්‍යාණ වූ සුනිඝෝෂ ය බඹලොව දක්වා ඉහා උස් ව පැන නැගෙන්නේ ය. මේ ඔහුගේ ශීලයෙහි දෙවෙනි අනුසස් වන්නේ ය. ඉදින් ක්ෂත්‍රිය පරිසදෘකට හෝ බ්‍රාහ්මණ පරිසදයකට හෝ ගෘහපති පරිසදයකට හෝ ශ්‍රමණ පරිසදයකට හෝ එළඹේ නම් තමා කෙරෙහි කිසි වරදක් දක්නට නැති හෙයින් විසාරද වූයේ නිර්භය වූයේ ලජ්ජා නු වූයේ

එළඹෙ සි. මේ සිල්වත්හු ගේ ශීලයෙහි තුන්වෙනි අනුසස් වන් නේ ය. මරණ සමයෙහි කුශලකර්මයන් වැටහෙන බැවින් මුළා නොව ප්‍රසන්න වූ සිත් ඇති ව කාලක්‍රියා කෙරෙ සි. මේ ඔහු ගේ ශීලයෙහි සතරවෙනි අනුසස් වන්නේ ය. කාබුන් මිර ණින් මත්තෙහි සුගති සඞ්ඛ්‍යාත දිව්‍යලෝකයෙහි උපදී මේ ඔහුගේ ශීලයෙහි පස්වෙනි අනුසස් වන්නේ ය.

එසින් වදාළ හ බුදුහු.

"පඤ්චිමේ ගහපතයෝ ආනිසංසා සීලවතො සීලසම්පදාය. කතමේ පඤ්ච? ඉධ ගහපතයෝ සීලවා සීලසම්පන්නෝ අප්පමා දාධිකරණං මහන්තං භොගක්ඛන්ධං අධිගච්ඡති අයං පඨමා ආනිසංසෝ සීලවතො සීලසම්පදාය. පුන ච පරං ගහපතයෝ සීලවතෝ සීලසම්පන්නස්ස කල්‍යාණෝ කිත්තිසද්දෝ අබ්භුග්ගච්ඡ ති අයං දුතියෝ ආනිසංසෝ සීලවතෝ සීලසම්පදාය. පුන ච පරං ගහපතයෝ සීලවා සීලසම්පන්නෝ යං යං දෙවපරිසං උපසං කමති යදි ඛත්තිය පරිසං යදි බ්‍රාහ්මණ පරිසං යදි ගහපති පරිසං යදි සමණ පරිසං විසාරදෝ උපසංකමති අමඞ්කුභූතෝ. අයං තතියෝ ආනිසංසෝ සීලවතෝ සීලසම්පදාය, පුන ච පරං ගහපතයෝ සීලවා සීලසම්පන්නෝ අසම්මූළ්හෝ කාලං කරොති. අයං චතුත්ථෝ ආනිසංසෝ සීලවතෝ සීලසම්පදාය. පුන ච පරං ගහපතයෝ සීලවා සීලසම්පන්නෝ කායස්ස භෙදා පරම්මරණා සුග තිං සග්ගං ලොකං උපපජ්ජති. අයං පඤ්චමෝ ආනිසංසෝ සීල වතෝ සීලසම්පදාය-සි.

අපි ච—ලොව් ලොවිතුරා ගුණ ළඟවන මේ ශාසනා ශාසනයෙහි ආචාර කුලපුත්‍රයන්ගේ යම් සීලයක් විනා සෙසු පිහිටෙක් නැද් ද මෙසේ අනුසස් ඇති ශීලයාගේ අනුසස්හි ම පමණ කව රෙක් නම් කියන්ට සමර්ථ වන්නේ ද නොවන්නේ මැ සි. තව ද ගංගා-යමුනා-සරභූ-සරස්වතී-නිම්නගා-අචිරවතී - මහී-යන මහා නදීහු ද මේ ලෝකයෙහි සත්ත්වයන්ගේ රාග දෝෂ මෝහ මද මාන මාත්සර්‍යාදී මලදෙවා පිරිසිදු කරන්ට අසමර්ථ වෙති. මේ සිල නැමැති ජලය තෙමේ ඒකාන්තයෙන් එ බඳු වූ කෙලෙස් මලදෙවා පිරිසිදු කරන්නේ ය. තව ද--මනාකොට රක්‍ෂාකරණ ලද විසුද්ධ හෙයින් ආර්‍ය්‍ය වූ අත්‍යන්තයෙන් ශීතල වූ මේ ශීලය තෙමේ මේ ලෝකයෙහි ප්‍රාණී සඞ්ඛ්‍යාත සත්ත්වයන්ගේ යම් පරි දාහයක් සන්සිඳුවා ද ඒ පරිදාහය මේඝ මාරුතයෝ ද නොසන්හිඳුවත්.

එ සේ ම හරිචන්දනයෝ ද මුක්තාහාරයෝ ද නො සංසිදුවත්. එ සේ ම වෛදූර්‍ය්‍ය මාණික්‍යයෝ ද චන්ද්‍රකිරණාඞ්කුර ය සි සියන ලද සඳරුස්හු ද සත් නො භිඳුවත්. යම් ශීලගන්ධයෙක් අනුවාත සඞ්ඛ්‍යාත යට සුලහට ද ප්‍රතිවාත සඞ්ඛ්‍යාත උඩු සුලහ ට ද සම්ව ගමන් ද ඒ ශීලගන්ධ ය හා සම් වූ සුගන්ධයෙක් නම් කවර තැනෙක්හි ඇද්ද නැත්තේ මැ සි. එ සේ ම සවගී ලෝක යට නැගෙන්ට ශීල ය හා සම් වූ අනික් හිණෙක් නැත. නිර්‍වාණ නගර ප්‍රවේශයට අනික් ද්වාරයෙක් නම් කොතැන්හි ඇද්ද නැත් මැ සි. එ සේ ම ශීලාභරණයෙන් අලඞ්කෘත වූ භික්ෂූහු සම් සේ හොඳිද මුතු මැණික් ආදීන් විභූෂිත වූ රජදරුවෝ එ සේ නො හොඳින්. මේ හැම දක්වන ලද මැ සි.

විශුද්ධිමාර්ගයෙහි—

සාසනෙ කුලපුත්තානං—පතිට්ඨා නත්ථි යං විනා,
ආනිසංස පරිවේඡදං—තස්ස සීලස්ස කොවදෙ.

න ගංගා යමුනාවාපි—සරභූ වා සරස්සතී,
නිත්තගා වා විරවතී—මිහිවාපි මහානදී.

සක්කුණන්ති විසොධෙතුං—යං මලං ඉධ පාණිනං,
විසොධයති සත්තානං—තං වෙ සීලජලං මලං.

න තං සජලදා වාතා—න චාපි හරිචන්දනං,
න මුත්තාහාර මිණයෝ—න චන්දකිරණාඞ්කුරං.

සමයන්තීධ සත්තානං—පරිළාහං සුරක්ඛිතං,
යං සමේති ඉදං අරිය—සීලං අවචන්ත සීතලං.

සීලගන්ධසමෝ ගන්ධෝ—කුතෝ නාම භවිස්සති,
යෝ සමං අනුවාතෙ ච—පටිවාතෙ ච වායති.

සග්ගාරොහණ සොපාණං—අඤ්ඤං සීල සමං කුතෝ,
ද්වාරං වා පන නිබ්බාණ—නගරස්ස පවෙසනෙ.

සොභනෙත්‍ථ වණ්ණ රාජානෝ—මුත්තාමණී විභූසිතා,
යථා සොභන්ති යතිනෝ—සීලභූසන භූසිතා.

මේ ආදී අනෙකප්‍රකාර අනුසස් සැලකීමෙන් ද ශීලයාගේ පිරිසිදු බව වේ. මෙ සේ දක්වන ලද ආනිසංසාදි ය ඇති හෙවත් අනාචාරාචාර හා අගොචර ගොචරය ද දැන නොයෙක් ආදීනව ඇති දුස්සීල භාවයෙන් දුරු වූ නොයෙක් අනුසස් ඇති සීලයෙහි පිහිටා ඒ **මහාකප්පින** ස්ථවිරයන් වහන්සේ පිරිවර හා සමග බුදුන් පිරිවරා වැඩහුන්සේකැ සි දතයුතු.

සුදස්සන මහ රජ්ජුරුවන්ගේ අවසරින් අසුන් කී වෙළෙන්දෝ ද රජ ගෙට ගොසින් රජ්ජුරුවන්ගේ මෙහෙවරින් ගිය නියා ව බිසවුන්ට කියා යවා ලත් අවසරින් බිසවුන් දැක වැඳ එකත් පසෙක සිටි කල්හි බිසවුන් විසින් කුමට අවුදැ සි විචාරණ ලදුව රජ්ජුරුවන් වහන්සේ මොඛ එවා වදාළ සේක. මසු තුන්ලකුණ යක් දෙවා වදාළ මැනව සි ඉල්වූ හ.

සගයෙනි! වස්තු ඉල්වා ලන නියා ව ඉතා බොහෝ ව රජ්ජුරුවන් වහන්සේට තොප විසින් කෙලේ කිමි ද කුමක් නිසා එකපැහැර මෙතෙක් වසතු දෙවූ සේක් දැ සි විචාළෝ ය. එ විට වෙළඳහු බිසවුන් වහන්ස! අනික් අපි කී කළ දෙයක් නැත. ලෝකයෙහි දුර්ලභ වූ අමුතු අසුන් තුනක් කිමි හ. ඊට ප්‍රසන්න වූ මහ රජ්ජුරුවෝ මසු තුන් ලකුණයක් දෙන්ට වදාළ සේකැ සි කිහ. බිසවි ඒ අසා අපට ත් ඒ අසුන් කියන්ට පිළිවන් දැ සි විචාළෝ ය. එ විට වෙළඳහු බිසවුන් වහන්ස! පිළිවනැ සි කිවූ ය. එ සේ වී නම් සගයෙනි! කියව සි කී කල්හි බිසවුන් වහන්ස! අනික්‍රාන්ත වූ අතීත කාලය ද අසම්ප්‍රාප්ත වූ අනාගතකාල ය ද දැන් පවත්නා වූ වර්ත්මාන කාල ය ද යන තුන් කාලයෙහි ම පැවති සියලු දැනගත යුතු කාරණ ය ශ්‍රී හස්ත යෙහි තුබූ ජොතිරඹමාණික්‍යයක් පරිද්දෙන් නිරවශෙෂකොට දහනා වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ සේකැ සි යන වචන ය කිමිහ සි කිවාහු ය.

අනොජා බිසවි ඒ අසා රජ්ජුරුවන් පරිද්දෙන් ම තුන් වාරයෙක කිසිවක් සලකාගත නොහි සහාරවෙනි වාරයෙහි සලකා පියා මෙ බස අසා රජ්ජුරුවන් වහන්සේ කෙතෙක් දුන්සේක්ද සි විචාරා මසු ලකුණයක් දුන් සේකැ සි කී කල්හි මෙ බදු උතුම් වූ අස්නක් අසා රජව සිට ලකුණක් වසතු දුන්. බව රජකමට තරම් නොවෙ සි. මම දුප්පත් නියාවට තුන්ලකුණයක් වසතු දෙමි කියා අනික් කුමක් කිවිදැ සි විචාරා බිසවුන් වහන්ස! නෛය්‍යාණික වූ සද්ධර්ම ය ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ නියා ව කිමි හ සි කී කල්හි ද යට කී ලෙසින් තුන්වාරයෙක කිසිවක් සලකා ගත නොහි සතරවෙනි වාරයෙහි සලකා පියා මෙ බස් ඇසූ මහ රජ්ජුරුවෝ කෙතෙක් වසතු දුන් සේක් දැ සි විචාරා ලකුණයක් වසතු දුන් සේකැ සි කී කල්හි—

මම තුන් ලකුණයක් දෙමි කියා නැවත අනික් කවර හස් නක් කිවූදැ සි විචාරා ඒ ධර්මය වූ පරිද්දෙන් පිළිපදිනා සඞ්ඝයා ලෝකයෙහි ප්‍රාදුර්භූත වූ බව කිමිහ සි කී කල්හි ද පෙර සේ ම

තුන්මාරයක කිසිවක් සලකා ගත නොහි සහරවෙනි වාරයෙහි සලකා පියා මේ බස් ඇසූ මහරජ්ජුරුවෝ කෙතෙක් වසතු දුන් සේක් ද යි විචාරා මීට ත් ලක්‍ෂයක් වසතු දුන් සේකැ යි කී කල්හි මම තුන් ලක්‍ෂයක් දෙමි කියා රජ්ජුරුවන් නමින් තුන් ලක්‍ෂ යක් හා නමින් නමින් නව ලක්‍ෂයක් හා දෙළොස් ලක්‍ෂයක් වසතු වෙළඳුන්ට දී රජ්ජුරුවන් වහන්සේ කොයිදැ යි විචාරා බුදුන් ලඟට මහණවන්ට වැඩිසේකැ යි කී කල්හි අපට කුමක් වදාළ සේක් ද යි විචාරා සියලු රාජ්‍ය සම්පත් නුඹවහන්සේට භාර කළ සේකැ යි කී කල්හි අමාත්‍යවරු කොයි ද යි විචාරා උයි ත් රජ්ජුරුවන් වහන්සේ සමඟ ගියහ යි කී කල්හි උන් හැමදෙනාගේ භායඹා වූත් ගෙන්වා උන් ආ කල—

එබඳා නොප හැමගේ සවාමිහු **කඤ්චන** මහරජ්ජුරුවන් සමඟ මහණවන්ට ගියෝ ල, ඒතොපි හැම කුමක් කරවී ද යි විචාරා උන් හැම මහණවන්ට යන ගමනේ අපට කුමක් කියා එවී ද යි විචාළ කල්හි තමන්ගේ සම්පත් තොපගේ අභිප්‍රාය ලෙස ප්‍රයෝජන විදිනා සේ කියා එව්හ යි බිසව් නිවි ය. ඒ එසේ ම ය. නුඹවහන්සේ කුමක් කරනසේක් ද යි ඔවුන් විචාළ කල්හි උන්වහන්සේ මග සිට තුණුරුවන් උදෙසා තුන් ලක්‍ෂයක් වස්තු පුදා මේ සා මහත් රජසැපත් කාරා දැමූ කෙලපිඬක් කොට ත් නො සිතා ම මහණවන්ට ගිය සේක.

මම තුණුරුවන් උදෙසා නව ලක්‍ෂයක් වසතු පිදීමි. ඒ සම්පත්නි ය නම් රජ්ජුරුවන්ට ම දුක්දෙන්නේ නො වෙ යි. එහි ඇළුම් කළහොත් ම්ට ත් දුක් එළවන්නේ ය. රජ්ජුරුවන් වහන්සේ දැමූ කෙළ කවරෙක් නම් දනබිම ඇන මුඛයෙන් ගණී ද? එ පරිද්දෙන් මම උන්වහන්සේ හළ සම්පතෙහි ආල ය නොකොට බුදුසසුන් වැඳ මහණ වෙමියි කී කල්හි ඔහු හැම දෙන ද බිසවුන් වහන්ස! එසේ වී නම් අපි ත් නුඹවහන්සේ හා මහණ වන්ට යම්හ යි කිව් ය.

එසේ වී නම් එව යි කියා රථ දහසක් යොදා රථවාහනා රූඪ ව බුදුන් කරා යන්නාහු අතුරු මග දුටු ගංගා තුණ ම රජ්ජුරුවන් විචාළ පරිද්දෙන් ම විචාරා තුණෙහි ම ප්‍රමාණය ත් අසා ඔරු ආදි ය ඇද්ද යි විචාරා ඒ ත් නැති නියා ව දැන ගංගා තුණෙහිදී ම ඔරු ආදි ය ලැබෙන නෙක් හිඳුමෝ නම් ජාති ය ජරාවට පමුණුව යි. ජරා ව මරණය ට පමුණුව යි. එසේ කල මහණ වන්නෝ කවුරු ද මේ ගංගා තුණ නම් රජ්ජුරුවන්

වහන්සේගේ ත් අපගේ ත් තුන්රුවන් විෂයෙහි විමතියක් නැති ව ම නික්මුණු නියා ව ප්‍රත්‍යක්ෂකොට ගඟවන්නට පහළවූවා සේ වූව.

තුණුරුවන් නැමැති ඔරු අහුළු නම් සතියන් සසර නැමැති මහමුහුදින් එතරකොට නිවන් නැමැති පරතෙරට පමුණුවන්ට සමර්ථ වූ කල පලලින් ගම් දෙගම් පමණ ඇති ගංගා දෙකක් හා සතර ගව්වක් පලල ඇති ගංගාවක් හා ගංගා තුණ ම පමණකින් අප දහසක් දෙනා එතර කොට බුදුන් කරා පමුණුවා නොලා ද රජ්ජුරුවන් වහන්සේ තුණුරුවන්ගේ ම ආනුභාව කරණකොට ගෙණ වැඩබවක් වන. අපි තුණුරුවන් ගුණ නැමැති ඔරු අහුල් කරම්හ යි තුණුරුවන්ගේ ගුණ සලකා එකඟ කොට සිතා ගත් ඒ සත්‍ය බලයෙන් රථවාහන සමග ගංගා තුණින් ම එහර වූහ. රථවල නෙමි අක් පමණක් ම තෙමින.

බුදුරජාණන් වහන්සේ උන් එන නියා ව දැන වදාරා තමන් වහන්සේ පිරිවරා වැඩහුන් සඟහු යම් පරිද්දෙකින් ම ඒ බිසෝවරුන්ට නො පෙණෙන සේක් වී නම් එලෙස අධිෂ්ඨාන කර වදාළ සේක. යන්නා වූ ඒ බිසෝවරු නීලාම්බරයෙහි නොයෙක් දිග දිවන විද්‍යුල්ලතා සෙයින් න්‍යග්‍රොධ වෘක්ෂය සරහා නොයෙක් දිග දිවන සවණගඤ්ඡන බුදුරැස් දැක **කපින** රජ්ජුරුවන් සිතූ ලෙස ම සිතා බුදුන් ලඟට ගොස් වැඳ එකත්පස් ව සිටියාහු, සවාමීනි! **කපින** මහරජ්ජුරුවන් වහන්සේ මහණවන්ට මොබ ආ සේක් නො වේ ද උන්වහන්සේ දැන් අපට පෙන්වා වදාළොත් යහපතැ සි කිවු ය. එ බසට බුදුරජාණන් වහන්සේ නව සිටු ව. ඔබකට නො ගොස් මෙතනදී ම දැක්ක හැකි ය සි වදාළ සේක.

ඒ අසා හැම දෙන ම දැන් මෙතනදී ම දකුමෝ ල ව සි සතුටුවූහ. බුදුරජාණන් වහන්සේ ත් ඔවුන්ගේ අදහස් බලා බණ වදාළ සේක. බණ අසා පිරිවර හා සමග **අඤ්ඤාකෝණ්ඩඤ්ඤ** බිසව් ශ්‍රොතාපත්ති ඵලාලංකාරයෙන් සැරහී සතුටු වූවා ය. **මහාකපින** සථවිරයන් වහන්සේ උන් හැමට වදාළ බණ අසා අනුන්ට වූ මධුරාහාරයක් අනුභව කළාක් මෙන් සඟපිරිවරින් සිවිපිළිසිඹියාපත් හා සමග රහත් වූ සේක. එ වේලෙහි සවාමි දරුවෝ ඒ රහත් සඟුන් සොවාන් වූ සපිරිවර බිසවුන්ට පෙණෙන සේ අධිෂ්ඨාන කොට වදාළ සේක. ආ වේලේ ම නො දක්වූයේ කුමක් නොසින්ද සි යත නොත්? දැලි හිසකෙස් බහා කාසාය වස්ත්‍ර හැඳ පෙරව සිටි භික්ෂූන් වහන්සේ දුටුකල බිසෝවරුන් ඒ වේ

ලාවට පාඨශේජන නෙයින් ආදී දුටු සැටියට දැන් අන් සැටියෙකැ යි සිනා සින එකඟ නො වන්නේ ය. සින එකඟ නැතිවීමෙන් බිසෝවරුන්ට අධිගම්ය සිද්ධ නො වන්නේ ය යි දැන සොවාන් ව අවුල් ශ්‍රද්ධාවෙහි පිහිටි කල්හි රහත් නහුන් දක්වා වදුළ සේකැ යි දතයුතු.

ඒ බිසෝවරු ද **ඛෙමාදේවී** මහ තෙරුන් වහන්සේ ඇතුළු වූ භික්ෂූන් වහන්සේලා දැක පසඟ පිහිටුවා වැඳ නුඹ හැමදෙනා වහන්සේට මහණ දම් මුදුන්පත් වී ය යි කියා බුදුන් වැඳ එකත් පස් ව සිටියාහු මහණ කරන්ට ආරාධනා කළහ. බුදුරජාණන් වහන්සේ ඒ අසා සැවැත් නුවරට ගොසින් මේහෙණවර මහණ ව යි වදුළ සේක. ඒ බිසවුන් ඇතුළු වූ ඔහුහැම දෙන ම අතර මැදි බොහෝ දෙනා ගෙන් සාධුසාමීව් ඒදිමින් පදසා ගමනින් ම සාරසිඇයූ ගවිවක් මානී ය නෙවා හොස් මේහෙණවර මහණ ව රහන් වූහ. බුදුහු න් වඩිනාගමනේ තනිව ම වැඩි ය ත් එක දවසින් ම මහණඇගළු පැවිදි කොට ගත් සඟ දහස පිරිවරා දහසක් රසින් දිලිහි දිලිහි අහිල පථයෙහි ගමන්ගත් ලහිරු මඬල සේ ආකාසයෙන් දෙවුරම් වෙහෙරට වැඩි සේක. **ඛෙමාදේවී** මහ තෙරුන් වහන්සේ ද 'දිවා රාත්‍රි දෙක්හි ම රාත්‍රිසථාන දිවා සථානයෙහි ඉතා සැප ය ඉතා සැප ය යි උදානවාක්‍ය දවන් වමින් ඇවිදින සේක.

එසින් කිහ දම්සියා දවුඩාවෙහි.

"තත්‍රසුදං ආයසමා මහාකපපිනෝ රත්තිට්ඨාන දිවාට්ඨානා දිසු "අහෝ සුඛං අහෝ සුඛන්ති" උදානං උදානෙන්නෝ විවරති-සි.

ඒ අසා සෙසු භික්ෂූන් වහන්සේලා බුදුන් කරා එළඹ සවාමීනි! **ඛෙමාදේවී** මහතෙරුන් වහන්සේ ඉතා සැප ය ඉතා සැප ය යි කිය කියා ඇවිදිනා සේක රජසැපත් අරහයා මේ නෝ යි සිතම්හ යි දැන් වූ සේක. සම්භැයන් වන්සේ ද **ඛෙමාදේවී** මහතෙරුන් ගෙන්වා කපපිනයෙනි! නොපි රජ සැපක් අරබයා උදන් අනවදැ යි විචාරා වදුළ සේක. එබසට **ඛෙමාදේවී** මහතෙරුන් වහන්සේ භාග්‍යවත් වූ සවාමීන් වහන්ස! මම එ බඳුක් නිසා උදන් අනන බව හෝ නැති බව නෝ දැන වදුරණ සේක. මා අනින් විචාරා වදුරන්නේ කිමිදැ යි දැන් වූ කල්හි බුදුරජාණන් වහන්සේ "න භික්ඛවෙ මම පුත්තෙනා රජජසුඛං ආරබ්භ උදානං උදානෙති පුත්තසස මේ ධම්මපීති නාම. ධම්මරතී නාම උපපජ්ජති සෝ අමත මහානිබ්බාණං ආරබ්භ එවං උදානං උදානෙති"යි.

යනුවෙන් මහණෙනි! ම පුනනුවෝ රජසැප ක් අරබයා උදන් අනන්නෝ නො වෙති සි වදරා මත්තෙහි—

ධම්මපීති සුඛං සෙති විපපසන්නෙන චෙතසා
අරියපපවෙදිතෙ ධම්මෙ-සදා රමති පණ්ඩිතො-සි.

යන දම්පියා ගාථාවෙන් යම් කෙණෙක් පාලි ධම් ය මිනා කොට ඉගෙණ අර්ථ නැමැති රස ය නුවණ නැමැති තුඩින් බොත් නම්, නවලොකොත්තර ධම්යෙන් මිගී ධම් ය බොත් නම්, එල ධම් සාක්ෂාත් කෙරෙත් නම්, නිවන් දහම් අරමුණු කෙරෙත් නම්, ඔහු ධම් ය බොන්නාහු නම් වෙති. කෙලෙස් කිළිටු නැති චිමෙන් ඉතා පහන් සිතින් මෙ සේ ධම් ය බොන්නා වූ සත්වයෝ සතර ඉරියව්වෙහි ම සැපසේ දවස් යවති. නුවණැත්තෝ නුමූ බුදුාදීන් විසින් දෙසන ලද සත්තිස් බෝධිපාක්ෂික ධම්යෙහි නැම කල ම් ඇලෙති සි වදළ සේක.

මේ දේශනාවගේ කෙළවර ත් බොහෝ දෙනා නිර්වාණ සම්පත් ලදහ. මෙ සේ සම්යක්සම්බොධත්වයට පැමිණි ඒ සම්බුදුරජාණන් වහන්සේ සාරසියඅසූ ගව්වක් තැන් වැඩ දහසක් අමාත්යයන් පිරිවර කොට ඇති කඳයින රජ්ජුරුවන්ට ද දහසක් අමාත්ය භාග්යවන් පිරිවර කොට ඇති අනොජා දේවින්ට ද නිර්වාණ සම්පත් දෙවා වදළෙ ත් මේ චතුස්සත්ය කෙළවර කොට ම ඇති ධම් දෙශනා වෙන් ම ය. එ සේ ප්රඥාවබොධ ය කර වදරණ සේකු ත් මේ චතුස්සත්ය ධම්යෝ අභිඤ්ඤෙය්ය වෙති. යනාදීන් තත්ත්වාවිපරිත වසයෙන් ඥානඥනයෙන් ප්රත්යක්ෂකොට දත් හෙයින් ම ය. එ සේ හෙයින් ලෝකාසවාමි වූ සම්බුදුරජාණන් වහන්සේ බුද්ධනම් වන සේක.

එයින් වදළහ.

අභිඤ්ඤෙය්යං අභිඤ්ඤාහං,
භාවෙ තබ්බඤ්ච භාවිතං,
පහාතබ්බං පහීණමෙම
තසමා බුදොසම් බ්රාහමණ-සි.

මෙතෙකින් මේ සද්ධර්ම සාරාර්ථ සන්ග්රහයෙහි

මහාකපපින සථවිරාවබොධ

කථා නම් වූ

අටවෙනි පරිච්ඡේද ය

නිමි.

9. පරිච්ඡේදය.

9. මහාමඞ්ගල සූත්‍රදෙශනා කථා

තව ද මේ සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහයෙහි

මහාමඞ්ගල සූත්‍රදෙශනා සඞ්ග්‍රහ කථා නම් කවරහ යත්?

හේ මෙසේ දතයුතු හෙයින් ය යත්?

බාරාණසී ච සාවත්ථී වෙසාලී මිථිලා' ළවී,
කොසම්බුජෙජනියෝ තක්ක සිලා චම්පා ච සාගලං.

සුංසුමාරගිරිං රාජ ගහං කපිලවත්ථු ච
සාකෙතමේඞ්ඛ පත්තසෙට්ඨාකකටඨා පාටලිපුත්තකං.
ජෙතුත්තරනතු සඞ්කස්සං කුසිණාරාදයොපුරි—සී.

දක්වන ලද බාරාණසී නම් නුවර ය ශ්‍රාවස්ති නම් නුවර ය සාලි නම් නුවර ය මිථිලා නුවර ය අළවි නම් නුවර ය කොසඹෑ නම් නුවර ය තක්සලා නම් නුවර ය චම්පා නම් නුවර ය මඩුරට සාගල් නම් නුවර ය සුංසුමාරගිරි නම් නුවර ය රජගහ නම් නුවර ය ශාක්‍ය රජ දරුවන්ගේ කපිල වස්තු නම් නුවර ය සාකෙත නම් නුවර ය කුරුරට ඉදුපත්නම් නුවර ය පාටලිපුත්‍රක නම් නුවර ය ජයතුරා නම් නුවර ය සඞ්කස්ස නම් නුවර ය මල්ලව රජදරුවන්ගේ කුසිණාරා නම් නුවර ය යනාදී රාජධානීන්හි ද සෙසු ගම් නියම් ගම් ආදියෙහි ද මනුෂ්‍යයෝ ඒ ඒ නගරද්වාර මන්ත්‍රණශාලා ශ්‍රුතිශාලාදියෙහි රැස් ව හිඳ රන්රුවන් ආදි ය දී රාමායන සීතාහරණාදී සවගී මොඟයට බාධක කථා කියවති. එසින් එක ම කථාවක් කියවන්ට පටන් ගත් කල්හි සාරමසකින් නිමාවට යෙ සි.

එක් දවසක් රැස්ව හුන්නවුන්ගෙන් එකෙක් මඟුලට යම්හ සි කී හෙයින් මූ (හුමූ) මඟුලට යම්හ සි කිය සි මඟුල් නම් තමා කවරේ දෑයි කියා උපදවාගෙණ කියන (කියන) කථා අතුරට මේ මඞ්ගල්‍ය කථාවන් ප්‍රාදුර්භූත විය. රැස්ව උන්නා වූ මිනිසුන් අතුරෙන් ඇතැම් කෙණෙක් අපි මඟුල් දනිම්හ සි කියා මේ ලෝකයෙහි යම් කිසි කෙණෙක් හිදු නැඹී හාසමාන සකුණාදීන් හෝ දකින් ද ගර්භිනීන් හෝ දකින් ද සැරසී සිටි කුමාර කෙණෙකුන් හෝ දකින්ද

පූර්ණඝටයක් හෝ දකින් ද අළුත් රේ මසෙකු හෝ දකින් ද ආජානීය අශ්වයන් හෝ දකින් ද අජානීය අශ්ව න් යෙදූ රථ හෝ දකින් ද කපිලවන් දෙනුන් හෝ දකින් ද අනික්‌ත් මේ බඳු යම් කිසි මඞ්ගල්‍ය සම්මත වස්තුවක් දකින් ද මගුල් නම් මේ ය සි කිවූ ය.

ඔවුන්ගේ වචන ය ඇසූ සමහර කෙණෙක් තමන් දන්නා මගුලු ත් එපමණක් ම නෙසින් සැබව සි ගිවිස ගත්හ. සමහර කෙණෙක් නොගිවිස්සාහ. විවාද කොට ගත්හ—දන්වන ලද මැසි. මඞ්ගලසූත්‍ර අවුවාවෙහි—

"ජම්බුදීපෙ කිර තත්‍ර තත්‍ර නගරද්වාර සන්ථාගාර සභාදිසු මහාජනා සන්නිපතිත්වා හිරඤ්ඤං සුවණ්ණං දත්වා නානප්පකාර සිතා හරණාදි බාහිර කථා කථාපෙන්ති. එකෙකා කථා වත්තුමාසච්චයෙන නිට්ඨාති. තත්‍ර එකදිවසං මඞ්ගල කථා සමුට්ඨාසි කින්නු ඛො මඞ්ගලං කිං දිට්ඨං මඞ්ගලං, සුතං මඞ්ගලං, මුතං මඞ්ගලං, කොව මඞ්ගලං, ජානාති ති. අථ දිට්ඨ මඞ්ගලිකො නාමෙකො පුරිසො ආහ. අහං මඞ්ගලං ජානාමි දිට්ඨං ලොකෙ මඞ්ගලං. දිට්ඨං නාම මඞ්ගල සම්මතං රූපං පස්සති සෙයථීදං? ඉධ කථෙවා කාලස්සෙව වුට්ඨාය භාසමිණ සකුණං වා පස්සති ඛෙළවලට්ඨිං වා ගබ්භිනිං වා කුමාරකෙ වා අලංකත පටියත්තෙන පුණ්ණඝටං වා අල්ලරොහිත මච්ඡං වා ආජඤ්ඤං වා ආජඤ්ඤරථං වා උසභං වා ගාවිං වා කපිලං වා යං වා පනඤ්ඤම්පි කිඤ්චි එවරූපං අනිමඞ්ගල සම්මතං රූපං පස්සති, ඉදං වුච්චති දිට්ඨමඞ්ගලන්ති. තස්ස වචන මෙකච්චෙ අග්ගහෙසුං. එකච්චෙ නාග්ගහෙසුං. යෙ නාග්ගහෙසුං තෙ තෙන සහ විවදිංසු-සි.

යම් කෙණෙක් නොගිවිස්සෝ නම් උන තුමූ දුටු දෙය මගුලැ සි කියා කිවවුත් හා විවාද කොට ගෙණ ඇසට නම් යහපත ත් පෙණෙ සි ඉදින් ඇසින් දුටුවක් මගුල් මේ නම් දුටු යම් සියලු දෙයක් ම මගුල් වුව මැනව. එ සේ නෙසින් නොපි මගුල් නොදතු ව අපි මගුල් දනුවිහ. හේ කෙසේදැ සි කිවහොත්? මේ ලෝකයෙහි යම් කිසි කෙණෙක් නිදු නැති සිට **වඩන්** යන බසක් හෝ **වඩමනෑ** සි යන බසක් හෝ **පුණණයෙනි** යන බසක් හෝ **පූසසයෙනි** යන බසක් හෝ **සුමන යෙනි** යන බසක් හෝ **ශ්‍රීයා** ය සි යන බසක් හෝ **ශ්‍රීවැඩි** ය සි යන බසක් හෝ අද නක්ෂත්‍ර මුහුර්තයෙන් යහපත් දින ය සි කියා හෝ අසත් ද, තවත් අනික් මඞ්ගල්‍ය සම්මත වූ මේ බඳු ශබ්ද අසත් ද මගුල් නම් මේ ය සි කිවූ ය. උන් කි ඒ කථාවන් ඇතැම් කෙණෙක් ගිවිස්සෝ ය. ඇතැම් කෙණෙක් නොගිවිස්සෝ ය. විවාද කොට ගත්හ.

කියේ මැනෝ

අථ සුතමඞ්ගලිකෝ නාමේකෝ පුරිසෝ ආහ. චක්ඛුනාමේතං හෝ සුවිමපි අසුවිමපි පස්සති තථා සුන්දරමපි අසුන්දරමපි මනාපමපි අමනාපම්පි, යදි තෙන දිට්ඨං මඞ්ගලං සියා, සබ්බමපි මඞ්ගලං සියා. තස්මා න දිට්ඨං මඞ්ගලං. අපි ච ඛෝ පන සුතං මඞ්ගලං. සුතං නාම අනිමිඞ්ගල සම්මතෝ සද්දෝ. සෙය්‍යථීදං? ඉධේකච්චෝ කාලස්සෙව වුට්ඨාය වඩ්ඩාති වා වඩ්ඩමානාති වා පුණ්ණාති වා එස්සාති වා සුමනා ති වා සිරීති වා සිරිවඩ්ඩාති වා අජ්ජ සුනක්ඛත්තං සුමුහුත්තං සුදි වසං සුමඞ්ගලන්ති එවරූපං වා යං කිඤ්චි අනිමිඞ්ගල සම්මතං සද්දං සුණාති ඉදං වුච්චති සුතමඞ්ගලන්ති. තස්සපි වචනං එකච්චෙ අන්‍ය තෙස්සුං. එකච්චෙ නාන්‍යතෙස්සුං. යෙ නාන්‍යතෙස්සුං තෙ තෙන සත ච්චදිංසු-සු.

යම් කෙණෙක් නොනිවිසෙසෝ නම් ඌ තුමූ ඇසූ දෙය මගුලැ සි කිවවුන් හා විවාද කොට ගෙණ කණ්ණයට නම් සාධූ ශබ්ද සංඛ්‍යාත යහපත් ශබ්ද ය ත් ඇසෙන්නේ ය. අසාධූ ශබ්ද සංඛ්‍යාත අයහ පත් ශබ්ද ය ත් ඇසෙන්නේ ය. ඉදින් කණ්ණයට ඇසුනු දෙය මගුල් වේ නම් අයහපත් ශබ්ද ය ත් මගුල් උව මැනව. ඒ කාරණයෙන් ශ්‍රොත්‍රයට ඇසෙන ශබ්ද ය මගුල් නොවන්නේ ය. අපි මගුල් දනුම් ම. කෙසේ ද යන්?

මේ ලෝකයෙහි යම් කෙණෙක් නිදා නැහි සිට සඳන් සුවඳ ආදී වූ සුවඳක් නාසිකාවෙන් ආඝ්‍රාණ ය කෙරෙත් නම් මේ ත් මගුල. නැවත අලුත් දූනැටි දණ්ඩක් හෝ කැවූ නම් ඉදින් දිවට දැනුනු රස ය ත් මගුල. පොළොව අල්වා හෝ නිලිගත් ගොයම් අල්වා හෝ අලුත ගළ ඇමියක් අල්වා හෝ කැස්බකු අල්වා හෝ තල ගොඩක් අල්වා හෝ නා මල් ආදියක් අල්වා හෝ වැලවරකා ආදී ඵලයක් අල්වා හෝ අලුත් වස්ත්‍රයක් හැඳ හෝ යම් කිසි පහසක් ලද්දහු නම් ඒ ත් මනුල. මගුල් වේ නම් මේ තුණ ය සි කිව් ය. උන්ගේ කථාව ත් සමහර කෙණෙක් ගිවිස ගත්හ. සමහර කෙණෙක් ඒ කිම් ද නාසයට සුවඳෙක් ම ඇගේ නම් දිවට යහපත් රසයෙක් ම දූනේ නම් ඇඟට යහපත් පහසෙක් ම දූනේ නම් ඒත් යුක්තියෙක. එ සේ නොව නාසයට සුගඳ දුගඳ දෙක ම ඇහෙන්නේ ය. දිවට යහ පත් නපුරු රස දෙක ම දූනෙන්නේ ය. කයට යහපත් අයහපත් පහස් දෙකම දූනෙන්නේ ය ඒ කාරණයෙන් මේ ත් මගුල් කොට ගත යුතු නොවෙ සි කියා නොගිවස්සා හ.

කියේ මැනෝ

අථ මුතමඞ්ගලිකෝ නාමේකෝ පුරිසෝ ආහ සොතම්පි හි නාමේතං නෝ සාධූම්පි අසාධූම්පි මනාපම්පි අමනාපම්පි සුණාති යදි තෙන සුතං මඞ්ගලං සියා, සබ්බම්පි මඞ්ගලං සියා. තස්මා න සුතං

මඞ්ගලං. අපි ච ඛො පන මුතං මඞ්ගලං. මුතං නාම් අනිමිඞ්ගල සම්මතං ගන්ධාරස ඵොට්ඨබ්බං. සෙය්‍යථීදං? ඉධෙකච්චෙ කාලසෙසව වුට්ඨාය පදුම් ගන්ධාදි පුප්ඵගන්ධං වා ඝායති, ථූසස දන්ත කට්ඨං වා ඛාදති, පඨවිං වා ආමසති හරින සසසං වා අල්ලා ගොමයං වා කච්ඡපං වා නිලවාහං වා පුප්ඵං වා ඵලං වා ආමසති, ථූසසමත්තනිකාය වා සමාලිම්පති. ථූසස සාටකා වා නිවාසෙති, ථූසස වෙඨනා වා ධාරෙති, යං වා පනඤඤම්පි කිඤචි එවරූපං අනිමිඞ්ගල සම්මතං ගන්ධං වා ඝායති, රසං වා සායති, ඵොට්ඨබ්බං වා ථූසති, ඉදා වුච්චති මුතමඞ්ගලනති. තසසපි වචනං එකදෙව අගහෙසුං. එකදෙව නාගහෙසුං. සි

මෙ ලෙසින් දෘෂ්ටමංගලික ය ශ්‍රුතමංගලික ය මුතමංගලික ය සි කියා තුන්කොටසක් වන්හ. ඔහු ද ඔවුනොවුන් හා විවාද කරන්නාහු දුටුදෙය මහුලැ සි කිවොත් ඇසුදෙය මහුලැ සි කිවොත් නාසයෙන් ඇසුදේ ය හා දිවින් දත් රස ය හා කයට හැහුනු පහස් මහුලැ සි කිවොත් පිළිවන් ව පෙණෙන හෙයින් ඔවුනොවුන් හා විවාද කරණ පමණක් මුත් තමන් කිය කියා ලූ දෙය කාරණා කියා සිටුවා ලිය හෙන්නේ නැත. මෙ ලෙසින් මේ මහුල් කථා ව දඹදිව මුළුල්ලෙහි ම ප්‍රසිද්ධ වී ය. දඹදිව් වැසි මිනිස්සු මුළුල්ලේ ම මුළු මුළු ව පියා වැලි මේ හැම මහුල් නොවන කලට මහුල් නම් කවරේ දෝ හෝ සි සිතන් ට වන්හ. උන්ගේ වසයෙන් උන්ට රැකවල සිටිනා දෙවියෝ ත් මහුල් නම් කවරේ දෝ හෝ සි සිතන්ට වන්හ. උන්ගේ වසයෙන් උන්ට මිත්‍ර ව හිඳිනා හස්කොලවල වසන දෙවියෝ ත් මහුල් ම සිතන්ට වන්හ. උන්ගේ වසයෙන් උන්ට මිත්‍ර ව හිඳිනා සව්මහරජයෙන් පාත අහස වසන දෙවියෝ ත් සිතන්ට වන්හ.

උන්ගේ වසයෙන් උන්ට මිත්‍ර ව හිඳිනා සව් මහරජයෙහි දෙවියෝ ත් මහුල් සිතන්ට වන්හ. උන්ගේ වසයෙන් උන්ට මිත්‍ර ව හිඳිනා තවුතිසා වැසි දෙවියෝ ය, උන්ට මිත්‍ර ව හිඳිනා යාම දෙව්ලොව දෙවියෝ ය, උන්ට මිත්‍ර වූ තුසිපුර වැසි දෙවියෝ ය, උන්ට මිත්‍ර වූ නිම්ණරති දෙවියෝ ය, උන්ට මිත්‍ර වූ පරනිර්මිත වසවර්ති දෙව්ලොව දෙවියෝ ය සි මේ දේවතාවෝ ත් මහුල් නම් කවරේ දෝ හෝ සි සිතන්ට පටන් ගත්හ. සිතන්ට සින් නැති හෙයින් හා අසන්ට කන් නැති හෙයින් අසංඥයන් හා සිතන්ට සින් ඇතත් අසන්ට කන් නැති හෙයින් අරූපී බ්‍රහ්මයන් හැර සෙසු බඹ දෙවියෝ ත් මහුල් සිතන්ට පටන් ගත්හ.

මේ මහුල් කථාව දඹදිව යම් සේ පැවැත්තේ වී නම් දෙව් බඹුන්ගේ වසයෙන් දසදහසක් සක්වළ මුළුල්ලෙහි ම එසේ ම පැවැත්තේ ය. මහුල් නම් කවරේ දෝ හෝ යි සිතිවිලි පමණක් මුත් මේ මහුලැ යි යන ලබ්ධි ය නැති හෙයින් නිවන් දුටුව වුන් හැර සියලු ම දෙව් මිනිස්සු ඇසින් දුටු දෙය මහුලැ යි ලබ්ධි ගත් එක් පක්ෂයක. කණින් ඇසූ දෙය මහුලැ යි නුත් එක් පක්ෂයක. නාසයට ආඝ්‍රාණ ගන්ධ ය හා දිවට දැනුනු රස ය හා කයට හැඟුනු පහස හා තුන් මහුලැ යි ගත් එක් පක්ෂයකැ යි තුන් පක්ෂයෙක් වූහ. මෙසේ පක්ෂ වූ පමණක් මුත් ඔවුනොවුන් හිවිස්වා ගත නොහෙති. කෝලාහල පසින් මේ මංගල්‍ය කෝලාහල ය සහිටු හනක් නැති ව මේ මිනිස් ලොව හවුරුදු ගණනින් දෙලොස් හවුරුද්දක් පැවැත්තේ ය.

කෝලාහල පසින් අනික් කෝලාහල සතර කවරේ ද යත්? කප නස්නට හවුරුදු ලක්ෂයක් නිබියදී ම කල්තබා කාමාවචර දෙවියෝ රත්සළු හැඳ ගෙණ හිසකේ උනා පිටහෙලා ගෙණ හඬමින් වලපමින් ඉතා නපුරු වෙස් ඇති ව මිනිස් ලොවට බැස පියා එම්බා නිදුකාණෙනි! මෙවක් පටන් හවුරුදු ලක්ෂයක් ගිය කලට සත් හිරු පහළවීමෙන් කප නස්සි. කෙළ ලක්ෂයක් සක්වළ එක පැහැර නස්සි. මහ මුහුදු වියලෙ සි. මහපොළොව ත් මහමෙර ත් නස්සි. නොනස්නා බඹලොව තබා සෙසු බඹලෝ පටන් උඩින් නස්සි. නිදුකාණෙනි! අනික් පිණන් නැති බැවින් ඔවුනොවුන් කෙරෙහි මෙන් පතුරුව ව, දුක්ඛිතයන් කෙරෙහි කරුණා ත් ඇතිව ව, සුඛිතයන් කෙරෙහි මුදිතා ත් උපෙක්ෂා ත් ඇතිව ව, දෙමව්පියන්ට උපස්ථාන කර ව, කුලදෙටුවන් පුදව, නොපමාව සි කියා ඇවිදිනි. මේ කල්ප කෝලාහල ය වන්නේ ය.

සක්විති රජුන් උපදනාට පෙරාතු හවුරුදු සියයක් තිබියදී ම කාමාවචර දෙවියෝ මේ මිනිස් ලොවට බැස මෙවක් පටන් අවුරුදු සියයක් ගිය කලට සක්විති රජ්ජුරු කෙණෙක් ලොව පහල වෙති සි කියා ඇවිදිනි. මේ සක්විති කෝලාහල ය වන්නේ ය.

යම් කලෙක බුදුකෙණෙකුන් වහන්සේ ලොව පහළවන සේක් නම් හවුරුදු දහසක් තිබිය දී පෙරාතු කොට ම අනගැමි බඹ බ්‍රහ්මාභරණයෙන් අමුතුවත් ව සැරසිගෙණ සුද්ධාවාස බඹලොවින් මිනිස් ලොවට බැස පියා මේ තැන් පටන් හවුරුදු දහසක් ගිය කලට බුදුකෙණෙකුන් වහන්සේ ලොව පහළ වන සේකැ යි

කියා ඇවිදිනි. මේ බුඬ කෝලාහල ය නම් වන්නේ ය. කල්ප කෝලාහල ය ත් චක්‍රවර්ති කෝලාහල ය ත් බුඬ කෝලාහල ය ත් දෙව් බඹුන් කියා ඇවිදිනා හෙයින් කෝලාහල වන්නාට ය.

මංගල කථා ව කෝලාහල වූයේ කෙසේ ද යත්? අනාගැමි බඹු ම දෙව් මිනිසුන්ගේ අදහස් දැන ගෙන මිනිස් ලොවට බැස දෙළොස් හවුරුද්දක් ගිය කලට බුදුහු මහුල් වදාරණ සේකැ යි කියා ඇවිදිහි ඒ තමා ත් උපදනේ බුදුන් උපන් සමයෙක ය. එ හෙයින් ඒ මංගල කෝලාහල ය නම් වන්නේ ය. තව ත් අනාගැමි බඹු ම මිනිස් ලොවට බැස පියා සත් අවුරුද්දක් ගිය කලට බුදුන් කරා එළඹ එක්කෙණෙකුන් වහන්සේ මුනිනාථ ය කරන්නා වූ පිළිවෙන් විචාරණ සේකැ යි කියා ඇවිදිනි. මේ මොනෙය්‍ය කෝලාහල ය නම් වන්නේ ය.

මෙසේ මේ කෝලාහල පසින් මංගල කෝලාහල ය ලොව පහළ ව මහුල් දැනගත නොහිමෙන් ම දෙළොස් අවුරුද්දක් ගිය කලට තවිනිසා වැසි දෙවියන්ට උන්ට උන්ගේ දින වසයෙන් සත් පැ දෙළොස් විනාඩි ගාවක් විතර ගිය කලට තවිනිසා වැසි දෙවියෝ එකතැන්ව ළා නිදුකාණෙනි! යම් සේ ගෙ හිමියෙක් ගෙයි මිනිසුන්ට මුදලි ද ගම් මුදලියෙක් ගම්වැස්සන්ට මුදලි ද රජ් ජුරුකෙණෙක් රටවැස්සන්ට නායකයෝ ද, එ පරිද්දෙන් ම සත් දෙවිදුහු ත් අප දෙව්ලොව දෙවියන්ට නායක සේක. උන්වහන් සේට මෙ පවත් කිවමනා වේදැ යි ශක්‍රයිනු ත් ඒ ඇසිල්ලට නිසි වූ සළු හැඳ ආභරණ ළා අඩුතුන්කෙළක් දෙවඟනන් පිරිවරාගෙණ පරසතු රුක්මුල පඬුඇඹුල් සලස්නෙහි විජම් දෙශනාවට පෙරාතු හෙයින් හුන්නවුන් කරා ගොසින් වැඳලා එකත්පස් ව සිට–

සවාමීනි! දන්වන දෙයක. මංගල කථාවෙක් ලොව ඉපදැන් මහා කෝලාහල ය. සමහර කෙණෙක් ඇසින් දුටු දෙය මහුලැ යි කියති. සමහර කෙණෙක් පියවි කණින් ඇසූ දෙය මහුලැ යි කියති. සමහර කෙණෙක් ගඬ රස ප්‍රඡවය ය මහුලැ යි කියති. එක්තරා සනිටුහණක් නොවූ හෙයින් මින් කවරෙක් මහුල් බවක් නො දනෙ යි. ඉත් යමෙක් මහුල් වී නම් අපට ඒ වදාළ යහපතැ යි කිවු ය. සක්දෙවිඳු තමන් මහ නුවණැති හෙයින් මේ මඞ්ගල කථා ව තොපි ම සිතා ගතු ද යමෙකුගෙන් ඇසූදැ යි විවාළෝ ය. ඌ තමන් සවිමහ රජයෙහි දෙවියන්ගෙන් ඇසූ නියාව කිවී ය. උන් ගෙන්වා විවාළ හෙත ඌ ආකාශසථ දෙවියන්ගෙන් ඇසූ නියා ව කිවු ය. උන් ගෙන්වා විවාළ හෙත ඌ බුමාටු දෙවියන්ගෙන් තමන් ඇසූ නියා ව

කිවූ ය. උන් ගෙන්වා විවාළ තැන මිනිසුන්ට රැකවල සිටි දෙවි යන්ගෙන් තමන් ඇසූ නියා ව කිවි ය. උන් විවාළ තෙන එෟ මිනිස් ලොව පහළ වූ නියා ව කිවි ය.

ඉක්බිත්තෙන් සක්දෙවිඳු තරාදි ය නිබිය දී අහින් කිරන් නා සේ ආයාස ගන්නේ කිම් ද බුදුහු දැන් කොයි වසන සේක් ද මිනිස් ලොව වසන සේකැ යි කී කල්හි ඔබ කරා ගොසින් ඔබගෙන් විවාළ කෙණෙක් ඇද්දැ යි කිවි ය. එසේ විවාළ කෙණෙක් නැතැ යි කී කල්හි කුමක් ද නොපි හැම ගිනි නිබිය දී ගිනි ය යි සිතා කණමැදිරියන් නබාලා පිඹිනා නියා ද මහුල් වදුරන්ට නිසි වූ නැවත දැකිම් වැඳීම් පිදිම් ආදි ය තබා තමන් වහන් සේගේ ගුණ සඳහන් කළ පමණකින් සඳහන් කළ වුන්ට ලොව් ලොවුතුරා සැප ත් සාදු දී ලන හෙයින් තමන් වහන්සේ ත් මහුල් වූ බුදුන් අහින් නොවිවාරා මා කුමක් දන්නා හෙයින් මා විවාරන්ට තබාගතු ද මහුල් දැනගන්ට උවමනා වී නම් තොප ත් අපි ත් බුදුන් කරා ගොසින් ඔබගෙන් විවාරා මහුල් මේ ය යි දැන ගනුම්හ. අප හැමදෙනා එකවිට විවාරන්ට බැරිවේ ද තොපි විවාරව යි එක් දෙවතාවෙකුට විධාන කළ හ.

ඒ දෙවිපුත් ද ඒ වේලාවට නිසි වූ ආභරණ ලා සැරහීගෙණ විදුලියක් මෙන් බබලමින් දසදහසක් සක්වළ දෙවි බඹුන් හා සමග මධ්‍යම රාත්‍රියෙක් හි වඳු සූයෂියන් මෙන් සියලු ජෙත වන ය ආලෝක පතුරුවා යම් තැනෙක් හි භාග්‍යවත් වූ බුදුරජාණන් වහන්සේ වැඩවසා වදුරණ සේක් ද එ තැන්හි එළඹියේ ය. නොඉොත් නානාප්‍රකාර වූ ගුණ ඉශෙෂාධිගමාභිප්‍රාය සඞ්ඛ්‍යාත වූ යම් කාරණයකින් සම්භූතෙම දිව්‍ය මනුෂ්‍යයන් විසින් උපසංක්‍රමිතව්‍ය ද එළඹිය යුතු ද ඒ කාරණයෙන් බුදුන්කරා එළඹියේ ය. එසේ එළඹ—

බහූ දෙවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං,
ආකඞ්ඛමානා සොත්ථානං බ්‍රූහි මඞ්ගල මුත්තමං—සි

යනුවෙන් සම්සන සබයන් කෙරෙහි පතල මහත් කරුණාවක් ඇත්තා වූ සම්භූයන් වහන්ස! දසදහසක් සක්වළ දෙවි බඹහු මහුල් විවාරණු නිසා මේ එක සක්වළට රැස් වූ හිසකේ අගක් ඔබාලන තැන දෙවි බඹහු දසයකු ත් විස්සකු ත් ඒසකු ත් සතළිසකු ත් පණසකු ත් සැටකුත් සැත්තැවෙකු ත් අසූවෙකු ත් සියුම් අත් බැවි මවාගෙණ රැස් වූ දෙවියන්ට වඩා දෙවතා වූ බ්‍රහ්මයන්ට වඩා බ්‍රහ්ම වූ නුඹවහන්සේට ආරාධනා කෙරෙමි.

සියලු දෙව් බඹුන්ගේ ආරාධනාවෙනු ත් මිනිසුන්ගේ අනුමැනි යෙනු ත් මහුල් නම් මේ ය යි වදළ යහපතැ යි කියා යාඤ්ඤ කෙළේ ය. බුදුහු අසා වදාරා හෙම්බළු දෙවතාව උන් තුන්පසෙ ය තෙල ලෙස කියත්. නමුත් මහුල් නම් කවරේදැ යි විවාළාට වැනි ව කියාලූ බව මුත් කාරණයක හෙලා නොකී බැවින් ඒ මහුල් නොවෙ යි. මහුල් නම් මෙලොවින් වුව ත් පරලොවින් වුව ත් යමෙක් වැඩට කාරණා වේ නම් එය එක මහුලක් විවාළා වූ තොපට මහුල් අටතිසක් කියමි යි වදාරා මං විවාළවුන්ට යම් සේ මං දැන කියා ලන කෙණෙක් නො යායුතු මං පළමු ව කියාලා යා යුතු මං පසු ව කියත් ද එ පරිද්දෙන් නො කලමනා දෙය නො කෑන්ට පළමු ව වදාරා පසු ව කළමනා දෙය වදාරණ සේක්-

අසෙවනා ච බාලානං පණ්ඩිතානඤ්ච සේවනා,
පූජා ච පූජනීයානං එතං මඞ්ගල මුත්තමං-යි.

මේ සේ එක මඞ්ගල්‍යයක් වදළ මෑනවැ යි ආරාධිත වූ සර්ව්ඥ යන් වහන්සේ මදක් ඉල්වන ලදු ව බොහෝ සම්පත් දෙන උදාර ඛ්‍යාශ ඇති උත්තම පුරුෂයෙකු මෙන් ද, බොහෝ අවැඩට කාරණා වූ දැහැන ජනයන්ගේ සේවන ය නොකිරි ම එක් මහු ලෙක බොහෝ වැඩට කාරණා වූ පණ්ඩිත ජනයන්ගේ සේවන ය කිරි ම එක් මහුලෙක. පිදිය යුතු වූ බුදු පසේබුදු සව්වන්ට කරන්නා වූ පූජා ත් අට නැළියක් විතර දැ සෙන් මල් අටමිටක් කොට පූජා කළ සුමන නම් මාලාකාරයාණන් අට පැයක් නොව අට දවසක් නොව අට මසක් නොව අටඅවු රුද්දක් නො ව අට සියයක් අවුරුදු නොව අට දහසක් අවුරුදු නොව කප්ලක්ෂයක් මුළුල්ලෙහි නරකාදී වූ සතර අපායට නො ගොසින් දෙව්ලොව දෙව් සැප ත් වළඳ-

මිනිස් ලොව මිනිස් සැප ත් වළඳ, කෙළවර සුමන නම් පසේ බුදුවන හෙයිනු ත් සංඛ නම් බමුණු ව උපන් මහ බෝසතුන් සුසිම නම් පසේ බුදුන්ගේ දැහැබට කළ යම් තම් විතර පූජාවක් නිසා බුදු වූ අවසථාවෙහි නා ලොව පටන් අකණිට්ඨ බඹලොව දක්වා සක්වළ ඇතුළත පැවති පූජා සත්කාර ගංගාරොහණ වතින් පෙණෙන හෙයිනු ත් ලොව් ලොවිතුරා වැඩට කාරණා හෙයින් එක් මහුලෙකැ යි කියා එක ගාථාවෙන් මහුල් තුණක් වදාරා එයින් මත්තෙහි දු දෙවතාවන්ගේ අසනු කැමති බව හෙයින් ද තව ත් මංගල්‍යානීයන් ඇති බව හෙයින් ද "පතිරූප දෙස වාසෝ ච" යනාදී ගාථාවෙන් වදාරන්ට පටන් ගෙණ වදළ සේකි.

පතිරූප දෙස වාසෝ ච පුබ්බේ ච කත පුඤ්ඤතා,
අත්ත සම්මා පණිධි ච එතං මඞ්ගල මුත්තමං-සි.

එහි අර්ථ කෙසේ ද යත්? පදගතාර්ථ ය වනාහි මඞ්ගලසූත්‍ර ව්‍යාඛ්‍යානයෙහි ප්‍රකාශ වූ හෙයින් මෙයින් මතු දු අටුවා කථානු කූල අර්ථ දක්වනු ලැබේ. **"පතිරූප දෙස වාසෝ ච"** යන් නෙහි ප්‍රතිරූප දෙශ ය නම් මධ්‍යදෙශාදී වූ යම් යම් දෙශයක බුද්ධ ධර්ම සඞ්ඝ සඞ්ඛ්‍යාත ත්‍රිවිධ රත්න ය පවතී නම්, තව ද මධ්‍යදෙශාදී වූ යම් දෙශයක සිව්වණක් පිරිස් වෙසෙත් නම්, දානාදී වූ දසපින් කිරියවත පවතී නම්, තෙවලා බුදුවදන් පවතී නම්, එ සේ වූ නිසි තෙන විසීම ත් ලොව් ලොවිතුරා වැඩට කාරණා හෙසින් මඟුල් වන්නේ ය.

"අත්තාසම්මාපණිධි ච" යන්නෙහි යම් කෙණෙක් පන්සිල් පමණකු ත් සිල් නොරැකීමෙහි ආදීනව සලකා සරණ ශීල ය පඤ්ච සීල ය අෂ්ටාඞ්ගශීල ය යනාදී ප්‍රභෙද ඇති ශීල ය රකින් නම් මකුළු හුය සටින් දු උසින් කළ නොවනතුරු රක්ෂා කළ පඤ්ච සීල ය පමණත් අනන්ත දිවසැප ත් සාදු දෙන බැවින් දුස්සීල වූ නමා එසින් මුදු සීලයෙහි පිහිටුවීම ද, එ සේ ම ගල තල පිට නොයම් හට නොගන්නා සේ බුද්ධාදී රත්නත්‍රයෙහි සැදැහැ නැති කල්හි කුසල් නැමැති බිජුවටින් ලොව් ලොවිතුරා සැපත් නැමැති සස්‍යඵල නොලැබිය හැකි බැවින් තමාගේ ශ්‍රද්ධා ව මිද වූ කල්හි අශ්‍රද්ධාවෙහි ආදීනව සලකා අශ්‍රද්ධාවෙන් මිදී ශ්‍රද්ධාවෙහි පිහිටි කල ඒ නිසා අනාථපිණ්ඩික විසාඛාදීන්ට මෙන් කුසලසිද්ධි ය වන බැවින් සැදැහැයෙහි පිහිට ත් නම්—

එ සේ ම **අදිට්ඨපුබ්බක මඞ්ගිය කෝසියාදීන්ට** මෙන් ද මිසුරු සින් ඇති වී නම් ඒ මසුරු බව නිසා මහත් අවැඩ ඵළවන බැවින් දානමය කුසල ය ත් මිසුරු සින් ඇති කලට සිදුනොවන බැවින් මසුරුකමින් දුරු වී තෲහි වෙත් නම් ලෞකික ලොකොත්තර සම්පත් සාදු දෙන බැවින් උතුම් මඟුල් වන්නේ ය සි මෙසේ ප්‍රතිරූප දෙශයෙහි විසීම එක් මඟුලෙක පෙර බුද්ධාදීන් කෙරෙහි රැස්කරණ ලද පින් ඇති බව එක් මඟුලෙක. දුස්සීල අශ්‍රද්ධා මාත්සර්‍ය්‍ය වූ තමා සීල ශ්‍රැත ශ්‍රද්ධා ත්‍යාග සම්පත්තියෙහි මනාකොට පිහිටුවීම එක් මඟුලෙකැ සි කියා "පතිරූපදෙසවාසෝ ච" යනාදී ගාථාවෙන් මඟුල් තුණක් වදරා මත්තෙහි ත් මඟුල් වදරන්නා වූ බුදුරජාණන් වහන්සේ-

බාහුසච්චඤ්ච සිප්පඤ්ච විනයෝ ච සුසික්ඛිතෝ,
සුභාසිතා චූ යා වාචා එතං මංගල මුත්තමං-සි.

යන ගය වදළ සේක. එහි "බාහුසච්චං" යන්නෙහි "බාහුසච්චන්ති බහුසුතභාවො"යි මඞ්ගල සූත්‍ර අට්ඨාවෙහි ආ හෙයින් බොහෝ ඇසූපිරූ තැන් ඇති බව. බහුශ්‍රැත බව නම් වෙයි. හෙ ද විදර්ශි බුදුන් ආදි වූ බුදුවරුන් සමයෙහි ආග මානියොග ය කළ කොටඹිල මහ තෙරුන් වහන්සේට අප බුදුන් සමයෙහි අධිගම ය නිරායාසයෙන් සිද්ධ වූ හෙයින් උතුම් මහුලෙක.

"සිප්පඤ්ච" යන්නෙහි "යංකිඤ්චිහත්ථකොසල්ලං"යි අට්ඨා කථාවෙහි ආ බැවින් මණිකාරාදී යම් ශිල්පයක් ඉගැන්ම නිසා මෙලෝ පරලෝ දෙකින් ම අවැඩ නොවේ නම් එසේ උගන්නා තකත් ආදී වූ අගාරිකයන්ට නිසි අගාරික ශිල්ප ඉගැන්ම අනගාරික තැනට නිසි වූ සිවුරු ගෙත්තම් ආදි වූ ශිල්ප ඉගැන්ම ත් තමන්ට ත් අනුන්ට ත් මෙලොව පරලොව වැඩ සාදන හෙයින් මහුලෙක.

"විනයොච සුසික්ඛිතො" යන්නෙහි "විනයොති කාය වාචා චිත්ත විනයො. සුසික්ඛිතොති සුට්ඨු සික්ඛිතො"යි ආ හෙයින් හික්මූවෝ ත් පණ්වා ආදීන් දුරු ව දන මානනාදියෙහි හැසිරීම ත් පැවිදි වූවෝ ත් පිරිසිදු කොට සතර සංවර සීල ය රැක්ක කිරීම ත් මහුල හෙවත් දශ අකුසල කම්පථ වර්ජිත ව මනාකොට හික්මෙන ලද දශ කුසල කම්පථ සඞ්ඛ්‍යාත අගාරිය විනය ය අඛණ්ඩ අවිච්ඡාදී වසයෙන් මනාකොට හික්මෙන ලද චතුපාරිසුද්ධි සීල සඞ්ඛ්‍යාත අනගාරිය විනය යන ද්විප්‍රකාර වූ විනය ඇති බව ද ලොව් ලොවිතුරා සැපතට පිහිට බැවින් උතුම් මහුලෙක.

"සුභාසිතා ච යා වාචා" යන්නෙහි සුභාසිත වචන ය නම් චතුර්විධ වාක් දුශ්චරිතයෙන් දුරු ව නිර්දොෂ සම්ප්‍රාප්තක වූ කර්ණ රසායන වූ වචන ය සුභාසිත වචන ය නම් වෙයි. හෙ ද ලෞකික ලොකොත්තර සම්පත්තියට කාරණා හෙයින් මහුලෙක. මෙ සේ මේ "බාහු සච්චඤ්ච" යනාදි ගාථාවෙන් බහු ශ්‍රැත බව ද නිරවද්‍ය ශිල්ප දන්නා බවද ගෘහස්ථ ප්‍රව්‍රජිතයන්ට වදළ ක්‍රමයෙන් හික්මෙන බව ද සුභාසිත වූ වචන ඇති බව දැසි යන මහුල් සතරක් වදරා මත්තෙහි මහුල් වදාරන්නා වූ බුදුරජාණන් වහන්සේ—

මාතා පිතු උපට්ඨානං පුත්තදාරස්ස සඞ්ගහො,
අනාකුලා ච කම්මන්තා එතං මඞ්ගල මුත්තමං—යි.

යන ගාථා ව වදුළ සේක. එහි "මාතාපිතූ උපට්ඨානං" යන්නෙහි මව් පිය දෙදෙනා ම මාතා පිතා නම් වෙති. ඔවුන්ට වන් දන මානනාදින් කරණ මෙහෙ උපස්ථාන නම් වෙ සි. හේ මෙසේ දත යුතු සි. දෙ මව් පියන්ට උපස්ථාන කරණුවන් විසින් තමා කටයුතු මෙහෙ දැසාදින් ඇත ද ඔවුනට නො ඇණවා උදය නැඟි සිත ඇත් නම් දරයිනි එළවා මහළු උව ද සෙම් සොටු මලමූත්‍රයෙන් වැකිසිය ශරීර ඇත ද වැදුමස් ලේ කුණු ආදියෙන් ගැවසි ගත් තමා ලදරු කාලයෙහි කැත නොකොට අපමිණ ස්නේහයෙන් වැඩූ දෙ මව්පියන්ගේ ගුණ සිහිකොට පසින් පහකළමිනා දෙය අනින් පහකොට අනින් පහකළමිනා දෙය හිසින් පහකොට සිය අනින් අත පය ආදි ය උලා නහවා තමා ලදරු කාලයෙහි මිනා පිළියෙන් සැරහූ දෙමව්පියන් සිහි කොට යෙහෙන් පමිණින් උතුම් පිළි ගඳවා ඒ ඒ කලට ශරීර යට පැමිණි ව්‍යාධියට හිසි පිළියම් කොට තමා ලදරුකාලයෙහි මිනා රස කැවූ දෙමව්පියන්ගේ ගුණ සිහිකොට—

කැඳ කැමතිවුව කැඳ පිළියෙල කොට බත් කැමතිවුව බත් පිළියෙල කෙට කැඳබත් දෙක ම කැමතිවුව කැඳබත් දෙකම පිළියෙල කොට තමා ලදරු කාලයෙහි තෙල්කිරි ගා වැඩූ දෙමව්පියන්ගේ ගුණ සිහිකොට සුවඳ තෙල් ආදි ය හසුන පාදදියෙහි ගල්වා සියතින් මැඩ සකස්කරණ ලද ගෘහයක උතුම් හැඳක හොවා දිවා රාත්‍රි දෙක ම මෙසෙසින් අප්‍රමාද ව උපස්ථාන කටයුතු. එ සේ කරණ ලද්දා වූ උපස්ථාන ය නම් ලොවුතුරා බුදුන් විසිනු දු යහපතැ සි ඒයා වර්ණනා කොට් වදාරණ ලද්දා වූ උතුම් වූ කුසල ක්‍රියාවන් වන්නේ ය. ඒ එ සේ ම ය. ඥාතිකානනාරාදින් තරණය කොට සබ්බඤ්ඤුතඥාණ භූමියට පමුණුවන හෙයින් ශාසනා නම් වූ අප නිලෝගුරු බුදු රජාණන් වහන්සේ ප්‍රභූප ඵලපල්ලවාලඞ්කෘත තරුවර නිකරා කිරණ ප්‍රවරොදුර තපොධනා ධාර වූ ජේතවනාරාමයෙහි වැඩ වසා වදාරණ සමයෙහි දුප්පත් දෙමව්පියන් ඇති එක් භික්ෂු කෙණෙකුන් වහන්සේ චීවර පිණිස ලද වස්ත්‍රයෙනුත් දෙමව් පියන්ට සඞ්ග්‍රහ කරණ සේක.

එ සේ ම ආහාර බෙහෙත් ආදියත් දුහැමෙන් සෙමෙන් ලද දෙය දෙමව්පියන්ට දී මහත් වූ ප්‍රේමයෙන් දුක්පත් මව්පිය දෙදෙනා රක්ෂා කරණ සේක. එ පවත් දුටු සෙසු භික්ෂූන් වහන්සේ ඔවුන් වහන්සේට මහණ තෝ නෛයර්‍යාණික බුද්ධ ශාසනයෙහි මහණ ව සැදුහැයෙන් දෙන ලද සිවුපසය ත් ගෙණ

ගිහින් පොෂ්‍යය කරන්ට කාරණා කින්දැ යි දෙවා නො කැමිනි පරිද්දෙන් බුදුන් සමීපයට කැඳවා ගෙණ ගොස් දන්වා, සවාමීනි! මේ මහණ ගිහින් පොෂ්‍යය කෙරෙමින් වෙසෙ යි දැන්වූ සේක. ඒ අසා සම්බුදුයන් වහන්සේ මහණෙනි! භික්ෂුහට නො දෙඩිව පුරාතනයෙහි නුවණැත්තෝ මුළු දඹදිව පැමිණියා වූ රාජශ්‍රී හැර මව්පියන් පොෂ්‍යය කෙරෙමින් වාසය කළාහු වෙත් දැ යි වදාරා ඒ භික්ෂූන් වහන්සේ විසින් ආරාධිත වූ නිලෝගුරු සම්බුදුයන් වහන්සේ අතීත කාලයෙහි පැවති කථාන්තර ය පාංසු ප්‍රතිවිජ්‍ඣන ජෝතිරඹ මාණික්‍යයක් ඉගණහැර දක්වන්නාක් පරිද්දෙන් වදාරණ සේක්—

මහණෙනි! යටගිය දවස බාරාණසී නොමේ **බ්‍රහ්ම වර්ධන** නම් නුවරෙක් වි ය. එහි **මනෝ** නම් රජදරු කෙණෙක් දැන-ප්‍රියවචන-අර්ථචරියා-සමානාත්මතා ය යන වතුස් සංග්‍රහ වස්තුවෙන් ජනරක්ඛන ය කෙරෙමින් රාජ්‍ය ය කරන් නාහු ය. යනාදීන් **සොණනන්ද ජාතකය** දක්වා වදාළ සේක. මෙසේ බුදුරජාණන් වහන්සේ විසින් ශාසනයෙහි පැවිදි වූ ශ්‍රාවකයන් විසිනු දු දෙමව්පියන්ට කරණ ලද උපකාරයෙහි අනුසස් ප්‍රකාශ කොට දන්වා වදාළ බැවින් ගෘහස්ථ ප්‍රව්‍රජිත දෙ පක්ෂයෙහි වූවන් විසින් ම දෙමව්පියන්ට කරණ උපස්ථානයෙහි අප්‍රමාද වි ය යුතු මැ යි. මෙහි වනාහි ගෘහස්ථයන් විසින් මව් පියන්ට උපස්ථාන කෙරෙමි සි කියා ප්‍රාණවධ කොට සොරකම් කොට වසතු උපදවා රහමෙර සපයා දී අධර්මයෙන් උපස්ථාන කළහොත් තමනු ත් ඔහුනු ත් අපායගාමී වන බැවින් නේ උපස්ථාන නම් නොවෙ යි. ඊට කරුණු කිම යත්?

"දිට්ඨාහං භික්ඛවෙ න සුපපතිකාරං වදාමි මාතුච්ච පිතුච්ච. එකෙන භික්ඛවෙ අංසෙන මාතරං පරිහරෙය්‍ය එකෙන අංසෙන පිතරං පරිහරෙය්‍ය වස්සසතායුකො වස්සසත ජීවි සෙ ච නෙසං උච්ඡාදන පරිමද්දන නහාපන සම්බාහනෙන තෙ ච තත්තෙව මූත්‍රකරීසං වජෙය්‍යුං නත්වෙ ච භික්ඛවෙ මාතා පිතූනං කතං වා හොති පතිකතං වා සි.

යනුවෙන් මහණෙනි! යමෙක් මව් පියන් තමහට උප කාර බැව් දැන ප්‍රත්‍යුපකාර කෙරෙ මි සි උන්සාහ පරවශ ව එක් දසරැයෙක මව හිඳුවා එක් දසරැයෙක පියා හිඳුවාගෙණ හවු රුදු සියයක් පරිහරණ ය කෙරේ ද? නෙ තෙම ඔවුන් උද්වත්තෙනු දු හස්ත පාද පරිමර්දනයෙනු දු ශීතොදක උෂ්ණොදක ස්නාන

පානයෙහු දු අඞ්ගසම්බාහනයෙහු දු උපස්ථාන කෙරේ ද මව්පියෝ ඔහු අංසකූටයෙහි ම හිඳ මූත්‍රපුරීෂ විසඟී කෙරෙද්ද හේ එසේ දු මූ මව්පියන්ට උපකාර නම් නොවෙ යි වදුළ හෙයින් ද,

ඉමිස්සා ව භික්ඛවෙ මහා පඨවියා පහූත සත්ත රත නාය මාතා පිතරෝ ඉස්සරියාධිපච්චෙ රජ්ජෙ පතිට්ඨාපෙය්‍ය නත්ථෙව භික්ඛවෙ මාතාපිත්‍රූනං කතං වා හොති පතිකතං වා—යි.

යනුවෙන් මහණෙනි! යමෙක් සියලු දඹදිව් තල ය හෙරිතලයක් සෙයින් සමකොට හිතිපමණ සත්රුවනින් පුරා මව්පියන් එහි නායක සෙට සක්විනි රාජ්‍යයෙහි පිහිටුවා ද හේ එසේ කෙළේ ද ඒ නම් මව්පියන්ට උපකාර කළා නම් නොවෙ යි වදුළ බැවින් ද තමන් ජීවිතයට වඩා ස්නේහ යෙන් වැඩූ දෙමව්පියන්ට දෙලොවින් ම සඞ්ග්‍රහ කෙරෙමි යි සිතා පූර්වෝක්ත ක්‍රමයෙන් ආදර ඇති ව මව්පියන් රක්නේ ය. ශ්‍රද්ධා නැති මව්පියන් ශ්‍රද්ධාවෙහි ද දුසිල වූ මව්පියන් සුසිල භාව යෙහි ද මසුරු වූවන් ත්‍යාගි බවෙහි ද අඥාන වූ මව්පියන් ප්‍රඥ වෙහි ද පිහිටුවා ප්‍රාණඝාත අදත්තාදානාදියෙන් දුරු ව ශ්‍රොවි තැන් ආදියෙන් දැහැමෙන් සෙමෙන් ලද දෙයකින් ආදර ඇති ව ම උපස්ථාන කටයුතු.

ප්‍රව්‍රජිතයන් විසිනු දු මව්පියන්ට උපස්ථාන කෙරෙමි යි කියා ද දශශීලයෙහිදී ම හෙවත් වුල්ල ශීලයෙහිදී ම ප්‍රතිෂ්ඨාප කළ රන්රිදී මසුඝභවණු පිළිගැන්මෙන් ද දැසිදැසයන් පිළිගැන් මෙන් ද ගවමහිෂාදීන් පිළිගැන්මෙන් ද ග්‍රාමක්ෂෙත්‍ර පිළිගැන් මෙන් ද මුක්තාමාණික්‍යාදි ය පිළිගැන්මෙන් ද නිසැඟුන් විසින් මවුපියන්ට කළ උපකාරයක් ශ්‍රී මුඛ පාළියෙක හෝ අටුවාකථා වෙක හෝ නො පෙණෙන බැවින් එසේ කළහොත් බුද්ධ ආඥ ව ඉක්ම අපායභාග් වන බව මුත් වැඩට කාරණා නො වන බැවින් එසේ නොකොට තමන් ලද ආහාර වස්ත්‍ර ඖෂධ සෙනසුන් යන මේ සිව්පසයෙහි ඇතුළත් දෙයකින් දිවිරැකි මට න් එ මණ ම බැවින් සංග්‍රහ කොට පරලොවින් සංග්‍රහ පිණිස පඤ්චසීලාදියෙහි පිහිටුවා උපස්ථාන කටයුතු.

මේ සේ ගෘහස්ථ ප්‍රව්‍රජිතයන් විසින් කටයුතු වූ මවුපියන්ට කළමනා උපස්ථාන ය තබා වරදවා යමෙක් පිළිපත්නේ ඒ නම් ඕ හට එන අවැඩ දක්වන පිණිස **මුගලන්** මහ තෙරුන්වහන් සේගේ කථා ව දක්වනු ලැබේ—කෙසේ ද යත්?

එකාසඞ්ඛ්‍ය කප් සුවහසක් වමත් අගසව් තනතුරට පත්‍ර ආ මහ මුගලන් මහ තෙරහු එක් ජන්මයෙක අඩු වූ දෙමව් පියන් රක්ෂාකරණ සේක් නිහඬබුනයට බැඳුන නොත් සැපසේ මව්පියන් රක්ෂා කොට ගත නො හෙමි යි සිතා නිත්‍යයෙන් අන් කිසිවක් නොකොට මව්පියන්ට ම උපස්ථාන කරණ සේක්—

එක් දවසක් දෙමෙව්පියන් විසින් ප්‍රතික්ෂුවනි! මේ ලෙස නොපට සුදුසු නොවෙ යි. නිසි කුලයකින් සරණයක් කොට ගෙණ වසව යි කියෙන් එ සේ කෙළෙමි නම් ඔබට උපස්ථාන කිරීම නබා අනදර කොට අපාගත ත් වෙමි යි ඒ කාරණයෙන් එ සේ නො කැමැත්තෙමි යි කියා ත් නැවත නැවත දෙමව් පියන් කියන වචනයට නිකරුව කුමාරිකා කෙණෙකුත් ගෙණ වූ ත් වසන සමයෙහි කුමාරිකා ද තමා පය ඔබාගන්නා තෙක් දවස් ගණනක් නැදිමසිලන්ට කලමනා උපස්ථාන අඩුවක් නැනි ව කොට ලා පසු ව නැදිමසිලන්ගේ දැනිමි පමණකුත් නොක මැනි ව මුඹට ගන්නා දිග මුත් මුඹගේ දෙමව්පියන්ට මෙහෙ මිට බැරි ය යි කියා උන් තමන් කුමක් කිව ත් නො ගිවිස්නා හෙයින් සමුනන් පිටතට ගිය කලට නරකෙස් නියාවක් ගහ වන්ට නියද කිදින් සොටු සෙම් මාරුවට කැඳ පෙණ ත් හැර ගෙණ ඒ ඒ තැන බා පියා සමුනන් අවුත් මේ කිම් දැ යි විවාළ කල්හි මේ මුඹගේ දැස් කන් නැනි දෙමව්පියන්ගේ කට ශ්‍රුතු ය හිසගේ පීරන කල කබාලනි. සෙම් කාරා ඒ ඒ තැන ලනි සොටු සූරා දමති. කසළ කළ කළ සේ දමා කි විටෙ කෑ යි කියා ගෙදොර පිසිමි ද මුන්දැ ගා මා ගා එක්ව රදලන්ට නො පිළිවනැ යි එක්වන් කිය යි.

මෙ සේ උන් කියන කලට ඒකාසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් වමත් සව්වන්ට පතා ආ මහ පුරුෂයාණෝ දෙමව්පියන් කෙරෙහි බිදී ගත් හ. බිදිලා ඊට නිස්ස දනිමි යි කියාලා දෙමව් පියන් කවා පොවාලා දෙමව්පියනි! මුඹගේ දසවල් තෙන හිදිනා නැයෝ මුඹ දන්නාකැමැත්තෝ ය. ඔබ යම්හ යි කියා ලා ගැලකට නංවා ගෙණයන ත.නැත්තෝ අඩෙව් මහවලට ගියකලට මුඹදැ ගැම මේ රිණ අල්වා ගෙණ පසින් සන්කොට ලන්නා හා ගොන් යෙනි. මෙනත සොරු ඇත. මම බැසලා සොරුන්ගේ සඤ්චාර ය දැන දැන යෙමි යි කියාලා දෙමව්පියන් අතට රිණ දීලා බැස පියා මදන් නැන් ගොසින් නබාලා කටහඬක් පෙරළා කෙලෙස් සොරුන් විනා අන් සොර කෙණෙකු එ නත නැත ත් සොරුන් අවුන් වන් සැටියක් කළ හ. දෙමව්පියොන් අරගල අසාලා

සොරුන් දේ හෝ සි සිනාලා පුනණ්ඩ! අපි මාළුව නියමි හ. අප මළ ත් මේ ය. ගැළවුණු ගමන් මුඛ ගැලවෙන්නේ ය සි කිව් ය. ඌ තුමූ දෙමව්පියන් එ ලෙස කි කල සොරුන් පලවා පියා ආ ලෙසත් සේ අවුත් ලා මොලොක් සිත් ඇති දෙමව් පියන් කැඳවාගෙණ පෙරලා ගෙට යන ලෙසකු ත් නොකොට—

බාලවනෙතා දුබ්බලා හොනති ථාමවනෙතාපි හායරෙ,
වසඞ්ගිනා අසීතො හොනි මාතුගාම වසංගතො-සි.

යන්නෙහි පිහිටා ඥානශක්ති ය නැතිවීමෙන් දුර්වල ව නුවණැස නැතිවීමෙන් අඛ දෙමව්පියන්ට වඩා අඛ ව රක්ෂා කළ ඇඛේතියන්ගේ අදහස ම රැකි පමිණෙන් මුත් පරලොව නසා සොරුන් ලෙසට අරගල කෙරෙමින් අවුත් ලා මරා තලා පියා වල දමා ගෙට ගොස් ඇගේ සිත් ගෙණ එයින් චුතව නොයෙක් ගවුරුදු ලක්ෂගණන් නරකයෙහි පැසිපියා නවත් අඟුසල ය නො ගෙවුණු හෙයින් අන්ඛාව සියයෙක තැලුම් කා මරණයට පැමිණ ක්‍රමයෙන් අවුත් මහපින් ඇති හෙයින් අප බුදුන්ගේ සස්නෙහි සෘද්ධිමත්තුන් කෙරෙහි අනතැන්පත් ව වසන සේක් එක් සමයෙක නිර්ඛිකයෝ එක්තැන් ව පියා ඔවුනොවුන් හා කථාකරන්නාහු මහණ ගොයුම්හට ලාභසත්කාර බලවත් වන්නට කාරණා දනුදැ සි විචාළෝ ය. අපි නො දනුම්හ. තෙල ලෙස විචාළෝ තොප හැම දන්නා නියා දැ සි කිව් ය එ සේ ය. අපි දනුම් හ. එක මුගලන් මහ තෙරුන් නිසා උපදනා ලාභසත්කාර ය. උන් නිසා උපදනේ කෙසේ ද යත්?

ඌ තුමූ දෙව්ලොවට ගොසින් මිනිස්ලොව සිටිනා කල දේව තාවන්ට නිසිව කල පින් විචාරාගෙණ උත්සාහ වඩනා නිසා මේ මේ පින්කම් කලාහු දෙව්ලොව ඉපිද දෙව් සැප ත් ලැබෙනි සි මිනිසුන්ට කියති කලෙක නරකයට ගොසින් හැසිල්ලකට නරක ගිනි නිවාලා නිරා දුකට කාරණා වූ පව්කම් විචාරාගෙණ අවුත් මේ මේ පව්කම් කළෝ නරකවල ඉපද මේ මේ දුක් විඳිනි සි කියති. මිනිස්සු ඒ අසා පවින් දුරු ව පින්කමෙහි හැසිරෙන් නාහු බොහෝ වූ ලාභ සත්කාර ළබති. මිනිසුන් දෙව් සැපත්හි ආලය කරවන්ට ඒ විසතාරකොට කියන්නෝ ත් ගොසින් බලා ආ හෙයින් ඌ ම ය. ඒ උපදෙශ ය යහපතැ සි හැම දෙන පවෙහි ආලය හරවන්ට එයින් බලා ආ හෙයින් නරක දුකක් කියන්නෝ ත් ඌ ම ය. දෙලෙයින් ම ලාභයට මං කළහ. ඉදින් උන් මරා පි මෝ නම් ඒ ලාභසත්කාර ය යටගං බලා යන දිය, වඩදිය වේලාවට උඩුගං බලා යන්නා සේ තවත් එ බදු කෙණෙකුන් පෙණෙන තෙක් අප කරා එයි කිව් ය.

ඒ උපදෙශය යහපතැයි හැමදෙනද එක්සිත් ව ගෙණ මරණ උපදෙස් සිතන්නාහු තමන්ගේ උපාසක වරුන් සම්දන් කරවාගෙණ මසු දහසක් ලදින් මිනී මරා ඇවිදිනා සොරුන් කැඳවා ගෙන්වා ගෙණ **මුගලන් තෙරහු** කළගල වෙසෙනී. එතනට ගොසින් උන් මරාපියව සි කියාලා අත්ලසට මසුදහසක් දුන්හ සොරු ත් වස්තු ලොභයෙන් නොගිවිසමිනා දෙස ගිවිස ගෙණ මහතෙරුන් වහන්සේ මරනු නිසා ගොසින් ඔබ දැඩි හිඳිනා තැන් වටකොට ගත්හ. මහතෙරුන් වහන්සේත් උන් වටකළ නියා ව දැන කෙසි සිදුරෙන් නික්මලා කැමති තෙනකට වැනි සේක. සොරු ත් එ දවස තෙරුන් වහන්සේ නො දැක අනික් දවසෙක ත් අවුත් ගල්ලෙන රැක ගත්හ මහතෙරුන් වහන්සේ දැනලා ආදි දවස් නිය මග රැකගත්හ සි අනික් මගක යන කෙණෙක් මේන් කාණිමඩල පලාගෙණ අහසට නැගි සේක.

මේ ලෙසින් දෙමසක් විතර ම මහතෙරුන් වහන්සේට කුමකු ත් කට නුහුණාහු ය තුන්වන මසදී මහතෙරුන් වහන්සේ සොරුන්ට වැලහෙන්නට පිළිවන් වූ ත් තමන් වහන්සේ තළ අකුශල කර්මයට වැලහෙන්නට තැත් වහන්සේට නබා බුදුන්ටත් බැරි බැවින් එ දවස් නොගොසින් වැඩහුන් සේක. සොරු ත් ගසා අල්වාගෙණ සියල් සිරුරෙහි ඇට තලා පඩියක පුරා ලූ සාල් මෙන් බිද සුණු කොට පියා මලු සි සිතා එක් කාලයකට දමා පියා ගිය හ මහතෙරුන් වහන්සේ බුදුන් දැක ම පිරිනිවන් පාම් සි තමන් වහන්සේගේ අත් බැව බුන් වලදක් වැලින් වෙලා තරකාරන්නා සේ ධ්‍යානයෙන් වෙලා තරකොට ගෙණ අහසින් බුදුන් ලඟට ගොසින් බුදුන් වැඳලා සවාමිනි! පිරිනිවන් පාම් සි කී සේක.

පිරිනිවන් පවිදු සි බුදුහු ත් විවාරා එ සේ ය සවාමිනි සි කී කල්හි කොසිදිදු සි විවාළ සේක. සවාමිනි! කළගල්ලෙන දී ය සි කී කල්හි එසේ වී නම් අපට බණක් කියා ලා යව මෙවක් පටන් නොප වැනි භාවූ කෙණෙකුත් දක්නට ත් නැත්තේ වේදු සි වදාළ සේක. යහපත සවාමිනි! එ ලෙස කරම් සි කියාලා බුදුන් වැදගෙණ අහසට නැගී සැරියුත් මහතෙරුන් වහන්සේ පිරිනිවන් පානා දවස් පෙළහැර දැක්වූවා මෙන් පෙළහැර දැක්වී මට තමන් වහන්සේ බුදුන්ට ඉක්බිති හෙසින් විශේෂ කොට පෙළහැර ත් දක්වා බුදුන්ගේ ආරාධනාවෙන් බණ ත් වදාරා අහසින් බැස කළගල්ලෙනට වැඩ පිරිනිවි සේක.

සොරු කෙණෙක් මුගලන් මහතෙරුන් වහන්සේ මැරූ යයි යන කථා ඔබ තුන් ප්‍රසිද්ධ ව සිටින හෙයින් සියලු දඹදිව විස්තීර්ණ වී ය. අජාසත් රජ්ජුරුවෝ ත් සොරුන් හසුකරන්ට මිනිසුන්ට විධාන කළහ. ඒ සොරුනු ත් රාත්‍රියකුණන හෙනින් රාත්‍රිභාගෙණ බොන කලට එකෙක් එකෙකුගේ රාත්‍රිභාගම ගසා හෙලා පී ය. ඒ ඕහට කිපී ගොසින් හැසි කොල මාගේ රාත්‍රිභාගම ගසා කුමකට හෙලී ද මුගලන් මහතෙරුන් වහන්සේට පළමු කොට ගැසුයේ නෝ ද? මා ත් ගැසුව සි කියා මේ ලෙසින් ඔබ මැරීමට එක් වූ හැම දෙන ම තමතමන්ගේ බයින් ම පෙණුනා හු ය. අසුකරන්ට සිටියෝ ත් උන් තමන්ම කියා සිටි හෙයින් සොරුන් හැම ගසා අල්වා ගෙණ රජ්ජුරුවන්ට පැවූ ය.

රජ්ජුරුවෝ ද මහතෙරුන් වහන්සේ මැරුවෝ නොපී දූ සි විචාරා එසේ ය සි කී කල්හි නොපී ම සිතාගණ මැරූ ද ඔබ්බේ විධානයකින් මැරුදූ සි විචාළෝ ය. නිවටුන්ගේ විධාන යෙනැ සි කී කල්හි රජ්ජුරුවෝ පන්සියයක් නිවටුන් ගෙන්වා ගෙණ පන්සියය ක් සොරුනු ත් උනු ත් දහස සෙන්ඛුළුවෙහි පෙකිනි පමණ වල ගස්වා ලා ඊ සිටු වා පස් තලවා ලා. පිදුරෙන් වස්වා ලා **උදේනි** රජ්ජුරුවන් **මාගන්දි** නම් බැමිණියගේ නැයන්ට ලා කැර වූ ලෙසට ම ගිනි ගැස්සූහ. ගිනි ගස් වා දූ ගත් නියා ව දූන ය නගුල් බාලා සාවා හිරි හිරි කොට පැලූ හ. දම් සෙබෙහි රැස් ව හුන් වහන්දූ න් ඇවැත්නි! මුගලන් මහතෙරුන් වහන්සේ පිරිනිවි ලෙස ඔබට තරම් නොවෙ සි කී සේක.

බුදුහු ඒ අසා වදාරා මහණෙනි! මෙවක මේ ලෙස මියයාම උන්ට නරම් නොවන පමණක් මුත් කෙලගි ව සිටියෝ නම් පෙර උන් කළ ලෙසට තරම්ම ය සි වදාරා පෙර කළ අකුශල කම් ය යට කී පරිදිදෙන් විස්තර කොට වදාළ සේක. මේ බඳු මහා පැරැම් ඇති මහොත්තමයන්ට පවා සසර වසන කල මව් පියන් කෙරෙහි කරණ ලද අනදරයෙහි විපාක ය සසර ත් නො යෙක් ජාතියෙහි විඳු වා අගසව් බවට පැමිණ නිවන් දක්නා ජාති ය දක්වා ලුහුබඳවා ආ කල සෙසු සඞ්ඝයන්ට එයින් වන අවැඩ කවර කෙණෙක් නම් වණ්නා කොට දක්වන්ට සමර්ථ වේන් ද අසමර්ථ වේ මැ සි.

තව ද- මව්පියන් කෙරෙහි අනදර කල හොත් දෙමව්පියන් මරා යම් පුද්ගලයෙක් ඒ අකුශල කම් ය ගෙවා නරකයට නො යන පිණිස සියලු සක්වල ගැබ සා තැන රුවන් ම ය වෛත්‍ය යෙන් පූරා තදනුරූප වූ පූජාකොට හෝ සියලු සක්වල ගැබ

පුරා වැඩ උන් මහරහතුන්ට සිව්පසයෙන් මහදන් දී නෝ බුදුන් ගේ සිවුරු කොණ අල්වා අන නොගැර අවිදීමෙන් නෝ උත්සාහ කළේ වී නමුත් ඒකාන්තයෙන් ම ඒ අත්බැවින් චුත ව නරක යෙහි ම උපදී.

දක්වන ලද මැ සි. **සාරසංග්‍රහය** ආනන්තරිය කම් විභාවනා නම් කථාවෙහි—

මනුස්සභූතං මාතරං වා පිතරං අපරිවත්තත්ත ලිඞ්ගං ජීවිතා වොරොපෙන්තස්ස කම්මං අනන්තරියං හොති. තස්ස විපාකං පටිබාහිස්සාමීති සකල චක්කවාළං මහාවෙනියපමාණෙහි කඤ්ච න ථූපෙහි පූරෙත්වාපි සකල චක්කවාලං පූරෙත්වා නිසින්නස්ස භික්ඛුසඞ්ඝස්ස මහාදානං දත්වාපි බුද්ධිස්ස භගවතෝ සඞ්ඝාටි කණ්ණං අමුඤ්චිත්වා චරන්තොපි කායස්ස භෙදා නිරයෙයෙව උපපජ්ජන්ති-සි.

නව ද- මේ ශාසනයෙහි ගෘහස්ථ පෘථග්ජන ශ්‍රද්ධාවන්ත යන් කෙරෙහි අගතැන් පත් ශ්‍රද්ධා ව ඇති හෙයින් බුදුන් පිරි නිවි සේකැ යි යනු අසා තුන්විටෙක මූර්ඡා ව සිහිමුලා බවට පැමිණියා වූ අපමණ වූ පූජාසත්කාරයෙන් ධාතු වඩා නිධන් කොට හබා මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට ඇති පන්සියයක් මහරහතන් ලවා **චෙභාරපබ්බත** ප්‍රාන්තයෙහි දී පිටකත්‍රය සංගායනා කරවා පස්වැදෑනසක් මුළුල්ලෙහි පවත් වන පරිද්දෙන් ධම්ය තැන්පත් කොට තැබූ **අජාසත්** මහරජ හු වැනියෝ ද පිතෘඝාතක කම්යෙන් ඒ අත් බැවින් චුත ව නරකයෙහි ම උපන් බැවින් තමිහට වැඩකැමති කෙණෙක් මව්පියන් කෙතෙක් නුගුණ ඇත ද ඒ නො සලකා අප්‍රමාද ව උපස්ථාන කළහොත් ප්‍රමාණාතික්‍රාන්ත ජාති කොටි සහස්‍රයෙහි සවඟී සම්පතට කාරණා බැවින් උතුම් මගුලෙක් නම් වන්නේ ය.

"පුත්තදාරස්ස සඞ්ගහෝ" යන්නෙහි පුත්‍රයන් හා දුරා වන්ට සංග්‍රහ කරණ පරිදි කෙසේ ද යත්? දරුවන්ට ප්‍රිය මිනාප වස්ත්‍රාභරණාදිය සපයා දීමෙන් ද පරදාරයෙහි පරපුරුෂ සේවනයෙහි හැසිර විඳුනා අපා දුකට අවකාශ නො දී පුත්‍රයන්ට සුදුසු වයසට කැමතිලෙස සරණ ගෙණදීමෙන් ද දියනියන් යහ පත් කුමරුවන්ට සරණ පාවා දීමෙන් ද එසේ ම භාර්‍යාවන්ට පලදනාදිය සපයා දීමෙන් ද ප්‍රිය වූ වචනාදිය කිමෙන් ද ඉහ ලෝකයෙනු ත් සංග්‍රහ කොට පරලොවින් ඔවුන්ට වැඩ පිණිස ප්‍රාණඝාතා දී පස්පවින් වලක්වා පොහොය පෙහෙවස් සමාදන්

කරවා අශ්‍රද්ධාදී දෝසයෙන් දුරුකොට ශ්‍රද්ධාදී ගුණධර්මයෙහි පිහිටුවා ධාර්මික සංග්‍රහ කරන්නා වූ යම් පුද්ගලයෙක් ඇත් නම් ඕ නට ශක්‍රාදි දෙවියෝ ද පවා සතුටු වෙත්.

ඒ එසේ මි ය—එක් සමයෙක් හි **මාතලි** දිව්‍යපුත්‍ර නෙම සක්දෙව් රජහු කෙරෙන් විචාරනු යේ දෙදෙව් ලොවට අධිපති ගෙයින් දිව්‍යලෝකයෙහි ශ්‍රෙෂ්ඨවයට පැමිණි ඔබ වැනි වූ මහත් සෘද්ධ්‍යානුභාව ඇති ශක්‍ර දිව්‍ය රාජයෙක් ගම් උස මිණි ඔටුනු පලන් තිබි ය නමා කටර කෙණෙකුන්ට නමස්කාර කරන්නෙ හිදැ සි විචාරමින් මෙසේ කියා—

සෙට්ඨඤ්ඤූ දෙව ලොකසමිං තිට්ඨසි දෙවො මහිද්ධිකො
අධොසිසං කරිත්වාන කිංසු සක්ක නමස්සසි. සි.

එ සේ විචාරණ ලද **මාතලි** දිව්‍ය පුත්‍රයාහට **මාතලි** ය! මේ ලෝකයෙහි යම් ගෘහස්තයෙක් දානාදී දසපින් කිරියවත් පුරා ද සරණසිල පඤ්චසීලාදී වෘයෙන් ශිල සංරක්ෂණ ය කෙරේ ද බුද්ධාදී රත්නත්‍රය භජන ය පර්යුපාශන ය කිරීමෙන් උපාසක ධර්මයෙහි පිහිටියේ ද දන සීල සමාදන ප්‍රියපිළිවන වඳුරා හරණ දානාදීන් ධාර්මික සංග්‍රහාදී කොට දැහැමෙන් සෙමෙන් පුත්‍රදාරාවන් පෝසන ය කෙරේ ද ඔහු විසින් **රැස්කරණ** ලද කුසල ය අනුමෝදන් වන පිණිස ඔහු වඳිමි සි යනු දක්වනුවෝ

යෙ ගහට්ඨා පුඤ්ඤකරා සීලවන්තො උපාසකා
ධම්මෙන දාරං පොසෙත්වා තං නමස්සාමි මාතලි-සි කිහ.

මේ ආදි ගුණයෙන් ශ්‍රුත්‍ත නෙසින් ද අඹුවන්ට හා දරුවන්ට උන් කෙරෙහි හරසර ඇතිවිමෙන් හෙලා නො දැන්මේන් උන් හික්ම නො පැවැත්වේන් සුරවුන්ට අත්හැරීමෙන් ආහරණ කරවා දීමේනැ සි මෙලෙස සංග්‍රහ කිරීමෙන් අඹුවෝ වූවත් ගෙයදඹු ඉඳුරා විචාරති. දරුවෝ වූවත් ඉතා පසඟවෙති. නෙසි ඇති කෙලි කොල්ලන්ට හිත පසඟවෙති. සවාමීහු ඉක්ම පවත්නෝත් නො වෙති. උපයා රැස්කළ දෙය නො නසා රැක ත් ලති. සියල්ලෙහි ම අනලස ත් වෙති. අප්‍රමාද ත් වෙති ඒ කාරණයෙන් පුත්‍රදාරාදීන්ට සංග්‍රහ කිරීම මේලෝ පරලෝ දෙකට කාරණා හෙසිහ් මුල් වන්නේ ය.

"අනාකුලා ච කම්මන්තා" යන තන්හි නිරවුල් කම්නත නම් අකුසල කම්පථ විරහිත ව කරණ කම්නත නො කිරීමේන් ද කරන ත් කල් ඉක්ම වා කිරීමේන් ද කලට කරන ත් නපුරා කොට මැලි ව කිරීමේන් ද යන මෙසින් දුරා ව කල් දැන නිසි

ලෙසින් නො මැලි ව කොට ගන්නා සී වප් ආදී වූ කර්මාන්ත ඇති බව අනා කුල කර්මාන්ත නම් වෙ සි. හෙ ද ධන ධාන්‍ය සම්පත් ඇති වීමට 'කාරණා නෙසින් මහුල් නම් වන්නේ ය. මෙ සේ මාතා පිතෘ උපස්ථානං, යනාදී ගාථාවෙන් මව්හුන්ට උපස්ථාන කිරීම ය පියන්ට උපස්ථාන කිරීම ය පුත්‍රදාරාවන්ට සංග්‍රහ කිරී ම ය නිරවුල් වූ කෘෂිවණිජ්‍ය දී කර්මාන්ත ඇති බව ය සි කියා මහුල් සතරක් වදාරණ ලදි. පුත්‍රයන්ට දාරාවන්ට සංග්‍රහ කිරීම් දෙකක් කොට මහුල් පහක් හෝ වෙසි මව්පියන්ට උපස්ථාන කිරීම එකෙක, පුත්‍රදාරාවන්ට ස ග්‍රහ කිරීම එකෙක, නිරවුල් කර්මාන්ත ඇති බව එකෙක සි කියා මහුල් තුණෙක් හෝ වෙසි. මේම කිහ. **මඞ්ගල සූත්‍ර අටුවාවෙහි**—

ඉමිස්සාපි ගාථාය මාතුපට්ඨානං පිතුපට්ඨානං පුත්තදාරස්ස සඞ්ගහෝ අනාකුලා ව කම්මන්තාති වත්තාරි. මඞ්ගලානි වුත්තානි පුත්තදාරස්ස සඞ්ගහෝ වා දට්ඨා කත්තා පඤ්ච. මාතුපිතුපට්ඨානං වා එකමෙව කත්වා තීණි—සි.

එයට අනතුරු ව මන්තෙහි න් මගුල් වදාරන්නා වූ බුදු රජාණන් වහන්සේ—

දානඤ්ච ධම්ම චරියා ච ඤාතකානඤ්ච සඞ්ගහෝ,
අනවජ්ජානි කම්මානි එතං මඞ්ගල මුත්තමං-සි.

යන ගය වදාළ සේක-එහි **"දානඤ්ච"** යන තන්හි ආමිස දාන ය ධර්මදාන ය සි කියා දාන ය ද්විප්‍රකාර වේ. ඒ ද්විප්‍රකාර වූ දානයන් අතුරෙහි ආමිස දාන ය නම් චතුර්විධ ප්‍රත්‍ය ය දාන ය හා දසවිධ දානවස්තු ආදි ය දන්දී ම වන්නේ ය. ඒ එසේ ම ය. මේ ලෝකයෙහි යම් කිසි ශ්‍රද්ධාසම්පන්න වූ සත්‍රියක් හෝ පුරුෂ යෙක් හෝ සමිතපාපී වූ ශ්‍රමණයෙකුට හෝ බාහිතපාපී බ්‍රාහ්මණ යෙකුට හෝ බාද්‍ය හොද්‍ය ලෙහ්‍ය පෙය්‍ය වසයෙන් චතුර්විධ වූ ආහාරය ද—

මධු මුද්දිකා සාලූක වොච මොචම්බ ජම්බුජං,
ඵාරුසං නාගනි සන්නත්තං පානකං යාමකාලිකා-සි.

දක්වන ලද අෂ්ටවිධ පාන වර්ග ය ද කාසි කෝසලා දී වූ වස්ත්‍ර ජාති ය ද, ඒළෙළු ඒළු කුතම් ඇත් අස් ආදී වූ යාන වාහන ය ද, ගෙතු නො ගෙතු සිනිද්ද බෝලිද්ද දූසමන් සපු දුනුකේ ආදී වූ පුෂ්ප ජාති ය ද, කස්තුරි කපුරු ජම්බු සාන්දු පිනිදිය ආදී වූ සුගන්ධ ද්‍රව්‍ය ය ද, කසා සඳුන් ආදී වූ ඡවි රාග

කරණය ද, බිසි බිමෙබ්ාහනා දි සෙයාාව ද, ආවාස ය ද හෙවත් ලෑගුම් හෙය ද, ප්‍රදීපයට තිත වූ පහන් තෙල් පහන් කඳු පහන් මාලා පහන් වැටි ආදිය ද යන මේ දස විධ දාන වස්තූන් දුන්නේ වී නම් ඒ සඩතෙම ඒ කුශල ධර්මය හේතුකොට ගෙණ කරජ කාය යාගේ භෙදයෙන් නොහොත් මරණින් මත්තෙහි සුගති (සවර්ග) සංඛ්‍යාත වූ දිව්‍යලෝකයෙහි උපදනේ ය.

හෙවත් **චාතුම්හාරාජිකා** නම් දිව්‍යලෝකයෙහි ඉපද මනුෂ්‍ය ගණනාවෙන් අනූලක්ෂයක් හවිරුදු දිව්‍යසම්පත් විඳ එයින් නැගී **තාවතිසා** දිව්‍ය භවනයෙහි ඉපද තුන්කෙළ සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ එයින් නැගී **යාම** නම් දිව්‍යලෝකයෙහි ඉපද තුදුස්කෙළ සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ එයින් නැගී **තුසිත** භවනයෙහි ඉපද එහි සත්පණස් කෙළ සැටලක්ෂයක් හවුරුදු දිව්‍යසම්පත් විඳ එයින් නැගී **නිම්මාණරති** නම් දිව්‍යලෝකයෙහි ඉපද එහි දෙසිය තිස්කෙළ සහලිස්ලක්ෂයක් හවුරුදු දිව්‍ය සම්පත් විඳ එයින් නැගී **පරනිර්මිත වසවර්ති** නම් දිව්‍ය ලෝකයෙහි ඉපද එහි නවසිය එක්විසිකෙළ සැටලක්ෂයක් හවුරුදු දිව්‍ය සම්පත් විඳ සදිව්‍යලෝකයෙහි මෙසේ එක්දහස් දෙසිය අට විසිකෙළ පණස්ලක්ෂයක් හවුරුදු මුළුල්ලෙහි විඳිනා දිව්‍ය සම්පත් නියද ඔහු කැමති වී නම් සාදා දෙන්නේ ය.

"දානංහි ලොකෙ බ්‍රහ්මසම්පත්තිං දෙති" යි වදාළ බැවින් එයින් නැගී **බ්‍රහ්මපාරිසඥ්** නම් බඹලොව ඉපද අසංඛ්‍ය කල්ප යක්හුගේ තුන්වන භාගයක් සුව විඳ එයින් නැගී **බ්‍රහ්මපුරෝහිත** නම් බඹලොව ඉපද එහි අඩ කල්පයක් සුවවිඳ එයින් නැගී **මහාබ්‍රහ්ම** නම් බඹලොව ඉපද කපක් සුවවිඳ එයින් නැගී **පරිත්තාභ** නම් බඹලොව ඉපද එහි මහාකල්ප දෙකක් සුවවිඳ එයින් නැගී **අප්‍රමාණාභ** නම් බඹලොව ඉපද එහි සතර කපක් සුවවිඳ එයින් නැගී **ආභස්සර** නම් බඹලොව ඉපද එහි අටකපක් සුවවිඳ එයින් නැගී **පරිත්තසුභ** නම් බඹලොව ඉපද එහි සොළොස් කපක් සුවවිඳ එයින් නැගී **අප්‍රමාණසුභ** නම් බඹලොව ඉපද එහි දෙතිස්කපක් සුවවිඳ එයින් නැගී **සුභකිණ්ණ** නම් බඹලොව ඉපද එහි සැට්කපක් සුවවිඳ එයින් නැගී **වෙහප්ඵල** නම් බඹලොව ඉපද පන්සියයක් කප් සුවවිඳ එහිදී අනාගාමී වෙයින් **සුදාවාස** යෙහි **අවිහ** නම් බඹලොව ඉපද දහසක් කප් සුව විඳ එයින් නැගී **අතප්ප** නම් බඹලොව ඉපද එහි දෙදහසක් කප් සුවවිඳ එයින් නැගී **සුදස්ස** නම් බඹලොව ඉපද එහි සාරදහසක් කප් සුවවිඳ එයින් නැගී **සුදර්ශි** නම් බඹලොව

ඉපද එහි අටදහසක් කප් සුවවිද එයින් නැඟී **අනඤ්ඤටඨ** නම් බඹලොව ඉපද එහි සොළොස් දහසක් කප් ධ්‍යානසුව විඳ, මේ සේ එක්නිස්දහස් සසිය විසිකපක් මුළුල්ලෙහි විඳිනා සම්පත්ති ය ද ඔහු කැමති වී නම් සාදු දෙන්නේ ය. ඉදින් එහි නොවූ පන්නේ වී නම් හෝ එහි සම්පත් විඳ හෝ යම් යම් තැනෙක මිනිස්ලොව උපදනේ ද **පුණ්ණවඩ්ඪන පුණ්ණඤ්ඤ කාතවලිය මේණ්ඩඤ්ඤ වෙලාම** බ්‍රාහ්මණාදීන් මෙන් ප්‍රමාණාතික්‍රාන්ත හොග සම්පත් ඇති ව උපදනේ ය. එසේ නෙයින් දුන ය නම් මහත් හොග සම්පත් ඇති බවට පමුණුවන්නේ සි.

එසින් වදළහ - සුභමානවකයාහට

ඉධ පන මානව එකච්චෝ ඉත්ථී වා පුරිසෝ වා දුතා හොති. සමණස්ස වා බ්‍රාහමණස්ස වා අන්නං පානං වත්ථං යානං මාල ගන්ධ විලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං සෝ තෙන කමෙමන එවං සමතෙනන එවං සමාදිතෙනන කායස්ස හෙදා පමමරණා සුගතිං සගගං ලොකං උපපජ්ජති. නො වෙ. කායස්ස හෙදා පර මමරණා සුගතිං සගගං ලොකං උපපජ්ජති. සවෙ මනුස්සත්තං ආගච්ඡති, යත්ථ යත්ථ පච්චා ජායති, මහා හොහෝ හොති මහා හොග සංවත්තනිකා. එසා මානව පටිපදා යදිදං දුතා හොති සමණස්ස වා බ්‍රාහ්මණස්ස වා අන්නං පානං වත්ථං යානා මාලා ගන්ධ විලෙපනං සෙය්‍යාවසථ පදීපෙය්‍යං-සි.

තව ද මේ දුන ය නම්

දුනං සීලඤ්ච නෙකඛම්මං පඤ්ඤා විරියෙන පඤ්චමං,
ඛන්ති සච්චඞ්ඛිට්ඨානං මෙත්තුපෙකඛානි මෙදස-සි.

වදුරණ ලද දුනාදී දසපාරමිතාවන් කෙරෙහි පළමුවෙනි පාරමිතා ව වන්නේ ය.

දුනං සීලඤ්ච භාවනා පත්තිපත්තානු මොදනා,
වෙය්‍යාවච්චාපචායඤ්ච දෙසනා සුති දිට්ඨිජු-සි.

වදුරණ ලද දශවිධ පුණ්‍යක්‍රියා වස්තූන් කෙරෙහි පළමු වෙනි පුණ්‍යක්‍රියා වසතු ව වන්නේ ය.

දුනං සීලං පරිචචාගං අජ්ජවං මද්දවං තපං,
අකොකාධො අවිහිංසා ච ඛන්තී ච අවිරොධතා-සි.

වදුරණ ලද දසරාජ ධර්මයන් කෙරෙහි පළමුවන රාජධර්ම ය වන්නේ ය. දුන, ප්‍රියවචන, අර්ථචරියා, සමානාත්මතා ය යන සතර සංග්‍රහ වස්තූන් කෙරෙහි පළමුවන සංග්‍රහ වසතුව වන්නේ ය.

දාන සීල භාවනා සංඛ්‍යාත ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තූන් කෙරෙහි පළමු වන පුණ්‍යක්‍රියා වස්තුව වන්නේ ය. එසේ හෙයින් මේ දාන ය තෙමේ ලොව්තුරා බුදුබව කෙළවර කොට ඇති සියලු සම්පත් සාදා දෙන්නේ ය.

එසින් වදාළහ.

දානං හි ලොකෙ සකකසම්පත්තිං දෙති. මාරසම්පත්තිං දෙති බ්‍රහ්මසම්පත්තිං දෙති චක්කවත්ති සම්පත්තිං දෙති සාවකපාරමී ඤාණං දෙති පච්චෙක බොධි ඤාණං දෙති අති සම්මාබොධි ඤාණං දෙති.

යනාදින් අනෙක ප්‍රකාරයෙන් වර්ණනා කර වදාරණ ලද්දු වූ අනුසස් ඇති දාන ය ආමිසදාන ය නම් වන්නේ ය. ධම්ම දාන ය නම් ත්‍රිවිධ පබ්‍රාජ්ජිතයන්ගේ ප්‍රභෙද දාන දෙන්නා වූ ධම්ම දාන ය යි. ත්‍රිවිධ පබ්‍රාජ්ජි නම් කිම යත්? අලගර්ද පබ්‍රාජ්ජි ය නිස්සරණ පබ්‍රාජ්ජි ය-භාණ්ඩාගාරික පබ්‍රාජ්ජි ය යි කියා පබ්‍රාජ්ජිතයු තුන්දෙනෙක් වන්නාහු ය. එහි වරදවා ගන්නා ලද නිසා ප්‍රතිඛගම කොට පුහුණු කරණ ලද පබ්‍රාජ්ජි ධම්ම ය අලගර්ද පබ්‍රාජ්ජි නම් වෙයි. ඒ කෙබඳු ද යත්?

යම් සේ නයින් අල්ලනු කැමැති පුරුෂයෙක් මිහන් වූ සර්පියෙකු දැක ඔහුගේ දරණ වැල හෝ නගුට හෝ අල්වා ද එ සඳ ඒ සර්පියා පෙරළී සිට ඒ ඇල් වූ පුරුෂයාගේ අත හෝ උර ය හෝ අන් කිසි අවයවයක් හෝ දෂ්ටකෙරේ ද ඒ පුරුෂයා ඒ කාරණයෙන් මරණයට හෝ මරණ සමාන දුකට හෝ පැමිණේ ද, ඊට කාරණා කවරේ ද? සර්පයා වරදවා ඇල් වූ හෙයිනි.

එ පරිදිදෙන් ම මේ ශාසනයෙහි තුවජ පුරුෂ කෙණෙක් සූත්‍රගෙය්‍යාදී නවාඞග ශාස්තෘ ශාසන සංඛ්‍යාත සද්ධම්ම ය පුහුණු කෙරෙද්ද ඔහු ඒ ධම්ම ය පුහුණුකොට ඒ ඒ ධම්මයන්ගේ අර්ථ ප්‍රඥාවෙන් පරීක්ෂා නොකෙරෙද්ද ප්‍රඥාවෙන් අර්ථ පරීක්ෂා නොක රන්නා වූ ඔවුන්ට ඒ ධම්මයෝ නුවණට නො වැටහෙති. ඔහු උපා දාන ය කාරණාකොට හෝ විවාද කාරණා කොට හෝ පුහුණු කෙරෙද්ද යමක් පිණිස ධම්ම ය ප්‍රගුණ කෙරෙත් නම් ඊට ඒ අර්ථ ය ප්‍රයෝජන හෝ වෙයි. ඒ ලාමක සත්වයන්ට වර දවා ගන්නා ලද ඒ ධම්ම ය බොහෝ කලක් අවැඩ පිණිස දුක් පිණිස පවත්නේ ය. ඊට කාරණා කවරේ ද? ධම්ම ය ඔවුන් විසින් වරදවා ගත් හෙයිනි.

යම් පබ්‍රාජ්ජිතයෙක් මොනවට උගන්නා ලද ද ශීලසකඛා දීන්ගේ පරිපූරණ ය කැමැත්තවුන් විසින් උපාරම්භාදියක් කාර ණා නො කොට පුහුණු කරණ ලද ද මේ නිස්සරණ පබ්‍රාජ්ජි

නම් වෙ යි. මනාකොට උගත්නා ලද ඒ ධර්‍ම ය ප්‍රගුණ කළ සඬ යන්ට මෙලෝ පරලෝ වැඩ සිදුකොට නිතසැප පිණිස පවත් නේ ය. කුමක් හෙයින් ද යත්? ධර්‍ම ය මනාකොට සිල පූරණා දි ය උදෙසා උගත් හෙයිනි. විශෙෂයෙන් පිරියිද දන්නා ලද පඤ්චස්කන්ධයන් ඇති ප්‍රහීණ කරණ ලද සකල ක්ලෙශයන් ඇති වඩන ලද මාර්ගඵල ඇති ප්‍රතිවේධ කරන ලද අර්හත්ඵල ඇති සාක්ෂාත් කරණ ලද නිර්‍වාණ ධර්‍මඇති සප්තාශ්‍රවයන් වහන්සේ හුදක් ප්‍රවේණි පාලන ය පිණිස වංශානු රක්ෂණ ය පිණිස ධර්‍මයක් පුහුණු කරණ සේක් ද ඒ භාණ්ඩාගාරික පර්‍යාප්ති නම් වන්නේ ය.

විනයෙහි මනාව පිළිපන් භික්ෂුතෙමේ ශීල සමාධි ය නිසා ත්‍රිවිද්‍යාවට පැමිණෙන්නේ ය. කුමක් හෙයින් ද යත්? ඒ විද්‍යාවන්ගේ ම ප්‍රභෙද ය එහි කියන හෙයිනි. සූත්‍රයෙහි මනාව පිළිපන්නේ සමාධි සමාධි ය නිසා ෂට් අභිඥාවට පැමිණෙන්නේ ය. එ හි දු ඔවුන්ගේ ප්‍රභෙද ය කියන හෙයිනි. අභිධර්‍මයෙහි මනා ව පිළිපන්නේ ප්‍රඥාසමා ධි ය නිසා චතු පටිසම්භිදාවට පැමිණෙන්නේ ය. එහි දු ඔවුන්ගේ ප්‍රභෙද ය කියන හෙයිනි.

මෙ සේ මේ ත්‍රිවිධ පර්‍යාප්ති ය ප්‍රභෙද හෙයින් දැන ඒකාන්තයෙන් ම බුදුන් විසින් සාරාසංඛ්‍ය කප්ප්‍රවහසක් මුළුල්ලෙහි මහපෙරුම් පුරා බුදු ව පරකරුණාවෙන් බඹ බ්‍රහ්මාදීන් සඳහා බ්‍රහ්මලෝකයට ද මාතෘදිව්‍ය පුත්‍රාදීන් සඳහා දිව්‍ය ලෝකයට ද චූළොදර මහොදරාදීන් සඳහා අන්‍ය දිපාන්තරයට ද වැඩ අපමණ වූ ප්‍රාතිහාර්‍යය දක්වා සඬ වගී යා සසරින් නගා නිවන්පුර පමුණුවනු පිණිස දෙසූ ධර්‍ම ය ලාභ සත්කාර කිර්ති ප්‍රශංසා පිණිස ය කියා ලක්ෂයක් වටනා වන්දනාමාර ය කුණු මොර පිණිස දෙන අඥානයන් සේ ධර්‍මයෙන් ලබන සඞ්ගීමොක්ෂ සම්පත් ලබන්නා තබා කුමක් පිණිස අපායෝත්පත්තියට පැමිණෙම් ද.

එ සේ හෙයින් බුදුන් විසින් නිවන් පිණිස දෙසූ ධර්‍ම ය මා විසිනු ත් සඬානුග්‍රහයෙන් දෙසා මේ සඬයන්ගේ ප්‍රාණඝාතාදී පාප ධර්‍මයන් මැඩපවත්වම් සි ශීලාදී ගුණධර්‍මයෙහි පිහිටුවා නිවන් සම්පත් අත්පත් කොට දෙම් සි මම ත් මේ ධර්‍ම ය ඉගෙණ අනුන්ට දෙසීමෙන් අනුන්ගේ ගෙරින් රැක දී එ දවසට යැපෙන ආහාර මාත්‍රයක් ලැබ කිරිතෙලින් ප්‍රයෝජනයක් නොලබන ගවපාලයා සේ නොව ධර්‍ම ය පුහුණුකොට නොකටයුතු තාක් දෙය හැර කටයුතු තාක් දෙය කොරෙම් සි ධර්‍මය වූ පරිද්දෙන් ම පිළිපදිම් සි අනුන්ටත් දෙසා ඔවුනු ත් ධර්‍මයෙහි පිහිටුවම් සි බුදුගුණ මහොත්තමයන් විසින් නින්දුකොට හළ ලාභ සත්කාර කිර්ති ප්‍රශංසාදියෙන් මට ප්‍රයෝ

ජන කවරේද යි සිනා කරුණා පුළුඛහම වූ අදහසින් යෙදී ධර්මධර ආචාරිවරයන් කරා එළඹ ගෞරව ඇති ව සකස්කොට බණඅහගෙණ ධර්මදාන ය දුනහොත් ඒ ධර්මදානයට වඩා අන්කිසි දානයෙක් නම් නැත්.

එසින් වදාළහ. සක්දෙව්රජතුමනි—

සබ්බදානං ධම්මදානං ජිනාති-සබ්බං රසං ධම්මරසෝ ජිනාති, සබ්බංරතිං ධම්මරති ජිනාති-තණ්හක්ඛයෝ සබ්බ දුක්ඛං ජිනාති- යි.

යනාදී නොයෙක් අනුසස් ඇත්තා වූ ධර්මදානය ද යන මේ යි. ආමිසදාන ධර්මදාන වසයෙන් ද්විප්‍රකාර වූ දාන ය දීම ත් ඓහලෞකික පාරලෞකික සම්පත් සාදදීමට කාරණා හෙයින් උතුම් මඟහල්‍ය යෙක් නම් වන්නේ ය.

"ධම්මචරියාව" යන තන්හි ධර්මචරියා නම් කිම යත්? දන් දීම ය සිල්රැකීම් ය භාවනාකිරීම් ය පින්දීම ය පින්ගැණීම් ය වතා වත් කිරීම ය මව්පිය ආදීන්ට වන්දන මානනාදි ය කිරීම් ය බණ ඇසීම් ය සම්‍යක් දෘෂ්ටිගැන්ම ය යන මේ දශවිධ වූ ධර්මචරියාවෙහි හැසිරීම් ධර්මචර්‍යා නම් වෙ යි. හෙ ද ප්‍රමාණාතික්‍රාන්ත වූ සඛනීමොක්ෂ සම්පත් සාදදීමට කාරණා වන බැවින් උතුම් මංගල්‍යයෙක් නම් වන්නේ ය.

"ඤාතකානඤ්චසංගහෝ" යන තන්හි ඤාතීහු නැයෝ නම් කවරු ද යත්? මව්පිය දෙදෙනාගේ සත්වන කුල පරම්පරාව දක්වා අව්වඡින්න ව පැවත ආ ඤාතීහු නැයෝ නම් වෙති. ඔවුන් අතුරෙන් යම් කිසි කරුණකින් දුකඛිත ව ආ නැයන් ට ධනධාන්‍යයෙන් කරන්නා වූ සංග්‍රහ ව ද දෘෂ්ටධාර්මික සාම්පරායිකාර්‍ථයෙන් යුක්ත බැවින් උතුම් මඟහල්‍යයෙක් නම් වන්නේ ය..

"අනවජ්ජානිකම්මානි" යන තන්හි අනවද්‍ය කර්‍මාන්ත නම් කිම යත්? සතවක් අටවක් තුදුස්වක් පසළොස්වක් සංඛ්‍යාත සතර පොහොයෙහි නොවරදවා පෙහෙවීම් කුල දෙටුවන්ට මෙහෙ කිරීම මල්වතු පැන් පොකුණු උයන් ගොනවු අම්බලම් හේදඬු ආදිය පින් පිණිස කිරීම් අනවද්‍ය කර්‍මාන්ත නම් වෙයි. හෙ ද මෙලෝ පරලෝ දෙකට අනිවෘද්ධියට කාරණා හෙයින් මඟුලෙක් නම් වන්නේ ය. මේසේ **"දානඤ්චධම්මචරියාව"** යනාදී ගාථාවෙන් දන්දීම එක් මඟුලෙක, දසකුසල කර්‍මපථ සංඛ්‍යාත ධර්මචර්‍යා ව එක් මඟුලෙක, ඤාතීන්ට සංග්‍රහකිරීම් එක් මඟුලෙක, සීල සමාදානාදී නිරවද්‍ය කර්‍මාන්ත ඇතිබව එක් මඟුලෙකැ යි කියා මඟුල් සහරක් වදාරා මත්තෙහි ත් මඟුල් වදාරන්නා වූ බුදුරජතුමා—

ආරති විරති පාපා මජ්ජපානා ච සඤ්ඤමෝ,
අප්පමාදෙ ච ධම්මෙසු එතං මඞ්ගල මුත්තමං-යි.

යන ගය වදාළ සේක. එහි **"ආරතිවිරතිපාපා"** යන්නෙහි ආරති විරති පාපා නම් පාපයෙහි ආදීනව දක්නා සුල්ලහුගේ මන සින් අනභිරති ය ද ප්‍රාණඝාතාදී අකුශල කර්මයෙන් කායවාක් දෙකින් වැලැක්ම ද වන්නේ ය. හෙ ද ඉහලෝක පරලෝක දෙකි න් ම වැඩට කාරණා හෙයින් මඟුල් නම් වන්නේ ය.

"මජ්ජපානාවසඤ්ඤමෝ" යන්නෙහි මද්‍යපාන නම් රහමේර පිම ය. රහමේර පි සතුවෙම මව්පියන් නො හඳුනන්නේ ය. කුල දෙවුවන් නො හඳුනන්නේ ය. දෙවියන් රඳුන් නො හඳුනන්නේ ය. බුදුන් පසේබුදුන් මහරහතුන් නො හඳුනන්නේ ය. කුසෙහි හොන් තන් නැයන් නො හඳුනන්නේ ය. සුරාමදයෙන් මත් ව පමණ නොදැන සම්පත් නැසීම් වසයෙන් දුහි වන්නේ ය. නොයෙක් අකු සල් රැස්කොට සතර අපායෙහි මහත් ව්‍යසනයට පැමිණෙන්නේ ය. එ සේ හෙයින් සවගීමොක්ෂයට බාධක වූ උම්මත්තකත්වාදී අනෙක ප්‍රකාර අනර්ථ එළවන්නා වූ මද්‍යපානයෙන් වැලැක්ම ද, ලෞකික ලොකොත්තර සම්පත්තියට කාරණා හෙයින් උතුම් මඟුල් නම් වන්නේ ය.

"අප්පමාදෙ ච ධම්මෙසු" යන්නෙහි අප්‍රමාද ය නම් කුශල කර්මයෙහි නොපමා බව ය. හේ කුශලධර්මයට මහත් ප්‍රතිඝාධාර වේ සි ඒ එසේ ම ය. සූර්‍ය්‍ය දිව්‍යරාජයාගේ උදා වීමට පළමුකොට නැගෙන්නා වූ යම් මේ අරුණු සංඛ්‍යාත රශ්මියක් ඇද්ද හේ සූර්‍ය්‍ය දිව්‍ය රාජයාගේ උදය වීමට පූර්ව නිමිති වෙ සි. එසේ හෙයින් ම ආර්‍ය්‍ය අෂ්ටාඞ්ගික මාර්ග ය උපදවන භික්ෂුවට අප්‍රමාද ය පූර්ව නිමිති වෙ සි. ප්‍රධානවෙ සි.

එසින් වදාළහ. සාඝුන් සහියෙ හි.

"සුරියස්ස භික්ඛවෙ උදයතො එතං පුබ්බඞ්ගමං එතං පුබ්බ නිමිත්තං යදිදං අරුණගහං. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛුනො අරි යස්ස අට්ඨඞ්ගිකස්ස මග්ගස්ස උප්පාදාය එතං පුබ්බඞ්ගමං එතං පුබ්බනිමිත්තං යදිදං අප්පමාද සම්පදා" යනාදී.

අපි ච- යම් තාක් අපාද ද්විපාද චතුෂ්පාදාදී සඩ කෙණෙක් ඇත් නම් ඒ සියලු සතුන් කෙරෙහි බුදුහු අග්‍ර වෙති. එ සෙසින් ම යම් කිසි කුශලධර්‍ම කෙණෙක් ඇත් ද ඒ සියල්ලෝ ම අප්‍රමාද ය ම මුල්කොට ඇත්තා හ. ඒ සියලු කුශල ධර්‍මයන් කෙරෙහි අප්‍රමාද ය ම අග්‍ර වේ.

එසින් වදුල හ—එම් සංයුත් සතිය අප්‍රමාද වගියෙහි

යාවතා භික්ඛවෙ සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනෙ නො වා නෙවසඤ්ඤිනෙ වා නාසඤ්ඤිනෙ වා තථාගතො තෙසං අග්ගමක්ඛායති අරහං සම්මාසම්බුද්ධො. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාද මූලකා අප්පමාද සමොසරණා. අප්පමාදො තෙසං ධම්මානං අග්ගමක්ඛායති. අප්පමත්තස්ස එතා භික්ඛවෙ භික්ඛුනො පාටිකංඛං අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙස්සති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරිස්ස ති කථඤ්ච භික්ඛවෙ භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති? ඉධ භික්ඛවෙ භික්ඛු සම්මා දිට්ඨිං භාවෙති විවෙක නිස්සිතං විරාග නිස්සිතං නිරොධ නිස්සිතං වොස්සග්ග පරිනාමිං -පෙ- සම්මා සමාධිං භාවෙති විවෙක නිස්සිතං විරාග නිස්සිතං නිරොධ නිස්සිතං වොස්සග්ග පරිනාමිං. එවමෙව ඛො භික්ඛවෙ භික්ඛු අප්පමත්තො අරියං අට්ඨඞ්ගිකං මග්ගං භාවෙති අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලීකරොති සි.

අපි ච-ලෝකයෙහි යම් කිසි රජදරු කෙණෙක් ඇද්ද ඒ සියලු රජදරුවන් කෙරෙහි සක්විති මහරජ ම ශ්‍රෙෂ්ඨ වෙත් ද එ පරිද්දෙන් ම යම් කිසි කුශලධම් කෙණෙක් ඇත් නම් ඒ සියලු කුශල ධම්යන් කෙරෙහි අප්‍රමාද ය ම උතුම් වෙ සි. ප්‍රධාන වෙ සි. ශ්‍රෙෂ්ඨ වෙ සි.

එසින් වදුල හ.

සෙය්‍යථාපි භික්ඛවෙ යෙ කෙචි කුඡ්ජරාජානො සබ්බෙ තෙ රඤ්ඤු චක්කවත්තිස්ස අනුයුත්තා භවන්ති රාජා තෙසං චක්ක වත්ති අග්ගමක්ඛායති. එව මෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා සබ්බෙ තෙ අප්පමාද මූලකා අප්පමාද සමොසරණා. අප්ප මාදො තෙසං අග්ගමක්ඛායති-පෙ-අරියං අට්ඨඞ්ගිකං මග්ගං බහුලී කරොති සි

අපි ච-යම් තාක් තාරකා ප්‍රභා කෙණෙක් ඇද්ද ඒ සියල්ලම චන්ද්‍රප්‍රභාවට සොළොස්වන කලාවට ද නො අගිත්. චන්ද්‍රප්‍රභා ව ම අග්‍ර වෙ සි. එ පරිද්දෙන් යම් තාක් කුශලධම් කෙණෙක් ඇත් නම් ඒ සියල්ලෙහි ඒ මේ අප්‍රමාද ය ම් අග්‍ර වේ-**එසින් වදුල හ.**

සෙය්‍යථාපි භික්ඛවෙ යා කාචි තාරක රූපානං පභා සබ්බා තා චන්දියා පභාය කලං නාග්ඝන්ති සොළසිං—චන්දිපභා තාසං අග්ගමක්ඛායති. එවමෙව ඛො භික්ඛවෙ යෙ කෙචි කුසලා ධම්මා —පෙ—අප්පමාද මූලකා-සි.

මේ ආදී නොයෙක් ලෙසින් වර්ණනා කොට වදාරණ ලද්දා වූ අප්‍රමාදයෙහි ගුණ සලකා පෙරවරු වේලෙහි කෙරෙමි යි සිතූ කුශල ධර්‍ම ය පස්වරු වේලෙහි කෙරෙමි යි සිතූන නොත්-

පවාතදීප තුල්‍යාය සාය්‍ය සන්තනි යාකඛයං,
පරූපමාය සම්පස්සං භාවයෙ මරණස්සතිං.

මහා සම්පත්ති සම්පත්තා යථා සත්තා මතා ඉධ,
තථා අහං මරිස්සාමි මරණං මම හෙස්සති.

උපපත්තියා සහෙවෙදං මරණං ආගතා සදා,
මරණත්ථාය ඔකාසං වධකෝ විය එසති.

ඊසකං අනිවත්තන්තං සතතං ගමනුස්සුකං,
ජීවිතං උදයා අත්ථං සුරියෝ විය ධාවති.

විජ්ජු බුබ්බුල උස්සාව ජලරාජී පරිකඛයං,
ඝාතකෝව රිපූතස්ස සබ්බත්ථාපි අවාරියෝ.

සුයස්සථාම පුඤ්ඤඳිධි බුද්ධි වුඩ්ඪි ජිනඛයං,
ඝාතෙසි මරණං ඛිපං කාතූ මාදිසකෙ කථා.

පච්චයානඤ්ච වෙකල්‍යා ඛාඛිරජ්ඣත්තු පඳවා,
මරාමොරං නිමෙසාපි මරමානෝ අනුකඛණං-යි.

යනාදීන් ජීවිත ය සථිර නොවන පරිදි සිහිකොට පෙරවරු සිතූ දෙය පෙරවරු ම පස්වරු සිතූදෙ ය පස්වරු ම කෙරෙමින් කුශල ධර්‍මයෙහි නො පමාව විසුව හොත් හෙවත් සම්පත්තියගේ අවිප්‍රවාස ය ලෞකික ලොකොත්තර සම්පත්තියට හේ ම කාරණා වන බැවින් එතුම් මගුලෙක් නම් වත්තේ ය.

මෙ සේ **"ආරතිවිරති"** යනාදී ගාථාවෙන් පාපයෙන් වැලැක් ම එක් මගුලෙක, මද්‍යපානයෙන් වැලැක්ම එක් මගුලෙක, කුශල ධර්‍මයෙහි නොපමා බව එක් මගුලෙකැ යි මගුල් තුණක් වදාරා මන්ත්‍රතන්ත්‍ර මගුල් වදාරණ සේක්-

ගාරවෝ ච නිවාතෝ ච සන්තුට්ඨි ච කතඤ්ඤුතා,
කාලෙන ධම්මසවණං එතං මඞ්ගල මුත්තමං-යි.

යන ගාථා ව වදාළ සේක. එහි **"ගාරවොව"** යන්නෙහි ගෞරව නම් බුද්ධ ප්‍රත්‍යෙකබුද්ධ බුද්ධශ්‍රාවක ආචාර්‍යෝපාධ්‍යාය මාතෘ පිතෘ ජ්‍යෙෂ්ඨභගිනී භ්‍රාතෘ ආදීන්ට කරණ ගෞරව ය වත්තේ ය. එ සේ කරණ ගෞරව තබා යමෙක් අගෞරව කළහොත් හෙවත්

ගරු කාර කටයුතු වූ බුද්ධාදීන්ට අනිමාන වසයෙන් නො වඳි ද නො පුදු ද දුක ග්‍රහණයෙන් නො නැති ද හිඳිනා අසුන් නොදේ ද මග හැර නොයේ ද සත්කාර නොකෙරේ ද ගරුකාර නොකෙරේ ද ඒ සත්වයා නරකයෙහි ඉපද අනේවා සුවිහස් නරක දුක් විඳ නැවත මිනිස් පියට පැමිණියේ වී නම් නීච කුලයෙහි ඉපද හැමදෙනා විසින් ගර්හිත වන්නේ ය.

ඉධ පන මානව එකච්චෝ ඉත්ථී වා පුරිසෝ වා ඵද්ධා හොති අනිමානි අභිවාදෙතබ්බං න අභිවාදෙති, පච්චුට්ඨෙතබ්බං න පච්චුට්ඨෙති, ආසනාරහස්ස ආසනං න දෙති, මග්ගාරහස්ස මග්ගං න දෙති, සක්කාතබ්බං න සක්කරොති, ගරුකාතබ්බං න ගරුකරොති, මානෙතබ්බං න මානෙති, පූජෙතබ්බං න පූජෙති, සෝ තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති නො වෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති, සවෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති නීච කුලිනො හොති, නීචාකුලීන සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං ඵද්ධා හොති අනිමානි අභිවාදෙතබ්බං න අභිවාදෙති පච්චුට්ඨෙතබ්බං න පච්චුට්ඨෙති ආසනාරහස්ස ආසනං න දෙති මග්ගාරහස්ස මග්ගං න දෙති සක්කාතබ්බං න සක්කරොති ගරුකාතබ්බං න ගරුකරොති මානෙතබ්බං න මානෙති පූජෙතබ්බං න පූජෙති-සි.

එ බදු ආදීනව දුක යමෙක් බුද්ධාදීන් කෙරෙහි ගෞරව කෙළේ වී නම් හෙතෙම ඒ කුසලයෙන් දෙව්ලොව ඉපද සුව විඳ මෙහි උපදනේ උතුම් කුලයෙහි ඉපද හැමදෙනා විසින් ගරුකට ලැබූ වන්නේ සි.

එසින් වදාළ හ.

ඉධ පන මානව එකච්චෝ ඉත්ථී වා පුරිසෝ වා අත්ථද්ධා හොති අනතිමානි අභිවාදෙතබ්බං අභිවාදෙති පච්චුට්ඨෙතබ්බං පච්චුට්ඨෙති ආසනාරහස්ස ආසනං දෙති මග්ගාරහස්ස මග්ගං දෙති සක්කාතබ්බං සක්කරොති ගරුකාතබ්බං ගරුකරොති මානෙතබ්බං මානෙති පූජෙතබ්බං පූජෙති, සෝ තෙන කම්මෙන එවං සමත්තෙන එවං සමාදින්නෙන කායස්සභෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති. නො වෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති, සවෙ මනුස්සත්තං ආගච්ඡති යත්ථ යත්ථ පච්චාජායති උච්චාකුලීනො හොති. උච්චාකුලීන සංවත්තනිකා එසා මානව පටිපදා යදිදං අත්ථද්ධොහොති අනතිමානී අභිවාදෙතබ්බං අභිවාදෙති පච්චුට්ඨෙතබ්බං පච්චුට්ඨෙති ආසනාරහස්ස ආසනං දෙති මග්ගාරහස්ස මග්ගං දෙති සක්කාතබ්බං සක්කරොති ගරුකාතබ්බං ගරුකරොති මානෙතබ්බං මානෙති පූජෙතබ්බං පූජෙති-සි.

යනාදී වියින් වණ්නාකර වදුරණ ලද අනුසස් සලකා බුද්ධාදින් කෙරෙහි ගෞරව කරන්නා වූ සඞ්ඝයන් ට දෘෂ්ටධාර්මික සාම්පරායික ධර්මයෙන් අභිවර්ධියට සිදුවීයට කාරණා වන බැවින් හෙ ද උතුම් මඟුල් නම් වන්නේ ය. **"නිවාතතොව"** යන්නෙහි නිවාත නම් මාන ඔෂධත්‍ය වසයෙන් ආත්මොත්කර්ෂණයක් නැති ව ගුරුන් වහන්සේ කෙරෙහි ද මව්පියන් ආදී වූ වෘද්ධයන් කෙරෙහි ද යටත් වූ පැවතුම් ඇති බව, පා පිස්නා බිසිකඩක් සෙයින් අහසුන් ගොණෙකු මෙන් නිය දළ සුන් දිවියෙකු මෙන් විෂ දළ සුන් සර්පයෙකු මෙන් නිහතමානී වීම, නිවාත වෙයි. හෙ ද ඇසු දුටු පණ්ඩිත ජනයින්ට සතුටු එළවන බැවින් ද ලෞකික ලොකොත්තර සම්පත්තියට කාරණා බැවින්ද උතුම් මඟුල් නම් වන්නේ ය.

"සන්තුට්ඨිව" යන්නෙහි සන්තොස ය ත්‍රිවිධ වේ. කිසේ ය යත්? - යථාලාභ සන්තොස ය, යථාබල සන්තොස ය, යථාසාරුප්ප සන්තොස ය, යන මේ යි. හෙ ද සිව්පසයෙහි පැවතීම් වසයෙන් ද්වාදස විධ වේ. කෙසේ ද යත්?

මේ ශාසනයෙහි භික්ෂුතෙමේ සුන්දර වූ හෝ අසුන්දර වූ හෝ සිවුරු ලබන්නේ එයින් ම සතුටු වන්නේ ය. අනිකක් නොපතන්නේ ය. ලැබුන ද නොපිළිගන්නේ ය. මේ චීවරයෙහි යථාලාභ සන්තොස ය නම් වේ. එ සේ ලද කල්හි ද වතාහි සවභාවයෙන් දුර්ලභ කමකින් හෝ යුක්ත ද එක්තරා ආබාධයක් හෝ ඇත්තේ වේ ද ජරාවෙන් හෝ පෙළෙන්නේ වේ ද එ බැවින් දළ වූ ගරුක වූ භාර වූ සිවුරු දැරීමෙන් ක්ලාන්ත හෝ වේ ද ඒ කාරණයෙන් අලෙප ඡ්ඡ වූ ඒ භික්ෂුතෙමේ සභාග වූ සදෘශ වූ විශ්වාස ඇති භික්ෂූන් හා සමග ඔවුන්ගේ සැහැල්ලු සිවුරු තබාගෙණ තමාගේ ගරුක භාර වූ සිවුරු ඔවුන්ට දී චීවර පරිවර්තන ය කොට සැහැල්ලු චීවරයෙන් යැපෙන්නේ ද සන්තුෂ්ට ම වේ. අසන්තුෂ්ට නම් නො වේ. මේ චීවර යෙහි යථාබල සන්තොස නම් වේ.

යථා සාරුප්ප සන්තොස ය නම් ඇතැම් භික්ෂුකෙණෙක් ප්‍රණීත වූ ප්‍රත්‍යයලාභී වන්නේ ය. හෙතෙම පටසිවුරු ආදී වූ එක්තරා මහානර්ඝ වූ සිවුරක් හෝ සිහින් මොලොක් බොහෝ සිවුරු හෝ ලැබ මේ සිවුරු සථවිර භික්ෂූන්ට පළමු මහණවුන්ට බහුශ්‍රුත වූ ධර්මධර යන්ට සුදුසු වන්නේ ය. මේ සිවුරු ප්‍රත්‍ය ය නොලැබෙන අල්පලාභීන්ට සුදුසු වන්නේ ය යි සිතා ඒ සිවුරු දන් දී පළමු සිවුරු ම හෝ කසලගොඩ ආදී තෙනින් අවුලාගත් පිළිගෙණ එයින් සඞ්ඝාටි සිවුරුකොට හෝ දරන්නේ ද හෙ තෙම අතිශයින් සන්තුෂ්ට නොවේ. මේ චීවරයෙහි යථා සාරුප්ප සන්තොස ය නම් වේ. මෙතෙකින්

චීවරයෙහි යථාලාභ සන්තෝෂ ය යථාබල සන්තෝෂ ය යථාසාරුප්ප සන්තෝෂ ය යන ත්‍රිවිධ සන්තෝෂ ය සැකෙවින් දක්වන ලද්දේ ය. කියේ මැනෝ.

ග්‍රාමාන්‍යඵල සූත්‍ර වර්ණනායෙහි

සන්තුට්ඨෝති ඉතරීතර පච්චය සන්තොසෙන සමන්නාගතො-සෝ පනෙස සන්තොසෝ ද්වාදසවිධෝ හොති. සෙය්‍යථිදං? චීවරෙ යථාලාභ සන්තොසෝ යථාබල සන්තොසෝ යථාසාරුප්ප සන්තොසෝති තිවිධෝ. එවං පිණ්ඩපාතාදිසු. තස්සායං පභෙද සංවණ්ණනා. ඉධ භික්ඛු චීවරං ලභති සුන්දරං වා අසුන්දරං වා සො තෙනෙව යාපෙති අඤ්ඤං න පත්ථෙති ලභන්තොපි න ගණ්හාති, අය මස්ස චීවරෙ යථාලාභ සන්තොසෝ. අථ පන පකති දුබ්බලො වා හොති ආබාධ ජරාභිභූතො වා ගරුචීවරං පාරුපන්තො කිලමති. සෝ සභාගෙන භික්ඛුනා සද්ධිං පරිවත්තෙත්වා ලහුකෙන යාපෙන්තොපි සන්තුට්ඨොව හොති. අයමස්ස චීවරෙ යථාබල සන්තොසෝ.

අපරෝ පණීත පච්චයලාභී හොති සෝ පට්ට චීවරාදීනං අඤ්ඤතර මහග්ඝ චීවරං වා බහූනි වා පන චීවරානි ලභිත්වා ඉදං ථෙරානං චිරපබ්බජිතානං, ඉදා බහුසුතානං අනුරූපං, ඉදං ගිලානානං ඉදං අපපලාභීනං හොතූති වත්වා තෙසං පුරාණ චීවරං වා ගහෙත්වා සංකාරකූටාදිතො වා පන තනතකානි උච්චිනිත්වා තෙහි සංඝාටිං කත්වා ධාරෙන්තොපි සන්තුට්ඨොව හොති. අයමස්ස චීවරෙ යථාසාරුප්ප සන්තොසෝ.

පිණ්ඩපාතයෙහි ත්‍රිවිධ සන්තොස ය කෙසේ ද යත්?-මේ සස්නෙහි සැදුනැයෙන් පැවිදි වූ මහණ තෙමේ මධුර වූ හෝ අමධුර වූ හෝ ආහාර ය ලැබ එයින් ම සතුටු වන්නේ ය. අනිකක් නොපතන්නේ ය. ලැබුණ ද නොපිළිගන්නේ ය. මේ පිණ්ඩපාතයෙහි යථාලාභ සන්තොස ය නම් වේ. පිණ්ඩපාතයෙහි යථාබල සන්තොස ය කෙසේ ද යත්?-යම් භික්ෂුකෙණෙක් නමහට ප්‍රකෘතීන් විරුද්ධ වූ හෝ ව්‍යාධියට විරුද්ධ වූ හෝ යම් දෙයක් වැළඳූ කල අමුතු ව්‍යාධි හෝ වඩි ද මේසේ යමකින් අථාසු වේ නම් ඒ භික්ෂුතෙම ඒ ආහාර ය ලැබුනු කල සහාග භික්ෂුන්ට දී ඔවුන් අතින් තමහට අවිරුද්ධ නෝජනයක් ගෙණ වළඳ, මහණ දම් කෙරේ නම් හෙ ද සන්තුෂ්ටමැ සි. නිවරදිමැ සි මේ පිණ්ඩපාතයෙහි යථාබල සන්තොස ය නම් වේ.

පිණ්ඩපාතයෙහි යථාසාරුප්ප සන්තොස ය කෙසේ ද යත්? ඇතැම් භික්ෂුකෙණෙක් ප්‍රණීත වූ බොහෝ ආහාර ලැබ සිව්රැ සෙයින් චිරප්‍රව්‍රජිත බහුශ්‍රැත අල්පලාභී ගිලන් භික්ෂූන්ට දන් දී

එසින් ශෙෂයකින් හෝ පිඬු පිණිස ගැසිර මිශ්‍රකාහාර ය නෝ වළඳන්නේ ද සනතුෂ්ට ම වේ. මේ පිණ්ඩපාතයෙහි යථාසාරූප සන්තොස ය නම් වේ. මෙතෙකින් පිණ්ඩපාතයෙහි යථා ලාභ සන්තොස ය යථාබල සන්තොස ය යථාසාරූප සන්තොස ය යන ත්‍රිවිධ සන්තොස ය දතයුතු. දක්වන ලද මැයි.

ශ්‍රාමාණ්‍යඵල සූත්‍ර වර්ණනායෙහි-

ඉධ පන භික්ඛු පිණ්ඩපාතං ලභති ලූඛං වා පණීතං වා සෝ තෙනෙව යාපෙති අඤ්ඤං න පත්ථෙති ලභන්තොපි න ගණ්හාති අයමස්ස පිණ්ඩපාතෙ යථාලාභ සන්තොසො. යො පන අත්තනො පකති විරුද්ධං වා ව්‍යාධි විරුද්ධං වා පිණ්ඩපාතං ලභති යෙනස්ස පරිභුත්තෙන අඵාසු හොති. සෝ සභාගස්ස භික්ඛුනො තං දත්වා තස්ස හත්ථතො සප්පායං භොජනං භුඤ්ජිත්වා සමණ ධම්මං කරොන්තොපි සන්තුට්ඨොව හොති. අයමස්ස පිණ්ඩපාතෙ යථාබල සන්තොසො. අපරො බහුං පණීතං පිණ්ඩපාතං ලභති සෝ තං වීවරං ඔය ඵෙර විරජබ්බජිත බහුසූත අපලාභී ගිලානානං දත්වා තෙසං වා සෙසකං පිණ්ඩාය වා චරිත්වා මිස්සකාහාරං භුඤ්ජන්තොපි සන්තුට්ඨොව හොති අයම්ස්ස පිණ්ඩපාතෙ යථාසාරූප සන්තොසො—යි.

සෙනාසනයෙහි ත්‍රිවිධ සන්තොස ය කෙසේ ද යත්?—මෙහි වනාහි ඇතැම් භික්ෂූ කෙණෙක් මනාප වූ හෝ අමනාප වූ හෝ සෙනස්නක් ලැබ හේ එහි සතුටක් හෝ දෙම්නසක් හෝ නොඋපදවා ද යටත් පිරිසෙසින් තෘණ සයනයකින් හෝ ලද යම් ලෙසකින් සතුටු වන්නේ ය. අනිකක් නොපතන්නේ ය. නැවත උතුම් සෙනස්නක් ලැබුණ ද නොපිළිගන්නේ ය. මේ ඔහුගේ සෙනාසනයෙහි යථා ලාභ සන්තොස ය නම් වෙ යි. සෙනාසනයෙහි යථාබල සන්තොස ය කෙසේ ද යත්? යම් භික්ෂූ කෙණෙකුන්ට සුභාවයෙන් විරුද්ධ වූ හෝ ව්‍යාධියට විරුද්ධ වූ හෝ නෙවත් යම් සෙනස්නක වසන්නාහට ඒ සෙනස්නෙහි විසිමෙන් වාතාදී යම් ව්‍යාධියක් කිපේ නම් යම් සෙනස්නක දිසූ කල ව්‍යාධිය මැඩපවති නම් තෙ ලත් අඵාසු සෙනස්න විශොසි වූ සභාග භික්ෂූන්ට දී ඔවුන්ගේ සැප සෙනස්න ගෙණ වසමින් ශ්‍රමණධම් ය පුරන්නේ ද සන්තුෂ්ට නම් වේ. මේ සෙනාසනයෙහි යථාබල සන්තොස ය නම් වේ.

සෙනාසනයෙහි යථාසාරූප සන්තොස ය කෙසේ ද යත්? මහත් වූ පින්ඇති ඇතැම් භික්ෂූ කෙණෙක් දෙර යෙදූ ගල් ලෙන් මණ්ඩප කූටාගාරාදී වූ ප්‍රණීත වූ බොහෝ සෙනාසන ලබන්නේ ය. උතුම් සෙනස්නෙහි වසන්නාහට පීනමිද්ධ ය වඩන්නේ ය. නිද්‍රාභිභූත ව නැවත නැගී සිටින කල්හි කාමවිතර්ක ය උපදනේ ය යි

කි හෙයින් ඒ සලකා ඔහු ඒ සෙනසුන් චීවර සෙයින් පළමු පැවිදි තැනට හෝ බහුශ්‍රුත ධර්මධර තැනට හෝ ප්‍රත්‍ය නො ලැබෙන අල්පලාභී තැනට හෝ ගිලන් රෝගී තැනට හෝ දන් දී අබෙහොකාස වෘක්ෂමූල පන්සල් ආදී යම් කිසි කෙනෙකු වස න්නේ අනිසසින් සනතුෂ්ට නම් වේ. මේ සෙනාසනයෙහි යථා සාරුප්ප සන්තොස ය නම් වේ. මේහෙකින් සෙනාසනයෙහි යථා ලාභ සන්තොස ය යථාබල සන්තෝස ය යථා සාරුප්ප සන්තෝ ස ය යන ත්‍රිවිධ සන්තෝස ය දතයුතු. හෙ ද දක්වන ලද මෑ සි.

ඉධ පන භික්ඛු සෙනාසනං ලභති මනාපං වා අමනාපං වා සො තෙනෙව සොමනස්සං න පටිඝං උපපාදෙති අනත්තමසො තිණසන්ථරකෙනාපි යථා ලද්ධෙනෙව තුස්සති අයමස්ස සෙනාස නෙ යථාලාභ සන්තොසො යො පන අත්තනො පකති විරුද්ධං වා ව්‍යාධි විරුද්ධං වා සෙනාසනං ලභති. යත්ථස්ස වසතො අඵාසු හොති සො තං සභාගස්ස භික්ඛුනො දත්වා තස්ස සන්තකෙ සපපාය සෙනාසනෙ බහුවසනෙනාපි සන්තුට්ඨො ව හොති. අය මස්ස සෙනාසනෙ යථාබල සන්තොසො.

අපරො මහා පුඤ්ඤ ලෙණ මණ්ඩප කූටාගාරාදීනි පණීත සෙනාසනානි ලභති සො තානි චීවරා දිය ථෙර විරපබ්බජිත බහුසසුත අපපලාභී ගිලානානං දත්වා යත්ථ කත්ථ චි වසනෙනා සන්තුට්ඨොව හොති. අයමස්ස සෙනාසනෙ යථාසාරුප්ප සන්තොසො. යො පි උත්තම සෙනාසනං නාම පමාදට්ඨානං තත්ථ නිසින්නස්ස පිනම්ධං ඔක්කමති නිද්දාභිභූතස්ස පුන පටිබුජ්ඣතො පාපවිතක්කා පාතුභවන්තීති පටිසංචික්ඛිත්වා තාදිසං සෙනාසනං පත්තමපි න සමපටිච්ඡති. සො තං පටික්ඛිපිත්වා අබෙහොකාස රුක්ඛමූලාදිසු වසන්තොපි සන්තුට්ඨොව හොති. අයම්පි සෙනා සනෙ යථාසාරුප්ප සන්තොසො-සි.

ගිලාන ප්‍රත්‍යයෙහි ත්‍රිවිධ සන්තෝස ය කෙසේ ද යත්? මේ ශාසනයෙහි භික්ෂුතෙමේ වතුමධුරා දී ප්‍රණීත වූ බෙහෙත් හෝ පූතිමූත්‍ර අරළු ආදී වූ අමධුර බෙහෙත් හෝ යමක් ලැබ හෙතෙ ම එයින් ම සතුටු වේ ද අනිකක් නො පතා ද ලැබුන ත් නො පිලිගණී ද මේ ඔහුගේ ගිලානප්‍රත්‍යයෙහි යථාලාභ සන්තෝස ය නම් වේ. ගිලාන ප්‍රත්‍යයෙහි යථාබල සන්තෝස ය කෙසේ ද යත්? යම් භික්ෂු කෙණෙක් තෙල් නැති ව සකුරු පමණ ලද්දේ තෙලෙන් ප්‍රයෝජන කැමති වී නම් ඵාණිත සංඛ්‍යාත උක්සකුරු

සහාග තෙනට දී ඔවුන් අතින් තෙල්ගෙණ හෝ පරියෙසන ය කොට හෝ බෙහෙත් කරන්නේ ද සතුටට ම වේ මේ ඔහුගේ ගිලානප්‍රත්‍යයෙහි යථාබල සන්තෝස ය නම් වේ.

ගිලානප්‍රත්‍යයෙහි යථාසාරූප සන්තෝස ය කෙසේ ද යත්? මහත් පින් ඇති ඇතැම් භික්ෂු කෙණෙක් ගිතෙල් මී උක්සකුරු ආදී වූ ප්‍රණීත වූ බොහෝ භෙෂජ්‍ය ලදින් චීවර සෙසින් විප්‍රවාසීන බහුශ්‍රැත අල්පලාභී ගිලානාදීන්ට දී ඔවුන් විසින් එළවන ලද යම් කිසිවකින් යැපෙන්නේ ද සතුටට ම වේ අපි ච— යම් භික්ෂු කෙණෙක්හට එක් බදනෙක ගෝමූ අරළු හා එක බදනෙක චතුමධුර ය පුරා සවාමිනි! මෙයින් කැමැත්තක් ගෙණ වළඳනු මැනව මේ හැම ඔබට අසිනි ය සි කියා දෙන ලද්දේ ද ඉදින් ඒ දෙකොටසාස ය ම තමාගේ ව්‍යාධියට හිත වී නම් එයින් කවරෝ වැලදුව ද රෝග ය ව්‍යුපශම වේ නම් එ කල්හි ගෝමූ අරළු නම් බුදුරදුන් විසින් වණ්ණාකර වදුරණ ලද්දේ ය සි සිතා චතුමධුර ය නො පිළිගෙණ ප්‍රතික්ෂෙප කොට ගෝමූ අරළු පිළිගෙණ එයින් බෙහෙත් කරන්නේ වී නම් පරම සතුටට නම් වේ. මේ උහුගේ ගිලාන ප්‍රත්‍යයෙහි පරම වූ උතුම් වූ යථාලාභ සන්තොස ය නම් වේ. දක්වන ලද මැ සි.

ඉධ පන භික්ඛු භෙසජ්ජං ලභති. ලූඛං වා පණීතං වා සො යං ලභති තෙනෙ ව තුස්සති අඤ්ඤං න පත්ථෙති ලභන්තොපි න ගණ්හාති. අයමස්ස ගිලාන පච්චයෙ යථාලාභ සන්තොසො. යො පන නෙලෙනත්ථිකො ඵාණිතං ලභති සො තං සභාගස්ස භික්ඛුනො දත්වා තස්ස හත්ථතො තෙලං ගන්ත්වා වා අඤ්ඤං වා පරියෙසිත්වා භෙසජ්ජං කරොන්තොපි සන්තුට්ඨොව හොති. අය මස්ස ගිලාන පච්චයෙ යථා ලාභ සන්තොසො. අපරො මහාපුඤ්ඤො බහුං තෙල මධු ඵාණිතාදී පණීත භෙසජ්ජං ලභති සො තං චීවරං විය ථෙර විර පබ්බජිත බහුස්සුත අපපලාභී ගිලානානං දත්වා තෙසං ආභතකෙන යෙන කෙනචි යාපෙන්තොපි සන්තුට්ඨොව හොති. යො පන එකස්මිං භාජනෙ මූත්‍තහරීටකං ඨපෙත්වා එකස්මිං චතුමධුරං, ගණ්හථ භන්තෙ යදිච්ඡසීති වුච්චමානො සච්ඡ තෙසු අඤ්ඤතරෙනාපි රොගො උපසම්මෙය්, අථ මූත්‍ත හරීටකං නාම බුද්ධාදීහි වණ්ණිතං'ති චතුමධුරං පටික්ඛිපිත්වා මූත්‍ත හරීටකෙනෙව භෙසජ්ජං කරොන්තො පරම සන්තුට්ඨොව හොති. අයමස්ස ගිලානපච්චයෙ යථාසාරූප සන්තොසො—සි.

මේ දොළොස්විධ වූ ඉතරීතර ප්‍රත්‍ය ය සන්තොසයෙන් සමින් ඉන වූ භික්ෂුහට තුන්සිවුරු පාත්‍ර වාසි සූචි කායබන්ධන පරිස්‍රාවන සඞ්ඛ්‍යාත අෂ්ට පරිස්කාර ය ම වටනා බව දක්වන්නට කිහ.

ඉමිනා පන දොළසවිධෙන ඉතරීතරපච්චය සන්තොසෙන සමන්නාගතස්ස භික්ඛුනො අට්ඨපරික්ඛාරා වට්ටන්ති තීනි චීවරානි පත්තො, දන්තකට්ඨඡේදන වාසි, එකා සූචි, කායබන්ධනං, පරිස්‍රාවනං—යි.

ඒ සියලු පරිස්කාරයෝ ම කාය පරිහාර ය යි කියන ලද කයට පොෂ්‍ය ය ද කුච්ඡි පරිහාර ය යි කියන ලද කුක්ෂි පොෂ්‍ය ය ද ප්‍රයෝජන කොට ඇත්තාහු යි. කෙසේ ද යත්? – එයින් පළමු කොට දක්වන ලද තුන්සිවුරු හැඳ පෙරව හැඳින කාලයෙහි කාය පරිහාර ය (පොෂ්‍ය ය) කරන්නේනු යි. කාය පරිහාර ය කයට පොෂ්‍ය ය ප්‍රයෝජන ය කොට ඇත්තේ ය. පෙරහන්කඩ නැනිවිට සිවුරු කණින් පැන් පෙරහා වලඳන කල ද ඛාදිතව්‍ය ඵලාඵල ගන්නා කල ද කුක්ෂිපරිහාර ය පොෂ්‍ය කරන්නේනු යි. කුක්ෂිපරිහාර කුක්ෂිපොෂ්‍ය ය නම් වේ යි. යනු දක්වන්නට කිහ.

තෙ සබ්බෙ කාය පරිහාරියාපි හොන්ති කුච්ඡි පරිහාරියාපි. කථං? තිච්චරං තාව නිවාසෙත්වා පාරුපිත්වා චීවරණකාලෙ කායං පරිහරන්ති කායෙ පොසෙන්ති ති කායපරිහාරියං හොති. චීවර කණ්ණන උදකං පරිස්‍රාවෙත්වා පිවන කාලෙ ඛාදිතබ්බ ඵලා ඵලං ගහණකාලෙ ච කුච්ඡිං පරිහරන්ති පොසෙන්ති ති කුච්ඡිපරිහාරියං හොති.

පාත්‍ර ය ද එයින් ලිං ආදියෙන් පැන් නගා ගන්නා කල ද කුටි පරිභණ්ඩ කරණ කල ද කාය පරිහාරික නම් වේ. ආහාර ගෙණ වලඳන කල කුක්ෂි පොෂ්‍ය ය නම් වෙති යි යනු දක්වන්නට කිහ–

පත්තොපි තෙන උදකං උද්ධරිත්වා නහාන කාලෙ කුටිපරිභණ්ඩ කරණ කාලෙ ච කායපරිහාරිකො හොති. ආහාරං ගහෙත්වා භුඤ්ජන කාලෙ කුච්ඡි පරිහාරිකො—යි.

වාසි සඞ්ඛ්‍යාත කර ය දැහැටි කපාගන්නා කල ද මඤ්චපීඨ යන්ට ප්‍රයෝජන වූ වේ පත් ආදියක් කපන කල ද සිවුරු කපන කල ද පන්සල කරණ විට යමක් කපන කල ද දඬු කපා අබ වස සිවුරු කුටියක් සාදාගන්නා කල ද කාය පොෂ්‍ය ය නම් වේ යි. උක් දඬු කපන කල ද තෙරළු පක් කපන කල ද කුක්ෂි පරිහාර ය කුක්ෂි පොෂ්‍ය ය නම් වෙති යි, යනු දක්වන්නට කිහ.

වාසිපි තාය දන්තකට්ඨවේජ්දන කාලෙ මඤ්ඣපිඨානං අඞ්ග පාද චීවරකුටි දණ්ඩක සජ්ජන කාලෙ ච කායපරිහාරිකා නොනි. උච්චු වේජ්දන නාලිකෙරාදි තච්ඡන කාලෙ කුච්ඡි පරිහාරිකා—සි.

සූචි සඞ්ඛ්‍යාත ඉදිකට්ටව ද සිව්රැ විදිනා කල කාය පරිහාරි ය නම් වෙ සි. පූපයක් හෝ ඵලයක් හෝ විද අනුභව කරණ කල කුක්ෂිපොෂ්‍ය වෙති සි, යනු දක්වන්නට කිහ—

සූචිපි චීවර සිබ්බන කාලෙ කායපරිහාරිකා හොනි. පූපං වා ඵලං වා විජ්ඣිත්වා ඛාදන කාලෙ කුච්ඡපරිහාරිකා—සි.

කාය බන්ධන සඞ්ඛ්‍යාත පටි ය බැඳ හැවිදින කල කාය පරිහාර වෙ සි. උක් දඹු ආදි ය බැඳගෙණ යන කල කුච්ඡි පරිහා රි ය වෙති සි යනු දක්වන්නට කිහ—

කාය බන්ධනං බන්ධිත්වා විචරණ කාලෙ කාය පරිහාරිකා. උච්චු ආදීනි බන්ධිත්වා ගහණ කාලෙ කුච්ඡි පරිහාරියං—සි.

පරිසාවන සඞ්ඛ්‍යාත පෙරහන්කඩ ජැන් පෙරහා නහන කල ද සෙනසුන් පරිභණ්ඩන කරණ කල ද කායපරිහාරි ය වෙසි. පැන් පාන වගීාදි ය පෙරහා වලදන කල ද ඒ පෙරහනින් ම තිල නණ්ඩුල පුථුකාදි ය ගෙණ කන කල ද කුක්ෂිපොෂ්‍ය වෙති සි යනු දක්වන්නට කිහ—

පරිසාවනං තෙන උදකං පරිසාවෙත්වා නහාන කාලෙ සෙ නාසන පරිභණ්ඩකරන කාලෙ ච කායපරිහාරියං. පානිය පානක පරිසාවන කාලෙ තෙතෙව තිලතණ්ඩුල පුථුකාදීනි ගහෙත්වා ඛාදන කාලෙ ච කුච්ඡිපරිහාරියං—සි.

මේ අෂ්ට පරිෂ්කාර ය ධරන්නා වූ භික්ෂුහුගේ පරිෂ්කාර මාත්‍රයක. තව පරිෂ්කාර ධරණ භික්ෂුහට වනාහි ශය්‍යාවට ප්‍රවි ෂ්ට වූවහුට තත්‍රට්ඨක පච්චත්ථරණ ය හෝ කුසුම්භකා ව හෝ වට නේ ය. දශ පරිෂ්කාරිකයහට වනාහි භිඳිනා සම්කඩ වටනේ ය. එකොළොස් පරිෂ්කාරිකයාහට ශරයට් ය හෝ තෙල් තළ හෝ වටනේ ය. දොළොස් පරිෂ්කාරිකයාහට ඡත්‍ර ය හෝ වහන් සහල හෝ වටනේ ය සි යනු දක්වන්නට කිහ—

අයං තාව අට්ඨපරික්ඛාරිකස්ස පරික්ඛාරසම්පත්ති. නවපරික්ඛා රිකස්ස පන සෙය්‍යං පවිසන්තස්ස තත්‍රට්ඨක පච්චත්ථරණං වා කුසුම්භකං වා වට්ටති. දසපරික්ඛාරිකස්ස නිසීදන චම්මඛණ්ඩං වා

වට්ටති. එකාදස පරික්ඛාරිකස්ස කත්තරයට්ඨිං වා පෙලනාලිකා වා වට්ටති. ද්වාදස පරික්ඛාරිකස්ස ඡත්තං වා උපාහනං වා වට්ටති.

මේසේ දක්වන ලද්දවුන් කෙරෙහි අෂ්ටපරිෂ්කාරික ම සන්තුෂ්ට ය. සෙසු නව දස එකොළොස් දොළොස් පරිෂ්කාර ධරයෝ අසන්තුෂ්ටයෝ ය. මහෙච්ඡයෝ ය. යනාදීන් නො කිය යුතු ය ඔවුනු දු අල්පෙච්ඡයෝ ම ය. සන්තුෂ්ටයෝ ම ය. සුභර යෝ ම ය. සල්ලහුක වුත්තිකයෝ ම ය සි යනු දක්වන්නට කිහ—

එතෙසු ච අට්ඨපරික්ඛාරිකො ච සන්තුට්ඨො. ඉතරෙ අස න්තුට්ඨා මහිච්ඡා. මහෙච්ඡානි න වත්තබ්බා. අප්පිච්ඡා ච සන්තුට්ඨා ච සුභරා ච සල්ලහුක වුත්තිනො-සි

මෙහි **සුභර** නම් උපාසක ජනයන් විසින් යම් කිසි රූපාදී ප්‍රණීත ප්‍රත්‍යයකින් මේ දෙය වළඳනා සේක් දෝ නොවළඳනා සේක් දෝ හෝ සි යන සැකයක් නැති ව ලද යම් දෙයකින් සැප සේ දන් දී පින් රැස්කරගන්ට එසු ඇතිබව ය. සල්ලහුක වුත්ති නම් බොහෝ පරිෂ්කාර නැති ව අෂ්ටපරිෂ්කාර මාත්‍රයක් පරිහරණ වසයෙන් දිගානතරයෙහි පත්‍රභාර සහිත ව යන සකුණක්හු මෙන් ලඝු වූ ප්‍රවෘත්ති ඇති බව වන්නේ ය. මෙසේ අනෙකප්‍රකාර යෙන් වර්ණනා කරණ ලද සංතුෂ්ටි භාවයෙහි ගුණ නොසලකා ලද දෙයකින් සතුටු නොව ලාභ සත්කාරයෙහි ඇලුන නොත් අනයව්‍යසනයට පැමිණෙන්නේ ය. කෙසේ ද යත්?

යම් සේ **බාලිසිකා** ය සි කියන ලද බිලි වැදිනෙමේ මත්ස්‍ය යන් ගන්නා බිලි ය ගැඹුරු වූ ජලයෙහි ප්‍රතික්ෂේප කරන්නේ ද ඒ දූක ගෝචරයෙහි ඇලුනු එන්තරා මත්ස්‍යයෙක් ගලන ය කරන්නේ ද එසේ ගිලි මත්ස්‍යතෙම අනයව්‍යසනයට පැමිණේ ද නෙවත් බිලි වැදිහුගේ අනිප්‍රායානුකූල වූ ක්‍රියාවට පැමිණෙන්නේ ය. ඒ එසේ ම ය. බිලි වැදි ය සි යනු පාපිමත් වූ මාරයාහට නමෙක. බිලියැ සි යනු ලාභසත්කාරයට නමෙකි. යම් කිසි භික්ෂු කෙණෙක් උපන් ලාභ සත්කාරයෙහි ඇලුම් ඇති ව ආශාවාද ඇති ව ඉවසා නම් ඒ කැවිනි වේ නම්, ඒ භික්ෂු තෙමේ ගිලින ලද බිලි ඇති කෙණෙකැ සි කියනු ලැබෙ සි. හෙවත් ලාභ සත්කාර නමැති බිලි ය ගිල පාපිමත් වූ මරහු නැමති බිලි වැදිහට අසුව මහත් වූ අනයව්‍යසනයට පැමිණෙන්නේ ය. ලාභසත්කාර ය නම් මෙසේ දරුණු වූ දෙයක. කටුක වූ දෙයක. එරුෂ වූ දෙයක. නිරාහාර වූ යොගක්ෂෙම ය සි කියන ලද නිබ්බාණ ය ට අන්තරා ය කරණ

දෙයකි. එසේ හෙයින් උපන් ලාභසත්කාර ය දුරු කෙරෙමි. නො උපන් ලාභසත්කාර ය නො පතමි. එහි සිත ගෙණ නොසිටුවමි යි කියා හික්මිය යුතු.–එසින් වදළහ. සංයුත්සගි ය **ලාභ සත්කාර සංයුක්තයෙහි**–

දුරණෙ භිකඛවෙ ලාභසකකාර සිලොකො. කටුකො. එරුසො අනතරාසිකො. අනුතතාරසස යොගකෙඛමිසස අධිගමා ය. සෙයයථාපි භිකඛවෙ බාලිසිකො ආමිසගතං බලිසං ගමභීරෙ උදකරහදෙ පකඛිපෙයය තමෙනං අඤඤතරො ආමිස වකඛු මචෙඡා ගිලෙයය, එවං හි සො භිකඛවෙ මචෙඡා ගිලිත බලිසො බාලිසිකසස අනයං ආපනනො වයසනං ආපනනො යථා කාම කරණීයො බාලිසිකසස. බාලිසිකොති ඛො මාරසෙතං පාපිමතො අධිවචනං. බලිසනති ඛො භිකඛවෙ ලාභසකකාර සිලොකසෙතං අධිවචනං. යො හි කොචි භිකඛවෙ භිකඛු උපපනනං ලාභසකකාර සිලොකං අසසාදෙති නිකාමෙති. අයං වුචචති භිකඛවෙ භිකඛු ගිලිත බලිසො. මාරසස අනයං ආපනනො. වයසනං ආපනනො. යථාකාමි කරණීයො පාපිමතො. එවං දුරණෙ ඛො භිකඛවෙ ලාභසකකාර සිලොකො කටුකො එරුසො. අනතරාසිකො. අනුතතාරසස යොග කෙඛමිසස අධිගමාය. තසමාතිහ භිකඛවෙ එවං සිකඛිතබබං. උපපනනං ලාභසකකාර සිලොකං පජහිසසාම න ච නො උපපජජො ලාභසකකාර සිලොකො චිතතං පරියාදාය ඨසසති නි. එවං හි වො භිකඛවෙ සිකඛිතබබං—යි.

අපි ච- යම් සේ දිග ලොම් ඇති හෙළි නොමෝ කටුයෙන් ගැවසිගත් කැලයක් දැක ගොදුරු ලෝභයෙන් එයට වැද ඒ ඒ තැන කටුයෙහි බැඳී මහත් අනයව්‍යසනයට පැමිණෙන්නේ ද එ පරිද්දෙන් ම මේ සාසනයෙහි ඇතැම් භික්ෂූකෙණෙක් ලාභසත්කාර චිතතයෙන් මැඩපවත්වන ලද්දේ පෙරවරු වේළෙහි හැඳ පෙරව ග්‍රාමයට නෝ නිගමයට නෝ පිඬු පිණිස පැමිණ අසවල් අසවල් නියම් ගම් රසමසවුලෙන් යුකත ව හොජනය දෙන්නා හු ය යනාදීන් සිතා ඒ ඒ තැන්හි බැඳි යෙමින් චුලල පිණඩ පාතික සථවිරාදීන් මෙන් මහත් වූ අනයව්‍යසනයට පැමිණෙන් නේ ය, ලාභසත්කාර නම් මෙසේ දරුණු වූ දෙයකි.

සෙය්‍යථාපි භිකඛවෙ දිඝලොමිකා එළකා කණටක ගහනං පවිසෙය්‍ය සා තත්‍ර තත්‍ර සජෙජය්‍ය තත්‍ර තත්‍ර ගවෙජය්‍ය තත්‍ර තත්‍ර බජෙඣය්‍ය තත්‍ර තත්‍ර අනයව්‍යසනං ආපජජෙය්‍ය, එවමෙව ඛො භිකඛවෙ ඉධෙකචචො භික්ඛු ලාභසකකාර සිලොකෙන

අභිභූතෝ පරියාදින්න චිත්තෝ පුබ්බණ්හ සමයං නිවාසෙත්වා පත්ත චීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති, සෝ තත්‍ර තත්‍ර සජ්ජති තත්‍ර තත්‍ර ගච්ඡති තත්‍ර තත්‍ර බජ්ඣති තත්‍ර තත්‍ර අනයව්‍යසනං ආපජ්ජති. එවං දාරුණෝ ඛෝ භික්ඛවේ ලාභ සක්කාර සිලෝකෝ—පෙ—"එවං හි වෝ භික්ඛවේ සික්ඛි තබ්බං"සි.

අපි ච—උපරි ආකාසයෙහි වෙරම්බ නම් වාතයෙක් හමන් නේ ය. ඒ වාතයට යම් පක්ෂියෙක් පැමිණියේ වී නම් ඒ වෙර ම්බ නම් වාතයෙන් බිඳ විසුරුවන ලදු ව පාදයෝ අත් තැනක යන්නා හ පක්ෂ පත්‍රයෝ අන්තැනක යන්නා හ. හිස අන් තැනක යන්නේ ය. කය අන් තැනෙක යන්නේ ය. එ සේ නෙයින් ම මේ ශාසනයෙහි ඇතැම් භික්ෂු කෙණෙහ් ලාභ සත් කාරයෙහි ගිජු ව ගම් නියම් ගම්හි පිඬු පිණිස හැසිරෙන්නේ නොරක්ෂණා ලද කය හා වචන ය හා සින ඇති ව ස ඉඳුරන් රැක් මෙහි සිහිනැති ව අසංවුත වූ ඉන්ද්‍රියයන් ඇති ව යන්නේ ය. එ කල්හි දුශ්නිවත්‍ර ව දුෂ්පාරූප වූ හෝ මාගමුන් දැක රාග චිත්ත ය උපදවා එයින් මඩනා ලදුයේ ශික්ෂාප්‍රත්‍යාඛ්‍යාන ය කොට නිහිඟෙට යන්නේ ය. එ කල්හි ඔහුගේ සිවුරු පාත්‍රාදී පිරිකර ඒ ඒ තැන දමන ලදු ව වේරම්බ වාතයෙන් නැසුනු පක්ෂීහු මෙන් විනාසයට පැමිණෙන්නේ ය. ලාභ සත්කාර ය නම් මේ බඳු අනර්ථදායක දෙයකි.

එයින් බැඳුණ.

උපරි භික්ඛවේ ආකාසෙ වෙරම්බා නාම වාතා වායන්ති. තත්‍ර යෝ පක්ඛි ගච්ඡති තමේනං වෙරම්බි වාතා ඛිපන්ති. තස්ස වෙරම්බවාත ඛිත්තස්ස අඤ්ඤදනෙව පාදා ගච්ඡන්ති. අඤ්ඤදා න පක්ඛා ගච්ඡන්ති. අඤ්ඤදා සීසං ගච්ඡති. අඤ්ඤදා කායෝ ගච්ඡති. එවමේව ඛෝ භික්ඛවේ ඉධේකච්චෝ භික්ඛු ලාභසක්කාර සිලෝකේන අභිභූතෝ පරියාදින්න චිත්තෝ පුබ්බණ්හ සමයං නිවාසෙත්වා පත්තචීවරමාදාය ගාමං වා නිගමං වා පිණ්ඩාය පවිසති අරක්ඛිතෙනෙව කායෙන අරක්ඛිතාය වාචාය අරක්ඛිතෙන චිත්තෙන අනුපට්ඨිතාය සතියා අසංවුතෙහි ඉන්ද්‍රියෙහි, සෝ තත්‍ර පස්සති මාතුගාමං දුන්නිවත්ථං වා දුප්පාරූපං වා තස්ස මාතුගාමං දිස්වා දුන්නිවත්ථං වා දුප්පාරූපං වා රාගෝ චිත්තං අනුද්ධංසෙති. සෝ රාගා අනුද්ධංසිතේන චිත්තේන සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තති. තස්ස අඤ්ඤදා චීවරං හරන්ති. අඤ්ඤදා පත්තං හරන්ති. අඤ්ඤදා නිසීදනං හරන්ති

අඤ්ඤදි සුවිසරං හරනති. වෙරම්බවාත ඛිත්තයෙසෙව සකුණස්ස. එවං දුරුණෙ ඛො භික්ඛවෙ ලාභසක්කාරසිලොකො—පෙ—එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං—යි.

අපි ච—ලාභසත්කාර ය නම් දරුණු වූ දෙයක. ලාභ සත්කාරයෙහි ගිජු ව ලාභ සත්කාරයෙන් මැඩපවත්වන ලද සිතින් මි දෙවදත්ත සථවිරයන් වහන්සේගේ කුසල්හි මුල් සිඳුනේ ය. ලාභ සත්කාර ය උපදවනු පිණිස ම සඞ්ඝභෙදදී තොයෙක් අකුසල් රැස්කොට අපාය භාග් වූ සේක. ලාභ සත්කාර ය නම් මේ සේ දරුණු වූ කටුක වූ දෙයකි.

එසින් වදළහ.

දුරුණෙ භික්ඛවෙ ලාභසක්කාර සිලොකො—පෙ—ලාභ සක්කාර සිලොකෙන අභිභූතො පරියාදින්න චිත්තො භික්ඛවෙ දෙවදත්තො සඞ්ඝං භින්දි. එවං දුරුණෙ ඛො භික්ඛවෙ ලාභ සක්කාර සිලොකො—පෙ—සික්ඛි තබ්බංති. දුරුණෙ භික්ඛවෙ ලාභසක්කාර සිලොකො—පෙ—ලාභසක්කාර සිලොකෙන අභිභූතස්ස පරියාදින්න චිත්තස්ස භික්ඛවෙ දෙවදත්තස්ස කුසලං මූලං සමුච්ඡිදමගමා එවං දුරුණෙ ඛො භික්ඛවෙ ලාභසක්කාර සිලොකො—පෙ—සික්ඛි තබ්බන්ති. දුරුණෙ භික්ඛවෙ ලාභ සක්කාර සිලොකො—පෙ—ලාභසක්කාර සිලොකෙන අභිභූතස්ස පරියාදින්න චිත්තස්ස භික්ඛවෙ දෙවදත්තස්ස කුසලො ධම්මො සමුච්ඡිදමගමා. එවං දුරුණෙ ඛො භික්ඛවෙ ලාභසක්කාර සිලොකො—පෙ—සික්ඛිතබ්බංති

"දුරුණෙ භික්ඛවෙ ලාභසක්කාර සිලොකො—පෙ—ලාභ සක්කාර සිලොකෙන අභිභූතස්ස පරියාදින්න චිත්තස්ස භික්ඛවෙ දෙවදත්තස්ස සුකෙකා ධම්මො සමුච්ඡිදමගමා. එවං දුරුණෙ ඛො භික්ඛවෙ ලාභසක්කාර සිලොකො-යනාදි.

අපි ච—මච්චියන් පිණිස ද දැන දැන බොරු නො කියන්නා වූ සඩියෝ කල් යාමෙන් ලාභ සත්කාරයෙහි ගිජු ව දැන දැන ම බොරු කියති. එ බැවින් භික්ෂූන් විසින් ලාභසත්කාර යෙහි ගිජු නො වුව මැනවි.

එසින් වදළහ.

ඉධාහං භික්ඛවෙ එකච්චං පුග්ගලං එවං චෙතසා චෙතො පරිච්ච පජානාමි. නවායමායස්මා මාතාපි ඔතු සම්පජාන මුසා භාසෙය්‍යාති. තමේනං පස්සාමි අපරෙන සමයෙන ලාභ සක්කාර සිලොකෙන අභිභූතං පරියාදින්න චිත්තං සම්පජාන මුසා භාසන්තං,

එවං දුරුණෝ බෝ භික්ඛවෙ ලාභසක්කාර සිලොකෝ, කටුකෝ ඵරුසෝ අන්තරායිකෝ අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය, තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං, උප්පන්නං ලාභ සක්කාර සිලොකං පජහිස්සාම් න ච නෝ උප්පජ්ජෝ ලාභසක්කාර සිලොකෝ චිත්තං පරියාදාය ඨස්සතීති, එවං හි වෝ භික්ඛවෙ සික්ඛිතබ්බං-සි.

අපි ච—යම් සේ බලවත් පුරුෂයෙක් දැඩිකොට හඹරණ ලද වාල රජ්ජුයෙන් හෙවත් වාල රෝමයෙන් (දැඩිකොට හඹ රණ ලද ලණුවකින්) කකුල ජඞ්ඝා ව වෙලා ලියන කද ලා අදනා රුහාණක් පරිද්දෙන් ඇද ඝර්ෂණ කළේ වී නම් ඒ රුහණ කකුලෙහි ත්වචය කපන්නේ ය. ත්වචය කපා චම්මය කපන් නේ ය චම්ම කපා මස් සිඳිනේ ය. මස් සිඳ නහර සිඳිනේ ය. නහර සිඳ ඇට සිඳිනේ ය. ඇට සිඳ ඇටමිදුලෙහි පැහැර වැදී සිටිනේ ය. එ පරිද්දෙන් ම මේ ලාභසත්කාර ය ත් ලොභ වස යෙන් ආශ්‍රය කළහුගේ ලාභසත්කාර නැමැති වාල රජ්ජුව ගුණ නැමැති ත්වචය ගුණ නැමැති චම්මය ගුණ නැමැති මාංස ය ගුණ නැමැති ඇට සිඳ ගොස් ගුණ නැමැති ඇට මිදුලෙහි වැදී නසන්නේ ය. ඒ ඒ අනර්ථයේ සවභාව වසයෙන් නෝ විඳිනේ ය. මරොනෙහි නෝ විඳිනේ ය. එ සේ ගෙයින් මේ ලාභසත් කාර ය නම් මේ බදු දුක් දුයක දෙයකි. එ බැවින් ඒ දුරුසට යුතු මැ යි.

එයින් වදුලහ.

සෙය්‍යථාපි භික්ඛවෙ බලවා පුරිසෝ දළ්හාය වාල රජ්ජුයා ජඞ්ඝං වෙයෙඩ්ඩා ඝංසයිත්වා ත්වචං ඡින්දෙය්‍ය ත්වචං ඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය චම්මං ඡෙත්වා මංසං ඡින්දෙය්‍ය මංසං ඡෙත්වා නහාරුං ඡින්දෙය්‍ය, නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහචව තිට්ඨෙය්‍ය. එවමෙව ඛෝ භික්ඛවෙ ලාභසක්කාර සිලොකෝ ත්වචං ඡින්දති ත්වචං ඡෙත්වා චම්මං ඡින්දති චම්මං ඡෙත්වා මංසං ඡින්දති මංසං ඡෙත්වා නහාරුං ඡින්දති නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දති අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහචව තිට්ඨති. එවං දුරුණෝ ඛෝ භික්ඛ වෙ ලාභසක්කාර සිලොකෝ.—යනාදී

අපි ච—එක් සමයෙක්හි බුදුහු රජගහ නුවර වේලුවනා රාමයෙහි වැඩවසා වදාරණ සේක. එ සමයෙහි වනාහි පූජාවලි යෙහි කියන ලද ක්‍රමයෙන් දෙවිදත්තෙර අජාසත්රජහු පහදවා ගත. ඒ රජකුමර පන්සියයක් පමණ රථ පිරිවරා සවස උදය

දෙවිදත් තෙරුන් කරා උපස්ථානයට එළඹෙන්නේ ය. රස මිස වුලෙන් යුක්ත වූ පන්සියයක් පමණ බත්වඳුන් ද එළවන් නේ ය. එ කල බොහෝ භික්ෂූන් වහන්සේ බුදුන් කරා එළඹි වැද එකත්පසෙක හිඳ එ පවත් දැන්වූ සේක.

එසින් සිහ.

රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ තෙන ඛො පන සමයෙන දෙවදත්තස්ස අජාතසත්තු කුමාරො පඤ්චහි රථ සතෙහි සායං පාතං උපට්ඨානං ගච්ඡති. පඤ්ච ච ථාලිපාක සතානි භත්තාභිහාරො අභිහරීයති. අථ ඛො සම්බහුලා භික්ඛූ යෙන භගවා තෙනුපසංකම්සු. උපසංකම්ත්වා භගවන්තං අභිවා දෙත්වා එකමන්තං නිසීදිංසු එකමන්තං නිසින්නා ඛො තෙ භික්ඛූ භගවන්තං එතදවොචුං. දෙවදත්තස්ස භන්තෙ අජාත සත්තු කුමාරො පඤ්චහි රථ සතෙහි සායං පාතං උපට්ඨානං ගම්ස්සති. පඤ්ච ථාලිපාක සතානි භත්තාභිහාරො අභිහරී යති—සි

මෙ පවත් ඇසූ විශුද්ධ ගුණරත්න නිධිනිකෙත වූ සම්බුදු යන් වහන්සේ—

මා භික්ඛවෙ දෙවදත්තස්ස ලාභසක්කාර සිලොකං පිහ යිත්ථ යාවකිවඤ්ච භික්ඛවෙ දෙවදත්තස්ස අජාතසත්තු කුමාරො පඤ්චහි රථසතෙහි සායං පාතං උපට්ඨානං ගමිස්සති. පඤ්ච ච ථාලිපාක සතානි භත්තාභිහාරො අභිහරිස්සති. තාවතියෙව භික්ඛවෙ දෙවදත්තස්ස පාටිකඞ්ඛා කුසලෙසු ධම්මෙසු නො වුද්ධි. සෙය්‍යථාපි භික්ඛවෙ වණ්ඩස්ස කුක්කුරස්ස නාසාය පිත්තං භින්දෙය්‍යුං, එවං හි සො භික්ඛවෙ කුක්කුරො භියේ‍යා සොමත්තා ය වණ්ඩතරො අස්ස. එවමෙව ඛො භික්ඛවෙ යාවකිවඤ්ච දෙව දත්තස්ස අජාතසත්තු කුමාරො පඤ්චහි රථසතෙහි සායං පාතං උපට්ඨානං ගමිස්සති පඤ්ච ච ථාලිපාක සතානි භත්තාභිහාරො අභිහරියති. තාවතියෙව භික්ඛවෙ දෙවදත්තස්ස පාටිකඞ්ඛා කුස ලෙසු ධම්මෙසු නො වුද්ධි—

යනාදී – මහණෙනි! තෙපි දෙවදත්ත සථවිරයන්ගේ ලාභ සත්කාර ය නො පතව. මහණෙනි! දෙවදත්ත සථවිරයන්ට අජා සත් රජ කුමර පන්සියයක් රථ පිරිවරා සවස උදය උපස්ථාන යට එළඹී ම හා පන්සියයක් බත් වඳුන් දෙන්නේ යම් තාක් කල් ද ඒ තාක් කල් දෙවදත්ත සථවිරයන්ට අභිමාන වසයෙන් හානියෙක් ම පෙණෙන්නේ ය ඔහුට කුසල ධර්මයෙහි වෘද්ධියෙක්

නො පැණෙන්නේ ය. යම් සේ මහණෙනි! වණඩ වූ සුනඛයාගේ නාසයෙහි පිහාටු බැඳුනා ලදදේ ඒ සුනඛ තෙමේ අතිශයින් ම වණඩතර වන්නේ ය. සෙසු දවසට වඩා සඩයන්කරා ලුහුබඳනේ වන්නේ ය.

එ පරිද්දෙන් ම මහණෙනි! යම් තාක් දෙවදහන සථවිර යන්ට අජාසත් රජකුමර පන්සියයක් රථ පිරිවරා සවස උදය උපසථානයට එළැඹ පන්සියයක් බන් වසුන් එළවා ද ඒ තාක් ඔහුට අභිමාන ය වැඩි හානියක් අවැඩක් මිස වැඩෙක් නො පෙණෙන්නේ ය. මහණෙනි! ලාභ සත්කාර නම් මෙසේ දරුණු දෙයකැ යි වදළ සේක. මේ පමණක් මතු නො වෙ යි. යම් සේ කදලිගස එකානතයෙන් තමහට අවැඩ පිණිස ඵල ගණී ද කෙසෙල් ගස ඵලගත් මතු නො පවත්නේ ද යම් සේ උණගස බටගස ඵලගත් කල නො පවතී ද නසී ද ගැබ්ගත් අසසතරී යම් සේ නසී ද එ පරිද්දෙන් ම ලාභසත්කාර ය ත් යමෙකුට උපන නො ත් එයින් ම ඔහු නසී.

එයින් වදළහ.

ඵලං වෙ කදලිං හනති ඵලං වෙලුං ඵලං නලං,
සක්කාරෝ කාපුරිසං හනති, ගබ්භා අසසතරිං යථා-සි.

ලාභසත්කාරයෙහි නො දක්වන ලද ආදීනව සංයුක්ත සහියෙහි ලාභසත්කාර සංයුක්තකයෙන් බලා දත යුතු. මෙ සේ නො යෙක් ලෙසින් වණන ලද ලාභසත්කාරයෙහි ආදීනව දැක ලද දෙයකින් සතුටුවීම ඓහලෞකික පාරලෞකික සම්පත්තියට කාරණා වන බැවින් හෙ ද උතුම් මඟුලෙක් නම් වන්නේ ය.

"කතඤ්ඤුතා" යන තන්හි කතඤ්ඤුතා නම් කවර යත්? මද වූ හෝ බොහෝ වූ හෝ කළ උපකාර ය දන්නා බව කතඤ්ඤුතා නම් වේ. යමෙක් කෘතොපකාර දන්නේ වී නම් හේ උත්තම පුද්ගලයෙකි. එසේ හෙයින් යම් කිසි කෙණෙක් යටත් පිරිසෙසින් අධික පිපාසයක් ඇති විටෙක පැන් පමණක් දී උපකාර කළවුන් කෙරෙහි ද රෝගපීඩාවකින් පෙළෙන විටෙක රෝගයට නිසි ඖෂධයක් හෝ ආහාරාදියක් හෝ දී යම් කිසි උපකාරයක් කළ කෙණෙක් ඇත් නම් යම් කිසි ශාසත්‍රයකින් එකපදයක් හෝ අකුරක් හෝ කියා කුසලා කුසල විභාග වසයෙන් දහම්පදයක් හෝ කියා ඵරලොවින් සංග්‍රහ කළ කෙණෙක් ඇත්නම් මංමුළා වූ නැනෙක මග කියා හෝ

යුක්ති කියන තැනක අගතියෙන් දුරු ව ආධාර ව වචනයක් කියා හෝ කී නොකී යම් ලෙසකින් ඉහලෝ පරලෝ දෙකින් කළ උපකාරයක් ඇත් නම්—

ඒ උපකාර ය ගලකෙටූ රෙඛාවක් පරිද්දෙන් තමා සිත තබාගෙණ කෘතොපකාර නොදන භයානක වූ නරා වලින් ගොඩ නැගූ වානර රජ්ජුරුවන්ගේ ගුණ නොසලකා මරා මස් කන පිණිස හිස උඩ ගල හෙලා වෙහෙස දී ඒ පවින් එම ජාතියෙහි මනුෂ්‍ය ප්‍රේත ව මහ දුක් විඳ නැවත අවීචි මහ නිරයට ගිය පුරුෂයාට සෙසින් වන අවැඩ න් සිත තබාගෙණ මට කළ උපකාර යට වඩා නොයෙක් ලෙසින් උපකාර කෙරෙමි යි කියා මිසු සතරක් නිසා එක උක් පතක් දී සංග්‍රහ කළ පුරුෂයා කෙරෙහි පැහැද නැව බිඳී මුහුදු බත් වූ කල තමා සතු පුවරු කඩ දී ප්‍රත්‍යුපකාර කොට ශාසනාන්තර්ධාන ය දක්වා පණ්ඩිත ජනයන් විසින් ඛණ කියා අසා සතුටු වන සඳහිමාලඞ්කාරයෙහි තමාගේ ගුණ ලියවාගත් පුරුෂයා සෙසින් කෘතොපකාර දුන් මෙහි ගුණ සලකා ඒ කෙරෙත් නම් හෙ ද ලෞකික ලොකොත් තර සම්පත්නියට කාරණාවන බැවින් උතුම් මඟුල් නම් වන්නේ ය.

"කාලෙන ධම්මසවනං" යන්තෙහි ධර්ම්ශ්‍රවණ ය නම් කවරහ යත්? යම් කලෙක සිත උඩඟු වේ ද කාම චිතකාදීන් විසින් මඩනා ලදවේ ද එ කල්හි කල්‍යාණ මිත්‍රයන් සමීප යට එළඹ තදනුරූප වූ ඛණ ඇසීම ධර්ම්ශ්‍රවණ නම් වේ. ඒ ධර්ම් ශ්‍රවණයෙහි අනුසස් නම් පෙර නොඇසූ අර්ථයන් අසනු ලැබෙ සි පෙර ඇසූ අර්ථයන් නැවත නැවත ඇසීම් වසයෙන් පිරිසිදු වෙ සි. සියලු අර්ථයන් කෙරෙහි කාංසා දුරුවෙ සි. සැක නැති බැවින් සම්‍යක්දෘෂ්ටි ය සෘජු වෙ සි. දෘෂ්ටි ය සෘජු වූ බැවින් ඔහුගේ සිත පහදි සි යන මේ පස ධර්ම්ශ්‍රවණයෙහි අනුසස් නම් වන්නේ සි.

එසින් වදළහ—බුදුහු.

පඤ්චිමේ භික්ඛවෙ ධම්මසවණෙ ආනිසංසා. කතමේ පඤ්ච? අසුතං සුණාති. සුතං පරියොදපෙති-කඞ්ඛං විතරති-දිට්ඨිං උජුං කරොති, චිත්තමස්ස පසීදති-ඉමේ ඛො භික්ඛවෙ ධම්මසවණෙ පඤ්ච ආනිසංසා-සි.

බොහෝ කීමෙන් ප්‍රයෝජන කවරේ ද? ඒකාසඞ්ඛ්‍ය කප් සුවහසක් මුළුල්ලෙහි මහපෙරුම් පුරා ආ **ශාරීපුත්‍ර** සථවිරයන් වහන්සේ පවා **අස්සජි** මහ තෙරුන් වහන්සේ විසින්—

යෙ ධම්මා හෙතුප්පභවා—තෙසං හෙතුං තථාගතෝ ආහ,
තෙසඤ්ච යෝ නිරොධෝ—එවංවාදී මහා සමණෝ-ති.

වදුරණ ලද මේ ගාථාව අසා සොවාන් ඵලයෙහි පිහිටා උපරිමාර්‍යත්‍රය බුදුන් කෙරෙන් ඇසූ ධර්මයෙන් සිද්ධකොට ගත් සේක. අසීතිසහස්සාණඤ්ච ප්‍රමුඛ වූ අටලොස් කෙළක් බ්‍රහ්ම යෝ ද බරණැස ඉසිපතනාරාමයෙ දී "ද්වෙමෙ භික්ඛවෙ" යනා දින් දෙසූ දම්සක් පැවතුම් සූත්‍රදෙශනා ව අසා ම නිවන් සම්පත් ලදහ. බිම්බිසාරාදී රජදරුවෝ ද අනාථපිණ්ඩිකාදි සිටු වරු ද විශාඛා ආදී උපාසිකාවරු ද සොනදණ්ඩාදී බ්‍රාහ්මණ යෝ ද සෙසු නොකී අපමණ මනුෂ්‍යයෝ ද ආලවක ආදී යක්ෂ යෝ ද ශක්‍ර ආදී දෙවියෝ ද මහාබ්‍රහ්මාදී බ්‍රහ්මයෝ ද එකෙක දෙකෙක යනාදින් හැර සුවිසි මණ්ඩලයෙක්හි දී නිවන් සම්පත් ලද සත්වයෝ ද ධර්මශ්‍රවණ ය කොට ම නිවන් සම්පත් ලදහ. අතීතයෙහි ලොව පහළ වූ අප්‍රමාණ සර්ව්‍වඥවරයන් කෙරෙහි නිවන් සම්පත් ලද අපමණ සත්වයෝ ද ධර්මශ්‍රවණ ය කොට ම නිවන් සම්පත් ලද හ.

අනාගතයෙහි පහළ වන අප්‍රමාණ සර්ව්‍වඥවරයන් කෙරෙහි නිවන් සම්පත් ලබන අපමණ සත්වයෝ ද බණ අසා ම නිවන් සම්පත් ලබන්නා හ. අතීතාදී කාලත්‍රයෙහි ම නරකාදී සතර අපායෙන් මිදී සුවගීමොක්ෂ සම්පත් ලබන සියලු සත්වයෝ ද බණ අසා ම නිවන් ලබන්නාහ. එසේ හෙයින් බුද්ධාදී පණ්ඩිතයන් කරා පැමිණ බණ ඇසි ම උතුම් ඵල් නම් වන්නේ ය.

මේ සේ **ගාරවොව** යනාදී ගාථාවෙන් බුද්ධාදී රත්නත්‍ර යෙහි ද මව්පියන් ආදී වෘද්ධයන් කෙරෙහි ද වන්දන මානනාදී වසයෙන් කරන්නා වූ ගෞරව ය එක මහුලෙක. මාන ඖද්ධත්‍ය වසයෙන් ආත්මොද්කර්ෂයක් නැති ව ගුරුන්වහන්සේ කෙරෙහි ද මව්පියන් ආදී වෘද්ධයන් කෙරෙහි ද යටත් වූ පැවතුම් ඇති බව එක් මහුලෙක. ත්‍රිවිධ සන්තොසයෙන් සන්තුෂ්ට බව එක් මහුලෙක. මද වූ ද බොහෝ වූ ද කෘතොපකාර දන්නා බව එක් මහුලෙක. යම් කලෙක සිත උඩහු වේ ද කාම චිතකාදීන් විසින් මඩනා ලද වේ ද එ කල්හි කල්‍යාණ මිත්‍රයන් සම්පයට එළඹ තදනුරූප වූ බණ ඇසීම එක් මහුලෙකැ සි කියා මහුල් පසක් වදුරා මේ තෙහි දු ඵල් වදුරන්නා වූ බුදුරජාණන් වහන්සේ—

ඛන්තී ච සොවචස්සතා සමණානඤ්ච දස්සනං,
කාලෙන ධම්මසාකච්ඡා එතං මඞ්ගලමුත්තමං—ති.

යන ගය වදාළ සේක. "ඛන්තියෝ" යන්නෙහි ක්ෂාන්ති ය නම් කවරහ යන්? ක්‍රියලු සත්ත්වයන් විසින් කරන්නා වූ අප රාධ ය ඉවසීම ක්ෂාන්ති ය නම් වන්නේ ය. හෙ ද දශපාරමී ධර්මයන් කෙරෙහි එක් පාරමිතාවක් හෙයිනුත් පෙර කලාබු නම් කසී රජෙකු විසින් කටු සැම්බියෙන් පහර දී සැතින් අත් පා කන් නාසා කපා පයින් ළය තලා කවින් ලෙහෙ නික්මවා ගිය කල්හි සේනාපති අවුත් ස්වාමිනි! රජ කළ දැ නොයෙදෙ සි වරද කළ රජහට මුත් ලොව නො කිපෙන්නේ ය සි කී හෙයින්—

යෝ මෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණ නාසඤ්ච ඡේදයි,
චිරං ජීවතු සෝ රාජා නහි කුප්පන්ති මාදිසා-සි.

යන ගාථාවෙන් එම්බා සෙනාපතිය! යම් කසී රජෙක් මාගේ හස්ත පාද කර්ණ නාසයන් ඡේදනය කෙළේ ද ඒ රජ තෙම ඔහුගේ අග්‍රමහෙසිකාවෙන් ඇතුළු වූ අන්තඃපුර වාසීන් හා රාජකුමාරයන් හා බන්ධු මිත්‍රයන් හා සියලු රාජ්‍යවාසීන් හා සමග චිරාත්කාලයක් මුළුල්ලෙහි ආයුරාරොග්‍යාදී සකලාභිවෘද්ධි වර්ධන ය කෙරෙමින් සැප සේ වාස ය කෙරේවයි මා වැනි වූ බෝමැඩ හිඳ බුදුවනු කැමති පණ්ඩිත වරු මෙ බන්දක් නිසා සිත කුණු කොට ගෙණ ක්ෂාන්ති පාරමිතා ව කිලුටු නො කෙරෙනි සි. රජහට ඇ වඩා ඒ පිනින් බෝමැඩ වැඩහිඳ බුදු වූ හෙයිනුත් මහුල් වන්නේ ය.

තව ද-- මේ ලෝකයෙහි දන්දෙන සත්ත්වයෝ සිල්වතුන් සොයා-දන් දෙත් ද, දයකයන්ට සිල්වත්හු පුණ්‍යක්ෂෙත්‍ර වෙත් ද, එ පරිද්දෙන් ක්ෂාන්ති පාරමිතා පුරමි සි පුරණ මහෝත්තම යෙක් ඇත් නම් ඔවුන් විසින් මෙ සේ සැලකිය යුතු සි. කෙසේ ද යත්--

ක්ෂාන්ති ය නම් දණ්ඩ නිග්‍රහයක් නො කරණ ලද දශා ක්‍රොශ වස්තුවෙන් නො බණන යහපත් සත්පුරුෂයන් කෙරෙහි ම කරණ ලද ක්ෂාන්තියක් නො වෙ සි. නො යෙක් ලෙසින් අපරාධ කරන්නා වූ සත්ත්වයන් කෙරෙහි ම පැවැත්විය යුත් තේ ය. යම් සේ කිසි රෝග පීඩාවක් නැත්තා වූ සත්ත්වයන්ට වෙදකමින් ප්‍රයෝජන නැද්ද, යම් වෛද්‍යවාය්‍යයෙක් වාත පිත් තාදී රෝගයෙන් ම පීඩිත සත්ත්වයන්හට වෙද කම් කොට සුවපත් කෙළේ වී නම් ඒ වෛද්‍යවාය්‍ය තෙම උතුම් වේ ද ප්‍රවර ද එ මෙන් යම් පණ්ඩිතයෙක් නොයෙක් ලෙසින් අපරාධ කරණ සත්ත්වයන්

කෙරෙහි ම ඤාණනි කෙළේ මී නම් හේ උතුම් වෙ සි. ප්‍රවර වෙ සි. මේසේ ද සිතා ඤාණනි ය කොටගත නො හැකි වේ නම් සච්ඡයන් වහන්සේගේ පූර්වචරිත ගුණ ය සැලකිය යුතු. ඒ මේසේ දත යුතු.

එම්බා පින්වත් වූ ප්‍රවෘජිත ය! තාගේ ශාස්තෘ තෙමේ සම්‍යක් සම්බෝධියට පැමිණෙනි ම සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා පූර නුයේ ඒ ඒ ආත්ම භාවවල්හි පථ්‍යාර්ථීන් සොරෙහි හෙවත් වෛරීන් කෙරෙහි පවා සිත කෝපයක් නො කළ සේක් නොවේ ද ඒ එසේ ම ය. අප මහ බෝසතාණෝ **සිලව** ජාතකයෙහි තමන්ගේ දේවීන් කෙරෙහි අපරාධ කළ හෙයින් නොමරා රටින් නෙරපූ පමිටු අමාත්‍ය යා විසින් නොයෙක් උපාය කොට ගෙණෙන ලද සතුරු රජහු තුන් සියයක් යොදුන් රාජ්‍යය ගන්නාහු හා යුද්ධ කොට වලකනු පිණිස වහසි තියා නැගිසිටි අමාත්‍යයන්ට ආයුධ අල්වන්ට ද නුදුන් සේක. නැවත අමාත්‍යයන් දහස හා සමග අමූසොහොනෙහි කර පමණ කොට බිම් කැණ වල සිටුවා පස්ගසන ලදුයේ දෙමහයෙන් සිත පමණ කු දු නොකලඹා කුණපානුභව ය පිණිස ආ ශෘගාලයන්ගේ පස් විසූහන ස දෙඅත්කොට පිරා දැම්ම නිසා වලින් නික්මෙන පිණිස බාහුබලයෙන් පුරුෂ ක්‍රියා කොට ප්‍රතිලබ්ධ ජීවිත ඇත්තේ යුකති ඛිනිශවයෙන් ආරාධිත සිත් ඇති යක්ෂයන්ගේ ආනුභාවයෙන් තමන්ගේ ශ්‍රී යහන් ගර්භයෙහි බැස සිට සිරිසයන හොත් සතුරු රජහු දැක කෝපයක් නොකොට ම ඔවුනොවුන් ද්‍රොහ නොවන පිණිස ශපත කොට ඒ සතුරු රජහු මිත්‍රස්ථානයෙහි පිහිටුවා ගෙණ

ආසිංසථෙව පුරිසො න නිබ්බින්දෙය්‍ය පණ්ඩිතො,
පස්සාම වෝ'හං අත්තානං යථා ඉච්ඡිං තථා අහුං–සි.

යනුවෙන් මේ ලෝකයෙහි පුරුෂතෙමේ අනිමිතාඥියෙහි න්‍යාය විසින් ආසාකරන්නේ ම ය. ඊට ඤාණනි ඇත්තා වූ පණ්ඩිත තෙමේ මේසේ දුකට පැමිණියට කොහි සුවබවෙක් ඇද්ද සි නො වලක්නේ ය. යම් ප්‍රකාරයකින් කිසිවක් හට පිඩා නොකොට රජ යෙහි පිහිටි මා කැමති වම් ද එසේ වූ මා දකිම් ද එසේ ම තොප ත් දකිවි සි කී සේක. මේ ද ආශ්වාස්‍ය නොවෙ සි. **චූලධම්මපාල** ජාතක යෙහි වනාහි උත්තාන සෙය්‍ය ස සි කියන ලද උඩ බලා හෝනා ලද බාල දරක වූයේ ද

වඤ්ඣ රසානුලිත්තා – බාහාජිජ්ජනනී ධම්මපාලස්ස,
දයාදස්ස පථව්‍යා - පාණා මෙ දෙව නිරුජ්ඣන්ති–.සි

යනුවෙන් මූළු පොළොවට හිමි වූ ධම්පාලයාගේ සඳුන් ඔලවුන් ගැල් වූ අත්හු සිඳුනා ලැබෙනි. දේවයෙනි! මාගේ ප්‍රාණයෝ නිරුද්ධ

වෙනි යි කියා ඉසේ මව් බිසවුන් හඬවමින් යිටියදි **මහාප්‍රතාප** නම් වූ පියරජහු ඔයින් හුණුහිලිල් සේ අත් පා කපවා එයින්නු දු නො සතුටු ව මොහුගේ හිස කපව යි නියෝග කළ කල්හි එම්බා බුදු කුරුදම්පුරණ ධර්මපාලයෙනි! නොපගේ ඔහට නිග්‍රහ කරන්ට සුදුසු කල් වන්නේය. එ හෙයින් දැන් හිසකපන පිණිස ඇණ වූ නොපගේ පියරජහු කෙරෙහි ද හිසකපන පුරුෂ යා කෙරෙහි ද හඬන මව්බිසව කෙරෙහි ද නොප කෙරෙහි ද යන මේ සතර සථාන යෙහි ම සමසිත් වව යි කියා දැස වූ සමාදානයෙහි පිහිටා කිවි ආකා රයකු දු නොකල සේක.

මේ ද මිනිසත් බව සිට කළ හෙයින් ආශ්චර්‍ය නොවේ යි. නිරස්වීන වූයේ ද නිමිවත **ඡද්දන්ත** නම් හස්තිරාජව ඉපද බිස පෙව් නියෙන් නාහියෙහි විදිනා ලද **සොතුත්තර** නම් වැදි කෙරෙහි පවා සිත නොකළඹා කුමට මට වඩ කෙළෙහි ද මේ ප්‍රයෝග ය කවර කෙණෙකුන්ගේ ප්‍රයෝගයෙක්ද යි මෙසේ කියා ද ඒ වැදිහු කසි රජහුගේ මෙහෙයි ය විසින් නොපගේ දළගෙණ යන පිණිස එවන ලදිමි වහන්සැ යි කී කල්හි එසේ වී නම් යහපතැ යි කියා ඒ වැදි හුගේ මනදෙළ පුරමින් ශ්‍රීවර්ණ රැස් විහිගීමනයෙන් බබළන්නා වූ මනොඥ සොනා ඇනි තමින් වහන්සේගේ දළසඟල සිඳ දුන්සේක. මෙම දක්වන්නට වදුලහ. බුද්ධඝොස මහ තෙරහු **විශුද්ධිමාගීය** මෛත්‍රීභාවනා කථාවෙහි

තස්ස මනොරථං පූරෙන්තො ඡබ්බණ්ණ රසමි නිවිජ්‍රණ ස මුජ්ජලිත වාරු සොතෙ අත්තනො දන්තෙ ඡෙවා අදාසි-යි.

තව ද – මහාකපිජාතකයෙහි තමා විසින් ම පවිත්‍රාත්ත යෙන් නගන ලද පුරුෂයා විසින්

හකෙඛා අයං මනුස්සානං යථෙවඤ්ඤ වනෙ මිගා,
ඉත්තුනිමං වඩිත්වාන ඡාතො ඛාදෙය්‍ය වානරං.
සිතොව'හං ගමිස්සාමි මංස මාදාය සම්බ්‍රූ,
කන්තාරං නිත්තරිස්සාමි පාථෙය්‍යමෙම භවිස්සති-යි.

යනු හෙයින් මේ වානර තෙමේ මිනිස්නට භය අත් හවයට නිසි ආහාරයක් වන්නේ ය. මොහු ද ආරණ්‍යයෙහි සෙසු මිග යන් මෙනි. එ හෙයින් මොහු මරා පියා ඡාත සංඛ්‍යාත භය ඇත් තෙම් වඳුරා කෑම් තම් යෙහොක. මස් කා අසිනවූයෙම් මාංස ය සම්බල ය යි කියන ලද මාගීයට ආහාර කොටගෙණ කාන්තාරයෙන් එතර වෙම් යි පාථෙය්‍ය ය යි කියන ලද මට සියලු මගට උපකරණ වන්

නේ ය සි මෙසේ සිතා ගලක් නගා මස්තකයට හැන පලාලී කල සුරතලට හිස ඇල් වූ ප්‍රිය පුතෙකු බලන පියාණ කෙණෙකුත් සේ කදුලු පිරුණු ඇස් ඇති ව ඒ පුරුෂයා බලන සේක්—

මායෙය්‍ය මේ හදනෙත එවං-භවං නාම මේදිසං කරි,
භවං බො නාම දිඝායු-අඤ්ඤං වාරෙතු මරහසි-සි.

යහුවෙන් වහන්ස! අමුතු බැවින් මට සවාමී වූ තොපි මේ බන්දක් කරන්නා වූ ද දිඝායුෂ්ක ය නෙපි නම් මෙසේ කරණ අනි කඤ්ඤු වලකනුවට සුදුස්සහු මෙසේ කෙළෙහිදැ සි කියා ඒ පුරුෂයා කෙරෙහි සිත් නොකළඹ, නමන්ගේ දුක ද නොසලකා ඒ පුරුෂයාට මිගකියා සෙමෙන්ත භූමියට පැමිණ වූ සේක. එම දක්වනු වෝ කිහ. විශුද්ධිමාගීයෙහි-

"තසෂ්ඨි පුරිසෙ චිත්තං අපදූසෙත්වා අත්තනොව දුක්ඛං අවින්දෙත්වා තමේව පුරිසං ඛෙමන්ත භූමිං සම්පාපෙසි"

තව ද - මහ පොළොව මහ මුහුද දවන විස තේජස් ඇති **හූරිදත්ත** නම් නා රජ ව උපොසථාඞ්ග අධිෂ්ඨාන කොට මිනිස් ලොව තුඹසක් මත්තෙහි සයන ය කරන්නේ කල්පාන්ත වහ්නියක් වැනි ඖෂධයෙන් සකල ශරීරයෙහි ඉස්නා කල්හි දු පෙළා'ය සි කියන ලද පෙට්ටියෙහි බහා සකල ජම්බුද්වීපයෙහි කෙළවන කල්හි දු ඒ බමුණා කෙරෙහි සිත කළඹනපමණකුදු නොකළ සේක, නොහොත් කුඩා පෙට්ටියෙහි පසින් ඇණ බහාලන කල්හි දු දුම්ල කරණු පිණිස අත්න් මඩනා කල්හි දු ඒ අහිගුණ්ඩිකයාහට මාගේ සීල කඩ වේ දෝ හෝ සි යන හසින් නොකිපුණු සේක. මේ ම දක්වන්නට වදළ හ. බුදුහු

පෙළාය පක්ඛිපනෙපි පමද්දනෙපි පාණිනා,
ආලම්බනෙ න කුප්පාමි සීල ඛණ්ඩ භයා මම—සි.

විශුද්ධිමාගීයෙහි ද කියේ මැ නෝ.

"හූරිදත්තො නාම නාගරාජා හුත්වා උපොසථඞ්ගානි අධිට්ඨාය වම්මික මූර්ධනි සයමානො කපල්ලට්ඨානගහි සදිසෙන ඔසධෙන සකල සරීරෙ සිඤ්චමානෙපි පෙළාය පක්ඛිපිත්වා සකල ජම්බුදීපෙ කීළාපිය මානෙපි තසමිං බ්‍රාහ්මණෙ මනො පදූසමත්තමපි නාකාසි." එ සේ ම **චමෙපය්‍ය** නම් නා රජව ද ඉපිද අහිගුණ්ඩිකයෙකු විසින් වෙහෙසනු ලබන්නේ ද මනෘ ප්‍රදෙෂ මාත්‍රයකු දු නොඉපද වූ සේක. හෙවත් චමෙපය්‍ය නම් නා රජ ව උපන් කල්හි දු ධර්මයෙහි හැසිරෙන්නා වූ පෙහෙවස් විසූ බෝසත්හු අහිගුණ්ඩිකයෙක් ගෙණ රජගෙයි දොර කෙළවන්නේ ය. ඒ අහිගුණ්ඩිකතෙම නිල්වත් වූ ද රත්වත් වූ ද

රත්තවණ්ණී වූ ද මදටවණ්ණී වූ ද ඔදාත වූ ද මිශ්‍රක වර්ණ වූ ද යම් යම් වර්ණයක් කැමති වේ ද සිතා ද ඔහුගේ සිත අනුව පවත්නා සේක් මොහුට ලාභසත්කාර වැඩිව සි යන සිතින් ඔහු සිතූ සිතට බඳු පැහැ ඇතිවන සේක.

ඒ බෝසතුන්ගේ ආනුභාව ය වනාහි ඵල සංඛ්‍යාත පොළොව මුහුදු සේ දියකරන්නට ද මුහුදු වැනි ජල ය පොළොව සේ කරන්නට ද හැකිවන සේක. ඉදින් ඒ ආලම්බකයාහට කිපුනු සේක් වීම් නම් ක්ෂණයකින් දවා භස්ම කරන්නට ද හැකිවන සේක. චිත්ත වසභ වූයෙම් වීම් නම් සීලයෙහු දු පිරිහෙම් සි සීලයෙන් පිරිහුනා හට සම්‍යක් සම්බෝධි නැමැති උත්තමාර්ථ ය සිද්ධනොවී පිරිහෙන්නේ ය සි සිතා කිසි දෝෂයක් නොකළ සේක.

වඳුලේ මැනෝ.

තදුපිමං ධම්මවාරිං උපවුත්ථං උපොසථං,
අභිගුණ්ඩිකෝ ගහෙත්වාන රාජඛාරමහි කීළති.

යං සෝ වණ්ණං චින්තයති නීලං පීතං ච ලොහිතං,
තස්ස චිත්තානුවත්තෙතානෙතා හොති චිත්තිත සන්නිභෝ.

ඵලං කරෙය්‍ය උදකං උදකම්පි ඵලං කරෙ,
යදි හන්තස්ස පකුපෙපය්‍යං ඛණෙන ඡාරිකං කරෙ.

යදි චිත්ත වසී හෙස්සං පරිහාසිස්සාමි සීලතෝ,
සීලෙන පරිහීනස්ස උත්තමත්ථෝ න සිජ්ඣති-සි.

විශුද්ධිමාර්ගයෙහි ද කියේ මැනෝ.

එමෙපය්‍යොපි නාගරාජා හුත්වා අභිගුණ්ඩිකෙන විහෙඨිය මානෝ මතොපදොස මත්තනම්පි න උප්පාදෙසි.

තව ද-සංඛපාල නම් නා රජව ද නිඃක්ෂණ වූ තෙබින් හැණ අට තැණකින් විද විදි මුඛයෙන් කටුසහිත වේ වැල් හැද නාසයෙහි දැඩි වූ රජ්ජුවක් (ලණුවක්) බහා ලා සොළොස් වැදි පුත්‍රයන් විසින් අට තඩකින් ගෙණයනු ලබන්නේ පොළෝ තෙළෙහි ගැසෙන සිරුරු ඇති ව ත් මහත් දුක් අනුභව කරන්නේ කිපි බැලූ පමණකින් ම සියලු වැදිපුත්‍රයන් දවා හළු කරන්ට සමර්ථ වූ සේකු ත් ඇසෑරැ කිපුනු ආකාරයකු දු නොකළ සේක. කියේ මැ නෝ **විශුද්ධිමාර්ගයෙහි.**

සංඛපාල නාගරාජා හුත්වා තික්ඛිණාහි සත්තිහි අට්ඨසු ඨානෙසු ඔවිජ්ඣිත්වා පහාරමුඛෙහි සකණ්ටකා ලතායො පවෙසෙත්වා නාසාය දළහං රජ්ජුං පක්ඛිපිත්වා සොළසහි හොජ පුත්තෙහි කාජෙනාදාය

වුඤ්ඣමානෝ ධරණීතලෙ නිඤ්ඤිය මාන සරීරෝ මහන්තං දුක්ඛං පච්චනුභොන්තෝ කුරුඤ්ඤා ඔලොකිත මත්තෙනෙව සබ්බ හොජපුත්තෙ හසමං කාතුං සමත්තොපි සමානෝ වක්ඛුං උම්මි ලෙඛා පදුට්ඨාකාර මත්තමපි න අකාසි.

හුදෙක් මේ මතු නොවෙ යි. සෙසු ත් බොහෝ කලක් **මාතු පොසක** ජාතකාදියෙහි මෛත්‍රී වසයෙන් නොයෙක් ආශ්චර්‍ය්‍ය ය කළ සේක. දැන් මේ කාලයෙහි සම්බුදු බවට පැමිණ දෙව්යන් සහිත වූ ලෝකයෙහි කිසි කෙණෙකුන් හා අසදෘශ වූ ශාන්ත ගුණ ඇති ඒ භාග්‍යවත් වූ ශාස්තෘන් වහන්සේ අපදේස කරන්නා වූ මම් ඒ බුදුන්ගේ ශ්‍රාවකයෙමි කියන්නා වූ මහණ තට ප්‍රතිඝ චිත්ත දොෂ කොධ ය තම් උපදවන්නට අතිශයින් ම අයුක්ත ය නුසුදුසු ය යි යනු සලකන්නට වදුළහ. **බුද්ධඝොස මහතෙරහු.**

න කෙවලඤ්ච එතානෙව අඤ්ඤානිපි දීඝරත්තං මාතුපොසක ජාතකාදිසු අනෙකානි අච්ඡරියානි අකාසි. තස්ස තෙදානි සබ්බඤ්ඤුතං පත්තං සදෙවකෙ ලොකෙ කෙනචි අපපටිසම ඛනති ගුණං තං භගවන්තං සත්ථාරං අපදිසතො පටිඝචිත්තං නාම උපපා දෙතුං අනිච්ච අයුත්තමිපපනිරූපං-යි.

ඉදින් වනාහි මෙසේ ශාස්තෘහුගේ පූජා වරිත ගුණ ය ප්‍රත්‍ය වෙක්ෂා කරන්නා වූ ද බොහෝ කලක් ක්ලේශයන්ගේ දාසභාවයට යියා වූ ඒ යොගිහට ඒ ප්‍රතිඝ චිත්ත ය නොම සං සිදේ නම් ඉක් බිත්තෙන් මේ යොගීහු විසින් අනමතග්ග පද ය ප්‍රතිසංයුක්ත වූ සූත්‍රයෝ ප්‍රත්‍යවෙක්ෂා කටයුත්තාහු යි. ඒ අනමතග්ගයෙහි ආ ක්‍රම කෙසේ ද යත්?

යම් සත්වයෙක් පූජ්‍යයෙහි මවු නොවූ විරි ද එ බඳු සත්ව යෙක් සුලභ රූපි නොවෙයි. ඇත්තේ ම නොවෙයි. යම් සත්ව යෙක් පිය නොවි ද යමෙක් බෑ නොවි ද බුහුන් නොවී ද යමෙක් පුත් නොවි ද යමෙක් දූ නොවී ද එ බඳු සත්වයෙක් සම්සා ලොකයෙහි ම ඇත්තේ නොවෙ යි. මෙහි විසාර ය සං යුත්සහියෙන්, අංගුත්තරසහියෙන්, ප්‍රදීපිකායෙන්, මතසුකර කථාදියෙන්, දත යුතු. ඒ කාරණයෙන් ඒ පුහුළන් කෙරෙහි මෙසේ සිත් ඉපදවිය යුතු. දැන් වෛරවූයේ වී නමුත් මේ පුහුල් තෙමේ අතීතයෙහි මට මාතාව ම දස මසක් කුසින් පරිහරණ ය කොට මූත්‍ර ය මල ය කෙල ය සොටු ය යනාදී අසුචි හරිවඳන සංඛ්‍යාත වූ රත්සදුන් කල්ක මෙන් පිළිකුල් නොකොට පහ කෙරෙමින් ලෙහි නටවන්නී ඇකයෙන් වඩන්නී පොෂ්‍ය ය කළා ය.

ඇතැම් කලෙක මට පිතෘ ව එළුවන් විසින් යා හැකි වූ අජපථ ය දෙටිලි මත්තෙහි අවුලුවා ඉහි එල්ඛ නැංග යුතු මග ය සි කියන ලද සංකු පථ ය ප්‍රපාත මාගී ය යනාදියෙහි වෙණ දම් කරන්නේ මා පිණිස ජීවිත ය ද පරිත්‍යාග කොට උහතෝ වුළහ සංග්‍රාම ය සි කියන ලද දෙයතින් නැංග සංග්‍රාමයෙහි වැද නැවින් ඉහමුහුද එතරව සෙසු දුෂ්කර ශතයකු ද කොට සූතු රක්ෂා කෙරෙම් සි ඒ ඒ උපායෙන් ධන රැස්කොට මා පෝෂ න ය කෙලේ ය. බෑ බුන් පුත් හා දූව ඉපද මේ මේ උපකාර කෙලේ ය. ඔහු කෙරෙහි මනොප දෙෂ ය කරන්නට සිත කල ඔන්නට මට නුසුදුසු ය සි මේසේ සිත් උපදවා ද ඤානනි ය කටයුතු මැ සි. මෙම දක්වන්නට පාලි හා මිශ්‍රකොට කියේ මැ නෝ- **විශුද්ධිමාගීයෙහි.**

සචෙ පනස්ස එවං සද්ධූ පුබ්බචරිය ගුණං පච්චවෙක්ඛතෝ දීඝරත්තං නිලෙසානං දූසව්‍යං උපගතස්ස නෙව නං පටිඝං වූප සමමනි. අථානෙන අනමනඤ්ඤානි පච්චවෙක්ඛි තබ්බානි තත්‍ර හි වුත්තං, න සෝ භික්ඛවෙ සත්තෝ සුලභරූපෝ යෝ න මාතා භූත පුබ්බෝ. යෝ න පිතා භූතපුබ්බෝ. යෝ න භාතා, යෝ න භගිනි, යෝ න පුත්තෝ, යෝ න ධීතා භූතපුබ්බෝනි. තසමා තසමිං පුග්ග ලෙ එවං චිත්තං. උපපාදෙතබ්බං. අයං කිර මෙ අතීතෙ මාතා හුත්වා දසමාසෙ කුච්ඡියා පරිහරිත්වා මූත්‍ර කරීස බෙළ සිංඝාණිකා දීනි හරිත්වඤ්ච ය අජීගුච්ඡමානා අපනෙත්වා උරෙ නච්චා පෙත්වී අංකෙන පරිහරියමානා පොසෙසි. පිතා හුත්වා අජපථ සංකු පථා දීනි ගන්ත්වා වණිජ්ජං පයොජයමානෝ මයා අත්ථාය ජීවිතම්පි පරිච්චජිත්වා උභතෝ වූළෙන සංගාමෙ පවිසිත්වා නාවාය මහාසමුද්දං පක්ඛන්දිත්වා අඤ්ඤානි ච දුක්කර සතානි කත්වා පුත්තකං පොසෙසෝ මීනි තෙහි තෙහි උපායෙහි ධනං සංහරිත්වා මං පොසෙසි. භාතා භගිනි පුත්තෝ ධීතාව හුත්වාපි ඉදංවිදං ව උපකාරං අකාසීනි. තත්‍ර මෙ නපපතිරූපං මනං පදූසෙතුං-සි.

ඉදින් වනාහි මෙසේ ද සිතා සිතෙහි උපන් දොෂ ය ක්‍රොධ ප්‍රතිඝ චිත්ත ය නො නිවේ නම් නොපිළිවත් ම මේ නම් ඉක්බිත් තෙන් මොහු විසින් මෙත්තානිසංස ය ප්‍රත්‍යවෙක්ෂා කටයුතු සි. කෙසේ ද යත්? භවත් ප්‍රවූජිත ය! තාගේ භගවත්හු මෙසේ වදුළ සේක් නො වේ ද, මහණෙනි! මෛත්‍රියෙන් යුක්ත වූ චෙතො විමුක්ති ය සි කියන ලද චිත්ත සමාදානයෙහි මෛත්‍රී ධ්‍යානයෙහි ආදර යෙන් සෙවීම් වසයෙන් ආසෙවිත වූ වැඩීම් වසයෙන් භාවිත වූ නැවත නැවත කිරීම් වසයෙන් බහුලී කෘත වූ සාදූ යානක් මෙන් කිරීම් වසයෙන් යාන කෘත වූ පිහිට කිරීම් වසයෙන් වස්තුකෘත වූ

අනුව සිටීම් වසයෙන් අනුටඨින වූ පුරුදු කිරීම් වසයෙන් පරිචිත වූ මනාකොට සපයන ලද බැවින් සුසමාරඬ වූ මෛත්‍රීධ්‍යානයෙහි එකොළොස් අනුසස් කෙණෙහි පැසැස්ස යුත්තාහු සි. කවර එකොළොසෙක් ද යත්?

සමාපත්තියට සම්වන් කෙණෙකු මෙන් සැපසේ නිදි සි. සැපසේ නිර්විකාර ව පුබුදි. නිදන ත් සිංහ ව්‍යාඝ්‍රාදීන් විසින් ලුහු බැඳ ඒම් ආදී වූ පාප සවප්න නොදකී. උර පැලඳි මුත්හරක් මෙන් මිනිස්නට ප්‍රිය වෙ සි **මහසුජ** මහතෙරුන් **විසාඛ** තෙරුන් සෙසින් අමනුෂ්‍යයන්ට ප්‍රිය වෙ සි. මව්පියන් පරිද්දෙන් දෙවියෝ ආරක්ෂා කෙරෙ ත්. මෛත්‍රී විහාරී වූ මේ මහණුනට ගිනිවත් විසවත් ආයුධ වත් නොවදී. වහා ම සිත සමාහිත වෙයි දෙවසයෙන් නොකැලඹුනු බැවින් මුහුණෙහි පැහැ ය ප්‍රසන්න වෙ සි මෙකී ගුණයෙන් යුක්ත බැවින් නොමුළා ව කාලක්‍රියා කෙරෙ සි. සම්පඃත්තීන් මතුයෙහි අර්හ ය ප්‍රතිවෙධ නොකරන්නේ (රහත් නොවූයේ) වී නම් බ්‍රහ්ම ලෝකයට පැමිණෙන්නේ ය. මෛත්‍රීධ්‍යානයෙහි මේ එකොළොස් අනුසස්හු ය සි වදාළ සේක. ඉදින් හෝ දෙවස ප්‍රතිඝ චිත්ත ය නිවා ගත නුහුනුයෙහි වී නම් භගවත්හු විසින් සංවර්ණිත වූ මේ අනුසසින් පිරිහෙන්නෙහි ය. එ බැවින් ඤානත්‍රී මෛත්‍රී ය වැඩි ය යුතු ය සි යනු දක්වන්නට පාලි හා සම්බන්ධ කොට වදාළහ. **බුදුස ඝොස මහතෙරහු-**

සවෙ පන එවම්පි චිත්තං නිබ්බාපෙතුං න සක්කොතියෙව අථා නෙනඵවං මෙත්තානිසංසා පච්චවෙක්ඛිතබ්බා භමෙහා පබ්බජිත!න නු වුත්තං භගවතා මෙත්තාය භික්ඛවෙ චෙතො විමුත්තියාආසෙවිතාය භාවිතාය බහුලි කතාය යානිකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරඬාය ඉමෙ එකාදසානිසංසා පාටිකංඛා, කතමෙ එකාදස? සුඛං සුපති සුඛං පටිබුජ්ඣති න පාපකං සුපිනං පස්සති මනුස්සානං පියෝ භොති අමනුස්සානං පියෝ හොති දෙවතා රක්ඛන්ති නාස්ස අග්ගි වා විසං වා සත්ථං වා කමති තුවටං චිත්තං සමාධියති මුඛවණ්ණා විපසීදති අසම්මූළ්හෝ කාලං කරොති උත්තරිං අප්පටිවිජ්ඣන්තෝ බ්‍රහ්මලොකූපගෝ හොති සවෙ ඒවං ඉදං චිත්තං න නිබ්බාපෙස්සසි ඉමෙහි ආනිසංසෙහි පරිබාහිරෝ භවිස්සසි සි.

තව ද—මෛත්‍රියෙහි අනුසස් දක්වනු පිණිස **විසාඛ** තෙරුන් වහන්සේගේ කථා ව මෙහි සංග්‍රහ කරණු ලැබේ. කෙසේ ද යත් ?

ඒ තෙරහු වනාහි පැළලුප් නුවර කෙළෙඹියෙක් වී එහි ම වසනුයේ මේ සේ ඇසු· තාම්බ්‍ර පර්ණි දීප ය වනාහි වෛභ්‍ය

මාලාවෙන් අලඞ්කෘත වූයේ ය. කාසාය වස්ත්‍රයෙන් උජ්වලිත ය. ඉහි කැමැති කැමති තන්හි හිඳිනට හෝ හෝනට හෝ පිළිවන. ඍතුසප්පාය සෙනාසන සප්පාය පුග්ගල සප්පාය ධම්ශ්‍රවණ සප්පාය යන සියල්ල මෙහි සුවසේ ලැබෙයි. යනු අසා හෙතෙම තමාගේ භොග රාශි ය අඹු දරුවන්ට පාවා දී දහකණ බඳ එක කහවණුවකින් ම ගෙන් නික්ම මුහුදුතෙර නැව් බලා හිඳිනේ එක්මසක් විසී. ඔහු ව්‍යවහාරයෙහි ඉතා දක්ෂ ය. එහෙයින් මේ දෙරබඩු ගෙණ අනික් තැනෙක විකුණන්නේ දැහැමින් කරණ වෙළඳුමින් එම මස ඇතුළත්හි දහසක් රැස් කෙළේ ය.

එසේ කොට ක්‍රමයෙන් ලක්දිව මහ වෙහෙරට අවුත් පැවිදි ඉල්වී. හෙතෙම මහණකරණ පිණිස සීමාවට එළවන ලද්දේ ඒ දහසින් බැඳි පියල්ල කවිරු දු අතුරෙන් බිම හෙලී. ඒ දුටු භික්ෂූහු කිමෙක් දැ සි විවාළ කල්හි සාමිනි! කහවණු දහස කැ සි කියා උපාසක ය පැවිජී වූ තැන් පටන් ගෙණ රත් රිදී මසු කහවණු විධාන කරන්නට නො ලැබෙ සි. නො වටි සි දැන් ම ඒ විචාර ව සුදුස්සක් කරව සි භික්ෂූන් විසින් වදරණ ලද්දේ විසාඛ යා මහණ කරවන තැනට ආවාහු සිස් අතින් නොයෙත් ව සි දහසින් බඳි පියල්ල මුදු සීමා මළුයෙහි ඉසපියා පැවිදි ව උපසම්පන්න වූයේ හෙතෙම පස්වස් වසා දෙමාතුකා පුහුණුකොට පවරා තමන් සැප කමටහණක් ගෙණ එක් වෙහෙරක සාරම්සෙක සාරම්සෙකැ සි සමකොට වත් පුරමින් සියලු සතුන් කෙරෙහි සම ප්‍රවෘත්ත මෛත්‍රී විහාර නැමැති වාස ද ඇත්තේ ඇවිද්ද සේක.

මෙසේ ඇවිදිනා වූ විසාඛ නම් තෙරහු වත අතුරෙහි සිට සිංහ ගර්ජනා කරන්නේ තමන්ගේ ගුණ සමූහ ය සිහි කරන්නේ මේ අර්ථ ය කිහු. නොහොත් ඒ තෙරහු සමවත්ත වාස ව වෙසෙමින් ඇවිදිනාහු එක්තරා රමණීය වන ලැහැබක් දැක එහි එක්තරා රුක්මූලෙක සමවතට සමවැද යථාපරිච්ඡේද යෙන් සමවතින් නැඟී තමන්ගේ ගුණ ආවර්ජනා හෙතුකොට ඇති ප්‍රීතිසොමනස්‍යයෙන් උදන් අනන්නාහු—

"**යාවතා උපසම්පදනෙනා**" යනාදී මෙ පවත් කිහ සි යන ගාථාවකු දු මතු පහළ වෙ සි. හෙවත් යම් තැනෙක පටන් උපසම්පන්න වීම් ද යම් තාක් පටන් මෙතනට ආ ම් ද මේ අතුරෙහි ස්ඛලනයෙක් නැත. නිදුක් වූ තොපට මහා ලාබයෙකි කියා

උදන් අනා ඒ තෙරහු සිතුල්පව් වෙහෙරට යන්නේ දෙඹංසඬි යකට පැමිණ ඒ දෙමෙහින් යා යුතු මග කවරෙක්දැ සි සිතමින් සිටි සේක. ඉක්බිති ඒ පළිතයෙහි අධිගෘහිත දෙවතාවෙක් අත දින් කොට මේ මිගය සි දැක්වී. ඒ තෙරහු සිතුල්පව් වෙහෙර සාරමසක් වැස අලුයම් වේලෙහි යෙමි සි සිතා වැද හොත් සේක. එ කල්හි සක්මන් කෙළවර මනිල රුකෙහි වසන දෙවතා තොමෝ හිණි මිග මත්තෙහි හිඳ හැඬූ.

ඒ අසා මහතෙරහු කවරෙක්දැ සි විමසූහ. එ කල දෙවතා තොමෝ මම **මනිල** දෙවතා යැ සි කිවී. කුමට හඬන් නෙහිදැ සි විචාරණ ලද්දී ඔබ වහන්සේ වඩනා නිසා යැ සි කී හෙයින් මා මෙහි විසීමෙන් තොපට කවර ගුණයෙක් දැ සි විචාරණ ලද්දී ඔබ වහන්සේගේ මෛත්‍රී ආනුභාවයෙන් දෙවියෝ ඔවුනොවුන් සෙරෙහි මෙන් සිත් පිළි ලබනු. නුඹ වහන්සේ වැඩිකල්හි නපුරු වචන බෙණෙති කිවූ. තෙරහු ඒ අසා මා මෙහි වසන කල්හි තොපට එසු විහාර භූමි සොඳුරු ය උතු මැ සි කියා අනික් සාරමසෙහි දු එහි ම වැස නැවත එ සේම වඩනට සිතු සේක. දෙවතා ද නැවත එ සේ ම හැඬී. මෙ ම උපායෙන් තෙරහු එම වෙහෙර වැස පිරිණිවියෝ. දක්වන ලද මෑ සි- **විසුද්ධිමග්ගයෙහි**—

සෝ කිර පාටලිපුත්තෙ කුටිම්බියෝ අහොසි. සෝ තත්ථෙව වසමානෝ අසෙසාසි තම්බපණ්ණි දීපෝ කිර චෙතිය මාලා ලඞ්කතෝ කාසාව පජ්ජොතෝ සෝ ඉච්ඡිතිච්ඡිතට්ඨානෙ යෙවෙත්ථ සක්කා නිසීදිතුං වා නිපජ්ජිතුං වා උතුසප්පායං සෙනාසන සප්පායං පුග්ගලසප්පායං ධම්මසවණ සප්පායන්ති සබ්බ මේත්ථ සුලභං, සෝ අත්තනෝ භොගකඞ්ඛං පුඤ්ඤඵලස්ස නීයා දෙවා දසන්නෙ ඛණ්ඩෙන එක කහාපණෙනෙව ඝරා නික්ඛමිත්වා සමුද්දති රෙ තාවං උද්ධිකඛමානෝ එක මාසං වසි. සෝ වොහාර කුසලතාය ඉමසම්ං දිවාරෙ භණ්ඩං කිණිත්වා අමුකසම්ං විකකිණනෙත්වා ධම්මිකාය වණිජ්ජාය තෙනෙවන්තර මාසෙන සහස්සං අනිසංහරි අනුපුබ්බෙන මහාවිහාරං ආගන්ත්වා පබ්බජ්ජං යාචි.

සෝ පබ්බාජනත්ථාය සීමං නීතෝ තං සහස්සත්ථවිකං ඔවට්ටකන්තරෙන භූමියං පාතෙසි. කිමේතන්ති වුත්තෙ කහා පණ සහස්සං භන්තෙති වත්වා උපාසක පබ්බජිත කාලතෝ පට්ඨාය න සක්කා විවාරෙතුං ඉදානෙව නං විවාරෙහීති වුත්තෙ විසාඛස්ස පබ්බජ්ජට්ඨානං ආගතා මා රිත්තහත්ථා ගමිංසූති මුඤ්චිත්වා සීමාමාලකෙ විපකිරිත්වා පබ්බජිත්වා උපසම්පන්නෙ සෝ

පඤ්චවසෙසා හුත්වා දෙව මානිකා පගුණං කත්වා පවාරෙත්වා අත්තනො සපායං කම්මට්ඨානං ගහෙත්වා එකෙකසමිං විහාරෙ චත්තාරො මාසෙ කත්වා සම්වත්තනවාසං වසමානො චරි. එවං චරමානොව—

වතනන්තරෙ සිතො ථෙරො--විසාඛො හජ්ජ මානකො,
අත්තනො ගුණමෙසනෙතා- ඉමම්හඨං අභාසථ.

යාවතා උපසම්පන්නො--යාවතා ඉධමාගතො,
එත්ථන්තරෙ ඛලිසං තත්ථි--අහො ලාභා තෙ මාරිසා නි.

සො චිත්තල පබ්බත විහාරං ගච්ඡන්තො දෙවාපථං පත්වා අයං නු ඛො මඟෙහා උදාහු අයන්ති චින්තයන්තො අට්ඨාසි. අථස්ස පබ්බතෙ අධිවත්ථා දෙවතා හත්ථං පසාරෙත්වා එස මඟෙහාති දස්සෙසි. සො චිත්තලපබ්බතෙ චත්තාරො මාසෙ වසිත්වා පවාරුසෙ ගම්ස්සාමීති විනෙතත්වා නිපජ්ජි. එඛකම සීසෙ **මණිල** රුකෙඛ අධිවත්ථා දෙවතා සොපාණ ඵලකෙ නිසිදිත්වා රොදි. ථෙරො කො එසොති ආහ. අහං භන්තෙ මනිලියා නි, කිස්ස රොදසීති, තුම්හාකං ගමනං පටිච්චාති, මයි ඉධ වසන්තෙ තුයහං කො ගුණොති, තුමෙහස්ු භන්තෙ ඉධ වසන්තෙස්ු අමනුස්සා අඤ්ඤමඤ්ඤං මෙත්තං පවිලභන්ති නෙ'දානි තුමෙහස්ු ගතෙසු කලහං කරිස්සන්ති දුට්ඨුල්ලං කථයිස්සන්ති. සචෙ මයි'ධවසන්තෙ තුම්හාකා ඵාසු විහාරො හොති, සුන්දරන්ති වත්වා අඤ්ඤදපි චත්තාරො මාසෙ තත්ථෙව වසිත්වා පුන තත්ථෙව ගමන චිත්තං උපපාදෙසි. දෙවතා'පි පුන තථෙ'ව රොදි. එතෙනෙ'ව උපායෙන ථෙරො තත්ථෙ'ව වසිත්වා තත්ථෙ'ව පරිණිබ්බායි.

මෙ සේ නොයෙක් ලෙසින් වර්ණනා කරණ ලද අනුසස් ඇති ක්‍ෂාන්තියෙහි අනුසස් සලකා පරෝපකාර සහනතා දී ක්‍ෂමා ලක්‍ෂණ වූ ක්‍ෂාන්තියෙන් යුක්ත වීම ත් දශවධම් සාමප රාමිකාභීයන් සාධා දීමට කාරණා වන බැවින් උතුම් මඟුලෙක් වන්නේ ය.

''**සොවචසසතා**'' යන්නෙහි සොවචසසතා නම් සකාරණ යෙන් කියා අවවාද කරණ ලදුව කළ අවවාදය කෙරෙහි ද අවවාද කළවුන් කෙරෙහි ද ගුණ නුගුණ චින්තනය වශයෙන් වික්‍ෂෙපයට නො පැමිණ වදාළ සේ යහපතැසි වරද පිළිගන්නා බව සොවචසසතා නම් වෙයි. නෙ ද සම්‍ාඤ්ඤාසියට කාරණා වන බැවින් මඟුල් නම් වන්නේ ය.

"**සමණානඤ්චදස්සනං**" යන යන තන්හි සන්හිඳුවන ලද කෙලෙසයන් හා වඩනා ලද ප්‍රඥාශීල සමාධ්‍යාදී ගුණයන් ඇති ශ්‍රමණයන්ගේ දර්ශන ය ශ්‍රමණ දර්ශන නම් වෙයි. එ බඳු ගුණ ඇත්තවුන් කරා එළඹීම ය උන්ට උපස්ථාන කිරීම ය උන් එක්වන් සිහිකිරීම ය උන්ගේ පවත් ඇසීම ය සිත් පහදවා බලාපිවින්ට නොයෙක් දහස්ගණන් ජාතිවල ත් ඇසටවන රෝග නැති හෙයින් දැකීම ය යන මේ සියල්ල සිද්ධවන හෙයිනු ත් භික්ෂුසඞ්ඝයා වහන්සේ පිරිවරා **චේදිසඤ්** නම් පළාතයෙහි වැඩ හුන් බුදුන් දැක සිත පහදවා බලාවි ඔකමූණා පවා **කප්ලඤ්** යක් මුළුල්ලෙහි දුගතියකට නොගොස් සොඳ මුහුණු ඇති ව දෙවිසැපත් වළඳා, කෙළවර සොමනස්ස නම් පසේ බුදුවන හෙයිනු ත් ගුණ ඇත්තවුන්ගේ දැකීම ත් මහුල් වන්නේ ය.

'**කාලෙන ධම්ම සාකච්ඡා**" යන තන්හි පෙරයම හෝ අලුයම හෝ සූත්‍රානිධම්යෙන් ඔදුනොවුත් හා කරන්නා වූ සාකච්ඡා ව ධම්ම සාකච්ඡා නම් වෙයි. හෙවත් පෙරයම හෝ අලුයම හෝ සූත්‍රපිටකයෙහි අභ්‍යාස ඇතිතැන් සූත්‍රකථා කරණ සේක් ද විජම් දෙසිවේහි අභ්‍යාස ඇති තැන් විජම් කථා කරණ සේක් ද ජාතකයෙහි අභ්‍යාස ඇතිතැන් ජාතක කථා කරණ සේක් ද අටුවායෙහි අභ්‍යාස ඇතිතැන් ඉන් කථා කරණ සේක් ද ඒ කථා ව ආගමව්‍යක්ති ආදී ගුණයට කාරණා වන බැවින් මහුල් වන්නේ ය. මෙසේ **බහුනි ච සොව වස්ස නා** යනාදි ගාථාවෙන් **ඤාණන්** ය එක් මහුලෙක. සුවව බව එක් මහුලෙක. ශ්‍රමණ දර්ශන ය එක් මහුලෙක. ධම්සාකච්ඡා ව එක් මහුලෙකැ යි කියා මහුල් සතරක් වදාරා මින්තෙහි මහුල් වදාරණ සේක්--

තපො ච බ්‍රහ්ම චරියා ච අරියසච්චාන දස්සනං,
නිබ්බාණ සච්ඡිකිරියා ච එතංමඞ්ගල මුත්තමං-යි.

යන ගය වදාළ සේක. එහි "**තපොච**" යන්තෙහි තපස් නම්, තපො නාම අනිඤ්ඣා දෞමනස්සාදීනං තපනතො ඉන්ද්‍රිය සංවරෝ කොසජ්ජස්ස වා තපතෙ-යි.

යනාදීන් කී බැවින් චක්ෂුරාදී සදෙරට විෂය වූ රූපාදියෙහි ඇලීමක් වේ ව යි අනිෂ්ට අරමුණෙහි ගැටීමක් වේ ව යි නැති ව අභිද්‍ය දෞර්මනස්‍යාදීන්ගේ නැසීමෙන් ඉන්ද්‍රිය සංවර ය හා කුසීත බව නැසීම තපස් නම් වෙයි. හෙද සම්‍යක් සිද්ධියට කාරණා වන බැවින් මහුල් වන්නේ ය.

"බ්‍රහ්මචරියාව" යන තන්හි, බ්‍රහ්මචරියං නාම මෙථුන විරති සරණ ධම්ම සාසන මග්ගානං ඉදං අධිවචනං-යි.

අට්ඨකථාවෙහි ආ බැවින් සප්තවිධ මෛථුන ධර්මය ප්‍රතිසංයුක්ත අබ්‍රහ්මචරියට ප්‍රතිපක්ෂ වූ උතුම් ශාසනමාර්ගී බ්‍රහ්මචරණය බ්‍රහ්මචර්‍ය්‍ය නම් වන්නේ ය. මෙහි සප්තවිධ මෛථුන යෙහි විභාග කෙසේ ද යත්?

මේ ලෝකයෙහි ප්‍රව්‍රජ්‍යා මාත්‍රයෙන් සමහර ශ්‍රමණයෙක් හෝ ජාතිමාත්‍රයෙන් ද ක්ෂත්‍රියක හා සමග දෙදෙනා විසින් සම වැද්ද යුතු බැවින් ද්වයංද්වය සමාපත්ති ය යි කියන්නා වූ මෛථුන යට නො පැමිණෙන්නේ චිනමුත් එකෙක් ඇත මාගමගේ ඇඟ ඉලීම් නැහැවීම් අතපය මැඩීම් ඉවසා ද හෙතෙම එහි රාග වසයෙන් ඇලේ ද ඒ කාමනීවේ ද එයින් ම තෘප්තියට පැමිණේ ද මේ ද බ්‍රහ්මචර්‍ය්‍යාවගේ එකාන්තයෙන් බණ්ඩ ද වෙයි. ඡිද්‍ර ද වෙයි සබල ද වෙයි. කල්මාස ද වෙයි. මෙ තෙම අපරිශුද්ධ බ්‍රහ්මචර්‍ය්‍යා ව ද ඇති ව වෙසෙයි. එකාන්තයෙන් ම සත්‍රී ය හා සමග මෛථුන සංඝීයෙන් ම යෙදී විසීම නම් වෙයි. බ්‍රහ්මචර්‍ය්‍යා ව නාසූ හෙයින් ජාතියෙන් නො මිදෙයි. ජරාවෙන් නො මිදෙයි මරණයෙන් නො මිදෙයි. සොකයෙන් නො මිදෙයි පරිදෙව සඞ්ඛ්‍යාත ඇඬීමෙන් වැලපීමෙන් නො මිදෙයි. දුක්ඛයෙන් නො මිදෙයි. දෞර්මනසින් නො මිදෙයි. උපායාස යෙන් නො මිදෙයි.

එසින් වදුලහ.

අඤ්ඤාතත්තරසඤ්ඤී ජාණුස්සෝණී නම් බ්‍රාහ්මණයාහට--

ඉධ බ්‍රාහ්මණ එකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානෝ නහෙව ඛෝ මාතුගාමේන සද්ධිං ද්වයං ද්වය සමාපත්තිං සමාපජ්ජති. අපි ච ඛෝ මාතුගාමස්ස උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං සාදියති සෝ තදස්සාදෙති තන්නිකාමෙති තෙනෙව චිත්තිං ආපජ්ජති. ඉදම්පි ඛෝ බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චති බ්‍රාහ්මණ අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති සංයුත්තෝ මෙථුනෙන සංයොගෙන න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දෞමනස්සෙහි උපායාසෙහි න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි-යි.

නැවත-මේ ලෝකයෙහි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මම බ්‍රහ්මචරියා ව ඇත්තෙමි යි ප්‍රතිඥා කරණ යම් කිසි

මහණ බමුණු කෙණෙක් මාගම හා සමග ද්වයංද්වය සම්පත්ති යට නොම සම්වදනේ ද ඇගේ ඇඟ ඉලීම් ආදිය නොම ඉව සන්නේ ද එකෙක් ඇත. මාගම් හා සමග කෙලස වසයෙන් මනා සිනා සේ ද කාය සංසර්ග වසයෙන් කෙළි ද සත්කාරයෙන් මාගම කෙරෙහි මිත්වය කෙරේ ද එහි ඇලේ ද කැමති වේ ද එයින් සතුටට පැමිණේ ද මේ තෙම අපරිසුද්ධ බ්‍රහ්මචර්‍යා ව ද වෙයි. මෛථුන සංයෝගයෙන් යෙදී මෙසේ මෛථුන සංයෝගයෙන් යුක්ත වූ බැවින් ජාතියෙන් ජරාවෙන් මරණින් සොකයෙන් පරිදෙවයෙන් දුකඛයෙන් දෞර්මනස්‍යයෙන් උපායාසයෙන් සියලු දුකඛයෙන් නො මිදේ.

එසින් වදුලහ.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෙ සමණෙ වා බ්‍රාහ්මණෙ වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානා නහෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයංද්වය සමාපත්තිං සමාපජ්ජන්ති න'පි මාතුගාමස්ස උච්ඡාදන පරිමද්දන නහාපන සම්බාහනා සාදියන්ති. අපි ච ඛො මාතුගාමෙන සද්ධිං සංජග්ඝන්ති සංකීළන්ති සංකෙළායන්ති සෙ හදස්සා දෙනි තන්නිකාමෙති තෙනෙව විත්තිං ආපජ්ජති. ඉදම්පි ඛො බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චති බ්‍රාහ්මණ අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති සංයුත්තො මෛථුනෙන සංයොගෙන න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුකඛෙහි දොමනස්සෙහි උපායාසෙහි න පරිමුච්චති දුකඛස්මාති වදාමි-සි.

නැවත ද-මේ ලෝකයෙහි යම් මහණෙක් හෝ බමුණෙක් හෝ බ්‍රහ්මචරියා ව ඇතුව වෙසෙම් සි කියා ප්‍රතිඥා කරන්නේ මාගමක හා ද්වයංද්වය සමාපත්තියට සම නො වදනේ ය. මාගමගේ ඇඟ ඉලීම් ආදිය නොම ඉවසන්නේ ය. මාගම හා සමග කෙලස වසයෙන් නොම මහා සිනාසෙන්නේ ය. කාය සංසර්ග වසයෙන් නො කෙළින්නේ ය. මාගම හා සමග සත්කාරයෙන් මමත්ව ය නො කරන්නේ ය. එකෙක් ඇති, තමාගේ ඇසින් මාගමගේ ඇස බලා ද හෙ තෙම එහි ඇලේ ද කැමති වේ ද එයින් තුෂ්ටියට පැමිණේ ද මේ ද බ්‍රහ්මචරියාවගේ ඛණ්ඩ ද වෙයි. සබල ද වෙයි.. කල්මාස ද වෙයි. මේ තෙම අපරිසුද්ධ බ්‍රහ්මචරියා ව ද වෙයි. මෛථුන සංයෝගයෙන් ම යෙදී වෙසේ. ඒ කාරණයෙන් ජාති ජරා ආදියෙන් නො මිදේ.

එසින් වදුලහ.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෙ සමණෙ වා බ්‍රාහ්මණෙ වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානා නහෙව ඛො මාතුගාමෙන

සද්ධිං ද්වයං ද්වය සමාපත්තිං සමාපජ්ජති නපි මාතුගාමස්ස උච්ඡා දනං නහාපනං සම්බාහනං සාදියති නපි මාතුගාමෙන සද්ධිං සංජ ග්ඝති සංකීළති සංකෙළායති අපි ච ඛෝ මාතුගාමස්ස වඤ්ඣනා වඤ්ඣං උපනිජ්ඣායති පෙඤ්ඣති නෝ තදස්සාදෙති තන්නිකාමේති. තෙනෙව චිත්තිං ආපජ්ජති. ඉදම්පි ඛෝ බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චති බ්‍රාහ්මණ අපරිසුද්ධ බ්‍රහ්මචරියං චරිස්සති සංයුත්තෝ මේථුනෙන සංයෝ ගෙන න පරිමුච්චති ජාතියා ජරා මරණෙන සොකෙහි පරිදෙ වෙහි දුක්ඛෙහි දෙමනස්සෙහි න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි-සි.

නැවත ද- ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක් බ්‍රහ්මචරියාව ඇත් තෙම් සි ප්‍රතිඥා කරන්නේ මාගම් හා සමග ද්වයංද්වය සමාපත්ති ය සි කියන ලද ලොකාස්වාද රතියෙන් නොයෙදෙන්නේ ය. මාගමගේ අත පය ඉලීම් ආදි ය නොඉවසන්නේ ය. මාගම් හා සමග කෙළි ආදි ය නොකරන්නේ ය. මාගමගේ ඇස ඇසින් නොබලන්නේ ය. එකෙක් ඇත, මැටි නිත්තියෙක්හි එපිටින් හෝ උළු පවුරේ එපිටින් හෝ මාගමගේ ගීතාසෙන්තියගේ ඛණ්ඩන්තියගේ හෝ ගී කියන් නියගේ හෝ හඬන්නියගේ හෝ ශබ්ද ය අසා ද නෙතෙම එහි ඇලේ ද කැමති වේ ද එයින් තුෂ්ටියට පැමිණේ ද මේ ද වනාහි බ්‍රහ්මචරියාවගේ ඛණ්ඩ ද වෙ සි. ඡිද්‍ර ද වෙ සි. සබල ද වෙ සි. කල්මාස ද වෙ සි. මෙ තෙම අපරිසුද්ධ බ්‍රහ්මචරියා ව ද ප්‍රර සි. මෛථුන සංයෝගයෙන් යුක්ත ව ම වෙසෙ සි. ජාති ජරා ව්‍යාධි ආදියෙන් නො මිදේ. තෙවන් සසර දුකින් නො මිදේ.

එසින් වදාළහ.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෙ සමණෙ වා බ්‍රාහ්ම ණෙ වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානා නහෙව ඛෝ මාතුගාමෙන සද්ධිං ද්වයංද්වය සමාපත්තිං සමාපජ්ජති නපි මාතුගාමස්ස උච්ඡා දනං පරිමද්දනං සම්බාහනං සාදියති නපි මාතුගාමෙන සද්ධිං සංජග්ඝති සංකීළති සංකෙළායති නපි මාතුගාමස්ස වඤ්ඣනා වඤ්ඣං උපනිජ්ඣායති න පෙඤ්ඣති. අපි ච ඛෝ මාතුගාමස්ස සද්දං සුණාති නිරොකුඩ්ඩා වා නිරොපාකාරා වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා සෝ තදස්සාදෙති තන්නි කාමේති තෙනෙ ව චිත්තිං ආපජ්ජති. ඉදම්පි ඛෝ බ්‍රාහ්මණ බ්‍රහ්ම චරියස්ස ඛණ්ඩම්පි ඡිද්දම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චති බ්‍රාහ්මණ අපරිසුද්ධං බ්‍රහ්මචරියං චරති සංයුත්තෝ මේථුනෙන සංයොගෙන න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරි දෙවෙහි දුක්ඛෙහි දෙමනස්සෙහි උපායාසෙහි න පරිමුච්චති දුක්ඛ

සම්හි වදාමි -සි.,

නැවත ද- මේ ලෝකයෙහි සමහර ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ බ්‍රහ්මචරියා ව ඇති ව වෙසෙමි සි ප්‍රතිඥ කරන්නේ මාගමක හා සමග ද්වයංද්වය සමාපත්තියට සම නොවදනේ ය. මාගමගේ ඇඟ ඉලීම් ආදි ය නොම ඉවසන්නේ ය. මාගම හා සමග නොසෙළින්නේ ය. මාගමගේ ඇස ඇසින් නොබලන්නේ ය. ප්‍රාකාරාදියෙන් ඇත සිට ගායනා ආදි ය කරණ මාගමගේ ශබ්ද ය නො අසන්නේ ය. එකෙක් ඇති, ව්‍රත සමාදානාදියට පූර්වයෙහි සත්‍රියක හා සමග කළ යම් ඒ සිනාවෙක් කථාවෙක් කෙළියෙක් ඇද්ද, ඒ සියල්ලවුන්ගේ සිහිකිරීමෙක් ඇද්ද, හෙතෙම එහි ඇලේ ද, ඒ අකැමති වේ ද, එයින් සතුටු වේ ද, මේ ද බ්‍රහ්මව්‍රතයාගේ ඛණ්ඩ ද වෙයි. ශිද්‍ර ද වෙයි. සබල ද වෙයි. කල්මාස ද වෙයි. මොහු ද නොපිරිසිදු බ්‍රහ්මව්‍රතයක් ම ඇති ව වෙසෙයි. මෛථුන සංයෝගයෙන් යුක්ත ව ම වෙසෙයි. එ හෙයින් ජාති ජරා ආදී දුකින් නොමිදේ.

එසින් වදළහ.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානෝ නහෙව ඛෝ මාතුගාමෙන සද්ධිං ද්වයංද්වය සමාපත්තිං සමාපජ්ජති, නපි මාතුගාමස්ස උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං සාදියති, නපි මාතුගාමෙන සද්ධිං සංජග්ඝති සංකීළති සංකෙළායති, නපි මාතුගාමස්ස චක්ඛුනා චක්ඛුං උපනිජ්ඣායති, න පෙක්ඛති, නපි මාතුගාමස්ස සද්දං සුණාති, තිරොකුඩ්ඩා වා තිරොපාකාරා වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා. අපි ච ඛෝ යානිස්ස තානි පුබ්බෙ මාතුගාමෙන සද්ධිං හසිත ලපිත කීළිතානි අනුස්සරති සෝ තදස්සාදෙති තන්නිකාමෙති තෙතෙව චිත්තං උපජ්ජති ඉදම්පි ඛෝ බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ශිද්‍රම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චති බ්‍රාහ්මණ අපරිසුද්ධ බ්‍රහ්මචරියං චරති සංයුත්තෝ මෛථුනෙන සංයොගෙන. න පරිමුච්චති ජාතියා ජරා මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි. න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි-සි.

නැවත ද- මේ ලෝකයෙහි ශ්‍රමණ බ්‍රාහ්මණ කෙණෙක් බ්‍රහ්මචාරී ව වෙසෙමි සි ප්‍රතිඥ කරන්නේ මාගම හා සමග ද්වයංද්වය සමාපත්තියට නොම සම්වදනේ ය. මාගමගේ ඇඟ ඉලීම් ආදි ය නොම ඉවසන්නේ ය. මාගම හා සමග නොම කෙළින්නේ ය. මාගමගේ හි ආදි ය නොම අසන්නේ ය. මාගම හා සමග පෙර කළ කෙළි සිනා ආදි ය සිහි නොකරන්නේ ය. එකෙක් ඇති, ගෘහපතියෙක් හෝ ගෘහපති පුත්‍රයෙක් හෝ පඤ්චකාම නොට්ඨාශයන් සහිත

වූවාහු සමන්විත වූවාහු කෙළනාහු උපස්ථාන කරන්නා වූ හෝ එහි ඇලේ ද, කාමනි වේ ද, එයින් තුෂ්ටියට පැමිණේ ද, මේ ද බ්‍රහ්මචරියාවගේ ඛණ්ඩ ද වෙ යි. ඡිද්‍ර ද වෙ යි. සබල ද වෙ යි. කල්මාස ද වෙ යි. මෙතෙම නොපිරිසිදු බ්‍රහ්මචර්‍යා ව ද පුරයි. මෛථුන සංඝයෙන් යුක්ත ව වෙසෙ යි. එ හෙයින් ජාති ජරා ව්‍යාධි මරණාදී සසර දුකින් නොමිදෙ යි.

එයින් වදාළහ.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෝ සමණෝ වා බ්‍රාහ්මණෝ වා සම්මා බ්‍රහ්මචාරී පටිජානමානෝ, නෝව ඛෝ මාතුගාමේන සද්ධිං ද්වයංද්වය සමාපත්තිං සමාපජ්ජති නපි මාතුගාමස්ස උච්ඡාදන පරිමද්දන නහාපන සම්බාහනං සාදියති නපි මාතුගාමේන සද්ධිං සංඝුජ්ඣති සංකීලති සංකෙලායති නපි මාතුගාමස්ස චකඛුනා චකඛුං උපනිජ්ඣායති න පෙකඛති නපි මාතුගාමස්ස සද්දං සුණාති තිරෝ කුඩ්ඩා වා තිරෝ පාකාරා වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා නපි යානිස්සතානි පුබ්බෙව මාතුගාමේන සද්ධිං හසිත ලපිත කීළිතානි අනුස්සරති.

අපි ච ඛෝ පස්සති ගහපතිං වා ගහපති පුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමංගීභූතං පරිවාරයමානං සෝ තදස්සා දෙති තදනිකාමෙති තෙනෙව චිත්තං ආපජ්ජති. ඉදම්පි ඛෝ බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ජිද්දම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චත් බ්‍රාහ්මණ අපරිසුද්ධ බ්‍රහ්මචරියං චරති සංයුත්තෝ මෛථුනෙන සංයොගෙන, න පරිමුච්චති ජාතියා ජරා මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දෙමනස්සෙහි. න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි—යි.

නැවත ද- මේ ලෝකයෙහි ශ්‍රමණබ්‍රාහ්මණයෙක් හෝ බ්‍රහ්ම චරියා ව ඇති ව වෙසෙමි යි ප්‍රතිඥ කරන්නේ මාගම හා සමග ද්වයං ද්වය සමාපත්තියට නොම සම්වදනේ ය. මාගමගේ ඇඟ ඉලිම් ආදි ය නොම ඉවසන්නේ ය. මාගම හා සමග නොම කෙළින්නේ ය. මාගමගේ ගායනාදි ය. නොම අසන්නේ ය. ඇ සමග පෙර කළ කෙළි සිනා ආදි ය නොම සිහිකරන්නේ ය. පඤ්චකාම ගුණයෙන් යුක්ත වූ ගෘහපතියෙකු හෝ ගෘහපති පුත්‍රයෙකු හෝ කෙළින්නහු උපස්ථාන කරන්නහු බලා සතුටු ආදි ය නොවන්නේ ය.

එකෙක් ඇති, එක්තරා දිව්‍යනිකායෙක් ප්‍රාර්ථනාකොට බ්‍රහ්ම චර්‍යා ව පුරා ද මම මේ ශීලයෙන් හෝ මේ වතයෙන් හෝ මේ තපසින් හෝ මේ බ්‍රහ්ම චර්‍යාවෙන් හෝ ශක්‍ර සුයාමාදී ප්‍රකට දෙවියෙක් ව හෝ අප්‍රකට දෙවියෙක් ව හෝ ඉපද පස්කම් සැප විඳිමි යි

එහි ඇලේ ද ඒ කැමැති වේ ද එයින් තුෂ්ටියට පැමිණේ ද මේ ද බ්‍රහ්මචර්‍යාවගේ ඛණ්ඩ ද වෙ යි. ශිදුර ද වෙ යි සබල ද වෙ යි. කල්මාස ද වෙ යි මේ තෙම නොපිරිසිදු බ්‍රහ්මචර්‍යාව ද පුර යි. මෛථුන සංඛ්‍යාත සත්‍ර්‍යාසේවායෙන් යුක්තව ම වෙසෙ යි. බුද්ධාදී මනොත්තමියන්ගේ බ්‍රහ්මචර්‍යාවට කළ අන්තරා ය හෙයින් ජාති යෙන් නොමිදෙ යි. මරණයෙන් නොමිදෙ යි. ශොකයෙන් නොමිදෙ යි. පරිදෙවයෙන් නොමිදෙ යි දුක්ඛයෙන් නොමිදෙ යි. දෞර්මනස්‍යයෙන් නොමිදෙ යි. උපායාසයෙන් නොමිදෙ යි. සියලු සසර දුකින් නොමිදෙ යි.

එයින් වදලහ.

පුන ච පරං බ්‍රාහ්මණ ඉධෙකච්චෙ සමණෙ වා බ්‍රාහ්මණෙ වා සමමා බ්‍රහ්මචරි පටිජානා මානො න හෙව ඛො මාතුගාමෙන සද්ධිං ද්වයංද්වය සමාපත්තිං සමාපජ්ජති නපි මාතුගාමස්ස උච්ඡාදනං පරිමද්දනං නහාපනං සම්බාහනං සාදියති නපි මාතුගාමෙන සද්ධිං සාකච්ඡති සංකෙළායති නපි මාතුගාමස්ස චක්ඛුනා චක්ඛුං උපනිජ්ඣායති න පෙක්ඛති නපි මාතුගාමස්ස සද්දං සුණාති තිරොකුඩ්ඩා වා තිරොපාකාරා වා හසන්තියා වා භණන්තියා වා ගායන්තියා වා රොදන්තියා වා නපි යානිස්සන්ති පුබ්බෙව මාතුගාමෙන සද්ධිං හසිත ලපිත කිළිත්තානි අනුස්සරති නපි පස්සති ගහපතිං වා ගහපති පුත්තං වා පඤ්චහි කාමගුණෙහි සමප්පිතං සමඞ්ගිභූතං පරිචාරයමානං.

අපි ච ඛො අඤ්ඤතරං දෙවනිකායං පණිධාය බ්‍රහ්මචරියං චරති ඉමිනාහං සීලෙන වා වතෙන වා තපෙන වා බ්‍රහ්මචරියෙන වා දෙවො වා භවිස්සාමි දෙවඤ්ඤතරොවාති සො තදස්සාදෙති තන්නිකාමෙති තෙනෙ ච චිත්තං ආපජ්ජති. ඉදම්පි ඛො බ්‍රාහ්මණ බ්‍රහ්මචරියස්ස ඛණ්ඩම්පි ශිදුම්පි සබලම්පි කම්මාසම්පි. අයං වුච්චති බ්‍රාහ්මණ අපරිසුද්ධා බ්‍රහ්මචරියං චරති සංයුත්තොතා මෙථුනෙන සංයොගෙන න පරිමුච්චති ජාතියා ජරාමරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි න පරිමුච්චති දුක්ඛස්මාති වදාමි-සි.

මෙසේ දක්වන ලද සප්තවිධ මෛථුනයෙහි දෙෂයන් සලකා ත් බ්‍රහ්මචර්‍යාව පිරිය යුත්තේ ය. තව ද, බ්‍රහ්මචර්‍යා භෙද ය කලහොත් නොවිඳ හැකි වූ නොඇසි ය හැකි වූ දුක්ඛදායක වන බැවිනුත් බ්‍රහ්මචර්‍යාව පිරිය යුත්තේ ය. හේ **අගික්ඛන්ධොපම** සූත්‍රයෙහි ආ ක්‍රමයෙන් සංග්‍රහ කෙරෙමි.

සංසාර භීරුකයන් විසින් සිත්හි ලා ඇසියයුතු ත්‍රිභුවන නිලොක වූ ත්‍රිභුවන කල්‍යාණ වූ ත්‍රිභුවන සෙඛර වූ ත්‍රිභුවනාමෘත දායක වූ භාග්‍යවත් වූ සම්‍යක් සම්බුද්ධ රාජෝත්තමයාණන් වහන්සේ එක්

සම්යෙක්හි ගුණ මහත්තඩයෙන් හා සඛ්‍යාපථ මහත්තඩයෙන් මහත් වූ භික්‍ෂුසඞ්ඝයා හා සමග තාරකා සමූහයා දිසින් ප්‍රදිවර්ණ ලදු ව ගමන්ගත් පූර්ණචන්ද්‍රයා සේ අපමිණ වූ බුද්ධ ලීලාවෙන් සතරා මර ලෝකයාගේ සිත් නෙත් තමන් වහන්සේ කරා ග්‍රහණ ය කෙරෙමින් ධම් ධවජ ය නගමින් ධම් කොන්ත ය ඔසවමින් ධම් සංඛ ය පිඹිමින් ධම්භෙරි ය පහරමින් ධම්වර්‍ෂා වස්වමින් කොසොල් රට සැරි සරණ සේක් අද්ධානමාගී සංඛ්‍යාත දීඝ මාගීයකට පිළිපන් සේක. එක්තරා ප්‍රදෙශයෙක්හි හාත් පසින් ගිනිසිලින් ගැවසිගෙණ එක ප්‍රභා සමූහ වූ මහත් ගිනිකඳක් දැක මහින් ඉවත් ව එක්තරා රුකක් මුල පණවන ලද බුද්ධාසනයෙහි වැඩහුන් සේක. වැඩ උන්නා වූ සර්‍වඥතෙම මහණෙනි! ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිභූත වූ තෙල මහත් ගිනිකඳ දුටුදු සි කියා භික්‍ෂූන් වහන්සේට ආමන්ත්‍රණ ය කළ සේක. ඒ භික්‍ෂූන් වහන්සේලා ද එසේ ය ස්වාමීන් වහන්ස දුටුම්හ සි ප්‍රතිවචන දුන්සේක් ලා ය. මෙම දක්වන්නට ද වදුළහ. **මහසුළු** මහතෙරුන් විසින් විවාරණ ලදු ව අනද මහතෙරහු ප්‍රථම සංගායනාවෙහි.

එවං මෙසුතං එකං සමයං භගවා කොසලෙසු චාරිකං චරති මහතා භික්‍ඛු සඞ්ඝෙන සද්ධිං. අද්දසා ඛො භගවා අද්ධාන මග්ග පටිපන්නො අඤ්ඤතරස්මිං පදෙසෙ මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජෝතිභූතං දිස්වා මග්ගා ඔක්කම්ම අඤ්ඤතරස්මිං රුක්ඛමූලෙ පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. නිසජ්ජ ඛො භගවා භික්‍ඛූ ආමන්තෙසි. පස්සථ නො තුම්හෙ භික්‍ඛවෙ අමූං මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතං සජෝතිභූතන්ති. එවං භන්තෙ- සි.

මෙසේ ප්‍රති වචන දුන් කල්හි මහණෙනි! ඒ කුම්කා සි සිතව් ද කවරෙක් උතුම් ද ගිනිගත් හෙයින් ආදීප්ත ය සි කියන ලද දිළිහෙන හෙයින් සම්ප්‍රජ්වලිත යැ සි කියන ලද හාත්පසින් ගිනි ඇවිලෙන ගිනිසිලින් එකප්‍රභා සෙයින් සජෝතිභූත ය සි කියන ලද තෙල මහත් ගිනිකඳ වැලඳගෙණ හිඳිනේ හෝ වේ ද හෝනේ හෝ වේ ද හෙවත් සැතපෙන්නේ හෝ වේ ද යන යමෙක් ඇද් ද, රාජකුලයෙහි උපන් රජදුවක හෝ බමුණුකුල යෙහි උපන් බැමිණි දුවක හෝ ගෘහපති කුලයෙහි උපන් ගැහැවි දුවක හෝ සෙසු සත්‍රියෙක හෝ මෘදු වූ සිවුමැලි වූ හස්තාදී අවයව ඇත්හි ය වැළඳගෙණ හිඳිනේ හෝ වේ ද හෝනේ හෝ වේ ද යන යමෙක් ඇද් ද මෙ දෙකින් කවරෙක් උතුම් ද හෙවත් හාත්පසින් ගිනිගෙණ දිළිහෙන තෙල මහත් ගිනිකඳ වැලඳගෙණ හිඳිනේ හෝ නෝනේ උතුම් ද ක්‍ෂත්‍රියා දී යාවත් කන්‍යාවක හා සමග උපනිසීදනා දි ය උතුම් දැ සි විවාරා වදුළ සේක. මෙහි කුකුස් කරන හොත්—

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමං නු ඛො වරං යං අමුං මිගනතං අයඝික්ඛණ්ඩං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසිදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා, යං ඛත්තියං කඤ්ඤං වා බ්‍රාහ්මණ කඤ්ඤං වා ගහපති කඤ්ඤං වා මුදු තලුන හත්ථපාදාදිං ආලිඞ්ගිත්වා උපනිසිදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා- සි.

වදුරණ ලද ත්‍රි මුඛ පාළි ය ද පිරිත්සි ය යුතු. යථොක්ත ක්‍රම යෙන් ච්වාරා වදුළ සත්ත්වයන් වහන්සේට අපායෙහිදී සැප නැත ත් ඉක්ම ලොකයෙහි දී ශරීරයට විද්‍යමාන සැප දක්වන භික්ෂූන් වහන්සේ සඳහා මින් වහන්ස! මේම උතුම්. කුමක් ද රජදුවක හෝ බැමිණි දුවක හෝ මුදුතලුන හස්තපාදාදි ශරීර අවයව ඇත්ති ය වැළඳගෙණ උප නිසිදනාදියෙන් ච්දිනා යම් සැපයෙක් ඇද් ද ඒ සැපත හාත්පසින් ගිනිගෙණ දිලිහෙණ තෙල මහත් ගිනිකඳ වැළඳගෙණ විදින සැප තට වඩා උතුම් නොවත් ගිනිකඳ වැළඳගෙණ විදිනා සැපතට වඩා රාජකන්‍යාදින් හා සමග විදිනා සැප උතුම්. ගිනිකඳ වැළඳ ගැන්ම දුක් ය සි දැන්වූ සේක් ලා ය. මේ ද කුකුස් හරණු පිණිස—

එනදෙව හනෙත වරං යං ඛත්තිය කඤ්ඤං වා බ්‍රාහ්මණ කඤ්ඤං වා ගහපති කඤ්ඤං වා මුදු තලුන හත්ථපාදාදිං ආලිඞ්ගිත්වා උපනිසිදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා, දුක්ඛං හෙතං භනෙත යං අමුං මිගනතං අයඝික්ඛණ්ඩං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසිදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා—සි.

තත් ප්‍රතිවචන වූ එම සූතුරෙහි ශ්‍රාවකභාසින පාඨ ය ද පිරික් සිය යුතු—ඉක්බිත්තෙන් ත්‍රෛලොකාවාග්‍රී වූ බුදුරජතෙමේ මහ ණෙනි! තොපට කියමි. මහණෙනි! තොපට භහවමි, කෙසේ ද?

සීල ය දූෂ්‍ය ය කළ හෙයින් දුශ්ශීල වූ ලාමක සවභා ව ඇති හෙයින් පාපධර්ම වූ තොපිරිසිදු කායවාක් කර්මාදිය ඇති බැවින් සුචි නොව ශඞ්කාවෙන් සමරණීය ප්‍රවෘත්ති ඇති බැවින් අසුචි සංකස්සර වූ අනුන් දුටහොත් ලජ්ජා කටයුතු බැවින් සැහවි ය යුතු කායවාක් ක්‍රියා ඇති මහණදම් නැසුනු බැවින් අශ්‍රමණ ව ලහ ගේ ආදියෙහි ශ්‍රමණයෙමි යන ප්‍රතිඥයෙන් ශ්‍රමණ ප්‍රතිඥ ඇති බ්‍රහ්මචර්‍යා ව නැති හෙයින් අබ්‍රහ්මචාරී වූ අබ්‍රහ්මචාරී ව සිට බ්‍රහ්මචර්‍යා ඇත්තෙමි යි කියා උපොසථ ගාහාදී මිථ්‍යා ප්‍රතිඥයෙන් බ්‍රහ්මචාරී ප්‍රතිඥ ඇති දුස්සීල කමින් ඇතුළ කුණු වූ හෙයින් අන්තොපූති වූ සදෙ රින් මැනෙන කෙළෙසුන් කෙරෙන් තෙත් වූ බැවින් අවස්සුත වූ හටගත්තා වූ රාගාදී කසල ඇතිබැවින් කසලක් සෙයින් සිටුවතුන් මැද සිටිය නොදී දුරුකරන බැවින් ද කසම්බුජාත වූ කසල සවභා

ඇති ඒ දුස්සීලයහට යථොක්ත ප්‍රකාර වූ තෙල මහත් ගිනිකඳ වැළඳගෙණ හිඳිනේ හෝ වේ ද නෝ නේ හෝ වේ ද යන යමෙක් ඇද් ද ඒ උතුම්. දුස්සීලයහට ක්ෂත්‍රිය කන්‍යාදීන් හා විදිනා සැපතට වඩා තෙල ගිනිකඳ වැළඳ ගැන් ම උතුම්. එයට කාරණාකිම් යත්?

මහණෙනි! ඒ ගිනිකඳ වැළඳගෙණ නිෂද්‍යාදි ය හේතුකොට ගෙණ ඒ දුස්සීල මහණ තෙමේ මරණයට හෝ පැමිණෙ යි. මරණය හා සම දුකට හෝ පැමිණෙ යි. ඒ ගිනිකඳ වැළඳ ගැන්මෙහි දෙෂය කින් මරණින් මත්තෙහි නරකයෙහි නොවුපදනේ ය. මහණෙනි! ඒ දුස්සීල තෙමේ පවිටු සවභාව ඇත්තේ නොපිරිසුදු කායකර්මාදිය ඇති බැවින් සුචිනොව ශංකාවෙන් සමන්විත ය වූ ප්‍රවෘත්ති ඇතියේ සැහවි ය යුතු වූ ක්‍රියා ව ඇතිවූයේ අශ්‍රමණ ව ශ්‍රමණ ප්‍රතිඥ ඇතියේ අබ්‍රහ්මචාරී ව බ්‍රහ්මචාරී ප්‍රතිඥ ඇත්තේ අන්තොපූතිවූයේ සදෙරින් වැහෙන කෙලෙසුන් විසින් තෙත්වූයේ කැලකට බඳු වූ සවභාව ඇතියේ ක්ෂත්‍රිය කන්‍යාවක හෝ බ්‍රාහ්මණ කන්‍යාවක හෝ ගෘහපති කන්‍යාවක හෝ ආලිඞ්ගන කෙරට හිඳුනේ හෝ වේ ද හෝනේ හෝ වේ ද යන යමෙක් ඇද් ද හෙ තෙම මහණෙනි! ඒ දුස්සීලයහට දීඝරාත්‍රියකට නෙවත් බොහෝ කලකට අහිත පිණිස දුක් පිණිස වෙයි. ශරීර භෙදයෙන් මරණින් මත්තෙහි අපාය දුර්ගති විනිපාත සංඛ්‍යාත නරකයෙහි උපදනේ ය යි වදාළ සේක. මේහි දු කුකුස් කරත හොත්—

ආරොචයාම් වො භික්ඛවෙ පවිවෙදයාම් වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීල්‍යස්ස පාප ධම්මස්ස අසුචිසංකස්සර සමාචාරස්ස පටිච්ඡන්න කම්මන්තස්ස අස්සමණස්ස සමණ පටිඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරී පටිඤ්ඤස්ස අන්තොපූතිස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං අම්හ මහන්තං අග්ගික්ඛන්ධං ආදිත්තං සම්පජ්ජලිතා සජොතිභූතං ආලිඞ්ගිත්වා උපනිසීදෙය්‍ය වා උපනිපජ්ජෙය්‍ය වා. තා කිස්සහෙතු? තතො නිදානං සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණ මත්තං වා දුක්ඛං. නත්වෙ ව තප්පච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනි පාතං නිරයං උපපජ්ජෙය්‍ය යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීල්‍යො පාපධම්මා අසුචිසඞ්කස්සර සමාචාරෝ පටිච්ඡන්න කම්මන්තො අස්සමණෝ සමණ පටිඤ්ඤු අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරි පටිඤ්ඤු අන්තොපූති අවස්සුතො කසම්බුජාතො ඛත්තිය කඤ්ඤං වා බ්‍රාහ්මණ කඤ්ඤං වා ගහපති කඤ්ඤං වා මුදු සලුන හත්ථ පාදං ආලිඞ්ගිත්වා උපනිසීදති වා උපනිපජ්ජති වා තං හිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති-යි.

යන ශ්‍රී මුඛ පාළිය ද පිරිත්සිය යුතු. මෙසේ ගිනිකඳ උපමාවෙන් සත්‍රින් පිළිබඳ පස්කම් ගුණයෙහි දුක් දක්වා මත් තෙහි ත් දුක් දක්වන මාහිසවාම් වූ බුදුරජතෙමේ මහණෙනි! ඒ කුමකැ යි සිතවි ද කවරෙක් උතුම් ද හෙවත් මහණෙනි! මහත් බලයෙන් යුක්ත පුරුෂයෙක් දැඩි වූ වාල රජ්ජුවෙන් හෙවත් වැලින් කරණ ලද තද කෲර වූ රුහාණකින් ජඞ්ඝාදෙක වෙලා ත්‍රිමකාරයකු සෙයින් හෝ ගිනි මඵන ය කරණ දණෙඩක වෙලන ලද ලණුවක් සෙයින් සිහින් කකුල්දෙක දැස වූ වාලරජ්ජුවෙන් වෙලා ඝර්ෂණ ය කෙරේ ද හෙවත් අදී ද එසේ අදිනා ඒ රුහාණතොමෝ ජඞ්ඝාවෙහි ඡවි ය සිදිනේ ය ඡවි ය සිද චම් සඞ්ඛ්‍යාත සම සිදිනේ ය. සම සිද මාංශ ය සිදිනේ ය. මාංශ ය සිද නහර සිදිනේ ය. නහර සිද අටසි සඞ්ඛ්‍යාත ඇට සිදිනේ ය. ඇට සිද ඇටමිදුලෙහි පැහැර සිටිනේ ය යන යමෙක් ඇද් ද ක්ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණ මහා සාරයන්ගේ හෝ ගෘහපති මහාසාරයන්ගේ හෝ අභිවාදන සඞ්ඛ්‍යාත වැඳීම් ඉවසිම ය යන යමෙක් ඇද් ද මේ දෙකින් කවරෙක් උතුම්දැ යි භික්ෂූන් වහන්සේගෙන් විමාරා වදාළ සේක ඊට ප්‍රතිවචන දෙන භික්ෂූන් වහන්සේ—

සවාමීන් වහන්ස! ක්ෂත්‍රිය මහාසාරයන්ගේ හෝ බ්‍රාහ්මණ මහාසාරයන්ගේ හෝ ගෘහපති මහාසරයන්ගේ හෝ වැඳීම් ඉවසි ම ය යන යමෙක් ඇද් ද ඒ උතුම. බලවත් පුරුෂයෙක් දැස වාල රජ්ජුවෙන් උභය ජඞ්ඝා වෙලා ඝර්ෂණ ය කෙරේ ද ඒ රුහාණ තොමෝ ඡවි ය සිදිනේ ය. ඡවි ය සිද චම් ය සිදි නේ ය. චම් ය සිද මස් සිදිනේ ය. මස් සිද නහර සිදිනේ ය. නහර සිද ඇට සිදිනේ ය. ඇට සිද ඇටමිදුලෙහි පැහැර සිටි නේ ය යන යමෙක් ඇද් ද මේ දුක් වන්නේ ය සි දන්වූ සේක් ලා ය.

එ කල්හි සද්ධම් ගඟා ප්‍රවාහ වූ සභීඥයන් වහන්සේ මහ ණෙනි! තොපට කියමි. මහණෙනි! තොපට හඟවමි. සීල ය නිත්‍ය හෙයින් දුසසීල වූ ලාමකසවනා ඇති නො පිරිසිදු කාය කම්දි ය ඇති ශඞ්කා ඇත්තා වූ ප්‍රතිච්ඡන්න වූ කම්මන්ත ඇති අශ්‍රමණ ව ශ්‍රමණ ප්‍රතිඥ ඇති අබ්‍රහ්මචාරී ව බ්‍රහ්මචාරී ප්‍රතිඥ ඇති අන්තඃපූති වූ කෙලෙසුන් විසින් තෙත් වූ කුවචර සවභා ඇති ඒ දුශ්ශීලයාහට යම් සේ බලවත් පුරුෂයෙක් දැස වූ වාල රජ්ජුයෙන් ජඞ්ඝාදෙක වෙලා මත රුහාණ මෙන් ඇද ඝර්ෂණ ය කරණ ඒ රුහාණ තොමෝ ඡවි ය සිදිනේ ය. ඡවිය සිද සම

සිදිනේ ය. සම සිද මස් සිදිනේ ය. මස් සිද නහර සිදිනේ ය. නහර සිද ඇට සිදිනේ ය. ඇට සිද ඇටමිදුළෙහි පැහැර සිටිනේ ය යන යමෙක් ඇද්ද මේ උතුම. රට කාරණා කවරේ ද—

මහණෙනි! ඒ වාළ රජ්ජුවෙන් ඝාතණය කිරීම් හේතු කොටගෙණ ඒ දුශ්ශීල තෙමේ මරණයට නෝ පැමිණෙ සි. මරණ හා සම දුකට නෝ පැමිණෙ සි. මරණින් මත්තෙහි ඒ දෙෂයෙන් අපායෙහි නො උපදනේ ය. මහණෙනි! ඒ දුශ්ශීල තෙමේ පවිටු වූ සවභාව ඇත්තේ නො පිරිසිදු කායකර්මාදීන් ඇති බැවින් සුවිනොව ශඞ්කාවෙන් සමරණීය වූයේ ප්‍රතිච්ඡන්න කර්මඇත්තේ අශ්‍රමණ ව ශ්‍රමණ ප්‍රතිඥ ඇත්තේ අබ්‍රහ්මචාරී ව බ්‍රහ්මචාරී ප්‍රතිඥ ඇත්තේ අන්තොපූති වූයේ කෙලෙසුන් විසින් තෙත් වූයේ කුවවරසවභා ඇත්තේ ක්ෂත්‍රිය මහාසාලයන්ගේ, නෝ බ්‍රාහ්මණ මහාසාලයන්ගේ නෝ ගෘහපති මහාසාලයන්ගේ නෝ අභිවාදන සඞ්ඛ්‍යාත වැදිම් ඉවසීමෙක් ඇද්ද නෙ තෙම මිහ ණෙනි! ඒ දුශ්ශීලයහට බොහෝ කලක් අහිතයට දුකඛයට කාරණා වන්නේ ය මරණින් මත්තෙහි නරකයෙහි උපදනේ ය සි වදාළ සේක. මෙහි දු සැක ඇත නොන්—

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො වරං යං බල වා පුරිසො දළහාය වාළ රජ්ජුයා උභොජඞ්ඝෙ වෙඨෙත්වා ඝංසෙය්‍ය සා ඡවිං ඡින්දෙය්‍ය ඡවිං ඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය චම්මං ඡෙත්වා මංසං ඡින්දෙය්‍ය මංසං ඡෙත්වා නහාරුං ඡින්දෙය්‍ය නහා රුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච නිට්ඨෙය්‍ය. යං ඛත්තිය මහා සාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා අභිවාදනං සාදියෙය්‍යාති, එතදෙව භන්තෙ වරං යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලා නං වා ගහපති මහාසාලානං වා අභිවාදනං සාදියෙය්‍ය දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසො දළහාය වාළරජ්ජුයා උභො ජඞ්ඝෙ වෙඨෙත්වා ඝංසෙය්‍ය, සා ඡවිං ඡින්දෙය්‍ය ඡවිං ඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය චම්මං ඡෙත්වා මංසං ඡින්දෙය්‍ය මංසං ඡෙත්වා නහාරුං ඡින්දෙය්‍ය නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය අට්ඨිං ඡෙත්වා අට්ඨි මිඤ්ජං ආහච්ච තිට්ඨෙය්‍යාති.

ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචි සඞ්කස්සර සමාචාරස්ස පටිච්ඡන්න කම්මන්තස්ස අස්සමණස්ස සමණ පටිඤ්ඤ ස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරි පටිඤ්ඤස්ස අන්තොපූතිස්ස අවස්සු

තස්ස කසම්බ්‍රජාතස්ස යං බලවා පුරිසෝ දළ්හාය වාළ රජ්ජුයා උභෝ ජණ්ණු වෙඨෙත්වා ඝංසෙය්‍ය. සා ඡවිං ඡින්දෙය්‍ය ඡවිං ඡෙත්වා චම්මං ඡින්දෙය්‍ය චම්මං ඡෙත්වා මංසං ඡින්දෙය්‍ය මංසං ඡෙත්වා නහාරුං ඡින්දෙය්‍ය නහාරුං ඡෙත්වා අට්ඨිං ඡින්දෙය්‍ය අට්ඨිං ඡෙත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච නිට්ඨෙය්‍යං තං කිස්ස හෙතු ?

තතෝ නිදානං හි සෝ භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. නත්වෙව තපපච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යඤ්ච ඛෝ සෝ භික්ඛවෙ දුස්සීලෝ පාපධම්මෝ අසුචි සංකස්සර සමාචාරෝ පටිච්ඡන්න කම්මන්තෝ අස්සමණෝ සමණ පටිඤ්ඤු අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරී පටිඤ්ඤු අන්තොපූති අවස්සුතෝ කසම්බු ජාතෝ බහූනං මහාසාළානං වා බ්‍රාහ්මණ මහාසාළානං වා ගහපති මහාසාළානං වා අභිවාදනා සාදියති, තංභිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති-සි.

යන ශ්‍රී මුඛ පාළි ය හා තත්ප්‍රතිවචන ශ්‍රාවක භාසිත ය ද පිරික්සිය යුතු. ඉක්බිත්තෙන් කෙලශඤ්ඤ නිම්නපණ සද්ධම් මෙඤ වූ සම්බුදුරජාණන් වහන්සේ මහණෙනි! ඒ කුමක් සි හහිවි ද කවරෙක් උතුම් ද හෙවත්, යම් බලවත් පුරුෂයෙක් තෙල් සණ ලූ අඩයටියෙන් හෙවත් තෙල්හණෙහි ගා යහපත්කොට මුවහත් කළ අඩයටි ය සි කියන ලද එනම් ආයුධයෙකින් ළය මැද පහරනේ ය යන යමෙක් ඇද් ද, ක්ෂත්‍රිය මහාසාලයන්ගේ හෝ බ්‍රාහ්මණ මහාසාලයන්ගේ හෝ ගෘහපති මහාසාලයන්ගේ හෝ අඤ්ජලිකම් සඞ්ඛ්‍යාත ඇඳිලි බැඳීම් ඉවසීම ය යන යමෙක් ඇද් ද මේ දෙකින් කවරෙක් නම් උතුම්දැ සි භික්ෂූන් කෙරෙන් විචාරා වදාළ සේක. ඊට ප්‍රතිවචන දෙන භික්ෂූන් වහන්සේ සවා මීන් වහන්ස! ක්ෂත්‍රිය මහාසාලයන්ගේ හෝ බ්‍රාහ්මණ මහාසාලයන් ගේ හෝ ගෘහපති මහාසාලයන්ගේ හෝ ඇඳිලි බැඳීම් ඉවසීම ය යන යමෙක් ඇද් ද මේ උතුම්. තෙල් සැණලූ අඩයටියෙන් ළමැද හෙළා ඇණීම ය යන යමෙක් ඇද් ද මේ දුක් ය සි දන්වූ සේක් ලා ය.

ඒ කල්හි තීර්ථක තිමිර නිකර විධ්වංශන දිනකර රාජ වූ සම්බුදුරජාණන් වහන්සේ මහණෙනි! තොපට ආරොචන ය කෙරෙම් මහණෙනි! තොපට ප්‍රතිවෙද ය කෙරෙම්. දුස්සීල වූ පාප සවභා ඇති ඒ සුවිතොව ශඞ්කාවෙන් සමරණීය වූ ප්‍රවෘත්ති ඇති සැඟවි ය යුතු ක්‍රියා ඇති අශ්‍රමණ ප්‍රතිඥ ඇති

අබ්‍රහ්මචාරී ව බ්‍රහ්මචාරී ප්‍රතිඥ ඇති දුස්සීල නෙයින් අන්‍යොන්‍ය පූති වූ සඳෙරින් වැහෙන කොළෙසුන් කෙරෙන් තෙත් වූ කසළකට බඳු වූ සවභාව ඇති ඒ දුස්සීලයහට යම් බලවත් පුරුෂයෙක් තෙල් සැණ ලූ අඩයටියෙන් පවේචාර සඞ්ඛ්‍යාත ළමැද පැහැරීම යන යමෙක් ඇද්ද මේ උත්තම. ඊට කාරණා කිමි යත්?

මහණෙනි! ඒ අඩයටියෙන් ළමැද ඇණීම හේතු කොට ගෙණ ඒ මහණහෙමේ මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණ යහා සම වූ දුකට හෝ පැමිණෙන්නේ ය. ඒ අඩයටියෙන් ළමැද පැහැරීම ප්‍රත්‍ය ය කොට ගෙණ මරණින් මත්තෙහි අපායෙහි නො උපදනේ ය. දුස්සීල වූ ලාමක සවභාව ඇති නො පිරිසිදු හෙයින් ශංකාවෙන් සමරණීය වූ ප්‍රවෘත්ති ඇති ප්‍රතිච්ඡන්න කම් ඇති අශ්‍රමණ ව ශ්‍රමණ ප්‍රතිඥ ඇති අබ්‍රහ්මචාරී ව බ්‍රහ්මචාරී ප්‍රතිඥ ඇති ඇතුළෙහි කුණු වූ කෙළෙසුන් විසින් තෙත් වූ කසළකට බඳු වූ සවභාව ඇති ඒ දුශ්ශීල තෙමේ ක්ෂත්‍රිය මහාසාල යන්ගේ හෝ බ්‍රාහ්මණ මහාසාලයන්ගේ හෝ ගෘහපති මහාසාල යන්ගේ හෝ ඇඳිලි කම් ය ඉවසීම් ය යන යමක් ඇද්ද ඒ වනාහි මහණෙනි! ඒදුශ්ශීලයහට චිරාන් කාලයක් මුළුල්ලෙහි අහිතයට දුකඛයට කාරණා වන්නේ ය. මරනින් මත්තෙහි නරකයෙහි උපදනේ යැ යි වදාළ සේක. මෙහි දී සැක හරණා පිණිස—

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛෝ වරං යං බලවා පුරිසෝ තිණහාය සත්තියා තෙලඩොතාය පවෙචාරසම්පං පහරෙය්‍ය, යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා අඤ්ජලිකම්මං සාදියෙය්‍යාති. එතදෙව භන්තෙ වරං යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා අඤ්ජලිකම්මං සාදියෙය්‍ය. දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසෝ තිණහාය සත්තියා තෙලඩොතාය පවෙචාරසම්පං පහරෙය්‍යාති.

ආරොචයාමි වෝ භික්ඛවෙ පටිවෙදයාමි වෝ භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචි සංකස්සර සමාචාරස්ස පටිච්ඡන්න කම්මන්තස්ස අසසමණස්ස සමණ පටිඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරී පටිඤ්ඤස්ස අන්‍යොන්‍යපූතිස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං බලවා පුරිසෝ තිණහාය සත්තියා තෙලඩොතාය පවෙචාරසම්පං පහරෙය්‍ය. තං කිස්සහෙතු? තතොනිදානං හි සෝ භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. තඤ්චෙව තපපච්චයා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යඤ්ච ඛෝ සෝ භික්ඛවෙ දුස්සීලෝ පාප ධම්මෝ අසුචිසංකස්සර සමාචාරෝ පටිච්ඡන්න

කම්මනෙතා අසඤ්ඤමෙතා සමණ පටිඤ්ඤඤ්ඤ අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරී පටිඤ්ඤඤ්ඤ අඤ්ඤතෙතා අසඤ්ඤතෙතා කසම්බුජාතෙතා ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා අඤ්ඤතරමමං සාදියති, තං හිස්ස හිතාය දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති-සි.

යන ශ්‍රී මුඛ පාළිය හා ශ්‍රාවක භාෂිත ය ද විභාග කට යුතු. තදනන්තරයෙන් සත්‍යප්‍රතිවේධාදක ඤණතර මෝහ තිමිර නිකර විධ්වංශන අසිසිර කිරණ වූ සම්බුදුරජාණන් වහන්සේ මහණෙනි! ඒ කුමක්‌ කැ සි ගතු ද කවරෙක්‌ උතුම් ද හෙවත් යම් බලවත් පුරුෂයෙක්‌ රත්කරණ ලද එ හෙයින් ම ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිභූත වූ ය පවින් ශරීර ය හාන්පසින් වෙළන්නේ ය යන යමෙක්‌ ඇද් ද, ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන්ගේ ශ්‍රද්ධාවෙන් දෙන ලද සිවුරු වළඳින්නේ ය යන යමෙක්‌ ඇද් ද, මහණෙනි! මේ දෙකින් කවරෙක්‌ උතුම්ද සි විචාරා වදාළ සේක. එයට ප්‍රතිවචන දෙන භික්ෂූන් වහන්සේ ස්වාමීන් වහන්ස! ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී ශ්‍රද්ධාවන්තයන්ගේ සිවුරු වැළඳ ගැන්ම උතුම්. ගිනි ගෙණ දිලිහෙණ ය පවින් සියලු ශරීර ය වෙළීම ය යන යමෙක්‌ ඇද් ද මේ දුෂ්කර ය සි දන්වූ සේක්‌ ලා ය.

එ කල්හි ත්‍රෛලොක්‍යාම්බර නරනාරී භ්‍රමර නිසෙවිත ශ්‍රීපාද රම්භෙපසොභිත වූ සම්බුදුරජාණන් වහන්සේ මහණෙනි! තොපට ආරොචන ය කෙරෙමි. මහණෙනි! තොපට ප්‍රතිවෙද ය කෙරෙමි. දුස්සිල වූ පාපසමාචාර ය ඇති අසුචි සංකස්සර සමාචාර වූ ප්‍රතිච්ඡන්න කර්ම ඇති අශ්‍රමණ ව ශ්‍රමණ ප්‍රතිඥ ඇති අබ්‍රහ්මචාරී ව බ්‍රහ්මචාරී ප්‍රතිඥ ඇති අන්තොපූති වූ කෙළෙසුන් විසින් තෙත් වූ කසාවත සමාචාර ඇති ඒ දුස්සීලයාහට බලවත් පුරුෂයෙකු විසින් රත්කරණ ලද එ හෙයින් ම ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝතිභූත වූ ය පවින් සියලු ශරීර ය වෙළීම ය යන යමෙක්‌ ඇද් ද මේ උතුම්. ඊට කාරණා කවරේ ද?

මහණෙනි! ඒ රත් වූ යපවින් සියලු ශරීරයෙහි වෙළීම හේතු කොට ගෙණ ඒ මහණතෙම මරණයට හෝ පැමිණෙන්නේය. මරණ ය හා සම දුකට හෝ පැමිණෙන්නේ ය. ඒ ය පවින් සියලු ශරීර ය වෙළීමෙහි දෙඅයකින් මරණින් මත්තෙහි නරකයෙහි නූපදනේ ය. මහණෙනි! දුස්සීලාදී දෙඅයෙන් යුක්ත වූ ඒ මහණතෙමේ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී ශ්‍රද්ධාවන්තයන්ගේ සිවුරු වැළඳීම ය යන යමෙක්‌ ඇද් ද, හෙතෙම මහණෙනි! ඒ දුස්සීලයහට

චිරකාලයක් මුළුල්ලෙහි අහිතයට දුකඛයට කාරණා වන්නේ ය. කා ඔබ් මරණින් මත්තෙහි අපාය දුගති විනිපාත සඞ්ඛ්‍යාත නරකයෙහි උපදනේ ය යි වදාළ සේක. මේහි කුකුස් කරත හොත්-

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමඤ්ඤු ඛො වරං යං බලවා පුරිසො තත්තෙන අයොපට්ටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍ය, යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධා දෙය්‍යං චීවරං පරිභුඤ්ජෙය්‍යාසි. එතදෙව භන්තෙ වරං යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධා දෙය්‍යං චීවරං පරිභුඤ්ජෙය්‍ය, දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසො තත්තෙන අයොපට්ටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍යාසි. ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචි සංකස්සර සමාචාරස්ස පටිච්ඡන්න කම්මන්තස්ස අස්සමණස්ස සමණ පටිඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරි පටිඤ්ඤස්ස අන්තොපූතිනස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං බලවා පුරිසො තත්තෙන අයොපට්ටෙන ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජොතිභූතෙන කායං සම්පලිවෙඨෙය්‍ය. තං කිස්ස හෙතු?

තතො නිදානං හි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. නත්වෙව තප්පච්චයා කායස්ස භෙදා පර මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය. යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො පාපධම්මො අසුචිසංකස්සර සමාචාරො පටිච්ඡන්න කම්මන්තො අස්සමණො සමණ පටිඤ්ඤු අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරී පටිඤ්ඤු අන්තොපූති අවස්සුතො කසම්බුජාතො යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහා සාලානං වා සද්ධාදෙය්‍යං චීවරං පරිභුඤ්ජති, තං කිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති.

යනු දු පිරික්සිය යුතු. තදනන්තරයෙන් කෘරතීජීක ගජ කුම්භ විදාරණ ප්‍රවර සිංහරාජ වූ සම්බුදුරජාණන් වහන්සේ මහණෙනි! මේ කුමකැ යි හඟු ද කවරෙක් උතුම් ද හෙවත් යම් බලවත් පුරුෂ යෙක් රත්කරණ ලද එ හෙයින් ම ආදීප්ත වූ සම්ප්‍රජ්වලිත වූ සජෝ තිභූත වූ යහඞ්ගුවෙන් මුඛ ය විවරකොට හාත්පසින් ගිනිගෙණ දිලිහෙන ලොහොං ගුලි මුඛයෙහි බහාලා ද එ කල්හි ඒ ය වට ය ඔහු ගේ ඔෂ්ඨ ය ද දවන්නේ ය. දිව ද දවන්නේ ය. ග්‍රීව ය ද දවන්නේ ය.

ළය ද දවන්නේ ය. අහන ය ද අතුණු ඛාණ ද දුගෙණ අධෝ භාගයට නික් මෙන්නේ ය. යන යමෙක් ඇත් ද ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී වූ ශ්‍රද්ධාවන්තයන් විසින් දෙන ලද මධුර වූ ආහාර වැළදීම ය යන යමෙක් ඇත් ද මේ දෙකින් කවරෙක් උතුම්ද යි විමාරා වදාළ සේක.

එයට ප්‍රතිවචන දෙන භික්ෂූන් වහන්සේ ස්වාමීනි! ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් විසින් දෙන ලද ආහාර වැළදීම ය යන යමෙක් ඇත්ද මේ උතුම්. ගිනිගෙණ දිලිහෙණ ය හඬුවෙන් බලවත් පුරුෂයෙක් මුඛ ය විවෘත කොට ගිනිගෙණ දිලිහෙන ය ගුලි මුඛයෙහි ප්‍රක්ෂෙප කරන්නේ ය. හෝ ඔහුගේ ඔෂ්ඨාදි ය දවා අධෝභාගයට නික් මෙන්නේ ය. යන යමෙක් ඇත් ද මේ දුක් ය යි දැන් වූ සේක් ලා ය. එ කල්හි සර්ලෝකානුකම්පක වූ සර්ඥයන් වහන්සේ මහණෙනි! තොපට ආරොචන ය කෙරෙමි. මහණෙනි! තොපට ප්‍රතිවෙද ය කෙරෙමි. දුශ්ශීලාදි දොෂයෙන් යුක්ත වූ ඒ මහණහු බලවත් පුරුෂ යෙකු විසින් ගිනිගෙණ දිලිහෙණ යහඬුවෙන් මුඛ ය විවෘතකොට ගිණිගෙණ දිලිහෙණ ය ගුලි මුඛයෙහි ප්‍රක්ෂෙප කරන්නේ ය. ඒ ඔහුගේ ඔෂ්ඨාදි ය දවා අධෝභාගයට යන්නේ ය, යන යමෙක් ඇත් ද ඒ උතුම්. ඊට කාරණා කවරේ ද.

මහණෙනි! ඒ ය ගුලි වැළදීම හේතුකොට ගෙණ ඒ මහණ තෙම මරණයට හෝ පැමිණෙන්නේ ය. මරණ හා සම දුකට හෝ පැමිණෙන්නේ ය. ඒ ය ගුලි වැළදීමෙහි දොෂයකින්. මරණින් මත්තෙහි අපායෙහි නූපදනේ ය. මහණෙනි! දුස්සීල වූ ඒ මහණ තෙම ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදි ශ්‍රද්ධාවන්තයන් විසින් දෙන ලද ආහාර වැළදීම ය යන යමෙක් ඇත් ද ඒ ආහාර වැළදීම ඒ දුස්සීලයාහට බොහෝ කාලයකට අහිතයට දුකඛයට කාරණා වන්නේ ය. මරණින් මත්තෙහි නරකයෙහි උපදනේ යැ යි වදාළ සේක. මේ හි දුකුස් හරණා පිණිස—

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛෝ වරං යං බලවා පුරිසෝ තතෙනන අයොසඞ්කුනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජෝති භූතෙන මුඛං විවරිත්වා තත්තං ලොහගුලං ආදිත්තං සම්පජ්ජලිතං සජෝතිභූතං මුඛෙ පක්ඛිපෙය්‍ය, තං තස්ස ඔට්ඨම්පි ඩහෙය්‍ය මුඛම්පි ඩහෙය්‍ය ජිව්හම්පි ඩහෙය්‍ය කණ්ඨම්පි ඩහෙය්‍ය උදරම්පි ඩහෙය්‍ය අන්තම්පි අන්තගුනම්පි ආඩාය අධෝ භාගා නික්ඛමෙය්‍ය. යං ඛත්තිය මහා සාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජෙය්‍යාති. එත දෙව භන්තෙ වරං යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහා සාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජෙය්‍ය.

දුක්ඛං නෙතං භන්තෙ යං බලවා පුරිසෝ තත්තෙන අයෝ සඞ්කූනා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජෝති භූතෙන මුඛං විවරිත්වා තත්තං ලොහගුළං ආදිත්තං සම්පජ්ජලිතා සජෝති භූතං මුඛෙ පක්ඛිපෙය්‍ය තං තස්ස ඔට්ඨම්පි ඩහෙය්‍ය මුඛම්පි ඩහෙය්‍ය ජිව්හම්පි ඩහෙය්‍ය කණ්ඨම්පි ඩහෙය්‍ය උදරම්පි ඩහෙය්‍ය අන්තම්පි අන්තගුණම්පි ආඩාය අධෝ භාගා නික්ඛමෙය්‍යාති.

ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචි සංකස්සර සමාචාරස්ස පටිච්ඡන්න කම්මන්තස්ස අස්සමණස්ස සමණ පටිඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරී පටිඤ්ඤස්ස අන්තොපූතිනිස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං බලවා පුරිසෝ තත්තෙන අයෝ සඞ්කූනා මුඛං විවරිත්වා තත්තං ලොහගුළං ආදිත්තං සම්පජ්ජලිතං සජෝතිභූතං මුඛෙ පක්ඛිපෙය්‍ය, තං තස්ස ඔට්ඨම්පි ඩහෙය්‍ය මුඛම්පි ඩහෙය්‍ය ජිව්හම්පි ඩහෙය්‍ය කණ්ඨම්පි ඩහෙය්‍ය උදරම්පි ඩහෙය්‍ය අන්තම්පි අන්තගුණම්පි ආඩාය ආඩොභාගා නික්ඛමෙය්‍ය. තං කිස්ස හෙතු? තතො නිදානං හි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණ මත්තං වා දුක්ඛං. නත්වෙව තපපච්චයා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය.

යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො පාපධම්මො අසුචි සංකස්සර සමාචාරො පටිච්ඡන්න කම්මන්තො අස්සමණො සමණ පටිඤ්ඤු අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරී පටිඤ්ඤු අන්තොපූති අවස්සුතො කසම්බුජාතො යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං පිණ්ඩපාතං පරිභුඤ්ජති, තං හිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති-සි යත්‍රු දූ පිරික්සිය යුතු.

ඉක්බිත්තෙන් අෂ්ටලෝක ධර්‍ම වාත විකම්පිත ගිරිරාජ වූ සර්‍වඥ රාජෝත්තමයාණන් වහන්සේ මහණෙනි! ඒ කුමක ය හතු ද කවරෙක් උතුම් ද හෙවත් බලවත් පුරුෂයෙක් ගිනි ය හෝ ගෙණ ගත හෝ ගෙණ ගිනිතෙණ දිලිහෙන ලොහොඑ ඇදක හෝ ලොහොඑ පුටුවෙක හෝ හිඳුවන්නේ ද හොවන්නේ ද යන යමෙක් ඇත් ද සැදැහැති ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් විසින් දෙන ලද ඇඳ පුටුයෙහි හිඳිනේ ය, හෝනේ ය, යන යමෙක් ඇත් ද මේ දෙකින් කවරෙක් උතුම් දැ යි විචාරා වදාළ සේක් එයට ප්‍රතිවචන දෙන භික්‍ෂූන් වහන්සේ සවාමීනි! ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් විසින් දෙන ලද මඤ්ච පීඨයෙහි හිඳීම ය හොවීම ය යන යමෙක් ඇත් ද මේ උතුම්. බලවත් පුරුෂයෙක්

ගිහි ය හෝ පෙණ කද හෝ පෙණ ගිනිපෙණ දිලිහෙන අයොපිඨ අයොමුඟුරුකයෙහි හිඳුවීම ය හොවීම ය යන යමෙක් ඇත් ද මේ දුක් ය යි දැන්වූ සේක් ලා ය.

එ කල්හි සද්ධම් කුසුම් ඵල සම්පන්නාත කල්පදුම් වූ සළු ඳුයන් වහන්සේ මහණෙනි! තොපට ආරොචන ය කෙරෙමි මහණෙනි! තොපට ප්‍රතිවේද ය කෙරෙමි යි. දුස්සීලාදී වූ දෙශ සහිත වූ එ තෙම ගිනිපෙණ දිලිහෙන අයොමුඟුරුවාදියෙහි බලවත් පුරුෂයන්හු විසින් හිඳුවීම ය හොවීම ය යන යමෙක් ඇත් ද මේ උපමි. ඊට හේතු කවරේ ද? මහණෙනි! ගිනිගෙන දිලිහෙණ අයොපිඨාදියෙහි හිඳුවීම ය හොවීම ය යන යමෙක් ඇද් ද ඒ කාරණ ය නිසාකොට පෙණ ඒ මහණතෙම මරණයට හෝ පැමිණෙන් නේ ය. මරණ හා සම දුකට හෝ පැමිණෙන්නේ ය. එහි දෙශ යකින් මරණින් මත්තෙහි නරකයෙහි නො උපදනේ ය. ඒ දුශ් ශීලතෙම ශ්‍රද්ධාවන්තයන් විසින් දෙන ලද හැඳ පුටුයෙහි හිඳීම ය හොවීම ය යන යමෙක් ඇත් ද හෙතෙම ඒ දුස්සීලයාහට බොහෝ කලක් අහිතයට දුකඛයට කාරණා වන්නේ ය. මරණින් මත්තෙහි අපාය දුගති විනිපාත සංඛ්‍යාත නරකයෙහි උපදවන්නේ යැ යි වදළ සේක. මේහි දී කුකුස් හරණා පිණිස—

තං කිම්මඤ්ඤථ භික්ඛවෙ කතමන්නු ඛො වරං යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා අයොමුඟුරුවං වා අයොපිඨං වා ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අභිනිසීදාපෙය්‍ය වා අභිනිපජ්ජාපෙය්‍ය වා යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං මුඟුවපිඨං පරිභුඤ්ජෙය්‍යාසි. එතදෙව භන්තෙ වරං යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං මුඟුව පිඨං පරිභුඤ්ජෙය්‍ය, දුක්ඛං හෙතුං භන්තෙ යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා ඛන්ධෙ වා ගහෙත්වා තත්තං අයොමුඟුරුවං වා අයොපිඨං වා ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අභිනිසීදාපෙය්‍ය වා අභිනිපජ්ජාපෙය්‍ය වා—

ආරොචයාමි වො භික්ඛවෙ පටිවෙදයාමි වො භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචි සංකස්සර සමාචාරස්ස පටිච්ඡන්න කම්මන්තස්ස අස්සමණස්ස සමණ පටිඤ්ඤස්ස අබ්‍රහ්ම චාරිස්ස බ්‍රහ්මචාරි පටිඤ්ඤස්ස අන්තො පූතිස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං බලවා පුරිසො සීසෙ වා ගහෙත්වා තත්තං අයොමුඟුරුවං වා අයොපිඨං වා ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං අභිනිසීදාපෙය්‍ය වා අභිනිපජ්ජාපෙය්‍ය වා තං කිස්සහෙතු?

තතො නිදානං හි සො භික්ඛවෙ මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං. නච්චෙව තපපච්චයා කායස්සභෙදා පර මමරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජෙය්‍ය.

යඤ්ච ඛො සො භික්ඛවෙ දුස්සීලො පාපධම්මො අසුචි සංකස්සර සමාචාරො පටිච්ඡන්න කම්මන්තො අස්සමණෙ සමණ පටිඤ්ඤු අබ්‍රහ්මචාරි බ්‍රහ්මචාරි පටිඤ්ඤු අන්තොපූති අවස්සුතො කසම්බුජාතො යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං මඤ්චපීඨං පරිභුඤ්ජති තං හිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති—යි.

යන්නූ ඊ පිරික්සිය යුතු. ඉක්බිත්තෙන් වෙනෙක ජන කෙෞම ද වන ප්‍රබොධන කාරාපනි නිර්විශෙෂ වූ සර්ඥයන් වහන්සේ මහණෙනි! බලවත් පුරුෂයෙක් අඩොශිඕ කොට ගෙන හෙවත් ඉස යටකොට ගෙණ කකියන ලොහොකුඹු නරකයෙහි ප්‍රක්ෂෙප කරන්නේ ද හෙ තෙම පෙණ නග නගා පැසෙන්නේ ය. එක්වටෙක ඌර්ධ්වභාගයට නැගෙන්නේ ය. එක් වටෙක අධොභාගයට බස් නේ ය. එක්වටෙක සරසට යන්නේ ය යන යමෙක් ඇද්ද, ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී ශ්‍රද්ධාවන්තයන් විසින් පිළිගන්වන ලද සෙනසුන් පරිභොග කරන්නේ ය යන යමෙක් ඇද්ද, මේ දෙකින් කවරෙක් උතුම්ද යි විචාරා වදාළ සේක. එයට ප්‍රතිවචන දෙන භික්ෂූන් වහන්සේ සවාමීන් වහන්ස! ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදී ශ්‍රද්ධාවන්තයන් විසින් පිළිගන් වන ලද සෙනසුන් පරිභොග කිරීම උතුම. බලවත් පුරුෂ යෙක් අධොශිඕ කොට ගෙණ කකියන ලොහොකුඹු නරකයෙහි බහා ලන්නේ ද හෙ තෙම පෙණ නැගි නැගී පැසෙන්නේ ය. එක්වටෙක ඌර්ධ්වභාගයට යන්නේ ය එක් වටෙක අධොභාගයට යන්නේ ය එක්වටෙක සරසට යන්නේය යන යමෙක් ඇද්ද මේ අතිශයින් දුක්වන්නේ ය සිදුන් වූ සේක් ලා ය. එ කල්හි ඍග්ලෙශ ගජකුම්භ විදාරණ මෘගරාජ වූ සර්ඥ යන් වහන්සේ මහණෙනි! තෙපි සැපදුක් දෙකෙහි පමණ නො දන්නාහු ද මහණෙනි! දුස්සීල වූ ඒ මහණුනට බලවත් පුරුෂයෙක් අධොශිඕකොට ගෙණ කකියන ලොහොකුඹු නරකයෙහි බහාලීම උතුම්. ඉට කාරණා කවරේ ද?

මහණෙනි! ඒ දුස්සීලතෙම බලවත් පුරුෂයෙකු විසින් කකියන ලෝහ කුම්භියෙහි බහාලීමෙන් මරණට හෝ මරණ සම දුකට හෝ පැමිණෙ යි. එහි දැමූ අෙෂයකින් නරකයට නො

යන්නේ ය. ශ්‍රද්ධාවන්න වූ ක්ෂත්‍රිය බ්‍රාහ්මණාදීන් විසින් දෙන ලද සෙනාසන පරිභොග කළ දෝෂය ඔහුට බොහෝ කලකට අහිතයට දුකඛයට කාරණා වන්නේ ය. මරණින් මත්තෙහි නරකයෙහි උපදවන්නේ ය සි වදළ සේක.

මෙහි දු කුකුස් හරණා පිණිස-

තං භික්ඛවේ තතමිනාහු ඛෝ වරං යං බලවා පුරිසෝ උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජෝතිභූතාය සෝ තත්ථ ඒණ්ඩෙදෙහකං පච්චමානෝ සකිම්පි උද්ධං ගවෙජ්ඣය්‍ය සකිම්පි අධෝ ගවෙජ්ඣය්‍ය සකිම්පි තිරියං ගවෙජ්ඣය්‍ය, යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධා දෙය්‍යං විහාරං පරිභුඤ්ජය්‍යානි. එතදෙව භන්තෙ වරං යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලානං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජය්‍ය. දුක්ඛං හෙතං භන්තෙ යං බලවා පුරිසෝ උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහ කුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජෝතිභූතාය, සෝ තත්ථ ඒණ්ඩෙදෙහකං පච්චමානෝ සකිම්පි උද්ධං ගවෙජ්ඣය්‍ය සකිම්පි අධෝ ගවෙජ්ඣය්‍ය සකිම්පි තිරියං ගවෙජ්ඣය්‍යානි.

ආරොචයාමි වෝ භික්ඛවෙ පටිවෙදයාමි වෝ භික්ඛවෙ යථා එතදෙව තස්ස වරං දුස්සීලස්ස පාපධම්මස්ස අසුචිසංකස්සර සමාචාරස්ස පටිච්ඡන්න කම්මන්තස්ස අස්සමණස්ස සමණ පටිඤ්ඤස්ස අබ්‍රහ්මචාරිස්ස බ්‍රහ්මචාරි පටිඤ්ඤස්ස අන්තොපූතිස්ස අවස්සුතස්ස කසම්බුජාතස්ස යං බලවා පුරිසෝ උද්ධපාදං අධෝ සිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපෙය්‍ය ආදිත්තාය සම්පජ්ජලිතාය සජෝතිභූතාය, සෝ තත්ථ ඒණ්ඩෙදෙහකං පච්ච මානෝ සකිම්පි උද්ධං ගවෙජ්ඣය්‍ය සකිම්පි අධෝ ගවෙජ්ඣය්‍ය සකිම්පි තිරියං ගවෙජ්ඣය්‍ය. තං කිස්සහෙතු? තතෝ හිධානං හි සෝ භික්ඛවෙ මරණං වා නිගවෙජ්ඣය්‍ය මරණ මත්තං වා දුක්ඛං. නහෙව තපපච්චයා කායස්සභෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජය්‍ය.

යඤ්ච ඛෝ සෝ භික්ඛවෙ දුස්සීලෝ පාපධම්මෝ අසුචි සංකස්සර සමාචාරෝ පටිච්ඡන්න කම්මන්තෝ අස්සමණෝ සමණ පටිඤ්ඤු අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරි පටිඤ්ඤු අන්තොපූති අවස්සුතෝ කසම්බුජාතෝ යං ඛත්තිය මහාසාලානං වා බ්‍රාහ්මණ මහාසාලා නං වා ගහපති මහාසාලානං වා සද්ධාදෙය්‍යං විහාරං පරිභුඤ්ජති තං හිස්ස භික්ඛවෙ හොති දීඝරත්තං අහිතාය දුක්ඛාය. කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති-සි.

යනු දු පිරික්සිය යුතු. මෙසේ අති කර්‍ශ දුකඛදයක බැහිනු දු මනාකොට ම බ්‍රහ්මචර්‍යාවෙහි හික්මී ය යුතු සි. යම් කෙණෙකුන්ගේ චීවර පිණ්ඩපාත සේනාසන ගිලානප්‍රත්‍ය ය සඞ්ඛ්‍යාත චතුර්විධ ප්‍රත්‍ය ය අප විසින් පරිභොග කරණු ලැබේ ද අපි දුස්සීල ව විසූ කල ඔවුන්ට ඒ ප්‍රත්‍යයෙන් මහත් ඵල මහානිසංස නොවෙසි. ඒ කාරණයෙනු දු අප විසින් මනාකොට හික්මිය යුතු ය. ආත්මාර්‍ථ ය පිණිස හෝ පරාර්‍ථ ය පිණිස හෝ උභයාර්‍ථ ය පිණිස හෝ බ්‍රහ්මචර්‍යා ව මනාකොට හික්මී ය යුතු යැ සි සිතා ද, බ්‍රහ්මචර්‍යාවෙහි මනාකොට හික්මී ය යුතු යැ සි යනු දක්වන්නට වදළහ.

තසමාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං, යෙසඤ්ච මයං පරිභුඤ්ජාම චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය හෙසජ්ජ පරික්ඛාරං තෙසන්තෙකාරා මහප්ඵලා භවිස්සන්ති මහානිසංසා. අම්හාකා වෙවාසං පබ්බජ්ජා අවඤ්ඣා භවිස්සති සඵලා සඋදයාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං, අත්තත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අපපමාදෙන සම්පාදෙතුං, පරත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අපපමාදෙන සම්පාදෙතුං, උභයත්ථං වා භික්ඛවෙ සම්පස්සමානෙන අලමෙව අපපමාදෙන සම්පාදෙතුං-සි.

මෙසේ මේ නිගාඨක වූ අඟුලිකඛන්ධොපම සූත්‍ර ය අනේක ප්‍රකාරයෙන් දේශනා කරන්ට පටන්ගත් කල්හි සැටක් පමණ භික්ෂූහු හසින් හෘදය තෑවී හුණු ලෙය වමණ ය කළහ. සැටක් පමණ භික්ෂූහු භාග්‍යවතුන් වහන්ස! අනිසසින් දුෂ්කර ය අති සසින් දුෂ්කරය සි කියා ශ්‍රමණ වෙස් හැර ගිහි භාවයට ගිය හ. "පිරිසිදු සීලයෙහි පිහිටියම් හ එ හෙයින් මේ අඟුලිකඛන්ධොපම සූත්‍රයෙහි වදළ දුකඛයෙන් මිදුනම්හ සි" සතුටු වූ සිත් ඇති සැටක් පමණ සීල සම්පන්න භික්ෂූන් වහන්සේ කෙලෙස් සතුරන් කෙරෙන් ඔත මිදූ සේක මේ දක්වන ලද මැ සි. එම සූත්‍රාව සානයෙහි.

ඉදමොව භගවා, ඉමස්මිඤ්ච පන වෙය්‍යාකරණස්මිං භඤ්ඤමානෙ සට්ඨිමත්තානං භික්ඛූනං උණ්හං ලොහිතං මුඛතො උග්ගඤ්ඡි. සට්ඨිමත්තා භික්ඛූ සික්ඛං පච්චක්ඛාය හීනායාවත්තිංසු. දුක්කරං භගවා සුදුක්කරං භගවාති. සට්ඨිමත්තානං භික්ඛූනං අනුපාදාය ආසවෙහි චිත්තං විමුච්චිංසු-සි.

යනුවෙන් දක්වා වදරණ ලද්දා වූ අඟුලිකඛන්ධොපම සූත්‍රාදි යෙහි නොඇසිය හැකි වූ නොවිදිය හැකි වූ නොසිතිය හැකි වූ දුකඛ ය බ්‍රහ්මචර්‍යා ව හෙදයට පැමිණ වූ භික්ෂූහු විදිනාහ.

එබැවින් සප්තවිධ මෛථුනාදියෙන් දුරු ව අබ්‍රහ්මචාරී භාවයෙන් යුක්ත ව ශ්‍රේෂ්ඨ වූ බ්‍රහ්මචර්‍යාවෙහි හැසිරීම ලොව් ලොවුතුරා සම්පත් සාදා දීමට කාරණා වන බැවින් උතුම් මඟුලෙක් නම් වන්නේ ය.

අරියසච්චාන දස්සනං යන්නෙහි ආර්‍යසත්‍යයෝ නම් දුක්ඛ සත්‍ය ය සමුදය සත්‍ය ය නිරෝධ සත්‍ය ය මාර්ග සත්‍ය ය යන චතුරාර්‍ය සත්‍ය ය වන්නේ ය. ඒ චතුරාර්‍ය සත්‍යයන්ගේ දර්ශන ය උතුම් මඟුලෙක් නම් වන්නේ ය.

"නිබ්බාන සච්ඡිකිරියාව" යන්නෙහි පඤ්චගති භය ය සි දන්නා ලද තෘෂ්ණාවෙන් නික්මුණු හෙයින් නිවණ සි කියන ලද නිර්‍වාණ පුරයට පැමිණීම ප්‍රත්‍යක්ෂ කිරීම උතුම් මඟුලෙක් නම් වන්නේ ය. මේ සේ **"නපොවබ්‍රහ්මචරියාව"** යනාදී ගාථා වෙන් අනිද්ධ්‍යා දෞර්මනස්‍යාදීන්ගේ නැවැත්මෙන් ඉන්ද්‍රියසංවර ය ද කෞක්‍රත්‍යයාගේ තාපනයෙන් නෙවන් කුසීත බව තාපන ය කිරීමෙන් වීර්‍ය්‍ය කිරීම ය යන තපස් ඇති බව එක් මඟුලෙක, මේ වුන්දමින් දුරුව උතුම් බඹසර රැකීම එක් මඟුලෙක, චතුරාර්‍ය සත්‍යයන් දැක්ම එක් මඟුලෙක, නිවන් සාක්ෂාත් කිරීම එක් මඟුලෙකැ සි කියා මඟුල් සතරක් වදාරා මතුයෙහි ත් මඟුල් වදාරණ සේක්—

> ඵුට්ඨස්ස ලොකධම්මෙහි චිත්තං යස්ස න කම්පති,
> අසොකං විරජං ඛෙමං එතං මඞ්ගල මුත්තමං.

යන ගය වදාළ සේක. එහි **"ඵුට්ඨස්ස ලොකධම්මෙහි චිත්තං යස්ස න කම්පති"** යන්නෙහි ලාභාදී අෂ්ටලෝකධර්මයෙන් පහරණ ලද්දා වූ යම්කිසි හුගේ සිත නොසැලේ ද නොවෙවුලා ද කම්පා නොවේ ද එසේ වූ ක්ෂීණාශ්‍රවයාගේ ඒ සිත ද උතුම් මඟුලෙක් වන්නේ ය. ඒ එසේ ම ය.

අසොක යැයි කියන ලද අර්හත් මාර්ගඥානයෙන් උපුටා හරණ ලද ශොක නැමති හුල් ඇති හෙයින් ශොකපීඩා රහිත වී නම් හෙ ද උතුම් මඟුලෙක් වන්නේ ය. එසේ ම විරජ යැ යි කියන ලද ක්ෂීණාශ්‍රවයාගේ සිත මාර්ගඥානයෙන් හරණ ලද රාග දෝෂ මෝහාදි පාපධර්මයන් ඇති හෙයින් රජස් රහිත ද නිර්මල ද වී නම් හෙ ද උතුම් මඟුල් වන්නේ ය. එසේ ම ඛෙම යැ යි කියන ලද ක්ෂීණාශ්‍රවයාගේ චතුර්විධ යෝගයෙන් විනිර්මුක්ත හෙයින් අභය ද නිරුපද්‍රව ද වී නම් හෙ ද උතුම් මඟුල් වන්නේ ය. මෙසේ **ඵුට්ඨස්ස ලොකධම්මෙහි** යනාදී ගාථාවෙන් අෂ්ට

ලෝක ධර්මයෙන් අකම්පිත බව එක් මගුලෙකි. කිසිවෙකු ත් සෝක නැති බව එක් මගුලෙකි. රාගාදී රජස් නැති බව එක් මගුලෙකි, කෙලෙස් සතුරන්ගෙන් උපද්‍රව නැති බව එක් මගුලෙකැ සි කියා මගුල් සතරක් වදාරා මත්තෙහි—

එතාදිසානි කත්වාන සබ්බත්ථ මපරාජිතා,
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති තං තෙසං මඞ්ගල මුත්තමං සි.

යනුවෙන් අප විසින් කියන ලද ප්‍රකාර ඇති බාලයන් ගේ අසෙවනාදී වූ මෙ බඳු මඞ්ගලයන් නො වරදවා කොට ප්‍රභෙද ඇති සියලු සතුරන් හා ත් නො පැරද උභය ලෝකයෙහි ම චතුර්විධ ඉරියවු සහිත වූ ද කෙලෙසක්ෂය කළ හෙයින් නිරුපද්‍ර වූවාහු දිව්‍ය පුත්‍රය ! මෙ බඳු වූ මඞ්ගල්‍යයන් කොට හැමතැන්හි සවසතිභාවයට යම් හෙයකින් යද් ද එ හෙයින් ඔවුන්ට අසෙව නාව බාලානං යනාදී මඞ්ගල්‍ය අටනිස උතුම් මගුලැ සි දේශ නා ව නිම වා වදාළ සේක.

එ සේ හෙයින් ඉහලොක පරලොක දෙකින් වැඩ කැමැත්තා වූ සත්පුරුෂයෙනි ! නුවණ තැත්තවුන් හා එක් නොව නුවණ ඇති පණ්ඩිත ජනයන් භජනය කොට පිදිය යුත් තවුන් පුදා ප්‍රථම ගාථාවෙන් වදාළ මගුල් තුණ පිළිගෙණ තුණු රුවන් පැවතීම් පිවුවණක් පිරිස් විසීම් ආදී වූ ප්‍රතිරූප දෙශ යෙහි පෙර කළ පින් ඇති බැවින් තමන් යහපත් ව සැපසේ වැස දෙවන ගාථාවෙන් වදාළ මහුල් තුණෙහි යෙදීමෙන් ද, බොහෝ ඇසූ පිරූ තැනුත් ඇති ව අගාරික අනගාරික වස යෙන් අකුශල කම්පථ විරහිත මණිකාර සවණ්ණ කාරාදී අනාරිය ශිල්ප ය සිවුරු ගෙත්තම් ආදී වූ අනගාරිය ශිල්ප ය යන දෙක ඉගැන්මෙන් ද, සංවර විනය පහාන විනයාදී වසයෙන් අකුශල යෙන් මිදී කුශලයෙහි පිහිටා මනාව භික්ම්මෙන් ද, සසුන් හොබ වා කියන බසක් ඇත් නම් යහපතක් ම කියා තුන්වන ගාථා වෙහි වදාළ මහුල් සතරෙහි යෙදීමෙන් ද,—

දෙමව්පියන්ට උපසථාන කිරීම **සාලිකේදර** ජාතක **සොනනන්ද** ජාතකාදියෙහි බෝසතුන් කි ලෙස කිරීමෙන් ද, අඹු දරුවන්ට සංග්‍රහ කිරීමෙන් මත්තට නිසා පොළි පිටලන් නාක් මෙන් කිරීමෙන් ද, කෘෂිවණ්ණාදී නිරවුල් කම්මන්ත ඇති වීමෙන් ධන ධාන්‍ය සම්පත් ඇති ව සතරවන ගාථාවෙන් වදාළ මහුල් තුණ හෝ සතර හෝ පස හෝ දැන එහි යෙදීමෙන් ද, කුසල් රැස්කරවමින් (සතරවන ගාථාවෙහි තුණ ය සතර ය පස ය යන මහුල් ප්‍රභෙද ය මෙම පරිවෙජදයෙහි එම ගාථාවට

කළ ව්‍යාඛ්‍යනයෙහි කි ලෙසින් දන්නේ ය.) දන්දීමෙන් හොඟ යෙහි සාරය හැරගෙණ දසකුසල ධර්මයෙහි යෙදීමෙන් ධර්ම චර්‍යා ව පුරා නැයන්ට සංග්‍රහ කිරීමෙන් සව පක්ෂය හිතකර මින් සිල සමාදානාදී නිරවද්‍ය කර්මාන්තයෙන් අනුන්ට හිත කරමින් පස්වැනි ගාථාවෙන් වදාළ මහුල් සතරෙහි යෙදීමෙන් ද, පවින් වැලැක්මෙන් ජනපීඩා ත් නැති ව රහමෙරින් දුරුවීමෙන් තමාට වන පීඩාත් නසා නො පමාවීමෙන් කුසල ධර්ම වඩමින්-

සවෙනි ගාථාවෙන් වදාළ මහුල් තුණෙහි යෙදීමෙන් ද, පිතට සින් නැමුණු බැවින් ගිනි සැප ත් හැර මහණ ව බුද්ධාදීන් කෙරෙහි ගෞරව ත් ඇති ව උඩහු බව ශාසනයට නුසුදුසු බැවින් කොතැන්හි ත් යටත් වූ පැවතුම් ඇති ව වන්පිළිවෙත් සාරව චතුර්විධ ප්‍රත්‍යයෙහි ද්වාදශවිධ ආයෂ්‍ය සන්තොෂ ය ඇති බැවින් සිව්පසයෙහි ලොල් බැව් හැර කළ දෙයෙහි ගුණ දන්නා බැවින් සත්පුරුෂ ව පින්කම්හි මැලිබවෙක් ඇත් නම් ධර්මශ්‍රවණ යෙන් ඒ දුරුකොට සත්වෙනි ගාථාවෙන් වදාළ මහුල් පසෙහි යෙදීමෙන් ද, ක්ෂමාකිරීමෙන් සියලු උවදුරු නසා කීකරු වීමෙන් සියල්ලට ම නිසි ව සුවව ව ගුණඇත්තවුන්ගේ දැක්ම නිසා උන්ගේ අනුශාසනාවෙන් නමා ත් ගුණ ඇති ව කුසල් විශයෙහි උපන් සැක ඇත්නම් නුවණැත්තවුන් හා කථාකිරීමෙන් ධර්ම සාකච්ඡාවෙන් ඒ දුරුකොට ගෙණ අටවෙනි ගාථාවෙන් වදාළ මහුල් සතරෙහි යෙදීමෙන් ද-

ඉන්ද්‍රිය තාපනය කොට සිවුපි රිසිදු සිල් පිහිටීමෙන් සීල සුද්ධි ය සපයාගෙණ සමථානියෝගයෙන් චිත්ත විසුද්ධි ය උපද වා දෘෂ්ටි විශුද්ධි ආදිය නැතුව ඥානදර්ශන විශුද්ධි ය සපයන්ට බැරි බැවින් ලක්ෂණාදී විසින් නාමරූප නිශ්චයාදී විසින් සෙසු විශුද්ධි ත් සපයා ගෙණ මානී පිත්‍රිවෙළින් ගොසින් රහත් ව සුලභකින් මහමෙර සොලවාලි ය නොහැක්කා මෙන් අෂ්ටලෝක ධර්ම නැමති පවනින් නොවෙවුලා නිසොසුක වීමෙන් නිකෙලෙස් වීමෙන් හැම තැන්හි නොපැරදෙන ලද අත්බැව සාර්ථක කටයුතු බව සලකා නවවන දස වන ගාථාද්වයෙන් වදාළ මහුල් අටෙහි ද යෙදීමට උත්සාහ කට යුතු. මේ **මඞ්ගල සූත්‍රයෙහි** "එවං ශබ්දයෙහි පටන් භගවන්තං ගාථාය අජ්ඣභාසි"යි යන තැන් දක්වා ශ්‍රාවකභාෂිත ය වන්නේ ය.

"බහූදෙවා මනුස්සා ච මඞ්ගලානි අචින්තයුං,
ආකංඛමානා සොත්ථානං බ්‍රූහි මඞ්ගල මුත්තමං."

යන ගාථා ව දෙවභාෂිත ය වන්නේ ය. "අසෙවනා ච බාලානං" යනාදී ගාථා එකොළොස බුද්ධ භාෂිත ය. එයින් ගාථා දසයකින් මහුල් අටනිස ප්‍රකාශ වී ය. කෙළවර ගාථාවෙන් වදාළේ නම් එම්බා දෙවපුත්‍ර ය! අප විසින් කියන ලද ප්‍රකාර ඇති බාලයන් අසේවනාදී වූ මේ බඳු මංගලයන් කොට සියලු මරුන් අතුරෙන් එකකු හා ත් නොපැරද උභය ලෝකයෙහි ම සියලු ඉරියව් සහිත වූ ද කෙලෙශක්ෂය කළ හෙයින් නිරුපද්‍ර වූවාහු, දිව්‍යපුත්‍ර ය මේ බඳු වූ මඞ්ගල්‍යයන් කොට හැමතැන්හි සැපයට පැමිණේද් ද එ හෙයින් ඔවුන්ට මේ මහුල් අටනිස(තෙම) උතුම් මහුලැ යි කියා දෙශනා ව නිමවා වදාළ බව යි. සියලු දිව්‍ය මනුෂ්‍යයන්ගේ කුකුස් හරවා ආකාස ගංගා ව ගෙණහැර පාන්නාක් මෙන් කුදුගොත් සහිය සූත්‍රනිපාත යෙහි මේ මඞ්ගල සූත්‍රදෙශනා ව නිමවා වදාළ කල්හි කෙළ ලක්ෂයක් දෙවියෝ රහත්වූහ. සෙසු තුන් මගින් නිවන්මග දුටුවෝ තුන් අසංඛ්‍යයකි. දක්වන ලද මෑ යි මඞ්ගලසූත්‍ර අට්ඨවාවෙහි—

එවං භගවතා නිට්ඨාපිතාය දෙසනාය පරියොසානෙ කොටි සතසහස්සා දෙවතායො අරහත්තං පාපුණිංසු. සොතාපන්නි සකදාගාමි අනාගාමි ඵලප්පත්තානං ගණනා අසංඛෙය්‍යා අහොසි.–යි

මේසේ චතුරාර්‍ය්‍ය සත්‍ය ය කෙළවරකොට ඇති ධර්මදේශනා වෙන් ප්‍රමාණාතික්‍රාන්ත සත්වයන් නිර්වාණපුර පැමිණ වූ හෙයින් ද බුද්ධ නම් වන සේක. ඒ එසේ ම ය. මේ සේ සත්ව ප්‍රජාවට අවබොධ කරවූයේ ත් තමන් වහන්සේ දන් හෙයින් ම ය. එසේ හෙයින් අනිඤ්ඤෙය්‍ය ධර්ම ය යි කියන ලද හෙයින් ද විශිෂ්ට ඥානයෙන් දතයුතු වූ චතුස්සත්‍ය ධර්මයන් ප්‍රථිභාගයෙහි විදර්ශනා ප්‍රඥාවෙන් අධිගම ක්ෂණයෙහි මාර්ග ප්‍රඥාවෙන් මතුයෙහි සම්බෝධනා ඥානයෙන් දතයුතු හෙයින් ද, පරිඤ්ඤෙය්‍ය ධර්ම ය යි කියන ලද දුක්ඛ සත්‍ය ධර්මයන් එ සේ ම දතයුතු හෙයින් ද, ප්‍රහාතව්‍ය ධර්ම ය යි කියන ලද සමුදය පාක්ෂික ධර්මයන් එ සේ ම දතයුතු හෙයින් ද. සච්ඡිකාතබ්බ ධර්ම ය යි කියන ලද නිර්වාණ ධර්මයන් එ සේ ම දතයුතු හෙයින් ද භාවිතව්‍ය ධර්ම ය යි කියන ලද මාර්ගසත්‍ය ධර්මයන් එ සේ ම දතයුතු හෙයින් ද දන් හෙයින් ද බුද්ධ නම් වන සේකැ යි යනු ඟඟවන්නට විශුද්ධිමාර්ගයෙහි—

අනිස්සෙසුද්‍යෙය්‍ය ධම්මෙ අනිස්සෙසුද්‍යයතො බුද්ධා පරිස්සෙසුද්‍යය ධම්මෙ පරිස්සෙසුද්‍යයතො, පහාතබ්බෙ පහාතබ්බතො, සච්ඡිකාතබ්බෙ සච්ඡිකාතබ්බතො, භාවෙතබ්බෙ භාවෙතබ්බතො-යි. යනු කිහු. එම් දක්වන්නට වදළහ. බුදුහු.

අනිස්සෙසුද්‍යය්‍යං අනිස්සුතං
භාවෙ තබ්බං ච භාවිතං,
පහාතබ්බං පහීණමෙ
තසමා බුද්ධොසම් බ්‍රාහමණ-යි.

මෙතෙකින් මේ සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහ නම් වූ

ධම්ප්‍රකරණයෙහි

මහා මඞ්ගල සූත්‍ර දෙශනා කථා නම් වූ

නවවන පරිච්ඡේද ය

නි ම්.

10. කතිං සංදර්ශනාදි කථා

බුද්ධත්තං පාපුණිත්වා අපි මුනි පවරෝ-ලොක නාථෝ මුනින්දෝ,
නාඤ්ඤං කිඤ්චිම්පි වත්වා පවර මුනිගුණේ-එව සංවණ්ණයන්තෝ.
කපපං වා තිට්ඨමානෝ විමල මුනිගුණේ-නෙව අන්තං පයාති,
ආයුස්සන්තං ව යාති ඉදමපි වචනං-සෝ ව බුද්ධෝ අවොච.

අනි නීවං භවග්ගොපි උද්ධා සත්ථු ගුණෝ තතෝ,
ආකාසොපි අනොකාසෝ මහන්තෝ මුනිනෝ ගුණෝ;
අඤ්ඤා පථවි වාපි ඝනෝ ව සත්ථුනෝ ගුණෝ.

අගම්භීරෝ සමුද්දොපි ගම්භීරෝ සත්ථුනෝ ගුණෝ,
සාරිපුත්තෝ මහාපඤ්ඤෝ මොග්ගල්ලානෝ ව ඉද්ධිමා.

එතෙපි පණ්ඩිතා ලොකෙ බ්‍රහම සක්කාදයොපි ච,
වක්‍ඛාපි වචසා නිච්චං අනන්තං මුනිනෝ ගුණං.

මනසා චින්තයිත්වාපි න පරං යන්ති සබ්බසෝ,
කථං මෙ අපප පුඤ්ඤත්ත අපප පඤ්ඤත්ත සත්ථුනෝ.

වණ්ණාරහෝ ගුණෝ හොති තසමා මේ ඤ්‍ඤණ සත්තියා,
එකාදස සහසෙහි ගන්ථෙහි අධිකෙහි ච;
පරිවෙජ්දෙහි නවහි යොජෙත්වා නවගුණෙහි තු.

බුද්ධ සද්දස්ස අත්ථං ච වණ්ණෙන්තෝ **සද්ධම්මාදිකං**,
සාරත්ථසංගහං නාම අකාසිං පකරණං ඉදං.

ඉමිනා පූඤ්ඤ තෙජෙන **සිරිවිජරජකකමෝ**,
නරින්දසිහෝ සෝ රාජා සීහලිස්මිං ජනාධිපෝ.

චිරං ජීවතු භූපාලෝ කපපං තිට්ඨතු භූපති,
පිය පුත්තෙතව රක්ඛන්තෝ ජනෙ ධම්මෙන සබ්බද.

ජීවිතං විය පාලෙන්තෝ සම්මා සම්බුද්ධ සාසනං,
වජ්ජෙන්තෝ පාපකෙ මිත්තෙ භජන්තෝ පණ්ඩිතෙ ජනෙ.

පාපෙ අකුසලෙ ධම්මෙ විසඡෙජන්තෝ විසං විය.
දානාදි කුසලෙ ධම්මෙ භජන්තෝ සාදරං සදා.

ආචරියාචූපඣ්ඣායා මාතා පිතාදයෝ හිතා,
සබ්බදුක්ඛෙහි මුත්තාව තිට්ඨන්තු එත්තමෙ සුඛෙ.

දෙවා බ්‍රහ්මා ච ගන්ධබ්බා නාගා ච යක්ඛ රක්ඛසා,
යම්රාජා ච අඤ්ඤේපි වාත වස්ස වලාහකා;
සබ්බේ තෙ අනුමෝදන්තු කතං තං කුසලං මයා.

මනුස්සා අමනුස්සා ච පාණා තෙරිස්සකාපි ච,
නිරවජ්ජා ගතා සබ්බේ පෙතා අසුර කායිකා.

ජලට්ඨා ච ථලට්ඨා ච රුක්ඛා ච දීඝ ජාතිකා,
අපාදා ච දිපාදා ච චතුප්පාදා බහුප්පදා.

භිතා ච අභිතාවාපි පාණා මජ්ඣත්තිකාපි ච,
සබ්බේ තෙ මම පුඤ්ඤන්ත තෙන මුඤ්චන්තු දුක්ඛතො.

උත්තානුත්තා අසෙසා ච පාණා සංසාර වාරිකා,
තෙනෙව පුඤ්ඤ කමෙවත මුඤ්චන්තු භව බන්ධනා.

අහං තු ධම්ම රාජස්මිං පස්සන්නෙනෙව චෙතසා,
කතෙන ඉමිනා පුඤ්ඤ කමෙමත භවතො ඉතො.

චුතෝ ගන්ත්වාන මෙත්තෙය්‍ය බොධිසත්තස්ස සන්තිකං,
තෙන සද්ධිං චිරං කාලං වස්සන්තෝ තුසිතෙ පුරෙ.

මෙත්තෙය්‍ය බොධිසත්තෝ සෝ කෙතුමත්‍යා පුරෙ යද,
බ්‍රහ්මබන්ධුකුලෙ සුද්ධෙ උපපජ්ජිත්වා විනායකෝ.

දෙවරාජ'ව චින්තෙන්තා අපපමාණ සුඛං සරෙ,
දෙවෙහි දස්සිතෙ දෙව දූතෙ දිස්වාන කෙවලං.

ඝරාවාසං චජිත්වාන පබ්බජිත්වාන නායකෝ,
නාග රුක්ඛස්ස මූලස්මිං නිසජ්ජ වජිරාසනෙ.

සූරියොදයෙ යථා අඤ්ඤං ජෙත්වා මාරං සවාහිනිං,
බුද්ධෝ භවෙය්‍ය සෝ නාථෝ අසමප්පටි පුග්ගලෝ.

අහම්පි තෙන සමයෙන කෙතුමත්‍යා පුරෙ තහිං,
බ්‍රහ්ම සූනු කුලෙ යෙව උපපජ්ජිත්වා මහද්ධනෝ.

ගුණවා සීලවා සන්තෝ පඤ්ඤවා සුගතං ජිනං,
උපසංකම්ම සම්බුද්ධිං මෙත්තෙය්‍යං ලොක නායකං.

සුත්වා සාදර චිත්තෙන ධම්මං නිය්‍යාණිකං වරං,
සද්ධායා'ගාරා නික්ඛම්ම පබ්බජ්ත්වාන සාසනෙ.

පංසුකූලික අඞ්ගාදි දෙව ච චීවර නිස්සිතෙ,
පිණ්ඩපාතික අඞ්ගාදි පඤ්ච ආහාර නිස්සිතෙ.

තථා ආරඤ්ඤකඞ්ගාදි පඤ්ච සෙනාසනිස්සිතෙ,
අඤ්ඤං තෙසජ්ජිකඞ්ගන්ති තෙරසිමෙ ධුතෙ ගුණෙ.

සම්මා සම්දිසිබ්බාන ලාභ කිත්ති යසාදිහි,
අවිනාසෙන්තො ව පාලෙය්‍යං තානි සබ්බානි සබ්බසො.

දෙවභානිකෙසු ථෙරෙසු ජෙට්ඨ ථෙරොඋවගමපන,
ධුතඞ්ගපටිවජ්ජකො හොමි ධුතධමෙම සදාදරො.

පාලෙන්තො තානි අඞ්ගානි සුත්තන්තං විනයම්පි ච,
අභිධම්ම පිටකඤ්ඤාපි ධාරෙන්තා පිටකත්තයං.

අකත්තබෙබ වජ්ජෙන්තාව කත්තබෙබ ච කරං සදා,
සද්ධාපුබ්බඞ්ගමෙ හුත්වා පාතිමොක්ඛෙ ච සංවුතො.

චක්ඛුනා සංවරො හුත්වා තථා සොතෙන සංවරො,
ඝාණෙන සංවරො හුත්වා තථා ජිවහාය සංවරො.

කායෙන සංවරො හුත්වා තථෙව මනසාපි ච,
සති පුබ්බඞ්ගමං කත්වා එවම්ඉන්ද්‍රිය සංවරං;
රත්තින්දිවාපමාදෙන නයනං විය පාලයං.

විනොදෙත්වාන කොසජ්ජං සපදානෙන සබ්බදා,
චරිත්වා එව ජීවන්තො විරියෙනාජීවිකං කරං.

පඤ්ඤා පුබ්බඞ්ගමං කත්වා පච්චයෙ අගතිතො සදා,
සම්මාව පච්චවෙක්ඛන්තො පච්චය සන්නිස්සිතං චරං.

සීලං ව පරිපූරෙන්තා ජීවිතං විය සබ්බදා,
අප්පමාද රතො හුත්වා සබ්‍රහ්මසු කරුණා පරො.

භාවනාභිරතො හුත්වා වජ්ජෙන්තා පාපකෙ ජනෙ,
මිත්තෙ භජන්තා කල්‍යාණෙ පන්ථසෙනාසනෙ රතො,

විවිතෙවෙ අප්ප නිග්ඝොසෙ සම්මා සම්බුද්ධ වණ්ණිතෙ,
වසන්තා ගුණ සම්පන්නා ගහෙත්වා මුනි මානසං.

විසාතචිත්ත ගොතොව ව්‍යග්ඝොව තබ්ධ ජිව්හකො,
දන්තචිත්තෙනා යථා නාගො චණ්ඩාලොව අමානිකො.

පාද පුඤ්ඡන වොලං ව පාදපීඨං ව සබ්බදා,
සබ්බෙසං බ්‍රහ්මචාරිනං උත්තමානං තපස්සිනං.

හුත්වා අනතිමානීව මුදුකො සුවචොපි ච,
පරියත්ති පට්පත්තීහි සොභෙන්තා ජින සාසනං.

ලභිත්වා පරිවාරෙ ච තාදිසෙව ගුණෙ ඨිතෙ,
එවං මෙත්තෙය්‍ය සම්බුද්ධං යාවජ්ජවං භජාම්‍යහං.

සකලානි තානි පුඤ්ඤානි කරොනෙතාපි අහං පන,
බුද්ධත්තං යෙව පත්ථෙනෙතා කරෙය්‍යං සුද්ධ වෙතසා.

තතො පරම්පි සංසාරෙ සංසරනෙතා භවා'භවෙ,
පාණඝාතාදි පාපානි න කරෙය්‍යං කුදාචනං.

දානාදි පාරමී ධම්මෙ පූරෙය්‍යං ජාතිජාතියං,
කිං බහුනා පපඤ්චෙන සබ්බ බුද්ධෙහි නින්දිතෙ.

පාපානි පරිවජ්ජෙනෙතා සබ්බබුද්ධෙහි සෙවිතෙ,
බොධිසත්ත ගුණෙ යෙව පූරෙනෙතා ජාහි ජාතියං.

උප්පන්නුප්පන්න බුද්ධානං පාපුණිත්වාන සම්මුඛං,
දිස්වා සුත්වා ච සද්ධම්මං පූජෙත්වා තෙපි සාදරං.

ව්‍යාකරණං ලභිත්වාන පුරෙ අපපටි පුග්ගලෙ,
මිඩ්ගලෙ විය සම්බුද්ධෙ බුද්ධෙ හුත්වා අනාගතෙ.

ධම්මචක්කං පවත්තෙත්වා ලොකෙ අපපතිවත්තියං,
භව බන්ධනතො සත්තෙ මොචෙත්වා විමලෙ වරෙ.

පතිට්ඨපෙය්‍යං අමරෙ නිබ්බාණ පුරමුත්තමෙ.
යාව තිට්ඨති සෙලිතෙ මහා මෙරුති සම්මතෙ,

යාව තිට්ඨන්ති ලොකසමිං වන්දසුරියා මහිද්ධිකා,
යාව බුද්ධොති නාමම්පි ලොකෙ තිට්ඨති සන්තුතෙ.

තාව තිට්ඨතු **සද්ධම්ම සාරත්ථ සඞ්ගහොං'යං**
සග්ගමොක්ඛහි සත්තානං කරොනෙතා අත්ථසඞ්ගහං'නි.

ප්‍රවරතර ශ්‍රී ලංකාද්වීප ප්‍රාප්ත විජයරාජ ප්‍රමුඛානෙක ශත නරපති පරම්පරා ප්‍රභව තාරහ ලතායෙහි විරාජමාන මධ්‍ය මාණික්‍ය ප්‍රතිභාග වූ අතීන්ද්‍රිතාඛ්‍ය ප්‍රත්‍යඛ්‍ය සම්පූර්ණ මෘගරාජ නිර්විශෙෂ තනු තරොප සොභිත රිපුජන තම නිකර දිනමණි නිර්විශෙෂ වූ අශෙෂ නරපති මෞලිමණිකිරණ රඤ්ජිත පාදාන්ත ඇති නෙකදිගන්තර ව්‍යාප්ත කීර්ති ප්‍රබන්ධ ඇති **ශ්‍රී විජයරාක්‍රම නරෙන්ද්‍රසිංහ** නම් පෘථිවීශ්වරතෙම රත්නත්‍රය ශරණ පරායන ව අනෙකවිධ පුණ්‍යසම්භාර සඤ්චය කරනුයේ අභිනව ධම්ප්‍රබන්ධ යකු දු උපදවනු කැමති ව රක්ෂිත ගොපිත සුවිසුද්ධ සීලාචාර ධූත වූතාලෙපවජ්ජ සල්ලෙඛ වෘත්ති ක්ෂාන්ති මෛත්‍රී ආදී විවිධාන්විත ශ්‍රාමණ්‍ය ලෞකික ගුණරත්නාලංකාර වූ ජනෙතු ලඞ්කාර-නෛරුක්ත්‍යාඛ්‍යනෙක ශාස්ත්‍රඥ විමලතර ප්‍රඥාසාර වූ-

ශිෂ්‍යවගී නැමැති පද්මවන ප්‍රබොධයට ශරත්සූයෝදයක් බඳු වූ සාමන්ත හුදීදන කුමුදු වන විකාශනයට සරාසඳක් වැනි වූ චතුර්දිශාගත ශ්‍රමණ බ්‍රාහ්මණ කෘපණ වණීබ්බක දරිද්‍රාදීන්ට මාගී චතුෂ්ක සන්ති ප්‍රතිෂ්ඨිත පුෂ්පාඩ්කුරාඪ්‍ය ප්‍රතිමණ්ඩිත ඖෂධි දෘම නිර්විශෙෂ වූ සර්ද්ධශාසන නැමැති රත්නාකරයට රත්නාං කුරයක් බඳු වූ උපොෂිතාරාම යතීන්ද්‍ර වංශාලඞ්කාර භූත වූ විඛ්‍යාජ නාලිකුල නිසෙවිත සරොරුහාකාර වාදීභ කුම්භ ප්‍රදලන කණ්ඨීරව සඞ්කාස සාමන්ත කවිජනාමිත ප්‍රාර්පිත පණ්ඩිත ජන ශිරොමාණික්‍ය අසරණ සරණ **සරණඞ්කරාභිධාන** අරණ්‍යවාසී පිණ්ඩපාතික සාමණෙරපාදයන් වහන්සේට සාදරයෙන් ආරාධනා කළ සේක.

උන්වහන්සේද තමන්වහන්සේ දශ සහශ්‍රී ලොකධාතුව එකාලොක කොට සර්ද්ධ පදප්‍රාප්ත වූ මඞ්ගල සම්මා සම්බුදුරජාණන් වහන්සේ සෙයින් සම්‍යක්සම්බොධි සමධිගම ය කෙරෙම්ව සියන ප්‍රාර්ථනා වෙත් පරමොත්කෘෂ්ඨ බොධි සම්භාරාවතාර ගුණ විශෙෂ ය ප්‍රාර්ථනා කරණ බැවින් හා අප්‍රතිපත්ති — දුෂ්ප්‍රතිපත්ති බාහුල්‍යතායෙන් බුදුසසුන් පිරිහෙන සේ දැක සුවව කීකරු නොයෙක් ශිෂ්‍යවගීයා ඇති කරවා ඔවුන් සුවිසුද්ධ සීලාචාර ධෘතවූතාදී ය පූරණ ය කරණ සේ සලස්වා ඡන්දස්-නිඝණ්ඩු-වෛය්‍යාකරණ -. සද්ධර්මෝද්ග්‍රහණ ධාරණාදියෙහි නිපුණත්වයට පැමිණවීමෙන් හා අර්ථ කථා සහිත වූ-

දීඝනිකාය—මජ්ඣිමනිකාය—සුත්තනිපාත ය-ජාතක ය ධම්මපදය-අභිධම්මාදීසංඝහ ය හා ධම්මසංගණ්හාදි සප්ත ප්‍රකරණයෙහි ඇතුළත් පාළි හා අටුවා ය, සමන්තපාසාදිකා නම් විනය අටුවා ය, බුද්ධවංශ අටුවා ය, චතුනිකායවාරට්ඨකථා ය, විනය විනිශ්චය, සද්ධර්මෝපායන ය, විශුද්ධිමාර්ග ය, සංසුන්තනිකාය, අඞ්ගුත්තරනිකාය, පරිජි-පවිති දෙ පොත හා චූලවංශ ය ඇතුළු වූ සෙසු ත් ත්‍රිපිටක බුද්ධවචනානන්තගීත වූ බොහෝ පොත් පත් ලිපිකාරයන්ට සංග්‍රහ කොට ලියවීමෙන් හා අනිතව මධුරාර්ථප්‍රකාශනී නම් වූ මහාබෝධිවංශාර්ථ ව්‍යාඛ්‍යාන—මුනිගුණාලඞ්කාර-අභිසම්බෝධි අලඞ්කාරාදී වූ ධර්ම ප්‍රබන්ධයනු දු උපදවා පර්‍යාප්ති—ප්‍රතිපත්ති ශාසන ය කලක් පවත්නා සේ කැන්පත් කිරීමෙන් හා—

තම්බත්වහන්සේගේ අපිස් සතොස් ගුණෙහි පහන් රාජ රාජ මහාඝාත්‍යාදීන් විසින් මහෝඝයක් සෙයින් ඵලවත ලද චතුර්විධ ප්‍රත්‍ය ය නවක මධ්‍යමාදී අල්ප ලාභීතෙනට පැමිණ වීමෙන් හා ජරාවාස ගත විහාර ප්‍රකෘති කම්කරවීමෙන් හා මහ බෝ වෛත්‍ය ප්‍රතිෂ්ඨාපනාදී වූ අනෙකවිධ ශාසනාභිවෘද්ධි වර්ධනයෙහි නිරතානිරත චිත්තාසනනාන ඇති සේක් යථොක්ත ක්‍රමානුසාර ඇති ආරාධනාව පිළිගෙන රසාතෙලෙහි පටන් භවාග්‍ර ය දක්වා ඉතා උස් ව පැත නැගෙතා පරිද්දෙන් බඹගොස් විහිදුවා ඉති'පි සො භගවා අරහං සම්මා සම්බුද්ධා යනාදීන් නව අර්හාදි ගුණ ය ප්‍රකාශ කොට වදුරණ ලද මේ ගාථාව ගේ නව පද ය අතුරෙන් "බුද්ධා" යන මේ අක්ෂරද්වයෙන් ප්‍රතිමණ්ඩිත වූ පද ය ගෙණ—


සුගත් වර්ෂයෙන් දෙදස් දෙසිය සැට නව වන්නෙහි ප්‍රකරණාරම්භයෙහි කියන ලද ප්‍රකාර ඇති සෙංකඩගල නුවර පෝයමඵවේ මහා විහාරේ දී ප්‍රකරණයට ආරම්භ කොට ශ්‍රී ලඞ්කාධිපති වූ ශ්‍රී විරපරාක්‍රම නරෙන්ද්‍රසිංහ නම් පෘථිවීශ්වර යාණන් ප්‍රමුඛකොට ඇති සමස්ත ශ්‍රී ලඞ්කාද්වීපවාසින්ට වැඩ පිණිස නොයෙක් අර්ථකථා පෙළ ආදියෙහි දුටු සාරාර්ථයන්

ගෙණ බුද්ධ ශබ්දයෙහි අනාගත කොට වණීනා කිරීම් වසයෙන් **නව මහා පරිච්ඡේදයකින්** හා **අධිකයක් සහිත එකොළොස් දහසක් ග්‍රන්ථයෙන් ප්‍රතිමණ්ඩිත** වූ මේ **සද්ධම්ම සාරාර්ථ සඞ්ග්‍රහ** නම් වූ ධර්මප්‍රකරණ ය කොට සම්පූර්ණ කළ සේක. ඒ මේ ධර්මකථාව තමාට හිත වැඩ කැමති සත්ජනයන් විසින් සාව ධාන ව අසා සංවේගමොක්ෂ සම්පත්ති ප්‍රතිලාභයට උත්සාහ කටයුතු සි.

චිරං තිට්ඨතු සද්ධම්මෝ—
කාලෙ දෙවෝ පවස්සතු,
ලෝකං පාලෙනතු රාජානෝ—
තථා ධම්මෙන සබ්බදා.



සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු